බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 1

# විනයපිටකයෙහි

01 වන ග්‍රන්ථය

# පාරාජිකපාළි

---

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්
ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිකාරී

පණ්ඩිත
වේරගොඩ අමරමොලි ස්ථවිරයන් වහන්සේ
විසින් කරණ ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලය
විසින් සංශෝධනය කොට සකස් කරණ ලදී.

---

බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 1

The First Book in the

**Vinaya-Pitaka**

**1**

# PĀRĀJIKAPĀLI

With the Sinhala translation by

**The Venerable Pandita**
**Veragoda Amaramoli Thera**
The librarian of
Sri Lanka Vidyodaya University, Colombo

Revised and Edited by
**The Editorial Board of**
**The Tripitaka Translation Committee**

**Published by**
**Dharma Chakkra Child Foundation**
Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka
Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /
**Co-published, printed and donated by**
**The Corporate Body of the Buddha Educational Foundation**
11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.
Tel: +886 2 23951198, Fax: +886 2 23913415
Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/
**B.E. 2557**
**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. ධම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතම කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගිනි, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**

**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

**2557 / 2013**

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක

වි. ජ. මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි

තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- ❄ පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- ❄ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ❄ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ❄ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- ❄ දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ❄ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ❄ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- ❄ පූජ්‍ය බබරුන්දේ ධම්මසිරි හිමි
- ❄ පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- ❄ මිලිනා සුමතිපාල මැතිණිය
- ❄ ජගත් සුමතිපාල මැතිතුමා
- ❄ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- ❄ දොස්තර අරුණ රබෙල් මහත්මා
- ❄ සුජිත් මොහොට්ටි මහත්මා
- ❄ රංජිත් අමරසිංහ මහත්මා
- ❄ ගාමිණී කාරියවසම් මහත්මා
- ❄ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ❄ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- ❄ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- ❄ සිරිසේන හේරත් මැතිතුමා
- ❄ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

# විනයපිටකෙ

# පාරාජිකපාළි

# විනයපිටකයෙහි

# පාරාජිකපාළිය

“තථාගතප්පවේදිතො ධම්මවිනයො භික්ඛවෙ විවටො විරොචති නො පටිච්ඡන්නො.” —

“මහණෙනි තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ ම බබල යි. වැසුනේ නො ම බබල යි.’

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය.)

# පටුන

## CONTANTS


| | පිටුව |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | I |
| ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලය ... ... | II |
| සංඥාපනය ... ... ... ... | III |
| සංකේත නිරූපණය — ABBREVIATIONS ... | VII |
| පාළිහෝඩිය- PĀLI ALPHABET ... ... | VIII |
| පාරාජිකපාළි විෂයසූචිය ... ... ... ... | XI–XVII |
| පෙළ හා පරිවර්තනය ... ... ... ... | 2–641 |
| පදානුක්‍රමණිකාව .... ... .... ... | 642–661 |
| සංඥානාම ... ... ... ... ... | 662–664 |
| ශුද්ධිපත්‍රය ... ... ... ... ... | 665–667 |

# සංස්කාරකනිවේදනය

ශ්‍රී **ලඞ්කා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි** පුස්තකාලයාධිකාරි **පණ්ඩිත වේරගොඩ අමරමොලි** නායක ස්ථවිරයන් වහන්සේ විසින් පාඨශෝධන සහිත ව කරණ ලද සිංහල පරිවර්තනයෙන් යුක්ත වූ මේ **පාරාජිකපාළිය** විනයපිටකයෙහි ප්‍රථම ග්‍රන්ථය වේ. ත්‍රිපිටකපාළිය සිංහල භාෂාවට පරිවර්තනය කරවා මුද්‍රණය කරවීමෙහි ආසක්ත වූ ලඞ්කාබෞද්ධමණ්ඩලයේ අයැදුම පරිදි උන්වහන්සේ විසින් පැසසිය යුතු පරිශ්‍රමයකින් නිමවන ලද පරිවර්තනය **ත්‍රිපිටකපරිවර්තනසංස්කාරකසභාවේ** සම්මතය අනුව උන්වහන්සේත් - පොල්ගහවෙල විද්‍යෝදය පරිවෙණාධිපති **කොසෙල්වතුගොඩ රතනජෝති** නායක ස්ථවිරයන් වහන්සේත් - පැල්මඩුල්ලේ පුරාණ-රජමහාවිහාරාධිපති **හාල්දඹුවන ධම්මරක්ඛිත** ස්ථවිරයන් වහන්සේත් - මාතර ශ්‍රී සුදර්ශී පරිවෙණාධිපති පණ්ඩිත **කඩවැද්දුව සිරිනිවාස** නායක ස්ථවිරයන් වහන්සේත් ඇතුළත් විනයග්‍රන්ථසංශෝධකමණ්ඩලය විසින් ප්‍රථමවාරයෙහි ශුද්ධ කරණ ලදී. නැවත **උත්තරීතරසංස්කාරකමණ්ඩලය** විසින් එහි ආකුල තැන් නිරාකුල කිරීම් ආදියෙන් දෙවැනිවර සකස් කොට එය මුද්‍රණයට සමවත කරණ ලදී.

උත්තරීතර මණ්ඩලයේ සම්මතය අනුව මේ ග්‍රන්ථයේ අනියත කාණ්ඩයේ පටන් **නිස්සග්ගිය කාණ්ඩය** තෙක් සිංහලපරිවර්තනය පාඨශෝධන සහිත ව නැවත ලියා සකස් කළ මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙණේ උපප්‍රධානාචාර්ය පණ්ඩිත **ලබුගම ලඞ්කානන්ද** ස්ථවිරයන් වහන්සේ හා ප්‍රවචනෝදය පිරිවෙන්හි උපාචාර්ය පණ්ඩිත **කරහම්පිටිගොඩ සුමනසාර** ස්ථවිරයන් වහන්සේත් විසින් දැරූ ආයාසය විශේෂයෙන් මෙහි සඳහන් කළ යුතු වේ. ඇතැම් ශෝධ්‍යපත්‍ර බැලීමෙන් හා පදානුක්‍රමණිකා හා ශුද්ධිපත්‍රය ද සකස් කිරීමෙනුත් පණ්ඩිත **ගලගම ධම්මික** ස්ථවිරයෝ ද මේ අධිකාරයෙහි සහාය වූහ. මේ ග්‍රන්ථයේ මුද්‍රණය මාස කීපයකින් අවසන් වූයේ **සිංහලජාතිය මුද්‍රණාලයේ** අධිකාරි වූ **ස්වදේශී ප්‍රවෘත්තිපත්‍ර සමාගමයේ** මහතුන්ගේ උත්සාහයෙනි.

සම්බුද්ධපරිනිර්වාණයෙන් පසු පැවැති ප්‍රථම විනයසඞ්ගීතිය සමග දඹදිව තෙවරක් ද, මහින්දාගමනයෙන් පසු පැවැති ථූපාරාම විනයසඞ්ගීතිය සමග ලක්දිව තෙවරක් දැයි මෙසේ සවරක් ම සංගීත වූ විනයපිටකයෙහි ප්‍රථම ග්‍රන්ථය වන **පාරාජිකපාළිය** හා එහි සිංහලපරිවර්තනය **බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලාවේ** ද අඞ්ක වශයෙන් ප්‍රථම ග්‍රන්ථය වේ. ත්‍රිපිටකපාළිය හා සඞ්ගීතිකථාදිය පිළිබඳ විස්තර මීට කලින් මුද්‍රිත වූ ත්‍රිපිටකග්‍රන්ථමාලා අඞ්ක 3 දරණ **මහාවග්ගපාළි** ග්‍රන්ථයෙහි ප්‍රස්තාවනාවෙන් දත හැකි වේ.

**විනයමහාවිභඞ්ග** නමින් ද දන්නා ලද **පාරාජිකපාළිය** හා එහි සිංහල-පරිවර්තනය ශාසනස්ථිතිය සඳහා මෙසේ මුද්‍රණද්වාරයෙන් ප්‍රකාශයට පැමිණවූ **ලඞ්කා ආණ්ඩුව** හා එහි **සාංස්කෘතික** කටයුතු භාර අංශයේ අධිකාරී මහතුන් ද, පරිවර්තන - සංශෝධන කාර්යයෙහි යෙදුනු මහතෙරුන් ද බෞද්ධ මහාජනයාගේ කෘතඥතාපූර්වක සාධුවාදයට හා අග්‍රගණ්‍ය වූ ධර්මදානමය පුණ්‍යමහිමයට හිමි වන බව අනුමෝදනා වශයෙන් ප්‍රකාශ කරමහ.

**පරවාහැර වජිරඤාණ ස්ථවිර.**

ත්‍රිපිටකපරිවර්තනකාරකසභාවෙහි හා
සංස්කාරකමණ්ඩලයෙහි සම්පාදක.

# ත්‍රිපිටකපරිවර්තනසංස්කාරකමණ්ඩලය

1. වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ (සභාපති),
2. පරවාහැර වජිරඤාණ නායක ස්ථවිරයන් වහන්සේ (සම්පාදක),
3. කෙසෙල්වතුගොඩ රතනජෝති නායක ස්ථවිරයන් වහන්සේ,
4. බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය නායක ස්ථවිරයන් වහන්සේ,
5. හාල්දඹුවන ධම්මරක්ඛිත ස්ථවිරයන් වහන්සේ,
6. අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ,
7. කඩවැද්දුව සිරිනිවාස නායක ස්ථවිරයන් වහන්සේ,
8. පලන්නොරුවේ විමලධම්ම නායක ස්ථවිරයන් වහන්සේ,
9. දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ,
10. වේරගොඩ අමරමෝලි නායක ස්ථවිරයන් වහන්සේ,
11. පරවාහැර පඤ්ඤානන්ද ස්ථවිරයන් වහන්සේ,
12. ගලගම සරණංකර ස්ථවිරයන් වහන්සේ,
13. හෑගොඩ ධම්මින්ද නායක ස්ථවිරයන් වහන්සේ.
14. කටුකුරුන්දේ දේවානන්ද නායක ස්ථවිරයන් වහන්සේ,
15. ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ,
16. කෝදාගොඩ ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ,
17. අකුරැටියේ අමරවංස නායක ස්ථවිරයන් වහන්සේ,
18. මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේ,
19. කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ,
20. වතුගෙදර අමරසීහ ස්ථවිරයන් වහන්සේ,
21. ඉඳුරුවේ උත්තරානන්ද ස්ථවිරයන් වහන්සේ,
22. මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්ථවිරයන් වහන්සේ,
23. කොත්ගොඩ ධම්මවංස ස්ථවිරයන් වහන්සේ,
24. තලල්ලේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ.

## උත්තරීතරසංස්කාරකමණ්ඩලය

1. පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක ස්ථවිරයන් වහන්සේ,
2. ආචාර්ය පරවාහැර වජිරඤාණ නායක ස්ථවිරයන් වහන්සේ,
3. බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය නායක ස්ථවිරයන් වහන්සේ,
4. පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ,
5. පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක ස්ථවිරයන් වහන්සේ.

# සංඥපනය

**විනයපිටකය:**

ශ්‍රී සුගත තථාගත සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේගේ ශාසනයෙහි පැවිදි වූවන්ගෙන් සකස් වූ භික්ෂු භික්ෂුණී උභතො-සඞ්ඝයාගේ කායවාක්සංවරසංවිධානය හා සඞ්ඝසුට්ඨුතා ඵාසුවිහාරතාදි ආනිසංස පිණිස ද, සද්ධර්මස්ථිතිය හා විනයානුග්‍රහය සඳහා ද පණවා වදාළ පන්සියඅටතිසක් පමණ වූ ශික්ෂාසමූහය ඇතුළත් විනයපිටකය ධර්ම (පාළි) අර්ථ දේශනා ප්‍රතිවේධ යන සතරින් ම ගැඹුරු ය. ත්‍රිපිටකය විභාග කළ අර්ථකථාචාර්යවරයෝ ආඥා ව්‍යවහාර පරමාර්ථ යන ත්‍රිවිධ බුද්ධදේශනා අතුරෙහි ආඥාවිධාන බහුල කොට ඇති හෙයින් විනයපිටකය ආණාදෙසනා යයි ද, යථාපරාධ යථානුලොම යථාධර්ම යන ත්‍රිවිධ අනුශාසනා අතුරෙහි අපරාධ (අධ්‍යාචාර) දොෂයන්ට අනුරූප වන පරිදි වදාළ ශාසන ඇති හෙයින් යථාපරාධශාසන යයි ද, සංවර - අසංවර දිට්ඨිවිනිවෙඨන නාමරූප පරිච්ඡේද යන ත්‍රිවිධ ධර්මකථා අතුරෙහි කායවාක් සංවරාදි කුදු මහත් සංවර පිළිබඳ කථා හෙයින් සංවරාසංවරකථා යයි ද කීහු.

ශීල සමාධි ප්‍රඥා යන ත්‍රිවිධ කල්‍යාණයෙන් යුත් තථාගත ශාසනයෙහි ආදිකල්‍යාණ වූ ප්‍රාතිමෝක්ෂ සංවරාදි අධිශීලශික්ෂාව විශේෂයෙන් සංගෘහීත වූයේ විනයපිටකයෙහි ය. ක්ලෙශප්‍රහාණ ක්‍රම වශයෙන් ව්‍යතික්‍රම පර්යුත්ථාන අනුශය වශයෙන් පවත්නා ක්ලේශයන් අතුරෙන් කායවාක් සංවර ව්‍යති-ක්‍රමයෙන් (සීමාව ඉක්මවීමෙන්) ඇති වන ක්ලේශයන්ට ශීලය ප්‍රතිපක්ෂ බැවින් ව්‍යතික්‍රම සංක්ලෙශ ප්‍රහාණය ද තදඞ්ග වශයෙන් දුශ්චරිතසංක්ලෙශ ප්‍රහාණය ද මෙහි දක්වේ.

මෙහි ඇතුළත් ශික්ෂාපදයන්ගේ ප්‍රඥප්ති, අනුප්‍රඥප්ති, ආපත්ති, අනා-පත්ති, තිකදුකාපත්ති, ආපත්ති ජාති වර්ග ස්කන්ධාදි විභාග පිළිබඳ ක්‍රම විසින් විවිධනය - විසෙසනය ඇති බැවින් විනය නම් වේ. තෙල විනය ප්‍රතිපන්නයන් කායවාක් සංයමයෙහි හික්මවා අවිප්‍රතිසාර ප්‍රාමොද්‍යාදි විනය ගුණ එළවා පිළිවෙළින් මාර්ගකුශලධර්මයන්ට උපනිඃශ්‍රය වෙමින් අනුපාදපරිනිබ්බාණය වෙත පමුණුවන හෙයින් ද විනය නම් වේ.

මෙසෙයින් සංවරවිනය වශයෙන් වදාළ විනය ශාසනමාර්ගබ්‍රහ්මචර්යයෙහි ආදිය බැවින් ද ශාසනාවචරයන්ගේ තදනුකූලප්‍රතිපත්ති පවත්නා තෙක් ම ශාසනස්ථිතිය වන බැවින් ද ධර්මවිනය වශයෙන් ද්විවිධ වූ ශාස්තෘශාසනය මතාන්තරසඞ්කලනයෙන් තොර කොට සංස්ථාපනය කරණු සඳහා ප්‍රථම සඞ්ගීතිය පැවැත්වූ මහරහතුන් වහන්සේ විසින් විනය ම ප්‍රථමයෙන් සඞ්ගායනා කොට "භාජනය, පර්යාප්තිපාළිය, ග්‍රන්ථය" යන අර්ථයන්හි ව්‍යවහෘත වූ "පිටක" ශබ්දය සමග යොදා **විනයපිටක** නාමයෙන් සම්මත කරණ ලදී.

මෙහි සඞ්ගීතිකථා, ග්‍රන්ථවිභාග, ආචාර්යමත ආදිය පිළිබඳ විස්තර **මහාවග්ගපාළිය** පිණිස ලියන ලද ප්‍රස්තාවනාවෙන් දත යුතු.

**පාරාජිකපාළිය:**

විනයෙහි එන ශික්‍ෂාපදසමූහය ප්‍රධාන වශයෙන් පාළි නම් වේ. එය මාතිකා, උභතොවිභඞ්ග, උභතොඛන්‍ධක යයි තෙවැදෑරුම් වෙයි. එහි මාතිකා නම් භික්‍ෂු භික්‍ෂුණීන් සඳහා පැණවූ ශික්‍ෂාපද සූත්‍ර පාඨයෝ ය. එය බුද්‍ධකාලයෙහි ම පාමොක් උදෙසීම් වශයෙන් සංගෘහීත ව පාතිමොක්ඛ, මාතිකා, උභය මාතිකා නමින් පැවැත්තේ ය.

ආදිබ්‍රහ්මචරියකසීලයට අයත් ඒ ශික්‍ෂාපද නිදාන වස්තු පුද්ගල පදභාජනීය වශයෙන් පාමොක් උදෙසන නියායෙන් ම භික්ඛුවිභඞ්ග භික්ඛුණීවිභඞ්ග වශයෙන් සඞ්ගීත විය. යළි එ දෙක එක් කොට **උභතොවිභඞ්ග** යයි ව්‍යවහෘත විය. පබ්බජ්ජා උපසම්පදා උපොසථ වස්සූපනායිකාදිය හා වත්පිළිවෙත් සඞ්ඝකර්‍මාදිය පිළිබඳ අනුඥාත වසයෙන් පැණවූ ආභිසමාචාරික ශික්‍ෂාපද නිදානකථාදිය සමග **ඛන්‍ධක** නාමයෙන් සඞ්ගීත විය.

ග්‍රන්‍ථවිභාගයෙහි මහණ මෙහෙණන් සඳහා පාමොක් වසයෙන් පැණවූනු සියලු ශික්‍ෂාපද **පාරාජිකපාළි, පාචිත්තියපාළි** දෙක්හි ඇතුළත් කරණ ලදී. ඛන්‍ධක පාළිය **මහාවග්ගපාළි, චුල්ලවග්ගපාළි** දෙක්හි අන්තර්ගත විය. මේ ග්‍රන්‍ථ සතරෙහි ඇතුළත් ප්‍රඥප්ත අනුඥාත ශික්‍ෂාපද හා පදභාජනීයාදිය පිළිබඳ නානා නයින් නිපුණ සාරාංශ කථනය **පරිවාරපාළියෙහි** නිර්දෙශ කරණ ලදී.

මෙසෙයින් විභක්ත ව ථෙරපරම්පරාවෙහි පැවැති විනයපාළියෙහි ප්‍රථම ග්‍රන්‍ථය වූ පාරාජිකපාළියෙහි භික්‍ෂූන් සඳහා පණවන ලද ශික්‍ෂාධර්‍ම දෙසිය සත්විස්සෙන් සතරපරිජි, තෙළෙස් සඟවෙසෙස්, දෙ අනියත, තිස් නිසැගිපචිති ය යි කාණ්ඩ සතරකට බෙදූ ශික්‍ෂාපද එකුන්පණසෙක් නිදාන පුද්ගල වස්තු පදභාජනීය විනීතවත්‍ථු සහිත ව දැක්වෙන්නේ ය. මෙයින් පාරාජික සික්ඛාපද ප්‍රධාන කොට ගෙණ ග්‍රන්‍ථය ද **පාරාජිකපාළි** යයි නම් කරණ ලදී.

එහි ශික්‍ෂාපදයෝ බුද්‍ධභාෂිත වෙති. නිදාන කථාදිය හා ගාථා **උපාලි** මහරහතුන් වහන්සේ විසින් නිර්දිෂ්ට ය. විනීතවත්‍ථු බුදුරජාණන් වහන්සේ විසින් ම ඒ ඒ ශික්‍ෂාපද පිළිබඳ ඇවැත් වන නො වන පරිදි නිශ්චය කොට වදාළ සැටි ඇතුළත් කොට සඞ්ගීතිකාරක මහරහතුන් විසින් විනයධරයන්ට ආදර්‍ශ වශයෙන් දක්වන ලද බුද්‍ධකාලීන කථාවස්තු වෙති. ග්‍රන්‍ථාරම්භයෙහි එන **වෙරඤ්ජකාණ්ඩයෙහි** දැක්වෙන්නේ අග්‍රශ්‍රාවක **ශාරීපුත්‍ර** මහරහතුන් වහන්සේ විසින් ශාසනස්ථිතිය සඳහා භික්‍ෂූන්ට පාමොක් උදෙසීම හා ශික්‍ෂා පැණවීම පිණිස බුදුරජාණන් වහන්සේට ආයාචනා කිරීමේ ප්‍රවෘත්ති ය යි. විනයෙහි බාහිරනිදානය වසයෙන් දැක්වෙන මේ ආයාචනය සියලු ම විනයප්‍රඥප්ති පිළිබඳ මුල් නිදානය යි.

**විනයශික්‍ෂා පැණවීම:**

බුදුරජාණන් වහන්සේ වේරඤ්ජාවෙහි විසූ වස බුද්‍ධත්වයෙන් දොළොස්වන වස ය. එකල භික්‍ෂුසඞ්ඝයා කෙරෙහි ශාසනානුලොම නොවූ කිසිදු පැවැතුමෙක් අර්බුදයෙක් නො වූයේ ම ය. තථාගත බුදුවරු ලෙඩක් නැති කල බෙහෙත් නොකියන වෙදුන් මෙන් කරුණක් නැති කල ශික්‍ෂා නො පණවති

එබැවින් "තථාගතයෝ ම ශික්ෂා පැණවීමට කල් දනිති. එතෙක් ඉවසවු"යි සැරියුත් තෙරණුවන්ට වදාරා ඉන් හවුරුදු අටක් ගිය තැන, බුද්ධත්වයෙන් විසිවස් වූ කල, පළමුපරිජිසිකපදය පැණවූ සේක. මෙයට වස්තු වූයේ එකල උපසම්පදාවෙන් අටවස් ඇති ශ්‍රද්ධාශීල සම්පන්න වූ සුදින්න තෙරණුවන් මවුපියන්ගේ බලවත් ආයාචනයෙන් සන්තාන (කුලවංශ) ප්‍රවෘත්තිය පිණිස බීජයක් (-පුතකු) ඇති කිරීම සඳහා පෙරඹුව සමග මෙවුන්දම් සෙවීම යි.

සම්බෝධියෙන් විසිවසක් වන තෙක් නිර්මල ව පැවැති සර්වඥශාසනයෙහි ප්‍රථම වරට සුදින්න විසින් ඇති කළ, දෙවියන් සහිත බෞද්ධලොකයාගේ සංවෙගයට හේතු වූ, මේ අර්බුදය මුල් කරුණු කොට ගෙණ තථාගතයන් වහන්සේ විසින් "යො පන භික්ඛු මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය, පාරාජිකො හොති අසංවාසො"යි මෛථුනවිරතිය සඳහා භික්ෂූන්ට මේ ශික්ෂාපදය පැණවූ සේක. මෙය විනයෙහි ප්‍රථම ගරු ශික්ෂාප්‍රඥප්ති ය යි.

"උපසපත් වීමෙන් භික්ෂුභාවයට පැමිණි යම් මහණෙක් මෙවුන්දම් සෙවුනේ නම් හෙතෙම පාරාජික (භික්ෂුභාවයෙන් සම්පූර්ණයෙන් චුත වන හෙයින් පැරදුනේ) වෙයි. සෙසු භික්ෂූන් හා සමානවාස නැත්තේ (එයට සුදුසු නොවූයේ) වේ"යයි තථාගතයන් වහන්සේ මූලප්‍රඥප්ති වශයෙන් මෙසේ පැණවූ මෛථුනපාරාජිකශික්ෂාපදය මෛථුනාසවාදයෙහි ඇලුනු අසංයමීන්ට කිසිදු අවකාශයක් නො තබා පැමිණි වස්තු අනුව අනුප්‍රඥප්ති දෙකකින් (නැවත දෙවරක් පැණවීමෙන්) දැඩි කොට වදාළහ.

මෙසෙයින් දෘඪීකෘත වූ සම්පූර්ණ ශික්ෂාපදය පිළිබඳ පදවිභාගයෙහි දැක්වෙන ක්‍රම වශයෙන් මේ ශික්ෂාපදව්‍යතික්‍රමයෙන් පරිජිඇවැත්වන ආකාරයෝ සතළොස් දහස් දෙසිය අසූවක් පමණ වෙති. එහි විස්තර අර්ථකථානුසාරයෙන් විමසා දත යුතු.

මෙවුන්දම් පරිජිය මෙන් ම මහණුහු භික්ෂුභාවයෙන් හෙළා ලන අදත්තා-දානය, මනුෂ්‍යවිග්‍රහය (මිනිස් සිරුරක් දිවියෙන් තොර කිරීම), උත්තරි-මනුස්සධම්ම (නොලත් ධ්‍යානමාර්ග ආදි ආර්යධර්ම ලත් සේ හඟවා) ආරොචනය කිරීම යන කරුණු විෂය කොට පැණවූ ශික්ෂාපද සමග "තත්‍රිමෙ චත්තාරො පාරාජිකා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති"යි පාමොක්හි එන සෙයින් ම පාරාජිකශික්ෂාපද හා සෙසු සඞ්ඝාදිසේසාදි ශික්ෂාපද ද පිළිවෙළින් තබා විභාග කරණ හෙයින් පාරාජිකපාළිය සුත්තවිභඞ්ග නමින් ද දන්නා ලදී.

**සංස්කරණය හා පරිවර්තනය :**

බුද්ධජයන්ති නිමිත්තෙන් ලඞ්කා රජය මගින් පිහිටුවන ලද ශ්‍රී ලඞ්කා බෞද්ධමණ්ඩලය විසින් විනයපිටකයෙහි ප්‍රථම ග්‍රන්ථය වූ පාරාජිකපාළිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම සඳහා අප වෙත පවරණ ලදී.

ත්‍රිපිටක පරිවර්තනය සම්බන්ධයෙන් නිකුත් කරණ ලද නිර්දේශ අනුව මෙහි චිරගත ලිපි දෝෂයන්ගෙන් දූෂිත වූ තැන් ද ගිලිහී ගිය පදපාඨයන් ද අස්ථානපතිත වාක්‍යප්‍රදේශ හා පෙය්‍යාලමුඛ ද ලක්දිව පැරැණි පුස්කොළ පොත් කිහිපයක් ද සිංහල බුරුම සියම් රෝමන් අකුරෙන් මුද්‍රිත පොත් ද සසඳා බලා එහි ද නැති තැන් සංස්කාරකතෙරහුන් සමග සාකච්ඡා කොට පාළ්‍යර්ථකථානුසාරයෙන් ගළපා පාළිය සකස් කිරීම ද එයට සිංහල ව්‍යාඛ්‍යාන කිරීම ද යථාශක්තියෙන් සිදු කළෙම්හ.

මෙහි පාලිසංස්කරණය හා සිංහල පරිවර්තනය සම්බන්ධයෙන් ත්‍රිපිටක-පරිවර්තන සංස්කාරක සභාවේ උත්තරිතරමණ්ඩලයෙන් ලත් විශෙෂ අනුග්‍රහය ද, මේ සංක්ෂෙපනය සකස් කිරීමට සංස්කාරකමණ්ඩලයේ සම්පාදක සද්ධර්මඥයන් වහන්සේගෙන් ලද උපකාරය ද කෘතඥතාපූර්වක ව සිහිපත් කරමහ.

**අතිරේකය** :

මේ ග්‍රන්ථය කියවනුවන්ට ඇතැම් ශික්ෂාපද පිළිබඳ විස්තරයෙහි අසභ්‍ය කථා සේ හැඟෙන තැන් ද දක්නට ලැබේ. එබඳු තන්හි ප්‍රතිකූලමනස්කාරය ද ශ්‍රමණසංඥා ද හිරිඔතප් ද එළවා ගෙණ සම්බුදුරජානන් වහන්සේගේ මහාකරුණා ගුණය සිහි කෙරෙමින් උන්වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ම කියවිය යුතු. තවද, "කාමරාගයෙන් රක්ත වූවෝ අර්ථය නො දනිති. ධර්මය නො දනිති. රාගයට වසඟ වූ කල වන්නේ මහඅඳුරෙක් ම ය" යන ආදි දේශනාවන් සිහිපත් කෙරෙමින් "රාගාදි ක්ලේශයෝ නම් බොහෝ ආදීනව ඇත්තෝ ය. ඔවුන්ගෙන් කලිඹට වූ කල උදාර පුරුෂයෝ ද ප්‍රකෘති සිතින් සිතිය නොහැකි තරම් වූ හීන ක්‍රියාවන්හි යෙදෙති"යි දක්වන්නාක් මෙන් මහාකාරුණික වූ ශාස්තෲන් වහන්සේ ශ්‍රාවකයන් කෙරෙහි අනුකම්පාවෙන් ම ඔවුන්ගේ සංවරය පිණිස ම එබඳු කරුණු ද නො සඟවා යථාර්ථය ම වදාළ-සේකැ යි සිතිය යුතු.

මෛථුනසේවනොපාය වශයෙන් එකල මිනිසුන් අතර පැවැති අසභ්‍ය පැවතුම් එලෙසින් හෝ එයට වැඩියෙන් හෝ අදත් ලොව ඇත. ඒ හීන වූ පැවතුම් කෙරෙහි කලකිරෙමින් සංයතභාවයෙන් හා බ්‍රහ්මචර්යයෙන් උදාරත්වයට පැමිණෙනු කැමැතියන්ට මේ විනයග්‍රන්ථය විශිෂ්ට වූ අනුශාසන-යෙක් ම ය. මෙය සාමාන්‍යයෙන් මානවධර්මය හා ශිෂ්ටාචාරය පිළිබඳ ඉතිහාස-යෙකි. බුද්ධකාලීන ඉන්දියාවේ පැවැති නානාකුලචාරිත්‍රානුගත ජනසමාජයෙහි තත්ත්වය පිළිබිඹු වූ ආදශයෙකි.

මෙසේ ගෙණ සලකත් ම මේ ග්‍රන්ථය සදාචාර සද්ධර්මමාර්ගයෙන් ලෞකික ඥානාභිවෘද්ධියට කැමැතියන්ගේ අත් පොත ද සර්වසංසාරදුඃඛනිඃසරණය සඳහා පිළිපන්නවුන්ගේ විමුක්තිමාර්ගය ද වන්නේ ය. එහෙයින් නුවණැත්තෝ මේ ග්‍රන්ථය ශාස්තෘගෞරවයෙන් හා ධර්මගෞරවයෙන් යෙදී උද්ග්‍රහණ ධාරණ විමර්ශනාදීන් පරිශීලනය කොට තදනුකූල පිළිවෙතින් මෙලොවෙහි ද ජන්මාන්තරයෙහි ද සුඛභාගී ව ක්ලේශදහනිර්වාපණයෙන් පරමශාන්තිය පසක් කෙරෙත්වා.

**වේරගොඩ අමරමොලි ස්ථවිර.**

2503 පොසොන් පුර පසළොස්වක් දින,
1959 විද්‍යොදය විශ්වවිද්‍යාලයේ දී ය

# සඞ්කෙතනිරූපණං

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| සී. 1. | —— | 'පැල්මඩුල්ල' මහාවිහාර-සීහල තාලපණ්ණ පොත්ථකං |
| සී. 2. | —— | 'කඩවැද්දුව' පුරාණවිහාර-තාලපණ්ණ පොත්ථකං |
| මඡසං. | —— | මරම්මඡට්ඨසංගීතිපිටක-පොත්ථකං |
| ස්‍යා. | —— | ස්‍යාමක්ඛර-පොත්ථකං |
| සීමු. | —— | සීහලක්ඛර-මුද්දිතපොත්ථකං |
| PTS. | —— | Pali Text Society-Parajika Pāli |

# THE PĀLI ALPHABET

## IN SINHALESE CHARACTERS.

## VOWELS

අa ආā ඉi ඊī උu ඌū එē ඔō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞṅa |
| චca | ඡcha | ජja | ඣjha | ඤña |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa |
| තta | ථtha | දda | ධdha | නna |
| පpa | ඵpha | බba | භbha | මma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංaṁ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | කාkā | කිki | කීkī | කුku | කූkū | කේkē | කෝkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛේkhē | ඛෝkhō |
| ගga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| කකkka | ඤඤñña | තවtva ත්‍රtra | මඵmpha |
| කඛkkha | ණහṇha | දදdda | මබ; ඹmba |
| කයkya | ඤචñca | ද්ධ, ධddha | මභmbha |
| ක්‍රිkri | ඡ, ඤඡñcha | ද්‍රdra | මමmma |
| කවkva | ජ, ඤජñja | ව, දවdva | මහmha |
| ඛයkhya | ඤඣñjha | ධවdhva | යය, යයyya |
| ඛවkhva | ටටṭṭa | නතnta | යහyha |
| ගගgga | ටඨ, ඨṭṭha | නථntha | ලලlla |
| ගඝggha | ඩඩḍḍa | ඳnda | ලයlya |
| ග්‍රgra, ඞකṅka | ඩඪḍḍha | නධndha | ලහlha |
| ඞඛṅkha | ණණṇṇa | නනnna, නහnha | වහwha |
| ඞගṅga | ණටṇṭa | පපppa | සසssa |
| ඞඝṅgha | ණඨṇṭha | පඵppha | සමsma |
| චචcca | ණඩ, ඬṇḍa | බබbba | සවswa |
| චඡccha | ණහṇha | බභbbha | හමhma |
| ජජjja | තතtta | බ්‍රbra | හවhva |
| ජඣjjha | තථttha | මපmpa | ළහḷha |

ා ā ි i ී ī ු u ූ ū ෙ ē ො ō

# පාරාජිකපාළි - විසයසූචි

**විසයා:**

## 1. වෙරඤ්ජකණ්ඩො


**වෙරඤ්ජභාණවාරො** ... ... ... **2 - 26**
නිදානං ... ... ... ... 2
බුද්ධගුණකථා ... ... ... 2
වෙරඤ්ජබ්‍රාහ්මණකථා ... ... ... 4
ඣානකථා ... ... ... 10
පුබ්බෙනිවාසානුස්සතිඤාණං ... ... ... 10
චුතූපපාතඤාණං ... ... ... 12
ආසවක්ඛයඤාණං ... ... ... 12
වෙරඤ්ජබ්‍රාහ්මණස්ස සරණගමනං ... ... ... 14
වෙරඤ්ජායං වස්සාවාසාධිවාසනං ... ... ... 14
වෙරඤ්ජායං දුබ්භික්ඛකථා ... ... ... 14
මහාමොග්ගල්ලානස්ස සීහනාදකථා ... ... 16
සාරිපුත්තස්ස සික්ඛාපඤ්ඤත්තියාචනං ... ... 16
වෙරඤ්ජබ්‍රාහ්මණස්ස ධම්මදෙසනා ... ... 24
භගවතො ජනපදචාරිකා ... ... 26


## 2. පාරාජිකකණ්ඩො


**පඨමපාරාජිකං** ... ... ... **28 - 94**
සුදින්නභාණවාරො ... ... ... 28 - 48
සුදින්නස්ස පබ්බජ්ජාකථා ... ... ... 28
සුදින්නස්ස සකපිතුනිවෙසනුපසඞ්කමනං ... ... 36
මාතාපිතූනං බීජයාචනං ... ... ... 38
සුදින්නස්ස පුරාණදුතියිකාය මෙථුනධම්මාභිවිඤ්ඤාපනං ... 42
සහායකභික්ඛූහි භගවතො ආරොචනං ... ... 42
භගවතා සික්ඛාපදපඤ්ඤාපනං ... ... ... 44
මූලපඤ්ඤත්ති ... ... ... ... 48

**සුදින්නභාණවාරො නිට්ඨිතො.**

මක්කටීවත්ථු - අඤ්ඤතර භික්ඛුස්ස මක්කටියා මෙථුනපටිසෙවනං 50
දුතියපඤ්ඤත්ති ... ... ... ... 54
සන්ථතභාණවාරො ... ... ... ... 54 - 80
වජ්ජිපුත්තකානං භික්ඛූනං මෙථුනපටිසෙවනං ... ... 54
තතියපඤ්ඤත්ති ... ... ... ... 56
පදභාජනීයං ... ... ... ... 56 - 80

**සන්ථතභාණවාරො නිට්ඨිතො.**

විනීතවත්ථු ... ... ... ... 80 - 94

**පඨමපාරාජිකං සමත්තං.**

**දුතියපාරාජිකං.** ... ... ... ... **94 - 150**
ධනියස්ස කුම්භකාරපුත්තස්ස කුටිකරණකථා ... ... 94
රාජභණ්ඩාවහරණකථා ... ... ... 96
සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... ... 102

ඡබ්බග්ගියභික්ඛූනං රජකභණ්ඩාවහරණකථා ... ... 102
දුතියපඤ්ඤත්ති ... ... ... ... 104
පදභාජනීයං ... ... ... ... 104
තයමාතිකා ... ... ... ... 106
විනීතවත්ථු ... ... ... ... 126 – 150

**දුතියපාරාජිකං සමත්තං.**

**තතිය පාරාජිකං ... ... ... ... 152 – 192**
භගවතො වෙසාලිභික්ඛූනං අසුභකථා ... ... 152
වෙසාලිභික්ඛූනං ජීවිතවොරොපනකථා ... ... 152
ආනාපානසතිසමාධිකථා ... ... ... 156
තතියපාරාජිකසික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... 158
දුතියපඤ්ඤත්ති ... ... ... ... 158
පදභාජනීයං ... ... ... ... 160
තයමාතිකා ... ... ... ... 164
විනීතවත්ථු ... ... ... ... 174 – 192

**තතියපාරාජිකං සමත්තං.**

**චතුත්ථපාරාජිකං ... ... ... ... 192 – 254**
වග්ගුමුදාතීරියභික්ඛූනං උත්තරිමනුස්සධම්මසමුදාචරණං ... 192
චතුත්ථපාරාජිකසික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... 198
දුතියපඤ්ඤත්ති ... ... ... ... 200
පදභාජනීයං ... ... ... ... 200
තයමාතිකා – සුද්ධිකවාරො ... ... ... 204 – 224
වත්ථුවිසාරකස්ස චක්කපෙය්‍යාලං – වත්ථුකාමවාරකථා ... 226 – 230
පච්චයපටිසංයුත්තවාරකථා ... ... ... 230 – 234
විනීතවත්ථු ... ... ... ... 236 – 254

**චතුත්ථපාරාජිකං සමත්තං.**

## 3. සඞ්ඝාදිසෙසකණ්ඩො

**1. සුක්කවිස්සට්ඨිසික්ඛාපදං ... ... ... 256 – 292**
සෙය්‍යසකවත්ථු ... ... ... ... 256
සුක්කවිස්සට්ඨිසික්ඛාපද (පඨම) පඤ්ඤත්ති ... ... 260
දුතියපඤ්ඤත්ති ... ... ... ... 260
පදභාජනීයං ... ... ... ... 260 – 282
විනීතවත්ථු ... ... ... ... 282 – 292

**සුක්කවිස්සට්ඨිසික්ඛාපදං නිට්ඨිතං.**

**2. කායසංසග්ගසික්ඛාපදං ... ... ... 292 – 318**
උදායිවත්ථු ... ... ... ... 292
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 294
පදභාජනීයං ... ... ... ... 294 – 314
විනීතවත්ථු ... ... ... ... 316 – 318

**කායසංසග්ග සික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **3. දුට්ඨුල්ලවාචාසික්ඛාපදං** ... ... ... | **320 - 328** |
| උදායිවත්ථු ... ... ... ... | 320 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... | 320 |
| පදභාජනීයං ... ... ... ... | 322 - 326 |
| විනීතවත්ථු ... ... ... ... | 326 - 328 |

**දුට්ඨුල්ලවාචාසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **4. අත්තකාමපාරිචරියාසික්ඛාපදං** ... ... | **330 - 338** |
| උදායිවත්ථු ... ... ... ... | 330 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... | 332 |
| පදභාජනීයං ... ... ... ... | 332 - 336 |
| විනීතවත්ථු ... ... ... ... | 336 - 338 |

**අත්තකාමපාරිචරියාසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **5. සඤ්චරිත්තසික්ඛාපදං** ... ... ... | **338 - 374** |
| උදායිවත්ථු ... ... ... ... | 332 |
| සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... ... | 348 |
| උදායිස්ස තඞ්ඛණිකසඤ්චරිත්තසමාපජ්ජනං ... ... | 344 |
| දුතියපඤ්ඤත්ති ... ... ... ... | 344 |
| පදභාජනීයං ... ... ... ... | 346 - 372 |
| විනීතවත්ථු ... ... ... ... | 372 - 374 |

**සඤ්චරිත්තසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **6. කුටිකාරසික්ඛාපදං** ... ... ... | **374 - 404** |
| ආළවකභික්ඛූනං කුටිකාරණවත්ථු ... ... ... | 374 |
| මණිකණ්ඨනාගරාජකථා ... ... ... | 378 |
| හිමවන්තවාසිඅඤ්ඤතරභික්ඛුස්ස කථා ... ... | 380 |
| රට්ඨපාලකථා ... ... ... ... | 382 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... | 382 |
| පදභාජනීයං ... ... ... ... | 382 - 404 |

**කුටිකාරසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **7. විහාරකාරසික්ඛාපදං** ... ... ... | **404 - 414** |
| ඡන්නස්ස වත්ථු ... ... ... ... | 404 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... | 406 |
| පදභාජනීයං ... ... ... ... | 406 - 414 |

**විහාරකාරසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **8. පඨමදුට්ඨදෝසසික්ඛාපදං** ... ... ... | **416 - 434** |
| දබ්බමල්ලපුත්තස්ස සේනාසනපඤ්ඤාපනකථා ... ... | 416 |
| මෙත්තියභුම්මජකභික්ඛූනං වත්ථු ... ... ... | 420 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... | 424 |
| පදභාජනීයං ... ... ... ... | 424 - 434 |

**පඨමදුට්ඨදෝසසික්ඛාපදං නිට්ඨිතං.**

**9. දුතියදුට්ඨදොසසික්ඛාපදං** ... ... ... **434 - 446**
මෙත්තියභුම්මජකභික්ඛූනං වත්ථු ... ... ... 434
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... 436
පදභාජනීයං ... ... ... ... 436 - 446

**දුතියදුට්ඨදොසසික්ඛාපදං නිට්ඨිතං.**

**10. පඨමසඞ්ඝභෙදසික්ඛාපදං** ... ... ... **448 - 454**
දෙවදත්තස්ස පඤ්චවත්ථුයාචනං ... ... ... 448
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 452
පදභාජනීයං ... ... ... ... 452 - 454

**පඨමසඞ්ඝාදිසෙසසික්ඛාපදං නිට්ඨිතං.**

**11. දුතියසඞ්ඝභෙදසික්ඛාපදං** ... ... ... **456 - 460**
දෙවදත්තවත්ථු ... ... ... ... 456
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 456
පදභාජනීයං ... ... ... ... 456 - 460

**දුතියසඞ්ඝභෙදසික්ඛාපදං නිට්ඨිතං.**

**12. දුබ්බචසික්ඛාපදං** ... ... ... **462 - 466**
ඡන්නස්ස අනාචාරවත්ථු ... ... ... ... 462
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 462
පදභාජනීයං .... ... ... ... 464 - 466

**දුබ්බචසික්ඛාපදං නිට්ඨිතං.**

**13. කුලදූසකසික්ඛාපදං** ... ... ... **466 - 482**
අස්සජිපුනබ්බසුකානං අනාචාරවත්ථු ... ... ... 466
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 476
පදභාජනීයං .. ... ... ... 478 - 482

**කුලදූසකසික්ඛාපදං නිට්ඨිතං.**

**තෙරසකං නිට්ඨිතං.**

**සඞ්ඝාදිසෙසකණ්ඩො නිට්ඨිතො.**

## 4. අනියතකණ්ඩො

**1. පඨමඅනියතසික්ඛාපදං** ... ... ... **484 - 490**
උදායිවත්ථු ... ... ... ... 484
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 486
පදභාජනීයං ... ... ... ... 486 - 490

**පඨමඅනියතසික්ඛාපදං නිට්ඨිතං.**

**2. දුතියඅනියතසික්ඛාපදං** ... ... ... **490 - 496**
උදායිවත්ථු ... ... ... ... 490
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 492
පදභාජනීයං ... ... ... ... 492 - 496

**දුතියඅනියතසික්ඛාපදං නිට්ඨිතං.**

# 5. නිස්සග්ගියකණ්ඩො

## 1. චීවරවග්ගො

**1. පඨමකඨිනසික්ඛාපදං ... ... ... 498 – 502**
ඡබ්බග්ගියවත්ථු ... ... ... ... 498
සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... ... 498
ආනන්දස්ස අතිරෙකචීවරවත්ථු ... ... ... 498
දුතියපඤ්ඤත්ති ... ... ... ... 500
පදභාජනීයං ... ... ... ... 500 – 502

පඨමකඨිනසික්ඛාපදං නිට්ඨිතං.

**2. දුතියකඨිනසික්ඛාපදං ... ... ... 502 – 510**
භික්ඛූනං සන්තරුත්තරෙන ජනපදචාරිකාවත්ථු ... ... 502
සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... ... 504
දුතියපඤ්ඤත්ති ... ... ... ... 504
පදභාජනීයං ... ... ... ... 504 – 510

දුතියකඨිනසික්ඛාපදං නිට්ඨිතං.

**3. තතියකඨිනසික්ඛාපදං ... ... ... 512 – 516**
අඤ්ඤතර භික්ඛුස්ස අකාල චීවරවත්ථු ... ... 512
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 512
පදභාජනීයං ... ... ... ... 512 – 516

තතියකඨිනසික්ඛාපදං නිට්ඨිතං.

**4. පුරාණචීවර සික්ඛාපදං ... ... ... 516 – 520**
උදායිස්ස පුරාණදුතියිකාවත්ථු ... ... ... 516
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 518
පදභාජනීයං ... ... ... ... 518 – 520

පුරාණචීවරසික්ඛාපදං නිට්ඨිතං.

**5. චීවරපටිග්ගහණ සික්ඛාපදං ... ... ... 522 – 526**
උදායිස්ස උප්පලවණ්ණාය භික්ඛුනියා චීවරපටිග්ගහණවත්ථු ... 522
සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... ... 524
පාරිවට්ටකචීවර අප්පටිග්ගහණවත්ථු ... ... ... 524
දුතියපඤ්ඤත්ති ... ... ... ... 524
පදභාජනීයං ... ... ... ... 524 – 526

චීවරපටිග්ගහණසික්ඛාපදං නිට්ඨිතං.

**6. අඤ්ඤාතකවිඤ්ඤත්තිසික්ඛාපදං ... ... 526 – 532**
උපනන්දවත්ථු ... ... ... ... 526
සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... ... 528
නග්ගභික්ඛූනං වත්ථු ... ... ... ... 528
දුතියපඤ්ඤත්ති ... ... ... ... 530
පදභාජනීයං ... ... ... ... 530 – 532

අඤ්ඤාතකවිඤ්ඤත්තිසික්ඛාපදං නිට්ඨිතං.

**7. තතුත්තරිසික්ඛාපදං** ... ... ... **532 – 534**
බහුචීවරවිඤ්ඤාපනවත්ථු ... ... ... 532
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 534
පදභාජනීයං ... ... ... ... 534


**තතුත්තරිසික්ඛාපදං නිට්ඨිතං.**


**8. පඨමඋපක්ඛටසික්ඛාපදං** ... ... ... **536 – 540**
උපනන්දස්ස චීවරවිකප්පනාපජ්ජනවත්ථු ... ... 536
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 536
පදභාජනීයං ... ... ... ... 538 – 540


**පඨමඋපක්ඛටසික්ඛාපදං නිට්ඨිතං.**


**9. දුතියඋපක්ඛටසික්ඛාපදං** ... ... ... **540 – 544**
උපනන්දස්ස චීවරවිකප්පනාපජ්ජනවත්ථු ... ... 540
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 542
පදභාජනීයං ... ... ... ... 542 – 544


**දුතියඋපක්ඛටසික්ඛාපදං නිට්ඨිතං.**


**10. රාජසික්ඛාපදං** ... ... ... ... **546 – 552**
උපනන්දවත්ථු ... ... ... ... 546
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 548
පදභාජනීයං ... ... ... ... 550 – 552


**රාජසික්ඛාපදං නිට්ඨිතං.**

**චීවරවග්ගො පඨමො.**

## 2. කොසියවග්ගො


**1. කොසියසික්ඛාපදං** ... ... ... **554 – 556**
ඡබ්බග්ගියවත්ථු ... ... ... ... 554
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 554
පදභාජනීයං ... ... ... ... 554 – 556


**කොසියසික්ඛාපදං නිට්ඨිතං.**


**2. සුද්ධකාළකසික්ඛාපදං** ... ... ... **556 – 558**
ඡබ්බග්ගියවත්ථු ... ... ... ... 556
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 556
පදභාජනීයං ... ... ... ... 556 – 558


**සුද්ධකාළකසික්ඛාපදං නිට්ඨිතං.**


**3. ද්වෙභාගසික්ඛාපදං** ... ... ... **558 – 560**
ඡබ්බග්ගියවත්ථු ... ... ... ... 558
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 560
පදභාජනීයං ... ... ... ... 560


**ද්වෙභාගසික්ඛාපදං නිට්ඨිතං.**

**4. ඡබ්බස්සසික්ඛාපදං** ... ... ... **562 – 566**
අනුවස්සං සන්ථතකාරාපනවත්ථු ... ... ... 562
සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... ... 562
සන්ථතසම්මුතියාචනවත්ථු ... ... ... 564
දුතියපඤ්ඤත්ති ... ... ... ... 564
පදභාජනීයං ... ... ... ... 564 – 566

**ඡබ්බස්සසික්ඛාපදං නිට්ඨිතං.**

**5. නිසීදනසන්ථතසික්ඛාපදං** ... ... ... **566 – 572**
සන්ථතඋජ්ඣිතවත්ථු ... ... ... ... 556
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 570
පදභාජනීයං ... ... ... ... 570 – 572

**නිසීදනසන්ථතසික්ඛාපදං නිට්ඨිතං.**

**6. එළකලෝමසික්ඛාපදං** ... ... ... **572 – 574**
එළකලෝමාහරණවත්ථු ... ... ... ... 572
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 572
පදභාජනීයං ... ... ... ... 574

**එළකලෝමසික්ඛාපදං නිට්ඨිතං.**

**7. එළකලෝමධෝවාපනසික්ඛාපදං** ... ... **576 – 578**
ඡබ්බග්ගියානං එළකලෝමධෝවාපනවත්ථු ... ... 576
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 576
පදභාජනීයං ... ... ... ... 576 – 578

**එළකලෝමධෝවාපනසික්ඛාපදං නිට්ඨිතං.**

**8. රූපියසික්ඛාපදං** ... ... ... ... **580 – 584**
උපනන්දස්ස රූපියපටිග්ගහණවත්ථු ... ... ... 580
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 580
පදභාජනීයං ... ... ... ... 580 – 584

**රූපියසික්ඛාපදං නිට්ඨිතං.**

**9. රූපියසංවෝහාරසික්ඛාපදං** ... ... ... **584 – 588**
ඡබ්බග්ගියානං රූපියසංවෝහාරවත්ථු ... ... ... 584
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 584
පදභාජනීයං ... ... ... ... 584 – 588

**රූපියසංවෝහාරසික්ඛාපදං නිට්ඨිතං.**

**10. කයවික්කයසික්ඛාපදං** ... ... ... **588 – 590**
උපනන්දස්ස කයවික්කයසමාපජ්ජනවත්ථු ... ... 581
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 590
පදභාජනීයං ... ... ... ... 590

**කයවික්කයසික්ඛාපදං නිට්ඨිතං.**

**කෝසියවග්ගෝ දුතියෝ.**

## 3. පත්තවග්ගො


| | |
|---|---|
| **1. පත්තසික්ඛාපදං** ... ... ... | **592 - 596** |
| ඡබ්බග්ගියානං පත්තසන්නිචයවත්ථු ... ... ... | 592 |
| සික්ඛාපද (මූල) පඤ්ඤත්ති ... ... .. | 592 |
| ආනන්දස්ස අතිරෙකපත්තවත්ථු .. ... . | 592 |
| දුතියපඤ්ඤත්ති ... ... ... .. | 594 |
| පදභාජනීයං . ... .. ... | 594 - 596 |

**පත්තසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **2. ඌනපඤ්චබන්ධනසික්ඛාපදං** ... ... ... | **596 - 604** |
| ඡබ්බග්ගියානං පත්තවිඤ්ඤපනවත්ථු .. . ... | 596 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... . . ... | 600 |
| පදභාජනීයං ... .. ... . | 600 - 604 |

**ඌනපඤ්චබන්ධනසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **3. භෙසජ්ජසික්ඛාපදං** ... ... ... | **606 - 612** |
| පිලින්දිවච්ඡවත්ථු ... ... ... ... | 606 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... | 610 |
| පදභාජනීයං .... ... ... .. | 610 - 612 |

**භෙසජ්ජසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **4. වස්සිකසාටිකසික්ඛාපදං** ... ... | **612 - 616** |
| ඡබ්බග්ගියානං වස්සිකසාටිකපරියෙසනවත්ථු .... ... | 612 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... | 614 |
| පදභාජනීයං ... ... ... | 614 - 616 |

**වස්සිකසාටිකසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **5. චීවරඅච්ඡින්දනසික්ඛාපදං** .. ... ... | **616 - 618** |
| උපනන්දස්ස චීවරඅච්ඡින්දනවත්ථු ... . ... | 616 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... . ... ... | 618 |
| පදභාජනීයං ... ... ... . | 618 |

**චීවරඅච්ඡින්දනසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **6. සුත්තවිඤ්ඤත්තිසික්ඛාපදං** . ... ... | **620 - 622** |
| ඡබ්බග්ගියානං සුත්තවිඤ්ඤපනවත්ථු ... ... ... | 620 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... . . ... ... | 620 |
| පදභාජනීයං ... ... ... ... | 620 - 622 |

**සුත්තවිඤ්ඤත්තිසික්ඛාපදං නිට්ඨිතං.**

| | |
|---|---|
| **7. මහාපෙසකාරසික්ඛාපදං** .. ... ... | **622 - 628** |
| උපනන්දස්ස පෙසකාරසුත්තවිකප්පනාපජ්ජනවත්ථු ... | 622 |
| සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... . . | 624 |
| පදභාජනීයං ... ... ... .. | 626 - 628 |

**මහාපෙසකාරසික්ඛාපදං නිට්ඨිතං.**

**8. අච්චෙකචීවරසික්ඛාපදං** ... ... **628 – 632**
අච්චෙකචීවරකාලසමයාතික්කමනවත්ථු ... .. 628
සික්ඛාපදපඤ්ඤත්ති ... ... 630
පදභාජනීයං ... ... ... 630 – 632

**අච්චෙකචීවරසික්ඛාපදං නිට්ඨිතං.**

**9. සාසඞ්කසික්ඛාපදං** ... ... ... **632 – 636**
අන්තරඝරෙ චීවරනික්ඛෙපනවත්ථු ... ... 632
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 634
පදභාජනීයං ... ... ... ... 634 – 636

**සාසඞ්කසික්ඛාපදං නිට්ඨිතං.**

**10. පරිණතසික්ඛාපදං** ... ... **636 – 640**
ඡබ්බග්ගියෙහි සඞ්ඝිකලාභං අත්තනො පරිණාමනවත්ථු ... 636
සික්ඛාපදපඤ්ඤත්ති ... ... ... ... 638
පදභාජනීයං ... ... ... 638 – 640

**පරිණතසික්ඛාපදං නිට්ඨිතං.**


**පත්තවග්ගො තතියො.**

**පාරාජිකපාළි නිට්ඨිතා.**

# විනයපිටකෙ

# පාරාජිකපාලි

# විනයපිටකෙ

# පාරාජිකපාළි

---

## භික්ඛුවිභඞ්ගො

## වෙරඤ්ජකණ්ඩො

I

### නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

---

1. **තෙන** සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති නළෙරු-පුචිමන්දමූලෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. අස්සොසි ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො: "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො වෙරඤ්ජායං විහරති නළෙරුපුචිමන්දමූලෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං. බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථා-රූපානං අරහතං දස්සනං හොතී"ති.

# විනයපිටකයෙහි

# පාරාජිකපාළිය

---

## භික්ෂුවිභඞ්ගය

## වේරඤ්ජකාණ්ඩය

## I

### ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

---

1. **එකල්හි** භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **වේරඤ්ජාව** සමීපයෙහි **නළේරු** කොසඹගස මුල පන්සියක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයා සමග වැඩ වෙසෙන සේක. **වේරඤ්ජබ්‍රාහ්මණ** තෙමේ (මෙය) ඇසී ය: “පින්වත්නි, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදි වූ ශ්‍රමණ ගෞතමයෝ පන්සියක් පමණ වූ මහසඟන සමග වේරඤ්ජානුවර නළේරු කොසඹරුක මූල වැඩ වෙසෙති. ඒ භවත් ගෞතමයන්ගේ කල්‍යාණ වූ කීර්තිරාවය මෙසේ පැන නැංගේ ය: “ඒ භාග්‍යවත් තෙමේ මේ මේ කරුණෙන් කෙලෙස්නතුරන් නැසුවෙක; සම්‍යක්සම්බුද්ධ ය; විද්‍යාචරණධර්මයන්ගෙන් යුක්ත ය; මනා ගමන් ඇත්තෙක; සව්ලෝ දත්තෙක; නිරුත්තර වූ පුරුෂදම්‍යසාරථි ය; දෙව්මිනිසුන්ගේ අනුශාසක ය; සව්තේ දත්තෙක; භගවත් ය. ඒ භාග්‍යවත් තෙමේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ අවකාශ ලෝකය හා මහණ බමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත වූ සත්ත්ව ලෝකය ද තෙමේ මනා නුවණින් දැන පසක් කොට පවසයි. හෙ තෙමේ මුල කල්‍යාණ වූ මැද කල්‍යාණ වූ අග කල්‍යාණ වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ වූ පිරිසිදු වූ දහම් දෙසයි. (මෙසේ) සපුන් බඹසර හා මගබඹසර ද පවසයි. එබඳු රහතුන් දැකීම මැනැව”යනු යි.

2. අථ ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "සුතං මෙතං භො ගොතම, න සමණො ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුද්ධෙ මහල්ලකෙ අද්ධගතෙ වයො අනුප්පත්තෙ අභිවාදෙති වා, පච්චුට්ඨෙති වා, ආසනෙන වා නිමන්තෙතීති. තයිදං භො ගොතම තථෙව. න හි භවං ගොතමො බ්‍රාහ්මණෙ ජිණ්ණෙ වුද්ධෙ මහල්ලකෙ අද්ධගතෙ වයො අනුප්පත්තෙ අභිවාදෙති වා, පච්චුට්ඨෙති වා, ආසනෙන වා නිමන්තෙති. තයිදං භො ගොතම න සම්පන්නමෙවා"ති.

3. "නාහං තං බ්‍රාහ්මණ, පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යමහං අභිවාදෙය්‍යං වා, පච්චුට්ඨෙය්‍යං වා, ආසනෙන වා නිමන්තෙය්‍යං. යං හි බ්‍රාහ්මණ තථාගතො අභිවාදෙය්‍ය වා, පච්චුට්ඨෙය්‍ය වා, ආසනෙන වා නිමන්තෙය්‍ය, මුද්ධාපි තස්ස විපතෙය්‍යා"ති

4. "අරසරූපො භවං ගොතමො"ති. "අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'අරසරූපො සමණො ගොතමො'ති. යෙ තෙ බ්‍රාහ්මණ, රූපරසා සද්දරසා ගන්ධරසා රසරසා ඵොට්ඨබ්බරසා, තෙ තථාගතස්ස පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'අරසරූපො සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

5. "නිබ්භොගො භවං ගොතමො"ති. "අත්ථි ඛ්වෙස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'නිබ්භොගො සමණො ගොතමො'ති. යෙ තෙ බ්‍රාහ්මණ, රූපභොගා සද්දභොගා ගන්ධභොගා රසභොගා ඵොට්ඨබ්බභොගා, තෙ තථාගතස්ස පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'නිබ්භොගො සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

2. ඉක්බිති වේරඤ්ජබමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු වූ සිහෙහි රැඳවිය යුතු වූ කථාව කොට නිමවා එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන්නා වූ වේරඤ්ජබමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: “භවත් ගෞතමයෙනි, මා විසින් මෙය අසන ලදී: ‘භවත් ගෞතමයෝ ජරාවට පත් වූ වෘද්ධ වූ මහලු වූ කල් ඉක්මවූ පැසුළුවියට පත් බමුණන් නො වඳිති. පෙරගමන් නො කෙරෙති. අසුනෙන් හෝ නො පවරති’යි. භවත් ගෞතමයෙනි, ඒ කාරණය එසේ මය. භවත් ගෞතම-යෝ ජරාවට පත් වූ වෘද්ධ වූ මහලු වූ කල් ඉක්මවූ පැසුළුවියට පත් බමුණන් නො වඳිති. නැගිට පෙර ගමන් නො කරති. අස්නෙන් හෝ නො පවරති. භවත් ගෞතමයෙනි, මේ කාරණය සුදුසු නො වෙයි.”

3. “බ්‍රාහමණය, මම යම් පුද්ගලයකුට වඳිම් ද, නැගිට පෙර ගමන් කෙරෙම් ද, අස්නෙන් හෝ පවරම් ද, එබඳු පුද්ගලයකු දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලෝකයෙහි ද මහණ බමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙහි ද නො ම දකිමි. බ්‍රාහමණය, යම් පුද්ගලයකුට තථාගත තෙමේ වදී නම් හෝ, නැගිට පෙර ගමන් කෙරේ නම් හෝ, අසුනෙන් පවරා නම් හෝ, ඔහුගේ හිස ද ගෙලෙන් ගිලිහෙයි.

4. “භවත් ගෞතමයෝ රසවිරොධිහු”යි. “බ්‍රාහමණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයෝ රස විරොධිහුය යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ ද, ඒ කාරණය මා කෙරෙහි විද්‍යමාන වේ ම ය. බමුණ, යම් ඒ රූපාස්වාදයෝ ශබ්දාස්වාදයෝ ගන්ධාස්වාදයෝ රසාස්වාදයෝ ස්ප්‍රෂ්ටව්‍යාස්වාදයෝ වෙද්ද, ඒ ආස්වාද (රසයෝ) තථාගතයන් විසින් ප්‍රහීණ කරණ ලදහ. සිඳිනා ලද මුල් ඇතියහ. මුදුන සුන් තල් රුකක් මෙන් කරණ ලදහ. නැවත නූපදනා සේ විනාශයට පමුණුවන ලදහ. මත්තෙහි නූපදනා සවභාවය ඇතියහ. යම් කරුණෙකින් ‘ශ්‍රමණ ගෞතමයෝ රසවිරොධිහුය’යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, බ්‍රාහමණය, මේ ඒ කාරණය යි. එහෙත් තෝ යමක් සඳහා කියයි ද, ඒ කාරණය නො වේ.”

5. “භවත් ගෞතමයෝ පරිභෝග රහිතයෝ යයි”. “බ්‍රාහමණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයෝ ‘පරිභෝග රහිතයෝ යැ’යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, ඒ කාරණය මා කෙරෙහි විද්‍යමාන වේ ම ය. බමුණ, යම් ඒ රූපපරිභොගයෝ, ශබ්දපරිභොගයෝ, ගන්ධපරිභොගයෝ, රසපරිභොගයෝ, ස්පොට්ඨබ්බපරිභොගයෝ වෙද්ද, ඔහු තථාගතයන් විසින් ප්‍රහීණ කරණ ලදහ. සිඳින ලද මුල් ඇතියහ. මුදුන සුන් තල්ගසක් මෙන් කරණ ලදහ. නැවත නූපදනා සේ විනාශයට පමුණුවන ලදහ. මත්තෙහි නූපදනා සවභාව ඇතියහ. යම් කරුණෙකින් ‘ශ්‍රමණ ගෞතමයෝ පරිභොග රහිතයෝය’යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, මේ ඒ කාරණය යි. එහෙත් තෝ යමක් සඳහා කියයි ද, ඒ කාරණය නො වේ.”

6. "අකිරියවාදො භවං ගොතමො"ති. "අත්ථි ඛ්‍යාස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'අකිරියවාදො, සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ අකිරියං වදාමි කායදුච්චරිතස්ස වචීදුච්චරිතස්ස මනොදුච්චරිතස්ස. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං අකිරියං වදාමි. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'අකිරියවාදො සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

7. "උච්ඡෙදවාදො භවං ගොතමො"ති. "අත්ථි ඛ්‍යාස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'උච්ඡෙදවාදො, සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ, උච්ඡෙදං වදාමි රාගස්ස දොසස්ස මොහස්ස. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං උච්ඡෙදං වදාමි. අයං ඛො බ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'උච්ඡෙදවාදො සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

8. "ජෙගුච්ඡී භවං ගොතමො"ති. "අත්ථි ඛ්‍යාස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'ජෙගුච්ඡී සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ, ජිගුච්ඡාමි කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා ජිගුච්ඡාමි. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'ජෙගුච්ඡී සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

9. "වෙනයිකො භවං ගොතමො"ති. "අත්ථි ඛ්‍යාස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'වෙනයිකො සමණො ගොතමො'ති. අහං හි බ්‍රාහ්මණ, විනයාය ධම්මං දෙසෙමි රාගස්ස දොසස්ස මොහස්ස. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං විනයාය ධම්මං දෙසෙමි. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'වෙනයිකො සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

6. "භවත් ගෞතමයෝ අක්‍රියවාදීහු ය'යි. "බ්‍රාහ්මණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයෝ 'අකිරියවාදීහ'යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, බ්‍රාහ්මණය, ඒ කාරණය ඇත් ම ය. බ්‍රාහ්මණය, මම කායදුශ්චරිතයාගේ වාග්දුශ්චරිතයාගේ මනොදුශ්චරිතයාගේ නොකිරීම කියමි. සෙසු ලාමක අකුශල ධර්මයන්ගේ නොකිරීම කියමි. බ්‍රාහ්මණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයෝ 'අකිරියවාදීහ'යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, බ්‍රාහ්මණය මේ ඒ කාරණයයි. එහෙත් යමක් සඳහා තෝ කියයි නම්, ඒ කාරණය නො වේ."

7. "භවත් ගෞතමයෝ උච්ඡෙදවාදීහුය'යි." "බ්‍රාහ්මණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයෝ 'උච්ඡෙදවාදීහුය' යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම් ඒ මේ කාරණය ඇත් ම ය. බ්‍රාහ්මණය, මම වනාහි රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ නැසීම කියමි. සෙසු අකුශල ධර්මයන්ගේ නැසීම කියමි. බ්‍රාහ්මණය, ශ්‍රමණ ගෞතමයෝ 'උච්ඡෙදවාදීහුය'යි මොනොවට කියන තෙනැත්තේ යම් කරුණෙකින් මට කියන්නේ නම්, බ්‍රාහ්මණය, මේ ඒ කරුණ ය. එහෙත් තෝ යමක් සඳහා කියයි නම්, ඒ කරුණ නො වේ."

8. "භවත් ගෞතමයෝ පිළිකුල් කරන්නෝය'යි. "බ්‍රාහ්මණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයෝ 'ජෙගුච්ඡී ය'යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, ඒ මේ කරුණ ඇත් ම ය. බ්‍රාහ්මණය, මම වනාහි කායදුශ්චරිතය, වාග්දුශ්චරිතය, මනොදුශ්චරිතය පිළිකුල් කරමි. සෙසු ලාමක අකුශලධර්මයන්ට පැමිණීම පිළිකුල් කරමි. බ්‍රාහ්මණය, ශ්‍රමණ ගෞතමයෝ 'ජෙගුච්ඡී ය'යි මොනොවට කියන තෙනැත්තේ යම් කරුණෙකින් මට කියන්නේ නම්, බ්‍රාහ්මණය, මේ ඒ කරුණ ය. එහෙත් තෝ යමක් සඳහා කියයි නම්, ඒ කරුණ නො වේ."

9. "භවත් ගෞතමයෝ නාශකයෝය"යි. "බ්‍රාහ්මණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතම තෙමේ 'නාශකයෝය'යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, ඒ මේ කරුණ ඇත් ම ය. බ්‍රාහ්මණය, මම් වනාහි රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ විනාශය පිණිස ධර්මය දේශනා කරමි. සෙසු ලාමක අකුශලධර්මයන්ගේ විනාශය පිණිස ධර්මය දේශනා කරමි. බ්‍රාහ්මණය, ශ්‍රමණ ගෞතමයෝ 'වෙනයිකයෝ= නාශකයෝය'යි මොනොවට කියන තෙනැත්තේ යම් කරුණෙකින් මට කියන්නේ නම්, බ්‍රාහ්මණය, මේ ඒ කරුණ ය. තෝ යමක් සඳහා කියයි නම්, ඒ කරුණ නො වේ."

10 "තපස්සී භවං ගොතමො"ති. "අත්‍ථි ඛ්‍වෙස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'තපස්සී සමණො ගොතමො'ති. තපනීයාහං බ්‍රාහ්මණ, පාපකෙ අකුසලෙ ධම්මෙ වදාමි කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. යස්ස ඛො බ්‍රාහ්මණ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීනා උච්ඡින්නමූලා තාලාවත්‍ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තමහං තපස්සීති වදාමි. තථාගතස්ස ඛො බ්‍රාහ්මණ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීනා උච්ඡින්නමූලා තාලාවත්‍ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'තපස්සී සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

11. "අපගබ්භො භවං ගොතමො"ති. "අත්‍ථි ඛ්‍වෙස බ්‍රාහ්මණ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'අපගබ්භො සමණො ගොතමො'ති. යස්ස ඛො බ්‍රාහ්මණ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීනා උච්ඡින්නමූලා තාලාවත්‍ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තමහං අපගබ්භො'ති වදාමි. තථාගතස්ස ඛො බ්‍රාහ්මණ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීනා උච්ඡින්නමූලා තාලාවත්‍ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො බ්‍රාහ්මණ පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය 'අපගබ්භො සමණො ගොතමො'ති. නො ච ඛො යං ත්වං සන්ධාය වදෙසි."

12. "සෙය්‍යථාපි බ්‍රාහ්මණ කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා, තානස්සු කුක්කුටියා සම්මා අධිසයිතානි සම්මා පරිසෙදිතානි සම්මා පරිභාවිතානි, යො නු ඛො තෙසං කුක්කුටච්ඡාපකානං පඨමතරං පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්‍ථිනා අභිනිබ්භිජ්ජෙය්‍ය කින්ති ස්වාස්ස වචනීයො ජෙට්ඨො වා කනිට්ඨො වා'ති. 'ජෙට්ඨො'ති'ස්ස භො ගොතම වචනීයො, සො හි තෙසං ජෙට්ඨො හොතී'ති. එවමෙව ඛො අහං බ්‍රාහ්මණ අවිජ්ජාගතාය පජාය අණ්ඩභූතාය පරියොනද්ධාය අවිජ්ජණ්ඩකොසං පදාලෙත්වා එකො'ව ලොකෙ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො. ස්වාහං බ්‍රාහ්මණ, ජෙට්ඨො සෙට්ඨො ලොකස්ස."

10. "භවත් ගෞතමයෝ අනුන් තවන්නෝය"යි. "බ්‍රාහමණය, යම් කරුණෙකින් ශ්‍රමණ ගෞතමයෝ 'තවන්නෝය'යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, ඒ මේ කරුණ ඇත් ම ය. "බ්‍රාහමණය, මම් වනාහි කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනොදුශ්චරිතය තැවිය යුතු කොට කියමි. බ්‍රාහමණය, යමකුගේ වනාහි තැවිය යුතු ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණ වෙද්ද, උදුරණ ලද මුල් ඇත්තෝ වෙද්ද, මුදුන සුන් තල් ගසක් මෙන් කරණ ලද්දෝ වෙද්ද, නැවත නොහටගන්නා පරිද්දෙන් කරණ ලද්දෝ වෙද්ද, මත්තෙහි නූපදනා සවභාව ඇත්තෝ වෙද්ද, මම් ඔහුට 'තපස්වී' (තවන්නා)' යි කියමි. බ්‍රාහමණය, තථාගතයන්ගේ වූ කලී තැවිය යුතු ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණයහ. උදුරණ ලද මුල් ඇතියහ. මුදුන සුන් තල්ගසක් මෙන් කරණ ලදහ. නැවත නොහටගන්නා පරිද්දෙන් කරණ ලදහ. මත්තෙහි නූපදනා සවභාව ඇතියහ. බ්‍රාහමණය, යම් කරුණෙකින් මොනොවට කියන තෙනැත්තේ 'ශ්‍රමණ ගෞතම තෙමේ තපස්සී යැ'යි මට කියන්නේ නම්, බ්‍රාහමණය, මේ ඒ කාරණය යි. එහෙත් තෝ යමක් සඳහා කියයි නම්, ඒ කරුණ නො වේ."

11. "භවත් ගෞතමයෝ අපගබ්භයෝය"යි. "බ්‍රාහමණය, යම් කරුණෙකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ අපගබ්භයෝය'යි මොනොවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, ඒ මේ කරුණ ඇත් ම ය. බ්‍රාහමණය, යමකුගේ මතු මවු ගැබ හෝනාබව, නැවත භවයෙහි ඉපදීම ප්‍රහීණ ද, උදුරණ ලද මුල් ඇත්තේ ද, සුන් මුදුන ඇති තල්ගසක් මෙන් කරණ ලද ද, නැවත නො හට ගන්නා පරිද්දෙන් කරණ ලද ද, මත්තෙහි නූපදනා සවභාවය ඇත් ද, ඔහුට මම් 'අපගබ්භ'ය යි කියමි. බ්‍රාහමණය, තථාගතයන්ගේ මතු මවුගැබ ශයනය, නැවත භවයෙහි ඉපදීම ප්‍රහීණ ය. උදුරණ ලද මුල් ඇත්තේ ය. සුන් මුදුන ඇති තල්ගසක් මෙන් කරණ ලද ය. නැවත නොහටගන්නා පරිද්දෙන් කරණ ලදය. මත්තෙහි නූපදනා සවභාවය ඇත්තේ ය. යම් කරුණෙකින් 'ශ්‍රමණ ගෞතමයෝ අපගබ්භ හ'යි මොනවට කියන තෙනැත්තේ මට කියන්නේ නම්, බ්‍රාහමණය, මේ ඒ කරුණ ය. එහෙත් තෝ යමක් සඳහා කියයි නම්, ඒ කාරණය නො වේ."

12. "බ්‍රාහමණය, යම්සේ කිකිළියගේ බිජයෝ අටෙක් හෝ දසයෙක් හෝ දොළොසෙක් හෝ වෙත් ද, උහු කිකිළිය විසින් මත්තෙහි හෙව රක්නා ලද්දාහු ද, මනා කොට උණුසුම් ගන්වන ලද්දාහු ද, මනා කොට කුකුළුගඳ ගන්වන ලද්දාහු ද, ඒ කුකුළුපැටවුන් අතුරෙන් යමෙක් සිය පාතියසිළින් හෝ මුවතුඩින් හෝ බිජුකටුව පලා ගෙණ සියල්ලන්ට පළමුවෙන් සුවයෙන් නික්මෙන්නේ ද, කිම, හේ දෙටු ය යි හෝ කනිටු ය යි හෝ කිය යුතු වන්නේ ද?". "භවත් ගෞතමයෙනි, හේ දෙටු ය යි කිය යුතු වන්නේ ය. හෙ තෙමේ ඔවුන් අතුරෙන් දෙටු වෙයි." "බ්‍රාහමණය, එපරිද්දෙන් ම මම් අවිද්‍යා නැමැති බිජුවට තුළ වූ, අවිද්‍යා නැමැති අණ්ඩකොශයෙන් හාත්පසින් බැඳුනා වූ සත්ත්වයන් අතුරෙන් අවිද්‍යා නැමැති බිජුකටුව පලාගෙණ සියලු ලෝකසන්නිවාසයෙහි අද්විතීය වූයෙම් නිරුත්තර වූ සම්‍යක්සම්බෝධිය ප්‍රතිවෙධ කෙළෙම්. බ්‍රාහමණය, ඒ මම් ලොවට දෙටු ද වෙමි. සෙට ද වෙමි.

13. ආරද්ධං ඛො පන මෙ බ්‍රාහ්මණ, විරියං[1] අහොසි අසල්ලීනං. උපට්ඨිතා සති අසම්මුට්ඨා. පස්සද්ධො කායො අසාරද්ධො. සමාහිතං චිත්තං එකග්ගං. සො ඛො අහං බ්‍රාහ්මණ, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහාසිං. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහාසිං. සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙසිං. යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහාසිං. සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහාසිං.

14. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාලීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ, 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. අයං ඛො මෙ බ්‍රාහ්මණ, රත්තියා පඨමෙ යාමෙ පඨමා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. අයං ඛො මෙ බ්‍රාහ්මණ, පඨමාභිනිබ්භිදා අහොසි කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා.

1. වීරියං, මජසං.

13. බ්‍රාහ්මණය, (බෝමැඩ හුන්) මා විසින් වඩන ලද වීර්‍ය්‍යය නො හැකුළුනේ විය. සිහිය එළඹ සිටියේ නොතටුයේ ය. (නාමරූප) කය සංහිඳුනේ දරථ රහිත විය. සිත අරමුණෙහි මොනොවට පිහිටියේ එකඟ විය. බ්‍රාහ්මණය, ඒ මම් කාමයන්ගෙන් වෙන් ව ම අකුශලධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ද ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙළෙම්. විතර්කවිචාරයන්ගේ සංහිඳීමෙන් සිය සතන්හි හටගත් ශ්‍රද්ධාවෙන් යුක්ත වූ, චිත්තයාගේ එකඟ බව ඇති, විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙළෙම්. ප්‍රීතියෙන් ද වෙන් වීමෙන් ධ්‍යානොපෙක්‍ෂාව ඇත්තෙම් වාසය කෙළෙම්. සිහි ඇත්තෙම්, සම්‍යක්ප්‍රඥාවෙන් යුක්ත වූයෙම්, කයින් සුවය වින්දෙම්. යම් ධ්‍යානයක් හේතු කොට ගෙණ, ඒ පුද්ගලයා 'උපෙක්‍ෂාවෙන් යුක්තයෙක, සිහියෙන් යුක්තයෙක, සුඛ විහරණ ඇත්තෙකැ'යි බුද්ධාදී ආර්‍ය්‍යයෝ ප්‍රකාශ කෙරෙත් නම්, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කෙළෙම්. කායිකසුඛයාගේ ද කායික දුඃඛයාගේ ද ප්‍රහාණයෙන්, පළමුවෙන් ම සොම්නස් දෙම්නස් පහ ව යාමෙන් දුක්වෙදනා නැති සුඛවෙදනා ද නැති, උපෙක්‍ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදුබව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙළෙම්.

14. ඒ මම් මෙසේ සිත චතුර්ථධ්‍යානයෙන් සමාහිත වූ කල්හි, උපෙක්‍ෂා-ස්මෘතිපරිශුද්ධියෙන් පිරිසිදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, පහ වූ රාගාදී අඞ්ගණ ඇති වූ කල්හි, පහ වූ උපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, අභිඥාකර්මයට සුදුසු ව පිරිසිදුබව්ආදියෙහි සිටි කල්හි, අචල බවට පත් කල්හි, පෙර වුසූ කඳපිළිවෙළ සිහි කිරීමේ නුවණ පිණිස සිත නැමූයෙම්. ඒ මම නන්වැදෑරුම් වූ පෙර වුසූ කඳපිළිවෙළ සිහි කරමි. ඒ මෙසේ යි: එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුණක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පණසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති ලක්‍ෂයක් ද, නොයෙක් නස්නා කල්පයන් ද, නොයෙක් වැඩෙන කල්පයන් ද, නොයෙක් නස්නා වැඩෙන කල්පයන් ද සිහි කරමි. කෙසේ ද? යත්: අසෝ තැන මෙබඳු නම් ඇත්තෙම්, මෙබඳු ගෝත්‍ර ඇත්තෙම්, මෙබඳු පැහැ ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙබඳු සුවදුක් විඳින්නෙම්, මෙබඳු ආයු කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම් එයින් චුත වූයෙම් අසෝ තැන උපනිමි. එහි ද මෙබඳු නම් ඇත්තෙම්, මෙබඳු ගෝත්‍ර ඇත්තෙම්, මෙබඳු පැහැ ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙබඳු සැප දුක් අනුභව කරන්නෙම්, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීම්. ඒ මම් එයින් චුත වූයෙම් මෙහි උපනිම් කියා යි. මෙසේ ආකාර සහිත වූ නාමගොත්‍රාදී උදෙසීම් සහිත වූ නන්වැදෑරුම් වූ පෙර වුසූ කඳ-පිළිවෙළ සිහි කරමි. බමුණ, මා විසින් රෑයෙහි පෙරයම්හි දී මේ පෙර වුසූ කඳ පිළිවෙළ සිහි කරණ නුවණ නැමැති ප්‍රථම විද්‍යාව ලබන ලදී. අවිද්‍යාව නසන ලදී. විද්‍යාව පහළ විය. මෝහ නැමැති අඳුර නැසුනේ ය. ප්‍රඥා නැමැති ආලොකය පහළ විය. ස්මෘතිඅවිප්‍රවාසයෙන් අප්‍රමත්ත වූ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත ව අභිප්‍රෙතාර්ථ සිද්ධිය කෙරෙහි යොමු කරණ ලද සිත් ඇති ව වාසය කරන්නහුට යම්සේ ද මටත් එසේ ය. බමුණ, බිජුවටින් කුකුළුපැටියාගේ නික්මීම මෙන් මාගේ මේ පළමු වන නික්මීම විය.

15. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන[1] අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි, "ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා"ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන[1] අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි. අයං ඛො මෙ බ්‍රාහ්මණ, රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. අයං ඛො මෙ බ්‍රාහ්මණ, දුතියාභිනිබ්භිදා අහොසි කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා.

16. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙසිං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛසමුදයො'ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධො'ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං අබ්භඤ්ඤාසිං. ඉමෙ ආසවා'ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවසමුදයො'ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං ආසවනිරොධො'ති යථාභූතං අබ්භඤ්ඤාසිං අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං අබ්භඤ්ඤාසිං. තස්ස මෙ එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චිත්ථ. භවාසවා'පි චිත්තං විමුච්චිත්ථ. අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං අහොසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසිං. අයං ඛො මෙ බ්‍රාහ්මණ රත්තියා පච්ඡිමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. අයං ඛො මෙ බ්‍රාහ්මණ තතියාභිනිබ්භිදා අහොසි කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩකොසම්හා'ති.

---

1. පරිසුද්ධෙන. සාළුවි.

15. ඒ මම මෙසේ සිත චතුර්ථධ්‍යානයෙන් සමාහිත වූ කල්හි, උපේක්‍ෂා සමෘති පරිශුද්ධියෙන් පිරිසිදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, පහ වූ රාගාදි අඞ්ගණ ඇති කල්හි, පහ වූ උපක්ලේශ ඇති කල්හි, මෘදුභාවයට පැමිණි කල්හි, අභිඥකර්මයට සුදුසු ව පරිශුද්ධභාවාදියෙහි පිහිටි කල්හි, අචලබවට පත් කල්හි සත්ත්වයන්ගේ චුති උපපත්ති දෙක දැනීම පිණිස සිත නැමූයෙමි. ඒ මම පිරිසිදු වූ, මිනිස් ඇස ඉක්ම පැවැත්තා වූ දිවැසින් චුත වන්නා වූ ද උපදින්නා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද ආඪ්‍ය වූ ද දිළිඳු වූ ද සත්ත්වයන් දකිමි. කර්මය පරිදි පැමිණියා වූ සත්ත්වයන් දනිමි. ඒ මෙසේ යි: "ඒකාන්තයෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූහ. වාග්දුශ්චරිතයෙන් යුක්ත වූහ. මනොදුශ්චරිතයෙන් යුක්ත වූහ. බුද්ධාදි ආර්‍ය්‍යයන්ට ගර්හා කරන්නෝ වූහ. විපරීතදෘෂ්ටි ඇත්තෝ වූහ. මිථ්‍යාදෘෂ්ටි-යෙන් ගන්නා ලද නානාවිධ කර්ම ඇත්තෝ වූහ. ඔහු කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ හෙයින් අපාය නම් වූ දුක පිහිටි තැන හෙයින් දුර්ගති නම් වූ, (නො කැමැත්තෙන් ම) පතිත වන හෙයින් විනිපාත නම් වූ නරකයට පැමිණියාහු ය. මේ භවත් සත්ත්වයෝ වනාහි කායසුචරිතයෙන් වාක්සුචරි-තයෙන් මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු ය. ආර්‍ය්‍යයන්ට ගර්හා නො කරන්නෝ වූහ. සම්‍යග්දෘෂ්ටියෙන් යුක්තයෝ ය. සම්‍යග්දෘෂ්ටියෙන් ගන්නා ලද නානාවිධ කර්ම ඇත්තෝ වූහ. ඔහු කාබුන් මරණින් මතු මනා ගති ඇති හෙයින් සුගති නම් වූ දිව්‍යලොකයට පැමිණියාහු ය''යි මෙසේ මිනිස් ඇස ඉක්ම පැවැති පිරිසිදු දිවැසින් චුත වන්නා වූ ද උපදින්නා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද ආඪ්‍ය වූ ද දිළිඳු වූ ද සත්ත්වයන් දකිමි. කර්මය වූ පරිදි පැමිණියා වූ සත්ත්වයන් දනිමි. බ්‍රාහ්මණය, මා විසින් රෑය මැදුම්යමෙහි මේ ද්විතීය විද්‍යාව වූ දිව්‍යඥානය ලබන ලදී. අවිද්‍යාව නසන ලදී. විද්‍යාව පහළ විය. මෝහ අඳුර පහ විය. ප්‍රඥ ලෝකය පහළ විය. අප්‍රමාදී වූ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත වූ නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති ව වසන්නහුට යම් සේ නම් එමෙනි. බ්‍රාහ්මණය, බිජුවටින් කුකුළු පැටියාගේ නික්මීම මෙන් මාගේ මේ ද්විතීය වූ නික්මීම විය.

16. ඒ මම මෙසේ සිත චතුර්ථධ්‍යානයෙන් සමාධිගත වූ කල්හි, පිරිසිදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, පහ වූ රාගාදි අඞ්ගණ ඇති කල්හි, පහ වූ උපක්ලේශ ඇති කල්හි, සිත වශී භාවයට පැමිණි කල්හි, අභිඥකර්මයට සුදුසු ව පරිශුද්ධභාවාදියෙහි පිහිටි කල්හි, නොසැලී සිටි කල්හි, ආස්‍රවක්‍ෂයකරඥානය පිණිස හෙවත් මගනුවණ පිණිස විදසුන් සිත නැමූයෙමි. ඒ මම මේ දුක යැ යි තත් වූ පරිද්දෙන් දනිමි. මේ දුක හටගැණීමට හේතුවැ යි තත් වූ පරිද්දෙන් දනිමි. මේ දුක්ඛනිරොධය යි තත් වූ පරිදි දනිමි. මේ දුක්ඛනිරොධයට = නිවණට යන පිළිවෙත ය යි තත් වූ පරිදි දනිමි. මොහු ආස්‍රවයෝ යි තතු සේ දනිමි. මේ ආස්‍රවයන්ගේ හට ගැණීමට හේතුව ය යි තතු සේ දනිමි. මේ ආස්‍රවනිරොධය යි තතු සේ දනිමි. මේ ආස්‍රවනිරොධ-ගාමිනී ප්‍රතිපත්ති ය යි තතු සේ දනිමි. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඒ මාගේ සිත කාමාස්‍රවයෙන් ද මිදුනේ ය. භවාස්‍රවයෙන් ද මිදුනේ ය. අවිද්‍යාස්‍රවයෙන් ද මිදුනේ ය. සිත මිදුනු කල්හි මිදිනැ යි නුවණ පහළ විය. ඉපදීම ක්‍ෂීණ විය. මග බඹසර වැස නිමවන ලදී. සිවු මග කටයුතු කරණ ලද්දේ ය. මේ බව (කෙලෙසුන් නැසීම) පිණිස අන්‍ය වූවක් නැතැ යි දනිමි. බ්‍රාහ්මණය, රෑ පැසුළුයාමෙහි මේ තෘතීයවිද්‍යාව (ආස්‍රවක්‍ෂයකරඥානය) අවබෝධ කරණ ලද්දේ ය. අවිද්‍යාව නසන ලදි. ආර්‍ය්‍යමාර්‍ගඥානවිද්‍යාව උපන. මොහාන්ධකාරය නැසින. ප්‍රඥලෝකය පහළ විය. අප්‍රමත්ත වූ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත වූ නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇති ව වසන්නහුට යම් සේ ද, එසේ ය. බ්‍රාහ්මණය, බිජුවටින් කුකුළු පැටියාගේ නික්මීම මෙන් මාගේ මේ තුන්වන නික්මීම විය,

17. එවං වුත්තෙ වෙරඤ්ජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: “ජෙට්ඨො භවං ගොතමො. සෙට්ඨො භවං ගොතමො. අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අධිවාසෙතු ච මෙ භවං ගොතමො වෙරඤ්ජායං වස්සාවාසං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා”ති.

18. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

19. තෙන ඛො පන සමයෙන වෙරඤ්ජා දුබ්භික්ඛා හොති ද්වීහිතිකා සෙතට්ඨිකා සලාකාවුත්තා. න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. තෙන ඛො පන සමයෙන උත්තරාපථකා අස්සවාණිජා පඤ්චමත්තෙහි අස්සසතෙහි වෙරඤ්ජං වස්සාවාසං උපගතා හොන්ති. තෙහි අස්සමණ්ඩලිකාසු භික්ඛූනං පත්ථපත්ථපුලකං පඤ්ඤත්තං හොති. භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙරඤ්ජං පිණ්ඩාය පවිසිත්වා පිණ්ඩං අලභමානා අස්සමණ්ඩලිකාසු පිණ්ඩාය චරිත්වා පත්ථපත්ථපුලකං ආරාමං හරිත්වා උදුක්ඛලෙ කොට්ටෙත්වා කොට්ටෙත්වා පරිභුඤ්ජන්ති. ආයස්මා පනානන්දො පත්ථපුලකං සිලායං පිංසිත්වා භගවතො උපනාමෙති. තං භගවා පරිභුඤ්ජති.

20. අස්සොසි ඛො භගවා උදුක්ඛලසද්දං.–ජානන්තාපි තථාගතා පුච්ඡන්ති, ජානන්තාපි න පුච්ඡන්ති. කාලං විදිත්වා පුච්ඡන්ති, කාලං විදිත්වා න පුච්ඡන්ති. අත්ථසංහිතං තථාගතා පුච්ඡන්ති, නො අනත්ථසංහිතං. අනත්ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං. ද්වීහාකාරෙහි බුද්ධා භගවන්තො භික්ඛූ පටිපුච්ඡන්ති: ‘ධම්මං වා දෙසෙස්සාම. සාවකානං වා සික්ඛාපදං පඤ්ඤපෙස්සාමා’ති.–

අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “කිං නු ඛො සො ආනන්ද උදුක්ඛලසද්දො”ති අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. “සාධු සාධු ආනන්ද, තුම්හෙහි ආනන්ද, සප්පුරිසෙහි විජිතං. පච්ඡිමා ජනතා සාලිමංසොදනං අතිමඤ්ඤිස්සතීති.

17. මෙසේ වදාළ කල්හි ඒ වේරඤ්ජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කෙළේ ය: "භවත් ගෞතමයෝ ජ්‍යෙෂ්ඨයහ. ශ්‍රේෂ්ඨයහ. භවත් ගෞතමයෙනි, ඉතා මැනැවි. භවත් ගෞතමයෙනි, ඉතා මැනැවි. භවත් ගෞතමයෙනි, යම්සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් විවෘත කරන්නේ ද, මං මුළා වූවකුට මග කියන්නේ ද, ඇස් ඇත්තෝ රූ දකිත්වා යි අඳුරෙහි තෙල්පහනක් දල්වන්නේ ද, මෙ පරිද්දෙන් ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් දහම් දෙසන ලදී. මම් භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂු සඞ්ඝයා ද සරණ යමි. භවත් ගෞතමයෝ අද පටන් දිවිහිමියෙන් සරණ ගියා වූ උවසුවකු කොට මා සලකත්වා. භවත් ගෞතමයෝ භික්ෂුසඞ්ඝයා සමග මට අනුග්‍රහය පිණිස වෙරඤ්ජා නුවර වස් විසීම ද ඉවසත්වා" යි.

18. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවසූසේක. ඉක්බිති වේරඤ්ජ බමුණු තෙමේ බුදුරජානන් වහන්සේගේ ඒ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය.

19. එකල්හි වේරඤ්ජා නුවර දුක සේ ලැබිය යුතු භික්ෂාව ඇත්තේය. ජීවිතයත් මරණයත් අතර පැවැති දෙ-අදහස් ඇත්තේ ය. තැන තැන විසුළ මිනීඇටවලින් යුක්ත ය. (නොහොත් 'සෙතට්ඨිකා' නම් සස්‍යරොගයෙන් යුක්ත ය.) කුසපත් බෙදූ කරණ දිවිපැවැත්ම ඇත්තේ ය. (නොහොත් කූරු පමණක් ව හටගත් සස්‍ය ඇත්තේ ය.) පිඬු සිඟීමෙන් යැපෙන්නට පහසු නොවන තැනෙක් විය. එකල්හි උත්තරාපථයෙන් පැමිණි අස්වෙළෙන්දෙ පන්සියයක් පමණ වූ අසුන් සමග වස් සාරමස විසීමට වෙරඤ්ජාවට පැමිණියාහු වෙත්. ඔවුන් විසින් අශ්මඬුලුවල දී භික්ෂූන්ට යවහාල් පත පත පිහිටුවන ලද්දේ වෙයි. භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ වේරඤ්ජාවට පිඬු පිණිස පිවිස පිඬු නො ලබන්නාහු අස්මඬුලුවල පිඬු සිඟා ඇවිද යවහාල් පත පත අරමට ගෙණවුත් වනෙහි ලා කොටා වළඳත්. ආයුෂ්මත් වූ ආනන්ද ස්ථවිර තෙමේ යවහාල්පතක් ගලෙහි ලා අඹරා (මී සකුරු යොදා) භාග්‍යවතුන් වහන්සේට පිළිගන්වයි. භාග්‍යවතුන් වහන්සේ එය වළඳනසේක.

20. භාග්‍යවතුන් වහන්සේ වනෙහි මොහොල් ගැටෙන හඬ ඇසූසේක. -තථාගතවරයෝ කරුණ දන්නාහු ද විචාරත්. දන්නාහු ද නො විචාරත්. කල් දැන විචාරත්. කල් දැන නො විචාරත්. තථාගතවරයෝ වැඩ සහිත වූවක් ම විචාරත්. අවැඩ සහිතයක් නො විචාරත්. අනර්ථ සහිත වචන විෂයයෙහි තථාගතවරයන්ගේ සේතුඝාතය (එබඳු වචන කීමෙහි සිත මාර්ගයෙන් නැසුනේ ම) වෙයි. භාග්‍යවත් බුදුවරු "දහම් හෝ දෙසන්නෙමු. සව්වන්ට සිකපද හෝ පණවන්නෙමු" යි දෙ කරුණෙකින් භික්ෂූන් පිළිවිසිත්.-

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමැතූ සේක: "ආනන්දය, ඒ වනෙහි මොහොල් ගැටෙන හඬ කිමෙක් ද?". ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙමේ භාග්‍යවතුන් වහන්සේට එපවත් සැළ කෙළේ ය. "ආනන්ද ය, මැනැවි, මැනැවි. සත්පුරුෂ වූ තොප විසින් දුර්භික්ෂය ද ලොභය ද දිනන ලදී. පශ්චිමජනතාව මස් හා හැල්සාල්බතට පවා අවමන් කරායි" වදාළ සේක.

21. අථ ඛො ආයස්මා **මහාමොග්ගල්ලානො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භගවන්තං එතදවොච: "එතරහි භන්තෙ වෙරඤ්ජා දුබ්භික්ඛා ද්වීහිතිකා සෙතට්ඨිකා සලාකාවුත්තා. න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. ඉමිස්සා භන්තෙ මහාපඨවියා හෙට්ඨිමං තලං සම්පන්නං. සෙය්‍යථාපි ඛුද්දමධුං අනීලකං එවමස්සාදං. සාධාහං භන්තෙ පඨවිං පරිවත්තෙය්‍යං, භික්ඛූ පප්පටකොජං පරිභුඤ්ජිස්සන්ති"ති.

"යෙ පන තෙ මොග්ගල්ලාන, පඨවිනිස්සිතා පාණා තෙ කථං කරිස්සසී?"ති.

"එකාහං භන්තෙ පාණිං අභිනිම්මිනිස්සාමි සෙය්‍යථාපි මහාපඨවී. යෙ පඨවිනිස්සිතා පාණා තෙ තත්ථ සඞ්කාමෙස්සාමි. එකෙන හත්ථෙන පඨවිං පරිවත්තෙස්සාමී"ති.

"අලං මොග්ගල්ලාන, මා තෙ රුච්චි පඨවිං පරිවත්තෙතුං. විපල්ලාසම්පි සත්තා පටිලභෙය්‍යු"න්ති.

"සාධු භන්තෙ සබ්බො භික්ඛුසඞ්ඝො උත්තරකුරුං පිණ්ඩාය ගච්ඡෙය්‍යා"ති.

"අලං මොග්ගල්ලාන, මා තෙ රුච්චි සබ්බස්ස භික්ඛුසඞ්ඝස්ස උත්තරකුරුං පිණ්ඩාය ගමන"න්ති.

22. අථ ඛො ආයස්මතො **සාරිපුත්තස්ස** රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "කතමෙසානං ඛො බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසි? කතමෙසානං බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසී?"ති.

23. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතද-වොච: "ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "කතමෙසානං ඛො බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසි? කතමෙසානං බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසී?"ති.

24. "කතමෙසානං නු ඛො භන්තෙ බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසි? කතමෙසානං බුද්ධානං භගවන්තානං බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසී?"ති

"භගවතො ච සාරිපුත්ත **විපස්සිස්ස** භගවතො ච **සිඛිස්ස** භගවතො ච **වෙස්සභුස්ස** බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසි. භගවතො ච සාරිපුත්ත **කකුසන්ධස්ස** භගවතො ච **කොනාගමනස්ස** භගවතො ච **කස්සපස්ස** බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසී"ති.

21. ඉක්බිති ආයුෂ්මත් වූ **මහමුගලන්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ පසෙක හුන්හ. පසෙක හුන් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ: “වහන්ස, දැන් වේරඤ්ජා නුවර **දුක** සේ ලැබිය යුතු වූ භික්ෂාව ඇත්තේ ය. ජීවිතය පිළිබඳ ව දෙඅතෙකින් පැවැති සැක ඇත්තේ ය. තැන තැන විසුළ මිනීඇට ඇත්තේ ය. (නොහොත් වැළඳුනු සෙතට්ඨිකා නම් සස්‍යරෝගය ඇත්තේය.) ලහ බෙදීමෙන් දිවි පවත්වන්නක් වෙයි. පිඩු සිඟීමෙන් ජීවත් වන්නට පහසු නොවන්නක් වෙයි. වහන්ස, මේ පොළොවේ යට පෙදෙස මිහිරිරසයෙන් සමෘද්ධ වෙයි. පිළවුන් නැති මීවදයක් යම් සේ ද, එමෙන් රසවත් වෙයි. වහන්ස, භික්ෂූහු පෘථිවීරසය වළඳත්වා' යි මම් පොළොව පෙරළන්නෙම් නම් මැනැවි” යනු යි.

“**මුගලන**, යම් ඒ පොළොව ඇසුරු කළ ප්‍රාණීහු වෙද්ද, ඔවුනට කුමක් කරන්නෙහි ද”

“වහන්ස, මම් පොළොව පමණ මහත් වූ එක් අත්ලක් මවන්නෙමි. පොළොව ඇසුරු කළ ඒ ප්‍රාණීන් එයට මාරු කරන්නෙමි. අතින් අතින් පොළොව පෙරළන්නෙමි.”

“මුගලන, නුසුදුසු ය. පොළොව පෙරළීම තොපට රුචි නො වේවා. සත්ත්වයෝ චිත්තවිපර්‍යාසයට පවා පැමිණෙන්නාහු ය.”

“වහන්ස, සියලු භික්ෂුසඞ්ඝ තෙමේ **උතුරුකුරු** දිවයිනට පිඩු පිණිස යන්නේ නම් මැනැවි.”

“මුගලන, නුසුදුසු ය. උතුරුකුරුදිවයිනට සියලු භික්ෂුසඞ්ඝයාගේ යෑම තොපට රුචි නො වේවා.”

22. ඉක්බිති රහෝගත වූ, චිත්තවිවේකයෙන් යුත් වූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ වූ චිත්තපරිවිතර්කයෙක් පහළ විය. “කවර භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී නො වී ද? කවර භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී වී ද?”

23. ඉක්බිති ආයුෂ්මත් වූ ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ පස්වරුයෙහි පලසමවතින් නැඟී සිටියේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ එකත්පස් ව හුන්නේය. එකත් පසෙක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: “වහන්ස, මෙහි රහසිගත වූ චිත්තවිවේකයෙන් යුත් වූ මගේ සිතට මෙබඳු විතර්කයෙක් පහළ විය. “කවර භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී නො වී ද? කවර භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී වී ද?” යනු යි.

24. “වහන්ස, මෙහි කවර භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී නො වී ද? කවර භාග්‍යවත් බුදුවරුන්ගේ ශාසනය චිරස්ථායී වී ද?”.

“ශාරිපුත්‍රයිනි, **විපස්සී** භාග්‍යවතුන් වහන්සේගේද **සිඛී** භාග්‍යවතුන් වහන්සේගේ ද **වෙස්සභූ** භාග්‍යවතුන් වහන්සේගේ ද ශාසනය බොහෝ කල් පැවැතුනෙක් නො වී ය. ශාරිපුත්‍රයිනි, **කකුසඳ** භාග්‍යවතුන් වහන්සේගේ ද **කෝනාගමන** භාග්‍යවතුන් වහන්සේගේ ද **කාශ්‍යප** භාග්‍යවතුන් වහන්සේගේ ද, ශාසනය වූ කලී බොහෝ කල් පැවැතුනෙක් වී” යැ යි වදාළ සේක.

25. "කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙන භගවතො ච විපස්සිස්ස භගවතො ච සිඛිස්ස භගවතො ච වෙස්සභුස්ස බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසී?"ති.

26. "භගවා ච සාරිපුත්ත විපස්සී භගවා ච සිඛී භගවා ච වෙස්සභූ කිලාසුනො අහෙසුං සාවකානං විත්ථාරෙන ධම්මං දෙසෙතුං. අප්පකං ච තෙසං අහොසි සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. අපඤ්ඤත්තං සාවකානං සික්ඛාපදං. අනුද්දිට්ඨං පාතිමොක්ඛං.

27. තෙසං බුද්ධානං භගවන්තානං අන්තරධානෙන බුද්ධානුබුද්ධානං සාවකානං අන්තරධානෙන යෙ තෙ පච්ඡිමා සාවකා නානානාමා නානාගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා, තෙ තං බ්‍රහ්මචරියං ඛිප්පඤ්ඤෙව අන්තරධාපෙසුං. සෙය්‍යථාපි සාරිපුත්ත නානාපුප්ඵානි ඵලකෙ නික්ඛිත්තානි සුත්තෙන අසඞ්ගහිතානි, තානි වාතො විකිරති විධමති විද්ධංසෙති. තං කිස්ස හෙතු? යථා තං සුත්තෙන අසඞ්ගහිතත්තා. එවමෙව ඛො සාරිපුත්ත තෙසං බුද්ධානං භගවන්තානං අන්තරධානෙන බුද්ධානුබුද්ධානං සාවකානං අන්තරධානෙන යෙ තෙ පච්ඡිමා සාවකා නානානාමා නානාගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා, තෙ තං බ්‍රහ්මචරියං ඛිප්පඤ්ඤෙව අන්තරධාපෙසුං.

28. කිලාසුනො[1] ච තෙ භගවන්තො අහෙසුං සාවකෙ චෙතසා චෙතො පරිච්ච ඔවදිතුං. භූතපුබ්බං සාරිපුත්ත වෙස්සභූ භගවා අරහං සම්මාසම්බුද්ධො අඤ්ඤතරස්මිං භිංසනකෙ වනසණ්ඩෙ සහස්සං භික්ඛුසඞ්ඝං චෙතසා චෙතො පරිච්ච ඔවදති අනුසාසති: "එවං විතක්කෙථ. මා එවං විතක්කයිත්ථ. එවං මනසි කරොථ. මා එවං මනසාකත්ථ. ඉදං පජහථ. ඉදං උපසම්පජ්ජ විහරථා"ති. අථ ඛො සාරිපුත්ත තස්ස භික්ඛුසහස්සස්ස වෙස්සභුනා භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන එවං ඔවදියමානානං එවං අනුසාසියමානානං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු. - තත්‍ර සුදං සාරිපුත්ත භිංසනකස්ස වනසණ්ඩස්ස භිංසනකතස්මිං හොති: යො කොචි අවීතරාගො තං වනසණ්ඩං පවිසති, යෙභුය්‍යෙන ලොමානි හංසන්ති.-

29. අයං ඛො සාරිපුත්ත හෙතු අයං පච්චයො, යෙන භගවතො ච විපස්සිස්ස භගවතො ච සිඛිස්ස භගවතො ච වෙස්සභුස්ස බ්‍රහ්මචරියං න චිරට්ඨිතිකං අහොසී"ති.

1. කිලාසුනො, ස්‍යා.

25. "වහන්ස, යම් හේතුවෙකින් **විපස්සී** භාග්‍යවතුන් වහන්සේගේ ද **සිඛී** භාග්‍යවතුන් වහන්සේගේ ද **වෙස්සභූ** භාග්‍යවතුන් වහන්සේගේ ද ශාසනය බොහෝ කල් පැවතුනෙක් නො වී නම්, එයට හේතු කවරේ ද? එයට ප්‍රත්‍යය කවරේ ද?"

26. "ශාරිපුත්‍රයෙනි, **විපස්සී** භාග්‍යවතුන් වහන්සේ ද **සිඛී** භාග්‍යවතුන් වහන්සේ ද **වෙස්සභූ** භාග්‍යවතුන් වහන්සේ ද ශ්‍රාවකයන්ට විස්තරවශයෙන් ධර්මය දෙශනා කරන්නට උත්සාහ රහිත වූහ. ඒ බුදුවරුන්ගේ සුත්ත ය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදාන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අබ්භුතධම්ම ය, වෙදල්ල ය යන නවාංග ශාස්තෘශාසනය ස්වල්ප ද විය. ශ්‍රාවකයන්ට ශික්ෂාපද ද නො පණවන ලදී. ආණාපාතිමොක්ඛය නො උදෙසන ලදී.

27. ඒ භාග්‍යවත් වූ බුදුවරුන්ගේ පරිනිර්වාණයෙන් ඒ බුදුවරුන්ගේ සම්බුද්ධශ්‍රාවකයන්ගේ ද පරිනිර්වාණයෙන් නානානාම ඇති, නානාගොත්‍ර ඇති, නානාජාතියෙන් නානාකුලයෙන් පැවිදි වූ යම් පශ්චිමශ්‍රාවක කෙනෙක් වූවාහු ද, ඔහු ඒ ශාසනය වහා ම අතුරුදන් කළාහු ය. ශාරිපුත්‍රයෙනි, යම්සේ තත් වැදෑරුම් පුෂ්පජාතීහු මලස්නේ හැන්පත් කරණ ලද්දාහු හුයෙන් නොගොතන ලද්දාහු ද, යම්සේ ඒ මල් වාතය හෙමේ විසුරුවා ද, අන් තැනකට යවා ද, තුබූ තැනින් පහ කෙරේ ද, ඒ කවර හෙයින් ද? යත්: සුදුසු පරිදි ඒ මල් හුයිත් නොගෙතුනු හෙයිනි. මෙ පරිද්දෙන් ම, ශාරිපුත්‍රයෙනි, ඒ භාග්‍යවත් බුදුවරුන්ගේ පිරිනිවන් පෑමෙන් ඒ බුදුවරුන්ගේ සම්බුද්ධශ්‍රාවකයන්ගේ පිරිනිවන් පෑමෙන් ඒ ශ්‍රාවකයන්ගේ අතැවැසි වූ නානානාමගෝත්‍ර ඇති, නානාජාතියෙන් නානාකුලයෙන් නික්ම පැවිදි වූ යම් පශ්චිමශ්‍රාවක කෙනෙක් වූවාහු නම්, ඔහු ඒ ශාසනය වහා ම අතුරුදන් කළහ.

28. වැලි දු ඒ භාග්‍යවත් බුදුවරු තමන්ගේ සිතින් ශ්‍රාවකයන් සිත පිරිසිඳ දැන ශ්‍රාවකයන්ට අවවාද කරන්නට උත්සාහ සහිත වූහ. ශාරිපුත්‍රයෙනි, පෙර වූවක් කියමි: අතීත් සම්‍යක්සම්බුද්ධ වූ **වෙස්සභූ** භාග්‍යවතුන් වහන්සේ බිහිසුණු වූ එක්තරා වනලැහැබක දී තමන්ගේ සිතින් ඒ මහණුන්ගේ සිත පිරිසිඳ දැන දහසක් මහණුන්ට 'මෙසේ (නෙක්ඛම්මාදි) විතර්ක කරවු. (කාමාදි) විතර්ක නො කරවු. මෙසේ අනිත්‍යාදිවශයෙන් මෙනෙහි කරවු. නිත්‍යාදිවශයෙන් මෙනෙහි නො කරවු. අකුසල් වූ මෙය දුරු කරවු. කුසල් වූ මෙයට පැමිණ වාසය කරවු'යි අවවාද කරණ සේක, අනුශාසනා කරණ සේක. ඉක්බිති ශාරිපුත්‍රයෙනි, අතීත් සම්‍යක්සම්බුද්ධ වූ වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ අවවාද කරණු ලබන්නා වූ මෙසේ අනුශාසනා කරණු ලබන්නා වූ ඒ දහසක් මහණුන්ගේ සිත් උපාදාන රහිත ව කාමාදි ආස්‍රවයන්ගෙන් මිදුනේය. - ශාරිපුත්‍රයෙනි, ඒ බිහිසුණු වනලැහැබෙහි මේ බිහිසුණු බව වෙයි: අවීතරාග වූ යමෙක් ඒ වන ලැහැබට පිවිසේද, බෙහෙවින් ඔහුගේ ලොමුදහ ගණී.-

29. යමක් හේතු කොට ගෙණ විපස්සී භාග්‍යවතුන් වහන්සේගේ ද සිඛී භාග්‍යවතුන් වහන්සේගේ ද වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේගේ ද ශාසනය බොහෝ කල් පවත්නේ නො වී ද, ශාරිපුත්‍රයිනි, මේ එයට හෙතුව යි. මේ එයට ප්‍රත්‍යය යි."

30. "කො පන හෙතු කො පච්චයො යෙන භගවතො ච **කකුසන්ධස්ස** භගවතො ච **කොනාගමනස්ස** භගවතො ච **කස්සපස්ස** බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසී?"ති.

31. "භගවා ච සාරිපුත්ත **කකුසන්ධො** භගවා ච **කොනාගමනො** භගවා ච **කස්සපො** අකිලාසුනො අහෙසුං සාවකානං විත්ථාරෙන ධම්මං දෙසෙතුං. බහුං ච තෙසං අහොසි සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. පඤ්ඤත්තං සාවකානං සික්ඛාපදං. උද්දිට්ඨං පාතිමොක්ඛං.

32. තෙසං බුද්ධානං භගවන්තානං අන්තරධානෙන, බුද්ධානුබුද්ධානං සාවකානං අන්තරධානෙන, යෙ තෙ පච්ඡිමා සාවකා නානානාමා නානාගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා, තෙ තං බ්‍රහ්මචරියං චිරං දීඝමද්ධානං ඨපෙසුං. සෙය්‍යථාපි සාරිපුත්ත නානාපුප්ඵානි ඵලකෙ නික්ඛිත්තානි සුත්තෙන සුසංගහිතානි, තානි වාතො න විකිරති න විධමති න විද්ධංසෙති. තං කිස්ස හෙතු? යථා තං සුත්තෙන සුසඞ්ගහිතත්තා. එවමෙව ඛො සාරිපුත්ත, තෙසං බුද්ධානං භගවන්තානං අන්තරධානෙන බුද්ධානුබුද්ධානං සාවකානං අන්තරධානෙන යෙ තෙ පච්ඡිමා සාවකා නානානාමා නානාගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා, තෙ තං බ්‍රහ්මචරියං චිරං දීඝමද්ධානං ඨපෙසුං.

33. අයං ඛො සාරිපුත්ත හෙතු අයං පච්චයො යෙන භගවතො ච කකුසන්ධස්ස භගවතො ච කොනාගමනස්ස භගවතො ච **කස්සපස්ස** බ්‍රහ්මචරියං චිරට්ඨිතිකං අහොසී"ති.

30. "වහන්ස, යමක් කරණ කොට ගෙණ කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේත් කෝණාගමන භාග්‍යවතුන් වහන්සේගේත් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේත් ශාසනය බොහෝ කල් පවත්නක් වී නම්, එයට හේතුව කිම? ප්‍රත්‍යය කිම?"

31. "ශාරීපුත්‍රයෙනි, කකුසඳ භාග්‍යවතුන් වහන්සේ ද කොනාගමන භාග්‍යවතුන් වහන්සේ ද කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ද ශ්‍රාවකයන්ට විස්තර වශයෙන් දහම් දෙසන්නට උත්සාහවත් වූහ. ඒ බුදුවරුන්ගේ සූත්‍ර-දේශනා ද, ගාථා සහිත සූත්‍ර දේශනා ද, අභිධර්මපිටකය හා අන්‍ය අඞ්ග අටට අයත් නුවූ බුද්ධවචන ද, ගාථා දේශනා ද, සොම්නස්මුවා නුවණින් වදාළ දේශනා ද, 'භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක'යි දැක්වූ සූත්‍රාන්ත ද, ජාතකදේශනා ද, ආශ්චර්‍ය්‍යාද්භූතධර්මප්‍රතිසංයුක්ත සූත්‍රාන්ත ද, ප්‍රීතිය හා ඥානය ඇසුරු කළ සූත්‍රාන්ත ද යන නවාංග ශාස්තෘශාසනය බොහෝ විය. ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවන ලදී. පාමොක් උදෙසන ලදී.

32. ඒ භාග්‍යවත් බුදුවරුන්ගේ පරිනිර්වාණයෙන්, ඒ බුදුවරුන්ගේ සම්මුඛශ්‍රාවකයන්ගේ පරිනිර්වාණයෙන්, ඒ සම්බුද්ධසම්මුඛ ශ්‍රාවකවරයන්ගේ අන්තැවැසි වූ, නන් වැදෑරුම් නම් ගොත් ඇති, නන් වැදෑරුම් ජාතියෙන් නන් කුලයෙන් නික්ම පැවිදි වූ යම් ඒ පශ්චිම ශ්‍රාවක කෙනෙක් වූවාහු නම්. ඔහු ඒ ශාසනය ඉතා දීර්ඝ කාලයක් තැබූහ. ශාරීපුත්‍රයෙනි, යම්සේ නන්වැදෑරුම් පුෂ්පයෝ මලස්නේ තැත්පත් කරණ ලද්දාහු හුයෙන් මනා ව බඳනා ලද්දාහු ද, වාතය තෙමේ ඔවුන් නො විසුරුවා ද, අන් තැන-කට නො යවා ද, තුබූ තැනින් පහ නො කෙරේ ද, ඒ කවර හෙයින් ද? යත්: සුදුසු පරිදි ඒ මල් හුයින් ගෙතුනු හෙයිනි. මෙ පරිද්දෙන් ම ශාරීපුත්‍රයෙනි, ඒ භාග්‍යවත් බුදුවරුන්ගේ පිරිනිවීමෙන්, ඒ බුදුවරුන්ගේ සම්මුඛශ්‍රාවකයන්ගේ පිරිනිවීමෙන්, ඒ සම්මුඛශ්‍රාවකයන්ගේ අන්තැවැසි වූ, නානා නම් ගොත් ඇති, නානාජාතියෙන් නානාකුලයෙන් නික්ම පැවිදි වූ යම් ඒ පශ්චිම ශ්‍රාවක කෙනෙක් වූවාහු ද, ඔහු ඒ ශාසනය බොහෝ දිගු කලක් තැබූහ.

33 ශාරීපුත්‍රයෙනි, යම් කරුණෙකින් කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේත් කොනාගමන භාග්‍යවතුන් වහන්සේගේත් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේත් ශාසනය දිගු කල් පවත්නේ වී ද, මේ එයට හේතුව ය, මේ එයට ප්‍රත්‍යය ය" යි වදාළ සේක.

34. අථ ඛො ආයස්මා **සාරිපුත්තො** උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: "එතස්ස භගවා කාලො, එතස්ස සුගත කාලො, යං භගවා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙය්‍ය, උද්දිසෙය්‍ය පාතිමොක්ඛං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතික"න්ති.

35. "ආගමෙහි ත්වං සාරිපුත්ත. ආගමෙහි ත්වං සාරිපුත්ත. තථාගතො'ව තත්ථ කාලං ජානිස්සති. න තාව සාරිපුත්ත සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙති, න උද්දිසති පාතිමොක්ඛං, යාව න ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති. යතො ච ඛො සාරිපුත්ත ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙති, උද්දිසති පාතිමොක්ඛං තෙසඤ්ඤෙව ආසවට්ඨානීයානං ධම්මානං පටිඝාතාය.

36. න තාව සාරිපුත්ත, ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, යාව න සඞ්ඝො රත්තඤ්ඤුමහත්තං පත්තො හොති. යතො ච ඛො සාරිපුත්ත, සඞ්ඝො රත්තඤ්ඤුමහත්තං පත්තො හොති, අථ ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති. අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙති, උද්දිසති පාතිමොක්ඛං තෙසඤ්ඤෙව ආසවට්ඨානීයානං ධම්මානං පටිඝාතාය.

37. න තාව සාරිපුත්ත, ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, යාව න සඞ්ඝො වෙපුල්ලමහත්තං පත්තො හොති. යතො ච ඛො සාරිපුත්ත සඞ්ඝො වෙපුල්ලමහත්තං පත්තො හොති, අථ ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති. අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙති, උද්දිසති පාතිමොක්ඛං තෙසඤ්ඤෙව ආසවට්ඨානීයානං ධම්මානං පටිඝාතාය.

38. න තාව සාරිපුත්ත, ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, යාව න සඞ්ඝො ලාභග්ගමහත්තං පත්තො හොති. යතො ච ඛො සාරිපුත්ත සඞ්ඝො ලාභග්ගමහත්තං පත්තො හොති, අථ ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙති, උද්දිසති පාතිමොක්ඛං තෙසඤ්ඤෙව ආසවට්ඨානීයානං ධම්මානං පටිඝාතාය.

39. න තාව සාරිපුත්ත, ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති, යාව න සඞ්ඝො බාහුසච්චමහත්තං පත්තො හොති. යතො ච ඛො සාරිපුත්ත සඞ්ඝො බාහුසච්චමහත්තං පත්තො හොති, අථ ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති. අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙති, උද්දිසති පාතිමොක්ඛං තෙසඤ්ඤෙව ආසවට්ඨානීයානං ධම්මානං පටිඝාතාය."

40. නිරබ්බුදො හි සාරිපුත්ත, භික්ඛුසඞ්ඝො නිරාදීනවො අපගතකාළකො සුද්ධො සාරෙ පතිට්ඨිතො. ඉමෙසං හි සාරිපුත්ත පඤ්චන්නං භික්ඛුසතානං යො පච්ඡිමකො භික්ඛු, සො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති.

34. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පොරෝණය එකස් කොට පෙරෙව භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "භාග්‍යවතුන් වහන්ස, යම් හෙයෙකින් මේ ශාසනය දිගුකල් පවත්තක්, බොහෝ කල් පවත්තක් වන්නේ ද, එසේ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවන සේක්වා. පාමොක් උදෙසන සේක්වා. භාග්‍යවතුන් වහන්ස, මෙය එයට කල් වෙයි. සුගතයන් වහන්ස, මෙය එයට කල් වෙයි."

35. "ශාරීපුත්‍රයෙනි, බලාපොරොත්තු වවු. ශාරීපුත්‍රයෙනි, බලාපො-රොත්තු වවු. තථාගත තෙමේ ම එයට කල් දන්නේ ය. ශාරීපුත්‍රයෙනි, යම් තාක් මේ ශාසනයෙහි ආස්‍රවයන් ඉපද සිටීමට ආධාර වූ ඇතැම් ධර්මයෝ සඞ්ඝයා කෙරෙහි නො පහළ වෙද්ද, ඒ තාක් ශාස්තෘ තෙමේ ශ්‍රාවකයන්ට සිකපද නො පණවයි, පාමොක් නො උදෙසයි. ශාරීපුත්‍රයෙනි, යම් කලෙක වනාහි මේ ශාසනයෙහි ඇතැම් ආස්‍රවස්ථානීයධර්මයෝ සඞ්ඝයා කෙරෙහි පහළ වෙද්ද, එකල්හි ශාස්තෘ තෙමේ එම ආස්‍රවස්ථානීය ධර්මයන් නැසීම පිණිස ශ්‍රාවකයන්ට සිකපද පණවයි, පාමොක් උදෙසයි.

36. ශාරීපුත්‍රයෙනි, සඞ්ඝ තෙමේ යම් තාක් චිරරාත්‍රඥයන්ගෙන් මහත් බවට නො පැමිණියේ වේ ද, ඒ තාක් මේ ශාසනයෙහි ඇතැම් ආස්‍රවස්ථානීය-ධර්මයෝ නො පහළ වෙත්. ශාරීපුත්‍රයෙනි, යම් කලෙක සඞ්ඝ තෙමේ චිරරාත්‍රඥ-යන්ගෙන් මහත්ත්වයට පැමිණියේ වේ ද, මේ ශාසනයෙහි ඇතැම් ආස්‍රවස්ථා-නීයධර්මයෝ සඞ්ඝයා කෙරෙහි පහළ වෙත් ද, එකල්හි ශාස්තෘ තෙමේ ඒ ආස්‍රවස්ථානීයධර්මයන් නැසීම පිණිස ශ්‍රාවකයන්ට සිකපද පණවයි, පාමොක් උදෙසයි.

37. ශාරීපුත්‍රයෙනි, සඞ්ඝ තෙමේ යම් තාක් ස්ථවිර මධ්‍යම නවක වශයෙන් විපුලත්වයට මහත්ත්වයට නො පැමිණියේ වේ ද, ඒ තාක් මේ ශාසනයෙහි සඞ්ඝයා කෙරෙහි ඇතැම් ආස්‍රවස්ථානීයධර්මයෝ නො පහළ වෙත්. ශාරීපුත්‍රයෙනි, යම් කලෙක සඞ්ඝ තෙමේ විපුලත්වයට මහත්ත්වයට පැමිණියේ වේ ද, එකල්හි මේ ශාසනයෙහි සඞ්ඝයා කෙරෙහි ඇතැම් ආස්‍රවස්ථානීයධර්මයෝ පහළ වෙත්. එකල්හි ශාස්තෘ තෙමේ එ ම ආස්‍රවස්ථානීය ධර්ම නැසීම පිණිස ශ්‍රාවකයන්ට සිකපද පණවයි, පාමොක් උදෙසයි.

38. ශාරීපුත්‍රයෙනි, යම් තාක් සඞ්ඝ තෙමේ ලාභයෙන් මහත් බවට නො පැමිණියේ වේ ද, ඒ තාක් මේ ශාසනයෙහි සඞ්ඝයා කෙරෙහි ඇතැම් ආස්‍රවස්ථානීයධර්මයෝ නො පහළ වෙත්. ශාරීපුත්‍රයෙනි, යම් කලෙක සඞ්ඝ තෙමේ ලාභයෙන් මහත්බවට පැමිණියේ වේ ද, එකල්හි මේ ශාසනයෙහි සඞ්ඝයා කෙරෙහි ඇතැම් ආස්‍රවස්ථානීයධර්මයෝ පහළ වෙත්. ඉක්බිති ශාස්තෘ තෙමේ එ ම ආස්‍රවස්ථානීය ධර්ම නැසීම පිණිස ශ්‍රාවකයන්ට සිකපද පණවයි, පාමොක් උදෙසයි.

39. ශාරීපුත්‍රයෙනි, යම් තාක් සඞ්ඝ තෙමේ බහුශ්‍රැතියෙන් මහත් බවට නො පැමිණියේ වේ ද, ඒ තාක් මේ ශාසනයෙහි සඞ්ඝයා කෙරෙහි ඇතැම් ආස්‍රවස්ථානීයධර්මයෝ නො පහළ වෙත්. ශාරීපුත්‍රයෙනි, යම් කලෙක සඞ්ඝ තෙමේ බොහෝ උගත්බවට පැමිණියේ වේ ද, එකල්හි මේ ශාසනයෙහි සඞ්ඝයා කෙරෙහි ඇතැම් ආස්‍රවස්ථානීයධර්මයෝ පහළ වෙත්. ඉක්බිති ශාස්තෘ තෙමේ එ ම ආස්‍රවස්ථානීයධර්ම නැසීම පිණිස ශ්‍රාවකයන්ට සිකපද පණවයි, පාමොක් උදෙසයි.

40. ශාරීපුත්‍රයෙනි, භික්ෂුසඞ්ඝ තෙමේ නිරර්බුද ය, නිදොස් ය, දුසිල් මහණුන් ගෙන් තොර ය, පිරිසුදු ය, සිල් ආදි සරුදහම්හි පිහිටියේ ය. ශාරීපුත්‍රයෙනි, මේ පන්සියක් මහණුන් අතුරෙන් යම් පැසුළු මහණෙක් වේ ද, හෙතෙමේ සෝවන් ය, අපායෙහි නො හෙනසුලු ය, නිවණට නියත ය, සම්බෝධිය ම පිහිට කොට ඇත්තේ ය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක

41. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "ආචිණ්ණං ඛො පනෙතං ආනන්ද තථාගතානං යෙහි නිමන්තිතා වස්සං වසන්ති, න තෙ අනපලොකෙත්වා ජනපදචාරිකං පක්කමන්ති. ආයාමානන්ද වෙරඤ්ජං බ්‍රාහ්මණං අපලොකෙස්සාමා"ති. "එවං භන්තෙ"ති ඛො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි.

42. අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරමාදාය ආයස්මතා ආනන්දෙන පච්ඡාසමණෙන යෙන වෙරඤ්ජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

43. අථ ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො වෙරඤ්ජං බ්‍රාහ්මණං භගවා එතදවොච: "නිමන්තිතම්හ තයා බ්‍රාහ්මණ වස්සං වුට්ඨා. අපලොකෙම තං. ඉච්ඡාම මයං ජනපදචාරිකං පක්කමිතු"න්ති.

44. "සච්චං භො ගොතම, නිමන්තිතත්ථ මයා වස්සං වුට්ඨා. අපි ච යො දෙය්‍යධම්මො සො න දින්නො. තඤ්ච ඛො නො අසන්තං නො'පි අදාතුකම්‍යතා. තං කුතෙත්ථ ලබ්භා? බහුකිච්චා ඝරාවාසා බහුකරණීයා. අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

45. අථ ඛො භගවා වෙරඤ්ජං බ්‍රාහ්මණං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

46. අථ ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: "කාලො භො ගොතම, නිට්ඨිතං භත්ත"න්ති.

41. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳතෙරුන් අමතා "ආනන්දය, බුදුවරු යම් කෙනෙකුන් විසින් නිමනත ලද්දාහු වස් වෙසෙද්ද, ඔවුන් නො විචාරා දනවු සැරිසැරීමට නො නික්මෙත් යන මෙය තථාගතයන්ගේ පුරුදු ධර්මතාවකි. ආනන්දය යමු. වෙරඤ්ජ බ්‍රාහ්මණයාට දැනුම් දෙමු"යි වදාළ සේක. ආයුෂ්මත් ආනන්ද තෙමේ, "වහන්ස, එසේ ය" යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුනි.

42. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරෙව පාසිවුරු ගෙණ ආයුෂ්මත් අනඳ තෙරහු පසුව ලා යන මහණකු කොට වෙරඤ්ජ බමුණාගේ නිවෙසට එළැඹි සේක. එළඹ පැණවූ අසුන්හි වැඩ හුන් සේක.

43. එකල්හි වෙරඤ්ජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළඹ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත් පසෙක හුන් වෙරඤ්ජ බමුණාට භාග්‍යවතුන් වහන්සේ "බමුණානෙනි, අපි තොප විසින් නිමතන ලද්දමෝ වස් වුසුවූ. තොපට දන්වමූ. දනවු සැරිසරන්නට අපි කැමැත්තෙමූ" යි වදාළ සේක.

44. "භවත් ගෞතමයන් වහන්ස, සැබැව. මා විසින් නිමනත ලද්දහු වස් වුසුහු ය. එහෙත් යම් දෙයධර්මයෙක් වී නම්, එය නො දෙන ලද්දේ ය. හෙ ද වනාහි නැති ව නො වෙයි. නො දෙනු කැමැත්තෙක් ද නො වීය. ගෘහවාසයෝ බොහෝ කෘත්‍ය ඇත්තෝ ය. බොහෝ කටයුතු ඇත්තෝ ය. එහෙයින් එයට අවකාශයෙක් කොයින් ලැබේ ද? භවත් ගෞතමයන් වහන්ස, භික්ෂු-සඞ්ඝයා සමග සෙට දවසට මාගේ දානය ඉවසන සේක්වා"යි හේ කී ය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දභාවයෙන් එය ඉවසූ සේක.

45. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වෙරඤ්ජ බ්‍රාහ්මණයාට දැහැමි කථාවෙන් කරුණු දක්වා, ඔහු කුසල් දහම්හි සමාදන් කරවා, තියුණු කරවා, සතුටු කොට හුනස්නෙන් නැඟී වැඩි සේක.

46. ඉක්බිති වෙරඤ්ජ බ්‍රාහ්මණ තෙමේ එ රැය ඇවෑමෙන් සිය නිවෙසෙහි ප්‍රණීත වූ ඛාද්‍ය භෝජ්‍ය පිළියෙල කරවා "භවත් ගෞතමයන් වහන්ස, කල් වෙයි. බත නිමියේ ය" යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වා යැවී ය.

47. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන **වෙරඤ්ජස්ස** බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං තිචීවරෙන අච්ඡාදෙසි. එකමෙකං ච භික්ඛුං එකමෙකෙන දුස්සයුගෙන අච්ඡාදෙසි. අථ ඛො භගවා වෙරඤ්ජං බ්‍රාහ්මණං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

48. අථ ඛො භගවා වෙරඤ්ජායං යථාභිරන්තං[1] විහරිත්වා අනුපගම්ම **සොරෙය්‍යං සඞ්කස්සං කණ්ණකුජ්ජං**, යෙන **පයාගපතිට්ඨානං**, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පයාගපතිට්ඨානෙ ගඞ්ගං නදිං උත්තරිත්වා යෙන **බාරාණසී** තදවසරි. අථ ඛො භගවා බාරාණසියං යථාභිරන්තං විහරිත්වා යෙන **වෙසාලී**, තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන **වෙසාලී** තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති **මහාවනෙ කූටාගාරසාලායං.**

**වෙරඤ්ජභාණවාරො නිට්ඨිතො.**[2]

---

1. යථාභිරන්තං කත්ථචි, 2 වෙරඤ්ජභාණවාරං, සීමු.

47. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, පෙරවරුයෙහි හැද පෙරෙව පාසිවුරු ගෙණ වේරඤ්ජ බ්‍රාහමණයාගේ නිවෙසට එළඹ පැණවූ අසුන්හි භික්ෂුසඞ්ඝයා සමග වැඩහුන් සේක. ඉක්බිති වේරඤ්ජබ්‍රාහමණ තෙමේ ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍යයෙන් බුදුපාමොක් මහසඟන සියතින් වළඳවා පවරවා, වළඳා නිමවූ, පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති භාග්‍යවතුන් වහන්සේ තුන්සිවුරෙන් පිදී ය. එක් එක් භික්ෂුනමක් එක් එක් වස්ත්‍රයුග්මයෙන් පිදී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජ බමුණාට දැහැමි කථාවෙන් කරුණු දක්වා, ඔහු කුසල් දහම්හි සමාදන් කරවා, තියුණු කරවා, පහන් කොට හුනස්නෙන් නැගී වැඩි සේක.

48. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජාවෙහි රිසි තාක් වැස සෝරෙය්‍ය, සඞ්කස්ස, කාන්‍යකුබ්ජ යන නගරයන්ට නො පැමිණ ප්‍රයාග-ප්‍රතිෂ්ඨානයට එළඹි සේක. එළඹ ප්‍රයාගප්‍රතිෂ්ඨානයෙහි දී ගඞ්ගා නදිය තරණය කොට බරණැසට වැඩිසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බරණැස රිසි තාක් වැස විසල්පුර බලා සැරි සරා වැඩිසේක. පිළිවෙළින් සැරි සරණ සේක්, විසල්පුර යම් තැනෙක ද එහි වැඩි සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ විසල්පුර මහාවනයෙහි කූටාගාරශාලාවෙහි වැඩ වෙසෙන සේක.

## වේරඤ්ජ බණවර නිමියේ ය.

# පාරාජිකකණ්ඩො

## 2

[තත්‍රිමෙ චත්තාරො පාරාජිකා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති*]

# පඨමපාරාජිකං

---

1. තෙන ඛො පන සමයෙන **වෙසාලියා** අවිදූරෙ **කලන්දගාමො** නාම හොති. තත්‍ථ **සුදින්නො** නාම **කලන්දපුත්තො** සෙට්ඨිපුත්තො හොති. අථ ඛො සුදින්නො කලන්දපුත්තො සම්බහුලෙහි සහායකෙහි සද්ධිං වෙසාලිං අගමාසි කෙනචිදෙව කරණීයෙන. තෙන ඛො පන සමයෙන භගවා මහතියා පරිසාය පරිවුතො ධම්මං දෙසෙන්තො නිසින්නො හොති.

2. අද්දසා ඛො සුදින්නො කලන්දපුත්තො භගවන්තං මහතියා පරිසාය පරිවුතං ධම්මං දෙසෙන්තං නිසින්නං. දිස්වානස්ස එතදහොසි: "යන්නූනාහම්පි ධම්මං සුණෙය්‍ය"න්ති. අථ ඛො සුදින්නො කලන්දපුත්තො යෙන සා පරිසා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස එතදහොසි: "යථා යථා ඛො අහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්‍ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

3. අථ ඛො සා පරිසා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

4. අථ ඛො සුදින්නො කලන්දපුත්තො අචිරවුට්ඨිතාය පරිසාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුදින්නො කලන්දපුත්තො භගවන්තං එතදවොච: "යථා යථා ඛො අහං භන්තෙ භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. ඉච්ඡාමහං භන්තෙ කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්‍ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. පබ්බාජෙතු මං භගවා"ති.

"අනුඤ්ඤාතො'සි පන ත්වං සුදින්න මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා?"ති.

"න ඛො අහං භන්තෙ අනුඤ්ඤාතො මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති

"න ඛො සුදින්න තථාගතා අනනුඤ්ඤාතං මාතාපිතූහි පුත්තං පබ්බාජෙන්තී"ති.

"සො'හං භන්තෙ තථා කරිස්සාමි, යථා මං මාතාපිතරො අනුජානිස්සන්ති, අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති.

---

* පාඨොයං පොත්ථකෙසු න දිස්සති.

## පාරාජිකකාණ්ඩය

## 2

[එහි (විනයෙහි) මේ පාරාජිකා ධර්මයෝ සිවු දෙන උදෙසීමට පැමිණෙත්.]

# ප්‍රථමපාරාජිකය

---

1. එසමයෙහි **විසල්පුර** අසල **කලන්දගාම** නම් ගමෙක් වෙයි. එහි **කලන්ද** සිටුහුගේ පුත් වූ **සුදින්න** නම් සිටුපුතෙක් වෙයි. ඉක්බිති කලන්ද-සිටුපුත් වූ සුදින්න තෙමේ බොහෝ යහළුවන් සමග කිසි යම් කටයුත්තෙකින් විසල්පුරයට පැමිණියේ ය. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහත් පිරිසක් විසින් පිරිවැරුණ සේක් දහම් දෙසමින් වැඩහුන් සේක.

2. කලන්ද සිටුපුත් තෙමේ මහපිරිසෙන් පිරිවරණ ලදු ව දහම් දෙසමින් වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ දිටී. දැක ඔහුට "ඉදින් මම ද බණ අසන්නෙම් නම් යෙහෙකැ"යි මෙබඳු සිතෙක් විය. ඉක්බිති සුදින්න සිටුපුත් තෙමේ ඒ පිරිස වෙත පැමිණ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් සුදින්න හට මෙබඳු සිතෙක් විය: "භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය යම් යම් සේ මම දනිම් ද, ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තින් පිරිපුන් එකාන්තින් පිරිසිදු ඒ සඞ්ඛලිඛිත බ්‍රහ්මචර්‍ය්‍යය හැසිරෙන්නට සුකර නො වේ. ඉදින් මම කෙස්රැවුලු බහවා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම සසුන් වදින්නෙම් නම් මැනැව" යනු යි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද, කුසල් දහම්හි යොදවන ලද, තියුණු කරණ ලද, පහන් කරණ ලද ඒ පිරිස හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියහ.

4. ඉක්බිති සුදින්න නම් වූ කලන්දපුත් තෙමේ ඒ පිරිස නැගිට ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් සුදින්න කලන්දපුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද ධර්මය මම යම්සේ දනිම් ද. ගිහිගෙහි වසන්නහු විසින් එකාන්තින් පිරිපුන් එකාන්තින් පිරිසිදු ඒ සඞ්ඛලිඛිත බ්‍රහ්මචර්‍ය්‍යය හැසිරෙන්නට සුකර නො වේ. වහන්ස, මම් කෙස්රැවුලු බහවා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම සසුන් වදින්නට කැමැත්තෙමි. භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරණ සේක්වා" යනු යි.

"සුදින්නය, ගිහිගෙන් නික්ම සසුන් වැදීම පිණිස මව්පියන් විසින් තෝ අනුදන්නා ලද්දෙහි ද?"

"වහන්ස, ගිහිගෙන් නික්ම සසුන් වැදීම පිණිස මව්පියන් විසින් මම නො අනුදන්නා ලද්දෙම් වෙමි"

"සුදින්නය, තථාගතවරයෝ මව්පියන් විසින් නොඅනුදත් කුලදරුවා පැවිදි නො කෙරෙත්"

"වහන්ස, ගිහිගෙන් නික්ම සසුන් වදින්නට මව්පියෝ මට යම්සේ අනුදන්නාහු ද, මම් එසේ කරන්නෙමි."

5. අථ ඛො සුදින්නො කලන්දපුත්තො වෙසාලියං තං කරණීයං තීරෙත්වා යෙන කලන්දගාමො, යෙන මාතාපිතරො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මාතාපිතරො එතදවොච: "අම්ම, තාත, යථා යථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. ඉච්ඡාමහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. අනුජානාථ මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. එවං වුත්තෙ සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො සුදින්නං කලන්දපුත්තං එතදවොචුං: "ත්වං ඛො'සි තාත සුදින්න, අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො[1]. න ත්වං තාත සුදින්න, කිඤ්චි දුක්ඛස්ස ජානාසි. මරණෙන'පි මයං තෙ අකාමකා විනා භවිස්සාම. කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති.

6. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො සුදින්නො කලන්දපුත්තො මාතාපිතරො එතදවොච: "අම්ම, තාත, යථා යථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. ඉච්ඡාමහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං. අනුජානාථ මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. තතියම්පි ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො සුදින්නං කලන්දපුත්තං එතදවොචුං: "ත්වං ඛො'සි තාත සුදින්න අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො[1]. න ත්වං තාත සුදින්න, කිඤ්චි දුක්ඛස්ස ජානාසි. මරණෙන'පි මයං තෙ අකාමකා විනා භවිස්සාම. කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා?"ති.

7. අථ ඛො සුදින්නො කලන්දපුත්තො "න මං මාතාපිතරො අනුජානන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති තත්ථෙව අනන්තරහිතාය[2] භූමියා නිපජ්ජි "ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා"ති. අථ ඛො සුදින්නො කලන්දපුත්තො එකම්පි භත්තං න භුඤ්ජි. ද්වෙ'පි භත්තානි න භුඤ්ජි. තීණි'පි භත්තානි න භුඤ්ජි. චත්තාරි'පි භත්තානි න භුඤ්ජි. පඤ්ච'පි භත්තානි න භුඤ්ජි. ඡ'පි භත්තානි න භුඤ්ජි. සත්ත'පි භත්තානි න භුඤ්ජි.

1. පරිභතො, සඤ්චි 2 අනන්තරිතාය?

5. ඉක්බිති කලන්ද සිටු පුත් වූ සුදින්න තෙමේ විසල්පුරයෙහි ඒ කටයුතු දැය අවසන් කොට කලන්දගම මව්පියන් වෙත ගියේ ය. ගොස් මව්පියන්ට "මෑණියෙනි, පියාණෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය මම යම් යම් ලෙසෙකින් දනිම් ද, ගිහිගෙයි වසන්නහු විසින් එකැතින් පිරිපුන් එකැතින් පිරිසිදු ඒ සඞ්ඛලිඛිත බඹසර හැසිරෙන්නට සුකර නො වේ. මම් කෙස්රැවුල් බහවා කසාවත් හැද ගිහිගෙන් නික්ම සසුන් වදින්නට කැමැත්තෙමි. ගිහිගෙන් නික්ම සසුන් වදින්නට මට අවසර දෙන්නැ"යි මෙය කී ය. මෙසේ කී කල්හි සුදින්න කලන්ද පුතුගේ මව්පියෝ සුදින්න කලන්ද පුත්හට "දරුව, සුදින්නය, තෝ අපගේ ප්‍රිය වූ මනාප වූ සුව සේ වැඩුනු, සුව සේ පෝෂණය කරණ ලද, එක ම පුත්‍ර වෙහි. දරුව, සුදින්නය, තෝ කිසි දුකක් නො දන්නෙහි ය. අපි තාගේ මරණයෙනුදු නොකැමැත්තමෝ ම වෙත් වන්නමූ. කිම, අපි ජීවත් වන්නා වූ තට ගිහිගෙන් නික්ම සසුන් වදින්නට අනුදනිමූ දැ?" යි මෙය කීහ.

6. දෙවෙනු ද ... තෙවෙනු ද ... කලන්ද පුත් වූ සුදින්න තෙමේ මව්පියන්ට "මෑණියෙනි, පියාණෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය මම යම් සේ දනිම් ද, ගිහිගෙහි වසන්නහු විසින් එකැතින් පිරිපුන් එකැති න් පිරිසිදු ඒ සඞ්ඛලිඛිත බඹසර හැසිරෙන්නට සුකර නො වේ. මම කෙස්රැවුල් බහවා කසාවත් හැද ගිහිගෙන් නික්ම සසුන් වදින්නට කැමැත්තෙමි. ගිහිගෙන් නික්ම සසුන් වැදීම පිණිස මට අවසර දෙන්නැ"යි. මෙය කී ය. තෙවෙනු ද කලන්ද පුත් සුදින්නගේ මව්පියෝ කලන්ද පුත් සුදින්නහට "දරුව, සුදින්නය, තෝ වනාහි අපගේ ප්‍රිය වූ, මන වඩන, සුව සේ වැඩුනු, සුවසේ පෝෂිත වූ, එක ම පුත්‍ර වෙහි. දරු, සුදින්න, තෝ කිසි දුකක් නො දන්නෙහි. තාගේ මරණයෙනුදු අපි නො කැමැත්තමෝ ම වෙත් වන්නමූ. කිම, අපි ජීවත් වන්නා වූ තට ගිහිගෙන් නික්ම සසුන් වදින්නට අනුදනිමූ දැ?"යි මෙය කීහ.

7. ඉක්බිති කලන්ද පුත් සුදින්න තෙමේ "ගිහිගෙන් නික්ම සසුන් වදින්නට මව්පියෝ මට නො ම අනු දනිත්. මෙහි ම මගේ මරණය හෝ පැවිද්ද හෝ වන්නේ ය"යි එහි ම කිසිවක් නො අතුළ බිමෙහි හොත්තේ ය. ඉක්බිති කලන්දපුත් සුදින්න තෙමේ එක් බතක් ද නො වැළඳී ය. බත් දෙකක් ද නො වැළඳී ය. බත් තුණක් ද නො වැළඳී ය. බත් සතරක් ද නො වැළඳී ය. බත් පසක්ද නො වැළඳී ය. බත් සයක් ද නො වැළඳී ය. බත් සතක් ද නො වැළඳී ය. (සත් දිනක් ම නො වැළඳී ය යනු භාවයි )

8. අථ ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො සුදින්නං කලන්දපුත්තං එතදවොචුං: "ත්වං ඛො'සි තාත සුදින්න, අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො, න ත්වං තාත සුදින්න, කිඤ්චි දුක්ඛස්ස ජානාසි, මරණෙන'පි මයං තෙ අකාමකා විනා භවිස්සාම. කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. උට්ඨෙහි තාත සුදින්න, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච. භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමෙ පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මයං අනුජානාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. එවං වුත්තෙ සුදින්නො කලන්දපුත්තො තුණ්හී අහොසි දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො සුදින්නං කලන්දපුත්තං එතදවොචුං: "ත්වං ඛො'සි තාත සුදින්න, අම්හාකං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො. න ත්වං තාත සුදින්න, කිඤ්චි දුක්ඛස්ස ජානාසි. මරණෙන'පි මයං තෙ අකාමකා විනා භවිස්සාම. කිං පන මයං තං ජීවන්තං අනුජානිස්සාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. උට්ඨෙහි තාත සුදින්න, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච. භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමෙ පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මයං අනුජානාම අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. තතියම්පි ඛො සුදින්නො කලන්දපුත්තො තුණ්හී අහොසි.

9. අථ ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස සහායකා යෙන සුදින්නො කලන්දපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නං කලන්දපුත්තං එතදවොචුං: "ත්වං ඛො'සි සම්ම සුදින්න මාතාපිතූනං එකපුත්තකො පියො මනාපො සුඛෙධිතො සුඛපරිහතො. න ත්වං සම්ම සුදින්න, කිඤ්චි දුක්ඛස්ස ජානාසි. මරණෙන'පි තෙ මාතාපිතරො අකාමකා විනා භවිස්සන්ති. කිං පන තං ජීවන්තං අනුජානිස්සන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. උට්ඨෙහි සම්ම සුදින්න, භුඤ්ජ ච පිව ච පරිචාරෙහි ච. භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමෙ පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු. න තං මාතාපිතරො අනුජානිස්සන්ති අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. එවං වුත්තෙ සුදින්නො කලන්දපුත්තො තුණ්හී අහොසි. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස සහායකා සුදින්නං කලන්දපුත්තං එතදවොචුං: "ත්වං ඛො'සි සම්ම සුදින්න -පෙ- තතියම්පි ඛො සුදින්නො කලන්දපුත්තො තුණ්හී අහොසි.

8. ඉක්බිති කලන්‍දපුත් සුදින්නගේ මවුපියෝ කලන්දපුත් සුදින්න හට "දරු, සුදින්න, තෝ වනාහි අපගේ ප්‍රිය වූ, මන වඩන්නා වූ, සුව සේ වැඩුනු, සුව සේ පෝෂණය කරණ ලද, එක ම පුත්‍ර වෙහි. දරුව සුදින්නය, තෝ කිසි දුකක් නො දන්නෙහි ය. තාගේ මරණයෙනුදු අපි නො කැමැත්තමෝ ම වෙන් වන්නමු. කිම, ජීවත් වන්නා වූ තට ගිහිගෙන් නික්ම සසුන් වැදීම පිණිස අපි අනුදනිමු ද? දරුව, සුදින්නය, නැගිටුව. අනුභව ද කරව. පානය ද කරව. ඉඳුරන් ද පිණවව. කමින් බොමින් ඉඳුරන් පිණවමින් පස්කම් සුව විඳිමින් පින් කරමින් ගිහිසුව විඳුව. ගිහිගෙන් නික්ම සසුන් වදිනට අපි තට නො ම අනුදනිමු" යි මෙය කීහ. මෙසේ කී කල්හි කලන්දපුත් සුදින්න තෙමේ නිහඬ වී ය. දෙවෙනුත් ... තෙවෙනුත් කලන්දපුත් සුදින්නගේ මවුපියෝ කලන්දපුත් සුදින්නහට "දරුව, සුදින්නය, තෝ වනාහි අපගේ ප්‍රිය වූ මනාප වූ සුව සේ වැඩුනා වූ සුව සේ පෝෂිත වූ එක ම පුත් වෙහි. දරුව, සුදින්නය, තෝ කිසි දුකක් නො දන්නෙහි ය. අපි තාගේ මරණයෙනුදු නො කැමැත්තමෝ වෙන් වන්නමු. කිම, අපි ජීවත් වන තට ගිහිගෙන් නික්ම සසුන් වදින්නට අනුදනිමු ද? දරුව, සුදින්නය, නැගිටුව, කව, බොව, ඉඳුරන් පිණවව. කමින් බොමින් ඉඳුරන් පිණවමින් පස්කම්සුව විඳිමින් පින් කරමින් (ගිහිගෙහි) සිත් අලවව. අපි තට ගිහිගෙන් නික්ම සසුන් වදින්නට අවසර නො දෙමු" යි මෙය කීහ. තෙවනුත් කලන්ද පුත් සුදින්න තෙමේ නිහඬ විය.

9. ඉක්බිති කලන්දපුත් සුදින්නගේ යහළුවෝ කලන්දපුත් සුදින්න වෙත පැමිණියාහු ය. පැමිණ කලන්දපුත් සුදින්නහට "යහළු සුදින්නය, තෝ වනාහි මවුපියන්ගේ ප්‍රිය වූ මනාප වූ සුවසේ වැඩුනාවූ, සුව සේ පෝෂිත වූ, එක ම පුත් වෙහි ය. යහළු සුදින්නය, තෝ කිසි දුකක් නො දන්නෙහි ය. තාගේ මරණයෙනුදු මවුපියෝ නො කැමැත්තෝ ම වෙන් වන්නාහ. කිම, ඔහු ජීවත් වන්නා වූ තට ගිහිගෙන් නික්ම සසුන් වැදීමට අනුදන්නාහු ද? යහළු සුදින්නය, නැගිටින්න. කන්න. බොන්න. ඉඳුරන් පිණවන්න. කමින් බොමින් ඉඳුරන් පිණවමින් කම් සුව විඳිමින් පින් කරමින් ගිහිගෙහි සිත් අලවන්න. මවුපියෝ තොපට ගිහිගෙන් නික්ම සසුන් වදින්නට නො අනුදන්නාහ"යි මෙය කීහ. මෙසේ කී කල්හි කලන්දපුත් සුදින්න තෙමේ නිහඬ විය. දෙවෙනුත් ... තෙවෙනුත් කලන්‍දපුත් සුදින්නගේ යහළුවෝ කලන්දපුත් සුදින්නයට මෙය කීහු: "යහළු සුදින්නය, තෝ වනාහි ..." තෙවෙනුත් කලන්‍දපුත් සුදින්න තෙමේ නිහඬ විය.

10. අථ ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස සහායකා යෙන සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නස්ස කලන්දපුත්තස්ස මාතාපිතරො එතදවොචුං: "අම්ම, තාත,[1] එසො සුදින්නො අනන්තරහිතාය භූමියා නිපන්නො 'ඉධෙව මෙ මරණං භවිස්සති පබ්බජ්ජා වා'ති. සචෙ තුම්හෙ සුදින්නං නානුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, තත්ථෙව මරණං ආගමිස්සති. සචෙ පන තුම්හෙ සුදින්නං අනුජානිස්සථ අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, පබ්බජිතම්පි තං දක්ඛිස්සථ. සචෙ සුදින්නො නාභිරමිස්සති අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය, කා තස්ස අඤ්ඤා ගති භවිස්සති? ඉධෙව පච්චාගමිස්සති. අනුජානාථ සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. "අනුජානාම, තාතා, සුදින්නං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති. අථ ඛො සුදින්නස්ස කලන්දපුත්තස්ස සහායකා යෙන සුදින්නො කලන්දපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සුදින්නං කලන්දපුත්තං එතදවොචුං: "උට්ඨෙහි සම්ම සුදින්න, අනුඤ්ඤාතො'සි මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති.

11. අථ ඛො සුදින්නො කලන්දපුත්තො "අනුඤ්ඤාතො'ම්හි කිර මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා"ති හට්ඨො උදග්ගො පාණිනා ගත්තානි පරිපුඤ්ඡන්තො උට්ඨාසි. අථ ඛො සුදින්නො කලන්දපුත්තො කතිපාහං බලං ගාහෙත්වා යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සුදින්නො කලන්දපුත්තො භගවන්තං එතදවොච: "අනුඤ්ඤාතො'ම්හි[2] අහං භන්තෙ මාතාපිතූහි අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය. පබ්බාජෙතු මං භගවා"ති. අලත්ථ ඛො සුදින්නො කලන්දපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ච පනායස්මා සුදින්නො එවරූපෙ ධුතගුණෙ සමාදාය වත්තති: ආරඤ්ඤිකො හොති, පිණ්ඩපාතිකො, පංසුකූලිකො, සපදානචාරිකො. අඤ්ඤතරං වජ්ජිගාමං උපනිස්සාය විහරති.

12. තෙන ඛො පන සමයෙන වජ්ජී දුබ්භික්ඛා හොති ද්වීහිතිකා සෙතට්ඨිකා සලාකාවුත්තා. න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. අථ ඛො ආයස්මතො සුදින්නස්ස එතදහොසි: "එතරහි ඛො වජ්ජී දුබ්භික්ඛා ද්වීහිතිකා සෙතට්ඨිකා සලාකාවුත්තා. න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. බහූ ඛො පන මෙ වෙසාලියං ඤාතී අඩ්ඪා මහද්ධනා මහාභොගා පහූතජාතරූපරජතා පහූතවිත්තූපකරණා පහූතධනධඤ්ඤා. යන්නූනාහං ඤාතී උපනිස්සාය විහරෙය්‍යං, ඤාතී[3] මං නිස්සාය දානානි දස්සන්ති. පුඤ්ඤානි කරිස්සන්ති භික්ඛූ ච ලාභං ලච්ඡන්ති. අහඤ්ච පිණ්ඩකෙන න කිලමිස්සාමී"ති.

---

1. අම්මතාතා, මජසං; 2. අනුඤ්ඤාතො, මජසං; 3. ඤාතකාපි, සහා,

10. ඉක්බිති කලන්‍දපුත්‍ර වූ සුදින්නගේ යහළුවෝ කලන්‍දපුත්‍ර සුදින්නගේ මාපියන් වෙත එළඹියාහු ය. එළඹ කලන්‍දපුත්‍ර සුදින්නගේ මාපියන්ට මෙය කීහු: “මෑනියනි, පියානනි, තෙල සුදින්න තෙමේ ‘මෙහි ම මාගේ මරණය හෝ පැවිද්ද වන්නේ ය’ යි කිසිවක් නො අතුළ බිමෙහි හොත්තේ වෙයි. ඉදින් තෙපි ගිහිගෙන් නික්ම සසුන් වදින්නට සුදින්නට අවසර නො දෙන්නහු නම්, එහි ම මරණය පැමිණෙන්නේ ය. ඉදින් තෙපි ගිහිගෙන් නික්ම සසුන් වැදීමට සුදින්නට අවසර දෙන්නහු නම්, පැවිදි වූ ඔහු දක්නහු ය. ඉදින් සුදින්න තෙමේ ගිහිගෙන් නික්ම සසුන් වැදී පැවිද්දෙහි සිත් නො අලවන්නේ නම්, ඔහුගේ කිනම් අනෙක් ගතියෙක් වන්නේ ද? මෙහි ම පෙරළා එන්නේ ය. ගිහිගෙන් නික්ම සසුන් වැදීමට සුදින්නට අනුදනිවු” යි. “දරුවෙනි, ගිහිගෙන් නික්ම සසුන් වැදීමට සුදින්නට අනුදනිමු” යි. ඉක්බිති කලන්‍දපුත්‍ර සුදින්නගේ යහළුවෝ කලන්‍දපුත්‍ර සුදින්න වෙත එළඹියාහු ය. එළඹ කලන්‍දපුත්‍ර සුදින්නහට මෙය කීහු: “යහළු සුදින්න යෙනි, නැගිටින්න, මාපියන් විසින් ගිහිගෙන් නික්ම සසුන් වැදීමට අනුදන්නා ලද්දහු ය” යි.

11. ඉක්බිති කලන්‍දපුත්‍ර සුදින්න තෙමේ “මාපියන් විසින් ගිහිගෙන් නික්ම සසුන් වැදීමට අනුදන්නා ලද්දෙම් වෙමි” යි සතුටු වූයේ ඔදවැඩි සිත් ඇත්තේ, අතින් සිරුර පිරිමදිමින් නැගී සිටියේ ය. ඉක්බිති කලන්‍දපුත්‍ර සුදින්න තෙමේ කීපදවසක් මුළුල්ලෙහි කය බල ගන්වා බුදුරදුන් වෙත එළැඹියේ ය. එළඹ බුදුරදුන් වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ කලන්‍දපුත්‍ර සුදින්න තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. “වහන්ස, මම ගිහිගෙන් නික්ම සසුන් වැදීමට මාපියන් විසින් අනුදන්නා ලද්දෙම් වෙමි. භාග්‍යවතුන්වහන්සේ මා පැවිදි කරණ සේක්වා” යි. කලන්‍දපුත්‍ර වූ සුදින්න තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබී ය. උපසම්පදාව ලැබී ය. උපසපන් වූ නොබෝ කල් ඇති ආයුෂ්මත් සුදින්න තෙමේ මෙබඳු ධුතගුණයන් සමාදන් ව වෙසෙයි: අරණෙහි වසන්නෙක් වෙයි. පිණ්ඩපාතිකයෙක් වෙයි. පසුල්සිවුරු දරන්නෙක් වෙයි. ගෙපිළිවෙළින් පිඬු සිඟන්නෙක් වෙයි. එක්තරා වැදූගමක් ඇසුරු කොට වාසය කෙරෙයි.

12. එකල වැදූරට දුක සේ ලැබිය යුතු භික්‍ෂාව ඇත්තේ වෙයි. දෙපරිද්දෙකින් පැවැති අදහස් ඇත්තක් වෙයි. තන්හි තන්හි විසුරුණු මිනීඇට ඇත්තක් වෙයි. නොහොත් සෙතට්ඨිකා නම් සස්‍යරෝගය ඇත්තක් වෙයි. කුසපත්නියමයෙන් ජීවිකාවෘත්තිය පවත්වන්නක් වෙයි නොහොත් ඉරටු පමණක් ව හටගත් සස්‍ය ඇත්තක් වෙයි. පාත්‍රය ගෙණ භික්‍ෂාවෙහි හැසිරීමෙන් ජීවත් වන්නට පහසු නො වන්නක් වෙයි. ඉක්බිති ආයුෂ්මත් වූ සුදින්නහට මේ සිත විය: “දැන් වනාහි වැදූරට දුක සේ ලැබිය හැකි භික්‍ෂාව ඇත්තකි. දෙපරිද්දෙන් පැවති අදහස් ඇත්තකි. තන්හි තන්හි විසුරුණු මිනීඇට ඇත්තකි නොහොත් සෙතට්ඨිකා නම් රෝගය ඇත්තකි. කුසපත්නියමයෙන් ජීවිකාවෘත්තිය පවත්වන්නකි නොහොත් ඉරටු පමණක් ව හටගත් සස්‍ය ඇත්තකි. පාත්‍රය ගෙණ භික්‍ෂාවෙහි හැසිරීමෙන් ජීවත් වන්නට පහසු නො වන්නකි. විසල්පුරයෙහි (උපභොග පරිභොගයන්ගෙන්) ආඪ්‍ය වූ නිදන්ගත මහත් ධනය ඇති, දින පතා වියදම් වන මහත් භෝග ඇති, බොහෝ වූ රන්රිදී ඇති, සතුටු උපදවන බොහෝ අලඞ්කාරොපකරණ ඇති, හණුදෙනුවට යෝග්‍ය වූ බොහෝ ධනධාන්‍යයන් ඇති මාගේ ඥාතීහු බොහෝ වෙත්. මම නෑයන් ඇසුරු කොට වාසය කරන්නෙම් නම්, ඉතා මැනැවි. නෑයෝ මා නිසා දන් දෙත්. පින් කරත්. භික්‍ෂූහු ද ලාබ ලබත්. මම ද ආහාරයෙන් ක්ලාන්ත නො වෙමි” යි.

13. අථ ඛො ආයස්මා සුදින්නො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන **වෙසාලී,** තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන වෙසාලි තදවසරි. තත්‍ර සුදං ආයස්මා සුදින්නො වෙසාලියං විහරති **මහාවනෙ**[1]. අස්සොසුං ඛො ආයස්මතො සුදින්නස්ස ඤාතකා "සුදින්නො කිර කලන්දපුත්තො වෙසාලිං අනුප්පත්තො"ති. තෙ ආයස්මතො සුදින්නස්ස සට්ඨිමත්තෙ ථාලිපාකෙ භත්තාභිහාරං අභිහරිංසු. අථ ඛො ආයස්මා සුදින්නො තෙ සට්ඨිමත්තෙ ථාලිපාකෙ භික්ඛූනං විස්සජ්ජෙත්වා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කලන්දගාමං පිණ්ඩාය පාවිසි. කලන්දගාමෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සකපිතුනිවෙසනං, තෙනුපසඞ්කමි.

14. තෙන ඛො පන සමයෙන ආයස්මතො සුදින්නස්ස ඤාතිදාසී ආභිදෙසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති. අථ ඛො ආයස්මා සුදින්නො තං ඤාතිදාසිං එතදවොච: "සචෙ තං භගිනි ඡඩ්ඩනීයධම්මං, ඉධ මෙ පත්තෙ ආකිරා"ති. අථ ඛො ආයස්මතො සුදින්නස්ස ඤාතිදාසී තං ආභිදෙසිකං කුම්මාසං ආයස්මතො සුදින්නස්ස පත්තෙ ආකිරන්තී හත්ථානඤ්ච පාදානඤ්ච සරස්ස ච නිමිත්තං අග්ගහෙසි. අථ ඛො ආයස්මතො සුදින්නස්ස ඤාතිදාසී යෙනායස්මතො සුදින්නස්ස මාතා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතො සුදින්නස්ස මාතරං එතදවොච: "යග්ඝය්‍යෙ ජානෙය්‍යාසි, අය්‍යපුත්තො සුදින්නො අනුප්පත්තො"ති. "සචෙ ජෙ සච්චං භණසි, අදාසිං තං කරොමී" ති.

15. තෙන ඛො පන සමයෙන ආයස්මා සුදින්නො තං ආභිදෙසිකං කුම්මාසං අඤ්ඤතරං කුඩ්ඩමූලං නිස්සාය පරිභුඤ්ජති. පිතා'පි ඛො ආයස්මතො සුදින්නස්ස කම්මන්තා ආගච්ඡන්තො අද්දස ආයස්මන්තං සුදින්නං තං ආභිදෙසිකං කුම්මාසං අඤ්ඤතරං කුඩ්ඩමූලං නිස්සාය පරිභුඤ්ජන්තං. දිස්වාන යෙනායස්මා සුදින්නො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සුදින්නං එතදවොච: "අත්ථි නාම, තාත සුදින්න, ආභිදෙසිකං කුම්මාසං පරිභුඤ්ජිස්සසි? නනු නාම තාත සුදින්න, සකං ගෙහං ගන්තබ්බ?" න්ති. "අගමිම්හ [2]ඛො තෙ ගහපති ගෙහං. තතායං ආභිදෙසිකො කුම්මාසො"ති. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පිතා ආයස්මතො සුදින්නස්ස බාහායං ගහෙත්වා ආයස්මන්තං සුදින්නං එතදවොච: "එහි තාත සුදින්න, ඝරං ගමිස්සාමා"ති. අථ ඛො ආයස්මා සුදින්නො යෙන සකපිතුනිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පිතා ආයස්මන්තං සුදින්නං එතදවොච: "භුඤ්ජ තාත සුදින්නා"ති. "අලං ගහපති. කතං මෙ අජ්ජ භත්තකිච්ච" න්ති. "අධිවාසෙහි තාත සුදින්න ස්වාතනාය භත්ත" න්ති. අධිවාසෙසි ඛො ආයස්මා සුදින්නො තුණ්හීභාවෙන. අථ ඛො ආයස්මා සුදින්නො උට්ඨායාසනා පක්කාමි.

---

1. මහාවනෙ කූටාගාරසාලායං, මජ්ඣං; 2. අගමම්හා ඉතිපි

13. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ සෙනසුන හැත්පත් කොට පාසිවුරු ගෙණ විසල්පුරය බලා ගියේ ය. පිළිවෙළින් ගොස් විසල්පුරයට පැමිණියේ ය. එකල්හි ආයුෂ්මත් සුදින්න තෙමේ විසල්පුර මහවනයෙහි වෙසෙසි. ආයුෂ්මත් වූ සුදින්නගේ නෑයෝ "කලන්ද පුත් සුදින්න තෙමේ විසල් පුරයට පැමිණියේ ල" යි ඇසූහ. ඔහු ආයුෂ්මත් සුදින්නට බත්සැළි සැටක් එළැවූහ. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ ඒ බත්සැළි සැට භික්ෂූන්ට දී පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ කලන්දසිටුගමෙහි පිඬු පිණිස හැසිරෙන්නේ සිය පියාගේ නිවෙසට පැමිණියේ ය.

14. එකල්හි ආයුෂ්මත් සුදින්නගේ නෑදෑස්සක් පිළුනු වූ කොමු පිඩුවක් ඉවත ලනු කැමැත්තී වෙයි. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ ඒ නෑදෑස්සට මෙය කී: "ඉදින් නැගනියෙනි, එය ඉවත දැමිය යුත්තක් නම් මෙහි මාගේ පාත්‍රයෙහි බහාලනු මැනැවි" යි. ඉක්බිති ආයුෂ්මත් වූ සුදින්නගේ නෑදෑස්ස ඒ පිළුනු කොමුපිඩුව ආයුෂ්මත් සුදින්නගේ පාත්‍රයෙහි බහන්නී අත්වල ද පාවල ද ස්වරයෙහි ද නිමිති ගත්තා ය. ඉක්බිති ආයුෂ්මත් වූ සුදින්නගේ නෑදෑස්ස ආයුෂ්මත් වූ සුදින්නගේ මවු වෙත එළඹියා ය. එළඹ ආයුෂ්මත් සුදින්නගේ මවට මෙය කිවූය: "ආර්යාවෙනි, දන්නෙහි ද? ආර්ය පුත්‍ර වූ සුදින්න තෙමේ පැමිණියේ ය" යි. "එම්බල දැසිය, ඉදින් තෝ සත්‍යයක් කියෙහි නම්, තී නොදැස්සක් කරමි" යි.

15. එකල්හි ආයුෂ්මත් සුදින්න තෙමේ ඒ පිළුනු වූ කොමුපිඩුව එක් ගෙබිත්තියක් ලඟ හිඳ වළඳයි. ආයුෂ්මත් සුදින්නගේ පිය තෙමේ ද කර්මාන්ත ස්ථානයෙන් පෙරළා එන්නේ ඒ පිළුනු වූ කොමුපිඩුව එක් ගෙබිත්තියක් ලඟ හිඳ වළඳන්නා වූ ආයුෂ්මත් සුදින්න දිටී ය. දැක ආයුෂ්මත් සුදින්න වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් සුදින්නට මෙය කී ය: "දරුව, සුදින්නයෙනි, රැලැගි කොමු පිඩුව වළඳව ද, (අපි නාම) තොප කෙරෙහි ශ්‍රමණගුණ විශේෂයෙක් ඇත් ම ය;[1] දරුව සුදින්නය, සියගෙට යා යුතු නො වේ ද?". "ගැහැවිය, ඔබගේ ගෙට ගියෙමු. මේ පිළුනු කොම පිඩුව ඒ ඔබගේ ගෙයින් ය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පිය තෙමේ ආයුෂ්මත් සුදින්නගේ බාහුව ගෙණ ආයුෂ්මත් සුදින්නට මෙය කීය: "දරුව, සුදින්නය, එව. ගෙට යමු" යි. පසු ව ආයුෂ්මත් සුදින්න තෙමේ සිය පියාගේ ගෙට ගියේ ය. ගොස් පණවන ලද අස්නෙහි හුනි. ඉන් පසු ආයුෂ්මත් වූ සුදින්නගේ පිය තෙමේ ආයුෂ්මත් වූ සුදින්නට "දරුව, සුදින්නය, අනුභව කරව" යි මෙය කී ය. "ගැහැවිය, කම් නැත. අද බත්කිස නිමවන ලදී" යි සුදින්න භික්ෂු තෙමේ කී ය.

1. මෙහි පාළියෙහි එන 'පරිභුඤ්ජිස්සසි' යන අනාගත වචනය 'නාම' නිපාතයොගයෙහි නින්දාර්ථයෙහි යෙදුනේය. මේ වාක්‍යයෙන් පිළුනු භෝජනයට නිඳා ද එය පිළිකුල් නො කොට වැළඳූ සුදින්න තෙරුන්ට ශ්‍රමණගුණයෙන් සම්භාවනා ද කළ සැටි ද දත යුතු.

16. අථ ඛො ආයස්මතො සුදින්නස්ස මාතා තස්සා රත්තියා අච්චයෙන හරිතෙන ගොමයෙන පඨවිං ඔපුඤ්ජාපෙත්වා[1] ද්වෙ පුඤ්ජෙ කාරාපෙසි: එකං හිරඤ්ඤස්ස, එකං සුවණ්ණස්ස. තාව මහන්තා පුඤ්ජා අහෙසුං-ඔරතො ඨිතො පුරිසො පාරතො ඨිතං පුරිසං න පස්සති, පාරතො ඨිතො පුරිසො ඔරතො ඨිතං පුරිසං න පස්සති. තෙ පුඤ්ජෙ කිලඤ්ජෙහි පටිච්ඡාදාපෙත්වා මජ්ඣෙ ආසනං පඤ්ඤපෙත්වා තිරොකරණීයං පරික්ඛිපිත්වා ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකං ආමන්තෙසි: "තෙන හි ත්වං වධු, යෙන අලඞ්කාරෙන අලඞ්කතා පුත්තස්ස මෙ සුදින්නස්ස පියා අහොසි මනාපා, තෙන අලඞ්කාරෙන අලඞ්කරා" ති. 'එවං අය්‍යෙ'ති ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකා ආයස්මතො සුදින්නස්ස මාතුයා පච්චස්සොසි.

17. අථ ඛො ආයස්මා සුදින්නො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන සකපිතුනිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පිතා යෙනායස්මා සුදින්නො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ පුඤ්ජෙ විවරාපෙත්වා ආයස්මන්තං සුදින්නං එතදවොච: "ඉදං තෙ තාත සුදින්න, මාතුමත්තිකං ඉත්ථිකාය ඉත්ථිධනං. අඤ්ඤං පෙත්තිකං. අඤ්ඤං පිතාමහං. ලබ්භා තාත සුදින්න, හීනායාවත්තිත්වා භොගා ච භුඤ්ජිතුං පුඤ්ඤානි ච කාතුං. එහි ත්වං තාත සුදින්න, හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු. පුඤ්ඤානි ච කරොහී"ති. "තාත, න උස්සහාමි. න විසහාමි. අභිරතො අහං බ්‍රහ්මචරියං චරාමී"ති. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ආයස්මතො සුදින්නස්ස පිතා ආයස්මන්තං සුදින්නං එතදවොච: "ඉදං තෙ තාත සුදින්න මාතුමත්තිකං ඉත්ථිකාය ඉත්ථිධනං. අඤ්ඤං පෙත්තිකං. අඤ්ඤං පිතාමහං. ලබ්භා තාත සුදින්න හීනායාවත්තිත්වා භොගා ච භුඤ්ජිතුං පුඤ්ඤානි ච කාතුං. එහි ත්වං තාත සුදින්න, හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු, පුඤ්ඤානි ච කරොහී"ති. "වදෙය්‍යාම ඛො තං ගහපති, සචෙ ත්වං නාතිකඩ්ඪෙය්‍යාසී"ති. "වදෙහි තාත සුදින්නා"ති. "තෙන හි ත්වං ගහපති, මහන්තෙ මහන්තෙ සාණිපසිබ්බකෙ කාරාපෙත්වා හිරඤ්ඤසුවණ්ණස්ස පූරාපෙත්වා සකටෙහි නිබ්බාහාපෙත්වා මජ්ඣෙ ගඞ්ගාය සොතෙ ඔසාදෙහි[2]. තං කිස්ස හෙතු? යං හි තෙ ගහපති භවිස්සති තතොනිදානං භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා ආරක්ඛො වා, සො තෙ න භවිස්සතී"ති. එවං වුත්තෙ ආයස්මතො සුදින්නස්ස පිතා අනත්තමනො අහොසි: "කථං හි නාම පුත්තො සුදින්නො එවං වක්ඛතී"ති.

18. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පිතා ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකං ආමන්තෙසි: "තෙන හි වධු, ත්වම්පි යාච, අප්පෙව නාම පුත්තො සුදින්නො තුය්හම්පි වචනං කරෙය්‍යා"ති. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකා ආයස්මතො සුදින්නස්ස පාදෙසු ගහෙත්වා ආයස්මන්තං සුදින්නං එතදවොච: "කීදිසා නාම තා අය්‍යපුත්ත අච්ඡරායො, යාසං ත්වං හෙතු බ්‍රහ්මචරියං චරසී?"ති. "න ඛො අහං භගිනි, අච්ඡරානං හෙතු බ්‍රහ්මචරියං චරාමී"ති.

---

1. ඔපුඤ්ඡාපෙත්වා, මජසං. ස්‍යා. 2. ඔපාතෙහි, මජසං.

16. ඉක්බිති ආයුෂ්මත් වූ සුදින්නගේ මවු තොමෝ එ රැය ඇවෑමෙන් අමුගොමින් බිම පිරිබඩ දී කහවණුවලින් එකක් ද රණින් එකක් දූ යි ගොඩවල් දෙකක් කරවී ය. මොබ සිටි පුරුෂතෙමේ ඔබ සිටි පුරුෂයා නො දකී ද, ඔබ සිටි පුරුෂ තෙමේ මොබ සිටි පුරුෂයා නො දකී ද, ඒ සා මහත් ගොඩවල් වූහ. ඒ ගොඩවල් කලාලවලින් වසා මැද අසුනක් පණවා තිරයකින් වට කොට ආයුෂ්මත් සුදින්නගේ පැරණි දෙවැන්නිය (=අඹුව) අමතා, "ලෙහෙළිය, යම් අලඞ්කාරයකින් සැරසුනා වූ නී මා පුත් සුදින්නට ප්‍රිය වූවා ද, මනාප වූවා ද, ඒ අලඞ්කාරයෙන් සැරසෙව" යි කිවු ය. "ආයසීාවෙනි, එසේ ය" යි ආයුෂ්මත් සුදින්නගේ පැරණි අඹුව ආයුෂ්මත් සුදින්නගේ මවුට පිළිවදන් දුන්නී ය.

17. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ පෙරබත්කල හැඳ පෙරෙව පාසිවුරු ගෙණ සිය පිය නිවෙස වෙත එළඹියේ ය. එළඹ පැණවූ අස්නෙහි හුන්නේ ය. ඉන්පසු ආයුෂ්මත් සුදින්නගේ පියතෙමේ ආයුෂ්මත් සුදින්න වෙත එළඹියේ ය. එළඹ ඒ රන්රුවන් ගොඩවල් වැසුම් හරවා ආයුෂ්මත් සුදින්නට මෙය කී: "දරුව, සුදින්නය, මේ මිත්තනියන් විසින් ඔබගේ මවට දෛනික පරිභෝග වූ නානසුණු ආදිය ගැණීම පිණිස දුන් ධනය වෙයි. පියාට අයත් ධනය මෙයින් අන්‍ය ය. මුත්තනුවන්ගේ ධනය මෙයින් අන්‍ය ය. දරුව සුදින්නය, ගිහිබවට පැමිණ භෝග අනුභව කරන්නට ද පින් කරන්නට ද හැකි ය. දරුව සුදින්නය, එව. තෝ ගිහිබවට පැමිණ භෝගයන් ද අනුභව කරව. පින් ද කරව" යනු යි. "පියානෙනි, නො හෙම්. නො හැකියෙමි. මම් සස්නෙහි ඇලුනෙම් බඹසර හැසිරෙමි"යි. දෙවනු-වත් ... තෙවෙනුවත් ආයුෂ්මත් සුදින්නගේ පියතෙමේ ආයුෂ්මත් සුදින්නහට මෙය කී ය: "දරුව සුදින්නය, මේ මිත්තනියන් විසින් ඔබගේ මවුට දෛනික පරිභෝගය පිණිස දුන් ධනය වෙයි. පියාට අයත් ධනය මෙයින් අන්‍ය ය. මුත්තනුවන්ගේ ධනය ද මෙයින් අන්‍ය ය. දරුව සුදින්නය, ගිහිබවට පැමිණ භොග අනුභව කරන්නට ද පින් කරන්නට ද හැකි ය. දරුව සුදින්නය, එව තෝ ගිහිබවට පැමිණ භොගයන් ද අනුභව කරව. පින් ද කරව" කියා යි. "ඉදින් ගැහැවිය, ඔබ නොකිපෙන්නහු නම්, එයට කිව යුතු දෙය කියමු" යි. "පුත සුදින්නය, කියව" යි ගැහැවි කී ය. "එසේ වී නම්, ගැහැවිය, ඔබ මහත් මහත් ගෝණිමලු කරවා, කහවණුවලින් හා රණින් පුරවා, ගැල්වලින් අදවා, ගඟ මැද සැඩ දියපහරෙහි කිඳවා ලන්න. ඒ කවර හෙයින් ද? ගැහැවිය, ඔබට එය හේතු කොට ගෙණ යම්බඳු බියක් හෝ ලය සැලීමෙක් හෝ ලොමුදැහ ගැණීමක් හෝ රැක ගැණීමක් හෝ වේ ද, එය ඔබට නොවන්නේය" යි සුදින්න භික්ෂු කී ය. මෙසේ කී කල්හි ආයුෂ්මත් සුදින්නගේ පිය තෙමේ "කෙසේ නම් මා පුත් සුදින්න තෙමේ මෙසේ කියන්නේ දූ?"යි නොසතුටු සිත් ඇත්තේ විය.

18. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ පිය තෙමේ ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹුව ඇමතී ය: "එසේ වී නම් ලෙහෙළිය, තෝ ද යාච්ඤා කරව. පුත් වූ සුදින්න තෙමේ තිගේ වචනය වත් කරන්නේ නම් ඉතා මැනැවි"යි කී ය. ඉන් පසු ආයුෂ්මත් වූ සුදින්නගේ ගිහිකල අඹු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ පා අල්ලාගෙණ ආයුෂ්මත් සුදින්නට මෙය කී ය: "ආයසීපුත්‍රයෙනි, ඔබ යම්බඳු වූ දෙවඟනන් ලැබීම පිණිස බඹසර හැසිරෙත් නම්, ඒ දෙවඟනෝ කෙබඳු දූ"යී ඇසුවා ය. "නැගනියෙනි, මම දෙවඟනන් හේතු කොට ගෙණ බඹසර නො හැසිරෙමි"යි හේ කී ය.

19. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකා "අජ්ජතග්ගෙ මං අය්‍යපුත්තො සුදින්නො භගිනීවාදෙන සමුදාචරතී"ති තත්ථෙව මුච්ඡිතා පපතා. අථ ඛො ආයස්මා සුදින්නො පිතරං එතදවොච: "සචෙ ගහපති, භොජනං දාතබ්බං, දෙථ. මා නො විහෙඨයිත්ථා"ති. "භුඤ්ජ තාත සුදින්නා"ති. අථ ඛො ආයස්මතො සුදින්නස්ස මාතා ච පිතා ච ආයස්මන්තං සුදින්නං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසුං සම්පවාරෙසුං. අථ ඛො ආයස්මතො සුදින්නස්ස මාතා ආයස්මන්තං සුදින්නං භුත්තාවිං ඔනීතපත්තපාණිං එතදවොච: "ඉදං තාත සුදින්න, කුලං අඩ්ඪං මහද්ධනං මහාභොගං පහූතජාතරූපරජතං පහූතවිත්තූපකරණං පහූතධනධඤ්ඤං. ලබ්භා තාත සුදින්න, හීනායාවත්තිත්වා භොගා ච භුඤ්ජිතුං. පුඤ්ඤානි ච කාතුං. එහි ත්වං තාත සුදින්න, හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු. පුඤ්ඤානි ච කරොහී"ති. "අම්ම, න උස්සහාමි. න විසහාමි. අභිරතො අහං බ්‍රහ්මචරියං චරාමී"ති. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ආයස්මතො සුදින්නස්ස මාතා ආයස්මන්තං සුදින්නං එතදවොච: "ඉදං තාත සුදින්න, කුලං අඩ්ඪං මහද්ධනං මහාභොගං පහූතජාතරූපරජතං පහූතවිත්තූපකරණං පහූතධනධඤ්ඤං. තෙන හි තාත සුදින්න, බීජකම්පි දෙහි, මා නො අපුත්තකං සාපතෙය්‍යං ලිච්ඡවයො[1] අතිහරාපෙසු"න්ති. "එතං ඛො මෙ අම්ම, සක්කා කාතු"න්ති. "කහං පන තාත සුදින්න, එතරහි විහරසී"ති ? "මහාවනෙ අම්මා"ති. අථ ඛො ආයස්මා සුදින්නො උට්ඨායාසනා පක්කාමි.

20. අථ ඛො ආයස්මතො සුදින්නස්ස මාතා ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකං ආමන්තෙසි: "තෙන හි වධු, යදා උතුනී හොසි, පුප්ඵං තෙ උප්පන්නං හොති, අථ මෙ ආරොචෙය්‍යාසී"ති. "එවං අය්‍යෙ"ති ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකා ආයස්මතො සුදින්නස්ස මාතුයා පච්චස්සොසි. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකා න චිරස්සෙව උතුනී අහොසි. පුප්ඵංසා උප්පජ්ජි. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකා ආයස්මතො සුදින්නස්ස මාතරං එතදවොච: "උතුනී'ම්හි අය්‍යෙ, පුප්ඵං මෙ උප්පන්න"න්ති. "තෙන හි වධු, යෙන අලඞ්කාරෙන අලඞ්කතා පුත්තස්ස සුදින්නස්ස පියා අහොසි මනාපා, තෙන අලඞ්කාරෙන අලඞ්කරා"ති. "එවං අය්‍යෙ"ති ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණ දුතියිකා ආයස්මතො සුදින්නස්ස මාතරං පච්චස්සොසි. අථ ඛො ආයස්මතො සුදින්නස්ස මාතා ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකං ආදාය යෙන මහාවනං, යෙනායස්මා සුදින්නො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සුදින්නං එතදවොච: "ඉදං තාත සුදින්න, කුලං අඩ්ඪං මහද්ධනං මහාභොගං පහූතජාතරූපරජතං පහූතවිත්තූපකරණං පහූතධනධඤ්ඤං. ලබ්භා තාත සුදින්න හීනායාවත්තිත්වා භොගා ච භුඤ්ජිතුං. පුඤ්ඤානි ච කාතුං. එහි ත්වං තාත සුදින්න, හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු. පුඤ්ඤානි ච කරොහී"ති. "අම්ම, න උස්සහාමි. න විසහාමි අභිරතො අහං බ්‍රහ්මචරියං චරාමී"ති. දුතියම්පි ඛො - පෙ - තතියම්පි ඛො - පෙ - ආයස්මතො සුදින්නස්ස මාතා ආයස්මන්තං සුදින්නං එතදවොච: "ඉදං තාත සුදින්න, කුලං අඩ්ඪං මහද්ධනං මහාභොගං පහූතජාතරූපරජතං පහූතවිත්තූපකරණං පහූතධනධඤ්ඤං. තෙන හි තාත සුදින්න, බීජකම්පි දෙහි, මා නො අපුත්තකං සාපතෙය්‍යං ලිච්ඡවයො[1] අතිහරාපෙසු"න්ති

1. ලිච්ඡවියො, කත්ථචි.

19. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹු තොමෝ ආයසීපුත්‍ර වූ සුදින්න තෙමේ "අද පටන් මට භගිනිවාදයෙන් කථා කෙරේ ය"යි සිහි නැති ව එහි ම වැටුනී ය. ඉන් පසු ආයුෂ්මත් සුදින්න තෙමේ "ඉදින් ගෘහපතිය දිය යුතු ආහාරයක් වේ නම්, දෙනු මැනැවි. අප නො වෙහෙසන්නැ"යි පියාට කී ය. "පුත සුදින්නය, වළඳනු මැනැවි" යි ගෘහපති කී ය. ඉන් පසු ආයුෂ්මත් සුදින්නගේ මවු ද පියා ද ආයුෂ්මත් සුදින්නට ප්‍රණීත වූ කෑ යුතු දෑය ද බිදිය යුතු දෑය ද සියතින් වැළඳවූහ, පැවැරවූහ. ඉන් පසු ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ වළඳා අවසන් කළ, පාත්‍රයෙන් ඉවතට ගත් අත් ඇති ආයුෂ්මත් සුදින්නට මෙය කී ය: "පුත සුදින්න, මේ කුලය ආඪ්‍ය ය. මහද්ධන ඇත්තක. මහද් භොග ඇත්තක. බොහෝ රන් රිදී මසු කහවණු ඇත්තක. බොහෝ වස්තූපකරණ ඇත්තක. බොහෝ ධනධාන්‍ය ඇත්තක. පුත සුදින්න, ගිහි බවට පැමිණ භොග අනුභව කරන්ට ද පින් කරන්ට ද හැකි ය. පුත සුදින්න. එව, තෝ ගිහි බවට පැමිණ භොග ද අනුභව කරව. පින් ද කරව" කියා සි. "මෑනියනි, නො හෙමි. නො හැක්කෙමි. මම ඇලුනෙම් බඹසර හැසිරෙමි"යි සුදින්න භික්ෂු කී ය. දෙවනුවත් ... තෙවනුවත් ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ආයුෂ්මත් සුදින්නහට මෙය කී ය: "පුත සුදින්න, මේ කුලය ආඪ්‍ය ය, මහද්ධන ඇත්තක. මහාභෝග ඇත්තක. බොහෝ රන්රිදී මසු කහවණු ඇත්තක. බොහෝ වූ වස්තූපකරණ ඇත්තක. බොහෝ ධනධාන්‍ය ඇත්තක. එහෙයින් පුත සුදින්න, (කුලවංශය ආරක්ෂා කර ගැණීමට) බීජයක් (පුතෙකු) දෙව. අපගේ දරුවන් නොමැති වසතුව ලිච්ඡවීහු ගෙන්වා නො ගණීත්වා"යනු සි. "මෑනියනි, මෙය මට කරන්නට හැකි ය"යී සුදින්න කී ය. "පුත සුදින්න, මේ කල කොහි වෙසෙහි ද?"යී මවු ඇසුවා ය. "මෑනියනි, මහවනයෙහියැ"යි සුදින්නභික්ෂු තෙමේ කී ය. ඉක්බිති ආයුෂ්මත් සුදින්න තෙමේ අස්නෙන් නැගිට ගියේ ය.

20. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹුව බණවා "එසේ වී නම් ලේලිය, යම් දවසක ඍතුමතී වෙහි ද, තිට මල්වර වේ ද, එ කල්හි මට දන්වව" යි කිවු ය. "ආයසීාවෙනි, එසේ යැ"යි කියා ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ මවුට පිළිවදන් දුන්නී ය. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹු තොමෝ නොබෝ දවසකින් ම ඍතුමතී වූවා ය. ඇයට මල්වර උපන. ඉන් පසු ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ මවුට "ආයසීාවෙනි, ඍතුනියක් වෙමි. මට ඔසප් ලෙය උපනැ"යි මෙය කීවා ය. "එසේ වී නම් ලේලිය, යම් අලඞ්කාරයකින් සැරසුනී පුත් වූ සුදින්නහට ප්‍රියමනාප වූ ද, ඒ අලඞ්කාරයෙන් සැරසෙව"යි ඕ කිවු ය. "ආයසීාවෙනි, එසේ ය"යි ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ මවුට පිළිවදන් ඇස්වූ ය. ඉන් පසු ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹුව කැඳවාගෙණ මහවනයෙහි ආයුෂ්මත් සුදින්න වෙත එළඹියා ය. එළඹ ආයුෂ්මත් සුදින්නහට මෙය කිවු ය: "පුත, සුදින්න, මේ කුලය ආඪ්‍ය ය. මහද්ධන ඇත්තක. මහද්භෝග ඇත්තක. බොහෝ රන්රිදී මසු කහ-වණු ඇත්තක. බොහෝ වස්තූපකරණ ඇත්තක. බොහෝ ධනධාන්‍ය ඇත්තක. පුත සුදින්න, ගිහිබවට පැමිණ භෝග අනුභව කරන්නට ද පින් කරන්නට ද හැකි ය. පුත සුදින්න, එව. තෝ ගිහිබවට පැමිණ භොගයන් ද අනුභව කරව. පින් ද කරව" යනු සි. "මෑනියනි, නො හෙමි. නො හැකියෙමි. මම ඇලුනෙම් බඹසර හැසිරෙමි"යි හේ කී ය. දෙවනුත් ... තෙවනුත් ... ආයුෂ්මත් සුදින්නගේ මවු තොමෝ ආයුෂ්මත් සුදින්නහට මෙය කීවාය: "පුත, සුදින්න, මේ කුලය ආඪ්‍ය ය. මහද් ධනඇත්තක. මහද් භොග ඇත්තක. බොහෝ රන්රිදී මසු කහවණු ඇත්තක. බොහෝ වස්තූපකරණ ඇත්තක. බොහෝ ධන ධාන්‍ය ඇත්තක. එහෙයින් පුත සුදින්නය, බීජයක් (පුතකු) දෙව. අපුත්‍රක වූ ධනය ලිච්ඡවීහු ගැර නො ගණීත්වා" යනු සි.

21. "එතං ඛො මෙ අම්ම, සක්කා කාතු"න්ති පුරාණදුතියිකං[1] බාහායං ගහෙත්වා මහාවනං අජ්ඣොගාහෙත්වා අපඤ්ඤත්තෙ සික්ඛාපදෙ අනාදීනවදස්සො පුරාණදුතියිකාය තික්ඛත්තුං මෙථුනං ධම්මං අභිවිඤ්ඤාපෙසි. සා තෙන ගබ්භං ගණ්හි.

භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං: "නිරබ්බුදො වත භො භික්ඛුසඞ්ඝො නිරාදීනවො. සුදින්නෙන කලන්දපුත්තෙන අබ්බුදං උප්පාදිතං, ආදීනවො උප්පාදිතො"ති. භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දෙවා සද්දමනුස්සාවෙසුං -පෙ- තාවතිංසා දෙවා,-යාමා දෙවා,-තුසිතා දෙවා,-නිම්මානරතිනො දෙවා,-පරනිම්මිතවසවත්තිනො දෙවා,-බ්‍රහ්මකායිකා දෙවා, සද්දමනුස්සාවෙසුං: "නිරබ්බුදො වත භො භික්ඛුසඞ්ඝො නිරාදීනවො. සුදින්නෙන කලන්දපුත්තෙන අබ්බුදං උප්පාදිතං, ආදීනවො උප්පාදිතො"ති. ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි.

22. අථ ඛො ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකා තස්ස ගබ්භස්ස පරිපාකමන්වාය පුත්තං විජායි. අථ ඛො ආයස්මතො සුදින්නස්ස සහායකා තස්ස දාරකස්ස 'බීජකො'ති නාමං අකංසු. ආයස්මතො සුදින්නස්ස පුරාණදුතියිකාය 'බීජකමාතා'ති නාමං අකංසු. ආයස්මතො සුදින්නස්ස 'බීජකපිතා'ති නාමං අකංසු. තෙ අපරෙන සමයෙන උභො අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අරහත්තං සච්ඡාකංසු.

23. අථ ඛො ආයස්මතො සුදින්නස්ස අහුදෙව කුක්කුච්චං, අහු විප්පටිසාරො "අලාභා වත මෙ. න වත මෙ ලාභා. දුල්ලද්ධං වත මෙ. න වත මෙ සුලද්ධං: යො'හං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා නාසක්ඛිං යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතු"න්ති. සො තෙනෙව කුක්කුච්චෙන තෙන විප්පටිසාරෙන කිසො අහොසි ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො. අන්තොමනො ලීනමනො දුක්ඛී දුම්මනො විප්පටිසාරී පජ්ඣායි.

24. අථ ඛො ආයස්මතො සුදින්නස්ස සහායකා භික්ඛූ ආයස්මන්තං සුදින්නං එතදවොචුං: "පුබ්බෙ ඛො ත්වං ආවුසො සුදින්න, වණ්ණවා අහොසි පීණින්ද්‍රියො[2] පසන්නමුඛවණ්ණො විප්පසන්නඡවිවණ්ණො. සො'දානි ත්වං එතරහි කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො, අන්තොමනො ලීනමනො දුක්ඛී දුම්මනො විප්පටිසාරී පජ්ඣායසි. කච්චි නො ත්වං ආවුසො සුදින්න, අනභිරතො බ්‍රහ්මචරියං චරසී"ති? "න ඛො අහං ආවුසො අනභිරතො බ්‍රහ්මචරියං චරාමි. අත්ථි මෙ පාපං කම්මං කතං. පුරාණදුතියිකාය මෙථුනො ධම්මො පටිසෙවිතො. තස්ස මය්හං ආවුසො, අහුදෙව කුක්කුච්චං, අහු විප්පටිසාරො: අලාභා වත මෙ. න වත මෙ ලාභා. දුල්ලද්ධං වත මෙ. න වත මෙ සුලද්ධං: යො 'හං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා නාසක්ඛිං යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතු"න්ති.

1. පුරාණදුතියිකාය, මජසං 2. පීණිතින්ද්‍රියො, මජසං

21. "මැතියනි, මෙය නම් මට කරන්නට හැකි" යි හෙතෙම ගිහි කල අඹුවගේ අත අල්ලා ගෙණ මහවනයට බැස ගෙණ, සිකපද නො පැණවූ කල්හි ආදීනව නො දක්නේ ගිහිකල අඹුව සමග තෙවරක් මෙවුන්දම් සෙවී ය. ඕ එයින් ගබ් ගත්තී ය.

"පින්වත්නි, ඒකාන්තයෙන් ම භික්ෂුසඞ්ඝ තෙමේ නො කැලැල් ය. නිදොස් ය. කලන්දසිටු පුත් වූ සුදින්න විසින් අර්බුදයක් උපදවන ලදී. ආදීනවයක් උපදවන ලද" යි භූමාටු දෙවියෝ උද්ඝෝෂණය කළාහු ය. භූමාටු දෙවියන්ගේ ශබ්දය අසා චාතුර්මහාරාජික දෙවියෝ උද්ඝෝෂණය කළාහු ය. ... තාවතිංශ වැසි දෙවියෝ ... යාම දෙවියෝ ... තුසිත දෙවියෝ ... නිම්මාණරති දෙවියෝ ... පරනිර්මිත වශවර්ති දෙවියෝ ... බඹලොව වැසි දෙවියෝ "පින්වත්නි, ඒකාන්තයෙන් භික්ෂුසඞ්ඝ තෙමේ නො කැලැල් ය. නිදොස් ය. කලන්දපුත් සුදින්න විසින් අර්බුදයක් උපදවන ලදී. ආදීනවයක් උපදවන ලද"යි උද්ඝෝෂණය කළාහු ය. මෙසේ එකෙණෙහි ඒ මොහොතෙහි ඝෝෂය බඹලොව තෙක් පැන නැගුනේ ය.

22. ඉක්බිති ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹුතොමෝ ඒ ගබ මිහිකිරීමට පැමිණ පුතකු වැදූවා ය. එකල්හි ආයුෂ්මත් වූ සුදින්නගේ යහළුවෝ ඒ දරුහට 'බීජක ය' යි නම් කළාහු ය. ආයුෂ්මත් සුදින්නගේ ගිහිකල අඹුවට 'බීජකමාතා ය' යි නම් කළාහු ය. ආයුෂ්මත් සුදින්නහට 'බීජකපිතා ය' යි නම් කළාහු ය. ඔහු (මාතාපුත්‍ර) දෙදෙන පසු කාලයෙහි ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වී රහත්බව ලැබූහ.

23. ඉක්බිති ආයුෂ්මත් සුදින්නහට "යම් ඒ මම මෙසේ මනා කොට දේශනා කරණ ලද ධර්මවිනයෙහි පැවිදි වී දිවි ඇති තාක් පිරිපුන් පිරිසිදු මඟ-බඹසර හැසිරෙන්නට නො හැකි වීම් ද, ඒ මට ඒකාන්තයෙන් අලාභයෝ ය. ඒකාන්තයෙන් මට ලාභයෝ නො වෙත්. මා විසින් ඒකාන්තයෙන් නපුරු ලැබීමක් ය. යහපත් ලැබීමක් නො වේ"යි පසුතැවිලි ඇති විය. විපිළිසර ඇති විය. හෙතෙමේ ඒ කුකුසෙන් ඒ විපිළිසරින් කෘශ වූයේ රළු වූයේ දුර්වර්ණ වූයේ පඬුවන් පැහැ ඇති වූයේ නහර ඉල්පී ගිය සිරුරු ඇත්තේ, හැඟවුනු හැකුළුනු සිත් ඇත්තේ දුක් ඇත්තේ නො සතුටු සිත් ඇත්තේ විපිළිසර වූයේ සිතිවිල්ලට වැටුනේ විය.

24. එකල්හි ආයුෂ්මත් සුදින්නගේ යහළු භික්ෂූහු ආයුෂ්මත් සුදින්න හට මෙය කීවාහු ය: "ඇවැත් සුදින්නය, පෙර තෝ පැහැපත් වූයෙහි ය. පිණා ගිය ඉඳුරන් ඇත්තෙහි ය. පහන් වූ මුව පැහැය ඇත්තෙහි ය. ඉතා ප්‍රසන්න වූ ඡවිවර්ණ ඇත්තෙහි ය. ඒ තෝ දැන් වනාහි කෘශ වූයෙහි රළු වූයෙහි දුර්වර්ණ වූයෙහි පඬුවන් පැහැ ඇති වූයෙහි නහර ඉල්පී ගිය සිරුරු ඇත්තෙහි හැඟවුනු සිත් ඇත්තෙහි හැකිළුනු සිත් ඇත්තෙහි දුක් ඇත්තෙහි නො සතුටු සිත් ඇත්තෙහි විපිළිසර වූයෙහි ඒ ඒ දෑ සිතන්නට පටන් ගත්තෙහි ය. කිම ඇවැත් සුදින්න, තෝ නො ඇලුනෙහි බඹසර හැසිරෙහි ද ?". "ඇවැත්නි, මම නො ඇලුනෙම් බඹසර නො හැසිරෙමි. මා විසින් කළ පව්කමක් ඇත. පොරණඅඹුව හා මෙවුන්දම් සෙවුනා ලද්දේ ය. 'ඇවැත්නි, යම් ඒ මම මෙසේ මනා කොට දේශනා කරණ ලද ධර්මවිනයෙහි පැවිදි ව දිවි ඇති තාක් පිරිපුන් පිරිසිදු මඟබඹසර හැසිරෙන්නට නො හැකි වීම් ද, ඒ මට අලාභයෝ ය. ඒකාන්තයෙන් ලාභයෝ නො වෙත්. මවිසින් ඒකාන්තයෙන් නපුරු ලැබීමකි, එකැයින් මට යහපත් ලැබීමක් නො වෙයි, පසුතැවිලි ඇති විය. විපිළිසර ඇති විය" යි සුදින්න මහණ කී ය. එ විට ඒ මහණහු මෙසේ කීහ:

25. "අලං හි තෙ ආවුසො සුදිනන කුකකුචචාය, අලං විපපටිසාරාය, යං ත්වං එවං ස්වාකඛාතෙ ධමමවිනයෙ පබබජිත්වා න සකඛිසසසි යාවජීවං පරිපුණණං පරිසුදධං බ්‍රහමචරියං චරිතුං.

26. නනු ආවුසො භගවතා අනෙකපරියායෙන විරාගාය ධමෙමා දෙසිතො නො සරාගාය? විසංයොගාය ධමෙමා දෙසිතො නො සංයොගාය? අනුපාදානාය ධමෙමා දෙසිතො නො සඋපාදානාය?

27. තතථ නාම ත්වං ආවුසො භගවතා විරාගාය ධමෙම දෙසිතෙ සරාගාය චෙතෙසසසි. විසංයොගාය ධමෙම දෙසිතෙ සංයොගාය චෙතෙසසසි. අනුපාදානාය ධමෙම දෙසිතෙ සඋපාදානාය චෙතෙසසසි,

28. නනු ආවුසො භගවතා අනෙකපරියායෙන රාගවිරාගාය ධමෙමා දෙසිතො? මදනිමමදනාය පිපාසවිනයාය ආලයසමුගඝාතාය වටටුපචෙඡදාය තණහකඛයාය විරාගාය නිරොධාය නිබබාණාය ධමෙමා දෙසිතො?

29. නනු ආවුසො භගවතා අනෙක පරියායෙන කාමානං පහාණං අකඛාතං, කාමසඤ්ඤානං පරිඤ්ඤා අකඛාතා, කාමපිපාසානං පටිවිනයො අකඛාතො, කාමවිතකකානං සමුගඝාතො අකඛාතො, කාමපරිළාහානං වූපසමො අකඛාතො?

30. නෙතං ආවුසො අපපසනනානං වා පසාදාය පසනනානං වා භිය්‍යොභාවාය [1] අථ ඛෙවතං ආවුසො අපපසනනානඤ්චෙව අපපසාදාය පසනනානඤ්ච එකචචානං අඤ්ඤථතතායා"ති.

31. අථ ඛො තෙ භිකඛූ ආයස්මනතං සුදිනනං අනෙකපරියායෙන විගරහිත්වා භගවතො එතමතථං ආරොචෙසුං. අථ ඛො භගවා එතසමිං නිදානෙ එතසමිං පකරණෙ භිකඛුසඞඝං සනනිපාතාපෙත්වා ආයස්මනතං සුදිනනං පටි-පුචඡි: "සචචං කිර ත්වං සුදිනන, පුරාණ දුතියිකාය මෙථුනං ධමමං පටිසෙවී"ති. "සචචං භගවා." විගරහි බුදෙධා භගවා:

1 භියෙ, ඉතිපි

25. "ඇවැත් සුදින්න, යම් හෙයකින් තෝ මෙසේ මැනැවින් දෙසූ ධම් විනයයෙහි පැවිදි ව දිවි ඇති තාක් පිරිපුන් පිරිසිදු මගබඹසර හැසිරෙන්නට නො හැකි වූයෙහි ද? තාගේ කුකුසට එය සෑහේ. විපිළිසරට සෑහේ.

26. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් සරාගය පිණිස නො ව විරාගය පිණිස දහම් දෙසන ලද්දේ නො වේ ද? (නො ඇලීම පිණිස දෙසන ලදී. ඇලීම පිණිස නො වෙයි.) ක්ලේශයන්ගෙන් වෙන් ව විසීම පිණිස ධර්මය දේශනා කරණ ලද්දේ නො වේ ද? කෙලෙසුන් හා නො යෙදීම පිණිස ධර්මය දෙසන ලද්දේ නො වේ ද? තෘෂ්ණාවශයෙන් දැඩි කොට නො ගැණීම පිණිස ධර්මය දේශනා කරණ ලද්දේ නො වේ ද? තෘෂ්ණා වශයෙන් දැඩි කොට ගැණීම පිණිස නො දෙසන ලද්දේ නො වේ ද?

27. එහි ඇවැත්නි, තෝ භාග්‍යවතුන් වහන්සේ විසින් විරාගය පිණිස ධර්මය දේශනා කරණ ලද කල්හි රාගය හා පවත්නා මෛථුන්දම් සෙවීම පිණිස උත්සාහ කෙළෙහි ය. විසංයෝගය පිණිස ධර්මය දේශනා කරණ ලද කල්හි සංයෝගය පිණිස උත්සාහ කෙළෙහි ය. අනුපාදනය පිණිස ධර්මය දේශනා කරණ ලද කල්හි සඋපාදනය පිණිස උත්සාහ කෙළෙහි ය.

28. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් මදදිය දුරු කිරීම පිණිස කාම පිපාසාදීන්ගේ දුර ලීම පිණිස, පඤ්චකාමාලය මුලින් ම සිඳීම පිණිස සංසාරයේ මුල් සිඳීම පිණිස, තෘෂ්ණාක්‍ෂයය පිණිස, විරාගය පිණිස, නිරෝධය, පිණිස, නිවණ පිණිස ධර්මය දේශනා කරණ ලද්දේ නොවේද?

29. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් වස්තුකාමක්ලේශ කාමයන්ගේ ප්‍රහාණය වදරණ ලද්දේ නො වේ ද? සියලු කාමසංඥාවන්ගේ ත්‍රිවිධ වූ පරිඥාව වදරණ ලද නො වේ ද? කාමපිපාසාවන්ගේ දුරු කිරීම් වදරණ ලද්දේ නො වේ ද? කාමවිතර්කයන්ගේ නැසීම වදරණ ලද්දේ නො වේ ද? කාමපරිදාහයන්ගේ සන්සිඳීම වදරණ ලද්දේ නො වේ ද?

30. ඇවැත්නි, ඔබගේ පාපකර්මය නොපහත් වූවන්ගේ පැහැදීම පිණිස නො වෙයි. පහන් වූවන්ගේ සැවත සැවත පැහැදීම පිණිස නො වෙයි. වැලිදු, ඇවැත්නි, තෙල පාපකර්මය එකාන්ත නොපහන් වූවන්ගේ නොපහන් බව පිණිස ද, පහන් වූ සමහරුන්ගේ (සෝවන් මගට නො පැමිණියවුන්ගේ) විපිළිසරබව පිණිස ද වෙයි."

31. ඉන් පසු ඒ භික්‍ෂූහු ආයුෂ්මත් සුදින්නහට නොයෙක් ආරෙන් ගර්හා කොට භාග්‍යවතුන් වහන්සේට ඒ කරුණ සැල කළාහු ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්‍ෂුසඞ්ඝයා රැස් කරවා "සුදින්න, තෝ පොරණ අඹුව සමග මෛථුන්දම් සේවනය කෙළෙහි ය යනු සැබෑ දැ"යි ආයුෂ්මත් සුදින්නගෙන් පිළිවිසි සේක. "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය"යි සුදින්න භික්‍ෂු කී ය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක:

32. "අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං අප්පතිරූපං අස්සා-මණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා න සක්ඛිස්සසි යාවජීවං පරිසුද්ධං පරිපුණ්ණං බ්‍රහ්මචරියං චරිතුං.

33. නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන විරාගාය ධම්මො දෙසිතො නො සරාගාය? විසංයොගාය ධම්මො දෙසිතො නො සංයොගාය? අනුපාදානාය ධම්මො දෙසිතො නො සඋපාදානාය?

34. තත්‍ථ නාම ත්වං මොඝපුරිස, මයා විරාගාය ධම්මෙ දෙසිතෙ සරාගාය චෙතෙස්සසි. විසංයොගාය ධම්මෙ දෙසිතෙ සංයොගාය චෙතෙස්සසි. අනුපාදානාය ධම්මෙ දෙසිතෙ සඋපාදානාය චෙතෙස්සසි.

35. නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන රාගවිරාගාය ධම්මො දෙසිතො? මදනිම්මදනාය පිපාසවිනයාය ආලයසමුග්ඝාතාය වට්ටුපච්ඡෙදාය තණ්හක්ඛයාය විරාගාය නිරොධාය නිබ්බාණාය ධම්මො දෙසිතො?

36. නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන කාමානං පහාණං අක්ඛාතං? කාමසඤ්ඤානං පරිඤ්ඤා අක්ඛාතා? කාමපිපාසානං පටිවිනයො අක්ඛාතො? කාමවිතක්කානං සමුග්ඝාතො අක්ඛාතො? කාමපරිළාහානං වූපසමො අක්ඛාතො.?"

37. "වරං තෙ මොඝපුරිස ආසිවිසස්ස ඝොරවිසස්ස මුඛෙ අඞ්ගජාතං පක්ඛිත්තං, න ත්වෙව මාතුගාමස්ස අඞ්ගජාතෙ අඞ්ගජාතං පක්ඛිත්තං. වරං තෙ මොඝපුරිස කණ්හසප්පස්ස මුඛෙ අඞ්ගජාතං පක්ඛිත්තං, න ත්වෙව මාතුගාමස්ස අඞ්ගජාතෙ අඞ්ගජාතං පක්ඛිත්තං. වරං තෙ මොඝපුරිස අඞ්ගාරකාසුයා ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය අඞ්ගජාතං පක්ඛිත්තං, න ත්වෙව මාතුගාමස්ස අඞ්ගජාතෙ අඞ්ගජාතං පක්ඛිත්තං. තං කිස්ස හෙතු? තතො නිදානං හි මොඝපුරිස මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. න ත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. ඉතොනිදානඤ්ච ඛො මොඝපුරිස කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය.

32. "හිස් පුරුෂය, නුසුදුසු වූ අනුලෝම නුවූ අයෝග්‍ය වූ ශ්‍රමණයන්ට අයත් නුවූ අකැප වූ නො කට යුත්තෙක. කෙසේ නම්, හිස් පුරුෂය, තෝ මෙසේ මැනැවින් දෙසූ ධම්විනයෙහි පැවිදි ව දිවි ඇති තාක් පිරිපුන් පිරිසිදු බඹසර හැසිරෙන්නට නො හැකි වූයෙහි ද?

33. හිස් පුරුෂය, මා විසින් නොයෙක් ලෙසින් විරාගය පිණිස දහම් දෙසන ලද්දේ නො වේ ද? සරාගය පිණිස දහම් නො දෙසන ලද්දේ නො වේ ද? විසංයෝගය පිණිස දහම් දෙසන ලද්දේ නො වේ ද? සංයෝගය පිණිස දහම් නො දෙසන ලද්දේ නො වේ ද? අනුපාදනය පිණිස දහම් දෙසන ලද්දේ නො වේ ද? සඋපාදනය පිණිස දහම් නො දෙසන ලද්දේ නො වේ ද?

34. හිස් පුරුෂය, එහි තෝ මා විසින් විරාගය පිණිස ධම්ය දෙසූ කල්හි සරාගය පිණිස උත්සාහ කෙළෙහි ය. විසංයෝගය පිණිස ධම්ය දෙසූ කල්හි සංයෝගය පිණිස උත්සාහ කෙළෙහි ය. අනුපාදනය පිණිස ධම්ය දෙසූ කල්හි සඋපාදනය පිණිස උත්සාහ කෙළෙහි ය.

35. හිස් පුරුෂය, මා විසින් නොයෙක් ලෙසින් රාගවිරාගය පිණිස ධම්ය දේශනා කරණ ලද්දේ නො වේ ද? මදනිම්මදනය පිණිස, පිපාසාවිනය පිණිස, ආලයසමුග්ඝාතය පිණිස, වට්ටූපච්ඡේදය පිණිස, තෘෂ්ණාක්ෂය පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, නිර්වාණය පිණිස, ධම්ය දේශනා කරණ ලද්දේ නො වේ ද?

36. හිස් පුරුෂය, මා විසින් නොයෙක් ලෙසින් කාමයන්ගේ ප්‍රහාණය කියන ලද්දේ නො වේ ද? කාමසංඥාවන්ගේ පරිඥාව කියන ලද්දේ නො වේ ද? කාමපිපාසවන්ගේ දුර ලීම කියන ලද්දේ නො වේ ද? කාමවිතර්කයන්ගේ නැසීම කියන ලද්දේ නො වේ ද? කාමපරිදාහයන්ගේ සංහිඳීම කියන ලද්දේ නො වේ ද?

37. "හිස් පුරුෂය, තා විසින් දරුණු විෂ ඇති ආශිවිෂයක්හුගේ මුඛයෙහි අඞ්ගජාතය බහා ලන ලද්දේ නම් මැනැවි. මාගමකගේ අඞ්ගජාතයෙහි සිය අඞ්ගජාතය බහාලන ලද්දේ නො මැනැවි. හිස් පුරුෂය, තා විසින් කෘෂ්ණසර්පයක්හුගේ මුඛයෙහි අඞ්ගජාතය බහාලන ලද්දේ නම් මැනැවි. මාගමකගේ අඞ්ගජාතයෙහි සවකීය අඞ්ගජාතය බහා ලන ලද්දේ නො මැනැවි. හිස් පුරුෂය, තා විසින් ඇවිළගත්, හාත්පසින් ඇවිළගත්, ගිනිදැල් සහිත වූ ගිනිඅඟුරුවලෙක අඞ්ගජාතය බහාලන ලද්දේ නම් මැනැවි. මාගමකගේ අඞ්ගජාතයෙහි සවකීය අඞ්ගජාතය බහාලන ලද්දේ නො මැනැවි. ඒ කවර හෙයින? යත්: හිස් පුරුෂය, එය හේතු කොට ගෙණ මරණයට හෝ පැමිණෙන්නේ ය. නැත හොත් මරණය වැනි දුකකට පැමිණෙන්නේ ය. ඒ හේතුවෙන් කා බුන් මරණින් මතු සැපයෙන් පහ වූ නරකගතියෙන් යුක්ත වූ විවශ ව පතිත වන්නා වූ නිරයට නො පැමිණෙන්නේ ය. මේ හේතුවෙන්, හිස් පුරුෂය, කා බුන් මරණින් මතු අපාය නම් වූ දුර්ගති නම් වූ විනිපාත නම් වූ නිරයට පැමිණෙන්නේ ය,

38. “තත්ථ නාම ත්වං මොඝපුරිස, යං ත්වං අසද්ධම්මං ගාමධම්මං වසලධම්මං දුට්ඨුල්ලං ඔදකන්තිකං රහස්සං ද්වයංද්වයසමාපත්තිං සමාපජ්ජිස්සසි, බහූනං ඛො ත්වං මොඝපුරිස අකුසලානං ධම්මානං ආදිකත්තා පුබ්බඞ්ගමො. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං මොඝපුරිස, අප්පසන්නානඤ්චෙව අප්පසාදාය, පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා”ති.

39. අථ ඛො භගවා ආයස්මන්තං සුදින්නං අනෙකපරියායෙන විගරහිත්වා දුභරතාය දුපොසතාය මහිච්ඡතාය අසන්තුට්ඨිතාය[1] සඞ්ගණිකාය කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා අනෙකපරියායෙන සුභරතාය සුපොසතාය අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

40. “තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**“යො පන භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, පාරාජිකො හොති අසංවාසො”ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති]

**සුදින්නභාණවාරො නිට්ඨිතො.**

---

1 අසන්තුට්ඨතාය. ස්‍යා

38. "හිස් පුරුෂය, ඒ මෙබඳු වූ සාවද්‍යකර්මයෙහි තෝ නීචජනයන්ගේ ස්වභාවයක් වූ, ගම්වැස්සන්ගේ ස්වභාවයක් වූ, ලාමකපුරුෂයන්ගේ ස්වභාවයක් වූ, රාගාදි කෙලෙසුන්ගෙන් දූෂිත වූ, දියකිස අවසන් කොට ඇති, රහසේ කට යුතු වූ, දෙදෙනෙකුන් දෙදෙනෙකුන් විසින් සමවැද්ද යුතු වූ මෛථුන ධර්මයට සමවන්නෙහි ය. හිස් පුරුෂය, තෝ බොහෝ දෙනා අතුරෙන් අකුශල ධර්මයන්ට ආදිකර්තෘ වෙහි. පූර්වඞ්ගම වෙහි. හිස් පුරුෂය, මෙය නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. පැහැදුනවුන්ගේ වැඩියක් පැහැදීම පිණිස හෝ නො වෙයි. වැලිදු, හිස් පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ නො පැහැදීම පිණිස ද පැහැදුනා වූ ඇතැමුන්ගේ අන්‍යථාභාවය පිණිස ද වේ."

39. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සුදින්නහට නොයෙක් ක්‍රමයෙන් ගර්හා කොට (තමන් විසින් ද අනුන් විසින් ද) දුර්භරභාවයෙහි ද දුක සේ පෝෂණය කට හැකි බව්හි ද, මහත් ආශා ඇති බව්හි ද, ලද දෑයෙකින් සතුටු නො වීමෙහි ද, ගණසමූහයා කෙරෙහි ඇලීමෙහි ද, කුසීත බවෙහි ද අගුණ වදරා, නොයෙක් ක්‍රමයෙන් සුභර භාවයෙහි ද, සුව සේ පොෂණය කට හැකි බව්හි ද, අපිස් වූවහුගේ ද, ලද දෑයෙකින් සතුටු වන්නහුගේ ද, කෙලෙස් සිඳ ලන්නහුගේ ද, කෙලෙස් කම්පිත කළහුගේ ද, ප්‍රසාදය එළවන සංවරයාගේ ද, කෙලෙස් රැස් නො කිරීමෙහි ද, වීර්‍යාරම්භයෙහි ද, ගුණ වදරා, භික්ෂූන්ට එතැනට සුදුසු වූ එයට අනුලෝම වූ දැහැමි කථාවක් කොට භික්ෂූන් ඇමතූ සේක.

40. "මහණෙනි, එසේ වී නම් සඞ්ඝයාගේ හිත සුව පිණිස, සඞ්ඝයාගේ පහසු බව පිණිස, දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහය පිණිස, ප්‍රියශීල භික්ෂූන්ගේ ඵාසුවිහරණය පිණිස, මෙලොව දී පැමිණියැ හැකි දුක් දුරු කිරීම පිණිස, පරලොව දී පැමිණෙන දුක් නැසීම පිණිස, නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස, පහන් වූවන්ගේ වැඩියක් පැහැදීම පිණිස, සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස, විනයානුග්‍රහය පිණිස ය යන මේ දස හිතවිශේෂයන්ගේ නිෂ්පත්තිය පිණිස භික්ෂූන්ට සිකපදයක් පණවන්නෙමි. මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් මෙවුන්දම් සෙවනේ නම්, කෙලෙස් සතුරන් විසින් පරදවන ලද්දේ සංඝයා හා එකකර්මාදිසංවාස නැති වන බැවින් (අසංවාස සහවාස නැත්තෙක්) වේ."**

භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මෙසේත් මේ ශික්ෂාපදය පණවන ලද්දේ වෙයි.

[මුල් පැණවීමයි.]

## සුදින්න බණවර නිමි.

# මක්කටිවත්ථු

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වෙසාලියං මහාවනෙ මක්කටිං ආමිසෙන උපලාපෙත්වා තස්සා මෙථුනං ධම්මං පතිසෙවති. අථ ඛො සො භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය වෙසාලිං පිණ්ඩාය පාවිසි.

2. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ සෙනාසනචාරිකං ආහිණ්ඩන්තා යෙන තස්ස භික්ඛුනො විහාරො තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො සා මක්කටී තෙ භික්ඛූ දූරතො'ව ආගච්ඡන්තෙ. දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා තෙසං භික්ඛූනං පුරතො කටිම්පි චාලෙසි, ඡෙප්පම්පි චාලෙසි, කටිම්පි ඔඩ්ඩි, නිමිත්තම්පි අකාසි. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "නිස්සංසයං ඛො සො භික්ඛු ඉමිස්සා මක්කටියා මෙථුනං ධම්මං පටිසෙවතී"ති එකමන්තං නිලීයිංසු. අථ ඛො සො භික්ඛු වෙසාලියං පිණ්ඩාය චරිත්වා පිණ්ඩපාතං ආදාය පටික්කමි.

3. අථ ඛො සා මක්කටී යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. අථ ඛො සො භික්ඛු තං පිණ්ඩපාතං එකදෙසං භුඤ්ජිත්වා එකදෙසං තස්සා මක්කටියා අදාසි. අථ ඛො සා මක්කටී භුඤ්ජිත්වා තස්ස භික්ඛුනො කටිං ඔඩ්ඩි. අථ ඛො සො භික්ඛු තස්සා මක්කටියා මෙථුනං ධම්මං පතිසෙවති.

4. අථ ඛො තෙ භික්ඛූ තං භික්ඛුං එතදවොචුං: "නනු ආවුසො භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං. කිස්ස ත්වං ආවුසො මක්කටියා මෙථුනං ධම්මං පතිසෙවසී"ති. "සච්චං ආවුසො භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං. තඤ්ච ඛො මනුස්සිත්ථියා, නො තිරච්ඡානගතායා"ති. "නනු ආවුසො තථෙව තං හොති. අනනුච්ඡවියං ආවුසො අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං ආවුසො එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා න සක්ඛිස්සසි යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුං? නනු ආවුසො භගවතා අනෙකපරියායෙන විරාගාය ධම්මො දෙසිතො නො සරාගාය -පෙ- කාමපරිළාහානං වූපසමො අක්ඛාතො? නෙතං ආවුසො අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං ආවුසො අප්පසන්නානඤ්චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා"ති. අථ ඛො තෙ භික්ඛූ තං භික්ඛුං අනෙකපරියායෙන විගරහිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං.

# මක්කටී වත්ථුව

1. එසමයෙහි එක්තරා මහණෙක් විසල්පුර මහ වෙනෙහි වැඳිරියක ආහාරයෙන් පොළොඹවා ඇය හා මෙවුන්දම් සෙවෙ යි. ඉක්බිති ඒ මහණ තෙමේ පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ පිඬු සඳහා විසල් පුරයට පිවිසියේ ය.

2. එසමයෙහි බොහෝ භික්ෂූහු සේනාසනචාරිකාවෙහි හැසිරෙන්නෝ ඒ මහණහුගේ විහාරය වෙත පැමිණියාහු ය. ඒ වැඳිරි එන ඒ භික්ෂූන් දුර දී ම දුටුවා ය. දැක ඒ භික්ෂූන් වෙත පැමිණියා ය. පැමිණ ඒ භික්ෂූන් ඉදිරියෙහි කටිය ද සැලූ ය. නගුට ද සැලූ ය. කටිය ද නැගූ ය. (මෙවුන් දමට ගැලපෙන සේ) නිමිත්ත ද කළා ය. ඉක්බිති ඒ භික්ෂූන්ට මේ සිත විය. "නිසැක ව ම ඒ මහණ මේ වැඳිරිය සමඟ මෙවුන්දම් සෙවෙයි යනුයි" ඔහු පසෙක සැඟවුනාහු ය. ඉක්බිති ඒ මහණ තෙමේ විසල්පුරයෙහි පිඬු පිණිස හැසිර පිඬු රැගෙණ ආපසු පැමිණියේ ය.

3. ඉක්බිති ඒ වැඳිරි ඒ මහණ වෙත එළඹියා ය. ඒ මහණ තෙමේ ඒ පිණ්ඩපාතය එක් කොටසක් වළඳ එක් කොටසක් ඒ වැඳිරියට දුන. ඒ වැඳිරි එය අනුභව කොට ඒ මහණහට කටිය නැගූ ය. තෙල මහණ ඒ වැඳිරිය සමග මෙවුන්දම් සෙවෙයි.

4. එකල්හි ඒ භික්ෂූහු ඒ මහණහට මෙය කීහු: "ඇවත, භාග්‍යවතුන් වහන්සේ විසින් සික‍පදයක් පණවන ලද්දේ නො වේ ද? ඇවත, තෝ කුමක්හෙයින් වැඳිරිය සමග මෙවුන්දම් සෙවෙහි ද?" "ඇවත, සැබවා භාග්‍යවතුන් වහන්සේ විසින් සික‍පදයක් පණවන ලද්දේ වේ. හෙ ද මිනිස් මාගම් හා මෙවුන්දම ඇරැබ ය. තිරිසන් මාගම් සමග මෙවුන්දම් ඇරැබ නො වේ" ය යි ඒ මහණ කී ය. "ඇවැත්නි, එයත් එසේ ම නො වේ ද? ඇවැත්නි, නුසුදුස්සෙක. අනුලොම් නුවූවෙක. නො ගැලපෙන්නෙක. මහණුන්ට අයෝග්‍යයෙක. නො කැපයෙක. නො කටයුත්තෙක. ඇවැත්නි, කෙසේ නම් තෝ මෙසේ මැනැවින් දේශනා කරණ ලද ශාසනයෙහි පැවිදි වී දිවි ඇති තාක් පිරිපුන් පිරිසිදු කොට බඹසර හැසිරෙන්නට නො හැකි වූයෙහි ද? ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් විරාගය පිණිස ධර්මය දේශනා කරණ ලද්දේ නො වේ ද? සරාගය පිණිස නො දෙසන ලද්දේ නො වේ ද? ... කාම පරිදාහයන්ගේ සංසිඳීම වදාරණ ලද්දේ නො වේ ද? ඇවැත්නි, මෙය නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ පැහැදුනවුන්ගේ වැඩියක් පැහැදීම පිණිස හෝ නො වෙයි. ඇවැත්නි, තව ද මෙය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස ද පැහැදුනා වූ ඇතැමුන්ගේ අන්‍යථාභාවය පිණිස ද වේ" යනු යි. ඉක්බිති ඒ භික්ෂූහු ඒ මහණහට නොයෙක් ලෙසින් ගරහා භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළාහු ය.

5. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා තං භික්ඛුං පටිපුච්ඡි: “සච්චං කිර ත්වං භික්ඛු මක්කටියා මෙථුනං ධම්මං පටිසෙවසී?”ති “සච්චං භගවා.” විගරහි බුද්ධො භගවා:

“අනනුච්ඡවිකං මොඝපුරිස, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා න සක්ඛිස්සසි යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුං? නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන විරාගාය ධම්මො දෙසිතො නො සරාගාය -පෙ- කාමපරිළාහානං වූපසමො අක්ඛාතො?.

6. වරං තෙ මොඝපුරිස, ආසීවිසස්ස ඝොරවිසස්ස මුඛෙ අඞ්ගජාතං පක්ඛිත්තං න ත්වෙව මක්කටියා අඞ්ගජාතෙ අඞ්ගජාතං පක්ඛිත්තං. වරං තෙ මොඝපුරිස කණ්හසප්පස්ස මුඛෙ අඞ්ගජාතං පක්ඛිත්තං, න ත්වෙව මක්කටියා අඞ්ගජාතෙ අඞ්ගජාතං පක්ඛිත්තං. වරං තෙ මොඝපුරිස, අඞ්ගාරකාසුයා ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය අඞ්ගජාතං පක්ඛිත්තං, න ත්වෙව මක්කටියා අඞ්ගජාතෙ අඞ්ගජාතං පක්ඛිත්තං. තං කිස්ස හෙතු? තතො නිදානං හි මොඝපුරිස, මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං, න ත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප-පජ්ජෙය්‍ය. ඉතො නිදානඤ්ච ඛො මොඝපුරිස, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය.

7. තත්ථ නාම ත්වං මොඝපුරිස, යං ත්වං අසද්ධම්මං ගාමධම්මං වසලධම්මං දුට්ඨුල්ලං ඔදකන්තිකං රහස්සං ද්වයංද්වයසමාපත්තිං සමාපජ්ජිස්සසි, නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං මොඝපුරිස, අප්පසන්නානඤ්චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා”ති.

8. අථ ඛො භගවා තං භික්ඛුං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය දුප්පොසතාය මහිච්ඡතාය අසන්තුට්ඨිතාය සඞ්ගණිකාය කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා අනෙකපරියායෙන සුභරතාය සුපොසතාය අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිකං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා "සැබෑ ද මහණ, තෝ වැඳිරියක සමඟ මෛථුන්දම් සෙවෙහි ද?" යි ඒ මහණ පුළුවුත් සේක. "සැබව, භාග්‍යවතුන් වහන්ස" යි එ මහණ කී ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගර්හා කළසේක:

"හිස් පුරුෂය, නුසුදුස්සෙක. අනුලෝම නො වූවෙක. නො ගැළපෙන්නෙක. මහණුන්ට යෝග්‍ය නුවූවෙක. නො කැපයෙක. නො කටයුත්තෙක. හිස් පුරුෂය, කෙසේ නම් තෝ මෙසේ මැනවින් දෙසන ලද ශාසනයෙහි පැවිදි වී දිවි ඇති තාක් පිරිපුන් පිරිසිදු කොට මගබඹසර හැසිරෙන්නට නො හැකි වූයෙහි ද? හිස් පුරුෂය, මා විසින් නොයෙක් ලෙසින් විරාගය පිණිස ධර්මය දේශනා කරණ ලද්දේ නො වේ ද? සරාගය පිණිස දහම් නො දෙසන ලද්දේ නො වේ ද? ... කාමපරිදාහයන්ගේ සංසිඳීම කියන ලද්දේ නො වේ ද?

6. හිස් පුරුෂය, දරුණු විෂ ඇති ආශිවිෂයක්හුගේ මුඛයෙහි සවකීය අඞ්ගජාතය බහාලන ලද්දේ නම් මැනැවි. වැඳිරියගේ අඞ්ගජාතයෙහි සවකීය අඞ්ගජාතය බහාලන ලද්දේ නො මැනැවි. හිස් පුරුෂය, කෘෂ්ණ සර්පයක්හුගේ මුඛයෙහි සවකීය අඞ්ගජාතය බහා ලන ලද්දේ මැනැවි. වැඳිරියගේ අඞ්ගජාතයෙහි සවකීය අඞ්ගජාතය බහාලන ලද්දේ නො මැනැවි. හිස් පුරුෂය, ඇවිලගත්, හාත්පසින් ඇවිලගත්, ගිනිදැල් සහිත වූ අඟුරුවළෙක සවකීය අඞ්ගජාතය බහාලන ලද්දේ මැනැවි. වැඳිරියගේ අඞ්ගජාතයෙහි සවකීය අඞ්ගජාතය බහා ලන ලද්දේ නො මැනැවි. ඒ කවර හෙයින? යත්: හිස් පුරුෂය, ඒ හේතුවෙන් මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණය වැනි දුකකට හෝ පැමිණෙන්නේ ය. ඒ හේතුවෙන් කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුගති වූ විවස ව පතිත වන්නා වූ නිරයට නො පැමිණෙන්නේ ය. හිස් පුරුෂය, මේ හේතුවෙන් කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ විවස ව පතිත වන නිරයට පැමිණෙන්නේ ය.

7. හිස් පුරුෂය, මෙහි තෝ මෙබඳු වූ අසද්ධර්මයෙහි, ගම්වැසියන්ගේ සවභාවයක් වූ, නීචජනයන්ගේ සවභාවයක් වූ, ලාමක පුරුෂයන්ගේ සවභාවයක් වූ, රාගාදි කෙලෙසින් දූෂිත වූ, දියකිස අවසන් කොට ඇත්තා වූ, රහසේ කටයුතු වූ, දෙදෙනෙකුන් දෙදෙනකුන්ගේ සම්වැදීමක් වූ, යම් මෛථුන්දම් සෙවීමකට සමවන්නෙහි ද, හිස් පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස ද පැහැදුනවුන්ගේ වැඩියක් පැහැදීම පිණිස ද නො වෙයි. හිස් පුරුෂය, වැලිදු මෙය නො පැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස ද, පැහැදුනා වූ ඇතැමුන්ගේ අන්‍යථාත්වය පිණිස ද වෙයි".

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහට නොයෙක් ලෙසින් ගරහා දුභර බව්හි ද, දුකසේ පෝෂණය කට හැකි බව්හි ද, මහත් ආශා ඇති බව්හි ද ලද දෙයකින් සතුටු නො වීමෙහි ද, සමූහයා කෙරෙහි ඇලීමෙහි ද, කුසීත බව්හි ද අගුණ වදරා, නොයෙක් කරුණින් සුභර බව්හි ද, සුවසේ පෝෂණය කටහැකි බව්හි ද, අපිස් බව්හි ද, සතොස් බව්හි ද, සැහැල්ලු බව්හි ද, සංලෙඛයෙහි ද, ප්‍රසාද එළවීමෙහි ද, කෙලෙස් සංසිඳුවීමෙහි ද, වීර්‍ය්‍යාරම්භයෙහි ද ගුණ වදරා, භික්ෂූන්ට එතැනට සුදුසු වූ ද, එයට අනුලෝම වූ ද, දැහැමි කථාවක් කොට භික්ෂූන් ඇමතූ සේක:

9. ‘‘තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**‘‘යො පන භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය අන්තමසො තිරච්ඡානගතායපි, පාරාජිකො හොති අසංවාසො’’ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[දුතියපඤ්ඤත්ති]

## මක්කටිවත්ථු නිට්ඨිතං.

---

## සන්ථතභාණවාරො

1. තෙන ඛො පන සමයෙන සම්බහුලා වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ යාවදත්ථං භුඤ්ජිංසු, යාවදත්ථං සුපිංසු, යාවදත්ථං නහායිංසු. යාවදත්ථං භුඤ්ජිත්වා, යාවදත්ථං සුපිත්වා, යාවදත්ථං නහායිත්වා, අයොනිසො මනසි කරිත්වා, සික්ඛං අපච්චක්ඛාය, දුබ්බල්‍යං අනාවිකත්වා, මෙථුනං ධම්මං පටිසෙවිංසු. තෙ අපරෙන සමයෙන ඤාතිව්‍යසනෙනපි ඵුට්ඨා, භොගව්‍යසනෙනපි ඵුට්ඨා, රොග-ව්‍යසනෙනපි ඵුට්ඨා ආයස්මන්තං ආනන්දං උපසඞ්කමිත්වා එවං වදන්ති: ‘‘න මයං භන්තෙ ආනන්ද, බුද්ධගරහිනො න ධම්මගරහිනො න සඞ්ඝගරහිනො. අත්ත-ගරහිනො මයං භන්තෙ ආනන්ද, අනඤ්ඤගරහිනො. මයමෙවම්හා අලක්ඛිකා මයං අප්පපුඤ්ඤා යෙ මයං එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා නාසක්ඛිම්හ යාවජීවං පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරිතුං. ඉදානි චෙ’පි මයං භන්තෙ ආනන්ද, ලභෙය්‍යාම භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යාම උපසම්පදං. ඉදානි’පි මයං විපස්සකා කුසලානං ධම්මානං පුබ්බරත්තාපරරත්තං බොධපක්ඛි-යානං ධම්මානං භාවනානුයොගමනුයුත්තා විහරෙය්‍යාම. සාධු භන්තෙ ආනන්ද, භගවතො එතමත්ථං ආරොචෙහී’’ති. ‘‘එවමාවුසො’’ති ඛො ආයස්මා ආනන්දො වෙසාලිකානං වජ්ජිපුත්තකානං පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙසි.

9. "මහණෙනි, එසේ වී නම් සඞ්ඝයාගේ හිත සුව පිණිස, සඞ්ඝයාගේ පහසුව පිණිස, දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහය පිණිස, ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස, මෙලොව දී විය හැකි විපත් දුරු කිරීම පිණිස, පරලොව දී වන දුක් නැසීම පිණිස, නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස, පහන් වූවන්ගේ වැඩියක් පැහැදීම පිණිස, සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස, විනයානුග්‍රහය පිණිස, භික්ෂූන්ට සික‍්ඛාපදයක් පණවන්නෙමි. මහණෙනි, මෙසේ මේ සික‍්ඛාපදය උදෙසවු:

**"යම් මහණෙක් යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක් හා ද මෙවුන්දම් සෙවියේ නම්, කෙලෙස් සතුරන් විසින් පරදවන ලද්දේ, සංඝයා හා සමාන සංවාස රහිතයෙක් වේ".**

භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මෙසේත් මේ සික‍්ඛාපදය පණවන ලද්දේ වෙයි.

**[දෙවැනි පැණවීම යි]**

## මක්කටී වස්තුව නිමි.

---

## සන්ථත බණවර

1. එසමයෙහි විසල්පුර වැසි බොහෝ **වජ්ජිපුත්‍ර** භික්ෂූහු රිසි තාක් වැළඳුවාහු ය. රිසි තාක් ශයනය කළාහු ය. රිසි තාක් නැවාහු ය. රිසි තාක් අනුභව කොට, රිසි තාක් ශයනය කොට, රිසි තාක් නා, නුනුවණින් මෙනෙහි කොට, පාතිමොක්ඛසංවර සඞ්ඛ්‍යාත ශික්ෂාව පිළිකෙව් නො කොට, සාජීවයෙහි දුබල බව පහළ නො කොට, මෙවුන්දම් සෙවියාහු ය. ඒ භික්ෂූහු පසු කාලයෙහි ඥාතිව්‍යසනයෙන් ද පහස්නා ලද්දාහු, භෝගව්‍යසනයෙන් ද පහස්නා ලද්දාහු, රෝගව්‍යසනයෙන් ද පහස්නා ලද්දාහු, ආයුෂ්මත් ආනන්ද තෙරුන් කරා එළඹ මෙසේ කියත්: "වහන්ස, ආනන්ද ස්ථවිරයෙනි, අපි බුදුරජුන්ට දෙස් නො කියන්නමෝ වමු. ධර්මයට දෙස් නොකියන්නමෝ වමු. සඞ්ඝයාට දෙස් නොකියන්නමෝ වමු. වහන්ස, ආනන්ද ස්ථවිරයෙනි, අපි තමන්ට ම ගර්හා කරන්නමෝ වමු. අපි මෙරමා ගරහන්නමෝ නො වමු. යම්බඳු වූ අපි මෙසේ මැනැවින් දෙසූ ශාසනයෙහි පැවිදි ව දිවි ඇති තාක් පිරිපුන් පිරිසිදු මගබඹසර හැසිරෙන්නට නො හැක්කමෝ වූමු ද, ඒ අපි ම කාලකණ්ණී වමු. අපි ම මඳ පිණැත්තමෝ වමු. වහන්ස, ආනන්ද ස්ථවිරයෙනි, ඉදින් දූනුදු අපි භාග්‍යවතුන් වහන්සේ ලඟ පැවිද්ද ලබන්නමු නම් උපසම්පදාව ලබන්නමු නම් යෙහෙක. දූනුත් අපි මහද්ගත කුශල ධර්මයන් විදර්ශනා වශයෙන් වඩන්නමෝ පෙර යම් හා පැසුළු යම බෝධිපාක්ෂික ධර්ම වැඩීමෙහි එක්වන් යෙදුනමෝ ව වාසය කරන්නමු. වහන්ස, ආනන්ද ස්ථවිරයෙනි, භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැළ කරන්නහු නම් යෙහෙකි" යනු යි "ඇවැත්නි, එසේ යැ"යි වදරා ආයුෂ්මත් වූ ආනන්ද ස්ථවිර තෙමේ විසල් පුරවැසි වජ්ජිපුත්‍රක භික්ෂූන්ට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ එපවත් සැළ කෙළේ ය.

2. "අට්ඨානමෙතං ආනන්ද, අනවකාසො, යං තථාගතො වජ්ජීනං වා වජ්ජිපුත්තකානං වා කාරණා සාවකානං පාරාජිකං සික්ඛාපදං පඤ්ඤත්තං සමූහනෙය්‍යා"ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: යො පන භික්ඛවෙ භික්ඛු සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවති, සො ආගතො න උපසම්පාදෙතබ්බො. යො ච ඛො භික්ඛවෙ භික්ඛු සික්ඛං පච්චක්ඛාය දුබ්බල්‍යං ආවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවති, සො ආගතො උපසම්පාදෙතබ්බො. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ":

**3. "යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය අන්තමසො තිරච්ඡානගතායපි, පාරාජිකො හොති අසංවාසො"ති.**

**[තතියපඤ්ඤත්ති]**

**4. යො පනාති** - යො යාදිසො යථායුත්තො යථාජච්චො යථානාමො යථාගොත්තො යථාසීලො යථාවිහාරී යථාගොචරො ථෙරො වා නවො වා මජ්ඣිමො වා එසො වුච්චති 'යො පනා'ති.

5. **භික්ඛූති**-භික්ඛකො'ති භික්ඛු, භික්ඛාචරියං අජ්ඣුපගතො'ති භික්ඛු, භින්නපටධරො'ති භික්ඛු, සමඤ්ඤාය භික්ඛු, පටිඤ්ඤාය භික්ඛු, එහි භික්ඛූ'ති භික්ඛු, තීහි සරණගමනෙහි උපසම්පන්නො'ති භික්ඛු, භද්‍රො භික්ඛු, සාරො භික්ඛු, සෙඛො භික්ඛු, අසෙඛො භික්ඛු, සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො'ති. භික්ඛු. තත්‍රය්වායං භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො, අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො 'භික්ඛූ'ති.

6. **සික්ඛාති** - තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. තත්‍ර යායං අධිසීලසික්ඛා අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා 'සික්ඛා'ති.

7. **සාජීවං නාම** - යං භගවතා පඤ්ඤත්තං සික්ඛාපදං, එතං සාජීවං නාම. තස්මිං සික්ඛති තෙන වුච්චති **සාජීවසමාපන්නො'ති.**

2 "ආනන්දය, තථාගත තෙමේ සව්වත්ට පණවන ලද පරිජි සිකපදය වජ්ජීන් හෝ වජ්ජිපුත්‍රයන් හෝ නිසා උදුරා ලන්නේ ය" යන යමක් වේ ද, මෙය විද්‍යමාන නො වෙයි. එයට අවකාශයක් ද නැතැ"යි වදාළසේක. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, යම් මහණෙක් තෙමේ ශික්ෂාව ප්‍රතික්ෂෙප නො කොට, දුබල බව පළ නො කොට, මෙවුන්දම් සේවනය කෙරේ ද, හෙතෙමේ නැවත පැමිණියේ ද උපසපන් නො කටයුතු යි. මහණෙනි, යම් මහණෙක් තෙමේ ශික්ෂාව ප්‍රතික්ෂේප කොට, දුබල බව පළ කොට, මෙවුන්දම් සේවනය කෙරේ ද, හෙතෙමේ පැමිණියේ උපසපන් කටයුතු යි. මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

3. **"යම් කිසි මහණෙක් භික්ෂූන්ගේ අධිශීල සංඛ්‍යාත ශික්ෂාවට හා ප්‍රඥප්ත ශික්ෂාපද සංඛ්‍යාත සාජීවයට පැමිණියේ, පාතිමොක්ඛසංවර සංඛ්‍යාත ශික්ෂාව ප්‍රතික්ෂේප නො කොට, සාජීවයෙහි දුබලබව පළ නො කොට, යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක් හා ද මෙවුන්දම් සෙවියේ නම්, කෙලෙස් සතුරන් විසින් පරදවන ලද්දේ පිරෙවි මහණුන් හා සමානසංවාස නැති බැවින් අසංවාස වේ".**

### තෙවැනි පැණවීමයි.

4. **යො පන** යනු: යම්බඳු, යම්, යම් ක්‍රියාවක යෙදුනු, යම්බඳු ජාති ඇති, යම්බඳු නම් ඇති, යම්බඳු ගොත් ඇති, යම්බඳු ස්වභාව ඇති, යම්බඳු විහරණ ඇති, යම්බඳු පැවතුම් ඇති ස්ථවිර වූවෙක් හෝ නවක වූවෙක් හෝ මජ්ඣිමයෙක් හෝ වේ ද, මෙ තෙමේ 'යො පන'යි කියනු ලැබේ.

5 **භික්ඛු** යනු: සිඟා යන්නේ නු යි භික්ඛු නම්. භික්ෂාචාරයට පැමිණියේ නු යි භික්ඛු නම්. බුන් වත් දරු නු යි භික්ඛු නම්. ව්‍යවහාර මාත්‍රයෙන් කිසිවෙක් භික්ඛු නම් වේ. ප්‍රතිඥාමාත්‍රයෙන් කිසිවෙක් භික්ඛු නම්. 'එහි භික්ඛු' යන්නෙන් භික්ෂු භාවය ලැබී නු යි භික්ඛු නම්. ත්‍රිසරණගමනයෙන් උපසපන් වූයේ නු යි භික්ඛු නම්. භද්‍ර වූ ශීලාදි පංච ධර්මයන්ගෙන් යුක්ත වූයේ නු යි භික්ඛු නම්. ශීලසාරාදියෙන් ම යුක්ත නු යි භික්ඛු නම්. භික්මේ නු යි භික්ඛු නම්. භික්මීම අවසන් කෙලේ නු යි භික්ඛු නම්. සමග වූ සඟන විසින් අකොප්‍ය වූ ශාසනයට සුදුසු වූ ඥප්තිචතුර්ථ කර්මයෙන් උපසපන් කරණ ලද්දේ නු යි භික්ඛු නම්. එහි යම් ඒ මහණෙක් සමග්‍ර සඞ්ඝයා විසින් අකොප්‍ය වූ ශාසනයට සුදුසු වූ ඥප්තිචතුර්ථ කර්මයෙන් උපසපන් කරණ ලද්දේ වේ ද මේ තෙමේ මේ අර්ථයෙහි භික්ඛු ය යි අදහස් කරණ ලද්දේ ය.

6. **සික්ඛා** යනු: අධිසීල සික්ඛා ය, අධිචිත්ත සික්ඛා ය, අධිපඤ්ඤා සික්ඛා ය යි ශික්ෂා තුණෙකි. මේ ත්‍රිවිධ ශික්ෂාවන් අතුරෙන් යම් මේ අධිසීල-ශික්ෂාවක් වේ ද මෝ තොමෝ මෙහි ලා සික්ඛා ය යි අදහස් කරණ ලදු.

7. **සාජීව** නම්: භාග්‍යවතුන් වහන්සේ විසින් පණවන ලද යම් සිකපදයක් වේ ද, මෙය සාජීව නම්. එහි හික්මෙයි. එහෙයින් සාජීව සමාපන්න ය යි කියනු ලැබේ.

8. **සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා**'ති – අත්ථි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා. අත්ථි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච පච්චක්ඛාතා.

9. කථඤ්ච භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා? ඉධ භික්ඛවෙ භික්ඛු උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො උපාසකභාවං පත්ථයමානො ආරාමිකභාවං පත්ථයමානො සාමණෙරභාවං පත්ථයමානො තිත්ථියභාවං පත්ථයමානො තිත්ථියසාවකභාවං පත්ථයමානො අස්සමණභාවං පත්ථයමානො අසක්‍යපුත්තියභාවං පත්ථයමානො 'යන්නූනාහං බුද්ධං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

10. අථ වා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො -පෙ- අසක්‍යපුත්තියභාවං පත්ථයමානො 'යන්නූනාහං ධම්මං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති -පෙ- 'යන්නූනාහං සඞ්ඝං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං සික්ඛං පච්චක්ඛෙය්‍යන්ති' වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං විනයං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං පාතිමොක්ඛං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං උද්දෙසං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං උපජ්ඣායං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං ආචරියං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං සද්ධිවිහාරිකං පච්චක්ඛෙය්‍යය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං අන්තෙවාසිකං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං සමානුපජ්ඣායකං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං සමානාචරියකං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං සබ්‍රහ්මචාරිං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං ගිහී අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං උපාසකො අස්සන්ති' වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං ආරාමිකො අස්සන්ති' වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං සාමණෙරො අස්සන්ති' වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං තිත්ථියො අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං තිත්ථියසාවකො අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං අස්සමණො අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, -- 'යන්නූනාහං අසක්‍යපුත්තියො අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

8. **සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා** යන මෙහි – 'මහණෙනි, දුබලබව හෙළි කිරීම නම් වේ, එහෙත් ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාත නො වේ, යන මෙය ඇත. 'මහණෙනි, දුබල බව හෙළි කිරීමත් වේ. එසේම ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාතත් වේ' යන මෙය ද ඇත.

9. මහණෙනි, 'දුබලබව හෙළි කිරීම නම් වේ. එහෙත් ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාත නො වේ' යන මෙය කෙසේ ද? යත්: මහණෙනි, මෙහි මහණෙක් පැවිද්දෙහි කලකිරුණේ, පැවිද්දෙහි නො ඇලුනේ, මහණුවමින් පහ වනු කැමැත්තේ, මහණුවමින් තමා පෙළුනකු මෙන් කොට පවත්වන්නේ, භික්‍ෂුභාවයෙන් ලජ්ජිත වන්නේ, මහණදම පිළිකුල් කරන්නේ, ගිහිබව පතන්නේ, උවසුබව පතන්නේ, ආරාමික බව පතන්නේ, හෙරණ බව පතන්නේ, තීර්‍ථික බව පතන්නේ, තීර්‍ථකශ්‍රාවක බව පතන්නේ, අශ්‍රමණ බව පතන්නේ, අශාක්‍යපුත්‍රීය බව පතන්නේ, 'මම බුදු රජුන් පිළිකෙව් කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද, හඟවා ද, මහණෙනි, මෙසේත් දුබල බව පහළ කිරීම වෙයි. වැලි දු ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාත (පියන ලද්දේ) නො වෙයි.

10: තව ද උකටලී වූයේ නො ඇලුනේ මහණුවමින් පහ වනු කැමැත්තේ, මහණුවමින් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ ... අශාක්‍යපුත්‍රීය බව පතන්නේ, 'මම ධර්‍මය ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙක'යි කියා ද හඟවා ද; ... 'මම සඞ්ඝයා ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම ශික්‍ෂාව ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම විනය ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම ප්‍රාතිමොක්‍ෂය ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම උදෙසීම ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම උපාධ්‍යායන් වහන්සේ ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම ආචාර්‍ය්‍යයන් වහන්සේ ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම සද්ධිවිහාරිකයා ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; .. 'මම අතෑවැස්සා ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම සමානොපාධ්‍යායයන් ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම සමානාචාර්‍ය්‍යයන් ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම සබ්‍රහමචාරීන් ප්‍රතික්‍ෂිප්ත කරන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම ගිහි වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම උවසුවෙක් වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම ආරාමිකයෙක් වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද. ... 'මම හෙරණෙක් වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම තොටු-වෙක් වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම තොටුසව්වෙක් වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම අශ්‍රමණයෙක් වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; ... 'මම අශාක්‍යපුත්‍රීයයෙක් වන්නෙම් නම් යෙහෙකැ'යි කියා ද හඟවා ද; මහණෙනි, මෙසේත් දුබල බව පහළ කිරීම වෙයි. වැලි දු ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාත නො වෙයි.

11. අථ වා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො -පෙ- අසක්‍යපුත්තියභාවං පත්ථයමානො 'යදි පනාහං බුද්ධං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති -පෙ- 'යදි පනාහං අසක්‍යපුත්තියො අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මං චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

12. අථවා පන -පෙ- 'අපාහං බුද්ධං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති -පෙ- 'අපාහං අසක්‍යපුත්තියො අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මං චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

13. අථ වා පන -පෙ- 'හන්දාහං බුද්ධං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති -පෙ- 'හන්දාහං අසක්‍යපුත්තියො අස්ස'න්ති, වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මං චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

14. අථ වා පන -පෙ- 'හොති මෙ බුද්ධං පච්චක්ඛෙය්‍ය'න්ති වදති විඤ්ඤාපෙති -පෙ- 'හොති මෙ අසක්‍යපුත්තියො අස්ස'න්ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්ඤෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

15. අථවා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො -පෙ- අසක්‍යපුත්තියභාවං පත්ථයමානො 'මාතරං සරාමී'ති වදති විඤ්ඤාපෙති -පෙ- 'පිතරං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'භාතරං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'භගිනිං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'පුත්තං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'ධීතරං සරාමී'ති වදති විඤ්ඤාපෙති, 'පජාපතිං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'ඤාතකෙ සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'මිත්තෙ සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'ගාමං සරාමී'ති වදති විඤ්ඤාපෙති, --'නිගමං සරාමී'ති වදති විඤ්ඤාපෙති ,-- 'ඛෙත්තං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'වත්ථුං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'හිරඤ්ඤං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සුවණ්ණං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සිප්පං සරාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'පුබ්බෙ හසිතං ලපිතං කීළිතං සමනුස්සරාමී'ති වදති විඤ්ඤාපෙති, -පෙ- එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්ඤෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

16. අථවා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො -පෙ- අසක්‍යපුත්තියභාවං පත්ථයමානො 'මාතා මෙ අත්ථි. සා මයා පොසෙතබ්බා'ති වදති විඤ්ඤාපෙති, -- 'පිතා මෙ අත්ථි සො මයා පොසෙතබ්බො'ති වදති විඤ්ඤාපෙති, -- 'භාතා මෙ අත්ථි. සො මයා පොසෙතබ්බො'ති වදති විඤ්ඤාපෙති, -- 'භගිනී මෙ අත්ථි සා මයා පොසෙතබ්බා'ති වදති විඤ්ඤාපෙති,-- පුත්තො මෙ අත්ථි. සො මයා පොසෙතබ්බො'ති වදති විඤ්ඤාපෙති, -- 'ධීතා මෙ අත්ථි. සා මයා පොසෙතබ්බා'ති වදති විඤ්ඤාපෙති, -- 'පජාපතී මෙ අත්ථි. සා මයා පොසෙතබ්බා'ති වදති විඤ්ඤාපෙති, -- 'ඤාතකා මෙ අත්ථි. තෙ මයා පොසෙතබ්බා'ති වදති විඤ්ඤාපෙති, -- 'මිත්තා මෙ අත්ථි. තෙ මයා පොසෙතබ්බා'ති වදති විඤ්ඤාපෙති, -පෙ- එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්ඤෙව හොති, සික්ඛා ච අපච්චක්ඛාතා.

11. නැත හොත් උකටලී වූයේ, නො ඇලුනේ, මහණබැවින් මිදෙනු කැමැත්තේ, භික්ෂු භාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, ජුගුප්සිත වන්නේ, ගිහි බව පතන්නේ, ... අශාක්‍යපුත්‍රීය බව පතන්නේ, මහණ තෙමේ 'ඉදින් මම බුදුරජුන් ප්‍රතික්ෂෙප කරන්නෙම් නම්'යි කියා ද හඟවා ද ... 'ඉදින් මම අශාක්‍යපුත්‍රීයයෙක් වන්නෙම් නම්'යි කියා ද හඟවා ද, ... 'මහණෙනි, මෙසේත් දුර්වල බව ප්‍රකාශ කිරීම වෙයි. එහෙත් ශික්ෂාව ප්‍රතික්ෂිප්ත (පිළිකෙව් කළා) නො වෙයි.

12. තව ද ... 'මම ඒකාන්තයෙන් බුදුරජුන් ප්‍රතික්ෂිප්ත කරන්නෙම් නම්'යි කියා ද හඟවා ද ... 'මම ඒකාන්තයෙන් අශාක්‍යපුත්‍රීයයෙක් වන්නෙම් නම්'යි කියා ද හඟවා ද 'මහණෙනි, මෙසේත් දුර්වල බව හෙළි කිරීම වෙයි. එහෙත් ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො කළා වෙයි

13. නැවත ද ... 'මම බුදුරදුන් ප්‍රතික්ෂිප්ත කරන්නෙම්'යි කියා ද හඟවා ද ... 'මම අශාක්‍යපුත්‍රීයයෙක් නමුදු වන්නෙම්'යි කියා ද හඟවා ද, මෙසේත් මහණෙනි, දුර්වල බව ප්‍රකාශ කිරීම වෙයි. එහෙත් ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි.

14. වැලිදු ... 'බුදුරදුන් ප්‍රතික්ෂිප්ත කරන්නෙමියි මට අදහස් වෙයි' කියා ද හඟවා ද ... 'අශාක්‍යපුත්‍රීයයෙක් වන්නෙමි යි මට අදහස් වෙයි' කියා ද හඟවා ද, මෙසේත් මහණෙනි, දුර්වල බව ප්‍රකාශ කිරීම වෙයි, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි.

15. තව ද උකටලී වූයේ, නො ඇලුනේ, මහණුවමින් මිදෙනු කැමැත්තේ, භික්ෂුභාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ ... අශාක්‍යපුත්‍රීය බව පතන්නේ, 'මව සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'පියා සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'බෑයා සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'නැඟනියන් සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'පුතු සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'දුව සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'බිරිය සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'නෑයන් සිහි කරමි'යි කියා ද හඟවා ද; ... මිතුරන් සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'ගම සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'නියම් ගම සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'කෙත සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'වත්ත සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'අමුරන් සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'රන් සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'ශිල්පය සිහි කරමි'යි කියා ද හඟවා ද; ... 'පෙර කළ සිනා, කී වචන, කළ ක්‍රීඩා සිහි කරමි'යි කියා ද හඟවා ද, 'මහණෙනි, මෙසේත් දුබල බව හෙළි කිරීම වෙයි. එහෙත් ශික්ෂාව පිළිකෙව් කළා නො වෙයි.

16. නැත හොත්, උකටලී වූයේ, නො ඇලුනේ, මහණුවමින් මිදෙනු කැමැත්තේ, භික්ෂුභාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ ... අශාක්‍යපුත්‍රීය බව පතන්නේ 'මාගේ මවු ඇත. මා විසින් ඕ තොමෝ පෝෂණය කටයුත්තී ය'යි කියා ද හඟවා ද, ... 'මාගේ පියා ඇත. මා විසින් හේ පෝෂණය කටයුත්තේ ය'යි කියා ද හඟවා ද, ...' මාගේ බෑයා ඇත. මා විසින් හේ පෝෂණය කටයුත්තේ ය'යි කියා ද හඟවා ද, ... 'මාගේ නගක් ඇත. මා විසින් ඕ පෝෂණය කටයුත්තී ය'යි කියා ද හඟවා ද, ... 'මාගේ පුතෙක් ඇත. හේ මා විසින් පෝෂණය කට-යුත්තේ ය'යි කියා ද හඟවා ද; ... 'මාගේ දුවක් ඇත. මා විසින් ඕ පෝෂණය කටයුත්තී ය'යි කියා ද හඟවා ද; ... 'මාගේ බිරිය ඇත. මා විසින් ඕ පෝෂණය කටයුත්තී ය'යි කියා ද හඟවා ද; ... මාගේ නෑයෝ ඇත. මා විසින් ඔහු පෝෂණය කටයුත්තාහ'යි කියා ද හඟවා ද; ... මාගේ මිත්‍රයෝ ඇත. මා විසින් ඔහු පෝෂණය කටයුත්තාහ'යි කියා ද හඟවා ද; ... මහණෙනි, මෙසේත් දුර්වල බව හෙළි කිරීම වෙයි. එහෙත් ශික්ෂාව පිළිකෙව් නො කළා වෙයි.

17. අථ වා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො --පෙ-- අස්සක්‍යපුත්තියභාවං පත්ථයමානො 'මාතා මේ අත්ථි. සා මං පොසෙස්සතී'ති වදති විඤ්ඤාපෙති, --- 'පිතා මෙ අත්ථි සො මං පොසෙස්සතී'ති වදති විඤ්ඤාපෙති, --- 'භාතා මෙ අත්ථි සො මං පොසෙස්සතී'ති වදති විඤ්ඤාපෙති, --- භගිනී මෙ අත්ථි සා මං පොසෙස්සතී'ති වදති විඤ්ඤාපෙති, --- 'පුත්තො මෙ අත්ථි සො මං පොසෙස්සතී'ති වදති විඤ්ඤාපෙති, --- 'ධීතා මෙ අත්ථි සා මං පොසෙස්සතී'ති වදති විඤ්ඤාපෙති, --- 'පජාපතී මෙ අත්ථි සා මං පොසෙස්සතී'ති වදති විඤ්ඤාපෙති, ---'ඤාතකා මෙ අත්ථි තෙ මං පොසෙස්සන්තී'ති වදති විඤ්ඤාපෙති, --- 'මිත්තා මෙ අත්ථි තෙ මං පොසෙස්සන්තී'ති වදති විඤ්ඤාපෙති,--- 'ගාමො මෙ අත්ථි තෙනාහං ජීවිස්සාමී'ති වදති විඤ්ඤාපෙති, --- 'නිගමො මෙ අත්ථි තෙනාහං ජීවිස්සාමී'ති වදති විඤ්ඤාපෙති, --- 'ඛෙත්තං මෙ අත්ථි තෙනාහං ජීවිස්සාමී'ති වදති විඤ්ඤාපෙති, --- 'වත්ථු මෙ අත්ථි තෙනාහං ජීවිස්සාමී'ති වදති විඤ්ඤාපෙති, --- 'හිරඤ්ඤං මෙ අත්ථි තෙනාහං ජීවිස්සාමි'ති වදති විඤ්ඤාපෙති, ---'සුවණ්ණං මෙ අත්ථි තෙනාහං ජීවිස්සාමී'ති වදති විඤ්ඤාපෙති, -පෙ- 'සිප්පං මෙ අත්ථි තෙනාහං ජීවිස්සාමී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

18. අථ වා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො -පෙ- අස්සක්‍යපුත්තියභාවං පත්ථයමානො 'දුක්කර'න්ති වදති විඤ්ඤාපෙති --- 'න සුකර'න්ති වදති විඤ්ඤාපෙති, 'දුච්චර'න්ති වදති විඤ්ඤාපෙති, --- 'න සුචර'න්ති වදති විඤ්ඤාපෙති, --- 'න උස්සහාමී'ති වදති විඤ්ඤාපෙති, --- 'න විසහාමී'ති වදති විඤ්ඤාපෙති, --- 'න රමාමී'ති වදති විඤ්ඤාපෙති, -පෙ- 'න අභිරමාමී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි ඛො භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච අපච්චක්ඛාතා.

---

19. කථඤ්ච භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච පච්චක්ඛාතා? ඉධ භික්ඛවෙ භික්ඛු උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො -පෙ- අස්සක්‍යපුත්තියභාවං පත්ථයමානො 'බුද්ධං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච පච්චක්ඛාතා.

17. නැත හොත්, උකටලිවූයේ, නො ඇලුනේ, මහණබැවින් මිදෙනු කැමැත්තේ, භික්‍ෂුභාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ...අශාක්‍යපුත්‍රීය බව පතන්නේ, 'මාගේ මවු ඇත. ඕතොමෝ මා පෝෂණය කරන්නී ය' යි කියා ද, හඟවා ද; ... 'මගේ පියා ඇත. හේ මා පෝෂණය කරන්නේ ය' යි කියා ද, හඟවා ද; ... මාගේ බෑයා ඇත. හේ මා පෝෂණය කරන්නේ ය'යි කියා ද, හඟවා ද; ... මාගේ නගෙක් ඇත. ඕ මා පෝෂණය කරන්නී ය' යි කියා ද, හඟවා ද; ... 'මාගේ පුත්‍රයා ඇත. හේ මා පෝෂණය කරන්නේ ය' යි කියා ද, හඟවා ද; ... 'මාගේ දුව ඇත. ඕ මා පෝෂණය කරන්නී ය' යි කියා ද, හඟවා ද; ... 'මාගේ බිරිය ඇත. ඕ මා පෝෂණය කරන්නී ය' යි කියා ද, හඟවා ද; ... 'මාගේ නෑයෝ ඇත. ඔහු මා පෝෂණය කරන්නාහු' යි කියා ද, හඟවා ද; ... 'මාගේ මිතුරෝ ඇත. ඔහු මා පෝෂණය කරන්නාහු යි' කියා ද, හඟවා ද; ... 'මාගේ ගමෙක් ඇත. එයින් මම ජීවත් වන්නෙමි' යි කියා ද, හඟවා ද; ... 'නියම්ගමෙක් ඇත. මම එයින් ජීවත්-වන්නෙමි'යි කියා ද, හඟවා ද; ...'මාගේ කෙතෙක් ඇත. මම එයින් ජීවත්වන්-නෙමි'යි කියා ද, හඟවා ද; ... 'මාගේ වත්තෙක් ඇත. මම එයින් ජීවත් වන් නෙමි'යි කියා ද, හඟවා ද; මගේ අමුරත් ඇත. මම එයින් ජීවත්වන්නෙමි'යි කියාද හඟවා ද; ... 'මාගේ රත්රන් ඇත. 'එයින් ජීවත් වන්නෙමි'යි කියා ද, හඟවා ද; ... 'මා දත් ශිල්පයෙක් ඇත. එයින් මම ජීවත් වන්නෙමි'යි කියා ද, හඟවා ද; මහණෙනි, මෙසේත් දුර්වල බව හෙළි කිරීම වේ. එහෙත් ශික්‍ෂාව පිළිකෙව් නොකළා වෙයි.

18. නැත හොත් උකටලි වූයේ, නො ඇලුනේ, මහණබැවින් මිදෙනු කැමැත්තේ, භික්‍ෂුභාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ ... අශාක්‍යපුත්‍රීය බව පතන්නේ, '(එක් වේලක් වැළඳීම් ආදිය) දුෂ්කරය'යි කියා ද, හඟවා ද; ... නැත හොත් 'නො පහසු ය'යි කියාද, හඟවාද; ... මහණදම දුශ්චර ය'යි කියා ද, හඟවාද, ... 'මහණදම් සුචර නො වේය' යි කියා ද, හඟවා ද; ... 'උත්සාහ නො කරමි' යි කියා ද, හඟවා ද; ... 'නො ඉවසමි'යි කියා ද, හඟවා ද; ... 'නො ඇලෙමි'යි කියා ද, හඟවා ද; ... 'දැඩි ව නො ඇලෙමි'යි කියා ද, හඟවා ද; .. මහණෙනි, මෙසේත් දුබල බව හෙළි කිරීම වෙයි. එහෙත් ශික්‍ෂාව පිළිකෙව් නො කළා වෙයි.

---

19. මහණෙනි, කෙසේ නම් දුබල බව හෙළි කිරීමත් ශික්‍ෂාව ප්‍රතික්‍ෂෙප කරණ ලද්දේත් වේ ද? මහණෙනි, මෙහි මහණෙක් උකටලි වූයේ, නො ඇලුනේ, මහණකමින් මිදෙනු කැමැත්තේ, භික්‍ෂුභාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහිබව පතන්නේ ... අශාක්‍යපුත්‍රීය භාවය පතන්නේ, 'බුදුරදුන් ප්‍රතික්‍ෂෙප කරමි' කියා ද, හඟවා ද, මහණෙනි, මෙසේත් දුබල බව හෙළි කිරීම වෙයි. ශික්‍ෂාව ද පිළිකෙව් කළා වෙයි.

20. අථ වා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො -පෙ- අසක්‍යපුත්තියභාවං පත්ථයමානො 'ධම්මං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සඞ්ඝං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සික්ඛං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'විනයං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'පාතිමොක්ඛං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'උද්දෙසං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'උපජ්ඣායං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'ආචරියං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සද්ධිවිහාරිකං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'අන්තෙවාසිකං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සමානුපජ්ඣායකං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සමානාචරියකං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'සබ්‍රහ්මචාරිං පච්චක්ඛාමී'ති වදති විඤ්ඤාපෙති, -- 'ගිහී ති මං ධාරෙහී'ති වදති විඤ්ඤාපෙති, -- 'උපාසකො ති මං ධාරෙහීති' වදති විඤ්ඤාපෙති, -- 'ආරාමිකො ති මං ධාරෙහී'ති වදති විඤ්ඤාපෙති, -- 'සාමණෙරො ති මං ධාරෙහී'ති වදති විඤ්ඤාපෙති, -- 'තිත්ථියො ති මං ධාරෙහී'ති වදති විඤ්ඤාපෙති, -- 'තිත්ථියසාවකො ති මං ධාරෙහී'ති වදති විඤ්ඤාපෙති, -- 'අස්සමණොති මං ධාරෙහී'ති වදති විඤ්ඤාපෙති, -පෙ- 'අසක්‍යපුත්තීයො ති මං ධාරෙහී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච පච්චක්ඛාතා.

21. අථ වා පන උක්කණ්ඨිතො අනභිරතො සාමඤ්ඤා චවිතුකාමො භික්ඛුභාවං අට්ටීයමානො හරායමානො ජිගුච්ඡමානො ගිහිභාවං පත්ථයමානො- -පෙ- අසක්‍යපුත්තියභාවං පත්ථයමානො 'අලං මෙ බුද්ධෙනා'ති වදති විඤ්ඤාපෙති, -පෙ- 'අලං මෙ සබ්‍රහ්මචාරීහී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි -පෙ- සික්ඛා ච පච්චක්ඛාතා.

22. අථ වා පන -පෙ- 'කින්නු මෙ බුද්ධෙනා'ති වදති විඤ්ඤාපෙති, -පෙ- 'කින්නු මෙ සබ්‍රහ්මචාරීහී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි -පෙ- සික්ඛා ච පච්චක්ඛාතා.

23. අථ වා පන -පෙ- 'න මමත්ථො බුද්ධෙනා'ති වදති විඤ්ඤාපෙති, -පෙ- 'නමමත්ථො සබ්‍රහ්මචාරීහී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි -පෙ-. සික්ඛා ච පච්චක්ඛාතා.

24. අථ වා පන -පෙ- 'සුමුත්තො හං බුද්ධෙනා'ති වදති විඤ්ඤාපෙති, -පෙ- 'සුමුත්තො හං සබ්‍රහ්මචාරීහී'ති වදති විඤ්ඤාපෙති, එවම්පි භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච පච්චක්ඛාතා.

25. යානි වා පනඤ්ඤානි'පි අත්ථි බුද්ධවෙවචනානි වා ධම්මවෙවචනානි වා සඞ්ඝවෙවචනානි වා සික්ඛාවෙවචනානි වා විනයවෙවචනානි වා පාතිමොක්ඛවෙවචනානි වා උද්දෙසවෙවචනානි වා උපජ්ඣායවෙවචනානි වා ආචරියවෙවචනානි වා සද්ධිවිහාරිකවෙවචනානි වා අන්තෙවාසික-වෙවචනානි වා සමානුපජ්ඣායකවෙවචනානි වා සමානාචරියකවෙවචනානි වා සබ්‍රහ්මචාරිවෙවචනානි වා ගිහීවෙවචනානි වා උපාසකවෙවචනානි වා ආරාමිකවෙවචනානි වා සාමණෙරවෙවචනානි වා තිත්ථියවෙවචනානි වා තිත්ථියසාවකවෙවචනානි වා අස්සමණවෙවචනානි වා අසක්‍යපුත්තිය-වෙවචනානි වා තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි වදති විඤ්ඤාපෙති, එවං ඛො භික්ඛවෙ දුබ්බල්‍යාවිකම්මඤ්චෙව හොති සික්ඛා ච පච්චක්ඛාතා.

20. උකටලී වූයේ, නො ඇලුනේ මහණබැවින් මිදෙනු කැමැත්තේ, භික්ෂුභාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහි බව පතන්නේ ... අශාක්‍යපුත්‍රීය භාවය පතන්නේ, 'ධර්මය ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'සඞ්ඝයා ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'ශික්ෂාව ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'විනය ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද ... 'ප්‍රාතිමෝක්ෂය ප්‍රතික්ෂේප කරමි'යි කියාද, හඟවාද; ... 'උදෙසීම ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'උපාධ්‍යායයන් වහන්සේ ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'ආචාර්‍යයන් වහන්සේ ප්‍රතික්ෂේප කරමි' යි කියා ද, හඟවා ද; ... 'සද්ධිවිහාරිකයා ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'අතෑ වැස්සා ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'සමානෝපාධ්‍යායයා ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... සමානාචාර්‍යයා ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'සබ්‍රම්සරුනු ප්‍රතික්ෂේප කරමි'යි කියා ද, හඟවා ද; ... 'මා ගිහියෙකැයි දරව'යි කියා ද, හඟවා ද; ... මා උවසුවෙකැයි දරව' යි කියා ද, හඟවා ද; ... 'මා ආරාමිකයෙකැයි දරව'යි කියා ද, හඟවාද; ... 'මා සෙරණෙකැයි දරව' යි කියා ද, හඟවා ද; ... 'මා තොවුවෙකැයි දරව' යි කියා ද, හඟවා ද; ... 'මා තොවුසව්වෙකැයි දරව' යි කියා ද, හඟවා ද; ... 'මා අශ්‍රමණයෙකැයි දරව'යි කියා ද, හඟවා ද; ... 'මා අශාක්‍යපුත්‍රීයයෙකැයි දරව'යි කියා ද, හඟවා ද; මහණෙනි, මෙසේත් දුබල බව හෙළිකිරීම වෙයි. ශික්ෂාව ද පියන ලද්දී වෙයි.

21. නැත හොත් උකටලී වූයේ නො ඇලුනේ, මහණබැවින් මිදෙනු කැමැත්තේ, භික්ෂුභාවයෙන් පීඩිත වන්නේ, ලජ්ජිත වන්නේ, පිළිකුල් කරන්නේ, ගිහිබව පතන්නේ ... අශාක්‍යපුත්‍රීයභාවය පතන්නේ, 'මට බුදුරදුන්ගෙන් කම් නැතැ'යි කියා ද, හඟවාද; ... 'මට සබ්‍රම්සරුන්ගෙන් කම් නැතැ'යි කියා ද, හඟවා ද; ... මෙසේත් ... ශික්ෂාව ද පියන ලද්දී වෙයි.

22. නැත හොත් ... 'මට බුදුරදුන්ගෙන් කිමැ'යි කියා ද, හඟවා ද; ... 'මට සබ්‍රම්සරුන්ගෙන් කිමැ'යි කියා ද, හඟවා ද; මෙසේත් ... ශික්ෂාව ද පියන ලද්දී වෙයි

23. නැත හොත් ... 'මට බුදුරදුන්ගෙන් වැඩෙක් නැතැ'යි කියා ද, හඟවා ද; ... 'මට සබ්‍රම්සරුන්ගෙන් වැඩෙක් නැතැ'යි කියා ද, හඟවා ද; මෙසේත් ... ශික්ෂාව ද පියන ලද්දී වෙයි.

24. නැත හොත් ... 'මම බුදුරදුන්ගෙන් මොනවට මිදුනෙමි'යි කියා ද, හඟවා ද; ... 'මම සබ්‍රම්සරුන්ගෙන් මොනවට මිදුනෙමි'යි කියා ද, හඟවා ද; මෙසේත් මහණෙනි, දුබල බව හෙළිකිරීම වෙයි. ශික්ෂාව ද පියන ලද්දී වෙයි.

25. යම් අන්‍ය වූ බුද්ධපර්‍යායය වචනයෝ හෝ ධර්මපර්‍යායය වචනයෝ හෝ, සඞ්ඝපර්‍යායය වචනයෝ හෝ, ශික්ෂාපර්‍යායය වචනයෝ හෝ, විනය-පර්‍යායය වචනයෝ හෝ, ප්‍රාතිමොක්ෂපර්‍යායය වචනයෝ හෝ, උද්දෙශ-පර්‍යායය වචනයෝ හෝ, උපාධ්‍යායපර්‍යායය වචනයෝ හෝ, ආචාර්‍යපර්‍යායය වචනයෝ හෝ, සද්ධිවිහාරික පර්‍යායය වචනයෝ හෝ, අන්තෙවාසික පර්‍යායය වචනයෝ හෝ; සමානඋපාධ්‍යාය පර්‍යායය වචනයෝ හෝ, සමානා-චාර්‍යපර්‍යායය වචනයෝ හෝ, සබ්‍රහමචාරිපර්‍යායය වචනයෝ හෝ, ගෘහි-පර්‍යායය වචනයෝ හෝ, උපාසකපර්‍යායය වචනයෝ හෝ, ආරාමිකපර්‍යායය වචනයෝ හෝ, ශ්‍රාමණෙරපර්‍යායය වචනයෝ හෝ, තීර්ථිකපර්‍යායය වචනයෝ හෝ, තීර්ථිකශ්‍රාවක පර්‍යායය වචනයෝ හෝ, අශ්‍රමණපර්‍යායය වචනයෝ හෝ, අශාක්‍යපුත්‍රීයපර්‍යායය වචනයෝ හෝ වෙද්ද, ඒ අයුරින්, ඒ ලකුණෙන් ඒ නිමිත්තෙන් කියා ද, හඟවා ද; මහණෙනි, මෙසේත් දුබල බව හෙළිකිරීම වෙයි. ශික්ෂාව ද පියන ලද්දී වෙයි.

26. කථඤ්ච භික්ඛවෙ අපච්චක්ඛාතා හොති සික්ඛා? ඉධ භික්ඛවෙ යෙහි ආකාරෙහි යෙහි ලිඞ්ගෙහි යෙහි නිමිත්තෙහි සික්ඛා පච්චක්ඛාතා හොති, තෙහි ආකාරෙහි තෙහි ලිඞ්ගෙහි තෙහි නිමිත්තෙහි උම්මත්තකො සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. උම්මත්තකස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. ඛිත්තචිත්තො සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. ඛිත්තචිත්තස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. වෙදනට්ටො සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. වෙදනට්ටස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. දෙවතාය සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතාහොති සික්ඛා තිරච්ඡානගතස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, අපපච්චක්ඛාතා හොති සික්ඛා. අරියකෙන මිලක්ඛස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, සො ච න පටිවිජානාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. මිලක්ඛකෙන අරියකස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, සො ච න පටිවිජානාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. අරියකෙන අරියකස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, සො ච න පටිවිජානාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. මිලක්ඛකෙන මිලක්ඛකස්ස සන්තිකෙ සික්ඛං පච්චක්ඛාති, සො ච න පටිවිජානාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. දවාය සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. රවාය සික්ඛං පච්චක්ඛාති, අපච්චක්ඛාතා හොති සික්ඛා. අසාවෙතුකාමො සාවෙති, අපච්චක්ඛාතා හොති සික්ඛා. සාවෙතුකාමො න සාවෙති, අපච්චක්ඛාතා හොති සික්ඛා. අවිඤ්ඤුස්ස සාවෙති, අපච්චක්ඛාතා හොති සික්ඛා. විඤ්ඤුස්ස න සාවෙති, අපච්චක්ඛාතා හොති සික්ඛා. සබ්බසො වා පන න සාවෙති, අපච්චක්ඛාතා හොති සික්ඛා. එවං ඛො භික්ඛවෙ අපච්චක්ඛාතා හොති සික්ඛා.

27. **මෙථුනධම්මො** නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො දුට්ඨුල්ලං ඔදකන්තිකං රහස්සං ද්වයංද්වයසමාපත්ති, එසො මෙථුනධම්මො නාම.

28. **පටිසෙවති** නාම: යො නිමිත්තෙන නිමිත්තං අඞ්ගජාතෙන අඞ්ගජාතං අන්තමසො තිලඵලමත්තම්පි පවෙසෙති, එසො පටිසෙවති නාම.

29. **අන්තමසො තිරච්ඡානගතායපී** ති– තිරච්ඡානගතිත්ථියාපි මෙථුනං ධම්මං පටිසෙවිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො, පගෙව මනුස්සිත්ථියා. තෙන වුච්චති 'අන්තමසො තිරච්ඡානගතායපී'ති.

26. **මහණෙනි**, කෙසේ නම් ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වේ ද? මහණෙනි, මෙහි යම් අයුරින්, යම් ලකුණෙන්, යම් නිමිත්තෙන් ශික්ෂාව ප්‍රතික්ෂිප්ත වේ ද, ඒ අයුරින් ඒ ලකුණින් ඒ නිමිත්තෙන් උමතුවෙක් තෙමේ ශික්ෂාව ප්‍රතික්ෂෙප කරයි නම් ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. උමතුවකු හමුවෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. ඛේදයට පැමිණි සිත් ඇත්තේ ශික්ෂාව ප්‍රතික්ෂේප කරයි ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. ඛේදයට පැමිණි සිත් ඇත්තහු හමුවෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. වේදනාවෙන් පීඩිත තැනැත්තේ ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. වේදනාවෙන් පෙළෙනහු හමුවෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. දෙවතාවක සමීපයෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේද ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. තිරිසනකු සමීපයෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. ආර්‍යයික ව්‍යවහාරයෙන් අනාර්‍යයකු හමුවෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, හෙ තෙමේ නො දනී ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. අනාර්‍යයික ව්‍යවහාරයෙන් ආර්‍යයකු සමීපයෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, හෙ තෙමේ නො දනී ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. ආර්‍යයික ව්‍යවහාරයෙන් ආර්‍යයෙකු සමීපයෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, හෙ තෙමේ නො දනී ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. අනාර්‍යයික ව්‍යවහාරයෙන් අනාර්‍යයෙකු සමීපයෙහි ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, හෙ තෙමේ නො දනී ද ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. වහා කීමෙන් ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. පැකුළුණු බසින් ශික්ෂාව ප්‍රතික්ෂේප කෙරේ ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. නො අස්වනු කැමැත්තේ අස්වයි ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. අස්වනු කැමැත්තේ නො අස්වයි ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. කිසිවක් නො දන්නකුට අස්වයි ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. නුවණැත්තකුට නො අස්වයි ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. සියලු අයුරින් හෝ නො අස්වයි ද, ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි. **මහණෙනි**, මෙසේත් ශික්ෂාව ප්‍රතික්ෂිප්ත නො වෙයි.

27. **මෙථුනධම්ම** නම්: යම් ඒ නීච ජනයන්ගේ සවභාවයක් වේද, ගම්වැස්සන්ගේ සවභාව ධර්මයෙක් වේ ද, වසලයන්ගේ ගතියක් වේ ද, කෙලෙසුන්ගෙන් දූෂිත බවක් වේ ද, දියකිස අවසන් කොට ඇත්තක් වේ ද, රහසින් කටයුතු දෙයක් වේ ද, දෙදෙනෙකුන් දෙදෙනෙකුන් විසින් සමවැදිය යුත්තක් වේ ද, මේ (මෛථුනධම්ම) නම්.

28. **පතිසෙවති** නම්: යමෙක් තෙමේ නිමිත්තෙන් නිමිත්ත අඞ්ගජාතයෙන් අඞ්ගජාතය යටත්පිරිසෙයින් තලැටක් පමණකුදු පිවිස්වා ද **මේ පතිසෙවති** (ප්‍රතිසේවනය කෙරේ) නම් වේ.

29. **අන්තමසො තිරච්ඡානගතායපි**– යතු තිරිසන් ගිය මාගමක හා ද මෙවුන්දම් සෙවීමෙන් අශ්‍රමණයෙක් වෙයි. අශාක්‍යපුත්‍රීයයෙක් වෙයි. මිනිස් මාගමක හා මෙවුන්දම් සෙවීම ගැණ කියනුම කිම? එහෙයින් **අන්තමසො** තිරච්ඡානගතායපි' (යටත්පිරිසෙයින් තිරිසන් ගිය මාගමක හා ද) යි කියනු ලැබේ.

30. **පාරාජිකො හොති** ති- සෙය්‍යථාපි නාම පුරිසො සීසච්ඡින්නො අභබ්බො තෙන සරීරබන්ධනෙන ජීවිතුං, එවමෙව භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තෙන වුච්චති පාරාජිකො හොතීති.

31. **අසංවාසො**'ති-සංවාසො නාම එකං කම්මං එකුද්දෙසො සමසික්ඛතා. එසො සංවාසො නාම. සො තෙන සද්ධිං නත්ථි. තෙන වුච්චති අසංවාසො'ති.

32. තිස්සො ඉත්ථියො: මනුස්සිත්ථි, අමනුස්සිත්ථි, තිරච්ඡානගතිත්ථි. තයො උභතොබ්‍යඤ්ජනකා: මනුස්සුභතොබ්‍යඤ්ජනකො, අමනුස්සුභතොබ්‍යඤ්ජනකො, තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකො. තයො පණ්ඩකා: මනුස්සපණ්ඩකො අමනුස්සපණ්ඩකො, තිරච්ඡානගතපණ්ඩකො. තයො පුරිසා: මනුස්සපුරිසො අමනුස්සපුරිසො තිරච්ඡානගතපුරිසො.

33. මනුස්සිත්ථියා තයො මග්ගෙ මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස[1] ආපත්ති පාරාජිකස්ස: වච්චමග්ගෙ පස්සාවමග්ගෙ මුඛෙ. අමනුස්සිත්ථියා -පෙ- තිරච්ඡානගතිත්ථියා තයො මග්ගෙ මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස[1] ආපත්ති පාරාජිකස්ස: වච්චමග්ගෙ පස්සාවමග්ගෙ මුඛෙ. මනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- අමනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකස්ස තයො මග්ගෙ මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස[1] ආපත්ති පාරාජිකස්ස: වච්චමග්ගෙ පස්සාවමග්ගෙ මුඛෙ.

34. මනුස්සපණ්ඩකස්ස ද්වෙ මග්ගෙ මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස[1] ආපත්ති පාරාජිකස්ස: වච්චමග්ගෙ මුඛෙ. අමනුස්සපණ්ඩකස්ස -පෙ- තිරච්ඡානගතපණ්ඩකස්ස -පෙ- මනුස්සපුරිසස්ස පෙ- අමනුස්සපුරිසස්ස - පෙ - තිරච්ඡානගතපුරිසස්ස ද්වෙ මග්ගෙ මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස[1] ආපත්ති පාරාජිකස්ස: වච්චමග්ගෙ මුඛෙ.

35. භික්ඛුස්ස සෙවනචිත්තං උපට්ඨිතෙ මනුස්සිත්ථියා වච්චමග්ගං අඞ්ගජාතං පවෙසෙන්තස්ස[2] ආපත්ති පාරාජිකස්ස. භික්ඛුස්ස සෙවනචිත්තං උපට්ඨිතෙ මනුස්සිත්ථියා පස්සාවමග්ගං -පෙ- මුඛං අඞ්ගජාතං පවෙසෙන්තස්ස ආපත්ති පාරාජිකස්ස. භික්ඛුස්ස සෙවනචිත්තං උපට්ඨිතෙ අමනුස්සිත්ථියා -පෙ- තිරච්ඡානගතිත්ථියා -පෙ- මනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- අමනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකස්ස වච්චමග්ගං -පෙ- පස්සාවමග්ගං -පෙ- මුඛං අඞ්ගජාතං පවෙසෙන්තස්ස[2] ආපත්ති පාරාජිකස්ස.

36. භික්ඛුස්ස සෙවනචිත්තං උපට්ඨිතෙ මනුස්සපණ්ඩකස්ස වච්චමග්ගං -පෙ- මුඛං අඞ්ගජාතං පවෙසෙන්තස්ස[2] ආපත්ති පාරාජිකස්ස. භික්ඛුස්ස සෙවනචිත්තං උපට්ඨිතෙ අමනුස්සපණ්ඩකස්ස -පෙ- තිරච්ඡානගතපණ්ඩකස්ස -පෙ- මනුස්සපුරිසස්ස -පෙ- අමනුස්සපුරිසස්ස -පෙ- තිරච්ඡානගතපුරිසස්ස වච්චමග්ගං -පෙ- මුඛං අඞ්ගජාතං පවෙසෙන්තස්ස[2] ආපත්ති පාරාජිකස්ස.

---

1. පටිසෙවෙන්තස්ස, සී, -. 2. පවෙසන්තස්ස මජසං

30. **පාරාජිකො හොති** යනු- යම් සේ හිස සුන් පුරුෂයෙක් ඒ ශරීරබන්ධනයෙන් ජීවත් වන්නට නුසුදුස්සෙක් වේ ද, එමෙන් ම මහණ තෙමේ මෙවුන්දම් සේවනය කොට අශ්‍රමණයෙක් වෙයි, අශාක්‍යපුත්‍රියයෙක් වෙයි. එහෙයින් "පාරාජිකො හොති (පැරදුනෙක් වේ)" යි කියනු ලැබේ.

31. **අසංවාසො** යනු- සංවාස නම් එක් ව කටයුතු සංඝකම් යි. එකතු ව උදෙසීම යි. සම්ශික්ෂා ඇති බව යි. මේ සංවාස නම්. එය ඔහු සමග නැත. එහෙයින් 'අසංවාසො' යි කියනු ලැබේ.

32. මිනිස් මාගමය, නොමිනිස් මාගමය, තිරිසන් ගිය මාගම ය යි මාගම්හු තුන් දෙනෙක් වෙත්. මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනක ය, අමනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනක ය, තිරච්ඡානගත උභතොබ්‍යඤ්ජනක ය යි උභතොබ්‍යඤ්ජනකයෝ තිදෙනෙක් වෙත්. මනුෂ්‍ය පණ්ඩකය, අමනුෂ්‍ය පණ්ඩකය, තිරච්ඡානගත පණ්ඩකය යි පණ්ඩකයෝ තිදෙනෙක් වෙත්. මනුෂ්‍ය පුරුෂය අමනුෂ්‍ය පුරුෂය, තිරච්ඡානගත පුරුෂය යි පුරුෂයෝ තිදෙනෙක් වෙත්.

33. මිනිස් මාගමකගේ වසමග පසමග මුව යන තුන් මගෙහි මෙවුන්දම් සෙවුනාහට පරිජි ඇවැත් වේ. නොමිනිස් මාගමකගේ ... තිරිසන්ගිය මාගමකගේ වසමග පසමග මුව යන තුන් මගෙහි මෙවුන්දම් සෙවුනාහට පරිජි ඇවැත් වේ. මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනකයාගේ ... අමනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනකයාගේ ... තිරච්ඡානගත උභතොබ්‍යඤ්ජනකයාගේ වසමග පසමග මුව යන තුන් මගෙහි මෙවුන්දම් සෙවුනාහට පරිජි ඇවැත් වේ.

34. මනුෂ්‍ය පණ්ඩකයාගේ වසමග මුව යන දෙමගෙහි මෙවුන්දම් සෙවුනාහට පරිජි ඇවැත් වේ. අමනුෂ්‍ය පණ්ඩකයාගේ ... තිරච්ඡානගත පණ්ඩකයාගේ ... මනුෂ්‍ය පුරුෂයාගේ ... අමනුෂ්‍යපුරුෂයාගේ ... තිරච්ඡානගත පුරුෂයාගේ වසමග මුව යන දෙමගෙහි මෙවුන්දම් සෙවුනාහට පරිජි ඇවැත් වේ.

35. සේවනචිත්තය එළඹ සිටි කල්හි මිනිස් මාගමකගේ වසමගට සවකීය අඞ්ගජාතය ප්‍රවිෂ්ට කරන්නාවූ මහණහට පරිජි ඇවැත් වේ. සේවනචිත්තය එළඹ සිටි කල්හි මිනිස් මාගමකගේ පසමගට ... මුවට සවකීය අඞ්ගජාතය ප්‍රවිෂ්ට කරන්නාවූ මහණහට පරිජි ඇවැත් වේ. සේවනචිත්තය එළඹ සිටි කල්හි නොමිනිස් මාගමකගේ ... තිරිසන් ගිය මාගමකගේ ... මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනකයාගේ ... අමනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනකයාගේ ... තිරච්ඡානගත උභතොබ්‍යඤ්ජනකයාගේ වසමගට ... පසමගට ... මුවට සවකීය අඞ්ගජාතය ප්‍රවිෂ්ට කරන්නාවූ මහණහට පරිජි ඇවැත් වේ.

36. සේවනචිත්තය එළඹ සිටි කල්හි මනුෂ්‍ය පණ්ඩකයාගේ වසමගට ... මුවට සවකීය අඞ්ගජාතය ප්‍රවිෂ්ට කරන්නාවූ මහණහට පරිජි ඇවැත් වේ. සේවනචිත්තය එළඹ සිටි කල්හි අමනුෂ්‍ය පණ්ඩකයාගේ ... තිරච්ඡානගත පණ්ඩකයාගේ ... මනුෂ්‍ය පුරුෂයාගේ ... අමනුෂ්‍ය පුරුෂයාගේ ... තිරච්ඡානගත පුරුෂයාගේ වසමගට ... මුවට සවකීය අඞ්ගජාතය ප්‍රවිෂ්ට කරන්නාවූ මහණහට පරිජි ඇවැත් වේ.

37. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං භික්ඛුස්ස සන්තිකෙ[1] ආනෙත්වා වච්චමග්ගෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං භික්ඛුස්ස සන්තිකෙ[1] ආනෙත්වා වච්චමග්ගෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං න සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං න සාදියති, පවිට්ඨං න සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං න සාදියති, පවිට්ඨං න සාදියති, ඨිතං න සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං භික්ඛුස්ස සන්තිකෙ[1] ආනෙත්වා වච්චමග්ගෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං න සාදියති, පවිට්ඨං න සාදියති, ඨිතං න සාදියති, උද්ධරණං න සාදියති, අනාපත්ති.

38. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති අනාපත්ති.

39. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං ජාගරන්තිං -පෙ- සුත්තං -පෙ- මත්තං -පෙ- උම්මත්තං පෙ- පමත්තං -පෙ- මතං අක්ඛායිතං -පෙ- මතං යෙභුය්‍යෙන අක්ඛායිතං -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. -පෙ- න සාදියති අනාපත්ති.

40. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං මතං යෙභුය්‍යෙන ඛායිතං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

41. භික්ඛුපච්චත්ථිකා අමනුස්සිත්ථිං -පෙ- තිරච්ඡානගතිත්ථිං -පෙ- මනුස්සුභතොබ්‍යඤ්ජනකං -පෙ- අමනුස්සුභතොබ්‍යඤ්ජනකං -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන-පෙ- පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

42. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකං ජාගරන්තං -පෙ- සුත්තං -පෙ- මත්තං -පෙ- උම්මත්තං -පෙ- පමත්තං -පෙ- මතං අක්ඛායිතං -පෙ- මතං යෙභුය්‍යෙන අක්ඛායිතං -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. -පෙ- න සාදියති, අනාපත්ති.

---

1. සන්තිකං, මජසං ලි.

37. වෛරී භික්‍ෂූහු මිනිස් මාගමක මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් (මහණහුගේ) අඞ්ගජාතය මත හිඳුවද්දද, ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවෙශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසාද, උද්ධරණය ඉවසා ද පරිජී ඇවැත් වේ. වෛරී භික්‍ෂූහු මිනිස් මාගමක මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් (මහණහුගේ) අඞ්ගජාතය මත හිඳුවද්දද, ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවෙශය නො ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද පරිජීඇවැත් වේ. වෛරී භික්‍ෂූහු මිනිස් මාගමක මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් අඞ්ගජාතය මත හිඳුවද්දද, ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවෙශය නො ඉවසා ද, ප්‍රවිෂ්ටය නො ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද පරිජීඇවැත් වේ. වෛරී භික්‍ෂූහු මිනිස් මාගමක මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් අඞ්ගජාතය මත හිඳුවද්දද, ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවෙශය නො ඉවසා ද, ප්‍රවිෂ්ටය නො ඉවසා ද, ස්ථිතය නො ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජී ඇවැත් වේ. වෛරී භික්‍ෂූහු මිනිස් මාගමක මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් අඞ්ගජාතය මත හිඳුවද්දද, ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවෙශය නො ඉවසා ද, ප්‍රවිෂ්ටය නො ඉවසා ද, ස්ථිතය නො ඉවසා ද, උද්ධරණය නො ඉවසා ද, ඇවැත් නො වේ.

38. වෛරී භික්‍ෂූහු මිනිස් මාගමක මහණක්හුගේ සමීපයට ගෙණවුත් පසමගින් ... මුවින් අඞ්ගජාතය මත හිඳුවද්දද, ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවෙශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජී ඇවැත් වේ. වෛරී භික්‍ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

39. වෛරී භික්‍ෂූහු නිදිවරණ මිනිස් මාගමක ... නිදි ගත් ... මත් වූ ... උමතු වූ ... පමා වූ ... මළාවූ එහෙත් ක්‍ෂීණ නුවූ ... මළාවූ බොහෝ සෙයින් ක්‍ෂීණ නුවූ ඉවසා ද, ... පරිජී ඇවැත් වේ.

40. වෛරී භික්‍ෂූහු මළාවූ බොහෝ සෙයින් ක්‍ෂයට පැමිණි මිනිස් මාගමක මහණකු සමීපයට ගෙණවුත් වසමගින් ... පසමගින් ... මුවින් අඞ්ගජාතය මත හිඳුවද්දද, ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවෙශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලසිඇවැත් වේ. ... වෛරී භික්‍ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

41. වෛරී භික්‍ෂූහු නොමිනිස් මාගමක ... තිරිසන්ගිය මාගමක ... මනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනකයකු ... අමනුෂ්‍ය උභතොබ්‍යඤ්ජනකයකු ... තිරච්ඡානගත උභතොබ්‍යඤ්ජනකයකු මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් ... පසමගින් ... මුවින් අඞ්ගජාතය මත හිඳුවද්දද, හේ ඉදින් ප්‍රවෙශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජී ඇවැත් වේ. වෛරී ක්‍ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

42. වෛරී භික්‍ෂූහු ... නිදිවරණ ... නිදිගත් ... මත් වූ උමතු වූ පමා වූ මළාවූ ක්‍ෂීණ නුවූ ... මළාවූ බෙහෙවින් ක්‍ෂීණ නුවූ තිරච්ඡානගත උභතොබ්‍යඤ්ජනකයකු ... ඉවසා ද, පරිජීඇවැත් වේ. ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

43. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකං මතං යෙභුය්‍යෙන ඛායිතං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

44. භික්ඛුපච්චත්ථිකා මනුස්සපණ්ඩකං -පෙ- අමනුස්සපණ්ඩකං -පෙ- තිරච්ඡානගතපණ්ඩකං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

45. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගතපණ්ඩකං ජාගරන්තං -පෙ- සුත්තං -පෙ- මත්තං -පෙ- උම්මත්තං -පෙ- පමත්තං -පෙ- මතං අක්ඛායිතං -පෙ- මතං යෙභුය්‍යෙන අක්ඛායිතං -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. -පෙ- න සාදියති අනාපත්ති.

46. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගත පණ්ඩකං මතං යෙභුය්‍යෙන ඛායිතං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති අනාපත්ති.

47. භික්ඛුපච්චත්ථිකා මනුස්සපුරිසං -පෙ- අමනුස්සපුරිසං -පෙ- තිරච්ඡානගතපුරිසං භික්ඛුස්ස සන්තිකෙ[1] ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති අනාපත්ති.

48. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගතපුරිසං ජාගරන්තං -පෙ- සුත්තං -පෙ- මත්තං -පෙ- උම්මත්තං -පෙ- පමත්තං -පෙ- මතං අක්ඛායිතං -පෙ- මතං යෙභුය්‍යෙන අක්ඛායිතං -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. -පෙ- න සාදියති, අනාපත්ති.

49. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගත පුරිසං මතං යෙභුය්‍යෙන ඛායිතං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

50. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්ච-මග්ගෙන -පෙ- පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති, සන්ථතාය අසන්ථතස්ස -පෙ- අසන්ථතාය සන්ථතස්ස -පෙ- සන්ථතාය සන්ථතස්ස -පෙ- අසන්ථතාය අසන්ථතස්ස. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති අනාපත්ති.

1. සන්තිකං ජ. ස.

43. වෛරී භික්ෂූහු ... මළ බෙහෙවින් ක්ෂීණ වූ තිරිසන්ගිය උභතො ව්‍යඤ්ජනයකු මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් .. පසමගින් ... මුවින් අඞ්ගජාතය මතහිඳුවද්ද, හේ ඉදින් ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලැසිඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

44 වෛරී භික්ෂූහු මිනිස් පඩුවකු ... නොමිනිස් පඩුවකු ... තිරිසන් ගිය පඩුවකු මහණක්හුගේ සමීපයට ගෙණවුත් වසමගින් ... මුවෙන් අඞ්ගජාතය මත හිඳුවද්ද, හේ ඉදින් ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජිඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

45. වෛරී භික්ෂූහු ... නිදි වරණ තිරිසන්ගිය පඩුවකු ... නිදි ගත් ... මත් වූ ... උමතු වූ ... පමා වූ ... මළා වූ ක්ෂීණ නුවූ ... මළාවූ බෙහෙවින් ක්ෂීණ නුවූ... ඉවසා ද, පරිජිඇවැත් වේ. ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

46. වෛරී භික්ෂූහු ... මළාවූ බෙහෙවින් ක්ෂීණ වූ .. තිරිසන් ගිය පඩුවකු ... මහණහුගේ සමීපයට ගෙණවුත් වසමගින් ... මුවින් අඞ්ගජාතය මත හිඳුවද්ද, හේ ඉදින් ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලැසිඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

47. වෛරී භික්ෂූහු මිනිස් පිරිමියකු ... නොමිනිස් පිරිමියකු ... තිරිසන්-ගිය පිරිමියකු මහණහු වෙත ගෙණවුත් වසමගින් ... මුවෙන් අඞ්ගජාතය මත හිඳුවද්ද, හේ ඉදින් ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජිඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

48. වෛරී භික්ෂූහු ... නිදි වරණ ... නිදි ගත් ... මත් වූ ... උමතු වූ ... ... පමා වූ ... මළාවූ ක්ෂය නුවූ ... මළාවූ බෙහෙවින් ක්ෂීණ නුවූ ... තිරිසන්ගිය පිරිමියකු ... ඉවසා ද, පරිජිඇවැත් වේ. ... නො ඉවසාද, ඇවැත් නොවේ.

49. වෛරී භික්ෂූහු ... මළ බෙහෙවින් ක්ෂීණ වූ තිරිසන් ගිය පිරිමියකු මහණක්හු වෙත ගෙණවුත් වසමගින් ... මුවින් අඞ්ගජාතය මත හිඳුවද්ද, හේ ඉදින් ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලැසිඇවැත් වේ. ... වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

50. වෛරී භික්ෂූහු මිනිස් මාගමක මහණක්හු සමීපයට ගෙණවුත් වසමගින් ... පසමගින් ... මුවින් අඞ්ගජාතය මත හිඳුවද්ද, (මෙහි වස්ත්‍රාදි යමෙකින්) වැසූ වසමග ඇ මග ඇත්තියගේ වසමග ඇ මගින් මහණහුගේ (වස්ත්‍රාදි යමෙකින්) නො වැසූ අඞ්ගජාතය මත ... නො වැසූ මග ඇත්තියගේ වසමග ඇ මගින් මහණහුගේ වැසූ අංගජාතය ... වැසූ මග ඇත්තියගේ වසමග ඇ මගින් මහණහුගේ වැසූ අඞ්ගජාතය ... නො වැසූ මග ඇත්තියගේ වසමග ඇ මගින් මහණහුගේ නො වැසූ අඞ්ගජාතය මත හිඳුවද්ද, ඒ මහණ තෙමේ ඉදින් (අඞ්ගජාතයාගේ) ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජිඇවැත් වේ. වෛරී භික්ෂූහු .... නො ඉවසා ද, ඇවැත් නො වේ.

51. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං ජාගරන්තිං -පෙ- සුත්තං -පෙ- මත්තං -පෙ- උම්මත්තං -පෙ- පමත්තං -පෙ- මතං අක්ඛයිතං -පෙ- මතං යෙභුය්‍යෙන අක්ඛයිතං -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. -පෙ- න සාදියති, අනාපත්ති.

52. භික්ඛුපච්චත්ථිකා මනුස්සිත්ථිං -පෙ- අමනුස්සිත්ථිං -පෙ- තිරච්ඡානගතිත්ථිං මතං යෙභුය්‍යෙන ඛයිතං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති, සන්ථතාය අසන්ථතස්ස -පෙ- අසන්ථතාය සන්ථතස්ස -පෙ- සන්ථතාය සන්ථතස්ස -පෙ- අසන්ථතාය අසන්ථතස්ස. -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

53. භික්ඛුපච්චත්ථිකා මනුස්සුභතොබ්‍යඤ්ජනකං -පෙ- අමනුස්සුභතොබ්‍යඤ්ජනකං -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති, සන්ථතස්ස අසන්ථතස්ස -පෙ- අසන්ථතස්ස සන්ථතස්ස -පෙ- සන්ථතස්ස සන්ථතස්ස -පෙ- අසන්ථතස්ස අසන්ථතස්ස -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති අනාපත්ති.

54. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකං ජාගරන්තං -පෙ- සුත්තං -පෙ- මත්තං -පෙ- උම්මත්තං -පෙ- පමත්තං -පෙ- මතං අක්ඛයිතං -පෙ- මතං යෙභුය්‍යෙන අක්ඛයිතං -පෙ- ආපත්ති පාරාජිකස්ස.

55. භික්ඛුපච්චත්ථිකා -පෙ- මතං යෙභුය්‍යෙන ඛයිතං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- පස්සාවමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති, සන්ථතස්ස අසන්ථතස්ස -පෙ- අසන්ථතස්ස සන්ථතස්ස, -පෙ- සන්ථතස්ස සන්ථතස්ස -පෙ- අසන්ථතස්ස අසන්ථතස්ස -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

56. භික්ඛුපච්චත්ථිකා මනුස්සපණ්ඩකං -පෙ- අමනුස්සපණ්ඩකං -පෙ- තිරච්ඡානගතපණ්ඩකං -පෙ- මනුස්සපුරිසං -පෙ- අමනුස්සපුරිසං -පෙ- තිරච්ඡානගතපුරිසං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති- සන්ථතස්ස අසන්ථතස්ස- අසන්ථතස්ස සන්ථතස්ස,- සන්ථතස්ස සන්ථතස්ස- අසන්ථතස්ස අසන්ථතස්ස -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු පච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

57. භික්ඛුපච්චත්ථිකා මනුස්සපණ්ඩකං -පෙ- තිරච්ඡානගතපුරිසං ජාගරන්තං -පෙ- සුත්තං -පෙ- මත්තං -පෙ- උම්මත්තං -පෙ- පමත්තං -පෙ- මතං අක්ඛයිතං -පෙ- මතං යෙභුය්‍යෙන අක්ඛයිතං -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු පච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

51. වෛරී භික්ෂූහු නොනිදන මිනිස් මාගමක ... නිදි ගත් ... මත් වූ ... උම තු ... පමා වූ ... මල සම්භිණ තුවූ ... මල බෙහෙවින් සම්භිණ තුවූ ... පරිජිආවැත් වේ. ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

52. වෛරී භික්ෂූහු ... මල බෙහෙවින් සම්භිණ වූ මිනිස් මාගමක, ... නො මිනිස් මාගමක... තිරිසන් ගිය මාගමක මහණහු සමීපයට ගෙණවුත් වසමගින්... පසමගින්, මුවින් අඞ්ගජාතය මත හිඳුවද්ද, අතුල තැනැත්තියගේ ... නො අතුල මහණහුගේ ... නො අතුල තැනැත්තියගේ ... අතුල මහණහුගේ ... වැසූ වසමග ආදියක් ඇත්තියගේ ... වැසූ අංගජාතය ඇති මහණහුගේ ... නො වැසූ වසමග ඇත්තියගේ ... නො වැසූ අංගජාතය ඇති මහණහුගේ ... ප්‍රවේශය ... ප්‍රවිෂ්ටය ... සථිතය ... උද්ධරණය ඉදින් ඉවසා ද, ථුල්ලසිආවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

53. වෛරී භික්ෂූහු මිනිස් උභතොබ්‍යඤ්ජනකයකු...නො මිනිස් උභතො-බ්‍යඤ්ජනකයකු ... තිරිසන්ගිය උභතොබ්‍යඤ්ජනකයකු ... මහණහු සමීපයට ගෙණවුත් වසමගින්, ... පසමගින්, ... මුවින් අංගජාතය මත හිඳුවද්ද, වැහු වසමග ඇ ඇති උභතොබ්‍යඤ්ජනකයාගේ ... නො වැසූ අංගජාතය ඇති මහණහුගේ ... නො වැසූ මං ඇති උභතොබ්‍යඤ්ජනකයාගේ...වැසූ අංගජාතය ඇති මහණහුගේ ... වැසූ මං ඇති උභතොබ්‍යඤ්ජනකයාගේ...වැහු අංගජාතය ඇති මහණහුගේ ... නො වැසූ මං ඇති උභතොබ්‍යඤ්ජනකයාගේ ... නො වැසූ අංගජාතය ඇති මහණහුගේ ... ඉදින් මහණ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, සථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

54. වෛරී භික්ෂූහු නො නිදන තිරිසන්ගිය උභතොබ්‍යඤ්ජනකයකු ... නිදිගත් ... මත් වූ ... උම්තු වූ ... පමා වූ ... මල සම්භිණ තුවූ ... මල බෙහෙවින් සම්භිණ තුවූ ... ඉවසා ද, පරිජිආවැත් වේ. ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

55. වෛරී භික්ෂූහු ... මල බෙහෙවින් සම්භිණ වූ තිරිසන් ගිය උභතො-බ්‍යඤ්ජනකයකු මහණ හු සමීපයට ගෙනවුත් වසමගින් ... පසමගින් ... මුවින් අංගජාතය මත හිඳුවද්ද, වැසූ මං ඇතියහුගේ ... නො වැසූ අඞ්ගජාතය ඇති මහණහුගේ ... නො වැසූ මං ඇතියහුගේ ... වැසූ අංග ජාතය ඇති මහණහුගේ ... වැසූ මං ඇතියහුගේ ... වැසූ අංගජාතය ඇති මහණහුගේ ... නො වැසූ මං ඇතියහුගේ ... නො වැසූ අංගජාතය ඇති මහණහුගේ ... ඉදින් ඒ මහණ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, සථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලසිආවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

56. වෛරී භික්ෂූහු මිනිස් පණ්ඩකයකු, ... නොමිනිස් පණ්ඩකයකු ... තිරිසන් ගිය පණ්ඩකයකු ... මිනිස් පිරිමියකු ... නොමිනිස් පිරිමියකු ... තිරිසන්ගිය පිරිමියකු මහණකු වෙත ගෙණවුත් වසමගින් ... මුවෙන් අංගජාතය මත හිඳුවද්ද, වැසූ මං ඇති පණ්ඩකයාගේ ... නො වැසූ අංගජාතය ඇති මහණහුගේ...නො වැසූ මං ඇතියහුගේ...වැසූ අංගජාතය ඇති මහණහුගේ... වැසූ මං ඇතියහුගේ ... නො වැසූ අංගජාතය ඇති මහණහුගේ ... නො වැසූ මං ඇතියහුගේ ... නො වැසූ අංගජාතය ඇති මහණහුගේ ... ඉදින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, සථිතය ඉවසාද, උද්ධරණය ඉවසා ද, පරිජිආවැත් වේ. ... වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

57. වෛරී භික්ෂූහු නොනිදි මිනිස් පණ්ඩකයකු...තිරිසන්ගිය පිරිමියකු ... නිදිගත් ... මත් වූ ... උමතු වූ ... පමා වූ ... මලා වූ සම්භිණ තුවූ ... මලා වූ බෙහෙවින් සම්භිණ තුවූ ... ඉවසා ද, පරිජිආවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

58. භික්ඛුපච්චත්ථිකා -පෙ- තිරච්ඡානගත පුරිසං මතං යෙභුය්‍යෙන ඛයිතං භික්ඛුස්ස සන්තිකෙ ආනෙත්වා වච්චමග්ගෙන -පෙ- මුඛෙන අඞ්ගජාතං අභිනිසීදෙන්ති, සන්ථතස්ස අසන්ථතස්ස, -පෙ- අසන්ථතස්ස සන්ථතස්ස, -පෙ- සන්ථතස්ස සන්ථතස්ස, -පෙ- අසන්ථතස්ස අසන්ථතස්ස. -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

59. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං මනුස්සිත්ථියා සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- පස්සාවමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති, සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

60. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං මනුස්සිත්ථියා ජාගරන්තියා -පෙ- සුත්තාය -පෙ- මත්තාය -පෙ- උම්මත්තාය -පෙ- පමත්තාය -පෙ- මතාය අක්ඛායිතාය, -පෙ- මතාය යෙභුය්‍යෙන අක්ඛායිතාය -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු පච්චත්ථිකා භික්ඛුං -පෙ- න සාදියති, අනාපත්ති.

61. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං -පෙ- මනුස්සිත්ථියා මතාය යෙභුය්‍යෙන ඛයිතාය සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- පස්සාවමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං -පෙ- න සාදියති, අනාපත්ති.

62. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං අමනුස්සිත්ථියා -පෙ- තිරච්ඡානගතිත්ථියා -පෙ- මනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- අමනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- මනුස්සපණ්ඩකස්ස -පෙ- අමනුස්සපණ්ඩකස්ස -පෙ- තිරච්ඡානගතපණ්ඩකස්ස -පෙ- මනුස්සපුරිසස්ස -පෙ- අමනුස්සපුරිසස්ස -පෙ- තිරච්ඡානගතපුරිසස්ස සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං -පෙ- න සාදියති, අනාපත්ති.

63. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං පෙ- තිරච්ඡානගතපුරිසස්ස ජාගරන්තස්ස -පෙ- සුත්තස්ස -පෙ- මත්තස්ස -පෙ- උම්මත්තස්ස -පෙ- පමත්තස්ස -පෙ- මතස්ස අක්ඛායිතස්ස -පෙ- මතස්ස යෙභුය්‍යෙන අක්ඛායිතස්ස -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු පච්චත්ථිකා භික්ඛුං -පෙ- න සාදියති, අනාපත්ති.

64. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං -පෙ- තිරච්ඡානගතපුරිසස්ස මතස්ස යෙභුය්‍යෙන ඛයිතස්ස සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති. සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං -පෙ- න සාදියති, අනාපත්ති.

65. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං මනුස්සිත්ථියා සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- පස්සාවමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති. සන්ථතස්ස අසන්ථතාය -පෙ- අසන්ථතස්ස සන්ථතාය -පෙ- සන්ථතස්ස සන්ථතාය -පෙ- අසන්ථතස්ස අසන්ථතාය -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

58. වෛරී භික්ෂුහු ... මළ බෙහෙවින් ක්ෂීණ වූ තිරිසන් ගිය පිරිමියකුගේ සිරුරක් මහණ හු වෙත ගෙණවුත් වසමගින් ... මුවෙන් අංගජාතය මත හිඳුවද්ද, වසන ලද සිරුරේ මහණහුගේ නො වසන ලද ... නො වසන ලද සිරුරේ මහණහුගේ වසන ලද ... වසන ලද සිරුරේ මහණහුගේ වසන ලද ... නො වසන ලද සිරුරේ මහණහුගේ නො වසන ලද අංගජාතය මත හිඳුවද්ද, ... ඉදින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලාසිඇවැත් වේ. වෛරී භික්ෂුහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

59. වෛරී භික්ෂුහු මහණකු මිනිස් මාගමක වෙත ගෙණවුත් අංගජාතයෙන් වසම්හෙහි ... පසම්ගෙහි ... මුවෙහි හිඳුවද්ද, ඉදින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂුහු මහණකු ... නො ඉවසා ද. ඇවැත් නො වේ.

60. වෛරී භික්ෂුහු මහණකු නොනිදන මිනිස් මාගමක වෙත ... නිදන ... මත් වූ ... උමතු වූ ... පමා වූ ... මළ ක්ෂීණ නුවූ ... මළ බෙහෙවින් ක්ෂීණ නුවූ ... ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂුහු මහණකු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

61. වෛරී භික්ෂුහු මහණකු ... මළ බෙහෙවින් ක්ෂීණ වූ ස්ත්‍රියකගේ සම්පයට ගෙණවුත් අංගජාතයෙන් වසම්ගෙහි ... පසම්ගෙහි ... මුවෙහි හිඳුවද්ද, ඉදින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලාසිඇවැත් වේ. වෛරී භික්ෂුහු මහණකු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

62. වෛරී භික්ෂුහු මහණකු නොමිනිස් මාගමකගේ ... තිරිසන් ගිය මාගමකගේ ... මිනිස් උභතොබ්‍යඤ්ජනකයකුගේ ... නො මිනිස් උභතොබ්‍යඤ්ජනකයකුගේ ... තිරිසන්ගිය උභතොබ්‍යඤ්ජනකයකුගේ ... මිනිස් පණ්ඩකයකුගේ...නොමිනිස් පණ්ඩකයකුගේ...තිරිසන්ගිය පණ්ඩකයකුගේ... මිනිස් පිරිමියකුගේ ... නොමිනිස් පිරිමියකුගේ ... තිරිසන්ගිය පිරිමියකුගේ සම්පයට ගෙණවුත් අංගජාතයෙන් වසම්හෙහි ... මුවෙහි හිඳුවද්ද, ඉදින් මහණ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද. උද්ධරණය ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂුහු මහණකු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

63. වෛරී භික්ෂුහු මහණකු නොනිදි තිරිසන්ගිය පිරිමියකුගේ ... නිදිගත් ... මත් වූ ... උමතු වූ ... පමා වූ ... මළ ක්ෂීණ නුවූ ... මළ වූ බෙහෙවින් ක්ෂීණ නුවූ ... ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂුහු මහණකු... නො ඉවසා ද, ඇවැත් නො වේ.

64. වෛරී භික්ෂුහු මහණකු ... මළාවූ බොහෝ සෙයින් ක්ෂීණ වූ තිරිසන් ගිය පිරිමියක්හුගේ සම්පයට ගෙණවුත් අංගජාතයෙන් වසම්ගෙහි ... මුවෙහි හිඳුවද්ද, ඉදින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුල්ලාසිඇවැත් වේ. වෛරී භික්ෂුහු මහණකු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

65. වෛරී භික්ෂුහු මහණකු මිනිස් මාගමකගේ සම්පයට ගෙණවුත් අංගජාතයෙන් වසම්ගෙහි ... පසම්ගෙහි ... මුවෙහි හිඳුවද් ද, මහණහුගේ යමෙකින් වැසුනු අඞගජාතය ... නො වැසුනු තැනැත්තියගේ ... මහණහුගේ නො අතුළ ... වැසුනු තැනැත්තියගේ ... මහණහුගේ වැසුනු ... වැසුනු තැනැත්තියගේ ... මහණහුගේ නො වැසුනු අඞගජාතය ... නො වැසුනු තැනැත්තියගේ ... ඉදින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද; ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂුහු මහණකු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

66. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං මනුස්සිත්ථියා ජාගරන්තියා -පෙ- සුත්තාය -පෙ- මත්තාය -පෙ- උම්මත්තාය -පෙ- පමත්තාය -පෙ- මතාය අක්ඛායිතාය -පෙ- මතාය යෙභුය්‍යෙන අක්ඛායිතාය -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. -පෙ- නසාදියති, අනාපත්ති.

67. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං මනුස්සිත්ථියා මතාය යෙභුය්‍යෙන ඛායිතාය සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- පස්සාවමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති .සන්ථතස්ස අසන්ථතාය -පෙ- අසන්ථතස්ස සන්ථතාය, -පෙ- සන්ථතස්ස සන්ථතාය -පෙ- අසන්ථතස්ස අසන්ථතාය -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

68. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං අමනුස්සිත්ථියා -පෙ- තිරච්ඡානගතිත්ථියා -පෙ- මනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- අමනුස්සුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- තිරච්ඡානගතුභතොබ්‍යඤ්ජනකස්ස -පෙ- වච්චමග්ගං -පෙ- පස්සාවමග්ගං -පෙ- මුඛං -පෙ- මනුස්සපණ්ඩකස්ස -පෙ- අමනුස්සපණ්ඩකස්ස -පෙ- තිරච්ඡානගතපණ්ඩකස්ස -පෙ- මනුස්සපුරිසස්ස -පෙ- අමනුස්සපුරිසස්ස -පෙ- තිරච්ඡානගතපුරිසස්ස සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති සන්ථතස්ස අසන්ථතස්ස -පෙ- අසන්ථතස්ස සන්ථතස්ස -පෙ- සන්ථතස්ස සන්ථතස්ස, -පෙ- අසන්ථතස්ස අසන්ථතස්ස -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති. ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති අනාපත්ති

69. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං -පෙ- තිරච්ඡානගතපුරිසස්ස ජාගරන්තස්ස -පෙ- සුත්තස්ස -පෙ- මත්තස්ස -පෙ- උම්මත්තස්ස -පෙ- පමත්තස්ස -පෙ- මතස්ස අක්ඛායිතස්ස -පෙ- මතස්ස යෙභුය්‍යෙන අක්ඛායිතස්ස -පෙ- සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

70. භික්ඛුපච්චත්ථිකා භික්ඛුං -පෙ- තිරච්ඡානගත පුරිසස්ස මතස්ස යෙභුය්‍යෙන ඛායිතස්ස සන්තිකෙ ආනෙත්වා අඞ්ගජාතෙන වච්චමග්ගං -පෙ- මුඛං අභිනිසීදෙන්ති. සන්ථතස්ස අසන්ථතස්ස -පෙ- අසන්ථතස්ස සන්ථතස්ස -පෙ- සන්ථතස්ස සන්ථතස්ස -පෙ- අසන්ථතස්ස අසන්ථතස්ස -පෙ- සො චෙ පවෙසනං සාදියති, පවිට්ඨං සාදියති, ඨිතං සාදියති, උද්ධරණං සාදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛුපච්චත්ථිකා -පෙ- න සාදියති, අනාපත්ති.

71. රාජපච්චත්ථිකා -පෙ- චොරපච්චත්ථිකා -පෙ- ධුත්තපච්චත්ථිකා -පෙ- උප්පලගන්ධපච්චත්ථිකා -පෙ- ආපත්ති -පෙ- [1]අනාපත්ති [භික්ඛු පච්චත්ථිකෙසු විය විත්ථාරෙතබ්බං] (සත්ථතං වණ්ණිත මෙව.)

72. මග්ගෙන මග්ගං පවෙසෙති, ආපත්ති පාරාජිකස්ස. මග්ගෙන අමග්ගං පවෙසෙති, ආපත්ති පාරාජිකස්ස. අමග්ගෙන මග්ගං පවෙසෙති, ආපත්ති පාරාජිකස්ස. අමග්ගෙන අමග්ගං පවෙසෙති, ආපත්ති ථුල්ලච්චයස්ස.

66. වෛරී භික්ෂූහු මහණකු නොනිදි මිනිස් මාගසාම්ගේ ... නිදි ගත් ... මත් වූ ... උම්තු වූ ... පමා වූ ... මළා වූ ක්ෂීණ නුවූ ... මළ බෙහෙවින් ක්ෂීණ නුවූ ... ඉවසා ද, පරිජි ඇවැත් වේ. ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

67. වෛරී භික්ෂූහු මහණකුබෙහෙවින් ක්ෂීණ වූ මළ ස්ත්‍රියකගේ සමීපයට ගෙණවුත් අඞ්ගජාතයෙන් වසම්ගෙහි ... පසම්ගෙහි ... මුවෙහි හිඳුවද්ද, මහණහුගේ වස්ත්‍රාදියෙන් පිළිසත් ... මාගම්හුගේ නො පිළිසත් ... මහණහුගේ නො පිළිසත් ... මාගම්හුගේ පිළිසත් ... මහණහුගේ පිළිසත් ... මාගම්හුගේ පිළිසත් ... මහණහුගේ නො පිළිසත් ... මාගම්හුගේ නො පිළිසත් ... ඉඳින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුලැසිඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

68. වෛරී භික්ෂූහු මහණකු නොමිනිස් මාගමකගේ ... තිරිසන්ගිය මාගමකගේ ... මිනිස් දෙහදත් ඇතියකුගේ ... නොමිනිස් දෙහදත් ඇතියකුගේ ... තිරිසන් ගිය දෙහදත් ඇතියකුගේ ... මිනිස් පණ්ඩකයකුගේ... නොමිනිස් පණ්ඩකයකුගේ...තිරිසන් ගිය පණ්ඩකයකුගේ.. මිනිස් පිරිමියකුගේ නොමිනිස් පිරිමියකුගේ ... තිරිසන්ගිය පිරිමියකුගේ සමීපයට ගෙණවුත් රහසගින් වසම්ගෙහි...මුවෙහි...හිඳුවද්ද, තිරිසන් ගිය පිරිමියකුගේ පිළිසත්... මහණහුගේ නො පිළිසත් ... තිරිසන් ගිය පිරිමියකුගේ නො පිළිසත් ... මහණහුගේ පිළිසත් ... තිරිසන් ගිය පිරිමියකුගේ පිළිසත් ... මහණහුගේ පිළිසත් ... තිරිසන් ගිය පිරිමියකුගේ නො පිළිසත් ... මහණහුගේ නො පිළිසත් ... ඉඳින් හෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

69. වෛරී භික්ෂූහු මහණකු නොනිදි තිරිසන්ගිය පිරිමියකුගේ ... නිදි ගත් ... මත් වූ ... උම්තු වූ ... පමා වූ ... මළා වූ ක්ෂීණ නො වූ ... මළා වූ බෙහෙවින් ක්ෂීණ නො වූ ... ඉවසා ද, පරිජි ඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

70. වෛරී භික්ෂූහු මහණහු ... මළා වූ බෙහෙවින් ක්ෂීණ වූ තිරිසන් ගිය පිරිමියකුගේ සමීපයට ගෙණවුත් රහසගින් වසම්ගෙහි ... මුවෙහි ... හිඳුවද්ද පිළිසත් මහණහුගේ ... නො පිළිසත් තිරිසන් ගිය පිරිමියකුගේ ... නො පිළිසත් මහණහුගේ ... පිළිසත් තිරිසන් ගියහුගේ ... පිළිසත් මහණහුගේ ... පිළිසත් තිරිසන් ගියහුගේ ... නො පිළිසත් මහණහුගේ ... නො පිළිසත් ... ඉඳින් ගෙ තෙමේ ප්‍රවේශය ඉවසා ද, ප්‍රවිෂ්ටය ඉවසා ද, ස්ථිතය ඉවසා ද, උද්ධරණය ඉවසා ද, ථුලැසිඇවැත් වේ. වෛරී භික්ෂූහු ... නො ඉවසා ද, ඇවැත් නො වේ.

71. සතුරු රජවරු ... සතුරු සොරු...සතුරු ධූර්තයෝ ... බිලියම් පිණිස හදවත උපුටා ගන්නා සතුරෝ ... ඉවසා ද, ඇවැත් වේ. නො ඉවසා ද, ඇවැත් නො වේ.

[වෛරී භික්ෂූහු වාරයන්හි මෙන් විස්තර කටයුතු]. (පිළිසත්වූව වර්ණනා කරණ ලද්දේ ම ය.)

72. මගින් මග මෙහෙයා නම් පරිජි ඇවැත් වේ. මගින් නොමග මෙහෙයා නම් පරිජි ඇවැත් වේ. නොමගින් මග මෙහෙයා නම් පරිජි ඇවැත් වේ, නො මගින් නොමග මෙහෙයා නම් ථුලැසි ඇවැත් වේ,

73. භික්ඛු සුත්තභික්ඛුම්හි විප්පටිපජ්ජති, පටිබුද්ධො සාදියති, උභො නාසෙතබ්බා. පටිබුද්ධො න සාදියති, දූසකො නාසෙතබ්බො.

74. භික්ඛු සුත්තසාමණෙරම්හි විප්පටිපජ්ජති, පටිබුද්ධො සාදියති, උභො නාසෙතබ්බා. පටිබුද්ධො න සාදියති, දූසකො නාසෙතබ්බො.

75. සාමණෙරො සුත්තභික්ඛුම්හි විප්පටිපජ්ජති, පටිබුද්ධො සාදියති, උභො නාසෙතබ්බා. පටිබුද්ධො න සාදියති, දූසකො නාසෙතබ්බො.

76. සාමණෙරො සුත්තසාමණෙරම්හි විප්පටිපජ්ජති, පටිබුද්ධො සාදියති, උභො නාසෙතබ්බා. පටිබුද්ධො න සාදියති, දූසකො නාසෙතබ්බා.

77. අනාපත්ති අජානන්තස්ස අසාදියන්තස්ස උම්මත්තකස්ස ඛිත්තචිත්තස්ස වෙදනට්ටස්ස ආදිකම්මිකස්සාති.

## සත්තම භාණවාරො නිට්ඨිතො.

---

## විනීතවත්ථු

**උද්දානගාථා:**

මක්කටී වජ්ජිපුත්තා ච ගිහී නග්ගො ච තිත්ථියා,
දාරිකුප්පලවණ්ණා ච බ්‍යඤ්ජනෙහි පරෙ දුවෙ.

මාතා ධීතා භගිනී ච ජායා ච මුදුලම්බිනො,
දෙව වණ්ණාලෙපචිත්තඤ්ච දාරුධීතලිකාය ච.

සුන්දරෙන සහ පඤ්ච පඤ්ච සිවථිකට්ඨිකා,
නාගී යක්ඛී ච පෙතී ච පණ්ඩකොපහතො ඡුපෙ.

භද්දියෙ අරහං සුත්තො සාවත්ථියා චතුරො පරෙ,
වෙසාලියා තයො මල්ලා සුපිනෙ භාරුකච්ඡකො.

සුපබ්බා සද්ධා භික්ඛුනී සික්ඛමානා සාමණෙරී ච,
වෙසියා පණ්ඩකො ගිහී අඤ්ඤමඤ්ඤං බුඩ්ඪපබ්බජිතො මිගො ති.

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මක්කටියා මෙථුනං ධම්මං පටිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි. භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං. කච්චි නු ඛො අහං පාරාජිකං ආපත්තිං ආපන්නො'ති. භගවතො එතමත්ථං ආරොචෙසි. -පෙ- ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (1)

2. තෙන ඛො පන සමයෙන සම්බහුලා වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවිංසු. තෙසං කුක්කුච්චං අහොසි: භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං. කච්චි නු ඛො මයං පාරාජිකං ආපත්තිං ආපන්නා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජිකන්ති. (2)

73. මහණ තෙමේ නිදි ගත් මහණකු කෙරෙහි වරදවා පිළිපදී ද, පිබිදියේ ඉවසා නම් දෙදෙනා ම ලිඞ්ගනාසනයෙන් නැසිය යුත්තාහ. පිබිද නො ඉවසා නම් දූෂකයා ලිඞ්ගනාසනයෙන් නැසිය යුත්තේ ය.

74. මහණ තෙමේ නිදි ගත් හෙරණකු කෙරෙහි වරදවා පිළිපදී ද, පිබිදියේ ඉවසා නම් දෙදෙන ම ලිඞ්ගනාසනයෙන් නැසිය යුත්තාහ. පිබිදියේ නොඉවසා නම් දූෂකයා නැසිය යුත්තේ ය.

75. හෙරණ තෙමේ නිදි ගත් මහණහු කෙරෙහි වරදවා පිළිපදී ද, පිබිදියේ ඉවසා නම් දෙදෙනා ම නැසිය යුත්තාහ. පිබිදියේ නො ඉවසා නම් දූෂකයා ලිඞ්ගනාසනයෙන් නැසිය යුත්තේ ය.

76. හෙරණ තෙමේ නිදි ගත් හෙරණකු කෙරෙහි වරදවා පිළිපදී ද, පිබිදියේ ඉවසා නම් දෙදෙන ම නැසිය යුත්තාහ. පිබිදියේ නො ඉවසා නම් දූෂකයා නැසිය යුත්තේ ය.

77. නොදත්තහුට නොඉවසත්තහුට උම්තු වූවහුට, යක්ෂොන්මාදයෙන් උම්තු වූවහුට, වේදනාවෙන් පීඩිත වූවහුට ආදිකම්මිකයාට ඇවැත් නො වේ.

## සත්වන බණවර නිමි.

---

## විනිශ්චිත කථාවස්තු.

**උද්දාන ගාථාවෝ:**

මක්කටී වජ්ජිපුත්තක ගිහි නග්ග තිත්ථිය වස්තූහු ය,
දාරිකා උප්පලවණ්ණා වස්තු දෙක ය, අන්‍ය වූ ව්‍යඤ්ජන වස්තු
දෙක ය, (15)

මාතු දුහිතු භගිනී ජායා වස්තූහු ය, මුදුපිට්ඨී ලම්බී වස්තු දෙක ය,
වණවත්‍ථු දෙක ය, දාරුධීතලිකා වස්තුව සමග ආලෙපචිත්ත
වස්තු ය, (10)

සුන්දර වස්තුව සමග වස්තු පස හා සීවථික වස්තු පස ය, අට්ඨික-
වස්තුව ය, යක්ඛී නාගී පෙතී පණ්ඩක උපහත ඡුපිත
යන වස්තූහු ය, (17)

භද්දිය නුවර සුත්ත අරහ වස්තුව ය. අන්‍ය වූ සැවැතෙහි වස්තු
සතර ය, විසල්පුර මල්ල වස්තු තුණ ය, සුපින වස්තුව ය, භාරුකච්ඡක
වස්තුවය (10)

සුපබ්බා වස්තු නව ය, සද්ධා වස්තු නව ය, භික්ඛුණී වස්තුව ය,
සික්ඛමානා සාමණෙරී වස්තු දෙක ය,
වෙසී පණ්ඩක ගිහි වස්තු තුණ ය, අඤ්ඤමඤ්ඤ බුඩ්ඪපබ්බජිත
මිග වස්තු ය යන මොහු වෙත්. (27)

1. එ සමයෙහි එක්තරා මහණෙක් වැදිරියක හා මෙවුන්දම් සෙවී ය. “භාග්‍යවතුන්වහන්සේ විසින් සික පද පණවන ලදී. කිම, මම පරිජි ඇවැත් අවන්නෙම් දෝ?”යි ඔහුට කුකුසෙක් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කෙළේ ය. ... “මහණ තෝ පරිජි ඇවැත් අවන්නෙහි ය”. (1)

2. එ සමයෙහි විසල්පුර වැසි බොහෝ වජ්ජිපුත්තක භික්‍ෂූහු සික පිළිකෙව් නො කොට දුබල බව් පල නො කොට මෙවුන්දම් සෙවූහ. “භාග්‍යවතුන් වහන්සේ විසින් සික පදයක් පණවන ලදී. කිම, අපි පරිජි ඇවැත් අවන්නමෝ දැ?”යි ඔවුනට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහු ය. ... “මහණෙනි, තෙපි පරිජි ඇවැත් අවන්නහු ය”. (2)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු එවං මෙ අනාපත්ති භවිස්සතීති ගිහිලිඞ්ගෙන මෙථුනං ධම්මං පතිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (3)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු එවං මෙ අනාපත්ති භවිස්සතීති නග්ගො හුත්වා මෙථුනං ධම්මං පතිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (4)

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු එවං මෙ අනාපත්ති භවිස්සතීති කුසචීරං නිවාසෙත්වා -පෙ- වාකචීරං නිවාසෙත්වා -පෙ- ඵලකචීරං නිවාසෙත්වා -පෙ- කෙසකම්බලං නිවාසෙත්වා -පෙ- වාලකම්බලං නිවාසෙත්වා -පෙ- උලූකපක්ඛං නිවාසෙත්වා -පෙ- අජිනක්ඛිපං නිවාසෙත්වා මෙථුනං ධම්මං පතිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරජික"න්ති. (5-11)

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු පීඨකෙ නිපන්නං දාරිකං පස්සිත්වා සාරත්තො අඞ්ගුට්ඨං අඞ්ගජාතං පවෙසෙසි. සා කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. ආපත්ති සඞ්ඝාදිසෙසස්සා"ති. (12)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො මාණවකො උප්පලවණ්ණාය භික්ඛුනියා පටිබද්ධචිත්තො හොති. අථ ඛො සො මාණවකො උප්පලවණ්ණාය භික්ඛුනියා ගාමං පිණ්ඩාය පවිට්ඨාය කුටිකං පවිසිත්වා නිලීනො අච්ඡි. උප්පල-වණ්ණා භික්ඛුනී පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා පාදෙ පක්ඛාලෙත්වා කුටිකං පවිසිත්වා මඤ්චකෙ නිසීදි. අථ ඛො සො මාණවකො උප්පලවණ්ණං භික්ඛුනිං උග්ගහෙත්වා දූසෙසි. උප්පලවණ්ණා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "අනාපත්ති භික්ඛවෙ අසාදියන්තියා"ති. (13)

8. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ඉත්ථිලිඞ්ගං පාතුභූතං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං "අනුජානාමි භික්ඛවෙ තඤ්ඤෙව උපජ්ඣං, තමෙව උපසම්පදං, තානි වස්සානි, භික්ඛුනීහි සඞ්කමිතුං, යා ආපත්තියො භික්ඛූනං භික්ඛුනීහි සාධාරණා, තා ආපත්තියො භික්ඛුනීනං සන්තිකෙ වුට්ඨාතුං, යා ආපත්තියො භික්ඛූනං භික්ඛුනීහි අසාධාරණා, තාහි අපත්තීහි අනාපත්තී"ති. (14)

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්සා භික්ඛුනියා පුරිසලිඞ්ගං පාතුභූතං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ තඤ්ඤෙව උපජ්ඣං, තමෙව උපසම්පදං, තානි වස්සානි, භික්ඛූහි සඞ්කමිතුං, යා ආපත්තියො භික්ඛුනීනං භික්ඛූහි සාධාරණා තා ආපත්තියො භික්ඛූනං සන්තිකෙ වුට්ඨාතුං, යා ආපත්තියො භික්ඛුනීනං භික්ඛූහි අසාධාරණා, තාහි ආපත්තීහි අනාපත්තී"ති. (15)

3. එසමයෙහි එක්තරා මහණෙක් 'මෙසේ මට ඇවැත් නොවන්නේ-ය'සි ගිහි වෙසින් මෛථුන්දම් සෙවී ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ, තෝ පරිජි ඇවැත් අවන්නෙහි ය". (3)

4. එ සමයෙහි එක්තරා මහණෙක් තෙමේ 'මෙසේ මට ඇවැත් නොවන්නේය'සි නග්න ව සිවුර ඉවත ලා මෛථුන්දම් සෙවී ය. ඔහුට කුකුසෙක්විය. ... මහණ, තෝ පරිජි ඇවැත් අවන්නෙහි ය". (4)

5. එසමයෙහි එක්තරා මහණෙක් තෙමේ මෙසේ මට ඇවැත් නො වන්නේය සි කුසතණ වැහැරි හැද ... තියද වැහැරි හැද ... පුවරු සටගතින් මිසා කල වැහැරි හැද ... කෙස්වලින් කල කම්බිලි හැද ... සෙමර වලින් කල කම්බිලි හැද ... මහමුහුණු පියාපතින් කල වැහැරි හැද ... ලොම් කුර සහිත අඳුන් දිවිසම් හැද ... මෛථුන් දම් සෙවී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ තෝ පරිජි ඇවැත් අවන්නෙහි ය." (5-11)

6. එසමයෙහි එක්තරු පිණ්ඩචාරික මහණෙක් පුටුවක හොත් දැරියක් දැක කායසංසග්ගරාගයෙන් යුක්තවූයේ මාපටැඟිල්ල අංගජාතයට ප්‍රවිෂ්ට කෙළේ ය. ඕ කළුරිය කළා ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ පරිජි ඇවත් නො වේ. සඟවෙසෙස් ඇවත් වේ." (12)

7. එසමයෙහි එක්තරු මාණවකයෙක් උපුල්වන් මෙහෙණ කෙරෙහි පිළිබඳ සිත් ඇත්තේ වෙයි. ඉක්බිති ඒ මාණවක තෙමේ උපුල්වන් මෙහෙණ ගමට පිඩු පිණිස වන් කල්හි කිළියට වැද සැඟවී හුන. උපුල්වන් මෙහෙණ පසුබත් කාලයෙහි පිඩු සිඟා පෙරලා පැමිණියා පා සෝදා කිළියට පිවිස ඇඳෙහි හුන්නු ය. ඉක්බිති ඒ තරුණයා උපුල්වන් මෙහෙණ මැඩ ගෙණ දූෂණය කෙළේ ය. උපුල්වන් මෙහෙණ තෙල කරුණ භික්‍ෂුණීන්ට සැල කළා ය. භික්‍ෂුණීහු භික්‍ෂූන්ට මේ කරුණ සැල කළාහු ය. භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට එය සැළ කළාහු ය. ... "මහණෙනි, නොඉවසන්නියට ඇවැත් නො වේ." (13)

8. එසමයෙහි එක්තරු මහණකුට ස්ත්‍රීනිමිත්ත පහළ විය. භාග්‍යවතුන්-වහන්සේට මෙය සැළ කළාහුය. "මහණෙනි, එම උපාධ්‍යායයන් ද, ඒ උපසපුව ද, ඒ වස් ද, භික්‍ෂුණීන් සමග එකතු වන්නට ද, භික්‍ෂූන් පිළිබඳ භික්‍ෂුණීන් හා සාධාරණ යම් ඇවැත් වේ නම් ඒ ඇවැත් භික්‍ෂුණීන් වෙත දෙසා නැගී සිටින්ට ද අනුදනිමි. භික්‍ෂූන් පිළිබඳ භික්‍ෂුණීන් හා අසාධාරණ යම් ඇවැත් කෙනෙක් වෙත් නම් ඒ ඇවැත්වලින් ඇවැත් නො වේ." (14)

9. එසමයෙහි එක්තරු භික්‍ෂුණියකට පුරුෂනිමිත්ත පහළ විය. භාග්‍ය-භාග්‍යවතුන් වහන්සේට මෙපුවත සැළ කළාහු ය. මහණෙනි, එම උපාධ්‍යාය-යන් වහන්සේ ද, එම උපසපුව් ද, ඒ වස් ගණන ද, භික්‍ෂූන් සමග එක් වන්ට ද අනුදනිමි. භික්‍ෂුණීන් පිළිබඳ භික්‍ෂූන් හා සාධාරණ යම් ඇවැත් වේ නම් ඒ ඇවැත් භික්‍ෂූන් වෙත දෙසා නැගී සිටින්නට ද අනුදනිමි. භික්‍ෂුණීන් පිළිබඳ භික්‍ෂූන් හා අසාධාරණ යම් ඇවැත් කෙනෙක් වෙත් නම් ඒ ඇවැත්-වලින් ඇවැත් නො වේ." (15)

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු එවං මෙ අනාපත්ති භවිස්සතීති මාතුයා මෙථුනං ධම්මං පටිසෙවි -පෙ- ධීතුයා මෙථුනං ධම්මං පටිසෙවි -පෙ- භගිනියා මෙථුනං ධම්මං පටිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (16-18)

11. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පුරාණදුතියිකාය මෙථුනං ධම්මං පටිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (19)

12. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මුදුපිට්ඨිකො හොති. සො අනභිරතියා පීළිතො අත්තනො අඞ්ගජාතං මුඛෙන අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (20)

13. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ලම්බී හොති. සො අනභිරතියා පීළිතො අත්තනො අඞ්ගජාතං අත්තනො වච්චමග්ගං පවෙසෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (21)

14. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මතසරීරං[1] පස්සි. තස්මිඤ්ච සරීරෙ අඞ්ගජාතසාමන්තා වණො හොති. සො එවං මෙ අනාපත්ති භවිස්සතීති අඞ්ගජාතෙ අඞ්ගජාතං පවෙසෙත්වා වණෙන නීහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (22)

15. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මතසරීරං[1] පස්සි, තස්මිඤ්ච සරීරෙ අඞ්ගජාතසාමන්තා වණො හොති. සො එවං මෙ අනාපත්ති භවිස්සතීති වණෙ අඞ්ගජාතං පවෙසෙත්වා අඞ්ගජාතෙන නීහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (23)

16. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාරත්තො ලෙපචිත්තස්ස නිමිත්තං අඞ්ගජාතෙන ඡුපි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ-. "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (24)

17. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාරත්තො දාරුධීතලිකාය නිමිත්තං අඞ්ගජාතෙන ඡුපි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- 'අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (25)

18. තෙන ඛො පන සමයෙන සුන්දරො නාම භික්ඛු රජගහා පබ්බජිතො රථිකාය ගච්ඡති. අඤ්ඤතරා[2] ඉත්ථී "මුහුත්තං භන්තෙ ආගමෙහි වන්දිස්සාමී"ති. සා වන්දන්තී අන්තරවාසකං උක්ඛිපිත්වා මුඛෙන අඞ්ගජාතං අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "සාදියි ත්වං භික්ඛූ?"ති. "නාහං භගවා සාදියි"න්ති. "අනාපත්ති භික්ඛු අසාදියන්තස්සා"ති. (26)

19. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී භික්ඛුං පස්සිත්වා එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති. "අලං භගිනි නෙතං කප්පතීති". 'එහි භන්තෙ අහං වායමිස්සාමි, ත්වං මා වායමි. එවං තෙ අනාපත්ති භවිස්සතී"ති. සො භික්ඛු තථා අකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ-. "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (27)

1. සරීරං, සී මු. 2. ඉත්ථී තං පස්සිත්වා එතදවොච මුහුත්තං

10. එසමයෙහි එක්තරා මහණෙක් "මෙසේ මට ඇවැත් නො වන්නේ ය"යි මවු හා මෙවුන්දම් සෙවී ය. ... දුව හා මෙවුන් දම් සෙවීය. ... බිහුන හා මෙවුන්දම් සෙවී ය. ඒ මහණහට කුකුසෙක් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කෙළේ ය. ... "මහණ, තෝ පරිජිඇවැත්-අවත්තෙහි ය." (16–18)

11. එසමයෙහි එක්තරා මහණෙක් ගිහිකල අඹු වූ තෙනැත්තිය සමග මෙවුන්දම් සෙවී ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ, තෝ පරිජි ඇවැත් අවත්තෙහි" ය. (19)

12. එසමයෙහි එක්තරා මහණෙක් මොළොක් පිටු ඇත්තෙක් වෙයි. හෙ තෙමේ අනභිරතියෙන් පෙළුනේ සිය රහසඟ මුවින් ගත්තේ ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ තෝ පරිජි ඇවැත් අවත්තෙහි ය." (20)

13. එසමයෙහි එක්තරා මහණෙක් එල්බෙන රහසඟ ඇත්තේ වෙයි. හේ අනභිරතියෙන් පෙළුනේ සිය රහසඟ තමාගේ වසම්හෙහි මෙහෙයී ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ තෝ පරිජි ඇවැත් අවත්තෙහි ය." (21)

14. එසමයෙහි එක්තරා මහණෙක් මළ සිරුරක් දිටී ය. ඒ සිරුරෙහි රහසඟ අවට ව්‍රණයෙක් වෙයි. හේ 'මෙසේ මට ඇවැත් නොවන්නේ' ය යි රහසඟෙහි රහසඟ මෙහෙයා ව්‍රණයෙන් බැහැර කෙළේ ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ තෝ පරිජි ඇවැත් අවත්තෙහි ය." (22)

15. එසමයෙහි එක්තරා මහණෙක් මළ සිරුරක් දුට. ඒ සිරුරෙහි ද රහසඟ අවට ව්‍රණයෙක් වෙයි. හෙතෙමේ "මට මෙසේ ඇවැත් නො වන්නේ ය"යි ව්‍රණයෙහි අඞ්ගජාතය මෙහෙයා අඞ්ගජාතයෙන් බැහැර කෙළේ ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ තෝ පරිජි ඇවැත් අවත්තෙහි ය". (23)

16. එසමයෙහි එක්තරා මහණෙක් රාගයෙන් ඇලුනේ සිතුවම්රුවක නිමිත්ත රහසඟින් පහළේ ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ, පරිජි ඇවැත් නො වේ. දුකුළා ඇවැත් වේ." (24)

17. එසමයෙහි එක්තරා මහණෙක් රාගයෙන් ඇලුනේ දවමුවා පෙතැලි-රුවක නිමිත්ත රහසඟින් පහලේ ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. දුකුළා ඇවැත් වේ." (25)

18. එසමයෙහි රජගහනුවරින් පැවිදි වූ සුන්‍දර නම් මහණ තෙමේ වීථියෙහි යෙයි. එක්තරා ස්ත්‍රියක් "වහන්ස, මොහොතක් නවතිනු මැනව. වඳින්නෙමි"යි කීවා ය. වඳින්නී අඳනය ඔසවා රහසඟ මුවින් ගත්තී ය. ඒ මහණහට කුකුසෙක් විය .... "මහණ තෝ ඉවසූයෙහි ද"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළසේක. "භාග්‍යවතුන් වහන්ස, මම් නො ඉවසීමි"යි හේ කී ය. "මහණ නොඉවසන්නහුට ඇවැත් නො වේ." (26)

19. එසමයෙහි එක්තරා ස්ත්‍රියක් මහණකු දැක "වහන්ස එනු මැනවි. මෙවුන්දම් සෙවුව මැනව"යි මෙය කීවා ය. "නැගනියෙනි, කම් නැත. මෙය නො කැප ය"යි හේ කී ය. "වහන්ස, එනු මැනව. මම වැයම් කරන්නෙමි. ඔබ නහමක් වැයම් කරන්න. මෙසේ ඔබට ඇවැත් නො වන්නේ ය"යි ඕ කීවා ය. ඒ මහණ එසේ කෙළේ ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ තෝ පරිජිඇවැත් අවත්තෙහි ය." (27)

20. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී භික්ඛුං පස්සිත්වා එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති. අලං භගිනි නෙතං කප්පතීති. එහි භන්තෙ ත්වං වායම, අහං න වායමිස්සාමි, එවං තෙ අනාපත්ති භවිස්සතීති. සො භික්ඛු තථා අකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ-. "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (28)

21. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී භික්ඛුං පස්සිත්වා එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති. අලං භගිනි නෙතං කප්පතීති. "එහි භන්තෙ අබ්භන්තරං ඝට්ටෙත්වා බහි මොචෙහි" -පෙ-. "බහි ඝට්ටෙත්වා අබ්භන්තරං මොචෙහි, එවං තෙ අනාපත්ති භවිස්සතී"ති. සො භික්ඛු තථා අකාසි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (29, 30)

22. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සීවථිකං ගන්ත්වා අක්ඛායිතං සරීරං පස්සිත්වා තස්මිං මෙථුනං ධම්මං පටිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (31)

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සීවථිකං ගන්ත්වා යෙභුය්‍යෙන අක්ඛායිතං[1] සරීරං පස්සිත්වා තස්මිං මෙථුනං ධම්මං පටිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි – පෙ – "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (32)

24. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සීවථිකං ගන්ත්වා යෙභුය්‍යෙන ඛායිතං[2] සරීරං පස්සිත්වා තස්මිං මෙථුනං ධම්මං පටිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (33)

25. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සීවථිකං ගන්ත්වා ඡින්නසීසං පස්සිත්වා වත්තකතෙ[3] මුඛෙ ඡුපන්තං අඞ්ගජාතං පවෙසෙසි. තස්ස කුක්කුච්චං අහොසි – පෙ –. "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (34)

26. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සීවථිකං ගන්ත්වා ඡින්නසීසං පස්සිත්වා වත්තකතෙ මුඛෙ අච්ඡුපන්තං අඞ්ගජාතං පවෙසෙසි. තස්ස කුක්කුච්චං අහොසි – පෙ – "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (35)

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරිස්සා ඉත්ථියා පටිබද්ධචිත්තො හොති. සා කාලකතා සුසානෙ ඡඩ්ඩිතා. අට්ඨිකානි විප්පකිණ්ණානි හොන්ති. අථ ඛො සො භික්ඛු සීවථිකං ගන්ත්වා අට්ඨිකානි සංකඩ්ඪිත්වා නිමිත්තෙන අඞ්ගජාතං පටිපාදෙසි. තස්ස කුක්කුච්චං අහොසි. – පෙ – "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (36)

28. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු නාගියා මෙථුනං ධම්මං පටිසෙවි – පෙ – යක්ඛියා මෙථුනං ධම්මං පටිසෙවි – පෙ – පෙතියා මෙථුනං ධම්මං පටිසෙවි. – පෙ – පණ්ඩකස්ස මෙථුනං ධම්මං පටිසෙවි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (37–40)

---

1. අක්ඛායිතං. ම ඡ ස. 2 ඛායිතං. ම ඡ ස. 3. වට්ටකතෙ. ම ඡ ස.

20. එසමයෙහි එක්තරා ස්ත්‍රියක් මහණකු දැක "වහන්ස, එනු මැනව, මෙවුන්දම් සෙවුව මැනව"යි, මෙය කීවා ය. නැගනියෙනි, නුසුදුසු ය, මෙය නො කැපය"යි හේ කී ය. "වහන්ස, එනු මැනවි. මම වෑයම් නො කරන්නෙමි. ඔබ වෑයම් කරන්න. මෙසේ ඔබට ඇවැත් නො වන්නේ ය"යි ඕ කීවා ය. ඒ මහණ එසේ කෙළේ ය. ඒ මහණ හට කුකුසෙක් විය. ... "මහණ තෝ පරිජි ඇවැත් අවන්නෙහි ය." (28)

21. එසමයෙහි එක්තරා ස්ත්‍රියක් මහණකු දැක "වහන්ස, එනු මැනව, මෙවුන්දම් සෙවුව මැනව"යි මෙය කී ය. "නැගනියෙනි, නුසුදුසු ය, මෙය නො කැප ය"යි හේ කී ය. "වහන්ස, එනු මැනව, අබතුර ගවා බැහැර මුදන්න. ... බැහැර ගවා අබතුර මුදන්න. මෙසේ ඔබට ඇවැත් නො වන්නේ ය"යි ඕ කීවා ය.ඒ මහණ එසේ කෙළේ ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි ය." (29-30)

22. එසමයෙහි එක්තරා මහණෙක් සොහොනකට ගොස් නො ගෙවී ගිය සිරුරක් දැක එහි මෙවුන්දම් සෙවී ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි ය". (31)

23. එසමයෙහි එක්තරා මහණෙක් සොහොනකට ගොස් බෙහෙවින් නො ගෙවී ගිය සිරුරක් දැක එහි මෙවුන්දම් සෙවී ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි ය." (32)

24. එසමයෙහි එක්තරා මහණෙක් සොහොනකට ගොස් බෙහෙවින් ගෙවී ගිය සිරුරක් දැක එහි මෙවුන්දම් සෙවී ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. ථුලසි ඇවැත්වේ". (33)

25. එසමයෙහි එක්තරා මහණෙක් සොහොනකට ගොස් සුන් හිසක් දැක විවට මියෙහි පහසමින් රහසඟ පිවිසවී ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ, පරිජිඇවැත් අවන්නෙහි ය". (34)

26. එසමයෙහි එක්තරා මහණෙක් සොහොනකට ගොස් සුන් හිසක් දැක විවට මියෙහි නොපහසමින් රහසඟ පිවිසවී ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ". (35)

27. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා ස්ත්‍රියක කෙරෙහි පිළිබඳ සිත් ඇත්තේ වෙයි. ඕ කළුරිය කළා සොහොනෙහි බහන ලද්දී වෙයි. ඇට විසුරුණේ වෙයි. ඉක්බිති ඒ මහණ සොහොනට ගොස් ඇට රැස් කොට නිමිති සවහතින් රහසඟ මෙහෙයී ය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ, පරිජි ඇවැත් නොවේ. දුකුළා ඇවැත් වේ". (36)

28. එසමයෙහි එක්තරා මහණෙක් නැයිනියක හා මෙවුන්දම් සෙවී ය.... යකින්නක හා මෙවුන්දම් සෙවී ය. ... ප්‍රේතියක හා මෙවුන්දම් සෙවී ය. ... පණ්ඩකයකු හා මෙවුන්දම් සෙවී ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ, තෝ පරිජි ඇවැත් අවන්නෙහි ය". (37 - 40)

29. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු උපහතින්ද්‍රියො හොති. සො ‘නාහං වෙදියාමි සුඛං වා දුක්ඛං වා, අනාපත්ති මෙ භවිස්සතී’ති මෙථුනං ධම්මං පතිසෙවි – පෙ – භගවතො එතමත්ථං ආරොචෙසුං. “වෙදියි වා සො භික්ඛවෙ මොඝපුරිසො න වා වෙදියි, ආපත්ති පාරාජිකස්සා”ති. (41)

30. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථියා මෙථුනං ධම්මං පතිසෙවිස්සාමීති ඡුපිතමත්තෙ විප්පටිසාරී අහොසි. තස්ස කුක්කුච්චං අහොසි. – පෙ – “අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති සඞ්ඝාදිසෙසස්සා”ති. (42)

31. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භද්දියෙ ජාතියාවනෙ දිවාවිහාරගතො නිපන්නො හොති. තස්ස අඞ්ගමඞ්ගානි වාතුපත්ථද්ධානි හොන්ති. අඤ්ඤතරා ඉත්ථී පස්සිත්වා අඞ්ගජාතෙ අභිනිසීදිත්වා යාවදත්ථං කත්වා පක්කාමි. භික්ඛූ කිලින්නං පස්සිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං.

“පඤ්චහි භික්ඛවෙ ආකාරෙහි අඞ්ගජාතං කම්මනියං හොති: රාගෙන වච්චෙන පස්සාවෙන වාතෙන උච්චාලිඞ්ගපාණකදට්ඨෙන. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහාකාරෙහි අඞ්ගජාතං කම්මනියං හොති. අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො යං තස්ස භික්ඛුනො රාගෙන අඞ්ගජාතං කම්මනියං අස්ස. අරහං සො භික්ඛවෙ භික්ඛු. අනාපත්ති භික්ඛවෙ තස්ස භික්ඛුනො”ති. (43)

32. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාවත්ථියං අන්ධවනෙ දිවාවිහාරගතො නිපන්නො හොති. අඤ්ඤතරා ගොපාලිකා පස්සිත්වා අඞ්ගජාතෙ අභිනිසීදි. සො භික්ඛු පවෙසනං සාදියි, පවිට්ඨං සාදියි, ඨිතං සාදියි, උද්ධරණං සාදියි. තස්ස කුක්කුච්චං අහොසි –පෙ– “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික”න්ති. (44)

33. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාවත්ථියං අන්ධවනෙ දිවාවිහාරගතො නිපන්නො හොති. අඤ්ඤතරා අජපාලිකා පස්සිත්වා – පෙ – අඤ්ඤතරා කට්ඨහාරිකා පස්සිත්වා –පෙ– අඤ්ඤතරා ගොමයහාරිකා පස්සිත්වා අඞ්ගජාතෙ අභිනිසීදි. සො භික්ඛු පවෙසනං සාදියි, පවිට්ඨං සාදියි, ඨිතං සාදියි, උද්ධරණං සාදියි. තස්ස කුක්කුච්චං අහොසි – පෙ – “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික”න්ති. (45 – 47)

34. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වෙසාලියං මහාවනෙ දිවාවිහාරගතො නිපන්නො හොති. අඤ්ඤතරා ඉත්ථී පස්සිත්වා අඞ්ගජාතෙ අභිනිසීදිත්වා යාවදත්ථං කත්වා සාමන්තා හසමානා ඨිතා හොති. සො භික්ඛු පටිබුජ්ඣිත්වා තං ඉත්ථිං එතදවොච: තුය්හිදං කම්මන්ති. “ආම මය්හං කම්ම”න්ති. තස්ස කුක්කුච්චං අහොසි –පෙ– “සාදියි ත්වං භික්ඛූ”ති. “නාහං භගවා ජානාමී”ති. “අනාපත්ති භික්ඛු අජානන්තස්සා”ති. (48)

35. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වෙසාලියං මහාවනෙ දිවාවිහාරගතො රුක්ඛං අපස්සාය නිපන්නො හොති. අඤ්ඤතරා ඉත්ථී පස්සිත්වා අඞ්ගජාතෙ අභිනිසීදි. සො භික්ඛු සහසා වුට්ඨාසි. තස්ස කුක්කුච්චං අහොසි –පෙ– “සාදියි ත්වං භික්ඛූ”ති. “නාහං භගවා සාදියි”න්ති. අනාපත්ති භික්ඛු අසාදියන්තස්සා”ති. (49)

29. එසමයෙහි එක්තරා මහණෙක් තවඉඳුරන් ඇත්තේ වෙයි. හේ "මම සුවයක් හෝ නොසුවයක් නො විඳිමි. මට ඇවැත් නො වන්නේ ය"යි මෙවුන්දම් සෙවී ය. ... භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළාහු ය. "මහණෙනි, ඒ හිස් මහණ වින්දේ හෝ නොවින්දේ හෝ පරිජිඇවැත් වේ". (41)

30. එසමයෙහි එක්තරා මහණෙක් ස්ත්‍රියක හා මෙවුන්දම් සෙවුනෙමි යි පහස්නා ලද පමණෙහි විපිළිසර විය. ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. සඟවෙසෙස් ඇවැත් වේ". (42)

31. එසමයෙහි එක්තරා මහණෙක් භද්දිය නුවර ජාතියාවනයෙහි දිවාවිහාරගත ව හොත්තේ වෙයි. ඔහුගේ අවයවයෝ වාතයෙන් තද වූවාහු වෙත්. එක්තරා ස්ත්‍රියක් ඔහු දැක රහසඟ මතුයෙහි හිඳ ගෙණ ඇතිතාක් කොට ගියා ය. භික්ෂූහු තෙත් වූවහු දැක භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහු ය.

"මහණෙනි, අයුරු පසකින් රහසඟ කම්ණ්‍ය වෙයි. රාගයෙන් ද වර්චසින්ද මූත්‍රයෙන් ද වාතයෙන් ද බූ පණුවන් ගැටීමෙන් ද යන පසෙනි. මහණෙනි, මෙ පස් අයුරෙන් රහසඟ කම්ණ්‍ය වෙයි. මහණෙනි, ඒ භික්ෂූහුගේ අඞ්ගජාතය රාගයෙන් කම්ත්‍ය වන්නේය යන මෙයට කරුණෙක් නැත, අවකාශයෙක් නැත. මහණෙනි, ඒ භික්ෂු තෙමේ රහත් ය. මහණෙනි, ඒ භික්ෂුහට ඇවැත් නො වේ". (43)

32. එසමයෙහි එක්තරා මහණෙක් සැවැත් නුවර අන්ධවනයෙහි දිවාවිහාරයට ගියේ හොත්තේ වෙයි. එක්තරා ගොපලු ස්ත්‍රියක් දැක අඞ්ගජාතය මත්තෙහි හිඳ ගත්තී ය. ඒ මහණ තෙමේ ප්‍රවෙශය ඉවසී ය. ප්‍රවිෂ්ටය ඉවසී ය. ස්ථිතය ඉවසී ය. උද්ධරණය ඉවසී ය. ඔහුට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි ය". (44)

33. එසමයෙහි එක්තරා මහණෙක් සැවැත් නුවර අන්ධවනයෙහි දිවාවිහාරයට ගියේ, හොත්තේ වෙයි. එක්තරා අජපාල ස්ත්‍රියක් දැක ... එක්තරා දර ගෙණෙන්නියක් දැක ... ගොම ගෙණ යන්නියක් දැක අඞ්ගජාතය මත්තෙහි හිඳගත්තී ය. ඒ මහණ තෙමේ ප්‍රවෙශය ඉවසී ය. ප්‍රවිෂ්ටය ඉවසී ය. ස්ථිතය ඉවසී ය. උද්ධරණය ඉවසී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ පරිජි ඇවැත් අවන්නෙහි ය". (45 – 47)

34. එසමයෙහි එක්තරා මහණෙක් විසල්පුර මහවනයෙහි දිවාවිහාරයට ගියේ, හොත්තේ වෙයි. එක්තරා ස්ත්‍රියක් දැක රහසඟ මත්තෙහි හිඳගෙණ ඇතිතාක් කොට සිනාසෙමින් සමීපයෙහි සිටියා වෙයි. ඒ මහණ තෙමේ පිබිදී ඒ ස්ත්‍රියගෙන් "මේ කාය්‍යීය තීගේ ද?"යි ඇසී ය. "එසේ ය, මගේ කාය්‍යීයකි"යි ඕ කිවූ ය. ඔහුට කුකුසෙක් විය. ... "මහණ, තෝ ඉවසුයෙහි ද? ... "භාග්‍යවතුන් වහන්ස, මම නො දනිමි"යි හේ කී ය. "මහණ, නොදන්නහුට ඇවැත් නො වේ". (48.)

35. එසමයෙහි එක්තරා මහණෙක් විසල්පුර මහවනයෙහි දිවා විහාරයට ගියේ ගහකට හාන්සි වී හොත්තේ වෙයි. එක්තරා ස්ත්‍රියක් ඔහු දැක රහසඟ මතුයෙහි හිඳගත්තා ය. ඒ මහණ තෙමේ වහා නැගිට සිටියේ ය. ඒ මහණහට කුකුස් විය ... "මහණ, තෝ ඉවසුයෙහි ද?" "භාග්‍යවතුන් වහන්ස, මම නො ඉවසීමි". "මහණ, නො ඉවසන්නහුට ඇවැත් නො වේ". (49)

36. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වෙසාලියං මහාවනෙ දිවාවිහාරගතො රුක්ඛං අපස්සාය නිපන්නො හොති. අඤ්ඤතරා ඉත්ථී පස්සිත්වා අඞ්ගජාතෙ අභිනිසීදි. සො භික්ඛු අක්කමිත්වා පවට්ටෙසි.[1] තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "සාදියි ත්වං භික්ඛූ?"ති. "නාහං භගවා සාදියි"න්ති. "අනාපත්ති භික්ඛු අසාදියන්තස්සා"ති. (50)

37. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වෙසාලියං මහාවනෙ කුටාගාරසාලායං දිවාවිහාරගතො ද්වාරං විවරිත්වා නිපන්නො හොති. තස්ස අඞ්ගමඞ්ගානි වාතුපත්ථද්ධානි හොන්ති. තෙන ඛො පන සමයෙන සම්බහුලා ඉත්ථියො ගන්ධඤ්ච මාලඤ්ච ආදාය ආරාමං අගමංසු විහාරපෙක්ඛිකායො. අථ ඛො තා ඉත්ථියො තං භික්ඛුං පස්සිත්වා අඞ්ගජාතෙ අභිනිසීදිත්වා යාවදත්ථං කත්වා 'පුරිසූසභො වතාය'න්ති වත්වා ගන්ධඤ්ච මාලඤ්ච ආරොපෙත්වා පක්කමිංසු. භික්ඛූ කිලින්නං පස්සිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං.

"පඤ්චහි භික්ඛවෙ ආකාරෙහි අඞ්ගජාතං කම්මනියං හොති: රාගෙන වච්චෙන පස්සාවෙන වාතෙන උච්චාලිඞ්ගපාණකදට්ඨෙන. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහාකාරෙහි අඞ්ගජාතං කම්මනියං හොති. අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසො, යං තස්ස භික්ඛුනො රාගෙන අඞ්ගජාතං කම්මනියං අස්ස. අරහං සො භික්ඛවෙ භික්ඛු. අනාපත්ති භික්ඛවෙ තස්ස භික්ඛුනො. අනුජානාමි භික්ඛවෙ දිවා පටිසල්ලීයන්තෙන ද්වාරං සංවරිත්වා පටිසල්ලීයිතු"න්ති. (51.)

38. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භාරුකච්ඡකො භික්ඛු සුපිනන්තෙන[2] පුරාණදුතියිකාය මෙථුනං ධම්මං පටිසෙවිත්වා 'අස්සමණො අහං විබ්භමිස්සාමී'ති භාරුකච්ඡං ගච්ඡන්තො අන්තරාමග්ගෙ ආයස්මන්තං උපාලිං පස්සිත්වා එතමත්ථං ආරොචෙසි. ආයස්මා උපාලි එවමාහ:. "අනාපත්ති ආවුසො සුපිනන්තෙනා"ති. (52.)

39. තෙන ඛො පන සමයෙන රාජගහෙ සුපබ්බා නාම උපාසිකා මුද්ධප්පසන්නා[3] හොති. සා එවංදිට්ඨිකා හොති: "යා මෙථුනං ධම්මං දෙති, සා අග්ගදානං දෙතී"ති. සා භික්ඛුං පස්සිත්වා එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති. "අලං භගිනි, නෙතං කප්පතී"ති. "එහි භන්තෙ ඌරන්තරිකාය[4] ඝට්ටෙහි, එවං තෙ අනාපත්ති භවිස්සතී"ති. සො භික්ඛු තථා අකාසි. තස්ස කුක්කුච්චං අහොසි. "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති සඞ්ඝාදිසෙසස්සා"ති. (53.)

---

1. පවත්තෙසි. මජස • පවට්ටෙසි. ස්‍යා 2. සුපිනන්තෙන. මජසං, 3. මුද්ධප්පසන්නා මජසං.
4. ඌරුන්තරිකාය. ම. ජ. සං.

36. එසමයෙහි එක්තරා මහණෙක් විසල්පුර මහවනයෙහි දිවාවිහාරයට ගියේ ගසකට හාන්සි වී හොත්තේ වෙයි. එක්තරා ස්ත්‍රියක් දැක ඔහුගේ රහසඟ මතුයෙහි හිඳගත්තා ය. ඒ මහණ තෙමේ ඇක්ම ඇය පෙරළී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ ඉවසුයෙහි ද?" "භාග්‍යවතුන් වහන්ස, මම නො ඉවසූයෙමි". "මහණ, නො ඉවසන්නහුට ඇවැත් නො වේ". (50)

37. එසමයෙහි එක්තරා මහණෙක් විසල්පුර මහවනයෙහි කූටාගාර-ශාලාවෙහි දිවාවිහාරයට ගියේ දොර හැර ගෙණ හොත්තේ වෙයි. ඔහුගේ අවයවයෝ වාතයෙන් දැඩි වූවාහු වෙත්. එසමයෙහි බොහෝ ස්ත්‍රීහු සුවඳ ද මල් ද රැගෙණ විහාරය බලනු කැමැතියෝ අරමට පැමිණියාහු ය. ඉක්බිති ඒ ස්ත්‍රීහු ඒ මහණ දැක රහසඟ මතුයෙහි හිඳගෙණ රිසිතාක් කොට 'ඒකාන්ත-යෙන් මේ තෙමේ පුරුෂශ්‍රෙෂ්ඨයෙකැ'යි කියා සුවඳ ද මල් ද (එහි) තගා ගියාහු ය. භික්‍ෂූහු තෙත් වූවහු දැක එපවත් භාග්‍යවතුන් වහන්සේට සැල කළාහු ය.

"මහණෙනි, පස් අයුරකින් රහසඟ කම්ණ්‍ය වෙයි: රාගයෙන් ද වර්චසින් ද මූත්‍රයෙන් ද වාතයෙන් ද බූපණුපහසින් ද යන පසිනි. මහණෙනි, මේ පස් අයුරෙන් රහසඟ කම්ණ්‍ය වෙයි. මහණෙනි, ඒ මහණහුගේ රහසඟ යම් හෙයකින් රාගයෙන් කම්ණ්‍ය වන්නේ ද එයට කාරුණු නැත. අවකාශයෙක් නැත. මහණෙනි, ඒ මහණ තෙමේ රහත් ය. මහණෙනි, ඒ මහණහට ඇවැත් නොවේ. "මහණෙනි, දහවල් සැතපෙන්නහු විසින් දොර වසාගෙණ සැතපෙන්නට අනුදනිමි"යි වදාළසේක. (51)

38. එසමයෙහි භරුකච්ඡයෙහි උපන් එක්තරා මහණෙක් ගිහිකල අඹු වූ තෙනැත්තිය සමග සිහිනෙන් මෙවුන්දම් සේවනය කොට "මම අශ්‍රමණයෙක් වීමි. ගිහි වන්නෙමි"යි භරුකච්ඡයට යන්නේ අතරමග ආයුෂ්මත් උපාලි තෙරුන් දැක එපුවත සැළ කෙළේ ය. ආයුෂ්මත් උපාලි ස්ථවිර තෙමේ මෙසේ කී ය: "ඇවැත්නි, සිහිනෙන් මෙවුන්දම් සේවනය කරන්නහුට ඇවැත් නො වේ." (52)

39. එසමයෙහි රජගහ නුවර සුපබ්බා නම් උවැසියක් මුග්ධප්‍රසන්න වෙයි. ඕ 'යම් ස්ත්‍රියක් මෙවුන්දම් දේ ද ඕ අගදත් දේ ය'යි මෙසේ දෘෂ්ටි ඇත්තියක් වෙයි. ඕ මහණකු දැක "වහන්ස, එනු මැනව' මෙවුන්දම් සේවනය කරන්න"යි මෙය කිවූ ය. "නැගනියෙනි, නුසුදුසු ය. මෙය අකැප ය'යි හේ කී ය. "වහන්ස, එනු මැනව. ඌරු අතරෙහි ගටනු මැනැව්. මෙසේ ඔබට ඇවැත් නොවන්නේ ය"යි ඕ කීවා ය. ඒ මහණ තෙමේ එසේ කෙළේ ය. ඔහුට කුකුස් විය. "මහණ, පරිජිඇවැත් නො වේ. සඟවෙසෙස්ඇවැත් වේ." (53)

40. තෙන ඛො පන සමයෙන රාජගහෙ සුපබ්බා නාම උපාසිකා මුද්ධප්පසන්නා හොති. සා එවං දිට්ඨිකා හොති: 'යා මෙථුනං ධම්මං දෙති, සා අග්ගදානං දෙතී'ති. සා භික්ඛුං පස්සිත්වා එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති. "අලං භගිනි, නෙතං කප්පතී"ති. "එහි භන්තෙ නාභියං ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ උදරවට්ටියං ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ උපකච්ඡකෙ ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ ගීවායං ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ කණ්ණච්ඡිද්දෙ ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ කෙසවට්ටියං ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ අඞ්ගුලන්තරිකාය ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ හත්ථෙන උපක්කමිත්වා මොචෙස්සාමි, එවං තෙ අනාපත්ති භවිස්සතී"ති. සො භික්ඛු තථා අකාසි. තස්ස කුක්කුච්චං අහොසි. "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති සඞ්ඝාදිසෙසස්සා"ති. (54–61.)

41. තෙන ඛො පන සමයෙන සාවත්ථියං සද්ධා නාම උපාසිකා මුද්ධප්පසන්නා හොති. සා එවං දිට්ඨිකා හොති: 'යා මෙථුනං ධම්මං දෙති, සා අග්ගදානං දෙතී'ති. සා භික්ඛුං පස්සිත්වා එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති. "අලං භගිනි, නෙතං කප්පතී"ති. "එහි භන්තෙ ඌරන්තරිකාය ඝට්ටෙහි" -පෙ- "එහි භන්තෙ හත්ථෙන උපක්කමිත්වා මොචෙස්සාමි. එවං තෙ අනාපත්ති භවිස්සතී"ති. සො භික්ඛු තථා අකාසි. තස්ස කුක්කුච්චං අහොසි". අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති සඞ්ඝාදිසෙසස්සා"ති. (62–70.)

42. තෙන ඛො පන සමයෙන වෙසාලියං ලිච්ඡවිකුමාරකා භික්ඛුං ගහෙත්වා භික්ඛුනියා විප්පටිපාදෙසුං. උභො සාදියිංසු. "උභො නාසෙතබ්බා" -පෙ- උභො න සාදියිංසු. "උභින්නං අනාපත්ති". (71.)

43. තෙන ඛො පන සමයෙන වෙසාලියං ලිච්ඡවිකුමාරකා භික්ඛුං ගහෙත්වා සික්ඛමානාය විප්පටිපාදෙසුං -පෙ- සාමණෙරියා විප්පටිපාදෙසුං. උභො සාදියිංසු. "උභො නාසෙතබ්බා" -පෙ- උභො න සාදියිංසු. "උභින්නං අනාපත්ති". (72–73.)

44. තෙන ඛො පන සමයෙන වෙසාලියං ලිච්ඡවිකුමාරකා භික්ඛුං ගහෙත්වා වෙසියා විප්පටිපාදෙසුං -පෙ- පණ්ඩකෙ විප්පටිපාදෙසුං -පෙ- ගිහිනියා විප්පටිපාදෙසුං -පෙ- භික්ඛු සාදියි. "භික්ඛු නාසෙතබ්බො". -පෙ- භික්ඛු න සාදියි. "භික්ඛුස්ස අනාපත්ති". (74–76.)

45. තෙන ඛො පන සමයෙන වෙසාලියං ලිච්ඡවිකුමාරකා භික්ඛූ ගහෙත්වා අඤ්ඤමඤ්ඤං විප්පටිපාදෙසුං. උභො සාදියිංසු. "උභො නාසෙතබ්බා" -පෙ- උභො න සාදියිංසු. "උභින්නං අනාපත්ති". (77.)

40. එසමයෙහි රජගහනුවර සුපබ්බා නම් උවැසියක් මුග්ධප්‍රසන්න වෙයි. ඕ "යම් සත්‍රියක් මෙවුන්දම් දේ ද ඕ අග දන් දේ ය"යි මෙසේ දෘෂ්ටි ඇත්තියක් වෙයි. ඕ මහණකු දැක "වහන්ස, එනු මැනව. මෙවුන්දම් සේවනය කරන්නැ"යි කිවු ය. "නැගනියෙනි, නුසුදුසු ය. මෙය කැප නො වෙයි" හේ කී ය. "වහන්ස, තැබෑ ගටනු මැනවි. ... වහන්ස, උදරවැටියෙහි ගටනු මැනවි. වහන්ස එනු මැනව. කිසිල්ලෙහි ගටනු මැනව. ... වහන්ස ගීවායෙහි ගටනු මැනව. ... වහන්ස, කන් සිදුරෙහි ගටනු මැනව. ... වහන්ස, කෙස් වැටියෙහි ගටනු මැනව. ... වහන්ස, එනු මැනවි. ඇඟිලි අතුරැ ගටනු මැනව ... "වහන්ස, එනු මැනව, අතින් උපක්‍රම කොට මුදන්නෙමි. මෙසේ ඔබට ඇවැත් නො වන්නේ"යි ඕ කිවු ය. ඒ මහණ එසේ කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. "මහණ, පරිජිඇවැත් නො වේ. සඟවෙසෙස්-ඇවැත් වේ". (54-61)

41. එසමයෙහි සැවැත් නුවර සද්ධා නම් උවැසියක් මුග්ධප්‍රසන්න වෙයි. ඕ තොමෝ "යම් සත්‍රියක් මෙවුන්දම් දේ නම් ඕ අග දන් දේය"යි මෙසේ දෘෂ්ටි ඇත්තියක් වෙයි. ඕ මහණකු දැක ,,වහන්ස, එනු මැනව. මෙවුන්දම් සේවනය කරන්නැ"යි කිවු ය. "නැගනියෙනි, නුසුදුසු ය. මෙය නො කැප ය"යි හේ කී ය. "වහන්ස, එනු මැනව. ඌරු අතරෙහි ගටන්න. ... "වහන්ස, එනු මැනව. අතින් උපක්‍රම කොට මුදන්නෙමි. මෙසේ ඔබට ඇවැත් නොවන්නේ"යි ඕ කිවු ය. ඒ මහණ එසේ කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. "මහණ, පරිජිඇවැත් නො වේ. සඟවෙසෙස් ඇවැත් වේ." (62-70)

42. එසමයෙහි විසල්පුරයෙහි ලිච්ඡවිකුමාරවරු මහණකු අල්ලා ගෙණ මෙහෙණක හා වරදවා පිළිපැදවූහ. දෙදෙන ම ඉවසූහ. "දෙදෙන ම (ලිංගනාසනයෙන්) නැසිය යුත්තාහු ය". ... දෙදෙන ම නො ඉවසූහ. "දෙදෙනාට ම ඇවැත් නො වේ". (71)

43. එසමයෙහි විසල්පුරයෙහි ලිච්ඡවිකුමාරවරු මහණකු අල්ලාගෙණ සික්ඛමානාවක හා වරදවා පිළිපැදවූහ. ... හෙරණක හා වරදවා පිළිපැදවූහ. දෙදෙන ම ඉවසූහ. "දෙදෙනා ම ලිංගනාසනායෙන් නැසිය යුත්තාහ." ... දෙදෙනා ම නො ඉවසූහ. "දෙදෙනාට ම ඇවැත් නො වේ." (72-73)

44. එසමයෙහි විසල්පුරයෙහි ලිච්ඡවිකුමාරවරු මහණකු අල්ලා ගෙණ වෙසඟනක හා වරදවා පිළිපැදවූහ. ... පණ්ඩකයකු හා වරදවා පිළිපැදවූහ. ගිහිනියක හා වරදවා පිළිපැදවූහ. ... මහණ ඉවසී ය. "මහණ තෙමේ නැසිය යුතු යි". ... මහණ නො ඉවසී ය. "මහණහට ඇවැත් නො වේ". (74-76)

45. එසමයෙහි විසල්පුරයෙහි ලිච්ඡවිකුමාරවරු මහණකු අල්ලාගෙණ ඔවුනොවුන් වරදවා පිළිපැදවූහ. දෙදෙන ම ඉවසූහ. "දෙදෙන ම නැසිය යුත්තාහ." ... දෙදෙන ම නො ඉවසූහ. "දෙදෙනාට ම ඇවැත් නො වේ." (77)

46. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො බුඩ්ඪපබ්බජිතො භික්ඛු පුරාණදුතියිකාය දස්සනං අගමාසි. සා ‘එහි භන්තෙ විබ්භමා’ති අග්ගහෙසි. සො භික්ඛු පටික්කමන්තො උත්තානො පරිපති. සා උබ්භුජිත්වා[1] අඞ්ගජාතෙ අභිනිසීදි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛු අසාදියන්තස්සා”ති. (78)

47. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු අරඤ්ඤෙ විහරති. මිගපොතකො තස්ස පස්සාවට්ඨානං ආගන්ත්වා පස්සාවං පිවන්තො මුඛෙන අඞ්ගජාතං අග්ගහෙසි. සො භික්ඛු සාදියි. තස්ස කුක්කුච්චං අහොසි භගවතො එතමත්ථං ආරොචෙසි. -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික”න්ති. (79)

## පඨමපාරාජිකං සමත්තං.

---

# දුතියපාරාජිකං

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ** විහරති **ගිජ්ඣකූටෙ** පබ්බතෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ **ඉසිගිලි**පස්සෙ තිණකුටියො කරිත්වා වස්සං උපගච්ඡිංසු. ආයස්මාපි **ධනියො** කුම්භකාරපුත්තො තිණකුටිකං කරිත්වා වස්සං උපගච්ඡි.

2. අථ ඛො තෙ භික්ඛූ වස්සං වුත්ථා තෙමාසච්චයෙන තිණකුටියො භින්දිත්වා තිණඤ්ච කට්ඨඤ්ච පටිසාමෙත්වා ජනපදචාරිකං පක්කමිංසු. ආයස්මා පන ධනියො කුම්භකාරපුත්තො තත්ථෙව වස්සං වසි, තත්ථ හෙමන්තං, තත්ථ ගිම්හං.

3. අථ ඛො ආයස්මතො ධනියස්ස කුම්භකාරපුත්තස්ස ගාමං පිණ්ඩාය පවිට්ඨස්ස තිණහාරියො කට්ඨහාරියො තිණකුටිකං භින්දිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ආදාය අගමංසු.

4. දුතියම්පි ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො තිණඤ්ච කට්ඨඤ්ච සංකඩ්ඪිත්වා තිණකුටිකං අකාසි. දුතියම්පි ඛො ආයස්මතො ධනියස්ස කුම්භකාරපුත්තස්ස ගාමං පිණ්ඩාය පවිට්ඨස්ස තිණහාරියො කට්ඨහාරියො තිණකුටිකං භින්දිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ආදාය අගමංසු.

5. තතියම්පි ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො තිණඤ්ච කට්ඨඤ්ච සංකඩ්ඪිත්වා තිණකුටිකං අකාසි. තතියම්පි ඛො ආයස්මතො ධනියස්ස කුම්භකාරපුත්තස්ස ගාමං පිණ්ඩාය පවිට්ඨස්ස තිණහාරියො කට්ඨහාරියො තිණකුටිකං භින්දිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ආදාය අගමංසු.

---

1. උබ්භජිත්වා, මජසං.

46. එසමයෙහි මහලු ව පැවිදි වූවෙක් ගිහිකල අඹු වූ ස්ත්‍රිය දැකීමට ගියේ ය. ඕ "වහන්ස, එනු මැනව. උපැවිදි වනු මැනවැ"යි අල්ලා ගත්තී ය. තෙමේ පෙරළා යනුයේ උඩුකුරු ව වැටුනේ ය. ඕ නැඟී රහසඟ මතුයෙහි හිඳ ගත්තී ය. ඔහුට කුකුස් විය. ... "මහණ නො ඉවසන්නහුට ඇවැත් නො වේ". (1)

47. එසමයෙහි එක්තරා මහණෙක් අරණෙහි වෙසෙයි. මුවපොව්වෙක් උන්වහන්සේ මූත්‍ර පහ කරණ තැනට පැමිණ මූත්‍ර බොමින් මුවින් රහසඟ ගත්තේ ය. ඒ මහණ ඉවසී ය. ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කෙළේ ය. "මහණ, තෝ පරිජි ඇවතට පැමිණියෙහි ය. (2)

# ප්‍රථමපාරාජිකය නිමි.

---

# ද්විතීයපාරාජිකය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ රජගහනුවර ගිජුකුළු- පව්වෙහි වැඩ වෙසෙන සේක. එසමයෙහි දුටු පමණින් මිතුරු වූ දැඩි මිතුරු වූ බොහෝ භික්ෂූහු ඉසිගිලි පර්වත පාර්‍ශ්වයෙහි තණ කිළි කොට වස් එළඹියාහු ය. කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේත් තණ කිළියක් කොට වස් එළඹියේ ය.

2. ඉක්බිති ඒ භික්ෂූහු විසූ වස් ඇත්තාහු තෙමස ඉක්ම යැමෙන් තණකිළි බිඳ දමා තණ ද ලීදඬු ද තැන්පත් කොට තබා දනවු සැරිසැරීමෙහි නික්මුනාහු ය. කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ එහි ම (තමන් කළ කුටියෙහි) වස්සානය ද එහි ම හෙමන්තය ද එහි ම ගිම්හානයෙහි ද විසී ය.

3. ඉක්බිති කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙරුන් ගමට පිඬු පිණිස පිවිසියැ දී තණ ගෙණ යන ස්ත්‍රීහු ද දර ගෙණ යන ස්ත්‍රීහු ද තණකිළිය බිඳදමා තණ ද දූව ද රැගෙණ ගියාහු ය.

4. දෙවෙනි වර ද කුම්භකාර පුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ තණ ද දූවද රැස් කොට ගෙන තණ කිළියක් කෙළේ ය. දෙවෙනි වර ද කුම්භකාර- පුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙරුන් ගමට පිඬු පිණිස පිවිසියැ දී තණ ගෙණ යන ස්ත්‍රීහු ද දූව ගෙණ යන ස්ත්‍රීහු ද තණ කිළිය බිඳ දමා තණ ද දූව ද රැගෙණ ගියාහු ය.

5. තෙවෙනි වර ද කුම්භකාරපුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙමේ තණ ද දූව ද රැස් කොට තණ කිළියක් කෙළේ ය. තෙවෙනි වරද කුම්භකාරපුත්‍රවූ ආයුෂ්මත් ධනිය තෙරුන් ගමට පිඬු පිණිස පිවිසියැදී තණ ගෙණ යන ස්ත්‍රීහු ද දූව ගෙණ යන ස්ත්‍රීහු ද තණ කිළිය බිඳ දමා තණ ද දූව ද රැගෙන ගියාහු ය.

6. අථ ඛො ආයස්මතො ධනියස්ස කුම්භකාරපුත්තස්ස එතදහොසි: 'යාව තතියකං ඛො මෙ ගාමං පිණ්ඩාය පවිට්ඨස්ස තිණහාරියො කට්ඨහාරියො තිණකුටිකං භින්දිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ආදාය අගමංසු. අහං ඛො පන සුසික්ඛිතො අනවයො සකෙ ආචරියකෙ කුම්භකාරකම්මෙ පරියොදාතසිප්පො යන්නූනාහං සාමං චික්ඛල්ලං මද්දිත්වා සබ්බමත්තිකාමයං කුටිකං කරෙය්‍ය'න්ති.

7. අථ ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො සාමං චික්ඛල්ලං මද්දිත්වා සබ්බමත්තිකාමයං කුටිකං කරිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ගොමයඤ්ච සංකඩ්ඪිත්වා තං කුටිකං පචි. සා අහොසි කුටිකා අභිරූපා දස්සනීයා පාසාදිකා ලොහිතිකා, සෙය්‍යථාපි ඉන්දගොපකො. සෙය්‍යථාපි නාම කිඞ්කිණිකසද්දො එවමෙවං තස්සා කුටිකාය සද්දො අහොසි.

8. අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දස තං කුටිකං අභිරූපං දස්සනීයං පාසාදිකං ලොහිතිකං. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: කිං එතං භික්ඛවෙ අභිරූපං දස්සනීයං පාසාදිකං ලොහිතිකං සෙය්‍යථාපි ඉන්දගොපකො?''ති:

9. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවියං භික්ඛවෙ තස්ස මොඝපුරිසස්ස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම සො භික්ඛවෙ මොඝපුරිසො සබ්බමත්තිකාමයං කුටිකං කරිස්සති. න හි නාම භික්ඛවෙ තස්ස මොඝපුරිසස්ස පාණෙසු අනුද්දයා අනුකම්පා අවිහෙසා භවිස්සති. ගච්ඡථෙතං භික්ඛවෙ කුටිකං භින්දථ. මා පච්ඡිමා ජනතා පාණෙසු පාතබ්‍යතං ආපජ්ජි. න ච භික්ඛවෙ සබ්බමත්තිකාමයා කුටිකා කාතබ්බා. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්සා''ති.

10. "එවං භන්තෙ''ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා යෙන සා කුටිකා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තං කුටිකං භින්දිංසු. අථ ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො තෙ භික්ඛූ එතදවොච: "කිස්ස මෙ තුම්හෙ ආවුසො කුටිකං භින්දථා''ති. "භගවා ආවුසො භෙදාපෙතී''ති. "භින්දථාවුසො සචෙ ධම්මස්සාමී භෙදාපෙතී''ති.

11. අථ ඛො ආයස්මතො ධනියස්ස කුම්භකාරපුත්තස්ස එතදහොසි: "යාවතතියකං ඛො මෙ ගාමං පිණ්ඩාය පවිට්ඨස්ස තිණහාරියො කට්ඨහාරියො තිණකුටිකං භින්දිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ආදාය අගමංසු. යාපි මයා සබ්බමත්තිකාමයා කුටිකා කතා, සාපි භගවතා භෙදාපිතා. අත්ථි ච මෙ දාරුගහෙ ගණකො සන්දිට්ඨො. යන්නූනාහං දාරුගහෙ ගණකං දාරූනි යාචිත්වා දාරුකුට්ටිකං[1] කුටිකං කරෙය්‍ය''න්ති.

1. දාරුකුටිකං. ආ.

6. ඉක්බිති කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙරුන්ට මේ සිත විය: "තෙවෙනි වර දක්වාත් මා ගමට පිඩු පිණිස පිවිසියැ දී තණ ගෙණ යන ස්ත්‍රීහු ද, දැව ගෙණ යන ස්ත්‍රීහු ද තණ කිළිය බිඳ දමා තණ ද දැව ද රැගෙණ ගියාහු ය. මම් වනාහි ස්වකීය ආචාර්‍ය්‍යයන්ගේ කර්‍මය වූ කුම්භකාරකර්‍මය මනාසේ උගත්තෙම් වෙමි. පිරිපුන් සිප් ඇත්තෙම් වෙමි. අසදෘශ ශිල්ප ඇත්තෙම් වෙමි. ඉදින් මම්-තෙමේ ම මැටි පාගා පදම් කොට හැම මැටිමුවා කිළියක්, කරත්තෙම් නම් යෙහෙක" යනු සි.

7. ඉක්බිති කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ මැටි පාගා පදම් කොට හැම මැටිමුවා කිළියක් කොට තණ ද දර ද ගොම වැරටි ද රැස් කොට ඒ කිළිය පිළිස්සී ය. රතිඳුගොව්වකු වැනි පැහැ ඇති ඒ කිළිය මනා රූ ඇත්තක් විය. දැකුම්කලු විය. ප්‍රසාද එළවන්නක් විය. ලෙහෙවත් විය. ඒ කිළියේ හඬ කිකිණි හඬ සේ විය.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග ගිජුකුළු-පව්වෙන් බස්නාසේක් මනා පැහැ ඇති දැකුම්කලු ප්‍රසාද එළවන ලේවන් වූ ඒ කිළිය දුටුසේක. දැක භික්ෂූන් අමතා "මහණෙනි රතිඳුගොව්වකු වැනි පැහැති මනා රූ ඇති දැකුම්කලු ප්‍රසාද එළවන ලෙහෙවන් වූ තෙල කිමෙක් දෝ?"යි ඇසූ සේක.

9. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ පවත් සැළ කළාහු ය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ඒ හිස් පුරුෂයාට නුසුදුසු වූවකි. අනුලොම් නුවූවකි. නොගැළපෙන්නකි, ශ්‍රමණසාරූප්‍ය නුවූවකි. කැප නුවූවකි. නොකටයුත්තකි" සි ගැරහූ සේක. "මහණෙනි, ඒ හිස් පුරුෂ තෙමේ කෙසේ නම් හැම මැටිමුවා වූ කිළියක් කෙළේ ද! මහණෙනි, ඒ හිස් පුරුෂයාට ප්‍රාණීන් කෙරෙහි දයාවක් අනුකම්පාවක් අවිහිංසාවක් නො වූයේ ම ය. මහණෙනි, යවු. තෙල කිළිය බිඳිවූ. පශ්චිම ජන තෙමේ ප්‍රාණීන් වැනසීමට තනමක් පැමිණේ වා. මහණෙනි, හැම මැටිමුවා කිළියක් නොකටයුතු ය. යමෙක් කරන්නේ නම් දුකුළාඇවැත් වේ".

10. ඒ භික්ෂූහු "වහන්ස, එසේය සි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ කිළිය වෙත එළඹ එය බිඳ දැමූහ. ඉක්බිති කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ ඒ භික්ෂූන්ට "ඇවැත්නි, තෙපි කුමක් හෙයින් මාගේ කිළිය බිඳිවු දෝ?" සි මෙය කී. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ බිඳවන සේක" සි කී හ. "ඇවැත්නි, ඉදින් දම්රජහු බිඳුවත් නම් බිඳිවූ"සී හේ කී ය.

11. ඉක්බිති කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙරුන්ට මේ සිත විය. "තෙවෙනි වර තෙක් ගමට පිඩු පිණිස මා පිවිසියැ දී තණ ගෙණ යන ස්ත්‍රීහු ද දැව ගෙණ යන ස්ත්‍රීහු ද තණ කිළිය බිඳ, තණ ද දැව ද රැගෙණ ගියාහු ය. මා විසින් හැම මැටිමුවා වූ යම් කිළියක් කරණ ලද ද, හෙ ද භාග්‍යවතුන් වහන්සේ විසින් බිඳුවන ලදී. රජහුගේ දැව ගබඩාවෙහි වූ දැවමුදලි තෙමේ මාගේ මිත්‍රයෙකි. මම දැවමුදලිගෙන් දැව ඉල්ලා ගෙණ දැවමුවා බිත්ති ඇති කිළියක් කරන්නෙම් නම් ඉතා යෙහෙක" යනු සි.

12. අථ ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො යෙන දාරුගහෙ ගණකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා දාරුගහෙ ගණකං එතදවොච: "යාව තතියකං ඛො මෙ ආවුසො ගාමං පිණ්ඩාය පවිට්ඨස්ස තිණහාරියො කට්ඨහාරියො තිණකුටිකං භින්දිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ආදාය අගමංසු. යාපි මයා සබ්බමත්තිකාමයා කුටිකා කතා, සාපි භගවතා භෙදාපිතා. දෙහි මෙ ආවුසො දාරූනි, ඉච්ඡාමි දාරුකුඩ්ඩිකං කුටිකං කාතුන්ති. "නත්ථි භන්තෙ තාදිසානි දාරූනි, යානාහං අය්‍යස්ස දදෙය්‍යං. අත්ථි භන්තෙ දෙවගහදාරූනි නගරපටිසඞ්ඛාරිකානි ආපදත්ථාය නික්ඛිත්තානි. සචෙ තානි රාජා දාපෙති, හරාපෙථ භන්තෙ"ති. "දින්නානි ආවුසො රඤ්ඤා"ති.

13. අථ ඛො දාරුගහෙ ගණකො "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා, රාජාපිමෙසං අභිප්පසන්නො. න අරහති අදින්නං දින්නන්ති වත්තු"න්ති ආයස්මන්තං ධනියං කුම්භකාරපුත්තං එතදවොච: 'හරාපෙථ භන්තෙ'ති. අථ ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො තානි දාරූනි ඛණ්ඩාඛණ්ඩිකං ඡෙදාපෙත්වා සකටෙහි නිබ්බාහාපෙත්වා දාරුකුඩ්ඩිකං කුටිකං අකාසි.

14. අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො රාජගහෙ කම්මන්තෙ අනුසඤ්ඤායමානො යෙන දාරුගහෙ ගණකො, තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා දාරුගහෙ ගණකං එතදවොච: "යානි තානි භණෙ දෙවගහ-දාරූනි නගරපටිසඞ්ඛාරිකානි ආපදත්ථාය නික්ඛිත්තානි, කහං තානි දාරූනී?"ති තානි සාමි, දාරූනි දෙවෙන අය්‍යස්ස ධනියස්ස කුම්භකාරපුත්තස්ස දින්නානී"ති.

15. අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො අනත්තමනො අහොසි: "කථං හි නාම දෙවො දෙවගහදාරූනි නගරපටිසඞ්ඛාරිකානි ආපදත්ථාය නික්ඛිත්තානි ධනියස්ස කුම්භකාරපුත්තස්ස දස්සතී"ති.

16. අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො, තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං එතදවොච: "සච්චං කිර දෙව දෙවෙන දෙවගහදාරූනි නගරපටිසඞ්ඛාරිකානි ආපදත්ථාය නික්ඛිත්තානි ධනියස්ස කුම්භකාරපුත්තස්ස දින්නානී?"ති "කො එවමාහා?"ති. "දාරුගහෙ ගණකො දෙවා"ති. "තෙන හි බ්‍රාහ්මණ දාරුගහෙ ගණකං ආණාපෙහී"ති.

17. අථ ඛො වස්සකාරො බ්‍රාහ්මණො මගධමහාමත්තො දාරුගහෙ ගණකං බද්ධං ආණාපෙසි. අද්දසා ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො දාරුගහෙ ගණකං බද්ධං නීයමානං. දිස්වාන දාරුගහෙ ගණකං එතදවොච: "කිස්ස ත්වං ආවුසො බද්ධො නීයාසී?"ති. "තෙසං භන්තෙ දාරූනං කිච්චා"ති. "ගච්ඡාවුසො අහම්පි ආගච්ඡාමී"ති. "එය්‍යාසි භන්තෙ පුරා හඤ්ඤාමී"ති.

12. ඉක්බිති කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ දූවමුදලියා වෙත එළඹ ඔහුට මෙය කීය: "ඇවත, තෙවෙනිවර තෙක් මා ගමට පිඬු පිණිස පිවිසියෑ දී තණ ගෙණ යන සත්‍රීහු ද දූව ගෙණ යන සත්‍රීහු ද තණ කිළිය බිඳ, තණ ද දූව ද ගෙණ ගියාහුය. මා විසින් හැම මැටිමුවා යම් කිළියක් කරණ ලද ද එය භාග්‍යවතුන් වහන්සේ විසින් බිඳුවන ලදී. ඇවත, දූවමුවා කිළියක් කරණු කැමැත්තෙමි. මට දූව දෙන්න" යනු යි. "වහන්ස, ආයුෂ්මත්-වහන්සේට දීමට සුදුසු දූව නැත. වහන්ස, නගරප්‍රතිසංස්කරණයට වෙන් වූ, ආපදුවකට තබන ලද, රජුට අයත් දූව ඇත. ඉදින් ඒ දූව රජ තෙමේ පරිත්‍යාග කෙරේ නම්, වහන්ස, ගෙන්වා ගණු මැනවි"යි හේ කී ය. "ඇවත, රජු විසින් අපට දෙන ලද්දාහු ය" යි හේ කී ය.

13. ඉක්බිති දූවමුදලි "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ ධම්චාරීහු ය, සමචාරීහු ය, බ්‍රහ්මචාරීහු ය, සත්‍යවාදීහු ය, සිල්වත්තු ය, කල්‍යාණදහම්හි පිළිපන්නෝ ය, මොවුනට රජ ද වෙසෙසින් පහන් ය. නොදෙන ලද්දක් දෙන ලදැ යි කියන්නට සුදුසු නො වේ"ය යි සිතී ය. සිතා කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය ස්ථවිරයන්ට "වහන්ස, ගෙන්වා ගණු මැනවැ"යි. කී ය. ඉක්බිති කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ ඒ දූව කඩ කඩ කොට සිඳුවා ගැල්වලින් ගෙන්වා ගෙණ දූවමුවා බිතු ඇති කිළියක් කෙළේ ය.

14. ඉක්බිති මගධරටෙහි මහඇමැති වූ වස්සකාර නම් බමුණු තෙමේ රජගහනුවර කර්මාන්තයන් විමසමින් දූවමුදලි කරා පැමිණ ඔහුට "සගය, නගරප්‍රතිසංස්කරණයට වෙන් වූ, ආපදුවක් පිණිස ගත යුතු වූ, යම් ඒ රජුට අයත් දූව රැසක් වී ද, ඒ දූව කොහි දැ?"යි කී ය. "හිමිය, ඒ දූව රජහු විසින් කුම්භකාර පුත්‍ර වූ ධනිය ආයුෂ්මතුන් වහන්සේට දෙන ලදී". හේ කී ය.

15. ඉක්බිති මගධමහාමාත්‍ය වූ වස්සකාර බමුණු තෙමේ "කෙසේ නම් රජතෙමේ නගර ප්‍රතිසංස්කරණය පිණිස වෙන් වූ, ආපදුවක් පිණිස තබන ලද්ද වූ, රජු සතු දූව කුම්භකාර පුත්‍ර වූ ධනිය තෙරුන්ට දෙන්නේ දැ?"යි නොසතුටු සිතැති වී ය.

16. එකල්හි මගධ මහඇමති වූ වස්සකාර බමුණු තෙමේ මගධාධිපති, සේනිය බිම්සර රජු කරා පැමිණියේ ය. පැමිණ මගධාධිපති සේනිය බිම්සර රජුගෙන් "දේවයන් වහන්ස, රජු විසින් නගර ප්‍රතිසංස්කරණය පිණිස වෙන් වූ ආපදුවක් පිණිස තබන ලද්ද වූ රජු සතු දූව කුම්භකාර පුත්‍ර වූ ධනිය තෙරුන්ට දෙන ලද්දේ ය යනු සැබෑ දැ?"යි විචාළේ ය. "කවරෙක් මෙසේ කියයි"ද? "දේවයන් වහන්ස, දූවමුදලියා ය." "බමුණ, එසේ වී නම් දූවමුදලි කැඳවාලව"යි රජ කී ය.

17. ඉක්බිති මගධමහාමාත්‍ය වූ වස්සකාර තෙමේ දූවමුදලි අත් පා බැඳ ගෙන්වී ය. කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ බැඳගෙණ යනු ලබන්නා වූ දූවමුදලි දිටී ය. දැක දූවමුදලිහට "ඇවත, තෝ කුමක් හෙයින් බඳනා ලදුවැ ගෙණයෙහි"දැ? කී ය. "වහන්ස, තෙල දූව හේතු කොටගෙණ යැ"යි හේ කී ය. "ඇවත, යනු. මම ද එමි"යි තෙරණුවෝ කී හ. "වහන්ස, මම නැස්තෙම් වේද: එයට පෙර එනු මැනැවි"යි හේ කී ය.

18. අථ ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො යෙන රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස නිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො යෙනායස්මා ධනියො කුම්භකාරපුත්තො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ධනියං කුම්භකාරපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මන්තං ධනියං කුම්භකාරපුත්තං එතදවොච:

19. "සච්චං කිර මයා භන්තෙ දෙවගහදාරූනි නගරපටිසඞ්ඛාරිකානි ආපදත්ථාය නික්ඛිත්තානි අය්‍යස්ස දින්නානී?"ති. "එවං මහාරාජා"ති. "මයං ඛො භන්තෙ රාජානො නාම බහුකිච්චා බහුකරණීයා. දත්වාපි නස්සරෙය්‍යාම. ඉඞ්ඝ භන්තෙ සරාපෙහී"ති. "සරසි ත්වං මහාරාජ, පඨමාභිසිත්තො එවරූපිං වාචං භාසිතා: දින්නං යෙව සමණබ්‍රාහ්මණානං තිණකට්ඨොදකං පරිභුඤ්ජන්තූ"ති. "සරාමහං භන්තෙ. සන්ති භන්තෙ සමණබ්‍රාහ්මණා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා. තෙසං අප්පමත්තකෙ'පි කුක්කුච්චං උප්පජ්ජති. තෙසං මයා සන්ධාය භාසිතං. තඤ්ච ඛො අරඤ්ඤෙ අපරිග්ගහිතං. සො ත්වං භන්තෙ තෙන ලෙසෙන දාරූනි අදින්නං හරිතුං මඤ්ඤසි. කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං හනෙය්‍ය වා? බන්ධෙය්‍ය වා? පබ්බාජෙය්‍ය වා, ගච්ඡ භන්තෙ. ලොමෙන ත්වං මුත්තොසි.[1] මාස්සු පුනපි එවරූපං අකාසී"ති.

20. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා මුසාවාදිනො. ඉමෙ හි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං. නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. නට්ඨං ඉමෙසං සාමඤ්ඤං. නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. කුතො ඉමෙසං සාමඤ්ඤං? කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං? අපගතා ඉමෙ සාමඤ්ඤා. අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. රාජානම්පිමෙ වඤ්චෙන්ති. කිම්පනඤ්ඤෙ මනුස්සෙ"ති.

21. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා ධනියො කුම්භකාරපුත්තො රඤ්ඤො දාරූනි අදින්නං ආදියිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

---

1. මූලෙකා, සීමු.

18. ඉක්බිති කුම්භකාර පුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙමේ මගධාධිපති සේනා ඇති බිම්සර රජුගේ නිවෙස වෙත එළඹ පැණ වූ අත්තෙහි හුනි. ඉක්බිති මගධාධිපති සේනිය බිම්සර රජතෙමේ කුම්භකාර පුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙරුන් වෙත එළඹියේ ය. එළඹ කුම්භකාර පුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙරුන් වැද එකත්පසෙක හුනි. එකත්පසෙක හුන් මගධාධිපති සේනිය බිම්සර රජතෙමේ කුම්භකාර පුත්‍ර ආයුෂ්මත් ධනිය තෙරුන්ට මෙය කී ය. "වහන්ස, මා විසින් නගර ප්‍රතිසංස්කරණයට වෙන් වූ ආපදාවක් පිණිස තබන ලද්දා වූ රාජසන්තක දාව ආයාචියන් වහන්සේට දෙන ලද්දේ ය, යනු සැබෑ ද?"

19. "මහරජ, සැබෑය." "වහන්ස, රජවරු වූ අපි බොහෝ කිස ඇත්තමෝ වෙමු. බොහෝ කටයුතු ඇත්තමෝ වෙමු. පරිභෝග කොට ද සිහි නො කරන්නෙමු. "වහන්ස, එසේ වී නම් සිහිකරවනු මැනවැ"යි. "මහරජතුමනි, ප්‍රථමාභිෂික්ත වෑ ඔබකී මෙබඳු වචනයක් සිහි කෙරෙහි ද'මහණ බමුණන්ට තණ දාව ජලය පරිත්‍යාග කරණ ලද්දේ ම ය. (කැමැති සේ) පරිභෝග කෙරෙත්වා"යි. "වහන්ස, මම සිහි කරමි. වහන්ස, ලජ්ජී වූ කුකුස් ඇත්තා වූ ශික්ෂාකාමී වූ මහණ බමුණෝ වෙති. උන්වහන්සේලාට සවල්පමාත්‍ර දෙයෙහි ද කුකුස් උපදී. මා විසින් උන්වහන්සේලා සඳහා කියන ලදී. හෙ ද වනාහි අරණෙහි වූ නොරක්නා ලද දෙයයි. වහන්ස, ඒ ඔබ ඒ ළේසයෙන් නො දෙන ලද දාව පැහැර ගන්නට හඟතෙහිය. කෙසේ නම් මා වැන්නෙක් මගේ රටෙහි වසන්නා වූ ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ නසන්නේ ද සිරගෙහි ලන්නේ ද රටින් නෙරපන්නේ ද "වහන්ස, යනු මැනැවි. ඔබ ලෝමමාත්‍රයෙන් (පැවිදිලිංගයෙන්) මිදුනහු ය. නැවත මෙබන්දක් නගමක් කරණු මැනැවි."

20. මිනිස්සු අවමන් කරත්,අයුණු කියත්, නුගුණ පතුරුවත්. "ශාක්‍ය පුත්‍ර වූ මේ ශ්‍රමණයෝ අලජ්ජීහු ය. දුශ්ශීලයෝ ය. මුසාවාදීහු ය. මොහු වනාහි 'ධම්මචාරීහු ය. සමචාරීහු ය. බ්‍රහ්මචාරීහු ය. සච්චවාදීහුය. සීලවන්තයෝ ය. කලණදම් ඇත්තමෝ වෙමු'යි පිළිත කරත්තාහු ය. මොවුන්ට මහණ කමක් නැත. මොවුන්ට බමුණුකමක් නැත. මොවුන්ගේ මහණකම නටුයේ ය. මොවුන්ගේ බමුණුකම නටුයේ ය. මොවුන්ට මහණකමක් කොයින් ද? මොවුන්ට බමුණුකමක් කොයින් ද? මොහු මහණකමින් පහවූවෝ ය. මොහු බමුණුකමින් පහවූවෝය. මොහු රජුන් ද රවටත්. අන් මිනිසුන් ගැණ කියනු කවරේද"යි.

21. භික්ෂූහු අවමන් කරන්නා වූ අයුණු කියන්නා වූ නුගුණ පතුරුවන්නා වූ ඒ මිනිසුන්ගේ කථාව ඇසූහ. අපිස් වූ සතොස් වූ ලජ්ජී වූ කුකුස් කරන්නා වූ ශික්ෂාකාමී වූ යම් ඒ භික්ෂූහු වෙද්ද, ඔහු අවමන් කරත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්: "කෙසේ නම් කුම්භකාර පුත්‍ර වූ ආයුෂ්මත් ධනියස්ථවිර තෙමේ, රජු සතු නුදුන් දාව සොරකම් කෙළේද"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළ කළාහු ය.

22. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං ධනියං කුම්භකාරපුත්තං පටිපුච්ඡි: “සච්චං කිර ත්වං ධනිය රඤ්ඤො දාරූනි අදින්නං ආදියී?”ති. “සච්චං භගවා. විගරහි බුද්ධො භගවා: “අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, රඤ්ඤො දාරූනි අදින්නං ආදියිස්සසි. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං මොඝපුරිස, අප්පසන්නානඤ්චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා”ති.

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරාණවොහාරිකො මහාමත්තො භික්ඛූසු පබ්බජිතො භගවතො අවිදූරෙ නිසින්නො හොති. අථ ඛො භගවා තං භික්ඛුං එතදවොච: “කිත්තකෙන ඛො භික්ඛු, රාජා මාගධො සෙනියො බිම්බිසාරො චොරං ගහෙත්වා හනති වා බන්ධති වා පබ්බාජෙති වා?”ති “පාදෙන වා භගවා පාදාරහෙන වා”ති. තෙන ඛො පන සමයෙන රාජගහෙ පඤ්චමාසකො පාදො හොති. අථ ඛො භගවා ආයස්මන්තං ධනියං කුම්භකාර පුත්තං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**“යො පන භික්ඛු අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා, චොරො'සි බාලො'සි මූළ්හො'සි ථෙනො'සීති, තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො අයම්පි පාරාජිකො හොති අසංවාසො”**ති.

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති]

1 තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ රජකත්ථරණං ගන්ත්වා රජකභණ්ඩිකං අවහරිත්වා ආරාමං හරිත්වා භාජෙසුං. භික්ඛූ එව මාහංසු: “මහාපුඤ්ඤත්ථ තුම්හෙ ආවුසො, බහුං තුම්හාකං චීවරං උප්පන්න”න්ති. “කුතො ආවුසො අම්හාකං පුඤ්ඤං? ඉදානි මයං රජකත්ථරණං ගන්ත්වා රජකභණ්ඩිකං අවහරිම්හා”ති.

“නනු ආවුසො භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං, කිස්ස තුම්හෙ ආවුසො රජකභණ්ඩිකං අවහරිත්ථා”ති.

“සච්චං ආවුසො භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං, තඤ්ච ඛො ගාමෙ නො අරඤ්ඤෙ”ති.

2. “නනු ආවුසො තථෙව තං හොති. අනනුච්ඡවියං ආවුසො අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තුම්හෙ ආවුසො රජකභණ්ඩිකං අවහරිස්සථ? නෙතං ආවුසො අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය, අථ ඛ්වෙතං ආවුසො අප්පසන්නානඤ්චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා”ති.

22. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි භික්ෂු සඞ්ඝයා රැස් කරවා කුම්භකාරපුත්‍ර වූ ආයුෂ්මත් ධනිය තෙරුන් විචාළ සේක. "ධනිය, තෝ රජු සතු නුදුන් දැව ගත්තෙහි යනු සැබෑ ද?" "සැබෑය, භාග්‍යවතුන් වහන්ස," භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූසේක. "හිස් පුරුෂය, නුසුදුසු වූවකි. අනුලොම් නුවූවකි. නොගැළපෙන්නකි. ශ්‍රමණ සාරූප්‍ය නුවූවකි. නොකැපවූවකි. නොකටයුත්තකි. "හිස් පුරුෂය, කෙසේ නම් තෝ නුදුන් රජු සතු දැව ගත්තෙහි ද?, "හිස් පුරුෂය මෙල කරුණ නොපහන් වූවන්ගේ ප්‍රසාදය පිණිස හෝ පහන් වූවන්ගේ වැඩි පැහැදීම පිණිස හෝ නො වෙයි. වැලි හිස් පුරුෂය, මෙල කරුණ නො-පහන් වූවන්ගේ නො පැහැදීම පිණිස ද, පහන් වූ ඇතැමුන්ගේ වෙනස් බව පිණිස ද වේ".

23. එසමයෙහි එක්තරා ගිහිකල විනිසකරු මහ ඇමතියෙක් භික්ෂූන් අතර පැවිදි වූයේ භාග්‍යවතුන් වහන්සේට නුදුරු තන්හි හුන්නේ වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූහට මෙය කීසේක. "මහණ, මගධාධි-පති වූ සේනාසමපන්න වූ බිම්සර රජතෙමේ කොපමණකින් සොරකු අල්ලා තසා ද? සිර කෙරේ ද? රටින් නෙරපා ද?" "භාග්‍යවතුන් වහන්ස, පාදයකින් හෝ පාදයක් පොහෝනා දෙයකිනි". එසමයෙහි රජගහනුවර මසුපසක් පාදයක් වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කුම්භකාර පුත්‍ර වූ ආයුෂ්මත් ධනියහට නන් අයුරින් ගරහා දුභර බැව් පිළිබඳ -පෙ- මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් හිමියන් විසින් නුදුන් වස්තුව සොරසිතින් ගණී ද, යම්බඳු වූ නුදුන් වස්තුව ගැන්මෙහි රජවරු සොරහු ගෙණ 'සොරෙකි, බාලයෙකි, මූඪයෙකි, අනුන් අයත් දැය සොරා ගත්තෙහි'යි පෙළද්ද, බඳිද්ද, රටින් නගද්ද, එබඳු වූ නුදුන් වස්තුව ගන්නා ඒ මහණ තෙමේ ද පරිජි අවන්නේ සංවාස නැත්තෙක් වේ."**

භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ සික පදය මෙසේත් පණවන ලද්දේ වෙයි.

## [මුල් පැණවීමයි]

1. එසමයෙහි **සවගමහණහු** රදතොටට ගොස් රජකයන් සතු රෙදි පොදියක් සොරකම් කොට ආරාමයට ගෙණ ගොස් බෙද ගත්තාහුය. භික්ෂූහු මෙසේ කීහු. "ඇවැත්නි, තෙපි මහ පිණැත්තෝ වහු ය. නොපට බොහෝ සිවුරු උපන." "ඇවැත්නි, අපට පිණක් කොයින් ද? දැන් අපි රදතොටට ගොස් රජකයන් සතු රෙදි පොදියක් සොරකම් කෙළෙමු"යි.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපදයක් පණවන ලද්දේ නො වේ ද, "ඇවැත්නි, තෙපි කුමක් හෙයින් රජකයන් සතු රෙදි පොදියක් සොරකම් කළහුද?"'යි.

"ඇවැත්නි, සැබව. භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපදයක් පණවන ලදී. හෙ ද වනාහි ගමෙහි ය. අරණෙහි නො වේ."

2. "ඇවැත්නි, එය එසේ ම නො වේ ද?" ඇවැත්නි, නුසුදුසුවූවකි, අනුලොම් නුවූවකි. නොගැළපෙන්නකි. ශ්‍රමණ සාරූප්‍ය නුවූවකි. නොකැප වූවකි, නොකටයුත්තකි, ඇවැත්නි, තෙපි කෙසේ නම් රජකයන් සතු රෙදි පොදියක් සොරකම් කළහු ද? ඇවැත්නි, මෙය නොපහන්වූවන්ගේ පැසාදය පිණිස හෝ පහන්වූවන්ගේ වැඩි පැහැදීම පිණිස හෝ නො වේ." "ඇවැත්නි, වැලි, එය නොපහන්වූවන්ගේ නොපැහැදීම පිණිස ද, පහන් වූ ඇතැමුන්ගේ වෙනස් බව පිණිස ද වේ'යි.

3. අථ ඛො තෙ භික්ඛූ ඡබ්බග්ගියෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ පටිපුච්ඡි "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ රජකත්ථරණං ගන්ත්වා රජකභණ්ඩිකං අවහරිත්ථා?"ති "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවිකං මොඝපුරිසා, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තුම්හෙ මොඝපුරිසා රජකත්ථරණං ගන්ත්වා රජකභණ්ඩිකං අවහරිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා 'චොරොසි' 'බාලොසි' 'මූළ්හොසි' 'ථෙනොසී'ති, තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො අයම්පි පාරාජිකො හොති අසංවාසො"ති.**

[**දුතියපඤ්ඤත්ති**]

4. **යො පනාති** - යො යාදිසො -පෙ-

**භික්ඛූති**-භික්ඛකොති භික්ඛු -පෙ- අයං ඉමස්මිං **අත්ථෙ** අධිප්පෙතො භික්ඛූති.

**ගාමො නාම** - එකකුටිකොපි ගාමො ද්විකුටිකොපි ගාමො තිකුටිකොපි ගාමො චතුකුටිකොපි ගාමො සමනුස්සොපි ගාමො අමනුස්සොපි ගාමො පරික්ඛිත්තොපි ගාමො අපරික්ඛිත්තොපි ගාමො ගොනිසාදිනිවිට්ඨොපි ගාමො යොපි සත්ථො අතිරෙකචාතුමාසනිවිට්ඨො, සොපි වුච්චති ගාමො.

**ගාමූපචාරො** නාම: පරික්ඛිත්තස්ස ගාමස්ස ඉන්දඛීලෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො. අපරික්ඛිත්තස්ස ගාමස්ස ඝරූපචාරෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො.

**අරඤ්ඤං** නාම: ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච අවසෙසං අරඤ්ඤං නාම.

**අදින්නං** නාම: යං අදින්නං අනිස්සට්ඨං අපරිච්චත්තං රක්ඛිතං ගොපිතං මමායිතං පරපරිග්ගහිතං, එතං අදින්නං නාම.

**ථෙය්‍යසඞ්ඛාතන්ති** - ථෙය්‍යචිත්තො අවහරණචිත්තො.

**ආදියෙය්‍යාති** - ආදියෙය්‍ය හරෙය්‍ය අවහරෙය්‍ය ඉරියාපථං විකොපෙය්‍ය ඨානා චාවෙය්‍ය සඞ්කෙතං වීතිනාමෙය්‍ය.

**යථාරූපං නාම**: පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා.

3. ඉක්බිති ඒ භික්ෂූහු සවගම්භණුන්ට නන් අයුරින් ගරහා භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ, සැල කළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා සවගම්භණුන් පුළුවුත්හ: "සැබෑ ද, මහණෙනි, තෙපි රදතොටට ගොස් රජකයන් සතු රෙදි පොදියක් සොරකම් කළහු ද?"යි. "භාග්‍යවතුන් වහන්ස සැබෑය." භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූසේක. "හිස් පුරුෂයෙනි, නුසුදුස්සකි. අනුලෝම නුවූවකි. නොගැළපෙන්නකි. ශ්‍රමණ සාරුප්‍ය නුවූවකි. නොකැපවූවකි. නො කටයුත්තකි. හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් රදතොටට ගොස් රජකයන් සතු රෙදි පොදියක් සොරකම් කළහු ද? හිස් පුරුෂයෙනි, මෙය නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. -පෙ- මහණෙනි, මෙසේත් මේ සිකපදය (අනුප්‍රඥප්තවශයෙන්) උදෙසවු:

**"යම් මහණෙක් නුදුන් වස්තුවක් ග්‍රාමයෙන් හෝ අරණ්‍යයෙන් හෝ සොරසිතින් ගණී ද, යම්බඳු වූ නුදුන් වස්තුවක් ගැන්මෙහි රජවරු 'සොරහු මෙණ සොරෙහි, බාලයෙහි, මූඪයෙහි, අනුන් අයත් දැය සොර ගත්තෙහි'යි ඔහු පෙළද්ද බඳිද්ද රටින් නෙරද්ද එබඳු නුදුන් වස්තුව සොරසිතින් ගන්නාවූ මේ මහණ ද පරිජි අවන්නේ සංවාස රහිතවූයේ වෙයි".**

[දෙවැනි පැණවීමයි]

4. **යොපන** යනු යම්බඳු වූ යමෙක් -පෙ-;

**භික්ඛු** යනු භිහන්නේ "භික්ෂු" නම්වේ. -පෙ- මේ තෙමේ මේ අරුත්හි භික්ෂුය යි අභිප්‍රෙතයි.

**ගාම** නම්: එක් කිළියක් ඇත්තේ ද ගමය. දෙකිළියක් ඇත්තේ ද ගමය. ගෙවල් තුණක් ඇත්තේ ද ගමය. ගෙවල් සතරක් ඇත්තේ ද ගමය. මිනිසුන් සහිතවූයේ ද ගමය. මිනිසුන් රහිතවූයේ ද ගමය. පිරිකෙව් කරණ ලද්දේ ද ගමය. පිරිකෙව් නො කරණ ලද්දේ ද ගමය. වීපි වෙත් කිරීමක් නොමැතිව ගෙවල් දෙකක් තුණක් (ගවයන් ලැගුනාක් මෙන්) තැනින් තැන වූයේ ද ගමය. යම් සාර්ථවාහකසමූහයක් ගාල්බඳු වෙළෙඳමූලක් අසිරා සිවුමස් කලක් විසුයේද ගමය යි කියනු ලැබේ.

**ගාමූපචාරය** නම්: පිරිකෙව් කළ ගමෙහි ඉන්ද්‍රඛීලය (පුරවැඩ) වෙත සිටි මැදුම් පුරුෂයෙකුගේ ලෙඩ්ඩුපාත යයි. (ගලක් ගසන දුරයි.) නො පිරිකෙව් කළ ගමෙහි ගෘහොපචාරයෙහි සිටියාවූ මැදුම් පුරුෂයෙකුගේ ලෙඩ්ඩුපාත ය යි.

**අරඤ්ඤ** නම්: ගම් ද, ගාමූපචාරය ද හැර සෙස්ස අරණ නම්.

**අදින්න** නම්: යමක් නො දෙන ලද ද, (අයිතියෙන්) බැහැර නො කරණ ලද ද, පරිත්‍යාග නො කරණ ලද ද, රක්නා ලද ද, ගෝපනය කරණ ලද ද, මාගේ යයි ගන්නා ලද ද, අනුන් අයත් දෑ ද, මෙය අදින්න නම්.

**ථෙය්‍යසඞ්ඛාතං** යනු- සොර සිත් ඇත්තේ, පැහැර ගන්නා සිත් ඇත්තේ ය.

**ආදියෙය්‍ය** යනු- ගණී නම්, හැර ගණී නම්, පැහැර ගණී නම්, ඉරියව් වෙනස් කෙරේ නම්, තුබූ තැනින් වෙන් කෙරේ නම්, සලකුණ ගැණීමෙහි කළ ලකුණ ඉක්මවා නම් ය.

**යථාරූපං** යනු- පාදයක් (මසු පහක්) හෝ, පාදයක් අගනේ හෝ පාදයකට වැඩි වූයේ හෝ ය.

රාජානො නාම: පඨබ්‍යාරාජා, පදෙසරාජා, මණ්ඩලිකා, අන්තරභොගිකා, අක්ඛදස්සා, මහාමත්තා, යෙ වා පන ඡෙජ්ජභෙජ්ජං අනුසාසන්ති, එතෙ රාජානො නාම.

චොරො නාම: යො පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, එසො චොරො නාම.

හනෙය්‍යුං වාති - හත්ථෙන වා පාදෙන වා කසාය වා වෙත්තෙන වා අඩ්ඪදණ්ඩකෙන වා ඡෙජ්ජාය වා හනෙය්‍යුං.

බන්ධෙය්‍යුං වාති - රජ්ජුබන්ධනෙන වා අන්දුබන්ධනෙන වා සඞ්ඛලිකබන්ධනෙන වා ඝරබන්ධනෙන වා නගරබන්ධනෙන වා ගාමබන්ධනෙන වා නිගමබන්ධනෙන වා බන්ධෙය්‍යුං, පුරිසගුත්තිං වා කරෙය්‍යුං.

පබ්බාජෙය්‍යුං වාති - ගාමා වා නිගමා වා නගරා වා ජනපදා වා ජනපදපදෙසා වා පබ්බාජෙය්‍යුං.

චොරොසි බාලොසි මූළ්හොසි ථෙනොසීති - පරිභාසො එසො.

තථාරූපං නාම: පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා.

ආදියමානොති - ආදියමානො හරමානො අවහරමානො ඉරියාපථං විකොපයමානො ඨානා චාවයමානො සඞ්කෙතං වීතිනාමයමානො.

අයම්පීති - පුරිමං උපාදාය වුච්චති.

පාරාජිකො හොතීති - සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසො බන්ධනා පවුත්තො[1] අභබ්බො හරිතත්තාය. එවමෙව භික්ඛු පාදං වා පාදාරහං වා අතිරෙකපාදං වා අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තෙන වුච්චති පාරාජිකො හොතීති.

අසංවාසොති - සංවාසො නාම එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා, එසො සංවාසො නාම. සො තෙන සද්ධිං නත්ථි තෙන වුච්චති අසංවාසොති

---

[නයමාතිකා]

1. භූමට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං උදකට්ඨං නාවට්ඨං යානට්ඨං භාරට්ඨං ආරාමට්ඨං විහාරට්ඨං ඛෙත්තට්ඨං වත්ථුට්ඨං ගාමට්ඨං අරඤ්ඤට්ඨං උදකං දන්තපොනං වනප්පති හරණකං උපනිධි සුඞ්කඝාතං පාණො අපදං දිපදං චතුප්පදං බහුප්පදං ඔචරකො ඔණිරක්ඛො සංවිදාවහාරො සඞ්කෙතකම්මං නිමිත්තකම්මන්ති.

---

1. පවුත්තො, සබ්බත්ථ. "සෙය්‍යථාපි නාම පණ්ඩුපලාසො බන්ධනා පවුත්තො"- ධම්මප්පදීපිකා (315)

**රාජානො** යනු- පෘථිවිශ්වර රජහු ය, ප්‍රදේශ රජහු ය, මණ්ඩලිකයෝ ය, අතර පිහිටි ගම් කීපයක් වළඳනා රජහු ය. අක්ෂදර්ශක (විනිශ්චයකාරක) යෝ ය, මහාමාත්‍යයෝ ය, යම් කෙනෙක් සිඳුම් බිඳුම් ඈ දඬුවම් නියම කෙරෙද්ද, මොහු මෙහි රජවරු නම් වෙත්.

**චොර** යනු- යමෙක් මසු පසක් හෝ අසිරූ මසු පසක් හෝ අගනා හිමියන් නුදුන් දෙය සොර සිතින් ගණී ද, හේ චෝර නම්.

**හනෙය්‍යුං වා** සි- අතින් හෝ පයින් හෝ කසයෙන් හෝ වේවැලින් හෝ අඩදඬුවකින් හෝ අවියකින් හෝ පෙළන්නාහු ය.

**බන්ධෙය්‍යුං වා** සි- රැහැන් බැම්මෙන් හෝ, විලංගු බැම්මෙන් හෝ, හැකිලි බැම්මෙන් හෝ, ගෙයක සිරකර තැබීමෙන් හෝ, නුවරක සිරකර තැබීමෙන් හෝ, ගමක සිරකර තැබීමෙන් හෝ, නියම් ගමක සිරකර තැබීමෙන් හෝ, මෙසේ බඳින්නාහුය. පුරුෂාරක්ෂාව හෝ කරන්නාහුය.

**පබ්බාජෙය්‍යුං වා** සි- ගමින් හෝ, නියම් ගමින් හෝ, නුවරින් හෝ, ජනපදයෙන් හෝ, ජනපදපෙදෙසින් හෝ, බැහැර කරන්නාහු ය.

**චොරොසි බාලොසි මූළ්හොසි ථෙනොසි** යනු- මෙය පරිභව කීමකි.

**තථාරූපං**: නම් පාදයක් හෝ, පාදයක් අගනේ හෝ, අසිරූ පාදයක් හෝ ය.

**ආදියමානො** යනු- ගන්නේ, හැරගන්නේ, පැහැර ගන්නේ, ඉරියව් වෙනස් කරන්නේ, තුබූ තැනින් ඉවත් කරන්නේ, සලකුණ වෙනස් කරන්නේ ය.

**අයම්පි** යනු-පළමු පරිජ් ඇවැතට අවත් පුද්ගලයා ගෙණ 'මෙතෙමේත්' සි කියනු ලැබේ.

**පාරාජිකො හොති** යනු- යමසේ නටුයෙන් ගිලිහුනු කොළය නැවත තිල්විමට නුසුදුසු වේ ද, එපරිද්දෙන් ම මහණ තෙමේ පාදයක් හෝ, පාදයක් අගනා දෙය හෝ, අසිරූ පාදයක් හෝ, හිමියන් නුදුන් දෙය සොර සිතින් ගෙණ අශ්‍රමණයෙක් වෙයි. අශාක්‍යපුත්‍රීයයෙක් වෙයි. එහෙයින් පාරාජික වේ යයි කියනු ලැබේ.

**අසංවාසො** සි - සංවාස නම් එක්ව විනයකම් කිරීම, එක්ව උදෙසීම, සමානශික්ෂා ඇතිබව මේ සංවාස නමි. එය ඔහු හා නැත් නුයි එහෙයින් අසංවාසයයි කියනු ලැබේ.

---

[නයමාතෘකා]

1. භූමට්ඨය, ථලට්ඨය, ආකාසට්ඨය, වෙහාසට්ඨය, උදකට්ඨය, නාවට්ඨය, යානට්ඨය, භාරට්ඨය, ආරාමට්ඨය, විහාරට්ඨය, ඛෙත්තට්ඨය, වත්ථුට්ඨය, ගාමට්ඨය, අරඤ්ඤට්ඨය, උදකය, දන්තපොනය, වනප්පතිය, හරණකය, උපනිධිය, සුඞ්කඝාතය, පාණය, අපදය, දිපදය, චතුප්පදය, බහුප්පදය, ඔචරකය, ඔනිරක්ඛය, සංවිදාවහාරය, සංකෙතකම්මය, නිමිත්තකම්මය යි.

2. භුම්මට්ඨං නාම භණ්ඩං භූමියං නික්ඛිත්තං හොති නිඛාතං පටිච්ඡන්නං. භුම්මට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති කුදාලං වා පිටකං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. තත්ථ ජාතකං කට්ඨං වා ලතං වා ඡින්දති, ආපත්ති දුක්කටස්ස. පංසුං ඛණති වා බ්‍යූහති වා උද්ධරති වා, ආපත්ති දුක්කටස්ස. කුම්භිං ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. අත්තනො භාජනං පවෙසෙත්වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. අත්තනො භාජනගතං වා කරොති මුට්ඨිං වා ඡින්දති, ආපත්ති පාරාජිකස්ස. සුත්තාරූළ්හං භණ්ඩං පාමඞ්ගං වා කණ්ඨසුත්තකං වා කටිසුත්තකං වා සාටකං වා වෙඨනං වා ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. කොටියං ගහෙත්වා උච්චාරෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඝංසන්තො නීහරති, ආපත්ති ථුල්ලච්චයස්ස. අන්තමසො කෙසග්ගමත්තම්පි කුම්භිමුඛා මොචෙති, ආපත්ති පාරාජිකස්ස. සප්පිං වා තෙලං වා මධුං වා ඵාණිතං වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො එකෙන පයොගෙන පිවති, ආපත්ති පාරාජිකස්ස. තත්ථෙව භින්දති වා ඡඩ්ඩෙති වා ඣාපෙති වා අපරිභොගං වා කරොති, ආපත්ති දුක්කටස්ස.

3. **ථලට්ඨං** නාම භණ්ඩං ථලෙ නික්ඛිත්තං හොති. ථලට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

4. **ආකාසට්ඨං** නාම භණ්ඩං ආකාසගතං හොති. මොරො වා කපිඤ්ජරො වා තිත්තිරො වා වට්ටකො වා සාටකං වා වෙඨනං වා හිරඤ්ඤං වා සුවණ්ණං වා ඡිජ්ජමානං පතති. ආකාසට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ගමනං උපච්ඡින්දති, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

5. **වෙහාසට්ඨං** නාම භණ්ඩං වෙහාසගතං හොති මඤ්චෙ වා පීඨෙ වා චීවරවංසෙ වා චීවරරජ්ජුයා වා භිත්තිඛිලෙ වා නාගදන්තෙ වා රුක්ඛෙ වා ලග්ගිතං හොති, අන්තමසො පත්තාධාරකෙ'පි. වෙහාසට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

2. **භුම්මට්ඨ** නම්: භාණ්ඩය බිම තබන ලද්දක් වෙයි. වළ දමන ලද්දක් වෙයි. සැඟවුනක් වෙයි. බිම පිහිටි භාණ්ඩය ගැරගන්නෙමි යි සොරසිත් ඇත්තේ දෙවැන්නකු හෝ සොයා නම් උදැල්ලක් හෝ කූඩයක් හෝ සොයා නම් යේ නම් හෝ දුකුලාඇවැත් වේ. එහි හටගත් දඬු කඩක් හෝ වැලක් හෝ සිදී ද දුකුලාඇවැත් වේ. පස් සාරයි හෝ රැස් කරයි හෝ නගයි හෝ දුකුලාඇවැත් වේ. සැළක් පහස්නේ හෝ දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවත් වේ. තුඹු තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. තම බඳුන එව මිසු පසක් හෝ අයිරා මිසු පසක් හෝ අගනා දැයක් සොර සිත් ඇත්තේ පහස්නේ නම් දුකුලාඇවැත් වේ. සොලොවාතම් ථුලැසිඇවැත් වේ. තම බඳුනට ගණී නම් හෝ මිටු මොලවා ගණී නම් හෝ පරිජිඇවැත් වේ. නූලක ඇවුනු භාණ්ඩයක් හෝ පමුවක් හෝ ගෙලපලඳනාවක් හෝ හිත පලඳනාවක් හෝ සළුවක් හෝ හිස් වෙළුම්ක් හෝ සොරසිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ කෙළවර ගෙණ ඔසවා නම් ථුලැසිඇවැත් වේ. ගටමින් බැහැර කෙරේ නම් ථුලැසිඇවැත් වේ. යටත් පිරිසෙයින් කෙසගක් පමණකුදු සැළිමුවෙන් මුදා නම් පරිජිඇවැත් වේ. ගිතෙල් හෝ තලතෙල් හෝ මී හෝ උක්පැණී හෝ මිසුපසක් හෝ අයිරා මිසුපසක් හෝ අගනා දැ සොරසිත් ඇත්තේ එක්පියොවකින් පානය කෙරේ නම් පරිජිඇවැත් වේ. එහි ම බිඳී නම් හෝ බැහැර කෙරේ නම් හෝ දවා නම් හෝ පරිභොගයට නුසුදුසු කෙරේ නම් හෝ දුකුලාඇවැත් වේ.

3. **ථලට්ඨ භාණ්ඩය** නම් භූම්‍යාදි තලයෙහි තබන ලද්දක් වෙයි. ඒ ථලට්ඨ භාණ්ඩය 'පැහැර ගන්නෙමි' යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු සොයා නම් හෝ යේ නම් හෝ දුකුලාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තුඹු තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

4. **ආකාශට්ඨ භාණ්ඩය** නම් ආකාශගත වස්තුවෙක් වෙයි. මොනරෙක් හෝ සුදු තිත්වටුවෙක් හෝ කළු තිත්වටුවෙක් හෝ වටුවෙක් හෝ සළුවක් හෝ හිස්වෙළුම්ක් හෝ අමුරන් කඩක් හෝ රන්රන් කඩක් හෝ සිඳිනු ලබන්නේ වැවේ. අහසෙහි වූ භාණ්ඩය 'පැහැර ගණිමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු හෝ සොයා නම්, යේ නම් හෝ දුකුලාඇවැත් වේ. ගමන ඔබ මොබ යාම් නවතා නම් දුකුලාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලා-ඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තුඹු තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

5. **වේහාසට්ඨ භාණ්ඩ** නම් අහස් ගත වූ භාණ්ඩයක් වෙයි. ඇඳෙක හෝ පුටුවෙක හෝ සිවුරුවසෙක හෝ සිවුරු රැහැනෙක හෝ බිත්තියෙහි සවි කළ ඇණයෙක හෝ නාදන්තෙක හෝ රුකෙක හෝ යටත්පිරිසෙයින් පාත්‍රාධාර-යෙක එල්වන ලද්දෙක් වෙයි. 'අහස් ගත භාණ්ඩය 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු හෝ සොයා නම්, යේ නම් හෝ දුකුලා ඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තුඹු තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

6. **උදකට්ඨං** නාම: භණ්ඩං උදකෙ නික්ඛිත්තං හොති. උදකට්ඨං භණ්ඩං ‘අවහරිස්සාමී’ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. නිමුජ්ජති වා උම්මුජ්ජති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. තත්ථ ජාතකං උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා භිසං වා මච්ඡං වා කච්ඡපං වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

7. **නාවා** නාම යාය තරති. නාවට්ඨං නාම භණ්ඩං නාවාය නික්ඛිත්තං හොති. නාවට්ඨං භණ්ඩං ‘අවහරිස්සාමී’ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. නාවං ‘අවහරිස්සාමී’ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. බන්ධනං මොචෙති, ආපත්ති දුක්කටස්ස. බන්ධනං මොචෙත්වා ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. උද්ධං වා අධො වා තිරියං වා අන්තමසො කෙසග්ගමත්තම්පි සඞ්කාමෙති, ආපත්ති පාරාජිකස්ස.

8. **යානං** නාම වය්හං රථො සකටං සන්දමානිකා. යානට්ඨං නාම: භණ්ඩං යානෙ නික්ඛිත්තං හොති. යානට්ඨං භණ්ඩං ‘අවහරිස්සාමී’ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. යානං ‘අවහරිස්සාමී’ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

9. **භාරෙ** නාම සීසභාරෙ ඛන්ධභාරෙ කටිභාරෙ ඔලම්බකො. සීසෙ භාරං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඛන්ධං ඔරොපෙති, ආපත්ති පාරාජිකස්ස. ඛන්ධෙ භාරං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. කටිං ඔරොපෙති, ආපත්ති පාරාජිකස්ස. කටියා භාරං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. හත්ථෙන ගණ්හාති, ආපත්ති පාරාජිකස්ස. හත්ථෙ භාරං ථෙය්‍යචිත්තො භූමියං නික්ඛිපති, ආපත්ති පාරාජිකස්ස. ථෙය්‍යචිත්තො භූමිතො ගණ්හාති, ආපත්ති පාරාජිකස්ස.

6. **උදකකට්ඨ භාණ්ඩය** නම් ජලයෙහි තබන ලද්දෙක් වෙයි. උදකට්ඨ භාණ්ඩය 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු සොයා නම් හෝ යේ නම් හෝ දුකුලාඇවැත් වේ. දියේ ගිලේ නම් හෝ දියෙන් මතු වේ නම් හෝ දුකුලාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. එහි හටගත් උපුලක් හෝ පියුමක් හෝ හෙල පියුමක් හෝ නෙළුම් දූලියක් හෝ මසකු හෝ කැසුබුවකු හෝ, මසු පසක් හෝ අසිරා මසු පසක් හෝ අගනා දූය සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම්, දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජි ඇවැත් වේ.

7. **නෞකා** නම් යමෙකින් තරණය කෙරේ ද, එය යි. (**නාවට්ඨ**) නෞකාසට්ඨ භාණ්ඩ නම් නැවෙහි තබන ලද්දෙක් වෙයි. නැවෙහි වූ බඩුවක් 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු හෝ සොයා නම්, යේ නම් දුකුලාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තුබූ තැනින් පහ කෙරේ නම් පරිජි ඇවැත් වේ. 'නැව පැහැර ගණිමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු සොයා නම් යේ නම් දුකුලාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. බැම්ම මුදා නම් දුකුලාඇවැත් වේ. බැම්ම මුදා ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසි ඇවැත් වේ. උඩට හෝ යටට හෝ සරසට හෝ යටත් පිරිසෙයින් කෙසගක් පමණකුදු ගමන් කරවා නම් පරිජිඇවැත් වේ.

8. **යාන** නම් හිදෙලුව ද, රිය ද, ගැල ද, ගුරුළුපියාපත් නයින් කල රිය ද වෙයි. **යානට්ඨ** භාණ්ඩය නම් යානයෙහි තබන ලද්ද වේ. යානයෙහි තුබූ භාණ්ඩය 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු සොයා නම් හෝ යේ නම් හෝ දුකුලාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලා ඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. 'යානය පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්-නකු සොයා නම් හෝ යේ නම් හෝ දුකුලාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

9. **භාර** නම් හිසින් උසුලන බර ය, උරහිසින් උසුලන බර ය, ඉණෙන් උසුලන බර ය, එල්ලාගෙණ යන බර ය: හිසෙහි වූ බර සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසි ඇවැත් වේ. කදෙහි තබා නම් පරිජිඇවැත් වේ. කදෙහි වූ බර සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසි ඇවැත් වේ. කටියෙහි තබා නම් පරිජි ඇවැත් වේ. කටියෙහි වූ බර සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. අතට ගණී නම් පරිජිඇවැත් වේ. අතෙහි වූ බර සොර සිත් ඇත්තේ බිම තබා නම් පරිජි ඇවැත් වේ. සොර සිත් ඇත්තේ බිමින් ගණී නම් පරිජිඇවැත් වේ.

10. **ආරාමො** නාම පුප්ඵාරාමො ඵලාරාමො. **ආරාමට්ඨං** නාම භණ්ඩං ආරාමෙ චතූහි ඨානෙහි නික්ඛිත්තං හොති: භුම්මට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං. ආරාමට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. තත්ථ ජාතකං මූලං වා තචං වා පත්තං වා පුප්ඵං වා ඵලං වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. ආරාමං අභියුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. සාමිකස්ස විමතිං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. සාමිකො 'න මය්හං භවිස්සතී'ති ධුරං නික්ඛිපති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො සාමිකං පරාජෙති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො පරජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස.

11 **විහාරට්ඨං** නාම: භණ්ඩං විහාරෙ චතූහි ඨානෙහි නික්ඛිත්තං හොති: භුම්මට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං. විහාරට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. විහාරං අභියුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. සාමිකස්ස විමතිං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. සාමිකො 'න මය්හං භවිස්සතී'ති ධුරං නික්ඛිපති, ආපත්ති පාරාජිකස්ස ධම්මං චරන්තො සාමිකං පරාජෙති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො පරජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස.

12. **ඛෙත්තං** නාම යත්ථ පුබ්බණ්ණං වා අපරණ්ණං වා ජායති. **ඛෙත්තට්ඨං** නාම: භණ්ඩං ඛෙත්තෙ චතූහි ඨානෙහි නික්ඛිත්තං හොති: භුම්මට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං. ඛෙත්තට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. තත්ථ ජාතකං පුබ්බණ්ණං වා අපරණ්ණං වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. ඛෙත්තං අභියුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. සාමිකස්ස විමතිං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. සාමිකො 'න මය්හං භවිස්සතී'ති ධුරං නික්ඛිපති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො සාමිකං පරාජෙති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො පරජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඛීලං වා රජ්ජුං වා වතිං වා මරියාදං වා සඞ්කාමෙති, ආපත්ති දුක්කටස්ස. එකං පයොගං අනාගතෙ, ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පයොගෙ ආගතෙ, ආපත්ති පාරාජිකස්ස.

10. **ආරාම** නම් පුෂ්පාරාම ඵලාරාම යි. **ආරාමස්ථ භාණ්ඩ** නම් ආරාමහි භූමිස්ථ, ස්ථලස්ථ, ආකාශස්ථ, විහායසස්ථ යැ යි සතර තැනින් යම් තැනෙක තබන ලද්ද වෙයි. ආරාමයෙහි තුබූ බඩුවක් 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු හෝ සොයා නම් හෝ එයට යේ නම් හෝ දුකුලා ඇවැත් වේ. ආමර්ශනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා ද ථුල්ලසිඇවැත් වේ. තැනින් බැහැර කෙරේ ද පරිජිඇවැත් වේ. එහි හටගත් මූලක් හෝ පොත්තක් හෝ පත්‍රයක් හෝ මලක් හෝ ගෙඩියක් හෝ; පස් මස්සක් හෝ අතිරේක පස් මස්සක් හෝ අගනා දෑයක් සොර සිත් ඇත්තේ ආමර්ශනය කෙරේ ද දුකුලාඇවැත් වේ. සොලොවා ද ථුල්ලසි ඇවැත් වේ. තැනින් පහ කෙරේ ද පරිජි ඇවැත් වේ. 'අරම තමා සතු ය'යි පැමිණිලි කෙරේ ද දුකුලාඇවැත් වේ. හිමියාට විමති උපදවා ද ථුල්ලසි ඇවැත් වේ. හිමියා 'මට අයත් නොවන්නේ යැ'යි ධුරනික්ෂෙපය කෙරේ ද පරිජිඇවැත් වේ. යුක්ති බණන්නේ හිමියා පරදවා ද පරිජිඇවැත් වේ. යුක්ති බණන්නේ තෙමේ පැරැදේ ද ථුල්ලසි ඇවැත් වේ.

11. **විහාරස්ථ** භාණ්ඩය නම් විහාරයෙහි සිවු තැනින් යම් තැනෙක තබන ලද්ද වෙයි: ඒ භුම්මට්ඨ, ථලට්ඨ, ආකාසට්ඨ, වෙහාසට්ඨ යන මොහු ය. විහාරස්ථ භාණ්ඩය 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු හෝ සොයා නම් හෝ යේ නම් හෝ දුකුලාඇවැත් වේ. ආමර්ශනය කෙරේ ද දුකුලාඇවැත් වේ. සොලොවා ද ථුල්ලසිඇවැත් වේ. තුබූ තැනින් බැහැර කෙරේ ද පරිජිඇවැත් වේ. විහාරය තිමිති කොට තබූ පවරා ද දුකුලාඇවැත් වේ. හිමියාට විමති උපදවා ද ථුල්ලසිඇවැත් වේ. හිමියා 'මට නොවන්නේ ය'යි ධුර නික්ෂෙපය කෙරේ ද පරිජිඇවැත් වේ. යුක්ති බණන්නේ හිමියා පරදවා ද පරිජිඇවැත් වේ. යුක්ති බණන්නේ තෙමේ පැරැදේ ද ථුල්ලසිඇවැත් වේ.

12. **ක්ෂේත්‍ර** නම් යම් තැනෙක ඇල් ආදි පුබ්බන්න ධාන්‍ය හෝ උඳු, මුං ආදි අපරන්න ධාන්‍ය හෝ හට ගණී ද එය යි. **ක්ෂේත්‍රස්ථ භාණ්ඩය** නම් කෙතෙහි සිවු තැනින් එක්තැනෙක තබන ලද්ද වෙයි: භුම්මට්ඨ, ථලට්ඨ, ආකාසට්ඨ, වෙහාසට්ඨ යන මොහු යි. කෙතෙහි වූ බඩුවක් 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු හෝ සොයා ද, යේ ද, දුකුලා ඇවැත් වේ. ආමර්ශනය කෙරේ ද දුකුලාඇවැත් වේ. සොලොවා ද ථුල්ලසි ඇවැත් වේ. තුබූ තැනින් පහ කෙරේ ද පරිජිඇවැත් වේ. මසු පසක් හෝ අසිරා මසු පසක් අගනා එහි හටගත් පුබ්බන්න හෝ අපරන්න හෝ සොර සිත් ඇත්තේ ආමර්ශනය කෙරේ ද දුකුලාඇවැත් වේ. සොලොවා ද ථුල්ලසි ඇවැත් වේ. තුබූ තැනින් පහ කෙරේ ද පරිජිඇවැත් වේ. කෙතට තබූ පවරා ද දුකුලාඇවැත් වේ. හිමියාට විමති උපදවා ද ථුල්ලසිඇවැත් වේ. හිමියා 'මට නො වන්නේය'යි බලාපොරොත්තුව හරී ද පරිජි ඇවැත් වේ. විනිශ්චය කරන්නේ (හිමියා) පරදවා ද පරිජි ඇවැත් වේ. විනිශ්චය කරන්නේ තෙමේ පැරැදේ ද ථුල්ලසිඇවැත් වේ. ඉම් කණුව හෝ තමන් සතු කරන්නේ ද, රැහැන හෝ පතුරුවන්නේ ද, වැට හෝ ඇත් කරන්නේ ද, ඉම හෝ පුළුල් කරන්නේ ද, මෙසේ ඉම ඉවත් කෙරේ නම් දුකුලාඇවැත් වේ. එය පිළිබඳ එක් ප්‍රයොගයක් (පමණක්) සම්පූර්ණ නොවූ කල්හි ථුල්ලසිඇවැත් වේ. ඒ ප්‍රයෝගය (උත්සාහය) ද සම්පූර්ණ වූ කල්හි පරිජිඇවැත් වේ.

13. **වත්ථු** නාම ආරාමවත්ථු විහාරවත්ථු. **වත්ථුට්ඨං** නාම: භණ්ඩං වත්ථුස්මිං චතූහි ඨානෙහි නික්ඛිත්තං හොති: භූමට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං. වත්ථුට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. වත්ථුං අභියුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. සාමිකස්ස විමතිං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. සාමිකො 'න මය්හං භවිස්සතී'ති ධුරං නික්ඛිපති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො සාමිකං පරාජෙති, ආපත්ති පාරාජිකස්ස ධම්මං චරන්තො පරජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඛීලං වා රජ්ජුං වා වතිං වා පාකාරං වා සඞ්කාමෙති, ආපත්ති දුක්කටස්ස. එකං පයොගං අනාගතෙ, ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පයොගෙ ආගතෙ, ආපත්ති පාරාජිකස්ස.

14. **ගාමට්ඨං** නාම: භණ්ඩං ගාමෙ චතූහි ඨානෙහි නික්ඛිත්තං හොති: භූමට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං. ගාමට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

15. **අරඤ්ඤං** නාම යං මනුස්සානං පරිග්ගහිතං හොති, තං අරඤ්ඤං. **අරඤ්ඤට්ඨං** නාම: භණ්ඩං අරඤ්ඤෙ චතූහි ඨානෙහි නික්ඛිත්තං හොති: භූමට්ඨං ථලට්ඨං ආකාසට්ඨං වෙහාසට්ඨං. අරඤ්ඤට්ඨං භණ්ඩං 'අවහරිස්සාමී'ති ථෙය්‍යචිත්තො දුතියං වා පරියෙසති ගච්ඡති වා, ආපත්ති දුක්කටස්ස. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. තත්ථ ජාතකං කට්ඨං වා ලතං වා තිණං වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

16. **උදකං** නාම භාජනගතං වා හොති පොක්ඛරණියා වා තළාකෙ වා. ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. අත්තනො භාජනං පවෙසෙත්වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං උදකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. අත්තනො භාජනගතං කරොති, ආපත්ති පාරාජිකස්ස. මරියාදං ඡින්දති, ආපත්ති දුක්කටස්ස. මරියාදං ඡින්දිත්වා පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං උදකං නික්ඛාමෙති, ආපත්ති පාරාජිකස්ස. අතිරෙකමාසකං වා ඌනපඤ්චමාසකං වා අග්ඝනකං උදකං නික්ඛාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. මාසකං වා ඌනමාසකං වා අග්ඝනකං උදකං නික්ඛාමෙති, ආපත්ති දුක්කටස්ස.

13. **වාස්තු** නම් ආරාම වාස්තු විහාර වාස්තු යි. **වාස්තුස්ථ භාණ්ඩ** නම් වත්තෙහි සිටි තැනින් යම් තැනෙක තබන ලද්ද වෙයි: භුම්මට්ඨය ථලට්ඨය ආකාසට්ඨය වෙහාසට්ඨය යන මොහු ය. වත්තෙහි වූ බඩු 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු හෝ යොදා ද යේ ද දුකුළාඇවැත් වේ. ආමශීනය කෙරේ ද දුකුළාඇවැත් වේ. සොලොවා ද ථුල්ලැසිඇවැත් වේ. තුබූ තැනින් පහ කෙරේ ද පරිජිඇවැත් වේ. වත්තට නඩු පවරා ද දුකුළාඇවැත් වේ. හිමියාට විමති උපදවා ද ථුල්ලැසිඇවැත් වේ. හිමියා 'මට නො වන්නේ යැ'යි බලාපොරොත්තුව හරී ද පරිජිඇවැත් වේ. විනිශ්චය කරන්නේ හිමියා පරදවා ද පරිජිඇවැත් වේ. විනිශ්චය කරන්නේ තෙමේ පැරැදේ ද ථුල්ලැසිඇවැත් වේ. ඉම් කණුව හෝ රැහැන හෝ වැට හෝ පවුර හෝ තමන් සතු වන සේ වෙනස් කෙරේ ද දුකුළාඇවැත් වේ. එක් ප්‍රයෝගයක් සම්පූර්ණ නොවූ කල්හි ථුල්ලැසිඇවැත් වේ. ඒ ප්‍රයෝගය ද සම්පූර්ණ වූ කල්හි පරිජිඇවැත් වේ.

14. **ග්‍රාමස්ථ** නම් ගමෙහි සිටි තැනින් එක් තැනෙක තබන ලද භාණ්ඩය වෙයි: භුම්මට්ඨ, ථලට්ඨ, ආකාසට්ඨ, වෙහාසට්ඨ (යන මොහු ය.) ගමෙහි වූ භාණ්ඩය 'පැහැර ගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු සොයා නම් හෝ යේ නම් හෝ දුකුළාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

15. **අරණ්‍ය** නම් මිනිසුන් විසින් පරිගෘහීත යමක් වේ ද එය අරණ්‍යය යි. **අරණ්‍යස්ථ භාණ්ඩය** නම් අරණෙහි සිටි තැනින් එක් තැනෙක තබන ලද්ද වෙයි. භුම්මට්ඨ, ථලට්ඨ, ආකාසට්ඨ, වෙහාසට්ඨ යන මොහු යි. අරණෙහි වූ භාණ්ඩයක් 'පැහැරගන්නෙමි'යි සොර සිත් ඇත්තේ දෙවැන්නකු සොයා නම් හෝ යේ නම් හෝ දුකුළාඇවැත් වේ. ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. මසු පසක් හෝ අයිරා මසු පසක් අගනා එහි හටගත් ලීයක් හෝ වැලක් හෝ තණ හෝ සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජි ඇවැත් වේ.

16. **උදක** නම් භාජනගත වූ හෝ පොකුණෙහි වූ හෝ තඩාගයෙහි වූ දියෙක් වේ. එය සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජි ඇවැත් වේ. තමාගේ බඳුන එහි එව මසු පසක් හෝ අයිරා මසු පසක් හෝ අගනා දියක් සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලැසිඇවැත් වේ. තම බඳුනට ගණී නම් පරිජි ඇවැත් වේ. මියර සිඳී නම් දුකුළාඇවැත් වේ. මියර සිඳ මසු පසක් හෝ හෝ අයිරා මසු පසක් හෝ අගනා දියක් නික්මවා ගණී නම් පරිජි ඇවැත් වේ. මස්සකට වැඩි වූ හෝ මසු පසකට අඩු වූ අගනා දියක් නික්මවා ගණී නම් ථුල්ලැසිඇවැත් වේ. මස්සක් හෝ උනුමස්සක් හෝ අගනා දියක් නික්මවා ගණී නම් දුකුළාඇවැත් වේ.

17. **දන්තපොනං** නාම ඡින්නං වා අච්ඡින්නං වා. පඤ්චමාසකං වා අතිරේකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

18. **වනස්සති**[1] නාම මනුස්සානං පරිග්ගහිතො හොති රුක්ඛො පරිභොගො. ථෙය්‍යචිත්තො ඡින්දති, පහාරෙ පහාරෙ ආපත්ති දුක්කටස්ස. එකං පහාරං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පහාරෙ ආගතෙ ආපත්ති පාරාජිකස්ස.

19. **හරණකං** නාම අඤ්ඤස්ස හරණකං භණ්ඩං. ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. 'සහභණ්ඩහාරකං නෙස්සාමී'ති පඨමං පාදං සඞ්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං සඞ්කාමෙති, ආපත්ති පාරාජිකස්ස. 'පතිතං භණ්ඩං ගහෙස්සාමී'ති පාතාපෙති, ආපත්ති දුක්කටස්ස. පතිතං භණ්ඩං පඤ්චමාසකං වා අතිරේකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

20. **උපනිධි** නාම උපනික්ඛිත්තං භණ්ඩං. 'දෙහි මෙ භණ්ඩ'න්ති වුච්චමානො 'නාහං ගණ්හාමී'ති භණති, ආපත්ති දුක්කටස්ස. සාමිකස්ස විමතිං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. සාමිකො 'න මය්හං දස්සතී'ති ධුරං නික්ඛිපති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො සාමිකං පරාජෙති, ආපත්ති පාරාජිකස්ස. ධම්මං චරන්තො පරජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස.

21. **සුඞ්කඝාතං** නාම රඤ්ඤා ඨපිතං හොති පබ්බතඛණ්ඩෙ වා නදීතිත්ථෙ වා ගාමද්වාරෙ වා 'අත්‍ර පවිට්ඨස්ස සුඞ්කං ගණ්හන්තූ'ති. තත්‍ර පවිසිත්වා රාජග්ගං භණ්ඩං පඤ්චමාසකං වා අතිරේකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. පඨමං පාදං සුඞ්කඝාතං අතික්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං අතික්කාමෙති, ආපත්ති පාරාජිකස්ස. අන්තො සුඞ්කඝාතෙ ඨිතො බහි සුඞ්කඝාතං පාතෙති, ආපත්ති පාරාජිකස්ස. සුඞ්කං පරිහරති, ආපත්ති දුක්කටස්ස.

22. **පාණො** නාම මනුස්සපාණො වුච්චති. ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. 'පදසා නෙස්සාමී'ති පඨමං පාදං සඞ්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං සඞ්කාමෙති, ආපත්ති පාරාජිකස්ස.

23. **අපදං** නාම අහිමච්ඡා. පඤ්චමාසකං වා අතිරේකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

---

1 වනප්පති, - මජසං.

17. **දන්තපොන** නම් සිඳින ලද හෝ නො සිඳින ලද දැහැවුයෙක් දතන පවතනදැහැටි වෙයි. මසු පසක් හෝ අසිරු මසු පසක් හෝ අගනා දැහැටි සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

18. **වනප්පති** නම් මිනිසුන් විසින් පරිගෘහිත මිනිසුන්ගේ පරිභෝග වූ වෘක්‍ෂයෙක් වෙයි. සොර සිත් ඇත්තේ (එය) සිඳී නම් පහරක් පාසා දුකුළා-ඇවැත් වේ. එක් පහරක් නො පැමිණි කල්හි ථුලැසිඇවැත් වේ. ඒ පහර ද පැමිණි කල්හි පරිජිඇවත් වේ.

19. **හරණක** නම් අනෙකකුට ගෙණ යන බඩුවෙකි. සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. 'බඩුව සමග ගෙණ යන්නහු හැර ගෙණ යන්නෙමි'යි පළමු පිය ඉදිරියට තබා නම් ථුලැසිඇවැත් වේ. දෙවෙනි පිය ඉදිරියට තබා නම් පරිජිඇවැත් වේ. 'වැටුනු බඩුව හැර ගන්නෙමි'යි බිම ලවා නම් දුකුළාඇවැත් වේ. මසු පසක් හෝ අසිරා මසු පසක් හෝ අගනා වැටුනු බඩුවක් සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

20. **උපනිධි** නම් රක්නා පිණිස තැබූ බඩුව ය. 'මගේ බඩුව දෙව'යි කියනු ලබන්නේ 'මම නො ගණිමි'යි කියා නම් දුකුළාඇවැත් වේ. හිමියාට විමති උපදවා නම් ථුලැසිඇවැත් වේ. හිමි තෙමේ 'මට නො දෙන්නේ යැ'යි ධුරනික්‍ෂෙප කෙරේ නම් පරිජිඇවැත් වේ. විනිශ්චය කරන්නේ හිමියා පරදවා නම් පරිජිඇවැත් වේ. විනිශ්චය කරන්නේ (තෙමේ) පරදී නම් ථුලැසිඇවැත් වේ.

21. **සුඞ්කඝාත** නම් කඳු කපොල්ලෙක හෝ ගංතොටෙක හෝ ගම් දොරෙක හෝ 'මෙහි පැමිණියහුගෙන් සුංවත් ගණිත්වා'යි රජු විසින් නියම කොට තබන ලද්දක් වේ. එහි පිවිස රජුගේ සුංවතට සුදුසු වූ මසු පසක් හෝ අසිරා මසුපසක් හෝ අගනා බඩුවක් සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. පළමු පිය සුංවත් ගන්නා තැනින් ඉක්මවා නම් ථුලැසිඇවැත් වේ, දෙවෙනි පිය ඉක්මවා නම් පරිජි ඇවැත් වේ. සුංවත් ගන්නා තැනැ තුළ සිටියේ සුංවත් ගන්නා තැනින් සුංකම පිටතට හෙළා නම් පරිජි ඇවැත් වේ. සුංකම වළකා නම් දුකුළාඇවැත් වේ.

22. **ප්‍රාණ** නම් මනුෂ්‍ය ප්‍රාණියෙක් කියනු ලැබේ. සොර සිතින් ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. 'පා ගමනින් ගෙණ යන්නෙමි'යි පළමු පිය ඉදිරියට තබවා නම් ථුලැසිඇවැත් වේ. දෙවෙනි පිය තබවා නම් පරිජි ඇවැත් වේ.

23. **අපද** නම් සර්පයෝ ය මත්ස්‍යයෝ ය. මසු පසක් හෝ අසිරා මසුපසක් හෝ අගනා සතකු සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

24. **ද්විපදං** නාම මනුස්සා පක්ඛජාතා. ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. 'පදසා නෙස්සාමී'ති පඨමං පාදං සඞ්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං සඞ්කාමෙති, ආපත්ති පාරාජිකස්ස.

25. **චතුප්පදං** නාම හත්ථී අස්සා ඔට්ඨා ගොණා ගද්‍රභා පසුකා. ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. 'පදසා නෙස්සාමී'ති පඨමං පාදං සඞ්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං සඞ්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. තතියං පාදං සඞ්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. චතුත්ථං පාදං සඞ්කාමෙති, ආපත්ති පාරාජිකස්ස.

26. **බහුප්පදං** නාම විච්ඡිකා-සතපදී-උච්චාලිඞ්ගපාණකා. පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස. 'පදසා නෙස්සාමී'ති සඞ්කාමෙති, පදෙ පදෙ ආපත්ති ථුල්ලච්චයස්ස. පච්ඡිමං පාදං සඞ්කාමෙති, ආපත්ති පාරාජිකස්ස.

27. **ඔචරකො** නාම භණ්ඩං ඔචරිත්වා ආචික්ඛති "ඉත්ථන්නාමං භණ්ඩං අවහරාති" ආපත්ති දුක්කටස්ස. සො තං භණ්ඩං අවහරති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

28. **ඔණිරක්ඛො** නාම ආහටං භණ්ඩං ගොපෙන්තො පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං ථෙය්‍යචිත්තො ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

29. **සංවිදාවහාරො** නාම සම්බහුලා සංවිදහිත්වා එකො භණ්ඩං අවහරති, ආපත්ති සබ්බෙසං පාරාජිකස්ස.

30. **සඞ්කෙතකම්මං** නාම සඞ්කෙතං කරොති පුරෙභත්තං වා පච්ඡාභත්තං වා රත්තිං වා දිවා වා 'තෙන සඞ්කෙතෙන තං භණ්ඩං අවහරා'ති ආපත්ති දුක්කටස්ස. තෙන සඞ්කෙතෙන තං භණ්ඩං අවහරති, ආපත්ති උභින්නං පාරාජිකස්ස. තං සඞ්කෙතං පුරෙ වා පච්ඡා වා තං භණ්ඩං අවහරති, මූලට්ඨස්ස අනාපත්ති. අවහාරකස්ස ආපත්ති පාරාජිකස්ස.

31. **නිමිත්තකම්මං** නාම නිමිත්තං කරොති 'අක්ඛිං වා නිඛණිස්සාමි භමුකං වා උක්ඛිපිස්සාමි සීසං වා උක්ඛිපිස්සාමි, තෙන නිමිත්තෙන තං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. තෙන නිමිත්තෙන තං භණ්ඩං අවහරති, ආපත්ති උභින්නං පාරාජිකස්ස. තං නිමිත්තං පුරෙ වා පච්ඡා වා තං භණ්ඩං අවහරති, මූලට්ඨස්ස අනාපත්ති, අවහාරකස්ස ආපත්ති පාරාජිකස්ස.

24. **ද්විපද** නම් මිනිස්සුද, පක්ෂීහු ද වෙත්. සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. 'පා ගමනින් ගෙණ යන්නෙමි'යි පළමු පිය ඉදිරියට තබවා නම් ථුල්ලසිඇවැත් වේ. දෙවෙනි පිය තබවා නම් පරිජිඇවැත් වේ.

25. **චතුෂ්පද** නම් ඇත් ය, අස් ය, ඔටු ය, ගව ය, කොටළු ය, සෙසු සිවුපාවෝ ය යන මොහු වෙති. සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. 'පා ගමනින් ගෙණ යන්නෙමි'යි පළමු පිය ඉදිරියට තබවා නම් ථුල්ලසිඇවැත් වේ. දෙවැනි පිය තබවා නම් ථුල්ලසිඇවැත් වේ. තෙවැනි පිය තබවා නම් ථුල්ලසිඇවැත් වේ. සිවුවන පිය තබවා නම් පරිජිඇවැත් වේ.

26. **බහුපද** නම් ගෝණුස්සෝ ය, පත්තෑයෝ ය, ඛුපණුවෝ ය, යන මොහු වෙත්. මිසු පසක් හෝ අසිරා මිසු පසක් හෝ අගතා සතකු සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ. 'පා ගමනින් ගෙණ යන්නෙමි'යි ඉදිරියට ගමන් කරවා නම් පියක් පාසා ථුල්ලසිඇවැත් වේ. පැසුම් පිය මාරු කරවා නම් පරිජිඇවැත් වේ.

27. **ඔචරක** නම් (යමෙක්) බඩුවක ඔත්තු බලා 'මෙ නම් බඩුව පැහැර ගණුව'යි කියා නම් දුකුලාඇවැත් වේ. හෙතෙමේ ඒ බඩුව සොරකම් කෙරේ නම් දෙදෙනාට ම පරිජිඇවැත් වේ.

28. **ඔනිරක්ඛ** නම් අනෙකකු ගෙණවුත් තුබූ බඩුව රක්නේ වෙයි. මිසු පසක් හෝ අසිරා මිසු පසක් හෝ අගතා එය සොර සිත් ඇත්තේ ආමශීනය කෙරේ නම් දුකුලාඇවැත් වේ. සොලොවා නම් ථුල්ලසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජි ඇවැත් වේ.

29. **සංවිදාවහාර** නම් බොහෝ දෙනෙකු සාකා කොට ගෙණ එකෙක් බඩුවක් සොරකම් කරයි. ඒ සියල්ලන් හට පරිජිඇවැත් වේ.

30. **සඞ්කෙතකම්** නම් පෙරවරු හෝ පස්වරු හෝ රෑ හෝ දවල් හෝ 'අසෝ සලකුණෙන් බඩු ගණුව'යි සලකුණු කෙරෙයි. 'ඒ සලකුණෙන් ඒ බඩුව ගණුව'යි කියා නම් දුකුලාඇවැත් වේ. ඒ සලකුණෙන් ඒ බඩුව සොරකම් කෙරේ නම් දෙදෙනාට ම පරිජිඇවැත් වේ. ඒ සලකුණට නියමිත කාලයට පෙර හෝ පසුව හෝ ඒ බඩුව සොරකම් කෙරේ නම් මූලිකයාට ඇවැත් නොවේ. සොරකම් කරන්නහුට පරිජිඇවැත් වේ.

31. **නිමිත්තකම්** නම් 'ඇස හෝ කනින්නෙමි. බැම හෝ නගන්නෙමි හිස හෝ ඔසවන්නෙමි. ඒ නිමිත්තෙන් ඒ බඩුව පැහැර ගණුව'යි නිමිති කෙරෙයි නම් දුකුලාඇවැත් වේ. ඒ නිමිත්තෙන් ඒ බඩුව පැහැර ගණී නම් දෙදෙනාට ම පරිජි ඇවැත් වේ. ඒ නිමිත්තට පෙර හෝ පසුව හෝ ඒ බඩුව සොරකම් කෙරේ නම් මූලිකයාහට ඇවැත් නො වේ. සොරකම් කරන්නහුට පරිජිඇවැත් වේ.

32. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො තං මඤ්ඤමානො තං අවහරති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

33. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො තං මඤ්ඤමානො අඤ්ඤං අවහරති, මූලට්ඨස්ස අනාපත්ති. අවහාරකස්ස ආපත්ති පාරාජිකස්ස.

34. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො අඤ්ඤං මඤ්ඤමානො තං අවහරති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

35. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො අඤ්ඤං මඤ්ඤමානො අඤ්ඤං අවහරති, මූලට්ඨස්ස අනාපත්ති අවහාරකස්ස ආපත්ති පාරාජිකස්ස.

36. භික්ඛු භික්ඛුං ආණාපෙති, "ඉත්ථන්නාමස්ස පාවද: ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස පාවදතු: ඉත්ථන්නාමො ඉත්ථන්නාමං භණ්ඩං අවහරතූ"ති, ආපත්ති දුක්කටස්ස. සො ඉතරස්ස ආරොචෙති, ආපත්ති දුක්කටස්ස. අවහාරකො පටිග්ගණ්හාති, මූලට්ඨස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. සො තං භණ්ඩං අවහරති, ආපත්ති සබ්බෙසං පාරාජිකස්ස.

37. භික්ඛු භික්ඛුං ආණාපෙති, "ඉත්ථන්නාමස්ස පාවද: ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස පාවදතු, ඉත්ථන්නාමො ඉත්ථන්නාමං භණ්ඩං අවහරතූ"ති, ආපත්ති දුක්කටස්ස. සො අඤ්ඤං ආණාපෙති, ආපත්ති දුක්කටස්ස. අවහාරකො පටිග්ගණ්හාති, ආපත්ති දුක්කටස්ස. සො තං භණ්ඩං අවහරති, මූලට්ඨස්ස අනාපත්ති. ආණාපකස්ස ච අවහාරකස්ස ච ආපත්ති පාරාජිකස්ස.

38. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො ගන්ත්වා පුන පච්චාගච්ඡති 'නාහං සක්කොමි තං භණ්ඩං අවහරිතු'න්ති. සො පුන ආණාපෙති 'යදා සක්කොසි තදා තං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො තං භණ්ඩං අවහරති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

39. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො ආණාපෙත්වා විප්පටිසාරී න සාවෙති 'මා අවහරී'ති. සො තං භණ්ඩං අවහරති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

40. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො ආණාපෙත්වා විප්පටිසාරී සාවෙති 'මා අවහරී'ති. සො 'ආණත්තො අහං තයා'ති තං භණ්ඩං අවහරති, මූලට්ඨස්ස අනාපත්ති, අවහාරකස්ස ආපත්ති පාරාජිකස්ස.

32. මහණෙක් මහණකුට 'මෙ නම් බඩුව සොරා ගණුව'යි අණ කෙරේ නම් දුකුළාආවැත් වේ. හෙතෙමේ එය යැ යි හඟනේ එය ම සොරකම් කෙරේ නම් දෙදෙනාහට පරිජිආවැත් වේ.

33. මහණෙක් මහණකුට 'මෙ නම් බඩුව සොරා ගණුව'යි අණ කෙරේ නම් දුකුළාආවැත් වේ. හෙතෙමේ එය ම යැ යි හඟනේ අනෙකක් සොරකම් කෙරේ නම් මූලිකයාහට ආවැත් නො වේ. සොරකම් කරන්නහුට පරිජි ආවැත් වේ.

34. මහණෙක් මහණකුට 'මෙ නම් බඩුව සොරකම් කරව'යි අණ කෙරේ නම් දුකුළාආවැත් වේ. හෙ තෙමේ අනෙකෙකැ යි හඟනේ එය සොරකම් කෙරේ නම් දෙදෙනාටම පරිජිආවැත් වේ.

35. මහණෙක් මහණකුට 'මෙ නම් බඩුව සොරකම් කරව'යි අණ කෙරේ නම් දුකුළාආවැත් වේ. හෙ තෙමේ අනෙකකැ යි හඟනේ අනෙකක් සොරකම් කෙරේ නම් මූලිකයාහට ආවැත් නො වේ. සොරකම් කරන්නහුට පරිජිආවැත් වේ.

36. මහණෙක් "මෙ නම් ඇත්තේ 'මෙ නම් බඩුව පැහැර ගණීවා'යි මෙ නම් ඇත්තේ මෙනම් ඇත්තහුට කියාවායි "මෙනම් ඇත්තහුට කියව"යි දන්වා නම් දුකුළාආවැත් වේ. හෙ තෙමේ (එය) දන්වා නම් දුකුළාආවැත් වේ. අවහාරක තෙමේ පිළිගණී නම් මූලිකයාහට ථුලැසිආවැත් වේ. හෙ තෙමේ ඒ බඩුව සොරකම් කෙරේ නම් සියල්ලන්හට පරිජිආවැත් වේ.

37. "මෙ නම් ඇත්තේ 'මෙ නම් බඩුව පැහැර ගණීවා'යි මෙ නම් ඇත්තේ මෙ නම් ඇත්තහුට කියාවායි මෙ නම් ඇත්තහුට කියව"යි මහණෙක් මහණකුට අණවා නම් දුකුළා ආවැත් වේ. හෙ තෙමේ (අසවලාට මේසේ කියව යි) අනෙකකුහට අණ කරයි නම් දුකුළාආවැත් වේ. අවහාරක තෙමේ පිළිගණී නම් දුකුළාආවැත් වේ. හෙ තෙමේ ඒ බඩුව සොරකම් කෙරේ නම් මූලිකයාහට ආවැත් නො වේ. අණවන්නහුට ද පැහැර ගන්නහුට ද පරිජි ආවැත් වේ.

38. මහණෙක් මහණකුට, 'මෙ නම් බඩුව සොරකම් කරව'යි අණ කෙරේ නම් දුකුළාආවැත් වේ. හෙ තෙමේ ගොස් 'ඒ බඩුව ගන්නට මම නො සමත්මි' යි පෙරළා එයි. මහණ තෙමේ 'යම් දවසක සමත් වී නම් එදවසෙහි ඒ බඩුව පැහැර ගණුව'යි නැවත අණවා නම් දුකුළාආවැත් වේ. ඒ මහණ තෙමේ ඒ බඩුව සොරකම් කරයි නම් දෙදෙනාහට ම පරිජිආවැත් වේ.

39. මහණෙක් මහණකුට 'මෙනම් බඩුව සොරකම් කරව'යි අණවයි නම් දුකුළා ආවැත් වේ. හෙ තෙමේ අණ කොට විපිළිසර වෙයි. 'නො ගණුව'යි නො කියයි. හේ ඒ බඩුව සොරකම් කරයි. දෙදෙනාහට ම පරිජි ආවැත් වේ.

40. මහණෙක් මහණකුට 'මෙනම් බඩුව සොරකම් කරව'යි අණවා නම් දුකුළාආවැත් වේ. හෙ තෙමේ අණ කොට විපිළිසර වූයේ 'නො ගණුව'යි අස්වයි. හේ 'තා විසින් මම අණ කරණ ලද්දෙමි' යි ඒ බඩුව සොරකම් කරයි. මූලිකයාහට ආවැත් නො වේ. පැහැර ගන්නහුට පරිජිආවැත් වේ.

41. භික්ඛු භික්ඛුං ආණාපෙති 'ඉත්ථන්නාමං භණ්ඩං අවහරා'ති, ආපත්ති දුක්කටස්ස. සො ආණාපෙත්වා විප්පටිසාරී සාවෙති 'මා අවහරී'ති. සො 'සුට්ඨූ'ති ඔරමති, උභින්නං අනාපත්ති.

42. පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති පාරාජිකස්ස· පරපරිග්ගහිතඤ්ච හොති, පරපරිග්ගහිතසඤ්ඤී ච, ගරුකො ච හොති පරික්ඛාරො පඤ්චමාසකො වා අතිරෙකපඤ්චමාසකො වා, ථෙය්‍යචිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති. ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

43. පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස: පරපරිග්ගහිතඤ්ච හොති, පරිපරිග්ගහිතසඤ්ඤී ච, ලහුකො ච හොති පරික්ඛාරො අතිරෙකමාසකො වා ඌනපඤ්චමාසකො වා, ථෙය්‍ය චිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස ඵන්දාපෙති, ආපත්ති දුක්කටස්ස. ඨානා චාවෙති, ආපත්ති ථුල්ලච්චයස්ස.

44. පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති දුක්කටස්ස: පරපරිග්ගහිතඤ්ච හොති, පරපරිග්ගහිතසඤ්ඤී ච, ලහුකො ච හොති පරික්ඛරො මාසකො වා ඌනමාසකො වා, ථෙය්‍යචිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති දුක්කටස්ස. ඨානා චාවෙති, ආපත්ති දුක්කටස්ස.

45. ඡහි ආකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති පාරාජිකස්ස: න ච සකසඤ්ඤී, න ච විස්සාසග්ගාහී, න ච තාවකාලිකං, ගරුකො ච හොති පරික්ඛාරො පඤ්චමාසකො වා අතිරෙකපඤ්චමාසකො වා, ථෙය්‍යචිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඨානා චාවෙති, ආපත්ති පාරාජිකස්ස.

46. ඡහි ආකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස: න ච සකසඤ්ඤී, න ච විස්සාසග්ගාහී, න ච තාවකාලිකං, ලහුකො ච හොති පරික්ඛාරො අතිරෙකමාසකො වා ඌනපඤ්චමාසකො වා, ථෙය්‍යචිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති දුක්කටස්ස. ඨානා චාවෙති, ආපත්ති ථුල්ලච්චයස්ස.

47. ඡහි ආකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති දුක්කටස්ස:- න ච සකසඤ්ඤී, න ච විස්සාසග්ගාහී, න ච තාවකාලිකං, ලහුකො ච හොති පරික්ඛාරො මාසකො වා ඌනමාසකො වා, ථෙය්‍යචිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස, ඵන්දාපෙති, ආපත්ති දුක්කටස්ස. ඨානා චාවෙති, ආපත්ති දුක්කටස්ස.

41. මහණෙක් මහණකුට 'මෙනම් බඩුව ගණුව'යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙ තෙමේ අණවා විපිළිසර වූයේ 'නො ගණුව'යි අස්වයි. හේ 'මැනවැ'යි අත්හරියි. දෙදෙනාට ම ඇවැත් නො වේ.

42. හිමියන් නුදුන් දය ගත්තහුට පස් අයුරකින් පරිජිඇවැත් වේ: අනුන් අයත් දෙයක් වේ ද, අනුන් අයත් යැයි හැඟීම් ඇත්තෙක් වේ ද, පස් මස්සක් හෝ අයිරු පස් මස්සක් හෝ අගනා ගරු පිරිකරකුත් වේ ද, සොර සිත එළඹ සිටියේත් වේ ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වේ, සොලොවා නම් ථුලැසිඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජි ඇවැත් වේ.

43. නුදුන් දය ගත්තහුට පස් අයුරකින් ථුලැසිඇවැත් වේ. අනුන් සතු දෙයෙක් වෙයි ද, අනුන් සතු යැයි හැඟීම් ඇත්තේ වෙයි ද, මස්සකට වැඩි වූ හෝ පස් මස්සකට අඩු වූ ලහු පිරිකරක් වෙයි ද, සොර සිත එළඹ සිටියේත් වේ ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වේ. සොලොවා නම් දුකුළාඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් ථුලැසි ඇවැත් වේ.

44. නුදුන් දය ගත්තහුට පස් අයුරකින් දුකුළාඇවැත් වේ. මෙරමා සතු දයකුත් වේ ද, මෙරමා සතුය යන හැඟීම් ඇත්තේත් වේ ද, මස්සක් හෝ ඌනමස්සක් හෝ අගනා ලහු පිරිකරකුත් වේ ද, සොර සිත එළඹ සිටියේත් වේ ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වේ. සොලොවා නම් දුකුළාඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

45. නුදුන් දය පැහැර ගත්තහුට ආකාර සයෙකින් පරිජිඇවැත් වේ. 'මෙය මා සතු ය' යන හැඟීම් නැත්තේත් වේ ද, විශ්වාසග්‍රාහය නැත්තෙක් වේ ද, තාවකාලිකත් නො වෙයි ද, මසු පසක් හෝ අයිරිත් මසු පසක් අගනා ගරු පිරිකරකුත් වේ ද, සොර සිත එළඹ සිටියේත් වේ ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වේ. සොලොවා නම් ථුලැසි ඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් පරිජිඇවැත් වේ.

46. නුදුන් දය ගත්තහුට අයුරු සයකින් ථුලැසිඇවැත් වේ. 'මා සතුය' යන හැඟීම් නැත්තේ වේ ද, විශ්වාසග්‍රාහය නැත්තේ වේ ද, තව්කැලිත් නො වේ ද, මස්සකින් වැඩි වූ මසු පසකින් අඩු වූ ලුහු පිරිකරකුත් වේ ද, සොර සිත එළඹ සිටියේත් වේ ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වේ; සොලොවා නම් දුකුළා ඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් ථුලැසි ඇවැත් වේ.

47. නුදුන් දය ගත්තහුට අයුරු සයෙකින් දුකුළාඇවැත් වේ. 'තමා සතු ය' යන හැඟීම් නැත්තේත් වේ ද, විශ්වාසග්‍රාහය නැත්තේත් වේ ද, තව්කැලිත් නො වේ ද, මස්සක් හෝ ඌනු මස්සක් හෝ අගනා ලුහු පිරිකරකුත් වේ ද, සොර සිත එළඹ සිටියේත් වේ ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වේ. සොලොවා නම් දුකුළාඇවැත් වේ. තැනින් පහ කෙරේ නම් දුකුළාඇවැත් වේ.

48. පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති දුක්කටස්ස න ච පරපරිග්ගහිතං හොති, පරපරිග්ගහිතසඤ්ඤී ච, ගරුකො ච හොති පරික්ඛාරො පඤ්චමාසකො වා අතිරෙකපඤ්චමාසකො වා, ථෙය්‍යචිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති දුක්කටස්ස. ඨානා චාවෙති, ආපත්ති දුක්කටස්ස.

49. පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති දුක්කටස්ස න ච පරපරිග්ගහිතං හොති, පරපරිග්ගහිතසඤ්ඤී ච, ලහුකො ච හොති පරික්ඛාරො අතිරෙකමාසකො වා ඌනපඤ්චමාසකො වා, ථෙය්‍ය චිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති දුක්කටස්ස. ඨානා චාවෙති, ආපත්ති දුක්කටස්ස.

50. පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති දුක්කටස්ස න ච පරපරිග්ගහිතං හොති, පරපරිග්ගහිතසඤ්ඤී ච, ලහුකො ච හොති පරික්ඛාරො මාසකො වා ඌනමාසකො වා, ථෙය්‍යචිත්තඤ්ච පච්චුපට්ඨිතං හොති, ආමසති, ආපත්ති දුක්කටස්ස. ඵන්දාපෙති, ආපත්ති දුක්කටස්ස. ඨානා චාවෙති, ආපත්ති දුක්කටස්ස.

51. අනාපත්ති සකසඤ්ඤිස්ස [1], විස්සාසග්ගාහෙ, තාවකාලිකෙ, පෙතපරිග්ගහෙ, තිරච්ඡානගතපරිග්ගහෙ, පංසුකූලසඤ්ඤිස්ස, උම්මත්තකස්ස, ඛිත්තචිත්තස්ස, වෙදනට්ටස්ස,[2] ආදිකම්මිකස්සාති.

## අදින්නාදානම්හි පඨමභාණවාරො නිට්ඨිතො

---

1 සසඤ්ඤිස්ස. සී. මු. 2 වෙදනාට්ටස්ස, මජසං.

48. නුදුන් දෑය ගන්නහුට පස් අයුරකින් දුකුළාඇවැත් වේ. අනුන් අයිති දෑයක් නො වෙයි ද, අනුන් අයත් යැ යි හැඟීම ඇත්තේ වෙයි ද, මසු පසක් හෝ අයිරා මසු පසක් හෝ අගනා ගරු පිරිකරක් වෙයි ද, සොර සිතක් එළඹ සිටියේ වෙයි ද, ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් වේ. සොලොවා නම් දුකුළාඇවැත් වේ. තුබූ තැනින් පහ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

49. නුදුන් දෑය ගන්නහුට පස් අයුරකින් දුකුළාඇවැත් වේ: අනුන් අයිති දෑයකුත් නො වෙයි ද, අනුන් අයත් යැ යි හැඟීම ඇත්තේත් වෙයි ද, අයිරා මස්සක් හෝ ඌනුපස් මස්සක් හෝ අගනා ලඝු වූ පිරිකරකුත් වෙයි ද, සොර සිතත් එළඹ සිටියේ වෙයි ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වේ. සොලොවා නම් දුකුළාඇවැත් වේ. තුබූ තැනින් මූදවා නම් දුකුළා ඇවැත් වේ.

50. පස් අයුරකින් නුදුන් දෑය ගන්නහුට දුකුළාඇවැත් වෙයි: අනුන් අයිති දෙයක් නොවෙයි ද, අනුන් අයත් යයි හැඟීම ඇත්තේ වෙයි ද, මස්සක් හෝ ඌනු මස්සක් හෝ අගනා ලඝු වූ පිරිකරකුත් වෙයි ද, සොර සිත ත් එළඹ සිටියේ වෙයි ද, ආමශීනය කෙරේ ද, දුකුළාඇවැත් වෙයි. සොලොවා නම් දුකුළාඇවැත් වෙයි. තැනින් මූදවා නම් දුකුළාඇවැත් වේ.

51. (මේ වස්තුව) මා සතුය යන හැඟීම් ඇත්තාහට ද, විශ්වාස ග්‍රාහය ඇතිකල්හි ද, තව්කාලියෙහි ද, ප්‍රෙතයන් සතු දෑයෙහි ද, තිරිසනුන් සතු දෑයෙහි ද, පංශුකූලසංඥවෙන් ගන්නහුට ද, උන්මත්තකයාට ද, වික්ෂිප්ත සිත් ඇත්තහුට ද, වෙදනාවෙන් පෙළුනහුට ද, ආදිකම්මිකයාට ද ඇවැත් නො වේ.

## අදින්නාදාන ශික්ෂාපදයෙහි පළමු වන බණවර නිමි.

# විනීතවත්ථු

**උද්දානගාථා**

රජකෙහි පඤ්ච අක්ඛාතා චතුරෙ අත්ථරණෙහි ච,
අන්ධකාරෙන වෙ පඤ්ච පඤ්චහාරණකෙන ච.

නිරුත්තියා පඤ්ච අක්ඛාතා වාතෙහි අපරෙ ද්වෙ,
අසම්භින්නෙ කුසාපාතො ජන්තාගෙහෙන[1] සහා දස.

විඝාසෙහි පඤ්ච අක්ඛාතා පඤ්ච චෙව අමූලකා
දුබ්භික්ඛෙ කුරමංසඤ්ච පූවසක්ඛලිමොදකා.

සපරික්ඛාරථවිකං[2] භිසිවංසා න නික්ඛමෙ,
ඛාදනීයඤ්ච විස්සාසං සසඤ්ඤාය පරෙ ද්වෙ.

සත්ත නාවහරාමාති සත්තචෙව අවාහරුං,
සබ්බස්ස අවහරුං සත්ත පුප්ඵෙහි අපරෙ ද්වෙ.

තයො ච වුත්තවාදිනො මණි තීණි අතික්කමෙ,
සූකරා ච මිගා මච්ඡා යානං චාපි පවට්ටයි.

ද්වෙ පෙසී ද්වෙ දාරු පංසුකූලං ද්වෙ දකා,
අනුපුබ්බවිධානෙන තදඤ්ඤො න පරිපූරති.

සාවත්ථියා චතුරෙ මුට්ඨී ද්වෙ විඝාසා ද්වෙ තිණා,
සබ්බස්ස භාජයුං සත්ත සත්ත චෙව අසාමිකා.

දාරුදකං[3] මත්තිකා ද්වෙ තිණානි සබ්බස්ස සත්ත අවහාසිසෙය්‍යුං[4]
සස්සාමිකං න චාපි නීහරෙය්‍ය හරෙය්‍ය සස්සාමිකං තාවකාලිකං.

චම්පා රාජගහෙ චෙව වෙසාලියා ච **අජ්ජුකො,**
බාරාණසී ච කොසම්බී සාගලා **දළ්හිකෙන** චාති.

1. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ රජකත්ථරණං ගන්ත්වා රජකභණ්ඩිකං අවහරිංසු. තෙසං කුක්කුච්චං අහොසි: භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං. කච්චි නු ඛො මයං පාරාජිකං ආපත්තිං ආපන්නා'ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජිකන්ති. (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රජකත්ථරණං ගන්ත්වා මහග්ඝං දුස්සං පස්සිත්වා ථෙය්‍යචිත්තං උප්පාදෙසි. තස්ස කුක්කුච්චං අහොසි: කච්චි නු ඛො අහං පාරාජිකං ආපත්තිං ආපන්නො'ති. භගවතො එතමත්ථං ආරොචෙසි: අනාපත්ති භික්ඛු චිත්තුප්පාදෙ'ති. (2)

---

1. ජන්තාඝරෙන. ස්‍යා. 2. ථවිකා. මජසං. 3. දාරුදකා. ස්‍යා. 4. අවහාසිසෙය්‍යං. සීමු.
5 අසාමිකා. මජසං.

# විනිශ්චිත කථාවස්තු

**උද්දානගාථා**

රජක බඩු විසින් වස්තු පසෙක් ද අභරණ නිසා සතරෙක් ද අන්ධකාරයෙන් පසෙක් ද හාරක විසින් පසක් හා සයෙක් ද කියන ලදහ. (25)

නිරුත්තියෙන් පසෙක් ද වාතයෙන් දෙකෙක් ද අසම්භින්න කුසාපාතජනානගග වස්තු තුණ සමග දසයෙක් කියන ලදී. (10)

විසාස විසින් පසෙක් ද අමූලක පසෙක් ද දුර්භික්ෂයෙහි කූර-මංස-පූව-සක්ඛලිකා-මොදක වශයෙන් පසෙක් ද කියන ලද හ. (15)

පරික්ඛාර වස්තු සතරෙකි, සකපරික්ඛාර එකෙකි, ථවිකා-භිසි-චීවරවංස-න නික්ඛම වසයෙන් සතරෙකි, ඛාදනීය නිසා එකෙකි. තවත් ඝසඝාදක විසින් දෙකෙකි. (12)

නාවහරාමයි සතෙකි, අවාහරාංයි සතෙකි, සඞ්ඝසන්තක අවහාර සතෙකි. පුප්ඵාරාම විසින් තවත් දෙකෙකි. (23)

වුත්තවාදී තුණෙකි. මණි අතික්කම තුණෙකි. සූකර දෙකෙකි. මිග දෙකෙකි. මච්ඡ දෙකෙකි. යානය පෙරළීයයි කී එකෙකි. (13)

මංස පෙසී දෙකෙකි. දරු දෙකෙකි. පංසුකූල එකෙකි. උදක (නදී) දෙකෙකි. අනුපුබ්බසංවිධාන 'තපරිපූරි' සමග දෙකෙකි. එයින් අන්‍ය වූ එකෙකි. (10)

සැවැතෙහි මුට්ඨි වත්‍ථු සතරෙකි, විඝාස දෙකෙකි, තිණ දෙකෙකි, සඞ්ඝභාජන සතෙකි. අසාමික විසින් සතෙකි. (22)

දරු-උදක-මත්තිකා වසයෙන් තුණෙකි. තිණ දෙකෙකි. අවහාසන වත්‍ථු සතෙකි. සසාමික නීහරෙය්‍ය-තාවකාලික හරෙය්‍ය වසයෙන් දෙකෙකි. (14)

චම්පානුවර, රජගහනුවර, විසල්පුර අජ්ජුක බරණැස, කොසඹෑනුවර, සාගලපුර දළ්හික යයි වත්‍ථු සයෙකි. (6)=150

1. එසමයෙහි සවග මහණහු රද තොටකට ගොස් රෙදි පොට්ටනියක් සොරකම් කළාහු ය. "භාග්‍යවතුන් වහන්සේ විසින් සික්පද පණවන ලදී. "කිම, අපි පරිජි ඇවැත් අවත්තමෝ දැ?"යි ඔවුනට කුකුස් ඇතිවි ය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහු ය. "මහණෙනි, තෙපි පරිජි ඇවැත් අවත්තහුයැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (1)

2. එසමයෙහි එක්තරා මහණෙක් රද තොටකට ගොස් මාහැඟි වතක් දැක සොරසිත් උපදවී ය. "කිම, මම පරිජි ඇවැත් අවත්තෙම් දෝ'යි ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කෙළේ ය. "මහණ චිත්තොත්පාදයෙහි ඇවැත් නොවේ"යැ යි වදාළ සේක. (2)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රජකත්ථරණං ගන්ත්වා මහග්ඝං දුස්සං පස්සිත්වා ථෙය්‍යචිත්තො ආමසි. තස්ස කුක්කුච්චං අහොසි: –පෙ– අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. ආපත්ති දුක්කටස්සාති. (3)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රජකත්ථරණං ගන්ත්වා මහග්ඝං දුස්සං පස්සිත්වා ථෙය්‍යචිත්තො ඵන්දාපෙසි. තස්ස කුක්කුච්චං අහොසි. –පෙ– අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. ආපත්ති ථුල්ලච්චයස්සාති. (4)

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රජකත්ථරණං ගන්ත්වා මහග්ඝං දුස්සං පස්සිත්වා ථෙය්‍යචිත්තො ඨානා චාවෙසි. තස්ස කුක්කුච්චං අහොසි: –පෙ– ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (5)

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු මහග්ඝං උත්තරත්ථරණං පස්සිත්වා ථෙය්‍යචිත්තං උප්පාදෙසි. –පෙ– ථෙය්‍යචිත්තො ආමසි. –පෙ– ථෙය්‍යචිත්තො ඵන්දාපෙසි. –පෙ– ථෙය්‍යචිත්තො ඨානා චාවෙසි. තස්ස කුක්කුච්චං අහොසි: –පෙ–. ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (6–9)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දිවා භණ්ඩං පස්සිත්වා නිමිත්තං අකාසි 'රත්තිං අවහරිස්සාමී'ති සො තං මඤ්ඤමානො තං අවහරි. –පෙ– තං මඤ්ඤමානො අඤ්ඤං අවහරි, –පෙ– අඤ්ඤං මඤ්ඤමානො තං අවහරි. –පෙ– අඤ්ඤං මඤ්ඤමානො අඤ්ඤං අවහරි. තස්ස කුක්කුච්චං අහොසි: –පෙ– ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (10–13)

8. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දිවා භණ්ඩං පස්සිත්වා නිමිත්තං අකාසි 'රත්තිං අවහරිස්සාමී'ති. සො තං මඤ්ඤමානො අත්තනො භණ්ඩං අවහරි. තස්ස කුක්කුච්චං අහොසි: –පෙ– අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. ආපත්ති දුක්කටස්සාති. (14)

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤස්ස භණ්ඩං හරන්තො සීසෙ භාරං ථෙය්‍යචිත්තො ආමසි. –පෙ– ථෙය්‍යචිත්තො ඵන්දාපෙසි. –පෙ– ථෙය්‍යචිත්තො ඛන්ධං ඔරොපෙසි. –පෙ– ඛන්ධෙ භාරං ථෙය්‍යචිත්තො ආමසි –පෙ– ථෙය්‍යචිත්තො ඵන්දාපෙසි. –පෙ– ථෙය්‍යචිත්තො කටිං ඔරොපෙසි. –පෙ– කටියා භාරං ථෙය්‍යචිත්තො ආමසි. –පෙ– ථෙය්‍යචිත්තො ඵන්දාපෙසි. –පෙ– ථෙය්‍යචිත්තො හත්ථෙන අග්ගහෙසි. –පෙ– හත්ථෙ භාරං ථෙය්‍යචිත්තො භූමියං නික්ඛිපි. –පෙ– ථෙය්‍යචිත්තො භූමිතො අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි: –පෙ– ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති (15–25)

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අජ්ඣොකාසෙ චීවරං පත්ථරිත්වා විහාරං පාවිසි. අඤ්ඤතරො භික්ඛු 'මායි දං චීවරං නස්සී'ති පටිසාමෙසි. සො නික්ඛමිත්වා තං භික්ඛුං පුච්ඡි: ආවුසො මය්හං චීවරං කෙන අවහටන්ති. සො එවමාහ: මයා අවහටන්ති. සො තං ආදියි. 'අස්සමණොසි ත්ව'න්ති. තස්ස කුක්කුච්චං අහොසි: –පෙ– භගවතො එතමත්ථං ආරොචෙසි. කිඤ්චිත්තො ත්වං භික්ඛූ?ති. 'නිරුත්තිපථො අහං භගවා'ති. අනාපත්ති භික්ඛු නිරුත්තිපථෙ'ති. (26)

3. එසමයෙහි එක්තරු මහණෙක් රදතොටකට ගොස් මාහැඟි වතක් දැක සොරසිතැතියේ ආමශීනය කෙළේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ පරිජි ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"යැ යි වදාළ සේක. (3)

4. එසමයෙහි එක්තරු මහණෙක් රදතොටකට ගොස් මාහැඟි වතක් දැක සොර සිත් ඇත්තේ සෙලැවී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යැ යි වදාළ සේක. (4)

5. එසමයෙහි එක්තරු මහණෙක් රදතොටකට ගොස් මාහැඟි වතක් දැක සොරසිත් ඇත්තේ තුබූ තැනින් පහ කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ තෝ පරිජිඇවැත් අවත්තෙහි යැ"යි වදාළ සේක, (5)

6. එසමයෙහි එක්තරු පිණ්ඩචාරික මහණෙක් මාහැඟි උතුරු අතුරු-ණක් දැක සොරසිත් ඉපද වීය. ... සොර සිත් ඇත්තේ ආමශීනය කෙළේ ය. ... සොර සිත් ඇත්තේ සෙලැවීය. ... සොර සිත් ඇත්තේ තුබූ තැනින් පහ කෙළේ ය. ඔහුට කුකුස් විය: ... "මහණ තෝ පරිජිඇවැත් අවත්තෙහි යැ"යි වදාළ සේක. (6-9)

7. එසමයෙහි එක්තරු මහණෙක් දවල් භාණ්ඩයක් දැක 'රෑ සොරා පැහැර ගන්නෙමි' යි නිමිති කෙළේ ය. හේ 'එයැ'යි හඟිමින් එය සොරකම් කෙළේ ය. ... 'එයැ'යි හඟිමින් අනෙකක් සොරකම් කෙළේ ය. ...'අනෙකෙ-කැ'යි හඟිමින් එය සොරකම් කෙළේ ය. ...'අනෙකෙකැ'යි හඟිමින් අනෙකක් සොරකම් කෙළේ ය. ඔහුට කුකුස් විය: ..."මහණ තෝ පරිජිඇවැත් අවත්තෙහි යැ"යි වදාළ සේක. 10-13

8. එසමයෙහි එක්තරු මහණෙක් දවල් භාණ්ඩයක් දැක 'රෑ සොරා ගන්නෙමි'යි නිමිති කෙළේ ය. හෙ තෙමේ 'ඒම යැ'යි හඟිමින් තමා සතු භාණ්ඩයක් සොරකම් කෙළේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ, පරිජි ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"යැ යි වදාළ සේක. 14

9. එසමයෙහි එක්තරු මහණෙක් අනෙකෙකු සතු භාණ්ඩයක් ගෙණ යත්තේ හිසෙහි තුබූ බර සොරසිත් ඇත්තේ ආමශීනය කෙළේ ය. ... සොරසිත් ඇත්තේ සෙලැවී ය. ... සොරසිත් ඇත්තේ කරට ගත්තේ ය. ... කරෙහි වූ බර සොරසිත් ඇත්තේ ආමශීනය කෙළේ ය. ... සොරසිත් ඇත්තේ සෙලැවී ය. ... සොරසිත් ඇත්තේ උකුළට ගත්තේ ය. ... උකුළෙහි වූ බර සොරසිත් ඇත්තේ ආමශීනය කෙළේ ය. ... සොරසිත් ඇත්තේ සෙලැවී ය. ... සොරසිත් ඇත්තේ අතින් ගත්තේ ය. ... අතෙහි වූ බර සොරසිත් ඇත්තේ බිම තැබී ය. ... සොරසිත් ඇත්තේ බිමින් උඩට ගත්තේ ය. ඔහුට කුකුස් විය: ... "මහණ තෝ පරිජි ඇවැත් අවත්තෙහි යැ"යි වදාළ සේක. (15-25)

10. එසමයෙහි එක්තරු මහණෙක් අභ්‍යවකාශයෙහි සිවුරක් අතුට විහා-රයට ගියේ ය. එක්තරු මහණෙක් 'මේ සිවුර නො වැනැසේ වා'යි තැන්පත් කොට තැබී ය. ඒ මහණ තෙමේ නික්ම ගොස් "ඇවැත, මාගේ සිවුර කවරකු විසින් පැහැර ගන්නා ලද දැ"යි ඒ මහණහු විචාළේ ය. 'මවිසින් පැහැර ගන්නා ලද යැ' යි ඒ මහණ කී ය. හෙ තෙමේ 'තෝ අශ්‍රමණයෙහි යැ'යි කියා එය ගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කෙළේ ය. "මහණ තෝ කෙබඳු සිතැති යෙහි දැ?"යි අසා වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, මම ව්‍යවහාර වචන ඇත්තෙමි වෙමි"යි හේ කීය. "මහණ, ව්‍යවහාරවචනයෙහි ඇවත් නො වේ"යැ යි වදාළ සේක. (26)

11. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පීඨෙ චීවරං නික්ඛිපිත්වා -පෙ- පීඨෙ නිසීදනං නික්ඛිපිත්වා -පෙ- හෙට්ඨාපීඨෙ පත්තං නික්ඛිපිත්වා විහාරං පාවිසි. අඤ්ඤතරො භික්ඛු 'මායං පත්තො නස්සී'ති පටිසාමෙසි. සො නික්ඛමිත්වා තං භික්ඛුං පුච්ඡි: 'ආවුසො මය්හං පත්තො කෙන අවහටො'ති. සො එවමාහ: 'මයා අවහටො'ති. සො තං ආදියි 'අස්සමණො'සි ත්ව'න්ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛු නිරුත්තිපථෙ"ති. (27-29)

12. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී වතියා චීවරං පත්ථරිත්වා විහාරං පාවිසි. අඤ්ඤතරා භික්ඛුනී 'මායිදං චීවරං නස්සී'ති පටිසාමෙසි. සා නික්ඛමිත්වා තං භික්ඛුනිං පුච්ඡි: 'අය්යෙ මය්හං චීවරං කෙන අවහට'න්ති. සා එවමාහ: 'මයා අවහට'න්ති. සා තං ආදියි 'අස්සමණී'සි ත්ව'න්ති. තස්සා කුක්කුච්චං අහොසි. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනාපත්ති භික්ඛවෙ නිරුත්තිපථෙ"ති. (30)

13. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වාතමණ්ඩලිකාය උක්ඛිත්තං සාටකං පස්සිත්වා 'සාමිකානං දස්සාමී'ති අග්ගහෙසි. සාමිකා තං භික්ඛුං චොදෙසුං: 'අස්සමණො'සි ත්ව'න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- කිඤ්චිත්තො ත්වං භික්ඛූ'ති. 'අථෙය්‍යචිත්තො අහං භගවා'ති. "අනාපත්ති භික්ඛු අථෙය්‍යචිත්තස්සා"ති. (31)

14. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වාතමණ්ඩලිකාය උක්ඛිත්තං වෙඨනං 'පුරෙ සාමිකා පස්සන්තී'ති ථෙය්‍යචිත්තො අග්ගහෙසි. සාමිකා තං භික්ඛුං චොදෙසුං: 'අස්සමණො'සි ත්ව'න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (32)

15. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සුසානං ගන්ත්වා අභින්නෙ සරීරෙ පංසුකූලං අග්ගහෙසි. තස්මිං ච සරීරෙ පෙතො අධිවත්ථො හොති. අථ ඛො සො පෙතො තං භික්ඛුං එතදවොච: "මා භන්තෙ මය්හං සාටකං අග්ගහෙසී"ති. සො භික්ඛු අනාදියන්තො අගමාසි. අථ ඛො තං සරීරං උට්ඨහිත්වා තස්ස භික්ඛුනො පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධි. අථ ඛො සො භික්ඛු විහාරං පවිසිත්වා ද්වාරං ථකෙසි. අථ ඛො තං සරීරං තත්ථෙව පරිපති[1]. තස්ස කුක්කුච්චං අහොසි - පෙ - "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. න ච භික්ඛවෙ අභින්නෙ සරීරෙ පංසුකූලං ගහෙතබ්බං. යො ගණ්හෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති. (33)

16. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස චීවරෙ භාජියමානෙ ථෙය්‍යචිත්තො කුසං සඞ්කාමෙත්වා චීවරං අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (34)

1. පරිපතී, කත්ථචි.

11. එසමයෙහි එක්තරා මහණෙක් පුටුවක් මත සිවුර බහා තබා ... පුටුවක් මත නිසීදනය බහා තබා ... පුටුවක් යට පාත්‍රය බහා තබා විහාරයට ගියේ ය. එක්තරා මහණෙක් 'මේ පාත්‍රය නො නැසේව'යි තැන්පත් කොට තැබී ය. ඒ මහණ නික්ම අවුත් තෙල මහණහුගෙන් "ඇවත, මාගේ පාත්‍රය කවරකු විසින් පැහැර ගත්තා ලද දැ?"යි විචාළේ ය. හෙතෙම 'මා විසින් පැහැර ගත්තා ලද'යි මෙසේ කී ය. හේ "තෝ අශ්‍රමණයෙහි යැ"යි කියා එය ගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, ව්‍යවහාර වචනයෙහි ඇවැත් නො වේ" යයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. (27-29)

12. එසමයෙහි එක්තරා මෙහෙණක් වැවේ සිවුර අතුට විහාරයට ගියා ය. එක්තරා මෙහෙණක් 'මේ සිවුර නො නැසේව'යි තැන්පත් කොට තැබූවා ය. ඕ නික්මවුත් ඒ මෙහෙණගෙන් 'ආයසීාවෙනි, මාගේ සිවුර කවරකු විසින් පැහැරගත්තා ලද දැ?'යි මෙසේ විචාළා ය. 'මා විසින් පැහැර ගත්තා ලද යැ'යි ඕ මෙසේ කීවා ය. ඒ මෙහෙණ එය ගත්තී ය. 'තෝ නොමෙහෙණකැ'යි කිවූ ය. ඇට කුකුස් විය. ඉක් පසු ඒ මෙහෙණ මෙහෙණන්ට මෙපවත් දැන්වූවා ය. මෙහෙණහු භික්ෂූන්ට මෙපවත් සැළ කළාහු ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ කාරුණ සැළ කළාහු ය. "මහණෙනි ව්‍යවහාරවචනයෙහි ඇවැත් නො වේ"යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. (30)

13. එසමයෙහි එක්තරා මහණෙක් පෙයාසුලඟින් හඟන ලද සළුවක් දක 'හිමියන්ට දෙමි'යි ගත්තේ ය. 'තෝ අශ්‍රමණයෙක් වෙහි ය'යි හිමිහු ඒ මහණහට චොදනා කළාහු ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ තෝ කෙබඳු සිතැත්තෙහි දැ?"යි අසා වදාළසේක. "භාග්‍යවතුන් වහන්ස, මම නොසොර සිත් ඇත්තෙම් වීමි"යි කී ය. "මහණ සොර සිත් නැත්තහුට ඇවැත් නො වේ"යැ යි වදාළසේක. (31)

14. එසමයෙහි එක්තරා මහණෙක් පෙයාසුලඟින් හඟන ලද භිස්වෙළුමක් 'නො බෝ වේලාවකින් හිමියෝ දක්නාහ, ඊට පෙර ගණිමි'යි සිතා) සොරසිත් ඇත්තේ හැර ගත්තේ ය. හිමියෝ ඒ මහණහට "තෝ අශ්‍රමණයෙහි"යි චොදනා කළාහු ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ තෝ පරිජිඇවැත් අවත්තෙහි ය"යි වදාළ සේක. (32)

15. එසමයෙහි එක්තරා මහණෙක් සොහොනට ගොස් නුබුන් මළ සිරුරෙහි පංසුකූල වස්ත්‍රය හැර ගත්තේ ය. ඒ සිරුරෙහි ද ප්‍රේතයෙක් අධිගෘහීත වී ය. එකල්හි ඒ ප්‍රේතයා ඒ මහණහට "වහන්ස, මගේ වස්ත්‍රය නොගත මැනව"යි කී ය. ඒ මහණ තෙමේ එය නො සලකමින් ගියේ ය. ඉක් පසු ඒ සිරුර නැගිට ඒ මහණහු පසුපස ලුහුබැන්දේ ය. එකල්හි ඒ මහණ විහාරයට ගොස් දොර වැසී ය. ඉක්බිති ඒ සිරුර එහි ම පතිත විය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, පරිජි ඇවැත් නො වේ. "මහණෙනි, නුබුන් සිරුරෙහි පංසුකූල වස්ත්‍රය නො ගතයුතු ය. යමෙක් ගත්තේ නම් දුකුලාඇවැත් වේ"යි වදාළ සේක. (33)

16. එසමයෙහි එක්තරා මහණෙක් සඟසතු සිවුරු බෙදනු ලබන කල්හි සොරසිත් ඇත්තේ කුසපත් මාරු කොට සිවුරක් ගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ තෝ පරිජිඇවත් අවත්තෙහියැ" යි වදාළ සේක. (34)

17. තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො ජන්තාඝරෙ අඤ්ඤ-
තරස්ස භික්ඛුනො අන්තරවාසකං අත්තනො මඤ්ඤමානො නිවාසෙසි. අථ
ඛො සො භික්ඛු ආයස්මන්තං ආනන්දං එතදවොච: "කිස්ස මෙ ත්වං ආවුසො
ආනන්ද, අන්තරවාසකං නිවාසෙසී"ති. "සකසඤ්ඤී අහං ආවුසො"ති. භගවතො
එතමත්ථං ආරොචෙසුං- පෙ- "අනාපත්ති භික්ඛවෙ සකසඤ්ඤිස්සා"ති. (35)

18. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ ගිජ්ඣකූටා පබ්බතා
ඔරොහන්තා සීහවිඝාසං පස්සිත්වා පචාපෙත්වා පරිභුඤ්ජිංසු. තෙසං කුක්කුච්චං
අහොසි -ප- "අනාපත්ති භික්ඛවෙ සීහවිඝාසෙ"ති. (36)

19. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ ගිජ්ඣකූටා පබ්බතා
ඔරොහන්තා ව්‍යග්ඝවිඝාසං පස්සිත්වා -පෙ- දීපිවිඝාසං පස්සිත්වා -පෙ-
තරච්ඡවිඝාසං පස්සිත්වා -පෙ- කොකවිඝාසං පස්සිත්වා පචාපෙත්වා
පරිභුඤ්ජිංසු. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ
තිරච්ඡානගතපරිග්ගහෙ"ති. (37-40)

20. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස
ඔදනෙ භාජියමානෙ "අපරස්ස භාගං දෙහී"ති අමූලකං අග්ගහෙසි. තස්ස
කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. ආපත්ති සම්ප-
ජානමුසාවාදෙ පාචිත්තියස්සා"ති. (41)

21. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස ඛාදනීයෙ
භාජියමානෙ -පෙ- සඞ්ඝස්ස පූවෙ භාජියමානෙ -පෙ- සඞ්ඝස්ස උච්ඡුම්හි
භාජියමානෙ -පෙ- සඞ්ඝස්ස තිම්බරූසකෙ භාජියමානෙ "අපරස්ස භාගං
දෙහී"ති අමූලකං අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති
භික්ඛු පාරාජිකස්ස, ආපත්ති සම්පජානමුසාවාදෙ පාචිත්තියස්සා"ති. (42-45)

22. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දුබ්භික්ඛෙ ඔදනීය-
ඝරං පවිසිත්වා පත්තපූරං ඔදනං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං
අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (46)

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දුබ්භික්ඛෙ සූනඝරං
පවිසිත්වා පත්තපූරං මංසං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි.
-පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (47)

24. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දුබ්භික්ඛෙ පූවඝරං
පවිසිත්වා පත්තපූරං පූවං ථෙය්‍යචිත්තො අවහරි -පෙ- පත්තපූරං සක්ඛ-
ලිකායො ථෙය්‍යචිත්තො අවහරි -පෙ- පත්තපූරෙ මොදකෙ ථෙය්‍යචිත්තො
අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො
පාරාජික"න්ති. (48-50)

17. එසමයෙහි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ ගිහිහල් ගෙහි එක්තරා මහණකුගේ අඳනයක් 'තමාගේ යැ'යි හඟිමින් හැන්දහ. එකල්හි ඒ මහණ තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය කී ය. "ඇවැත්නි, ආනන්ද ස්ථවිරයෙනි, තෙපි මගේ අඳනය කුමක් හෙයින් ඇන්දහු ද? "යි විචාළේ ය. "ඇවැත්නි, මම 'මගේ යැ' යි හැඟීම් ඇත්තෙම් වීමි' යි තෙරණුවෝ කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැල කලාහු ය. ... "මහණෙනි, 'තමා සතු ය' යන හැඟීම් ඇත්තහුට ඇවැත් නො වේ."ය යි වදාළසේක. (35)

18. එසමයෙහි බොහෝ භික්ෂූහු ගිජ්ඣකූළපව්වෙන් බස්නාහු සිංහයකු විසින් ඉඳුල් කළ මසක් දැක පිසවා අනුභව කලාහු ය. ඔවුන්ට කුකුස් විය. ... "මහණෙනි, සීහවිඝාසයෙහි ඇවැත් නො වේ" ය යි වදාළ සේක. (36)

19. එසමයෙහි බොහෝ භික්ෂූහු ගිජ්ඣකූළපව්වෙන් බස්නාහු ව්‍යාඝ්‍ර-යකු ඉඳුල් කළ මසක් දැක, ... දිවියකු කා හැර දැමූ මසක් දැක ... කරබාතා වලසකු කා හැර දැමූ මසක් දැක ... වෘකයකු කා ඉතිරි කළ මසක් දැක පිසවා අනුභව කලාහු ය. ඔවුන්ට කුකුස් විය. ... "මහණෙනි, තිරිසනුන් අයත් දෑයෙහි ඇවැත් නො වේ" ය යි වදාළ සේක. (37-40)

20. එසමයෙහි එක්තරා මහණෙක් සඟනට බත් බෙදන කල්හි 'අනෙකකුට ද කොටසක් දෙව'යි අමුලු කොට ගත්තේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. දැන දැන මුසවා කීමෙහි පචිති ඇවැත් වේ" ය යි වදාළ සේක. (41)

21. එසමයෙහි එක්තරා මහණෙක් සඟනට කැවිලි බෙදන කල්හි, ... සඟනට පූ බෙදන කල්හි, ... සඟනට උක් දඬු බෙදන කල්හි ... සඟනට තිඹිරි බෙදන කල්හි, 'අනෙකකුට ද කොටසක් දෙව'යි අමුලු කොට (පිළිගා නැතිව) ගත්තේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. දැන දැන බොරු කීමෙහි පචිතිඇවැත්වේ" ය යි වදාළ සේක. (42-45)

22. එසමයෙහි එක්තරා මහණෙක් දුර්භික්ෂයෙහි විකිණීමට බත් පිසන ගෙයකට පැමිණ සොර සිත් ඇත්තේ පාත්‍රය පුරා බත් හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය, ... "මහණ, තෝ පරිජිඇවැත් අවත්නෙහි යැ" යි වදාළ සේක. (46)

23. එසමයෙහි එක්තරා මහණෙක් දුර්භික්ෂයෙහි විකිණීමට මස් පිසන ගෙයකට පිවිස සොරසිත් ඇත්තේ පාත්‍රය පුරා මස් හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවත්නෙහි ය"යි වදාළ සේක (47)

24. එසමයෙහි එක්තරා මහණෙක් දුර් භික්ෂයෙහි කැවුම් පිසන ගෙයකට පැමිණ සොරසිත් ඇත්තේ පාත්‍රය පුරා කැවුම් හැර ගත්තේ ය. ... සොරසිත් ඇත්තේ පාත්‍රය පුරා ලඟලු හැර ගත්තේ ය. ... සොරසිත් ඇත්තේ පාත්‍රය පුරා අග්ගලා හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය. "මහණ, තෝ පරිජිඇවැත් අවත්නෙහි" යයි වදාළ සේක (48-50.)

25. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දිවා පරික්ඛාරං පස්සිත්වා නිමිත්තං අකාසි: "රත්තිං අවහරිස්සාමී"ති. සො තං මඤ්ඤමානො තං අවහරි -පෙ- තං මඤ්ඤමානො අඤ්ඤං අවහරි -පෙ- අඤ්ඤං මඤ්ඤමානො තං අවහරි -පෙ- අඤ්ඤං මඤ්ඤමානො අඤ්ඤං අවහරි -පෙ- තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (51-54)

26. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දිවා පරික්ඛාරං පස්සිත්වා නිමිත්තං අකාසි. "රත්තිං අවහරිස්සාමී"ති. සො තං මඤ්ඤමානො අත්තනො පරික්ඛාරං අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (55)

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පීඨෙ ථවිකං පස්සිත්වා ඉතො ගණ්හන්තො පාරාජිකො භවිස්සාමීති සහ පීඨකෙන සඞ්කාමෙත්වා අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (56)

28. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස භිසිං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (57)

29. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු චීවරවංසෙ චීවරං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (58)

30. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු විහාරෙ චීවරං අවහරිත්වා ඉතො නික්ඛමන්තො පාරාජිකො භවිස්සාමීති විහාරා න නික්ඛමි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "නික්ඛමෙය්‍ය වා සො භික්ඛවෙ මොඝපුරිසො න වා නික්ඛමෙය්‍ය ආපත්ති පාරාජිකස්සා"ති. (59)

31. තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛූ සහායකා හොන්ති. එකො භික්ඛු ගාමං පිණ්ඩාය පාවිසි. දුතියො භික්ඛු සඞ්ඝස්ස ඛාදනීයෙ භාජියමානෙ සහායකස්ස භාගං ගහෙත්වා තස්ස විස්සාසන්තො පරිභුඤ්ජි. සො ජානිත්වා තං චොදෙසි: 'අස්සමණොසි ත්ව'න්ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "කිඤ්චිත්තො ත්වං භික්ඛූ?"ති "විස්සාසග්ගාහී අහං භගවා"ති. "අනාපත්ති භික්ඛු විස්සාසග්ගාහෙ"ති. (60)

32. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ චීවරකම්මං කරොන්ති. සඞ්ඝස්ස ඛාදනීයෙ භාජියමානෙ සබ්බෙසං පටිවිංසා ආහරිත්වා උපනික්ඛිත්තා හොන්ති. අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරස්ස භික්ඛුනො පටිවිංසං අත්තනො මඤ්ඤමානො පරිභුඤ්ජි. සො ජානිත්වා තං චොදෙසි: 'අස්සමණොසි ත්ව'න්ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "කිඤ්චිත්තො ත්වං භික්ඛූ"ති "සකසඤ්ඤී අහං භගවා"ති. "අනාපත්ති භික්ඛු සකසඤ්ඤිස්සා"ති. (61)

25. එසමයෙහි එක්තරා මහණෙක් දවල් පිරිකරක් දැක "රෑ සොරකම් කරන්නෙමි" යි නිමිති ගත්තේ ය. හෙතෙමේ 'එයැ' යි හඟිමින් එය සොරකම් කෙළේ ය. ... 'එයැ' යි හඟිමින් අනෙකක් සොරකම් කෙළේ ය. ... 'අනෙකකැ'යි හඟිමින් එය සොරකම් කෙළේ ය. ... අනෙකකැයි හඟිමින් අනෙකක් සොරකම් කළේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ තෝ පරිජිඇවැත් අවත්නෙහි" ය යි වදාළ සේක (51-54.)

26. එසමයෙහි එක්තරා මහණෙක් දවල් පිරිකරක් දැක 'රෑ සොරකම් කරන්නෙමි' යි නිමිති කෙළේ ය. හෙතෙමේ 'එයැ'යි හඟිමින් තමාගේ පිරිකරක් (සොර සිතින්) හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ" යයි වදාළ සේක. (55)

27. එසමයෙහි එක්තරා මහණෙක් පුටුවකැ පියැල්ලක් දැක 'මෙයින් පැහැරගන්නෙම් පැරැදුනෙම්' වෙම් සී සිතා පුටුව සම්ග බැහැර කොට හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය. -පෙ- "මහණ තෝ පරිජිඇවැත් අවත්නෙහි ය." (56)

28. එසමයෙහි එක්තරු මහණෙක් සඟසතු බිස්සක් සොර සිතින් හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය. -පෙ- "මහණ තෝ පරිජිඇවැත් අවත්නෙහි ය"සි. (57)

29. එසමයෙහි එක්තරා මහණෙක් සිවුරුවසෙහි ලූ සිවුරක් සොර සිතින් හැරගත්තේ ය. ඔහුට කුකුස් විය. -පෙ- "මහණ තෝ පරිජි ඇවැත් අවත්නෙහි ය." (58)

30. එසමයෙහි එක්තරා මහණෙක් විහාරයෙහි සිවුරක් සොරාගෙණ 'මෙයින් නික්මෙන්නෙම් පරිජි ඇවැත් අවත්නෙම්'සි විහාරයෙන් නො නික්මිත. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ පුවත සැල කළාහු ය. ... "මහණෙනි, ඒ හිස් පුරුෂ තෙමේ නික්මෙන්නේ හෝ නො නික්මෙන්නේ හෝ පරිජිඇවැත් අවත්නේ වෙයි." (59)

31. එසමයෙහි යහළු භික්ෂූහු දෙනමක් වෙත්. එක් නමක් පිඬු පිණිස ගමට පිවිසියේ ය. දෙවැන්නා සඟනට කැවිලි බෙදනු ලබන කල්හි යහළුවා අයත් කොටස ගෙණ ඔහුට විස්වස් ඇතියේ වැළැඳී ය. ඒ මහණ තෙමේ එය දැන "තෝ නොමහණෙක් වෙහි"සි ඒ මහණහට චොදනා කෙළේය. ඒ මහණ-හට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කෙළේ ය. ... මහණ තෝ කෙබඳු සිතැතියෙහි ද? "භාග්‍යවතුන් වහන්ස, මම විශ්වාස ග්‍රාහී වීමි." "මහණ විශ්වාසග්‍රාහයෙන් ඇවැත් නො වේ." (60)

32. එසමයෙහි බොහෝ භික්ෂූහු සිවුරුකම් කරත්. සඟනට කැවිලි බෙදනු ලබන කල්හි සියල්ලන්ගේ කොටස් ගෙණවුත් වෙත තබන ලද්දාහු වෙත්. එක්තරා මහණෙක් 'අනෙක් මහණකුගේ කොටස තමාගේ ය' සි හඟිමින් වැළැඳිය. ඒ මහණ තෙමේ එය දැන "තෝ නොමහණෙක් වෙහි"සි ඔහුට චොදනා කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මේ පවත් සැල කෙළේ ය. ... "මහණ, තෝ කෙබඳු සිතැත්තෙහි ද?" "භාග්‍යවතුන් වහන්ස, තමාගේ ය යන හැඟීම් ඇත්තෙම් වීමි." "මහණ, තමාගේය යන හැඟීම් ඇත්තහුට ඇවැත් නොවේ." (61)

33. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ චීවරකම්මං කරොන්ති. සඞ්ඝස්ස ඛාදනීයෙ භාජියමානෙ අඤ්ඤතරස්ස භික්ඛුනො පත්තෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පටිවිංසො ආහරිත්වා උපනික්ඛිත්තො හොති. පත්තසාමිකො භික්ඛු අත්තනො මඤ්ඤමානො පරිභුඤ්ජි. සො ජානිත්වා තං චොදෙසි: "අස්සමණො'සි ත්ව"න්ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "කිඤ්චිත්තො ත්වං භික්ඛූ?"ති "සකසඤ්ඤී අහං භගවා"ති. "අනාපත්ති භික්ඛු සකසඤ්ඤිස්සා"ති. (62)

34. තෙන ඛො පන සමයෙන අම්බචොරකා අම්බං පාතෙත්වා භණ්ඩිකං ආදාය අගමංසු. සාමිකා තෙ චොරකෙ අනුබන්ධිංසු. චොරකා සාමිකෙ පස්සිත්වා භණ්ඩිකං පාතෙත්වා පලායිංසු. භික්ඛූ පංසුකූලසඤ්ඤිනො පටිග්ගාහාපෙත්වා පරිභුඤ්ජිංසු. සාමිකා තෙ භික්ඛූ චොදෙසුං: "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "කිඤ්චිත්තා තුම්හෙ භික්ඛවෙ?"ති "පංසුකූලසඤ්ඤිනො මයං භගවා"ති. "අනාපත්ති භික්ඛවෙ පංසුකූලසඤ්ඤිස්සා"ති. (63)

35. තෙන ඛො පන සමයෙන ජම්බුචොරකා -පෙ- ලබුජචොරකා -පෙ- පනසචොරකා -පෙ- තාලපක්කචොරකා -පෙ- උච්ඡුචොරකා -පෙ- තිම්බරූසකචොරකා තිම්බරූසකෙ ඔචිනිත්වා භණ්ඩිකං ආදාය අගමංසු. සාමිකා තෙ චොරකෙ අනුබන්ධිංසු. චොරකා සාමිකෙ පස්සිත්වා භණ්ඩිකං පාතෙත්වා පලායිංසු. භික්ඛූ පංසුකූලසඤ්ඤිනො පටිග්ගාහාපෙත්වා පරිභුඤ්ජිංසු. සාමිකා තෙ භික්ඛූ චොදෙසුං: "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛවෙ පංසුකූලසඤ්ඤිස්සා"ති. (64-69)

36. තෙන ඛො පන සමයෙන අම්බචොරකා අම්බං පාතෙත්වා භණ්ඩිකං ආදාය අගමංසු. සාමිකා තෙ චොරකෙ අනුබන්ධිංසු. චොරකා සාමිකෙ පස්සිත්වා භණ්ඩිකං පාතෙත්වා පලායිංසු. භික්ඛූ "පුරෙ සාමිකා පස්සන්තී"ති ථෙය්‍යචිත්තා පරිභුඤ්ජිංසු. සාමිකා තෙ භික්ඛූ චොදෙසුං "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජික"න්ති. (70)

37. තෙන ඛො පන සමයෙන ජම්බුචොරකා -පෙ- ලබුජචොරකා -පෙ- පනසචොරකා -පෙ- තාලපක්කචොරකා -පෙ- උච්ඡුචොරකා -පෙ- තිම්බරූසකචොරකා තිම්බරූසකෙ ඔචිනිත්වා භණ්ඩිකං ආදාය අගමංසු. සාමිකා තෙ චොරකෙ අනුබන්ධිංසු. චොරකා සාමිකෙ පස්සිත්වා භණ්ඩිකං පාතෙත්වා පලායිංසු. භික්ඛූ "පුරෙ සාමිකා පස්සන්තී"ති ථෙය්‍යචිත්තා පරිභුඤ්ජිංසු. සාමිකා තෙ භික්ඛූ චොදෙසුං "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජික"න්ති. (71-76)

38. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස අම්බං ථෙය්‍යචිත්තො අවහරි -පෙ- සඞ්ඝස්ස ජම්බුං -පෙ- සඞ්ඝස්ස ලබුජං -පෙ- සඞ්ඝස්ස පනසං -පෙ- සඞ්ඝස්ස තාලපක්කං -පෙ- සඞ්ඝස්ස උච්ඡුං -පෙ- සඞ්ඝස්ස තිම්බරූසකං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (77-83)

33. එසමයෙහි බොහෝ භික්ෂූහු සිවුරු ගෙත්තම් කරත්. සඟනට කැවිලි බෙදනු ලබන කල්හි එක්තරා මහණකුගේ පාත්‍රයෙහි අන් මහණකුගේ කොටස ගෙණවුත් තබන ලද්දේ වෙයි. පාත්‍රය හිමි මහණ තෙමේ තමාගේ ය යි සිතමින් වැළැඳී ය. ඒ මහණ එය දැන ඒ මහණහට 'තෝ නොමහණෙහි''යි. චෝදනා කෙළේ ය. ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කෙළේ ය. ... "මහණ තෝ කෙබඳු සිතැත්තෙහි ද?" "භාග්‍යවතුන් වහන්ස, මම සවකීය ය යන හැඟීම් ඇත්තෙම් විමි." "මහණ, ස්වකීය ය යන හැඟීම ඇත්තහුට ඇවැත් නො වේ." (62)

34. එසමයෙහි අඹ සොරු අඹ නෙළා පොදියක් බැඳ ගෙණ ගියාහු ය. හිමියෝ ඒ සොරුන් ලුහු බැන්දාහු ය. සොරු හිමියන් දැක පොදිය බිම හෙළා පැන ගියාහු ය. භික්ෂූහු පාංසුකූල සංඥ ඇත්තාහු පිළිගන්වා ගෙණ වැළඳූහ. "තෙපි නොමහණහ"යි හිමියෝ ඔවුනට චෝදනා කළාහු ය. ඔවුනට කුකුස් විය. ... භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ. මහණෙනි, තෙපි කෙබඳු සිත් ඇත්තෝ වූහු ද?" "භාග්‍යවතුන් වහන්ස, අපි පාංසුකූලසංඥ ඇත්තම්හ"යි "මහණෙනි, පාංසුකූලසංඥ ඇත්තහුට ඇවැත් නොවේ." (63)

35. එසමයෙහි දඹසොරු ... දෙල් සොරු ... කොස්සොරු ... තල්පල සොරු ... උක්සොරු ... තිඹිරිසොරු තිඹිරිපල නෙළා පොදියක් බැඳගෙණ ගියාහු ය. හිමියෝ ඒ සොරුන් ලුහුබැන්දාහු ය. සොරු හිමියන් දැක පොදිය බිම හෙළා පලා ගියාහු ය. භික්ෂූහු පාංසුකූලසංඥ ඇති ව පිළිගන්වා ගෙණ වැළඳූහ. "තෙපි නොමහණහ"යි හිමියෝ ඔවුනට චෝදනා කළාහුය, ඔවුනට කුකුස් විය. ... "මහණෙනි. පාංසුකූලසංඥ ඇත්තහුට ඇවැත් නො වේ." (64-69)

36. එසමයෙහි අඹසොරු අඹ නෙළා පොදියක් බැඳගෙණ ගියාහු ය. හිමියෝ ඔවුන් ලුහුබැන්දාහු ය. සොරු හිමියන් දැක පොදිය බිම හෙළා පලා ගියාහු ය. භික්ෂූහු සොර සිත් ඇත්තාහු 'නො බෝ කලෙකින් හිමියෝ දක්නාහ'යි වැළඳූහ. හිමියෝ "තෙපි නොමහණහ"යි ඔවුනට චෝදනා කළාහුය. ඔවුනට කුකුස් විය. ... "මහණෙනි, තෙපි පරිජිඇවැත් අවන්නාහු ය." (70)

37. එසමයෙහි දඹසොරු ... දෙල්සොරු ... කොස්සොරු ... තල්පල සොරු ... උක්සොරු ... තිඹිරිසොරු තිඹිරිපල නෙළා පොදි බැඳ ගෙණ ගියාහු ය. හිමියෝ ඔවුන් ලුහුබැන්දාහු ය. සොරු හිමියන් දැක පොදි බිම හෙළා පැන ගියාහු ය. භික්ෂූහු සොරසිත් ඇත්තෝ 'නො බෝ කලෙකින් හිමියෝ දක්නාහ'යි වැළඳූහ. "තෙපි නොමහණහ"යි හිමියෝ ඔවුනට චෝදනා කළාහුය. ඔවුනට කුකුස් විය. ... "මහණෙනි, තෙපි පරිජිඇවැත් අවන්නහුය." (71-76)

38. එසමයෙහි එක්තරා මහණෙක් සොර සිත් ඇත්තේ සඟසතු අඹ සොරකම් කෙළේ ය. ... සඟසතු දඹ ... සඟසතු දෙල් ... සඟසතු කොස් ... සඟසතු තල්පල ... සඟසතු උක් ... සඟසතු තිඹිරි සොර සිත් ඇත්තේ පැහැර ගත්තේය. ඔහුට කුකුස් විය. ... "මහණ තෝ පරිජිඇවැත් අවන්නෙහි ය". (77-83)

39. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පුප්ඵාරාමං ගන්ත්වා ඔචිතං පුප්ඵං පඤ්චමාසග්ඝනකං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික”න්ති. (84)

40. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පුප්ඵාරාමං ගන්ත්වා පුප්ඵානි ඔචිනිත්වා පඤ්චමාසග්ඝනකං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික”න්ති (85)

41. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගාමකං ගච්ඡන්තො අඤ්ඤතරං භික්ඛුං එතදවොච: “ආවුසො තුය්හං උපට්ඨාකකුලං වුත්තො වජෙමී”ති. සො ගන්ත්වා එකං සාටකං ආහරාපෙත්වා අත්තනා පරිභුඤ්ජි. සො ජානිත්වා තං චොදෙසි: ‘අස්සමණො’සි ත්ව’න්ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. “න ච භික්ඛවෙ ‘වුත්තො වජෙමී’ති වත්තබ්බො. යො වදෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති. (86)

42. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගාමකං ගච්ඡති. අඤ්ඤතරෙ භික්ඛු තං භික්ඛුං එතදවොච: “ආවුසො මය්හං උපට්ඨාකකුලං වුත්තො වජෙහී”ති. සො ගන්ත්වා යුගසාටකං ආහරාපෙත්වා එකං අත්තනා පරිභුඤ්ජි. එකං තස්ස භික්ඛුනො අදාසි. සො ජානිත්වා තං චොදෙසි: “අස්සමණො’සි ත්ව”න්ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. “න ච භික්ඛවෙ ‘වුත්තො වජෙහී’ති වත්තබ්බො. යො වදෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති. (87)

43. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගාමකං ගච්ඡන්තො අඤ්ඤතරං භික්ඛුං එතදවොච: “ආවුසො තුය්හං උපට්ඨාකකුලං වුත්තො වජෙමී”ති. සො’පි එවමාහ: “වුත්තො වජෙහී”ති. සො ගන්ත්වා ආළ්හකං සප්පිං, තුලං ගුළං, දොණං තණ්ඩුලං, ආහරාපෙත්වා අත්තනා පරිභුඤ්ජි. සො ජානිත්වා තං චොදෙසි: “අස්සමණො’සි ත්ව”න්ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. “න ච භික්ඛවෙ ‘වුත්තො වජෙමී’ති වත්තබ්බො. ‘න ච වුත්තො වජෙහී’ති වත්තබ්බො. යො වදෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති. (88)

44. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ පුරිසො මහග්ඝං මණිං ආදාය අඤ්ඤතරෙන භික්ඛුනා සද්ධිං අද්ධානමග්ගපටිපන්නො හොති. අථ ඛො සො පුරිසො සුඞ්කට්ඨානං පස්සිත්වා තස්ස භික්ඛුනො අජානන්තස්ස ථවිකාය මණිං පක්ඛිපිත්වා සුඞ්කට්ඨානං අතික්කමිත්වා අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “කිඤ්චිත්තො ත්වං භික්ඛූ?”ති. “නාහං භගවා ජානාමී”ති. අනාපත්ති භික්ඛු අජානන්තස්සාති. (89)

39. එසමයෙහි එක්තරා මහණෙක් මල් උයනකට පැමිණ මනුපසක් අගනා තෙළා තුඹු මල් සොර සිතින්හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඅැවැත් අවත්නෙහි ය." (84)

40. එසමයෙහි එක්තරා මහණෙක් මල් උයනකට පැමිණ සොරසිත් ඇතියේ මසු පසක් අගනා මල් තෙළා ගෙණ ගියේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ තෝ පරිජිඅැවැත් අවත්නෙහි ය." (85)

41. එසමයෙහි එක්තරා මහණෙක් ගමකට යත්තේ එක්තරා මහණකුට, "ඇවැත්ති, තොපගේ උපසථායකකුලයට (ගොස් ඉල්ලා ගැණීමට) 'තොප විසින් කියනු ලැබුයෙමි'යි තොප වචනයෙන් කියමි"යි කී ය. හෙ තෙමේ ගොස් එක් සළුවක් ගෙන්වා ගෙණ තෙමේ පරිභොග කෙළේ ය. හේ දැන ගෙණ ඒ මහණහට "තෝ අශ්‍රමණ වෙහි'ය යි චොදනා කෙළේ ය. ඔහුට කුකුස් විය. -පෙ- මහණ පරිජිඅැවැත් නො වේ. "මහණෙනි, '(පණිවුඩයක්) කියනු ලැබුවෙමි යි (ඔවුන්ට) කියමි'යි නො කිය යුතු ය. යමෙක් කියා නම් දුකුළාඅැවැත් වේ." (86)

42. එසමයෙහි එක්තරා මහණෙක් ගමකට යෙයි. අන් මහණෙක් ඒ මහණහට ඇවැත්නි, "මගේ උපසථායක කුලයට මා විසින් කියන ලද්දෙහියයි මගේ වචනයෙන් කියව"යි කී ය. හෙ තෙමේ ගොස් සළුවලක් ගෙන්වා ගෙණ එකක් තමා පරිභොග කෙළේය. එකක් ඒ මහණහට දින. හෙ තෙමේ එය දැනගෙණ ඔහුට 'තෝ අශ්‍රමණ වෙහි'යි චොදනා කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ පරිජිඅැවැත් නො වේ. "මහණෙනි, 'මා විසින් කියන ලද්දෙහි මගේ වචනයෙන් කියව'යි නො කිය යුතු ය. යමෙක් කියා නම් දුකුළා ඇවැත් වේ." (87)

43. එසමයෙහි එක්තරා මහණෙක් ගමකට යත්තේ එක්තරා මහණකුට "ඇවැත්නි, තොපගේ උපසථායක 'කුලයට තා විසින් කියන ලදු යෙමි'යි තාගේ වචනයෙන් කියමි"යි කිය. හෙතෙමේ ද "මා විසින් කියන ලද්දෙහි යයි මාගේ වචනයෙන් කියව"යි කී ය. හෙ තෙමේ ගොස් තැලියක් ගිතෙල් ද, තුලාවක් උක්සකුරු ද, තිඹක් සහල් ද, ගෙන්වා ගෙණ තෙමේ පරිභොග කෙළේ ය. හෙතෙමේ එය දැනගෙණ ඒ මහණහට 'තෝ නො මහණෙක් වෙහි'යි චොදනා කෙළේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ පරිජිඅැවැත් නො වේ. මහණ 'තා විසින් කියන ලද්දෙමි' තාගේ වචනයෙන් කියමි'යි. නො කිය යුතු යි. 'මා විසින් කියන ලද්දෙහි මාගේ වචනයෙන් කියව'යි නො කිය යුතු යි. යමෙක් කියා නම් දුකුළාඅැවැත් වේ" යැ යි වදාළ සේක. (88)

44. එසමයෙහි එක්තරා පුරුෂයෙක් මාහැඟි මැණිකක් රැගෙණ එක්තරා මහණකු හා අදත් මගට පිළිපත්තේ වෙයි. එකල්හි ඒ පුරුෂයා ශුල්කසථානයක් (සුංකම් අයකරණ තැනක්) දැක නො දන්නා වූ ඒ මහණහුගේ පසුම්බියෙහි මැණික බහා සුංකම් අයකරණ තැන ඉක්මවා නැවත හැර ගත්තේය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ කෙබඳු සිතැති වෙහි දැ"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, මම එය නො දනිමි"යි හේ කී ය. "මහණ නො දන්නහුට ඇවැත් නො වේ" යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (89)

45. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො මහග්ඝං මණිං ආදාය අඤ්ඤතරෙන භික්ඛුනා සද්ධිං අද්ධානමග්ගපටිපන්නො හොති. අථ ඛො සො පුරිසො සුඞ්කට්ඨානං පස්සිත්වා ගිලානාලයං කරිත්වා අත්තනො භණ්ඩිකං තස්ස භික්ඛුනො අදාසි. අථ ඛො සො පුරිසො සුඞ්කට්ඨානං අතික්කමිත්වා තං භික්ඛුං එතදවොච: "ආහර මෙ භන්තෙ භණ්ඩිකං, නාහං අකල්ලකො"ති. කිස්ස පන ත්වං ආවුසො එවරූපං අකාසීති. අථ ඛො සො පුරිසො තස්ස භික්ඛුනො එතමත්ථං ආරොචෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අජානන්තස්සා"ති. (90)

46. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සත්ථෙන සද්ධිං අද්ධානමග්ගපටිපන්නො හොති. අඤ්ඤතරො පුරිසො තං භික්ඛුං ආමිසෙන උපලාපෙත්වා සුඞ්කට්ඨානං පස්සිත්වා මහග්ඝං මණිං තස්ස භික්ඛුනො අදාසි. ඉමං භන්තෙ මණිං සුඞ්කට්ඨානං අතික්කාමෙහීති. අථ ඛො සො භික්ඛු තං මණිං සුඞ්කට්ඨානං අතික්කාමෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (91)

47. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පාසෙ බද්ධං[1] සූකරං කාරුඤ්ඤෙන මුඤ්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "කිඤ්චිත්තො ත්වං භික්ඛු?"ති "කාරුඤ්ඤාධිප්පායො අහං භගවා"ති. "අනාපත්ති භික්ඛු කාරුඤ්ඤාධිප්පායස්සා"ති. (92)

48. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පාසෙ බද්ධං සූකරං "පුරෙ සාමිකා පස්සන්තී"ති ථෙය්‍යචිත්තො මුඤ්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (93)

49. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පාසෙ බද්ධං මිගං කාරුඤ්ඤෙන මුඤ්චි -පෙ- පාසෙ බද්ධං මිගං 'පුරෙ සාමිකා පස්සන්තී"ති ථෙය්‍යචිත්තො මුඤ්චි -පෙ- කුමිනෙ බද්ධෙ මච්ඡෙ කාරුඤ්ඤෙන මුඤ්චි. -පෙ- කුමිනෙ බද්ධෙ මච්ඡෙ 'පුරෙ සාමිකා පස්සන්තී"ති. ථෙය්‍යචිත්තො මුඤ්චි, තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (94-97)

50. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු යානෙ භණ්ඩං පස්සිත්වා "ඉතො ගණ්හන්තො පාරාජිකො භවිස්සාමී"ති අතික්කමිත්වා පවට්ටෙත්වා අග්ගහෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (98)

51. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කුලලෙන උක්ඛිත්තං මංසපෙසිං "සාමිකානං දස්සාමී"ති අග්ගහෙසි. සාමිකා තං භික්ඛුං චොදෙසුං: "අස්සමණො'සි ත්ව"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අථෙය්‍යචිත්තස්සා"ති. (99)

52. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කුලලෙන උක්ඛිත්තං මංසපෙසිං "පුරෙ සාමිකා පස්සන්තී"ති ථෙය්‍යචිත්තො අග්ගහෙසි. සාමිකා තං භික්ඛුං චොදෙසුං: "අස්සමණො'සි ත්ව"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (100)

---

1. බන්ධං මජසං.

45. එසමයෙහි එක්තරා පුරුෂයෙක් මාහැඟි මැණිකක් රැගෙණ එක්තරා මහණකු සමග අදන් මගට පිළිපන්නේ වෙයි. එකල්හි ඒ පුරුෂයා ශුල්කස්ථානයක් දැක ගිලන් අයුරු දක්වා සවකීය බඩු පොදිය ඒ මහණහට දින. ඉන් පසු ඒ පුරුෂයා ශුල්කස්ථානය ඉක්මවා ඒ මහණහට "වහන්ස, මගේ බඩුපොදිය දෙනු මැනව. මම ගිලනෙක් නො වෙමි"යි මෙය කී ය. "ඇවත, තෝ කුමක් හෙයින් මෙබන්දක් කෙළෙහි ද?යි" ඒ මහණ පිළිවිසී ය. එකල ඒ පුරුෂයා ඒ මහණහට තෙල කරුණ දත් වී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ නොදන්නහුට ඇවැත් නො වේ." යැයි වදාළ සේක. (90)

46. එසමයෙහි එක්තරා මහණෙක් ගැල් තවලමක් සමග අදන්මගට පිළිපන්නේ වෙයි. එක් පුරුෂයෙක් ඒ මහණහු ආමිෂයෙන් පොළොඹවා ශුල්කස්ථානය දැක "වහන්ස, මේ මැණික ශුල්කස්ථානය ඉක්මවා ගෙණ යනු මැනවැ"යි මාහැඟි මැණිකක් ඒ මහණහට දිනි. වැලි ඒ මහණ තෙමේ ඒ මැණික ශුල්කස්ථානය ඉක්මවා ගෙණ ගියේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක (91)

47. එසමයෙහි එක්තරා මහණෙක් මලපුඹුවෙක බැඳුනු ඌරකු කුළුණු සිත් ඇතියේ මුදා ලී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ කෙබඳු සිතැති විහි ද"යි අසා වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, මම කුළුණු සිත් ඇත්තෙම් වීමි"යි හේ කී ය. "කුළුණු සිත් ඇත්තහුට ඇවැත් නො වේ යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (92)

48. එසමයෙහි එක්තරා මහණෙක් මලපත බැඳි ඌරකු හිමියෝ දක්නාහ'යි පෙරම සොර සිත් ඇතියේ මුදා ලී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි යැ"යි වදාළ සේක. (93)

49. එසමයෙහි එක්තරා මහණෙක් මලපුඹුවෙක බැඳි මුවකු කුළුණු සිත් ඇතියේ මුදා ලී ය. ... මලපත බැඳි මුවකු 'නො බෝ කලෙකින් හිමියෝ දක්නාහ'යි සොරසිත් ඇතිව මුදා ලී ය. ... කෙමිනෙහි හසු වූ මසුන් කුළුණු සිත් ඇතියේ මුදාලී ය. ... කෙමිනෙහි හසු වූ මසුන් 'නො බෝකලෙකින් හිමියෝ දක්නාහ'යි සොර සිත් ඇතිව මුදා ලී ය. ඒ මහණහට කුකුස් විය. "මහණ තෝ පරිජිඇවැත් අවන්නෙහි යැ" යි වදාළ සේක. (94-97)

50. එසමයෙහි එක්තරා මහණෙක් යානයක භාණ්ඩය දැක 'මෙයින් ගන්නෙම් නම් පරිජ අවදින්නෙම්'යි ඉවත් කොට පෙරළා ගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ තෝ පරිජිඇවැත් අවන්නෙහි යැ"යි වළද සේක. (98)

51. එසමයෙහි එක්තරා මහණෙක් උස්සකු විසින් තභාගත් මස්වැදැල්ලක් 'හිමියනට දෙන්නෙමැ'යි ගත්තේ ය. හිමියෝ "තෝ අශ්‍රමණ වෙහි"යි ඒ මහණහට චෝදනා කළාහු ය." ඔහුට කුකුස් විය. ... "මහණ සොර සිත් නැත්තහුට ඇවැත් නො වේ" යැයි වදාළ සේක. (99.)

52. එසමයෙහි එක්තරා මහණෙක් උකුස්සකු විසින් තභාගත් මස් වැදැල්ලක් 'නො බෝකලෙකින් හිමියෝ දක්නාහ'යි සොරසිත් ඇති ව ගත්තේ ය. 'තෝ අශ්‍රමණ වෙහි'යි හිමියෝ ඒ මහණහට චෝදනා කළාහු ය. ඔහුට කුකුස් විය. ... 'මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි යැ' යි වදාළ සේක. (100)

53. තෙන ඛො පන සමයෙන මනුස්සා උළුම්පං බන්ධිත්වා අචිරවතියා නදියා ඔසාදෙන්ති.[1] "බන්ධනෙ ඡින්නෙ කට්ඨානි විප්පකිණ්ණානි අගමංසු. භික්ඛූ පංසුකූලසඤ්ඤිනො උත්තාරෙසුං. සාමිකා තෙ භික්ඛූ චොදෙසුං "අස්සමණත්ථ තුම්හෙ'ති" තෙසං කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛවෙ පංසුකූලසඤ්ඤිස්සා'ති. (101)

54. තෙන ඛො පන සමයෙන මනුස්සා උළුම්පං බන්ධිත්වා අචිරවතියා නදියා ඔසාදෙන්ති. බන්ධනෙ ඡින්නෙ කට්ඨානි විප්පකිණ්ණානි අගමංසු. භික්ඛූ "පුරෙ සාමිකා පස්සන්තී"ති ථෙය්‍යචිත්තා උත්තාරෙසුං. සාමිකා තෙ භික්ඛූ චොදෙසුං: "අස්සමණත්ථ තුම්හෙ"[2]ති" තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජික"න්ති. (102)

55. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො ගොපාලකො රුක්ඛෙ සාටකං ආලග්ගෙත්වා උච්චාරං අගමාසි. අඤ්ඤතරො භික්ඛු පංසුකූලසඤ්ඤී අග්ගහෙසි. අථ ඛො සො ගොපාලකො තං භික්ඛුං චොදෙසි: "අස්සමණො'සි ත්ව"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පංසුකූලසඤ්ඤිස්සා"ති. (103)

56. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො නදිං තරන්තස්ස රජකානං හත්ථතො මුත්තං සාටකං පාදෙ ලග්ගං හොති. සො භික්ඛු සාමිකානං දස්සාමීති අග්ගහෙසි. සාමිකා තං භික්ඛුං චොදෙසුං: "අස්සමණො'සි ත්ව"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අථෙය්‍යචිත්තස්සා"ති. (104)

57. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො නදිං තරන්තස්ස රජකානං හත්ථතො මුත්තං සාටකං පාදෙ ලග්ගං හොති. සො භික්ඛු "පුරෙ සාමිකා පස්සන්තී"ති ථෙය්‍යචිත්තො අග්ගහෙසි. සාමිකා තං භික්ඛුං චොදෙසුං: "අස්සමණො'සි ත්ව"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (105)

58. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සප්පිකුම්භිං පස්සිත්වා ථොකං ථොකං[3] පරිභුඤ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (106)

59. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ සංවිදහිත්වා අගමංසු: "භණ්ඩං අවහරිස්සාමා"ති. එකො භණ්ඩං අවහරි. තෙ එවමාහංසු: "න මයං පාරාජිකා. යො අවහටො සො පාරාජිකො"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජික"න්ති. (107)

60. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ සංවිදහිත්වා භණ්ඩං අවහරිත්වා භාජෙසුං. තෙහි භාජියමානෙ එකමෙකස්ස පටිවිංසො න පඤ්චමාසකො පූරි. තෙ එවමාහංසු. "න මයං පාරාජිකා"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජික"න්ති. (108)

1. ඔසාරෙන්ති, මජසං සතා. 2. අස්සමණත්ථ, මජසං සතා. 3. ථොකථොකං. මජසං

53. එසමයෙහි මිනිස්සු පසුරක් බැඳ අචිරවතී නදියෙහි බවාපියති. බැමි සිඳී ගිය කල්හි ලී දඬු විසිර ගියේ ය. භික්ෂූහු පාංශුකූල සංඥ ඇත්තෝ ගොඩ ගත්හ. හිමියෝ ඒ භික්ෂූන්ට "තෙපි අශ්‍රමණයව්හ"යි චෝදනා කළාහු ය. ඔවුනට කුකුස් විය. ..."මහණෙනි, පාංශුකූල සංඥ ඇත්තහුට ඇවැත් නො වේ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (101)

54. එසමයෙහි මිනිස්සු පසුරක් බැඳ අචිරවතී නදියෙහි බවාපියති. බැඳුම් සිඳී ගිය කල්හි ලී දඬු විසිර ගියේ ය. භික්ෂූහු 'නොබෝකලකින් හිමියෝ දක්නාහ'යි සොර සිත් ඇත්තාහු ඒ ගොඩ දැමූහ. හිමියෝ "තෙපි නො මහණහ"යි ඔවුනට චෝදනා කළාහු ය. ඔවුනට කුකුස් විය. ... "මහණෙනි, තෙපි පරිජිඇවැත් අවත්තහු යැ"යි වදාළ සේක. (102)

55. එසමයෙහි එක්තරා ගොපල්ලෙක් ගසක සළුව එල්වා මල පහ කිරීම පිණිස ගියේ ය. එක්තරා මහණෙක් පාංශුකූල සංඥ ඇත්තේ එය ගත්තේ ය. ඉන් පසු ඒ ගොපලු තෙමේ ඒ මහණහට "තෝ අශ්‍රමණ වෙහි"යි චෝදනා කෙළේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ පාංශුකූල සංඥ ඇත්තහුට ඇවැත් නො වේ"යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. (103)

56. එසමයෙහි නදියක් තරණය කරණ මහණකුගේ පාදයෙහි රජකයන්ගේ අතින් මිදුනු සළුවෙක් ලැගුනේ වෙයි. ඒ මහණ තෙමේ 'හිමියන්ට දෙමි'යි එය ගත්තේ ය. හිමියෝ "තෝ අශ්‍රමණයෙහි"යි ඒ මහණහට චොදනා කළාහු ය. ඔහුට කුකුස් විය. ... "මහණ සොර සිත් නැත්තහුට ඇවැත් නො වේ"යැ යි වදාළ සේක. (104.)

57. එසමයෙහි නදියක් තරණය කරණ මහණකුගේ පාදයෙහි රජකයන්ගේ අතින් මිදුනු සළුවෙක් ලැගුනේ වෙයි. ඒ මහණ 'නොබෝකලෙකින් හිමියෝ දක්නාහ'යි සොරසිත් ඇතියේ එය ගත්තේ ය. හිමියෝ ඒ මහණහට තෝ අශ්‍රමණ වෙහි"යි චොදනා කළාහු ය. ඔහුට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහි"යැයි වදාළ සේක. (105)

58. එසමයෙහි එක්තරා මහණෙක් ගිතෙල් කළයක් දැක ටික ටික වැළඳී ය. ඔහුට කුකුස් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"යැ යි වදාළ සේක. (106.)

59. එසමයෙහි බොහෝ භික්ෂූහු 'බඩු සොරකම් කරන්නමු'යි සංවිධාන කොට ගෙණ ගියාහු ය. එක් තමෙක් බඩුව සොරකම් කෙළේ ය. සෙස්සෝ "අපි පරිජි ඇවැත් නො අවදුම්හ. යමෙක් එය සොරා ගත්තේ ද හෙතෙමේ ම පරිජි ඇවැත් අවත්තේ වේ"යැ යි මෙසේ කීහු. භාග්‍යවතුන් වහන්සේට මේ පවත් සැල කළාහු ය. "මහණෙනි, තෙපි පරිජිඇවැත් අවත්තහුයැ"යි වදාළ සේක. (107.)

60. එසමයෙහි බොහෝ භික්ෂූහු සංවිධාන කොට බඩු සොරා ගෙණ බෙදුවාහු ය. ඔවුන් විසින් බඩු බෙදනු ලබන කල්හි එක් එක් මහණක්හුගේ කොටස (අගයෙන්) මසුපසක් නො පිරුණි. ඔහු "අපි පාරදුනමෝ නොවන්නමු"යි කීහු. භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැළ කළාහු ය.... "මහණෙනි, තෙපි පරිජිඇවැත් අවත්තහු යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (108.)

61. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාවත්ථියං දුබ්භික්ඛෙ ආපණිකස්ස තණ්ඩුලමුට්ඨිං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (109)

62. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාවත්ථියං දුබ්භික්ඛෙ ආපණිකස්ස මුග්ගමුට්ඨිං -පෙ- මාසමුට්ඨිං -පෙ- තිලමුට්ඨිං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (110-112)

63. තෙන ඛො පන සමයෙන සාවත්ථියා අන්ධවනෙ චොරකා ගාවිං හන්ත්වා මංසං ඛාදිත්වා සෙසකං පටිසාමෙත්වා අගමංසු. භික්ඛූ පංසුකූලසඤ්ඤිනො පටිග්ගාහාපෙත්වා[1] පරිභුඤ්ජිංසු. චොරකා තෙ භික්ඛූ චොදෙසුං: "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පංසුකූලසඤ්ඤිස්සා"ති. (113)

64. තෙන ඛො පන සමයෙන සාවත්ථියා අන්ධවනෙ චොරකා සූකරං හන්ත්වා මංසං ඛාදිත්වා සෙසකං පටිසාමෙත්වා අගමංසු. භික්ඛූ පංසුකූලසඤ්ඤිනො පටිග්ගාහාපෙත්වා පරිභුඤ්ජිංසු. චොරකා තෙ භික්ඛූ චොදෙසුං: "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පංසුකූලසඤ්ඤිස්සා"ති. (114)

65. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු තිණක්ඛෙත්තං ගන්ත්වා ලූනං[2] තිණං පඤ්චමාසග්ඝනකං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (115)

66. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු තිණක්ඛෙත්තං ගන්ත්වා තිණං ලායිත්වා[3] පඤ්චමාසග්ඝනකං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (116)

67. තෙන ඛො පන සමයෙන ආගන්තුකා භික්ඛූ සඞ්ඝස්ස අම්බං භාජාපෙත්වා පරිභුඤ්ජිංසු. ආවාසිකා භික්ඛූ තෙ භික්ඛූ චොදෙසුං: "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "කිංචිත්තා තුම්හෙ භික්ඛවෙ?"ති "පරිභොගත්ථා.[4] මයං භගවා"ති. "අනාපත්ති භික්ඛවෙ පරිභොගත්ථායා"ති. (117)

68. තෙන ඛො පන සමයෙන ආගන්තුකා භික්ඛූ සඞ්ඝස්ස ජම්බුං -පෙ- සඞ්ඝස්ස ලබුජං -පෙ- සඞ්ඝස්ස පනසං -පෙ- සඞ්ඝස්ස තාලපක්කං -පෙ- සඞ්ඝස්ස උච්ඡුං -පෙ- සඞ්ඝස්ස තිම්බරූසකං භාජාපෙත්වා පරිභුඤ්ජිංසු. ආවාසිකා භික්ඛූ තෙ භික්ඛූ චොදෙසුං: "අස්සමණත්ථ තුම්හෙ"ති. තෙසං කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛවෙ පරිභොගත්ථායා"ති. (118-123)

69. තෙන ඛො පන සමයෙන අම්බපාලකා භික්ඛූනං අම්බඵලං දෙන්ති. භික්ඛූ 'ගොපෙතුං ඉමෙ ඉස්සරා, නයිමෙ දාතු'න්ති කුක්කුච්චායන්තා න පටිග්ගණ්හන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනාපත්ති භික්ඛවෙ ගොපකස්ස දානෙ"ති. (124)

---

1. පරිග්ගාහාපෙත්වා, 2. ලූතං, මජසං. 3. ලාවිත්වා, සී.මු. 4. පරිභොගත්ථාය, මජසං., ස්‍යා.

61. එසමයෙහි එක්තරා මහණෙක් සැවැත්නුවර දුර්භික්ෂයෙක දී වෙළෙන්දකුගේ සහල් මිටක් සොරසිතැතියේ ගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවත්නෙහි යැ"යි වදාළ සේක. (109.)

62. එසමයෙහි එක්තරා මහණෙක් සැවැත්නුවර දුර්භික්ෂයෙක දී වෙළෙන්දකුට අයත් මුං මිටක් ... මෑ මිටක් ... තල මිටක් සොර සිතැතියේ හැර ගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ පරිජි ඇවැත් අවත්නෙහි යැ"යි වදාළ සේක. (110-112.)

63. එසමයෙහි සැවැත්නුවර අන්ධවනයෙහි සොරු ගවදෙනක මරු මස් කා සෙස්ස සඟවා තබා ගියාහු ය. භික්ෂූහු පාංශුකූල සංඥ ඇත්තෝ පිළිගන්වා ගෙණ එය වැළඳූහ. සොරු ඒ භික්ෂූන්ට "තෙපි අශ්‍රමණයව්හ"යි චොදනා කළාහු ය. ඔවුනට කුකුස් විය. ... "මහණෙනි, පාංශුකූල සංඥ ඇත්තහුට ඇවැත් නො වේ"ය යි වදාළ සේක. (113.)

64. එසමයෙහි සැවැත්නුවර අන්ධවනයෙහි සොරු ඌරකු මරු මස් කා සෙස්ස සඟවා තබා ගියාහු ය භික්ෂූහු පාංශුකූල සංඥ ඇත්තෝ පිළිගන්වා ගෙණ එය වැළඳූ හ. සොරු මහණුන්ට "තෙපි නො මහණහ"යි චොදනා කළාහු ය. ඔවුනට කුකුස් විය. "මහණෙනි, පාංශුකූල සංඥ ඇත්තහුට ඇවැත් නො වේ"ය යි වදාළ සේක. (114.)

65. එසමයෙහි එක්තරා මහණෙක් තණකෙතකට ගොස් සිද ලන ලද පස් මස්සක් අගනා තණ සොරසිතැතියේ හැර ගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවත්නෙහි යැ"යි වදාළසේක. (115)

66. එසමයෙහි එක්තරා මහණෙක් තණකෙතකට ගොස් සොරසිත් ඇත්තේ පස් මස්සක් අගනා තණ කපා පැහැර ගත්තේය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඅවැත්. අවත්නෙහි යැ"යි වදාළසේක. (116)

67. එසමයෙහි ආගන්තුක භික්ෂූහු සඟසතු අඹ බෙදවා ගෙණ වැළඳූහ. ආවාසික භික්ෂූහු ඔවුනට "තෙපි නොමහණහ"යි චෝදනා කළාහු ය. ඔවුනට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පුවත සැළ කළාහු ය. "මහණෙනි, තෙපි කෙබඳු සිත් ඇති වූහු ද?"යි අසා වදාළසේක. 'භාග්‍ය-වතුන් වහන්ස, අපි පරිභෝග කැමැත්තමෝ වූමු'යි ඔහු කීහ. ... "මහණෙනි, පරිභෝග කිරීම පිණිස ඇවැත් නො වේ." යැයි වදාළසේක. (117)

68. එසමයෙහි ආගන්තුක භික්ෂූහු සඟසතු දඹ...සඟසතු දෙල්...සඟසතු පනා (කොස්) ... සඟසතු තල්පල ... සඟසතු උක් ... සඟසතු තිඹිරි බෙදවා වැළඳූහ. ආවාසික භික්ෂූහු ඔවුනට "තෙපි නොමහණහ"යි චෝදනා කළාහු ය. ඔවුනට කුකුස් විය. ... "මහණෙනි, පරිභෝග පිණිස ඇවැත් නො වේ."යැයි වදාළසේක. (118-123.)

69. එසමයෙහි අඹපල්ලෝ භික්ෂූන්ට අඹ පල දෙත්. භික්ෂූහු "මොහු අඹ රැක ගැන්මෙහි ඉසුරෝ වෙත්. මොහු අනුන්ට දෙන්නට ඉසුරෝ නො වෙත්'යැ"යි කුකුස් කරන්නාහු නො පිළිගණිති. භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළාහු ය. "මහණෙනි ආරක්ෂකයා දුන් දෑය පිළිගැන්මෙහි ඇවැත් නොවේ"යැ යි වදාළසේක. (124)

70. තෙන ඛො පන සමයෙන ජම්බුපාලකා -පෙ- ලබුජපාලකා -පෙ- පනසපාලකා -පෙ- තාලපක්කපාලකා -පෙ- උච්ඡුපාලකා -පෙ- තිම්බරූසකපාලකා භික්ඛූනං තිම්බරූසකෙ දෙන්ති. භික්ඛූ "ගොපෙතුං ඉමෙ ඉස්සරා, නයිමෙ දාතු"න්ති කුක්කුච්චායන්තා න පටිග්ගණ්හන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනාපත්ති භික්ඛවෙ ගොපකස්ස දානෙ"ති. (125-130)

71. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස දාරුං තාවකාලිකං හරිත්වා අත්තනො විහාරස්ස කුඩ්ඩං උපත්ථම්භෙසි. භික්ඛූ තං භික්ඛුං චොදෙසුං: "අස්සමණො'සි ත්ව"න්ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- 'කිංචිත්තො ත්වං භික්ඛූ'ති. 'තාවකාලිකො අහං භගවා'ති, ... "අනාපත්ති භික්ඛු තාවකාලිකෙ"ති. (131)

72. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස උදකං ථෙය්‍යචිත්තො අවහරි. -පෙ- සඞ්ඝස්ස මත්තිකං ථෙය්‍යචිත්තො අවහරි. -පෙ- සඞ්ඝස්ස පුඤ්ජකිතං තිණං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (132-134)

73. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස පුඤ්ජකිතං තිණං ථෙය්‍යචිත්තො ඣාපෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (135)

74. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස මඤ්චං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (136)

75. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඞ්ඝස්ස පීඨං -පෙ- සඞ්ඝස්ස භිසිං -පෙ- සඞ්ඝස්ස බිම්බොහනං -පෙ- සඞ්ඝස්ස කවාටං -පෙ- සඞ්ඝස්ස ආලොකසන්ධිං -පෙ- සඞ්ඝස්ස ගොපානසිං ථෙය්‍යචිත්තො අවහරි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (137-142)

76. තෙන ඛො පන සමයෙන භික්ඛූ අඤ්ඤතරස්ස උපාසකස්ස විහාරපරිභොගං සෙනාසනං අඤ්ඤත්‍ර පරිභුඤ්ජන්ති. අථ ඛො සො උපාසකො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භදන්තා අඤ්ඤත්‍ර පරිභොගං අඤ්ඤත්‍ර පරිභුඤ්ජිස්සන්තී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "න භික්ඛවෙ අඤ්ඤත්‍ර පරිභොගො අඤ්ඤත්‍ර පරිභුඤ්ජිතබ්බො, යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති. (143)

77. තෙන ඛො පන සමයෙන භික්ඛූ උපොසථග්ගම්පි සන්නිසජ්ජම්පි හරිතුං කුක්කුච්චායන්තා ඡමායං නිසීදන්ති. ගත්තානි'පි චීවරානි'පි පංසුකිතානි හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ තාවකාලිකං හරිතු"න්ති. (144)

70. එසමයෙහි දඹපල්ලෝ ... දෙල් රක්තෝ ... කොස් රක්තෝ ... තල්පල රක්තෝ, ... උක් රක්තෝ ... තිඹිරි රක්තෝ භික්ෂූන්ට තිඹිරි දෙත්. භික්ෂූහු 'මොහු රක්තට ඉසුරෝ වෙති. මොහු දෙන්නට ඉසුරෝ නොවෙති'යි කුකුස් කරමින් නො පිළිගණිත්. භාග්‍යවතුන් වහන්සේට මෙ පුවත සැළකළාහු ය. ... "මහණෙනි, රක්තහුගේ දනය පිළිගැන්මෙහි ඇවැත් නො වේ" යැයි වදළසේ'ක. (125–130)

71. එසමයෙහි එක්තරා මහණෙක් සඟසතු දව තාවකාලික වසයෙන් ගෙණ ගොස් තමාගේ විහාරයේ බිත්තියට රුකුල් වසයෙන් යෙදී ය. භික්ෂූහු ඒ මහණහට චෝදනා කළාහු ය: "තෝ අශ්‍රමණ වෙහි"ය යි. ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් දන් වි ය. "මහණ තෝ කෙබඳු සිතැති වෙහි ද?" 'භාග්‍යවතුන් වහන්ස, තව්කාලි සිත් ඇත්තෙමි'. "මහණෙනි, තව්කාලියෙහි ඇවැත් නො වේ." (131)

72. එසමයෙහි එක්තරා මහණෙක් සඟසතු ජලය සොර සිත් ඇත්තේ හැර ගත්තේ ය. ... සඟසතු මැටි සොර සිත් ඇත්තේ හැරගත්තේ ය. ... සඟසතු ගොඩගසා තුබු තණ සොර සිත් ඇත්තේ හැරගත්තේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහි ය. (132–134)

73. එසමයෙහි එක්තරා මහණෙක් සඟසතු ගොඩ ගැසු තණකොළ සොරසිතින් දවී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, පරිජිඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ." (135)

74. එසමයෙහි එක්තරා මහණෙක් සඟ සතු ඇඳක් සොරසිත් ඇතියේ හැර ගත්තේ ය. ඔහුට කුකුස් විය. ... "මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහි ය." (136)

75. එසමයෙහි එක්තරා මහණෙක් සඟසතු පුටුවක්...සඟසතු බිස්සක්... සඟසතු කොට්ටයක් ... සඟසතු කවුළුදෙරක් ... සඟසතු කවුළුවක් ... සඟසතු ගොතැස්සක් සොරසිත් ඇතියේ හැ ර ගත්තේ ය. ඔහුට කුකුස් විය.... "මහණ, තෝ පරිජ් ඇවැත් අවත්තෙහි ය." (137–142)

76. එසමයෙහි භික්ෂූහු එක්තරා උවසුවකුගේ විහාරපරිභෝගවූ සෙනසුනක් අන් තැනක පරිභොග කරත්. ඉක්පසු ඒ උවසු තෙමේ අවමන් කෙරෙයි, අයුණු කියයි, නුගුණ පතුරුවයි: 'කෙසේ නම් පින්වත්හු අන්තැනක පරිභෝග කළයුතු දෙයක් අන්තැනක පරිභෝග කෙරෙද් දැ'යි. භාග්‍යවතුන් වහන්සේට එපවත් සැළ කළාහු ය. ... "මහණෙනි අන් තැනක පරිභෝග කළයුතු දෙය අන් තැනෙක දී පරිභෝග නො කළ යුතු යි. යමෙක් පරිභෝග කෙරේ නම් දුකුලාඇවැත් වේ." (143)

77. එසමයෙහි භික්ෂූහු පොහොයගෙට ද හිඳිනාකඩ පවා හැරගෙණ යන්නට කුකුස් උපදවන්නාහු බිම හිඳ ගණිත්. සිරුරු ද සිවුරු ද පස් වැකුණාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළාහු ය. ... "මහණෙනි තව්කාලිව ගෙණ යන්නට අනු දනිමි." (144)

78. තෙන ඛො පන සමයෙන **චම්පායං** **ථුල්ලනන්දාය** භික්ඛුනියා අන්තෙවාසිකා[1] භික්ඛුනී ථුල්ලනන්දාය භික්ඛුනියා උපට්ඨාකකුලං ගන්ත්වා “අය්‍යා ඉච්ඡති තෙකටුලයාගුං පාතු”න්ති පචාපෙත්වා හරිත්වා අත්තනා පරිභුඤ්ජි. සා ජානිත්වා තං චොදෙසි: “අස්සමණී'සි ත්ව”න්ති. තස්සා කුක්කුච්චං අහොසි. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති සම්පජානමුසාවාදෙ පාචිත්තියස්සා”ති. (145)

79. තෙන ඛො පන සමයෙන රාජගහෙ ථුල්ලනන්දාය භික්ඛුනියා අන්තෙවාසිකා භික්ඛුනී ථුල්ලනන්දාය භික්ඛුනියා උපට්ඨාකකුලං ගන්ත්වා “අය්‍යා ඉච්ඡති මධුගොළකං ඛාදිතු”න්ති පචාපෙත්වා හරිත්වා අත්තනා පරිභුඤ්ජි. සා ජානිත්වා තං චොදෙසි: “අස්සමණීසි ත්ව”න්ති. තස්සා කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති සම්පජානමුසාවාදෙ පාචිත්ති-යස්සා”ති. (146)

80. තෙන ඛො පන සමයෙන වෙසාලියං ආයස්මතො **අජ්ජුකස්ස** උපට්ඨාකස්ස ගහපතිනො ද්වෙ දාරකා හොන්ති පුත්තො ච භාගිනෙය්‍යො ච. අථ ඛො සො ගහපති ආයස්මන්තං අජ්ජුකං එතදවොච: “ඉමං භන්තෙ ඔකාසං යො ඉමෙසං ද්වින්නං දාරකානං සද්ධො හොති පසන්නො තස්ස ආචික්ඛෙය්‍යාසීති.[2] තෙන ඛො පන සමයෙන තස්ස ගහපතිනො භාගිනෙය්‍යො සද්ධො හොති පසන්නො. අථ ඛො ආයස්මා අජ්ජුකො තං ඔකාසං තස්ස දාරකස්ස ආචික්ඛි. සො තෙන සාපතෙය්‍යෙන කුටුම්බඤ්ච සණ්ඨපෙසි, දානඤ්ච පට්ඨපෙසි. අථ ඛො තස්ස ගහපතිනො පුත්තො ආයස්මන්තං ආනන්දං එතදවොච: “කො නු ඛො භන්තෙ **ආනන්ද** පිතුනො දායජ්ජො පුත්තො වා භාගිනෙය්‍යො වා”ති. “පුත්තො ඛො ආවුසො පිතුනො දායජ්ජො”ති. අයං “අය්‍යො අජ්ජුකො අම්හාකං සාපතෙය්‍යං අම්හාකං මෙථුනකස්ස ආචික්ඛී”ති. “අස්සමණො ආවුසො ආයස්මා අජ්ජුකො”ති. අථ ඛො අජ්ජුකො අයස්මන්තං ආනන්දං එතදවොච: “දෙහි මෙ ආවුසො ආනන්ද විනිච්ඡය”න්ති. තෙන ඛො පන සමයෙන අයස්මා **උපාලි** ආයස්මතො අජ්ජුකස්ස පක්ඛො හොති. අථ ඛො ආයස්මා උපාලි ආයස්මන්තං ආනන්දං එතදවොච: “යො නු ඛො ආවුසො ආනන්ද සාමිකෙන ‘ඉමං ඔකාසං ඉත්ථන්නාමස්ස ආචික්ඛා’ති[3] වුත්තො තස්ස ආචික්ඛති” කිං සො ආපජ්ජතී’ති. “න භන්තෙ කිඤ්චි ආපජ්ජති, අන්තමසො දුක්කටමත්තම්පී”ති. “අයං ආවුසො ආයස්මා අජ්ජුකො සාමිකෙන ‘ඉමං ඔකාසං ඉත්ථන්නාමස්ස ආචික්ඛා’ති වුත්තො තස්ස ආචික්ඛති.[4] අනාපත්ති ආවුසො ආයස්මතො අජ්ජුකස්සා’ති. (147)

---

1. අන්තෙවාසිනී. මජසං. 2. ආචික්ඛෙය්‍යාසි. සො කාලමකාසීති සසා. 3. ආචික්ඛාහීති සසා
4. ආචික්ඛි, සිමු.

78. එසමයෙහි **චම්පාවෙහි ථුල්ලනන්ද** නම් මෙහෙණගේ අතැවැසි මෙහෙණක් ථුල්ලනන්ද මෙහෙණගේ පසඳකුලයට ගොස් "ආයසීතොමෝ තිකුළු කැඳ[1] පානය කරන්නට කැමති"ය යි පිසවා ගෙන්වා ගෙණ තොමෝ පානය කළා ය. ඕ තොමෝ එය දැන ගෙණ ඇයට "නී මෙහෙණක් නො වෙහි"යි චෝදනා කළා ය. ඇයට කුකුස් විය. ඉන්පසු ඒ මෙහෙණ මෙහෙණන්ට මෙය සැළ කළා ය. මෙහෙණහු මහණුන්ට මෙය සැල කළාහු ය. මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙපුවත සැළ කළාහු ය. "මහණෙනි, පරිජි ඇවැත් නො වේ. දැන දැන මුසවා කීමෙහි පචිති ඇවැත් වේ." (145)

79. එසමයෙහි රජගහ නුවර ථුල්ලනන්ද නම් මෙහෙණගේ අතැවැසි මෙහෙණක් ථුල්ලනන්ද මෙහෙණගේ පසඳ කුලයට පැමිණ "ආයසී තොමෝ අතිරස කැවුම් වළඳන්නට කැමැත්තී"ය යි අතිරස කැවුම් පිසවා ගෙන්වා ගෙණ තොමෝ වැළඳුවා ය. ඕ මේ කරුණ දැන ගෙණ තෙල මෙහෙණට 'තෝ නොමෙහෙණක් වෙහි'යි චෝදනා කළා ය. ඒ මෙහෙණට කුකුස් විය. ... "මහණෙනි' පරිජි ඇවැත් නො වේ. දැන දැන මුසවා කීමෙහි පචිති ඇවැත් වේ." (146)

80. එසමයෙහි විසල් පුරයෙහි ආයුෂ්මත් **අජ්ජුක** මහණහුගේ උපස්ථායක ගෘහපතිහුගේ පුත්‍රයා ද බෑනා ද යි දරුවෝ දෙදෙනෙක් වෙති. ඉක්බිති ඒ ගැහැවි තෙමේ ආයුෂමත් අජ්ජුක තෙරුන්ට මෙය කීය: "වහන්ස, මේ දරුවන් දෙදෙනා අතුරෙන් යමෙක් සැදැහැති වේ ද, සත්හෙහි පැහැදුනෙක් වේ ද, ඔහුට මේ ස්ථානය (ධනය) කියනු මැනැවැ"යි. එසමයෙහි ඒ ගැහැවියාගේ බෑනා සැදැහැ ඇත්තෙක් ද පැහැදුනෙක් ද වෙයි. ඉක්බිති ආයුෂමත් අජ්ජුක තෙමේ ඒ ස්ථානය ඒ දරුහට කීයේ ය. හෙ තෙමේ ඒ ධනයෙන් ගෙදළු (ගිහි ජීවිතය) ඇරඹී ය. දන් වැට ද තැබී ය. ඉක්බිති ඒ ගැහැවියාගේ පුත් තෙමේ ආයුෂමත් **ආනන්ද** ස්ථවිරයන් වහන්සේට මෙය දැන්වී ය. "වහන්ස, ආනන්ද ස්ථවිරයෙනි, කවරෙක් පියසතු ධනයට හිමියා වේ ද 'පුත්‍රයා ද නැතහොත් බෑනා ද?"යි. "ඇවත පුත් තෙමේ පියසතු ධනයට හිමියා වෙයි" කී ය. "වහන්ස, මේ අජ්ජුක හිමි තෙමේ අපසතු ධනය අපගේ නෑ හුහුරුබඩු පැවරී ය. ඇවැත්නි, ආයුෂමත් අජ්ජුක තෙමේ නො මහණෙකි'යි. ඉක්බිති අජ්ජුක තෙමේ ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය කී ය: "ඇවැත් ආනන්ද ස්ථවිරයෙනි, මට විනිශ්චයක් දෙනු මැනැවැ"යි. එසමයෙහි ආයුෂමත් **උපාලි** ස්ථවිර තෙමේ ආයුෂමත් අජ්ජුකහට පක්‍ෂපාතී වෙයි. ඉක්බිති ආයුෂමත් උපාලි ස්ථවිර තෙමේ ආයුෂමත් ආනන්ද ස්ථවිරයන්ට මෙය කීය: "ඇවැත් ආනන්ද ස්ථවිරය, යමෙක් වනාහි හිමියා විසින් 'මේ ස්ථානය මෙනම් ඇත්තහුට කියව'යි කියන ලද්දේ ඔහුට කියා නම් හෙතෙමේ කිනම් ඇවතකට පැමිණේ ද?" "වහන්ස, කිසියම් ඇවැතකට නො පැමිණෙයි. යටත් පිරිසෙයින් දුකුළාවක් පමණකට ද නො පැමිණේ"යි. "ඇවැත්නි, මේ ආයුෂමත් අජ්ජුක තෙමේ හිමියා විසින් මේ ස්ථානය මෙනම් ඇත්තහුට කියව'යි කියන ලද්දේ ඔහුට කී ය. ඇවැත්නි, ආයුෂමත් අජ්ජුකහට ඇවැත් නො වේ." (147)

---

1. තල-සහල්-මුං හෝ, තල-සහල්-මෑ හෝ, තල-සහල්-කොල්ලු හෝ, තල-සහල් දෙක යම්කිසි අපරණ්ණ ධාන්‍යයක් සමග මිශ්‍රකොට ගන්නා ලද්ද සතරෙන් කොටසක් දිය මුසු කිරියෙහි බහා පියගත් ගිතෙල් මී සකුරු ආදිය යෙදූ කැඳයි. (සමන්තපාසාදිකා)

81. තෙන ඛො පන සමයෙන **බාරාණසියං** ආයස්මතො **පිලින්දිවච්ඡස්ස** උපට්ඨාකකුලං චොරෙහි උපද්දුතං හොති. ද්වෙ ච දාරකා නීතා හොන්ති. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො තෙ දාරකෙ ඉද්ධියා ආනෙත්වා පාසාදෙ ඨපෙසි. මනුස්සා තෙ දාරකෙ පස්සිත්වා "අය්‍යස්සායං පිලින්දිවච්ඡස්ස ඉද්ධානුභාවො"ති ආයස්මන්තෙ පිලින්දිවච්ඡෙ අභිප්පසීදිංසු. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා පිලින්දිවච්ඡො චොරෙහි නීතෙ දාරකෙ ආනෙස්සතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "අනාපත්ති භික්ඛවෙ ඉද්ධිමතො[1] ඉද්ධිවිසයෙ"ති. (146)

82. තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛූ සහායකා හොන්ති **පණ්ඩුකො** ච **කපිලො** ච. එකො ගාමකෙ විහරති එකො **කොසම්බියං**. අථ ඛො තස්ස භික්ඛුනො ගාමකා කොසම්බිං ගච්ඡන්තස්ස අන්තරා මග්ගෙ නදිං තරන්තස්ස සූකරිකානං හත්ථතො මුත්තා මෙදවට්ටි පාදෙ ලග්ගා හොති. සො භික්ඛු "සාමිකානං දස්සාමී"ති අග්ගහෙසි. සාමිකා තං භික්ඛුං චොදෙසුං: "අස්සමණො'සි ත්ව"න්ති. තං උත්තිණ්ණං අඤ්ඤතරා[2] ගොපාලිකා පස්සිත්වා එතදවොච: "එහි භන්තෙ මෙථුනං ධම්මං පටිසෙවා"ති. සො 'පකතියාපහං අස්සමණො'ති[3] තස්සා මෙථුනං ධම්මං පටිසෙවිත්වා කොසම්බිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. ... අනාපත්ති භික්ඛවෙ අදින්නාදානෙ පාරාජිකස්ස, ආපත්ති මෙථුනධම්මසමායොගෙ පාරාජිකස්සා"ති (149)

83. තෙන ඛො පන සමයෙන **සාගලායං** ආයස්මතො **දළ්හිකස්ස** සද්ධි-විහාරිකො භික්ඛු අනභිරතියා පීළිතො ආපණිකස්ස වෙඨනං අවහරිත්වා ආයස්මන්තං දළ්හිකං එතදවොච: "අස්සමණො අහං භන්තෙ විබ්භමිස්සාමී"ති. "කිං තයා ආවුසො කත"න්ති? සො තමත්ථං ආරොචෙසි. ආහරාපෙත්වා අග්ඝාපෙසි. තං අග්ඝාපෙන්තො න පඤ්චමාසකො අග්ඝි[4] ... "අනාපත්ති ආවුසො පාරාජිකස්සා"ති ධම්මකථං අකාසි. සො භික්ඛු අභිරමීති.[5] (150)

## දුතියපාරාජිකං සමත්තං.

---

1 ඉද්ධිමන්තස්ස. මජ්ඣං. ඉද්ධිමතො. ස්‍යා. 2. [illegible]. මජ්ඣං. 3. අස්සමණොසම්හීති සිමු. 4. අග්ඝාපෙන්තං න පඤ්චමාසකො අග්ඝාපෙති. මජ්ඣං. 5. අභිරමතීති. ම.ඡ.සං.

81. එසමයෙහි **බරණැස්නුවර** ආයුෂමත් **පිලින්දිවච්ඡ** තෙරුන්ගේ උපස්ථායකකුලය සොරුන් විසින් පෙළනලද්දේ වෙයි. දරුවන් දෙදෙන ද පැහැර ගෙණ යන ලද්දාහු වෙත්. ඉක්බිති ආයුෂමත් පිලින්දිවච්ඡ තෙමේ ඒ දරුවන් සෘද්ධියෙන් ගෙණවුත් පහයෙහි තැබී ය. මිනිස්සු ඒ දරුවන් දැක මෙය පිලින්දිවච්ඡ ආයර්‍යයන්ගේ සෘද්ධ්‍යනුභාව යයි ආයුෂමත් පිලින්දිවච්ඡ තෙරුන් කෙරෙහි ඉතා පැහැදුනාහු ය. භික්ෂූහු අවමන් කෙරෙති, අයුණු කියති, නුගුණ පතුරුවත්: "කෙසේ නම් ආයුෂමත් පිලින්දිවච්ඡතෙමේ සොරුන් විසින් ගෙණ යනලද දරුවන් ගෙණ ආයේ දැ"යි. භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළාහු ය. ... "මහණෙනි, සෘද්ධිමත්හුගේ සෘද්ධි විෂයෙහි ඇවැත් නො වේ." (148)

82. එසමයෙහි **පණ්ඩුකය කපිලය** යි යහළු භික්ෂූහු දෙනමක් වෙත්. එක් නමක් ගමක වෙසෙයි. එක් නමක් **කොසඹෑනුවර** වෙසෙයි. ඉක්බිති ගමින් කොසඹෑනුවරට යද්දී අතර මග නදියක් තරණය කරන්නා වූ ඒ මහණහුගේ පාදයෙහි සූරුවැද්දන්ගේ අතින් ගිලිහුනු වුරුණු තෙල් වැටිය ලැගුනේ වෙයි. ඒ මහණ තෙමේ "හිමියන්ට දෙන්නෙමැ"යි එය හැර ගත්තේ ය. හිමියෝ ඒ මහණහට "තෝ අශ්‍රමණ වෙහි"යි චෝදනා කළාහුය. එතරවූ ඒ මහණ දැක එක් ගෙවිලියක් මෙසේ කීවාය. "වහන්ස, එනු මැනැවි. මෙවුන්දම් සේවනය කරන්නැ"යි. හෙතෙමේ "මම පියොවිනිදු අශ්‍රමණයෙමි"යි ඇය හා මෙවුන්දම් සේවනය කොට කොසඹෑනුවරට ගොස් භික්ෂූන්ට තෙල පවත් සැල කෙළේය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කළාහුය. ... "මහණෙනි, අයිනාදනින් පරිජි ඇවැත් නොවේ. මෙවුන්දම් සෙවීමෙන් පරිජිඇවැත් වේ". (149)

83. එසමයෙහි **සගල්පුර** ආයුෂමත් **දළ්හිකය**ගේ සද්ධිවිහාරික මහණෙක් අනභිරතියෙන් පෙළුනේ වෙළෙන්දකුගේ හිස් වෙළුමක් සොරා ගෙණ ආයුෂමත් වූ දළ්හික තෙරුන්ට මෙය කීය: "වහන්ස, මම අශ්‍රමණ වෙමි. උපැවිදි වන්නෙමි"යි "ඇවැත්නි තා විසින් කුමක් කරණ ලදද?" හෙතෙමේ එකරුණ කීය. එය ගෙන්වා අගය (මිල නියම) කරවීය. අගය කරවන කල්හි මසුපසක් නො අගනේ විය. "ඇවැත්නි, පරිජිඇවත නො වේය"යි දැහැමි කථාවක් කෙළේය. ඒ මහණ තෙමේ සන්තහි සිත් ඇලවීය. (150)

## දෙවන පරිජිය නිමි.

# 2. 3.

## තතියපාරාජිකං

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූනං අනෙකපරියා-යෙන අසුභකථං කථෙති, අසුභාය වණ්ණං භාසති, අසුභභාවනාය වණ්ණං භාසති, ආදිස්ස ආදිස්ස අසුභසමාපත්තියා වණ්ණං භාසති.

2. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "ඉච්ඡාමහං භික්ඛවෙ අඩ්ඪමාසං පතිසල්ලීයිතුං, නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාත නීහාරකෙනා"ති. "එවං භන්තෙ"ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා[1] නාස්සු'ධ කොචි භගවන්තං උපසඞ්කමති අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනී-හාරකෙන.

3. භික්ඛූ "භගවා ඛො අනෙකපරියායෙන අසුභකථං කථෙති, අසුභාය වණ්ණං භාසති, අසුභභාවනාය වණ්ණං භාසති, ආදිස්ස ආදිස්ස අසුභසමා-පත්තියා වණ්ණං භාසතී"ති තෙ අනෙකාකාරවොකාරං අසුභභාවනානුයොග-මනුයුත්තා විහරන්ති.

4. තෙ සකෙන කායෙන අට්ටීයන්ති හරායන්ති ජිගුච්ඡන්ති. සෙය්‍යථාපි නාම ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසංන්හාතො අහිකුණපෙන වා කුක්කුරකුණපෙන වා මනුස්සකුණපෙන වා කණ්ඨෙ ආසත්තෙන අට්ටීයෙය්‍ය හරායෙය්‍ය ජිගුච්ඡෙය්‍ය. එවමෙව තෙ භික්ඛූ සකෙන කායෙන අට්ටීයන්තා හරායන්තා ජිගුච්ඡන්තා අත්තනාපි අත්තානං ජීවිතා වොරොපෙන්ති, අඤ්ඤමඤ්ඤම්පි ජීවිතා වොරොපෙන්ති. මිගලණ්ඩිකම්පි සමණකුත්තකං උපසඞ්කමිත්වා එවං වදෙන්ති:- "සාධු නො ආවුසො ජීවිතා වොරොපෙහි, ඉදං තෙ පත්තචීවරං භවිස්සතී"ති.

5. අථ ඛො මිගලණ්ඩිකො සමණකුත්තකො පත්තචීවරෙහි භටො සම්බහුලෙ භික්ඛූ ජීවිතා වොරොපෙත්වා ලොහිතකං අසිං ආදාය යෙන වග්ගුමුදා නදී, තෙනුපසඞ්කමි. අථ ඛො මිගලණ්ඩිකස්ස සමණකුත්තකස්ස ලොහිතකං අසිං[2] ධොවන්තස්ස අහුදෙව කුක්කුච්චං අහු විප්පටිසාරො: "අලාභා වත මෙ, න වත මෙ ලාභා. දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං. බහුං වත මයා අපුඤ්ඤං පසුතං යො'හං භික්ඛූ සීලවන්තෙ කල්‍යාණධම්මෙ ජීවිතා වොරොපෙසි"න්ති.

6. අථ ඛො අඤ්ඤතරා මාරකායිකා දෙවතා අභිජ්ජමානෙ උදකෙ ආගන්ත්වා මිගලණ්ඩිකං සමණකුත්තකං එතදවොච: "සාධු සාධු සප්පුරිස, ලාභා තෙ සප්පුරිස, සුලද්ධං තෙ සප්පුරිස, බහුං තයා සප්පුරිස, පුඤ්ඤං පසුතං, යං ත්වං අතිණ්ණෙ තාරෙසී"ති.

---

1 පටිස්සුණිත්වා මජසං. 2. තං අසිං. මජසං.

# 2. 3.

## තෘතීය පාරාජිකය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ විසල්පුර මහවෙනෙහි කූටාගාරසාලාවෙහි වෙසෙන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් භික්ෂූන්ට අසුභය පිළිබඳ කථාව වදාරණ සේක. අසුභයෙහි විස්තර වදාරණ සේක. අසුභභාවනාවෙහි ගුණ කියන සේක. කරුණු දක්ව දක්වා අසුභසමාපත්තියෙහි අනුසස් වදාරණ සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, මම අඩමසක් හුදකලාව වසන්නට කැමැත්තෙමි. පිණ්ඩපාතය ගෙණෙන එක් මහණකු හැර කිසිවකු විසින් නොඑළඹිය යුත්තෙම් වෙමි"යි. "වහන්ස, එසේ ය"යි. ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී මෙහි පිණ්ඩපාතය ගෙණෙන එක් මහණකු හැර කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත නො එළඹෙයි.

3. භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් අසුභකථාව වදාරණ සේක. අසුභයෙහි විස්තර කියන සේක. අසුභභාවනාවෙහි ගුණ කියන සේක. කරුණු දක්ව දක්වා අසුභසමාපත්තියෙහි අනුසස් වදාරණ සේකැ"යි ඒ භික්ෂූහු නොයෙක් අයුරින් මුසුවූ අසුභභාවනාවෙහි යෙදුනාහු වෙසෙත්.

4. යම්සේ සැරසීම පියවී කොට ඇති හිස නැවාවූ තරුණවූ යොවුනෙහි සිටියා වූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගෙලෙහි ලැගුනු සර්පකුණපයකින් හෝ බලුකුණකින් හෝ මිනිස් කුණකින් හෝ පෙලෙන්නේ ද, ලජ්ජිතවන්නේ ද, පිළිකුල් කරන්නේ ද, එපරිද්දෙන් ම ඒ භික්ෂූහු සියකයින් පෙලෙන්නාහු ලජ්ජිත වන්නාහු, පිළිකුල් කරන්නාහු තුමූ තමන් ම ජීවිතයෙන් තොරකර ගණිත්. ඔවුනොවුන් ද ජීවිතයෙන් තොරකර ගණිත්. මහණවෙස් ගත් මිගලණ්ඩිකයා වෙත ද එළඹ මෙසේ කියත්: "ඇවත, අප ජීවිතයෙන් තොර කරණු මැනව. මේ පා සිවුරු තට වන්නේය"යි.

5. ඉක්බිති මහණ වෙස් ගත් මිගලණ්ඩික තෙමේ පා සිවුරුවලින් පෝෂිත වූයේ බොහෝ භික්ෂූන් දිවියෙන් තොරකොට ලේ වැකුනු කඩුව ගෙණ වග්ගුමුදු නදිය වෙත පැමිණියේ ය. ඉක්බිති ලේ වැකුණු කඩුව දෝනා මහණවෙස් ගත් මිගලණ්ඩිකයාට කුකුස් වූයේ ම ය. විපිළිසර වූයේ ම ය. "ඒකාන්තයෙන් මට අලාභයක. ඒකාන්තයෙන් මට ලාභයෝ නො වෙති. මා ලත් මිනිසත් බව ද නපුරු ය. මනාසේ ලද්දක් ද නො වෙයි. යම් බඳු වූ මම සිල්වත් වූ කලණදම් ඇති භික්ෂූන් දිවියෙන් තොර කෙලෙම් ද, ඒ මා විසින් ඒකාන්තයෙන් බොහෝ අකුසල් රැස්කරණ ලද්දේය"යි

6. ඉක්බිති එක්තරා මාරපාක්ෂික දෙවියෙක් නොබිඳෙන දියෙහි (සෘද්ධියෙන්) අවුත් මහණවෙස් ගත් මිගලණ්ඩිකයාට මෙය කීය: "සත්පුරුෂය, ඉතා මැනවි. සත්පුරුෂය, තට ලාභයක. සත්පුරුෂය, තා විසින් ලද්දේ මනා මිනිසත් බවෙක. යම් හෙයකින් තෝ සසරින් එතර නුවූවන් එතර කෙලෙහි ද එහෙයින් තා විසින් බොහෝ පින් රැස් කරණ ලද්දේය."යි

7. අථ ඛො මිගලණ්ඩිකො සමණකුත්තකො: "ලාභා කිර මෙ, සුලද්ධං කිර මෙ, බහුං කිර මයා පුඤ්ඤං පසුතං, අතිණ්ණෙ කිරහං තාරෙමී"ති තිණ්හං අසිං ආදාය විහාරෙන විහාරං පරිවෙණෙන පරිවෙණං උපසඞ්කමිත්වා එවං වදෙති: "කො අතිණ්ණො කං තාරෙමී"ති. තත්‍ථ යෙ තෙ භික්ඛූ අවීතරාගා තෙසං තස්මිං සමයෙ හොතියෙව භයං. හොති ඡම්භිතත්තං. හොති ලොමහංසො. යෙ පන තෙ භික්ඛූ වීතරාගා තෙසං තස්මිං සමයෙ න හොති භයං. න හොති ඡම්භිතත්තං. න හොති ලොමහංසො.

8. අථ ඛො මිගලණ්ඩිකො සමණකුත්තකො එකම්පි භික්ඛුං එකාහෙන ජීවිතා වොරොපෙසි, ද්වෙ'පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, තයො'පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, චත්තාරො'පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, පඤ්ච'පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, දස'පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, වීසම්පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, තිංසම්පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, චත්තාරීසම්පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, පඤ්ඤාසම්පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි, සට්ඨිම්පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි.

9. අථ ඛො භගවා තස්ස අද්ධමාසස්ස අච්චයෙන පටිසල්ලානා වුට්ඨිතො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "කිං නු ඛො ආනන්ද තනුභූතො විය භික්ඛුසඞ්ඝො"ති.

10. "තථා හි පන භන්තෙ, භගවා භික්ඛූනං අනෙකපරියායෙන අසුභකථං කථෙති, අසුභාය වණ්ණං භාසති, අසුභභාවනාය වණ්ණං භාසති, ආදිස්ස ආදිස්ස අසුභසමාපත්තියා වණ්ණං භාසති. තෙ ච භන්තෙ භික්ඛූ භගවා ඛො අනෙකපරියායෙන අසුභකථං කථෙති, අසුභාය වණ්ණං භාසති, අසුභභාවනාය වණ්ණං භාසති, ආදිස්ස ආදිස්ස අසුභසමාපත්තියා වණ්ණං භාසතී"ති තෙ අනෙකාකාරවොකාරං අසුභභාවනානුයොගමනුයුත්තා විහරන්ති. තෙ සකෙන කායෙන අට්ටීයන්ති හරායන්ති ජිගුච්ඡන්ති. සෙය්‍යථාපි නාම ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසං නහාතො අහිකුණපෙන වා කුක්කුරකුණපෙන වා මනුස්සකුණපෙන වා කණ්ඨෙ ආසත්තෙන අට්ටීයෙය්‍ය හරායෙය්‍ය ජිගුච්ඡෙය්‍ය, එවමෙව තෙ භික්ඛූ සකෙන කායෙන අට්ටීයන්තා හරායන්තා ජිගුච්ඡන්තා අත්තනාපි අත්තානං ජීවිතා වොරොපෙන්ති, අඤ්ඤමඤ්ඤම්පි ජීවිතා වොරොපෙන්ති. මිගලණ්ඩිකම්පි සමණකුත්තකං උපසඞ්කමිත්වා එවං වදෙන්ති: "සාධු නො ආවුසො ජීවිතා වොරොපෙහි. ඉදං තෙ පත්තචීවරං භවිස්සතී"ති. අථ ඛො භන්තෙ මිගලණ්ඩිකො සමණකුත්තකො පත්තචීවරෙහි භටො එකම්පි භික්ඛුං එකාහෙන ජීවිතා වොරොපෙසි -පෙ- සට්ඨිම්පි භික්ඛූ එකාහෙන ජීවිතා වොරොපෙසි. "සාධු භන්තෙ භගවා අඤ්ඤං පරියායං ආචික්ඛතු, යථායං භික්ඛුසඞ්ඝො අඤ්ඤාය සණ්ඨහෙය්‍යා"ති.

11. "තෙනහානන්ද යාවතිකා භික්ඛූ වෙසාලිං උපනිස්සාය විහරන්ති, තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙහී"ති. "එවං භන්තෙ"ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා යාවතිකා භික්ඛූ වෙසාලිං උපනිස්සාය විහරන්ති තෙ සබ්බෙ උපට්ඨානසාලායං සන්නිපාතෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "සන්නිපතිතො භන්තෙ භික්ඛුසඞ්ඝො, යස්ස'දානි භන්තෙ භගවා කාලං මඤ්ඤතී"ති.

7. ඉක්බිති මහණවෙස් ගත් මිගලණ්ඩිකයා "මට ලාභය. මා විසින් ලද්දේ මනා මිනිසත් බවෙක. මා විසින් බොහෝ පින් රැස් කරණ ලද්දේය. මම වනාහි සසරින් එතර නුවූවන් එතර කෙරෙමි"යි තියුණු අසිපතක් ගෙණ වෙහෙරින් වෙහෙරට ද, පිරිවෙණින් පිරිවෙණට ද එළඹ මෙසේ කියයි: "කවරෙක් සසරින් එතර නුවූයේ ද? කවරකු සසරින් එතර කෙරෙම්දැ"යි. එහි යම් අවීතරාග භික්ෂූහු වෙත් නම් ඔවුන්ට එකල්හි බියෙක් වේ ම ය. තැති ගැණීමෙක් වෙයි. ලොමුදහගැන්මෙක් වෙයි. යම් ඒ වීතරාග භික්ෂූහු වෙද්ද එකල්හි ඔවුන්ට බියෙක් නො වෙයි. තැතිගැන්මෙක් නො වෙයි. ලොමුදහගැන්මෙක් නො වෙයි.

8. ඉක්බිති මහණවෙස් ගත් මිගලණ්ඩික තෙමේ එකදවසකින් එක් මහණකුදු දිවියෙන් තොර කෙළේය. එකදවසකින් භික්ෂූන් දෙනමක් ද දිවියෙන් තොර කෙළේය. එකදවසකින් භික්ෂූන් තෙනමක් ද දිවියෙන් තොර කෙළේ ය. එකදවසකින් භික්ෂූන් සිවුනමක් ද දිවියෙන් තොර කෙළේ ය. එකදවසකින් භික්ෂූන් පස්නමක් ද දිවියෙන් තොර කෙළේ ය. එකදවසකින් භික්ෂූන් දසනමක් ද දිවියෙන් තොර කෙළේය. එකදවසකින් භික්ෂූන් විසිනමක් ද දිවියෙන් තොර කෙළේ ය. එකදවසකින් භික්ෂූන් තිස් නමක් ද දිවියෙන් තොර කෙළේ ය. එකදවසකින් භික්ෂූන් සතළිස් නමක් ද දිවියෙන් තොර කෙළේ ය. එකදවසකින් භික්ෂූන් පණස් නමක් ද දිවියෙන් තොර කෙළේ ය. එකදවසකින් භික්ෂූන් සැට නමක් ද දිවියෙන් තොර කෙළේ ය.

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ අඩමස ඇවෑමෙන් පලසමවතින් නැගී සිටියේක් ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූ සේක: "ආනන්දය, කුමක් හෙයින් භික්ෂු සඞ්ඝයා තුනී වූවාක් මෙන් වී ද?"යි

10. වහන්ස, එසේ ම ය. භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් භික්ෂූන්ට අසුභකථාව වදාරණ සේක. අසුභයෙහි විස්තර කියන සේක. අසුභ භාවනාවෙහි ගුණ කියන සේක, කරුණු දක්ව දක්වා අසුභ සමවතෙහි අනුසස් වදාරණ සේක. වහන්ස, ඒ භික්ෂූහු ද "භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් අසුභකථාව වදාරති. අසුභයෙහි විස්තර කියති. අසුභ භාවනාවෙහි ගුණ කියති. කරුණු දක්ව දක්වා අසුභ සමවතෙහි අනුසස් කියති"යි ඒ භික්ෂූහු නන් අයුරින් මුසු වූ අසුභභාවනාවෙහි යෙදුනාහු වෙසෙත්. ... යම් සේ සැරසීම පියවි කොට ඇති ශීර්ෂස්නාතය කළ තරුණ වූ යොවුනෙහි සිටියා වූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගෙලෙහි ලැගුනු අහිකුණපයකින් හෝ බලුකුණකින් හෝ මිනිස් කුණකින් හෝ පීඩිතවන්නේ ද, ලජ්ජිතවන්නේ ද, ජුගුප්සිත වන්නේ ද, එමෙන් ම ඒ භික්ෂූහු සිය කයින් පීඩිත වෙමින් ලජ්ජිත වෙමින් ජුගුප්සිත වෙමින් තුමූ ම තමන් නසා ගණිත්. ඔවුනොවුන් ද දිවි තොර කර ගණිත්. මහණවෙස් ගත් මිගලණ්ඩිකයා වෙත ද පැමිණ මෙසේ කියත්: "ඇවැත්නි, අප දිවියෙන් තොර කරණු මැනැවි. මේ පාසිවුරු තට වන්නේය"යි. ඉක්බිති ශ්‍රමණවේෂය ගත් මිගලණ්ඩික තෙමේ පාසිවුරු වලින් පෝෂිත වූයේ එක් දවසකින් එක් භික්ෂු නමක් ද, ... එක් දවසකින් භික්ෂූන් සැට නමක් ද දිවියෙන් තොර කෙළේ ය. "වහන්ස, යම් සේ මේ භික්ඛුසඞ්ඝතෙමේ අඟීත්වයෙහි පිහිටන්නේ ද භාග්‍යවතුන් වහන්සේ එබඳු වූ අනික් ක්‍රමයක් දෙසන සේක්වා"යි.

11. 'ආනන්දය, එසේ වී නම් යම් පමණ භික්ෂූහු විසල්පුර ඇසුරු කොට වෙසෙද් ද, ඒ සියල්ලන් උවැටන්හලෙහි රැස් කරවයි "වහන්ස, එසේය"යි ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී යම් පමණ භික්ෂූහු විසල්පුර ඇසුරු කොට වෙසෙද් ද, ඒ සියල්ලන් උවැටන්හලෙහි රැස්කරවා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ මෙය සැළ කළේ ය. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම්කට කල් දන්නා සේක් ද ඒ සඳහා භික්ෂුසඞ්ඝතෙමේ රැස්වීය"යි.

12. අථ ඛො භගවා යෙන උපට්ඨානසාලා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: අයම්පි ඛො භික්ඛවෙ ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති. සෙය්‍යථාපි භික්ඛවෙ ගිම්හානං පච්ඡිමෙ මාසෙ ඌහතං රජොජල්ලං, තමෙනං මහා අකාලමෙඝො ඨානසො අන්තරධාපෙති වූපසමෙති, එවමෙව ඛො භික්ඛවෙ ආනාපානසතිසමාධි භාවිතො බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති.

13. කථං භාවිතො ච භික්ඛවෙ ආනාපානසතිසමාධි කථං බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති?

14. “ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො සතොව අස්සසති, සතො පස්සසති:-

දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති, සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, පීති පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී පස්සසිස්සමීති සික්ඛති, චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති, පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, අභිප්පමොදයං චිත්තං -පෙ- සමාදහං චිත්තං -පෙ- විමොචයං චිත්තං -පෙ-. අනිච්චානුපස්සී -පෙ- විරාගානුපස්සී -පෙ- නිරොධානුපස්සී -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති. එවං භාවිතො ඛො භික්ඛවෙ ආනාපානසතිසමාධි එවං බහුලීකතො සන්තො චෙව පණීතො ච අසෙචනකො ච සුඛො ච විහාරො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙතී”ති.

12. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උවැටන්හල වෙත එළඹ පැණවූ අසුන්හි වැඩහිඳ භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි මේ ආනාපානසති සමාධිය වඩනලද්දේ බහුල කරණ ලද්දේ සාන්ත ද ප්‍රණීත ද පියවින් මිහිරි ද සුව විහරණ ඇත්තේ ද වෙයි. උපනුපන් ලාමක අකුසල් ක්ෂණයකින් අතුරුදන් කෙරෙයි. සන්හිඳුවයි. මහණෙනි යම් සේ ගිම්හානයේ පැසුළු මස අහසට නැගුනු දූවිලි නොකල් මහ වැස්සක් ක්ෂණයකින් ම අතුරුදන් කෙරේ ද, එසේ ම මහණෙනි ආනාපානසතිසමාධිය වඩන ලද්දේ බහුල කරණ ලද්දේ ශාන්ත ද, ප්‍රණීත ද, පියවින් මිහිරි ද, සුව විහරණ ඇත්තේ ද වෙයි. උපනුපන් ලාමක අකුසල් ක්ෂණයකින් අතුරුදන් කෙරෙයි. සන්හිඳුවයි.

13. මහණෙනි, ආනාපානසති සමාධිය කෙසේ වඩන ලද්දේ කෙසේ බහුල කරණ ලද්දේ ශාන්ත වේ ද ප්‍රණීත වේ ද පියවින් මිහිරි වේ ද සැප විහරණ ඇත්තක් වේ ද, උපනුපන් ලාමක අකුසල් ක්ෂණයකින් අතුරුදන් කෙරේ ද සන්හිඳවා ද?

14. "මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ වනසෙනසුනට ගියේ හෝ රුක්මුලකට ගියේ හෝ ශූන්‍යාගාරයකට ගියේ හෝ පලක් බැඳ සිරුර කෙළින් තබා ගෙණ සිහිය කමටහනට යොමු කොට හිඳියි. හෙතෙමේ සිහි ඇත්තේ ආශ්වාස කෙරෙයි. සිහි ඇත්තේ ප්‍රශ්වාස කෙරෙයි:-

ප්‍රවෘත්තිකාල වශයෙන් දීඝ කොට හෝ ආශ්වාස කරන්නේ දීඝ කොට ආශ්වාස කරමියි දනියි. දීඝ කොට හෝ ප්‍රශ්වාස කරන්නේ දීඝ කොට ප්‍රශ්වාස කරමියි දනියි. ලුහුඬු කොට හෝ ආශ්වාස කරන්නේ ලුහුඬු කොට ආශ්වාස කරමියි දනියි. ලුහුඬු කොට හෝ ප්‍රශ්වාස කරන්නේ ලුහුඬු කොට ප්‍රශ්වාස කරමි'යි දනියි. සියලු ආශ්වාසකය මොනොවට දනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සියලු ප්‍රශ්වාසකය මොනොවට දනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖලාරික කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖලාරික කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. — ප්‍රීතිය අරමුණු විසින් මොනොවට දනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය මොනොවට දනිමින් ප්‍රශ්වාස කරන්නෙ-මියි හික්මෙයි. කායික චෛතසික සුවය දනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. කායික චෛතසික සුවය දනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්තසඞ්ඛාරයන් දනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්තසඞ්ඛාරයන් දනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි. හික්මෙයි. ඖලාරික චිත්ත-සඞ්ඛාරයන් සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖලාරික චිත්තඞ්ඛාරයන් සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. — චිත්ත-පටිසංවෙදී වූයේ ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත පටිසංවෙදී වූයේ ප්‍රශ්වවාස කරන්නෙමියි හික්මෙයි. (සමථ විපස්සනා වශයෙන්) සිත පහන් කරමින් ... අරමුණෙහි සිත පිහිටුවමින් ... නීවරණාදී යෙන් සිත මුදමින් ... — අනිස විසින් දක්නා සුළුවූයේ ... (බය-අච්චන්ත විසින්) විරාගානුපස්සී වූයේ ... නිරොධානුපස්සී වූයේ ... (පරිච්චාගපක්ඛන්දන වශයෙන්) කෙලෙස් දුරලීම දන්නා සුළුවූයේ ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. (පරිච්චාග-පක්ඛන්දන වශයෙන්) කෙලෙස් දුරලීම දක්නා සුළුවූයේ ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. — "මහණෙනි, ආනාපානසති සමාධිය මෙසේ වඩනා ලද්දේ, මෙසේ බහුල කරණ ලද්දේ, සාන්තවූයේ ද, පණීතවූයේ ද, ස්වභාව මධුරවූයේ ද, සුව විහරණ ඇත්තේ වූයේ ද, උපනුපන් ලාමක අකුසල් ක්ෂණයකින් අතුරුදන් කෙරෙයි. සන්හිඳුව"යි.

---

මේ ලකුණෙන් මෙහි සතර සතර බැගින් කමටහන් සොළසක් බව ද මුල් සතර සමථය, සෙසු තුන්-සතර විපස්සනා යයි ද දතයුතු.

15. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අත්තනාපි අත්තානං ජීවිතා වොරොපෙන්ති. අඤ්ඤමඤ්ඤම්පි ජීවිතා වොරොපෙන්ති. මිගලණ්ඩිකම්පි සමණකුත්තකං උපසඞ්කමිත්වා එවං වදෙන්ති:[1] සාධු නො ආවුසො ජීවිතා වොරොපෙහි, ඉදං තෙ පත්තචීවරං භවිස්සතී"ති. "සච්චං භගවා." "විගරහි බුද්ධො භගවා, අනනුච්ඡවියං භික්ඛවෙ තෙසං භික්ඛූනං අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තෙ භික්ඛවෙ භික්ඛූ අත්තනාපි අත්තානං ජීවිතා වොරොපෙස්සන්ති, අඤ්ඤමඤ්ඤම්පි ජීවිතා වොරොපෙස්සන්ති, මිගලණ්ඩිකම්පි සමණකුත්තකං උපසඞ්කමිත්වා එවං වක්ඛන්ති: "සාධු නො ආවුසො ජීවිතා වොරොපෙහි, ඉදං තෙ පත්තචීවරං භවිස්සතී"ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:-

**"යො පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය, සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය, අයම්පි පාරාජිකො හොති අසංවාසො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති.]

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො ගිලානො හොති. තස්ස පජාපති අභිරූපා හොති දස්සනීයා පාසාදිකා. ඡබ්බග්ගියා භික්ඛූ තස්සා ඉත්ථියා පටිබද්ධචිත්තා හොන්ති. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි: "සචෙ ඛො සො ආවුසො උපාසකො ජීවිස්සති න මයං තං ඉත්ථිං ලභිස්සාම. හන්ද මයං ආවුසො තස්ස උපාසකස්ස මරණවණ්ණං සංවණ්ණෙමා"ති.

2. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ යෙන සො උපාසකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තං උපාසකං එතදවොචුං: "ත්වං ඛො'සි උපාසක, කතකල්‍යාණො කතකුසලො කතභීරුත්තාණො අකතපාපො අකතලුද්දො අකතකිබ්බිසො. කතං තයා කල්‍යාණං, අකතං තයා පාපං. කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන, මතං තෙ ජීවිතා සෙය්‍යො. ඉතො ත්වං කාලකතො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං[2] උපපජ්ජිස්සසි. තත්ථ දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙස්සසී"ති.

3. අථ ඛො සො උපාසකො "සච්චං ඛො අය්‍යා ආහංසු. අහං හි කතකල්‍යාණො කතකුසලො කතභීරුත්තාණො, අකතපාපො අකතලුද්දො අකතකිබ්බිසො. කතං මයා කල්‍යාණං, අකතං මයා පාපං. කිං මය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන, මතං මෙ ජීවිතා සෙය්‍යො. ඉතො අහං කාලකතො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සාමි. තත්ථ දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙස්සාමී"ති. සො අසප්පායානි චෙව භොජනානි භුඤ්ජි, අසප්පායානි ච ඛාදනීයානි ඛාදි, අසප්පායානි සායනීයානි සායි, අසප්පායානි පානානි පිවි. තස්ස අසප්පායානි චෙව භොජනානි භුඤ්ජතො අසප්පායානි ච ඛාදනීයානි ඛාදතො අසප්පායානි සායනීයානි සායතො අසප්පායානි පානානි පිවතො ඛරො ආබාධො උප්පජ්ජි. සො තෙනෙව ආබාධෙන කාලමකාසි.

---

1. වදන්ති. මජසං. 2. ලොකෙ උප්පජ්ජිස්සති. කාම්බො.

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ නිදානයෙහි ඒ ප්‍රස්තාවයෙහි භික්සඝන රැස් කරවා භික්ෂූන් විචාළසේක. "සැබෑ ද මහණෙනි, භික්ෂූහු තුමූ ද තමන් දිවියෙන් තොර කෙරෙත්, ඔවුනොවුන් ද දිවියෙන් තොර කෙරෙත්. මහණවෙස් ගත් මිගලණ්ඩිකයා වෙත එළඹ 'ඇවැත, අප දිවියෙන් තොර කරණු මැනව, මේ පාසිවුර තට වන්නේය'යි මෙසේ කියද්ද?" "සැබව භාගවතුන් වහන්සැ"යි. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූ සේක: "මහණෙනි, ඒ භික්ෂූන්ගේ ක්‍රියාව නුසුදුස්සෙක. අනුලොම් නුවූවෙක. නොගැළපෙන්නෙක. නොමහණකමෙක. නොකැපයෙක. නොකටයුත්තෙක. "මහණෙනි, ඒ භික්ෂූහු කෙසේ නම් තුමූ තමනු දු දිවියෙන් තොරකර ගන්නාහු ද, ඔවුනොවුනුදු දිවියෙන් තොරකර ගන්නාහු ද, මහණ වෙස්ගත් මිගලණ්ඩිකයා වෙත එළඹ 'ඇවැත්නි, අප දිවියෙන් තොර කරණු මැනව. මේ පාසිවුර තට වන්නේය'යි මෙසේ කියන්නාහු ද? මහණෙනි, මේ කරුණ නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස ද නො වෙයි. ... මහණෙනි, මේ සික පදය මෙසේ උදෙසවු:-

**"යම් මහණෙක් 'මොහු මරමි' දැන දැන මිනිස් සිරුරක් දිවියෙන් තොර කෙරේ ද, දිවි තොර කරණ අවියක් හෝ ඔහුට ගත හැකි සේ එළවා තබා ද, මේ මහණද පැරදුණෙන් සංවාසරහිතයෙක් වේ."**

භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ සිකපදය මෙසේත් පණවන ලද්දේ වෙයි.

## [මුල්පැණවීමයි.]

1. එසමයෙහි එක්තරා උවසුවෙක් ගිලන් වෙයි. ඔහුගේ බිරිඳ මනා රූ ඇත්නී, දැකුම්කලු වූවා, දුටුවන් පහදවන්නී වෙයි. සවග මහණහු ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇත්තාහු වෙත්. එකල්හි සවග භික්ෂූන්ට මෙබදු සිතෙක් විය. "ඇවැත්නි, ඉදින් ඒ උවසු තෙමේ ජීවත්වන්නේ නම් අපි ඒ මාගම නො ලබන්නෙමු. ඇවැත්නි, එබැවින් අපි ඒ උවසුහට මරණයෙහි ගුණ වණමු"යි.

2. ඉක්බිති සවග මහණහු ඒ උවසු වෙත එළඹ මෙය කීහ. "උපාසකය, තෝ කළ කලණදම් ඇත්තෙහි. කළ කුසල් ඇත්තෙහි. කළ බිය රැකුම් ඇත්තෙහි. නොකළපව් ඇත්තෙහි. නොකළ රුදුකම් ඇත්තෙහි. නොකළ සැහැසිකම් ඇත්තෙහි. තා විසින් යහපතක් ම කරණ ලදී. තා විසින් පව් නොකරණ ලදී. තට මේ ලාමක වූ ජීවිතයෙන් කිම්? තාගේ ජිවත් වීමට වඩා මරණය උතුම්. තෝ මෙලොවින් කළුරිය කළේ කාබුත් මරණින් මතු සුගතිය වූ දෙව්ලොවට පැමිණෙන්නෙහි. එහි දී දිව-පස්කම් ගුණයෙන් පිණාගියෙහි, එයින් යුතුවූයේ අභිරමණය කරන්නෙහි ය."

3. ඉක්බිති ඒ උවසු තෙමේ "ආයසීයෝ සැබවක් කීහු. මම වනාහි කළ යහපත ඇත්තෙක් මි. කළ කුසල් ඇත්තෙක් මි. කළ බිය රැකුම් ඇත්තෙක් මි. නොකළ පව් ඇත්තෙක් මි. නොකළ රුදු කම් ඇත්තෙක් මි. නොකළ සැහැසි කම් ඇත්තෙක් මි. මා විසින් යහපත කරණලදී. මා විසින් පව් නොකරණ ලදී. මට මේ ලාමක දුඃඛ ජීවිතයෙන් කිම්? මගේ ජිවත් වීමට වඩා මරණය උතුම්. මම මෙලොවින් කළුරිය කෙළෙම් කාබුත්, මරණින් මතු සුගතිය වූ සවගීලොකයට පැමිණෙන්නෙමි. එහි දී දිව පස් කම් ගුණයෙන් පිණා ගියෙම් එයින් යුතුවූයෙම් අභිරමණය කරන්නෙමි"යි. හෙ තෙමේ නොසැපවූ ම බොජුන් වැළඳී ය. නොසැප වූ කැවිලි කැවේ ය. නො සැප වූ ලේහයන් ලෙවී ය. නොසැප වූ පැන් පානය කෙළේ ය. අහිත බොජුන් ම බුදින, අහිත කැවිලි කන, අහිත ලේහයන් ලොවින, අහිත පැන් බොන, ඔහුට දැඩි ආබාධයෙක් උපන. හෙතෙමේ ඒ ආබාධයෙන් ම කළුරිය කෙළේ ය.

4. තස්ස පජාපති උජ්ඣායති ඛීයති විපාචෙති: "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා මුසාවාදිනො. ඉමෙ හි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං, නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. නට්ඨං ඉමෙසං සාමඤ්ඤං, නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. කුතො ඉමෙසං සාමඤ්ඤං, කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. අපගතා ඉමෙ සාමඤ්ඤා, අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. ඉමෙ මෙ සාමිකස්ස මරණවණ්ණං සංවණ්ණෙසුං. ඉමෙහි මෙ සාමිකො මාරිතො"ති.

5. අඤ්ඤෙපි මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා මුසාවාදිනො. ඉමෙහි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං, නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. නට්ඨං ඉමෙසං සාමඤ්ඤං, නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. කුතො ඉමෙසං සාමඤ්ඤං, කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. අපගතා ඉමෙ සාමඤ්ඤා, අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. ඉමෙ උපාසකස්ස මරණවණ්ණං සංවණ්ණෙසුං. ඉමෙහි උපාසකො මාරිතො"ති.

6. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ උපාසකස්ස මරණවණ්ණං සංවණ්ණිස්සන්තී"ති.

7. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ පටිපුච්ඡි: "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ උපාසකස්ස මරණවණ්ණං සංවණ්ණයිත්ථා"ති. "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා "අනනුච්ඡවියං මොඝපුරිසා, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තුම්හෙ මොඝපුරිසා උපාසකස්ස මරණවණ්ණං සංවණ්ණිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය" -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:-

**"යො පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය, සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය, මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය: "අම්භො පුරිස කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන, මතන්තෙ ජීවිතා සෙය්‍යො"ති ඉති චිත්තමනො චිත්තසඞ්කප්පො අනෙකපරියායෙන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය, අයම්පි පාරාජිකො හොති අසංවාසො"ති.**

[ දුතියපඤ්ඤත්ති. ]

8. **යො පනාති** - යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සඤ්චිච්චාති** - ජානන්තො සඤ්ජානන්තො චෙච්ච අභිවිතරිත්වා වීතික්කමො.

---

1. සූලං වා ලගුළං වා සයා.

4. ඔහුගේ බිරිඳ අවමන් කෙරෙයි, අයුණු කියයි, නුගුණ පතුරුවයි: "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ අලජ්ජීහු ය, දුශ්ශීලයෝ ය, මුසාවාදීහු ය. මොහු තම් 'ධර්මචාරීහු ය, සමචාරීහු ය, බ්‍රහ්මචාරීහු ය, සච්චවාදීහු ය, සිල්වත්හු ය කලණ දහම් ඇත්තාහුය'යි පිළිත කෙරෙත්. මොවුන්ට මහණකමෙක් නැත. මොවුන්ට බමුණු කමෙක් නැත. මොවුන්ගේ මහණකම නටුයේ ය. මොවුන්ගේ බමුණුකම නටුයේ ය. මොවුන්ට මහණකමෙක් කොයින් ද, මොවුන්ට බමුණු කමෙක් කොයින් ද, මොහු මහණකමින් පහවූවෝ ය. මොහු බමුණු කමෙන් පහවූවෝ ය. මොහු මාගේ සැමියාට මරණයෙහි ගුණ වැණූහ. මොවුන් විසින් මාගේ සැමියා මරණ ලද්දේය"යි.

5. අන් මිනිස්සු ද අවමන් කෙරෙත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්. "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ අලජ්ජීහු ය, දුශ්ශීලයෝ ය, මුසාවාදීහු ය. මොහු වූ කලී 'ධම්මචාරීහු ය, සමචාරීහු ය, බ්‍රහ්මචාරීහු ය, සච්චවාදීහු ය, සීලවන්තයෝ ය, කළ කලණ දහම් ඇත්තෝය'යි පිළිත කෙරෙති. මොවුන්ට මහණකමෙක් නැත. මොවුන්ට බමුණුකමෙක් නැත. මොවුන්ගේ මහණකම නටුයේ ය. මොවුන්ගේ බමුණුකම නටුයේ ය. මොවුන්ට මහණකමෙක් කොයින් ද, මොවුන්ට බමුණු කමෙක් කොයින් ද, මොහු මහණ කමින් පහ වූවෝ ය. මොහු බමුණුකමින් පහවූවෝ ය. මොහු උවසුහට මරණයෙහි ගුණ වැණූහ. මොවුන් විසින් උවසු තෙමේ මරණ ලද්දේ"යි.

6. භික්ෂූහු අවමන් කරණ, අයුණු කියන, නුගුණ පතුරුවන, ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් ඒ අපිස් මහණහු වෙද් ද, ඔහු අවමන් කරති, අයුණු කියති, නුගුණ පතුරුවත්: කෙසේ නම් සවග මහණහු උවසුහට මරණයෙහි ගුණ වැණූහු ද? යි.

7. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැළ කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ නිදානයෙහි ඒ කරුණෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා සවග මහණුන් පිළිවිසි සේක. "සැබෑ ද, මහණෙනි තෙපි උවසුහට මරණයෙහි ගුණ වැණූහුද"යි. 'සැබව භාග්‍යවතුන් වහන්ස'. භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ ගැරහූ සේක: "හිස් පුරුෂයෙනි, නුසුදුස්-සෙක. අනුලොම් නුවූවෙක. නොගැළපෙන්නෙක. නොමහණකමෙක. නො කැපයෙක, නොකටයුත්තෙක. "හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් උවසු-හට මරණයෙහි ගුණ වැණූහු ද, "හිස් පුරුෂයෙනි, තෙල කරුණ නො-පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ." ... මහණෙනි, මෙසේ මේ සික පදය උදෙසවු:

**"යම් මහණෙක් දැන දැන මිනිස්සිරුර දිවියෙන් තොර කෙරේද, දිවි හරණ අවියක් උහු වෙත එළවා තබන්නේ ද, මරණයෙහි ගුණ හෝ කියන්නේ ද, මරණය පිණිස උපාය උගන්වන්නේ ද, 'එම්බා පුරුෂය, තාගේ ලාමක වූ මේ දුඃඛජීවිතයෙන් කිම? තාගේ ජීවත්වීමට වඩා මරණය උතුම්'යි මෙබඳු මරණ සිත් ඇත්තේ මෙබඳු මරණ සංකල්පනා ඇත්තේ නොයෙක් අයුරින් මරණයෙහි ගුණ හෝ වණා ද, මරණය පිණිස උපාය උගන්වා ද, මේ මහණ තෙමේ ද පැරදුනේ වෙයි, සංවාසයට නුසුදුසු වෙයි."**

**[දෙවනපැණවීමයි.]**

8. **යො පන යි යම්බඳු වූ යමෙක්** ...

**භික්ඛු** යි ... (ඥප්තිචතුර්ථකර්මයෙන් උපසපන් වූයේ ද,) **මේ තෙමේ මේ** කරුණෙහි භික්ඛු යයි අදහස් කරණ ලදි.

**සඤ්චිච්ච** යි ප්‍රාණියෙකැ යි දන්නේ, දිවියෙන් **තොර කරමි යි දන්නේ,** වධයට සිතා, නිසැකසිත **මෙහෙයවා,** ව්‍යතික්‍රම (ක්‍රියාවෙහි යෙදීම) කරන්නේ ය.

**මනුස්සවිග්ගහො** නාම: යං මාතුකුච්ඡිස්මිං පඨමං චිත්තං උප්පන්නං පඨමං විඤ්ඤාණං පාතුභූතං යාව මරණකාලා එත්ථන්තරෙ එසො මනුස්සවිග්ගහො නාම.

**ජීවිතා වොරොපෙය්‍යාති**-- ජීවිතින්ද්‍රියං උපච්ඡින්දති උපරොධෙති සන්තතිං විකොපෙති.

**සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍යාති**-- අසිං වා සත්තිං වා භෙණ්ඩිං වා ලගුළං[1] වා පාසාණං වා සත්ථං වා විසං වා රජ්ජුං වා.

**මරණවණ්ණං වා සංවණ්ණෙය්‍යාති**-- ජීවිතෙ ආදීනවං දස්සෙති, මරණෙ වණ්ණං භණති.

**මරණාය වා සමාදපෙය්‍යාති**-- සත්ථං වා ආහර, විසං වා ඛාද, රජ්ජුයා වා උබ්බන්ධිත්වා කාලං කරොහීති.

**අම්භො පුරිසාති**-- ආලපනාධිවචනමෙතං අම්භො පුරිසාති.

**කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙනාති**-- පාපකං නාම ජීවිතං: අඩ්ඪානං ජීවිතං උපාදාය දලිද්දානං ජීවිතං පාපකං, සධනානං ජීවිතං උපාදාය අධනානං ජීවිතං පාපකං, දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං ජීවිතං පාපකං. දුජ්ජීවිතං නාම: හත්ථච්ඡින්නස්ස පාදච්ඡින්නස්ස හත්ථපාදච්ඡින්නස්ස කණ්ණච්ඡින්නස්ස නාසච්ඡින්නස්ස කණ්ණනාසච්ඡින්නස්ස. ඉමිනා ච පාපකෙන ඉමිනා ච දුජ්ජීවිතෙන මතන්තෙ ජීවිතා සෙය්‍යොති.

**ඉති චිත්තමනොති**-- යං චිත්තං තං මනො, යං මනො තං චිත්තං.

**චිත්තසඞ්කප්පොති**-- මරණසඤ්ඤී මරණචෙතනො මරණාධිප්පායො.

**අනෙකපරියායෙනාති**-- උච්චාවචෙහි ආකාරෙහි.

**මරණවණ්ණං වා සංවණ්ණෙය්‍යාති**-- ජීවිතෙ ආදීනවං දස්සෙති, මරණෙ වණ්ණං භණති: 'ඉතො ත්වං කාලකතො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිස්සසි. තත්ථ දිබ්බෙහි පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙස්සසී'ති.[2]

**මරණාය වා සමාදපෙය්‍යාති**-- සත්ථං වා ආහර, විසං වා ඛාද, රජ්ජුයා වා උබ්බන්ධිත්වා කාලං කරොහි, සොබ්භෙ වා නරකෙ වා පපාතෙ වා පපතා'ති.

**අයම්පීති**-- පුරිමෙ උපාදාය වුච්චති.

**පාරාජිකො හොතීති**-- සෙය්‍යථාපි නාම පුථුසිලා ද්වෙධා භින්නා අප්පටිසන්ධිකා හොති, එවමෙව භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො. තෙන වුච්චති පාරාජිකො හොතීති.

---

1. ලගුළං, සීමු. 2. පරිචාරෙස්සතීති. සීමු.

**මනුස්සවිග්ගහ** නම්: මව්කුසෙහි දී පළමු යම් සිතක් උපන්නේ ද, ප්‍රථම විඥානය පහළවී ද, මරණය දක්වා මේ අතරෙහි පැවැති මේ තෙමේ මනුස්සවිග්ගහ නම්.

**ජීවිතා වොරොපෙය්‍ය** යි රූපාරූප ජීවිතෙන්ද්‍රිය සිඳියි. වළක්වයි. සන්තතිය වෙන් කරයි.

**සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය** යි කඩුවක් හෝ අඩයටියක් හෝ හෙල්ලක් හෝ මුගුරක් හෝ පහණක් හෝ සැතක් හෝ විස හෝ රැහැනක් හෝ ඔහු ලඟ තබන්නේ ය.

**මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය** යි දිවියෙහි දෙස් දක්වයි. මරණයෙහි ගුණ කියයි.

**මරණාය වා සමාදපෙය්‍ය** යි ශස්ත්‍රයක් හෝ ගණුව, විස හෝ අනුභව කරව, වැලකින් හෝ එල්ලී කලුරිය කරව යි උපාය ගන්වන්නේ ය.

**අම්භො පුරිස** යි මෙය ආමන්ත්‍රණ පදයකි.

**කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන** යි ලාමකජීවිතය නම් ආඪ්‍යයන්ගේ ජීවිතය නිසා දිළිඳුන්ගේ ජීවිතය ලාමක ය. ධනවතුන්ගේ ජීවිතය නිසා ධන හීනයන්ගේ ජීවිතය ලාමක ය. දෙවියන්ගේ ජීවිතය නිසා මිනිසුන්ගේ ජීවිතය ලාමක ය. අත් සිඳුනහුගේ, පා සිඳුනහුගේ, අත් පා සිඳුනහුගේ, කන් සිඳුනහුගේ, නැහැය සිඳුනහුගේ, කන්නාසා සිඳුනහුගේ (දිවිය) දුජ්ජීවිත නම්. මේ ලාමක ජීවිතයෙන්, මේ දුක්ඛජීවිතයෙන් ජීවත්වීමට වඩා තාගේ මරණය උතුම්.

**ඉතිචිත්තමනො** යි යමක් සිත ද, ඒ මන නම්. යමක් මන ද, එය සිත නම්.

**චිත්තසඞ්කප්පො** යි මරණසංඥා ඇත්තේ, මරණචේතනා ඇත්තේ, මරණ අදහස් ඇත්තේ ය.

**අනෙකපරියායෙන** යි නොයෙක් අයුරෙන්ය.

**මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය** යි දිවියෙහි දෙස් දක්වයි. මරණයෙහි ගුණ කියයි: මෙයින් තෝ කලුරිය කෙළෙහි කාබුත් මරණින් මතු සුගති නම්වූ දෙව්ලොවට පැමිණෙන්නෙහි ය. එහිදී දිව්‍යපස්කම් ගුණයන් ගෙන් සමෘද්ධ වූයේ, යුක්ත වූයේ අභිරමනය කරන්නෙහි ය.

**මරණාය වා සමාදපෙය්‍ය** යි සැතක් හෝ ගණුව, විසක් හෝ කව, රැහැනකින් හෝ එල්බී කලුරිය කරව, හෙබක හෝ තරාවළෙක හෝ ප්‍රපාතයක හෝ වැටෙව.

**අයම්පි** යි පළමු මෙවුන්දම් සෙවීමෙන් පරිජි අවන් පුහුලා සලකාගෙණ කියනු ලැබේ.

**පාරාජිකො හොති** යි දෙබෑවූ මහගලක් යම්සේ සන්ධි කට නො හැකිවේ ද, එපරිද්දෙන් ම මහණ තෙමේ දූත දූත මිනිස්සිරුර දිවියෙන් තොර කොට නොමහණෙක් වෙයි. අශාක්‍යපුත්‍රීයයෙක් වෙයි. එහෙයින් පරිජි අවන්නේ වේ යයි කියනු ලැබේ.

**අසංවාසොති**-- සංවාසො නාම: එකකම්මං එකුද්දෙසො සමසික්ඛතා, එසො සංවාසො නාම. සො තෙන සද්ධිං නත්ථි තෙන වුච්චති අසංවාසො'ති.

---

[නයමාතිකා]

1. සාමං අධිට්ඨාය, දූතෙන, දූතපරම්පරාය, විසක්කියෙන දූතෙන, ගතපච්චාගතෙන දූතෙන, අරහො රහොසඤ්ඤී, රහො අරහොසඤ්ඤී, අරහො අරහොසඤ්ඤී, රහො රහොසඤ්ඤී, කායෙන සංවණ්ණෙති, වාචාය සංවණ්ණෙති, කායෙන වාචාය සංවණ්ණෙති, දූතෙන සංවණ්ණෙති, ලෙඛාය සංවණ්ණෙති, ඔපාතං, අපස්සෙනං, උපනික්ඛිපනං, භෙසජ්ජං, රූපූපහාරො, සද්දූපහාරො, ගන්ධූපහාරො, රසූපහාරො, ඵොට්ඨබ්බූපහාරො, ධම්මූපහාරො, ආචික්ඛනා, අනුසාසනී, සංකෙතකම්මං, නිමිත්තකම්මන්ති.

2. **සාමන්ති**-- සයං හනති කායෙන වා කායපටිබද්ධෙන වා නිස්සග්ගියෙන වා.

3. **අධිට්ඨායාති**-- අධිට්ඨහිත්වා ආණාපෙති: "එවං විජ්ඣ, එවං පහර, එවං ඝාතෙහී"ති.

4. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො තං මඤ්ඤමානො තං ජීවිතා වොරොපෙති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

5. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො තං මඤ්ඤමානො අඤ්ඤං ජීවිතා වොරොපෙති, මූලට්ඨස්ස අනාපත්ති, වධකස්ස ආපත්ති පාරාජිකස්ස.

6. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො අඤ්ඤං මඤ්ඤමානො තං ජීවිතා වොරොපෙති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

7. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො අඤ්ඤං මඤ්ඤමානො අඤ්ඤං ජීවිතා වොරොපෙති, මූලට්ඨස්ස අනාපත්ති; වධකස්ස ආපත්ති පාරාජිකස්ස.

8. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමස්ස පාවද: ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස පාවදතු: ඉත්ථන්නාමො ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙතූ"ති, ආපත්ති දුක්කටස්ස. සො ඉතරස්ස ආරොචෙති, ආපත්ති දුක්කටස්ස. වධකො පටිග්ගණ්හාති, මූලට්ඨස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. සො තං ජීවිතා වොරොපෙති, ආපත්ති සබ්බෙසං පාරාජිකස්ස.

**අසංවාසො** යි එකට කම් කිරීමය, එකට උදෙසීමය, සම වූ ශික්‍ෂා ඇති බවය යන මෙය සංවාස නම්. ඔහු හා ඒ සංවාසය නැත. එහෙයින් අසංවාස යයි කියනු ලැබේ.

---

## [නයමාතෘකා]

1. තෙමේ ම ඉටා දූතයකු ලවා හෝ, දූතපරපුරෙන් හෝ, වරදවා කියන දූතයෙකු ලවා හෝ, ගොස් පෙරළා පැමිණි දූතයෙකු ලවා හෝ, නොරහස රහස් යයි හැඟීම් ඇත්තේ හෝ, රහස නො රහස් යයි හැඟීම් ඇත්තේ හෝ, නොරහස් නොරහස් යයි හැඟීම් ඇත්තේ හෝ, රහස රහස යයි හැඟීම් ඇත්තේ හෝ, කයින් අඟවයි. වදනින් කියයි. කයින් හා වදනින් අඟවයි. දූතයෙකු ලවා අරොජයි. ලිපියකින් අඟවයි. මරුවළ, වැතිර ගන්නා පුවරුව, ලඟ තබන අවිය, විස බෙහෙත, බිහිසුණු රුව එළවීම, බිහිසුහුණු හඬ එළවීම, දරුණු දුගඳ එළවීම, පිළිකුල් රස එළවීම, කැකුළු පහස එළවීම, බියකරු බණ එළවීම, ඔත්තු කීම, අනුසස් කීම, සලකුණු කිරීම, නිමිති කම් ය.

2. **සාමං** යි කයින් හෝ කා පිළිබඳ දෙයකින් හෝ දමා ලූ දෙයකින් හෝ තෙමේ මරයි.

3. **අධිට්ඨාය** යි සමීපයෙහි සිට "මෙසේ විදුව, මෙසේ පහර දෙව, මෙසේ නසව"යි අණ කෙරෙයි.

4. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව" යි අණවා නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ ඔහුයයි හගිමින් උහු දිවියෙන් තොර කෙරේ නම් දෙදෙනාටම පරිජිඇවැත් වේ.

5. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ ඔහු යයි හගිමින් අනෙකකු දිවියෙන් තොර කෙරේ නම් මූලිකයාට ඇවැත් නො වේ. වධක මහණහට පරිජිඇවැත් වේ.

6. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ අනෙකෙකැයි හගිමින් උහු දිවියෙන් තොර කෙරේ නම් දෙදෙනාට ම පරිජිඇවැත් වේ.

7. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ අනෙකෙකැයි හගිමින් අනෙකකු දිවියෙන් තොර කෙරේ නම් මූලිකයාට ඇවැත් නො වේ. වධකමහණහට පරිජිඇවැත් වේ.

8. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහුට කියව: මෙනම් ඇත්තේ මෙනම් ඇත්තහුට කියවා: මෙනම් ඇත්තේ මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ අනෙකාහට කියා නම් දුකුළාඇවැත් වේ. වධක තෙමේ එය පිළිගණී නම් මූලික මහණහට ථුල්ලසිඇවැත් වේ. ඒ මහණ තෙමේ උහු දිවියෙන් තොර කෙරේ නම් හැමට ම පරිජිඇවැත් වේ.

9. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමස්ස පාවද: ඉත්ථන්නාමො ඉත්ථන්නාමස්ස පාවදතු: ඉත්ථන්නාමො ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙතූ"ති, ආපත්ති දුක්කටස්ස. සො අඤ්ඤං ආණාපෙති, ආපත්ති දුක්කටස්ස. වධකො පටිග්ගණ්හාති, ආපත්ති දුක්කටස්ස. සො තං ජීවිතා වොරොපෙති, මූලට්ඨස්ස අනාපත්ති. ආණාපකස්ස ච වධකස්ස ච ආපත්ති පාරාජිකස්ස.

10. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො ගන්ත්වා පුන පච්චාගච්ඡති 'නාහං සක්කොමි තං ජීවිතා වොරොපෙතු'න්ති. සො පුන ආණාපෙති: "යදා සක්කොසි තදා තං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො තං ජීවිතා වොරොපෙති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

11. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො ආණාපෙත්වා විප්පටිසාරී න සාවෙති 'මා ඝාතෙහී'ති. සො තං ජීවිතා වොරොපෙති, ආපත්ති උභින්නං පාරාජිකස්ස.

12. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස; සො 'ආණාපෙත්වා විප්පටිසාරී සාවෙති 'මා ඝාතෙහී'ති, සො 'ආණත්තො අහං තයා'ති තං ජීවිතා වොරොපෙති, මූලට්ඨස්ස අනාපත්ති, වධකස්ස ආපත්ති පාරාජිකස්ස.

13. භික්ඛු භික්ඛුං ආණාපෙති: "ඉත්ථන්නාමං ජීවිතා වොරොපෙහී"ති, ආපත්ති දුක්කටස්ස. සො ආණාපෙත්වා විප්පටිසාරී සාවෙති: 'මා ඝාතෙහී'ති, සො 'සුට්ඨූ'ති ඔරමති, උභින්නං අනාපත්ති.

14. **අරහො රහොසඤ්ඤී උල්ලපති**: "අහො ඉත්ථන්නාමො හතො අස්සා"ති, ආපත්ති දුක්කටස්ස. රහො අරහොසඤ්ඤී උල්ලපති: "අහො ඉත්ථන්නාමො හතො අස්සා"ති, ආපත්ති දුක්කටස්ස. අරහො අරහොසඤ්ඤී උල්ලපති: "අහො ඉත්ථන්නාමො හතො අස්සා"ති, ආපත්ති දුක්කටස්ස. රහො රහොසඤ්ඤී උල්ලපති: "අහො ඉත්ථන්නාමො හතො අස්සා"ති, ආපත්ති දුක්කටස්ස.

15. **කායෙන සංවණ්ණෙති** නාම: කායෙන විකාරං කරොති: "යො එවං මරති සො ධනං වා ලභති යසං වා ලභති සග්ගං වා ගච්ඡතී"ති, ආපත්ති දුක්කටස්ස; තාය සංවණ්ණනාය මරිස්සාමීති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

16. **වාචාය සංවණ්ණෙති** නාම: වාචාය භණති: "යො එවං මරති සො ධනං වා ලභති යසං වා ලභති සග්ගං වා ගච්ඡතී"ති, ආපත්ති දුක්කටස්ස; තාය සංවණ්ණනාය, මරිස්සාමී'ති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

9. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහුට කියව: මෙනම් ඇත්තේ මෙනම් ඇත්තහුට කියවා: මෙනම් ඇත්තේ මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ අනෙකකුට අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. වධක මහණ තෙමේ පිළිගණී නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ උහු දිවියෙන් තොර කෙරේ නම් මූලිකයාහට ඇවැත් නො වේ. අණවත්තහුට ද, වධක මහණහට ද පරිජිඇවැත් වේ.

10. මහණෙක්, මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ ගොස් "උහු දිවියෙන් තොර කරන්ට මම නො සමත්මි"යි පෙරළා ඒ ද, හෙතෙමේ "යම් කලක හැකි වේ නම් එකල ඔහු දිවියෙන් තොර කරව"යි නැවත අණවා නම් දුකුළාඇවැත් වේ. ඒ මහණ තෙමේ උහු දිවියෙන් තොර කෙරේ නම් දෙදෙනාහට ම පරිජිඇවැත් වේ.

11. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණ කෙරේ නම් දුකුළාඇවැත් වේ. හෙතෙමේ අණවා විපිළිසරවූයේ "නො නසව"යි නො අස්වයි ද, හෙ තෙමේ උහු දිවියෙන් තොර කෙරේ නම් දෙදෙනාට ම පරිජිඇවැත් වේ.

12. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණවා නම් දුකුළාඇවැත් වේ. හෙ තෙමේ අණවා විපිළිසරවූයේ "නො නසව"යි අස්වා ද තෙල මහණ තෙමේ "තා විසින් මම අණ කරණු ලැබුවෙමි"යි උහු දිවියෙන් තොර කෙරේ නම් මූලික මහණහට ඇවැත් නො වේ. වධක මහණහට පරිජිඇවැත් වේ.

13. මහණෙක් මහණකුට "මෙනම් ඇත්තහු දිවියෙන් තොර කරව"යි අණවා නම් දුකුළාඇවැත් වේ. හෙ තෙමේ අණවා විපිළිසරවූයේ "නො නසව"යි අස්වයි. හෙ තෙමේ මැනවයි එයින් වළකියි, දෙදෙනාට ම ඇවැත් නො වේ.

14. සම්මුඛයෙහි සිටියේ 'අසම්මුඛයෙහි ය' යන හැඟීම් ඇත්තේ "මෙනම් තැනැත්තේ නසන ලද්දේ නම් යෙහෙකැ'යි කථා කෙරේ නම් දුකුළාඇවැත් වේ. අසම්මුඛයෙහි සිටියේ 'සම්මුඛයෙහි ය' යන හැඟීම් ඇත්තේ "මෙනම් තැනැත්තේ නසන ලද්දේ නම් යෙහෙකැ"යි කියා නම් දුකුළාඇවැත් වේ. සම්මුඛයෙහි වූයේ 'සම්මුඛයෙහි ය' යන හැඟීම් ඇත්තේ "මෙනම් තැනැත්තේ නසන ලද්දේ යෙහෙකැ"යි කියා නම් දුකුළාඇවැත් වේ. අසම්මුඛයෙහි වූයේ 'අසම්මුඛයෙහි ය' යන හැඟීම් ඇත්තේ "මෙනම් තැනැත්තේ නසන ලද්දේ යෙහෙකැ"යි කියා නම් දුකුළාඇවැත් වේ.

15. **කායෙන සංවණ්ණෙති** නම් යමෙක් මෙසේ මැරේ ද, හෙ තෙමේ ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. සවර්ගයට හෝ යේ යයි කයින් සංඥ කෙරේ නම් දුකුළාඇවැත් වේ. ඒ කායසංවණ්ණනාව හේතු කොට ගෙණ 'මැරෙන්නෙමි'යි දුක් වේදනා උපදවා නම් ථුල්ලැසිඇවැත් වේ. මැරේ නම් පරිජිඇවැත් වේ.

16. **වාචාය සංවණ්ණෙති** නම් යමෙක් මෙසේ මැරේද, හේ ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. සවර්ගයට හෝ යේයයි වචනයෙන් කියා නම් දුකුළාඇවැත් වේ. ඒ වැණීමෙන් මැරෙන්නෙමියි දුක් වේදනා උපදවා ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

17. **කායෙන වාචාය සංවණ්ණනා** නාම: කායෙන ච විකාරං කරොති, වාචාය ච භණති, "යො එවං මරති. සො ධනං වා ලභති යසං වා ලභති සග්ගං වා ගච්ඡතී"ති, ආපත්ති දුක්කටස්ස; තාය සංවණ්ණනාය "මරිස්සාමී"ති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

18. **දූතෙන සංවණ්ණනා** නාම: දූතස්ස සාසනං ආරොචෙති: "යො එවං මරති සො ධනං වා ලභති යසං වා ලභති සග්ගං වා ගච්ඡතී"ති, ආපත්ති දුක්කටස්ස. දූතස්ස සාසනං සුත්වා 'මරිස්සාමී'ති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

19. **ලෙඛාය සංවණ්ණනා නාම**: ලෙඛං ඡින්දති "යො එවං මරති සො ධනං වා ලභති යසං වා ලභති සග්ගං වා ගච්ඡතී"ති; අක්ඛරක්ඛරාය ආපත්ති දුක්කටස්ස; ලෙඛං පස්සිත්වා 'මරිස්සාමී'ති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

20. **ඔපාතං** නාම: මනුස්සං උද්දිස්ස ඔපාතං ඛණති 'පපතිත්වා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; පපතිතෙ දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස. අනොදිස්ස ඔපාතං ඛණති 'යො කොචි පපතිත්වා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස. මනුස්සො තස්මිං පපතති, ආපත්ති දුක්කටස්ස; පපතිතෙ දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස. යක්ඛො වා පෙතො වා තිරච්ඡානගතමනුස්සවිග්ගහො වා තස්මිං පපතති, ආපත්ති දුක්කටස්ස; පපතිතෙ දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති දුක්කටස්ස; මරති, ආපත්ති ථුල්ලච්චයස්ස. තිරච්ඡානගතො තස්මිං පපත'ති, ආපත්ති දුක්කටස්ස; පපතිතෙ දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති දුක්කටස්ස; මරති, ආපත්ති පාචිත්තියස්ස.

21. **අපස්සෙනං** නාම: අපස්සෙනෙ සත්ථං වා ඨපෙති, විසෙන වා මක්ඛෙති, දුබ්බලං වා කරොති, සොබ්භෙ වා නරකෙ වා පපාතෙ වා ඨපෙති 'පපතිත්වා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; සත්ථෙන වා විසෙන වා පපතිතෙන වා දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

22. **උපනික්ඛිපනං** නාම: අසිං වා සත්තිං වා භෙණ්ඩිං වා ලගුළං වා පාසාණං වා සත්ථං වා විසං වා රජ්ජුං වා උපනික්ඛිපති 'ඉමිනා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; තෙන මරිස්සාමීති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

23. **භෙසජ්ජං** නාම: සප්පිං වා නවනීතං වා තෙලං වා මධුං වා ඵාණිතං වා දෙති 'ඉමං සායිත්වා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; තං සායිතෙ දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

24. **රූපූපහාරො** නාම: අමනාපිකං රූපං උපසංහරති භයානකං භෙරවං "ඉමං පස්සිත්වා උත්තසිත්වා මරිස්සතී"ති, ආපත්ති දුක්කටස්ස; තං පස්සිත්වා උත්තසති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස. මනාපිකං රූපං උපසංහරති[1] 'ඉමං පස්සිත්වා අලාභකෙන සුස්සිත්වා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; තං පස්සිත්වා අලාභකෙන සුස්සති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

1. පෙමනීයං හදයඞ්ගමං. සං.

17. **කායෙන වාචාය සංවණ්ණනාති** නම් "යමෙක් මෙසේ මැරේද, හේ ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. ස්වර්ගයට හෝ යේ ය"යි කයින් ද හඟවයි. වචනයෙන් ද කියයි. දුකුලාඇවැත් වේ. ඒ වැණීමෙන් මැරෙන්නෙමි'යි දුක් වේදනා උපදවාද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජි ඇවැත් වේ.

18. **දූතෙන සංවණ්ණනාති** නම් "යමෙක් මෙසේ මැරේ ද හේ ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. ස්වර්ගයට හෝ යේය"යි දූතයකුට අස්නක් බෙණේ ද, දුකුලාඇවැත් වේ. දූතයාගේ අස්න අසා 'මැරෙන්නෙමි'යි දුක් වේදනා උපදවා ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

19. **ලේඛාය සංවණ්ණනාති** නම් "යමෙක් මෙසේ මැරේ ද හේ ධනය හෝ ලබයි. කීර්තිය හෝ ලබයි. ස්වර්ගයට හෝ යේය"යි (පොත පතක අකුරු ලියා ද, අකුරක් පාසා දුකුලාඇවැත් වේ. ලිපිය දැක මැරෙන්නෙමි යි දුක් වේදනා උපදවා ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

20. **ඕපාත** නම් "වැටී මැරෙන්නේය"යි මිනිසකු උදෙසා වළක් කනී නම් දුකුලාඇවැත් වේ. වැටුනු කල්හි දුක් වේදනා උපදී ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ. "යම් කිසිවෙක් වැටී මැරෙන්නේය"යි (කෙනකුත්) නො උදෙසා වළක් කනී ද දුකුලාඇවැත් වේ. මිනිසෙක් එහි වැටේ ද දුකුලාඇවැත් වේ. වැටුනු කල්හි දුක් වේදනා උපදී ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ. යකෙක් හෝ ප්‍රේතයෙක් හෝ තිරිසන්වෙස් හෝ මිනිස් වෙස් ගත්තෙක් (යකෙක් හෝ ප්‍රේතයෙක්) හෝ එහි වැටේ ද, දුකුලාඇවැත් වේ. වැටුනු කල්හි දුක් වේදනා උපදී ද දුකුලාඇවැත් වේ. මැරේ ද ථුල්ලැසිඇවැත් වේ. තිරිසනෙක් එහි වැටේ ද දුකුලාඇවැත් වේ. වැටුනු කල්හි දුක් වේදනා උපදී ද දුකුලාඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

21. **අපස්සෙන** නම් ආලම්බන පුවරුවෙහි සැතක් හෝ තබා ද, විෂ හෝ ගල්වා ද දුර්වල හෝ කෙරේ ද, හෙබක හෝ නරාවළක හෝ ප්‍රපාතයක 'හෝ වැටී මැරෙන්නේය'යි (ආලම්බනඵලකය) තබා ද, දුකුලාඇවැත් වේ. සැත කරණකොටගෙණ හෝ විෂ කරණකොටගෙණ හෝ වැටීමෙන් හෝ දුක් වේදනා උපදී ද, ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

22. **උපනික්ඛිපන** නම් "මෙයින් මැරෙන්නේ ය"යි කඩුවක් හෝ අඩයටියක් හෝ හෙල්ලක් හෝ මුගුරක් හෝ ගලක් හෝ සැතක් හෝ විෂක් හෝ රැහැනක් හෝ ලඟ තබා ද දුකුලාඇවැත්වේ. එයින්, මැරෙන්නෙමි'යි දුක් වේදනා උපදවා ද ථුල්ලැසිඇවැත්වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

23. **භෙසජ්ජ** නම් "මෙය ලෙව මැරෙන්නේය"යි ගිතෙල් හෝ වෙඬරු හෝ තලතෙල් හෝ මී හෝ පැණි හෝ දේ ද, දුකුලාඇවැත් වේ. එය ලෙව් කල්හි ඔහුට දුක් වේදනා උපදී ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

24. **රූපූපහාර** නම් "මෙය දැක තැති ගෙණ මැරෙන්නේය"යි භයජනක බියපත් කරවන, නො මනා රූවක් ලඟ තබා ද, දුකුලාඇවැත් වේ. එය දැක තැති ගණී ද, ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ. 'මෙය දැක නො ලැබීමෙන් වියලී මැරෙන්නේය'යි මනා රූවක් ලඟ තබා ද දුකුලාඇවැත් වේ. එය දැක නො ලැබීමෙන් වියලේ ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

25. **සද්දූපහාරො** නාම: අමනාපිකං සද්දං උපසංහරති භයානකං භෙරවං 'ඉමං සුත්වා උත්තසිත්වා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; තං සුත්වා උත්තසති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස. මනාපිකං සද්දං උපසංහරති පෙමනීයං හදයඞ්ගමං 'ඉමං සුත්වා අලාභකෙන සුස්සිත්වා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; තං සුත්වා අලාභකෙන සුස්සති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

26. **ගන්ධූපහාරො** නාම: අමනාපිකං ගන්ධං උපසංහරති ජෙගුච්ඡං පාටිකුල්‍යං 'ඉමං ඝායිත්වා ජෙගුච්ඡතා පාටිකුල්‍යතා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; තං ඝායිතෙ ජෙගුච්ඡතා පාටිකුල්‍යතා දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස. මනාපිකං ගන්ධං උපසංහරති 'ඉමං ඝායිත්වා අලාභකෙන සුස්සිත්වා මරිස්සතී'ති. ආපත්ති දුක්කටස්ස; තං ඝායිත්වා අලාභකෙන සුස්සති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

27. **රසූපහාරො** නාම: අමනාපිකං රසං උපසංහරති ජෙගුච්ඡං පාටිකුල්‍යං 'ඉමං සායිත්වා ජෙගුච්ඡතා පාටිකුල්‍යතා මරිස්සතී'ති, ආපත්ති දුක්කටස්ස; තං සායිතෙ ජෙගුච්ඡතා පාටිකුල්‍යතා දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස. මනාපිකං රසං උපසංහරති, ඉමං සායිත්වා අලාභකෙන සුස්සිත්වා මරිස්සතී'ති. ආපත්ති දුක්කටස්ස; තං සායිත්වා අලාභකෙන සුස්සති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

28. **ඵොට්ඨබ්බූපහාරො** නාම: අමනාපිකං ඵොට්ඨබ්බං උපසංහරති දුක්ඛසම්ඵස්සං ඛරසම්ඵස්සං "ඉමිනා ඵුට්ඨො මරිස්සතී'ති ආපත්ති දුක්කටස්ස; තෙන ඵුට්ඨස්ස දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති; ආපත්ති පාරාජිකස්ස. මනාපිකං ඵොට්ඨබ්බං උපසංහරති සුඛසම්ඵස්සං මුදුසම්ඵස්සං "ඉමිනා ඵුට්ඨො අලාභකෙන සුස්සිත්වා මරිස්සතී"ති, ආපත්ති දුක්කටස්ස; තෙන ඵුට්ඨො අලාභකෙන සුස්සති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

29. **ධම්මූපහාරො** නාම: නෙරයිකස්ස නිරයකථං කථෙති "ඉමං සුත්වා උත්තසිත්වා මරිස්සතී"ති, ආපත්ති දුක්කටස්ස; තං සුත්වා උත්තසති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස. කල්‍යාණකම්මස්ස සග්ගකථං කථෙති "ඉමං සුත්වා අධිමුත්තො මරිස්සතී"ති, ආපත්ති දුක්කටස්ස; තං සුත්වා අධිමුත්තො "මරිස්සාමී"ති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

30. **ආචික්ඛනා** නාම: පුට්ඨො භණති එවං මරස්සු "යො එවං මරති, සො ධනං වා ලභති, යසං වා ලභති, සග්ගං වා ගච්ඡතී"ති ආපත්ති දුක්කටස්ස; තාය ආචික්ඛනාය මරිස්සාමීති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

31. **අනුසාසනී** නාම: අපුට්ඨො භණති එවං මරස්සු "යො එවං මරති, සො ධනං වා ලභති, යසං වා ලභති, සග්ගං වා ගච්ඡතී"ති, ආපත්ති දුක්කටස්ස; තාය අනුසාසනියා "මරිස්සාමී"ති දුක්ඛං වෙදනං උප්පාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස; මරති, ආපත්ති පාරාජිකස්ස.

25. **සද්දූපහාර** නම් 'මෙය අසා තැති ගෙණ මැරෙන්නේයයි' බියජනක, බියපත් කරවන නො මනා ශබ්දයක් ඉදිරිපත් කෙරේ ද, දුකුලාඇවැත් වේ. එය අසා තැති ගැණී ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ. 'මෙය අසා නො ලැබීමෙන් වියලී මැරෙන්නේය'යි ප්‍රේමයට හිත වූ ලගන්නා වූ මනාප ශබ්දයක් ඉදිරිපත් කෙරේ ද දුකුලාඇවැත් වේ. එය අසා නො ලැබීමෙන් වියලේ ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

26. **ගන්ධූපහාර** නම් 'මෙය සිඹ ජුගුප්සා බැවින් පිළිකුල් බැවින් මැරෙන්නේය'යි ජුගුප්සා කටයුතු පිළිකුල් කටයුතු නො මනා ගඳක් එළවා ද දුකුලාඇවැත් වේ. එය සිඹි කල්හි ජුගුප්සා බැවින් පිළිකුල් බැවින් දුක් වේදනා උපදී ද, ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ. 'මෙය සිඹ නො ලැබීමෙන් වියලී මැරෙන්නේය'යි මනා සුවඳක් එළවා ද, දුකුලා-ඇවැත් වේ. එය සිඹ නො ලැබීමෙන් වියලේ ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

27. **රසූපහාර** නම් 'මෙය රස විඳ ජුගුප්සා බැවින් පිළිකුල් බැවින් මැරෙන්නේය'යි ජුගුප්සා කටයුතු පිළිකුල් කටයුතු නො මනා රසයක් එළවා ද දුකුලාඇවැත් වේ. එය රස විඳිකල්හි ජුගුප්සා බැවින් පිළිකුල් බැවින් දුක් වේදනා උපදී ද, ථුල්ලැසිඇවැත්වේ. මැරේ ද පරිජිඇවැත් වේ. 'මෙය රස විඳ නො ලැබීමෙන් වියලී මැරෙන්නේ ය'යි මනාප රසයක් එළවා තබා ද දුකුලා-ඇවැත් වේ. එය රස විඳ නො ලැබීමෙන් වියලේ ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

28. **ඵොට්ඨබ්බූපහාර** නම් 'මෙයින් පහස්නා ලද්දේ මැරෙන්නේය"යි දුක් පහස් ඇති රළු පහස් ඇති නො මනා පහස්නා දෑයක් එළවා තබා ද දුකුලාඇවැත් වේ. එයින් පහස්නා ලද්දහුට දුක් වේදනා උපදී ද ථුල්ලැසි-ඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ. 'මෙයින් පහස්නා ලද්දේ නො ලැබීමෙන් වියලී මැරෙන්නේ ය'යි සුවපහස් ඇති මුදුපහස් ඇති මනාප වූ පහස්නා දෑයක් එළවා තබා ද දුකුලාඇවැත් වේ. එයින් පහස්නා ලද්දේ නො ලැබීමෙන් වියලේ ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

29. **ධම්මූපහාර** නම් 'මෙය අසා තැති ගෙණ මැරෙන්නේ ය'යි නිරයට සුදුසුවූවකුට නිරය පිළිබඳ කථා කියා ද දුකුලාඇවැත් වේ. එය අසා තැති ගණී ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ. 'මෙය අසා එහි ඇලුනේ මැරෙන්නේ ය'යි කලණකම් ඇත්තහුට දෙව්ලෝ පිළිබඳ කථා කෙරේ ද දුකුලාඇවැත් වේ. එය අසා එහි ඇලුනේ 'මැරෙන්නෙමි'යි දුක් වේදනා උපදවාද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

30. **ආචික්ඛනා** නම් විචාරණ ලද්දේ "මෙසේ මැරෙව. යමෙක් මෙසේ මැරේ නම් හේ ධනය හෝ ලබයි. යශස් හෝ ලබයි. දෙව්ලොවට හෝ යේ"යි කියා ද, දුකුලාඇවැත් වේ. ඒ සැලකිරීමෙන් 'මැරෙන්නෙමි'යි දුක් වේදනා උපදවා ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

31. **අනුසාසනී** නම් නොවිචාරණ ලද්දේ "මෙසේ මැරෙව. යමෙක් මෙසේ මැරේද, හේ ධනය හෝ ලබයි. යශස් හෝ ලබයි. සවර්ග යට හෝ යේ ය"යි කියා ද දුකුලාඇවැත් වේ. ඒ අනුශාසනාවෙන් 'මැරෙන්නෙමි'යි දුක් වේදනා උපදවා ද ථුල්ලැසිඇවැත් වේ. මැරේ ද පරිජිඇවැත් වේ.

32. **සඞ්කෙතකම්මං** නාම: සඞ්කෙතං **කරොති**: “පුරෙ භත්තං වා පච්ඡාභත්තං වා රත්තිං වා දිවා වා තෙන **සඞ්කෙතෙන** තං ජීවිතා වොරොපෙහී”ති, ආපත්ති දුක්කටස්ස; තෙන සඞ්කෙතෙන තං ජීවිතා වොරොපෙති, ආපත්ති උභින්නං පාරාජිකස්ස; තං සඞ්කෙතං පුරෙ වා පච්ඡා වා තං ජීවිතා වොරොපෙති, මූලට්ඨස්ස අනාපත්ති; වධකස්ස ආපත්ති පාරාජිකස්ස.

33. **නිමිත්තකම්මං** නාම: නිමිත්තං කරොති “අක්ඛිං වා නිඛණිස්සාමි භමුකං වා උක්ඛිපිස්සාමි සීසං වා උක්ඛිපිස්සාමි තෙන නිමිත්තෙන තං ජීවිතා වොරොපෙහී”ති, ආපත්ති දුක්කටස්ස; තෙන නිමිත්තෙන තං ජීවිතා වොරොපෙති, ආපත්ති උභින්නං පාරාජිකස්ස; තං නිමිත්තං පුරෙ වා පච්ඡා වා ජීවිතා වොරොපෙති, මූලට්ඨස්ස අනාපත්ති; වධකස්ස ආපත්ති පාරාජිකස්ස.

34. අනාපත්ති අසඤ්චිච්ච අජානන්තස්ස න මරණාධිප්පායස්ස උම්මත්තකස්ස ඛිත්තචිත්තස්ස වෙදනට්ටස්ස[1] ආදිකම්මිකස්සාති.

## මනුස්සවිග්ගහපාරාජිකම්හි පඨමභාණවාරො නිට්ඨිතො.

---

1. ඛිත්තචිත්තස්ස, වෙදනට්ටස්ස. සීහළ පොත්ථකෙසු නත්ථි

32. **සඞ්කෙතකම්ම** නම "පෙර බත්කල හෝ පසු බත්කල හෝ රෑ හෝ දවල් හෝ ඒ සලකුණෙන් ඔහු දිවියෙන් තොර කරව"යි සලකුණක් කෙරේ ද දුකුළාඇවැත් වේ. ඒ සලකුණෙන් ඔහු දිවියෙන් තොර කෙරේ ද දෙදෙනාට ම පරිජිඇවැත් වේ. ඒ සලකුණට පෙර හෝ පසුව හෝ ඔහු දිවියෙන් තොර කෙරේ ද මූලිකයාට ඇවැත් නො වේ. මැරුවහුට පරිජිඇවැත් වේ.

33. **නිමිත්තකම්ම** නම "ඇස හෝ කසන්නෙමි. බැම හෝ නගන්නෙමි. හිස හෝ ඔසවන්නෙමි. ඒ නිමිත්තෙන් ඔහු දිවියෙන් තොර කරව යි නිමිති කෙරේ ද, දුකුළාඇවැත් වේ. ඒ නිමිත්තෙන් ඔහු දිවියෙන් තොර කෙරේ ද දෙදෙනාහට ම පරිජිඇවැත් වේ. ඒ නිමිත්තට පෙර හෝ පසුව හෝ ඔහු දිවියෙන් තොර කෙරේ ද මූලිකයාට ඇවැත් නො වේ. මැරුවහුට පරිජිඇවැත් වේ.

34. නො දැන මරන්නහුට ද, නොදන්නහුට ද, නොමරණ අදහස් ඇත්තහුට ද, උමතුවූවහුට ද, විසුළුසිත් ඇත්තහුට ද වේදනාවෙන් පෙළුනහුට ද, ආදි කර්මිකයාට ද ඇවැත් නො වේ.

## මිනිස්විකාපරිජියෙහි පළමුවන බණවර නිමි.

# විනීතවත්ථු.

**උද්දානගාථා.**

සංවණ්ණනා නිසීදන්තො මුසලොදුක්ඛලෙන ච,
බුඩ්ඪපබ්බජිතා සත්තා[1] ලග්ගවිංසතාවිසං.

තයො ච වත්ථුකම්මෙහි ඉට්ඨකාහි පරෙ තයො,
වාසී ගොපානසී චෙව අට්ටකො තාරණම්පති.

සෙදං නත්ථු ච සම්බාහො නහාපනබ්භඤ්ජනෙන ච,
උට්ඨාපෙන්තො නිපාතෙන්තො අන්නපානෙන මරණං.

ජාරගබ්භො සපත්තී ච මාතා පුත්තං උභො වධි,
උභො න මීයරෙ මද්දා තාපං වඤ්ඣා විජායිනී.

පතොදං නිග්ගහො යක්ඛො වාලයක්ඛඤ්ච පාහිනී,
තං මඤ්ඤමානො පහරි සග්ගඤ්ච නිරයං භණෙ.

ආලවියා තයො රුක්ඛා දායෙහි අපරෙ තයො,
මා කිලමෙසි න තුය්හං තක්කං සොවීරකෙන චාති.

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති, තස්ස භික්ඛූ කාරුඤ්ඤෙන මරණවණ්ණං සංවණ්ණෙසුං, සො භික්ඛු කාලමකාසි, තෙසං කුක්කුච්චං අහොසි, "කච්චි නු ඛො මයං පාරාජිකං ආපත්තිං ආපන්නා"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "ආපත්තිං තුම්හෙ භික්ඛවෙ ආපන්නා පාරාජිකන්ති." (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු පීඨකෙ පිලොතිකාය පටිච්ඡන්නං දාරකං නිසීදන්තො ඔත්ථරිත්වා මාරෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස." "න ච භික්ඛවෙ අප්පටිවෙක්ඛිත්වා ආසනෙ නිසීදිතබ්බං. යො නිසීදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති. (2)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භත්තග්ගෙ අන්තරඝරෙ ආසනං පඤ්ඤපෙන්තො මුසලෙ උස්සිතෙ එකං මුසලං අග්ගහෙසි. දුතියො මුසලො පරිපතිත්වා අඤ්ඤතරස්ස දාරකස්ස මත්ථකෙ අවත්ථාසි. සො කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- 'කිඤ්චිත්තො ත්වං භික්ඛූති?" අසඤ්චිච්ච අහං භගවා"ති. "අනාපත්ති භික්ඛු අසඤ්චිච්චා"ති. (3)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භත්තග්ගෙ අන්තරඝරෙ ආසනං පඤ්ඤපෙන්තො උදුක්ඛලභණ්ඩිකං අක්කමිත්වා පවට්ටෙසි, අඤ්ඤතරං දාරකං ඔත්ථරිත්වා මාරෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අසඤ්චිච්චා"ති. (4)

---

1. බුඩ්ඪපබ්බජිතාභිසන්නා. මජසං.

# විනිශ්චිත කථාවස්තු

## උද්දානගාථා

සංවණ්ණනා, නිසීදනන, මුසල, උදුක්ඛල සමග සතරක් ද, බුඩ්ඪපබ්බජිත තුණක්දූයි සතකි. ලග්ග තුණක් ද වීමංසන විස දෙකක් දූයි වස්තු 12 ක් ද,

විහාරවත්ථු තුණක් ද අනෙක් ඉට්ඨකවත්ථු තුණක් ද, වාසී, ගොපානසී, අට්ටක, ඔතාරණ, යන වස්තූන් තුණ බැගින් ද, පති දෙකෙක් දූසී 20 ක් ද,

සෙද, නත්‍ථු, සම්බාහන, නහාපන, අබ්භඤ්ජන, උට්ඨාපන, නිපාතන, අන්නමාරණ, පානමාරණ වස්තු තුණ බැගින් 27 ක් ද,

ජාරගබ්භ, සපත්තිය සම්බන්ධ මවුමළ, පුතුමළ, දෙදෙනා ම මළ, දෙදෙනා ම නො මළ වස්තු සතරක්ද, මද්දපන, තාපන වඣ්ඣා, විජායිනී වස්තු සතරක් දූසි 9 ක් ද,

පතොද, නිග්ගහ, යක්ඛ වස්තු ද, වාළ යක්ඛවස්තු තුණක් ද, පාහිනි කන්තාර වස්තු සයක් ද, මඤ්ඤමාන සතරක් ද, පහාර තුණක් ද, සග්ග තුණක් ද, නිරයවණ්ණනා තුණක් දූසි 25 ක් ද,

ආලවිරුක්ඛවත්ථු තුණක් ද දාය වත්ථු තුණක් ද, මා කිලමෙසි තුණක් ද, තක්ක, සොවීරක දෙක දූසි 10 ක් ද වූ විනීත වස්තු එක්සිය තුණෙකි.

1. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වූයේ වෙයි. භික්ෂූහු ඒ මහණහට කරුණාවෙන් මරණයෙහි ගුණ වැණූහ. ඒ මහණ තෙමේ කළුරිය. කෙළේය. "කිම අපි පරිජිඇවැත් අවත්නමෝද"යි. ඔවුන්ට කුකුස් විය. ... ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළාහු ය. ... "මහණෙනි, තෙපි පරිජිඇවැත් අවත්නහු ය."

2. එසමයෙහි එක්තරා පිණ්ඩචාරික මහණෙක් පුටුවක හිඳගත්තේ රෙදිකඩකින් පිළිසත් දරුවකු මැඩ ගෙණ මැරී ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. මහණෙනි, පරීක්‍ෂා නො කොට අසුනෙහි නො හිඳිය යුතුයි. යමෙක් හිඳී නම් දුකුළාඇවැත් වේ."

3. එසමයෙහි එක්තරා මහණෙක් ඇතුළුගම බොජුන්හලෙහි අසුන් පණවන්නේ මොහොල් දෙකක් ඔසවා තැබූ කල්හි එක් මොහොලක් හැර ගත්තේ ය. දෙවෙනි මොහොල පෙරළී එක්තරා දරුවකුගේ හිසමත වැටුනේය. ඒ දරු තෙමේ කළුරිය කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ තෝ කෙබඳු සිත් ඇත්තෙහි ද"? "භාග්‍යවතුන් වහන්ස, මම නො දැන කෙළෙමි." මහණ, නො දැන කළහුට ඇවැත් නොවේ.

4. එසමයෙහි එක්තරා මහණෙක් ඇතුළුගම බොජුන්හලෙහි අසුන් පණවන්නේ වංගෙඩියක් ඇක්ම පෙරළීය. එක්තරා දරුවකු යට කොට මැරී ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, නො දැන කළහුට ඇවැත් නො වේ.

5. තෙන ඛො පන සමයෙන පිතාපුත්තා භික්ඛූසු පබ්බජිතා හොන්ති. කාලෙ ආරොචිතෙ පුත්තො පිතරං එතදවොච: 'ගච්ඡ භන්තෙ සඞ්ඝො තං පතිමානෙතී'ති පිට්ඨියං ගහෙත්වා පනාමෙසි. සො පපතිත්වා කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "කිංචිත්තො ත්වං භික්ඛූ"?ති "නාහං භගවා මරණාධිප්පායො"ති. "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (5)

6. තෙන ඛො පන සමයෙන පිතාපුත්තා භික්ඛූසු පබ්බජිතා හොන්ති. කාලෙ ආරොචිතෙ පුත්තො පිතරං එතදවොච: 'ගච්ඡ භන්තෙ සඞ්ඝො තං පතිමානෙතී'ති මරණාධිප්පායො පිට්ඨියං ගහෙත්වා පනාමෙසි. සො පපතිත්වා කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (6)

7. තෙන ඛො පන සමයෙන පිතාපුත්තා භික්ඛූසු පබ්බජිතා හොන්ති. කාලෙ අරොචිතෙ පුත්තො පිතරං එතදවොච: 'ගච්ඡ භන්තෙ සඞ්ඝො තං පතිමානෙතී'ති මරණාධිප්පායො පිට්ඨියං ගහෙත්වා පනාමෙසි. සො පපතිත්වා න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (7)

8. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො භුඤ්ජන්තස්ස මංසං කණ්ඨෙ විලග්ගං හොති. අඤ්ඤතරො භික්ඛු තස්ස භික්ඛුනො ගීවායං පහාරං අදාසි. සලොහිතං මංසං පති. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (8)

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො භුඤ්ජන්තස්ස මංසං කණ්ඨෙ විලග්ගං හොති. අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො තස්ස භික්ඛුනො ගීවායං පහාරං අදාසි. සලොහිතං මංසං පති. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (9)

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො භුඤ්ජන්තස්ස මංසං කණ්ඨෙ විලග්ගං හොති. අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො තස්ස භික්ඛුනො ගීවායං පහාරං අදාසි. සලොහිතං මංසං පති. සො භික්ඛු න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (10)

11. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු විසගතං පිණ්ඩපාතං ලභිත්වා පටික්කමනං හරිත්වා භික්ඛූනං අග්ගකාරිකං අදාසි. තෙ භික්ඛූ කාලමකංසු. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "කිංචිත්තො ත්වං භික්ඛූ"ති? "නාහං භගවා ජානාමී"ති. "අනාපත්ති භික්ඛු අජානන්තස්සා"ති. (11)

12. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු වීමංසාධිප්පායො අඤ්ඤතරස්ස භික්ඛුනො විසං අදාසි. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "කිංචිත්තො ත්වං භික්ඛූ"ති? "වීමංසාධිප්පායො අහං භගවා"ති. "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (12)

5. එසමයෙහි දෙ පුතු පිය කෙනෙක් භික්ෂූන් කෙරෙහි මහණවූවෝ වෙත්. කල් දූත් වූ කල්හි පුත් තෙමේ පියාට මෙය කී ය: 'වහන්ස, යනු මැනැව්. සඞ්ඝතෙමේ තොප අපේක්ෂා කෙරේ'යි පිට ගෙණ නෙරිය. හෙතෙමේ වැටී මළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ කෙබඳු සිතැත්තෙහි ද? 'භාග්‍යවතුන් වහන්ස, මම මරණ අදහස් නැත්තෙමි. වෙමි'. මහණ, මරණ අදහස් නැත්තහුට ඇවැත් නො වේ. (5)

6. එසමයෙහි දෙ පුතු පිය කෙනෙක් භික්ෂූන් කෙරෙහි පැවිදිවූවාහු වෙත්. කල් දූත් වූ කල්හි පුත් තෙමේ පියාට මෙය කී ය: 'වහන්ස, යනු මැනව්. සඞ්ඝ තෙමේ තොප අපේක්ෂා කෙරේ'යි මරණ අදහස් ඇත්තේ පිට ගෙණ නෙරිය හෙ තෙමේ වැටී මළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහි ය. (6)

7. එසමයෙහි දෙ පුතු පිය කෙනෙක් භික්ෂූන් කෙරෙහි පැවිදිවූවාහු වෙත්. කල් දූත්වූ කල්හි පුත් තෙමේ පියාට මෙය කීය: 'වහන්ස, යනු මැනව්. සඞ්ඝ තෙමේ තොප අපේක්ෂා කෙරේ'යි මරණ අදහස් ඇත්තේ පිට ගෙණ නෙරිය හෙ තෙමේ වැටී නොමළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (7)

8. එසමයෙහි එක්තරා බුදිත මහණකුගේ උගුරෙහි මස් කැබැල්ලෙක් ලැගුනේ වෙයි. එක්තරා මහණෙක් ඒ මහණහුගේ ගෙලට පහරක් දුනි. ලේ මුසු මස වැටුනේ ය. ඒ මහණ කලුරිය කෙළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, මරණ අදහස් නැත්තහුට ඇවැත් නො වේ. (8)

9. එසමයෙහි එක්තරා බුදිත මහණකුගේ උගුරෙහි මස් කැබැල්ලක් ලැගුනේ වෙයි. මැරියැටි එක්තරා මහණෙක් ඒ මහණහුගේ ගෙලට පහරක් දුනි. ලේ මුසු මස වැටුනේ ය. ඒ මහණ කලුරිය කෙළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහි ය. (9)

10. එසමයෙහි බුදිත එක්තරා මහණකුගේ උගුරෙහි මස් කැබැල්ලෙක් ලැගුනේ වෙයි. මැරියැටි එක්තරා මහණෙක් ඒ මහණහුගේ ගෙලට පහරක් දුනි. ලේ මුසු මස වැටුනේ ය. ඒ මහණ නො ම මෙළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (10)

11. එසමයෙහි එක්තරා පිණ්ඩචාරික මහණෙක් විසමුසු අහරක් ලැබ අසුන්හලට ගෙණ ගොස් භික්ෂූන්ට අග්‍රපිණ්ඩය දුනි. ඒ භික්ෂූහු මළහ. ඔහුට කුකුස් විය. ... 'මහණ, තෝ කෙබඳු සිතැත්තෙහි ද?' 'භාග්‍යවතුන් වහන්ස, මම නො දනිමි' මහණ නොදත්තහුට ඇවැත් නො වේ. (11)

12. එසමයෙහි විමැසියැටි එක්තරා මහණෙක් එක්තරා මහණකුට වස දුනි. ඒ මහණ මළේ ය. ඔහුට කුකුස් විය. ... 'මහණ, තෝ කෙබඳු සිතැත්-තෙහි ද?' 'භාග්‍යවතුන් වහන්ස, මම විමසන අදහස් ඇත්තෙමි'යි. මහණ, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (12)

13. තෙන ඛො පන සමයෙන ආලවකා[1] භික්ඛූ විහාරවත්ථුං කරොන්ති. අඤ්ඤතරො භික්ඛු හෙට්ඨා හුත්වා සිලං උච්චාරෙසි, උපරිමෙන භික්ඛුනා දුග්ගහිතා සිලා හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ අවත්ථාසි. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අසඤ්චිච්චා"ති. (13)

14. තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ විහාරවත්ථුං කරොන්ති. අඤ්ඤතරො භික්ඛු හෙට්ඨා හුත්වා සිලං උච්චාරෙසි. උපරිමො භික්ඛු මරණාධිප්පායො හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ සිලං මුඤ්චි. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (14)

15. තෙන -පෙ- සො භික්ඛු න කාලමකාසි තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (15)

16. තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ විහාරස්ස කුඩ්ඩං උට්ඨාපෙන්ති. අඤ්ඤතරෙ භික්ඛු හෙට්ඨා හුත්වා ඉට්ඨකං උච්චාරෙසි, උපරිමෙන භික්ඛුනා දුග්ගහිතා ඉට්ඨකා හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ අවත්ථාසි. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අසඤ්චිච්චා"ති. (16)

17. තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ විහාරස්ස කුඩ්ඩං උට්ඨාපෙන්ති. අඤ්ඤතරො භික්ඛු හෙට්ඨා හුත්වා ඉට්ඨකං උච්චාරෙසි, උපරිමො භික්ඛු මරණාධිප්පායො හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ ඉට්ඨකං මුඤ්චි. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති තෙන ඛො පන සමපයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (17-18)

18. තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ නවකම්මං කරොන්ති. අඤ්ඤතරො භික්ඛු හෙට්ඨා හුත්වා වාසිං උච්චාරෙසි. උපරිමෙන භික්ඛුනා දුග්ගහිතා වාසි හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ අවත්ථාසි. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අසඤ්චිච්චා"ති. (19)

19. තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ නවකම්මං කරොන්ති. අඤ්ඤතරො භික්ඛු හෙට්ඨා හුත්වා වාසිං උච්චාරෙසි, උපරිමො භික්ඛු මරණාධිප්පායො හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ වාසිං මුඤ්චි. සො භික්ඛු කාලමකාසි [-පෙ- ආපන්නො පාරාජිකන්ති තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති -පෙ- භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (20-21)

20. තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ නවකම්මං කරොන්ති. අඤ්ඤතරෙ භික්ඛු හෙට්ඨා හුත්වා ගොපානසිං උච්චාරෙසි, උපරිමෙන භික්ඛුනා දුග්ගහිතා ගොපානසී හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ අවත්ථාසි. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු අසඤ්චිච්චා"ති. (22)

1. ආලවිකා. සභා.

13. එසමයෙහි අලවුරට වැසි භික්ෂූහු විහාරභූමියක් (ගොඩලක්) කෙරෙත්. එක්තරා මහණෙක් යට සිට ගලක් නැගී ය. මත්තෙහි සිටි මහණ විසින් නපුරු කොට ගත් ගල යට සිටි මහණහු හිස මත වැටුනේ ය. ඒ මහණ මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, නො දැන කළහුට ඇවැත් නො වේ. (13)

14. එසමයෙහි අලවු වැසි භික්ෂූහු විහාර භූමියක් කෙරෙත්. එක්තරා මහණෙක් යට සිට ගලක් එසවී ය. මත්තේ සිටි මැරියැටි මහණෙක් යට සිටි මහණහුගේ හිසමත ගල හෙළී ය. ඒ මහණ මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහි ය· (14)

15. එසමයෙහි ... ඒ මහණ නො මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ. (15)

16. එසමයෙහි අලවු වැසි භික්ෂූහු විහාරයට බිතක් නංවත්. එක්තරා මහණෙක් යට සිටි ගඩොලක් එසවී ය. මත්තේ සිටි මහණ විසින් නපුරු කොට ගත් ගඩොල යට සිටි මහණහු හිස මත වැටුනේ ය. ඒ මහණ මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, නො දැන කළහුට ඇවැත් නො වේ. (16)

17. එසමයෙහි අලවු වැසි භික්ෂූහු විහාර බිතක් නංවත්. එක්තරා මහණෙක් යට සිට ගඩොලක් එසවී ය. මත්තෙහි සිටි මැරියැටි මහණ යට සිටි මහණහු හිස මත ගඩොල හෙළී ය. ඒ මහණ මළේ ය. ... [පරිජි ඇවත් අවත්තෙහිය ... එසමයෙහි] ... ඒ මහණ නොමළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ. (17-18)

18. එසමයෙහි අලවුවැසි භික්ෂූහු නවකම් කෙරෙත්. එක්තරා මහණෙක් යට සිට වැයක් එසවී ය. මත්තෙහි සිටි මහණහු විසින් නපුරු කොට ගත් වැය යට සිටි මහණහු හිස මත වැටුනේ ය. ඒ මහණ මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ නො දැන කළහුට ඇවත් නො වේ. (19)

19. එසමයෙහි අලවුරට වැසි භික්ෂූහු නවකම් කෙරෙත්. එක්තරා මහණෙක් යට සිට වැයක් එසවී ය. මත්තෙහි සිටි මහණතෙමේ මැරියැටිවූයේ යට සිටි මහණහුගේ හිස මත වැය හෙළී ය. ඒ මහණ මළේ ය. ... පරිජි ඇවැත් අවත්තෙහිය ... එසමයෙහි] ... ඒ මහණ නො මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලැසි-ඇවැත් වේ (20-21)

20. එසමයෙහි අලවු වැසි භික්ෂූහු නවකම් කෙරෙත්. එක්තරා මහණෙක් යට සිට ගොනැස්සක් එසවිය. මත්තෙහි සිටි මහණහු විසින් නපුරු කොට ගත් ගොනැස්ස යට සිටි මහණහුගේ හිස මත වැටුනේ ය. ඒ මහණ මළේ ය. ඔහුට කුකුස් විය. ... නො දැන කළහුට ඇවැත් නො වේ. (22)

21. තෙන ඛො පන සමයෙන ආළවකා භික්ඛූ නවකම්මං කරොන්ති. අඤ්ඤතරො භික්ඛු හෙට්ඨා හුත්වා ගොපානසිං උච්චාරෙසි, උපරිමො භික්ඛු මරණාධිප්පායො හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ ගොපානසිං මුඤ්චි. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සාති”. (23-24)

22. තෙන ඛො පන සමයෙන ආළවකා භික්ඛූ නවකම්මං කරොන්තා අට්ටකං බන්ධන්ති. අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං එතදවොච: “ආවුසො අත්‍රට්ඨිතො බන්ධාහී”ති. සො තත්‍රට්ඨිතො බන්ධන්තො පරිපතිත්වා කාලමකාසි. තස්ස කුක්කුච්චං අනොසි -පෙ- “කිඤ්චිත්තො ත්වං භික්ඛූ?ති” “නාහං භගවා මරණාධිප්පායො”ති. “අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා”ති. (25)

23. තෙන ඛො පන සමයෙන ආළවකා භික්ඛූ නවකම්මං කරොන්තා අට්ටකං බන්ධන්ති. අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො අඤ්ඤතරං භික්ඛුං එතදවොච: “ආවුසො අත්‍රට්ඨිතො බන්ධාහී”ති. සො තත්‍රට්ඨිතො බන්ධන්තො පරිපතිත්වා කාලමකාසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති තෙන ඛො පන සමයෙන -පෙ- තත්‍රට්ඨිතො] පරිපතිත්වා න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා”ති. (26-27)

24. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු විහාරං ඡාදෙත්වා ඔතරති. අඤ්ඤතරො භික්ඛු තං භික්ඛුං එතදවොච: “ආවුසො ඉතො ඔතරාහී”ති. සො තෙන ඔතරන්තො පරිපතිත්වා කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා”ති. (28)

25. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු විහාරං ඡාදෙත්වා ඔතරති. අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො තං භික්ඛුං එතදවොච:- “ආවුසො ඉතො ඔතරාහී”ති. සො තෙන ඔතරන්තො පරිපතිත්වා කාලමකාසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති තෙන ඛො පන සමයෙන -පෙ-] පරිපතිත්වා න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා”ති. (29-30)

26. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අනභිරතියා පීළිතො ගිජ්ඣකූටං පබ්බතං අභිරුහිත්වා පපාතෙ පපතන්තො අඤ්ඤතරං විලීවකාරං ඔත්ථරිත්වා මාරෙසි, තස්ස කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. න ච භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං. යො පාතෙය්‍ය, ආපත්ති දුක්කටස්සා”ති. (31)

27. තෙනඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිජ්ඣකූටං පබ්බතං අභිරුහිත්වා දවාය සිලං පවිජ්ඣිංසු. අඤ්ඤතරං ගොපාලකං ඔත්ථරිත්වා මාරෙසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, න ච භික්ඛවෙ දවාය සිලා පවිජ්ඣිතබ්බා, යො පවිජ්ඣෙය්‍ය ආපත්ති දුක්කටස්සා”ති. (32)

28. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ සෙදෙසුං. සො භික්ඛු කාලමකාසි තෙසං කුක්කුච්චං අහොසි -පෙ- “අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා”ති. (33)

21. එසමයෙහි අලවු වැසි භික්‍ෂූහු තවහම් කෙරෙත්. එක්තරා මහණෙක් යට සිට ගොතැස්සක් එසවීය. මත්තෙහි සිටි මහණ තෙමේ මැරියැටි වූයේ යට සිටි මහණහුගේ හිස මත ගොතැස්ස හෙළී ය. ඒ මහණ මළේ ය. ... පරිජි ඇවැත් අවන්නෙහිය. එසමයහි ... ඒ මහණ නො මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ. (23-24)

22. එසමයෙහි අලවුරට භික්‍ෂූහු තවහම් කරන්නාහු අටල්ලක් බඳිත්. එක්තරා මහණෙක් එක්තරා මහණකුට මෙය කීය: 'ඇවත, මෙහි සිට බඳව'යි, හෙ තෙමේ එහි සිට බඳින්නේ පෙරළී වැටි මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ තෝ කෙබඳු සිතැත්තෙහි ද? "භාග්‍යවතුන් වහන්ස, මම මැරි යැටි නො වෙමි". මහණ, නො මැරියැටිහුට ඇවැත් නො වේ. (25)

23. එසමයෙහි අලවුවැසි භික්‍ෂූහු තවහම් කරන්නාහු අටල්ලක් බඳිත්. එක්තරා මහණෙක් මැරියැටි වූයේ එක්තරා මහණකුට මෙය කීය. "ඇවත, මෙහි සිට බඳව"යි, හෙ තෙමේ එහි සිට බඳින්නේ පෙරළී වැටී මළේ ය. ... පරිජිඇවැත් අවන්නෙහිය. එසමයෙහි ... පෙරළී වැටී නො මළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලැසි-ඇවැත් වේ. (26-27)

24. එසමයෙහි එක්තරා මහණෙක් විහාරය සෙවෙනි කොට බසී. එක්තරා මහණෙක් ඒ මහණහට මෙය කීය: "ඇවත, මෙ තැනින් බසිනු"යි හෙ තෙමේ එතැනින් බස්නේ පෙරළී වැටී මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, මරණ අදහස් නැත්තහුට ඇවැත් නො වේ. (28)

25. එසමයෙහි එක්තරා මහණෙක් විහාරය සෙවෙනි කොට බසී. එක්තරා මහණෙක් මැරියැටි වූයේ ඒ මහණහට මෙය කීය. "ඇවත, මෙතැනින් බසිනු"යි හෙ තෙමේ එතැනින් බස්නේ පෙරළී වැටී මළේ ය. ... පරිජිඇවැත් අවන්නෙහිය. එසමයෙහි ... පෙරළී වැටී නො මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ පරිජිඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ. (29-30)

26. එසමයෙහි එක්තරා මහණෙක් සත්තෙහි උකටලී බැවින් පෙළුනේ ගිජුකුළුපව්වට නැගී ප්‍රපාතයෙහි වැටෙන්නේ එක්තරා නලකාරුවකු යට කොට මැරී ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ පරිජිඇවැත් නො වේ. මහණෙනි, ආත්මඝාතනය නො කටයුතුයි, යමෙක් ආත්මඝාතනය කෙරේ නම් දුකුළාඇවැත් වේ. (31)

27. එසමයෙහි සවග මහණහු ගිජුකුළුපව්වට නැගී කෙළි පිණිස ගලක් පෙරළූහ. ඒ ගල එක්තරා ගොපොල්ලකු යට කොට මැරී ය. ඔවුන්ට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. මහණෙනි, කෙළි පිණිස ගල් නො පෙරළිය යුතුයි. යමෙක් පෙරළන්නේ නම් දුකුළාඇවැත් වේ. (32)

28. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්‍ෂූහු ඒ මහණ බඟ ගැත්වූහ. හෙ තෙමේ මළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, මරණ අදහස් නැත්තහුට ඇවැත් නො වේ. (33)

29. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ මරණාධිප්පායා සෙදෙසුං. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන ...] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (34-35)

30. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො සීසාභිතාපො හොති. තස්ස භික්ඛූ නත්ථුං අදංසු. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (36)

31. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො සීසාභිතාපො හොති. තස්ස භික්ඛූ මරණාධිප්පායා නත්ථුං අදංසු. සො භික්ඛු කාලමකාසි. -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (37-38)

32. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ සම්බාහෙසුං. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (39)

33. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ මරණාධිප්පායා සම්බාහෙසුං. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (40-41)

34. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ නහාපෙසුං. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (42)

35. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ මරණාධිප්පායා නහාපෙසුං. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සාති. (43-44)

36. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙ භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ තෙලෙන අබ්භඤ්ජිංසු. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (45)

37. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ මරණාධිප්පායා තෙලෙන අබ්භඤ්ජිංසු. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -ප-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (46-47)

38. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ උට්ඨාපෙසුං. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (48)

39. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ මරණාධිප්පායා උට්ඨාපෙසුං, සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (49-50)

29. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණ මැරියැටි වූවෝ ඔහු ගැන්වූ හ. ඒ මහණ මළේ ය. ... [පරිජි ඇවැත් අවන්නහුය එසමයෙහි ...] ඒ මහණ නො මළේ ය. ඔවුනට කුකුස් විය: ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (34-35)

30. එසමයෙහි එක්තරා මහණකුට හිසරුජාවක් වෙයි. භික්ෂූහු ඒ මහණහට නස්‍යයක් දුන්හ. ඒ මහණ මළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, මරණ අදහස් නැත්තහුට ඇවැත් නො වේ. (36)

31. එසමයෙහි එක්තරා මහණකුට හිසරුජාවක් වෙයි. භික්ෂූහු මැරියැටි-වූවෝ ඒ මහණහට නස්‍යයක් දුන්හ. ඒ මහණ මළේ ය. ... [පරිජි ඇවැත් අවන්නහුය. එසමයෙහි ...] ඒ මහණ නොමළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (37-38)

32. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණ සම්බාහනය (=ඇඟ පිරිමැදීම) කළහ. ඒ මහණ මළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නොමැරියැටි වූවහුට ඇවැත් නො වේ. (39)

33. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණ මැරියැටි වූවෝ සම්බාහනය කළාහු ය. ඒ මහණ මළේ ය. [පරිජි ඇවැත් අවන්නහුය. එසමයෙහි ...] ... ඒ මහණ නොමළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (40-41)

34. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණ නැහැවූ හ. ඒ මහණ මළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (42)

35. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු මැරියැටි වූවෝ ඒ මහණ නැහැවූ හ. ඒ මහණ මළේ ය. ... [පරිජි ඇවැත් අවන්නහුය. එසමයෙහි ...] ඒ මහණ නො මළේ ය. ඔවුනට කුකුස් විය ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (43-44)

36. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි, භික්ෂූහු ඒ මහණ වෙර තෙල් ගැල් වූ හ. ඒ මහණ මළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (45)

37. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු මැරියැටිවූවෝ ඒ මහණ වෙර තෙල් ගැල්වූහ. ඒ මහණ මළේය. ... [පරිජි ඇවැත් අවන්නහුය. එසමයෙහි ...] ඒ මහණ නො මළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (46-47)

38. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණ නැඟිටවූහ. ඒ මහණ මළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (48)

39. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු මැරියැටි වූවෝ ඒ මහණ නැඟිට වූහ. ඒ මහණ මළේය. ... [පරිජි ඇවැත් අවන්නහුය. එසමයෙහි ...] ඒ මහණ නො මළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (49-50)

40. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ නිපාතෙසුං. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (51)

41. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ මරණාධිප්පායා නිපාතෙසුං. සො භික්ඛු කාලමකාසි. -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (52-53)

42. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තස්ස භික්ඛූ අන්නං අදංසු. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (54)

43. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තස්ස භික්ඛූ මරණාධිප්පායා අන්නං අදංසු. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (55-56)

44. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තස්ස භික්ඛූ පානං අදංසු. සො භික්ඛු කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ න මරණාධිප්පායස්සා"ති. (57)

45. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති, තස්ස භික්ඛූ මරණාධිප්පායා පානං අදංසු. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නා පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (58-59)

46. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී පවුත්ථපතිකා ජාරෙන ගබ්භිනී හොති. සා කුලූපගං භික්ඛුං එතදවොච:- "ඉඞ්ඝය්‍ය ගබ්භපාතනං ජානාහී"ති "සුට්ඨු භගිනී"ති තස්සා ගබ්භපාතනං අදාසි. දාරකො කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (60)

47. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පුරිසස්ස ද්වෙ පජාපතියො හොන්ති එකා වඤ්ඣා එකා විජායිනී. වඤ්ඣා ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච:- "සචෙ සා භන්තෙ විජායිස්සති සබ්බස්ස කුටුම්බස්ස ඉස්සරා භවිස්සති. ඉඞ්ඝය්‍ය තස්සා ගබ්භපාතනං ජානාහී"ති. "සුට්ඨු භගිනී"ති තස්සා ගබ්භපාතනං අදාසි. දාරකො කාලමකාසි. මාතා න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (61)

48. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පුරිසස්ස ද්වෙ පජාපතියො හොන්ති එකා වඤ්ඣා, එකා විජායිනී. වඤ්ඣා ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච:- "සචෙ සා භන්තෙ විජායිස්සති සබ්බස්ස කුටුම්බස්ස ඉස්සරා භවිස්සති. ඉඞ්ඝය්‍ය තස්සා ගබ්භපාතනං ජානාහී"ති. "සුට්ඨු භගිනී"ති තස්සා ගබ්භපාතනං අදාසි. මාතා කාලමකාසි, දාරකො න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (62)

40. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණ බිම හෙළූහ. ඒ මහණ මළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නොමැරියැවියහුට ඇවැත් නො වේ. (51)

41. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු මැරියැවී වූවෝ ඒ මහණ බිම හෙළූහ. ඒ මහණ මළේය. ... [පරිජි ඇවැත් අවත්තහුය. එසමයෙහි ] ඒ මහණ නොමළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (52-53)

42. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට බත් දුන්හ. ඒ මහණ මළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (54)

43. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු මැරියැවිවූවෝ ඒ මහණහට බත් දුන්හ. ඒ මහණ මළේය. ... [පරිජි ඇවැත් අවත්තහුය. එසමයෙහි ...] ඒ මහණ නොමළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (55-56)

44. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට පැන් දුන්හ. ඒ මහණ මළේය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (57)

45. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු මැරියැවී වූවෝ ඒ මහණහට පැන් දුන්හ. ඒ මහණ මළේය. ... [පරිජි ඇවැත් අවත්තහුය. එසමයෙහි ...] ඒ මහණ නො මළේය. ඔවුනට කුකුස් විය. මහණෙනි, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (58-59)

46. එසමයෙහි විරහිණී වූ එක්තරා ස්ත්‍රියක් සොර සැමියකු නිසා ගැබිනී වෙයි. ඕ තොමෝ කුලූපග මහණහට මෙය කීවාය. "ආයසීයන් වහන්ස, ගැබ් හෙළන බෙහෙතක් දනු මැනව". "යහපත නැගනිය"සී ඇයට ගැබ් හෙළන බෙහෙතක් දුනි. දරුවා මළේය. ඒ මහණහට කුකුස් විය. ... මහණ තෝ පරිජිඇවැත් අවත්නෙහි ය. (60)

47. එසමයෙහි එක්තරා පුරුෂයකුට භාය්‍යාවෝ දෙදෙනෙක් වෙත්. එකක් වඳ ය, එකක් නො වඳ ය. වඳ ගැහැණිය කුලූපග මහණකුට මෙය කීවාය. "වහන්ස, ඉදින් දරුවන් වදන්නීනම් ඕ සියලු ධනයට හිමි වන්නීය. "ආයසීයන් වහන්ස, ඇයට ගැබ් හෙළන බෙහෙතක් දනු මැනව"යි "යහපත, නැගනිය"සී ඇයට ගැබ් හෙළන බෙහෙතක් දුනි. දරුවා මළේය. මවු නො මළාය. ඔහුට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවත්නෙහි ය. (61)

49. එසමයෙහි එක්තරා පුරුෂයකුට භාය්‍යාවෝ දෙදෙනෙක් වෙති. එකක් වඳය. එකක් නො වඳය. වඳ ගැහැණිය, කුලූපග මහණකුට මෙය කීවාය. "වහන්ස, ඉදින් ඕ වදන්නී නම් සියලු ධනයට හිමි වන්නීය. ආයසීයන් වහන්ස, ඇගේ ගැබ් හෙළන බෙහෙතක් දනු මැනව"යි, "යහපත, නැගනිය"යි, ඇයට ගැබ් හෙළන බෙහෙතක් දුනි. මවු මළා ය. දරුවා නො මළේය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසි-ඇවැත් වේ. (62)

49. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස පුරිසස්ස ද්වෙ පජාපතියො හොන්ති එකා වඤ්ඣා එකා විජායිනී. වඤ්ඣා ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච:- "සචෙ සා භන්තෙ විජායිස්සති, සබ්බස්ස කුටුම්බස්ස ඉස්සරා භවිස්සති. ඉඞ්ඝය්‍ය තස්සා ගබ්භපාතනං ජානාහී"ති. "සුට්ඨු භගිනී"ති තස්සා ගබ්භපාතනං අදාසි, උභො කාලමකංසු -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] උභො න කාලමකංසු. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (63-64)

50. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ගබ්භිනී ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච:- "ඉඞ්ඝය්‍ය ගබ්භපාතනං ජානාහී"ති. "තෙන හි භගිනි මද්දස්සූ"ති. සා මද්දාපෙත්වා ගබ්භං පාතෙසි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (65)

51. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ගබ්භිනී ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච:- "ඉඞ්ඝය්‍ය ගබ්භපාතනං ජානාහී"ති. "තෙන හි භගිනි තාපෙහී"ති. සා තාපෙත්වා ගබ්භං පාතෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (66)

52. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා වඤ්ඣා ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච:- "ඉඞ්ඝය්‍ය භෙසජ්ජං ජානාහි යෙනාහං විජායෙය්‍ය"න්ති. "සුට්ඨු භගිනී"ති තස්සා භෙසජ්ජං අදාසි. සා කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති දුක්කටස්සා"ති. (67)

53. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා විජායිනී ඉත්ථී කුලූපගං භික්ඛු එතදවොච:- "ඉඞ්ඝය්‍ය භෙසජ්ජං ජානාහි යෙනාහං න විජායෙය්‍ය"න්ති. "සුට්ඨු භගිනී"ති තස්සා භෙසජ්ජං අදාසි. සා කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති දුක්කටස්සා"ති. (68)

54. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සත්තරසවග්ගියං භික්ඛුං අඞ්ගුලිපතොදකෙන හාසෙසුං. සො භික්ඛු උත්තසන්තො අනස්සාසකො කාලමකාසි. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්සා"ති.[1] (69)

55. තෙන ඛො පන සමයෙන සත්තරසවග්ගියා භික්ඛූ ඡබ්බග්ගියං භික්ඛුං කම්මං කරිස්සාමාති ඔත්ථරිත්වා මාරෙසුං. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්සා"ති, (70)

56. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භූතවෙජ්ජකො භික්ඛු යක්ඛං ජීවිතා වොරොපෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (71)

57. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං වාළයක්ඛවිහාරං පාහෙසි. තං යක්ඛා ජීවිතා වොරොපෙසුං. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (72)

1. අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස ආපත්ති පාචිත්තියස්සාති. සං.

(ඉමස්මිං පන වත්ථුස්මිං යාය ආපත්තියා භවිතබ්බං සා ඛුද්දකෙසු නිද්දිට්ඨාති ඉධ න වුත්තා. අට්ඨකථා)

49. එසමයෙහි එක්තරා පුරුෂයකුට අඹුවෝ දෙදෙනෙක් වෙත්. එකක් වඳ ය. එකක් නො වඳ ය. වඳ ගැහැණිය කුලූපග මහණකුට මෙය කීවාය. "වහන්ස, ඉදින් ඕ වදන්නී නම් සියලු සැපතට හිමි වන්නී ය. ආයසීයන් වහන්ස, ඇගේ ගැබ හෙළන බෙහෙතක් දනු මැනව"යි "යහපත නැගනිය"යි ඇයට ගැබ් හෙළන බෙහෙතක් දුනි. දෙදෙනාම මළාහුය ... [පරිජි ඇවැත් අවන්නෙහිය. එසමයෙහි ...] දෙදෙනාම නො මළාහු ය. ඔහුට කුකුස් විය ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. 63-64)

50. එසමයෙහි එක්තරා ගැබිනි ගැහැණියක් කුලූපග මහණකුට මෙය කීවාය. "ආයසීයන් වහන්ස, ගැබ් හෙළන බෙහෙතක් දනු මැනව"යි එසේ වී නම් නැගනිය, (කුස) මඩින්නැ"යි. ඕ කුස මැඩ ගැබ හෙළී ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි ය. (65)

51. එසමයෙහි එක්තරා ගැබිනි ගැහැණියක් කුලූපග මහණකුට මෙය කීවාය. "ආයසීයන් වහන්ස, ගැබ් හෙළන බෙහෙතක් දනු මැනව"යි නැගනිය එසේ වී නම් කුස තවනු"යි. ඕ කුස තවා ගැබ හෙළී ය. ඔහුට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි ය. (66)

52. එසමයෙහි එක්තරා වඳ ගැහැණියක් කුලූපග මහණකුට මෙය කීවාය. 'ආයසීයන් වහන්ස, යම් බෙහෙතකින් මම වදම් ද එබඳු බෙහෙතක් දනු මැනව"යි. යහපත නැගනිය"යි ඇයට බෙහෙතක් දුනි. ඕ මළා ය. ..ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ. (67)

53. එසමයෙහි එක්තරා වදන ගැහැණියක් කුලූපග මහණකුට මෙය කීවාය. යම් බෙහෙතකින් මම් නො වදම් ද එබඳු බෙහෙතක් දනු මැනව"යි. යහපත නැගනිය"යි ඇයට බෙහෙතක් දුනි. ඕ මළා ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ. (68)

54. එසමයෙහි සවග මහණහු සතළොස්වග මහණකු ඇඟිල්ලෙන් කිති කැවීමෙන් සිනැසූහ. ඒ මහණ අධිකව සිනාසෙන්නේ ආශ්වාසප්‍රශ්වාස රහිත වූයේ මළේ ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. (69)

55. එසමයෙහි සතළොස් වග මහණහු සවග මහණකු "කම්යක් (=දඬුවමක්) කරන්නෙමු"යි ඇක්ම මැරූහ. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජිඇවැත් නො වේ. (70)

56. එසමයෙහි එක්තරා භූතවෛද්‍ය මහණෙක් යක්ෂයකු දිවියෙන් තොර කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (71)

57. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා මහණකු සැඩයකුන් අරක්-ගත් විහාරයකට යැවී ය. යක්ෂයෝ ඒ මහණ දිවියෙන් තොර කළාහු ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (72)

58. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො අඤ්ඤතරං භික්ඛුං වාළයක්ඛවිහාරං පාහෙසි. තං යක්ඛා ජීවිතා වොරොපෙසුං -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] තං යක්ඛා ජීවිතා න වොරොපෙසුං. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (73-74)

59. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං වාළකන්තාරං පාහෙසි. තං වාළා ජීවිතා වොරොපෙසුං. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (75)

60. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො අඤ්ඤතරං භික්ඛුං වාළකන්තාරං පාහෙසි. තං වාළා ජීවිතා වොරොපෙසුං -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] තං වාළා ජීවිතා න වොරොපෙසුං. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (76-77)

61. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං චොරකන්තාරං පාහෙසි. තං චොරා ජීවිතා වොරොපෙසුං. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (78)

62. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො අඤ්ඤතරං භික්ඛුං චොරකන්තාරං පාහෙසි. තං චොරා ජීවිතා වොරොපෙසුං. -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] තං චොරා ජීවිතා න වොරොපෙසුං. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (79-80)

63. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු තං මඤ්ඤමානො තං ජීවිතා වොරොපෙසි -පෙ- තං මඤ්ඤමානො අඤ්ඤං ජීවිතා වොරොපෙසි. -පෙ- අඤ්ඤං මඤ්ඤමානො තං ජීවිතා වොරොපෙසි -පෙ- අඤ්ඤං මඤ්ඤමානො අඤ්ඤං ජීවිතා වොරොපෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (81-84)

64. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අමනුස්සෙන ගහිතො හොති. අඤ්ඤතරො භික්ඛු තස්ස භික්ඛුනො පහාරං අදාසි. සො භික්ඛු කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (85)

65. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අමනුස්සෙන ගහිතො හොති. අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො තස්ස භික්ඛුනො පහාරං අදාසි. සො භික්ඛු කාලමකාසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො භික්ඛු න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (86-87)

66. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කල්‍යාණකම්මකස්ස සග්ගකථං කථෙසි. සො අධිමුත්තො කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (88)

67. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො කල්‍යාණකම්මකස්ස සග්ගකථං කථෙසි. සො අධිමුත්තො කාලමකාසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො අධිමුත්තො න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (89-90)

58. එසමයෙහි එක්තරා මහණෙක් මැරියැව්වූයේ එක්තරා මහණකු සැඩ යකුන් අරග්ගත් විහාරයකට යැවී ය. යක්‍ෂයෝ ඒ මහණහු දිවියෙන් තොර කළාහු ය. [පරිජිඇවැත් අවත්තෙහිය. එසමයෙහි ...] ... යක්‍ෂයෝ ඒ මහණහු දිවියෙන් තොම තොර කළාහු ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (73-74)

59. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා මහණකු ව්‍යාල-කාන්තාරයකට යැවීය. ව්‍යාලයෝ ඒ මහණහු දිවියෙන් තොර කළාහු ය. ඔහුට කුකුස් විය. ... මහණ, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (75)

60. එසමයෙහි එක්තරා මහණෙක් මැරියැව්වූයේ එක්තරා මහණකු ව්‍යාලකාන්තාරයකට යැවී ය. ව්‍යාලයෝ ඒ මහණහු දිවියෙන් තොර කළාහු ය. ... [පරිජිඇවැත් අවත්තෙහිය. එසමයෙහි ...] ව්‍යාලයෝ ඒ මහණහු දිවියෙන් තොම තොර කළාහු ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (76-77)

61. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා මහණකු සොරකතරකට යැවී ය. සොරු ඒ මහණහු දිවියෙන් තොර කළාහු ය. ඔහුට කුකුස් විය. ... මහණ, නොමැරියැවියහුට ඇවැත් නො වේ. (78)

62. එසමයෙහි එක්තරා මහණෙක් මැරියැව්වූයේ එක්තරා මහණකු සොරකතරකට යැවී ය. සොරු ඒ මහණහු දිවියෙන් තොර කළාහු ය. ... [පරිජිඇවැත් අවත්තෙහිය. එසමයෙහි ...] සොරු ඒ මහණහු දිවියෙන් තොම තොර කළාහු ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (79-80)

63. එසමයෙහි එක්තරා මහණෙක් ඔහු යයි හඟිමින් ඔහු දිවියෙන් තොර කෙළේ ය. ... ඔහු යයි හඟිමින් අනෙකකු දිවියෙන් තොර කෙළේය. ... අනෙකෙකැයි හඟිමින් ඔහු දිවියෙන් තොර කෙළේ ය. ... අනෙකෙකැයි හඟිමින් අනෙකකු දිවියෙන් තොර කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහි ය. (81-84)

64. එසමයෙහි එක්තරා මහණෙක් අමනුෂ්‍යයකු විසින් ගත්තා ලද්දේ වෙයි. එක්තරා මහණෙක් ඒ මහණහට පහරක් දුනි. ඒ මහණ මළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, නොමැරියැවියහුට ඇවැත් නො වේ. (85)

65. එසමයෙහි එක්තරා මහණෙක් අමනුෂ්‍යයකු විසින් ගත්තා ලද්දේ වෙයි. එක්තරා මහණෙක් මැරියැවි වූයේ ඒ මහණහට පහරක් දුනි. ඒ මහණ මළේ ය.... [පරිජිඇවැත් අවත්තෙහිය. එසමයෙහි...] ... ඒ මහණ නො මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (86-87)

66 එසමයෙහි එක්තරා මහණෙක් කලණකම් ඇත්තහුට සග්ගී කථාව කෙළේ ය. හෙතෙමේ එහි සිත් ඇලවූයේ මළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, නො මැරියැවියහුට ඇවැත් නො වේ. (88)

67. එසමයෙහි එක්තරා මහණෙක් මැරියැව්වූයේ කලණකම් ඇත්තකුට සග්ගීකථාව කෙළේ ය. හෙ තෙමේ එහි සිත් ඇලවූයේ මළේ ය. ... [පරිජි-ඇවැත් අවත්තෙහිය. එසමයෙහි ...] හෙ තෙමේ එහි සිත් ඇලවූයේ නො මළේ ය. ඒ මහණහට කුකුසෙක් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (89-90)

68. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු නෙරයිකස්ස නිරයකථං කථෙසි. සො උත්තසිත්වා කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මරණාධිප්පායස්සා"ති. (91)

69. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො නෙරයිකස්ස නිරයකථං කථෙසි. සො උත්තසිත්වා කාලමකාසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] සො උත්තසිත්වා න කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (92-93)

70. තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ නවකම්මං කරොන්තා රුක්ඛං ඡින්දන්ති. අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං එතදවොච: "ආවුසො අත්‍රට්ඨිතො ඡින්දාහී"ති. තං තත්‍රට්ඨිතං ඡින්දන්තං රුක්ඛො ඔත්ථරිත්වා මාරෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු නමරණාධිප්පා-යස්සා"ති. (94)

71 තෙන ඛො පන සමයෙන ආලවකා භික්ඛූ නවකම්මං කරොන්තා රුක්ඛං ඡින්දන්ති. අඤ්ඤතරො භික්ඛු මරණාධිප්පායො අඤ්ඤතරං භික්ඛුං එතදවොච: "ආවුසො අත්‍රට්ඨිතො ඡින්දාහී"ති. තං තත්‍රට්ඨිතං ඡින්දන්තං රුක්ඛො ඔත්ථරිත්වා මාරෙසි -පෙ- [ආපන්නො පාරාජිකන්ති. තෙන ඛො පන සමයෙන -පෙ-] රුක්ඛො ඔත්ථරිත්වා න මාරෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු පාරාජිකස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (95-96)

72. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දායං ආලිම්පෙසුං. මනුස්සා දඩ්ඪා කාලමකංසු. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ නමරණාධිප්පායස්සා"ති. (97)

73. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මරණාධිප්පායා දායං ආලිම්පෙසුං. මනුස්සා දඩ්ඪා කාලමකංසු -පෙ- [ආපන්නා පාරාජිකන්ති තෙන ඛො පන සමයෙන -පෙ-] මනුස්සා දඩ්ඪා න කාලම්-කංසු. තෙසං කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛවෙ පාරාජිකස්ස,ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (98-99)

74. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ආඝාතනං ගන්ත්වා චොරඝාතං එතදවොච:- "ආවුසො මායිමං කිලමෙසි, එකෙන පහාරෙන ජීවිතා වොරොපෙහී"ති. 'සුට්ඨු භන්තෙ'ති එකෙන පහාරෙන ජීවිතා වොරොපෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජික"න්ති. (100)

75. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ආඝාතනං ගන්ත්වා චොරඝාතං එතදවොච:- "අවුසො මායිමං කිලමෙසි, එකෙන පහාරෙන ජීවිතා වොරොපෙහී"ති. සො "නාහං තුය්හං වචනං කරිස්සාමී"ති ජීවිතා වොරොපෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛු පාරාජි-කස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (101)

76. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො ඤාතිඝරෙ හත්ථ-පාදච්ඡින්නො ඤාතකෙහි සම්පරිකිණ්ණො හොති. අඤ්ඤතරො භික්ඛු තෙ මනුස්සෙ එතදවොච:- "ආවුසො ඉච්ඡථ ඉමස්ස මරණ"න්ති. "ආම භන්තෙ ඉච්ඡාමා"ති. "තෙන හි තක්කං පායෙථා"ති. තෙ තං තක්කං පායෙසුං. සො කාලමකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (102)

68. එසමයෙහි එක්තරා මහණෙක් මිනිස්තිරිසනකුට නිරයකථාව කෙළේ ය. හෙ තෙමේ තැති ගෙණ මළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, නො මැරියැටියහුට ඇවැත් නො වේ. (91)

69. එසමයෙහි එක්තරා මහණෙක් මරණ රිසි ඇතියේ ආපායිකයකුට නිරයකථාව කෙළේ ය. හෙ තෙමේ තැති ගෙණ මළේ ය. ... [පරිජි ඇවැත් අවත්තෙහිය. එසමයෙහි ...] හෙ තෙමේ තැති ගෙණ නොමළේ ය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ. (92-93)

70. එසමයෙහි අලවුවැසි භික්ෂූහු නවකම් කරන්නාහු රුකක් සිඳිත්. එක්තරා මහණෙක් එක්තරා මහණකුට මෙය කීයේ ය: "ඇවත, මෙහි සිට සිඳුව"සි, වෘක්ෂය තෙමේ එහි සිට සිඳින උහු යටකොට මැරී ය. ඒ මහණහට කුකුස් විය. මහණ, නොමරණරිසි ඇතියහුට ඇවැත් නො වේ. (94)

71. එසමයෙහි අලවු වැසි භික්ෂූහු නවකම් කරන්නෝ රුකක් සිඳිත්. එක්තරා මහණෙක් මරණරිසි ඇතියේ එක්තරා මහණකුට මෙය කීය: "ඇවත, මෙහි සිට සිඳුව"සි. වෘක්ෂය තෙමේ එහි සිට සිඳින මහණහු යට කොට මැරී ය. ... [පරිජිඇවැත් අවත්තෙහිය එසමයෙහි ...] වෘක්ෂය තෙමේ යට කොට නො මැරී ය. ඔහුට කුකුස් විය. ... මහණ, ... පරිජිඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ. (95-96)

72. එසමයෙහි සවග මහණහු වනය ගිනි ලූහ. මිනිස්සු දැවුනාහු මළාහු ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, නොමරණ රිසි ඇතියහුට ඇවැත් නො වේ. (97)

73. එසමයෙහි සවග මහණහු මරණ රිසි ඇත්තෝ වනය ගිනි ලූහ. මිනිස්සු දැවුනාහු මළාහු ය. ... [පරිජි ඇවැත් අවත්තහුය එසමයෙහි ...] මිනිස්සු දැවුනෝ නොමළාහු ය. ඔවුනට කුකුස් විය. ... මහණෙනි, පරිජි ඇවැත් නො වේ. ථුල්ලැසි ඇවැත් වේ. (98-99)

74. එසමයෙහි එක්තරා මහණෙක් වධඝාතයට ගොස් චොරඝාතකයාට මෙය කීය: "ඇවත, මොහු නොවෙහෙසව. එක පහරින් දිවියෙන් තොර කරව"සි 'වහන්ස, මැනව'සි එක පහරින් දිවියෙන් තොර කෙළේය. ඔහුට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහිය. (100)

75 එසමයෙහි එක්තරා මහණෙක් වධකඝාතයට ගොස් චොරඝාතකයාට මේය කීය. "ඇවත, මොහු නො වෙහෙසව. එක පහරින් දිවියෙන් තොරකරව"සි හෙතෙමේ "මම තාගේ වචනය නහමක් කරන්නෙමි"සි ඔහු දිවියෙන් තොර කෙළේය. ඔහුට කුකුස් විය. ... මහණ, පරිජි ඇවැත් නො වේ. දුකුළා ඇවැත් වේ. (101)

76. එසමයෙහි එක්තරා පුරුෂයෙක් තෙමේ නෑගෙයකදී සුන් අත් පා ඇතියේ නෑයන් විසින් පිරිවරණ ලද්දේ වෙයි. එක්තරා මහණෙක් ඒ මිනිසුන්ට මෙය කීය: "ඇවත්නි, මොහුගේ මරණය කැමැතිවවූ දැ? වහන්ස, එසේය, කැමැතිවෙමූ"සි. "එසේ විනම් මෝරු පොවවූ'සි. ඔවුහු ඔහුට මෝරු පෙවූහ. හෙ තෙමේ මළේ ය. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ පරිජි ඇවැත් අවත්තෙහිය. (102)

77. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො කුලඝරෙ හත්ථපාදච්ඡින්නො ඤාතකෙහි සම්පරිකිණ්ණො හොති. අඤ්ඤතරා භික්ඛුනී තෙ මනුස්සෙ එතදවොච:– "ආවුසො ඉච්ඡථ ඉමස්ස මරණ"න්ති. "ආමය්‍යෙ ඉච්ඡාමා"ති. "තෙන හි "ලොණසොවීරකං පායෙථා"ති. තෙ තං ලොණසොවීරකං පායෙසුං. සො කාලමකාසි. තස්සා කුක්කුච්චං අහොසි. අථ ඛො සා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං –පෙ– "ආපත්තිං සා භික්ඛවෙ භික්ඛුනී ආපන්නා පාරජික"න්ති. (103)

## තතියපාරාජිකං සමත්තං.

---

## 2. 4.

## චතුත්ථපාරාජිකං.

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ වග්ගුමුදාය නදියා තීරෙ වස්සං උපගච්ඡිංසු. තෙන ඛො පන සමයෙන වජ්ජී දුබ්භික්ඛා හොති ද්වීහිතිකා සෙතට්ඨිකා[1] සලාකා වුත්තා න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං.

2. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි:– එතරහි ඛො වජ්ජී දුබ්භික්ඛා ද්වීහිතිකා සෙතට්ඨිකා සලාකා වුත්තා න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. කෙන නු ඛො මයං උපායෙන සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසෙය්‍යාම, න ච පිණ්ඩකෙන කිලමෙය්‍යාමා'ති.

3. එකච්චෙ එවමාහංසු:– "හන්ද මයං ආවුසො ගිහීනං කම්මන්තං අධිට්ඨෙම, එවං තෙ අම්හාකං දාතුං මඤ්ඤිස්සන්ති", එවං මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිස්සාම, න ච පිණ්ඩ–කෙන කිලමිස්සාමා"ති.

4. එකච්චෙ එවමාහංසු:– "අලං ආවුසො කිං ගිහීනං කම්මන්තං අධිට්ඨිතෙන, හන්ද මයං ආවුසො ගිහීනං දූතෙය්‍යං හරාම, එවං තෙ අම්හාකං දාතුං මඤ්ඤිස්සන්ති, එවං මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිස්සාම, න ච පිණ්ඩකෙන කිලමිස්සාමා"ති.

5. එකච්චෙ එවමාහංසු: "අලං ආවුසො කිං ගිහීනං කම්මන්තං අධිට්ඨිතෙන, කිං ගිහීනං දූතෙය්‍යං හටෙන, හන්ද මයං ආවුසො ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසාම,[2] අසුකො භික්ඛු පඨමස්ස ඣානස්ස ලාභී, අසුකො භික්ඛු දුතියස්ස ඣානස්ස ලාභී, අසුකො භික්ඛු තතියස්ස ඣානස්ස ලාභී, අසුකො භික්ඛු චතුත්ථස්ස ඣානස්ස ලාභී, අසුකො භික්ඛු සොතාපන්නො, අසුකො භික්ඛු සකදාගාමී, අසුකො භික්ඛු අනාගාමී, අසුකො භික්ඛු අරහා, අසුකො භික්ඛු තෙවිජ්ජො, අසුකො භික්ඛු ඡළභිඤ්ඤො'ති. එවං තෙ අම්හාකං දාතුං මඤ්ඤිස්සන්ති. එවං මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිස්සාම න ච පිණ්ඩකෙන කිලමිස්සාමා"ති. "එසොයෙව ඛො ආවුසො සෙය්‍යො යො අම්හාකං ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණො භාසිතො"ති.

---

1. සෙතට්ටිකා, සාළුවි. 2. භාසිස්සාම - මජසං.

77. එසමයෙහි එක්තරා පුරුෂයෙක් කුලගෙයකදී සුත් අත් පා ඇතියේ නෑයන් විසින් පිරිවරණ ලද්දේ වෙයි. එක්තරා මෙහෙණක් ඒ මිනිසුන්ට මෙය කිවුය. "ඇවැත්නී, මොහුගේ මරණය රිසිවවු දැ? යි" "ආර්යාවෙනි, එසේය, රිසියෙමු"යි කීහ. "එසේ නම් ලොණසොවීරකය පොවවු" යී. ඔවුහු ඒ පුරුෂයාට ලොණසොවීරකය පෙවූහ. හෙතෙමේ මළේ ය. ඒ මෙහෙණට කුකුස් විය. ඉක්බිති ඒ මෙහෙණ භික්ෂුණීන්ට මෙ පවත් සැල කළා ය. භික්ෂුණීහු භික්ෂූන්ට මෙ පවත් සැල කළාහු ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කළාහු ය. ... "මහණෙනි, ඒ මෙහෙණ පරිජි ඇවැත් අවත්නී ය." (103)

## තෙවෙනි පරිජිය නිමි.

---

# 2-4.

## සිවුවන පරිජිය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ විසල් පුර මහ-වෙනෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වෙසෙන සේක. එසමයෙහි බොහෝ දුටුමිතුරු ඉටුමිතුරු වූ භික්ෂූහු වග්ගුමුදා නම් ගංතෙර වස් එළඹුනාහ. එසමයෙහි වැදූරට දුබික් වෙයි. ජීවිතය පිළිබඳ දෙපරිද්දෙකින් පැවති අදහස් ඇති වෙයි. සෙතට්ඨිකා නම් ශස්‍යරොග ඇති වෙයි. (වපුළ ධාන්‍ය) හටගත් හිරවූ ඇති වෙයි. පිඬු සිඟීමෙන් යැපෙන්නට පහසු නො වේ.

2. ඉක්බිති ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් විය: "දැන් වනාහි වැදූරට දුබික් වේ. ජීවිතයත් මරණයත් අතර පැවති අදහස් ඇත්තේ වෙයි. සෙතට්ඨිකා නම් ශස්‍ය රෝගයෙන් පෙළුනේ වෙයි. වපුළ ද හිරවූය. පිඬු සිඟීමෙන් යැපෙන්නට පහසු නො වෙයි. අපි කවර උපායකින් සමඟ වූවමෝ සතුටු වූවමෝ විවාද නො කරන්නමෝ පහසු සේ වස් වසන්නමූ ද, පිණ්ඩයෙන් නොම කලානත වන්නමූ දැ"යි.

3. ඇතැම් කෙනෙක් මෙසේ කීහ: "ඇවැත්නි, ඉදින් අපි ගිහියන්ගේ කර්මාන්ත හිටු කරන්නමෝ නම් මැනැව. එසේ ඇතිකල්හි ඔහු අපට පිඬු දෙන්නට සිතන්නාහ. මෙසේ අපි සමග වූවමෝ මනා ව සතුටු වන්නමෝ විවාද නො කරන්නමෝ පහසු සේ වස් වසන්නමූ. පිණ්ඩයෙන් ද නො ම කලානත වන්නමූ"යි.

4. ඇතැම් කෙනෙක් මෙසේ කීහ: "ඇවැත්නි, කම් නැත. ගිහියන්ගේ කර්මාන්ත හිටු කිරීමෙන් කිම? ඇවැත්නි, අපි ගිහියන්ගේ පණිවුඩ ගෙණ යන්නමෝ නම් මැනැව. එසේ ඇතිකල්හි ඔහු අපට පිඬු දෙන්නට සිතන්නාහ. මෙසේ අපි සමග වූවමෝ සතුටු වන්නමෝ විවාද නො කරන්නමෝ පහසු සේ වස් වසන්නමූ. පිණ්ඩයෙන් ද කලානත නො වන්නෙමූ"යි.

5. ඇතැම් කෙනෙක් මෙසේ කීහ: "ඇවැත්නි, නොමැනැවි. ගිහියන්ගේ කර්මාන්ත හිටු කිරීමෙන් කිම? ගිහියන්ගේ පණිවුඩ ගෙණ යැමෙන් කිම.? ඇවැත්නි, අපි ගිහියනට ඔවුනොවුන් පිළිබඳ උතුරුමිනිස්දම්ගුණ කියමූ: "අසෝ මහණ තෙමේ ප්‍රථමධ්‍යානලාභී ය. අසෝ මහණ තෙමේ ද්විතීයධ්‍යාන ලාභී ය. අසෝ මහණ තෙමේ තෘතීයධ්‍යාන ලාභී ය. අසෝ මහණ තෙමේ චතුර්ථධ්‍යාන ලාභී ය. අසෝ මහණ තෙමේ සෝවාන් ය. අසෝ මහණ තෙමේ සෙදගැමි ය. අසෝ මහණ තෙමේ අනගැමි ය. අසෝ මහණ තෙමේ රහත් ය. අසෝ මහණ තෙමේ ත්‍රිවිද්‍යා ඇත්තෙක. අසෝ මහණ තෙමේ ෂඩභිඥ ය"යි. මෙසේ ඇති කල්හි ඔහු අපට පිඬු දෙන්නට සිතන්නාහ. මෙසේ අපි සමග වූවමෝ සතුටු වූවමෝ විවාද නොකරන්නමෝ පහසු සේ වස් වසන්නමූ. පිඬුයෙන් ද කලානත නො වන්නමූ"යි. "ඇවැත්නි, අප විසින් ගිහියන්ට ඔවුනොවුන් පිළිබඳ යම් උතුරුමිනිස්දම් ගුණයෙක් කියන ලද්දේ ද, මෙය ම ශ්‍රෙෂ්ඨ වෙයි."

6. අථ ඛො තෙ භික්ඛූ ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිංසු: අසුකො භික්ඛු පඨමස්ස ඣානස්ස ලාභී -පෙ- අසුකො භික්ඛු ඡළභිඤ්ඤො"ති.

7. අථ ඛො තෙ මනුස්සා "ලාභා වත නො, සුලද්ධං වත නො, යෙසං[1] නො එවරූපා භික්ඛූ වස්සං උපගතා, න වත නො ඉතො පුබ්බෙ එවරූපා භික්ඛූ වස්සං උපගතා, යථයිමෙ භික්ඛූ සීලවන්තො, කල්‍යාණධම්මා"ති. තෙ න තාදිසානි භොජනානි අත්තනා භුඤ්ජන්ති, මාතාපිතූනං දෙන්ති, පුත්තදාරස්ස දෙන්ති, දාසකම්මකරපොරිසස්ස දෙන්ති, මිත්තාමච්චානං දෙන්ති, ඤාතිසාලොහිතානං දෙන්ති, යාදිසානි භික්ඛූනං දෙන්ති. න තාදිසානි ඛාදනියානි -පෙ- සායනියානි -පෙ- පානානි අත්තනා පිවන්ති, මාතාපිතූනං දෙන්ති, පුත්තදාරස්ස දෙන්ති, දාසකම්මකරපොරිසස්ස දෙන්ති, මිත්තාමච්චානං දෙන්ති, ඤාතිසාලොහිතානං දෙන්ති, යාදිසානි භික්ඛූනං දෙන්ති. අථ ඛො තෙ භික්ඛූ වණ්ණවා අහෙසුං පීණින්ද්‍රියා පසන්නමුඛවණ්ණා විප්පසන්නඡවිවණ්ණා.

8. ආචිණ්ණං ඛො පනෙතං වස්සං වුත්ථානං භික්ඛූනං භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො තෙ භික්ඛූ වස්සං වුත්ථා තෙමාසච්චයෙන සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන වෙසාලී තෙන පක්කමිංසු. අනුපුබ්බෙන යෙන වෙසාලී මහාවනං කූටාගාරසාලා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

9. තෙන ඛො පන සමයෙන දිසාසු වස්සං වුත්ථා භික්ඛූ කිසා හොන්ති ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා. වග්ගුමුදාතීරියා පන[2] භික්ඛූ වණ්ණවා හොන්ති පීණින්ද්‍රියා පසන්නමුඛවණ්ණා විප්පසන්නඡවිවණ්ණා. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං.

10. අථ ඛො භගවා වග්ගුමුදාතීරියෙ භික්ඛූ එතදවොච: "කච්චි භික්ඛවෙ ඛමනීයං කච්චි යාපනීයං කච්චි සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිත්ථ, න ච පිණ්ඩකෙන කිලමිත්ථා"ති. "ඛමනීයං භගවා, යාපනීයං භගවා, සමග්ගා ච මයං භන්තෙ සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිම්හා, න ච පිණ්ඩකෙන කිලමිම්හා"ති. ජානන්තාපි තථාගතා පුච්ඡන්ති, ජානන්තාපි න පුච්ඡන්ති, කාලං විදිත්වා පුච්ඡන්ති කාලං විදිත්වා න පුච්ඡන්ති, අත්ථසංහිතං තථාගතා පුච්ඡන්ති නො අනත්ථසංහිතං, අනත්ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං.

1. යෙසං වත. - ම.ජ.සං. 2. 'පන' ඉති පොත්ථකෙසු ඌනං.

6. ඉක්බිති ඒ භික්ෂූහු ගිහියන්ට ඔවුනොවුන් පිළිබඳ උතුරුමිනිස්දම්ගුණ කීහ: "අසෝ මහණ තෙමේ ප්‍රථමධ්‍යානලාභී ය. ... අසෝ මහණ තෙමේ ෂඩභිඥය"යි.

7. ඉක්බිති ඒ මිනිස්සු "අපට ලාභයෙක් ම ය. ඒකාන්තයෙන් අපට මනා ලැබුමෙකි. යම්බඳු වූ අප වෙත මෙබඳු භික්ෂූහු වස් එළඹියාහු ද, යම්හේ මේ භික්ෂූහු සිල්වත් ද, කලණදහම් ඇත්තාහු ද, ඒකාන්තයෙන් මින් පෙර මෙබඳු භික්ෂූහු අපගේ වසට නො එළඹියාහුය"යි සිතූහ. ඔහු යම් බඳුවූ බොජුන් භික්ෂූන්ට දෙත් ද, එබඳු බොජුන් තුමූ නො බුදිත්. මවුපියනට ද නො දෙත්. අඹුදරුවන්ට ද නො දෙත්. දස් කම්කරු පුරුෂයනට ද නො දෙත්. මිත්‍රාමාත්‍යයනට ද නො දෙත්. සහලේ නෑයනට ද නො දෙත්. යම්බඳු වූ කෑ යුතු දෑය භික්ෂූන්ට දෙත් ද, එබඳු කෑයුතු දෑ ද ... නො දෙත්. රස විඳිය යුතු දෑ ද ... නො දෙත්. ... පානවර්ගයන් ද තුමූ නො බොත්. මවුපියනට ද නො දෙත්. අඹුදරුවනට ද නො දෙත්. දස් කම්කරුවනට ද නො දෙත්. මිත්‍රාමාත්‍යයනට ද නො දෙත්. සහලේ නෑයනට ද නො දෙත්. ඉක්බිති ඒ භික්ෂූහු වර්ණවත් වූහ. පිණාගිය ඉඳුරන් ඇති වූහ. පහන් මුවපැහැ ඇති වූහ. වෙසෙසින් පහන් සිවිපැහැ ඇති වූහ.

8. වැස නිමවූ වස් ඇති භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ දැකීම සඳහා යෑම පුරුදු ම ය. ඉක්බිති වැස නිමවූ වස් ඇති ඒ භික්ෂූහු තෙමස ඇවෑමෙන් සෙනසුන් තැන්පත් කොට තබා, පාසිවුරු ගෙණ විසල්පුරය බලා නික්මුනාහු ය. පිළිවෙළින් විසල්පුර මහවෙනෙහි කූටාගාරශාලාවෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහු ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නාහු ය.

9. එසමයෙහි දිසාවන්හි වස් වුසූ භික්ෂූහු වැහැරුණාහු රළු වූවාහු දුර්වර්ණ වූවාහු හටගත් පඬුවන් පැහැ ඇත්තාහු නහර ඉල්පීගිය සිරුරු ඇත්තෝ වෙත්. වග්ගුමුදා ගංතෙර වස් වුසූ භික්ෂූහු වර්ණවත් වූවාහු පිණාගිය ඉඳුරන් ඇත්තාහු පහන් මුවපැහැ ඇත්තාහු වෙසෙසින් පහන් සිවිපැහැ ඇත්තෝ වෙත්. භාග්‍යවත් බුදුවරුන් විසින් ආගන්තුක භික්ෂූන් සමග පිළිසඳර කිරීම ආචීර්ණ ම ය.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදා ගංතෙර වැසි භික්ෂූන්ට "මහණෙනි, කිම සිහිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම සමග වූවහු, සතුටු වූවහු විවාද නො කරන්නහු පහසු සේ වස් වුසුවහු ද? අහරින් ක්ලාන්ත නො වූවහු ද?"යි වදාළ සේක. භාග්‍යවතුන් වහන්ස, සිහිය හැක්ක. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැක්ක. වහන්ස, අපි සමඟ වූවමෝ සතුටු වූවමෝ විවාද නො කරමින් පහසු සේ වස් වුසුම්හ. අහරින් ක්ලාන්ත නො වූම්හ"යි. තථාගතවරු දනිමිනුත් විචාරත්. දනිමිනුත් නො විචාරත්. කල් දැන විචාරත්. කල් දැන නො විචාරත්. තථාගතවරු අර්ථයෙන් යුක්ත වූවක් ම විචාරත්. අනර්ථසංහිතයක් නො විචාරත්. අනර්ථයෙන් යුක්ත වචනයෙහි තථාගතවරයන්ගේ මගනුවණින් ප්‍රත්‍යයඝාතය වෙයි.

11. ද්වීහාකාරෙහි බුද්ධා භගවන්තො භික්ඛූ පටිපුච්ඡන්ති "ධම්මං වා දෙසිස්සාම, සාවකානං වා සික්ඛාපදං පඤ්ඤපෙස්සාමා"ති. අථ ඛො භගවා වග්ගුමුදාතීරියෙ භික්ඛූ එතදවොච: "යථා කථං පන තුම්හෙ භික්ඛවෙ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිත්ථ, න ච පිණ්ඩකෙන කිලමිත්ථා"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "කච්චි පන වො භික්ඛවෙ භූත"න්ති. "අභූතං භගවා"ති. විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවිකං මොඝපුරිසා අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තුම්හෙ මොඝපුරිසා උදරස්ස කාරණා ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිස්සථ. වරං තුම්හෙහි මොඝපුරිසා තිණ්හෙන ගොවිකන්තනෙන[1] කුච්ඡිපරිකන්තො,[2] න ත්වෙව උදරස්ස කාරණා ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණො භාසිතො. තං කිස්ස හෙතු? තතො නිදානං හි මොඝපුරිසා මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං, න ත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. ඉතො නිදානඤ්ච ඛො මොඝපුරිසා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

12. පඤ්චිමෙ භික්ඛවෙ මහාචොරා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ පඤ්ච?

(1) ඉධ භික්ඛවෙ එකච්චස්ස මහාචොරස්ස එවං හොති: "කුදස්සු[3] නාමාහං සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගමරාජධානීසු ආහිණ්ඩිස්සාමි හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො"ති. සො අපරෙන සමයෙන සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගමරාජධානීසු ආහිණ්ඩති හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චස්ස පාපභික්ඛුනො එවං හොති: "කුදස්සු නාමාහං සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගමරාජධානීසු චාරිකං චරිස්සාමි සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො ගහට්ඨානං චෙව පබ්බජිතානඤ්ච, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන"න්ති. සො අපරෙන සමයෙන සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගමරාජධානීසු චාරිකං චරති සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො ගහට්ඨානඤ්චෙව පබ්බජිතානඤ්ච, ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අයං භික්ඛවෙ පඨමො මහාචොරො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

(2) පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පාපභික්ඛු තථාගතප්පවෙදිතං ධම්මවිනයං පරියාපුණිත්වා අත්තනො දහති. අයං භික්ඛවෙ දුතියො මහාචොරො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

(3) පුන ච පරං භික්ඛවෙ ඉධෙකච්චො පාපභික්ඛු සුද්ධං බ්‍රහ්මචාරිං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්තං අමූලකෙන අබ්‍රහ්මචරියෙන අනුද්ධංසෙති. අයං භික්ඛවෙ තතියො මහාචොරො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

1. ගොවිකන්තනෙන, කත්ථචි, මු. 2. කුච්ඡිංපරිකන්තො. කත්ථචි. 3. කුදාසු. මජසං

11. භාග්‍යවත් බුදුවරු දෙ අයුරකින් භික්ෂූන් පුළුවුසිත්: "ධර්මය හෝ දෙසන්නමු. සවුවනට සිකපද හෝ පණවන්නමු"යි. ඉක්බිති භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වග්ගුමුදා ගංතෙර වස් වුසූ භික්ෂූන්ට මෙය වදාළ සේක: "මහණෙනි, තෙපි කෙසේ නම් සමග වූවහු සතුටු වෙමින් විවාද නොකරමින් සුවසේ වස් වුසුවහු ද, අහරින් ක්ලාන්ත නුවූවහුද?" යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැළ කළහ. "කිමෙක් ද, මහණෙනි, සැබවක් කීවහුද?"යි. "භාග්‍යවතුන් වහන්ස, නොසැබවක් ම කීවමු"යි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූ සේක: "හිස් පුරුෂයෙනි, නුසුදුස්සෙක. අනුලෝම නුවූවක. නොගැළපෙන්නක. නොමහණකමෙක. නොකැපයෙක. නොකටයුත්තෙක. "හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් කුස කරුණු කොට ගිහියනට ඔවුනොවුන් පිළිබඳ උතුරුමිනිස්දම්ගුණ කීවහු ද? හිස් පුරුෂයෙනි, තොප විසින් තියුණු ගෙරි කපන කැත්තෙන් කුස කපා ගැනීම මැනවි. කුස කරුණු කොට ගිහියනට ඔවුනොවුන් පිළිබඳ උතුරුමිනිස්දම් වැණීම නො මැනවි. ඒ කවර හෙයින? හිස් පුරුෂයෙනි, ඒ හේතුවෙන් මරණයට හෝ මරණය වැනි දුකකට පැමිණෙන්නේ ය. ඒ හේතුවෙන් කාබුන් මරණින් මතු සැපයෙන් තොරවූ නපුරු ගති ඇති විවශ ව පතිත වීම් ඇති නිරයට නො ම පැමිණෙන්නේ ය. හිස් පුරුෂයෙනි, මෙ කරුණෙන් කාබුන් මරණින් මතු සැපයෙන් තොරවූ නපුරුගති ඇති විවශ ව පතිත වන නිරයට පැමිණෙන්නේ ය. හිස් පුරුෂයෙනි, මෙය නොපහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ. ..." ගරහා දැහැමි කථාවක් කොට භික්ෂූන් ඇමතූ සේක:

12. "මහණෙනි, ලොව මේ මහසොරු පස්දෙනෙක් වෙති. ඔහු පස්දෙන කවරහු ද? යත්:

(1) මහණෙනි, මේ ලෝකයෙහි එක්තරා මහ සොරකුට මෙබඳු අදහසෙක් වෙයි: "මම කවරදා නම් සියයකින් හෝ දහසකින් හෝ පිරිවරණ ලද්දෙම් ගම් නියම්ගම් රජදනවුහි නසමින් නස්වමින් සිඳිමින් සිඳුවමින් දවමින් දවවමින් ඇවිදින්නෙම් දෝ"යි. හෙ තෙමේ පසු කලෙක සියයකින් හෝ දහසකින් පිරිවරණ ලද්දේ ගම් නියම්ගම් රජ දනවුහි මරමින් මරවමින් සිඳිමින් සිඳුවමින් දවමින් දවවමින් ඇවිදී. මහණෙනි, එපරිද්දෙන් ම මේ සස්නෙහි ඇතැම් පවිටු මහණකුට මෙ බඳු සිතෙක් වෙයි: "කවරදා නම් මම සියයකින් හෝ දහසකින් හෝ පිරිවරණ ලද්දෙම් ගම් නියම්ගම් රජදනවුහි ගැහැවියන් විසින් ද පැවිද්දන් විසින් ද සත්කාර කරණ ලද්දෙම්, ගරු කරණ ලද්දෙම්, බුහුමන් කරණ ලද්දෙම්, සිවුපසයෙන් පුදන ලද්දෙම්, අභිවාදනා කරණ ලද්දෙම්, සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර ලබන්නෙම් සැරි සරන්නෙම් දෝ"යි. ඒ මහණ පසු කලෙක සියයකින් හෝ දහසකින් හෝ ගම් නියම්ගම් රජදනවුහි ගිහියන් විසින් හා පැවිද්දන් විසින් සත්කාර කරණ ලද්දේ ගරු කරණ ලද්දේ බුහුමන් කරණ ලද්දේ සිවුපසයෙන් පුදන ලද්දේ අභිවාදනා කරනලද්දේ සිවුරු පිඩු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර ලැබීම් ඇත්තේ සැරි සරයි. මහණෙනි, මේ තෙමේ ලොව විද්‍යමාන වූ පළමුවැනි මහසොරු වෙයි.

(2) වැලිදු, මහණෙනි, මේ සස්නෙහි ඇතැම් පවිටු මහණෙක් තථාගතභාෂිත ධර්ම විනය ප්‍රගුණ කොට (එය) තමාගේ යයි ප්‍රකාශ කෙරෙයි. මහණෙනි, මේ තෙමේ ලොව විද්‍යමාන වූ දෙවැනි මහසොරා වෙයි.

(3) වැලිදු, මහණෙනි, මේ සස්නෙහි ඇතැම් පවිටු මහණෙක් පිරිසිදු බඹසර හැසිරෙණ රහත් මහණකුට මුල් රහිත පරිජිඅැවැතින් චෝදනා කෙරේ ද. මහණෙනි, මේ තෙමේ ලොව විද්‍යමාන වූ තෙවන මහසොරු වෙයි.

(4) පුන ච පරං භික්ඛවෙ ඉධෙ'කච්චො පාපභික්ඛු යානි තානි සඞ්ඝස්ස ගරුභණ්ඩානි ගරුපරික්ඛාරානි, සෙය්‍යථීදං: ආරාමො ආරාමවත්ථු විහාරො විහාරවත්ථු මඤ්චො පීඨං භිසි බිම්බොහනං[1] ලොහකුම්භී ලොහභාණකො ලොහවාරකො ලොහකටාහං වාසි ඵරසු කුඨාරි කුද්දාලො නිඛාදනං වල්ලී වෙළු මුඤ්ජං බබ්බජං තිණං මත්තිකා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං, තෙහි ගිහී[2] සඞ්ගණ්හාති, උපලාපෙති. අයං භික්ඛවෙ චතුත්ථො මහාචොරො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

(5) සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අයං අග්ගො මහාචොරො යො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති. තං කිස්ස හෙතු? ථෙය්‍යාය වො භික්ඛවෙ රට්ඨපිණ්ඩො භුත්තොති.

අඤ්ඤථා සන්තමත්තානං අඤ්ඤථා යො පවෙදයෙ,
නිකච්ච කිතවස්සෙව භුත්තං ථෙය්‍යෙන තස්ස තං.

කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා,
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ.

සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො,
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතොති.

13. අථ ඛො භගවා වග්ගුමුදාතීරියෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්සධම්මං අත්තූපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය 'ඉති ජානාමි, ඉති පස්සාමී'ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා ආපන්නො විසුද්ධාපෙක්ඛො එවං වදෙය්‍ය: 'අජානමෙවාහං ආවුසො අවචං ජානාමි, අපස්සං පස්සාමි, තුච්ඡං මුසා විලපි'න්ති. අයම්පි පාරාජිකො හොති අසංවාසො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති.]

1. බිබ්බොහනං. ම.ඡ.සං. 2. ගිහිං, කත්ථචි.

(4) වැලිදු, මහණෙනි, මේ සස්නෙහි ඇතැම් පවිටු මහණෙක් සඟසතු යම් ඒ ගරු බඩු ගරු පිරිකර වේ ද, ඒ කවරේ දී? අරම්, අරම්වතු, වෙහෙර, වෙහෙර-වතු, ඇඳ, පුටු, බිසි, කන්වයින්, ලොහොකළ, ලොහොසැළ, කුඩා ලොහොකළ, ලෝහකටාරම්, වෑ, පොරෝ, කෙවේරි, උදලු, නියන්, වැල්, හුණ, මුදුතණ, බබුස්තණ, සෙවෙනියට සුදුසු තණ, මැටි, දුව බඩු, මැටි බඳුන් ය. එයින් ගිහියන් සඟන්නේ ද, පොළඹවන්නේ ද, මහණෙනි, මෙතෙම ලොව විද්‍යමාන සිවුවැනි මහසොරු වෙයි.

(5) මහණෙනි, යමෙක් සිය සතන්හි නැති උතුරුමිනිස්දම් තමා කෙරෙහි ඇතැයි කියා ද, මේ මහණ තෙමේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලෝකයෙහි ද, මහණ බමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත වූ ප්‍රජාව කෙරෙහි ද, ප්‍රමුඛ වූ මහසොරු වෙයි. ඒ කවර හෙයිනි? මහණෙනි, සොර සිතින් රටඨපිණ්ඩය අනුභව කරණ ලද්දේ ය. එහෙයිනි.

යමෙක් අන් පරිද්දෙකින් සිවුනා තමා අන් අයුරකින් පවසන්නේ නම්, ඔහුගේ ඒ සොරකමින් සිවුපසය වැළඳීම ලිහිණිවැද්ද විසින් ලිහිණින් රවටා මරා කනු වැන්න.

ගෙලෙහි ලූ කසාවත් ඇති පවිටු ගතියෙන් යුත් නොහික්මුනු පුද්ගලයෝ බොහෝ වෙත්. ඒ පවිටෝ පවිටුකමින් නිරයට පැමිණෙත්.

ඉදින් නොහික්මුණු දුසිල් මහණ තෙමේ යම් හෙයකින් රටවැසියාගේ පිඬු වළඳන්නේ ද එයට වඩා ගිනිසිළුවක් වැනි රත් වූ යවටක් බුදින ලද්දේ උතුම් වේ.

13. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වග්ගුමුදු ගංතෙරින් ආ මහණුන්ට නන් අයුරින් ගරහා දුබර බැව්හි ... මහණෙනි, මෙසේත් මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් නොදන්නේ ආර්යඥානදර්ශනයට යෝග්‍යවූ උතුරු-මිනිස්දම් තමා කෙරෙහි එළවා, 'මෙසේ (තමා කෙරෙහි ඇතැයි) දනිමි. මෙසේ (තමා කෙරෙහි ඇතැයි) දකිමි'යි කියන්නේ ද, ඉන් පසු කලෙක විචාරණු ලබන්නේ හෝ නොවිචාරණු ලබන්නේ හෝ පරිජි අවන්නේ පිරිසිදු බැව් කැමැත්තේ මෙසේ කියන්නේය: 'ඇවැත්නි, මම නොදන්නෙම් මෙසේ දනිමියි කීමි. නොදක්නෙම් දකිමියි හිස් බොරු කීමි'යි. මේ මහණ ද පරිජි අවන්නේ සංවාස රහිත වේ."**

මෙසේත් භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ සිකපදය පණවන ලද්දේ වේ.

[මුල් පැණවිමයි.]

14. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අදිට්ඨෙ දිට්ඨසඤ්ඤිනො අප්පත්තෙ පත්තසඤ්ඤිනො අනධිගතෙ අධිගතසඤ්ඤිනො අසච්ඡිකතෙ සච්ඡිකතසඤ්ඤිනො අධිමානෙන අඤ්ඤං ව්‍යාකරිංසු. තෙසං අපරෙන සමයෙන රාගායපි චිත්තං නමති, දොසායපි චිත්තං නමති, මොහායපි චිත්තං නමති. තෙසං කුක්කුච්චං අහොසි: "භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං. මයඤ්චම්හ අදිට්ඨෙ දිට්ඨසඤ්ඤිනො අප්පත්තෙ පත්තසඤ්ඤිනො අනධිගතෙ අධිගතසඤ්ඤිනො අසච්ඡිකතෙ සච්ඡිකතසඤ්ඤිනො, අධිමානෙන අඤ්ඤං ව්‍යාකරිම්හ, කච්චි නු ඛො මයං පාරාජිකං ආපත්තිං ආපන්නා"ති. ආයස්මතො ආනන්දස්ස එතමත්ථං ආරොචෙසුං. ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි.

15. හොන්ති[1] තෙ ආනන්ද භික්ඛූ අදිට්ඨෙ දිට්ඨසඤ්ඤිනො අප්පත්තෙ පත්තසඤ්ඤිනො අනධිගතෙ අධිගතසඤ්ඤිනො අසච්ඡිකතෙ සච්ඡිකතසඤ්ඤිනො අධිමානෙන අඤ්ඤං බ්‍යාකරොන්ති, තං ච ඛො එතං අබ්බොහාරිකන්ති. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්සධම්මං අත්තුපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය 'ඉති ජානාමි, ඉති පස්සාමී'ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා ආපන්නො විසුද්ධාපෙක්ඛො එවං වදෙය්‍ය: 'අජානමෙවාහං ආවුසො අවචං ජානාමි, අපස්සං පස්සාමි, තුච්ඡං මුසා විලපි'න්ති අඤ්ඤත්‍ර අධිමානා. අයම්පි පාරාජිකො හොති අසංවාසො"**ති.

[**දුතියපඤ්ඤත්ති.**]

16. **යො පනාති** - යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- [ඤත්තිචතුත්ථෙන කම්මෙන -පෙ- උපසම්පන්නො]. අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අනභිජානන්ති** අසන්තං අභූතං අසංවිජ්ජමානං අජානන්තො අපස්සන්තො අත්තනි කුසලං ධම්මං අත්ථි මෙ කුසලො ධම්මොති.

**උත්තරිමනුස්සධම්මො** නාම: ඣානං විමොක්ඛං සමාධි සමාපත්ති ඤාණදස්සනං මග්ගභාවනා ඵලසච්ඡිකිරියා කිලෙසප්පහානං විනීවරණතා චිත්තස්ස සුඤ්ඤාගාරෙ අභිරති.

**අත්තුපනායිකන්ති** තෙ වා කුසලෙ ධම්මෙ අත්තනි උපනෙති, අත්තානං වා තෙසු කුසලෙසු ධම්මෙසු උපනෙති.

**ඤාණන්ති** තිස්සො විජ්ජා.

**දස්සනන්ති** යං ඤාණං තං දස්සනං. යං දස්සනං තං ඤාණං.

**සමුදාචරෙය්‍යාති** ආරොචෙය්‍ය ඉත්ථියා වා පුරිසස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා.

1. හොන්ති යෙව තෙ ආනන්ද, මජසං. හොන්ති යෙවානන්ද, සයා.

14. එසමයෙහි බොහෝ භික්‍ෂූහු නොදක්නා ලද්දෙහි දක්නා ලද්දේයයි හැඟුම් ඇත්තාහු, නොපැමිණෙන ලද්දෙහි පැමිණෙන ලදූයි යන හැඟුම් ඇත්තාහු, නොපිළිවිදි දහම්හි පිළිවිදිනැයි හැඟුම් ඇත්තාහු, නොපසක් කළ දහම්හි පසක් කළැයි හැඟුම් ඇත්තාහු, අධිමානයෙන් යුක්ත ව අභීත්තවය ප්‍රකාශ කළහ. පසු කාලයෙහි ඔවුන්ගේ සිත රාගයට ද නැමෙයි. ද්වේෂයට ද සිත නැමෙයි. මෝහයට ද සිත නැමෙයි. ඔවුන්ට කුකුස් උපනි. "භාග්‍යවතුන් වහන්සේ විසින් සිකපද පණවන ලදී. අපි දු නොදක්නා ලද්දෙහි දක්නා ලදූයි හැඟුම් ඇත්තමෝ නොපත් ගුණෙහි පැමිණෙන ලදූයි හැඟුම් ඇත්තමෝ නොපිළිවිදි ගුණෙහි පිළිවිදිනැයි හැඟුම් ඇත්තමෝ නොපසක් කළ දහම්හි පසක් කළැයි හැඟුම් ඇත්තමෝ අධිමානයෙන් යුක්ත ව අභීත්තවය ප්‍රකාශ කළමූ. කිම අපි පරිජ්ඇවැත් අවන්නමෝ දැ?"යි. ඒ භික්‍ෂූහු ආයුෂ්මත් වූ අනඳ තෙරුන්ට මෙ පවත් දැන්වූහ. ආයුෂ්මත් ආනන්‍දස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කෙළේය.

15. ආනන්‍දය. තෙල භික්‍ෂූහු නොදක්නා ලද්දෙහි දක්නා ලද්දේයයි හැඟුම් ඇත්තාහු, නොපත්ගුණෙහි පැමිණෙන ලදූයි හැඟුම් ඇත්තාහු, නොපිළිවිදි ගුණෙහි පිළිවිදිනැයි හැඟුම් ඇත්තාහු, නොපසක් කළ දහම්හි පසක් කළැයි හැඟුම් ඇත්තාහු වෙත්. අධිමානයෙන් යුක්ත ව රහත් බව ප්‍රකාශ කෙරෙත්. ඔවුන්ගේ තෙල රහත් බැව් පලකිරීම ඇවැතට කරුණු නො වේ. මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් නොදන්නේ ආය්‍ර්‍යඥානදර්‍ශනයට යොග්‍යවූ උතුරුමිනිස්දම් තමා කෙරෙහි එළවා 'මෙසේ දනිමි, මෙසේ දකිමි'යි අධිමානයෙන් තොර ව කියන්නේ ද, ඉන් පසුකාලයෙහි විචාරණු ලබන්නේ හෝ නොවිචාරණු ලබන්නේ හෝ පරිජි අවන්නේ පිරිසිදු බැව කැමැත්තේ මෙසේ කියන්නේ ය: "ඇවැත්නි මම 'නො දන්නෙම් මෙසේ දනිමි'යි කීමි. නො දක්නෙම් දකිමියි තිස් බොරු කීමි"යි මෙ මහණ ද පැරදුනේ සංවාසරහිත වේ."**

[**දෙවෙනි පැණවීමයි.**]

16. **යොපන** යනු යම් බඳුවූ යමෙක්: ...

**භික්ඛු** යනු ... ඥප්තිචතුර්ථ කර්මයෙන් ... උපසපන් වූයේ ද, මෙ තෙමේ මේ අර්ථයෙහි භික්‍ෂුයයි අභිමතයි.

**අනභිජානං** යනු නැත්තා වූ, නො වූ, විද්‍යමාන නො වූ කුසල් දහම් තමා කෙරෙහි නොදන්නේ, නොදක්නේ මට කුසල් දහම් ඇත්තේය'යි.

**උත්තරිමනුස්සධම්ම** නම්: ධ්‍යාන, විමොක්ඛ, සමාධි, සමාපත්ති, ඤාණදස්සන, මග්ගභාවනා, ඵලසච්ඡිකිරියා, කිලෙසප්පහාණ, සිත නීවරණයන් ගෙන් තොර බව, ශූන්‍යාගාරයෙහි අභිරතිය යි.

**අත්තූපනායිකං** යනු ඒ කුසල් දහම් හෝ තමා කෙරෙහි එළවයි. තමා හෝ ඒ කුසල් දහම්හි පමුණුවයි.

**ඤාණං** යනු ත්‍රිවිද්‍යා ය.

**දස්සනං** යනු යම් ඥානයක් වේ ද ඒ දර්‍ශනයයි. යම් දර්‍ශනයක් වේ ද එය ඥානයයි.

**සමුදාචරෙය්‍ය** යනු ක්‍ෂත්‍රියකට හෝ පුරුෂයකුට හෝ ගැහැවියකුට හෝ පැවිද්දකුට හෝ සැල කරන්නේ ය.

**ඉති ජානාමි ඉති පස්සාමීති** ජානාමහං එතෙ ධම්මෙ, පස්සාමහං එතෙ ධම්මෙ, අත්ථි ච මෙ එතෙ ධම්මා, මයි එතෙ ධම්මා සන්දිස්සන්ති, අහඤ්ච එතෙසු ධම්මෙසු සන්දිස්සාමීති

**තතො අපරෙන සමයෙනාති** යස්මිං ඛණෙ සමුදාචිණ්ණං හොති, තං ඛණං තං ලයං තං මුහුත්තං වීතිවත්තෙ.

**සමනුග්ගාහියමානොති** යං වත්ථු පටිඤ්ඤාතං හොති, තස්මිං වත්ථුස්මිං සමනුග්ගාහියමානො: 'කිං තෙ අධිගතං, කින්ති තෙ අධිගතං, කදා තෙ අධිගතං, කත්ථ තෙ අධිගතං, කතමෙ තෙ කිලෙසා පහීනා, කතමෙසං ත්වං ධම්මානං වා ලාභී'ති.

**අසමනුග්ගාහියමානොති** න කෙනචි වුච්චමානො.

**ආපන්නොති** පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපිත්වා පාරාජිකං ආපත්තිං ආපන්නො හොති.

**විසුද්ධාපෙක්ඛොති** ගිහී වා හොතුකාමො උපාසකො වා හොතුකාමො ආරාමිකො වා හොතුකාමො සාමණෙරො වා හොතුකාමො.

**අජානමෙවං ආවුසො අවචං ජානාමි අපස්සං පස්සාමීති** නාහං එතෙ ධම්මෙ ජානාමි, නාහං එතෙ ධම්මෙ පස්සාමි, නත්ථි ච මෙ එතෙ ධම්මා, න මයි එතෙ ධම්මා සන්දිස්සන්ති, න චාහං එතෙසු ධම්මෙසු සන්දිස්සාමීති.

**තුච්ඡං මුසා විලපින්ති** තුච්ඡකං මයා භණිතං, මුසා මයා භණිතං, අභූතං මයා භණිතං, අජානන්තෙන මයා භණිතං.

**අඤ්ඤත්‍ර අධිමානාති** ඨපෙත්වා අධිමානං.

**අයම්පීති** පුරිමෙ උපාදාය වුච්චති.

**පාරාජිකො හොතීති** සෙය්‍යථාපි නාම තාලො මත්ථකච්ඡින්නො අභබ්බො පුන විරූළ්හියා, එවමෙව භික්ඛු පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපිත්වා අස්සමණො හොති අසක්‍යපුත්තියො, තෙන වුච්චති පාරාජිකො හොතීති.

**අසංවාසොති** සංවාසො නාම: එක[1]කම්මං එකුද්දෙසො සමසික්ඛතා එසො සංවාසො නාම. සො තෙන සද්ධිං නත්ථි, තෙන වුච්චති අසංවාසොති.

**උත්තරිමනුස්සධම්මො** නාම: ඣානං විමොක්ඛං සමාධි සමාපත්ති ඤාණදස්සනං මග්ගභාවනා ඵලසච්ඡිකිරියා කිලෙසප්පහානං විනීවරණතා චිත්තස්ස සුඤ්ඤාගාරෙ අභිරති.

**ඣානන්ති** පඨමං ඣානං දුතියං ඣානං තතියං ඣානං චතුත්ථං ඣානං.

---

1. එකං කම්මං, සාළවි.

**ඉති ජානාමි ඉති පස්සාමි** යනු මම තෙල දහම් දනිමි. මම තෙල දහම් දකිමි. තෙල දහම් මට ඇත් ම ය, තෙල දහම් මා කෙරෙහි පැණෙත්, මම ද තෙල දහම්හි පෙණෙන්නෙමි.

**තතො අපරෙන සමයෙන** යනු යම් කෙණෙක්හි සැල කෙළේ වේ ද ඒ ක්‍ෂණය, ඒ ලයය, ඒ මොහොත ඉක්මවූ කල්හි ය.

**සමනුග්ගාහියමානො** යනු යම් වතක් පිළිණ කරණ ලද්දේ වේ ද, ඒ වස්තුවෙහි විචාරණු ලබන්නේ: "තා විසින් කිනම් දහමක් අවබෝධ කරණ ලද ද, තා විසින් කෙසේ අවබෝධ කරණ ලද ද, තා විසින් කවර ද අවබෝධ කරණ ලද ද, කොහිදී තා විසින් අවබෝධ කරණ ලද ද, තාගේ කවර කෙලෙස් ප්‍රහීණ ද, තෝ කවර දහම් හෝ ලැබුයෙහි ද?"

**අසමනුග්ගාහියමානො** යනු කිසිවකු විසින් නොවිචාරණු ලබන්නේ ය.

**ආපන්නො** යනු ලාමක ආශා ඇත්තේ, ඉච්ඡාවෙන් මඩනා ලද්දේ අවිද්‍යමාන වූ, නුවූ උතුරුමිනිස්දම් පවසා පරිජිඇවැත් අවන්නේ වේ.

**විසුද්ධාපෙක්ඛො** යනු ගිහි හෝ වනු කැමැත්තේ උවසු හෝ වනු කැමැත්තේ ආරාමික හෝ වනු කැමැත්තේ හෙරණකු හෝ වනු කැමැත්-තේ ය.

**අජානමෙවං ආවුසො අවචං ජානාමි අපස්සං පස්සාමි** යනු "මම තෙල දහම් නො දනිමි. මම තෙල දහම් නො දකිමි. තෙල දහම් ද මට නැත. තෙල දහම් මා කෙරෙහි නො පැණෙයි. මම ද තෙල දහම්හි නො පැණෙන්නෙමි"යි.

**තුච්ඡං මුසා විලපිං** යනු මා විසින් හිස් වදන් කියන ලදී. මා විසින් මුසවා කියන ලදී. මා විසින් නො වූවක් කියන ලදී. නොදන්නාවූ මා විසින් කියන ලදී.

**අඤ්ඤත්‍ර අධිමානා** යනු අධිමානය හැර ය.

**අයම්පි** යනු පලමු තුන් පරිජි අවන් පුහුලන් ගෙණ කියනු ලැබේ.

**පාරාජිකො හොති** යනු යම් සේ මුදුන සුන් තල්ගසක් නැවත වැඩීමට නුසුදුසු වේ ද, එමෙන් ම මහණ තෙමේ ලාමක ආශා ඇත්තේ ඉච්ඡාවෙන් මඩනා ලද්දේ අවිද්‍යමාන වූ අභූතවූ උතුරුමිනිස්දහම් පවසා අශාක්‍යපුත්‍රීය වෙයි, අශ්‍රමණ වෙයි. එහෙයින් පැරදුනේ වේ ය යි කියනු ලැබේ.

**අසංවාසො** යනු සංවාස නම්: එක් ව කරණ කම්ය, එක් ව කරණ උදෙසීම ය, සම වූ ශික්‍ෂා ඇති බව ය යන මේ සංවාස නම්. ඒ සංවාසය ඔහු සමග නැත. එහෙයින් අසංවාස ය යි කියනු ලැබේ.

**උත්තරිමනුස්සධම්ම** නම්: ධ්‍යානය, විමොක්‍ෂය, සමාධිය, සමාපත්තිය, ඥානදර්ශනය, මාර්ගභාවනාය, ඵල පසක් කිරීම ය, කෙලශප්‍රහාණ ය, සිත නීවරණ රහිත බව, ශූන්‍යාගාරයෙහි ඇල්ම ද වේ.

**ඣානං** යනු ප්‍රථමධ්‍යානය- ද්විතීයධ්‍යානය- තෘතී ධ්‍යානය- **චතුත්‍ථ**-ධ්‍යාන යි.

**විමොක්ඛොති** සුඤ්ඤතො විමොක්ඛො අනිමිත්තො විමොක්ඛො අප්පණිහිතො විමොක්ඛො.

**සමාධීති** සුඤ්ඤතො සමාධි අනිමිත්තො සමාධි අප්පණිහිතො සමාධි.

**සමාපත්තීති** සුඤ්ඤතා සමාපත්ති අනිමිත්තා සමාපත්ති අප්පණිහිතා සමාපත්ති.

**ඤාණදස්සන**න්ති[1] තිස්සො විජ්ජා.

**මග්ගභාවනා**ති චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

**ඵලසච්ඡිකිරියා**ති සොතාපත්තිඵලස්ස සච්ඡිකිරියා සකදාගාමිඵලස්ස සච්ඡිකිරියා අනාගාමිඵලස්ස සච්ඡිකිරියා අරහත්තස්ස සච්ඡිකිරියා.

**කිලෙසප්පහාන**න්ති රාගස්ස පහානං දොසස්ස පහානං මොහස්ස පහානං.

**විනීවරණතා චිත්තස්සා**ති රාගා චිත්තං විනීවරණතා දොසා චිත්තං විනීවරණතා මොහා චිත්තං විනීවරණතා.

**සුඤ්ඤාගාරෙ අභිරතී**ති පඨමෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති, දුතියෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති, තතියෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති, චතුත්ථෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති.

---

1. තීහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජින්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති.

2. චතූහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජින්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං.

3. පඤ්චහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජින්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං.

4. ඡහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජින්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං.

---

1. ඤාණන්ති, සබ්බත්ථ.

**විමොක්ඛො** යනු රාගද්වේෂමෝහයන්ගෙන් සුන් බැවින් ශූන්‍යත-විමොක්ෂය, රාග ද්වෙෂ මෝහ නිමිති රහිත බැවින් අනිමිත්ත විමොක්ෂය, රාග ද්වෙෂ මෝහ ප්‍රනිධි රහිත බැවින් අප්‍රණිහිත විමොක්ෂය යි.

**සමාධි** යනු ශූන්‍යතසමාධිය, අනිමිත්තසමාධිය, අප්‍රණිහිතසමාධිය යි.

**සමාපත්ති** යනු ශූන්‍යතසමාපත්තිය, අනිමිත්තසමාපත්තිය, අප්‍රණිහිත සමාපත්තිය යි.

**ඤාණදස්සනං** යනු ත්‍රිවිද්‍යාව යි.

**මග්ගභාවනා** යනු සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය, සතර ඍද්ධිපාදය, පඤ්චෙන්ද්‍රියය, පඤ්චබලය, සප්තබොධ්‍යඞ්ගය, ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික-මාර්ගය යි.

**ඵලසච්ඡිකිරියා** යනු සෝවාන් පල පසක් කිරීම ය, සෙදගැමිපල පසක් කිරීම ය, අනාගැමිපල පසක් කිරීම ය, රහත්පල පසක් කිරීම යි.

**කිලෙසප්පහානං** යනු රාගප්‍රහාණය, ද්වේෂප්‍රහාණය, මෝහප්‍රහාණය යි.

**විනීවරණතා චිත්තස්ස** යනු රාගයෙන් සිත නො වැසෙන බව, ද්වේෂයෙන් සිත නො වැසෙන බව, මෝහයෙන් සිත නොවැසෙන බව යි.

**සුඤ්ඤාගාරෙ අභිරති** යනු ප්‍රථමධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලීම ය, ද්විතීයධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලීම ය, තෘතීයධ්‍යානයෙන් ශූන්‍යා-ගාරයෙහි ඇලීම ය, චතුර්ථධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලීම යි.

---

1. තුන් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවන්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: කැල ම ඔහුට බොරු කියන්නෙමි යන සිත් වෙයි. මුසවා කියන්නහුට මුසවා බෙණෙමි යි සිත වෙයි. බිණු කල්හි ඔහුට මා විසින් මුසවා කියන ලදැ යි සිත වෙයි.

2. සිවු අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවන්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: කැල ම ඔහුට මුසවා කියන්නෙමි යි සිත වෙයි. කියන්නහුට මුසවා කියමි යි සිත වෙයි. බිණු කල්හි ඔහුට මා විසින් මුසවා කියන ලදැ යි සිත වෙයි. දෘෂ්ටිය සඟවා තබා යි.

3. පස් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවන්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: කැල ම ඔහුට මුසවා කියන්නෙමි යි සිත් වෙයි. කියන්නහුට මුසවා කියමි යි සිත වෙයි. කී කල්හි ඔහුට මා විසින් මුසවා කියන ලදැ යි සිත වෙයි. දෘෂ්ටිය, ක්ෂාන්තිය සඟවා තබා යි.

4. සායුරකින් ප්‍රථමධ්‍යානයට සමවන්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. කැලම ඔහුට මුසවා කියන්නෙමි යි සිත වෙයි. කියන්නහුට මුසවා කියමි යි සිත වෙයි. කී කල්හි ඔහුට මා විසින් මුසවා කියන ලදැ යි සිත වෙයි. දෘෂ්ටිය, ක්ෂාන්තිය, රුචිය සඟවා තබා යි.

5. සත්තහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජින්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිතනන්ති," විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

6. තීහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජාමීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති.

7. චතුහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජාමීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං.

8. පඤ්චහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජාමීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං.

9. ඡහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජාමීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං.

10. සත්තහාකාරෙහි පඨමං ඣානං සමාපජ්ජාමීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

11. තීහාකාරෙහි පඨමං ඣානං සමාපන්නොති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති.

12. චතුහාකාරෙහි පඨමං ඣානං සමාපන්නොති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං.

13. පඤ්චහාකාරෙහි පඨමං ඣානං සමාපන්නොති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං.

5. සත් අයුරකින් ප්‍රථම ධ්‍යානයට සමවැදිමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "බොරු කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට "මා විසින් මුසවා කියන ලද්ද"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය (අධ්‍යාශය) සඟවාගෙණ යි.

6. තුන් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවදිමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා බෙණෙමි"යි සිත වෙයි. කිණුවහුට "මා විසින් මුසවා කියන ලද්ද"යි සිත වෙයි.

7. සිවු අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවදිමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට "මා විසින් මුසවා කියන ලද්ද"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණ යි.

8. පස් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවදිමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට "මවිසින් මුසවා කියන ලද්ද"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණ යි.

9. සායුරකින් ප්‍රථමධ්‍යානයට සමවදිමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට "මවිසින් මුසවා කියන ලද්ද"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණ යි.

10. සත් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවදිමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා බෙණෙමි"යි සිත වෙයි. කිණුවහුට "මවිසින් මුසවා කියන ලද්ද"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණ යි.

11. තුන් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවතැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා බෙණෙමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් මුසවා කියන ලද්දයි සිත වෙයි.

12. සිවු අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවතැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි" යි සිත වෙයි. කියන්නහුට "මුසවා බෙණෙමි" යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්ද"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණ යි.

13. පස් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවතැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි" යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි" යි සිත වෙයි. කිණුවහුට "මවිසින් මුසවා කියන ලද්ද" යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණ යි.

14. ඡහාකාරෙහි පඨමං ඣානං සමාපන්නොති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං.

15. සත්තහාකාරෙහි පඨමං ඣානං සමාපන්නොති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති. විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

16. තීහාකාරෙහි පඨමස්ස ඣානස්ස ලාභී'ම්හීති සම්පජානමුසා භණ-න්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති.

17. චතූහාකාරෙහි පඨමස්ස ඣානස්ස ලාභී'ම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං.

18. පඤ්චහාකාරෙහි පඨමස්ස ඣානස්ස ලාභී'ම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං.

19. ඡහාකාරෙහි පඨමස්ස ඣානස්ස ලාභී'ම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං.

20. සත්තහාකාරෙහි පඨමස්ස ඣානස්ස ලාභී'ම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

21. තීහාකාරෙහි පඨමස්ස ඣානස්ස වසී'ම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති.

22. චතූහාකාරෙහි පඨමස්ස ඣානස්ස වසී'ම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති; විනිධාය දිට්ඨිං.

14. සායුරකින් ප්‍රථමධ්‍යානයට සමවතැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි" යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි" යි සිත වෙයි. කිණුවහුට "මවිසින් මුසවා කියන ලද්"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණ යි.

15. සත් අයුරකින් ප්‍රථමධ්‍යානයට සමවතැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්" යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණ යි.

16. තුන් අයුරකින් ප්‍රථමධ්‍යානය ලබන සුලුවෙමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්"යි සිත වෙයි.

17. සිවු අයුරකින් ප්‍රථමධ්‍යානය ලබන සුලු වෙමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණ යි.

18. පස් අයුරකින් ප්‍රථමධ්‍යාන ලබන සුලු වෙමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණ යි.

19. සය අයුරකින් ප්‍රථමධ්‍යානය ලබන සුලු වෙමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින්"මුසවා කියන ලද්"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණ යි.

20. සත් අයුරකින් ප්‍රථමධ්‍යානය ලබන සුලු වෙමි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි" යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණ යි.

21. තුන් අයුරකින් ප්‍රථමධ්‍යානය පිළිබඳ වසියෙක්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්යි" සිත වෙයි.

22. සිවු අයුරකින් ප්‍රථමධ්‍යානය පිළිබඳ වසියෙක්මියි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලද්"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණ යි.

23. පඤ්චහාකාරෙහි පඨමස්ස ඣානස්ස වසිම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති භණන්තස්ස හොති "මුසා භණාමී"ති භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං.

24. ඡහාකාරෙහි පඨමස්ස ඣානස්ස වසිම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං.

25. සත්තහාකාරෙහි පඨමස්ස ඣානස්ස වසිම්හීති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

26. තීහාකාරෙහි "පඨමං ඣානං සච්ඡිකතං මයා"ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති.

27. චතූහාකාරෙහි "පඨමං ඣානං සච්ඡිකතං මයා"ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං.

28. පඤ්චහාකාරෙහි "පඨමං ඣානං සච්ඡිකතං මයා"ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං.

29. ඡහාකාරෙහි "පඨමං ඣානං සච්ඡිකතං මයා"ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං.

30. සත්තහාකාරෙහි "පඨමං ඣානං සච්ඡිකතං මයා"ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

(යථා ඉදං පඨමං ඣානං විත්ථාරිතං, එවං සබ්බං විත්ථාරෙතබ්බං.)

31. තීහාකාරෙහි – දුතියං ඣානං –පෙ– තතියං ඣානං –පෙ– චතුත්ථං ඣානං –පෙ– සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– චතුත්ථස්ස ඣානස්ස ලාභිම්හි –පෙ– වසිම්හි –පෙ– චතුත්ථං ඣානං සච්ඡිකතං මයාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, –පෙ– විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

23. පස් අයුරකින් ප්‍රථමධ්‍යානය පිළිබඳ වසියෙක්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණ යි.

24. සය අයුරකින් ප්‍රථමධ්‍යානය පිළිබඳ වසියෙක්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය රුචිය සඟවාගෙණ යි.

25. සත් අයුරකින් ප්‍රථමධ්‍යානය පිළිබඳ වසියෙක්මි යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණ යි.

26. තුන් අයුරකින් "මවිසින් ප්‍රථමධ්‍යානය පසක් කරණ ලදැ"යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි.

27. සිවු අයුරකින් " මවිසින් ප්‍රථමධ්‍යානය පසක් කරණ ලදැ"යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණ යි.

28. පස් අයුරකින් "මවිසින් ප්‍රථමධ්‍යානය පසක් කරණ ලදැ"යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවා-ගෙණ යි.

29. සය අයුරකින් "මවිසින් ප්‍රථමධ්‍යානය පසක් කරණ ලදැ"යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවා-ගෙණය, රුචිය සඟවාගෙණ යි.

30. සත් අයුරකින් "මවිසින් ප්‍රථමධ්‍යානය පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්-නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණ යි.

(මේ පළමුවන දැහැන යම්සේ විස්තර කරණ ලද ද, එසේ ම සියල්ල විස්තර කටයුතු යි.)

31. තුන් අයුරකින් දෙවන දැහැනට ... තෙවන දැහැනට ... සිවුවන දැහැනට සමවැදිමි. ... සමවදිමි. ... සමවැදුනෙමි. ... සිවුවන දැහැන ලබන-සුලු වෙමි. ... වශියෙමි. ... මවිසින් සිවුවන දැහැන පසක් කරණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට "මුසවා කියන ලදැ"යි සිත වෙයි. ... දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවා-ගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණ යි.

32. තීහාකාරෙහි – සුඤ්ඤතං විමොක්ඛං –පෙ– අනිමිත්තං විමොක්ඛං –පෙ– අප්පණිහිතං විමොක්ඛං සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– අප්පණිහිතස්ස විමොක්ඛස්ස ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'අප්පණිහිතො විමොක්ඛො සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

33. තීහාකාරෙහි – සුඤ්ඤතං සමාධිං –පෙ– අනිමිත්තං සමාධිං –පෙ– අප්පණිහිතං සමාධිං සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– අප්පණිහිතස්ස සමාධිස්ස ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'අප්පණිහිතො සමාධි සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

34. තීහාකාරෙහි – සුඤ්ඤතං සමාපත්තිං –පෙ– අනිමිත්තං සමාපත්තිං –පෙ– අප්පණිහිතං සමාපත්තිං සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– අප්පණිහිතාය සමාපත්තියා ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'අප්පණිහිතා සමාපත්ති සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

35. තීහාකාරෙහි – තිස්සො විජ්ජා සමාපජ්ජිං, –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– තිස්සන්නං විජ්ජානං ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'තිස්සො විජ්ජා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

36. තීහාකාරෙහි – චත්තාරො සතිපට්ඨානෙ –පෙ– චත්තාරො සම්මප්පධානෙ –පෙ– චත්තාරො ඉද්ධිපාදෙ සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– චතුන්නං ඉද්ධිපාදානං ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'චත්තාරො ඉද්ධිපාදා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

37. තීහාකාරෙහි – පඤ්චින්ද්‍රියානි –පෙ– පඤ්චබලානි සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– පඤ්චන්නං බලානං ලාභිම්හි පෙ– වසීම්හි –පෙ– 'පඤ්ච බලානි සච්ඡිකතානි මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

38. තීහාකාරෙහි – සත්තබොජ්ඣඞ්ගෙ සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– සත්තන්නං බොජ්ඣඞ්ගානං ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'සත්ත බොජ්ඣඞ්ගා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

39. තීහාකාරෙහි – අරියං අට්ඨඞ්ගිකං මග්ගං සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'අරියො අට්ඨඞ්ගිකො මග්ගො සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

40. තීහාකාරෙහි – සොතාපත්තිඵලං –පෙ– සකදාගාමිඵලං –පෙ– අනාගාමිඵලං –පෙ– අරහත්තං සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– අරහත්තස්ස ලාභිම්හි –පෙ– වසීම්හි –පෙ– 'අරහත්තං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

41. තීහාකාරෙහි – 'රාගො මෙ චත්තො, වන්තො, මුත්තො, පහීනො, පටිනිස්සට්ඨො, උක්ඛෙටිතො, සමුක්ඛෙටිතො'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස –පෙ–

32. තුන් අයුරකින් ශූන්‍යතවිමොක්ෂයට ... අනිමිත්තවිමොක්ෂයට ... අප්‍රණිහිතවිමොක්ෂයට සමවැදිමි. සමවදිමි. ... සමවැදුනෙමි. ... අප්‍රණිහිත-විමොක්ෂය ලබනසුලු වෙමි. ... වශියෙක්මි. ... මවිසින් අප්‍රණිහිතවිමොක්ෂය පසක් කරණ ලදූයි, දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

33. තුන් අයුරකින් ශූන්‍යතසමාධියට ... අනිමිත්තසමාධියට ... අප්‍රණිහිතසමාධියට සමවැදිමි, .... සමවදිමි, සමවැදුනෙමි, ... අප්‍රණිහිතසමාධිය ලබනසුලු වෙමි. ... වශියෙමි. ... මවිසින් අප්‍රණිහිතසමාධිය පසක් කරණ ලදූ'යි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

34. තුන් අයුරකින් ශූන්‍යතසමාපත්තියට ... අනිමිත්තසමාපත්තියට ... අප්‍රණිහිතසමාපත්තියට සමවැදිමි. ... සමවදිමි. ... සමවැදුනෙමි. ... අප්‍රණිහිත-සමාපත්තිය ලබන සුලු වෙමි. ... වශියෙමි. ... අප්‍රණිහිතසමාපත්තිය මවිසින් පසක් කරණ ලදූයි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

35. තුන් අයුරකින් ත්‍රිවිද්‍යාවට සමවැදිමි. ... සමවදිමි. .... සමවැදුනෙමි. .... අප්‍රණිහිතසමාපත්තිය ලබනසුලු වෙමි. .... වශියෙමි. .... අප්‍රණිහිතසමාපත්තිය මවිසින් පසක් කරණ ලදූයි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

36. තුන් අයුරකින් සිවු සිවටන් ... සිවු පධන්වෙර ... සිවු ඉදුපා සමවැදිමි. .... සමවදිමි. .... සමවැදුනෙමි. .... සිවු ඉදුපා ලබනසුලු වෙමි. .... වශියෙමි. .... සිවු ඉදුපා මවිසින් පසක් කරණ ලදූ යි දූත දූත මුසවා කියන්න-හුට පරිජිඇවැත් වේ. ...

37. තුන් අයුරකින් (සැදූහැ ආදී) පස් ඉඳුරනට ... පස් බලයනට සමවැදිමි. .... සමවදිමි. .... සමවැදුනෙමි. .... පස් බල ලබනසුලු වෙමි. .... වශියෙමි. .... පස් බල මවිසින් පසක් කරණ ලදූයි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

38. තුන් අයුරකින් සත් බොජඟ සමවැදිමි. .... සමවදිමි. .... සමවැදුනෙමි. .... සත් බොජඟ ලබනසුලු වෙමි. ... වශියෙමි. .... සත් බොජඟ මවිසින් පසක් කරණ ලදූ යි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

39. තුන් අයුරකින් අරිඅටඟිමඟ සමවැදිමි. .... සමවදිමි. .... සම-වැදුනෙමි. .... අරිඅටඟිමඟ ලබනසුලු වෙමි. .... වශියෙමි. .... අරිඅටඟිමඟ මවිසින් පසක් කරණ ලදූ යි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

40. තුන් අයුරකින් සෝවාන්පල ... සෙදගැමිපල ... අනගැමිපල ... රහත්බව් සමවැදිමි. .... සමවදිමි. .... සමවැදුනෙමි. .... රහත්බව් ලබනසුලු වෙමි. .... වශියෙමි. .... රහත්බව් මවිසින් පසක් කරණ ලදූ යි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

41. තුන් අයුරකින් මවිසින් රාගය හළ, විහිට, මිදින, පැහින, නෙරිත උපුටා හරිණ ලද, මැතවින් උපුටා හරිණ ලදූ යි දූත දූත මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

42. තීහාකාරෙහි - දොසො මෙ වන්තො, වන්තො, මුත්තො, පහීනො, පටිනිස්සට්ඨො, උක්ඛෙටිතො, සමුක්ඛෙටිතො'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

43. තීහාකාරෙහි - මොහො මෙ වන්තො, වන්තො, මුත්තො, පහීනො පටිනිස්සට්ඨො, උක්ඛෙටිතො, සමුක්ඛෙටිතො'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

44. තීහාකාරෙහි - රාගා මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

45. තීහාකාරෙහි - දොසා මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

46. තීහාකාරෙහි - මොහා මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස:- පුබ්බෙවස්ස හොති: "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති.

47. චතුහාකාරෙහි -පෙ- පඤ්චහාකාරෙහි -පෙ- ඡහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි මොහා මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

**සුද්ධිකං නිට්ඨිතං.**

---

1. තීහාකාරෙහි - පඨමඤ්ච ඣානං දුතියඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස දුතියස්ස ච ඣානස්ස ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- 'පඨමඤ්ච ඣානං දුතියඤ්ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

2. තීහාකාරෙහි - පඨමං ච ඣානං තතියං ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස තතියස්ස ච ඣානස්ස ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- 'පඨමඤ්ච ඣානං තතියඤ්ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

3. තීහාකාරෙහි - පඨමඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- 'පඨමඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

42. තුන් අයුරකින් ද්වෙෂය මවිසින් හළ, විහිට, මිදින, පැහින, තෙරින, උපුටා හරිණ ලද, මැනවින් උපුටා හරිණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

43. තුන් අයුරකින් මවිසින් මෝහය හළ, විහිට, මිදින, පැහින, තෙරින, උපුටා හරිණ ලද, මැනවින් උපුටා හරිණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

44. තුන් අයුරකින් රාගයෙන් මා සිත නො ඇවිරිනැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

45. තුන් අයුරකින් ද්වෙෂයෙන් මා සිත නොඇවිරිනැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

46. තුන් අයුරකින් මෝහයෙන් මා සිත නො ඇවිරිනැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි" යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි" යි සිත වෙයි. කීණුවහුට "මවිසින් මුසවා කියන ලද" යි සිත වෙයි.

47. සිවු අයුරකින් ... පස් අයුරකින් ... සායුරකින් ... සත් අයුරකින් මෝහයෙන් මා සිත නො වැසිනැයි දැන දැන මුසවා කියන්නහුට පරිජි-ඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කීණුවහුට මවිසින් "මුසවා කියන ලද"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවා-ගෙණය, භාවය සඟවාගෙණ යි.

**සුද්ධිකවාරය නිමි.**

---

1. තුන් අයුරකින් පළමුවන දැහැනට ද දෙවන දැහැනට ද සමවැදිමි .... සමවදිමි .... සමවැදුනෙමි .... පළමුවන දැහැන ද දෙවන දැහැන ද ලබනසුලු වෙමි ... වශීවෙමි .... මවිසින් පළමු දැහැන ද දෙවන දැහැන ද පසක් කරණ ලද යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

2. තුන් අයුරකින් පළමුවන දැහැනට ද තෙවන දැහැනට ද සමවැදිමි. සමවදිමි ... සම වැදුනෙමි ... පළමුවන දැහැන ද තෙවන දැහැන ද ලබනසුලු වෙමි ... වශිවෙමි. .... මා විසින් පළමුවන දැහැන ද තෙවන දැහැන ද පසක් කරණ ලද යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

3. තුන් අයුරකින් පළමුවන දැහැනට ද සිවුවන දැහැනට ද සමවත්මි ... සමවදිමි .... සමවැදුනෙමි .... පළමුවන දැහැන ද සිවුවන දැහැන ද ලබනසුලු වෙමි .... වශී වෙමි ... මවිසින් පළමුවන දැහැන ද සිවුවන දැහැන ද පසක් කරණ ලද යි දැන දැන මුසවා කියන්හුට පරිජිඇවැත් වේ. ....

4. තීහාකාරෙහි- පඨමඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච විමොක්ඛං, පඨමඤ්ච ඣානං අනිමිත්තඤ්ච විමොක්ඛං, පඨමඤ්ච ඣානං අප්පණිහිතඤ්ච විමොක්ඛං සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස අප්පණිහිතස්ස ච විමොක්ඛස්ස ලාභිම්හි, වසිම්හි, 'පඨමඤ්ච ඣානං අප්පණිහිතො ච විමොක්ඛො සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

5. තීහාකාරෙහි- පඨමඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච සමාධිං, පඨමඤ්ච ඣානං අනිමිත්තඤ්ච සමාධිං, පඨමඤ්ච ඣානං අප්පණිහිතඤ්ච සමාධිං සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස අප්පණිහිතස්ස ච සමාධිස්ස ලාභිම්හි, වසිම්හි, 'පඨමඤ්ච ඣානං අප්පණිහිතො ච සමාධි සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

6. තීහාකාරෙහි- පඨමඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච සමාපත්තිං, පඨමඤ්ච ඣානං අනිමිත්තඤ්ච සමාපත්තිං, පඨමඤ්ච ඣානං අප්පණිහිතඤ්ච සමාපත්තිං, සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස අප්පණිහිතාය ච සමාපත්තියා ලාභිම්හි, වසිම්හි, 'පඨමං ච ඣානං අප්පණිහිතා ච සමාපත්ති සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ- 1

7. තීහාකාරෙහි- පඨමං ච ඣානං තිස්සො ච විජ්ජා සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස තිස්සන්නං ච විජ්ජානං ලාභිම්හි, වසිම්හි, 'පඨමං ච ඣානං තිස්සො ච විජ්ජා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

8. තීහාකාරෙහි- පඨමං ච ඣානං චත්තාරො ච සතිපට්ඨානෙ, පඨමං ච ඣානං චත්තාරො ච සම්මප්පධානෙ, පඨමං ච ඣානං චත්තාරො ච ඉද්ධි-පාදෙ සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස චතුන්නඤ්ච ඉද්ධිපාදානං ලාභිම්හි, වසිම්හි, 'පඨමං ච ඣානං චත්තාරො ච ඉද්ධිපාදා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

9. තීහාකාරෙහි- පඨමං ච ඣානං පඤ්ච ච ඉන්ද්‍රියානි, පඨමං ච ඣානං පඤ්ච ච බලානි සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස පඤ්චන්නං ච බලානං ලාභිම්හි, වසිම්හි, 'පඨමං ච ඣානං පඤ්ච ච බලානි සච්ඡිකතානි මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

10. තීහාකාරෙහි- පඨමං ච ඣානං සත්ත ච බොජ්ඣඞ්ගෙ සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස සත්තන්නං ච බොජ්ඣඞ්ගානං ලාභිම්හි, වසිම්හි, 'පඨමං ච ඣානං සත්ත ච බොජ්ඣඞ්ගා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

11. තීහාකාරෙහි- පඨමං ච ඣානං අරියං ච අට්ඨඞ්ගිකං මග්ගං සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස අරියස්ස ච අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ලාභිම්හි, වසිම්හි, 'පඨමං ච ඣානං අරියො ච අට්ඨඞ්ගිකො මග්ගො සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

---

11—2. විහිඩාය භාවං මූ.

4. තුන් අයුරකින් පළමුවන දූහැනට ද සුඤ්ඤතවිමොක්ඛයට ද පළමුවන දූහැනට ද අනිමිත්තවිමොක්ඛයට ද පළමුවන දූහැනට ද අප්පණිහිත-විමොක්ඛයට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද අප්පණි-හිතවිමොක්ඛය ද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් පළමුවන දූහැන ද අප්පණිහිත විමොක්ඛය ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

5. තුන් අයුරකින් පළමුවන දූහැනට ද සුඤ්ඤතසමාධියට ද, පළමුවන දූහැනට ද අනිමිත්තසමාධියට ද, පළමුවන දූහැනට ද අප්පණිහිතසමාධියට ද, සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද අප්පණිහිතසමාධිය ද ලබනසුලු වෙමි. වශීවෙමි. මවිසින් පළමුවන දූහැන ද අප්පණිහිතසමාධිය ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

6. තුන් අයුරකින් පළමුවන දූහැනට ද සුඤ්ඤතසමාපත්තියට ද, පළමුවන දූහැනට ද අනිමිත්තසමාපත්තියට ද, පළමුවන දූහැනට ද අප්පණිහිතසමාපත්තියට ද සමවත්මි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද අප්පණිහිතසමාපත්තිය ද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් පළමුවන දූහැනද අප්පණිහිතසමාපත්තිය ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්හුට පරිජිඇවැත් වේ. ...

7. තුන් අයුරකින් පළමුවන දූහැනට ද ත්‍රිවිද්‍යාවන්ට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද ත්‍රිවිද්‍යාවන් ද ලබනසුලු වෙමි. වශීවෙමි, මවිසින් පළමුවන දූහැන ද ත්‍රිවිද්‍යා ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

8. තුන් අයුරකින් පළමුවන දූහැනට ද සතර සතිපට්ඨානයන්ට ද, පළමුවන දූහැනට ද, සතර සම්‍යක්පධන්වියඹියන්ට ද, පළමුවන දූහැනට ද, සතර ඍද්ධිපාදයන්ට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද සතර ඍද්ධිපාදයන් ද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් පළමුවන දූහැන ද සතර ඍද්ධිපාද ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

9. තුන් අයුරකින් පළමුවන දූහැනට ද සද්ධාදි පසිඳුරන්ට ද, පළමුවන දූහැනට ද පඤ්ච බලයන්ට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද පස්බල ද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් පළමුවන දූහැන ද පස්බල ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ....

10. තුන් අයුරකින් පළමුවන දූහැනට ද සත්තබොජ්ඣඞ්ගයන්ට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද සත්ත බොජ්ඣඞ්ග ද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් පළමුවන දූහැන ද සත්ත බොජ්ඣඞ්ග ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

11. තුන් අයුරකින් පළමුවන දූහැනට ද අරිඅටඟිමගට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දූහැන ද අරිඅටඟිමග ද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් පළමුවන දූහැන ද අරිඅටඟිමග ද පසක් කරණ ලදැයි දූන දූන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

12. තීහාකාරෙහි- පඨමං ච ඣානං සොතාපත්තිඵලං ච, පඨමං ච ඣානං සකදාගාමිඵලං ච, පඨමං ච ඣානං අනාගාමිඵලං ච, පඨමං ච ඣානං අරහත්තං ච සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස අරහත්තස්ස ච ලාභීම්හි, වසීම්හි, 'පඨමං ච ඣානං අරහත්තං ච සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

13. තීහාකාරෙහි- පඨමං ච ඣානං, සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස ලාභීම්හි, වසීම්හි, පඨමං ච ඣානං සච්ඡිකතං මයා, රාගො ච මෙ වන්තො, දොසො ච මෙ වන්තො, මොහො ච මෙ වන්තො, වන්තො, මුත්තො, පහීනො, පටිනිස්සට්ඨො, උක්ඛෙටිතො, සමුක්ඛෙටිතො,ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

14. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි- පඨමං ච ඣානං සමාපජ්ජිං, සමාපජ්ජාමි, සමාපන්නො, පඨමස්ස ච ඣානස්ස ලාභීම්හි, වසීම්හි, පඨමං ච ඣානං සච්ඡිකතං මයා, රාගා ච මෙ චිත්තං විනීවරණං, දොසා ච මෙ චිත්තං විනීවරණං, මොහා ච මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

ඛණ්ඩචක්කං නිට්ඨිතං.

---

1. තීහාකාරෙහි දුතියං ච ඣානං තතියං ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- දුතියස්ස ච ඣානස්ස තතියස්ස ච ඣානස්ස ලාභීම්හි- වසීම්හි- දුතියං ච ඣානං තතියං ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

2. තීහාකාරෙහි දුතියං ච ඣානං චතුත්ථං ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- දුතියස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස ලාභීම්හි-වසීම්හි- දුතියං ච ඣානං චතුත්ථං ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

3. තීහාකාරෙහි දුතියං ච ඣානං සුඤ්ඤතං ච විමොක්ඛං- අනිමිත්තං ච විමොක්ඛං- අප්පණිහිතං ච විමොක්ඛං- සුඤ්ඤතං ච සමාධිං- අනිමිත්තං ච සමාධිං- අප්පණිහිතං ච සමාධිං- සුඤ්ඤතං ච සමාපත්තිං- අනිමිත්තං ච සමාපත්තිං- අප්පණිහිතං ච සමාපත්තිං- තිස්සො ච විජ්ජා- චත්තාරො ච සතිපට්ඨානෙ- චත්තාරො ච සම්මප්පධානෙ- චත්තාරො ච ඉද්ධිපාදෙ- පඤ්ච ච ඉන්ද්‍රියානි- පඤ්ච ච බලානි- සත්ත ච බොජ්ඣඞ්ගෙ- අරියඤ්ච අට්ඨඞ්ගිකං මග්ගං- සොතාපත්තිඵලං ච- සකදාගාමිඵලං ච- අනාගාමිඵලං ච- අරහත්තං ච- සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- දුතියස්ස ච ඣානස්ස අරහත්තස්ස ච ලාභීම්හි- වසීම්හි- දුතියං ච ඣානං අරහත්තං ච සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

12. තුන් අයුරකින් පළමුවන දැහැනට ද සෝවාන් ඵලයට ද, පළමුවන දැහැනට ද සකදාගාමි ඵලයට ද, පළමුවන දැහැනට ද අනාගාමි ඵලයට ද, පළමුවන දැහැනට ද රහත්බවට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දැහැන ද රහත්බව ද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් පළමුවන දැහැන ද රහත්බව ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

13. තුන් අයුරකින් පළමුවන දැහැනට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දැහැන ද ලබනසුලු වෙමි, වශියෙමි, මවිසින් පළමුවන දැහැන ද පසක් කරණ ලදී, මවිසින් රාගය ද හළ, මවිසින් ද්වෙෂය ද හළ, මවිසින් මෝහය ද හළ, විගිට, මිදින, පැහින, නෙරින, උපුටා හරිණ ලද, හැම අයුරින් උපුටා හරිණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

14. තුන් අයුරකින් ... සත් අයුරකින් පළමුවන දැහැනට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, පළමුවන දැහැන ද ලබනසුලු වෙමි, වශියෙමි, මවිසින් පළමුවන දැහැන ද පසක් කරණ ලදී, මා සිත රාගයෙන් ද නිරාවරණය, මා සිත ද්වෙෂයෙන් ද, නිරාවරණය, මා සිත මෝහයෙන් ද, නිරාවරණයයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "බොරු කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "බොරු කියමි"යි සිත වෙයි. කිණුවහුට "මවිසින් බොරු කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්‍ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණ යි.

**ඛණ්ඩචක්‍රය නිමි.**

---

1. තුන් අයුරකින් දෙවන දැහැනට ද තෙවන දැහැනට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, දෙවන දැහැන ද තෙවන දැහැනද ලබනසුලු වෙමි, වශීවෙමි, මවිසින් දෙවන දැහැන ද තෙවන දැහැන ද පසක් කරණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

2. තුන් අයුරකින් දෙවන දැහැනට ද සිවුවන දැහැනට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, දෙවන දැහැන ද සිවුවන දැහැන ද ලබනසුලු වෙමි. වශී වෙමි, මවිසින් දෙවන දැහැන ද සිවුවන දැහැන ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

3. තුන් අයුරකින් දෙවන දැහැනට ද සුඤ්ඤතවිමොක්ඛයට ද, අනිමිත්තවිමොක්ඛයට ද, අප්පණිහිතවිමොක්ඛයට ද, සුඤ්ඤතසමාධියට ද, අනිමිත්තසමාධියට ද, අප්පණිහිතසමාධියට ද, සුඤ්ඤතසමාපත්තියට ද, අනිමිත්තසමාපත්තියට ද, අප්පණිහිතසමාපත්තියට ද, ත්‍රිවිද්‍යාවන්ට ද, සතර සතිපට්ඨානයන්ට ද, සතර සම්‍යක්ප්‍රධන්වීර්‍ය්‍යයන්ට ද, සතර සෘද්ධිපාදයන්ට ද, පඤ්චෙන්‍ද්‍රියන්ට ද, පඤ්චබලයන්ට ද, සත්ත බොජ්ඣඞ්ගයන්ට ද, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට ද, සෝවාන් ඵලයට ද, සකදාගාමි ඵලයට ද, අනාගාමි ඵලයට ද, අරහත් ඵලයට ද, සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, දෙවන දැහැන ද අරහත් ඵලය ද ලබනසුලු වෙමි, වශී වෙමි, මවිසින් දෙවන දැහැන ද අරහත් ඵලය ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

4. තීහාකාරෙහි දුතියං ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- දුතියස්ස ච ඣානස්ස ලාභීම්හි- වසීම්හි- දුතියං ච ඣානං සච්ඡිකතං මයා- රාගො ච මෙ චත්තො- දොසො ච මෙ චත්තො- මොහො ච මෙ චත්තො- වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො- සමුක්ඛෙටිතො රාගා ච මෙ චිත්තං විනීවරණං- දොසා ච මෙ චිත්තං විනීවරණං- මොහා ච මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

5. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි දුතියං ච ඣානං පඨමං ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- දුතියස්ස ච ඣානස්ස පඨමස්ස ච ඣානස්ස ලාභීම්හි- වසීම්හි- දුතියං ච ඣානං පඨමං ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

බද්ධචක්කං.

**එවං එකෙකං මූලං කාතූන බද්ධචක්කං[1] පරිවත්තකං කාතබ්බං.**

---

1. තීහාකාරෙහි තතියඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං -පෙ- තතියඤ්ච ඣානං අරහත්තඤ්ච සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- තතියස්ස ච ඣානස්ස අරහත්තස්ස ච ලාභීම්හි- වසීම්හි- තතියඤ්ච ඣානං අරහත්තඤ්ච සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

2. තීහාකාරෙහි තතියඤ්ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- තතියස්ස ච ඣානස්ස ලාභීම්හි- වසීම්හි- තතියඤ්ච ඣානං සච්ඡිකතං මයා- රාගො ච මෙ චත්තො- දොසො ච මෙ චත්තො- මොහො ච මෙ චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො. රාගා ච මෙ චිත්තං විනීවරණං- දොසා ච මෙ චිත්තං විනීවරණං- මොහා ච මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

3. තීහාකාරෙහි තතියඤ්ච ඣානං පඨමඤ්ච ඣානං -පෙ- තතියඤ්ච ඣානං දුතියඤ්ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- තතියස්ස ච ඣානස්ස දුතියස්ස ච ඣානස්ස ලාභීම්හි- වසීම්හි- තතියඤ්ච ඣානං දුතියඤ්ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

4. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමඤ්ච ඣානං -පෙ- දුතියඤ්ච ඣානං තතියඤ්ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං චතුත්ථස්ස ච ඣානස්ස ලාභීම්හි- වසීම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං චතුත්ථඤ්ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

---

1. චක්කං සිමු.

4. තුන් අයුරකින් දෙවන දැහැනට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි දෙවන දැහැන ද ලබනසුලු වෙමි, වශී වෙමි, මවිසින් දෙවන දැහැන ද පසක් කරණ ලදී, මවිසින් රාගයද හරණ ලදී, මවිසින් ද්වෙෂය ද හරණ ලදී, මවිසින් මොහය ද හරණ ලදී. විහිට, මිදින, පැහින, නෙරින, උපුටා හරිණ ලදී. මැනවින් උපුටා හරිණ ලදී. මා සිත රාගයෙන් ද නිරාවරණය, මා සිත ද්වෙෂයෙන් ද නිරාවරණය මා සිත මෝහයෙන් ද නිරාවරණයැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

5. තුන් අයුරකින් ... සත් අයුරකින් දෙවන දැහැනට ද පළමුවන දැහැනට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, දෙවන දැහැන ද පළමුවන දැහැන ද ලබනසුලු වෙමි, වශී වෙමි, මවිසින් දෙවන දැහැන ද පළමුවන දැහැන ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ, ...

**බද්ධචක්ක වාරයයි**

**මෙසේ එක එක මුල් කොට බද්ධචක්‍රය පරිවර්තනය කටයුතු යි.**

---

1. තුන් අයුරකින් තෙවන දැහැනට ද සිවුවන දැහැනට ද ... තුන්වන දැහැනට ද රහත් ඵලයට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, තුන්වන දැහැන ද රහත් ඵලය ද ලබනසුලු වෙමි, වශී වෙමි, මවිසින් තුන්වන දැහැන ද රහත් ඵලය ද පසක් කරණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

2. තුන් අයුරකින් තෙවන දැහැනට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි තෙවන දැහැන ද ලබනසුලු වෙමි, වශී වෙමි, මවිසින් තෙවන දැහැන ද පසක් කරණ ලදී, මවිසින් රාගය ද හරණ ලදී, මවිසින් ද්වෙෂය ද හරණ ලදී, මවිසින් මොහය ද හරණ ලදී, විහිට, මිදින, පැහින, නෙරින, උපුටා හරිණ ලදී, මැනවින් උපුටා හරිණ ලදී, මා සිත රාගයෙන් ද නිරාවරණය, මා සිත ද්වෙෂයෙන් ද නිරාවරණය, මා සිත මොහයෙන් ද නිරාවරණය යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

3. තුන් අයුරකින් තෙවන දැහැනට ද, පළමුවන දැහැනට ද, තෙවන දැහැනට ද, දෙවන දැහැනට ද, සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, තෙවන දැහැන ද දෙවන දැහැන ද ලබනසුලු වෙමි, වශී වෙමි. මා විසින් තෙවන දැහැන ද දෙවන දැහැන ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

4. තුන් අයුරකින් මා සිත මෝහයෙන් ද නිරාවරණය, පළමුවන දැහැනට ද ... දෙවන දැහැනට ද, තෙවන දැහැනට ද, සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, සිවුවන දැහැන ද ලබනසුලු වෙමි, වශී වෙමි. මා සිත මෝහයෙන් ද නිරාවරණය, මවිසින් සිවුවන දැහැන ද පසක් කරණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

5. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං සුඤ්ඤතඤ්ච විමොක්ඛං අනිමිත්තඤ්ච විමොක්ඛං අප්පණිහිතඤ්ච විමොක්ඛං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං, අප්පණිහිතස්ස ච විමොක්ඛස්ස ලාභිම්හි- වසිම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං අප්පණිහිතො ච විමොක්ඛො සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

6. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං සුඤ්ඤතඤ්ච සමාධිං අනිමිත්තඤ්ච සමාධිං අප්පණිහිතඤ්ච සමාධිං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං- අප්පණිහිතස්ස ච සමාධිස්ස ලාභිම්හි- වසිම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං අප්පණිහිතො ච සමාධි සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

7. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං සුඤ්ඤතඤ්ච සමාපත්තිං අනිමිත්තඤ්ච සමාපත්තිං අප්පණිහිතඤ්ච සමාපත්තිං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං- අප්පණිහිතාය ච සමාපත්තියා ලාභිම්හි- වසිම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං අප්පණි-හිතා ච සමාපත්ති සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

8. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං තිස්සො ච විජ්ජා සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං තිස්සන්නං ච විජ්ජානං ලාභිම්හි- වසිම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං තිස්සො ච විජ්ජා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

9. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං චත්තාරො ච සතිපට්ඨානෙ චත්තාරො ච සම්මප්පධානෙ චත්තාරො ච ඉද්ධිපාදෙ සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං චතුන්නංච ඉද්ධිපාදානං ලාභිම්හි- වසිම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං චත්තාරො ච ඉද්ධිපාදා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

10. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං පඤ්ච ච ඉන්ද්‍රියානි පඤ්ච ච බලානි සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං පඤ්චන්නඤ්ච බලානං ලාභිම්හි- වසිම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං පඤ්ච ච බලානි සච්ඡිකතානි මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

11. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං සත්ත ච බොජ්ඣඞ්ගෙ සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං සත්තන්නඤ්ච බොජ්ඣඞ්ගානං ලාභිම්හි- වසිම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං සත්ත ච බොජ්ඣඞ්ගා සච්ඡිකතා මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

5. තුන් අයුරකින් මා සිත මෝහයෙන් ද නිරාවරණය, සුඤ්ඤත-විමොක්ඛයට ද අනිමිත්තවිමොක්ඛයට ද අප්පණිහිතවිමොක්ඛයට ද සම-වැදිමි, සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, අප්ප-ණිහිතවිමොක්ඛය ද ලබනසුලුමි, වසියෙක්මි, මා සිත මොහයෙන් ද නිරාවරණය, මවිසින් අප්පණිහිතවිමොක්ඛය ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

6. තුන් අයුරකින් මා සිත මොහයෙන් ද නිරාවරණය, සුඤ්ඤතසමා-ධියට ද, අනිමිත්තසමාධියට ද, අප්පණිහිතසමාධියට ද, සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, අප්පණිහිතසමාධිය ද ලබනසුලු වෙමි, වශී වෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, මවිසින් අප්පණිහිතසමාධිය ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

7. තුන් අයුරකින් මා සිත මෝහයෙන් ද නිරාවරණය. සුඤ්ඤත සමා-පත්තියට ද, අනිමිත්තසමාපත්තියට ද, අප්පණිහිතසමාපත්තියට ද, සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, අප්පණිහිතසමාපත්තිය ද ලබනසුලු වෙමි, වශී වෙමි, මා සිත මොහයෙන් ද නිරාවරණය. මා විසින් අප්පණිහිතසමාපත්තිය ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

8. තුන් අයුරකින් මා සිත නිරාවරණය, මෝහයෙන් ද නිරාවරණය, ත්‍රිවිද්‍යාවන්ට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, ත්‍රිවිද්‍යාවන් ද ලබනසුලු වෙමි, වසියෙක්මි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, මා විසින් ත්‍රිවිද්‍යා ද පසක් කරණ ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ....

9. තුන් අයුරකින් මා සිත මෝහයෙන් ද නිරාවරණය, සතර සතිපට්ඨා-නයන්ට ද සතර සම්‍යක්පධන්වීර්‍ය්‍යයන්ට ද සතර ඍද්ධිපාදයන්ට ද සමවැදිමි. සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, සතර ඍද්ධිපාද-යන් ද ලබනසුලු වෙමි, වශී වෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, මවිසින් සතර ඍද්ධිපාද ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

10. තුන් අයුරකින් මා සිත මෝහයෙන් ද නිරාවරණය, සද්ධාදිපඤ්චෙ-න්ද්‍රියයන්ට ද පඤ්චබලයන්ට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, පඤ්චබලයන් ද ලබනසුලු වෙමි, වශී වෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, මා විසින් පඤ්චබල ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

11. තුන් අයුරකින් මා සිත මෝහයෙන් ද නිරාවරණය, සත්ත-බොජ්ඣඞ්ගයන්ට ද සමවැදිමි, සමවදිමි, සමවැදුනෙමි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, සත්තබොජ්ඣඞ්ගයන් ද ලබනසුලු වෙමි, වසියෙක්මි, මා සිත මෝහයෙන් ද නිරාවරණය, මවිසින් සත්තබොජ්ඣඞ්ග ද පසක් කරණ ලදැ යි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ....

12. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං අරියඤ්ච අට්ඨඞ්ගිකං මග්ගං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං අරියස්ස ච අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ලාභීම්හි- වසීම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං අරියො ච අට්ඨඞ්ගිකො මග්ගො සච්ඡිකතො මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

13. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං සොතාපත්තිඵලං ච සකදාගාමිඵලං ච අනාගාමිඵලං ච අරහත්තඤ්ච සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං අරහත්තස්ස ලාභීම්හි- වසීම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං අරහත්තඤ්ච සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස. -පෙ-

14. තීහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමං ච ඣානං සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො- මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමස්ස ච ඣානස්ස ලාභීම්හි- වසීම්හි- මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමං ච ඣානං සච්ඡිකතං මයා'ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ-

15. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි මොහා ච මෙ චිත්තං විනීවරණං දුතියං ච ඣානං -පෙ- තතියං ච ඣානං -පෙ- චතුත්ථං ච ඣානං -පෙ- සුඤ්ඤතං ච විමොක්ඛං -පෙ- දොසා ච මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ- පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති, භණන්තස්ස හොති 'මුසා භණාමී'ති, භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

### [1]එකමූලකං නිට්ඨිතං.

16. දුමූලකම්පි තිමූලකම්පි චතුමූලකම්පි පඤ්චමූලකම්පි ඡමූලකම්පි සත්තමූලකම්පි අට්ඨමූලකම්පි නවමූලකම්පි දසමූලකම්පි කාතබ්බං. යථා නික්ඛිත්තානි පදානි එකෙකමූලකං වඩ්ඪෙතබ්බං. යථා එකමූලකං විත්ථාරිතං එවමෙව දුමූලකාදී'පි විත්ථාරෙතබ්බං.

---

1. තීහාකාරෙහි -පෙ- සත්තාහාකාරෙහි පඨමං ච ඣානං දුතියං ච ඣානං තතියං ච ඣානං චතුත්ථං ච ඣානං සුඤ්ඤතං ච විමොක්ඛං අනිමිත්තඤ්ච විමොක්ඛං අප්පණිහිතං ච විමොක්ඛං සුඤ්ඤතං ච සමාධිං අනිමිත්තං ච සමාධිං අප්පණිහිතං ච සමාධිං සුඤ්ඤතං ච සමාපත්තිං අනිමිත්තං ච සමාපත්තිං අප්පණිහිතං ච සමාපත්තිං තිස්සො ච විජ්ජා චත්තාරො ච සතිපට්ඨානෙ චත්තාරො ච සම්මප්පධානෙ චත්තාරො ච ඉද්ධිපාදෙ පඤ්ච ච ඉන්ද්‍රියානි පඤ්ච ච බලානි සත්ත ච බොජ්ඣඞ්ගෙ අරියඤ්ච අට්ඨඞ්ගිකං මග්ගං සොතාපත්තිඵලඤ්ච සකදාගාමිඵලඤ්ච අනාගාමිඵලඤ්ච අරහත්තඤ්ච සමාපජ්ජිං- සමාපජ්ජාමි- සමාපන්නො -පෙ- රාගො ච මෙ චත්තො දොසො ච මෙ චත්තො මොහො ච මෙ චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො, රාගා ච මෙ චිත්තං විනීවරණං, දොසා ච මෙ චිත්තං විනීවරණං, මොහා ච මෙ චිත්තං විනීවරණන්ති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාරාජිකස්ස -පෙ- පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

### සබ්බමූලකං නිට්ඨිතං

### සුද්ධිකවාරකථා නිට්ඨිතා.

---

1. එකමූලකං සඞ්ඛිත්තං නිට්ඨිතං. සතා

12. තුන් අයුරකින් මා සිත මොහයෙන් ද නිරාවරණය, අරිඅටගිමගට ද සමවැදිමි— සමවදිමි— සමවැදුනෙමි— මා සිත මොහයෙන් ද නිරාවරණය, අරිඅටගිමග ද ලබනසුලු වෙමි— වශී වෙමි— මා සිත මොහයෙන් ද නිරාවරණය මවිසින් අරිඅටගි මග ද පසක් කරණ ලද සි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

13. තුන් අයුරකින් මා සිත මොහයෙන් ද නිරාවරණය, සෝවාන් ඵලයට ද සකෘදගාමිඵලයට ද අනාගාමිඵලයට ද රහත්ඵලයට ද සමවැදිමි— සමවදිමි— සමවැදුනෙමි— මා සිත මොහයෙන් ද නිරාවරණය, රහත්ඵලය ලබනසුලු වෙමි— වශී වෙමි— මා සිත මොහයෙන් ද නිරාවරණය, මවිසින් රහත් ඵලය ද පසක් කරණ ලද සි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. ...

14. තුන් අයුරකින් මා සිත මොහයෙන් ද නිරාවරණය, ප්‍රථමධ්‍යානයට ද සමවැදිමි— සමවදිමි— සමවැදුනෙමි— මා සිත මොහයෙනුදු නිරාවරණය, ප්‍රථමධ්‍යානය ලබනසුලු ද වෙමි— වශී වෙමි— මොහයෙනුදු මා සිත නිරාවරණය, මා විසින් ප්‍රථමධ්‍යානය ද පසක් කරන ලදැයි දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ.

15. තුන් අයුරකින් ... සත් අයුරකින් මා සිත මොහයෙන් ද නිරාවරණය ද්විතීයධ්‍යානයට ද ... තෘතීයධ්‍යානයට ද ... චතුර්ථධ්‍යානයට ද ... සුඤ්ඤත-විමොක්ඛයට ද ... ද්වේෂයෙන් ද නිරාවරණය සි දැන දැන මුසවා කියන්න හුට පරිජිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි" සි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"සි සිත වෙයි. කිණුවහුට මවිසින් මුසවා කියන ලදැයි සිත වෙයි. දෘෂ්ටිය සඟවාගෙණය, ක්ෂාන්තිය සඟවාගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණයි.

### එක මූලකය නිමි.

16. දුමූලකය ද තිමූලකය ද චතුමූලකය ද පඤ්චමූලකය ද ඡමූලකය ද සත්තමූලකය ද අට්ඨමූලකය ද නව මූලකය ද දසමූලකය ද (විස්තර) කටයුතු සි. නික්ෂිප්තපද ඇතිසැටියෙන් එකී එකී මූලකය වැඩිය යුතු සි. යම්සේ එකමූලකය විස්තාර කරණ ලද්දේද එපරිද්දෙන් ම දුමූලකාදිය ද විස්තර කට යුතුයි.

———

1. තුන් අයුරකින් .... සත් අයුරකින් පළමුවන දැහැනට ද දෙවන දැහැනට තෙවන දැහැනට ද සිවුවන දැහැනට ද සුඤ්ඤතවිමොක්ඛයට ද අනිමිත්ත-විමොක්ඛයට ද අප්පණිහිතවිමොක්ඛයට ද සුඤ්ඤත සමාධියට ද අනිමිත්ත-සමාධියට ද අප්පණිහිතසමාධියට ද සුඤ්ඤතසමාපත්තියට ද අනිමිත්ත සමාපත්තියට ද අප්පණිහිතසමාපත්තියට ද ත්‍රිවිද්‍යාවන්ට ද සතර සතිපට්ඨානයන්ට ද සතර සම්‍යක්පධන්වීර්‍යයන්ට ද සතර ඍද්ධිපාදයන් ට ද පඤ්චෙන්ද්‍රියයන්ට ද පඤ්චබලයන්ට ද සත්තබොජ්ඣඞ්ගයන්ට ද අරිඅටගි-මගට ද සෝවාන්ඵලයට ද සකෘදගාමිඵලයට ද අනාගාමිඵලයට ද රහත්-ඵලයට ද සමවැදිමි— සමවදිමි— සමවැදුනෙමි. .... මවිසින් රාගය ද හරණ ලදී. මවිසින් ද්වේෂය ද හරණලදී. මා විසින් මෝහය ද හරණ ලදී. වමාරණ ලදී. මුදන ලදී. පහකරණ ලදී. බැහැර කරණ ලදී. උපුටාහරිණ ලදී. සවාරෙන් උපුටාහරිණ ලදී. මා සිත රාගයෙන් ද නිරාවරණය. මා සිත ද්වේෂයෙන් ද නිරාවරණය, සිත මෝහයෙන් ද නිරාවරණය, දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ: පෙරම ඔහුට "මුසවා කියන්නෙමි"සි සිත වෙයි, කියන්නහුට "මුසවා කියමි"සි සිත වෙයි, කිණුවහුට මවිසින් "මුසවා කියන ලදැ"සි සිත වෙයි, දෘෂ්ටිය සඟවාගෙණය, ක්ෂාන්තිය සඟවා-ගෙණය, රුචිය සඟවාගෙණය, භාවය සඟවාගෙණයි.

### සබ්බමූලකය නිමි.

### සුද්ධිකවාර කථාව නිමි.

1. තීහාකාරෙහි 'පඨමං ඣානං සමාපජ්ජි'න්ති වත්තුකාමො 'දුතියං ඣානං සමාපජ්ජි'න්ති සම්පජානමුසාභණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස; න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

2. තීහාකාරෙහි 'පඨමං ඣානං සමාපජ්ජි'න්ති වත්තුකාමො 'තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- සුඤ්ඤතං විමොක්ඛං -පෙ- අනිමිත්තං විමොක්ඛං -පෙ- අප්පණිහිතං විමොක්ඛං -පෙ- සුඤ්ඤතං සමාධිං -පෙ- අනිමිත්තං සමාධිං -පෙ- අප්පණිහිතං සමාධිං -පෙ- සුඤ්ඤතං සමාපත්තිං -පෙ- අනිමිත්තං සමාපත්තිං -පෙ- අප්පණිහිතං සමාපත්තිං -පෙ- තිස්සො විජ්ජා -පෙ- චත්තාරො සතිපට්ඨානෙ -පෙ- චත්තාරො සම්මප්පධානෙ -පෙ- චත්තාරො ඉද්ධිපාදෙ -පෙ- පඤ්චින්ද්‍රියානි -පෙ- පඤ්ච බලානි -පෙ- සත්ත බොජ්ඣඞ්ගෙ -පෙ- අරියං අට්ඨඞ්ගිකං මග්ගං -පෙ- සොතාපත්තිඵලං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තං සමාපජ්ජිං -පෙ- රාගො මෙ චත්තො -පෙ- දොසො මෙ චත්තො -පෙ- මොහො මෙ චත්තො, වන්තො, මුත්තො, පහීනො, පටිනිස්සට්ඨො, උක්ඛෙටිතො, සමුක්ඛෙටිතො -පෙ- රාගා මෙ චිත්තං විනීවරණං -පෙ- දොසා මෙ චිත්තං විනීවරණං -පෙ- මොහා මෙ චිත්තං විනීවරණ'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, -පෙ- විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

**වත්තුකාමවාරකස්ස[1] එකමූලකස්ස ඛණ්ඩචක්කං.**

---

1. තීහාකාරෙහි 'දුතියං ඣානං සමාපජ්ජි'න්ති වත්තුකාමො 'තතියං ඣානං සමාපජ්ජි'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස; න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

2. තීහාකාරෙහි 'දුතියං ඣානං සමාපජ්ජි'න්ති වත්තුකාමො -පෙ- මොහා මෙ චිත්තං විනීවරණ'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස; න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

---

1. වත්තුවිස්සාරකස්ස. සී. මජ්සං. ස්‍යා. වත්තුවිස්සාරකස්ස, සී.මු

1. තුන් අයුරකින් 'පළමුවන දැහැනට සමවැදිමි'යි කියනු කැමැත්තේ 'දෙවන දැහැනට සමවැදිමි'යි දත්නා පුහුලක්හු වෙත දැන දැන මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නො දත්තක්හු වෙත කියන්නහුට ථුලැසි-ඇවැත් වේ.

2. තුන් අයුරකින් 'පළමුවන දැහැනට සමවත්මි'යි කියනු කැමැත්තේ 'තෙවන දැහැනට ... සිවුවන දැහැනට ... සුඤ්ඤතවිමොක්ඛයට ... අනිමිත්ත-විමොක්ඛයට ... අප්පණිහිතවිමොක්ඛයට ... සුඤ්ඤතසමාධියට ... අනිමිත්ත-සමාධියට ... අප්පණිහිත සමාධියට ... සුඤ්ඤතසමාපත්තියට ... අනිමිත්ත-සමාපත්තියට ... අප්පණිහිතසමාපත්තියට ... ත්‍රිවිද්‍යාවට ... සතරසතිපට්ඨා-නයට...සතර සම්‍යක්ප්‍රධානයන්ට ... සතර ඍද්ධිපාදයට ... පඤ්චඉන්‍ද්‍රියන්ට ... පඤ්චබලයන්ට... සත්තබොජ්ඣඞ්ගයන්ට...අරිඅටඟිමඟට...සෝවාන් ඵලයට... සකෘදාගාමි ඵලයට ... අනාගාමි ඵලයට ... රහත්බවට සමවැදිමි. ... මවිසින් රාගය හරණලද ... මවිසින් ද්වෙෂය හරණ ලද ... මවිසින් මොහය හරණ ලද. විගතාන්ත:කරනලද. මුදනලද. පහ කරණලද. බැහැර කරණලද. උපුටා හරිණලද. හැමඅයුරින් උපුටා හරිණලද. මා සිත රාගයෙන් නිරාවරණය. ... මා සිත ද්වෙෂයෙන් නිරාවරණය ... මා සිත මොහයෙන් නිරාවරණයයි. දැනගන්නකු වෙත දැන දැන මුසවා කියන්නහුට පරිජිඇවැත් වේ. නො දැනගන්නකු වෙත කියන්නකුට ථුලැසිඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මා විසින් "මුසවා කියන ලද්"යි සිත වෙයි. ... දෘෂ්ටිය-ක්‍ෂාන්තිය-රුචිය-භාවය සඟවාගෙණයි.

**කියනු කැමතිවූ එය සඳහන් නොකරන්නාහු පිළිබඳ**

**එකමූලකඛණ්ඩවක්‍රය නිමි.**

---

1. තුන් අයුරකින් 'දෙවන දැහැනට සමවැදිමි'යි කියනු කැමැත්තේ 'තෙවන දැහැනට සමවත්මි'යි දත්නා පුහුලක්හු වෙත දැන දැන මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නොදත්තක්හු වෙත කියන මහණහට ථුලැසිඇවැත් වේ.

2. තුන් අයුරකින් 'දෙවන දැහැනට සමවත්මි'යි කියනු කැමැත්තේ ... 'මා සිත මොහයෙන් නිරාවරණය'යි දත්නා පුහුලක්හු වෙත දැන දැන මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නො දත්තක්හු වෙත කියන මහණහට ථුලැසිඇවැත් වේ.

3. තිහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි 'දුතියං ඣානං සමාපජ්ජි'න්ති වත්තුකාමො 'පඨමං ඣානං සමාපජ්ජි'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස; න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස -පෙ- විනිධාය භාවං.

**වත්ථුවිසාරකස්ස එකමූලකස්ස ඛණ්ඩචක්කං.**

---

### මූලකං සඞ්ඛිත්තං.

1. තිහාකාරෙහි 'මොහා මෙ චිත්තං විනීවරණ'න්ති වත්තුකාමො 'පඨමං ඣානං සමාපජ්ජි'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස; න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

2. තිහාකාරෙහි 'මොහා මෙ චිත්තං විනීවරණ'න්ති වත්තුකාමො 'දොසා මෙ චිත්තං විනීවරණ'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස; න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

**වත්ථුවිසාරකස්ස එකමූලකං නිට්ඨිතං.**

3. දුමූලකම්පි තිමූලකම්පි චතුමූලකම්පි පඤ්චමූලකම්පි ඡමූලකම්පි සත්තමූලකම්පි අට්ඨමූලකම්පි නවමූලකම්පි දසමූලකම්පි එවමෙව කාතබ්බං.

---

### ඉදං සබ්බමූලකං.

1. තිහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි 'පඨමඤ්ච ඣානං දුතියඤ්ච ඣානං තතියඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච විමොක්ඛං අනිමිත්තඤ්ච විමොක්ඛං අප්පණිහිතඤ්ච විමොක්ඛං සුඤ්ඤතඤ්ච සමාධිං අනිමිත්තඤ්ච සමාධිං අප්පණිහිතඤ්ච සමාධිං සුඤ්ඤතඤ්ච සමාපත්තිං අනිමිත්තඤ්ච සමාපත්තිං අප්පණිහිතඤ්ච සමාපත්තිං තිස්සො ච විජ්ජා චත්තාරො ච සතිපට්ඨානෙ චත්තාරො ච සම්මප්පධානෙ චත්තාරො ච ඉද්ධිපාදෙ පඤ්ච ච ඉන්ද්‍රියානි පඤ්ච ච බලානි සත්ත ච බොජ්ඣඞ්ගෙ අරියඤ්ච අට්ඨඞ්ගිකං මග්ගං සොතාපත්තිඵලඤ්ච සකදාගාමිඵලඤ්ච අනාගාමිඵලඤ්ච අරහත්තඤ්ච සමාපජ්ජිං -පෙ- රාගො ච මෙ වන්තො -පෙ- දොසො ච මෙ වන්තො -පෙ- මොහො ච මෙ වන්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො, රාගා ච මෙ චිත්තං විනීවරණං, දොසා ච මෙ චිත්තං විනීවරණං, මොහා මෙ චිත්තං විනීවරණ'න්ති වත්තුකාමො, සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස: -පෙ- විනිධාය භාවං.

3. තුන් අයුරකින් ... සත් අයුරකින් 'දෙවන දැහැනට සමවන්මි'යි කියනු කැමැත්තේ 'පළමුවන දැහැනට සමවත්මි'යි දන්නක්හු වෙත දැන දැන මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නො දන්නා පුඟුලක්හු වෙත කියන මහණහට ථුලැසිඇවැත් වේ. ... භාවය සඟවාගෙණයි.

**කියනු කැමැති වැ එය සඳහන් නොකරන්නහුගේ එකමූලක බද්ධචක්‍රයයි.**

---

**මූලකය සංඤ්ඤිපත සි.**

1. **තුන් අයුරකින් 'මා සිත මොහයෙන් නිරාවරණය'යි කියනු කැමැත්තේ 'පළමුවන දැහැනට සමවැදිමි'යි දන්නක්හු වෙත දැන දැන මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නො දන්නකුට කියන මහණහට ථුලැසිඇවැත් වේ.**

2. තුන් අයුරකින් 'මා සිත මොහයෙන් නිරාවරණය'යි කියනු කැමැත්තේ 'මා සිත ද්වෙෂයෙන් නිරාවරණය'යි දන්නා පුඟුලක්හු වෙත දැන දැන මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නොදන්නක්හු වෙත කියන මහණහට ථුලැසිඇවැත් වේ.

**කියනු කැමති වැ එය සඳහන් නොකරන්නහුගේ එකමූලකය නිමි.**

3. දිමූලකය ද, තිමූලකය ද, චතුමූලකය ද, පඤ්චමූලකය ද, ඡමූලකය ද, සත්තමූලකය ද, අට්ඨමූලකය ද, නවමූලකය ද, දසමූලකය ද මෙසේ ම විස්තර කටයුතු සි.

---

**මේ සබ්බමූලකය සි.**

1. තුන් අයුරකින් ... සත් අයුරකින් 'පළමුවන දැහැනට ද දෙවන දැහැනටද තෙවන දැහැනට ද සිවුවන දැහැනට ද සුඤ්ඤතවිමොක්ඛයට ද අනිමිත්තවිමොක්ඛයට ද අප්පණිහිතවිමොක්ඛයට ද සුඤ්ඤත සමාධියට ද අනිමිත්තසමාධියට ද අප්පණිහිතසමාධියට ද සුඤ්ඤතසමාපත්තියට ද අනිමිත්තසමාපත්තියට ද අප්පණිහිතසමාපත්තීයට ද ත්‍රිවිද්‍යාවට ද සතර සතිපට්ඨානයට ද, සතර සම්‍යක් පධන්වීර්‍ය්‍යයන්ට ද සතර ඍද්ධිපාදයන්ට ද පඤ්චඉන්ද්‍රියන්ට ද පඤ්චබලයන්ට ද සත්තබොජ්ඣඞ්ගයන්ට ද අරිඅටඟිමගට ද සොවාන් ඵලයට ද සකදාගාමි ඵලයට ද අනාගාමි ඵලයට ද රහත් බවට ද සමවැදිමි. ... මවිසින් රාගය ද හරණ ලද. මා විසින් ද්වෙෂය ද හරණ ලද. මා විසින් මොහය ද හරණ ලද. විගතානතකරණ ලද. මුදන ලද. පහකරණ ලද. බැහැර කරණ ලද. උපුටා හරිණ ලද. හැම අයුරින් උපුටා හරිණ ලද. 'මා සිත රාගයෙන් ද නිරාවරණය. මා සිත ද්වෙෂයෙන්ද නිරාවරණය'යි කියනු කැමැත්තේ, 'මා සිත මොහයෙන් ද නිරාවරණය'යි දන්නකුට දැන දැන මුසවා කියන 'මහණහට පරිජිඇවැත් වේ. නො දන්නකුට කියන මහණහට ථුලැසිඇවැත් වේ. ... භාවය සඟවාගෙණ සි.

2. තීහාකාරෙහි 'දුතියස්ස ඣානං තතියස්ස ඣානං චතුත්ථස්ස ඣානං සුඤ්ඤතස්ස විමොක්ඛං අනිමිත්තස්ස විමොක්ඛං අප්පණිහිතස්ස විමොක්ඛං සුඤ්ඤතස්ස සමාධිං අනිමිත්තස්ස සමාධිං අප්පණිහිතස්ස සමාධිං සුඤ්ඤතස්ස සමාපත්තිං අනිමිත්තස්ස සමාපත්තිං අප්පණිහිතස්ස සමාපත්තිං තිස්සො ච විජ්ජා චත්තාරො ච සතිපට්ඨානෙ චත්තාරො ච සම්මප්පධානෙ චත්තාරො ච ඉද්ධිපාදෙ පඤ්ච ච ඉන්ද්‍රියානි පඤ්ච ච බලානි සත්ත ච බොජ්ඣඞ්ගෙ අරියස්ස අට්ඨඞ්ගිකං මග්ගං සොතාපත්තිඵලං ච සකදාගාමිඵලං ච අනාගාමිඵලං ච අරහත්තං ච සමාපජ්ජිං, රාගො ච මෙ වන්තො, දොසො ච මෙ වන්තො, මොහො ච මෙ වන්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො, රාගා ච මෙ චිත්තං විනීවරණං, දොසා ච මෙ චිත්තං විනීවරණං, 'මොහා ච මෙ චිත්තං විනීවරණ'න්ති වත්තුකාමො 'පඨමං ඣානං සමාපජ්ජි'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

3. තීහාකාරෙහි 'තතියස්ස ඣානං චතුත්ථං ච ඣානං -පෙ- මොහා ච මෙ චිත්තං විනීවරණං -පෙ- පඨමස්ස ඣානං සමාපජ්ජි'න්ති වත්තුකාමො 'දුතියං ඣානං සමාපජ්ජි'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

4. තීහාකාරෙහි 'මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමස්ස ඣානං දුතියස්ස ඣානං තතියස්ස ඣානං චතුත්ථස්ස ඣානං -පෙ- රාගා ච මෙ චිත්තං විනීවරණ'න්ති වත්තුකාමො: 'දොසා ච මෙ චිත්තං විනීවරණ'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාරාජිකස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස: පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති -පෙ- විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

**සබ්බමූලකං.**

**වත්ථුවිසාරකස්ස එකූනපඤ්ඤාසං නිට්ඨිතං.**

**වත්තුකාමවාරකථා නිට්ඨිතා.**

---

1. තීහාකාරෙහි 'යො තෙ විහාරෙ වසි, සො භික්ඛු පඨමං ඣානං සමාපජ්ජි, සමාපජ්ජති, සමාපන්නො, සො භික්ඛු පඨමස්ස ඣානස්ස ලාභී, වසී, තෙන භික්ඛුනා පඨමං ඣානං සච්ඡිකත'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස; න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස: පුබ්බෙවස්ස[1] හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති.

1. පුබ්බෙවස්සාදිපාඨො මජසං. නත්ථි.

2. තුන් අයුරකින් 'දෙවන දූහැනට ද තෙවන දූහැනට ද සිවුවන දූහැනට ද සුඤ්ඤතවිමොක්ඛයට ද අනිමිත්තවිමොක්ඛයට ද අප්පණිහිත-විමොක්ඛයට ද සුඤ්ඤතසමාධියට ද අනිමිත්තසමාධියට ද අප්පණිහිත-සමාධියට ද සුඤ්ඤතසමාපත්තියට ද අනිමිත්තසමාපත්තියට ද අප්පණිහිත-සමාපත්තියට ද ත්‍රිවිද්‍යාවට ද සතර සතිපට්ඨානයට ද සතර සම්මප්පධා-නයන්ට ද සතර ඍද්ධිපාදයන්ට ද පඤ්චඉන්ද්‍රියයන්ට ද පඤ්චබලයන්ට ද සත්තබොජ්ඣඞ්ගයන්ට ද අරිඅටඟිමගට ද සොවාන්ඵලයට ද සකදාගාඵලයට ද අනාගාමිඵලයට ද රහත්බවට ද සමවැදිමි. මා විසින් රාගය ද හරණ ලද. මා විසින් ද්වේෂය ද හරණ ලද. මා විසින් මොහය ද හරණ ලද. විහිව. මිදින. පැහින. තෙරිණ උපුල. මෑනවින් උපුල. මා සිත රාගයෙන් අනීවරණය. මා සිත ද්වේෂයෙන් අනාවරණය. මා සිත මොහයෙන් නිරාවරණය'යි කියනු කැමැත්තේ 'පළමුවන දූහැනට සමවැදිමි'යි දන්නකුට දූත දූත මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නොදන්නකුට කියන මහණට ථුල්ලසිඇවැත් වේ.

3. තුන් අයුරකින් තෙවන දූහැනට ද සිවුවන දූහැනට ද ... මා සිත මොහයෙන් ද නිරාවරණය. ... පළමුවන දූහැනට ද සමවැදිමි යි කියනු කැමැත්තේ දෙවන දූහැනට සමවැදිමි යි දන්නෙකුට දූත දූත මුසවා කියන මහණහට පරිජිඇවැත් වේ. නොදන්නකුට කියන මහණහට ථුල්ලසි-ඇවැත් වේ.

4. තුන් අයුරකින් 'මා සිත මොහයෙන් ද නිරාවරණය' පළමුවන දූහැනට ද දෙවන දූහැනට ද තෙවන දූහැනට ද සිවුවන දූහැනට ද ... මා සිත රාගයෙන් ද නිරාවරණයයි කියනු කැමැත්තේ මා සිත ද්වේෂයෙන් නිරාවරණය'යි දන්නකු හමුයෙහි දූත දූත මුසවා කියන මහණහට පරිජි-ඇවැත් වේ. නො දන්නකු හමුයෙහි කියන මහණහට ථුල්ලසිඇවැත් වේ. පෙර ම ඔහුට 'මුසවා කියන්නෙමි'යි සිත වෙයි. කියන මහණහට 'මුසවා කියමි'යි සිත වෙයි. කිණුවහුට 'මා විසින් මුසවා කියන ලද'යි සිත වෙයි. ... දෘෂ්ටිය – ඛන්තිය – රුචිය – භාවය සඟවාගෙණයි.

සබ්බමූලකය යි.

**කියනු කැමැති වැ එය සඳහන් නො කරන්නහුගේ වත්ථුපෙය්‍යාලය නිමි.**

**වත්ථුකාමවාර කථාව නිමි.**

---

1. තුන් අයුරකින් 'යම් මහණෙක් තොප විහාරයෙහි විසී ද ඒ මහණ තෙමේ පළමුවන දූහැනට සමවැදිනි. සමවදියි. සමවැදුනේ වෙ යි; ඒ මහණ පළමුවන දූහැන ලාභියෙක. වශියෙක. ඒ මහණ විසින් පළමුවන දූහැන පසක් කරණ ලද'යි දන්නකු හමුයෙහි දූත දූත මුසවා කියන මහණහට ථුල්ලසි-ඇවැත් වේ. නො දන්නකු හමුයෙහි කියන මහණහට දුකුළුඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මා විසින් "මුසවා කියන ලද"යි සිත වෙයි.

2. චතුහාකාරෙහි -පෙ- පඤ්චහාකාරෙහි -පෙ- ඡහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි යො තෙ විහාරෙ වසි, සො භික්ඛු 'පඨමං ඣානං සමාපජ්ජි සමාපජ්ජති, සමාපන්නො, සො භික්ඛු පඨමස්ස ඣානස්ස ලාභී, වසී, තෙන භික්ඛුනා පඨමං ඣානං සච්ඡිකත'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති, දුක්කටස්ස, පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති "මුසා භණාමී"ති, භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

3. තීහාකාරෙහි 'යො තෙ විහාරෙ වසි සො භික්ඛු දුතියං ඣානං— තතියං ඣානං — චතුත්ථං ඣානං — සුඤ්ඤතං විමොක්ඛං — අනිමිත්තං විමොක්ඛං — අප්පණිහිතං විමොක්ඛං — සුඤ්ඤතං සමාධිං — අනිමිත්තං සමාධිං — අප්පණිහිතං සමාධිං — සුඤ්ඤතං සමාපත්තිං — අනිමිත්තං සමාපත්තිං — අප්පණිහිතං සමාපත්තිං — තිස්සො විජ්ජා — චත්තාරො සතිපට්ඨානෙ — චත්තාරො සම්මප්පධානෙ — චත්තාරො ඉද්ධිපාදෙ — පඤ්ච ඉන්ද්‍රියානි — පඤ්ච බලානි — සත්ත බොජ්ඣඞ්ගෙ — අරියං අට්ඨඞ්ගිකං මග්ගං — සොතාපත්තිඵලං — සකදාගාමිඵලං — අනාගාමිඵලං — අරහත්තං — සමාපජ්ජි — සමාපජ්ජති — සමාපන්නො — සො භික්ඛු අරහත්තස්ස ලාභී — වසී — තෙන භික්ඛුනා අරහත්තං සච්ඡිකත'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස.

4. තීහාකාරෙහි 'තස්ස භික්ඛුනො රාගො චත්තො- දොසො චත්තො- මොහො චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො'ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස.

5. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි තස්ස භික්ඛුනො රාගා චිත්තං විනීවරණං- දොසා චිත්තං විනීවරණං- මොහා චිත්තං විනීවරණ'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස, පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති, භණන්තස්ස හොති, "මුසා භණාමී"ති, භණිතස්ස හොති, "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

6. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි 'යො තෙ විහාරෙ වසි, සො භික්ඛු සුඤ්ඤාගාරෙ පඨමං ඣානං- දුතියං ඣානං- තතියං ඣානං- චතුත්ථං ඣානං සමාපජ්ජි- සමාපජ්ජති- සමාපන්නො- -පෙ- සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී, වසී, තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකත'න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස, පුබ්බෙවස්ස හොති "මුසා භණිස්ස"න්ති භණන්තස්ස හොති "මුසා භණාමී"ති භණිතස්ස හොති "මුසා මයා භණිත"න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

2. සිවු අයුරකින් ... පස් අයුරකින් ... සඅයුරකින් ... සත් අයුරකින් 'යම් මහණෙක් තොප විහාරයෙහි විසී ද ඒ මහණ තෙමේ පළමුවන දැහැනට සමවැදිනි, සමවදියි, සමවැදුනෝ වෙයි. ඒ මහණ ප්‍රථමධ්‍යාන ලාභිය, වශිය, ඒ මහණ විසින් පළමුවන දැහැන පසක් කරණ ලද'යි දන්නකු හමුයෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලැසිඇවැත් වේ. නොදන්නකු හමුයෙහි කියන මහණහට දුකුලාඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කියුවහුට මා විසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය - ක්‍ෂාන්තිය - රුචිය - භාවය සඟවාගෙණ ය.

3. තුන් අයුරකින් 'යම් මහණෙක් තොප විහාරයෙහි විසී ද ඒ මහණ දෙවන දැහැනට — තෙවන දැහැනට — සිවුවන දැහැනට — සුඤ්ඤතවිමොක්ඛයට — අනිමිත්තවිමොක්ඛයට — අප්පණිහිතවිමොක්ඛයට — සුඤ්ඤතසමාධියට — අනිමිත්තසමාධියට — අප්පණිහිතසමාධියට — සුඤ්ඤතසමාපත්තියට — අනිමිත්ත සමාපත්තියට — අප්පණිහිතසමාපත්තියට — ත්‍රිවිද්‍යාවට — සතර සතිපට්ඨානයන්ට — සතර සම්මප්පධානයන්ට — සතර ඉද්ධිපාදයන්ට — පඤ්ච ඉන්ද්‍රියයන්ට — පඤ්ච බලයන්ට — සත්තබොජ්ඣඞ්ගයට — අරිඅටඟිමගට — සෝවාන් ඵලයට — සකදාගාමිඵලයට — අනාගාමිඵලයට — රහත්බවට සමවැදිනි. සමවදියි. සමවැදුනෝ වෙයි. ඒ මහණ තෙමේ අර්හත්ව ලාභියෙක. වශියෙකි. ඒ මහණ විසින් රහත් බව පසක් කරණ ලද'යි දන්නකු හමුයෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලැසිඇවැත් වේ. නො දන්නකු හමුයෙහි කියන මහණහට දුකුලා ඇවැත් වේ.

4. තුන් අයුරකින් 'ඒ මහණහු විසින් රාගය හරණ ලද ... ද්වේෂය හරණ ලද ... මෝහය හරණ ලද. විහිට. මිදින. පැහින. නෙරිණ. උපුල. මැනවින් උපුලැයි දන්නකු හමුයෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලැසිඇවැත් වේ. නොදන්නකු හමුයෙහි කියන මහණහට දුකුලා-ඇවැත් වේ.

5. තුන් අයුරකින් ... සත් අයුරකින් ඒ මහණහුගේ සිත රාගයෙන් නීරාවරණය ... සිත ද්වේෂයෙන් නීරාවරණය ... සිත මෝහයෙන් නිරාවරණයයි දන්නකු හමුයෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලැසිඇවැත් වේ. නො දන්නකු හමුයෙහි කියන මහණහට දුකුලාඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කියුවහුට මා විසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය — ක්‍ෂාන්තිය — රුචිය — භාවය සඟවාගෙණ ය.

6. තුන් අයුරකින් ... සත් අයුරකින් 'යම් මහණෙක් තොප විහාරයෙහි විසී ද ඒ මහණ ශූන්‍යාගාරයෙහි පළමුවන දැහැනට ... දෙවන දැහැනට ... තෙවන දැහැනට ... සිවුවන දැහැනට සමවැදිනි. සමවදියි ... සමවැදුනෝ වෙයි. ... ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යාන ලාභියෙක වශියෙකි. ඒ මහණ විසින් ශූන්‍යාගාරයෙහි සිවුවන දැහැන පසක් කරණ ලද'යි දන්නකු හමුයෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලැසිඇවැත් වේ. නොදන්නකු හමුයෙහි කියන මහණහට දුකුලාඇවැත් වේ. පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි. කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කියුවහුට මා විසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය — ක්‍ෂාන්තිය — රුචිය — භාවය සඟවාගෙණ ය.

7. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි ‘යො තෙ විහාරං පරිභුඤ්ජි. යො තෙ චීවරං පරිභුඤ්ජි, යො තෙ පිණ්ඩපාතං පරිභුඤ්ජි, යො තෙ සෙනාසනං පරිභුඤ්ජි, යො තෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජි, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සමාපජ්ජි- සමාපජ්ජති- සමාපන්නො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී, වසී. තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකත’න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස. -පෙ-

8. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි ‘යෙන තෙ විහාරො පරිභුත්තො. යෙන තෙ චීවරං පරිභුත්තං, යෙන තෙ පිණ්ඩපාතො පරිභුත්තො, යෙන තෙ සෙනාසනං පරිභුත්තං, යෙන තෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො පරිභුත්තො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සමාපජ්ජි- සමාපජ්ජති- සමාපන්නො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී, වසී. තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකතන්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස. -පෙ-

9. තීහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි ‘යං ත්වං ආගම්ම විහාරං අදාසි, චීවරං අදාසි, පිණ්ඩපාතං අදාසි, සෙනාසනං අදාසි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අදාසි, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සමාපජ්ජි- සමාපජ්ජති- සමාපන්නො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී, වසී. තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකත’න්ති සම්පජානමුසා භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස. පුබ්බෙවස්ස හොති “මුසා භණිස්ස”න්ති, භණන්තස්ස හොති “මුසා භණාමී”ති, භණිතස්ස හොති මුසා මයා භණිත’න්ති විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං. විනිධාය රුචිං, විනිධාය භාවං.

පෙය්‍යාලපණ්ණරසකං නිට්ඨිතං.

පච්චයපටිසංයුත්තවාරකථා නිට්ඨිතා.

උත්තරිමනුස්සධම්මචක්කපෙය්‍යාලං නිට්ඨිතං.

---

අනාපත්ති අධිමානෙන, අනුල්ලපනාධිප්පායස්ස, උම්මත්තකස්ස, ඛිත්තචිත්තස්ස, වෙදනාට්ටස්ස, ආදිකම්මිකස්සාති.

7. තුන් අයුරකින් ... 'සත් අයුරකින් යම් මහණෙක් තොපගේ විහාරය පරිභොග කෙළේ ද, යම් මහණෙක් තොපගේ සිවුරු පරිභොග කෙළේ ද, යමෙක් තොපගේ පිණ්ඩපාතය පරිභොග කෙළේ ද, යමෙක් තොපගේ සෙනසුන පරිභොග කෙළේ ද, යමෙක් තොපගේ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කෙළේ ද ඒ මහණ තෙමේ ශූන්‍යාගාරයෙහි සිවුවන දැහැනට සමවැදිනි. ... සමවදියි. සමවැදුනේ වෙයි. ඒ මහණ තෙමේ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානලාභියෙක, වසියෙකි, ඒ මහණ විසින් ශූන්‍යාගාරයෙහි සිවුවන දැහැන පසක් කරණ ලද'යි දන්නකු හමුවෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලසිඇවැත් වේ. නොදන්නහු හමුවෙහි කියන මහණහට දුකුළාඇවැත් වේ. ...

8. තුන් අයුරකින් ... 'සත් අයුරකින් යම් මහණකු විසින් තොප විහාරය පරිභොග කරණ ලද ද, යමකු විසින් තොපගේ සිවුරු පරිභොග කරණ ලද ද, යමකු විසින් තොපගේ පිණ්ඩපාතය පරිභොග කරණ ලද ද, යමකු විසින් තොපගේ සෙනසුන පරිභොග කරණ ලද ද යමකු විසින් තොපගේ ගිලන්පස බෙහෙත් පිරිකර පරිභොග කරණ ලද ද ඒ මහණ ශූන්‍යාගාරයෙහි සිවුවන දැහැනට සමවැදිනි. ... සමවදියි. ... සමවැදුනේ වෙයි. ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානලාභිය. වසියෙකි. ඒ මහණහු විසින් ශූන්‍යාගාරයෙහි සිවුවන දැහැන පසක් කරණ ලද'යි දන්නකු හමුවෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලසිඇවැත් වේ. නො දන්නකු හමුවෙහි කියන මහණහට දුකුළාඇවැත් වේ. ...

9. තුන් අයුරකින් ... 'සත් අයුරකින් තෝ යම් මහණකු වෙත පැමිණ විහාරය පිදුවෙහි ද, සිවුරු පිදුවෙහි ද, පිඩු පිදුවෙහි ද, සෙනසුනක් පිදුවෙහි ද, ගිලන්පස බෙහෙත් පිරිකර පිදුවෙහි ද, ඒ මහණ තෙමේ ශූන්‍යාගාරයෙහි සිවුවන දැහැනට සමවැදිනි. ... සමවදියි. ... සමවැදුනේ වෙයි. ඒ මහණ තෙමේ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානලාභිය, වසියෙකි, ඒ මහණහු විසින් ශූන්‍යාගාරයෙහි සිවුවන දැහැන පසක් කරණ ලද'යි දන්නකු හමුවෙහි දැන දැන මුසවා කියන මහණහට ථුල්ලසිඇවැත් වේ. නො දන්නකු හමුවෙහි කියන මහණහට දුකුළාඇවැත් වේ: පෙර ම ඔහුට "මුසවා කියන්නෙමි"යි සිත වෙයි, කියන්නහුට "මුසවා කියමි"යි සිත වෙයි. කිණුවහුට මා විසින් "මුසවා කියන ලදැ"යි සිත වෙයි. දෘෂ්ටිය—ක්‍ෂාන්තිය—රුචිය—භාවය සඟවා ගෙණ යි.

**පෙය්‍යාලපණ්ණරසකය නිමි.**

**ප්‍රත්‍යයප්‍රතිසංයුක්තවාරකථාව නිමි.**

**උතුරු මිනිස්දම් පිළිබඳ චක්කපෙය්‍යාලය නිමි.**

---

අධිමානයෙන් කියන්නහුට ද උතුරුමිනිස්දම් නො කියැවී මහණහට ද උමතුවූවහුට ද පෙරළි සිත් ඇත්තහුට ද වෙදනාවෙන් පෙළුනහුට ද ආදිකම්මිකයාට ද ඇවැත් නො වේ.

# විනීතවත්ථු

**උද්දානගාථා.**

අධිමානෙන[1] 'රඤ්ඤම්හි පිණ්ඩොපජ්ඣාරියාපථො,
සඤ්ඤොජනා රහො ධම්මා විහාරෙ පච්චුපට්ඨිතො.

න දුක්කරං විරියමථොපි මච්චුනො භායාවුසො විප්පටිසාරි සම්මා,
විරියෙන යොගෙන ආරාධනාය අථ වෙදනාය අපරෙ දුවෙ.

බ්‍රාහ්මණෙ පඤ්චවත්ථූනි අඤ්ඤබ්‍යාකරණා තයො,
අගාරාවරණා කාමා රති චාපි ච පක්කමො.

අට්ඨිපෙසි උභො ගාවො ඝාතකා පිණ්ඩො සාකුණිකො නිච්ඡවොරබ්භි
අසි ච සූකරි සත්ති මාගවි උසු ච කාරණිකො සූචි සාරථි.

යො ච සිබ්බීයති සූචකො හි සො අණ්ඩභාරී අහු ගාමකූටකො,
කූපෙ නිමුග්ගො හි සො පාරදාරිකො ගූථඛාදී අහු දුට්ඨබ්‍රාහ්මණො.

නිච්ඡවිත්ථී අතිචාරිනී අහු මඞ්ගුලිත්ථී අහු ඉක්ඛණිත්ථිකා,
ඔකිලිනී සපත්තඞ්ගාරොකිරි සීසච්ඡිනො අහු චොරඝාතකො.

භික්ඛු භික්ඛුණී සික්ඛමානා සාමණෙරො අථ සාමණෙරිකා,
කස්සපස්ස විනයස්ස පබ්බජුං පාපකම්මමකරිංසු තාවදෙ.

තපොදා රාජගහෙ යුද්ධං නාගානොගාහනෙන ච,
සොභිතො අරහං භික්ඛු පඤ්ච කප්පසතං සරෙති.

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අධිමානෙන අඤ්ඤං ව්‍යාකාසි. තස්ස කුක්කුච්චං අහොසි: 'භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං, කච්චි නු ඛො අහං පාරාජිකං ආපත්තිං ආපන්නො'ති. අථ ඛො සො භික්ඛු භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- අනාපත්ති භික්ඛු අධිමානෙනාති. (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පණිධාය අරඤ්ඤෙ විහරති "එවං මං ජනො සම්භාවෙස්සතී"ති. තං ජනො සම්භාවෙසි. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; න ච භික්ඛවෙ පණිධාය අරඤ්ඤෙ වත්ථබ්බං, යො වසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා'ති. (2)

# විනිශ්චිතවස්තු

**උද්දානගාථා**

අධිමානෙන ය, අරඤ්ඤම්හි ය, පිණ්ඩ යයි වස්තු තුණෙක, උපජ්ඣාය වස්තු දෙකය, ඉරියාපථ වස්තු සතර ය, සංයොජන වස්තු ය, රහොධම්ම වස්තු දෙක ය, විහාරවස්තු ය, පච්චුපට්ඨිත (උපට්ඨිත) වස්තු ය.

තදුක්කර වස්තු ය, විරිය වස්තු ය, මච්චු වස්තුව ය, විප්පටිසාරි වස්තු ය, සම්මාපයුත්ත වස්තු ය, ආරද්ධවිරිය වස්තු ය, යුත්තයොග ආරාධන වස්තු ය, වැලිදු අතික් වෙදනා වස්තු දෙක ය.

බ්‍රාහමණවස්තු පසෙක, අඤ්ඤබ්‍යාකරණ වස්තු තුණ ය, අගාරාවරණ වස්තුව ය, කාමාවරණ වස්තු ය, අභිරති වස්තු ය, පක්කම වස්තු ය.

අට්ඨි- පෙසි ගොඝාතක වස්තු දෙක ය, මංසපිණ්ඩ සාකුණික වස්තු ය.

නිච්ඡවිඔරබ්භික වස්තු ය, අසිලොමසූකරිකවස්තු ය, සත්තිලොම් මාගවික වස්තු ය, උසුලොම කාරණික වස්තු ය, සූචිලොම සාරථි වස්තු ය.

යමෙක් සූචියෙන් මැසේ ද ඒ සූචක වස්තු ය, අණ්ඩභාරී ගාමකූටක වස්තු ය, ගූථකූපයෙහි නිමග්ග පාරදාරික වස්තු ය, ගූථඛාදී දුෂ්ට බ්‍රාහමණ වස්තු ය.

නිච්ඡවිඅතිචාරිණී වස්තු ය, මඞ්ගුලීඉක්ඛණිකා වස්තු ය. ඔකිලිනී සපත්තඞ්ගාරා වස්තු ය, සීසච්ඡින්න චොරඝාතක වස්තු ය.

භික්ඛු ය, භික්ඛුණී ය, සික්ඛමානා ය, සාමණෙර ය, සාමණෙරී ය යන මොහු කසුප් බුදු සස්නෙහි පැවිදිවූවාහු එකල්හි පව් කළාහු ය. ඔවුන්ගේ වස්තු ය.

තපොදය, රාජගහයුද්ධය, නාගාතොගාහනය, රහත් වූ සොභිත මහණ පන්සිය කපක් සිහිකෙරෙයි යන මේ වස්තු දසයි විනීතවස්තු සැටකි.

1. එසමයෙහි එක්තරා මහණෙක් අධිමානයෙන් අර්හත්ත්වය ප්‍රකාශ කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. "භාග්‍යවතුන් වහන්සේ විසින් සිකපද පණවන ලදී. කිම? මම පරිජිඇවැත් අවත්තෙම් දෝ"යි ඉක්බිති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැළ කෙළේ ය. ... මහණ අධිමානයෙන් කියන්නහුට ඇවැත් නො වේ. (1)

2. එසමයෙහි එක්තරා මහණෙක් බුහුමන් පතා වෙනෙහි වෙසෙයි "ජන තෙමේ මට සම්භාවනා කරන්නේ"යි. ජන තෙමේ ඒ මහණහට සම්භාවනා කෙළේ ය. ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැළ කෙළේ ය. ... මහණ පරිජිඇවැත් නො වේ. මහණෙනි, බුහුමන් පතා වෙනෙහි නො විසිය යුතුයි. යමෙක් වෙසේ නම් දුකුළාඇවැත් වේ. (2)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පණිධාය පිණ්ඩාය චරති "එවං මං ජනො සම්භාවෙස්සතී"ති. තං ජනො සම්භාවෙසි. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි-පෙ-අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. න ච භික්ඛවෙ පණිධාය පිණ්ඩාය චරිතබ්බං. යො චරෙය්‍ය ආපත්ති දුක්කටස්සාති. (3)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං එතදවොච: "යෙ ආවුසො අම්හාකං උපජ්ඣායස්ස සද්ධිවිහාරිකා සබ්බෙව අරහන්තො"ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි. -පෙ- කිංචිත්තො ත්වං භික්ඛූති? උල්ලපනාධිප්පායො අහං භගවාති. අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සාති. (4)

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං භික්ඛුං එතදවොච: "යෙ ආවුසො අම්හාකං උපජ්ඣායස්ස අන්තෙවාසිකා සබ්බෙව මහිද්ධිකා මහානුභාවා"ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- කිංචිත්තො ත්වං භික්ඛූති. උල්ලපනාධිප්පායො අහං භගවාති. අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සාති. (5)

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පණිධාය චඞ්කමති — පණිධාය තිට්ඨති — පණිධාය නිසීදති — පණිධාය සෙය්‍යං කප්පෙති "එවං මං ජනො සම්භාවෙස්සතී"ති. තං ජනො සම්භාවෙසි. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස. න ච භික්ඛවෙ පණිධාය -පෙ- සෙය්‍යා කප්පෙතබ්බා. යො කප්පෙය්‍ය, ආපත්ති දුක්කටස්සාති. (6-9)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරස්ස භික්ඛුනො උත්තරිමනුස්සධම්මං උල්ලපති. සොපි එවමාහ: "මය්හම්පි ආවුසො සඤ්ඤොජනා පහීනා"ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි. -පෙ- ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (10)

8. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රහොගතො උත්තරිමනුස්සධම්මං උල්ලපති. පරචිත්තවිදූ භික්ඛු තං භික්ඛුං අපසාදෙසි: "මා ආවුසො එවරූපං අභණි. නත්ථෙසො තුය්හ"න්ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති දුක්කටස්සාති. (11)

9 තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රහොගතො උත්තරිමනුස්සධම්මං උල්ලපති. දෙවතා තං භික්ඛුං අපසාදෙසි: "මා භන්තෙ එවරූපං අභණි. නත්ථෙසො තුය්හ"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති දුක්කටස්සාති. (12)

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං උපාසකං එතදවොච: 'යො ආවුසො තුය්හං විහාරෙ වසති, සො භික්ඛු අරහා'ති. සො ච තස්ස විහාරෙ වසති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- කිංචිත්තො ත්වං භික්ඛූති? "උල්ලපනාධිප්පායො අහං භගවා"ති. අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සාති. (13)

3. එසමයෙහි එක්තරා මහණෙක් බුහුමන් පතා පිඩු පිණිස හැසිරෙයි "මෙසේ ජනතෙමේ මට සම්භාවනා කරන්නේ"යි. ජනතෙමේ ඒ මහණහට සම්භාවනා කෙළේ ය. ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේ ය. ... මහණ පරිජිඇවැත් නො වේ. මහණෙනි, බුහුමන් පතා පිඩු පිණිස නො ද හැසිරිය යුතුයි. යමෙක් හැසිරේ නම් දුකුලාඇවැත් වේ. (3)

4. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා මහණකුට මෙය කී ය: "ඇවැත්නි, අපගේ උපාධ්‍යායයන් වහන්සේගේ යම් සද්ධිවිහාරිකයෝ වෙද්ද, ඒ සියල්ලෝ ම රහත්හු"යි ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේ ය. ... මහණ, තෝ කෙබඳු සිතැත්තෙහි ද? "භාග්‍යවතුන් වහන්ස, මම හුවා දක්වනු රිසියෙමි"යි. මහණ, පරිජි-ඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (4)

5. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා මහණකුට මෙය කී ය: "ඇවැත්නි, අපගේ උපාධ්‍යායන් වහන්සේගේ යම් අතැවැස්සෝ වෙද්ද ඒ සියල්ලෝ ම මහත් සෘද්ධි ඇත්තෝ ය. මහත් ආනුභාව ඇත්තෝ"යි. ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේ ය. ... මහණ, තෝ කෙබඳු සිතැත්තෙහිදැ යි. 'භාග්‍යවතුන් වහන්ස, මම හුවා දක්වනු රිසියෙමි'යි. මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (5)

6. එසමයෙහි එක්තරා මහණෙක් බුහුමන් පතා සක්මන් කෙරෙයි — බුහුමන් පතා සිටියි- බුහුමන් පතා හිඳියි- බුහුමන් පතා හොවියි "ජනතෙමේ මෙසේ මට සම්භාවනා කරන්නේය"යි. ජනතෙමේ ඔහුට සම්භාවනා කෙළේ ය. ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේ ය. ... මහණ, පරිජිඇවැත් නො වේ. මහණෙනි, බුහුමන් පතා ... ශයනය නො කට යුතුයි. යමෙක් ශයනය කරන්නේ නම් දුකුලාඇවැත් වේ. (6-9)

7. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා මහණකුට උතුරුමිනිස්දම් පවසයි. හෙ තෙමේ ද මෙසේ කියයි. "ඇවැත මාගේ දස සංයොජනයෝ ප්‍රහීණයහ"යි. ඔහුට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේ ය. ... මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහි ය. (10)

8. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා මහණකුට රහසිගතව උතුරුමිනිස්දම් පවසයි. පරසිත් දත්තා ඒ මහණ තෙමේ තෙල මහණහට ගැරහී ය: ඇවැත, මෙබන්දක් තහමක් කියව. 'තෙල උතුරුමිනිස්දම තට නැත, ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේ ය. ... මහණ, පරිජිඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ. (11)

9. එසමයෙහි එක්තරා මහණෙක් රහසිගතව උතුරුමිනිස්දම් පවසයි. දෙවියෙක් ඒ මහණහට ගැරහී ය: 'වහන්ස, මෙබන්දක් තහමක් කියව. ඔබට එබන්දක් නැත. ඒ මහණහට කුකුස් විය. ... මහණ, පරිජි-ඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ. (12)

10. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා උවසුවකුහට මෙසේ කීය. ඇවැත, යමෙක් තොපගේ වෙහෙර වෙසේ ද, ඒ මහණතෙමේ රහතෙකි. හෙතෙමේ ද ඔහුගේ වෙහෙර වෙසෙයි. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ කෙබඳු සිතැත්තෙහි ද? භාග්‍යවතුන් වහන්ස, "මම උතුරුමිනිස්-දහම් එළවා දක්වනු රිසියෙමි"යි. මහණ, පරිජිඇවැත් නොවේ. ථුල්ලසිඇවැත් වේ. (13)

**11.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරං උපාසකං එතදවොච: “යං ත්වං අවුසො උපට්ඨෙසි චීවරපිණ්ඩපාතසෙනාසනගිලාන-පච්චය[1] භෙසජ්ජපරික්ඛාරෙන, සො භික්ඛු අරහා”ති. සො ච තං උපට්ඨෙති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය[1] භෙසජ්ජපරික්ඛාරෙන. තස්ස කුක්කු-ච්චං අහොසි -පෙ- කිඤ්චිත්තො ත්වං භික්ඛූ?ති. “උල්ලපනාධිප්පායො අහං භගවා”ති. අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සාති. (14)

**12.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: “ආයස්මතො උත්තරිමනුස්සධම්මො”ති. “න ආවුසො දුක්කරං අඤ්ඤං බ්‍යාකාතු”න්ති තස්ස කුක්කුච්චං අහොසි. යෙ ඛො තෙ භගවතො සාවකා තෙ එවං වදෙය්‍යුං: “අහඤ්චම්හි න භගවතො සාවකො. කච්චි නු ඛො අහං පාරාජිකං ආපත්තිං ආපන්නො”ති. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- කිඤ්චිත්තො ත්වං භික්ඛූති? “අනුල්ලපනාධිප්පායො අහං භගවා”ති. අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (15)

**13.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: “ආයස්මතො උත්තරිමනුස්සධම්මො”ති. “ආරාධනීයො ඛො ආවුසො ධම්මො ආරද්ධවිරියෙනා”ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි. -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (16)

**14.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: “මා ඛො ආවුසො භායී”ති. “නාහං ආවුසො මච්චුනො භායාමී”ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනා-ධිප්පායස්සාති. (17)

**15.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: “මා ඛො ආවුසො භායී”ති. “යො නූනාවුසො විප්පටිසාරී අස්ස, සො භායෙය්‍යා”ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (18)

**16.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: “ආයස්මතො උත්තරිමනුස්සධම්මො”ති. “ආරාධනීයො ඛො ආවුසො ධම්මො සම්මාපයුත්තෙනා”ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (19)

**17.** තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: “ආයස්මතො උත්තරිමනුස්සධම්මො”ති. “ආරාධනීයො ඛො ආවුසො ධම්මො ආරද්ධවිරියෙනා”ති. තස්ස කුක්කුච්චං අහොසි. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පා-යස්සාති. (20)

---

1. ගිලානප්පච්චය, මජසං.

11. එසමයෙහි එක්තරා මහණෙක් එක්තරා උවසුවකුහට මෙසේ කීය: 'යමකුට තෝ සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් උවැටන් කෙරෙහි ද? ඒ මහණතෙමේ රහතෙකි.' හෙතෙමේ ඒ මහණහට සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරින් උවැටන් කෙරෙයි. ඒ මහණහට කුකුස් විය. ... මහණ, කෙබඳු සිතැත්තෙහි ද? භාග්‍යවතුන් වහන්ස, මම උතුරුමිනිස්දම් එළවා දක්වන රිසියෙමි. මහණ, පරිජිඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ. (14)

12. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙය කීහු: "ආයුෂමත්හට උතුරුමිනිස්දම් ඇද්ද යි" ඇවැත, අභිතාවය ප්‍රකාශ කරන්නට දුෂ්කර නො වෙයි. ඒ මහණහට කුකුස් විය. භාග්‍ය-වතුන් වහන්සේගේ යම් ඒ සවුවෝ වෙද්ද, ඔහු මෙසේ කියන්නාහ: "මම වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සවුවෙක් නො වෙමි. කිමෙක් ද? මම පරිජිඇවැත් අවන්නෙම් ද?"සි, භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේය. "මහණ, තෝ කෙබඳු සිතැත්තෙහි" ද? "භාග්‍යවතුන් වහන්ස, මම තහමක් උතුරුමිනිස්දම් එළවා දක්වනු රිසියෙමි"සි, මහණ, තහමක් හුවා දක්වන රිසියහුට ඇවැත් නො වේ. (15)

13. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙසේ කීහ: 'ආයුෂමත්හට උතුරුමිනිස්දම් ඇද්ද'සි. ඇවැත්නි, උතුරුමිනිස්දම ඇරඹූ වෙර ඇත්තහු විසින් ඇරයිය හැක්කේ ය. ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේය. .... මහණ, තහමක් උතුරුමිනිස්දම් එළවා දක්වන රිසියහුට ඇවැත් නො වේ. (16)

14. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙය කීහ: 'ඇවැත, නොබා'සි. 'ඇවැත, මම මරුට නොබාම්'සි. ඒ මහණහට කුකුස් විය. මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (17)

15. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙය කීහ: 'ඇවැත, නොබා'සි. 'ඇවැත්නි, යමෙක් ඒකාන්තයෙන් පිළිසර-වන්නේ නම් හෙතෙමේ බන්නේය'සි. ඒ මහණහට කුකුස් විය. .... මහණ, තහමක් හුවා දක්වන රිසියහුට ඇවැත් නො වේ. (18)

16. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙය කීහ: "ආයුෂමත්හට උතුරුමිනිස්දම් ඇද්ද"සි. "ඇවැත්නි, උතුරු-මිනිස්දම මනා පිළිවෙතෙහි යෙදුනහු විසින් ඇරයිය හැක්කේ ම ය." ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේය. -පෙ- මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (19)

17. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙය කීහු: 'ආයුෂමත්හට උතුරුමිනිස්දම් ඇද්ද'සි. 'ඇවැත්නි, ඇරඹූ වෙර ඇත්තහු විසින් උතුරුමිනිස්දම් ඇරයිය හැක්කේ ම ය.' ඒ මහණහට කුකුස් විය. -පෙ- මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (20).

18. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: "අත්ථායස්මතො උත්තරිමනුස්සධම්මො"ති. "ආරාධනීයො ඛො ආවුසො ධම්මො යුත්තයොගෙනා"ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (21)

19. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: "කච්චාවුසො ඛමනීයං, කච්චි යාපනීය"න්ති. "නාවුසො සක්කා යෙන වා තෙන වා අධිවාසෙතු"න්ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (22)

20. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. තං භික්ඛූ එතදවොචුං: "කච්චාවුසො ඛමනීයං කච්චි යාපනීය"න්ති. "නාවුසො සක්කා පුථුජ්ජනෙන අධිවාසෙතු"න්ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- කිංචිත්තො ත්වං භික්ඛූති? "උල්ලපනාධිප්පායො අහං භගවා"ති. අනාපත්ති භික්ඛු පාරාජිකස්ස; ආපත්ති ථුල්ලච්චයස්සාති. (23)

21. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො බ්‍රාහ්මණො භික්ඛූ නිමන්තෙත්වා එතදවොච: "ආයන්තු භොන්තො අරහන්තො"ති. තෙසං කුක්කුච්චං අහොසි, "මයඤ්චම්හ අනරහන්තො.[1] අයඤ්ච බ්‍රාහ්මණො අම්හෙ අරහන්තවාදෙන සමුදාචරති. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- අනාපත්ති භික්ඛවෙ පසාදභඤ්ඤෙති. (24)

22. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො බ්‍රාහ්මණො භික්ඛූ නිමන්තෙත්වා එතදවොච: "නිසීදන්තු භොන්තො අරහන්තො"ති. -පෙ- "භුඤ්ජන්තු භොන්තො අරහන්තො"ති. -පෙ- "තප්පන්තු[2] භොන්තො අරහන්තො"ති. -පෙ- ගච්ඡන්තු භොන්තො අරහන්තො"ති. තෙසං කුක්කුච්චං අහොසි: මයඤ්චම්හ අනරහන්තො. අයඤ්ච බ්‍රාහ්මණො අම්හෙ අරහන්තවාදෙන සමුදාචරති. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- අනාපත්ති භික්ඛවෙ පසාදභඤ්ඤෙති. (25-28)

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරස්ස භික්ඛුනො උත්තරිමනුස්සධම්මං උල්ලපති. සොපි එවමාහ: "මය්හම්පි ආවුසො ආසවා පහීනා"ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (29)

24. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරස්ස භික්ඛුනො උත්තරිමනුස්සධම්මං උල්ලපති. සොපි එවමාහ: "මය්හම්පි ආවුසො එතෙ ධම්මා සංවිජ්ජන්තී"ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (30)

25. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අඤ්ඤතරස්ස භික්ඛුනො උත්තරිමනුස්සධම්මං උල්ලපති. සොපි එවමාහ: "අහම්පාවුසො තෙසු ධම්මෙසු සන්දිස්සාමී"ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (31)

---

1. න අරහන්තො. සීමු. 2. තප්පෙන්තු. ඛඤුසු.

18. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙය කීහු: ‘ආයුෂමත්හට උතුරුමිනිස්දම් ඇද්ද’යි. ඇවැත්නි, උතුරු-මිනිස්දම් භාවනාවෙහි යෙදුනහු විසින් ඇරැසිය හැක්කේ ම ය. ඒ මහණහට කුකුස් විය -පෙ- මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (21)

19. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මේ කීහු: ‘ඇවැත, කිම, ඉවසිය හැකිද’යි, කිම, යැපිය හැකිද’යි, ඇවැත්නි, යම්තමකු විසින් ඉවසන්නට නොහැකිය. ඒ මහණහට කුකුස් විය. … මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (22)

20. එසමයෙහි එක්තරා මහණෙක් ගිලන් වෙයි. භික්ෂූහු ඒ මහණහට මෙය කීහ: ඇවැත්නි, කිම, ඉවසිය හැකි ද, කිම, යැපියහැකි ද’යි. ඇවැත්නි, පුහුදුන් විසින් ඉවසන්නට නො හැකිය. ඒ මහණහට කුකුස් විය. … ‘මහණ, තෝ කෙබඳු සිතැත්තෙහි ද?යි භාග්‍යවතුන් වහන්ස, උල්ලපනාධිප්‍රාය ඇතියෙමියි, මහණ, පරිජිඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (23)

21. එසමයෙහි එක්තරා බමුණෙක් භික්ෂූන් පවරා මෙය කීය: “භවත් රහත්හු වඩිත්වා”යි, ඒ භික්ෂූන්ට කුකුස් විය. අපි වනාහි නො රහතුම්හ. මේ බමුණු තෙමේ අපට අරහන්තවාදයෙන් ව්‍යවහාර කෙරෙයි. අප විසින් කෙසේ පිළිපැදිය යුතු ද? භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැළ කළහ. … මහණෙනි, පහන් සිතින් කිණීමෙහි ඇවැත් නො වේ. (24)

22. එසමයෙහි එක්තරා බමුණෙක් භික්ෂූන් පවරා මෙය කීය. “භවත් රහත්හු වැඩ හිඳින සේක්වා”යි … “භවත් රහත්හු වළඳන සේක්වා”යි … “භවත් රහත්හු තෘප්ත වෙත්වා”යි … “භවත් රහත්හු යන සේක්වා”යි. ඒ භික්ෂූන්ට කුකුස් විය. අපි වනාහි නො රහතුම්හ. මේ බමුණුතෙමේ අපට අරහත්වාදයෙන් කථා කරයි. අප විසින් කෙසේ නම් පිළිපැදිය යුතුද’යි, භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළාහුය. … මහණෙනි, පහන් සිතින් කිණීමෙහි ඇවැත් නො වේ. (25-28)

23. එසමයෙහි එක්තරු මහණෙක් එක්තරු මහණකුට උතුරුමිනිස්-දම් පවසයි. හෙ තෙමේ ද මෙසේ කීය: “ඇවැත, මාගේ ද ආශ්‍රවයෝ ප්‍රහීණයහ”යි, ඒ මහණහට කුකුස් විය. … මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහිය. (29)

24. එසමයෙහි එක්තරු මහණෙක් එක්තරු මහණකුට උතුරුමිනිස්දම් පවසයි. හෙ තෙමේ ද මෙසේ කීය: “ඇවැත, මාගේ ද තෙල උතුරු-මිනිස්දම් විද්‍යමාන වේ”යි. ඒ මහණහට කුකුස් විය. … මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහිය. (30)

25. එසමයෙහි එක්තරු මහණෙක් එක්තරු මහණකුට උතුරුමිනිස්දම් පවසයි. හෙ තෙමේ ද මෙසේ කීය. “ඇවැත මම ද තෙල උතුරුමිනිස්-දම්හි පැණෙන්නෙමි”යි ඒ මහණහට කුකුස් විය. … මහණ, තෝ පරිජිඇවැත් අවත්තෙහිය. (31)

26. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරං භික්ඛුං ඤාතකා එතදවොචුං: එහි භන්තෙ අගාරං අජ්ඣාවසාති." "අභබ්බො ඛො ආවුසො මාදිසො අගාරං අජ්ඣාවසිතු"න්ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (32)

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරං භික්ඛුං ඤාතකා එතද-වොචුං: "එහි භන්තෙ, කාමෙ පරිභුඤ්ජා"ති. "ආවටා මෙ ආවුසො කාමා"ති. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පා-යස්සාති. (33)

28. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරං භික්ඛුං ඤාතකා එතද වොචුං: "අභිරමසි භන්තෙ"ති. "අභිරතො අහං ආවුසො පරමාය අභිරතියා"ති. තස්ස කුක්කුච්චං අහොසි. 'යෙ ඛො තෙ භගවතො සාවකා තෙ එවං වදෙය්‍යුං: අහඤ්චම්හි න භගවතො සාවකො, කච්චි නු ඛො අහං පාරාජිකං ආපත්තිං ආපන්නො"ති. භගවතො එතමත්ථං ආරොචෙසි. "කිංචිත්තො ත්වං භික්ඛු?"ති "අනුල්ලපනාධිප්පායො අහං භගවා"ති. අනාපත්ති භික්ඛු අනුල්ලපනාධිප්පායස්සාති. (34)

29. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කතිකං කත්වා අඤ්ඤ-තරස්මිං ආවාසෙ වස්සං උපගච්ඡිංසු: "යො ඉමම්හා ආවාසා පඨමං පක්කමිස්සති, තං මයං අරහාති ජානිස්සාමා"ති. අඤ්ඤතරො භික්ඛු මං අරහාති ජානන්තූති තම්හා ආවාසා පඨමං පක්කාමි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො පාරාජිකන්ති. (35)

30. තෙන සමයෙන බුද්ධො භගවා රජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ච ලක්ඛණො ආයස්මා ච මහාමොග්ගල්ලානො ගිජ්ඣකූටෙ පබ්බතෙ විහරන්ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙනායස්මා ලක්ඛණො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ලක්ඛණං එතදවොච: "ආයාමාවුසො ලක්ඛණ, රජගහං පිණ්ඩාය පවිසිස්සාමා"ති. "එවමාවුසො"ති ඛො ආයස්මා ලක්ඛණො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස පච්චස්සොසි.

31. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අඤ්ඤතරස්මිං පදෙසෙ සිතං පාත්වාකාසි. අථ ඛො ආයස්මා ලක්ඛණො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: "කො නු ඛො ආවුසො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො සිතස්ස පාතුකම්මායා"ති. "අකාලො ඛො ආවුසො ලක්ඛණ, එතස්ස පඤ්හස්ස,[1] භගවතො මං සන්තිකෙ එතං පඤ්හං පුච්ඡා"ති.

1. පඤ්හස්ස බ්‍යාකරණාය ස්‍යා.

26. එසමයෙහි එක්තරා මහණකුට තෑයෝ මෙය කීහු: "වහන්ස, එනු මැනව. ගිහිගෙයි වසනු මැනව. ඇවැත්නි, මා වැන්නෙක් ගිහිගෙයි වසන්නට නුසුදුසු වෙයි. ඒ මහණහට කුකුස් විය. ... මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (32)

27. එසමයෙහි එක්තරා මහණකුට තෑයෝ මෙය කීහු: "වහන්ස, එනු මැනව. පස්කම් සැප අනුභව කරව"යි "ඇවැත්නි, මට කාමයෝ ඇවුරුණහ"යි, ඒ මහණහට කුකුස් විය. ... මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (33)

28. එසමයෙහි එක්තරා මහණකුට තෑයෝ මෙය කීහු: "වහන්ස, අභිරමණය කරව"යි "ඇවැත්නි, මම උතුම් අභිරතියෙහි ඇලුනෙම් වෙම්"යි ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේගේ යම් ඒ සව්වෝ වෙද්ද, ඔවුහු මෙසේ කියන්නාහුය. මම ද භාග්‍යවතුන් වහන්සේගේ සව්වෙක් නො වෙමි. කිම? "මම පරිජිඇවැත් අවන්නෙම් දෝ"යි භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කෙළේ ය. මහණ, තෝ, කෙබඳු සිතැත්තෙහි ද? භාග්‍යවතුන් වහන්ස, "මම අනුල්ලපනාධිප්‍රාය ඇතියෙමි"යි මහණ, අනුල්ලපනාධිප්‍රාය ඇතියහුට ඇවැත් නො වේ. (34)

29. එසමයෙහි බොහෝ භික්ෂූහු කතිකා කොට එක්තරා ආවාසයෙක්හි වස් විසූහ. යමෙක් මේ අවසින් පළමුව බැහැර යන්නේ ද "ඔහු රහතෙකැයි අපි දැන ගන්නමු"යි, එක්තරා මහණෙක් "මා රහතෙකැයි දැන ගණිත්වා"යි ඒ අවසින් පළමුව නික්මුනි. ඒ මහණහට කුකුස් විය. ... මහණ, තෝ පරිජිඇවැත් අවන්නෙහිය. (35)

30. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වසන සේක. එසමයෙහි ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ද, ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ද ගිජුකුළුපව්වෙහි වෙසෙත්. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ පෙරවරු වේලෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ ආයුෂ්මත් ලක්ඛණ තෙරුන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවන්ට මෙය කීහ: "ඇවැත් ලක්ඛණය, යම්හ. රජගහනුවරට පිඩු පිණිස පිවිසෙන්නම්හ"යි. "ඇවැත්නි, එසේ"යි ආයුෂ්මත් ලක්ඛණ තෙමේ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට පිළිවදන් දුනි.

31. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ගිජුකුළුපව්වෙන් බස්නාහු එක්තරා පෙදෙසෙක දී සිනා පහළ කළහ. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ තෙමේ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය කීය: ඇවැත්, මුගලන, සිනා පහළ කිරීමට හේතු කවරේ ද? ප්‍රත්‍යය කවරේදැ යි? ඇවැත් ලක්ඛණය, මෙල පැනයට කල් නො වේ ම ය. භාග්‍යවතුන් වහන්සේගේ සම්පයෙහි දී මාගෙන් මෙල පැනය විචාරව'යි.

32. අථ ඛො ආයස්මා ච ලක්ඛණො ආයස්මා ච මහාමොග්ගල්ලානො රාජගහෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුප සඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ලක්ඛණො ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: "ඉධායස්මා මහාමොග්ගල්ලානො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අඤ්ඤතරස්මිං පදෙසෙ සිතං පාත්වාකාසි. කො නු ඛො ආවුසො මොග්ගල්ලාන, හෙතු කො පච්චයො සිතස්ස පාතුකම්මායා"ති. ඉධාහං[1] ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං අට්ඨිකසඞ්ඛලිකං වෙහාසං ගච්ඡන්තිං. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා ඵාසුළන්තරිකාහි විතුදන්ති[2]. සා සුදං අට්ටස්සරං කරොති. තස්ස මය්හං ආවුසො එතදහොසි: "අච්ඡරියං වත හො අබ්භුතං වත හො, එවරූපොපි නාම සත්තො භවිස්සති, එවරූපොපි නාම යක්ඛො භවිස්සති, එවරූපොපි නාම අත්තභාවපටිලාභො භවිස්සතී"ති. භික්ඛූ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "උත්තරිමනුස්සධම්මං ආයස්මා මහාමොග්ගල්ලානො උල්ලපතී"ති.

33. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: චක්ඛුභූතා වත භික්ඛවෙ සාවකා විහරන්ති, ඤාණභූතා වත භික්ඛවෙ සාවකා විහරන්ති, යත්‍ර හි නාම සාවකො එවරූපං ඤස්සති වා, දක්ඛිති වා, සක්ඛිං වා කරිස්සති. පුබ්බෙව මෙ සො භික්ඛවෙ සත්තො දිට්ඨො අහොසි. අපිචාහං න ව්‍යාකාසිං. අහඤ්චෙතං ව්‍යාකරෙය්‍යං, පරෙ ච මෙ න සද්දහෙය්‍යුං. යෙ මෙ න සද්දහෙය්‍යුං, තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය. එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ ගොඝාතකො අහොසි. සො තස්ස කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චිත්වා තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන එවරූපං අත්තභාව-පටිලාභං පටිසංවෙදෙති. සච්චං භික්ඛවෙ මොග්ගල්ලානො ආහ. අනාපත්ති භික්ඛවෙ මොග්ගල්ලානස්සාති. (36)

34. ඉධාහං, ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං මංසපෙසිං වෙහාසං ගච්ඡන්තිං, තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති විරාජෙන්ති[3]. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ ගොඝාතකො අහොසි (37)

35. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං මංසපිණ්ඩං වෙහාසං ගච්ඡන්තං, තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනු-පතිත්වා විතච්ඡෙන්ති විරාජෙන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ සාකුණිකො අහොසි. (38)

36. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං නිච්ඡවිං පුරිසං වෙහාසං ගච්ඡන්තං, තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති විරාජෙන්ති.[4] සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ ඔරබ්භිකො අහොසි. (39)

1. ඉධාහං. සීමු. (සබ්බත්ථාපි) 2. විතුදෙන්ති විතච්ඡෙන්ති විරාජෙන්ති. ස්‍යා. 3. විතච්ඡෙන්ති
4. විතච්ඡෙන්ති. මජ්සං. උපරි ච එවං.

32. ඉක්බිති ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ද, ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ ද රජගහනුවර පිඩු පිණිස හැසිර පසුබත් කල පිඩු සිඟීමෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියාහුය. එළඹ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නාහුය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ලක්ඛණ තෙරණුවෝ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය කීහ: මෙහි ආයුෂ්මත් මුගලන් තෙරණුවෝ ගිජ්ඣකුළු පව්වෙන් බස්නාහු එක්තරු පෙදෙසකදී සිනා පහළ කළහ. ඇවැත් මුගලන, සිනා පහළ කිරීමට හේතු කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද? ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකුළු පව්වෙන් බස්නෙම් අහසින් ගමන් කරණ ඇට සැකිල්ලක් දුටිමි. එය ගිජුලිහිණියෝ ද, කවුඩෝ ද උකුස්සෝ ද, ලුහුබැඳ ලුහුබැඳ ඉළ ඇට අතරෙන් විනිවිද යෙත්. ඒ ඇට-සැකිල්ල බැගෑහඬ කරයි. ඇවැත්නි, ඒ මට මේ සිත විය: "පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි. අද්භූතයෙකි. මෙබඳු නම් සත්ත්වයෙක් වන්නේ ද? මෙබඳු නම් යක්ෂයෙක් වන්නේ ද? මෙබඳු නම් අත්බැව් පිළි-ලැබුවෙක් වන්නේ ද"යි භික්ෂූහු අවමන් කෙරෙත්. අගුණ කියත්. නුගුණ පතුරුවත්: "ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ උතුරුම්නිස්දම් දක්වති"යි.

33. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, ඒකාන්තයෙන් සව්වෝ ඇස් ඇති ව වෙසෙත්. මහණෙනි, ඒකාන්තයෙන් සව්වෝ නුවණ ඇති ව වෙසෙත්. යම් හෙයකින් ශ්‍රාවක තෙමේ මෙ බන්දක් දන්නේ හෝ දක්නේ හෝ සාක්ෂ්‍යය හෝ කරන්නේ ද, මහණෙනි, පෙර ම මා විසින් ඒ සත්ත්වතෙමේ දක්නා ලද්දේ විය. එතකුදු වුවත් මම එය ප්‍රකාශ නො කෙළෙමි. මම තෙල කරුණ ප්‍රකාශ කෙළෙම් නම් අන්‍යයෝ මාගේ වචනය නො අදහන්නාහු ය. යම් කෙනෙක් මාගේ වචනය නො අදහන්නාහු ද ඔවුන්ට එය දිගුකලක් අහිත පිණිස දුක් පිණිස වන්නේය. මහණෙනි, මේ සත්ත්ව තෙමේ මේ රජගහනුවර ම ගොනාතකයා විය. හෙ තෙමේ ඒ කම් විපාකයෙන් බොහෝ අවුරුදු ගණන් බොහෝ අවුරුදු සියගණන් බොහෝ අවුරුදු දහස් ගණන්, බොහෝ අවුරුදු සුවහස් ගණන් නරකයෙහි පැසී ඒ කර්මයාගේ ම ශෙෂ වූ විපාකයෙන් මෙබඳු අත්බැව් ලැබීමක් විඳියි. මහණෙනි, මුගලන් තෙමේ සත්‍යයක් කියයි. මහණෙනි, මුගලනට ඇවැත් නැති." (36)

34. මහණෙනි, මම මෙහි ගිජ්ඣකුළුපව්වෙන් බස්නෙම් අහසින් ගමන් කරණ මස්වැදැල්ලක් දිටිමි. ගිජුලිහිණියෝ ද, කවුඩෝ ද, උකුස්සෝ ද පැන පැන එය කඩා ගෙණ කත්, ඉරා කත්. ඒ මස්වැදැල්ල බැගෑහඬ කෙරෙයි. ... මහණෙනි, තෙල සත්ත්ව තෙමේ මේ රජගහනුවර ම ගොනාතක-යෙක් විය. (37)

35. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකුළුපව්වෙන් බස්නෙම් අහස යන මස් පිඩක් දිටිමි. ඒ මේ මස් පිඩ ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද තුඩින් සිඳිත්. කඩත්. ඒ මස් පිඩ බැගෑ හඬ කෙරෙයි. ... මහණෙනි, තෙල සත්ත්ව තෙමේ මේ රජගහනුවර ම ලිහිණි වැද්දෙක් විය. (38)

36. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකුළුපව්වෙන් බස්නෙම් අහස යන සිවිනැති පුරුෂයකු දිටිමි. ඒ මේ පුරුෂයා ගිජු ලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝද පැන පැන තුඩින් සිඳිත්. කඩත්. ඒ පුරුෂ තෙමේ බැගෑහඬ කරයි. ... මහණෙනි, තෙල සත්ත්ව තෙමේ මේ රජගහ නුවර ම එළුවන් මරන්නෙක් විය. (39)

37. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං අසිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තෙ අසී උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ සූකරිකො අහොසි (40)

38 ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සත්ති-ලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තා සත්තියො උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිං යෙව රාජගහෙ මාගවිකො අහොසි. (41)

39. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං උසුලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තෙ උසූ උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ කාරණිකො අහොසි. (42)

40. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සූචිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තා සූචියො උප්පතිත්වා උප්පතිත්වා තස්සෙව කායෙ නිපතන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ සාරථිකො අහොසි. (43)

41. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං සූචිලොමං පුරිසං වෙහාසං ගච්ඡන්තං. තස්ස තා සූචියො සීසෙ පවිසිත්වා මුඛතො නික්ඛමන්ති, මුඛෙ පවිසිත්වා උරතො නික්ඛමන්ති, උරෙ පවිසිත්වා උදරතො නික්ඛමන්ති, උදරෙ පවිසිත්වා ඌරූහි නික්ඛමන්ති, ඌරූසු පවිසිත්වා ජඞ්ඝාහි නික්ඛමන්ති, ජඞ්ඝාසු පවිසිත්වා පාදෙහි නික්ඛමන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ සූචකො අහොසි. (44)

42. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං කුම්භණ්ඩං පුරිසං වෙහාසං ගච්ඡන්තං. සො ගච්ඡන්තොපි තෙව අණ්ඩෙ ඛන්ධෙ ආරොපෙත්වා ගච්ඡති, නිසීදන්තොපි තෙසෙව අණ්ඩෙසු නිසීදති. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති විරාජෙන්ති.[1] සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ ගාමකූටකො අහොසි. (45)

43. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං පුරිසං ගූථකූපෙ සසීසකං නිමුග්ගං -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ පාරදාරිකො අහොසි, (46)

44. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං පුරිසං ගූථකූපෙ සසීසකං නිමුග්ගං උභොහි හත්ථෙහි ගූථං ඛාදන්තං -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ දුට්ඨබ්‍රාහ්මණො අහොසි. සො කස්සපස්ස සම්මාසම්බුද්ධස්ස පාවචනෙ භික්ඛුසඞ්ඝං භත්තෙන නිමන්තෙත්වා දෙණියො[2] ගූථස්ස පූරාපෙත්වා කාලං ආරොචාපෙත්වා එතදවොච: අතො[3] භොන්තො යාවදත්ථං භුඤ්ජන්තු චෙව හරන්තු චා"ති. (47)

---

1. විතුදෙන්ති විභජ්ජන්ති විරාජෙන්ති. සයා. 2. දෙණියා (ඉතිපි සීමු.)
3. ඉතො. සයා. අතො. (ඉතිපි සයා)

37. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අහස යන අසිලොම් පුරුෂයකු දිටිමි. ඔහුගේ අසිහු නැගි නැගී ඔහුගේ ම සිරුරු හෙත්. හෙතෙමේ බැගෑහඬ කෙරෙයි. ... මහණෙනි, තෙල සත්‍ව තෙමේ මේ රජගහනුවර ම ළඟරත් මරත්නෙක් විය. (40)

38. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අහස යන සැත්-ලොම් පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ සැත්හු නැගි නැගී ඔහුගේ ම සිරුරු හෙත්. ඒ පුරුෂ තෙමේ බැගෑහඬ කෙරෙයි. මහණෙනි, තෙල සත්‍ව තෙමේ මේ රජගහනුවර ම මූව වැද්දෙක් විය. (41)

39. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අහස යන උසුලොම් පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ ශරයෝ නැගි නැගී ඔහුගේ ම සිරුරු හෙත්. හෙ තෙමේ බැඟෑහඬ කෙරෙයි. ... මහණෙනි, තෙල සත්‍ව තෙමේ මේ රජගහනුවර ම කම්කටුලු කොට මරත්නෙක් විය. (42)

40. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අහස යන හිදිලොම් පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ හිදිහු නැගි නැගී ඔහුගේ ම සිරුරු හෙත්. හෙ තෙමේ බැගෑහඬ කෙරෙයි. ... මහණෙනි, තෙල සත්‍ව තෙමේ මේ රජගහ-නුවර ම අහුන් හික්මවන්නෙක් (වධකයෙක්) විය. (43)

41. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අහස යන හිදිලොම් පුරුෂයකු දිටිමි. ඔහුගේ ඒ හිදිහු හිසැ පිවිස මුවින් නික්මෙත්. මුවෙහි පිවිස ලයෙන් නික්මෙත්. ලෙහි පිවිස කුසෙන් නික්මෙත්. කුස පිවිස වටොරින් නික්මෙත්. වටොර පිවිස කෙණ්ඩාවලින් නික්මෙත්. කෙණ්ඩාහි පිවිස පාවලින් නික්මෙත්. හෙ තෙමේ බැගෑහඬ කෙරෙයි. ... මහණෙනි, තෙල සත්‍ව තෙමේ මේ රජගහ නුවර ම පිසුනු කියන්නෙක් විය. (44)

42. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අහස යන කුම්භාණ්ඩ පුරුෂයකු දිටිමි. හෙ තෙමේ යමින් ද එම අණ්ඩයන් කොත්දෙහි තගා ගෙණ යෙයි. හිඳිත්තේ ද එම අණ්ඩයන්හි හිඳියි. එය ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද තුඩින් සිඳිත්. කඩත්. හෙ තෙමේ බැගෑහඬ කෙරෙයි. ... මහණෙනි, තෙල සත්‍ව තෙමේ මෙම රජගහනුවර කුළ විනිසකරුවෙක් විය. (45)

43. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අසුචි වළක හිස තෙක් ගැලුණු පුරුෂයකු දිටිමි. ... මහණෙනි, තෙල සත්‍ව තෙමේ මෙම රජගහනුවර පරඹුවන් සෙවුනෙක් විය. (46)

44. ඇවැත්නි, මම මෙහි ගිජ්ඣකූළපව්වෙන් බස්නෙම් අසුචි වළක හිස තෙක් ගැලුණු දෙ අතින් අසුචි බුදින පුරුෂයකු දිටිමි. ... මහණෙනි, තෙල සත්‍ව තෙමේ මෙම රජගහනුවර දූෂට බ්‍රාහමණයෙක් විය. හෙ තෙමේ කසුප්-සම්බුදුන්ගේ සස්නෙහි භික්සඟන බතින් පවරා අසුචියෙන් ඔරු පුරවා කල් දන්වා මෙය කිය. "පින්වත්හු මින් ඇතිතාක් බුදිත්වා," ගෙණ යෙත්වා,"යි. (47)

45. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං නිච්ඡවිං ඉත්ථිං වෙහාසං ගච්ඡන්තිං. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති විරාජෙන්ති. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- එසා භික්ඛවෙ ඉත්ථී ඉමස්මිංයෙව රාජගහෙ අතිචාරිනී අහොසි. (48)

46. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං ඉත්ථිං දුග්ගන්ධං මඞ්ගුලිං වෙහාසං ගච්ඡන්තිං. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති විරාජෙන්ති. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- එසා භික්ඛවෙ ඉත්ථී ඉමස්මිංයෙව රාජගහෙ ඉක්ඛණිකා අහොසි. (49)

47. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං ඉත්ථිං උප්පක්කං ඔකිලිනිං ඔකිරිනිං වෙහාසං ගච්ඡන්තිං. සා සුදං අට්ටස්සරං කරොති -පෙ- එසා භික්ඛවෙ ඉත්ථී කාලිඞ්ගස්ස රඤ්ඤො අග්ගමහෙසී අහොසි. සා ඉස්සාපකතා සපත්තිං අඞ්ගාරකටාහෙන ඔකිරි. (50

48. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං අසීසකං කවන්ධං වෙහාසං ගච්ඡන්තං. තස්ස උරෙ අක්ඛීනි චෙව හොන්ති මුඛඤ්ච. තමෙනං ගිජ්ඣාපි කාකාපි කුලලාපි අනුපතිත්වා අනුපතිත්වා විතච්ඡෙන්ති විරාජෙන්ති. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ සත්තො ඉමස්මිංයෙව රාජගහෙ **හාරිකො** නාම චොරඝාතකො අහොසි. (51)

49. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං භික්ඛුං වෙහාසං ගච්ඡන්තං. තස්ස සඞ්ඝාටිපි ආදිත්තා සම්පජ්ජලිතා සජොතිභූතා, පත්තොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො, කායබන්ධනම්පි ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, කායොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො. සො සුදං අට්ටස්සරං කරොති -පෙ- එසො භික්ඛවෙ භික්ඛු කස්සපස්ස සම්මාසම්බුද්ධස්ස පාවචනෙ පාපභික්ඛු අහොසි. (52)

50. ඉධාහං ආවුසො ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තො අද්දසං භික්ඛුනිං -පෙ- අද්දසං සික්ඛමානං -පෙ- අද්දසං සාමණෙරං -පෙ- අද්දසං සාමණෙරිං වෙහාසං ගච්ඡන්තිං. තස්සා සඞ්ඝාටිපි ආදිත්තා සම්පජ්ජලිතා සජොතිභූතා, පත්තොපි ආදිත්තො සම්පජ්ජලිතො සජොතිභූතො, කායබන්ධනම්පි ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං, කායොපි ආදිත්තො සම්පජ්ජලිතො, සජොතිභූතො. සා සුදං අට්ටස්සරං කරොති. තස්ස මය්හං ආවුසො එතදහොසි: "අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, එවරූපොපි නාම සත්තො භවිස්සති, එවරූපොපි නාම යක්ඛො භවිස්සති, එවරූපොපි නාම අත්තභාවපටිලාභො භවිස්සතී"ති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: උත්තරිමනුස්සධම්මං ආයස්මා මහාමොග්ගල්ලානො උල්ලපතීති.

45. ඇවැත්නි, මම මෙහි ගිජුකුළුපව්වෙන් බස්නෙම් අහස යන සිව්නැති අඟනක් දිටිමි. ඇය ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද තුඩින් සිඳිත්. කඩත්. ඕ බැගෑපත්ව හඩයි. ... මහණෙනි, තෙල අඟන මෙම රජගහනුවර හිමියා ඉක්ම යන්නියක් වූවා ය. (48)

46. ඇවැත්නි, මම මෙහි ගිජුකුළුපව්වෙන් බස්නෙම් අහස යන පිළිකුල් දුගඳ හමන අඟනක් දිටිමි. ඇය ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද තුඩින් සිඳිත්. කඩත්. ඕ බැගෑපත්ව හඩයි. ... මහණෙනි, තෙල අඟන මෙම රජගහනුවර යක්දැස්සක් වූවා ය. (49)

47. ඇවැත්නි, මම මෙහි ගිජුකුළුපව්වෙන් බස්නෙම් දැඩි ගින්නෙන් පැලහුනු නෙත බස්නා, ගිනි අඟුරෙන් ගැවසුනු, අඟනක් දිටිමි. ඕ බැගෑපත්ව හඩයි. ... මහණෙනි, තෙල අඟන කලිඟු රජහුගේ අගමෙහෙසිය වූවාය. ඕ තොමෝ ඉසි සිතින් මඩනා ලද්දී සපත්නියක මත අඟුරු කබලක් හෙළූ ය. (50)

48. ඇවැත්නි, මම මෙහි ගිජුකුළුපව්වෙන් බස්නෙම්, අහස යන හිස සුන් කවඩියකු දිටිමි. ඔහුගේ ලෙහි නෙත් ද මුව ද වෙත්. ඔහු ගිජුලිහිණියෝ ද කවුඩෝ ද උකුස්සෝ ද තුඩින් සිඳිත්. කඩත්. හෙ තෙමේ බැගෑපත්ව හඩයි. ... මහණෙනි, තෙල සත්ත්ව තෙමේ මෙම රජගහනුවර හාරික නම් වොරඝාතකයෙක් විය. (51)

49. ඇවැත්නි, මම මෙහි ගිජුකුළුපව්වෙන් බස්නෙම් අහස යන මහණකු දිටිමි. ඔහුගේ සඟළ ද ඇවිලිත, දිලිසිත, ගිනිදැල් සහිතය. පය ද ඇවිලිත, දිලිසිත, ගිනිදැල් සහිතය, කාබාත ද ඇවිලිත, දිලිසිත, ගිනිදැල් සහිතය, කය ද ඇවිලිත, දිලිසිත, ගිනිදැලින් ද වෙළුනේ ය. හෙ තෙමේ බැගෑපත්ව හඩයි .... මහණෙනි, තෙල මහණ තෙමේ කසුප් සම්බුදුන්ගේ සස්නෙහි පැවිටු මහණෙක් විය. (52)

50. ඇවැත්නි, මම මෙහි ගිජුකුළුපව්වෙන් බස්නෙම් මෙහෙණක දිටිමි. ... සිකඛමානාවක දිටිමි. ... හෙරණකු දිටිමි. "අහස යන හෙරණියක දිටිමි. ... ඇගේ සඟළ ද, ඇවිලිත, දිලිසිත, ගිනිදැලින් වෙළුනාය. පය ද ඇවිලිත, දිලිසිත, ගිනිදැලින් වෙළුනේ ය. කාබාත ද ඇවිලිත, දිලිසිත, ගිනිදැලින් වෙළුනේ ය. කය ද ඇවිලිත, දිලිසිත, ගිනිදැලින් වෙළුනේය. ඕ බැගෑපත්ව හඩයි. ඇවැත්නි, ඒ මට මෙබඳු සිතෙක් විය. පින්වත, පුදුමයකි. පින්වත, නොවූ විරූවකි. මෙබඳු සත්ත්වයෙක් නම් වන්නේය. මෙබඳු යක්ෂයෙක් වන්නේය. මෙබඳු අත්බව් ලැබුවෙක් නම් වන්නේ"යි භික්ෂූහු අවමන් කෙරෙත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්: "ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ උතුරුමිනිස්දම් එළවා දක්වති"යි.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. චක්ඛුභූතා වත භික්ඛවෙ සාවකා විහරන්ති, ඤාණභූතා වත භික්ඛවෙ සාවකා විහරන්ති, යත්‍ර හි නාම සාවකො එවරූපං ඤස්සති වා දක්ඛති වා සක්ඛිං වා කරිස්සති. පුබ්බෙව මෙ සා භික්ඛවෙ සාමණෙරී දිට්ඨා අහොසි, අපිචාහං න බ්‍යාකාසිං. අහඤ්චෙතං බ්‍යාකරෙය්‍යං, පරෙ ච මෙ න සද්දහෙය්‍යුං, යෙ මෙ න සද්දහෙය්‍යුං, තෙසං තං අස්ස දීඝරත්තං අහිතාය දුක්ඛාය. එසා භික්ඛවෙ සාමණෙරී කස්සපස්ස සම්මාසම්බුද්ධස්ස පාවචනෙ පාපසාමණෙරී අහොසි. සා තස්ස කම්මස්ස විපාකෙන බහූනි වස්සානි බහූනි වස්සසතානි බහූනි වස්සසහස්සානි බහූනි වස්සසතසහස්සානි නිරයෙ පච්චිත්වා තස්සෙව කම්මස්ස විපාකාවසෙසෙන එවරූපං අත්තභාවපටිලාභං පටිසංවෙදෙති. සච්චං භික්ඛවෙ මොග්ගල්ලානො ආහ. අනාපත්ති භික්ඛවෙ මොග්ගල්ලානස්සාති. (53-56)

51. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි. යත්‍රායං ආවුසො තපොදා සන්දති, සො දහො අච්ඡොදකො සීතොදකො සාතොදකො සෙතකො සුප්පතිත්ථො රමණීයො පහූතමච්ඡකච්ඡපො චක්කමත්තානි ච පදුමානි පුප්ඵන්තීති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම ආයස්මා මහාමොග්ගල්ලානො එවං වක්ඛති. "යත්‍රායං ආවුසො තපොදා සන්දති, සො දහො අච්ඡොදකො සීතොදකො සාතොදකො සෙතකො සුපතිත්ථො රමණීයො පහූතමච්ඡකච්ඡපො, චක්කමත්තානි ච පදුමානි පුප්ඵන්තී"ති. "අථ ච පනායං තපොදා කුපිතා[1] සන්දති. උත්තරිමනුස්සධම්මං ආයස්මා මහාමොග්ගල්ලානො උල්ලපතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "යත්‍රායං භික්ඛවෙ තපොදා සන්දති, සො දහො අච්ඡොදකො සීතොදකො සාතොදකො සෙතකො සුපතිත්ථො රමණීයො පහූතමච්ඡකච්ඡපො, චක්කමත්තානි ච පදුමානි පුප්ඵන්ති, අපිචායං භික්ඛවෙ තපොදා ද්වින්නං මහානිරයානං අන්තරිකාය ආගච්ඡති, තෙනායං තපොදා කුපිතා සන්දති. සච්චං භික්ඛවෙ මොග්ගල්ලානො ආහ. අනාපත්ති භික්ඛවෙ මොග්ගල්ලානස්සා"ති. (57)

52. තෙන ඛො පන සමයෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො ලිච්ඡවීහි සද්ධිං සඞ්ගාමෙන්තො පභග්ගො හොති.[2] අථ රාජා පච්ඡා සෙනං සංකඩ්ඪිත්වා ලිච්ඡවයො පරාජෙසි, සඞ්ගාමෙ ච නන්දී චරති "රඤ්ඤා ලිච්ඡවී පභග්ගා"ති. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි. "රාජා ආවුසො ලිච්ඡවීහි පභග්ගො"ති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා මහාමොග්ගල්ලානො එවං වක්ඛති": "රාජා ආවුසො ලිච්ඡවීහි පභග්ගො"ති. සඞ්ගාමෙ ච නන්දී චරති රඤ්ඤා ලිච්ඡවී පභග්ගා"ති. උත්තරි- මනුස්සධම්මං ආයස්මා මහාමොග්ගල්ලානො උල්ලපතීති. භගවතො එතමත්ථං ආරොචෙසුං. පඨමං භික්ඛවෙ රාජා ලිච්ඡවීහි පභග්ගො. අථ රාජා පච්ඡා සෙනං සඞ්කඩ්ඪිත්වා ලිච්ඡවයො පරාජෙසි. සච්චං භික්ඛවෙ මොග්ගල්ලානො ආහ. අනාපත්ති භික්ඛවෙ මොග්ගල්ලානස්සාති. (58)

---

1. කුධීතා. සං. කඨිතා, කථිච. 2. අහොසි. මජ්ඣං. 3. නන්දිං. මජ්ඣං.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, සච්චෝ ඇස් ඇති ව නුවණැති ව වෙසෙත්. යම් කලෙක සච්චෙක් මෙබන්දක් දැනගන්නේ හෝ වේ ද දන්නේ හෝ වේ ද පසක් කරන්නේ හෝ වේ ද මහණෙනි, පෙර ම මා විසින් ඒ හෙරණී තොමෝ දක්නා ලද්දී ය. එහෙත් මම එය නො පැවැසීම්. මම එය පවසන්නෙම් නමුදු අන්‍යයෝ මබස නො හදහන්නාහු ය. යම් කෙනෙක් මබස නො හදහන්නාහු නම් ඔවුන්ට දිගුකලක් අවැඩ පිණිස දුක් පිණිස වන්නේ ය. මහණෙනි, තෙල හෙරණී තොමෝ කසුප් සම්බුදුන්ගේ සස්නෙහි පැවිදි හෙරණක් විය. ඕ තොමෝ බොහෝ ගණන් අවුරුදු බොහෝ සියගණන් අවුරුදු බොහෝ දහස් ගණන් අවුරුදු බොහෝ සුවහස් ගණන් අවුරුදු නිරයෙහි පැසී ඒ කර්මයාගේ විපාකය ශේෂවීමෙන් මෙබඳු ආත්මභාවයක් ලබයි. මුගලන් තෙමේ සැබවක් කීය. මහණෙනි, මුගලන්හට ඇවැත් නැත. (53-56)

51. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ: ඇවැත්නි, මේ තපෝද නදිය යම් තැනක පටන් ගලා බසී ද, ඒ විල පහන් දිය ඇත්තකි. සිහිල් දිය ඇත්තකි. මිහිරි දිය ඇත්තකි. පිරිසිදු වූවකි. මනා තොටු ඇත්තකි. සිත්කලු වූවකි. බොහෝ මස් කැසුබුවන් ඇත්තකි. රියසක් සා පියුම් පිපෙයි කීහ "කෙසේ නම් ආයුෂ්මත් මහමුගලන් තෙමේ මෙසේ කියන්නේද"යි, භික්ෂූහු අවමන් කෙරෙත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්: ඇවැත්නි, මේ තපෝදනදිය යම් තැනක පටන් ගලා බසී ද ඒ විල පහන් දිය ඇත්තකි, සිහිල් දිය ඇත්තකි, මිහිරි දිය ඇත්තකි, පිරිසිදු වූවකි, මනා තොටු ඇත්තකි, සිත්කලු වූවකි. බොහෝ මස් කැසුබුවන් ඇත්තකි. රියසක් සා පියුම් පිපේය"යි. එහෙත් මේ තපෝද නදිය කැකැරී ගලා බසී. ආයුෂ්මත් මහමුගලන් තෙමේ උතුරුමිනිස්දම් එළවා දක්වයි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළාහු ය. මහණෙනි, මේ තපෝද-නදිය යම් තැනක පටන් ගලා බසී ද, ඒ තපෝද විල පහන් දිය ඇත්තකි. සිහිල් දිය ඇත්තකි. මිහිරි දිය ඇත්තකි. පිරිසිදු දිය ඇත්තකි. මනා තොටු ඇත්තකි. සිත්කලු වූවකි. බොහෝ මස් කැසුබුවන් ඇත්තකි. රිය-සක් සා පියුම් පිපෙයි'. මහණෙනි, එතකුදු වුවත් මේ තපෝදනදිය මහ නිරය දෙකකට මැදිව ගලා එයි. එහෙයින් මේ තපෝදනදිය කැකැරී ගලයි. මහණෙනි, මුගලන් තෙමේ සැබවක් කීය. මහණෙනි, මුගලන්හට ඇවැත් නො වේ. (57)

52. එසමයෙහි මගධාධිපති සේනා ඇති බිම්සර රජ තෙමේ ලිච්ඡවීන් සමග යුද කරන්නේ බිඳී ගියේ වෙයි. ඉක්බිති රජ තෙමේ යළිත් සෙනග රැස් කොට ගෙණ ලිච්ඡවීන් පැරද විය. රජහු විසින් ලිච්ඡවීහු පරදවන ලදහයි ජය බෙරය පැතිරෙයි. එකල්හි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ. "ඇවැත්නි, රජ තෙමේ ලිච්ඡවීන් විසින් පරදවන ලද්දේ"යි. "කෙසේ නම් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ මෙසේ කියන්නාහුද"යි. භික්ෂූහු අවමන් කෙරෙත්. අයුණු කියත්. නුගුණ පතුරුවත්. "ඇවැත්නි, රජ තෙමේ ලිච්ඡවීන් විසින් පරදවන ලද්දේය"යි. යුදබිමෙහි ද රජු විසින් ලිච්ඡවීහු පරදවන ලද්දාහු යි ජය බෙර පැතිරේ. ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ උතුරුමිනිස්දම් ඔසවා දක්වති"යි භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහු ය. මහණෙනි, පළමුකොට රජ තෙමේ ලිච්ඡවීන් විසින් පරදවන ලද්දේ ය. ඉක්බිති රජ තෙමේ යළිත් සෙනග රැස් කොට ලිච්ඡවීන් පැරද විය. මහණෙනි, මුගලන් තෙමේ සැබවක් කීය. මහණෙනි, මුගලන්හට ඇවැත් නො වේ. (58)

54. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො භික්ඛූ ආමන්තෙසි. ඉධාහං ආවුසො සප්පිනිකාය නදියා තීරෙ ආනෙඤ්ජං සමාධිං සමාපන්නො නාගානං ඔගය්හ උත්තරන්තානං කොඤ්චං කරොන්තානං සද්දං අස්සොසින්ති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා මහාමොග්ගල්ලානො ආනෙඤ්ජං සමාධිං සමාපන්නො සද්දං සොස්සති. උත්තරිමනුස්සධම්මං ආයස්මා මහාමොග්ගල්ලානො උල්ලපතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අත්ථෙසො භික්ඛවෙ සමාධි, සො ච ඛො අපරිසුද්ධො. සච්චං භික්ඛවෙ මොග්ගල්ලානො ආහ. අනාපත්ති භික්ඛවෙ මොග්ගල්ලානස්සා"ති. (59)

55. අථ ඛො ආයස්මා **සොභිතො** භික්ඛූ ආමන්තෙසි: "අහං ආවුසො පඤ්චකප්පසතානි අනුස්සරාමී"ති. භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා සොභිතො එවං වක්ඛති: අහං ආවුසො පඤ්චකප්පසතානි අනුස්සරාමී"ති. "උත්තරිමනුස්සධම්මං ආයස්මා සොභිතො උල්ලපතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අත්ථෙසා භික්ඛවෙ සොභිතස්ස, සා ච ඛො එකායෙව ජාති. සච්චං භික්ඛවෙ සොභිතො ආහ. අනාපත්ති භික්ඛවෙ සොභිතස්සාති. (60)

## චතුත්ථපාරාජිකං සමත්තං.

**උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාරාජිකා ධම්මා, යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා න ලභති භික්ඛූහි සද්ධිං සංවාසං, යථා පුරෙ තථා පච්ඡා පාරාජිකො හොති අසංවාසො. තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.**

**පාරාජිකං නිට්ඨිතං.**

තස්සුද්දානං:

මෙථුනාදින්නාදානඤ්ච මනුස්සවිග්ගහුත්තරි,
පාරාජිකානි චත්තාරි ඡෙජ්ජවත්ථූ අසංසයාති.

## පාරාජිකකණ්ඩො නිට්ඨිතො.

54. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ. "ඇවැත්නි, මම මෙහි සප්පිනිකා ගං තෙර නො සැලෙන සිවු වන සමවතට සමවන්නෙම් ගඟට බැස එතරවන කුඤ්චනාද කරණ ඇතුන්ගේ හඬ ඇසීමි"යි. "කෙසේ ශබ්දයක් අසන්නේ ද, භික්ෂූහු අවමන් කෙරෙත්. අයුණු කියත්. නුගුණ පතුරුවත්. "කෙසේ නම් ආයුෂ්මත් මහමුගලන් තෙමේ නො සැලෙන සිවුවන සමවතට සමවන්නේ අසා ද, ආයුෂ්මත් මහමුගලන් තෙමේ උතුරු-මිනිස්දම් දක්වා"යි. භාග්‍යවතුන් වහන්සේට මේ පුවත සැල කළාහු ය. මහණෙනි, එබඳු සමාධියෙක් ඇත. හෙද වනාහි නොපිරිසුදු ය. මහණෙනි, මුගලන් තෙමේ සැබවක් කීය. මහණෙනි, මුගලන්හට ඇවැත් නො වේ. (59)

55. ඉක්බිති ආයුෂ්මත් සෝභිත තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ. "ඇවැත්නි, පන්සිය කපක් සිහිකරමි"යි භික්ෂූහු අවමන් කෙරෙත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්, "කෙසේ නම් ආයුෂ්මත් සෝභිත තෙමේ මෙසේ කියා ද, "ඇවැත්නි මම පන්සිය කපක් සිහි කරමි"යි. "ආයුෂ්මත් සෝභිත තෙමේ උතුරුමිනිස්දම් දක්වා"යි. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහු ය. මහණෙනි, සෝභිතහට එබඳු සමවතෙක් ඇත. හෙද වනාහි එක ම ජාතියකි. මහණෙනි, සෝභිත තෙමේ සැබවක් කීය. මහණෙනි, සෝභිතහට ඇවැත් නො වේ. (60)

## සිවුවන පරිජිය නිමි.

**ආයුෂ්මත්නි, සිවුපරිජිඇවැත් උදෙසන ලදී. මහණ තෙමේ යම් ඒ ඇවැත් අතුරෙන් එක්තරා එක්තරා ඇවැතකට පැමිණ පිඹවි භික්ෂූන් සමග සහවාසය නො ලබා ද, පෙර ගිහිකල යම්සේ ද පසුවත් එසේ ම පැරදුණේ සංවාස රහිතයෙක් වෙයි. එහි ලා ආයුෂ්මතුන් විචාරමි: කිම පිරිසිදු වහු ද? දෙවනුවත් විචාරමි: කිම පිරිසිදු වහු ද? තෙවනුවත් විචාරමි: කිම පිරිසිදු වහු ද? ආයුෂ්මත්හු පිරිසිදු වහු ය. එහෙයින් නිහඬ ය. මේ පිරිසිදු බව මෙසේ දරමි.**

### සිවුපරිජි නිමි.

එහි උද්දානය මෙසේයි:

මෙථුනය, අදින්නාදානය, මනුස්සවිග්ගහය, උත්තරිමනුස්සධම්මය යන පරිජි සතරකි. ඔවුහු නිඃසැකයෙන් ඡේද්‍යවස්තුහු ය.

## පාරාජිකකාණ්ඩය නිමි.

# සඞ්ඝාදිසෙසකණ්ඩො

## 3.

## තෙරසකං.

**ඉමෙ ඛො පනායස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

## 3. 1.

## පඨමසඞ්ඝාදිසෙසො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **සෙය්‍යසකො** අනභිරතො බ්‍රහ්මචරියං චරති. සො තෙන කිසො හොති ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො.

2. අද්දසා ඛො ආයස්මා **උදායී** ආයස්මන්තං සෙය්‍යසකං කිසං ලූඛං දුබ්බණ්ණං උප්පණ්ඩුප්පණ්ඩුකජාතං ධමනිසන්ථතගත්තං. දිස්වාන ආයස්මන්තං සෙය්‍යසකං එතදවොච: "කිස්ස ත්වං ආවුසො සෙය්‍යසක, කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො. කච්චි නො ත්වං ආවුසො සෙය්‍යසක, අනභිරතො බ්‍රහ්මචරියං චරසී"ති. 'එවමාවුසො'ති. 'තෙන හි ත්වං ආවුසො සෙය්‍යසක යාවදත්ථං භුඤ්ජ, යාවදත්ථං සුප, යාවදත්ථං නහාය, යාවදත්ථං භුඤ්ජිත්වා යාවදත්ථං සුපිත්වා යාවදත්ථං නහායිත්වා යදා තෙ අනභිරති උප්පජ්ජති, රාගො චිත්තං අනුද්ධංසෙති, තදා හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙහී'ති. "කිං නු ඛො ආවුසො කප්පති එවරූපං කාතු"න්ති. 'ආම ආවුසො, අහම්පි එවං කරොමී'ති.

3. අථ ඛො ආයස්මා සෙය්‍යසකො යාවදත්ථං භුඤ්ජි, යාවදත්ථං සුපි, යාවදත්ථං නහායි. යාවදත්ථං භුඤ්ජිත්වා යාවදත්ථං සුපිත්වා යාවදත්ථං නහායිත්වා, යදා අනභිරති උප්පජ්ජති, රාගො චිත්තං අනුද්ධංසෙති, තදා හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙති. අථ ඛො ආයස්මා සෙය්‍යසකො අපරෙන සමයෙන වණ්ණවා අහොසි පීණින්ද්‍රියො පසන්නමුඛවණ්ණො විප්පසන්නඡවිවණ්ණො.

# සඞ්ඝාදිසෙසකාණ්ඩය.

## 3.

## තෙරසකය

**ආයුෂ්මත්නි, මේ තෙළෙස් සඟවෙසෙස්ඇවැත්හු උදෙසීමට පැමිණෙත්.**

## 3. 1.

## ප්‍රථමසඞ්ඝාදිසෙසය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඩුසිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් **සෙය්‍යසක** තෙමේ කලකිරුණේ බඹසර හැසිරෙයි. හෙතෙමේ එයින් කෘශ වූයේ රූක්ෂ වූයේ දුර්වර්ණ වූයේ අතිශයින් පඬුවන් වූයේ ඉල්පුනු නහරින් යුත් සිරුරු ඇත්තේ වෙයි.

2. ආයුෂ්මත් වූ **උදායි** තෙමේ කෘශ වූ රූක්ෂ වූ දුර්වර්ණ වූ ඉතා පඬුවන් වූ ඉල්පී ගිය නහරින් යුත් සිරුරු ඇති ආයුෂ්මත් සෙය්‍යසක මහණහට මෙය කීය: "ඇවැත් සෙය්‍යසකයිනි, තෙපි කුමක් හෙයින් කෘශ වූ රූක්ෂ වූ දුර්වර්ණ වූ ඉතා පඬුවන් වූ නහර ඉල්පී ගිය සිරුරු ඇති වූවහු ද? ඇවැත් සෙය්‍යසකයිනි, කිම තෙපි කලකිරුණහු බඹසර හැසිරෙවු ද යනුයි. "ඇවැත්නි එසේ" යයි ඒ මහණ කීය. ඇවැත් සෙය්‍යසකයිනි, එසේ වී නම් තෙපි කැමැති තාක් අනුභව කරවු. කැමති තාක් සැතපෙවු. කැමැති තාක් ස්නානය කරවු. කැමැති තාක් අනුභව කොට කැමති තාක් සැතපී කැමැති තාක් නා යම් කලෙක තොපට අනභිරතියක් උපදී නම් රාගය සිත මැඩ ගණී නම් එකල්හි අතින් ගටා සුකුරු මුදවූ යයි උදායි තෙර කීය. ඇවැත්නි, එබන්දක් කරන්නට කැපද?'යි ඒ මහණ ඇසී ය. ඇවැත්නි, එසේ ය. මම ද එසේ කරමි යි උදායි තෙර කී ය.

3. ඉක්බිති ආයුෂ්මත් සෙය්‍යසක තෙමේ කැමැති තාක් වැළැඳී ය. කැමැති තාක් සැතපුනේ ය. කැමැති තාක් නැවේ ය. කැමති තාක් වළඳ, කැමැති තාක් සැතපී කැමැති තාක් නා යම් කලෙක අනභිරතිය උපදී ද, රාගය සිත මැඩ ගණී ද, එකල්හි අතින් ගටා සුකුරු මුදයි. ඉක්බිති ආයුෂ්මත් සෙය්‍යසක තෙමේ පසු කාලයෙහි පැහැය ඇත්තෙක් ද පිණා ගිය ඉඳුරන් ඇත්තෙක් ද පහන් මුව පැහැය ඇත්තෙක් ද අතිශයින් සිවිපැහැ ඇත්තෙක් ද විය.

4. අථ ඛො ආයස්මතො සෙය්‍යසකස්ස සහායකා භික්ඛූ ආයස්මන්තං සෙය්‍යසකං එතදවොචුං: "පුබ්බෙ ඛො ත්වං ආවුසො සෙය්‍යසක කිසො අහොසි ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො. සො 'දානි ත්වං එතරහි වණ්ණවා පීණින්ද්‍රියො පසන්නමුඛවණ්ණො විප්පසන්නඡවිවණ්ණො. කින්නු ඛො ත්වං ආවුසො සෙය්‍යසක භෙසජ්ජං කරොසී"ති. 'න ඛො අහං ආවුසො භෙසජ්ජං කරොමි. අපි චාහං යාවදත්ථං භුඤ්ජාමි, යාවදත්ථං සුපාමි, යාවදත්ථං නහායාමි, යාවදත්ථං භුඤ්ජිත්වා යාවදත්ථං සුපිත්වා යාවදත්ථං නහායිත්වා, යදා මෙ අනභිරති උප්පජ්ජති, රාගො චිත්තං අනුද්ධංසෙති, තදා හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙමී'ති. 'කිං පන ත්වං ආවුසො සෙය්‍යසක යෙනෙ'ව හත්ථෙන සද්ධාදෙය්‍යං භුඤ්ජසි, තෙනෙ'ව හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙසී'ති. 'එවමාවුසො'ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: 'කථං හි නාම ආයස්මා සෙය්‍යසකො හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙස්සතී'ති. අථ ඛො තෙ භික්ඛූ ආයස්මන්තං සෙය්‍යසකං අනෙකපරියායෙන විගරහිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං.

5. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං සෙය්‍යසකං පටිපුච්ඡි: "සච්චං කිර ත්වං සෙය්‍යසක හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙසී"ති. 'සච්චං භගවා'. විගරහි බුද්ධො භගවා "අනනුච්ඡවියං මොඝපුරිස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං, කථං හි නාම ත්වං මොඝපුරිස හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙස්සසි. නනු මයා මොඝපුරිස අනෙකපරියායෙන විරාගාය ධම්මො දෙසිතො නො සරාගාය, විසඤ්ඤොගාය ධම්මො දෙසිතො නො සඤ්ඤොගාය, අනුපාදානාය ධම්මො දෙසිතො නො සඋපාදානාය. තත්ථ නාම ත්වං මොඝපුරිස මයා විරාගාය ධම්මෙ දෙසිතෙ සරාගාය චෙතෙස්සසි. විසඤ්ඤොගාය ධම්මෙ දෙසිතෙ සඤ්ඤොගාය චෙතෙස්සසි. අනුපාදානාය ධම්මෙ දෙසිතෙ සඋපාදානාය චෙතෙස්සසි. නනු මයා මොඝපුරිස අනෙක-පරියායෙන රාගවිරාගාය ධම්මො දෙසිතො, මදනිම්මදනාය, පිපාසවිනයාය, ආලයසමුග්ඝාතාය, වට්ටුපච්ඡෙදාය, තණ්හක්ඛයාය, විරාගාය, නිරොධාය, නිබ්බාණාය ධම්මො දෙසිතො. නනු මයා මොඝපුරිස අනෙකපරියායෙන කාමානං පහානං අක්ඛාතං, කාමසඤ්ඤානං පරිඤ්ඤා අක්ඛාතා, කාමපිපා-සානං පටිවිනයො අක්ඛාතො, කාමවිතක්කානං සමුග්ඝාතො අක්ඛාතො, කාමපරිළාහානං වූපසමො අක්ඛාතො. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භියොභාවාය. අථ ඛ්වෙතං මොඝපුරිස අප්පසන්නානඤ්චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා"ති.

4. ඉක්බිති ආයුෂ්මත් සෙය්‍යසක මහණහුගේ යහළු භික්ෂූහු ආයුෂ්මත් සෙය්‍යසකහට මෙය කීවාහුය: "ඇවැත් සෙය්‍යසකයෙනි, තෙපි පෙර කෘශ වූවහු රූක්ෂ වූවහු දුර්වර්ණ වූවහු ඉතා පඬුවන් වූවහු ඉල්පී ගිය නහරින් යුත් සිරුරු ඇත්තහු වූවහු ය. ඒ තෙපි දැන් වර්ණවත් ය. පිණා ගිය ඉඳුරන් ඇත්තහු ය. පහන් මුව පැහැය ඇත්තහු ය. වෙසෙසින් පහන් සිවි පැහැ ඇත්තහු ය, ඇවැත් සෙය්‍යසකයෙනි. කිම තෙපි බෙහෙතක් කරවුද්"යි ඇසූහ. "ඇවැත්නි, මම් බෙහෙතක් නො කෙරෙමි. එහෙත් මම් කැමති තාක් වළඳමි, කැමැති තාක් සැතපෙමි. කැමැති තාක් නාමි. කැමති තාක් වළඳ කැමති තාක් සැතපී කැමැති තාක් නහා යම් කලෙක මට අනභිරතියෙක් ඇති වේ නම්, රාගය සිත මැඩ ගණී නම්, එකල්හි අතින් ගටා සුකුරු මුදමි"යි සෙය්‍යයක මහණ කීය· "කිම? ඇවැත් සෙය්‍යසකයිනි, තෙපි යම් අතෙකින් ම සැදැහැයෙන් දෙන දෑ වළඳවූ නම් ඒ අතින් ම ගටා සුකුරු මුදවූ දෑ,යි ඒ භික්ෂූහු කීහ. "ඇවැත්නි, එසේ ය"යි සෙය්‍යසක මහණ කී ය. යම් ඒ භික්ෂූහු අල්පේච්ඡයෝ ද ඔහු "කෙසේ නම්, ආයුෂ්මත් සෙය්‍යසකයෝ අතින් ගටා සුකුරු මුදන්නෝ දෑ" යි අවමන් කෙරෙත්. අයුණු කියත්. නුගුණ පතුරවත්. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් සෙය්‍යසකහට නන් අයුරින් ගරහා භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂු සඞ්ඝයා රැස් කරවා ආයුෂ්මත් සෙය්‍යසක මහණහු ගෙන් විචාළ සේක: "සැබෑ ද සෙය්‍යසකය, තෝ අතින් ගටා සුකුරු මුදයිද්ද" යි අසා වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, සැබව"යි ඒ මහණ කී ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක. "හිස් පුරුෂය, නුසුදුසු වූ අනුලොම් නුවූ අප්‍රතිරූප වූ ශ්‍රමණසාරූප්‍ය නුවූ නොකැප වූ නොකටයුත්තෙක. හිස් පුරුෂය තෝ කවර කරුණකින් අතින් ගටා සුකුරු මුදනෙහි ද? "හිස් පුරුෂය මා විසින් නන් අයුරෙන් සරාගය පිණිස නො ව විරාගය පිණිස ධර්මය දෙසන ලද්දේ නො වේ ද? සංයොගය පිණිස නො ව විසංයොගය පිණිස ධර්මය දෙසන ලද්දේ නො වේ ද? උපාදානය පිණිස නොව අනුපාදානය පිණිස ධර්මය දේශනා කරණ ලද්දේ නො වේ ද? එහිලා හිස් පුරුෂය, තෝ මා විසින් විරාගය පිණිස ධර්මය දේශනා කළ කල්හි සරාගය පිණිස ප්‍රයොග කෙලෙහි ය. විසංයෝගය පිණිස දහම් දෙසූ කල්හි සංයෝගය පිණිස ප්‍රයොග කෙලෙහි ය. කෙලෙසුන් නොගැණීම පිණිස දහම් දෙසූ කල්හි කෙලෙසුන් ගැණීම පිණිස ප්‍රයෝග කෙලෙහි ය. "හිස් පුරුෂය මා විසින් නන් අයුරින් රාගවිරාගය පිණිස දහම් දෙසන ලද්දේ නොවේ ද? මදනිම්මදනය පිණිස පිපාසවිනය පිණිස ආලයසමුග්ඝාතය පිණිස වට්ටුපච්ඡේදය පිණිස තණ්හාක්ඛය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස නිබ්බාණය පිණිස දහම් දෙසන ලද්දේ නො වේ ද? හිස් පුරුෂය මා විසින් නන් අයුරින් කාමයන්ගේ ප්‍රහාණය කියන ලද්දේ නොවේ ද? කාමසංඥවන්ගේ ත්‍රිවිධ පරිඥවෝ කියන ලද්දෑහු නො වෙද්ද? කාමපිපාසයන් ගේ ප්‍රතිවිනය කියන ලද්දේ නො වේ ද? කාමවිතර්කයන්ගේ නැසීම කියන ලද්දේ නො වේ ද? කාමගුණිකරාගපරිදාහයන්ගේ සංහිඳීම කියන ලද්දේ නො වේ ද? හිස් පුරුෂය මෙය වනාහි නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ පහන් වූවන්ගේ බොහෝබව පිණිස හෝ නො වෙයි. වැලිදු හිස් පුරුෂය මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස පහන් වූ ඇතැමුන්ගේ අන්‍යථාභාවය පිණිස ම වෙයි." යනුයි.

6. අථ ඛො භගවා ආයස්මන්තං සෙය්‍යසකං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය-පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"සඤ්චෙතනිකා සුක්කවිසට්ඨි[1] සඞ්ඝාදිසෙසො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

**[පඨමපඤ්ඤත්ති.]**

7. තෙන ඛො පන සමයෙන භික්ඛූ පණීතානි භොජනානි භුඤ්ජිත්වා මුට්ඨස්සතී අසම්පජානා නිද්දං ඔක්කමන්ති. තෙසං මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං සුපිනන්තෙන අසුචි මුච්චති. තෙසං කුක්කුච්චං අහොසි: "භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං සඤ්චෙතනිකා සුක්කවිසට්ඨි සඞ්ඝාදිසෙසො"ති. "අම්හාකඤ්ච සුපිනන්තෙන අසුචි මුච්චති. අත්ථි චෙත්ථ චෙතනා ලබ්භා"ති. "කච්චි නු ඛො මයං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපන්නා"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අත්ථෙසා භික්ඛවෙ චෙතනා, සා ච ඛො අබ්බොහාරිකා"ති. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"සඤ්චෙතනිකා සුක්කවිසට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සඞ්ඝාදිසෙසො"ති.**

**[දුතියපඤ්ඤත්ති.]**

8. **සඤ්චෙතනිකා**'ති ජානන්තො සඤ්ජානන්තො චෙච්ච අභිවිතරිත්වා වීතික්කමො.

**සුක්කන්ති** දසසුක්කානි: නීලං පීතං ලොහිතකං ඔදාතං තක්කවණ්ණං දකවණ්ණං තෙලවණ්ණං ඛීරවණ්ණං දධිවණ්ණං සප්පිවණ්ණං.

**විසට්ඨීති** ඨානතො චාවනා වුච්චති විසට්ඨීති.

**අඤ්ඤත්‍ර සුපිනන්තා**'ති ඨපෙත්වා සුපිනන්තං.

**සඞ්ඝාදිසෙසො**'ති සඞ්ඝො'ව තස්සා ආපත්තියා පරිවාසං දෙති, මූලාය පටිකස්සති, මානත්තං දෙති, අබ්භෙති. න සම්බහුලා න එකපුග්ගලො. තෙන වුච්චති සඞ්ඝාදිසෙසො'ති. තස්සෙ'ව ආපත්තිනිකායස්ස නාමකම්මං අධිවචනං. තෙන'පි වුච්චති සඞ්ඝාදිසෙසො'ති.

9. අජ්ඣත්තරූපෙ මොචෙති, බහිද්ධාරූපෙ මොචෙති, අජ්ඣත්තබහිද්ධාරූපෙ මොචෙති, ආකාසෙ කටිං කම්පෙන්තො මොචෙති, රාගූපත්ථම්භෙ මොචෙති, වච්චූපත්ථම්භෙ මොචෙති, පස්සාවූපත්ථම්භෙ මොචෙති, වාතූපත්ථම්භෙ මොචෙති, උච්චාලිඞ්ගපාණකදට්ඨූපත්ථම්භෙ මොචෙති, ආරොග්‍යත්ථාය මොචෙති, සුඛත්ථාය මොචෙති, භෙසජ්ජත්ථාය මොචෙති, දානත්ථාය මොචෙති, පුඤ්ඤත්ථාය මොචෙති, යඤ්ඤත්ථාය මොචෙති, සග්ගත්ථාය මොචෙති, බීජත්ථාය මොචෙති, වීමංසත්ථාය මොචෙති, දවත්ථාය මොචෙති, නීලං මොචෙති, පීතකං මොචෙති, ලොහිතකං මොචෙති, ඔදාතං මොචෙති, තක්කවණ්ණං මොචෙති, දකවණ්ණං මොචෙති, තෙලවණ්ණං මොචෙති, ඛීරවණ්ණං මොචෙති, දධිවණ්ණං මොචෙති, සප්පිවණ්ණං මොචෙති.

1. සුක්කවිස්සට්ඨි; මජසං.

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සෙය්‍යසක මහණහට තන් අයුරින් ගරහා දුබරබව්හි ... වදුරා මහණෙනි මේ සිකපදය මෙසේ ද උදෙසවු:

**"ව්‍යතික්‍රම චෙතනා ඇති සුකුරු මිදුම සඟවෙසෙස් වේ."**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ සිකපදය පණවන ලදී.

**[පළමුපැණවිමයි.]**

7. එසමයෙහි භික්ෂූහු ප්‍රණීත බොජුන් වළඳ මුළා සිහි ඇත්තාහු සම්ප්‍රජන්‍යයෙන් තොර වූවාහු නින්දට බසිත්. මුළා සිහි ඇත්තාවූ සති සම්ප්‍රජන්‍යයෙන් තොර වූවාවූ නින්දට බැස ගත් ඔවුන්ට සිහිනෙන් සුකුරු මිදෙයි. "භාග්‍යවතුන් වහන්සේ විසින් මිදියැටි සිතින් සුකුරු මිදුව සඟ-වෙසෙස් වේ ය"යි සිකපදයක් පණවන ලදී. අපට ද සිහිනෙන් සුකුරු මිදෙයි. මෙහිදී ආසවාදචෙතනාව ලැබේ ද? කිම? අපි සඟවෙසෙස් ඇවතට පැමිණියමෝද?"යි කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළාහු ය. මහණෙනි, මෙහි චෙතනාවක් ඇත. එය ඇවතට අංග නො වෙයි. මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"සිහින විනා ව්‍යතික්‍රම චෙතනා ඇති සුකුරු මිදුම සඟවෙසෙස් වේ."**

**[දෙවනපැණවිමයි.]**

8. **සඤ්චෙතනිකා** යනු උපක්‍රම කරමි යි දන්නේ, සුකුරු මුදමි යි මැනැවින් දන්නේ, සිතා, නිසැක සිත මෙහෙයා ව්‍යතික්‍රමය කිරීම ය.

**සුක්කං** යනු නිල්වත් ය, කසාවත් ය, ලෙහෙවත් ය, සුදුවත් ය, මෝරු-වත් ය, දියවත් ය, තෙල්වත් ය, කිරිවත් ය, දිහිවත් ය, ගිතෙල් වත් ය, යන දස සුකුරු ය.

**විසට්ඨි** යනු පිහිටි තැනින් මිදීම විසට්ඨි ය යි කියනු ලැබේ.

**අඤ්ඤත්‍ර සුපිනන්තා** යනු සිහින හැර යි.

**සංඝාදිසෙසො** යනු සඞ්ඝයා ම ඒ ඇවතට පිරිවෙස් දෙයි. මුලට අදියි. මානත දෙයි. අබ්භානය කෙරෙයි. සම්බහුලයෝ ද නො වෙත්. එක් පුද්ගලයෙක් ද නො වෙයි. එහෙයින් සඞ්ඝාදිසෙස ය යි කියනු ලැබේ. ඒ ඇවැත්සමූහයට නම් කිරීමකි. එයිනුදු සංඝාදිසෙස ය යි කියනු ලැබේ.

9. ආධ්‍යාත්මිකරූපයෙහි මුදයි. බාහිර රූපයෙහි මුදයි. ආධ්‍යාත්මික බාහිර රූපයෙහි මුදයි, අහසෙහි කටිය සොලවමින් මුදයි. රාගයෙන් තද වූ කල්හි මුදයි. වසුරුයෙන් තදවූ කල්හි මුදයි. මූයෙන් තද වූ කල්හි මුදයි. වායෙන් තද වූ කල්හි මුදයි. බූපණුදලපහසින් තද වූ කල්හි මුදයි. නීරෝග බව පිණිස මුදයි. සුවය පිණිස බෙහෙත් පිණිස මුදයි. දානය පිණිස මුදයි. පින් පිණිස මුදයි. යැදීම පිණිස මුදයි. දෙව්ලෝ සැප ලැබීම පිණිස මුදයි. බීජ පිණිස මුදයි, විමසීම පිණිස මුදයි. කෙළි පිණිස මුදයි. නිල් පැහැය ඇත්තක් මුදයි. කහ පැහැය ඇත්තක් මුදයි. ලේ පැහැය ඇත්තක් මුදයි. සුදු පැහැය ඇත්තක් මුදයි. මොහොරු පැහැය ඇත්තක් මුදයි. දිය පැහැය ඇත්තක් මුදයි. තෙල් පැහැය ඇත්තක් මුදයි. කිරි පැහැය ඇත්තක් මුදයි. දී පැහැය ඇත්තක් මුදයි. ගිතෙල් පැහැය ඇත්තක් මුදයි.

10. **අජ්ඣත්තරූපෙ‘ති** අජ්ඣත්තං උපාදින්නෙ රූපෙ.

**බහිද්ධාරූපෙ‘ති** බහිද්ධා උපාදින්නෙ වා අනුපාදින්නෙ වා.

**අජ්ඣත්තබහිද්ධාරූපෙ‘ති** තදුභයෙ.

**ආකාසෙ කටිං කම්පෙන්තො‘ති** ආකාසෙ වායමන්තස්ස අඞ්ගජාතං කම්මනියං හොති.

**රාගූපත්ථම්භෙ‘ති** රාගෙන පීළිතස්ස අඞ්ගජාතං කම්මනියං හොති.

**වච්චූපත්ථම්භෙ‘ති** වච්චෙන පීළිතස්ස අඞ්ගජාතං කම්මනියං හොති.

**පස්සාවූපත්ථම්භෙ‘ති** පස්සාවෙන පීළිතස්ස අඞ්ගජාතං කම්මනියං හොති.

**වාතූපත්ථම්භෙ‘ති** වාතෙන පීළිතස්ස අඞ්ගජාතං කම්මනියං හොති.

**උච්චාලිඞ්ගපාණකදට්ඨූපත්ථම්භෙ‘ති** උච්චාලිඞ්ගපාණකදට්ඨෙන අඞ්ගජාතං කම්මනියං හොති.

**ආරොග්‍යත්ථායා‘ති** අරොගො භවිස්සාමි;

**සුඛත්ථායා‘ති** සුඛං වෙදනං උප්පාදෙස්සාමි;

**භෙසජ්ජත්ථායා‘ති** භෙසජ්ජං භවිස්සති;

**දානත්ථායා‘ති** දානං දස්සාමි;

**පුඤ්ඤත්ථායා‘ති** පුඤ්ඤං භවිස්සති;

**යඤ්ඤත්ථායා‘ති** යඤ්ඤං යජිස්සාමි;

**සග්ගත්ථායා‘ති** සග්ගං ගමිස්සාමි;

**බීජත්ථායා‘ති** බීජං භවිස්සති;

**වීමංසත්ථායා‘ති** නීලං භවිස්සති -පෙ- සප්පිවණ්ණං භවිස්සති;

**දවත්ථායා‘ති** ඛිඩ්ඩාධිප්පායො.

11. අජ්ඣත්තරූපෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

බහිද්ධාරූපෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

අජ්ඣත්තබහිද්ධාරූපෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

ආකාසෙ කටිං කම්පෙන්තො චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

රාගූපත්ථම්භෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

10. **අජ්ඣත්තරූපෙ** යනු ආධ්‍යාත්මික සවිඥාන රූපයෙහි ය.

**බහිද්ධාරූපෙ** යනු බාහිර වූ සවිඥාන වූ හෝ අවිඥාන රූපයෙහි ය. **අජ්ඣත්තබහිද්ධාරූපෙ** යි ඒ දෙපරිදි රූපයෙහි ය.

**ආකාසෙ කටිං කම්පෙන්තස්ස** යනු අහසෙහි වෑයම් කරන්නහුගේ හදත් කම්පනය වෙයි.

**රාගූපත්ථම්භෙ** යනු රාගයෙන් පෙළුනහුගේ හදත් කම්පනය වෙයි.

**වච්චූපත්ථම්භෙ** යනු වර්චසින් පෙළුනහුගේ හදත් කම්පනය වෙයි.

**පස්සාවූපත්ථම්භෙ** යනු මූයෙන් පෙළුනහුගේ හදත් කම්පනය වෙයි.

**වාතූපත්ථම්භෙ** යනු වායෙන් පෙළුනහුගේ හදත් කම්පනය වෙයි.

**උච්චාලිඞ්ගපාණකදට්ඨූපත්ථම්භෙ** යනු බූපණුලොම් ගැටීමෙන් හදත් කම්පනය වෙයි.

**ආරොග්‍යත්ථාය** යනු නීරෝගයෙක් වන්නෙමි යි (අදහසින්).

**සුඛත්ථාය** යනු සුවවෙදනා උපදවන්නෙමි යි (අදහසින්).

**භෙසජ්ජත්ථාය** යනු බෙහෙතක් වන්නේයැ යි (සිතා).

**දානත්ථාය** යනු දන් දෙන්නෙමි යි (සිතා).

**පුඤ්ඤත්ථාය** යනු පිණක් වන්නේය යි (සිතා).

**යඤ්ඤත්ථාය** යනු යාගයක් කරන්නෙමි යි (සිතා).

**සග්ගත්ථාය** යනු දෙව්ලොවට යන්නෙමි යි (සිතා).

**බීජත්ථාය** යි දරුකබීජයක් වන්නේ යැ යි (සිතා).

**විමංසත්ථාය** යනු නිල්වන්නේ දැ යි...ගිතෙල් පැහැය වන්නේ දැ යි විමසීම පිණිස.

**දවත්ථාය** යනු කෙළි අදහස් ඇත්තේ.

11. අධ්‍යාත්මරූපයෙහි මිදේවා යි සිතා ද, එයට වෑයම් කෙරේ ද, මිදේ ද, සඟ වෙසෙස් ඇවැත් වේ.

බාහිරරූපයෙහි මිදේවා යි සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඟ වෙසෙස් ඇවැත් වේ.

අධ්‍යාත්ම බාහිර රූපයෙහි සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඟ වෙසෙස් ඇවැත් වේ.

අහසෙහි කටිය සොලොවමින් සිතා ද වෑයම් කෙරේ ද, මිදේ ද, සඟ වෙසෙස් ඇවැත් වේ.

රාගයෙන් තද වූ කල්හි සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඟවෙසෙස් ඇවැත් වේ.

වච්චූපත්ථම්භෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පස්සාවූපත්ථම්භෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

වාතූපත්ථම්භෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.
උච්චාලිඞ්ගපාණකදට්ඨූපත්ථම්භෙ චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

12. ආරොග්‍යත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

සුඛත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

භෙසජ්ජත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

දානත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පුඤ්ඤත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

යඤ්ඤත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

සග්ගත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

බීජත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

වීමංසත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

13. නීලං චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### සුද්ධිකං නිට්ඨිතං

14. ආරොග්‍යත්ථඤ්ච සුඛත්ථඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ආරොග්‍යත්ථඤ්ච භෙසජ්ජත්ථඤ්ච -පෙ- ආරොග්‍යත්ථඤ්ච දානත්ථඤ්ච -පෙ- ආරොග්‍යත්ථඤ්ච පුඤ්ඤත්ථඤ්ච -පෙ- ආරොග්‍යත්ථඤ්ච යඤ්ඤත්ථඤ්ච -පෙ- ආරොග්‍යත්ථඤ්ච සග්ගත්ථඤ්ච -පෙ- ආරොග්‍යත්ථඤ්ච බීජත්ථඤ්ච -පෙ- ආරොග්‍යත්ථඤ්ච වීමංසත්ථඤ්ච -පෙ- ආරොග්‍යත්ථඤ්ච දවත්ථඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### එකමූලකස්ස ඛණ්ඩචක්කං නිට්ඨිතං.

වච්චියෙන් තද වූ කල්හි සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

මුත්‍රයෙන් තද වූ කල්හි සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

වාතයෙන් තද වූ කල්හි සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

බූපණු දළ ගෑවීමෙන් තද වූ කල්හි සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

12. නීරොග බව පිණිස සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. සුව පිණිස සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. බෙහෙත් පිණිස සිතා ද වෑයම් කෙරේද මිදේ ද සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. දන් පිණිස සිතා ද වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. පින් පිණිස සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. යාග පිණිස සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. සග පිණිස සිතා ද වෑයම් කෙරේ ද මිදේ ද සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. දරකබීජයපිණිස සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. කෙළි පිණිස සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. විමසීම පිණිස සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

13. නිල්වන් සුකුරු මිදීමට සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. කසාවන් ... ලෙහෙවන් ... සුදුවන් ... මෝහොරුවන් ... දියවන් ... තෙල්වන් ... කිරිවන් .. දීවන් ... ගිතෙල්වන් සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

සුද්ධිකය නිමි.

14. ආරෝග්‍යය පිණිසත් සුවය පිණිසත්, සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද සඞ්ඝාදිසෙස් ඇවැත් වේ. ආරෝග්‍යය පිණිසත් බෙහෙත් පිණිසත් ... ආරෝග්‍ය පිණිසත් දන් පිණිසත් ... ආරෝග්‍යය පිණිසත් පින් පිණිසත් ... ආරෝග්‍යය පිණිසත් යාග පිණිසත් ... ආරෝග්‍යය පිණිසත් ස්වර්ගය පිණිසත් ... ආරෝග්‍යය පිණිසත් දරකබීජය පිණිසත් ... ආරෝග්‍ය පිණිසත් විමසීම පිණිසත් ... ආරෝග්‍යය පිණිසත් කෙළි පිණිසත් සිතා ද, වෑයම් කෙරේ ද, මිදේ ද, සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

එකමූලක බණ්ඩවක්‍රය නිමි.

15. සුඛත්ථාය භෙසජ්ජත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සුඛත්ථාය දානත්ථාය -පෙ- සුඛත්ථාය පුඤ්ඤත්ථාය -පෙ- සුඛත්ථාය යඤ්ඤත්ථාය -පෙ- සුඛත්ථාය සග්ගත්ථාය -පෙ- සුඛත්ථාය බීජත්ථාය -පෙ- සුඛත්ථාය වීමංසත්ථාය -පෙ- සුඛත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සුඛත්ථාය ආරොග්‍යත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස,

16. භෙසජ්ජත්ථාය දානත්ථාය -පෙ- භෙසජ්ජත්ථාය පුඤ්ඤත්ථාය -පෙ- භෙසජ්ජත්ථාය යඤ්ඤත්ථාය -පෙ- භෙසජ්ජත්ථාය සග්ගත්ථාය -පෙ- භෙසජ්ජත්ථාය බීජත්ථාය -පෙ- භෙසජ්ජත්ථාය වීමංසත්ථාය -පෙ- භෙසජ්ජත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති, මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. භෙසජ්ජත්ථාය ආරොග්‍යත්ථාය -පෙ- භෙසජ්ජත්ථාය සුඛත්ථාය චෙතෙති, උපක්කමති , මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

17 දානත්ථාය පුඤ්ඤත්ථාය -පෙ- දානත්ථාය යඤ්ඤත්ථාය -පෙ- දානත්ථාය සග්ගත්ථාය -පෙ- දානත්ථාය බීජත්ථාය -පෙ- දානත්ථාය වීමංසත්ථාය -පෙ- දානත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. දානත්ථාය ආරොග්‍යත්ථාය -පෙ- දානත්ථාය සුඛත්ථාය -පෙ- දානත්ථාය භෙසජ්ජත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

18. පුඤ්ඤත්ථාය යඤ්ඤත්ථාය -පෙ- පුඤ්ඤත්ථාය සග්ගත්ථාය -පෙ- පුඤ්ඤත්ථාය බීජත්ථාය -පෙ- පුඤ්ඤත්ථාය වීමංසත්ථාය -පෙ- පුඤ්ඤත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පුඤ්ඤත්ථාය ආරොග්‍යත්ථාය -පෙ- පුඤ්ඤත්ථාය සුඛත්ථාය -පෙ- පුඤ්ඤත්ථාය භෙසජ්ජත්ථාය -පෙ- පුඤ්ඤත්ථාය දානත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

19. යඤ්ඤත්ථාය සග්ගත්ථාය -පෙ- යඤ්ඤත්ථාය බීජත්ථාය -පෙ- යඤ්ඤත්ථාය වීමංසත්ථාය -පෙ- යඤ්ඤත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. යඤ්ඤත්ථාය ආරොග්‍යත්ථාය -පෙ- යඤ්ඤත්ථාය සුඛත්ථාය -පෙ- යඤ්ඤත්ථාය භෙසජ්ජත්ථාය -පෙ- යඤ්ඤත්ථාය දානත්ථාය -පෙ- යඤ්ඤත්ථාය පුඤ්ඤත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

20. සග්ගත්ථාය බීජත්ථාය -පෙ- සග්ගත්ථාය වීමංසත්ථාය -පෙ- සග්ගත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදි-සෙසස්ස. සග්ගත්ථාය ආරොග්‍යත්ථාය -පෙ- සග්ගත්ථාය සුඛත්ථාය -පෙ- සග්ගත්ථාය භෙසජ්ජත්ථාය -පෙ- සග්ගත්ථාය දානත්ථාය -පෙ- සග්ගත්ථාය පුඤ්ඤත්ථාය -පෙ- සග්ගත්ථාය යඤ්ඤත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

15. සුව පිණිස ද, බෙහෙත් පිණිස ද, සිතයි නම් වෑයම් කෙරෙයි නම් මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. සුව පිණිස ද දන් පිණිස ද ... සුව පිණිස ද පින් පිණිස ද ... සුව පිණිස ද යාග පිණිස ද ... සුව පිණිස සග පිණිස ද ... සුව පිණිස ද බීජ පිණිස ද ... සුව පිණිස ද විමසුම් පිණිස ද ... සුව පිණිස ද කෙළි පිණිස ද සිතයි නම් වෑයම් කෙරෙයි නම් මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. සුව පිණිස ද ආරොග්‍යය පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

16. බෙහෙත් පිණිස ද දූතය පිණිස ද ... බෙහෙත් පිණිස ද පින් පිණිස ද ... බෙහෙත් පිණිස ද යාග පිණිස ද ... බෙහෙත් පිණිස ද සග පිණිස ද ... බෙහෙත් පිණිස ද බීජ පිණිස ද ... බෙහෙත් පිණිස ද විමසුම් පිණිස ද ... බෙහෙත් පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. බෙහෙත් පිණිස ද ආරොග්‍යය පිණිස ද ... බෙහෙත් පිණිස ද සුව පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

17. දන් පිණිස ද පින් පිණිස ද ... දන් පිණිස ද යාග පිණිස ද ... දන් පිණිස ද සග පිණිස ද ... දන් පිණිස ද බීජ පිණිස ද ... දන් පිණිස ද විමසුම් පිණිස ද ... දන් පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. දන් පිණිස ද ආරොග්‍යය පිණිස ද ... දන් පිණිස ද සුව පිණිස ද ... දන් පිණිස ද බෙහෙත් පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

18. පින් පිණිස ද යාග පිණිස ද ... පින් පිණිස ද සග පිණිස ද ... පින් පිණිස ද බීජ පිණිස ද ... පින් පිණිස ද විමසුම් පිණිස ද ... පින් පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. පින් පිණිස ද ආරොග්‍යය පිණිස ද ... පින් පිණිස ද සුව පිණිස ද ... පින් පිණිස ද බෙහෙත් පිණිස ද .. පින් පිණිස ද දන් පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

19. යාග පිණිස ද සග පිණිස ද ... යාග පිණිස ද බීජ පිණිස ද ... යාග පිණිස ද විමසුම් පිණිස ද ... යාග පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. යාග පිණිස ද ආරොග්‍යය පිණිස ද ... යාග පිණිස ද සුව පිණිස ද ... යාග පිණිස ද බෙහෙත් පිණිස ද ... යාග පිණිස ද දූතය පිණිස ද ... යාග පිණිස ද පින් පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

20. සග පිණිස ද ගැබ් පිණිස ද ... සග පිණිස ද විමසුම් පිණිස ද ... සග පිණිස ද කෙළි පිණිය ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. සග පිණිස ද ආරොග්‍යය පිණිස ද ... සග පිණිස ද සුව පිණිස ද ... සග පිණිස ද බෙහෙත් පිණිස ද ... සග පිණිස ද කෙළි පිණිස ද ... සග පිණිස ද පින් පිණිස ද ... සග පිණිස ද යාග පිණිස ද සිතයි නම් වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

21. බීජත්ථාය වීමංසත්ථාය -පෙ- බීජත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. බීජත්ථාය ආරොග්‍යත්ථාය -පෙ- බීජත්ථාය සුඛත්ථාය -පෙ- බීජත්ථාය භෙසජ්ජත්ථාය -පෙ- බීජත්ථාය දානත්ථාය -පෙ- බීජත්ථාය පුඤ්ඤත්ථාය -පෙ- බීජත්ථාය යඤ්ඤත්ථාය -පෙ- බීජත්ථාය සග්ගත්ථාය චෙතෙති උපක්කමති, මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

22. වීමංසත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. වීමංසත්ථාය ආරොග්‍යත්ථාය -පෙ- වීමංසත්ථාය සුඛත්ථාය -පෙ- වීමංසත්ථාය භෙසජ්ජත්ථාය -පෙ- වීමංසත්ථාය දානත්ථාය -පෙ- වීමංසත්ථාය පුඤ්ඤත්ථාය -පෙ- වීමංසත්ථාය යඤ්ඤත්ථාය -පෙ- වීමංසත්ථාය සග්ගත්ථාය -පෙ- වීමංසත්ථාය බීජත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

23. දවත්ථාය ආරොග්‍යත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. දවත්ථාය සුඛත්ථාය -පෙ- දවත්ථාය භෙසජ්ජත්ථාය, -පෙ- දවත්ථාය දානත්ථාය, -පෙ- දවත්ථාය පුඤ්ඤත්ථාය, -පෙ- දවත්ථාය යඤ්ඤත්ථාය, -පෙ- දවත්ථාය සග්ගත්ථාය, -පෙ- දවත්ථාය බීජත්ථාය, -පෙ- දවත්ථාය වීමංසත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස,

**එකමූලකස්ස බද්ධචක්කං.**

**සඞ්ඛිත්තං.**

**එකමූලකස්ස චක්කපෙය්‍යාලං නිට්ඨිතං.**

24. ආරොග්‍යත්ථාය සුඛත්ථාය භෙසජ්ජත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. -පෙ- ආරොග්‍යත්ථාය සුඛත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**දුමූලකස්ස ඛණ්ඩචක්කං නිට්ඨිතං.**

25. සුඛත්ථාය භෙසජ්ජත්ථාය දානත්ථාය චෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. -පෙ- සුඛත්ථාය භෙසජ්ජත්ථාය දවත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සුඛත්ථාය භෙසජ්ජත්ථාය ආරොග්‍යත්ථාය චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**දුමූලකස්ස බද්ධචක්කං.**

**සඞ්ඛිත්තං.**

21. ගැබ් පිණිස ද විමසුම් පිණිස ද ... ගැබ් පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. ගැබ් පිණිස ද ආරෝග්‍යය පිණිස ද ... ගැබ් පිණිස ද සුව පිණිස ද ... ගැබ් පිණිස ද බෙහෙත් පිණිස ද ... ගැබ් පිණිස ද දන් පිණිස ද ... ගැබ් පිණිස ද පින් පිණිස ද ... ගැබ් පිණිස ද යාග පිණිස ද ... ගැබ් පිණිස ද සග පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

22. විමසුම් පිණිස ද කෙළි පිණිස ද සිතයි නම් වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. විමසුම් පිණිස ද ආරෝග්‍යය පිණිස ද ... විමසුම් පිණිස ද සුව පිණිස ද ... විමසුම් පිණිස ද බෙහෙත් පිණිස ද ... විමසුම් පිණිස ද දන් පිණිස ද ... විමසුම් පිණිස ද පින් පිණිස ද ... විමසුම් පිණිස ද යාග පිණිස ද ... විමසුම් පිණිස ද සග පිණිස ද ... විමසුම් පිණිස ද ගැබ් පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

23. කෙළි පිණිස ද ආරෝග්‍යය පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. කෙළි පිණිස ද සුව පිණිස ද ... කෙළි පිණිස ද බෙහෙත් පිණිස ද ... කෙළි පිණිස ද දන් පිණිස ද ... කෙළි පිණිස ද පින් පිණිස ද ... කෙළි පිණිස ද යාග පිණිස ද ... කෙළි පිණිස ද සග පිණිස ද ... කෙළි පිණිස ද ගැබ් පිණිස ද ... කෙළි පිණිස ද විමසුම් පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම් මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**එකමූලකබද්ධචක්‍රය සංක්‍ෂෙප කරණ ලදී.**

**එකමූලක චක්‍රපෙය්‍යාලය නිමි**

24. ආරෝග්‍යය පිණිස ද සුව පිණිස ද බෙහෙත් පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම් මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. ... ආරෝග්‍යය පිණිස ද සුව පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟ වෙසෙස් ඇවැත් වේ.

**දුමූලක ඛණ්ඩචක්‍රය නිමි.**

25. සුව පිණිස ද බෙහෙත් පිණිස ද දන් පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟ වෙසෙස් ඇවැත් වේ. ... සුව පිණිස ද බෙහෙත් පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. සුව පිණිස ද බෙහෙත් පිණිස ද ආරෝග්‍යය පිණිස ද සිතයි නම් වෑයම් කෙරෙයි නම් මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**දුමූලක බද්ධචක්‍රය සංක්‍ෂිප්තයි.**

26. වීමංසත්ථඤ්ච දවත්ථඤ්ච ආරොග්‍යත්ථඤ්ච චෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. -පෙ- වීමංසත්ථඤ්ච දවත්ථඤ්ච සුඛත්ථඤ්ච -පෙ- වීමංසත්ථඤ්ච දවත්ථඤ්ච බීජත්ථඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### දුමූලකං නිට්ඨිතං.

27. තිමූලකම්පි චතුමූලකම්පි පඤ්චමූලකම්පි ඡමූලකම්පි සත්තමූලකම්පි අට්ඨමූලකම්පි නවමූලකම්පි එවමෙව විත්ථාරෙතබ්බං.

### ඉදං සබ්බමූලකං:

28. ආරොග්‍යත්ථඤ්ච සුඛත්ථඤ්ච භෙසජ්ජත්ථඤ්ච දානත්ථඤ්ච පුඤ්ඤත්ථඤ්ච යඤ්ඤත්ථඤ්ච සග්ගත්ථඤ්ච බීජත්ථඤ්ච වීමංසත්ථඤ්ච දවත්ථඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### සබ්බමූලකං නිට්ඨිතං.

### වත්ථුපෙය්‍යාලං නිට්ඨිතං.

29. නීලඤ්ච පීතකඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. නීලඤ්ච ලොහිතකඤ්ච -පෙ- නීලඤ්ච ඔදාතඤ්ච. -පෙ- නීලඤ්ච තක්කවණ්ණඤ්ච, -පෙ- නීලඤ්ච දකවණ්ණඤ්ච, -පෙ- නීලඤ්ච තෙලවණ්ණඤ්ච, -පෙ- නීලඤ්ච ඛීරවණ්ණඤ්ච, -පෙ- නීලඤ්ච දධිවණ්ණඤ්ච, -පෙ- නීලඤ්ච සප්පිවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස

### එකමූලකස්ස ඛණ්ඩචක්කං.

30. පීතකඤ්ච ලොහිතකඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පීතකඤ්ච ඔදාතඤ්ච -පෙ- පීතකඤ්ච තක්කවණ්ණඤ්ච -පෙ- පීතකඤ්ච දකවණ්ණඤ්ච -පෙ- පීතකඤ්ච තෙලවණ්ණඤ්ච -පෙ- පීතකඤ්ච ඛීරවණ්ණඤ්ච -පෙ- පීතකඤ්ච දධිවණ්ණඤ්ච, -පෙ- පීතකඤ්ච සප්පිවණ්ණඤ්ච -පෙ- පීතකඤ්ච නීලඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### එකමූලකස්ස බද්ධචක්කං,

26. විමසීම පිණිස ද කෙළි පිණිස ද ආරෝග්‍යය පිණිස ද සිතයි, වෑයම් කෙරෙයි, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. ... විමසීම පිණිස ද කෙළි පිණිස ද සුව පිණිස ද ... විමසීම පිණිස ද කෙළි පිණිස ද ගැබි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟ වෙසෙස් ඇවැත් වේ.

**දුවිමූලකය නිමි.**

27. තිමූලකය ද, චතුමූලකය ද, පඤ්චමූලකය ද, ඡමූලකය ද, සත්ත-මූලකය ද, අට්ඨමූලකය ද, නවමූලකය ද මෙසේ ම විස්තර කටයුතු ය.

**මේ සබ්බමූලකයයි:**

28. ආරෝග්‍යය පිණිස ද සුවය පිණිස ද බෙහෙත් පිණිස ද දන් පිණිස ද පින් පිණිස ද යාගය පිණිස ද සග පිණිස ද ගැබි පිණිස ද විමංසනය පිණිස ද කෙළි පිණිස ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟ වෙසෙස් ඇවැත් වේ.

**සබ්බමූලකය නිමි.**

**වත්ථුපෙය්‍යාලය නිමි.**

29. නිල්වන් ද කහවන් ද සිතයි, වෑයම් කෙරෙයි, මිදෙයි, සඟවෙසෙස් ඇවැත් වේ. නිල්වන් ද ලේ වන් ද ... නිල්වන් ද සුදු වන් ද ... නිල්වන් ද මොහොරු වන් ද ... නිල්වන් ද දියවන් ද ... නිල්වන් ද තෙල්වන් ද ... නිල්වන් ද කිරිවන් ද ... නිල්වන් ද දිහිවන් ද ... නිල්වන් ද ගිතෙල්වන් ද සිතයි නම්, වෑයම් කරයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**එකමූලක ඛණ්ඩචක්‍රය නිමි.**

30. කහවන් ද ලේවන් ද සිතයි නම්, වෑයම් කරයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. කහවන් ද සුදුවන් ද ... කහවන් ද මෝරුවන් ද ... කහවන් ද දියවන් ද ... කහවන් ද තෙල්වන් ද ... කහවන් ද කිරිවන් ද ... කහවන් ද දිහිවන් ද ... කහවන් ද ගිතෙල්වන් ද ... කහවන් ද නිල්වන් ද සිතයි නම්, වෑයම් කරයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

**එකමූලක බද්ධචක්‍රය.**

31. ලොහිතකස්ස ඔදාතස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ලොහිතකස්ස තක්කවණ්ණස්ස -පෙ- ලොහිතකස්ස දකවණ්ණස්ස -පෙ- ලොහිතකස්ස තෙලවණ්ණස්ස -පෙ- ලොහිතකස්ස ඛීරවණ්ණස්ස -පෙ- ලොහිතකස්ස දධිවණ්ණස්ස -පෙ- ලොහිතකස්ස සප්පිවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ලොහිතකස්ස නීලස්ස -පෙ- ලොහිතකස්ස පීතකස්ස වෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

32. ඔදාතස්ස තක්කවණ්ණස්ස -පෙ- ඔදාතස්ස දකවණ්ණස්ස -පෙ- ඔදාතස්ස තෙලවණ්ණස්ස -පෙ- ඔදාතස්ස ඛීරවණ්ණස්ස -පෙ- ඔදාතස්ස දධිවණ්ණස්ස -පෙ- ඔදාතස්ස සප්පිවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ඔදාතස්ස නීලස්ස -පෙ- ඔදාතස්ස පීතකස්ස -පෙ- ඔදාතස්ස ලොහිතකස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

33. තක්කවණ්ණස්ස දකවණ්ණස්ස -පෙ- තක්කවණ්ණස්ස තෙලවණ්ණස්ස -පෙ- තක්කවණ්ණස්ස ඛීරවණ්ණස්ස -පෙ- තක්කවණ්ණස්ස දධිවණ්ණස්ස -පෙ- තක්කවණ්ණස්ස සප්පිවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. තක්කවණ්ණස්ස නීලස්ස -පෙ- තක්කවණ්ණස්ස පීතකස්ස -පෙ- තක්කවණ්ණස්ස ලොහිතකස්ස -පෙ- තක්කවණ්ණස්ස ඔදාතස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

34. දකවණ්ණස්ස තෙලවණ්ණස්ස -පෙ- දකවණ්ණස්ස ඛීරවණ්ණස්ස -පෙ- දකවණ්ණස්ස දධිවණ්ණස්ස -පෙ- දකවණ්ණස්ස සප්පිවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. දකවණ්ණස්ස නීලස්ස -පෙ- දකවණ්ණස්ස පීතකස්ස -පෙ- දකවණ්ණස්ස ලොහිතකස්ස -පෙ- දකවණ්ණස්ස ඔදාතස්ස -පෙ- දකවණ්ණස්ස තක්කවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

35. තෙලවණ්ණස්ස ඛීරවණ්ණස්ස -පෙ- තෙලවණ්ණස්ස දධිවණ්ණස්ස -පෙ- තෙලවණ්ණස්ස සප්පිවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. තෙලවණ්ණස්ස නීලස්ස -පෙ- තෙලවණ්ණස්ස පීතකස්ස -පෙ- තෙලවණ්ණස්ස ලොහිතකස්ස තෙලවණ්ණස්ස ඔදාතස්ස -පෙ- තෙලවණ්ණස්ස තක්කවණ්ණස්ස -පෙ- තෙලවණ්ණස්ස දකවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

36. ඛීරවණ්ණස්ස දධිවණ්ණස්ස -පෙ- ඛීරවණ්ණස්ස සප්පිවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ඛීරවණ්ණස්ස නීලකස්ස -පෙ- ඛීරවණ්ණස්ස පීතකස්ස -පෙ- ඛීරවණ්ණස්ස ලොහිතකස්ස -පෙ- ඛීරවණ්ණස්ස ඔදාතස්ස -පෙ- ඛීරවණ්ණස්ස තක්කවණ්ණස්ස -පෙ- ඛීරවණ්ණස්ස දකවණ්ණස්ස -පෙ- ඛීරවණ්ණස්ස තෙලවණ්ණස්ස වෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

31. ලේවත් ද සුදුවත් ද සිතයි නම්, වෑයම් කරයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. ලෙහෙවත් ද මෝරුවත් ද ... ලෙහෙවත් ද දියවත් ද ... ලෙහෙවත් ද තෙල්වත් ද ... ලෙහෙවත් ද කිරිවත් ද ... ලෙහෙවත් ද දිහිවත් ද ... ලෙහෙවත් ද ගිතෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

32. ලෙහෙවත් ද නිල්වත් ද ... ලෙහෙවත් ද කහවත් ද සිතයි නම්, වෑයම් කරයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. සුදුවත් ද මෝරුවත් ද ... සුදුවත් ද දියවත් ද ... සුදුවත් ද තෙල්වත් ද ... සුදුවත් ද කිරිවත් ද ... සුදුවත් ද දීවත් ද ... සුදුවත් ද ගිතෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. සුදුවත් ද නිල්වත් ද ... සුදුවත් ද කහවත් ද ... සුදුවත් ද ලෙහෙවත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

33. මෝරුවත් ද දියවත් ද ... මෝරුවත් ද තෙල්වත් ද ... මෝරුවත් ද කිරිවත් ද ... මෝරුවත් ද දීවත් ද ... මෝරුවත් ද ගිතෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟ වෙසෙස් ඇවැත් වේ. මෝරුවත් ද නිල්වත් ද ... මෝරුවත් ද කහවත් ද ... මෝරුවත් ද ලෙහෙවත් ද ... මෝරුවත් ද සුදුවත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

34. දියවත් ද තෙල්වත් ද ... දියවත් ද කිරිවත් ද ... දියවත් ද දීවත් ද ... දියවත් ද ගිතෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. දියවත් ද නිල්වත් ද ... දියවත් ද කහවත් ද ... දියවත් ද ලෙහෙවත් ද ... දියවත් ද සුදුවත් ද ... දියවත් ද මෝරුවත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

35. තෙල්වත් ද කිරිවත් ද ... තෙල්වත් ද දීවත් ද ... තෙල්වත් ද ගිතෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. තෙල්වත් ද නිල්වත් ද ... තෙල්වත් ද කහවත් ද ... තෙල්වත් ද ලෙහෙවත් ද ... තෙල්වත් ද සුදුවත් ද ... තෙල්වත් ද මෝරු වත් ද ... තෙල් වත් ද දිය වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

36. කිරිවත් ද දීවත් ද ... කිරිවත්ද ගිතෙල්වත් ද ... සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. කිරිවත් ද නිල්වත් ද ... කිරිවත් ද කහවත් ද ... කිරිවත් ද ලෙහෙවත් ද ... කිරිවත් ද සුදුවත් ද ... කිරිවත් ද මෝරුවත් ද ... කිරිවත් ද දියවත් ද ... කිරිවත් ද තෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

37. දධිවණ්ණඤ්ච සප්පිවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. දධිවණ්ණඤ්ච නීලඤ්ච -පෙ- දධිවණ්ණඤ්ච පීතකඤ්ච -පෙ- දධිවණ්ණඤ්ච ලොහිතකඤ්ච -පෙ- දධිවණ්ණඤ්ච ඔදාතඤ්ච -පෙ- දධිවණ්ණඤ්ච තක්කවණ්ණඤ්ච -පෙ- දධිවණ්ණඤ්ච දකවණ්ණඤ්ච -පෙ- දධිවණ්ණඤ්ච තෙලවණ්ණඤ්ච -පෙ- දධිවණ්ණඤ්ච ඛීරවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

38. සප්පිවණ්ණං ච නීලං ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සප්පිවණ්ණඤ්ච පීතකඤ්ච -පෙ- සප්පිවණ්ණඤ්ච ලොහිතකඤ්ච -පෙ- සප්පිවණ්ණඤ්ච ඔදාතඤ්ච -පෙ- සප්පිවණ්ණඤ්ච තක්කවණ්ණඤ්ච -පෙ- සප්පිවණ්ණඤ්ච දකවණ්ණඤ්ච -පෙ- සප්පිවණ්ණඤ්ච තෙලවණ්ණඤ්ච -පෙ- සප්පිවණ්ණඤ්ච ඛීරවණ්ණඤ්ච -පෙ- සප්පිවණ්ණඤ්ච දධිවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### එකමූලකස්ස බද්ධචක්කං නිට්ඨිතං.

39. නීලඤ්ච පීතකඤ්ච ලොහිතඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. නීලඤ්ච පීතකඤ්ච ඔදාතකඤ්ච -පෙ- නීලඤ්ච පීතකඤ්ච සප්පිවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### දුමූලකස්ස ඛණ්ඩචක්කං.

40. පීතකඤ්ච ලොහිතකඤ්ච ඔදාතඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. -පෙ- පීතකඤ්ච ලොහිතකඤ්ච සප්පිවණ්ණඤ්ච -පෙ- පීතකඤ්ච ලොහිතකඤ්ච නීලඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### දුමූලකස්ස බද්ධචක්කං.

41. දධිවණ්ණඤ්ච සප්පිවණ්ණඤ්ච නීලඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. -පෙ- දධිවණ්ණඤ්ච සප්පිවණ්ණඤ්ච ඛීරවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### දුමූලකං නිට්ඨිතං.

42. තිමූලකම්පි චතුමූලකම්පි පඤ්චමූලකම්පි ඡමූලකම්පි සත්තමූලකම්පි අට්ඨමූලකම්පි නවමූලකම්පි එවමෙව විත්ථාරෙතබ්බං.

37. දිගිවත් ද ගිතෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. දීවත් ද නිල්වත් ද ... දීවත් ද කහවත් ද ... දීවත් ද ලෙහෙවත් ද ... දීවත් ද සුදුවත් ද ... දීවත් ද මෝරුවත් ද ... දීවත් ද දියවත් ද ... දීවත් ද තෙල්වත් ද ... දීවත් ද කිරිවත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

38. ගිතෙල්වත් ද නිල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. ගිතෙල්වත් ද කහවත් ද ... ගිතෙල්වත් ද ලේවත් ද ... ගිතෙල්වත් ද සුදුවත් ද ... ගිතෙල්වත්ද මෝරුවත් ද ... ගිතෙල්වත් ද දියවත් ද ... ගිතෙල්වත් ද තෙල්වත් ද ... ගිතෙල්වත් ද කිරිවත් ද ... ගිතෙල්වත් ද දීවත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

එකමූලක බද්ධචක්‍රය නිමි.

39. නිල්වත් ද කහවත් ද ලේවත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. නිල්වත් ද කහවත් ද සුදුවත් ද ... නිල්වත් ද ගිතෙල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

දුවිමූලක ඛණ්ඩචක්‍රය.

40. කහවත් ද ලේවත් ද සුදුවත් ද සිතයි නම්, වෑයම් කරයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. ... කහවත් ද ලේවත් ද ගිතෙල්වත් ද ... කහවත් ද ලේවත් ද නිල්වත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ.

දුවිමූලක බද්ධචක්‍රය නිමි.

41. දිගිවත් ද ගිතෙල්වත් ද නිල්වත් ද සිතයි නම්, වෑයම් කරයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. දිගිවත් ද ගිතෙල්වත් ද කිරිවත් ද සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

දුවිමූලකය නිමි.

42. තිමූලකය ද චතුමූලකය ද පඤ්චමූලකය ද ඡමූලකය ද සත්තමූලකය ද අට්ඨමූලකය ද නවමූලකය ද මෙසේ ම විස්තර කටයුතුයි.

### ඉදං සබ්බමූලකං:

43. නීලඤ්ච පීතකඤ්ච ලොහිතකඤ්ච ඔදාතඤ්ච තක්කවණ්ණඤ්ච දකවණ්ණඤ්ච තෙලවණ්ණඤ්ච ඛීරවණ්ණඤ්ච දධිවණ්ණඤ්ච සප්පිවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### සබ්බමූලකං නිට්ඨිතං.

44. ආරොග්‍යත්ථඤ්ච නීලඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ආරොග්‍යත්ථඤ්ච සුඛත්ථඤ්ච නීලඤ්ච පීතකඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ආරොග්‍යත්ථඤ්ච සුඛත්ථඤ්ච භෙසජ්ජත්ථඤ්ච නීලඤ්ච පීතකඤ්ච ලොහිතකඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. -පෙ- සප්පිවණ්ණං චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### උභතොවඩ්ඪකං එවමෙව නෙතබ්බං.[1]

45. ආරොග්‍යත්ථඤ්ච සුඛත්ථඤ්ච භෙසජ්ජත්ථඤ්ච දානත්ථඤ්ච පුඤ්ඤත්ථඤ්ච යඤ්ඤත්ථඤ්ච සග්ගත්ථඤ්ච බීජත්ථඤ්ච වීමංසත්ථඤ්ච දවත්ථඤ්ච නීලඤ්ච පීතකඤ්ච ලොහිතකඤ්ච ඔදාතඤ්ච තක්කවණ්ණඤ්ච දකවණ්ණඤ්ච තෙලවණ්ණඤ්ච ඛීරවණ්ණඤ්ච දධිවණ්ණඤ්ච සප්පිවණ්ණඤ්ච චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### මිස්සකචක්කං නිට්ඨිතං.

46. නීලං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, පීතකං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. නීලං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### ඛණ්ඩචක්කං නිට්ඨිතං

47. පීතකං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, ලොහිතකං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පීතකං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං -පෙ- නීලං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### බද්ධචක්කං.

### මූලං සඞ්ඛිත්තං.

1. වඩ්ඪෙතබ්බං. මජසං.

**මේ සබ්බමූලකය යි:**

43. නිල්වන් ද කහවන් ද ලේවන් ද සුදුවන් ද මෝරුවන් ද දියවන් ද තෙල්වන් ද කිරිවන් ද දීවන් ද ගිතෙල්වන් ද සිතයි නම්, වැයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවත් වේ.

**සබ්බමූලකය නිමි.**

44. ආරොග්‍යය පිණිස ද නිල්වන් ද සිතයි නම්, වැයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස් ඇවැත් වේ. ආරොග්‍යය පිණිස ද සුව පිණිස ද නිල්වන් ද කහවන් ද සිතයි නම්, වැයම් කෙරෙයි නම්, මිදෙයි නම් සඟවෙසෙස්ඇවැත් වේ. ආරොග්‍යය පිණිස ද සුව පිණිස ද බෙහෙත් පිණිස ද නිල්වන් ද කහවන් ද ලේවන් ද සිතයි නම්, වැයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. ... ගිතෙල්වන් සිතයි නම්, වැයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**දෙපසින් වැඩෙන සේ මේ පරිද්දෙන් පැමිණවිය යුතුයි.**

45. ආරොග්‍යය පිණිස ද සුව පිණිස ද බෙහෙත් පිණිස ද දන් පිණිස ද පින් පිණිස ද යාගය පිණිස ද සග පිණිස ද ගබ් පිණිස ද විම්සුම් පිණිස ද කෙළි පිණිස ද නිල්වන් ද කහවන් ද ලේවන් ද සුදුවන් ද මෝරුවන් ද දියවන් ද තෙල්වන් ද කිරිවන් ද දිහිවන් ද ගිතෙල්වන් ද සිතයි නම්, වැයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**මිශ්‍රකචක්‍රය නිමි.**

46. නිල්වන් සුකුරු මුදන්නෙම් යි සිතයි නම්, වැයම් කෙරෙයි නම්, කහවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. නිල්වන් සුකුරු මුදන්නෙම් යි සිතයි නම්, වැයම් කෙරෙයි නම්, ලෙහෙවන් ... සුදුවන් ... මෝරුවන් ... දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් ... ගිතෙල්වන් මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**ඛණ්ඩචක්‍රය නිමි.**

47. කහවන් සුකුරු මුදන්නෙම් යි සිතයි නම්, වැයම් කෙරෙයි නම්, ලේවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. කහවන් ... මුදන්නෙම් යි සිතයි නම්, වැයම් කෙරෙයි නම්, සුදුවන් ... මෝරුවන් ... දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් ... ගිතෙල්වන් ... නිල්වන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**බද්ධචක්‍රයයි.**

**මූලය සංක්ෂේපය.**

48. සප්පිවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, නීලං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සප්පිවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**කුච්ඡිචක්කං නිට්ඨිතං.**

49. පීතකං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, නීලං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති නීලං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**පිට්ඨිචක්කස්ස පඨමං ගමනං නිට්ඨිතං.**

50. ලොහිතකං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, පීතකං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං -පෙ- නීලං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති පීතකං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**පිට්ඨිචක්කස්ස දුතියං ගමනං නිට්ඨිතං.**

51. ඔදාතං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති ලොහිතකං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං -පෙ- නීලං -පෙ- පීතකං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති. ලොහිතකං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**පිට්ඨිචක්කස්ස තතියං ගමනං නිට්ඨිතං**

52. තක්කවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති ඔදාතං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං -පෙ- නීලං -පෙ- පීතකං -පෙ- ලොහිතකං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, ඔදාතං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**පිට්ඨිචක්කස්ස චතුත්ථං ගමනං නිට්ඨිතං.**

48. ගිතෙල්වන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, නිල්වන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. ගිතෙල්වන් මුදන්නෙමි යි සිතයි නම්, වෑයම්කෙරෙයි නම්, කහවන් ... ලේවන් ... සුදුවන් ... මෝරුවන් ... දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**කුවජ්වක්‍රය නිමි.**

49. කහවන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, නිල්වන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. ලේවන් ... සුදුවන් ... මෝරුවන් ... දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් ... ගිතෙල්වන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, නිල්වන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**පිට්ඨිචක්‍රය පිළිබඳ පළමුවන ගමන නිමි.**

50. ලේවන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, කහවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. සුදුවන් ... මෝරුවන් ... දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් ... ගිතෙල්වන් ... නිල්වන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, කහවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**පිට්ඨිචක්‍රය පිළිබඳ දෙවන ගමන නිමි.**

51. සුදුවන් සුකුරු මුදන්නෙමියි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, ලේවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. මෝරුවන් සුකුරු ... දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් ... ගිතෙල්වන් ... නිල්වන් ... කහවන් සුකුරු මුදන්නෙමි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, ලේවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**පිට්ඨිචක්‍රය පිළිබඳ තෙවෙනි ගමන නිමි.**

52. මෝරුවන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, සුදුවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් ... ගිතෙල්වන් ... නිල්වන් ... කහවන් ... ලේවන් සුකුරු මුදන්නෙමි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, සුදුවන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**පිට්ඨිචක්‍රය පිළිබඳ සිවුවන ගමන නිමි.**

53. දකවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, තක්කවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං -පෙ- නීලං -පෙ- පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, තක්කවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පිට්ඨිචක්කකස්ස පඤ්චමං ගමනං නිට්ඨිතං.

54. තෙලවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, දකවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං -පෙ- නීලං -පෙ- පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, දකවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පිට්ඨිචක්කකස්ස ඡට්ඨං ගමනං නිට්ඨිතං.

55. ඛීරවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, තෙලවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. දධිවණ්ණං -පෙ- සප්පිවණ්ණං -පෙ- නීලං -පෙ- පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති තෙලවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පිට්ඨිචක්කකස්ස සත්තමං ගමනං නිට්ඨිතං.

56. දධිවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, ඛීරවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සප්පිවණ්ණං -පෙ- නීලං -පෙ- පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, ඛීරවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පිට්ඨිචක්කකස්ස අට්ඨමං ගමනං නිට්ඨිතං.

57. සප්පිවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති දධිවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. නීලං -පෙ- පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, දධිවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පිට්ඨිචක්කකස්ස නවමං ගමනං නිට්ඨිතං.

53. දියවත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මෝරුවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. තෙල්වත් ... කිරිවත් ... දිහිවත් ... ගිතෙල්වත් ... තිල්වත් ... කහවත් ... ලේවත් ... සුදුවත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මෝරුවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

### පිටසීවක්‍රය පිළිබඳ පස්වන ගමන නිමි.

54. තෙල්වත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, දියවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. කිරිවත් ... දිහිවත් ... ගිතෙල්වත් ... තිල්වත් ... කහවත් ... ලේවත් ... සුදුවත් ... මෝරුවත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, දියවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

### පිටසීවක්‍රය පිළිබඳ සවන ගමන නිමි.

55. කිරිවත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, තෙල්වත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. දිහිවත් ... ගිතෙල් වත් ... තිල්වත් ... කහවත් ... ලේවත් ... සුදුවත් ... මොහොරුවත් ... දියවත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, තෙල්වත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

### පිටසීවක්‍රය පිළිබඳ සත්වන ගමන නිමි.

56. දිහිවත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, කිරිවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. ගිතෙල්වත් ... තිල්වත් ... කහවත් ... ලේවත් ... සුදුවත් ... මෝරුවත් ... දියවත් ... තෙල්වත් ... සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, කිරිවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

### පිටසීවක්‍රය පිළිබඳ අටවන ගමන නිමි.

57. ගිතෙල්වත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, දිහිවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. තිල්වත් ... කහවත් ... ලේවත් ... සුදුවත් ... මෝරුවත් ... දියවත් ... තෙල්වත් ... කිරිවත් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, දිහිවත් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

### පිටසීවක්‍රය පිළිබඳ නවවන ගමන නිමි.

58. නීලං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, සප්පිවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පීතකං -පෙ- ලොහිතකං -පෙ- ඔදාතං -පෙ- තක්කවණ්ණං -පෙ- දකවණ්ණං -පෙ- තෙලවණ්ණං -පෙ- ඛීරවණ්ණං -පෙ- දධිවණ්ණං මොචෙස්සාමීති චෙතෙති උපක්කමති, සප්පිවණ්ණං මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**පිට්ඨිචක්කස්ස දසමං ගමනං නිට්ඨිතං**

**පිට්ඨිචක්කං නිට්ඨිතං**

59. චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස;

චෙතෙති උපක්කමති න මුච්චති, ආපත්ති ථුල්ලච්චයස්ස;

චෙතෙති න උපක්කමති මුච්චති, අනාපත්ති;

චෙතෙති න උපක්කමති න මුච්චති, අනාපත්ති;

න චෙතෙති උපක්කමති මුච්චති, අනාපත්ති;

න චෙතෙති උපක්කමති න මුච්චති, අනාපත්ති;

න චෙතෙති න උපක්කමති මුච්චති, අනාපත්ති;

න චෙතෙති න උපක්කමති න මුච්චති, අනාපත්ති.

60. අනාපත්ති සුපිනන්තෙන, න මොචනාධිප්පායස්ස, උම්මත්තකස්ස, ඛිත්තචිත්තස්ස, වෙදනාට්ටස්ස, ආදිකම්මිකස්සාති.

---

## විනීතවත්ථු.

**උද්දානගාථා.**

සුපිනො උච්චාරපස්සාවො විතක්කුණ්හොදකෙන ච
භෙසජ්ජං කණ්ඩුවං මග්ගො වත්ථිජන්තාඝරං [1]ඌරු.

සාමණෙරෙ ච සුත්තො ච ඌරු මුට්ඨිනා පීළයි
ආකාසෙ ථම්භං නිජ්ඣායි ඡිද්දං කට්ඨෙන ඝට්ටයී.

සොතෙ උදඤ්ජලං ධාවං පුප්ඵාවලියපොක්ඛරං
වාලිකා කද්දමුස්සෙකො සයනඞ්ගුට්ඨකෙන චාති.

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො සුපිනන්තෙන අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි: කච්චි නු ඛො අහං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපන්නො'ති. අථ ඛො සො භික්ඛු භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "අනාපත්ති භික්ඛු සුපිනන්තෙනා"ති. (1)

---

1. ජන්තාඝරූපක්කමො මජසං.

58. තිල්වන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, ගිතෙල්වන් සුකුරු මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ. කහවන් ... ලේවන් ... සුදුවන් ... මෝරුවන් ... දියවන් ... තෙල්වන් ... කිරිවන් ... දිහිවන් සුකුරු මුදන්නෙමි යි සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, ගිතෙල්වන් සුකුරුමිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

**පිටසිවක්‍රය පිළිබඳ දසවැනි ගමන නිමි.**

**පිටසිවක්‍රය නිමි.**

59. සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදෙයි නම්, සඟවෙසෙස් ඇවැත් වේ.

සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, නො මිදේ නම්, ථුල්ලසිඇවැත් වේ.

සිතයි නම්, වෑයම් නො කෙරෙයි නම්, මිදෙයි නම්, ඇවැත් නො වේ.

සිතයි නම්, වෑයම් නො කෙරෙයි නම්, නො මිදේ නම්, ඇවැත් නො වේ.

නො සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, මිදේ නම්, ඇවැත් නො වේ.

නො සිතයි නම්, වෑයම් කෙරෙයි නම්, නො මිදේ නම්, ඇවැත් නො වේ.

නො සිතයි නම්, වෑයම් නො කෙරෙයි නම්, මිදෙයි නම්, ඇවැත් නො වේ.

නො සිතයි නම්, වෑයම් නො කෙරෙයි නම්, නො මිදේ නම් ඇවැත් නො වේ.

60. සිහිනෙන් ද, නො මුදන අදහස් ඇත්තහුට ද, උම්තුවූවහුට ද, වික්ෂිප්ත සිත් ඇත්තහුට ද, වේදනාවෙන් පෙළෙන්නහුට ද, ආදි කම්මිකයාට ද ඇවැත් නො වේ.

---

## විනිශ්චිත වස්තු

**උද්දානගාථා**

සුපින, උච්චාර, පස්සාව, කාමවිතක්ක, උණ්ණොදක, භෙසජ්ජ, කණ්ඩූව, මග්ග, වත්ථි, ජන්තාඝර, ඌරු යන වස්තූහු ද.

සාමණෙර, සුත්තසාමණෙර, ඌරු, මුට්ඨිපිළන, ආකාසකම්පන, කායත්ථම්භ, උපනිජ්ඣාන, තාලච්ඡිද්ද, කට්ඨඝට්ටන වස්තූහු ද.

පටිසොතනහායන, උදඤ්ජල, උදකධාවන, පුප්ඵාවලි, පොක්ඛරවන, වාලිකා, කද්දම, උසෙසක, සයන, අඞ්ගුට්ඨක යන වස්තූහු ද යි විනීත වස්තු සම සැත්තෑවකි.

1. එසමයෙහි එක්තරා මහණකුට සිහිනෙන් සුකුරු මිදිනි. කිමෙ?, මම සඟවෙසෙස් ඇවැතට අවන්නෙම් දෝයි ඒ මහණහට කුකුස් උපනි. ඉක්බිති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. "මහණ, සිහිනෙන් ඇවැත් නො වේ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො උච්චාරං කරොන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- භගවතො එතමත්ථං ආරොචෙසි. "කිංචිත්තො ත්වං භික්ඛූ"ති. "නාහං භගවා මොචනාධිප්පායො"ති. "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (2)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පස්සාවං කරොන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (3)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො කාමවිතක්කං විතක්කෙන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු විතක්කෙන්තස්සා"ති. (4)

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො උණ්හොදකෙන නහායන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "කිංචිත්තො ත්වං භික්ඛූ"ති. "නාහං භගවා මොචනාධිප්පායො"ති. "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (5)

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස උණ්හොදකෙන නහායන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (6)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස උණ්හොදකෙන නහායන්තස්ස අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (7)

8. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො අඞ්ගජාතෙ වණො හොති, භෙසජ්ජෙන ආලිම්පෙන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (8)

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො අඞ්ගජාතෙ වණො හොති, [1]මොචනාධිප්පායස්ස භෙසජ්ජෙන ආලිම්පෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (9-10)

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො අණ්ඩං කණ්ඩුවන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (11)

11. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස අණ්ඩං කණ්ඩුවන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (12-13)

12. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මග්ගං ගච්ඡන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (14)

1. තස්ස මොචනාධිප්පායස්ස සෘා,

2. එසමයෙහි එක්තරා මල පහ කරණ මහණකුට සුකුරු මිදිනි. ඒ මහණහට කුකුස් උපනි. ... භාග්‍යවතුන් වහන්සේට මේය සැල කෙළේ ය. "මහණ, තෝ කෙබඳු සිතැති වූයෙහිදැ"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළසේක. "භාග්‍යවතුන් වහන්ස, මම නො මුදන රිසිවීම්"යි හේ කීය. "මහණ, නො මුදන රිසියහුට ඇවැත් නො වේය යි. භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (2)

3. එසමයෙහි සුළුවටත් කරණ, එක්තරා මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් උපනි ... "මහණ, නො මුදන රිසියහුට ඇවැත් නො වේ"ය යි වදාළ සේක. (3)

4. එසමයෙහි කාමවිතකී උපදවන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් උපනි ... "මහණ, විතකීණය කරන්නහුට ඇවැත් නො වේ"ය යි වදාළ සේක. (4)

5. එසමයෙහි උණුදිය නාන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් උපනි ... "මහණ, තෝ කුමන සිතැති වූයෙහි ද?"යි අසා වදාළසේක. භාග්‍යවතුන් වහන්ස, මම් මුදන රිසියෙම් නො වීම්" යි හේ කී ය. "මහණ, මුදනු නො රිසියහුට ඇවැත් නො වේ. (5)

6. එසමයෙහි මුදන රිසියැති උණුදිය නාන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් උපනි. ... "මහණ, තෝ සඟවෙසෙස් ඇවැත් අවන්-නෙහි ය යි" වදාළසේක. (6)

7. එසමයෙහි මුදන රිසිඇති උණුදිය නාන එක්තරා මහණකුට සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් උපනි. ... "මහණ, සඟවෙසෙස් ඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ" ය යි වදාළසේක. (7)

8. එසමයෙහි එක්තරා මහණකුගේ රහසඟෙහි වණයෙක් වෙයි. බෙහෙත් ආලේප කරණ ඒ මහණහට සුකුරු මිදිනි. ඔහුට කුකුස් උපනි ... "මහණ, නො මුදන රිසියහුට ඇවැත් නො වේ" යි වදාළසේක. (8)

9. එසමයෙහි එක්තරා මහණකුගේ රහසඟ වණයක් වෙයි. මුදන රිසි ඇති බෙහෙදින් අලෙවූ දෙන්නහුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් උපනි ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලසි-ඇවැත් වේ." ය යි වදාළසේක. (9-10)

10. එසමයෙහි අණ්ඩය කසන්නාවූ එක්තරා මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, නුමුදන රිසියහුට ඇවැත් නො වේ."යි වදාළසේක. (11)

11. එසමයෙහි මුදන අදහස ඇති අණ්ඩය කසන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුසෙක් විය. ... මහණ, සඟ-වෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලසිඇවැත් වේ." යි වදාළසේක. (12-13)

12. එසමයෙහි මඟ යන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් උපනි. "මහණ, මුදන නො රිසියහුට ඇවැත් නො වේ" යි වදාළසේක. (14)

13. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස මග්ගං ගච්ඡන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (15-16)

14. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො වත්ථිං ගහෙත්වා පස්සාවං කරොන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (17)

15. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස වත්ථිං ගහෙත්වා පස්සාවං කරොන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (18-19)

16. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ජන්තාඝරෙ උදරවට්ටිං තාපෙන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (20)

17. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස ජන්තාඝරෙ උදරවට්ටිං තාපෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (21-22)

18. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ජන්තාඝරෙ උපජ්ඣායස්ස පිට්ඨිපරිකම්මං කරොන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (23)

19. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස ජන්තාඝරෙ උපජ්ඣායස්ස පිට්ඨිපරිකම්මං කරොන්තස්ස අසුචි මුච්චි- පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සාති. (24-25)

20 තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ඌරුං ඝට්ටාපෙන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (26)

21. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස ඌරුං ඝට්ටාපෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස, ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (27-28)

22. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මොචනාධිප්පායො අඤ්ඤතරං සාමණෙරං එතදවොච: "එහි මෙ ත්වං ආවුසො සාමණෙර අඞ්ගජාතං ගණ්හාහී"ති සො තස්ස අඞ්ගජාතං අග්ගහෙසි, තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (29)

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සුත්තස්ස සාමණෙරස්ස අඞ්ගජාතං අග්ගහෙසි, තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (30)

13. එසමයෙහි මුදත රිසි ඇති මග යන එක්තරා මහණකුට සුකුරු මිදිනි… සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, සඟවෙසෙස්-ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළසේක. (15–16)

14. එසමයෙහි රහසඟ ගෙණ හුළුවටත් කරණ එක්තරු මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. … 'මහණ, නො මුදත රිසියහුට ඇවැත්නොවේ"යි වදාළසේක. (17)

15. එසමයෙහි මුදත රිසි ඇතිවැ රහසඟ ගෙණ සුළුවටත් කරණ එක්තරු මහණකුට සුකුරු මිදිනි. … සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, සඟවෙසෙස් ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළසේක. (18–19)

16. එසමයෙහි ගිහිහල්ගෙහි උදරය තවන එක්තරු මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, නො මුදත රිසියහුට ඇවැත් නො වේ" යි වදාළසේක. (20)

17. එසමයෙහි ගිහිහල්ගෙහි උදරය තවන මුදිත රිසි එක්තරු මහණකුට සුකුරු මිදිනි. … සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළසේක. (21–22)

18. එසමයෙහි ගිහිහල්ගෙහි උවදු තෙරුන්ගේ පිට පිරිමදින එක්තරු මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, නො මුදත රිසියහුට ඇවැත් නො වේ. (23)

19. එසමයෙහි මුදත රිසි ඇති ගිහිහල්ගෙහි උවදු තෙරුන්ගේ පිට පිරිමදින එක්තරු මහණකුට සුකුරු මිදිනි. … සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ" යි වදාළසේක. (24–25)

20. එසමයෙහි එක්තරු මහණකු දෙවටොර ගටද්දී සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, මුදත රිසි නැත්තහුට ඇවැත් නො වේ" යි වදාළසේක. (26)

21. එසමයෙහි මිදියැටි ව වටොර ගටන මහණකුට සුකුරු මිදිනි. … සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ." (27–28)

22. එසමයෙහි එක්තරු මහණෙක් සුකුරු මිදියැටි ව එක්තරු හෙරණකුට "ඇවැත් හෙරණ, එව තෝ මගේ රහසඟ ගණුව"යි කී ය. හේ ඔහුගේ රහසඟ ගති. ඔහුව සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, තෝ සඟවෙසෙස්ඇවැත් අවත්තෙහි" ය යි බුදුහු වදාළහ. (29)

23. එසමයෙහි එක්තරා මහණෙක් නිදි ගත් හෙරණකුගේ රහසඟ ගත. ඔහුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. … "මහණ, සඟවෙසෙස්-ඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ" යි බුදුහු වදාළහ. (30)

24. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස ඌරුහි අඞ්ගජාතං පීළෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (31-32)

25. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස මුට්ඨිනා අඞ්ගජාතං පීළෙන්තස්ස අසුචි මුච්චි. -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (33-34)

26. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස ආකාසෙ කටිං කම්පෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (35-36)

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො කායං ථම්භෙන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (37)

28. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස කායං ථම්භෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (38-39)

29. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාරත්තො මාතුගාමස්ස අඞ්ගජාතං උපනිජ්ඣායි. තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. න ච භික්ඛවෙ සාරත්තෙන මාතුගාමස්ස අඞ්ගජාතං උපනිජ්ඣායිතබ්බං, යො උපනිජ්ඣායෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති. (40)

30. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස තාළච්ඡිද්දං අඞ්ගජාතං පවෙසෙන්තස්ස අසුචි මුච්චි. -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සාති. (41-42)

31. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස කට්ඨෙන අඞ්ගජාතං ඝට්ටෙන්තස්ස අසුචි මුච්චි. -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (43-44)

32. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පටිසොතෙ නහායන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (45)

33. තෙ ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස පටිසොතෙ නහායන්තස්ස[1] අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (46-47)

1. නහායන්තස්ස. සී. මු.

24. එසමයෙහි මිදියැටි ව රහසභ වටොරින් පෙළන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. .. "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ" යි බුදුහු වදාළහ. (31-32)

25. එසමයෙහි රහසඟ මිටින් පෙළන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්-ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළහ. (33-34)

26. එසමයෙහි අහසෙහි කටිකම්පනය කරණ මිදියැටි වූ එක්තරා මහණ-කුට සුකුරු මිදිනි ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය .... "මහණ, සඟවෙසෙස් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළහ. (35-36)

27. එසමයෙහි කය වජඹන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, නොමුදන රිසි ඇතියහුට ඇවැත් නො වේ"යි වදාළහ. (37)

28. එසමයෙහි කය තද කරණ මිදියැටි වූ එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්-ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළහ. (38-39)

29. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ මාගමකගේ අඞ්ග-ජාතය සිත එළවා බැලී ය. ඔහුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. මහණහු විසින් සංරක්ත ව මාගමකගේ අඞ්ගජාතය නො බැලිය යුතු සි. යමෙක් බලන්නේ නම් දුකුළාඇවැත් වේ"යි වදාළහ. (40)

30. එසමයෙහි මිදියැටි ව කෙසිසිදුරක අඞ්ගජාතය මෙහෙයන මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළහ. (41-42)

31. එසමයෙහි මිදියැටි ව දඬුයෙකින් රහසඟ ගටන මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්-ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළහ. (43-44)

32. එසමයෙහි උඩුහොය බලා නාන මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, මුදන රිසි නැත්තහුට ඇවැත් නො වේ" යි වදාළහ. (45)

33. එසමයෙහි උඩුහොය බලා නාන මිදියැටි වූ මහණකුට සුකුරු මිදිනි....සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්-ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළහ. (46-47)

34. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො උදඤ්ජලං කීළන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (48)

35. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස උදඤ්ජලං කීළන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති.-(49-50)

36. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො උදකෙ ධාවන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (51)

37. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස උදකෙ ධාවන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (52-53)

38. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පුප්ඵාවලියං කීළන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (54)

39. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස පුප්ඵාවලියං කීළන්තස්ස අසුචි මුච්චි. -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (55-56)

40. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පොක්ඛරවනෙ ධාවන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (57)

41. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස පොක්ඛරවනෙ ධාවන්තස්ස අසුචි මුච්චි. -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (58-59)

42. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස වාලිකං අඞ්ගජාතං පවෙසෙන්තස්ස[1] අසුචි මුච්චි. -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (60-61)

43. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස කද්දමං අඞ්ගජාතං පවෙසෙන්තස්ස[1] අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (62-63)

44. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො න මොචනාධිප්පායස්ස උදකෙන අඞ්ගජාතං ඔසිඤ්චන්තස්ස අසුචි මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු න මොචනාධිප්පායස්සා"ති. (64)

---

1. පවෙසන්තස්ස- සී මු.

34. එසමයෙහි මඩදියෙහි ක්‍රීඩා කරණ මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. ... මහණ, මුදන රිසි නැතියහුට ඇවැත් නො වේ"යි වදාළහ. (48)

35. එසමයෙහි මඩදියෙහි ක්‍රීඩා කරණ මිදියැටි මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඞවෙසෙස්-ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළහ. (49-50)

36. එසමයෙහි දියෙහි දුවන මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, මුදන රිසි නැත්තහුට ඇවැත් නො වේ"යි වදාළහ. (51)

37. එසමයෙහි දියෙහි දුවන මිදියැටි මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඞවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළහ. (52-53)

38. එසමයෙහි පුෂ්පාවලී ක්‍රීඩාව[1] කරණ මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, නොමුදන රිසි ඇතියහුට ඇවැත් නො වේ"යි වදාළහ. (54)

39. එසමයෙහි පුෂ්පාවලී[1] ක්‍රීඩාව කරණ මිදියැටි එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. "මහණ, සඞවෙසෙස්-ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළහ. (55-56)

40. එසමයෙහි පියුම්වලෙහි දුවන මහණකුට සුකුරු මිදිනි... ඔහුට කුකුස් විය.... "මහණ, මුදන රිසි නැත්තහුට ඇවැත් නො වේ"යි වදාළහ. (57)

41. එසමයෙහි පියුම්වලෙහි දුවන මිදියැටි මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය,... "මහණ සඞවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළහ. (58-59)

42. එසමයෙහි වැල්ලෙහි රහඟ මෛථුන මිදියැටි එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ සඞවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළහ. (60-61)

43. එසමයෙහි කලලෙහි සිය හදත් මෛථුන මිදියැටි එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, සඞවෙසෙස්ඇවැත් නො වේ. ථුල්ලැසිඇවැත් වේ"යි වදාළහ. (62-63)

44. එසමයෙහි දියෙන් හදත් තෙමන නොමිදියැටි මහණකුට සුකුරු මිදිනි. ඔහුට කුකුස් විය. ... "මහණ, නොමුදන රිසි ඇතියහුට ඇවැත් නො වේ"යි වදාළහ. (64)

1. ගංගෝවල ඉවුරු බිඳි තැන් දිය දූම්මෙන් දූවී ගේ මඩ කොට එහි මුණින් හිඳ පා දිගු කොට ලිස්සලිස්සා දියට බැසීම.

45. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස උදකෙන අඞ්ගජාතං ඔසිඤ්චන්තස්ස අසුචි මුච්චි. -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (65-66)

46. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස සයනෙ අඞ්ගජාතං ඝට්ටෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (67-68)

47. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මොචනාධිප්පායස්ස අඞ්ගුට්ඨෙන අඞ්ගජාතං ඝට්ටෙන්තස්ස අසුචි මුච්චි -පෙ- අසුචි න මුච්චි. තස්ස කුක්කුච්චං අහොසි: 'කච්චි නු ඛො අහං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපන්නො'ති. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (69-70)

**සුක්කවිස්සට්ඨිසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 3. 2.

## කායසංසග්ගසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායී අරඤ්ඤෙ විහරති. තස්සායස්මතො විහාරො අභිරූපො හොති දස්සනීයො පාසාදිකො, මජ්ඣෙ ගබ්භො සමන්තා පරියාගාරො. සුපඤ්ඤත්තං මඤ්චපීඨං භිසිබිම්බොහනං, පානීයං පරිභොජනීයං සුපට්ඨිතං, පරිවෙණං සුසම්මට්ඨං. බහූ මනුස්සා ආයස්මතො උදායිස්ස විහාරපෙක්ඛකා ආගච්ඡන්ති.

2. අඤ්ඤතරො'පි බ්‍රාහ්මණො සපජාපතිකො යෙනායස්මා උදායී, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොච: "ඉච්ඡාම මයං භොතො උදායිස්ස විහාරං පෙක්ඛිතු"න්ති. "තෙන හි බ්‍රාහ්මණ පෙක්ඛස්සූ"ති අවාපුරණං ආදාය ඝටිකං උග්ඝාටෙත්වා කවාටං පණාමෙත්වා විහාරං පාවිසි. සො'පි ඛො බ්‍රාහ්මණො ආයස්මතො උදායිස්ස පිට්ඨිතො පාවිසි. සාපි ඛො බ්‍රාහ්මණී තස්ස බ්‍රාහ්මණස්ස පිට්ඨිතො පාවිසි. අථ ඛො ආයස්මා උදායී එකච්චෙ වාතපානෙ විවරන්තො එකච්චෙ වාතපානෙ ථකෙන්තො ගබ්භං අනුපරිගන්ත්වා පිට්ඨිතො ආගන්ත්වා තස්සා බ්‍රාහ්මණියා අඞ්ගමඞ්ගානි පරාමසි. අථ ඛො සො බ්‍රාහ්මණො ආයස්මතා උදායිනා සද්ධිං පටිසම්මොදිත්වා අගමාසි.

3. අථ ඛො සො බ්‍රාහ්මණො අත්තමනො අත්තමනවාචං නිච්ඡාරෙසි: "උළාරා ඉමෙ සමණා සක්‍යපුත්තියා යෙ ඉමෙ එවරූපෙ අරඤ්ඤෙ විහරන්ති. භවම්පි උදායී උළාරො යො එවරූපෙ අරඤ්ඤෙ විහරතී"ති. එවං වුත්තෙ සා බ්‍රාහ්මණී තං බ්‍රාහ්මණං එතදවොච: "කුතො තස්ස උළාරතා? යථෙව මෙ ත්වං අඞ්ගමඞ්ගානි පරාමසි. එවමෙව මෙ සමණො උදායී අඞ්ගමඞ්ගානි පරාමසී"ති.

45. එසමයෙහි දියෙන් හදත් තෙමන මිදියැටි මහණකුට සුකුරු මිදිනි... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය.... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළහ. (65-66)

46. එසමයෙහි මිදියැටි ව යහන්හි හදත් ගටන එක්තරා මහණකුට සුකුරු මිදිනි. ... සුකුරු නො මිදිනි. ඔහුට කුකුස් විය, "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ. (67-68)

47. එසමයෙහි මාපටැඟිල්ලෙන් රහසඟ ගටන මිදියැටි එක්තරා මහණකුට සුකුරු මිදිනි.... සුකුරු නො මිදිනි. ඔහුට "කිම, මම් සඟවෙසෙස්ඇවැත් අවන්නෙම්දෝ?"යි කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි බුදුහු වදාළහ. (69-70)

සුක්‍කවිස්සට්ඨි ශික්‍ෂාපදය.

---

## 3. 2.

## කායසංසග්ගශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් උදායි තෙමේ අරණෙහි[1] වෙසෙයි. ඒ ආයුෂ්මත්හුගේ අරම මනහර දකුම් ඇත්තෙකි. ප්‍රසාද එළවන්නෙකි. මැද ගබ හාත් පස මණ්ඩලමාලයෙන් පිරිකෙවූ කරණ ලද්දේ ය. එහි ඇඳ පුටු කිසි කිම්බොහන මනා කොට පණවන ලද්දේ ය. පියයුතු පිරිබෝ කටයුතු ජලය එළවන ලද්දේ ය. මිදුල මනා කොට ගමදින ලද්දේ ය. බොහෝ මිනිස්සු උදායිහුගේ විහාරය බලනු කැමැත්තෝ එහි පැමිණෙති.

2. කිරිඳ සහිත වූ එක්තරා බමුණෙක් ආයුෂ්මත් උදායි වෙත පැමිණියේය. පැමිණ ආයුෂ්මත් උදායීහට, "අපි වනාහි භවත් උදායිහුගේ විහාරය දක්නට කැමැත්තෙමු"යි කී ය. ආයුෂ්මත් උදායි තෙමේ "එසේ නම් බමුණ බලව"යි යතුර ගෙණ අගුල හැර, කවුළු හැර. විහාරයට පැමිණියේ ය. ඒ බමුණු තෙමේ ද ආයුෂ්මත් උදායිහුගේ පිටු පසින් පැමිණියේ ය. බැමිණිය ද බමුණා ගේ පිටු පසින් ගියා ය. ඉක්බිති ආයුෂ්මත් උදායි තෙමේ ඇතැම් වාකවුළු හරිනුයේ, ඇතැම් වාකවුළු වසනුයේ, ගැබ හාත්පසින් ගමන් කොට පිටුපසින් අවුත් ඒ බැමිණියගේ සිරුරෙහි අවයවයන් පරාමර්ශනය කෙළේ ය. ඉක්බිති ඒ බමුණු තෙමේ ආයුෂ්මත් උදායි හා බෙහෙවින් සතුටු වී ගියේ ය.

3. වැලිදු ඒ බමුණු තෙමේ සතුටු වූයේ, "යම් මේ මහණ කෙනෙක් මෙබඳු අරම්හි වෙසෙද්ද, ඒ මේ ශ්‍රමණ වූ ශාක්‍යපුත්‍රීයයෝ උදාරයහ. යමෙක් මෙබඳු අරණෙක වෙසේ ද, ඒ භවත් උදායි තෙමේ ද උදාර යැ"යි සතුට හඟවන වචන ද පැවැසී ය. මෙසේ කී කල්හි ඒ බැමිණී තොමෝ, "ඔහුගේ උදාර බවෙක් කොයින් ද? යම් සේ තෙපි මගේ අඟපසඟ පරාමර්ශනය කළහු නම් එ මෙන් ම ඒ උදායී මහණ තෙමේ ද මගේ ශරීරාවයව පරාමර්ශනය කෙළේ" යයි බමුණුට කීවා ය.

---

1. දෙව්රම කෙළවර පිහිටි වෙනෙහි.

4. අථ ඛො සො බ්‍රාහ්මණො උජ්ඣායති ඛීයති විපාචෙති: "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා මුසාවාදිනො. ඉමෙහි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං, නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං, නට්ඨං ඉමෙසං සාමඤ්ඤං, නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං, කුතො ඉමෙසං සාමඤ්ඤං, කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං, අපගතා ඉමෙ සාමඤ්ඤා, අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. කථං හි නාම සමණො උදායි මම භරියාය අඞ්ගමඞ්ගානි පරාමසිස්සති. නහි සක්කා කුලිත්ථීහි කුලධීතාහි කුලකුමාරීහි කුලසුණ්හාහි කුලදාසීහි ආරාමං වා විහාරං වා ගන්තුං. සචෙ[1] කුලිත්ථියො කුලධීතයො[2] කුලකුමාරියො කුලසුණ්හායො කුලදාසියො ආරාමං වා විහාරං වා ගච්ඡෙය්‍යුං, තාපි සමණා සක්‍යපුත්තියා දූසෙය්‍යු"න්ති.

5. අස්සොසුං ඛො භික්ඛූ තස්ස බ්‍රාහ්මණස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායී මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජිස්සතී"ති.

6. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං උදායිං පටිපුච්ඡි: "සච්චං කිර ත්වං උදායි මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජී"ති. "සච්චං භගවා"ති. විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවිකං මොඝපුරිස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජිස්සසි. නනු මයා මොඝපුරිස අනෙකපරියායෙන විරාගාය ධම්මො දෙසිතො නො සරාගාය -පෙ- කාමපරිළාහානං වූපසමො අක්ඛාතො. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය: හත්ථග්ගාහං වා වෙණිග්ගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අඞ්ගස්ස පරාමසනං, සඞ්ඝාදිසෙසො"**ති.

7. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ඔතිණ්ණො** නාම: සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො.

1. සචෙපි: සතා 2. කුලධීතරො· මජසං. කුලධීතායො සීමු.

4. ඉක්බිති ඒ බමුණු තෙමේ මෙසේ අවමන් කරයි, අයුණු කියයි, නුගුණ පතුරවයි: "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ අලජ්ජිහු ය, දුශ්ශීලයෝ ය, මුසාවාදීහු ය. මොහු නම් තුමූ ධම්මචාරීහු ය යි සමචාරීහු ය යි බ්‍රහ්මචාරීහු ය යි සත්‍යවාදීහුය යි සීලවන්තයෝය යි කල්‍යාණධම් ඇත්තෝය"යි පිළින කෙරෙත්. "මොවුන්ට මහණ කමෙක් නැත. මොවුන්ට බමුණු කමෙක් නැත. මොවුන්ගේ මහණකම නටුයේ ය. මොවුන්ගේ බමුණුකම නටුයේ ය. මොවුන්ට මහණකමෙක් කොයින් ද? මොවුන්ට බමුණු කමෙක් කොයින් ද? මොහු මහණකමින් පහ වූවෝ ය. මොහු බමුණුකමින් පහ වූවෝ ය. කෙසේ නම් උදායී මහණ තෙමේ මගේ බිරින්දගේ අඟපසඟ පිරිමැද්දේ ද? කුලගනන් සමග කුලදූන් සමග කුලකුමරියන් සමග කුලලේලියන් සමග කුලදාසියන් සමග අරමකට හෝ වෙහෙරකට යැමට නො හැකි ය. ඉදින් කුලස්ත්‍රීහු කුලදුහිතෘහු කුලකුමාරිහු කුලලෙහෙළිහු කුලදාසීහු අරමකට හෝ වෙහෙරකට යන්නාහු නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ ඔවුන් දූෂණය කරන්නාහු" යනුයි.

5. අවමන් කරණ අයුණු කියන දෙස් පතුරවන ඒ බමුණාගේ තෙපුල් භික්ෂූහු ඇසූහ. යම් ඒ අල්පේච්ඡ භික්ෂූහු වෙද්ද ඔහු "කෙසේ නම් ආයුෂ්මත් උදායී තෙමේ මාගමක හා කායසංසගට පැමිණියේද?"යි අවමන් කරත්. අයුණු කියත්. නුගුණ පතුරවත්.

6. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා ආයුෂ්මත් උදායිගෙන් විචාළහ. "උදායි, තෝ මාගමක හා කායසංසගට පැමිණියෙහි ය යනු සැබෑ දැ?"යි අසා වදාළ සේක. "සැබව, භාග්‍යවතුන් වහන්ස"යි ආයුෂ්මත් උදායී කීය. "හිස් පුරුෂය, නුසුදුසු ය. අනුලෝම් නො වේ. යොග්‍ය නො වේ. මහණුන්ට නො සරුප් ය. නො කැප ය. මහණකු විසින් නොකට යුතු ය. "හිස් පුරුෂය, තෝ කෙසේ නම් මාගමක හා කායසංසගට සම්වන්නෙහි ද? හිස් පුරුෂය, ඇලීම පිණිස නො ව නො ඇලීම පිණිස මා විසින් නන් අයුරින් දහම් දෙසන ලද්දේ නො වේ ද? ... කාමපරිදාහයන් සංසිඳවීම මා විසින් නොයෙක් අයුරින් කියන ලද්දේ නො වේ ද? "හිස් පුරුෂය මේය නො පහන්වූවන්ගේ පහන් බව පිණිස නො වන්නේ ය. ... මහණෙනි. මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් රාගයට බඳුනේ පෙරළී ගිය සිතින් මාගමක හා කායසංසගට පැමිණියේ නම්, අත ගැනීම හෝ කෙහෙ ගැනීම හෝ යම්බ අඟපසඟක් පිරිමැදීම හෝ කෙරේ නම් සඟවසෙස් වේ"** යනු යි.

7. **යො පන** යනු යමෙක්, යම්බඳු වූයෙක් ...

**භික්ඛු** යනු ... මේ තෙමේ මේ අර්ථයෙහි භික්ෂු ය යි අදහස් කරණ ලදී.

**ඔතිණ්ණො** නම්: අතිශයින් ඇලුනේ, බලාපොරොත්තු ඇත්තේ, පිළිබඳ සිත් ඇත්තේ ය.

**විපරිණතන්ති** රත්තම්පි චිත්තං විපරිණතං, දුට්ඨම්පි චිත්තං විපරිණතං, මූළ්හම්පි චිත්තං විපරිණතං. අපි ච රත්තං චිත්තං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතං විපරිණතන්ති.

**මාතුගාමො** නාම මනුස්සිත්ථී, න යක්ඛී, න පෙතී, න තිරච්ඡානගතා. අන්තමසො තදහුජාතාපි දාරිකා, පගෙව මහත්තරී.

**සද්ධින්ති** එකතො.

**කායසංසග්ගං සමාපජ්ජෙය්‍යාති** අජ්ඣාචාරො වුච්චති.

**හත්ථො** නාම කප්පරං උපාදාය යාව අග්ගනඛා.

**වෙණී** නාම සුද්ධකෙසා වා සුත්තමිස්සා වා මාලාමිස්සා වා හිරඤ්ඤමිස්සා වා සුවණ්ණමිස්සා වා මුත්තාමිස්සා වා මණිමිස්සා වා.

**අඞ්ගං** නාම හත්ථඤ්ච වෙණිඤ්ච ඨපෙත්වා අවසෙසං අඞ්ගං නාම.

8. ආමසනා පරාමසනා ඔමසනා උම්මසනා ඔලඞ්ඝනා උල්ලඞ්ඝනා ආකඩ්ඪනා පතිකඩ්ඪනා අභිනිග්ගණ්හනා අභිනිප්පීළනා ගහණං ඡුපනං.

**ආමසනා** නාම ආමට්ඨමත්තා.

**පරාමසනා** නාම ඉතොචිතො ච සඤ්චොපනා.

**ඔමසනා** නාම හෙට්ඨා ඔරොපනා.

**උම්මසනා** නාම උද්ධං උච්චාරණා.

**ඔලඞ්ඝනා** නාම හෙට්ඨා ඔනමනා.

**උල්ලඞ්ඝනා** නාම උද්ධං උච්චාරණා.

**ආකඩ්ඪනා** නාම ආවිඤ්ඡනා.[1]

**පතිකඩ්ඪනා** නාම පතිප්පණාමනා.

**අභිනිග්ගණ්හනා** නාම අඞ්ගං ගහෙත්වා නිප්පීළනා.

**අභිනිප්පීළනා** නාම කෙනචි සහ නිප්පීළනා.

**ගහණං** නාම ගහිතමත්තං.

**ඡුපනං** නාම ඵුට්ඨමත්තං.

**සඞ්ඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසො'ති.

---

1. ආවිඤ්ජනා. මජසං. ස්‍යා.

**විපරිණතං** යනු රාගයෙන් රත් වූ සිත ද, විපරිණත ය. ද්වේෂයෙන් දුෂ්ට වූ සිත ද විපරිණත ය. මෝහයෙන් මුළා වූ සිත ද විපරිණත ය. එහෙත් මේ අර්ථයෙහි රාගයෙන් රත් වූ සිත විපරිණත ය යි අදහස් කරණ ලදී.

**මාතුගාම** නම් මිනිස් මාගම ය. යකින්නක් නො වෙයි. ප්‍රේතියක් නො වෙයි. තිරිසන්ගිය මාගමක් නො වෙයි. යටත් පිරිසෙයින් එදින උපන් දූරි ය. ඈයට වඩා මහත් වූවා කැලැමය. (මූලදීම මාගම් වෙයි.)

**සද්ධිං** යනු එක්ව ය.

**කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය** යනුයෙන් අධ්‍යාචාරය (ආචාරය ඉක්මවීම) කියනු ලැබේ.

**හත්ථ** නම් වැලමිට පටන් නිය අගතෙක් ය.

**වෙණි** නම් හුදු කෙහෙ හෝ, හුයින් මුසු හෝ, මලින් මුසු හෝ, කහවනුයෙන් මුසු හෝ, රත්කුරුයෙන් මුසු හෝ, මුතුවැළින් මුසු හෝ, මණිමාලායෙන් මුසු හෝ යි.

**අඞ්ග** නම් අත ද කෙස්වැටිය ද හැර සෙස්ස අඞ්ග නම්.

8. ආමසනා, පරාමසනා, ඔමසනා, උම්මසනා, ඔලඞ්ඝනා, උල්ලඞ්ඝනා, ආකඩ්ඪනා, පතිකඩ්ඪනා, අභිනිග්ගණ්හනා, අභිනිප්පීළනා, ගහණ, ඡුපන යන මේ දත යුතු ය.

**ආමසනා** නම් ආමර්ශන මාත්‍ර ය (අත ගෑම ය.)

**පරාමසනා** නම් ඔබ මොබ පිරිමැදීම ය.

**ඔමසනා** නම් යටට පිරිමැදීම ය.

**උම්මසනා** නම් උඩට පිරිමැදීම ය.

**ඔලඞ්ඝනා** නම් යටට නැමීම ය.

**උල්ලඞ්ඝනා** නම් උඩට නැමීම ය.

**ආකඩ්ඪනා** නම් ලංකර ගැණීම (ඇද ගැණීම) ය.

**පතිකඩ්ඪනා** නම් තමන් කරා හරවා ගැණීම ය.

**අභිනිග්ගණ්හනා** නම් අවයවයක් ගෙණ මැඩීම ය.

**අභිනිප්පීළනා** නම් කිසිවක් හා මැඩීම ය.

**ගහණ** නම් ගැණීම මාත්‍ර ය.

**ඡුපන** නම් ස්පර්ශ කිරීම මාත්‍ර ය.

**සඞ්ඝාදිසෙසො** යනු ... ඒ කරණ කොට ගෙණ ද සඞ්ඝාදිසෙස් ය යි කියනු ලැබේ.

1. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායෙන කායං ආමසති පරාමසති ඔමසති උම්මසති ඔලඞ්ඝෙති උල්ලඞ්ඝෙති ආකඩ්ඪති පතිකඩ්ඪති අභිනිග්ගණ්හාති අභිනිප්පීළෙති ගණ්හාති ඡුපති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

2. ඉත්ථී ච හොති, වෙමතිකො සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඉත්ථී ච හොති, පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයස්ස. ඉත්ථී ච හොති, පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති. ආපත්ති ථුල්ලච්චයස්ස. ඉත්ථී ච හොති, තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්ච-යස්ස.

3. පණ්ඩකො ච හොති, පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං පණ්ඩකස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයස්ස. පණ්ඩකො ච හොති, වෙමතිකො සාරත්තො ච, භික්ඛු ච තං පණ්ඩකස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස. පණ්ඩකො ච හොති, පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං පණ්ඩකස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස. පණ්ඩකො ච හොති, තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං පණ්ඩකස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස. පණ්ඩකො ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං පණ්ඩකස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස.

4. පුරිසො ච හොති, පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං පුරිසස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්ක-ටස්ස; පුරිසො ච හොති, වෙමතිකො -පෙ- පුරිසො ච හොති, තිරච්ඡාන-ගතසඤ්ඤී -පෙ- පුරිසො ච හොති, ඉත්ථිසඤ්ඤී -පෙ- පුරිසො ච හොති, පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං පුරිසස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස.

1. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රියක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේ තමාගේ කයින් ස්ත්‍රියගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, අවමර්ශනය කෙරෙයි ද, උත්මර්ශනය කෙරෙයි ද, අවලම්බනය කෙරෙයි ද, උල්ලම්බනය කෙරෙයි ද, ආකර්ෂණය කෙරෙයි ද, ප්‍රතිකර්ෂණය කෙරෙයි ද. අභිනිග්‍රහණය කෙරෙයි ද, අභිනිෂ්පීඩනය කෙරෙයි ද, ග්‍රහණය කෙරෙයි ද, ස්පර්ශ කෙරෙයි ද, සඞඝාදිසෙස් ඇවැත් වේ.

2. ස්ත්‍රියකුදු වෙයි, සංරක්ත වෙමතියෙකුත් වෙයි, මහණ තෙමේ තමාගේ කයින් ස්ත්‍රියගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුල්ලාසිඇවැත් වේ. ස්ත්‍රියකුදු වෙයි, පණ්ඩකය යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රියගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුල්ලාසිඇවැත් වේ. ස්ත්‍රියකුදු වෙයි, පුරුෂයෙක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රියගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුල්ලාසිඇවැත් වේ. ස්ත්‍රියකුදු වෙයි, තිරිසන්ගිය යි හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රියගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද ථුල්ලාසිඇවැත් වේ.

3. පණ්ඩකයෙකුදු වෙයි, පණ්ඩක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පණ්ඩකයාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුල්ලාසි-ඇවැත් වේ. පණ්ඩකයෙකුදු වෙයි, විමති ඇති සංරක්තයෙකුත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පණ්ඩකයාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුලාඇවැත් වේ. පණ්ඩකයෙකුදු වෙයි, පුරුෂයෙක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේ තමාගේ කයින් පණ්ඩකයාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුලා-ඇවැත් වේ. පණ්ඩකයෙකුදු වෙයි, තිරිසන්ගතයෙකැ යි හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පණ්ඩකයාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුලාඇවැත් වේ. පණ්ඩකයෙකුදු වෙයි, ස්ත්‍රියක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රියගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද ස්පර්ශ කෙරෙයි ද, දුකුලාඇවැත් වේ.

4. පුරුෂයෙකුදු වෙයි, පුරුෂයෙක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පුරුෂයාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුලාඇවැත් වේ. පුරුෂයෙකුදු වෙයි, විමති ඇති ... පුරුෂයෙකුදු වෙයි, තිරිසන් ගතයෙක යන හැඟීම් ඇත්තේත් ... පුරුෂයෙකුදු වෙයි, ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේත් ... පුරුෂයෙකුදු වෙයි, පණ්ඩකයෙක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පුරුෂයාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරේ ද දුකුලාඇවැත් වේ.

5. තිරච්ඡානගතො ච හොති තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච නං තිරච්ඡානගතස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස. තිරච්ඡානගතො ච හොති, වෙමතිකො -පෙ- තිරච්ඡානගතො ච හොති, ඉත්ථිසඤ්ඤී -පෙ- තිරච්ඡානගතො ච හොති පණ්ඩකසඤ්ඤී -පෙ- තිරච්ඡානගතො ච හොති, පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච නං තිරච්ඡානගතස්ස කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස.

## එකමූලකං.

---

1. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච නං ද්වින්නං ඉත්ථීනං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං.

2. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං වෙමතිකො සාරත්තො ච, භික්ඛු ච නං ද්වින්නං ඉත්ථීනං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං.

3. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං පණ්ඩකසඤ්ඤී -පෙ- පුරිසසඤ්ඤී -පෙ- තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච නං ද්වින්නං ඉත්ථීනං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං.

4. ද්වෙ පණ්ඩකා, ද්වින්නං පණ්ඩකානං පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච නං ද්වින්නං පණ්ඩකානං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං.

5. ද්වෙ පණ්ඩකා, ද්වින්නං පණ්ඩකානං වෙමතිකො -පෙ- පුරිසසඤ්ඤී -පෙ- තිරච්ඡානගතසඤ්ඤී -පෙ- ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච නං ද්වින්නං පණ්ඩකානං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

තිරිසන් ගතයෙකුදු වෙයි, තිරිසන් ගතයෙක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් තිරිසන්ගතයාගේ කය ආමශීතය කෙරෙයි ද, පරාමශීතය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද දුකුලාඇවැත් වේ. තිරිසන්ගතයෙකුදු වෙයි, විමති ඇති ... තිරිසන්ගතයෙකුදු වෙයි, ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේත් ... තිරිසන්ගතයකුදු වෙයි, පණ්ඩකයෙක යන හැඟීම් ඇත්තේද වේ, ... තිරිසන්ගත-යෙකුදු වෙයි, පුරුෂයෙක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් තිරිසන්ගතයාගේ කය ආමශීතය කෙරෙයි ද, පරාමශීතය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුලාඇවැත් වේ.

## එකමූලකනය නිමි.

---

1. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රීහුය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රීන් දෙදෙනාගේ කය ආමශීතය කෙරෙයි ද, පරාමශීතය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, සඟවෙසෙස්ඇවැත් දෙකෙකි.

2. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ විමති ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රීන් දෙදෙනාගේ කය ආමශීතය කෙරෙයි ද, පරාමශීතය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, ථුල්ලසිඇවැත් දෙකෙකි.

3. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ පණ්ඩකය යන හැඟීම් ඇත්තේ ... පුරුෂයෙක යන හැඟීම් ඇත්තේ ... තිරිසනෙක යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රීන් දෙදෙනාගේ කය ආමශීතය කෙරෙයි ද, පරාමශීතය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, ථුල්ලසිඇවැත් දෙකෙකි.

4. පණ්ඩකයෝ දෙදෙනෙක් වෙත්, පණ්ඩකයන් දෙදෙනා පිළිබඳ ව පණ්ඩක ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පණ්ඩකයන් දෙදෙනාගේ කය ආමශීතය කෙරෙයි ද, පරා-මශීතය කෙරෙයි ද ... ගණී ද, සපශී කෙරෙයි ද, ථුල්ලසිඇවැත් දෙකෙකි.

5. පණ්ඩකයෝ දෙදෙනෙක් වෙත්, පණ්ඩකයන් දෙදෙනා පිළිබඳ ව විමති ඇත්තේ ... පුරුෂය යන හැඟීම් ඇත්තේ ... තිරිසන්ගතය යන හැඟීම් ඇත්තේ ... ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පණ්ඩකයන් දෙදෙනාගේ කය ආමශීතය කෙරෙයි ද, පරාමශීතය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුලා-ඇවැත් දෙකෙකි.

6. ද්වෙ පුරිසා, ද්වින්නං පුරිසානං පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං පුරිසානං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

7. ද්වෙ පුරිසා, ද්වින්නං පුරිසානං වෙමතිකො -පෙ- තිරච්ඡානගතසඤ්ඤී -පෙ- ඉත්ථිසඤ්ඤී -පෙ- පණ්ඩකසඤ්ඤී සාරත්තො ච භික්ඛු ච, තං ද්වින්නං පුරිසානං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

8. ද්වෙ තිරච්ඡානගතා, ද්වින්නං තිරච්ඡානගතානං තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං තිරච්ඡානගතානං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

9. ද්වෙ තිරච්ඡානගතා, ද්වින්නං තිරච්ඡානගතානං වෙමතිකො -පෙ- ඉත්ථිසඤ්ඤී -පෙ- පණ්ඩකසඤ්ඤී -පෙ- පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං තිරච්ඡානගතානං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

10. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

11. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං වෙමතිකො සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස.

12. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති ඡුපති -පෙ- ගණ්හාති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං.

13. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස.

14 ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස.

6. පුරුෂයෝ දෙදෙනෙක් වෙත්, පුරුෂයන් දෙදෙනා පිළිබඳ ව පුරු-ෂය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පුරුෂයන් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුලාඇවැත් දෙකෙකි.

7. පුරුෂයෝ දෙදෙනෙක් වෙත්, පුරුෂයන් දෙදෙනා පිළිබඳව විමති ඇත්තේ ... ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේ ... පණ්ඩකයෙක යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් පුරුෂයන් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුලාඇවැත් දෙකෙකි.

8. තිරිසන්නු දෙදෙනෙක් වෙත්, තිරිසනුන් දෙදෙනා පිළිබඳ ව තිරි-සන්නුය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, ඒ මහණ තෙමේත් තමාගේ කයින් තිරිසනුන් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුලාඇවැත් දෙකෙකි.

9. තිරිසන්නු දෙදෙනෙක් වෙත්, තිරිසනුන් දෙදෙනා පිළිබඳ ව විමති ඇත්තේ ... ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේ ... පණ්ඩකයෙක යන හැඟීම් ඇත්තේ ... පුරුෂයෙක යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි මහණ තෙමේත් තමාගේ කයින් තිරිසනුන් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුලාඇවැත් දෙකෙකි.

10. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, සඟවෙසෙස් හා දුකුලාඇවැත් වේ.

11. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳව විමති ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, ථුලැසියක් හා දුකුලාඇවැත් වේ.

12. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව පණ්ඩක ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, ඒ මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, ථුලැසිඇවැත් දෙකෙකි.

13. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව පුරුෂ ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, ඒ මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද ථුලැසි හා දුකුලාඇවැත් වේ.

14. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ තිරිසන් ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වේ, ඒ මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, ථුලැසි හා දුකුලාඇවැත්වේ.

15. ඉත්ථි ච පුරිසො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

16. ඉත්ථි ච පුරිසො ච, උභින්නං වෙමතිකො -පෙ- පණ්ඩකසඤ්ඤී -පෙ- පුරිසසඤ්ඤී -පෙ- තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස.

17. ඉත්ථි ච තිරච්ඡානගතො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

18. ඉත්ථි ච තිරච්ඡානගතො ච, උභින්නං වෙමතිකො -පෙ- පණ්ඩකසඤ්ඤී -පෙ- පුරිසසඤ්ඤී -පෙ- තිරච්ඡානගතසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස.

19. පණ්ඩකො ච පුරිසො ච, උභින්නං පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස.

20. පණ්ඩකො ච පුරිසො ච, උභින්නං වෙමතිකො -පෙ- පුරිසසඤ්ඤී -පෙ- තිරච්ඡානගතසඤ්ඤී -පෙ- ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

21. පණ්ඩකො ච තිරච්ඡානගතො ච, උභින්නං පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස.

22. පණ්ඩකො ච තිරච්ඡානගතො ච, උභින්නං වෙමතිකො -පෙ- පුරිසසඤ්ඤී -පෙ- තිරච්ඡානගතසඤ්ඤී -පෙ- ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

15. ස්ත්‍රියකුදු පුරුෂයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, ඒ මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද,... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, සඟවෙසෙස් හා දුකුලාඇවැත් වේ.

16. ස්ත්‍රියකුදු පුරුෂයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව විමති ඇත්තේ ... පණ්ඩකය යන හැඟීම් ඇත්තේ, ... පුරුෂය යන හැඟීම් ඇත්තේ ... තිරිසන් ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශකෙරෙයි ද, ථුල්ලැසි හා දුකුලාඇවැත් වේ.

17. ස්ත්‍රියකුදු තිරිසනෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ස්පර්ශ කෙරෙයි ද, සඟවෙසෙස් හා දුකුලාඇවැත් වේ.

18. ස්ත්‍රියකුදු තිරිසනෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳව විමති ඇත්තේ, ... පණ්ඩක ය යන හැඟීම් ඇත්තේ, ... පුරුෂය යන හැඟීම් ඇත්තේ, ... තිරිසන් ය යන හැඟීම් ඇත්තේ, ... සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුල්ලැසි හා දුකුලාඇවැත් වේ.

19. පණ්ඩකයෙකුදු පුරුෂයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව පණ්ඩක ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුල්ලැසි හා දුකුලාඇවැත් වේ.

20. පණ්ඩකයෙකුදු පුරුෂයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳව විමති ඇත්තේ ... පුරුෂ ය යන හැඟීම් ඇත්තේ, ... තිරිසන්ගතය යන හැඟීම් ඇත්තේ, ... ස්ත්‍රී ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුලාඇවැත් දෙකෙකි.

21. පණ්ඩකයෙකුදු තිරිසනෙකුදු වෙත්, මහණ තෙමේ දෙදෙනා පිළිබඳ ව පණ්ඩක ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුල්ලැසි හා දුකුලාඇවැත් වේ.

22. පණ්ඩකයෙකුදු තිරිසනෙකුදු වෙත්, මහණ තෙමේ දෙදෙනා පිළිබඳ ව විමති ඇත්තේ, ... පුරුෂ ය යන හැඟීම් ඇත්තේ ... තිරිසන් ය යන හැඟීම් ඇත්තේ ... ස්ත්‍රී ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුලාඇවැත් දෙකෙකි.

23. පුරිසො ච තිරච්ඡානගතො ච, උභින්නං පුරිසසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

24. පුරිසො ච තිරච්ඡානගතො ච, උභින්නං වෙමතිකො -පෙ- තිරච්ඡානගතසඤ්ඤී -පෙ- ඉත්ථිසඤ්ඤී -පෙ- පණ්ඩකසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

## දුමූලකං නිට්ඨිතං.

1. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයස්ස. -පෙ-

2. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං කායෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං. -පෙ-

3. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස -පෙ-

4. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායපටිබද්ධෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයස්ස. -පෙ-

5. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං කායපටිබද්ධෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං. -පෙ-

6. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායපටිබද්ධෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස. -පෙ-

7. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති දුක්කටස්ස. -පෙ-

23. පුරුෂයෙකුදු තිරිසනෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව පුරුෂ ය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද ස්පර්ශ කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි.

24. පුරුෂයෙකුදු තිරිසන්ගතයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව විමති ඇත්තේ, ... තිරිසන්ගත ය යන හැඟීම් ඇත්තේ .... ස්ත්‍රී ය යන හැඟීම් ඇත්තේ, .... පණ්ඩක ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුළා-ඇවැත් දෙකෙකි.

### ද්විමූලකය නිමි.

1. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රියගේ කය පිළිබඳ වූවක් ආමර්ශ-නය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුලැසිඇවැත් වේ. ...

2. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රී ය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රීන් දෙදෙනාගේ කය පිළිබඳ වූවක් ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුලැසිඇවැත් දෙකෙකි. ...

3. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රී යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රීන් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුලැසි හා දුකුළාඇවැත් වේ. ...

4. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි ද, මහණ තෙමේත් තමාගේ කයින් ස්ත්‍රියගේ කය පිළිබඳ වූවක් ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුලැසි-ඇවැත් වේ. ...

5. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කය පිළිබඳ වූවකින් ස්ත්‍රීන් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුලැසිඇවැත් දෙකෙකි. ...

6. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කය පිළිබඳ වූවකින් දෙදෙනාගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද .... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, ථුලැසි හා දුකුළාඇවැත් වේ. ...

7. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රී යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කය පිළිබඳ වූවකින් ස්ත්‍රියගේ කය පිළිබඳ වූවක් ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, දුකුළාඇවැත් වේ. ...

8. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං. -පෙ-

9. ඉත්ථි ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, ආපත්ති ද්වින්නං දුක්කටානං. -පෙ-

10. ඉත්ථි ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා නිස්සග්ගියෙන කායං ආමසති, ආපත්ති දුක්කටස්ස. -පෙ-

11. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං නිස්සග්ගියෙන කායං ආමසති, ආපත්ති ද්වින්නං දුක්කටානං. -පෙ-

12. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති ද්වින්නං දුක්කටානං. -පෙ-

13. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති දුක්කටස්ස. -පෙ-

14. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති ද්වින්නං දුක්කටානං. -පෙ-

15. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති ද්වින්නං දුක්කටානං. -පෙ-

16. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ඉත්ථියා නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති, ආපත්ති දුක්කටස්ස. -පෙ-

17. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති, ආපත්ති ද්වින්නං දුක්කටානං. -පෙ-

18. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, භික්ඛු ච තං උභින්නං නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති, ආපත්ති ද්වින්නං දුක්කටානං.

**භික්ඛුපෙය්‍යාලං නිට්ඨිතං.**

8. සත්‍රීහු දෙදෙනෙක් වෙත්, සත්‍රීන් දෙදෙනා පිළිබඳ ව සත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් තමාගේ කය පිළිබඳ වූවකින් සත්‍රීන් දෙදෙනාගේ කය පිළිබඳ වූවක් ආමශීනය කෙරෙයි ද, පරාමශීනය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි. ...

9. සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ සත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්‍තත් වෙයි ද, මහණ තෙමේත් තමාගේ කය පිළිබඳ වූවකින් දෙදෙනාගේ කය පිළිබඳ වූවක් ආමශීනය කෙරෙයි ද, පාරාමශීනය කෙරෙයි ද ... ගණියි ද, සපශී කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි. ...

10. සත්‍රියකුදු වෙයි, සත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් තමා විසින් මුදලුවකින් සත්‍රියගේ කය ආමශීනය කෙරේ ද දුකුළාඇවැත් වේ. ...

11. සත්‍රීහු දෙදෙනෙකුත් වෙත්, සත්‍රීන් දෙදෙනා පිළිබඳ සත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් මුදලුවකින් දෙදෙනාගේ කය ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි. ...

12. සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳව සත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් මුදලුවකින් දෙදෙනාගේ කය ආමශීනය කෙරෙයි ද, දුකුළා ඇවැත් දෙකෙකි.

13. සත්‍රියකුදු වෙයි, සත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් මුදලුවකින් සත්‍රියගේ කය පිළිබඳ වූවක් ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් වේ. ...

14. සත්‍රීහු දෙදෙනෙක් වෙත්, සත්‍රීන් දෙදෙනා පිළිබඳව සත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්‍තත් වෙයි ද, මහණ තෙමේත් මුදලුවකින් සත්‍රීන් දෙදෙනාගේ කය පිළිබඳවූවක් ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි. ...

15. සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ සත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් මුදලුවකින් දෙදෙනාගේ කය පිළිබඳ වූවක් ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි. ...

16. සත්‍රියකුදු වෙයි, සත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් සත්‍රිය පිළිබඳ මුදලුවකින් මුදලුවක් ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් වේ. ...

17. සත්‍රීහු දෙදෙනෙක් වෙත්, දෙදෙනා පිළිබඳ ව සත්‍රිය යන හැඟීම් ඇත්තේ, සංරක්‍තත් වෙයි, මහණ තෙමේත් සත්‍රීන් දෙදෙනා පිළිබඳ මුදලුවකින් මුදලුවක් ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි. ...

18. සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ සත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්‍තත් වෙයි ද, මහණ තෙමේත් දෙදෙනා පිළිබඳ මුදලුවකින් මුදලුවක් ආමශීනය කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි.

**භික්ඛුපෙය්‍යාලය නිමි.**

1. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථී ච තං භික්ඛුස්ස කායෙන කායං ආමසති පරාමසති ඔමසති උම්මසති ඔලඞ්ඝෙති උල්ලඞ්ඝෙති ආකඩ්ඪති පතිකඩ්ඪති අභිනිග්ගණ්හාති අභිනිප්පීළෙති ගණ්හාති ඡුපති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. -පෙ-

2. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථියො ච තං භික්ඛුස්ස කායෙන කායං ආමසන්ති පරාමසන්ති ඔමසන්ති උම්මසන්ති ඔලඞ්ඝෙන්ති උල්ලඞ්ඝෙන්ති ආකඩ්ඪන්ති පතිකඩ්ඪන්ති අභිනිග්ගණ්හන්ති අභිනිප්පීළෙන්ති ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති, ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං -පෙ-

3. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, උභො ච තං භික්ඛුස්ස කායෙන කායං ආමසන්ති පරාමසන්ති -පෙ- ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ-

4. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථී ච තං භික්ඛුස්ස කායෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ථුල්ලච්චයස්ස -පෙ-

5. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථියො ච තං භික්ඛුස්ස කායෙන කායපටිබද්ධං ආමසන්ති පරාමසන්ති -පෙ- ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං -පෙ-

6. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, උභො ච තං භික්ඛුස්ස කායෙන කායපටිබද්ධං ආමසන්ති පරාමසන්ති -පෙ- ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස -පෙ-

7. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථී ච තං භික්ඛුස්ස කායපටිබද්ධෙන කායං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ථුල්ලච්චයස්ස -පෙ-

8. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථියො ච තං භික්ඛුස්ස කායපටිබද්ධෙන කායං ආමසන්ති පරාමසන්ති -පෙ- ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං -පෙ-

1. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රියක යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රියත් තමාගේ කයින් මහණහුගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, අවමර්ශනය කෙරෙයි ද, උන්මර්ශනය කෙරෙයි ද, අවලම්බනය කෙරෙයි ද, උල්ලම්බනය කෙරෙයි ද, ආකර්ෂණය කෙරෙයි ද, ප්‍රතිකර්ෂණය කෙරෙයි ද, අභිනිග්‍රහණය කෙරෙයි ද, නිෂ්පීඩනය කෙරෙයි ද, ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, සෙවුනා අදහස් ඇත්තේ වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දැන ගණියි ද,සඟවෙසෙස් ඇවැත් වේ. ...

2. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රීහු ද තමන්ගේ කයින් මහණහුගේ කය ආමර්ශනය කෙරෙත් ද, පරාමර්ශනය කෙරෙත් ද, අවමර්ශනය කෙරෙත් ද, උන්මර්ශනය කෙරෙත් ද, අවලම්බනය කෙරෙත් ද, උල්ලම්බනය කෙරෙත් ද, ආකර්ෂණය කෙරෙත් ද, ප්‍රතිකර්ෂණය කෙරෙත් ද, අභිනිග්‍රහණය කෙරෙත් ද, අභිනිෂ්පීඩනය කෙරෙත් ද, ග්‍රහණය කෙරෙත් ද, ස්පර්ශ කෙරෙත් ද, මහණ තෙම සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කරයි ද, ස්පර්ශය දැන ගණියි ද, සඟවෙසෙස්ඇවැත් දෙකෙකි. ...

3. ස්ත්‍රියකුදු පණ්ඩකයකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, දෙදෙනා තමන්ගේ කයින් මහණහුගේ කය ආමර්ශනය කෙරෙත් ද පරාමර්ශනය කෙරෙත් ද, ... ගණිත් ද, ස්පර්ශ කෙරෙත් ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කරයි ද, ස්පර්ශය විඳියි ද, සඟවෙසෙස් හා දුකුළාඇවැත් වේ. ...

4. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි ස්ත්‍රිය තමාගේ කයින් මහණහුගේ කය පිළිබඳවූවක් ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ...ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, සෙවුනා අදහස් ඇත්තේ තමාගේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දැන ගණියි ද, ථුල්ලැසි-ඇවැත් වේ. ...

5. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රීහුය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රීහුත් තමන්ගේ කයින් මහණහුගේ කය පිළිබඳ වූවක් ආමර්ශනය කරත් ද, පරාමර්ශනය කරත් ද ... ගණිත් ද, ස්පර්ශ කෙරෙත් ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දැන ගණියි ද, ථුල්ලැසිඇවැත් දෙකෙකි. ...

6. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, දෙදෙනා ම තමන්ගේ කයින් මහණහුගේ කය පිළිබඳ වූවක් ආමර්ශනය කෙරෙත් ද, පරාමර්ශනය කෙරෙත් ද, ... ගණිත් ද, ස්පර්ශ කෙරෙත් ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දැන ගණියි ද, ථුල්ලැසි හා දුකුළාඇවැත් වේ. ...

7. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රියත් තමාගේ කය පිළිබඳ වූවකින් මහණහුගේ කය ආමර්ශනය කෙරෙයි ද, පරාමර්ශනය කෙරෙයි ද, ... ගණියි ද, ස්පර්ශ කෙරෙයි ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කරයි ද, ස්පර්ශය දැන ගණියි ද, ථුල්ලැසිඇවැත් වේ. ...

8. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ඒ ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රීහුය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රීහුත් තමන්ගේ කය පිළිබඳ වූවකින් මහණහුගේ කය ආමර්ශනය කෙරෙත් ද, පරාමර්ශනය කෙරෙත් ද, ...ගණිත් ද, ස්පර්ශ කෙරෙත් ද, මහණ තෙම සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දැන ගණියි ද, ථුල්ලැසිඇවැත් දෙකෙක් වේ. ...

9. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, උභො ච නං භික්ඛුස්ස කායපටිබද්ධෙන කායං ආමසන්ති පරාමසන්ති -පෙ- ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස -පෙ-

10. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථී ච නං භික්ඛුස්ස කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති පරාමසති -පෙ- ගණ්හාති ඡුපති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති දුක්කටස්ස -පෙ-

11. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථියො ච නං භික්ඛුස්ස කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසන්ති පරාමසන්ති -පෙ- ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

12. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, උභො ච නං භික්ඛුස්ස කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසන්ති පරාමසන්ති -පෙ- ගණ්හන්ති ඡුපන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

13. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථී ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන කායං ආමසති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති දුක්කටස්ස -පෙ-

14 ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථියො ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන කායං ආමසන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

15. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, උභො ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන කායං ආමසන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

16. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථී ච නං භික්ඛුස්ස නිස්ස- ග්ගියෙන කායපටිබද්ධං ආමසති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති දුක්කටස්ස -පෙ-

9. සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, මහණ තෙම ඒ දෙදෙනා පිළිබඳ ව සත්‍රීහුය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, දෙදෙනා තමන්ගේ කය පිළිබඳ වූවකින් මහණහුගේ කය ආමශීතය කෙරෙත් ද, පරාමශීතය කෙරෙත් ද, ... ගණිත් ද, සපශී කෙරෙත් ද, මහණ සෙවුනා අදහස් ඇත්තේ කයින් වැයම් කෙරෙයි ද, සපශීය දූත ගණියි ද, ථුල්ලසි හා දුකුලාඇවැත් වේ. ...

10. සත්‍රියකුත් වෙයි, සත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, තමාගේ කය පිළිබඳ වූවකින් මහණහුගේ කය පිළිබඳ වූවක් ආමශීතය කෙරෙයි ද, පරාමශීතය කෙරෙයි ද, ... ගණියි ද, සපශී කෙරෙයි ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වැයම් කෙරෙයි ද, සපශීය දූත ගණියි ද, දුකුලා-ඇවැත් වේ. ...

11. සත්‍රීහු දෙදෙනෙක් වෙත්, ඒ සත්‍රීන් දෙදෙනා පිළිබඳව සත්‍රීහු ය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, සත්‍රීහු තමන්ගේ කය පිළිබඳ වූවකින් මහණහුගේ කය පිළිබඳ වූවක් ආමශීතය කෙරෙත් ද, පරාමශීතය කෙරෙත් ද ... ගණිත් ද, සපශී කෙරෙත් ද, මහණ තෙම සෙවුනා අදහස් ඇත්තේ කයින් වැයම් කෙරෙයි ද, සපශීය දූතගණියි ද, දුකුලාඇවැත් දෙකෙකි. ...

12. සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, ඒ දෙදෙනා පිළිබඳ ව සත්‍රීහුය යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, දෙදෙනා තමන්ගේ කයපිළිබඳ වූවකින් මහණහුගේ කය පිළිබඳ වූවක් ආමශීතය කෙරෙත් ද, පරාමශීතය කෙරෙත් ද, ... ගණිත් ද, සපශී කෙරෙත් ද, මහණ තෙම සෙවුනා අදහස් ඇත්තේ කයින් වැයම් කෙරෙයි ද, සපශීය දූත ගණියි ද, දුකුලාඇවැත් දෙකෙකි.

13. සත්‍රියකුදු වෙයි, සත්‍රියක යන හැඟීම් ඇත්තේ, සංරක්තත් වෙයි, සත්‍රිය දමාලූ දෙයින් මහණහුගේ කය ආමශීතය කෙරෙයි ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වැයම් කෙරෙයි ද, සපශීය දූත ගණියි ද, දුකුලා-ඇවැත් වේ. ...

14. සත්‍රීහු දෙදෙනෙක් වෙත්, ඒ සත්‍රීන් දෙදෙනා පිළිබඳව සත්‍රීහු ය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි සත්‍රීහු ද මුදාලූවකින් මහණහුගේ කය ආමශීතය කෙරෙත් ද, මහණ සෙවුනා අදහස් ඇත්තේකයින් වැයම් කෙරෙයි ද, සපශීය දූත ගණියි ද, දුකුලා ඇවැත් දෙකෙකි. ...

15 සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, ඒ දෙදෙනා පිළිබඳ ව සත්‍රීහුය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, දෙදෙනා මුදාලූවකින් මහණහුගේ කය ආමශීතය කෙරෙත් ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වැයම් කෙරෙයි ද, සපශීය දූත ගණියි ද, දුකුලාඇවැත් දෙකෙකි. ...

16. සත්‍රියකුදු වෙයි, සත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, සත්‍රීත් මුදාලූවකින් මහණහුගේ කය පිළිබඳ වූවක් ආමශීතය කෙරෙයි ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වැයම් කෙරෙයි ද, සපශීය දූත ගණියි ද, දුකුලාඇවැත් වේ. ...

17. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථියො ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

18. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, උභො ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

19. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථී ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති, සෙවනාධිප්පායො කායෙන වායමති, න ච ඵස්සං පටිවිජානාති, ආපත්ති දුක්කටස්ස -පෙ-

20. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, ඉත්ථියො ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති, න ච ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

21. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී සාරත්තො ච, උභො ච නං භික්ඛුස්ස නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසන්ති, සෙවනාධිප්පායො කායෙන වායමති න ච ඵස්සං පටිවිජානාති, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

22. සෙවනාධිප්පායො කායෙන වායමති ඵස්සං පටිවිජානාති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සෙවනාධිප්පායො කායෙන වායමති න ච ඵස්සං පටිවිජානාති, ආපත්ති දුක්කටස්ස. සෙවනාධිප්පායො න ච කායෙන වායමති ඵස්සං පටිවිජානාති, අනාපත්ති. සෙවනාධිප්පායො න ච කායෙන වායමති න ච ඵස්සං පටිවිජානාති, අනාපත්ති, මොක්ඛාධිප්පායො න ච කායෙන වායමති ඵස්සං පටිවිජානාති, අනාපත්ති. මොක්ඛාධිප්පායො න ච කායෙන වායමති ඵස්සං පටිවිජානාති, අනාපත්ති. මොක්ඛාධිප්පායො න ච කායෙන වායමති ඵස්සං පටිවිජානාති, අනාපත්ති. මොක්ඛාධිප්පායො න ච කායෙන වායමති න ච ඵස්සං පටිවිජානාති අනාපත්ති.

23. අනාපත්ති අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, අසාදියන්තස්ස, උම්මත්තකස්ස, ඛිත්තචිත්තස්ස, වෙදනට්ටස්ස[1], ආදිකම්මිකස්සාති.

---

1. වෙදනාට්ටස්ස. මජසං.

17. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ස්ත්‍රීහු ය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රීහුත් මුදුලූවකින් මහණහුගේ කය පිළිබඳ වූවක් ආමර්ශනය කෙරෙත් ද, මහණ තෙමේත් සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දත ගණියි ද, දුකුලාඇවැත් දෙකෙකි. ...

18. ස්ත්‍රියකුදු පණ්ඩකයකුදු වෙත්, දෙදෙනා පිළිබඳව ස්ත්‍රීහු ය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, දෙදෙන මුදුලූවකින් මහණ-හුගේ කය පිළිබඳ වූවක් ආමර්ශනය කෙරෙත් ද, සෙවුනා අදහස් ඇත්තේ, එ මහණත් කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දත ගණියි ද, දුකුලාඇවැත් දෙකෙකි. ...

19. ස්ත්‍රියක් වෙයි, ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රිය ද මහණහු පිළිබඳ මුදුලූවකින් මුදුලූවක් ආමර්ශනය කෙරෙයි ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, පහස නොදනියි ද, දුකුලා-ඇවැත් වේ. ...

20. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රීහුය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, ස්ත්‍රීහුත් මුදුලූවකින් මහණහු පිළිබඳ මුදුලූවක් ආමර්ශනය කෙරෙත් ද, ඒ මහණ තෙමේ සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය නො ම දනියි ද, දුකුලාඇවැත් දෙකෙකි. ...

21. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, දෙදෙනා පිළිබඳ ව ස්ත්‍රීහු ය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි ද, දෙදෙනා ම මුදුලූවකින් මහණහු පිළිබඳ මුදුලූවක් ආමර්ශනය කෙරෙත් ද, සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය නො ම දනියි ද, දුකුලාඇවැත් දෙකෙකි. ...

22. සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, ස්පර්ශය දනියි ද, සඟවෙසෙස් ඇවැත් වේ. සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, පහස නොම දනියි ද, දුකුලාඇවැත් වේ. සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් නො කෙරෙයි ද, පහස දනියි ද, ඇවැත් නො වේ. සෙවුනා අදහස් ඇත්තේ කයින් වෑයම් නො කෙරෙයි ද, පහස නො ම-දනියි ද, ඇවැත් නො වේ. මිදෙන අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, පහස දනියි ද, ඇවැත් නො වේ. මිදෙන අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරෙයි ද, පහස නො ම දනියි ද, ඇවැත් නො වේ. මිදෙන අදහස් ඇත්තේ කයින් වෑයම් නො කෙරෙයි ද, පහස දනියි ද, ඇවැත් නො වේ. මිදෙන අදහස් ඇත්තේ කයින් වෑයම් නො කෙරෙයි ද, පහස නො ම දනියි ද, ඇවැත් නොවේ.

23. නො දන සිටියහුට ද, නො සිහියෙන් සිටියහුට ද නො දන්නහුට ද නොඉවිසන්නහුට ද, උමතු වූවහුට ද, බෙදයට පැමිණි සිත් ඇත්තහුට ද, වේදනාවෙන් පෙළුනහුට ද, ආදිකම්මිකයාට ද, ඇවැත් නො වේ.

# විනීතවත්ථු

**උද්දානගාථා:**

මාතා ධීතා ච භගිනී ච ජායා යක්ඛී ච පණ්ඩකො,
සුත්තා මතා තිරච්ඡානා දාරුධීතලිකාය ච.

සම්පීළෙ සඞ්කමෙ මග්ගො රුක්ඛො නාවා ච රජ්ජු ච,
දණ්ඩො පත්තං පනාමෙසි වන්දෙ වායාමි නච්ඡුපෙති.

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මාතුයා මාතුපෙමෙන ආමසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- කච්චි නු ඛො අහං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපන්නො,ති. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ධීතුයා ධීතුපෙමෙන ආමසි -පෙ- භගිනියා භගිනිපෙමෙන ආමසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (2-3)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පුරාණදුතියිකාය කාය-සංසග්ගං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (4)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු යක්ඛියා කායසංසග්ගං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙ-සස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (5)

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පණ්ඩකස්ස කායසං-සග්ගං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (6)

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සුත්තිත්ථියා කාය-සංසග්ගං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (7)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු මතිත්ථියා කායසංසග්ගං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙ-සස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (8)

8. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු තිරච්ඡානගතිත්ථියා කායසංසග්ගං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (9)

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දාරුධීතලිකාය කායසං-සග්ගං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති දුක්කටස්සා"ති (10)

# විනිශ්චිතවස්තු

**උද්දානගාථා:**

මාතු පීතු භගිනී වත්‍ථුය, ජායා යක්‍ඛී පණ්ඩක වත්‍ථුය, සුත්‍ත මත තිරච්ඡානගත වත්‍ථුය, දාරුධීතලික වත්‍ථුය, සම්පීලන සංකම මග්ග වත්‍ථුය, රුක්ඛ නාවා රජ්ජුවත්‍ථු ය, දණ්ඩ පතන පනාමිත වන්දන තජ්ජන වත්‍ථු ය සි විනීතවත්‍ථු විස්සති.

1. එසමයෙහි එක්තරු මහණෙක් මාතෘප්‍රේමයෙන් මවගේ සිරුර අත ගෑ ය. ඔහුට කුකුස් විය. ... කිම? මම සඟවෙසෙස්ඇවැත් අවන්නෙම් ද?"සි භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැළ කෙළේ ය. ... "මහණ සඟවෙසෙස් ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"ය සි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

2. එසමයෙහි එක්තරා මහණෙක් දුහිතෘප්‍රේමයෙන් දුවගේ සිරුර අත ගෑ ය. ... භගිනී ප්‍රේමයෙන් බුහුනනියන්ගේ සිරුර අත ගෑය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"ය සි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (2. 3)

3. එසමයෙහි එක්තරා මහණෙක් ගිහිකල අඹුව හා කායසංසගීයට සමවනී. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස්ඇවැත් අවන්නෙහි ය"සි වදාළ සේක. (4)

4. එසමයෙහි එක්තරා මහණෙක් යකින්නක හා කායසසගයට සමවනී. ඒ මහණහට කුකුස් විය.... "මහණ සඟවෙසෙස් ඇවැත් නො වේ. ථුලැසි ඇවැත් වේ"සි වදාළ සේක. (5.)

5. එසමයෙහි එක්තරා මහණෙක් පණ්ඩකයකු හා කායසසගයට සමවනී. ඒ මහණට කුකුස් විය. ... 'මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසි ඇවැත් වේ"ය සි වදාළ සේක. (6.)

6. එසමයෙහි එක්තරා මහණෙක් නිදන ස්ත්‍රියක හා කායසසගයට සමවනී. ඔහුට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස්ඇවැත් අවන්නෙහි ය"සි වදාළ සේක. (7.)

7. එසමයෙහි එක්තරා මහණෙක් මළ ස්ත්‍රියක හා කායසසගයට සමවනී. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"ය සි වදාළ සේක. (8.)

8. එසමයෙහි එක්තරු මහණෙක් තිරිසන්ගිය මාගමක හා කායසසගයට සමවනී. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"සි වදාළ සේක. (9.)

9. එසමයෙහි එක්තරු මහණෙක් දඬුමුවා පෙනැලිරුවක් හා කායසසගයට සමවනී. ඔහුට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"සි වදාළ සේක. (10.)

10. තෙන ඛො පන සමයෙන සම්බහුලා ඉත්ථියො අඤ්ඤතරං භික්ඛුං සම්පීළෙත්වා බාහාපරම්පරාය [1]නෙසුං. තස්ස කුක්කුච්චං අහොසි. "සාදියි ත්වං භික්ඛූ"ති. "නාහං භගවා සාදියි"න්ති "අනාපත්ති භික්ඛු අසාදියන්තස්සා"ති. (11)

11. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථියා අභිරූළ්හං සඞ්කමං සාරත්තො සංචාලෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (12)

12. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථිං පටිපථෙ පස්සිත්වා සාරත්තො අංසකූටෙන පහාරං අදාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (13)

13. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථියා අභිරූළ්හං රුක්ඛං සාරත්තො සඤ්චාලෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (14)

14. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථියා අභිරූළ්හං නාවං සාරත්තො සඤ්චාලෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (15)

15. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථියා ගහිතං රජ්ජුං සාරත්තො ආවිඤ්ඡි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (16)

16. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථියා ගහිතං දණ්ඩං සාරත්තො ආවිඤ්ඡි. තස්ස කුක්කුච්චං අහොසි. -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (17)

17. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාරත්තො ඉත්ථිං පත්තෙන පනාමෙසි. තස්ස කුක්කුච්චං අහොසි. "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (18)

18. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථියා වන්දන්තියා සාරත්තො පාදං උච්චාරෙසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (19)

19. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ඉත්ථිං ගහෙස්සාමීති වායමිත්වා න ඡුපි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ-. "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති දුක්කටස්සා"ති. (20)

**කායසංසග්ගසික්ඛාපදං නිට්ඨිතං.[2]**

1. ආනෙසුං. මජසං. 2. කායසංසග්ගසික්ඛාපදං නිට්ඨිතං දුතියං. මජසං.

10. එසමයෙහි බොහෝ සත්‍රීහු එක්තරා මහණකු පෙළා අතිනතින් පැමිණවූහ. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ ඉවසුයෙහි දැ?"යි අසා වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, මම නො ඉවසීමි" යි හේ කීය. "මහණ, නො ඉවසන්නහුට ඇවැත් නො වේ"යි වදාළ සේක. (11.)

11. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියක නැගුනු එදණ්ඩක් සෙලවී ය. ඒ මහණහට කුකුස් විය... "මහණ සඟවෙසෙස් ඇවැත් නො වේ. දුකුළා ඇවැත් වේ"යි වදාළ සේක. (12.)

12. එසමයෙහි එක්තරා මහණෙක් පෙරමඟ සත්‍රියක දැක සංරක්ත වූයේ උරහිසින් පහර දිනි. ඒ මහණහට කුකුස් විය.... "මහණ, තෝ සඟ-වෙසෙස් ඇවැත් අවත්නෙහි ය"යි වදාළ සේක. (13.)

13. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියක නැගුනු ගසක් සෙලවී ය. ඒ මහණහට කුකුස් විය- ... "මහණ සඟවෙසස්ඇවැත් නො වේ. දුකුළාඇවැත්වේ"යි වදාළ සේක. (14.)

14. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියක නැගුනු ඔරුවක් සෙලවී ය. ඒ මහණහට කුකුස් විය. "මහණ සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"යි වදාළ සේක. (15.)

15. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියක ගත් රැහනක්ඇද්දේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලසිඇවැත්වේ"යි වදාළ සේක.

16. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්තවූයේ සත්‍රියක ගත් දඬුකඩක් ඇද්දේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළසේක. (17)

17. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියක පාත්‍රයෙන් දුරු කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත් වේ"යි වදාළ සේක. (18)

18. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියක වඳින කල්හි පය එසවී ය. ඒ මහණහට කුකුස් විය. "මහණ, තෝ සඟවෙසෙස්ඇවැත් අවත්නෙහි ය"යි වදාළ සේක. (19)

19. එසමයෙහි එක්තරා මහණෙක් සත්‍රියක අල්ලා ගණිමි යි වෑයම් කොටසපයී නො කෙළේ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ"යි වදාළ සේක. (20)

**කායසංසග්ග ශික්ෂාපදය නිමි.**

## 3. 3.

## දුට්ඨුල්ලවාචාසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **උදායී අරඤ්ඤෙ** විහරති. තස්සායස්මතො විහාරො අභිරූපො හොති දස්සනීයො පාසාදිකො. තෙන ඛො පන සමයෙන සම්බහුලා ඉත්ථියො ආරාමං අගමංසු විහාරපෙක්ඛිකායො. අථ ඛො තා ඉත්ථියො යෙනායස්මා උදායී, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොචුං: "ඉච්ඡාම මයං භන්තෙ අය්‍යස්ස විහාරං පෙක්ඛිතු"න්ති. අථ ඛො ආයස්මා උදායී තා ඉත්ථියො විහාරං පෙක්ඛාපෙත්වා තාසං ඉත්ථීනං වච්චමග්ගං පස්සාවමග්ගං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති. යාචති'පි ආයාචති'පි, පුච්ඡති'පි පටිපුච්ඡති'පි, ආචික්ඛති'පි, අනුසාසති'පි, අක්කොසති'පි. යා තා ඉත්ථියො ඡින්නිකා ධුත්තිකා අහිරිකායො තා ආයස්මතා උදායිනා සද්ධිං ඌහසන්ති'පි උල්ලපන්ති'පි උජ්ජග්ඝන්ති'පි උප්පණ්ඩෙන්ති'පි. යා පන තා ඉත්ථියො හිරිමනා තා නික්ඛමිත්වා භික්ඛූ උජ්ඣාපෙන්ති: "ඉදං භන්තෙ නච්ඡන්නං නප්පතිරූපං, සාමිකෙනපි මයං එවං වුත්තා න ඉච්ඡෙය්‍යාම, කිම්පනාය්‍යෙන උදායිනා"ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායී මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං උදායිං පටිපුච්ඡි: "සච්චං කිර ත්වං උදායී මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසී"ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවියං මොඝපුරිස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිස්සසි. නනු මයා මොඝපුරිස අනෙකපරියායෙන විරාගාය ධම්මො දෙසිතො, නො සරාගාය -පෙ- කාමපරිළාහානං වූපසමො අක්ඛාතො. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවං ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය යථා තං යුවා යුවතිං මෙථුනුපසංහිතාහි, සඞ්ඝාදිසෙසො**'ති.

3. **යො පනා**'ති යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ඔතිණ්ණො** නාම සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො.

# 3. 3.

## දුට්ඨුල්ලවාචාශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් අනේපිඬුසිටුහුගේ අරම්හි වාසය කරණ සේක. එසමයෙහි ආයුෂ්මත් **උදායී** තෙමේ අරණෙහි වෙසෙයි. ඒ ආයුෂ්මත් උදායී තෙරුන්ගේ විහාරය මනරම් ය. දකුම්කලු ය. ප්‍රසාද එළවන්නේ ය. එසමයෙහි බොහෝ ස්ත්‍රීහු සෙනස්න බැලියැටි වූවාහු ඒ අරමට පැමිණියාහු ය. ඉක්බිති ඒ ස්ත්‍රීහු ආයුෂ්මත් උදායී තෙරුන් කරා එළඹියාහු ය. එළඹ ආයුෂ්මත් උදායී හට "ස්වාමීනි, ආර්ය්‍යයන් වහන්සේගේ විහාරය බලන්නට අපි කැමැත්තෙමු" යි කීහ. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙමේ ඒ ස්ත්‍රීන්ට විහාරය පෙන්වා ඒ ස්ත්‍රීන්ගේ වසමග පසමග ලක් කොට ගුණ ද කියයි. අගුණ ද කියයි. යදන්නේත් වෙයි. අයදන්නේත් වෙයි. විචාරණුයේත් වෙයි. පුළුවුස්නේත් වෙයි. අනුසස්නේත් වෙයි. භවත්නේත් වෙයි. යම් ඒ ස්ත්‍රී කෙනෙක් පුන් ඔනප් ඇත්තෝ සඨ වූවෝ ලජ්ජා නැත්තෝ වෙත් ද, ඔහු ආයුෂ්මත් උදායී තෙරුන් සමග මඳ සිනා පහළ කරන්නෝත් වෙත්. පොළඹවන බස් දොඩන්නෝත් වෙත්. මහ හඬින් සිනා සෙන්නෝ ද වෙත්. පරිහාස ද කෙරෙත්. යම් ඒ ස්ත්‍රී කෙනෙක් ලජ්ජා ඇත්තාහු ද ඔහු නික්ම 'වහන්ස, මෙය නුසුදුසු ය. යෝග්‍ය නො වෙයි. හිමියා විසිනුදු මෙසේ කියන ලද්දා වූ අපි නො රුස්නෙමු. උදායී ආර්ය්‍යයන් වහන්සේ විසින් කියන ලදුමෝ කිම රුස්නමෝ ද?"යි භික්ෂූන්ට අවඬු කරත්. යම් ඒ අපිස් මගණහු වෙත් ද ඔහු "කෙසේ නම් ආයුෂ්මත් උදායී තෙමේ මාගමුන්ට වසමග පසමග ඇරැබ තුළුල් තෙපුලින් ඔවස් බෙණේ ද?"යි අවඬු කෙරෙත්. අයුණු කියත්. දෙස් පතුරුවත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළහ.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා "උදායී, තෝ මාගමට තුළුල් තෙප්ලෙන් ඔවස් බිණුයෙහි සැබෑ ද?" යි ආයුෂ්මත් උදායී තෙරුන් පුළුවුත් සේක. "සැබව, භාග්‍යවතුන් වහන්සැ"යි හේ කීය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාරණ සේක්, "හිස් පුරුෂය, නුසුදුසු ය. අනුලෝම් නො වෙයි. යෝග්‍ය නො වෙයි. මහණුන්ට නො ගැළපෙන්නෙක. නො කැප ය. නොකටයුත්තක. හිස් පුරුෂය, කවර කරුණකින් තෝ මාගමට තුළුල් තෙප්ලෙන් පහත් ලෙස බිණුයෙහි ද? හිස් පුරුෂය, මා විසින් සරාගය පිණිස නො ව විරාගය පිණිස නන් අයුරින් දහම් දෙසන ලද්දේ නො වේ ද? කාමපරිදාහයන් ගේ සංසිඳීම කියන ලද්දේ නො වේ ද? හිස් පුරුෂය, මෙය නොපහන් වූවන්ගේ පහන් බව පිණිස නො වේ"යි ... ගැරහූ සේක. ඉක්බිති මෙය වදාළ සේක: මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් තුළුල් තෙපුල් කියැවි රාගයෙන් මඩනා ලද්දේ පෙරළි සිතින් මිනිස් මාගමකට වසමග පසමග ඇරැබ මෙවුන්දම් පිළිබඳ තුළුල් තෙප්ලෙන් තරුණයකු තරුණියකට මෙන් ඔවස් බෙණේ නම් ඒ මහණහට සඟවෙසෙස්ඇවැත් වේ."**

3. **යොපන** යනු යමෙක්, යම්බඳු වූයෙක් ...

**භික්ඛු** යනු ... මේ අරුත්හි මේ තෙමේ භික්ෂු ය යි අභිමත යි.

**ඔතිණ්ණ** නම්: ඇලුම් ඇත්තේ, අපේක්ෂා ඇත්තේ, පිළිබඳ සිතැත්තේ යි.

**විපරිණත**න්ති රත්තම්පි චිත්තං විපරිණතං, දුට්ඨම්පි චිත්තං විපරිණතං, මූළ්හම්පි චිත්තං විපරිණතං. අපි ච රත්තං චිත්තං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතං විපරිණතන්ති.

**මාතුගාමො** නාම: මනුස්සිත්ථී, න යක්ඛී න පෙතී න තිරච්ඡානගතා, විඤ්ඤූ පටිබලා සුභාසිතදුබ්භාසිතා දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං.

**දුට්ඨුල්ලං වාචා** නාම: වච්චමග්ගපස්සාවමග්ගමෙථුනධම්මපටිසංයුත්තා වාචා.

**ඔභාසෙය්‍යා**ති අජ්ඣාචාරෙ වුච්චති.

**යථා තං යුවා යුවති**න්ති දහරො දහරිං තරුණො තරුණිං කාමභොගී කාමභොගිනිං.

**මෙථුනූපසංහිතාහී**ති මෙථුනධම්මපටිසංයුත්තාහි.

**සඞ්ඝාදිසෙසො**‘ති -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසො‘ති,

.4 ද්වෙ මග්ගෙ ආදිස්ස වණ්ණම්පි භණති, අවණ්ණම්පි භණති, යාචති‘පි, ආයාචති‘පි, පුච්ඡති‘පි, පටිපුච්ඡති‘පි, ආචික්ඛති‘පි, අනුසාසති‘පි, අක්කොසති‘පි.

**වණ්ණං භණති** නාම: ද්වෙ මග්ගෙ ථොමෙති වණ්ණෙති පසංසති.

**අවණ්ණං භණති** නාම: ද්වෙ මග්ගෙ ඛුංසෙති වම්භෙති ගරහති.

**යාචති** නාම: දෙහි මෙ අරහසි මෙ දාතුන්ති.

**ආයාචති** නාම: කදා තෙ මාතා පසීදිස්සති, කදා තෙ පිතා පසීදිස්සති, කදා තෙ දෙවතායො පසීදිස්සන්ති, කදා[1] සුඛණො සුලයො සුමුහුත්තො භවිස්සති, කදා තෙ මෙථුනං ධම්මං ලභිස්සාමී[2]ති.

**පුච්ඡති** නාම: කථං ත්වං සාමිකස්ස දෙසි[3] කථං ජාරස්ස දෙසී[3]ති.

**පටිපුච්ඡති** නාම: එවං කිර ත්වං සාමිකස්ස දෙසි[3] එවං ජාරස්ස දෙසී[3]ති.

**ආචික්ඛති** නාම: පුට්ඨො භණති “එවං දෙහි, එවං දෙන්තී[4] සාමිකස්ස පියා භවිස්සසි මනාපා චා”ති.

**අනුසාසති** නාම: අපුට්ඨො භණති, “එවං දෙන්තී[1] සාමිකස්ස පියා භවිස්සති මනාපා චා”ති.

**අක්කොසති** නාම: අනිමිත්තා‘සි නිමිත්තමත්තා‘සි අලොහිතා‘සි ධුවලොහිතා‘සි ධුවචොළා‘සි පග්ඝරන්තී‘සි සිඛරණී‘සි ඉත්ථිපණ්ඩකා‘සි වෙපුරිසිකා‘සි සම්භින්නා‘සි උභතොබ්‍යඤ්ජනාසීති.

---

1. කදා තෙ. ස්‍යා. 2. ලභිස්සසීති. සී. මු. 3; දෙහි, දෙහීති. සී. මු. 4. දෙන්තා, මජ්සං.

**විපරිණතං** යනු: රාගයෙන් රත් වූ සිත ද විපරිණත ය, ද්වේෂයෙන් දුෂ්ට වූ සිත ද විපරිණත ය, මෝහයෙන් මූළ වූ සිත ද විපරිණත ය. වැලිත් මේ අර්ථයෙහි රාගයෙන් රත් වූ සිත විපරිණතය යි අභිමත යි.

**මාතුගාම** නම්: මිනිස් මාගමකි. යකින්නක් නො වෙයි. ප්‍රේතියක් නො වෙයි. තිරිසන් ගිය මාගමක් ද නො වෙයි. සුබැසි දුබැසි තුළුල් නොතුළුල් තෙපුල් දැන ගැණීමට සමත් නුවණැති මාගමකි.

**දුට්ඨුල්ලවාචා** නම්: වසමග පසමග මෙවුන්දම් පිළිබඳ තෙපුල් ය.

**ඔභාසෙය්‍ය** යනුයෙන් ආචාරව්‍යතික්‍රමය කියනු ලැබේ.

**යථා තං යුවා යුවතිං** යනු ගම්දරුවකු ගම්දැරියකට තරුණයකු තරුණියකට කම්සැප විඳින්නකු කම්සැප විඳින්නියකට කථා කරන්නාක් මෙනි.

**මෙථුනුපසංහිතා** යනු: මෙවුන්දම් පිළිබඳ තෙපුලින් ය.

**සඞ්ඝාදිසෙසො** යනු ... එයිනුදු සඟවෙසෙස යි කියනු ලැබේ.

4. දෙමග ඇරැබ ගුණත් කියයි. අගුණත් කියයි. යදින්නේත් වෙයි. අයදින්නේත් වෙයි. විචාරන්නේත් වෙයි. පුළුවුස්නේත් වෙයි. කියන්නේත් වෙයි. අනුශාසනා කරන්නේත් වෙයි. ආක්‍රොශ කරන්නේත් වෙයි.

**ගුණ කියයි** යනු: දෙමග ගුණ කියයි. වණයි. පසසයි.

**අගුණ කියයි** යනු: ගරහයි, අවමන් කෙරෙයි, නිඥ කෙරෙයි,

**යදියි** යනු: 'මට දෙව, මට දීමට සුදුස්සෙහි ය'යි කියයි.

**අයදියි** යනු: කවරදා තීගේ මවු තුටු වන්නී ද? කවරදා තීගේ පියා තුටු වන්නේ ද? කවරදා තීගේ (ඉටු) දෙවියෝ පහදින්නාහු ද? කවරදා සුබ ක්ෂණය, සුබ ලය, සුබ මොහොත වන්නේ ද? කවරදා තීගේ මෙවුන්දම් ලබන්නෙම් ද? යි කියයි.

**විචාරයි** යනු: 'කෙසේ නම් තෝ සැමියාට දෙයි ද? කෙසේ නම් තෝ සොර සැමියාට දෙයි ද? යි ප්‍රශ්න කෙරෙයි.

**පිළිවිසියි** යනු: 'මෙසේ තෝ සැමියාට දෙසිල මෙසේ තෝ සොරසැමියාට දෙසිල'යි පිළිවිසියි.

**කියයි** යනු: විචාරණ ලද්දේ "මෙසේ දෙව. මෙසේ දෙන්නිය හිමියාට ප්‍රිය ද මන වඩන්නී ද වන්නීය"යි කියයි.

**අනුශාසනා කෙරෙයි** යනු: නොවිචාරණ ලද්දේ "මෙසේ දෙන්නිය සැමියාට ප්‍රිය වන්නී ය, මන වඩන්නීය"යි කියයි.

**ආක්‍රොශ කෙරෙයි** යනු: 'නිමිත්ත නැත්තී වෙහි, නො පිරිපුන් නිමිත්ත ඇත්තී වෙහි, ඔසප් නැත්තී වෙහි, නිති ඔසප් ඇත්තී වෙහි, නිති දරණ පිළී කඩ ඇත්තී වෙහි, මූ වගුරුවන්නී වෙහි, හිවී ගිය මස් ඇත්තී වෙහි, ස්ත්‍රී-පණ්ඩක වෙහි, පිරිමි අයුරු ඇත්තී වෙහි, මුසු වූ හදන් ඇත්තී වෙහි, දෙහදත් ඇත්තී වෙහි'යි කියයි.

1. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ඉත්ථියා වච්චමග්ගං පස්සාවමග්ගං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති, යාචති'පි ආයාචති'පි පුච්ඡති'පි පටිපුච්ඡති'පි, ආචික්ඛති'පි, අනුසාසති'පි, අක්කොසති'පි, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස -පෙ-*

2. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං වච්චමග්ගං පස්සාවමග්ගං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං -පෙ-

3. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං උභින්නං වච්චමග්ගං පස්සාවමග්ගං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, අපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ-

4. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ඉත්ථියා වච්චමග්ගං පස්සාවමග්ගං ඨපෙත්වා අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති ථුල්ලච්චයස්ස -පෙ-

5. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං වච්චමග්ගං පස්සාවමග්ගං ඨපෙත්වා අධක්ඛකං උබ්භජාණු-මණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති ද්වින්නං ථුල්ලච්චයානං -පෙ-

6. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං උභින්නං වච්චමග්ගං පස්සාවමග්ගං ඨපෙත්වා අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසතිපි, ආපත්ති ථුල්ලච්චයෙන දුක්කටස්ස -පෙ-

7. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ඉත්ථියා උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ-අක්කොසති'පි, ආපත්ති දුක්කටස්ස -පෙ-

8. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

9. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං උභින්නං උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-

10. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ඉත්ථියා කායපටිබද්ධං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති දුක්කටස්ස -පෙ-

* පෙය්‍යාලමුඛෙන කායසංසග්ගෙ වුත්තනයෙනෙව වෙදිතබ්බා.

1. ස්ත්‍රියකුදු වෙයි, 'ස්ත්‍රිය' යන හැඟීම් ඇති ඇලුනු මහණෙකුදු වෙයි, ස්ත්‍රියගේ වසම්ග පසම්ග ඇරැබ ගුණ කියයි ද, අගුණ කියයි ද, යදියි ද, අයදියි ද, විචාරයි ද, පිළිවිසියි ද, බෙණෙයි ද, අනුශාසනා කෙරෙයි ද, ආක්‍රොශ කෙරෙයි ද, සඞ්ඝාදිසෙසයටපැමිණ සඝවෙසෙස්ඇවැත් වේ. ...

2. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, මහණ තෙම ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ ව 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද, වෙයි, ස්ත්‍රීන් දෙදෙනාගේ වසම්ග පසම්ග ඇරැබ ගුණ කියයි ද, අගුණ කියයි ද ... ආක්‍රොශ කෙරෙයි ද සඟවෙසෙස්ඇවැත් දෙකෙකි. ...

3. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, මහණ තෙම් දෙදෙනා පිළිබඳ ව 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද, වෙයි, ස්ත්‍රීන් දෙදෙනාගේ වසම්ග පසම්ග ඇරැබ ගුණ කියයි ද, අගුණ කියයි ද ... ආක්‍රොශ කෙරෙයි ද, සඟවෙසෙස් හා දුකුළාඇවැත් වේ. ...

4. ස්ත්‍රියකුදු වෙයි, මහණතෙම 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද, වෙයි. ස්ත්‍රියගේ වසම්ග පසම්ග හැර අකුඇටින් යට දෙදණ මඬලින් මතු ගුණ කියයි ද, අගුණ කියයි ද, ආක්‍රොශ කෙරෙයි ද ථුල්ලැසි වේ. ...

5. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, මහණ තෙම ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳව 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද වෙයි. ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳ වසම්ග පසම්ග හැර අකුඇටින් යට දෙදණ මඬලින් උඩ ගුණ කියයි ද, අගුණ කියයි ද ... ආක්‍රොශ කෙරෙයි ද, ථුල්ලැසිඇවැත් දෙකෙකි. ...

6. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, මහණ තෙමේ දෙදෙනා පිළිබඳව 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද වෙයි. දෙදෙනාගේ වසම්ග පසම්ග හැර අකුඇටින් යට දෙදණ මඬලින් මතු ගුණ කියයි ද, අගුණ කියයි ද ... ආක්‍රොශ කෙරෙයි ද ථුල්ලැසි හා දුකුළාඇවැත් වේ. ...

7. ස්ත්‍රියක් ද වෙයි, මහණ තෙමේ 'ස්ත්‍රියක' යන හැඟීම් ඇත්තේ, ඇලුම් ඇත්තේ ද වෙයි. ස්ත්‍රියගේ අකුඇටින් මතු දෙදෙණ මඬලින් යට ගුණ කියයි ද, අගුණ කියයි ද, ... ආක්‍රොශ කෙරෙයි ද, දුකුළාඇවැත් වේ. ...

8. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, මහණ තෙමේ ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳව 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද වෙයි. ස්ත්‍රීන් දෙදෙනාගේ අකුඇටින් මතු දෙදණ මඬලින් යට ගුණ කියයි ද, අගුණ කියයි ද ... ආක්‍රොශ කෙරෙයි ද, දුකුළාඇවැත් දෙකෙකි. ...

9. ස්ත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්, මහණ තෙමේ දෙදෙනා පිළිබඳ 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද වෙයි. දෙදෙනාගේ අකු ඇටින් මතු දෙදණ මඬලින් යට ගුණ කියයි ද, අගුණ කියයි ද, ... ආක්‍රොශ කෙරෙයි ද දුකුළාඇවැත් දෙකෙකි. ...

10. ස්ත්‍රියක් ද වෙයි, මහණ තෙමේ 'ස්ත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද වෙයි. ස්ත්‍රියගේ කය පිළිබඳ වූ වස්ත්‍රාදිය ඇරැබ ගුණ කියයි ද, අගුණ කියයි ද. ... ආක්‍රොශ කෙරෙයි ද. දුකුළාඇවැත් වේ. ...

11. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච නං ද්වින්නං ඉත්ථීනං කායපටිබද්ධං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-.

12. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච නං උභින්නං කායපටිබද්ධං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති -පෙ- අක්කොසති'පි, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ-.

13. අනාපත්ති අත්ථපුරෙක්ඛාරස්ස, ධම්මපුරෙක්ඛාරස්ස, අනුසාසනීපුරෙක්ඛාරස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

## විනීතවත්ථු

**උද්දානගාථා:**

ලොහිතං කක්කසාකිණ්ණං ඛරං දීඝඤ්ච වාපිතං
කච්චි සංසීදති[1] මග්ගො සද්ධා දත්තෙන කම්මුනා'ති.

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී නවරත්තං කම්බලං පාරුතා හොති. අඤ්ඤතරො භික්ඛු සාරත්තො තං ඉත්ථිං එතදවොච: "ලොහිතං ඛො තෙ භගිනී"ති. සා න පටිවිජානි. "ආමය්‍ය, නවරත්තො කම්බලො"ති. තස්ස කුක්කුච්චං අහොසි. "කච්චි නු ඛො අහං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපන්නො"ති. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී ඛරකම්බලං පාරුතා හොති. අඤ්ඤතරො භික්ඛු සාරත්තො තං ඉත්ථිං එතදවොච: "කක්කසලොමං ඛො තෙ භගිනී"ති. සා න පටිවිජානි. "ආමය්‍ය, ඛරකම්බලකො"ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (2)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී නවාවුතං කම්බලං පාරුතා හොති. අඤ්ඤතරො භික්ඛු සාරත්තො තං ඉත්ථිං එතදවොච: "ආකිණ්ණලොමං ඛො තෙ භගිනී"ති. සා න පටිවිජානි. "ආමය්‍ය, නවාවුතො කම්බලො"ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති දුක්කටස්සා"ති. (3)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී ඛරකම්බලකං පාරුතා හොති. අඤ්ඤතරො භික්ඛු සාරත්තො තං ඉත්ථිං එතදවොච: "ඛරලොමං ඛො තෙ භගිනී"ති. සා න පටිවිජානි, "ආමය්‍ය, ඛරකම්බලකො"ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති දුක්කටස්සා"ති. (4)

---

1. සංසීරති. සී.මු. ස්‍යා.

11. සත්‍රීහු දෙදෙනෙක් වෙත්. මහණ තෙමේ සත්‍රීන් දෙදෙනා පිළිබඳව 'සත්‍රිය' යන හැඟීම් ඇත්තේ ද වෙයි. ඇලුනේ සත්‍රීන් දෙදෙනාගේ කය පිළිබඳ වූ වස්ත්‍රාදිය ඇරැබ ගුණ කියයි ද, අගුණ කියයි ද, ... ආක්‍රොශ කෙරෙයි ද, දුකුලාඇවැත් දෙකෙකි. ...

12. සත්‍රියකුදු පණ්ඩකයෙකුදු වෙත්. මහණ තෙමේ දෙදෙනා පිළිබඳව 'සත්‍රිය' යන හැඟීම් ඇත්තේ, ඇලුනේ ද වෙයි. දෙදෙනාගේ කය පිළිබඳ වූවක් ඇරැබ ගුණ කියයි ද, අගුණ කියයි ද ... ආක්‍රොශ කෙරෙයි ද දුකුලාඇවැත් දෙකෙකි. ...

13. ඔවං පෙරටුකොට, දහම් පෙරටු කොට අනුශාසන පෙරටු කොට කියන්නහුටත්, උම්තුවූවහුටත් ආදිකම්මිකයාටත් ඇවැත් නො වේ.

## විනීශචිතවස්තු

**උද්දානගාථා:**

ලොහිත වත්‍ථු, කක්කස ලොම වත්‍ථු, ආකිණ්ණ ලොම වත්‍ථු, ඛර ලොම වත්‍ථු, දීඝ ලොම වත්‍ථු, වාපිත වත්‍ථු, කච්චිසංසිදනමග්ග වත්‍ථු, සද්ධා වත්‍ථු, දාන වත්‍ථු, කම්ම වත්‍ථු (තුනෙකා) යි වස්තු දොළසෙකි:

1. එසමයෙහි එක්තරා සත්‍රියක් අලුත රැඳු කම්බලයක් පෙරෙවියා වෙයි. එක්තරා මහණෙක් සංරක්තවූයේ ඒ සත්‍රියට "බුහුනනියනි, තිගේ ලෙය" යි කී ය. ඕ එබස නො දත්තී 'එසේය, ආයසීයන් වහන්ස, අලුත රැඳු කම්බලයකි'යි කිවූ ය. මහණහට "කිම, මම් සඟවෙසෙස්-ඇවැත් අවන්නෙම් දැ?"යි කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කෙළේ ය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ"යි වදාළ සේක.

2. එසමයෙහි එක්තරා සත්‍රියක් ගතලොම් කම්බලයක් පෙරෙවියා වෙයි. සංරක්තවූ එක්තරා මහණෙක් ඒ සත්‍රියට "බුහුනනියනි, තිගේ කැකුළ ලොමැ" යි කීය. ඕ තොමෝ එ බස නො දත්තීය. "ආයසීයන් වහන්ස, රළු ලොම් කම්බලයෙකි"යි ඕ කිවූ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ"යි වදාළ සේක. (2)

3. එසමයෙහි එක්තරා සත්‍රියක් අලුත වියූ කම්බලයක් පෙරෙවියා වෙයි. සංරක්ත වූ එක්තරා මහණෙක් ඒ සත්‍රියට "බුහුනනියනි, තිගේ ගැවසුනු ලොම් වේ"යි කී ය. ඕ දැන නො ගත්තී ය. "එසේ ය ආයසීයන් වහන්ස, අලුත වියූ කම්බලයකි"යි කිවූ ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්-ඇවැත් නො වේ. දුකුලා ඇවැත් වේ" යි වදාළ සේක. (3)

4. එසමයෙහි එක්තරා සත්‍රියක් රළුලොම් කම්බලයක් පෙරෙවියා වෙයි. සංරක්ත වූ එක්තරා මහණෙක් ඒ සත්‍රියට "බුහුනනියනි, තිගේ රළු ලොමැ"යි කී ය. ඕ දැන නො ගත්තී ය. "එසේ ය ආයසීයන් වහන්ස. කම්බලය රළුලොම් ඇත්තෙකැ"යි කිවූය. ඒ මහණහට කුකුස් විය. "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුලාඇවැත් වේ" යි වදාළ සේක. (4)

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී පාවාරං[1] පාරුතා හොති. අඤ්ඤතරො භික්ඛු සාරත්තො තං ඉත්ථිං එතදවොච: "දීඝලොමං ඛො තෙ භගිනී"ති. සා න පටිවිජානි, "ආමය්‍ය, පාවාරො"[2]ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (5)

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී ඛෙත්තං වපාපෙත්වා ආගච්ඡති. අඤ්ඤතරො භික්ඛු සාරත්තො තං ඉත්ථිං එතදවොච: "වාපිතං ඛො තෙ භගිනී"ති. සා න පටිවිජානි "ආමය්‍ය, නො ච ඛො පටිවුත්ත"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස, ආපත්ති දුක්කටස්සා"ති. (6)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පරිබ්බාජිකං පටිපථෙ පස්සිත්වා සාරත්තො තං පරිබ්බාජිකං එතදවොච: "කච්චි තෙ භගිනි මග්ගො සංසීදතී"ති[3]. සා න පටිවිජානි. "ආම භික්ඛු, පටිපජ්ජිස්සසී"ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (7)

8. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාරත්තො අඤ්ඤතරං ඉත්ථිං එතදවොච: "සද්ධා'සි ත්වං භගිනි අපි ච යං ත්වං සාමිකස්ස දෙසි තං නාම්හාකං දෙසී"ති. "කිං භන්තෙ"ති. "මෙථුනං ධම්ම"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (8)

9. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාරත්තො අඤ්ඤතරං ඉත්ථිං එතදවොච: "සද්ධා'සි ත්වං භගිනි. අපි ච යං අග්ගදානං තං නාම්හාකං දෙසී"ති. "කිං භන්තෙ අග්ගදාන"න්ති. "මෙථුනං ධම්ම"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති (9)

10. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී කම්මං කරෙති. අඤ්ඤතරො භික්ඛු සාරත්තො තං ඉත්ථිං එතදවොච: "තිට්ඨ භගිනි අහං කරිස්සාමී"ති -පෙ- "නිසීද භගිනි අහං කරිස්සාමී"ති -පෙ- "නිපජ්ජ භගිනි, අහං කරිස්සාමී"ති. සා න පටිවිජානි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස. ආපත්ති දුක්කටස්සා"ති. (10-11-12)

**දුට්ඨුල්ලවාචාසික්ඛාපදං නිට්ඨිතං.**

---

1. දීඝපාවාරං. සයා. 2. දීඝපාවාරො. සයා. 3. සංසීරතීති. සී. මු

5. එසමයෙහි එක්තරා සත්‍රියක් උතුරු සළුවක් පෙරෙව්යා වෙයි. සංරක්ත වූ එක්තරා මහණෙක් ඒ සත්‍රියට "නඟ, තිගේ දිග ලොම්ය"යි කී ය. ඕ දැන නොගත්තී ය. "එසේ ය, ආයඞීයන් වහන්ස, උතුරුසළුවකි" යි කිවු ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ" ය යි වදාළ සේක. (5)

6. එසමයෙහි එක්තරා සත්‍රියක් කෙතක් වපුරවා එයි. එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියට "නඟ, තිගේ කෙත වපුළේ ද?" යි කී ය. ඕ දැන නො ගත්තී ය. "එසේ ය, ආයඞීයන් වහන්ස, වැලිත් නැවත වපුළේ නො වේ ය"යි කිවු ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ" යි වදාළ සේක. (6)

7. එසමයෙහි එක්තරා මහණෙක් පෙරමඟ පිරිවැජියක දැක සංරක්ත වූයේ, ඒ පිරිවැජියට "කිම නඟ, තිගේ මඟ මැනාවින් පවත්නේ ද?" යි ඇසී ය. ඕ නො දත්තී ය. "එසේ ය මහණ, මඟ බැස යන්නා"යි කිවු ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. ථුලැසිඇවැත්වේ" යි වදාළ සේක. (7)

8. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ එක්තරා සත්‍රියකට "නඟ, ශ්‍රද්ධා ඇති වෙහි ය. එහෙත් තෝ යමක් හිමියාට දෙයි නම් එය අපට නො දෙහිය" යි කී ය. "වහන්ස, කිමෙක් ද?" යි ඕ කිවු ය. "මෙවුන්දමය" යි හේ කී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස්ඇවැත් අවන්නෙහිය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. (8)

9. එසමයෙහි එක්තරා මහණෙක් සංරක්ත වූයේ සත්‍රියකට "නඟ, තෝ සැදැහැවත් ය. වැලිත් යම් අග්‍රදානයෙක් වේ නම් එය අපට නො දෙහිය' යි කී ය. "වහන්ස, අග්‍රදානය යනු කිමැ?" යි කිවු ය. "මෙවුන්දමය"යි කී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස්-ඇවත් අවන්නෙහිය" යි වදාළ සේක. (9)

10. එසමයෙහි එක්තරා සත්‍රියක් කිසි කටයුත්තක් කෙරෙයි. සංරක්ත වූ එක්තරා මහණෙක් ඒ සත්‍රියට 'නඟ, සිටුව මම් කරන්නෙමි' ... 'නඟ, හිඳුව. මම් කරන්නෙමි' ... 'නඟ, වැදහෙව. මම් කරන්නෙමි' යි කී ය. ඕ දැන නො ගත්තී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, සඟවෙසෙස්ඇවැත් නො වේ. දුකුළාඇවැත්වේ"යි වදාළ සේක. (10. 11. 12.)

**දුට්ඨුල්ලාවාචාශික්ෂාපදය නිමි.**

# 3. 4.

## අත්තකාමපාරිචරියසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායී සාවත්ථියං කුලූපගො හොති. බහුකානි කුලානි උපසඞ්කමති. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී මතපතිකා අභිරූපා හොති දස්සනීයා පාසාදිකා. අථ ඛො ආයස්මා උදායී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන තස්සා ඉත්ථියා නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

2. අථ ඛො සා ඉත්ථී යෙනායස්මා උදායී, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං ඉත්ථිං ආයස්මා උදායී ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

3. අථ ඛො සා ඉත්ථී ආයස්මතා උදායිනා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා ආයස්මන්තං උදායිං එතදවොච: "වදෙය්‍යාථ භන්තෙ යෙන අත්ථො. පටිබලා මයං අය්‍යස්ස දාතුං යදිදං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර"න්ති "න ඛො තෙ භගිනි අම්හාකං දුල්ලභා යදිදං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරා. අපි ච යො අම්හාකං දුල්ලභො තං දෙහී"ති. "කිං භන්තෙ"ති "මෙථුනං ධම්ම"න්ති. "අත්ථො භන්තෙ"ති "අත්ථො භගිනී"ති. "එහි භන්තෙ"ති ඔවරකං පවිසිත්වා සාටකං නික්ඛිපිත්වා මඤ්චකෙ උත්තානා නිපජ්ජි. අථ ඛො ආයස්මා උදායී යෙන සා ඉත්ථී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා "කො ඉමං වසලං දුග්ගන්ධං ආමසිස්සතී"ති නිට්ඨුභිත්වා පක්කාමි.

4. අථ ඛො සා ඉත්ථී උජ්ඣායති ඛීයති විපාචෙති: "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා දුස්සීලා මුසාවාදිනො. ඉමෙහි නාම ධම්මචාරිනො සමචාරිනො බ්‍රහ්මචාරිනො සච්චවාදිනො සීලවන්තො කල්‍යාණධම්මා පටිජානිස්සන්ති. නත්ථි ඉමෙසං සාමඤ්ඤං. නත්ථි ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. නට්ඨං ඉමෙසං සාමඤ්ඤං. නට්ඨං ඉමෙසං බ්‍රහ්මඤ්ඤං. කුතො ඉමෙසං සාමඤ්ඤං? කුතො ඉමෙසං බ්‍රහ්මඤ්ඤං? අපගතා ඉමෙ සාමඤ්ඤා. අපගතා ඉමෙ බ්‍රහ්මඤ්ඤා. කථං හි නාම සමණො උදායී මං සාමං මෙථුනං ධම්මං යාචිත්වා, 'කො ඉමං වසලං දුග්ගන්ධං ආමසිස්සතී'ති නිට්ඨුභිත්වා පක්කමිස්සති? කිං මෙ පාපකං? කිං මෙ දුග්ගන්ධං? කස්සාහං? කෙන හායාමී?"ති.

5. අඤ්ඤාපි ඉත්ථියො උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "අලජ්ජිනො ඉමෙ සමණා සක්‍යපුත්තියා -පෙ- කථං හි නාම සමණො උදායී ඉමිස්සා සාමං මෙථුනං ධම්මං යාචිත්වා කො ඉමං වසලං දුග්ගන්ධං ආමසිස්සතීති නිට්ඨුභිත්වා පක්කමිස්සති? කිං ඉමිස්සා පාපකං? කිං ඉමිස්සා දුග්ගන්ධං? කස්සායං? කෙන හායතී?"ති.

6. අස්සොසුං ඛො භික්ඛූ තාසං ඉත්ථීනං උජ්ඣායන්තීනං ඛීයන්තීනං විපාචෙන්තීනං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායී මාතුගාමස්ස සන්තිකෙ අත්තකාම-පාරිචරියාය වණ්ණං භාසිස්සතී"ති.

# 3. 4.

## අන්‍යකාමපාරිචරියශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වාසය කරණ සේක. එසමයෙහි ආයුෂ්මත් උදායී තෙමේ සැවැත්නුවර බොහෝ කුලයන් කරා එළඹෙයි. එසමයෙහි සැමියා මළ මනා රූ ඇති දකුම්කලු වූ ප්‍රසාද එළවන්නාවූ එක්තරා ස්ත්‍රියක් වෙයි. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙමේ පෙරවරු හැඳ පොරොවා පාසිවුරු ගෙණ ඒ ස්ත්‍රියගේ නිවසට එළඹ පැණවූ අස්නෙහි හිඳගත්තේ ය.

2. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් උදායී වෙත එළඹ වැඳ එකත් පසෙක හිඳ ගත්තී ය. එකත්පසෙක හුන් ඒ ස්ත්‍රියට ආයුෂ්මත් උදායී තෙමේ දැහැමි කථාවෙන් දෙලෝවැඩ මනාකොට දක්වීය. කුශල-ධර්‍මයන්හි සමාදන් කරවීය. උත්සාහවත් කරවී ය. මැනවින් පැහැද වීය.

3. ඉක්බිති ආයුෂමත් උදායී විසින් දෙලෝවැඩ දක්වන ලද්දාවූ කුශල ධර්‍මයන්හි සමාදන් කරවන ලද්දාවූ උත්සාහවත් කරණ ලද්දාවූ මනා කොට පහදවන ලද්දාවූ ඒ ස්ත්‍රී ආයුෂමත් උදායීහට "වහන්ස, යමකින් ප්‍රයෝජන නම් එය මට කියනු මැනව. සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙය ආර්‍යයන් වහන්සේට දීමට සමත් වෙමි" යි කිවු ය. "නඟ, මේ සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර යන යමෙක් වේ ද, ඒ අපට දුලබ නො වෙයි. වැලි දු අපට යමක් දුලබ නම් එය දෙව" යි හේ කී ය. "වහන්ස, කිමැ" යි ඕ ඇසූ ය. "මෛථුන්දම" යි හේ කී ය. "වහන්ස, එයට කැමති ද?" යි ඕ ඇසූ ය. "නඟ, කැමැත්තෙමි" යි හේ කී ය. "වහන්ස, එනු මැනවැ" යි ලගිනාගෙට පිවිස සළුව මුදා ඇඳෙහි උඩුකුරු ව හොත්තී ය. ඉක්බිති ආයුෂමත් උදායී තෙමේ ඈය වෙත පැමිණ "කවරෙක් නම් මල වැහෙන දුගඳ මැය ආමර්‍ශනය කරන්නේ ද?" යි කෙළ ගසා ඉවත් ව ගියේ ය.

4. ඉක්බිති ඒ ස්ත්‍රිය අවමන් කරයි. අයුණු කියයි. දෙස් පතුරුවයි. මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ අලජ්ජීහු ය. දුශ්ශීලයෝ ය. මුසාවාදීහු ය. මොහු "තුමූ ධර්‍මචාරීහු ය යි සමාචාරීහු ය යි බ්‍රහ්මචාරීහුය යි සත්‍යවාදීහු ය යි සිල්-වත්හු ය යි කලණ දහම් ඇත්තෝ ය යි පිළිණ කෙරෙත්. මොවුන්ට මහණ-කමෙක් නැත. මොවුන්ට බමුණු කමෙක් නැත. මොවුන්ගේ මහණකම නටුයේ ය. මොවුන්ගේ බමුණුකම නටුයේ ය. මොවුන්ට මහණකමෙක් කොයින් ද? මොවුන්ට බමුණුකමෙක් කොයින් ද? මොහු මහණකමින් පහ වූවෝ ය. මොවුහු බමුණු කමින් පහ වූවෝ ය. කවර කරුණකින් උදායී මහණ තෙමේ ම මා මෛථුන්දමින් යැද "කවරෙක් මළ වැහෙන දුගඳ වූ මැය ආමර්‍ශනය කරන්නේ ද?" යි "කෙළ ගසා යන්නේ ද?" "මගේ කුමක් ලාමක ද? මගේ කුමක් දුගඳ ද? මම කිනම් ස්ත්‍රියකට කෙබඳු අලඞ්කාරයකින් පිරිහෙම් ද?" යි කිවු ය.

5. අනෙක් ස්ත්‍රීහු ද "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ අලජ්ජීහුය ... අයුණු කියත්. නුගුණ පතුරුවත්. කවරහෙයකින් උදායි මහණ තෙමේ මැයගෙන් තෙමේ ම මෛථුන්දම් යැද කවරෙක් මළ වගුරණ දුගඳ වූ මැය ආමර්‍ශනය කරන්නේ ද?යි කෙළ ගසා යන්නේ ද? මැගේ කුමක් ලාමක ද? මැගේ කුමක් දුගඳ ද? මෝ තොමෝ කිනම් ස්ත්‍රියකට කිනම් අලංකාරයකින් පිරිහේ ද?" යනු යි.

6. භික්ෂූහු අවමන් කරන්නාවූ අයුණු කියන්නාවූ නුගුණ පතුරුවන්නාවූ ඒ ස්ත්‍රීන්ගේ කථාව ඇසූහ. යම් අල්පේච්ඡ භික්ෂූහු වූවාහු ද ඔහු අවමන් කෙරෙත්. අයුණු කියත්. නුගුණ පතුරුවත්. "කවර-කරුණකින් ආයුෂමත් උදායි තෙමේ ස්ත්‍රියක ලඟ තමහට මෛථුන්දමින් මෙහෙ කිරීමෙහි අනුසස් කියන්නේ ද?"

7. අථ ඛො තෙ භික්ඛූ[1] භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං උදායිං පටිපුච්ඡි: "සච්චං කිර ත්වං උදායි මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසසී"ති. "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවියං මොඝපුරිස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසිස්සසි? නනු මයා මොඝපුරිස අනෙකපරියායෙන විරාගාය ධම්මො දෙසිතො නො සරාගාය -පෙ- කාමපරිළාහානං වූපසමො අක්ඛාතො. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසෙය්‍ය: එතදග්ගං භගිනි, පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍යාති මෙථුනුපසංහිතෙන, සඞ්ඝාදිසෙසො"ති.**

8. **යො පනාති** යො යාදිසො -පෙ-.

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූ'ති.

**ඔතිණ්ණො** නාම: සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො.

**විපරිණතන්ති** රත්තම්පි චිත්තං විපරිණතං. දුට්ඨම්පි චිත්තං විපරිණතං මූළ්හම්පි චිත්තං විපරිණතං. අපි ච රත්තං චිත්තං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතං විපරිණතන්ති.

**මාතුගාමො** නාම: මනුස්සිත්ථී. න යක්ඛී, න පෙතී, න තිරච්ඡානගතා, විඤ්ඤූ පටිබලා සුභාසිතදුබ්භාසිතා දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං.

**මාතුගාමස්ස සන්තිකෙ**'ති මාතුගාමස්ස සාමන්තා, මාතුගාමස්ස අවිදූරෙ.

**අත්තකාමන්ති** අත්තනො කාමං, අත්තනො හෙතුං, අත්තනො අධිප්පායං, අත්තනො පාරිචරියං,

**එතදග්ගන්ති** එතං අග්ගං එතං සෙට්ඨං එතං මොක්ඛං එතං උත්තමං එතං පවරං-

**යා**'ති ඛත්තියා[2] වා බ්‍රාහ්මණී වා වෙස්සී වා සුද්දී වා.

**මාදිසන්ති** ඛත්තියං වා බ්‍රාහ්මණං වා වෙස්සං වා සුද්දං වා.

1. අථ ඛො තෙ භික්ඛූ ආයස්මන්තං උදායිං අනෙකපරියායෙන විගරහිත්වා භගවතො, මජ්ඣං. 2. ඛත්තී. සී.මු.

7. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස්කරවා. "උදායි, තෝ ස්ත්‍රියක ලඟ තමහට මෙවුන්දම් සෙවුමෙහි අනුසස් කීයෙහි යනු සැබෑ ද?"යි ආයුෂ්මත් උදායින් විචාළසේක. "සැබව, භාග්‍යවතුන් වහන්ස" යි හේ කී ය. භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ. "හිස්පුරුෂය, නුසුදුස්සෙකි. අනුලොම් නොවූවෙකි. මහණකමට නොසුදුස්සෙකි. නො-කැපයෙකි. නොකටයුත්තකි. හිස් පුරුෂය, තෝ කෙසේ නම් මාගම ලඟ තමහට මෙවුන්දමින් මෙහෙ කිරීමෙහි අනුසස් කිවුයෙහි ද? හිස් පුරුෂය, මා විසින් නොයෙක් අයුරින් සරාගය පිණිස නොව විරාගය පිණිස දහම් දෙසන ලද්දේ නො වේ ද? ... කාමදාහයන් සංසිඳුවීම දෙසන ලද්දේ නො වේ ද? හිස් පුරුෂය, මෙය නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස නො වෙයි. ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් අත්තකාමපාරිචරියා රාගයට බවුයේ පෙරළී ගිය සිතින් මිනිස් මාගමක සමීපයෙහි යම් ස්ත්‍රියක් සිල්වත් වූ කලණ දහම් ඇති බඹසර ඇති මා වැන්නක්හු මේ මෙවුන්දමින් අභිරමනය කරවා නම් මෙය පාරිචරියාවන් අතුරෙන් අග්‍රයයි මෛථුනොපනිඃශ්‍රිත වචනයෙන් තමහට මෙවුන්දමින් මෙහෙ කිරීමෙහි අනුසස් කියා ද, ඒ මහණහට සඟවෙසෙස් ඇවැත් වේ."**

8. **යොපන** යනු යමෙක් යම්බඳුවෙක් ...

**භික්ඛු** යනු ... මේ අර්ථයෙහි මෙ තෙමේ භික්ෂු ය යි අභිමත යි.
**ඔතිණ්ණො** නම්: මොනවට ඇලුනේ බලාපොරොත්තු සහිතවූ
යේ පිළිබඳසිත් ඇත්තේ යි.

**විපරිණත** නම්: රාගයෙන් රත් වූ සිත ද විපරිණත ය, ද්වෙෂයෙන් දුෂ්ට වූ සිත ද විපරිණත ය, මෝහයෙන් මුළා සිත ද විපරිණතය. වැලිත් මේ අර්ථයෙහි රාගයෙන් රත් වූ සිත විපරිණතය යි අභිමත යි.

**මාතුගාම** නම්: මිනිස් මාගමකි. යක්ෂිනියක් නො වෙයි. ප්‍රේතියක් නො වෙයි. තිරිසන් ගත මාගමක් ද නො වෙයි. සුබැසි දුබැසි තුළුල් නොතුළුල් තෙපුල් දැන ගන්නට සමත් නුවණැත්තියකි.

**මාතුගාමස්ස සන්තිකෙ** යනු මාගම් වෙත, මාගම්හට නුදුරු තැන ය.

**අත්තකාමං** යනු තමාගේ කැමැත්ත, තමාගේ හේතුව, තමාගේ අදහස, තමා පිළිබඳ පාරිචර්යා ය.

**එතදග්ගං** යනු මෙය අග්‍ර ය, මෙය ශ්‍රෙෂ්ඨ ය, මෙය ප්‍රමුඛ ය, මෙය උත්තම ය, මෙය ප්‍රවර ය යන අර්ථ යි.

**යා** යනු **ක්ෂත්‍රිය** හෝ බ්‍රාහ්මණ හෝ වෛශ්‍ය හෝ ශූද්‍ර හෝ **ස්ත්‍රීයි.**

**මාදිසං** යනු කැතකු හෝ බමුණකු හෝ වෙළෙඳකු හෝ **සුදුරකු හෝ.**

**සීලවන්තන්ති** පාණාතිපාතා පටිවිරතං, අදින්නාදානා පටිවිරතං, මුසාවාදා පටිවිරතං.

**බ්‍රහ්මචාරින්ති** මෙථුනධම්මා පටිවිරතං.

**කල්‍යාණධම්මො** නාම: තෙන ච සීලෙන තෙන ච බ්‍රහ්මචරියෙන කල්‍යාණධම්මො හොති.

**එතෙන ධම්මෙනාති** මෙථුනධම්මෙන.

**පරිචරෙය්‍යාති** අභිරමෙය්‍ය.

**මෙථුනූපසංහිතෙනාති** මෙථුනධම්මපටිසංයුත්තෙන.

**සඞ්ඝාදිසෙසො**'ති -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසො'ති.

1. ඉත්ථී ච හොති, ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ඉත්ථියා සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

2. [ඉත්ථී ච හොති, වෙමතිකො -පෙ- පණ්ඩකසඤ්ඤී -පෙ- පුරිසසඤ්ඤී -පෙ- තිරච්ඡානගතසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං ඉත්ථියා සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති දුක්කටස්ස.

3. පණ්ඩකො ච හොති, පණ්ඩකසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං පණ්ඩකස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති ථුල්ලච්චයස්ස.

4. පණ්ඩකො ච හොති වෙමතිකො -පෙ- පුරිසසඤ්ඤී. -පෙ- තිරච්ඡානගතසඤ්ඤී. ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං පණ්ඩකස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති ආපත්ති දුක්කටස්ස.

5. පුරිසො ච හොති -පෙ- තිරච්ඡානගතො ච හොති, තිරච්ඡානගතසඤ්ඤී -පෙ- වෙමතිකො. -පෙ- ඉත්ථිසඤ්ඤී. -පෙ- පණ්ඩකසඤ්ඤී. -පෙ- පුරිසසඤ්ඤී සාරත්තො ච. භික්ඛු ච තං තිරච්ඡානගතස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති ආපත්ති දුක්කටස්ස.]*

6. ද්වෙ ඉත්ථියො, ද්වින්නං ඉත්ථීනං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච, භික්ඛු ච තං ද්වින්නං ඉත්ථීනං සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං -පෙ-.

7. ඉත්ථී ච පණ්ඩකො ච, උභින්නං ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච. භික්ඛු ච තං උභින්නං සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ-.

* [ ] ඉදමෙත්ථ අත්‍ථාරිතපාඨො සීමු. පොත්‍ථකෙ තාදිස්සන්ති.

**සීලවන්තං** යනු: පණිවායෙන් තොර වූ අයිනාදනින් තොර වූ මුසවායෙන් තොර වූ එකක්හු ය.

**බ්‍රහ්මචාරිං** යනු: මෙවුන්දමින් තොරවූවකු ය.

**කල්‍යාණධම්මං** නම්: ඒ සීලයෙන් ද ඒ බඹසරින් ද කලණදහම් ඇත්තෙක් වෙයි.

**එතෙන ධම්මෙන** යනු: මෙවුන්දමින් ය.

**පරිචරෙය්‍ය** යනු: අභිරමණය කෙරේ නම්.

**මෙථුනුපසංහිතෙන** යනු: මෙවුන්දම් පිළිබැඳි දහමින් ය.

**සඞ්ඝාදිසෙසො** යනු ... එයිනුදු සඞ්ඝාදිසෙස ය යි කියනු ලැබේ.

1. ස්ත්‍රියකුදු වෙයි, ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේ ත් ස්ත්‍රිය සමීපයෙහි තමහට මෙවුන්දමින් මෙහෙ කිරීමෙහි අනුසස් කියා ද සඟවෙසෙස්ඇවැත් වේ.

2. ස්ත්‍රියකුත් වේද, වෙමතිකත් වේද, ... පණ්ඩකය යන හැඟීම් ඇති ... පිරිමියක යන හැඟීම් ඇති ... තිරිසන් ගතයෙක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි. මහණ තෙමේ ඒ ස්ත්‍රිය සමීපයෙහි අත්ත-කාමපාරිචරියාවෙහි ගුණ කියා ද ථුල්ලැසිඇවැත් වේ.

3. පණ්ඩකයෙකුදු වෙයි, පණ්ඩකය යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේ ඒ පණ්ඩකයා සමීපයෙහි අත්තකාමපාරිචරියාවෙහි ගුණ කියයි ද ථුල්ලැසි ඇවැත් වේ.

4. පණ්ඩකයෙකුත් වෙයි ද, වෙමතිකත් වේ ද ... පිරිමියෙක යන හැඟීම් ඇති ... තිරිසන් ගතයෙක යන හැඟීම් ඇති ... ස්ත්‍රියක යන හැඟීම් ඇති සංරක්තයෙකුදු වෙයි, මහණ තෙමේත් ඒ පණ්ඩකයා සමීපයෙහි අත්තකාමපාරිචරියාවෙහි ගුණ කියා ද, දුකුළාඇවැත් වේ.

5. පිරිමියෙකුදු වෙයි, ... තිරිසන්ගතයෙක් වෙයි, තිරිසන්ගතයෙක යන හැඟීම් ඇත්තේ ... විමති ඇත්තේ, ... ස්ත්‍රිය යන හැඟීම් ඇත්තේ, ... පණ්ඩකයෙක යන හැඟීම් ඇත්තේ, ... පිරිමියෙක යන හැඟීම් ඇත්තේ සංරක්තත් වෙයි, මහණ තෙමේ ඒ තිරිසන්ගතයා සමීපයෙහි අත්තකාමපාරිචරියාවෙහි ගුණ කියා ද දුකුළාඇවැත් වේ.

6. ස්ත්‍රීහු දෙදෙනෙක් වෙත්, ස්ත්‍රීන් දෙදෙනා පිළිබඳව 'ස්ත්‍රිය' යන හැඟීම් ඇති සංරක්තයෙක් වෙයි, මහණ තෙමේ ඒ ස්ත්‍රීන් දෙදෙනා සමීපයෙහි අත්තකාමපාරිචරියාවෙහි ගුණ කියා ද, සඟවෙසෙස් දෙකෙකි....

7. ස්ත්‍රියකුදු වෙයි, පණ්ඩකයෙකුදු වෙයි, දෙදෙනා පිළිබඳ ව 'ස්ත්‍රිය' යන හැඟීම් ඇති සංරක්තයෙකුත් වෙයි, මහණ තෙමේත් ඒ දෙදෙනා සමීපයෙහි අත්තකාමපාරිචරියාවෙහි ගුණ කියයි ද, සඟවෙසෙස් හා දුකුළා-ඇවැත් වේ. ...

8. අනාපත්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛා-රෙන උපට්ඨහාති භණති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

## විනීතවත්ථු

**උද්දානගාථා.**

කථං වඤ්ඣා ලභෙ පුත්තං පියා ච සුභගා සියා,
කිං දජ්ජං කෙනුපට්ඨෙය්‍යං කථං ගච්ඡෙය්‍යං සුග්ගතින්ති.

1. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා වඤ්ඣා ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච: “කථාහං භන්තෙ විජායෙය්‍ය’’න්ති. “තෙන හි භගිනි අග්ගදානං දෙහී’’ති. “කිං භන්තෙ අග්ගදාන’’න්ති? “මෙථුනං ධම්ම’’න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදි-සෙස’’න්ති (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා විජායිනී ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච: “කථාහං භන්තෙ පුත්තං ලභෙය්‍ය’’න්ති. “තෙන හි භගිනි අග්ගදානං දෙහී’’ති. “කිං භන්තෙ අග්ගදාන?’’න්ති. “මෙථුනං ධම්ම’’න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදි-සෙස’’න්ති. (2)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී කුලූපගං භික්ඛුං එතද-වොච: “කථාහං භන්තෙ සාමිකස්ස පියා අස්ස’’න්ති. “තෙන හි භගිනි අග්ගදානං දෙහී’’ති. “කිං භන්තෙ අග්ගදාන?’’න්ති. “මෙථුනං ධම්ම’’න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස’’න්ති. (3)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච: “කථාහං භන්තෙ සුභගා අස්ස?’’න්ති. “තෙන හි භගිනි අග්ගදානං දෙහී’’ති. “කිං භන්තෙ අග්ගදාන?’’න්ති. “මෙථුනං ධම්ම’’න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස’’න්ති. (4)

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී කුලූපගං භික්ඛුං එතද-වොච: “ක්‍යාහං භන්තෙ අය්‍යස්ස දජ්ජාමී?’’ති. “අග්ගදානං භගිනී’’ති. “කිං භන්තෙ අග්ගදාන?’’න්ති. “මෙථුනං ධම්ම’’න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස’’න්ති. (5)

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී කුලූපගං භික්ඛුං එතද වොච: “කෙනාහං භන්තෙ අය්‍යං උපට්ඨෙමී?’’ති. “අග්ගදානෙන භගිනී’’ති. කිං භන්තෙ අග්ගදාන?’’න්ති. “මෙථුනං ධම්ම’’න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- “ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස’’න්ති. (6)

8. "සිවුරු පිඬු සෙනසුන් ගිලන්පස බෙහෙත් යන පිරිකරින් උවටැන් කරව" යි කියයි ද, (ඔහුට ද,) උන්මත්තකයාට ද, ආදිකම්මිකයාට ද, ඇවැත් නො වේ.

## විනීතවත්‍ථු

**උද්දානගාථා:**

කථංවඤ්ඣාවත්‍ථු, පුත්තවත්‍ථු, පියාවත්‍ථු, සුභගාවත්‍ථු, කිංදජ්ජාවත්‍ථු, කෙනුපට්ඨෙය්‍යවත්‍ථු, සුගතිං කථං ගවෙජය්‍ය වත්‍ථු යි වස්තු සතෙකි:

1. එසමයෙහි එක්තරු වඳගැහැණියක් කුලූපග මහණකුට "වහන්ස, මම් කෙසේ නම් වදන්නෙම් ද?"යි මෙය කිවුය. "නඟ, එසේ නම් අග්‍රදානය දෙව" යි හේ කී ය. "වහන්ස, අග්‍රදානය යනු කිමැ?" යි ඕ පුළුවුත. "මෙවුන්දමැ"යි හේ කී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ තෝ සඟවෙසෙස්ඇවැත් අවන්නෙහි ය" යි වදාළසේක. (1)

2. එසමයෙහි එක්තරු වදන ගැහැණියක් කුලූපග මහණකුට වහන්ස, "කෙසේ නම් පුතකු ලබන්නෙම් දැ?"යි කිවු ය. "නඟ, එසේ නම් අග්‍රදානය දෙව" යි කී ය. "වහන්ස, අග්‍රදාන නම් කිමැ?"යි ඕ පුළුවන. "මෙවුන්දමැ"යි හේ කීය. ... ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස් ඇවැත් අවන්නෙහි ය"යි වදාළ සේක. (2)

3. එසමයෙහි එක්තරු ගැහැණියක් කුලූපග මහණකුට "වහන්ස, කෙසේ නම් මම් හිමියාට ප්‍රිය වන්නෙම් දැ?" විචාළා ය. එසේ නම් "අග්‍රදානය දෙව"යි හේ කී ය. "වහන්ස, අග්‍රදානය නම් කිමැ?"යි ඕ පුළුවුත. "මෙවුන්දමැ"යි හේ කී ය. ... ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස්-ඇවැත් අවන්නෙහි" ය යි වදාළ සේක. (3)

4. එසමයෙහි එක්තරු ගැහැණියක් කුලූපග මහණකුට "වහන්ස, මම් කෙසේ නම් ඉසුරුමතියක් වන්නෙම දැ?" යි පුළුවුත. "එසේ නම් "අග්‍රදානය දෙව"යි හේ කී ය. "වහන්ස, අග්‍රදානය නම් කිමැ?" යි ඕ පුළුවුත. "මෙවුන්දම ය" යි හේ කී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස් ඇවැත් අවන්නෙහි ය" යි වදාළසේක. (4)

5. එසමයෙහි එක්තරු ගැහැණියක් කුලූපග මහණකුට "වහන්ස, මම් ආර්‍ය්‍යයන් වහන්සේට කුමක් දෙන්නෙම් දැ?" යි විචාළා ය. "නඟ, අග්‍ර දානය" යි හේ කී ය. "වහන්ස, අග්‍රදානය යනු කිමැ?" යි ඕ පුළුවුත. "මෙවුන්දමැ" යි හේ කී ය. ඒ මහණහට කුකුස් විය. ... "මහණ, තෝ සඟවෙසෙස්-අවැත් අවන්නෙහි ය"යි වදාළසේක. (5)

6. එසමයෙහි එක්තරු ගැහැණියක් කුලූපග මහණකුට "වහන්ස, මම් කිමෙකින් ආර්‍ය්‍යයන් වහන්සේට උපස්ථාන කෙරෙම් දැ?" යි විචාළා ය. "නඟ අග්‍රදානයෙනි"යි හේ කී ය. "වහන්ස, අග්‍රදානය යනු කිමැ?" යි ඕ පුළුවුත. "මෙවුන්දමැ" යි හේ කීය. ... ඒ මහණහට කුකුස් විය. "මහණ, තෝ සඟවෙසෙස් ඇවැත් අවන්නෙහි ය" යි වදාළසේක. (6)

7. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී කුලූපගං භික්ඛුං එතදවොච: "කථාහං භන්තෙ සුගතිං ගච්ඡෙය්‍ය?"න්ති. "තෙන හි භගිනි අග්ගදානං දෙහී"ති. "කිං භන්තෙ අග්ගදාන?"න්ති. "මෙථුනං ධම්ම"න්ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "ආපත්තිං ත්වං භික්ඛු ආපන්නො සඞ්ඝාදිසෙස"න්ති. (7)

**අත්තකාමපාරිචරියසික්ඛාපදං නිට්ඨිතං.**

## 3. 5.

## සඤ්චරිත්තසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **උදායී** සාවත්ථියං කුලූපගො හොති, බහුකානි කුලානි උපසඞ්කමති, යත්ථ පස්සති කුමාරකං වා අපජාපතිකං, කුමාරිකං වා අපතිකං, කුමාරකස්ස මාතාපිතූනං සන්තිකෙ කුමාරිකාය වණ්ණං භණති: "අමුකස්ස කුලස්ස කුමාරිකා අභිරූපා දස්සනීයා පාසාදිකා පණ්ඩිතා බ්‍යත්තා මෙධාවිනී දක්ඛා අනලසා. ඡන්නා සා කුමාරිකා ඉමස්ස කුමාරකස්සා"ති. තෙ එවං වදෙන්ති: "එතෙ ඛො භන්තෙ අම්හෙ න ජානන්ති "කෙ වා ඉමෙ කස්ස වා"ති. සචෙ භන්තෙ අය්‍යො දාපෙය්‍ය ආනෙය්‍යාම මයං තං කුමාරිකං ඉමස්ස කුමාරකස්සා"ති. කුමාරිකාය මාතාපිතූනං සන්තිකෙ කුමාරකස්ස වණ්ණං භණති: "අමුකස්ස කුලස්ස කුමාරකො අභිරූපො දස්සනීයො පාසාදිකො පණ්ඩිතො බ්‍යත්තො මෙධාවී දක්ඛො අනලසො. ඡන්නායං[1] කුමාරිකා තස්ස කුමාරකස්සා"ති. තෙ එවං වදෙන්ති: එතෙ ඛො භන්තෙ අම්හෙ න ජානන්ති: 'කෙ වා ඉමෙ කස්සවා'ති. කිස්මිං විය කුමාරිකාය වත්තුං. සචෙ භන්තෙ අය්‍යො යාචාපෙය්‍ය දදෙය්‍යාම මයං ඉමං කුමාරිකං තස්ස කුමාරකස්සා"ති. එතෙනෙව උපායෙන ආවාහානි'පි කාරාපෙති. විවාහානි'පි කාරාපෙති. වාරෙය්‍යානි'පි වත්තාපෙති.

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්සා පුරාණගණකියා ධීතා අභිරූපා හොති දස්සනීයා පාසාදිකා. තිරොගාමකා ආජීවකසාවකා ආගන්ත්වා තං ගණකිං එතදවොචුං: "දෙහය්‍යෙ ඉමං කුමාරිකං අම්හාකං කුමාරකස්සා"ති. සා එවමාහ: "අහං ඛ්වය්‍යා[2] තුම්හෙ න ජානාමි "කෙ වා ඉමෙ කස්ස වා"ති. අයඤ්ච මෙ එකධීතිකා. තිරොගාමො ච ගන්තබ්බො, "නාහං දස්සාමී"ති. මනුස්සා තෙ ආජීවකසාවකෙ එතදවොචුං: "කිස්ස තුම්හෙ අය්‍යා ආගතත්ථා"ති. "ඉධ මයං අය්‍යා අමුකං නාම ගණකිං ධීතරං යාචිම්හ අම්හාකං කුමාරකස්ස, සා එවමාහ: "අහං ඛ්වය්‍යා තුම්හෙ න ජානාමි "කෙ වා ඉමෙ කස්ස වා"ති. අයඤ්ච මෙ එකධීතිකා තිරොගාමො ච ගන්තබ්බො, නාහං දස්සාමී"ති. "කිස්ස තුම්හෙ අය්‍යා තං ගණකිං ධීතරං යාචිත්ථ? නනු අය්‍යො උදායී වත්තබ්බො? අය්‍යො උදායී දාපෙස්සතී"ති. අථ ඛො තෙ ආජීවකසාවකා යෙනායස්මා උදායී, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොචුං: "ඉධ මයං භන්තෙ අමුකං නාම ගණකිං ධීතරං යාචිම්හ අම්හාකං කුමාරකස්ස. සා එවමාහ: අහං ඛ්වය්‍යා තුම්හෙ න ජානාමි කෙ වා ඉමෙ කස්ස වා'ති. අයඤ්ච මෙ එකධීතිකා තිරොගාමො ච ගන්තබ්බො, නාහං දස්සාමී'ති. සාධු භන්තෙ අය්‍යො තං ගණකිං ධීතරං දාපෙතු අම්හාකං කුමාරකස්සා"ති.

---

1. ඡන්නො සො කුමාරකො ඉමිස්සා කුමාරිකායාති, සයා.
2. ඛ්වෙය්‍යා, සිමු, ම.ඡ.සං.

7. එසමයෙහි එක්තරා ගැහැණියක් කුලූපග මහණකුට "වහන්ස, කෙසේ සුගතියට යන්නෙම් දැ?" යි කිවූ ය. "නඟ, එසේ නම් අග්‍රදානය දෙව" යි කීය. "වහන්ස, අග්‍රදාන යනු කිමැ?" යි ඕ විචාළා ය. "මෛථුන්දම,, යි කීය. ... ඒ මහණහට කුකුසෙක් විය. ... "මහණ' තෝ සඟවෙසෙස්-ඇවැත් අවන්නෙහිය" යි වදාළ සේක. (7)

අතත්කාමපාරිචරියශික්ෂාපදය නිමි.

## 3. 5.

## සඤ්චරිත්ත ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් නම් අනේපිඬුසිටුහුගේ අරම්හි වාසය කරණ සේක. එසමයෙහි ආයුෂ්මත් උදායී තෙමේ සැවැත්නුවර කුලූපග වෙයි. බොහෝ කුලයන් කරා පැමිණෙයි. යම් තැනෙක බිරියක නැති කුමරකු හෝ සැමියකු නැති කුමරියක හෝ දකී ද, කුමරුගේ මව්පියන් සමීපයේ දී, "අසෝ කුලයේ කුමරිය අභිරූප ය, දැකුම් කලු ය, ප්‍රසාද එළවන්නී ය, පණ්ඩිත ය, ව්‍යක්ත ය, නුවණැත්තී ය, දක්‍ෂ ය, අනලස ය. මේ කුමරුහට ඒ කුමරිය සුදුසු ය" යි ඇය ගුණ කියයි. 'වහන්ස, 'මොහු කවරහු ද? මොහු කා අයත් දැ? යි තුලූහු අප නො දනිත්. ඉදින් වහන්ස, ආර්‍ය්‍ය තෙමේ දෙවන්නේ නම් අපි ඒ කුමරිය මේ කුමරුට ගෙණ එන්නෙමු" යි ඔහු මෙසේ කියත්. "අසෝ කුලකුමාර තෙමේ අභිරූපය, දැකුම්කලු ය, ප්‍රසාද එළවන්නේ ය, පණ්ඩිත ය, ව්‍යක්ත ය, නුවණැත්තේ ය, දක්‍ෂය, අනලස ය. මේ කුමාරිකා තොමෝ ඒ කුමාරයාහට සුදුසු ය" යි කුමරියගේ මාපියන් සමීපයේ දී කුමරුගේ ගුණ කියයි. "වහන්ස, මොහු කවරහු ද? මොහු කා අයත් දැ?" යි තුලූහු අප නො දනිත්. වහන්ස, කුමරිය හෙතුකොට කීම අපට ලජ්ජා එළවන්නක් වැන්න. ඉදින් වහන්ස, ආර්‍ය්‍ය තෙමේ ඔවුන් ලවා යාචනා කරවා නම්, අපි මේ කුමරිය ඒ කුමරුට දෙන්නමු" යි ඔහු මෙසේ කියත්. ආයුෂ්මත් උදායී තෙම මේ උපායෙන් ම ආවාහයන් ද කරවයි. විවාහයන් ද කරවයි. දින නකත් ආදිය ද ගිවිස්වා තබයි.

2. එසමයෙහි එක්තරා හිමි නැති ගණිකියකගේ දුවක් අභිරූප ය. දැකුම් කලු ය. ප්‍රසාද එළවන්නී ය. අන් ගමෙක වසන ආජීවකසව්වෝ පැමිණ ඒ ගණික බිරියට "ආර්‍ය්‍යාවෙනි, මේ කුමරිය අපගේ කුමරුට දෙව" යි මෙබස් කීහ. "ආර්‍ය්‍යයෙනි, මොහු කවුරු ද? කා අයත් දැ?" යි මම් තොප නො හඳුනමි. මෝ ද මාගේ එක ම දුව ය. බැහැරගම් ද යා යුතු ය. මම නො දෙන්නෙමි" යි ඕ මෙසේ කිවූ ය. මිනිස්සු ආජීවක ශ්‍රාවකයන්ට "ආර්‍ය්‍යයෙනි, තෙපි කුමක් හෙයින් ආවහු දැ?" යි මෙය කීහ. "ආර්‍ය්‍යයෙනි, මෙහි අපි අසෝ ගණිකියගෙන් අපගේ කුමරුට ඇය දුව යැදීමූ. ඕ ද "ආර්‍ය්‍යයෙනි, මම් මොහු කවුරු දැ යි කියා හෝ මොහු කාගේ දැ?" යි කියා හෝ නො දනිමි. මෝ ද මගේ එක ම දුව ය. බැහැරගම් ද යා යුතු ය. මම් ඇය නො දෙමි" යි කීවා ය යි ඔහු කීහ. "ආර්‍ය්‍යයෙනි, තෙපි කුමක් හෙයින් ඒ ගණිකියගෙන් ඇය යැදූහු ද? ආර්‍ය්‍ය උදායී තෙමේ කිය යුතු නො වේ ද? ආර්‍ය්‍ය වූ උදායී තෙමේ දෙවන්නේ ය" යි ඔහු කීහ. ඉක්බිති ආජීවක ශ්‍රාවකයෝ ආයුෂ්මත් උදායී තෙර කරා එළඹියාහු ය. එළඹ, අයුෂ්මත් උදායීහට, "වහන්ස, මෙහි අපි අසෝ ගණිකියගෙන් අපගේ කුමාරයාහට දුව යැදූමූ. ඕ 'ආර්‍ය්‍යයෙනි මොහු කාගේ කවුරු දැ? යි මම තොප නො හඳුනමි. මෝ ද මගේ එක ම දුව ය. බැහැරගම් ද යා යුතුය. මම් ඇය නො දෙමි'යි කීවා ය. වහන්ස, ආර්‍ය්‍ය තෙමේ ඒ ගණිකියගේ දුව අපගේ කුමරුට දෙවන්නේ නම් මැනවැ" යි කීහ.

3. අථ ඛො ආයස්මා උදායී යෙන සා ගණකී, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං ගණකිං එතදවොච: “කිස්සිමෙසං ධිතරං න දෙසී?”ති. “අහං ඛ්වය්‍ය ඉමෙ න ජානාමි ‘කෙ වා ඉමෙ කස්ස වා’ති. අයඤ්ච මෙ එකධීතිකා, තිරොගාමො ච ගන්තබ්බො, නාහං දස්සාමී”ති. “දෙහිමෙසං, අහං ඉමෙ ජානාමී”ති “සචෙ භන්තෙ අය්‍යො ජානාති, දස්සාමී”ති. අථ ඛො සා ගණකී තෙසං ආජීවකසාවකානං ධිතරං අදාසි. අථ ඛො තෙ ආජීවකසාවකා තං කුමාරිකං නෙත්වා මාසංයෙව සුණිසාභොගෙන භුඤ්ජිංසු. තතො අපරෙන දසිභොගෙන භුඤ්ජන්ති. අථ ඛො සා කුමාරිකා මාතුයා සන්තිකෙ දූතං පාහෙසි: “අහං හි දුග්ගතා දුක්ඛිතා න සුඛං ලභාමි. මාසං යෙව මං සුණිසාභොගෙන භුඤ්ජිංසු. තතො අපරෙන දසිභොගෙන භුඤ්ජන්ති. ආගච්ඡතු මෙ මාතා මං නෙස්සතූ”ති.

4. අථ ඛො සා ගණකී යෙන තෙ ආජීවකසාවකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ ආජීවකසාවකෙ එතදවොච: “මාය්‍යා ඉමං කුමාරිකං දසිභොගෙන භුඤ්ජිත්ථ, සුණිසාභොගෙන ඉමං කුමාරිකං භුඤ්ජථා”ති. තෙ එවමාහංසු “නත්ථම්හාකං තයා සද්ධිං ආහාරූපහාරො, සමණෙන සද්ධිං අම්හාකං ආහාරූපහාරො, ගච්ඡ ත්වං, න මයං තං ජානාමා”ති. අථ ඛො සා ගණකී තෙහි ආජීවකසාවකෙහි අපසාදිතා පුනදෙව සාවත්ථිං පච්චාගඤ්ඡි. දුතියම්පි ඛො සා කුමාරිකා මාතුයා සන්තිකෙ දූතං පාහෙසි: “අහං හි දුග්ගතා දුක්ඛිතා, න සුඛං ලභාමි. මාසංයෙව මං සුණිසාභොගෙන භුඤ්ජිංසු. තතො අපරෙන දසිභොගෙන භුඤ්ජන්ති. ආගච්ඡතු මෙ මාතා. මං නෙස්සතූ”ති.

5. අථ ඛො සා ගණකී යෙනායස්මා උදායී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොච: “සා කිර භන්තෙ කුමාරිකා දුග්ගතා දුක්ඛිතා න සුඛං ලභති. මාසංයෙව නං සුණිසාභොගෙන භුඤ්ජිංසු. තතො අපරෙන දසිභොගෙන භුඤ්ජන්ති. වදෙය්‍යාථ භන්තෙ: “මාය්‍යා ඉමං කුමාරිකං දසිභොගෙන භුඤ්ජිත්ථ. සුණිසාභොගෙන ඉමං කුමාරිකං භුඤ්ජථා”ති. අථ ඛො ආයස්මා උදායී යෙන තෙ ආජීවකසාවකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ ආජීවකසාවකෙ එතදවොච: මාය්‍යා ඉමං කුමාරිකං දසිභොගෙන භුඤ්ජිත්ථ සුණිසාභොගෙන ඉමං කුමාරිකං භුඤ්ජථා”ති. තෙ එවමාහංසු: “නත්ථම්හාකං තයා සද්ධිං ආහාරූපහාරො, ගණකියා සද්ධිං අම්හාකං ආහාරූපහාරො. සමණෙන භවිතබ්බං අබ්‍යාවටෙන. සමණො අස්ස සුසමණො. ගච්ඡ ත්වං. න මයං තං ජානාමා”ති. අථ ඛො ආයස්මා උදායී තෙහි ආජීවකසාවකෙහි අපසාදිතො පුනදෙව සාවත්ථිං පච්චාගඤ්ඡි. තතියම්පි ඛො සා කුමාරිකා මාතුයා සන්තිකෙ දූතං පාහෙසි: “අහං හි දුග්ගතා දුක්ඛිතා, න සුඛං ලභාමි. මාසංයෙව මං සුණිසාභොගෙන භුඤ්ජිංසු. තතො අපරෙන දසිභොගෙන භුඤ්ජන්ති. ආගච්ඡතු මෙ මාතා මං නෙස්සතූ”ති.

6. දුතියම්පි ඛො සා ගණකී යෙනායස්මා උදායී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොච: සා කිර භන්තෙ කුමාරිකා දුග්ගතා දුක්ඛිතා. න සුඛං ලභති. මාසංයෙව නං සුණිසාභොගෙන භුඤ්ජිංසු. තතො අපරෙන දසිභොගෙන භුඤ්ජන්ති. වදෙය්‍යාථ භන්තෙ: “මාය්‍යා ඉමං කුමාරිකං දසිභොගෙන භුඤ්ජිත්ථ. සුණිසාභොගෙන ඉමං කුමාරිකං භුඤ්ජථා”ති. පඨමං පාහං තෙහි ආජීවකසාවකෙහි අපසාදිතො. ත්වං ගච්ඡ නාහං ගමිස්සාමීති.

3. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙමේ ඒ ගණකිය වෙත පැමිණ ඒ ගණකියට "කුමක් හෙයින් මොවුන්ට දුව නො දෙයි ද?" යි කී ය. "ආර්‍ය්‍යයන් වහන්ස, මොහු කාගේ කවුරු දැ" යි මොවුන් නො හඳුනමි. මෝ ද මාගේ එක ම දුව ය. මම ඈය නො දෙන්නෙමි බැහැරගම්ද යායුතු ය යි ඕ කිවූ ය. "මොවුන්ට දෙව, මම මොවුන් හඳුනමි" යි ආයුෂ්මත් උදායීතෙර කී ය. "ඉදින් වහන්ස, ආර්‍ය්‍යයන් වහන්සේ හඳුනත් නම් දෙන්නෙමි" යි ඕ කිවූ ය. ඉක්බිති ඒ ගණකී ඒ ආජීවක සව්වන්ට සිය දුව දුන්නී ය. ඉක්බිති ඒ ආජීවක සව්වෝ ඒ කුමරිය කැඳවා ගෙණ ගොස් මසක් ම ලෙහෙළියකු කොට පරිභෝග කළාහු ය. ඉන්පසු දාසියක කොට පරිහරණය කෙරෙති. ඉක්බිති ඒ කුමාරිකා තොමෝ, "මම දූන් දුගී වෙමි. දුප්පත්මි. සැපයක් නො ලබමි. මසක් ම මා ලෙහෙළියක කොට පරිභෝග කළහ. ඉන්පසු දාසියක මෙන් පරිහරණය කෙරෙති. මගේ මව් තොමෝ මෙහි ඒවා. මා ගෙණ යේවා" යි මවු වෙතට දූතයකු යැවූවා ය.

4. ඉක්බිති ඒ ගණකී තොමෝ ඒ අජීවක සව්වන් කරා එළඹියා ය. එළඹ ඔවුන්ට "ආර්‍ය්‍යයෙනි, මේ කුමරිය දාසියක කොට පරිහරණය නො කරව. ලෙහෙළියක කොට මේ කුමරිය පරිහරණය කරව"යි කිවූය. ඔහු "තී හා අපගේ ගණුදෙනුවෙක් නැත. අපගේ ගණු දෙනුව මහණහු සමග ය. තෝ යව. අපි තී නො දනිමූ"යි කීහ. ඉක්බිති ඒ ගණකී තොමෝ ආජීවක සව්වන් විසින් ගරහන ලද්දී නැවත සැවැතට පෙරළා පැමිණියා ය. දෙවෙනි වර ද ඒ කුමරි "මම දුගීයෙමි. දුප්පත්මි. සැපයක් නො ලබමි. මසක් පමණ මා ලෙහෙළියක කොට පරිහරණය කළහ. එතැන් පටන් දාසියක්කොට පරිහරණය කරත්. මගේ මවු තොමෝ මෙහි ඒවා. මා කැඳවා ගෙණ යේවා"යි මවගේ සමීපයට දූතයකු යැවූ ය.

5. ඉක්බිති ඒ ගණකී තොමෝ ආයුෂ්මත් උදායීතෙර කරා පැමිණියා ය. පැමිණ, ආයුෂමත් උදායීහට "වහන්ස, ඒ කුමරිය දුගී ල, දුප්පත් ල, සුවයක් නො ලබා ල. මසක් ම ලෙහෙළියක කොට පරිහරණය කළාහු ල. එතැන් පටන් දාසියක කොට පරිහරණය කරත් ල. වහන්ස,ආර්‍ය්‍යයෙනි, මේ කුමරිය දාසියක කොට පරිහරණය නොකරවු ලෙහෙළියක කොට පරිහරණය කරවු'යි කියනු මැනවැයි කී ය. ඉක්බිති ආයුෂමත් උදායී තෙමේ ඒ ආජීවක සව්වන් කරා ගියේ ය ගොස්, ඒ ආජීවක ශ්‍රාවකයන්ට "ආර්‍ය්‍යයෙනි, මේ කුමරිය දාසියක කොට පරිහරණය නො කරවු. ලෙහෙළියක කොට මැය පරිහරණය කරවු"යි කී ය. "මුඹ හා අපගේ ගණුදෙනුවෙක් නැත. අපගේ ගණුදෙනුව ගණකිය හා ය. ශ්‍රමණයා ව්‍යාපාර නැත්තකු විය යුතු යි. ශ්‍රමණයෙක් නම් මනා ශ්‍රමණයෙක් වන්නේය. මුඹ යන්න. අපි මුඹ නො දනිමූ"යි ඔහු කීහ. ඉක්බිති ආයුෂමත් උදායී තෙමේ ආජීවක ශ්‍රාවකයන් විසින් ගරහන ලද්දේ සැවතට ම පෙරළා ආයේ ය. තුන්වන වර ද ඒ කුමරි මවු සමීපයට "මම දුගීයෙමි. දුප්පත් වෙමි. සුවයක් නො ලබමි. මසක් ම මා ලෙහෙළියක කොට පරිහරණය කළහ. එතැන් පටන් දාසියක කොට පරිහරණය කරත්. මගේ මව මෙහි ඒවා. මා කැඳවා ගෙණ යේවා'යි දූතයකු යැවූ ය.

6. දෙවෙනි වර ද ඒ ගණකී ආයුෂමත් උදායීතෙර කරා ගියා ය. ගොස් ආයුෂමත් උදායීහට වහන්ස, ඒ කුමරී දුගී ල. දුප්පත් ය. සුවයක් නො ලබා ල. මසක් ම ඈය ලෙහෙළියක කොට පරිහරණය කළාහු ල. එතැන් පටන් දාසියක මෙන් පරිහරණය කරත් ල. වහන්ස, 'ආර්‍ය්‍යයෙනි, මේ කුමරිය දාසියක කොට පරිහරණය නො කර මූ. ලෙහෙළියක කොට පරිහරණය කරවු"යි කියන්නැ යි සැළ කළා ය. "පළමු වර මම ඒ ආජීවක ශ්‍රාවකයන් විසින් ගරහන ලද්දෙම් වෙමි. තෝ යව මම් නො යන්නෙමි"යි ආයුෂමත් උදායී කී ය.

7. අථ ඛො සා ගණකී උජ්ඣායති ඛීයති විපාචෙති: "එවං දුග්ගතො හොතු අය්‍යො උදායී, එවං දුක්ඛිතො හොතු අය්‍යො උදායී, එවං මා සුඛං ලභතු අය්‍යො උදායී, යථා මෙ කුමාරිකා දුග්ගතා දුක්ඛිතා න සුඛං ලභති, පාපිකාය සස්සුයා පාපකෙන සසුරෙන පාපකෙන සාමිකෙනා"ති. සා'පි ඛො කුමාරිකා උජ්ඣායති ඛීයති විපාචෙති: "එවං දුග්ගතො හොතු අය්‍යො උදායී, එවං දුක්ඛිතො හොතු අය්‍යො උදායී, එවං මා සුඛං ලභතු අය්‍යො උදායී, යථාහං දුග්ගතා දුක්ඛිතා න සුඛං ලභාමි පාපිකාය සස්සුයා පාපකෙන සසුරෙන පාපකෙන සාමිකෙනා"ති. අඤ්ඤාපි ඉත්ථියො අසන්තුට්ඨා සස්සූහි වා සසුරෙහි වා සාමිකෙහි වා, තා එවං ආයාචන්ති: "එවං දුග්ගතො හොතු අය්‍යො උදායී, එවං දුක්ඛිතො හොතු අය්‍යො උදායී, එවං මා සුඛං ලභතු අය්‍යො උදායී, යථා මයං දුග්ගතා දුක්ඛිතා න සුඛං ලභාම, පාපිකාහි සස්සූහි පාපකෙහි සසුරෙහි පාපකෙහි සාමිකෙහී"ති.

8. යා පන තා ඉත්ථියො සන්තුට්ඨා සස්සූහි වා සසුරෙහි වා සාමිකෙහි වා තා එවං ආයාචන්ති: "එවං සුඛිතො හොතු අය්‍යො උදායී, එවං සජ්ජිතො හොතු අය්‍යො උදායී, එවං සුඛමෙධතු අය්‍යො උදායී, යථා මයං සුඛිතා සජ්ජිතා සුඛමෙධාම භද්දිකාහි සස්සූහි භද්දකෙහි සසුරෙහි, භද්දකෙහි සාමිකෙහී"ති.

9. අස්සොසුං ඛො භික්ඛූ එකච්චානං ඉත්ථීනං ඔයාචන්තීනං එකච්චානං ඉත්ථීනං ආයාචන්තීනං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ආයස්මා උදායී සඤ්චරිත්තං සමාපජ්ජිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

10. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං උදායිං පටිපුච්ඡි:- "සච්චං කිර ත්වං උදායී සඤ්චරිත්තං සමාපජ්ජී"ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: "කථංහි නාම ත්වං මොඝපුරිස සඤ්චරිත්තං සමාපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං ජායත්තනෙ වා ජාරත්තනෙ වා, සඞ්ඝාදිසෙසොති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

**[මූලපඤ්ඤත්ති.]**

7. ඉක්බිති ඒ ගණිකා "යම්සේ මා කුමරි පාපි වූ නැන්දනියත් පාපි වූ මයිලනුවත් කරණ කොට ගෙණ, පාපි වූ සැමියා කරණ කොට ගෙණ දුගී වූවා ද, දුප්පත් වූවා ද, සුවයක් නො ලබා ද, ආයශ්මා උදායී ද එසේ ම දුගී වේවා, එසේ දුප්පත් වේවා, ආයශ්මා උදායී තෙමේ එසේ සුවයක් නො ලබාවා"යි අවමන් කෙරෙයි, අගුණ කියයි, නුගුණ පතුරුවයි. ඒ කුමරි ද "යම්සේ මම් ලාමක වූ නැන්දනියත් කරණ කොට ගෙණ, ලාමක වූ මයිලනුවත් කරණ කොට ගෙණ, ලාමක වූ හිමියා කරණ කොට ගෙණ දුගී වෙම්ද, දුක්පත් වෙම්ද, සුවයක් නො ලබම් ද, එසේ ම ආයශ්මා උදායී තෙමේ දුගී වේවා එසේ ම ආයශ්මා උදායී තෙමේ දුප්පත් වේවා එසේ ම ආයශ්මා උදායී තෙමේ සුවක් නො ලබාවා"යි අවමන් කෙරෙයි, අගුණ කියයි, නුගුණ පතුරුවයි(ආයුෂමත් උදායී තෙරුන්ගේ මෙහෙයීමෙන් පතිකූලයට ගිය) අන් ස්ත්‍රීහු ද නැන්දනියත් හෝ මයිලනුවත් හෝ සැමියන් හෝ සමග නොසතුටු වූවෝ "යම්සේ අපි පාපි වූ නැන්දනියත් පාපි වූ මයිලනුවත්, පාපි වූ සැමියන් කරණ කොට ගෙණ දුගී වූමු ද, දුප්පත් වූමු ද, සුවක් නො ලබමෝ ද, ආයශ්මා උදායීත් එසේ ම දුගී වේවා, ආයශ්මා උදායීත් එසේ ම දුප්පත් වේවා, ආයශ්මා උදායීත් එසේ ම සුවක් නො ලබවා"යි ප්‍රාර්ථනා කෙරෙත්.

8. යම් ස්ත්‍රී කෙනෙක් (උදායී තෙරහුගේ මෙහෙයීමෙන් පතිකූලයට ගියෝ) නැදිමයිලන් හා සැමියන් හා සතුටු වූවාහු ද, ඔහු "යම්සේ අපි භද්‍ර නැදිමයිලන්, භද්‍ර සැමියන් කරණ කොට ගෙණ සුවපත් වූවමෝ සැදුනමෝ සුවසේ වැඩෙමු ද, ආයශ්මා උදායී තෙමේ එසේ ම සුව පත් වේවා, ආයශ්මා උදායී තෙමේ එසේ ම සැදුනේ වේවා, ආයශ්මා උදායී තෙමේ එසේ ම සුවසේ වැඩේවා"යි මෙසේ ප්‍රාර්ථනා කෙරෙත්.

9. භික්ෂූහු නිගා කරන්නාවූ ඇතැම් ස්ත්‍රීන්ගේ කථා ද, සුව පතන්නා වූ ඇතැම් ස්ත්‍රීන්ගේ කථා ද ඇසූහ. යම් ඒ භික්ෂූහු අල්පේච්ඡ ද, ඔහු "කෙසේ නම් ආයුෂමත් උදායී තෙමේ (ස්ත්‍රීපුරුෂයන් අතර) සංචරණයට පැමිණේද"යි අවමන් කෙරෙත්, අගුණ කියත්, නුගුණ පතුරුවත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂු සඞ්ඝයා රැස් කරවා ආයුෂමත් උදායි අමතා, "උදායිය, තෝ ස්ත්‍රී පුරුෂයන් අතර සංචරණයට පැමිණියෙහි සැබෑද?"යි අසා වදාළ සේක. "සැබව භාග්‍යවතුන් වහන්සැ"යි ආයුෂමත් උදායී කී ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ වදාරණසේක්, "හිස් පුරුෂය, තෝ කෙසේ නම් ස්ත්‍රීපුරුෂයන් අතර සංචරණයට පැමිණියෙහි ද? හිස් පුරුෂය, මෙය නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ" යි ... ගැරැහූ සේක. "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:-

**"යම් මහණෙක් භායර්‍යාභාවයෙහි හෝවයි, මිථ්‍යාචාර භාවයෙහි හෝවයි, පුරුෂමතිය ස්ත්‍රියට හෝ ස්ත්‍රීමතිය පුරුෂයාහට හෝ ගෙණ එමින් සඤ්චරණභාවයට වදනේ නම් සඟවෙසෙස් වේ".**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ ශික්ෂාපදය පණවන ලද්දේ වෙයි.

**[මුල් පැණවීමයි.]**

11. තෙන ඛො පන සමයෙන සම්බහුලා ධුත්තා උය්‍යානෙ පරිචාරෙන්තා අඤ්ඤතරස්සා[1] වෙසියා සන්තිකෙ දූතං පාහෙසුං: "ආගච්ඡතු උය්‍යානෙ පරිචාරෙස්සාමා"ති. සා එවමාහ: "අහං ඛ්වය්‍යා[2] තුම්හෙ න ජානාමි 'කෙ වා ඉමෙ කස්ස වා'ති. අහඤ්චම්හි බහුභණ්ඩා, බහුපරික්ඛාරා, බහිනගරඤ්ච ගන්තබ්බං, නාහං ගමිස්සාමී"ති. අථ ඛො සො දූතො තෙසං ධුත්තානං එතමත්ථං ආරොචෙසි, එවං වුත්තෙ අඤ්ඤතරො පුරිසො තෙ ධුත්තෙ එතදවොච: "කිස්ස තුම්හෙ අය්‍යා තං වෙසිං යාචිත්ථ? නනු අය්‍යො උදායී වත්තබ්බො? අය්‍යො උදායී උය්‍යොජෙස්සතී"ති. එවං වුත්තෙ අඤ්ඤතරො උපාසකො තං පුරිසං එතදවොච: "මාය්‍යො එවං අවච, න කප්පති සමණානං සක්‍යපුත්තියානං එවරූපං කාතුං. නාය්‍යො උදායී එවං කරිස්සතී"ති. එවං වුත්තෙ, 'කරිස්සති න කරිස්සතී'ති අබ්භුතං අකංසු. අථ ඛො තෙ ධුත්තා යෙනායස්මා උදායී තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොචුං: "ඉධ මයං භන්තෙ උය්‍යානෙ පරිචාරෙන්තා අසුකාය නාම වෙසියා සන්තිකෙ දූතං පහිණිම්හ: "ආගච්ඡතු උය්‍යානෙ පරිචාරෙස්සාමා"ති සා එවමාහ:" "අහං ඛ්වය්‍යා තුම්හෙ න ජානාමි 'කෙ වා ඉමෙ කස්ස වා' ති, අහඤ්චම්හි බහුභණ්ඩා, බහුපරික්ඛාරා, බහිනගරඤ්ච ගන්තබ්බං, නාහං ගමිස්සාමී"ති. "සාධු භන්තෙ අය්‍යො තං වෙසිං උය්‍යොජෙතූ"ති.

12. අථ ඛො ආයස්මා උදායී යෙන සා වෙසී, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං වෙසිං එතදවොච: "කිස්ස මෙසං න ගච්ඡසී"ති. "අහං ඛ්වය්‍ය ඉමෙ න ජානාමි 'කෙ වා ඉමෙ කස්ස වා'ති. අහඤ්චම්හි බහුභණ්ඩා' බහුපරික්ඛාරා බහිනගරඤ්ච ගන්තබ්බං. නාහං ගමිස්සාමී"ති. "ගච්ඡිමෙසං අහං ඉමෙ ජානාමී"ති. සචෙ භන්තෙ අය්‍යො ජානාති, ගමිස්සාමී"ති. අථ ඛො තෙ ධුත්තා තං වෙසිං ආදාය උය්‍යානං අගමංසු. අථ ඛො සො උපාසකො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම අය්‍යො උදායී තඞ්ඛණිකං සඤ්චරිත්තං සමාපජ්ජිස්සතී"ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස උපාසකස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායී තං ඛණිකං සඤ්චරිත්තං සමාපජ්ජිස්සතී"ති, අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර ත්වං උදායී තං ඛණිකං සඤ්චරිත්තං සමාපජ්ජී"ති. "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම ත්වං මොඝපුරිස තඞ්ඛණිකං සඤ්චරිත්තං සමාපජ්ජිස්සසි. නෙ'තං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවං ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං, ජායත්තනෙ වා ජාරත්තනෙ වා, අන්තමසො තඞ්ඛණිකායපි, සඞ්ඝාදිසෙසො"ති.**

**[දුතියපඤ්ඤත්ති.]**

1. අඤ්ඤතරිස්සා. මජ්සං. 2. ඛ්වෙය්‍යා, සීමු. මජ්සං.

11. එසමයෙහි බොහෝ ස්ත්‍රීධූර්තයෝ උයනෙහි රමණය කරන්නාහු, "එව, උයනෙහි අභිරමණය කරන්නෙමු"යි එක්තරා වෙසඟනක සමීපයට දූතයකු යැවූහ. "ආර්‍ය්‍යයෙනි, මොහු කවුරුද, කාගේදැ?"යි මම තොප නො හඳුනමි. මම් බොහෝ බඩු ඇතියෙම් වෙමි. බොහෝ පිරිකර ඇතියෙමි. බැහැර නුවර යා යුතු ද වෙයි. මම නො යන්නෙමි"යි ඕ කිවු ය. ඉක්බිති ඒ දූත තෙමේ ඒ ධූර්තයන්ට මේ කාරණය කීය. මෙසේ කී කල්හි එක්තරා පුරුෂයෙක් ඒ ධූර්තයන්ට "ආර්‍ය්‍යයෙනි, තෙපි කුමක් හෙයින් වෙසඟන යැද්දහු ද? ආර්‍ය්‍ය වූ උදායී තෙමේ කිය යුතු නො වේ ද? ආර්‍ය්‍ය වූ උදායී තෙමේ ඇය යවන්නේ ය"යි කීය. මෙසේ කී කල්හි එක්තරා උවසුවෙක් ඒ පුරුෂයාට "ආර්‍ය්‍ය තෙමේ මෙසේ නො කියාවා, මෙබන්දක් කරන්නට ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයන්ට නොකැප ය. ආර්‍ය්‍ය වූ උදායී තෙමේ මෙසේ වූ දැයක් නො කරන්නේ ය"යි කීය. මෙසේ කී කල්හි "හෙතෙම එය කරන්නේය යි ද? නො කරන්නේය යිද"යි පරදු තැබූහ. ඉක්බිති ඒ ධූර්තයෝ ආයුෂ්මත් උදායිහු කරා ගියාහු ය. ගොස් ආයුෂ්මත් උදායිහට "වහන්ස, අපි මේ උයනෙහි අභිරමණය කරන්නමෝ 'එව, අභිරමණය කරන්නමු'යි අසෝ වෙසඟන වෙතට දූතයකු යැවූම්හ. 'මොහු කවුරුද? කා අයත් දැ'යි මම තොප නොහඳුනමි. මම ද බොහෝ බඩු ඇතියෙමි. බොහෝ පිරිකර ඇතියෙමි. බැහැර නුවර යා යුතු වේ. මම නො යන්නෙමි'යි ඕ කිවු ය, වහන්ස. හිමියන් ඒ වෙසඟන යවන්නේ මැනැවි'යි ඔහු කීහ.

12. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙමේ ඒ වෙසඟන කරා පැමිණියේය. පැමිණ ඒ වෙසඟනට "කුමක් හෙයින් මොවුන් සමීපයට නො යෙහි ද"යි ඇසී ය. ආර්‍ය්‍යයන් වහන්ස, මොහු කවුරුදැ යි කාගේ දැයි මම නො හඳුනමි. මම ද බොහෝ බඩු ඇතියෙමි. බොහෝ පිරිකර ඇතියෙමි. බැහැර නුවර යා යුතු ද වෙයි. මම නො යන්නෙමි"යි ඕ කිවු ය. "මොවුන් සමීපයට යව. මම මොවුන් හඳුනමි"යි උදායි තෙර කී ය. "වහන්ස, ඉදින් ආර්‍ය්‍ය තෙමේ දනී නම් යන්නෙමි"යි ඕ කිවු ය. ඉක්බිති ඒ ධූර්තයෝ ඒ වෙසඟන කැඳවා ගෙණ උයනට ගියාහුය. එකල්හි උවසු තෙමේ "කෙසේ නම් ආර්‍ය්‍ය වූ උදායි තෙමේ (ස්ත්‍රී පුරුෂයන් අතර) එකෙණෙහි සංවරණයට පැමිණේ දැ යි අවමන් කෙළේය, අයුණු කී ය. නුගුණ පැතිරැවී ය. භික්ෂූහු අවමන් කරණ, අයුණු කියන, නුගුණ පතුරුවන ඒ උවසුහුගේ කථාව ඇසූහ. අල්පේච්ඡ වූ ඒ භික්ෂූහු "කෙසේ නම් අයුෂ්මත් උදායි තෙමේ ස්ත්‍රී පුරුෂයන් අතර එකෙණෙහි සංවරණයට පැමිණේ දැ"යි අවමන් කළහ, අයුණු කීහ, නුගුණ පැතිරැවූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කළාහුය. ... "උදායිය, තෝ ස්ත්‍රී පුරුෂයන් අතර එකෙණෙහි සංවරණයට පැමිණියෙහි ය යනු සැබෑ ද"යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළසේක. "සැබව, භාග්‍යවතුන් වහන්ස"යි හේ කීය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූ සේක: ... "හිස් පුරුෂය, කෙසේ නම් ස්ත්‍රී පුරුෂයන් අතර එකෙණෙහි සංවරණයට පැමිණියෙහි ද, හිස් පුරුෂය, මෙය නොපහන්වූවන්ගේ පැහැදීම පිණිස නො වෙයි. ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවූ:

**"යම් මහණෙක් කායසංසර්ගභාවයෙහි වේවයි, මිථ්‍යාචාර භාවයෙහි වේවයි, පුරුෂමතිය ස්ත්‍රියට හෝ ස්ත්‍රීමතිය පුරුෂයාහට හෝ යටත්හි එමොහොත සෙවනා කැමැති මාගමකට හෝ ගෙණ එමින් සඤ්චරණභාවයට වදනේ නම් සඟවෙසෙස් වේ."**

**[ දෙවන පැණවිමයි. ]**

13. **යො පනා**ති යො යාදිසො -පෙ-

**භික්ඛූ**'ති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො 'භික්ඛූ'ති.

**සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍යා**ති ඉත්ථියා වා පහිතො පුරිසස්ස සන්තිකෙ ගච්ඡති. පුරිසෙන වා පහිතො ඉත්ථියා සන්තිකෙ ගච්ඡති.

**ඉත්ථියා වා පුරිසමති**න්ති පුරිසස්ස මතිං ඉත්ථියා වා ආරොචෙති.

**පුරිසස්ස වා ඉත්ථිමති**න්ති ඉත්ථියා මතිං පුරිසස්ස වා ආරොචෙති.

**ජායත්තනෙ වා**'ති ජායා භවිස්සසි.

**ජාරත්තනෙ වා**'ති ජාරී භවිස්සසි.

**අන්තමසො තං ඛණිකායපි**ති මුහුත්තිකා භවිස්සසි.

**සඞ්ඝාදිසෙසො**ති -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

14. දස ඉත්ථියො: මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මාතාපිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනිරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා, සාරක්ඛා, සපරිදණ්ඩා.

දස භරියායො: ධනක්කීතා, ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභතචුම්බටා, දාසී ච භරියා ච, කම්මකාරී ච භරියා ච, ධජාහටා, මුහුත්තිකා,

**මාතුරක්ඛිතා** නාම: මාතා රක්ඛති ගොපෙති ඉස්සරියං කරොති වසං වත්තෙති.

**පිතුරක්ඛිතා** නාම: පිතා රක්ඛති ගොපෙති ඉස්සරියං කාරෙති වසං වත්තෙති.

**මාතාපිතුරක්ඛිතා** නාම: මාතාපිතරො රක්ඛන්ති ගොපෙන්ති ඉස්සරියං කාරෙන්ති වසං වත්තෙන්ති.

**භාතුරක්ඛිතා** නාම: භාතා රක්ඛති ගොපෙති ඉස්සරියං කාරෙති වසං වත්තෙති.

**භගිනිරක්ඛිතා** නාම: භගිනි රක්ඛති ගොපෙති ඉස්සරියං කරොති වසං වත්තෙති.

**ඤාතිරක්ඛිතා** නාම: ඤාතකා රක්ඛන්ති ගොපෙන්ති ඉස්සරියං කාරෙන්ති වසං වත්තෙන්ති.

**ගොත්තරක්ඛිතා** නාම: සගොත්තා රක්ඛන්ති ගොපෙන්ති ඉස්සරියං කාරෙන්ති වසං වත්තෙන්ති.

13. **යො පන** යනු යමෙක් යම්බඳු වූවෙක් ...

**භික්ඛූ** යනු ... මේ තෙමේ මේ අර්ථයෙහි 'භික්ෂු'ය යි අභිප්‍රෙත ය.

**සංචරිත්තං සමාපජ්ජෙය්‍ය** යනු: ස්ත්‍රිය විසින් යවන ලද්දේ පුරුෂයා සමීපයට යේ ද, පුරුෂයා විසින් යවන ලද්දේ ස්ත්‍රියගේ සමීපයට යේද,

**ඉත්ථියා වා පුරිස මතිං** යනු: පුරුෂාගේ අදහස ස්ත්‍රියට හෝ කියයි ද,

**පුරිසස්ස වා ඉත්ථිමතිං** යනු: ස්ත්‍රියගේ අදහස පුරුෂයාට හෝ කියයි ද,

**ජායත්තනෙ වා** යනු: බිරිඳ වන්නෙහි ය යි...

**ජාරත්තනෙ වා** යනු: සොර අඹු වන්නෙහි ය යි...

**අන්තමසො තඞ්ඛණිකායපි** යනු: එ මොහොතෙහි අඹු වන්-නෙහිය යි

**සඞ්ඝාදිසෙසො** යනු ... එයිනුදු 'සඟවෙසෙස'යි කියනු ලැබේ.

14. ස්ත්‍රීහු දස දෙනෙකි; මාතුරක්ඛිතා ය, පිතුරක්ඛිතා ය, මාතාපිතු-රක්ඛිතා ය, භාතුරක්ඛිතා ය, භගිනිරක්ඛිතා ය, ඤාතිරක්ඛිතා ය, ගොත්ත-රක්ඛිතා ය, ධම්මරක්ඛිතා ය, සාරක්ඛා ය, සපරිදණ්ඩා ය යන මොහු යි.

භාර්‍ය්‍යාවෝ දස දෙනෙකි: ධනක්කීතා ය, ඡන්දවාසිනී ය, භොගවාසිනී ය, පටවාසිනී ය, ඔදපත්තකිනී ය, ඔභතචුම්බටා ය, දාසිභරියා ය, කම්මකාරී භරියා ය, ධජාහටා ය, මුහුත්තිකා ය, යන මොහු යි.

**මාතුරක්ඛිතා** නම්: මවු තොමෝ (යම් ස්ත්‍රියක) රකී ද, ගුප්තස්ථාන-යෙහි තබා රකියි ද සෙවර විහරණයට ඉඩ නො දෙයි ද තමා වශයෙහි පවත්වයි ද, (ඕ තොමෝ යි.)

**පිතුරක්ඛිතා නම්:** යම් මාගමක් පිය තෙමේ රකියි ද, ගෝපනය කෙරෙයි ද සෙවර විහරණයට ඉඩ නො දෙයිද, සිය වශයෙහි පවත්වයි ද, (ඕ තොමෝ යි)

**මාතාපිතුරක්ඛිතා** නම්: මවුපිය දෙදෙනා ම යම් ස්ත්‍රියක රකිත් ද, ගෝපනය කරත් ද, සෙවරිණීවන්නට ඉඩ නො දෙත් ද, වශයෙහි පවත්වත් ද (ඒ ස්ත්‍රී යි.)

**භාතුරක්ඛිතා නම්:** යම් ස්ත්‍රියක සොහොවුරු තෙමේ රකියි ද, ගෝපනය කෙරෙයි ද, සෙවරිණීවන්නට ඉඩ නො දෙයි ද, වශයෙහි පවත්වයි ද, (ඕ තොමෝ යි.)

**භගිනිරක්ඛිතා** නම්: යම් මාගමක බිහිනි තොමෝ රකියි ද, ගෝපනය කෙරෙයි ද, සෙවරිණීවන්නට ඉඩ නො දෙයි ද, වශයෙහි පවත්වයි ද, (ඕ තොමෝය.)

**ඤාතිරක්ඛිතා** නම්: යම් ස්ත්‍රියක නෑයෝ රකිත්ද, ගෝපනය කෙරෙත් ද, සෙවරිණී වන්නට ඉඩ නො දෙත් ද, වශයෙහි පවත්වත් ද (ඕ තොමෝ යි.)

**ගොත්තරක්ඛිතා** නම්: යම් මාගමක සමානගොත්‍රඇතියෝ රකිත් ද, ගෝපනය කෙරෙත් ද, සෙවරිණීවන්නට ඉඩ නොදෙත් ද, වශයෙහි පවත්වත් ද, (ඕ තොමෝ යි.)

**ධම්මරක්ඛිතා** නාම: සහධම්මිකා රක්ඛන්ති ගොපෙන්ති ඉස්සරියං කාරෙන්ති වසං වත්තෙන්ති.

**සාරක්ඛා** නාම: ගබ්භෙපි පරිග්ගහීතා හොති 'මය්හං එසා'ති, අන්තමසො මාලාගුණපරික්ඛිත්තාපි.

**සපරිදණ්ඩා** නාම: කෙහිචි දණ්ඩො ඨපිතො හොති 'යො ඉත්ථන්නාමං ඉත්ථිං ගච්ඡති එත්තකො දණ්ඩො'ති.

**ධනක්කීතා** නාම: ධනෙන කිණිත්වා වාසෙති.

**ඡන්දවාසිනී** නාම: පියො පියං වාසෙති.

**භොගවාසිනී** නාම: භොගං දත්වා වාසෙති.

**පටවාසිනී** නාම: පටං දත්වා වාසෙති.

**ඔදපත්තකිනී** නාම: උදපත්තං ආමසිත්වා වාසෙති.

**ඔභතචුම්බටා**[1] නාම: චුම්බටං ඔරොපෙත්වා වාසෙති.

**දාසී** නාම: දාසී චෙව හොති භරියා ච.

**කම්මකාරී** නාම: කම්මකාරී චෙව හොති භරියා ච.

**ධජාහටා** නාම: කරමරානීතා වුච්චති.

**මුහුත්තිකා** නාම: තඞ්ඛණිකා වුච්චති.

## නික්ඛෙපපදානි.

1. පුරිසො භික්ඛු පහිණාති[2]: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

2. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතං බ්‍රෑහි -පෙ- මාතාපිතුරක්ඛිතං බ්‍රෑහි -පෙ- භාතුරක්ඛිතං බ්‍රෑහි -පෙ- භගිනීරක්ඛිතං බ්‍රෑහි -පෙ- ඤාතිරක්ඛිතං බ්‍රෑහි -පෙ- ගොත්තරක්ඛිතං බ්‍රෑහි -පෙ- ධම්මරක්ඛිතං බ්‍රෑහි -පෙ- සාරක්ඛං බ්‍රෑහි -පෙ- සපරිදණ්ඩං බ්‍රෑහි -පෙ- හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

1. ඔභට මජසං, 2. පහිණති. මජසං,

**ධම්මරක්ඛිතා** නම්: යම් මාගමක සහදම්මියෝ රකිත් ද, ගෝපනය කෙරෙත් ද, සෙවරිණීවත්නට ඉඩ නො දෙත් ද, වශයෙහි පවත්වත් ද (ඕ තොමෝයි.)

**සාරක්ඛා** නම්: යම් මාගමක ගැබෙහි දී ම 'මෝ මට අයත්වන්නී ය'යි වෙන් කොට ගන්නා ලද්දියක් වෙයි ද, යටත් පිරිසෙයිත් මල්දමකින් පිරිකෙවු කරණ ලද්දී වෙයි ද, (ඕ තොමෝ යි.)

**සපරිදණ්ඩා** නම්: කිසිවකු විසින් "යමෙක් මෙනම් ස්ත්‍රිය කරා යේ නම් මෙ පමණ දඩ ය"යි යම් මාගමක ඇරැබ දඩ තබන ලද්දේ වෙයි ද (ඕ තොමෝ යි.)

**ධනක්කීතා** නම්: ධනයෙන් පෙරළා ගෙණ වාසය කරවයි ද (ඕ තොමෝ යි)

**ඡන්දවාසිනී** නම්: ප්‍රියයෙක් යම් ප්‍රියාවක වාසය කරවයි ද (ඕ තොමෝ යි.)

**භොගවාසිනී** නම්: යම් මාගමක භොග දී වාසය කරවයි ද (ඕ තොමෝ යි.)

**පටවාසිනී** නම්: යම් මාගමක පිළී දී වාසය කරවයි ද (ඕ තොමෝ යි.)

**ඔදපත්තකිනී** නම්: යම් මාගමක දිය බඳුනක අත එව (ඒ හා සමව) වාසය කරවයි ද (ඕ තොමෝ යි.)

**ඔභතචුම්බටා** නම්: යම් මාගමක සුඹුළුව පහකොට තමා වෙත වාසය කරවයි ද (ඕ තොමෝ යි.)

**දාසී** නම්: යමක් දාස්ස වූවා බිරිය ද වෙයි.

**කම්මකාරී** නම්: යම් මාගමක් මිනියක් වූවා බිරිය වෙයි ද (ඕ තොමෝ යි.)

**ධජාහටා** නම්: බලාත්කාරයෙන් ගෙණෙන ලද්දී කියනු ලැබේ.

**මුහුත්තිකා** නම්: එකෙණෙහි කැඳවා ගන්නා ලද ස්ත්‍රිය කියනු ලැබේ.

**නික්ෂෙපපදයෝ යි.**

1\. පුරුෂයෙක් මහණකු යවයි: "වහන්ස, යනු මැනව. මෙ නම් ඇති මාතුරක්ඛිතාවට මෙ නම් ඇත්තහුට මිලදී ගත් බිරිඳ වෙවයි කියව"යි පිළිගණියි ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

2\. පුරුෂයෙක් "වහන්ස, යනු මැනව. මෙ නම් ඇති පිතුරක්ඛිත ස්ත්‍රියට කියනු මැනව මාතාපිතුරක්ඛිත ස්ත්‍රියට කියනු මැනව" යි මහණකු යවයි ද, භාතුරක්ඛිත ස්ත්‍රියට කියව ... භගිනිරක්ඛිත ස්ත්‍රියට කියව ... ඤාතිරක්ඛිත ස්ත්‍රියට කියව ... ගොත්තරක්ඛිත ස්ත්‍රියට කියව ... ධම්මරක්ඛිත ස්ත්‍රියට කියව ... සාරක්ඛ ස්ත්‍රියට කියව ... සපරිදණ්ඩ ස්ත්‍රියට කියව ... 'මෙ නම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යාව වෙව' යි කියව ... පිළිගණියි ද විමසයි ද පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

3. පුරිසො භික්ඛුං පහිණාති:- “ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච පිතුරක්ඛිතඤ්ච බ්‍රූහි: “හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා”ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

4. පුරිසො භික්ඛුං පහිණාති: “ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච -පෙ- මාතුරක්ඛිතඤ්ච භාතුරක්ඛිතඤ්ච -පෙ- මාතුරක්ඛිතඤ්ච භගිනිරක්ඛිතඤ්ච -පෙ- මාතුරක්ඛිතං ච ඤාතිරක්ඛිතඤ්ච -පෙ- මාතුරක්ඛිතඤ්ච ගොත්තරක්ඛිතඤ්ච -පෙ- මාතුරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච -පෙ- මාතුරක්ඛිතඤ්ච සාරක්ඛඤ්ච -පෙ මාතුරක්ඛිතඤ්ච සපරිදණ්ඩඤ්ච බ්‍රූහි: හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා”ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**ඛණ්ඩචක්කං.**

5. පුරිසො භික්ඛුං පහිණාති: “ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච බ්‍රූහි: හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා”ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

6. පුරිසො භික්ඛුං පහිණාති: “ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතඤ්ච භාතුරක්ඛිතඤ්ච -පෙ- පිතුරක්ඛිතඤ්ච භගිනිරක්ඛිතඤ්ච -පෙ- පිතුරක්ඛිතඤ්ච ඤාතිරක්ඛිතඤ්ච -පෙ- පිතුරක්ඛිතඤ්ච ගොත්තරක්ඛිතඤ්ච -පෙ- පිතුරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච -පෙ- පිතුරක්ඛිතඤ්ච සාරක්ඛඤ්ච -පෙ- පිතුරක්ඛිතඤ්ච සපරිදණ්ඩඤ්ච බ්‍රූහි: “හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා”ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

7. පුරිසො භික්ඛුං පහිණාති:- “ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතඤ්ච මාතුරක්ඛිතඤ්ච බ්‍රූහි: හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා”ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**බද්ධචක්කං.**

**මූලං සඞ්ඛිත්තං.**

8. පුරිසො භික්ඛුං පහිණාති: “ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං සපරිදණ්ඩඤ්ච මාතුරක්ඛිතඤ්ච බ්‍රූහි: හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා”ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

9. පුරිසො භික්ඛුං පහිණාති: “ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං සපරිදණ්ඩඤ්ච පිතුරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච භාතුරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච භගිනිරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච ඤාතිරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච ගොත්තරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච ධම්මරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච සාරක්ඛඤ්ච බ්‍රූහි: හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා”ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**එකමූලකං නිට්ඨිතං.**

3. පුරුෂයෙක් "වහන්ස, යනු මැනව. මෙ තම් මාතුරක්ඛිත ස්ත්‍රියට ද, පිතුරක්ඛිත ස්ත්‍රියට ද කියනු මැනව: 'මෙ තම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යා වව"යි මහණකු යවයි ද, හෙතෙම එය පිළිගණියි ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස් ඇවැත් වේ.

4. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙ තම් මාතුරක්ඛිත ස්ත්‍රියට ද පිතුරක්ඛිත ස්ත්‍රියට ද, ... මාතුරක්ඛිත ස්ත්‍රියට ද භාතුරක්ඛිත ස්ත්‍රියට ද, ... මාතුරක්ඛිත ස්ත්‍රියට ද භගිනිරක්ඛිත ස්ත්‍රියටද, ... මාතුරක්ඛිත ස්ත්‍රියටද ඤාතිරක්ඛිත ස්ත්‍රියට ද, ... මාතුරක්ඛිත ස්ත්‍රියටද ගොත්තරක්ඛිත ස්ත්‍රියට ද ... මාතුරක්ඛිත ස්ත්‍රියට ද ධම්මරක්ඛිත ස්ත්‍රියට ද මාතුරක්ඛිත ස්ත්‍රියට ද සාරක්ඛ ස්ත්‍රියට ද ... මාතු රක්ඛිත ස්ත්‍රියට ද සපරිදණ්ඩ ස්ත්‍රියට ද කියව: "මෙතම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යා වව" යි. පිළිගණියි, විමසයි, පිළිතුරු ගෙණ එයි, සඟවෙසෙස්ඇවැත් වේ.

ඛණ්ඩචක්‍රය යි.

5. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙතම් පිතුරක්ඛිත මාතාපිතුරක්ඛිත ස්ත්‍රීන්ට "මෙතම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යා වව"යි කියනු මැනව. පිළිගණියි, විමසයි, පිළිතුරු ගෙණ එයි, සඟවෙසෙස් ඇවැත් වේ.

6. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස යනු මැනව. මෙතම් පිතුරක්ඛිත ස්ත්‍රියට ද භාතුරක්ඛිත ස්ත්‍රියට ද ... පිතුරක්ඛිත ස්ත්‍රියට ද භගිනිරක්ඛිත ස්ත්‍රියට ද ... පිතුරක්ඛිත ස්ත්‍රියට ද ඤාතිරක්ඛිත ස්ත්‍රියට ද ... පිතුරක්ඛිත ස්ත්‍රියට ද ගොත්තරක්ඛිත ස්ත්‍රියට ද ... පිතුරක්ඛිත ස්ත්‍රියට ද ධම්මරක්ඛිත ස්ත්‍රියට ද ... පිතුරක්ඛිත ස්ත්‍රියට ද සාරක්ඛ ස්ත්‍රියට ද ... පිතුරක්ඛිත ස්ත්‍රියට ද සපරිදණ්ඩ ස්ත්‍රියට ද කියනු මැනව: "මෙතම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යා වව"යි. පිළිගණියි, විමසයි, පිළිතුරු ගෙණ එයි, සඟවෙසෙස්ඇවැත් වේ.

7. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙතම් පිතුරක්ඛිත ස්ත්‍රියට ද මාතුරක්ඛිත ස්ත්‍රියට ද කියනු මැනව. "මෙතම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යා වව"යි පිළිගණියි, විමසයි, පිළිතුරු ගෙණ එයි, සඟවෙසෙස්ඇවැත් වේ.

බද්ධචක්‍රය යි.

මූලය සංක්ෂිප්තය.

8. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස යනු මැනව. "මෙතම් ඇති සපරිදණ්ඩ ස්ත්‍රියට ද මාතුරක්ඛිත ස්ත්‍රියට ද කියනු මැනව. මෙතම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යා වව යි" පිළිගණියි, විමසයි, පිළිතුරු ගෙණ එයි, සඟවෙසෙස්ඇවැත් වේ.

9. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙතම් ඇති සපරිදණ්ඩ ස්ත්‍රියට ද පිතුරක්ඛිත ස්ත්‍රියට ද ... සපරිදණ්ඩ ස්ත්‍රියට ද මාතාපිතුරක්ඛිත ස්ත්‍රියට ද ... සපරිදණ්ඩ ස්ත්‍රියට ද භාතුරක්ඛිත ස්ත්‍රියට ද ... සපරිදණ්ඩ ස්ත්‍රියට ද භගිනිරක්ඛිත ස්ත්‍රියට ද ... සපරිදණ්ඩ ස්ත්‍රියට ද ඤාතිරක්ඛිත ස්ත්‍රියට ද ... සපරිදණ්ඩ ස්ත්‍රියට ද ගොත්තරක්ඛිත ස්ත්‍රියට ද ... සපරිදණ්ඩ ස්ත්‍රියට ද ධම්මරක්ඛිත ස්ත්‍රියට ද ... සපරිදණ්ඩ ස්ත්‍රියට ද සාරක්ඛ ස්ත්‍රියට ද කියනු මැනව. "මෙතම් ඇත්තහුට ධනක්කීත භාර්‍ය්‍යා වව යි" පිළිගණියි, විමසයි, පිළිතුරු ගෙණ එයි, සඟවෙසෙස්ඇවැත් වේ.

එකමූලකය නිමි.

10. එවං දුමූලකම්පි තිමූලකම්පි චතුමූලකම්පි පඤ්චමූලකම්පි ඡමූලකම්පි සත්තමූලකම්පි අට්ඨමූලකම්පි නවමූලකම්පි කාතබ්බං.*

## ඉදං දසමූලකං:

11. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච පිතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච භාතුරක්ඛිතඤ්ච භගිනිරක්ඛිතඤ්ච ඤාතිරක්ඛිතඤ්ච ගොත්තරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච සාරක්ඛඤ්ච සපරිදණ්ඩඤ්ච බ්‍රෑහි: හොන්තු කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

## ධනක්කීතාචක්කං[1] නිට්ඨිතං.

12. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී -පෙ- භොගවාසිනී -පෙ- පටවාසිනී -පෙ- ඔදපත්තකිනී -පෙ- ඔභටචුම්බටා -පෙ- දාසී ච භරියා ච -පෙ- කම්මකාරී ච භරියා ච -පෙ- ධජාහටා -පෙ- මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

13. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතං බ්‍රෑහි -පෙ- මාතාපිතුරක්ඛිතං බ්‍රෑහි -පෙ- භාතුරක්ඛිතං බ්‍රෑහි -පෙ- භගිනිරක්ඛිතං බ්‍රෑහි -පෙ- ඤාතිරක්ඛිතං බ්‍රෑහි -පෙ- ගොත්තරක්ඛිතං බ්‍රෑහි -පෙ- ධම්මරක්ඛිතං බ්‍රෑහි -පෙ- සාරක්ඛං බ්‍රෑහි -පෙ- සපරිදණ්ඩං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

## නික්ඛෙපපදානි.

14. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච පිතුරක්ඛිතඤ්ච බ්‍රෑහි: හොන්තු කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

15. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච -පෙ- මාතුරක්ඛිතඤ්ච සපරිදණ්ඩඤ්ච බ්‍රෑහි: හොන්තු කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

## ඛණ්ඩචක්කං නිට්ඨිතං

16. පුරිසො භික්ඛුං පහිණාති: ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච බ්‍රෑහි: "හොන්තු කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

---

* එවං දුමූලකම්පි තිමූලකම්පි යාව නවමූලකං කාතබ්බං ම.ඡසං.

1. ධනක්කීතාදිචක්කං සීමු.

10. ද්‍විමූලකය ද තිමූලකය ද චතුමූලකය ද පඤ්චමූලකය ද ඡමූලකය ද සත්තමූලකය ද අට්ඨමූලකය ද නවමූලකය ද මෙසේ කටයුතුයි.

**මේ දසමූලකය යි:**

11. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙනම් ඇති මාතුරක්ඛිත ස්ත්‍රියට ද, පිතුරක්ඛිත ස්ත්‍රියට ද, මාතාපිතුරක්ඛිත ස්ත්‍රියට ද, භාතුරක්ඛිත ස්ත්‍රියට ද, භගිනිරක්ඛිත ස්ත්‍රියට ද, ඤාතිරක්ඛිත ස්ත්‍රියට ද, ගොත්තරක්ඛිත ස්ත්‍රියට ද, ධම්මරක්ඛිත ස්ත්‍රියට ද, සාරක්ඛ ස්ත්‍රියට ද, සපරිදණ්ඩ ස්ත්‍රියට ද, කියනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්කීත භාර්‍යා වව"යි පිළිගණියි. විමසයි. පිළිතුරු ගෙණ එයි. සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

**ධනක්කීතචක්‍රය නිමි.**

12. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙනම් මාතුරක්ඛිත ස්ත්‍රියට කියනු මැනව. 'මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී භාර්‍යා වව'යි ... භොගවාසිනී ... පටවාසිනී ... ඔදපත්තකිනී ... ඔභටචුම්බටා ... දස්සක් ද, භාර්‍යාවක් ද, මිඩියක් ද, භාර්‍යාවක් ද, ධජාහටා ... මුහුත්තිකා භාර්‍යා වව"යි පිළිගණියි. විමසයි. පිළිතුරු ගෙණ එයි. සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

13. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙනම් පිතුරක්ඛිත ස්ත්‍රියට කියව. ... මාතාපිතුරක්ඛිත ස්ත්‍රියට කියව. ... භාතුරක්ඛිත ස්ත්‍රියට කියව. භගිනිරක්ඛිත ස්ත්‍රියට කියව, ... ඤාතිරක්ඛිත ස්ත්‍රියට කියව. ... ගොත්තරක්ඛිත ස්ත්‍රියට කියව. ... ධම්මරක්ඛිත ස්ත්‍රියට කියව. ... සාරක්ඛ ස්ත්‍රියට කියව. ... සපරිදණ්ඩ ස්ත්‍රියට කියනු මැනව. මෙනම් ඇත්තහුට මුහුත්තිකා භාර්‍යා වව" යි පිළිගණියි. විමසයි. පිළිතුරු ගෙණ එයි. සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

**නික්ඛෙපපදයෝ යි.**

14. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙනම් මාතුරක්ඛිත ස්ත්‍රියට ද, පිතුරක්ඛිත ස්ත්‍රියට ද කියනු මැනව. මෙනම් ඇත්තහුට මුහුත්තිකා භාර්‍යා, වව"යි පිළිගණියි. විමසයි. පිළිතුරු ගෙණ එයි. සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

15. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස යනු මැනව. මෙනම් මාතුරක්ඛිත ස්ත්‍රියට ද, මාතාපිතුරක්ඛිත ස්ත්‍රියට ද ... මාතුරක්ඛිත ස්ත්‍රියට ද, සපරිදණ්ඩ ස්ත්‍රියට ද කියනු මැනව. මෙනම් ඇත්තහුට මුහුත්තිකා භාර්‍යා වව"යි පිළිගණියි. විමසයි. පිළිතුරු ගෙණ එයි. සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

**ඛණ්ඩචක්‍රය නිමි.**

16. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස, යනු මැනව. මෙනම් පිතුරක්ඛිත ස්ත්‍රියට ද, මාතාපිතුරක්ඛිත ස්ත්‍රියට ද කියනු මැනව. මෙනම් ඇත්තහුට මුහුත්තිකා භාර්‍යා වව"යි පිළිගණියි. විමසයි. පිළිතුරු ගෙණ එයි. සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

17. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතඤ්ච භාතුරක්ඛිතඤ්ච -පෙ- පිතුරක්ඛිතඤ්ච සපරිදණ්ඩඤ්ච බ්‍රූහි: "හොති කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

18. පුරිසො භික්ඛුං පහිණාති, "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං පිතුරක්ඛිතඤ්ච මාතුරක්ඛිතඤ්ච බ්‍රූහි: හොති කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

ඛණ්ඩචක්කං.

මූලං සඞ්ඛිත්තං.

19. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං සපරිදණ්ඩඤ්ච මාතුරක්ඛිතඤ්ච බ්‍රූහි: හොති කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

20. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං සපරිදණ්ඩඤ්ච පිතුරක්ඛිතඤ්ච -පෙ- සපරිදණ්ඩඤ්ච සාරක්ඛඤ්ච බ්‍රූහි: හොති කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති, වීමංසති පච්චාහරති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

එකමූලකං නිට්ඨිතං.

21. එවං දුමූලකම්පි, තිමූලකම්පි, චතුමූලකම්පි, පඤ්චමූලකම්පි, ඡමූලකම්පි, සත්තමූලකම්පි, අට්ඨමූලකම්පි, නවමූලකම්පි කාතබ්බං.*

ඉදං දසමූලකං:

22. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච පිතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච භාතුරක්ඛිතඤ්ච භගිනිරක්ඛිතඤ්ච ඤාතිරක්ඛිතඤ්ච ගොත්තරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච සාරක්ඛඤ්ච සපරිදණ්ඩඤ්ච බ්‍රූහි: හොති කිර ඉත්ථන්නාමස්ස භරියායො මුහුත්තිකා"ති. පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

මුහුත්තිකාචක්කං[1] නිට්ඨිතං.

---

* එවං දුමූලකම්පි තිමූලකම්පි යාව නවමූලකං කාතබ්බං මජසං: දුමූලකාදීනිපි එවමෙව කාතබ්බානි, සීමු.

1. මුහුත්තිකා ඉත්ථිචක්කං. සීමු.

17. පුරුෂයෙක් මහණකු යවයි. "වහන්ස ... යනු මැනව. මෙනම් පිතුරක්ඛිත ස්ත්‍රියට ද භාතුරක්ඛිත ස්ත්‍රියට ද ... පිතුරක්ඛිත ස්ත්‍රියට ද සපරිදණ්ඩ ස්ත්‍රියට ද, කියව. මෙනම් ඇත්තහුට මුහුත්තිකා භාර්‍යා වව"යි පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වේ.

18. "වහන්ස, යනු මැනව. මෙනම් තැනැත්තහුට මුහුත්තිකා භාර්‍යා වව"යි මෙනම් පිතුරක්ඛිත ස්ත්‍රියට ද මාතුරක්ඛිත ස්ත්‍රියට ද කියන්නැ"යි පුරුෂයෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වේ.

**බද්ධචක්‍රය යි.**

**මූලය සංක්ෂිප්ත යි.**

19. "වහන්ස, යනු මැනව. මෙනම් තැනැත්තහුට මුහුත්තිකා භාර්‍යා වන්නැ" යි මෙනම් සපරිදණ්ඩ ස්ත්‍රියට ද මාතෘරක්ෂිත ස්ත්‍රියට ද කියන්නැ"යි පුරුෂයෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වේ.

20. "වහන්ස, යනු මැනව. "මෙනම් සපරිදණ්ඩ ස්ත්‍රියට ද පිතෘරක්ෂිත ස්ත්‍රියට ද ... මෙනම් සපරිදණ්ඩ ස්ත්‍රියට ද සාරක්ෂක ස්ත්‍රියට ද, 'මෙනම් තැනැත්තහුට මුහුත්තිකා භාර්‍යා වන්නැ' යි කියනු මැනවැ" යි පුරුෂයෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්-ඇවැත් වේ.

**ඒකමූලකය නිමියේ ය.**

21. ද්විමූලකය ද, ත්‍රිමූලකය ද, චතුර්මූලකය ද, පඤ්චමූලකය ද, ෂණ්මූලකය ද, සප්තමූලකය ද, අෂ්ටමූලකය ද, නවමූලකය ද මෙසේ කටයුතු යි.

**මේ දසමූලකය යි:**

22. "වහන්ස, යනු මැනව. මෙනම් මාතෘරක්ෂිතාවට ද, පිතෘරක්ෂිතාවට ද, මාතෘරක්ෂිතාවට ද, භ්‍රාතෘරක්ෂිතාවට ද, භගිනීරක්ෂිතාවට ද, ඥාතිරක්ෂිතා-වට ද, ගොත්‍රරක්ෂිතාවට ද, ධර්මරක්ෂිතාවට ද, සාරක්ෂාවට ද, සපරිදණ්ඩාවට ද, "මෙනම් තැනැත්තහුට මුහුත්තිකා භාර්‍යා වන්නැ"යි කියව"යි මිනිසෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්-ඇවැත් වේ.

**මුහුර්තිකාචක්‍රය නිමියේ ය.**

23. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

24. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී -පෙ- භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභටචුම්බටා,[1] දසී ච භරියා ච, කම්මකාරී ච භරියා ච, ධජාහටා, මුහුත්තිකා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

නික්ඛෙපපදානි.

25. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති; ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

26. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච භොගවාසිනී ච -පෙ- ධනක්කීතා ච පටවාසිනී ච -පෙ- ධනක්කීතා ච ඔදපත්තකිනී ච -පෙ- ධනක්කීතා ච ඔභටචුම්බටා ච -පෙ- ධනක්කීතා ච දසී ච භරියා ච -පෙ- ධනක්කීතා ච කම්මකාරී ච භරියා ච -පෙ- ධනක්කීතා ච ධජාහටා ච -පෙ- ධනක්කීතා ච මුහුත්තිකා චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

ඛණ්ඩචක්කං.

27. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී ච භොගවාසිනී ච -පෙ- ඡන්දවාසිනී ච මුහුත්තිකා ච, ඡන්දවාසිනී ච ධනක්කීතාචා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

බද්ධචක්කං.

මූලං සඞ්ඛිත්තං.

28. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා මුහුත්තිකා ච ධනක්කීතා ච -පෙ- මුහුත්තිකා ච ඡන්දවාසිනී ච, -පෙ- මුහුත්තිකා ච ධජාහටා චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

එකමූලකං නිට්ඨිතං.

එවං දුමූලකම්පි යාව නවමූලකං කාතබ්බං.

1. ඔභතචුම්බටා. සීමු.

23. "වහන්ස, යනු මැනව. "මෙනම් ඇත්තහුට ධනක්‍රීත (ධනයෙන් පෙරළාගත්) භාර්‍ය්‍යා වන්නැ" යි මෙනම් මාතුරක්ඛිතාවට කියනු මැනව" යි කියා මිනිසෙක් මහණකු යවා ද, මහණ තෙමේ එය පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස් වන්නේ ය.

24. "වහන්ස, යනු මැනව. මෙනම් තැනැත්තහුට ඡන්දවාසිනී (සිය කැමැත්තෙන් වසන) භාර්‍ය්‍යා වන්නැ"යි මව විසින් රක්නා ලද මෙනම් ස්ත්‍රියට කියනු මැනවැ" යි මිනිසෙක් මහණකු යවා ද ... භොග නිසා වසන ස්ත්‍රියක් වන්නැ" යි... පටවාසිනී (වස්ත්‍ර නිසා වසනා භාර්‍ය්‍යා වන්නැ" යි... ඔදපත්තකිනී (දිය බඳුනක දෙදෙනාගේ ම අත් බහවා මේ දිය මෙන් නො වෙන්ව වසවු"ය යි කියා පාවදෙනු ලබන) භාර්‍ය්‍යාවක් වන්නැ" යි ... ඔභටචුම්බටා (හිසින් සුඹුළු බහවා සිය ගෙහි වස්වනු ලබන) භාර්‍ය්‍යා වන්නැ" යි ... දාසීත් භාර්‍ය්‍යාත් වන්නැ" යි ... කම්කාරිණීත් (ගෙහි බැලමෙහෙවර කරණ තැනැත්තීත්) භාර්‍ය්‍යාත් වන්නැ" යි ... ධජාහට (එසවූ ධජ ඇති යුදසෙන් හා ගොස් පිටරටින් පැහැර ගෙණ ආ) භාර්‍ය්‍යා වන්නැ" යි ... ඒ මොහොතට පමණක් භාර්‍ය්‍යා වන්නැ" යි මව විසින් රක්නාලද මෙනම් ඇත්තියට කියනු මැනව"යි කියා මිනිසෙක් මහණකු යවා ද, ඒ මහණ පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**නික්ඛෙපපද යි.**

25. "වහන්ස, යනු මැනව. මෙනම් තැනැත්තහුට ධනක්‍රීත වූ ද ඡන්දවාසිනී වූ ද භාර්‍ය්‍යා වන්නැ" යි මව විසින් රක්නා ලද මෙනම් ඇත්තියට කියන්නැ" යි මිනිසෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

26. "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්‍රීත ද භොගවාසිනී ද භාර්‍ය්‍යා වන්නැ" යි... ධනක්‍රීත ද පටවාසිනී ද භාර්‍ය්‍යා වන්නැ" යි ... ධනක්‍රීත ද ඔදපත්තකිනී ද භාර්‍ය්‍යා වන්නැ" යි ... ධනක්‍රීත ද ඔභටචුම්බට ද භාර්‍ය්‍යා වන්නැ" යි ... ධනක්‍රීත ද දාසී ද භාර්‍ය්‍යා වන්නැ" යි ... ධනක්‍රීත ද ධජාහට ද භාර්‍ය්‍යා වන්නැ" යි ... ධනක්‍රීත ද මුහුත්තිකා ද භාර්‍ය්‍යා වන්නැ" යි ... මෙනම් මාතෘරක්ෂිතාවට කියනු මැනව" යි කියා මිනිසෙක් මහණකු යවා ද, ඒ මහණ ඒ පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**ඛණ්ඩ චක්‍රය යි.**

27. "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී ද භාර්‍ය්‍යා වන්නැ"යි ...ඡන්දවාසිනී ද මුහුත්තිකා ද භාර්‍ය්‍යා වන්නැ" යි ... ඡන්දවාසිනී ද ධනක්‍රීතා ද භාර්‍ය්‍යා වන්නැ" යි කියා මෙනම් මාතෘරක්ෂිතාවට කියන්නැ" යි මිනිසෙක් මහණකු යවා ද, ඒ මහණ තෙමේ පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**බද්ධචක්‍රය යි.**

**මූලය සංක්ෂිප්ත යි.**

28 "වහන්ස, මෙනම් ඇත්තහුට මුහුත්තිකා ද, ධනක්‍රීත ද ... මුහුත්තිකාද ඡන්දවාසිනී ද ... මුහුත්තිකා ද, ධජාහට ද භාර්‍ය්‍යා වන්නැ"යි කියා 'මෙනම් මාතෘරක්ෂිතාවට කියන්නැ"යි මිනිසෙක් මහණකු යවා ද, ඒ මහණ තෙමේ පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**ඒකමූලකය නිමියේ ය.**

ද්විමූලකය ද මෙසේ යි. නවමූලකය තෙක් මෙසේ ම කටයුතු යි.

### දසමූලකං.

29. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී ච පටවාසිනී ච ඔදපත්තකිනී ච ඔභටචුම්බටා ච දාසී ච භරියා ච කම්මකාරී ච භරියා ච ධජාහටා ච මුහුත්තිකා චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### මාතුරක්ඛිතචක්කං නිට්ඨිතං.

30. පුරිසො භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං පිතුරක්ඛිතං -පෙ- මාතාපිතුරක්ඛිතං -පෙ- භාතුරක්ඛිතං -පෙ- භගිනිරක්ඛිතං -පෙ- ඤාතිරක්ඛිතං -පෙ- ගොත්තරක්ඛිතං -පෙ- ධම්මරක්ඛිතං -පෙ- සාරක්ඛං -පෙ- සපරිදණ්ඩං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

31. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං සපරිදණ්ඩං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී -පෙ- භොගවාසිනී -පෙ- පටවාසිනී -පෙ- ඔදපත්තකිනී -පෙ- ඔභටචුම්බටා -පෙ- දාසී ච භරියා ච -පෙ- කම්මකාරී ච භරියා ච -පෙ- ධජාහටා -පෙ- මුහුත්තිකා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### නික්ඛෙපපදානි.

32. පුරිසො භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං සපරිදණ්ඩං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී චා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

33. පුරිසො භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං සපරිදණ්ඩං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච භොගවාසිනී ච -පෙ- ධනක්කීතා ච මුහුත්තිකා චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### ඛණ්ඩචක්කං.

34. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං සපරිදණ්ඩං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී ච භොගවාසිනී ච -පෙ- ඡන්දවාසිනී ච මුහුත්තිකා ච -පෙ- ඡන්දවාසිනී ච ධනක්කීතා චා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

### බද්ධචක්කං.

### මූලං සඞ්ඛිත්තං.

දසමූලකය:

29. "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්‍රීත ද ඡන්දවාසිනී ද භෝගවාසිනී ද පටවාසිනී ද ඔදපත්තකිනී ද ඔභටචුම්බට ද දාසීභාර්‍ය්‍යා ද කම්මකාරිණී භාර්‍ය්‍යා ද ධජාහටා ද මුහුත්තිකා ද භාර්‍ය්‍යා වන්නැ" යි මව විසින් රක්නා ලද මෙනම් ඇත්තියට කියන්නැ" යි කියා මිනිසෙක් මහණකු යවා ද, පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස් ඇවැත් වන්නේ ය.

මාතුරක්ඛිතවක්‍රය නිමියේ ය.

30. "වහන්ස යනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්‍රීත භාර්‍ය්‍යා වන්නැ" යි මෙනම් ඇති පිතෘරක්ඛිතාවට... මෙනම් මාතාපිතෘරක්ඛිතාවට... මෙනම් භ්‍රාතෘ-රක්ඛිතාවට ... මෙනම් භගිනීරක්ඛිතාවට ... මෙනම් ඥාතිරක්ඛිතාවට ... මෙනම් ගෝත්‍රරක්ඛිතාවට ... මෙනම් ධම්මරක්ඛිතාවට ... මෙනම් සාරක්ඛාවට ... මෙනම් සපරිදණ්ඩාවට ... කියන්නැ" යි මිනිසෙක් මහණකු යවා ද, හේ පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

31. "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට ... ඡන්දවාසිනී ... භොගවාසිනී ... පටවාසිනී ... ඔදපත්තකිනී...ඔභටචුම්බට...දාසී භාර්‍ය්‍යාත් වූ ... කම්මකාරිණී භාර්‍ය්‍යාත් වූ ... ධජාහට ... මුහුත්තිකා භාර්‍ය්‍යා වව" යි කියනු මැනවැ" යි මිනිසෙක් මහණකු යවා ද, ඒ මහණ තෙමේ එය පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

නිඃක්ෂෙප පදයෝ යි.

32. "වහන්ස යනු මැනව මෙනම්. ඇත්තහුට ධනක්‍රීත ද ඡන්දවාසිනී ද භාර්‍ය්‍යා වව"යි මෙනම් සපරිදණ්ඩාවට කියනු මැනවැ"යි මිනිසෙක් මහණකු යවා ද මහණ තෙමේ ඒ පිළිගණී ද විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්-ඇවැත් වන්නේ ය.

33. "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට ධනක්‍රීත ද භෝගවාසිනී ද ධනක්‍රීත ද මුහුත්තිකා ද භාර්‍ය්‍යා වව" යි මෙනම් සපරිදණ්ඩාවට කියන්නැ"යි මිනිසෙක් මහණකු යවා ද පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

ඛණ්ඩචක්‍රය යි.

34. "වහන්ස, යන්න. 'මෙනම් ඇත්තහුට ඡන්දවාසිනීත් භාර්‍ය්‍යා වව"යි ... ඡන්දවාසිනීත් මුහුත්තිකාත් ... ඡන්දවාසිනීත් ධනක්කීතාත් භාර්‍ය්‍යා වව" යි. මෙනම් සපරිදණ්ඩාවට කියන්නැ"යි මිනිසෙක් මහණකු යවා ද පිළිගණී ද, විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

බද්ධචක්‍රය යි.

මූලය සංක්ෂිප්ත යි,

35. පුරිසො භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං සපරිදණ්ඩං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා මුහුත්තිකා ච ධනක්කීතා ච -පෙ- මුහුත්තිකා ච ඡන්දවාසිනී ච -පෙ- මුහුත්තිකා ච ධජාහටා චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

එකමූලකං නිට්ඨිතං.

දුමූලකම්පි යාව නවමූලකං එවමෙව කාතබ්බං.

ඉදං දසමූලකං:

36. පුරිසො භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං සපරිදණ්ඩං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී ච පටවාසිනී ච ඔදපත්තකිනී ච ඔභටචුම්බටා ච දාසී ච භරියා ච කම්මකාරී ච භරියා ච ධජාහටා ච මුහුත්තිකා චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

සපරිදණ්ඩාවක්කං නිට්ඨිතං.

37. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං මාතුරක්ඛිතං බ්‍රෑහි: "හොහි කිර ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

38. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච පිතුරක්ඛිතඤ්ච බ්‍රෑහි: 'හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා ච ඡන්දවාසිනී චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

39. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච පිතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච බ්‍රෑහි: "හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

එවං උභතො වඩ්ඪමානං[1] කාතබ්බං.

40. පුරිසො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං මාතුරක්ඛිතඤ්ච පිතුරක්ඛිතඤ්ච මාතාපිතුරක්ඛිතඤ්ච භාතුරක්ඛිතඤ්ච භගිනීරක්ඛිතඤ්ච ඤාතිරක්ඛිතඤ්ච ගොත්තරක්ඛිතඤ්ච ධම්මරක්ඛිතඤ්ච සාරක්ඛඤ්ච සපරිදණ්ඩඤ්ච බ්‍රෑහි: "හොථ කිර ඉත්ථන්නාමස්ස භරියායො ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී ච පටවාසිනී ච ඔදපත්තකිනී ච ඔභටචුම්බටා ච දාසී ච භරියා ච කම්මකාරී ච භරියා ච ධජාහටා ච මුහුත්තිකා චා"ති, පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

උභතොවඩ්ඪකං නිට්ඨිතං.

1. වඩ්ඪකං මජසං. සී.මු.

35. "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට මුහුත්තිකාත් ධනක්‍රීතාත් භාර්‍යා වව"යි...මුහුත්තිකාත් ඡන්දවාසිනීත් ... මුහුත්තිකාත් ධජාහටාත් භාර්‍යා වව"යි මෙනම් සපරිදණ්ඩාවට කියන්නැ"යි මිනිසෙක් මහණකු යවාද, පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**එකමූලකය නිමියේ ය.**

**දුවිමූලකය ද නවමූලකය තෙක් මෙසේ ම කටයුතු යි.**

**මේ දසමූලකය යි:**

36 "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට ධනක්‍රීත ද ඡන්දවාසිනී ද භොගවාසිනී ද පටවාසිනී ද ඔදපත්තකිනී ද ඔහටචුම්බට ද, දුසිභාර්‍යා ද, කම්කාරිණී භාර්‍යා ද, ධජාහට ද මුහුත්තිකා ද භාර්‍යා වව"යි මෙනම් සපරි-දණ්ඩාවට කියන්නැ"යි කියා මිනිසෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**සපරිදණ්ඩාවක්‍රය නිමියේ ය.**

37. "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත් තහුට ධනක්‍රීත භාර්‍යා වව"යි. මෙනම් මාතෘරක්ෂිතාවට කියන්නැ"යි කියා මිනිසෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟාවෙසෙස්ඇවැත් වන්නේ ය.

38. "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට ධනක්‍රීත ද ඡන්දවාසිනී ද භාර්‍යා වව"යි මෙනම් මාතෘරක්ෂිතාවට ද මෙනම් පිතෘරක්ෂිතාවට ද කියන්නැ"යි මිනිසෙක් මහණකු යවා ද පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

39. "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට ධනක්‍රීත ද, ඡන්දවාසිනී ද භොගවාසිනී ද භාර්‍යා වව"යි, මෙනම් මාතෘරක්ෂිතාවට ද මෙනම් පිතෘරක්ෂි-තාවට ද මෙනම් මාතාපිතෘරක්ෂිතාවට ද කියන්නැ"යි මිනිසෙක් මහණකු යවා ද, පිළිගණී ද, විමසා ද පිළිතුරු ගෙණ ඒ ද. සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**මෙසේ දෙපසින් වැඩෙන්නක් කළයුතු යි.**

40. "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට ධනක්‍රීත ද ඡන්දවාසිනී ද භොගවාසිනී ද පටවාසිනී ද ඔදපත්තකිනී ද ඔහටචුම්බටා ද දුසි භාර්‍යා ද කම්ම-කාරිණී භාර්‍යා ද ධජාහටා ද මුහුත්තිකා ද භාර්‍යා වව"යි මෙනම් මාතෘරක්ෂිතාවට ද මෙනම් පිතෘරක්ෂිතාවට ද ... මෙනම් මාතාපිතෘරක්ෂිතාවට ද මෙනම් භ්‍රාතෘ-රක්ෂිතාවට ද මෙනම් භගිනීරක්ෂිතාවට ද මෙනම් ඥතිරක්ෂිතාවට ද මෙනම් ගොත්‍රරක්ෂිතාවට ද මෙනම් ධර්මරක්ෂිතාවට ද මෙනම් සාරක්ෂාවට ද මෙනම් සපරිදණ්ඩාවට ද කියන්නැ"යි, මිනිසෙක් මහණකු යවා ද පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**දෙපසින් වැඩීම නිමියේ ය.**

41. පුරිසස්ස මාතා භික්ඛුං පහිණාති -පෙ- පුරිසස්ස පිතා භික්ඛුං පහිණාති -පෙ- පුරිසස්ස මාතාපිතරො භික්ඛුං පහිණන්ති -පෙ- පුරිසස්ස භාතා භික්ඛුං පහිණාති -පෙ- පුරිසස්ස භගිනී භික්ඛුං පහිණාති -පෙ- පුරිසස්ස ඤාතකා භික්ඛුං පහිණන්ති, පුරිසස්ස ගොත්තා භික්ඛුං පහිණන්ති -පෙ- පුරිසස්ස සහධම්මිකා භික්ඛුං පහිණන්ති -පෙ- .

**පුරිසස්ස පෙය්‍යාලො විත්ථාරෙතබ්බො.**

**උභතො වඩ්ඪකං යථා පුරිමනයො තථෙව විත්ථාරෙතබ්බං.**

42. මාතු රක්ඛිතාය මාතා භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති, පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

43. මාතුරක්ඛිතාය මාතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී -පෙ- භොගවාසිනී -පෙ- පටවාසිනී -පෙ- ඔදපත්තකිනී -පෙ- ඔභටචුම්බටා, ... දාසී ච භරියා ච -පෙ- කම්මකාරී ච භරියා ච -පෙ- ධජාහටා -පෙ- මුහුත්තිකා"ති, පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**නික්ඛෙපපදානි.**

44. මාතුරක්ඛිතාය මාතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං බ්‍රෑහි: 'හොතු ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච' -පෙ- ධනක්කීතා ච භොගවාසිනී ච -පෙ- ධනක්කීතා ච මුහුත්තිකා චා"ති, පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**ඛණ්ඩචක්කං.**

45. මාතුරක්ඛිතාය මාතා භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී ච භොගවාසිනී ච -පෙ- ඡන්දවාසිනී ච මුහුත්තිකා ච -පෙ- ඡන්දවාසිනී ච ධනක්කීතා චා"ති, පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**බද්ධචක්කං.**

**මූලං සඞ්ඛිත්තං**

46. මාතුරක්ඛිතාය මාතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා මුහුත්තිකා ච ධනක්කීතා ච -පෙ- මුහුත්තිකා ච ඡන්දවාසිනී ච -පෙ- මුහුත්තිකා ච ධජාහටා චා"ති, පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**එකමූලකං නිට්ඨිතං.**

**එවං දුමූලකම්පි යාව නවමූලකං කාතබ්බං.**

41. පුරුෂයක්හුගේ මව මහණකු යවා ද, ... පුරුෂයක්හුගේ පියා මහණකු යවා ද ... පුරුෂයක්හුගේ මාපියෝ මහණකු යවද්ද, ... පුරුෂයක්හුගේ බෑයා මහණකු යවා ද... පුරුෂයක්හුගේ බිහිනී මහණකු යවා ද ... පුරුෂයක්හුගේ නෑයෝ මහණකු යවද්ද ... පුරුෂයක්හුගේ ගොත්‍රයෝ මහණකු යවද්ද ... පුරුෂයක්හුගේ සහදහැම්යෝ මහණකු යවද්ද. ...

**පුරුෂයා පිළිබඳ පෙය්‍යාලය විස්තර කටයුතු සි.**

**පලමුනය සෙයින් දෙපසින් වැඩීම විස්තර කටයුතු සි.**

42. "වහන්ස, යනු මැනව. 'මෙතම් ඇත්තහුට ධනක්‍රීතභාය්‍යී වේවා"සි මෙතම් ඇත්තියට කියත්තැ"සි මාතෘරක්‍ෂිතාවකගේ මවක් මහණකු යවා ද පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

43. "වහන්ස, යනු මැනව. 'මෙතම් ඇත්තහුට ඡන්දවාසිනී භාය්‍යී වේවා"සි ... භොගවාසිනී ... පටවාසිනී ... ඔදපත්තකිනී ... ඔභටචුම්බටා ... දසී භාය්‍යී ... කම්කාරිණීභාය්‍යී ... ධජාහටභාය්‍යී ... මුහුත්තිකාභාය්‍යී වේවා"සි. මෙතම් ඇත්තියට කියත්තැ'සි මාතෘරක්‍ෂිතාවකගේ මවක් මහණකු යවා ද, මහණ ඒ පිළිගණී ද, සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**නිඃක්‍ෂෙපපදයෝ සි.**

44. "වහන්ස, යනු මැනව. 'මෙතම් ඇත්තහුට ධනක්‍රීත ද ඡන්දවාසිනී ද භාය්‍යී වේවා'සි ... ධනක්‍රීත ද භොගවාසිනී ද . . ධනක්‍රීත ද මුහුත්තිකා ද භාය්‍යී වේවා"සි මෙතම් ඇත්තියට කියත්තැ'සි කියා මාතෘරක්‍ෂිතා-වකගේ මවක් මහණකු යවා ද, පිළිගණී ද ඉවසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**ඛණ්ඩචක්‍රය සි.**

45. "වහන්ස, යනු මැනව. 'මෙතම් ඇත්තහුට ඡන්දවාසිනී ද භොගවාසිනී ද... ඡන්දවාසිනී ද මුහුත්තිකා ද...ඡන්දවාසිනී ද ධනක්‍රීතා ද භාය්‍යී වේවා" සි මෙතම් ඇත්තියට කියත්තැ"සි මාතෘරක්‍ෂිතාවකගේ මවක් මහණකු යවා ද, පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**බද්ධචක්‍රය සි**

**මූලය සංක්‍ෂිප්ත සි.**

46. "වහන්ස, යනු මැනව. "මෙතම් ඇත්තහුට මුහුත්තිකා ද ධනක්‍රීත ද භාය්‍යී වේවා"සි ... මුහුත්තිකා ද ඡන්දවාසිනී ද භාය්‍යී වේවා"සි ... මුහුත්තිකා ද ධජාහටා ද භාය්‍යී වේවා" සි මෙතම් ඇත්තියට කියත්තැ"සි මාතෘරක්‍ෂි-තාවකගේ මවක් මහණකු යවා ද, මහණ එය පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඟවෙසෙස්ඇවැත් වන්නේ ය.

**එකමූලකය නිමියේ ය.**

**මෙසේ ද්විමූලකය ද, නවමූලකය තෙක් කටයුතු සි.**

ඉදං දසමූලකං:

47. මාතුරක්ඛිතාය මාතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ, ඉත්ථන්නාමං බ්‍රූහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී ච පටවාසිනී ච ඔදපත්තකිනී ච ඔභටචුම්බටා ච දාසී ච භරියා ච කම්මකාරී ච භරියා ච ධජාහටා ච මුහුත්තිකා චා"ති පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

මාතුචක්කං නිට්ඨිතං

48. පිතුරක්ඛිතාය පිතා භික්ඛුං පහිණාති -පෙ- මාතාපිතුරක්ඛිතාය මාතාපිතරො භික්ඛුං පහිණන්ති -පෙ- භාතුරක්ඛිතාය භාතා භික්ඛුං පහිණාති -පෙ- භගිනිරක්ඛිතාය භගිනී භික්ඛුං පහිණාති -පෙ- ඤාතිරක්ඛිතාය ඤාතකා භික්ඛුං පහිණන්ති -පෙ- ගොත්තරක්ඛිතාය ගොත්තා භික්ඛුං පහිණන්ති -පෙ- ධම්මරක්ඛිතාය සහධම්මිකා භික්ඛුං පහිණන්ති -පෙ- සාරක්ඛාය යෙන-පරිග්ගහිතා හොති සො භික්ඛුං පහිණාති -පෙ- සපරිදණ්ඩාය යෙන දණ්ඩො ඨපිතො හොති සො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස; සපරිදණ්ඩාය යෙන දණ්ඩො ඨපිතො හොති සො භික්ඛුං පහිණාති, "ගච්ඡ භන්තෙ. ඉත්ථන්නාමං බ්‍රූහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී -පෙ- භොගවාසිනී -පෙ- පටවාසිනී -පෙ- ඔදපත්තකිනී -පෙ- ඔභටචුම්බටා, දාසී ච භරියා ච -පෙ- කම්මකාරී ච භරියා ච -පෙ- ධජාහටා -පෙ- මුහුත්තිකා"'ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

නික්ඛෙපපදානි.

49. සපරිදණ්ඩාය යෙන දණ්ඩො ඨපිතො හොති, සො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච -පෙ- ධනක්කීතා ච භොගවාසිනී ච -පෙ- ධනක්කීතා ච මුහුත්තිකා චා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

ඛණ්ඩචක්කං.

50. සපරිදණ්ඩාය යෙන දණ්ඩො ඨපිතො හොති සො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී ච භොගවාසිනී ච -පෙ- ඡන්දවාසිනී ච මුහුත්තිකා ච -පෙ- ඡන්දවාසිනී ච ධනක්කීතා චා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදි-සෙසස්ස.

බද්ධචක්කං.

මූලං සංඛිත්තං.

### මේ දසමූලකය යි:

47. "වහන්ස, යනු මැන. 'මෙනම් ඇත්තහුට ධනක්‍රීත භාර්‍ය්‍යා ද ඡන්දවාසිනී භාර්‍ය්‍යා ද භොගවාසිනී භාර්‍ය්‍යා ද පටවාසිනී භාර්‍ය්‍යා ද ඕදපත්තකිනී භාර්‍ය්‍යා ද ඔභටචුම්බටා භාර්‍ය්‍යා ද දාසීභාර්‍ය්‍යා ද කම්මකාරිණීභාර්‍ය්‍යා ද ධජාහටා-භාර්‍ය්‍යා ද මුහුත්තිකාභාර්‍ය්‍යා ද වව"යි මෙනම් ඇත්තියට කියන්නැ"යි කියා මාතෘරක්ෂිතාවකගේ මවක් මහණකු යවා ද පිළිගණී ද විමසා ද පිළිතුරු ගෙණ ඒ ද සඞ්ඝාවශෙසස්ඇවැත් වන්නේ ය.

### මාතෘචක්‍රය නිමියේ ය.

48. පිතුරක්ඛිතාවගේ පියා මහණකු මෙහෙයයි. ... මාතාපිතුරක්ඛිතා-වගේ මවුපියෝ මහණකු මෙහෙයත් ... භාතුරක්ඛිතාවගේ සොහොයුරු මහණකු මෙහෙයයි. ... භගිනීරක්ඛිතාවගේ බුහුනතිය මහණකු මෙහෙයයි. ... ඤාතිරක්ඛිතාවගේ නෑයෝ මහණකු මෙහෙයත්. ... ගොත්තරක්ඛිතාවගේ ගොත්‍රිකයෝ මහණකු මෙහෙයත්. ... ධම්මරක්ඛිතාවගේ සහධාර්මිකයෝ මහණකු මෙහෙයත්. ... සාරක්ඛාව පිළිබඳ යමකු විසින් පරිගෘහීත වේ ද හෙතෙමේ මහණකු මෙහෙයයි. ... සපරිදණ්ඩාව පිළිබඳ යමකු විසින් දඩ තබන ලද්දේ වේ ද හෙතෙමේ මහණකු මෙහෙයයි. 'වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තියට කියනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්කීතා භාර්‍ය්‍යා වේවා"යි පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද. සඞ්ඝාවශෙසස්ඇවැත් වේ. සපරිදණ්ඩාව පිළිබඳ යමකු විසින් දඩ තබන ලද්දේ වේ ද හෙතෙමේ මහණකු මෙහෙයයි 'වහන්ස, යනු මැනව මෙනම් ඇත්තියට කියනු මැනව. මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී. ... භොගවාසිනී ... පටවාසිනී ... ඕදපත්තකිනී ... ඔභටචුම්බටා ... දාසීභරියා ... කම්මකාරී භරියා ... ධජාහටා ... මුහුත්තිකා ද භාර්‍ය්‍යා වේවා" යි මහණ මෙහෙයා ද, හේ පිළිගණී ද, විමසයි ද පිළිතුරු ගෙණ එයි ද, සඞ්ඝාවශෙසස්ඇවැත් වේ.

### නිඃක්ෂෙපපදයෝ යි.

49. සපරිදණ්ඩාව පිළිබඳ ව යමකු විසින් දඩ තබන ලද්දේ වේ ද හෙ තෙමේ මහණකු මෙහෙය යි. "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තියට කියනු මැනව. මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී ද භොගවාසිනී ද ... ඡන්ද-වාසිනී ද මුහුත්තිකා ද... ඡන්දවාසිනී ද ධනක්කීතා ද භාර්‍ය්‍යා වේවා" යි මහණකු මෙහෙයා ද හේ පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඞ්ඝාවශෙසස්-ඇවැත් වේ.

### ඛණ්ඩචක්‍රය යි.

50. සපරිදණ්ඩාව පිළිබඳව යමකු විසින් දඩ තබන ලද්දේ වේ ද හෙතෙමේ "වහන්ස, යනු මැනව, මෙනම් ඇත්තියට කියනු මැනව, මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී ද, භොගවාසිනී ද ... ඡන්දවාසිනී ද, මුහුත්තිකා ද ... ඡන්දවාසිනී ද, ධනක්කීතා ද භාර්‍ය්‍යා වේවා" යි මෙනම් ඇත්තියට කියනු මැනව" යි මහණකු මෙහෙයා ද, හේ මහණ පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඞ්ඝාවශෙසස්ඇවැත් වේ.

### බද්ධචක්‍රය යි.

### මූලය සංක්ෂිප්ත යි.

51. සපරිදණ්ඩාය යෙන දණ්ඩො ඨපිතො හොති සො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා මුහුත්තිකා ච ධනක්කීතා ච -පෙ- මුහුත්තිකා ච ඡන්දවාසිනී ච -පෙ- මුහුත්තිකා ච ධජාහටා චා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**එකමූලකං නිට්ඨිතං.**

**දුමූලකම්පි තිමූලකම්පි යාව නවමූලකං එවමෙව කාතබ්බං.**

**ඉදං දසමූලකං:**

52. සපරිදණ්ඩාය යෙන දණ්ඩො ඨපිතො හොති සො භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොතු ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී ච පටවාසිනී ච ඔදපත්තකිනී ච, ඔභටචුම්බටා ච, දාසී ච භරියා ච, කම්මකාරී ච භරියා ච, ධජාහටා ච, මුහුත්තිකා චා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**දණ්ඩඨපිතචක්කං නිට්ඨිතං.**

53. මාතුරක්ඛිතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

54. මාතුරක්ඛිතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී -පෙ- භොගවාසිනී -පෙ- පටවාසිනී -පෙ- ඔදපත්තකිනී -පෙ- ඔභටචුම්බටා -පෙ- දාසී ච භරියා ච -පෙ- කම්මකාරී ච භරියා ච ධජාහටා -පෙ- මුහුත්තිකා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**නික්ඛෙපපදානි.**

55. මාතුරක්ඛිතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී චා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. මාතුරක්ඛිතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච භොගවාසිනී ච -පෙ- ධනක්කීතා ච මුහුත්තිකා චා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**ඛණ්ඩචක්කං.**

56. මාතුරක්ඛිතා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රූහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී ච භොගවාසිනී ච -පෙ- ඡන්දවාසිනී ච මුහුත්තිකා ච -පෙ- ඡන්දවාසිනී ච ධනක්කීතා චා" ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**බද්ධචක්කං.**

**මූලං සඞ්ඛිත්තං,**

51. සපරිදණ්ඩාව පිළිබඳ ව යමකු විසින් දඩ තබන ලද්දේ වේ ද හෙතෙමේ "වහන්ස, යනු මැනව, මෙනම් ඇත්තහුට මුහුත්තිකා ද, ධනක්කීතා ද ... මුහුත්තිකා ද, ඡන්දවාසිනී ද ... මුහුත්තිකා ද ධජාහටා ද භාර්‍යා වේවා" යි මෙනම් ඇත්තියට කියනු මැනව' යි මහණකු මෙහෙයා ද ඒ මහණ එය පිළිගණී ද, විමසා ද, පිළිතුරු ගෙණ ඒ ද, සඟවෙසෙස්-ඇවැත් වේ.

එකමූලකය නිමි.

දුමූලකය ද, තිමූලකය ද, නවමූලකය තෙක් මෙසේ ම කටයුතු යි.

මේ දසමූලකය යි:

52. සපරිදණ්ඩාව පිළිබඳ ව යමකු විසින් දඩ තබන ලද්දේ වේ ද, හෙතෙමේ මහණකු මෙහෙයයි "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්කීතා ද, ඡන්දවාසිනී ද, භොගවාසිනී ද, පටවාසිනී ද, ඔදපත්තකිනී ද, ඔභටචුම්බටා ද, දාසීභරියා ද, කම්මකාරීභරියා ද, ධජාහටා ද, මුහුත්තිකා ද භාර්‍යා වේවා" යි මෙනම් ඇත්තියට කියනු මැනව' යි මහණකු මෙහෙයයි ද, එ මහණ පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

දණ්ඩඵසිතචක්‍රය නිමි

53. මාතුරක්ඛිතාවක් තොමෝ "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්කීතා භාර්‍යා වෙමි" යි මෙනම් ඇත්තහුට කියනු මැනව'යි මහණකු මෙහෙයා ද, මහණ එය පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

54. මාතුරක්ඛිතාවක් "වහන්ස, යනු මැනව, මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී ... භොගවාසිනී ... පටවාසිනී ... ඔදපත්තකිනී ... ඔභටචුම්බටා ... දාසීභරියා ... කම්මකාරීභරියා ... ධජාහටා ... මුහුත්තිකා භාර්‍යා වෙමි"යි මෙ නම් ඇත්තහුට කියනු මැනව' යි මහණකු මෙහෙයා ද, පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

නිඃක්ෂෙපපදයෝ යි.

55. මාතුරක්ඛිතාවක් "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට කියනු මැනව. මෙනම් ඇත්තහුට ධනක්කීතා ද, ඡන්දවාසිනී ද භාර්‍යා වෙමි" යි මෙනම් ඇත්තහුට කියනු මැනව' යි මහණකු මෙහෙයා ද ඒ මහණ එය පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඟවෙසෙස්ඇවැත් වේ. මාතුරක්ඛිතාවක් "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට ධනක්කීතා ද, භොගවාසිනී ද ... ධනක්කීතා ද, මුහුත්තිකා ද භාර්‍යා වෙමි' යි මෙනම් ඇත්තහුට කියනු මැනව' යි මහණකු මෙහෙයයි ද, ඒ මහණ එය පිළිගණීයි ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

ඛණ්ඩචක්‍රය යි.

56. මාතුරක්ඛිතාවක් මහණකු මෙහෙය යි, "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී ද, භොගවාසිනී ද ... ඡන්දවාසිනී ද, මුහුත්තිකා ද ... ඡන්දවාසිනී ද, ධනක්කීතා ද භාර්‍යා වෙමි"යි මෙනම් ඇත්තහුට කියනු මැනව" යි මහණකු මෙහෙයා ද, ඒ මහණ පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

බද්ධචක්‍රය යි.

මූලය සංක්ෂිප්ත යි.

57. මාතුරක්ඛිතා භික්ඛුං පහිණති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා මුහුත්තිකා ච ධනක්කීතා ච -පෙ- මුහුත්තිකා ච ඡන්දවාසිනී ච -පෙ- මුහුත්තිකා ච ධජාහටා වා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

එකමූලකං නිට්ඨිතං.

දුමූලකාදීනිපි එවමෙව කාතබ්බානි.

ඉදං දසමූලකං:

58. මාතුරක්ඛිතා භික්ඛුං පහිණති- "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී ච පටවාසිනී ච ඔදපත්තකිනී ච ඔභටචුම්බටා ච දාසී ච භරියා ච කම්මකාරී ච භරියා ච ධජාහටා ච මුහුත්තිකා වා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

අපරං මාතුරක්ඛිතාවක්කං නිට්ඨිතං.

59. පිතුරක්ඛිතා භික්ඛුං පහිණති -පෙ- මාතාපිතුරක්ඛිතා භික්ඛුං පහිණති -පෙ- භාතුරක්ඛිතා භික්ඛුං පහිණති -පෙ- භගිනිරක්ඛිතා භික්ඛුං පහිණති -පෙ- ඤාතිරක්ඛිතා භික්ඛුං පහිණති -පෙ- ගොත්තරක්ඛිතා භික්ඛුං පහිණති-පෙ- ධම්මරක්ඛිතා භික්ඛුං පහිණති -පෙ- සාරක්ඛා භික්ඛුං පහිණති, -පෙ- සපරිදණ්ඩා භික්ඛුං පහිණති "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

60. සපරිදණ්ඩා භික්ඛුං පහිණති, "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභටචුම්බටා, දාසී ච භරියා ච, කම්මකාරී ච භරියා ච, ධජාහටා, මුහුත්තිකා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

නික්ඛෙපපදානි.

61. සපරිදණ්ඩා භික්ඛුං පහිණති:- "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච -පෙ- ධනක්කීතා මුහුත්තිකා වා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

ඛණ්ඩචක්කං.

62. සපරිදණ්ඩා භික්ඛුං පහිණති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ඡන්දවාසිනී ච භොගවාසිනී ච -පෙ- ඡන්දවාසිනී ච මුහුත්තිකා ච -පෙ- ඡන්දවාසිනී ච ධනක්කීතා වා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

බද්ධචක්කං.

මූලං සඞ්ඛිත්තං.

57. මාතුරක්ඛිතාවක් "වහන්ස, යනු මැනව. මෙතම් ඇත්තහුට මුහුත්තිකා ද, ධනක්කීතා ද ... මුහුත්තිකා ද ඡන්දවාසිනී ද ... මුහුත්තිකා ද ඔධපත්තකිනී ද භායමිා වෙම්'යි මෙතම් ඇත්තහුට කියනු මැනව'යි මහණකු මෙහෙයා ද, එ මහණ පිළිගණී ද විමසයි ද පිළිතුරු ගෙණ එයි ද සඟවෙසෙස්-ඇවැත් වේ.

එකමූලකය නිමි.

දුමූලකාදිහු ද මෙසේම කටයුත්තාහ.

මේ දසමූලකය යි:

58. මාතුරක්ඛිතාවක් "වහන්ස, යනු මැනව. මෙතම් ඇත්තහුට ධනක්කීතා ද, ඡන්දවාසිනී ද, භොගවාසිනී ද, පටවාසිනී ද, ඔදපත්තකිනී ද, ඔභටචුම්බටා ද, දාසීභරියා ද, කම්මකාරී භරියා ද, ධජාහටා ද, මුහුත්තිකා ද, භායමිා වෙම්"යි මෙතම් ඇත්තහුට කියනු මැනව"යි මහණකු මෙහෙයා ද, එ මහණ පිළිගණීයි ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඟවෙසෙස්-ඇවැත් වේ.

අපර මාතුරක්ඛිතාවක්‍රය නිමි.

59. පිතුරක්ඛිතාවක් ... මාතුරක්ඛිතාවක් ... භාතුරක්ඛිතාවක් ... භගිනිරක්ඛිතාවක් ... ඤාතිරක්ඛිතාවක් ... ගොත්තරක්ඛිතාවක් ... ධම්මරක්ඛිතාවක් ... සාරක්ඛාවක් ... සපරිදණ්ඩාවක් "වහන්ස, යනු මැනව. මෙතම් ඇත්තහුට ධනක්කීතා භායමිා වෙම්'යි මෙතම් ඇත්තහුට කියනු මැනව"යි මහණකු මෙහෙයා ද, පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඟවෙසෙස්ඇවැත් වේ.

60. සපරිදණ්ඩාවක් "වහන්ස, යනු මැනව. මෙතම් ඇත්තහුට ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභටචුම්බටා, දාසී භරියා කම්මකාරීභරියා, ධජාහටා මුහුත්තිකා භායමිා වෙම්"යි මෙතම් ඇත්තහුට කියනු මැනව'යි මහණකු මෙහෙයා ද එ මහණ එය පිළිගණී ද විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඟවෙසෙස්ඇවැත් වේ.

නිඃක්ෂෙපපදයෝ යි.

61. සපරිදණ්ඩාවක් "වහන්ස, යනු මැනව. මෙතම් ඇත්තහුට ධනක්කීතා ද, ඡන්දවාසිනී ද ... ධනක්කීතා ද මුහුත්තිකා ද භායමිා වෙම්'යි මෙතම් ඇත්තහුට කියනු මැනව"යි මහණකු මෙහෙයා ද පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඟවෙසෙස්ඇවැත් වේ.

ඛණ්ඩචක්‍රය යි.

62. සපරිදණ්ඩාවක් 'වහන්ස, යනු මැනව. මෙතම් ඇත්තහුට ඡන්දවාසිනී ද, භොගවාසිනී ද, ... ඡන්දවාසිනී ද මුහුත්තිකා ද ... ඡන්දවාසිනී ද ධනක්කීතා ද භායමිා වෙම්'යි මෙතම් ඇත්තහුට කියනු මැනව"යි මහණකු මෙහෙයා ද එ මහණ එය පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

බද්ධචක්‍රය යි.

මූලය සංක්ෂිප්ත යි.

63. සපරිදණ්ඩා භික්ඛුං පහිණාති: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා මුහුත්තිකා ච ධනක්කීතා ච -පෙ- මුහුත්තිකා ච ඡන්දවාසිනී ච -පෙ- මුහුත්තිකා ච ධජාහටා චා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**එකමූලකං නිට්ඨිතං.**

**දුමූලකාදීනිපි එවමෙව කාතබ්බානි.**

**ඉදං දසමූලකං:**

64. සපරිදණ්ඩා භික්ඛුං පහිණාති:- "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං බ්‍රෑහි: "හොමි ඉත්ථන්නාමස්ස භරියා ධනක්කීතා ච ඡන්දවාසිනී ච භොගවාසිනී ච පටවාසිනී ච ඔදපත්තකිනී ච ඔභටචුම්බටා ච දාසී ච භරියා ච කම්මකාරී ච භරියා ච ධජාහටා ච මුහුත්තිකා චා"ති. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**සපරිදණ්ඩාචක්කං.**

**සබ්බං චක්කපෙය්‍යාලං නිට්ඨිතං.**

65. පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

පතිගණ්හාති වීමංසති න පච්චාහරති, ආපත්ති ථුල්ලච්චයස්ස.

පතිගණ්හාති න වීමංසති පච්චාහරති, ආපත්ති ථුල්ලච්චයස්ස.

පතිගණ්හාති න වීමංසති, න පච්චාහරති, ආපත්ති දුක්කටස්ස.

න පතිගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති ථුල්ලච්චයස්ස.

න පතිගණ්හාති වීමංසති න පච්චාහරති, ආපත්ති දුක්කටස්ස.

න පතිගණ්හාති න වීමසංති පච්චාහරති, ආපත්ති දුක්කටස්ස

න පතිගණ්හාති න වීමංසති න පච්චාහරති, අනාපත්ති.

66. පුරිසො සම්බහුලෙ භික්ඛූ ආණාපෙති:- "ගච්ඡථ භන්තෙ ඉත්ථන්නාමං ඉත්ථිං වීමංසථා"ති. සබ්බෙ පතිගණ්හන්ති සබ්බෙ වීමංසන්ති සබ්බෙ පච්චාහරන්ති, ආපත්ති සබ්බෙසං සඞ්ඝාදිසෙසස්ස.

67. පුරිසො සම්බහුලෙ භික්ඛූ ආණාපෙති:- "ගච්ඡථ භන්තෙ ඉත්ථන්නාමං ඉත්ථිං වීමංසථාති." සබ්බෙ පතිගණ්හන්ති සබ්බෙ වීමංසන්ති එකං පච්චාහරාපෙන්ති, ආපත්ති සබ්බෙසං සඞ්ඝාදිසෙසස්ස.

68. පුරිසො සම්බහුලෙ භික්ඛූ ආණාපෙති:- "ගච්ඡථ භන්තෙ ඉත්ථන්නාමං ඉත්ථිං වීමංසථා"ති. සබ්බෙ පතිගණ්හන්ති එකං වීමංසාපෙත්වා සබ්බෙ පච්චාහරන්ති, ආපත්ති සබ්බෙසං සඞ්ඝාදිසෙසස්ස.

63. සපරිද්දණ්ඩාවක් "වහන්ස, යනු මැනව. මෙනම් ඇත්තහුට මුහුත්තිකා ද, ධනක්කීතා ද ... මුහුත්තිකා ද ඡන්දවාසිනී ද ... මුහුත්තිකා ද ධජාහටා ද භාගයීා වෙමි'යි මෙනම් ඇත්තහුට කියනු මැනව"යි මහණකු මෙහෙයා ද, එ මහණ එය පිළිගණී ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

එකමූලකය නිමි.

දිමූලකාදීහු ද මෙසේ ම කටයුත්තාහ.

මේ දසමූලකය යි:

64. සපරිද්දණ්ඩාවක් "වහන්ස, යනු මැනව. 'මෙනම් ඇත්තහුට ධනක්කීතා ද, ඡන්දවාසිනී ද, භොගවාසිනී ද, පටවාසිනී ද, ඔදපත්තකිනී ද, ඔහටචුම්බටා ද, දසීභරියා ද, කම්මකාරී භරියා ද, ධජාහටා ද, මුහුත්තිකා ද භාගයීා වෙමි'යි මෙනම් ඇත්තහුට කියනු මැනව"යි මහණකු මෙහෙයා ද එ මහණ එය පිළිගණියි ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඞ්ඝවෙසෙස්-ඇවැත් වේ.

සපරිද්දණ්ඩා චක්‍රය යි.

චක්කපෙයාාලය හැම නිමි.

65. පිළිගණියි ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, සඞ්ඝවෙසෙස්-ඇවැත් වේ. පිළිගණියි ද, විමසයි ද, පිළිතුරු නොම ගෙණ එයි ද ථුල්ලැසි-ඇවැත් වේ. පිළිගණියි ද, නොවිමසයි ද, පිළිතුරු ගෙණ එයි ද ථුල්ලැසිඇවැත් වේ. පිළිගණියි ද, නො විමසයි ද පිළිතුරු නොම ගෙණ එයි ද, දුකුළා-ඇවැත් වේ. නො පිළිගණියි ද විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද, ථුල්ලැසි-ඇවැත් වේ. නො පිළිගණියි ද. විමසයි ද, පිළිතුරු නොම ගෙණ එයි ද, දුකුළාඇවැත් වේ. නො පිළිගණියි ද, නො විමසයි ද, පිළිතුරු නොම ගෙණ එයි ද ඇවැත් නොවේ.

66. පුරුෂයෙක් "වහන්ස, යන්න. මෙනම් ස්ත්‍රිය විමසන්න"යි බොහෝ මහණුන් අණවයි, සියල්ලෝ ම පිළිගණීත් ද, සියල්ලෝ ම විමසත් ද, සියල්ලෝ ම පිළිතුරු ගෙණ එත් ද, සියල්ලන්ට ම සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

67. පුරුෂයෙක් "වහන්ස, යන්න, මෙනම් ස්ත්‍රිය විමසන්න"යි බොහෝ මහණුන් අණවයි, සියල්ලෝ ම පිළිගණීත් ද, සියල්ලෝ ම විමසත් ද, එක් මහණකු ලවා පිළිතුරු එළවත් ද, සියල්ලන්ට ම සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

68 .පුරුෂයෙක් "වහන්ස, යන්න. මෙනම් ස්ත්‍රිය විමසන්න"යි බොහෝ මහණුන් අණවයි. සියල්ලෝ ම පිළිගණීත් ද; එක් මහණකු ලවා විමසවා ද සියල්ලෝ ම පිළිතුරු එළවත් ද සියල්ලන්ට ම සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

69. පුරිසො සමබහුලෙ භිකඛූ ආණාපෙති:- "ගචඡථ භනෙත ඉතථනනාමං ඉතථිං වීමංසථා"ති. සබෙබ පටිගණහනති එකං වීමංසාපෙතවා එකං පචචා-හරාපෙනති, ආපතති සබෙබසං සඞඝාදිසෙසසස.

70. පුරිසො භිකඛුං ආණාපෙති:- "ගචඡ භනෙත ඉතථනනාමං ඉතථිං වීමංසා"ති. පටිගණහාති වීමංසති පචචාහරති, ආපතති සඞඝාදිසෙසසස.

71. පුරිසො භිකඛුං ආණාපෙති:- "ගචඡ භනෙත ඉතථනනාමං ඉතථිං වීමංසා"ති. පටිගණහාති වීමංසති අනෙතවාසිං පචචාහරාපෙති. ආපතති සඞඝාදිසෙසසස.

72. පුරිසො භිකඛුං ආණාපෙති:- "ගචඡ භනෙත ඉතථනනාමං ඉතථිං වීමංසා"ති. පටිගණහාති, අනෙතවාසිං වීමංසාපෙතවා අතතනා පචචාහරති, ආපතති සඞඝාදිසෙසසස.

73. පුරිසො භිකඛුං ආණාපෙති "ගචඡ භනෙත ඉතථනනාමං ඉතථිං වීමංසා"ති පටිගණහාති අනෙතවාසිං වීමංසාපෙති, අනෙතවාසී වීමංසිතවා බහිදධා පචචාහරති, ආපතති උභිනනං ථුලලචචයසස.

74. ගචඡනෙතා සමපාදෙති, ආගචඡනෙතා විසංවාදෙති, ආපතති ථුලලචචයසස. ගචඡනෙතා විසංවාදෙති, ආගචඡනෙතා සමපාදෙති, ආපතති ථුලලචචයසස. ගචඡනෙතා සමපාදෙති, ආගචඡනෙතා සමපාදෙති, ආපතති සඞඝාදිසෙසසස. ගචඡනෙතා විසංවාදෙති, ආගචඡනෙතා විසංවාදෙති, අනාපතති.

75. අනාපතති සඞඝසස වා චෙතියසස වා ගිලානසස වා කරණීයෙන ගචඡති, උමමතතකසස, ආදිකමමිකසසාති.

---

## විනීතවතථු

**උදදානගාථා:**

සුතතා මතා ච නිකඛනතා අතථි ඉතථිපණඩකා,
කලහං කතවාන සමෙමාදි සඤචරිතතඤච පණඩකෙති.

1. තෙන ඛො පන සමයෙන අඤඤතරො පුරිසො අඤඤතරං භිකඛුං ආණාපෙසි:- "ගචඡ භනෙත ඉතථනනාමං ඉතථිං වීමංසා"ති. සො ගනතවා මනුසෙස පුචඡි:- "කහං ඉතථනනාමා"ති "සුතතා භනෙත"ති තසස කුකකු-චචං අහොසි. "කචචි නු ඛො අහං සඞඝාදිසෙසං ආපතතිං ආපනෙනා"ති. භගවතො එතමතථං ආරොචෙසි -පෙ- "අනාපතති භිකඛු සඞඝාදිසෙසසස; ආපතති දුකකටසසා"ති (1)

69. පුරුෂයෙක් 'වහන්ස, යන්න. මෙනම් ස්ත්‍රිය විමසන්න"යි බොහෝ මහණුන් අණවයි'ද සියල්ලෝ ම පිළිගණිත් ද එක් මහණකු ලවා විමසවා ද එක් මහණකු ලවා පිළිතුරු එළවා ද සියල්ලන්ට ම සඟවෙසෙස්ඇවැත් වේ.

70. පුරුෂයෙක් "වහන්ස, යනු මැනව. මෙනම් ස්ත්‍රිය විමසන්න"යි මහණකු අණවයි. පිළිගණියි ද, විමසයි ද, පිළිතුරු ගෙණ එයි ද සඟවෙසෙස්-ඇවැත් වේ.

71. පුරුෂයෙක් "වහන්ස, යනු මැනව. මෙනම් ස්ත්‍රිය විමසන්න"යි මහණකු අණවයි ද, පිළිගණියි ද, විමසයි ද, අතැවැසි මහණකු ලවා පිළිතුරු එළවයි ද සඟවෙසෙස්ඇවැත් වේ.

72. පුරුෂයෙක් "වහන්ස, යනු මැනව. මෙනම් ස්ත්‍රිය විමසන්න"යි මහණකු අණවයි ද, පිළිගණියි. අතැවැසි මහණකු ලවා විමසවා තෙමේ පිළිතුරු ගෙණ එයි ද, සඟවෙසෙස්ඇවැත් වේ.

73. පුරුෂයෙක් "වහන්ස, යනු මැනව. මෙනම් ස්ත්‍රිය විමසන්න"යි මහණකු අණවයි ද, පිළිගණියි ද, අතැවැසි මහණකු ලවා විමසවයි ද, අතැවැසි තෙමේ විමසා බැහැරට පිළිතුරු එළවයි ද දෙදෙනාටම ථුල්ලසිඇවැත් වේ.

74. යන්නේ පිළිගණියි ද, විමසයි ද, පෙරළා එන්නේ පිළිතුරු නො පවසයි ද, ථුල්ලසිඇවැත් වේ. යන්නේ නො පිළිගණියි ද, එන්නේ විමසයි ද, පිළිතුරු එළවයි ද, ථුල්ලසිඇවැත් වේ. යන්නේ පිළිගණියි ද, එන්නේ විමසයි ද, පිළිතුරු එළවයි ද සඟවෙසෙස්ඇවැත් වේ. යන්නේ නො පිළිගණියි ද, නො විමසයි ද, එන්නේ පිළිතුරු නො එළවයි ද, ඇවැත් නොවේ.

75. සංඝයා පිළිබඳ හෝ චෛත්‍යය පිළිබඳ හෝ ගිලනුන් පිළිබඳ හෝ කටයුත්තකින් යෙයි ද ඔහුට ද උන්මත්තකයාට ද ආදිකම්මිකයාට ද ඇවැත් නොවේ.

## විනීතවත්ථු

**උද්දානගාථා.**

සුත්තාය, මතාය, නික්ඛන්තාය, අත්ථිය, ඉත්ථිපණ්ඩකාය, කලහසම්මො-දනය, පණ්ඩකසඤ්චරිත්තය යි මෙහි වස්තු සතෙකි.

1. එසමයෙහි එක්තරා පුරුෂයෙක් "වහන්ස, යනු මැනව. මෙ නම් ස්ත්‍රිය විමසන්නැ"යි එක්තරා මහණකු ඇණවී ය. හෙතෙමේ ගොස් "මෙනම් තැනැත්තී කොහිද"යි මිනිසුන් විචාළේ ය. "වහන්ස, ඕ නිද්‍රොපගත ය"යි මිනිස්සු කීහ. "කිම්? මම සඟවෙසෙස්ඇවැත් අවන්නෙම්ද"යි ඒ මහණහට කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කෙළේය.... "මහණ, සඟවෙසෙස්ඇවැත් නොවේ. දුකුලා ඇවැත් වේ."යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. (1)

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො අඤ්ඤතරං භික්ඛුං ආණාපෙසි: "ගච්ඡ භන්තෙ ඉත්ථන්නාමං ඉත්ථිං වීමංසා"ති. සො ගන්ත්වා මනුස්සෙ පුච්ඡි: "කහං ඉත්ථන්නාමා"ති "මතා භන්තෙ"ති -පෙ- "නික්ඛන්තා භන්තෙ"ති, 'අනිත්ථී භන්තෙ"ති, "ඉත්ථිපණ්ඩකා භන්තෙ"ති. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති දුක්කටස්සාති. (2–5)

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා ඉත්ථී සාමිකෙන සහ භණ්ඩිත්වා මාතුඝරං අගමාසි. කුලූපගො භික්ඛු සම්මොදනීයං අකාසි. තස්ස කුක්කුච්චං අහොසි -පෙ- "අලංවචනීයා භික්ඛු"ති? "නාලංවචනීයා භගවා"ති. "අනාපත්ති භික්ඛු නාලංවචනීයායා"ති. (6)

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු පණ්ඩකෙ සඤ්චරිත්තං සමාපජ්ජි. තස්ස කුක්කුච්චං අහොසි:– කච්චි නු ඛො අහං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපන්නොති. භගවතො එතමත්ථං ආරොචෙසි -පෙ- "අනාපත්ති භික්ඛු සඞ්ඝාදිසෙසස්ස; ආපත්ති ථුල්ලච්චයස්සා"ති. (7)

**සඤ්චරිත්ත සික්ඛාපදං නිට්ඨිතං**

## 3. 6.

## කුටිකාරසික්ඛාපදං

11. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආළවකා භික්ඛූ සඤ්ඤාචිකායො කුටියො කාරාපෙන්ති අස්සාමිකායො අත්තුද්දෙසිකායො අප්පමාණිකායො, තායො න නිට්ඨානං ගච්ඡන්ති. තෙ යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරන්ති: "පුරිසං දෙථ, පුරිසත්ථකරං දෙථ, ගොණං දෙථ, සකටං දෙථ, වාසිං දෙථ, ඵරසුං දෙථ, කුඨාරිං දෙථ, කුද්දාලං දෙථ, නිඛාදනං දෙථ, වල්ලිං දෙථ, වෙළුං දෙථ, මුඤ්ජං දෙථ, බබ්බජං දෙථ, තිණං දෙථ, මත්තිකං දෙථා"ති. මනුස්සා උපද්දුතා යාචනාය, උපද්දුතා විඤ්ඤත්තියා භික්ඛූ දිස්වා උබ්බිජ්ජන්තිපි උත්තසන්තිපි පලායන්තිපි අඤ්ඤෙනපි ගච්ඡන්ති අඤ්ඤෙනපි මුඛං කරොන්ති ද්වාරම්පි ථකෙන්ති, ගාවිම්පි දිස්වා පලායන්ති, භික්ඛූ මඤ්ඤමානා.

12. අථ ඛො ආයස්මා මහාකස්සපො රාජගහෙ වස්සං වුත්ථො යෙන ආළවී තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන ආළවී තදවසරි. තත්‍ර සුදං ආයස්මා මහාකස්සපො ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. අථ ඛො ආයස්මා මහාකස්සපො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ආළවිං පිණ්ඩාය පාවිසි. මනුස්සා ආයස්මන්තං මහාකස්සපං පස්සිත්වා උබ්බිජ්ජන්තිපි උත්තසන්තිපි පලායන්තිපි අඤ්ඤෙනපි ගච්ඡන්ති අඤ්ඤෙනපි මුඛං කරොන්ති ද්වාරම්පි ථකෙන්ති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආළවියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො භික්ඛූ ආමන්තෙසි:

2. එසමයෙහි එක්තරා පුරුෂයෙක්, "වහන්ස, යනු මැනව. මෙ නම් ස්ත්‍රිය විමසන්නැ"යි එක්තරා මහණකු ඇණවී ය. හෙතෙමේ ගොස්, "මෙ නම් තැනැත්තිය කොහිදැ?"යි මිනිසුන් විචාළේ ය. "වහන්ස, ඕ මළාය"යි ඔහු කීහ.... "වහන්ස, ඕ නික්ම ගියා ය." ... "වහන්ස, ඒ ස්ත්‍රියක් නොවේ." ... "වහන්ස, ඕ ස්ත්‍රීපණ්ඩකාවකැ"යි ඔහු කීහ. ඒ මහණහට කුකුස් විය.... "මහණ, සඞඝාදිසෙසස්ඇවැත් නො වේ. දුකුළාඇවැත් වේ." (2-5)

3. එසමයෙහි එක්තරා ස්ත්‍රියක් හිමියා සමග ඩබර කොට ගෙණ මවුගේ ගෙට ගියා ය. කුලූපග මහණෙක් ඈය ඔවා දී සහසා සැමියා වෙත පෙරළා යැවී ය. ඒ මහණහට කුකුස් විය.... "මහණ, සැමියා විසින් අනුශාසා නොවූවක් වේ ද?"... "භාග්‍යවතුන් වහන්ස, එසේ අනුශාස්‍යවූවක් නොවේ"... "මහණ, අනුශාස්‍යවූවක පිණිස ඇවැත් නොවේ." (6)

4. එ සමයෙහි එක්තරා මහණෙක් පණ්ඩකයකු කෙරෙහි සංචරණ-භාවයට පැමිණියේ ය. ඒ මහණහට "කිමි? මම් සඞඝාදිසෙසස්ඇවැත් අවන්නෙම් දෝ"යි කුකුස් විය. භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කෙළේ ය. ... "මහණ, සඞඝාදිසෙසස්ඇවැත් නොවේ. ථුල්ලච්චයඇවැත් වේ"... (7)

**සඤ්චරිත්තශික්ෂාපදය නිමි.**

# 3. 6.

## කුටිකාරශික්ෂාපදය

1. එ සමයෙහි භාග්‍යවතුන් වහන්සේ කලන්දක නිවාප නම් වූ වේළුවන-යෙහි වැඩවසන සේක. එකල්හි අළවු රට වැසි මහණහු ඉල්ලාගත් උපකරණ ඇති, කරවා දෙන හිමියන් නැති, ඉක්මවූ පමණ ඇති, තමන් උදෙසා වූ කුටි කරවත්. ඒ කුටීහු නිමාවට නොයෙත්. ඒ මහණහු "පුරුෂයකු දෙන්න, අත්තමක් දෙන්න, ගොණකු දෙන්න, ගැලක් දෙන්න, වෑයක් දෙන්න, පොරොවක් දෙන්න, කෙටේරියක් දෙන්න, උදැල්ලක් දෙන්න, නියනක් දෙන්න, වැලක් දෙන්න, හුණගසක් දෙන්න, මුදුතණ දෙන්න, බබුස්තණ දෙන්න, කුසතණ දෙන්න, මැටි දෙන්නැ"යි යැදීම් බහුල කොටැති ව විනවීම් බහුල කොටැති ව වෙසෙත්. මිනිස්සු ආයාචනයෙන් මිරිකුනෝ, විනවීමෙන් මිරිකුනෝ මහණුන් දැක උද්වේගයට ද පැමිණෙත්. තැති ද ගණිත්. පලා යැම ද කෙරෙත්. අන් මගෙකින් ද යත්. අන් දිගකට මුහුණ ද පෙරළත්. දොර ද වසත්. ඈත දෙනක ද දැක "මහණහු"යි හඟිමින් පලායෙත්.

2. එකල්හි **මහසුප්** තෙරණුවෝ රජගහනුවර වස් වැස පවරා **අළවු** නුවරට වැඩියහ. එසමයෙහි මහසුප් තෙරණුවෝ අළවු නුවරට නොදුරු නොළං තන්හි වූ **අග්ගාලව** නම් චෛත්‍යස්ථානයෙහි වෙසෙත්. ඉක්බිති මහසුප් තෙරණුවෝ පෙරවරු හැඳ පෙරෙව පා සිවුරු ගෙණ අළවු නුවරට පිඬු පිණිස පිවිසියහ. මිනිස්සු තෙරුන් දැක උද්විග්න වෙත්. තැති ගණිත්. පලා යෙත්. මග වළහා යෙත්. මුහුණ අන් අතකට ද පෙරළත්. දොර ද පියත්. ඉක්බිති මහසුප් තෙරණුවෝ අළවු නුවර පිඬු පිණිස හැසිර පිඬුවාසෙන් වැළකුණෝ පසුබත්හි භික්ෂූන් අමතා මෙසේ වදාළහ:

“පුබ්බායං ආවුසො ආළවී සුභික්ඛා අහොසි සුලභපිණ්ඩා සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. එතරහි පනායං ආළවී දුබ්භික්ඛා දුල්ලභපිණ්ඩා න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. කො නු ඛො ආවුසො හෙතු කො පච්චයො යෙනායං ආළවී දුබ්භික්ඛා දුල්ලභපිණ්ඩා න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතු”න්ති. අථ ඛො තෙ භික්ඛූ ආයස්මතො මහාකස්සපස්ස එතමත්ථං ආරොචෙසුං.

3. අථ ඛො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා යෙන ආළවී තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ආළවී තදවසරි. තත්‍ර සුදං භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. අථ ඛො ආයස්මා මහාකස්සපො යෙන භගවා, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහාකස්සපො භගවතො එතමත්ථං ආරොචෙසි.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආළවකෙ භික්ඛූ පටිපුච්ඡි: “සච්චං කිර තුම්හෙ භික්ඛවෙ සඤ්ඤාචිකායො කුටියො කාරාපෙථ අස්සාමිකායො අත්තුද්දෙසිකායො අප්පමාණිකායො, තායො න නිට්ඨානං ගච්ඡන්ති. තෙ තුම්හෙ යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරථ, පුරිසං දෙථ, පුරිසත්ථකරං දෙථ, -පෙ- තිණං දෙථ, මත්තිකං දෙථා”ති. මනුස්සා උපද්දුතා යාචනාය, උපද්දුතා විඤ්ඤත්තියා භික්ඛූ දිස්වා උබ්බිජ්ජන්තිපි උත්තසන්තිපි පලායන්තිපි අඤ්ඤෙනපි ගච්ඡන්ති අඤ්ඤෙනපි මුඛං කරොන්ති ද්වාරම්පි ථකෙන්ති, ගාවිම්පි දිස්වා පලායන්ති භික්ඛූ මඤ්ඤමානා”ති. “සච්චං භගවා.”

5. විගරහි බුද්ධො භගවා: “කථං හි නාම තුම්හෙ මොඝපුරිසා සඤ්ඤාචිකායො කුටියො කාරාපෙස්සථ අස්සාමිකායො අත්තුද්දෙසිකායො අප්පමාණිකායො, තායො න නිට්ඨානං ගච්ඡන්ති. තෙ තුම්හෙ යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරිස්සථ: පුරිසං දෙථ පුරිසත්ථකරං දෙථ -පෙ- තිණං දෙථ මත්තිකං දෙථා”ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"ඇවැත්නි, මේ අළවුනුවර පෙර සුභික්ෂ විය. සුලභ පිඩු ඇති විය. පිඩු සිඟීමෙන් යැපීම පහසු විය. දැන් වනාහි මේ අළවුනුවර දුර්භික්ෂ ය. දුර්ලභ පිඩු ඇත්තේ ය. පිඩු සිඟීමෙන් යැපෙන්නට දුෂ්කර ය. ඇවැත්නි, යම් හෙයකින් මේ අළවුනුවර දුර්භික්ෂ නම්, දුර්ලභ පිඩු ඇත්තේ නම්, පිඩු සිඟීමෙන් යැපෙන්නට දුෂ්කර නම්, එයට හේතු කවරේ ද? ප්‍රත්‍යය කවරේ" ද? යනු යි. ඉක්බිති ඒ භික්ෂූහු මහසුප් මහතෙරුන්ට ඒ පවත් සැළ කළහ.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කැමැති තාක් වැස පිළිවෙළින් සැරි සරා වඩනා සේක්, අළවුනුවරට වැඩි සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ අළවුනුවර අග්ගාලව නම් චෛත්‍යස්ථානයෙහි වැඩ වසන සේක. ඉක්බිති මහසුප් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ වැඳ එකත්පසක ඉඳගත්හ. එකත් පසෙක හුන් මහසුප් තෙරණුවෝ භාග්‍ය-වතුන් වහන්සේට ඒ පවත් සැළ කළහ.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රකරණයෙහි (ප්‍රස්තාවයෙහි) භික්ෂුසඞ්ඝයා රැස් කරවා අළවුවැසි මහණුන්ගෙන් මෙසේ විචාළ සේක: "සැබෑද, මහණෙනි? තෙපි කරවා දෙන හිමියන් නැති, පමණ ඉක්ම වූ, තමන් ඉල්ලා ගත් උපකරණ ඇති, තමන් උදෙසා වූ කුටි කරවවු ද? ඒ කුටීහු නිමාවට නො යෙත් ද? ඒතෙපි "පුරුෂයකු දෙන්න, අත්තමක් දෙන්න, ... කුසතණ දෙන්න, මැටි දෙන්නැ"යි යැදීම් බහුල ව, විතවීම් බහුල, ව වසවු ද? මිනිස්සු යැදීමෙන් මිරිකුනෝ, විතවීමෙන් මිරිකුනෝ, මහණුන් දැක උද්වේගයට පැමිණෙත් ද? තැති ගණිත් ද? පලායෙත් ද? මඟ වළනා යෙත් ද? මුහුණු වෙත අතකට පෙරළත් ද? දොර වසත් ද? "මහණහු"යි හඟිමින් දෙනක ද දැක පලායෙත් ද?" "සැබව භාග්‍යවතුන් වහන්ස" යි ඒ මහණහු පිළිවදන් දුන්හ.

5. භාග්‍යවතුන් වහන්සේ ගැරැහූ සේක: "හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් ඉල්ලා ගත් උපකරණ ඇති, කරවා දෙන හිමියන් නැති, තමන් උදෙසා වූ, පමණ ඉක්ම වූ කුටි කරවවු ද?,... ඒ කුටීහි නිමාවට නොයෙත්. ඒ තෙපි "පුරුෂයකු දෙන්න, අත්තමක් දෙන්න කුස තණ දෙන්න, මැටි දෙන්නැ"යි යැදීම් බහුලව විතවීම් බහුලව වසවු ද? හිස් පුරුෂයෙනි, මෙය නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස ද නොවේ. ... යි ගරහා දැහැමි කතා කොට භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක:

6. භූතපුබ්බං භික්ඛවෙ ද්වෙ භාතරො ඉසයො ගඞ්ගං නදිං උපනිස්සාය විහරිංසු. අථ ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා ගඞ්ගං නදිං උත්තරිත්වා යෙන කණිට්ඨො ඉසි තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා කණිට්ඨං ඉසිං සත්තක්ඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා උපරි මුද්ධනි මහන්තං ඵණං කරිත්වා අට්ඨාසි. අථ ඛො භික්ඛවෙ කණිට්ඨො ඉසි තස්ස නාගස්ස භයා කිසො අහොසි ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො. අද්දසා ඛො භික්ඛවෙ ජෙට්ඨො ඉසි කණිට්ඨං ඉසිං කිසං ලූඛං දුබ්බණ්ණං උප්පණ්ඩුප්පණ්ඩුකජාතං ධමනිසන්ථතගත්තං, දිස්වාන කණිට්ඨං ඉසිං එතද-වොච: "කිස්ස ත්වං භො කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො"ති. ඉධ භො මණිකණ්ඨො නාගරාජා ගඞ්ගං නදිං උත්තරිත්වා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං සත්තක්ඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා උපරි මුද්ධනි මහන්තං ඵණං කරිත්වා අට්ඨාසි. තස්සාහං භො නාගස්ස භයා'ම්හි කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුක-ජාතො ධමනිසන්ථතගත්තො"ති. "ඉච්ඡසි පන ත්වං භො තස්ස නාගස්ස අනාගමනන්ති." "ඉච්ඡාමහං භො තස්ස නාගස්ස අනාගමනන්ති." "අපි පන ත්වං භො තස්ස නාගස්ස කිඤ්චි පස්සසී"ති "පස්සාමහං භො මණිස්ස කණ්ඨෙ පිළන්ධන"න්ති. "තෙන හි ත්වං භො තං නාගං මණිං යාච, මණිං මෙ භො දෙහි, මණිනා මෙ අත්ථො"ති.

7. අථ ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා ගඞ්ගං නදිං උත්තරිත්වා යෙන කණිට්ඨො ඉසි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො භික්ඛවෙ මණිකණ්ඨං නාගරාජානං කණිට්ඨො ඉසි එතදවොච: "මණිං මෙ භො දෙහි, මණිනා මෙ අත්ථො"ති. අථ ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා "භික්ඛු මණිං යාචති, භික්ඛුස්ස මණිනා අත්ථො"ති ඛිප්පඤ්ඤෙව අගමාසි. දුතියම්පි ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා ගඞ්ගං නදිං උත්තරිත්වා යෙන කණිට්ඨො ඉසි තෙනුපසඞ්කමි. අද්දසා ඛො භික්ඛවෙ කණිට්ඨො ඉසි මණිකණ්ඨං නාගරාජානං දූරතොව ආගච්ඡන්තං දිස්වාන මණි-කණ්ඨං නාගරාජානං එතදවොච: "මණිං මෙ භො දෙහි, මණිනා මෙ අත්ථො"ති. අථ ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා "භික්ඛු මණිං යාචති, භික්ඛුස්ස මණිනා අත්ථො"ති තතොව පටිනිවත්ති. තතියම්පි ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා ගඞ්ගං නදිං උත්තරති. අද්දසා ඛො භික්ඛවෙ කණිට්ඨො ඉසි මණිකණ්ඨං නාගරාජානං ගඞ්ගං නදිං උත්තරන්තං. දිස්වාන මණිකණ්ඨං නාගරාජානං එතදවොච: "මණිං මෙ භො දෙහි, මණිනා මෙ අත්ථො"ති. අථ ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා කණිට්ඨං ඉසිං ගාථාහි අජ්ඣභාසි:

"මමන්නපානං විපුලං උළාරං උප්පජ්ජතිමස්ස මණිස්ස හෙතු,
තං තෙ න දස්සං අතියාචකො'සි න චාපි තෙ අස්සමමාගමිස්සං.

සුසූ යථා සක්ඛරධොතපාණී තාසෙසි මං සෙලං යාචමානො,
තං තෙ න දස්සං අතියාචකො'සි න චාපි තෙ අස්සමමාගමිස්ස"න්ති.

6. මහණෙනි, පෙරවූවක් කියමි. දෙබෑ තවුස් කෙනෙක් ගංගා නදිය ඇසුරු කොට වුසූහ. මහණෙනි, එකල්හි මණිකණ්ඨ නම් නාරජ ගංගානදිය පිහිනා කණිට්ඨ තවුසා වෙත එළඹියේ ය. එළඹ සත් වටක් ඔහු දරණවැළින් වෙළා හිස මතුයෙහි මහත් සේ පෙණය කොට සිටියේ ය. මහණෙනි, එකල්හි කණිට්ඨ තවුස් තෙම ඒ නාරජුට බියෙන් වැහැරුණේ, රූක්ෂ වූයේ, විවර්ණ වූයේ, හටගත් පඬු පැහැ ඇත්තේ, නහර පතුළ සිරුර ඇත්තේ විය. මහණෙනි, දෙටු තවුස් තෙම වැහැරුනු රූක්ෂවූ විවර්ණවූ හටගත් පඬු පැහැති නහර පතුළ සිරුර ඇති කණිට්ඨ තවුසා දිටී. දැක ඔහුට "පින්වත, තෝ කවර හෙයින් වැහැරුනෙහි ද? රූක්ෂවූයෙහි ද? විවර්ණ වූයෙහි ද? හටගත් පඬු පැහැත්තෙහි ද? නහරවැල් පතුළ සිරුර ඇත්තෙහි"ද? යි කී ය. "පින්වත, මෙහි මණිකණ්ඨ නාරජ ගඟනිය පිහිනා මා කරා අවුත් සත් යලක් මා දරණවැළින් වෙළා හිස මතුයෙහි මහත් සේ පෙණය කොට සිටියේ ය. පින්වත, මම් ඒ නයාට බියෙන් වැහැරුනෙමි, රූක්ෂ වූයෙමි, විවර්ණ වූයෙමි, හටගත් පඬු පැහැ ඇත්තෙමි, නහර පතුළ සිරුර ඇත්තෙම් වෙමි" යි හෙතෙම කීය. "පින්වත, තෝ ඒ නාරජුගේ නොඊම කැමැත්තෙහි ද?" යි දෙටු තවුස් පුළුවුත. "පින්වත, මම් ඒ නාරජුගේ නොඊම කැමැත්තෙමි" යි කණිට්ඨ තවුස් කීය. "පින්වත, තෝ ඒ නාරජුගේ කිසිවක් දක්නෙහි ද?" යි දෙටු තවුස් පුළුවුත. "පින්වත, ගෙලෙහි පලන් මිණක් දකිමි" යි කණිට්ඨ තවුස් කීය. "එසේ නම් පින්වත, "මට මිණ දෙව, මිණෙන් මට වැඩෙක් ඇතැ"යි නාරජුගෙන් මිණ ඉල්ලව"යි හෙ තෙම කීය.

මහණෙනි, ඉක්බිති මණිකණ්ඨ නාරජ ගංගානදිය පිනා කණිට්ඨ තවුසා වෙත එළඹ එක් පසෙක සිටියේ ය. එක් පසෙක සිටි නාරජුට කණිට්ඨ තවුස්තෙම "පින්වත, මට මිණ දෙව. මිණෙන් මට වැඩෙක් ඇතැ"යි කීය. මහණෙනි, එවිට මණිකණ්ඨ නාරජ "මහණ මිණ ඉල්ලයි. මහණහට මිණෙන් වැඩෙක් ඇතැ"යි යුහු ව පලා ගියේ ය. දෙවනු ද මණිකණ්ඨ නාරජ ගඞ්ගා නදිය පිනා කණිට්ඨ තවුසා වෙත එළඹියේ ය. කණිට්ඨ තවුස් තෙම මණිකණ්ඨ නා රජහු ඈත එන්නහු දැක "පින්වත, මට මිණ දෙව. මිණෙන් මට වැඩ ඇතැ"යි කීය. මහණෙනි"එකල්හි මණිකණ්ඨ නාරජ "මහණ මිණ ඉල්ල යි. මහණහට මිණෙන් වැඩෙක් ඇතැ"යි එපමණින් ම පෙරළා ගියේ ය. තෙවනු ද මහණෙනි, කණිට්ඨ තවුස් තෙමේ ගඞ්ගා නදිය පිහිනා එන මණිකණ්ඨ නාරජු දුටුයේ ය. දැක ඔහුට "පින්වත, මට මිණ දෙව. මිණෙන් මට වැඩ ඇතැ"යි කීයේය. මහණෙනි, එකල්හි මණිකණ්ඨ නාරජ තෙමේ කණිට්ඨ තවුසාට දෙගයෙකින් මෙසේ කීය.

"මේ මිණ නිසා මට බොහෝ වූ ප්‍රණීත ආහාරපාන උපදී. එය ඔබට නො දෙන්නෙමි. තෙපි පුනපුනා යදනහු ය. තොප අසපුවට ද නො එන්නෙමි.

මුවහත් තබන ලද කඩුවක් ගත් අතැති තරුණයකු මෙන් තෙපි මිණ ඉල්ලමින් මා තැති ගන්වනු. එය තොපට නො දෙන්නෙමි. තෙපි පුන පුනා යදනහු ය. තොප අසපුවට ද නො එන්නෙමි"

8. අථ ඛො භික්ඛවෙ මණිකණ්ඨො නාගරාජා "භික්ඛු මණිං යාචති භික්ඛුස්ස මණිනා අත්ථො"ති පක්කාමි. තදා පක්කන්තො පක්කන්තොව[1] අහොසි, න පුන පච්චාගඤ්ඡි. අථ ඛො භික්ඛවෙ කණිට්ඨො ඉසි තස්ස නාගස්ස දස්සනීයස්ස අදස්සනෙන භිය්‍යොසොමත්තාය කිසො අහොසි ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො. අද්දසා ඛො භික්ඛවෙ ජෙට්ඨො ඉසි කණිට්ඨං ඉසිං භිය්‍යොසොමත්තාය කිසං ලූඛං දුබ්බණ්ණං උප්පණ්ඩුප්පණ්ඩුකජාතං ධමනිසන්ථතගත්තං. දිස්වාන කණිට්ඨං ඉසිං එතදවොච: "කිස්ස ත්වං භො භිය්‍යොසොමත්තාය කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො"ති. තස්සාහං භො නාගස්ස දස්සනීයස්ස අදස්සනෙන. භිය්‍යොසොමත්තාය කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො"ති. අථ ඛො භික්ඛවෙ ජෙට්ඨො ඉසි කණිට්ඨං ඉසිං ගාථාය අජ්ඣභාසි:-

"න තං යාචෙ යස්ස පියං ජිගිංසෙ[2] දෙස්සො[3] හොති අතියාචනාය,
නාගො මණිං යාචිතො බ්‍රාහ්මණෙන අදස්සනඤ්ඤෙව තදජ්ඣගමා"ති.

තෙසං හි නාම භික්ඛවෙ තිරච්ඡානගතානං පාණානං අමනාපා භවිස්සති යාචනා අමනාපා විඤ්ඤත්ති. කිමඞ්ග[4] පන මනුස්සභූතානං."

9. භූතපුබ්බං භික්ඛවෙ අඤ්ඤතරො භික්ඛු හිමවන්තපස්සෙ විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තස්ස ඛො පන භික්ඛවෙ වනසණ්ඩස්ස අවිදූරෙ මහන්තං නින්නං පල්ලලං. අථ ඛො භික්ඛවෙ මහාසකුණසඞ්ඝො තස්මිං පල්ලලෙ දිවසං ගොචරං චරිත්වා සායං තං වනසණ්ඩං වාසාය උපගච්ඡති. අථ ඛො භික්ඛවෙ සො භික්ඛු තස්ස සකුණසඞ්ඝස්ස සද්දෙන උබ්බාළ්හො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අහං භික්ඛවෙ තං භික්ඛුං එතදවොච "කච්චි භික්ඛු ඛමනීයං, කච්චි යාපනීයං, කච්චිසි අප්පකිලමථෙන අද්ධානං ආගතො, කුතො ච ත්වං භික්ඛු ආගච්ඡසී"ති. "ඛමනීයං භගවා, යාපනීයං භගවා, අප්පකිලමථෙන චාහං භන්තෙ අද්ධානං ආගතො. අත්ථි භන්තෙ හිමවන්තපස්සෙ මහාවනසණ්ඩො. තස්ස ඛො පන භන්තෙ වනසණ්ඩස්ස අවිදූරෙ මහන්තං නින්නං පල්ලලං. අථ ඛො භන්තෙ මහාසකුණසඞ්ඝො තස්මිං පල්ලලෙ දිවසං ගොචරං චරිත්වා සායං තං වනසණ්ඩං වාසාය උපගච්ඡති. තතො අහං භගවා ආගච්ඡාමි තස්ස සකුණසඞ්ඝස්ස සද්දෙන උබ්බාළ්හො"ති. "ඉච්ඡසි පන ත්වං භික්ඛු තස්ස සකුණසඞ්ඝස්ස අනාගමන"න්ති. "ඉච්ඡාමහං භගවා තස්ස සකුණසඞ්ඝස්ස අනාගමන"න්ති. "තෙන හි ත්වං භික්ඛු තත්ථ ගන්ත්වා තං වනසණ්ඩං අජ්ඣොගහෙත්වා රත්තියා පඨමං යාමං තික්ඛත්තුං සද්දමනුස්සාවෙහි: "සුණන්තු මෙ භොන්තො සකුණා, යාවතිකා ඉමස්මිං වනසණ්ඩෙ වාසං උපගතා පත්තෙන මෙ අත්ථො, එකෙකං මෙ භොන්තො පත්තං දදන්තූ"ති. රත්තියා මජ්ඣිමං යාමං -පෙ- රත්තියා පච්ඡිමං යාමං තික්ඛත්තුං සද්දමනුස්සාවෙහි: "සුණන්තු මෙ භොන්තො සකුණා යාවතිකා ඉමස්මිං වනසණ්ඩෙ වාසං උපගතා, පත්තෙන මෙ අත්ථො, එකෙකං මෙ භොන්තො පත්තං දදන්තූ"ති.

1. තථා පක්කන්තොව, මජස. තදා පක්කන්තොව සීමු. 2. ජිගීංස., මජසං.
3. විදෙස්සො, මජසං. දෙස්සො ච., සතා. 4. කිමඞ්ගං, මජසං.

8. මහණෙනි, ඉක්බිති මණිකණ්ඨ නාරජ තෙම "මහණ මිණ ඉල්ලයි. මහණහට මිණෙන් වැඩෙක් ඇතැ"යි නික්ම ගියේ ය. එදා නික්ම ගියේ ගියේ ම විය. පෙරළා නො ආයේ ය. මහණෙනි, ඉක්බිති කණිටු තවුස් තෙම දැකුම්කලු ඒ නාරජු නොදැක්මෙන් බෙහෙවින් වැහැරුනේ රූක්ෂවූයේ විවර්ණ වූයේ හටගත් පඬුපැහැ ඇත්තේ නහර ඉල්පී ගිය සිරුර ඇත්තේ විය. මහණෙනි, දෙටු තවුස් තෙම බෙහෙවින් වැහැරුණු රූක්ෂ වූ විවර්ණ වූ හටගත් පඬු පැහැති කණිටු තවුසා දිටී. දැක ඔහුට, "පින්වත, තෝ කවර හෙයින් වැරුනෙහි, රූක්ෂ වූයෙහි, විවර්ණ වූයෙහි, හටගත් පඬු පැහැ ඇත්තෙහි, නහරවැල් පෙනෙන සිරුර ඇත්තෙහි දැ?"යි ඇසී ය. "පින්වත, දැකුම්කලු ඒ නා රජු නො දැක්මෙන් බෙහෙවින් වැරුනෙමි, රූක්ෂ වූයෙමි, පඬුපැහැති වූයෙමි, නහර ඉල්පුනු සිරුර ඇතියෙමි වෙමි"යි කී ය. මහණෙනි, ඉක්බිති දෙටු තවුස් තෙම කණිටු තවුසාට ගයෙකින් මෙසේ කී ය:

"යමක්හට යමක් ප්‍රිය සී දන්නේ නම්, එය නො ඉල්ලන්නේ ය. පුන පුනා ඉල්ලීමෙන් ද්වෙෂ්‍ය (අප්‍රිය) වෙයි. බමුණා විසින් මිණ ඉල්ලනු ලැබූ නා තෙ ම ඔහුගේ අදර්ශනයටම ගියේ ය."

මහණෙනි, ඒ තිරිසන්ගිය සත්නට පවා ඉල්ලීම, විනවීම අමනාප විය. මිනිස් වූවනට කියනු කිම?

9. මහණෙනි, පෙර එක්තරු මහණෙක් හිමවත් පියසෙහි එක්තරු වනලැහැබෙක වෙසෙයි. මහණෙනි, ඒ වනලැහැබට නොදුරෙහි ගැඹුරු මහවිලෙක් ඇත. මහණෙනි, එකලැ පක්ෂිසමූහයෙක් ඒ විලෙහි දහවල් ගොදුරු කා සවස ලගිනු පිණිස ඒ වනලැහැබට පැමිණෙයි. මහණෙනි, ඉක්බිති ඒ මහණ තෙම ඒ පක්ෂි සමූහයාගේ හඬින් පෙළුනේ මා වෙත එළැඹියේ ය. එළැඹ මා වැඳ එකත්පස්ව හුන්නේ ය. මහණෙනි, එකත්පස් ව හුන් ඒ මහණහට "කිම, මහණ, ඉවැසිය හැකි ද? කිම? යැපිය හැකි ද? කිම? නිදුකින් අදන්මග ආහි ද? මහණ තෝ කොහි සිට එයි දැ?" යි කීමි. එවිට ඒ මහණ මෙය කී ය: "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. වහන්ස, මම නිදුකින් අදන්මග ආයෙමි ද වෙමි. වහන්ස, හිමවු පියසෙහි මහ වනලැහැබෙක් වෙයි. එය නොදුරෙහි ගැඹුරු මහවිලෙක් වෙයි. වැලිදු වහන්ස, මහත් පක්ෂිසමූහයෙක් ඒ විලෙහි දහවල් ගොදුරු කා සවස ලගින්නට ඒ වනලැහැබට පැමිණෙයි. භාග්‍යවතුන් වහන්ස, මම එහි සිට එමි. ඒ පක්ෂිසමූහයාගේ හඬින් පෙළුනෙමි වෙමි." "මහණ, තෝ ඒ පක්ෂිසමූහයාගේ නොපැමිණීම කැමැත්තෙහි දැ?"යි මම ඇසීමි. "එසේය, වහන්ස, මම ඒ පක්ෂිසමූහයාගේ නොපැමිණීම රිසියෙමි" යි ඒ මහණ කී ය. එවිට "මහණ, එසේ වී නම්, තෝ එහි ගොස් ඒ වනලැහැබට වැද, 'යම් පමණ පක්ෂීහු මේ වනලැහැබෙහි විසීමට පැමිණියාහු ද, ඒ පින්වත් පක්ෂීහු මගේ වචනය අසත්වා. පියාපතින් මට වැඩ ඇත. පින්වත්හු මට එකි එකී පියාපත දෙත්වා"යි පෙරයම්හි තෙවරක් හඬ ගා කියව. රෑ මැදි යම්හි ද, පැසුළු යම්හි ද එසේ ම තෙවර තෙවර හඬ ගා කියව" යි කීමි.

10. අථ ඛො භික්ඛවෙ සො භික්ඛු තත්ථ ගන්ත්වා තං වනසණ්ඩං අජ්ඣො-ගහෙත්වා රත්තියා පඨමං යාමං තික්ඛත්තුං සද්දමනුස්සාවෙසි: “සුණන්තු මෙ භොන්තො සකුණා යාවතිකා ඉමස්මිං වනසණ්ඩෙ වාසං උපගතා, පත්තෙන මෙ අත්ථො, එකෙකං මෙ භොන්තො පත්තං දදන්තූ”ති. රත්තියා මජ්ඣිමං යාමං -පෙ- රත්තියා පච්ඡිමං යාමං තික්ඛත්තුං සද්දමනුස්සාවෙසි: “සුණන්තු මෙ භොන්තො සකුණා යාවතිකා ඉමස්මිං වනසණ්ඩෙ වාසං උපගතා, පත්තෙන මෙ අත්ථො, එකෙකං මෙ භොන්තො පත්තං දදන්තූ”ති. අථ ඛො භික්ඛවෙ සො සකුණසඞ්ඝො භික්ඛු පත්තං යාචති, භික්ඛුස්ස පත්තෙන අත්ථො”ති. තම්හා වනසණ්ඩා පක්කාමි. තදා පක්කන්තො පක්කන්තොව අහොසි. න පුන පච්චාගඤ්ඡි. තෙසං හි නාම භික්ඛවෙ තිරච්ඡානගතානං පාණානං අමනාපා භවිස්සති යාචනා අමනාපා විඤ්ඤත්ති, කිමඞ්ග පන මනුස්සභූතානං.

11. භූතපුබ්බං භික්ඛවෙ රට්ඨපාලස්ස කුලපුත්තස්ස පිතා රට්ඨපාලං කුලපුත්තං ගාථාය අජ්ඣභාසි.:

“අපාහං තෙ න ජානාමි රට්ඨපාල බහුජ්ජනා,
තෙ මං සඞ්ගම්ම යාචන්ති කස්මා මං ත්වං න යාචසීති.

යාචකො අප්පියො හොති යාචං අදදමප්පියො,
තස්මාහං තං න යාචාමි මා මෙ විද්දෙසනා[1] අහූ”ති.

12. සො හි නාම භික්ඛවෙ රට්ඨපාලො කුලපුත්තො සකං පිතරං එවං වක්ඛති කිමඞ්ග පන ජනො ජනං. ගිහීනං හි භික්ඛවෙ දුස්සංහරානි භොගානි සංභතානි'පි[2] දුරනුරක්ඛියානි. තත්ථ නාම තුම්හෙ මොඝපුරිසා එවං දුස්සංහරෙසු භොගෙසු සංභතෙසුපි[3] දුරනුරක්ඛියෙසු යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරිස්සථ: “පුරිසං දෙථ, පුරිසත්ථකරං දෙථ, ගොණං දෙථ, සකටං දෙථ, වාසිං දෙථ: එරසුං[4] දෙථ, කුඨාරිං දෙථ, කුද්දාලං දෙථ, නිඛාදනං දෙථ, වල්ලිං දෙථ, වෙළුං දෙථ මුඤ්ජං දෙථ, බබ්බජං දෙථ, තිණං දෙථ, මත්තිකං දෙථා”ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:”

**“සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානෙන අස්සාමිකං අත්තුද්දෙසං පමාණිකා කාරෙතබ්බා. තත්‍රිදං පමාණං: දීඝසො ද්වාදස-විදත්ථියො සුගතවිදත්ථියා තිරියං සත්තන්තරා, භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය. තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමනං. සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනෙ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය පමාණං වා අතික්කාමෙය්‍ය සඞ්ඝාදිසෙසො**”ති.

13. **සඤ්ඤාචිකා** නාම: සයං යාචිත්වා පුරිසම්පි පුරිසත්ථකරම්පි ගොණම්පි සකටම්පි වාසිම්පි එරසුම්පි කුඨාරිම්පි කුද්දාලම්පි නිඛාදනම්පි වල්ලිම්පි වෙළුම්පි මුඤ්ජම්පි බබ්බජම්පි තිණම්පි මත්තිකම්පි.

**කුටි**නාම: උල්ලිත්තා වා හොති අවලිත්තා වා උල්ලිත්තාවලිත්තා වා.

**කාරයමානෙනා**ති කරොන්තො වා කාරාපෙන්තො වා.

1. විදෙස්සනා. ම.ජ.සං. සී.මු. 2. සංහතානිපි. සී.මු. 3. සංහතෙසුපි. සී.මු.
4. පරසුං ම.ජ.සං. සී. මු.

10. මහණෙනි, ඉක්බිති ඒ මහණ තෙම එහි ගොස් ඒ වනලැහැබ වැද රෑ පෙරයම්හි 'යම් පමණ පක්ෂීහු මේ වනලැහැබෙහි වාසයට පැමිණියාහු ද, ඒ පින්වත් පක්ෂීහු මගේ වචනය අසත්වා. පියාපතින් මට වැඩ ඇත. පින්වත්හු මට එකි එකී පියාපත දෙත්වා"යි රෑ පෙරයම්හි ද... මැද යම්හි ද ... පැසුළු යම්හි ද තුන්යලක් හඬගා කී ය. මහණෙනි, එකල්හි ඒ පක්ෂිසමූහයා "මහණ තෙම පියාපත් ඉල්ලයි. මහණහට පියාපතින් වැඩ ඇතැ" යි ඒ වනලැහැබෙන් නික්මුනේ ය. එදා ගියේ ගියේ ම ය. පෙරළා නො ආයේ ය. මහණෙනි, ඒ තිරිසන්ගිය සත්නට පවා ඉල්ලීම අප්‍රිය විය. විනවීම අප්‍රිය විය. මිනිස්වූවනට කියනු ම කිම?

11. මහණෙනි, පෙර රට්ඨපාල කුලපුතුගේ පියා රට්ඨපාල කුලපුතුට-

"රට්ඨපාලය, බොහෝ දෙනා මා වෙත එළඹ මා යදතුදු මම ඔවුන් නො දනිමි. කවර හෙයින් තෝ මා නො අයදනෙහි දැ?"යි ගයෙකින් කී ය.

"ඉල්ලන තැනැත්තේ අප්‍රිය වෙයි. ඉල්ලූ දෑ නො දෙන තැනැත්තේ ද අප්‍රිය වෙයි. එහෙයින් "මා කෙරෙහි අප්‍රිය භාවයෙක් නො වේ වා"යි මම ඔබ නො යදිමි" යි රට්ඨපාල කුලපුත් කී ය.

12. මහණෙනි, ඒ රට්ඨපාල කුලපුත් පවා සිය පියාට මෙසේ කියයි. බාහිර ජනයාට කියනුම කවරේ ද? මහණෙනි, ගිහියන් විසින් භෝග රැස් කටයුතු යි, රැස් කරන ලද භෝග දුකසේ රැක්ක යුතු. හිස් පුරුෂයෙනි, මෙසේ දුකසේ රැස් කළ යුතු, දුකසේ රැක්ක යුතු ඒ භෝග විෂයයෙහි තෙපි "පුරුෂයකු දෙන්න, අත්තමක් දෙන්න, ගොණකු දෙන්න, ගැලක් දෙන්න, වෑයක් දෙන්න, පොරොවක් දෙන්න, කෙටේරියක් දෙන්න, උදැල්ලක් දෙන්න, නියනක් දෙන්න, වැලක් දෙන්න, හුණගසක් දෙන්න, මුදුතණ දෙන්න, බබුස් තණ දෙන්න. කුසතණ දෙන්න, මැටි දෙන්නැ"යි යැදුම් බහුලව, විනවීම් බහුලව වසවු ද? හිස් පුරුෂයෙනි, මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"තමා ඉල්ලාගත් උපකරණයෙන්, කරවා දෙන හිමියකු නැති, තමා උදෙසා වූ කිළියක් කරවන මහණහු විසින් පමණින් යුත් කිළියක් කරවිය යුතු. එහි මේ ප්‍රමාණයි. දිගින් සුගත් වියතින් දොළොස් වියතෙක. පුළුල අතර සත් වියතෙකි. කුටි බිම දෙසනු පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් උවදුරු රහිත වූ උපචාර සහිත වූ කුටිවාස්තුව දෙසිය යුතු, ඉදින් මහණතෙම උවදුරු සහිත වූ උපචාර රහිත වාස්තුයෙහි ඉල්ලා ගත් උපකරණයෙන් කිළියක් කරවන්නේ නම්, කුටිවාස්තුව දෙසීම පිණිස භික්ෂූන් හෝ නො කැඳවන්නේ නම් පමණ හෝ ඉක්මවන්නේ නම්, සඟවෙසෙස්ඇවැත් වේ."**

13. **සඤ්ඤාචිකා** නම්: පුරුෂයකු ද අත්තමක් ද ගොණකු ද ගැලක් ද වෑයක් ද පොරොවක් ද කෙටේරියක් ද උදැල්ලක් ද නියනක් ද වැල් ද හුණගසක් ද මුදුතණ ද බබුස් තණ ද කුසතණ ද මැටි ද තමා ම ඉල්ලා ගෙණ ය.

**කුටි** නම්: ඇතුළත අලෙවූ දූත් හෝ පිටත අලෙවූ දූත් හෝ ඇතුළත පිටත දෙක්හි ම අලෙවූ දූත් හෝ කිළිය වෙයි.

**කාරයමානෙන** යනු කරණ හෝ කරවන.

**අස්සාමිකන්ති** න අඤ්ඤො කොචි සාමිකො හොති ඉත්ථී වා පුරිසො වා ගහට්ඨො වා පබ්බජිතො වා

**අත්තුද්දෙසන්ති** අත්තනො අත්ථාය.

**පමාණිකා කාරෙතබ්බා තත්‍රිදං පමාණං: දීඝසො ද්වාදස විදත්ථියො සුගතවිදත්ථියා** ති බාහිරිමෙන මානෙන.

**තිරියං සත්තන්තරා** ති අබ්භන්තරිමෙන මානෙන.

**භික්ඛු අභිනෙතබ්බා වත්ථු දෙසනායාති**-තෙන කුටිකාරකෙන භික්ඛුනා කුටිවත්ථුං සොධෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: “අහං භන්තෙ සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං. සොහං භන්තෙ සඞ්ඝං කුටිවත්ථු ඔලොකනං යාචාමී” ති. දුතියම්පි යාචිතබ්බා. තතියම්පි යාචිතබ්බා. සචෙ සබ්බො සඞ්ඝො උස්සහති කුටිවත්ථුං ඔලොකෙතුං, සබ්බෙන සඞ්ඝෙන ඔලොකෙතබ්බං. නො චෙ සබ්බො සඞ්ඝො උස්සහති කුටිවත්ථුං ඔලොකෙතුං, යෙ තත්ථ හොන්ති භික්ඛු ව්‍යත්තා පටිබලා සාරම්භං අනාරම්භං සපරික්කමනං අපරික්කමනං ජානිතුං, තෙ යාචිත්වා සම්මන්නිතබ්බා. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

“සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං, සො සඞ්ඝං කුටිවත්ථු-ඔලොකනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛු සම්මන්නෙය්‍ය ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං, සො සඞ්ඝං කුටිවත්ථුඔලොකනං යාචති, සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛු සම්මන්නති ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස ච ඉත්ථන්නාමස්ස ච භික්ඛූනං සම්මති[1] ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතා සඞ්ඝෙන ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච භික්ඛු ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථුං ඔලොකෙතුං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී”ති.

---

1. සම්මුති. මජසං

**අසාමිකං** යනු: අත්කිසි හිමියෙක්, සත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගැහැවියෙක් හෝ පැවිද්දෙක් හෝ නො වෙයි.

**අත්තුද්දෙසං** යනු: තමා උදෙසා.

**පමාණිකා කාරෙතබ්බා තත්‍රිදං පමාණං දීඝසො ද්වාදස විදත්ථියො සුගතවිදත්ථියා** යනු: ප්‍රමාණික ව කටයුතුය යන මෙහි ප්‍රමාණය නම් බිහි බිත්හි සිට මැනීමෙන් සුගත් වියතින් දෙළොස් වියතෙකි.

**තිරියං සත්තන්තරා** යනු: ඇතුළත බිත්හි සිට මැනීමෙන් සරස වියත් සතෙකි.

**භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය** යනු: ඒ කුටිය කරණ මහණහු විසින් කුටිවාස්තුව ශුද්ධ කොට සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට මහලු භික්ෂූන් පා වැඳ උළුල්ලෙන් හිඳ ඇඳිලි බැඳ මෙසෙයින් කිය යුතු වන්නේ ය. 'වහන්ස, මම කරවා දෙන හිමියකු නැති තමා උදෙසා වූ කිළියක් කරණු කැමැත්තෙමි. වහන්ස, ඒ මම කුටිවාස්තුව බැලීමට සඞ්ඝයා යදිමි'යි. දෙවනවට ද යැදිය යුතු. තෙවනවට ද යැදිය යුතු. ඉදින් සියලු සඞ්ඝ තෙමේ කුටිවාස්තුව බැලීමට රුචි කෙරේ නම් හැම සඞ්ඝයා විසින් බැලිය යුතු ය. ඉදින් හැම සඞ්ඝ තෙමේ කුටිවාස්තුව බලන්නට උත්සාහ-වත් නො වේ නම් එහි යම් භික්ෂු කෙනෙක් සොපද්‍රව අනුපද්‍රව බව, සළපචාර අනුපචාර බව දැනගන්නට ව්‍යක්ත වූවාහු ප්‍රතිබල වූවාහු වෙත් ද, ඒ භික්ෂූහු අයැද සම්මත කළ යුත්තාහ. මහණෙනි, මෙසෙයින් සම්මත කළ යුතු. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

" වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා: මේ මෙනම් ඇති මහණ තෙමේ කරවා දෙන හිමියකු නැති තමා උදෙසා වූ කුටියක් තමා ම ඉල්ලාගත් උපකරණයෙන් කරණු කැමැති වෙයි. හෙතෙම කුටිවාස්තුව බැලීමට සඞ්ඝයා යදී. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත් නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහුගේ කුටිවාස්තුව බැලීමට මෙනම් වූ ද මෙනම් වූ ද භික්ෂූන් සම්මත කරන්නේ ය. තෙල ඤත්ති ය යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා: මේ මෙනම් ඇති මහණ තෙමේ කරවා දෙන හිමියකු නැති තමා උදෙසා වූ කුටියක් තමා ම ඉල්ලාගත් උපකරණයෙන් කරණු කැමැති වෙයි. හෙතෙම කුටිවාස්තුව බැලීමට සඞ්ඝයා යදී. සඞ්ඝ තෙමේ මෙනම් මහණහුගේ කුටිවාස්තුව බලන්නට මෙනම් වූ ද, මෙනම් වූ ද භික්ෂූන් සම්මත කෙරෙයි. මෙනම් මහණහුගේ කුටිවාස්තුව බලන්නට මෙනම් වූ ද මෙනම් වූ ද භික්ෂූන්ගේ සම්මුතිය යම් ආයුෂ්මතක්හට රුචි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට රුචි නො වේ නම් හෙතෙම කියන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණහුගේ කුටිවාස්තුව බලන්නට මෙනම් වූ ද මෙනම් වූ ද භික්ෂූහු සම්මතයහ. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් මේ තුෂ්ණීම්භාවයැ යි. මෙසේ තෙල තුෂ්ණීම්භාවය ධරමි"යි.

තෙහි සම්මතෙහි භික්ඛූහි තත්ථ ගන්ත්වා කුටිවත්ථු ඔලොකෙතබ්බං සාරම්භං අනාරම්භං, සපරික්කමනං අපරික්කමනං ජානිතබ්බං. සචෙ සාරම්භං හොති අපරික්කමනං, මා ඉධ කරීති වත්තබ්බො. සචෙ අනාරම්භං හොති සපරික්කමනං සඞ්ඝස්ස ආරොචෙතබ්බං අනාරම්භං සපරික්කමනන්ති. තෙන කුටිකාරකෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං, සොහං භන්තෙ සඞ්ඝං කුටිවත්ථුදෙසනං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බො. තතියම්පි යාචිතබ්බො. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං, සො සඞ්ඝං කුටිවත්ථුදෙසනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථුං දෙසෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අස්සාමිකං අත්තුද්දෙසං, සො සඞ්ඝං කුටිවත්ථුදෙසනං යාචති, සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථුං දෙසෙති, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථුස්ස දෙසනා සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දෙසිතං සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො කුටිවත්ථු. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

**සාරම්භං** නාම: කිපිල්ලිකානං වා ආසයො හොති. උපචිකානං වා ආසයො හොති. උන්දූරානං වා ආසයො හොති. අහීනං වා ආසයො හොති. විච්ඡිකානං වා ආසයො හොති. සතපදීනං වා ආසයො හොති. හත්ථීනං වා ආසයො හොති. සීහානං වා ආසයො හොති. ව්‍යග්ඝානං වා ආසයො හොති. දීපීනං වා ආසයො හොති. අච්ඡානං වා ආසයො හොති. තරච්ඡානං වා ආසයො හොති. යෙසං කෙසඤ්චි තිරච්ඡානගතානං පාණානං ආසයො හොති. පුබ්බණ්ණනිස්සිතං වා හොති. අපරණ්ණනිස්සිතං වා හොති. අබ්භාඝාතනිස්සිතං වා හොති. ආඝාතනිස්සිතං වා හොති සුසානනිස්සිතං වා හොති. උය්‍යානනිස්සිතං වා හොති. රාජවත්ථුනිස්සිතං වා හොති. හත්ථිසාලානිස්සිතං වා හොති. අස්සසාලානිස්සිතං වා හොති. බන්ධනාගාරනිස්සිතං වා හොති. පානාගාරනිස්සිතං වා හොති. සූනානිස්සිතං වා හොති. රච්ඡානිස්සිතං වා හොති. චච්චරනිස්සිතං වා හොති. සභානිස්සිතං වා හොති. සංසරණ[1] නිස්සිතං වා හොති. එතං සාරම්භං නාම.

**අපරික්කමනං** නාම: න සක්කා හොති යථායුත්තෙන සකටෙන අනුපරිගන්තුං, සමන්තා නිස්සෙණියා අනුපරිගන්තුං. එතං අපරික්කමනං නාම.

---

1 සංචරණ, අට්ඨකථා.

ඒ සම්මත වූ භික්ෂූන් විසින් එහි ගොස් කුටිවාස්තුව බැලිය යුතු ය. සොපද්‍රව බව අනුපද්‍රව බව සඋපචාර බව අනුපචාර බව දතයුතු ය. ඉදින් සොපද්‍රව අනුපචාර වේ නම් "මෙහි තනමක් කරු"යි කියයුත්තේ ය. ඉදින් අනුපද්‍රව සඋපචාර වේ නම් 'අනුපද්‍රව ය. සඋපචාර ය'යි සඟහට ආරෙවන කළයුතු ය. ඒ කුටිකාරක මහණහු විසින් සඟුන් වෙත එළඹ උතුරුසඟ එකස් කොට මහලු භික්ෂූන් පා වැඳ උළුල්ලෙන් හිඳ ඇදිලි බැඳ මෙසේ කියයුත්තේ ය: 'වහන්ස, මම කරවා දෙන හිමියකු නැති තමා උදෙසා වූ කුටියක් තමා ම ඉල්ලාගත් උපකරණින් කරණු කැමැත්තෙමි. වහන්ස, ඒ මම කුටිවාස්තු දෙශනාවට සඞ්ඝයා අයදිමි'යි. දෙවනවට ද යැදිය යුතු. තෙවනවට ද යැදිය යුතු. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ ඥපනය කළ යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා: මේ මෙනම් මහණ කරවා දෙන හිමියකු නැති තමා උදෙසා වූ කුටියක් තමා ම ඉල්ලාගත් උපකරණින් කරණු කැමැත්තේ ය. හේ කුටිවාස්තු දෙශනාවට සඞ්ඝයා අයදී. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහු ගේ කුටිවාස්තුව දෙසන්නේ ය. මෙල ඤාපති යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා: මේ මෙනම් මහණ කරවා දෙන හිමියකු නැති තමා උදෙසා වූ කුටියක් තමා ම ඉල්ලාගත් උපකරණින් කරණු කැමැත්තේ ය. හේ කුටිවාස්තු දෙශනාවට සඞ්ඝයා අයදී. සඞ්ඝ තෙමේ මෙනම් මහණහුගේ කුටිවාස්තුව දෙසයි. යම් ආයුෂ්මතක්හට මෙනම් මහණහුගේ කුටිවාස්තුව දෙසීම රුචි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට රුචි නො වේ නම් හෙතෙම කියන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණහුගේ කුටිවාස්තුව දෙසන ලද. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් තුෂ්ණීම්භාවය යි. මෙසේ මෙල තුෂ්ණීම්භාවය ධරමි"යි.

**සාරම්භ** නම්: කුහුඹුවන්ගේ හෝ තුඹසෙක් වෙයි. වේයන්ගේ හෝ තුඹසෙක් වෙයි. මීයන්ගේ හෝ බිලයෙක් වෙයි. සපුන්ගේ හෝ බිලයෙක් වෙයි. නුහුසුවන්ගේ හෝ බිලයෙක් වෙයි. සියපානන්ගේ හෝ බිලයෙක් වෙයි. ඇතුන් හෝ වසන තැනෙක් වෙයි. සිංහයන් හෝ වසන තැනෙක් වෙයි. වගුන් හෝ වසන තැනෙක් වෙයි. දිවියන් හෝ වසන තැනෙක් වෙයි. වලසුන් හෝ වසන තැනෙක් වෙයි. තරසුන් හෝ වසන තැනෙක් වෙයි. යම්කිසි තිරිසන්ගිය සතුන් වසන තැනෙක් වෙයි. හැල් ඇ පුබ්බණ්ණ වපුළ තැනෙක් හෝ වෙයි. උඳු ඇ අපරණ්ණ වපුළ තැනෙක් හෝ වෙයි. වධස්ථාන ඇසිරි කෙළෙ හෝ වෙයි. දම්ගෙඩිය ඇසිරි කෙළෙ හෝ වෙයි. සොහොන ඇසිරි කෙළෙ හෝ වෙයි. උයන් ඇසිරි කෙළෙ හෝ වෙයි· රජවතු ඇසිරි කෙළෙ හෝ වෙයි. ඇත්හල් ඇසිරි කෙළෙ හෝ වෙයි. අස්හල් ඇසිරි කෙළෙ හෝ වෙයි. සිරගේ ඇසිරි කෙළෙ හෝ වෙයි. අවන්හල් ඇසිරි කෙළෙ හෝ වෙයි. මස්ළොඹු ඇසිරි කෙළෙ හෝ වෙයි. රියමඟ ඇසිරි කෙළෙ හෝ වෙයි. සිවුමංසල ඇසිරි කෙළෙ හෝ වෙයි. සභා ඇසිරි කෙළෙ හෝ වෙයි. යන එන මඟ ඇසිරි කෙළෙ හෝ වෙයි. මෙල 'සාරම්භ' නම.

**අපරික්කමන** නම්: ගොනුන් යෙදූ ගැලෙකින් සිසාරා යන්නට හාත්පස හිණෙකින් සිසාරා යන්නට නො හැකි වේ ද, මෙල 'අපරික්කමන' නම.

**අනාරම්භං** නාම: න කිපිල්ලිකානං වා ආසයො හොති -පෙ- න සංසරණනිස්සිතං වා හොති. එතං අනාරම්භං නාම.

**සපරික්කමනං** නාම: සක්කා හොති යථා යුත්තෙන සකටෙන අනුපරිගන්තුං, සමන්තා නිස්සෙණියා අනුපරිගන්තුං, එතං සපරික්කමනං නාම.

**සඤ්ඤාචිකා** නාම: සයං යාචිත්වා පුරිසම්පි පුරිසත්තකරම්පි -පෙ- මත්තිකම්පි.

**කුටි** නාම: උල්ලිත්තා වා හොති අවලිත්තා වා උල්ලිත්තාවලිත්තා වා. **කාරෙය්‍යාති** කරොති වා කාරාපෙති වා.

**භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය පමාණං වා අතික්කාමෙය්‍යාති**: ඤත්තිදුතියෙන කම්මෙන කුටිවත්ථුං න දෙසාපෙත්වා ආයාමතො වා විත්ථාරතො වා අන්තමසො කෙසග්ගමත්තම්පි අතික්කාමෙත්වා කරොති වා කාරාපෙති වා පයොගෙ පයොගෙ දුක්කටං, එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස; තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**සඞ්ඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

---

1. භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං,

භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

භික්ඛු කුටිං කරොති පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං.

**අනාරම්භ** නම්: කුහුඹුවන්ගේ හෝ තුඹසෙක් නො වෙයි. ... යත එත මග ඇසිරි කෙළේ හෝ නො වෙයි. තෙල අනාරම්භ නම.

**සපරික්කමන** නම්: ගොනුන් යෙදූ ගැලෙකින් සිසාරු යන්නට, හාත්පස හිණෙකින් සිසාරු යන්නට හැකි වෙයි. තෙල 'සපරික්කමන' නම.

**සඤ්ඤාචිකා** නම්: මිනිසකු දු මිනිස් අත්කමු දු ... මැටි දු තෙමේ ඉල්ලා ගෙණ.

**කුටි** නම්: ඇතුළත පිරියම් කරණ ලදු හෝ පිටත පිරියම් කරණ ලදු හෝ ඇතුළත පිටත පිරියම් කරණ ලදු හෝ වෙයි.

**කාරෙය්‍ය** යනු: කෙරෙයි හෝ කරවා හෝ.

**භික්ඛු වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය පමාණං වා අතික්කාමෙය්‍ය** යනු: සඳහන්දුනිස කම්වදනින් ගෙබිම නො දෙසවා ආයමින් හෝ විතරින් හෝ යටත්පිරිසෙයින් කෙසගක් පමණකු දු ඉක්මවා කෙරෙයි හෝ කරවා **හෝ පියොවෙහි පියොවෙහි දුකුළා** වෙයි. පැදුළු එක් මැටි පිඩක් නො පත් **කල්හි තුලැසිදැවැත් වෙයි. එ පිඩ පැමිණි කල්හි** සඟවෙසෙස් ඇවැත් වේ.

**සඞ්ඝාදිසෙසො යනු ... එහිනු දු** 'සඞ්ඝාදිසෙස'ය යි කියනු ලැබේ.

---

**1. මහණ** තෙම **නො දෙසූ** ගෙබිම් ඇති උපද්‍රව සහිත වූ උපචාර රහිත වූ **කුටියක් කෙරේ හෝ කරවා** නම් සඟවෙසෙස් සමග දෙ දුකුළා-**ඇවැතෙක්** වෙයි.

**මහණ** තෙම **නො දෙසූ ගෙබිම්** ඇති උපද්‍රව සහිත වූ උපචාර සහිත වූ **කුටියක් කෙරේ** හෝ **කරවා** නම් සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වේ.

**මහණ** තෙම නො දෙසූ ගෙබිම් ඇති අනුපද්‍රව වූ උපචාර රහිත වූ **කුටියක් කෙරේ** හෝ කරවා නම් සඟවෙසෙස් සමග දුකුළාඇවැතෙක් වෙයි.

**මහණ** තෙම නො දෙසූ ගෙබිම් ඇති අනුපද්‍රව වූ සෝපචාර වූ කුටියක් **කෙරේ** හෝ කරවා නම් සඟවෙසෙස්ඇවැත් වේ.

**මහණ** තෙම දෙසූ ගෙබිම් ඇති සෝපද්‍රව වූ උපචාර රහිත වූ කුටියක් **කෙරේ** හෝකරවා නම් දෙ දුකුළාඇවැතෙක් වෙයි.

**මහණ** තෙම දෙසූ ගෙබිම් ඇති සෝපද්‍රව වූ සෝපචාර වූ කුටියක් කෙරේ **හෝ** කරවා නම් දුකුළාඇවැත් වෙයි.

**මහණ** තෙම දෙසූ ගෙබිම් ඇති අනුපද්‍රව වූ අනුපචාර වූ කුටියක් කෙරේ **හෝ** කරවා නම් දුකුළාඇවැත් වෙයි.

**මහණ** තෙම දෙසූ ගෙබිම් ඇති අනුපද්‍රව වූ සෝපචාර වූ කුටියක් කෙරේ **හෝ කරවා** නම් ඇවැත් නැති.

**මහණ** තෙම පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් **කෙරේ** හෝ කරවා නම් සඟවෙසෙස් සමග දෙ දුකුළාඇවැතෙක් වෙයි.

භික්ඛු කුටිං කරොති පමාණාතික්කන්තං සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති පමාණාතික්කන්තං අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති පමාණාතික්කන්තං අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

භික්ඛු කුටිං කරොති පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං.

භික්ඛු කුටිං කරොති පමාණිකං සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති පමාණිකං අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති පමාණිකං අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං.

භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං සපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං අනාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං අනාරම්භං සපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං පමාණිකං සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං පමාණිකං අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු කුටිං කරොති දෙසිතවත්ථුකං පමාණිකං අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

මහණ තෙම පමණ ඉක්ම වූ සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් සඞ්ඝාදිසෙස සමග දුකුලාඇවැතෙක් වෙයි.

මහණ තෙම පමණ ඉක්ම වූ අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් සඞ්ඝාදිසෙස සමග දුකුලාඇවැතෙක් වෙයි.

මහණ තෙම පමණ ඉක්ම වූ අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් සඞ්ඝාදිසෙස්ඇවැත් වේ.

මහණ තෙම පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දෙ දුකුලාඇවැතෙක් වෙයි.

මහණ තෙම පමණින් යුත් සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දුකුලාඇවැත් වෙයි.

මහණ තෙම පමණින් යුත් අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දුකුලාඇවැත් වෙයි.

මහණ තෙම පමණින් යුත් අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් ඇවැත් නැති.

මහණ තෙම නො දෙසූ ගෙබිම් ඇති පමණ ඉක්ම වූ උපද්‍රව සහිත වූ උපචාර රහිත වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දෙ සඞ්ඝාදිසෙසක් සමග දෙ දුකුලාඇවැතෙක් වෙයි.

මහණ තෙම නො දෙසූ කුටිවත් ඇති පමණ ඉක්ම වූ සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දෙ සඞ්ඝාදිසෙසක් සමග දුකුලාඇවැත් වෙයි.

මහණ තෙම නො දෙසූ කුටිවත් ඇති පමණ ඉක්ම වූ අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දෙ සඞ්ඝාදිසෙසක් සමග දුකුලාඇවැත් වෙයි.

මහණ තෙම නො දෙසූ කුටිවත් ඇති පමණ ඉක්ම වූ අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දෙ සඞ්ඝාදිසෙස්ඇවැතෙක් වේ.

මහණ තෙම දෙසූ කුටිවත් ඇති පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දෙ දුකුලාඇවැතෙක් වෙයි.

මහණ තෙම දෙසූ කුටිවත් ඇති පමණින් යුත් සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දුකුලාඇවැත් වෙයි.

මහණ තෙම දෙසූ කුටිවත් ඇති පමණින් යුත් අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් දුකුලාඇවැත් වෙයි.

මහණ තෙම දෙසූ කුටිවත් ඇති පමණින් යුත් අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ හෝ කරවා නම් ඇවැත් නැති.

2. භික්ඛු සමාදිසති කුටිං මෙ කරොථාති, තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස. -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

3. භික්ඛු සමාදිසති කුටිං මෙ කරොථාති, තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

4. භික්ඛු සමාදිසති කුටිං මෙ කරොථාති, තස්ස කුටිං කරොන්ති පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

5. භික්ඛු සමාදිසති කුටිං මෙ කරොථාති, තස්ස කුටිං කරොන්ති පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

6. භික්ඛු සමාදිසති කුටිං මෙ කරොථාති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස. -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස. -පෙ- අනාරම්භං සපරික්කනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං.

7. භික්ඛු සමාදිසති කුටිං මෙ කරොථාති තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

8. භික්ඛු සමාදිසිත්වා පක්කමති. කුටිං මෙ කරොථාති න ච සමාදිසති. දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චාති තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

2. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නම් ඒ මහණහට නො දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් සඞ්ඝාදිසෙස් සමග දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් සඞ්ඝාදිසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමනවූ (කුටියක් කෙරෙත්) නම් සඞ්ඝාදිසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ (සපරික්කමන වූ කුටියක් කෙරෙත්) නම් සඞ්ඝාදිසෙස්-ඇවැත් වේ.

3. මහණ තෙම 'මට කුටියක් කරවයි ඇණවා නම් ඔහට දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) ඇවැත් නැති.

4. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නම් ඔහට පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් සඞ්ඝාදිසෙස් සමග දෙ දුකුළා-ඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඞ්ඝාදිසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඞ්ඝාදිසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ...අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඞ්ඝාදිසෙස්ඇවැත් වේ.

5. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නම් ඔහට පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙ දුකුළාඇවැතෙක් වෙයි.... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුළා ඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් ඇවැත් නැති.

6. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නම්, ඔහට නො දෙසූ, ගෙබිම් ඇති පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙසඞ්ඝාදිසෙසක් සමග දෙ දුකුළාඇවැතෙක් වෙයි ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දෙ සඞ්ඝාදිසෙසක් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දෙ සඞ්ඝාදිසෙසක් සමග දුකුළාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දෙ සඞ්ඝාදිසෙස්ඇවැතෙක් වෙයි.

7. මහණ තෙම 'මට කුටියක් කරව' යි ඇණවා නම් ඔහට දෙසූ කුටිවත් ඇති පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙ-දුකුළාඇවැතෙක් වෙයි ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි .... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) ඇවැත් නැති.

8. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම් දේසිතවත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ඇණවා නම් ඔහට නො දෙසූ කුටිවත් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් සඞ්ඝාදිසෙස් සමග දෙ දුකුළාඇවැතෙක් වෙයි. සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඞ්ඝාදිසෙස් සමග දුකුළාඇවැත් වෙයි.... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඞ්ඝාදිසෙස් සමග දුකුළාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඞ්ඝාදිසෙස්-ඇවැත් වේ.

9. භික්ඛු සමාදිසිත්වා පක්කමති: "කුටිං මෙ කරොථා"ති න ච සමාදිසති, "දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා"ති තස්ස කුටිං කරොන්ති. දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

10. භික්ඛු සමාදිසිත්වා පක්කමති "කුටිං මෙ කරොථා'ති න ච සමාදිසති, පමාණිකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති තස්ස කුටිං කරොන්ති පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

11. භික්ඛු සමාදිසිත්වා පක්කමති "කුටිං මෙ කරොථාති න ච සමාදිසති' පමාණිකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති, තස්ස කුටිං කරොන්ති පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

12. භික්ඛු සමාදිසිත්වා පක්කමති "කුටිං මෙ කරොථාති න ච සමාදිසති 'දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භාච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස. -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං.

13. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති න ච සමාදිසති 'දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භා ච සපරික්කමනා චා'ති තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකා පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං, -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස. -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං අනාපත්ති.

12. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, සො සුණාති "කුටි කිර මෙ කයිරති අදෙසිතවත්ථුකා සාරම්භා අපරික්කමනා"ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො. 'දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය. දූතං වා පහිණෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

9. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම්, දේසිතවත්‍ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ද ඇණවා නම් ඔහට දෙසූ කුටිවත් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙ දුකුලාඇවැතෙක් වෙයි... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුලාඇවැත් වෙයි .... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) ඇවැත් නැති.

10. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම් පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ද ඇණවා නම් ඔහට පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් සඟවෙසෙස් සමග දෙ දුකුලාඇවැතෙක් වෙයි ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඟවෙසෙස් සමග දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් සඟවෙසෙස් සමග දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) සඟවෙසෙස් ඇවැත් වේ.

11. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම් පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ද ඇණවා නම් ඔහට පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙ දුකුලාඇවැතෙක් වෙයි... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් ඇවැත් නැති.

12. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම්, දේසිතවත්‍ථුක ද පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ද ඇණවා නම් ඔහට නො දෙසූ කුටිවත් ඇති පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙ සඟවෙසෙසක් සමග දෙ දුකුලාඇවැතෙක් වෙයි ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දෙ සඟවෙසෙසක් සමග දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දෙ සඟවෙසෙසක් සමග දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දෙ සඟවෙසෙස්ඇවැතෙක් වෙයි.

13. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම් දෙසිතවත්‍ථුක ද පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ද ඇණවා නම් ඔහට දෙසූ කුටිවත් ඇති පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දෙ දුකුලාඇවැතෙක් වෙයි ... සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) දුකුලාඇවැත් වෙයි ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) ඇවැත් නැති.

14. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම් යළි දේසිතවත්‍ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවා නම් ඔහට නො දෙසූ කුටිවත් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් හෙතෙම මට නො දෙසූ කුටිවත් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කරනු ලැබේ ල යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය දේසිතවත්‍ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුලාඇවැත් වේ.

15. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං සපරික්කමනං සො සුණාති කුටි කිර මෙ කයිරති අදෙසිතවත්ථුකා සාරම්භා සපරික්කමනා'ති තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො ''දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා චා''ති නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

16. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති සමාදිසති ච දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං අනාරම්භං අපරික්කමනං සො සුණාති 'කුටි කිර මෙ කයිරති අදෙසිතවත්ථුකා අනාරම්භා අපරික්කමනා'ති, තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො. 'දෙසිතවත්ථුකා ච හොතු සපරික්කමනා චා''ති, නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

17. භික්ඛු සමාදිසිත්වා පක්කමති ''කුටිං මෙ කරොථා'ති සමාදිසති ච දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං අනාරම්භං සපරික්කමනං. සො සුණාති ''කුටි කිර මෙ කයිරති අදෙසිතවත්ථුකා අනාරම්භා සපරික්කමනා'ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො දෙසිතවත්ථුකා හොතු'ති නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

18. භික්ඛු සමාදිසිත්වා පක්කමති කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති. දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං. සො සුණාති කුටි කිර මෙ කයිරති දෙසිතවත්ථුකා සාරම්භා අපරික්කමනා'ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං, දූතො වා පාහෙතබ්බො. 'අනාරම්භා ච හොතු සපරික්කමනා චා'ති. නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය. ආපත්ති දුක්කටස්ස.

19. භික්ඛු සමාදිසිත්වා පක්කමති කුටිං මෙ කරොථා'ති සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං සපරික්කමනං. සො සුණාති ''කුටි කිර මෙ කයිරති දෙසිතවත්ථුකා සාරම්භා සපරික්කමනා'ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො. 'අනාරම්භා හොතු'ති. නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

20. භික්ඛු සමාදිසිත්වා පක්කමති කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං අනාරම්භං අපරික්කමනං. සො සුණාති 'කුටි කිර මෙ කයිරති දෙසිතවත්ථුකා අනාරම්භා අපරික්කමනා'ති තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො. 'සපරික්කමනා ච හොතු'ති. නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

21. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

15. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම් යළි දේසිතවත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවා නම් ඔහට නො දෙසූ කුටිවත් ඇති සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් හෙතෙම මට අදේසිතවත්ථුක වූ සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කරනු ලැබේ ල' යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය. 'දෙසිතවත්ථුක ද අනාරම්භ ද වේවා'යි දූතයෙක් හෝ යැවියයුත්තේ ය. ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළාඇවැත් වේ.

16. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යේ නම් යළි දේසිත-වත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවා නම් ඔහට අදේසිතවත්ථුක වූ අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් හෙතෙම 'මට අදේසිතවත්ථුක වූ අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ ල' යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය. දේසිතවත්ථුක ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළාඇවැත් වේ.

17. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි දේසිත-වත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි ඔහට අදේසිතවත්ථුක වූ අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙති. හෙතෙම මට අදේසිත-වත්ථුක වූ අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ ල'යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය. 'දේසිතවත්ථුක වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළාඇවැත් වේ.

18. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි දෙසිත-වත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට දේසිතවත්ථුක වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. හෙතෙම 'මට දෙසිතවත්ථුක වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරේ ල'යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය, අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළා-ඇවැත් වේ.

19. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි දේසිත-වත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට දේසිතවත්ථුක වූ සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙති. හෙතෙම දේසිතවත්ථුක වූ සාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරේ ල'යි අසා නම් ඒ මහණහු තමා හෝ යායුතු ය. අනාරම්භ වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළාඇවැත් වේ.

20. මහණ තෙමේ, මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි දේසිත-වත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට දේසිතවත්ථුක වූ අනාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙයි. හෙතෙම 'මට දේසිතවත්ථුක වූ අනාරම්භ වූ අරිපක්කමන වූ කුටියක් කෙරේ ල' යි අසා නම් ඒ මහණහු තමා හෝ යායුතු ය. 'සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළා-ඇවැත් වේ.

21. මහණ තෙම 'මට කුටියක් කරව' යි ඇණවා නික්ම යෙයි. යළි දේසිතවත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි, ඔහට දේසිතවත්ථුක වූ අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් ඇවැත් නැති.

22. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'පමාණිකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං. සො සුණාති 'කුටි කිර මෙ කයිරති පමාණාතික්කන්තා සාරම්භා අපරික්කමනා'ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො පමාණිකා[1] ච හොතු අනාරම්භා ච සපරික්කමනා චාති -පෙ- පමාණිකා ච හොතු අනාරම්භා චාති -පෙ- පමාණිකා ච හොතු සපරික්කමනා චාති -පෙ- පමාණිකා හොතූ'ති. නො චෙ සාමං වා ගවෙසෙය්‍ය දූතං වා පහිණෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

23. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'පමාණිකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති පමාණිකං සාරම්භං අපරික්කමනං. සො සුණාති 'කුටි කිර මෙ කයිරති පමාණිකා සාරම්භා අපරික්කමනා'ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො 'අනාරම්භා ච හොතු සපරික්කමනා චා'ති -පෙ- අනාරම්භා හොතූ'ති -පෙ- සපරික්කමනා හොතූ'ති -පෙ- අනාපත්ති.

24. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං. සො සුණාති 'කුටි කිර මෙ කයිරති අදෙසිතවත්ථුකා පමාණාතික්කන්තා සාරම්භා අපරික්කමනා'ති තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං, දූතො වා පාහෙතබ්බො දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භා ච සපරික්කමනා චා'ති -පෙ- 'දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භා චා'ති -පෙ- 'දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච සපරික්කමනා චා'ති -පෙ- දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා චා'ති. නො චෙ සාමං වා ගවෙසෙය්‍ය දූතං වා පහිණෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

25. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං පමාණිකං සාරම්භං අපරික්කමනං. සො සුණාති 'කුටි කිර මෙ කයිරති දෙසිතවත්ථුකා පමාණිකා සාරම්භා අපරික්කමනා'ති තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං, දූතො වා පාහෙතබ්බො අනාරම්භා ච හොතු සපරික්කමනා චා'ති -පෙ- අනාරම්භා හොතූ'ති -පෙ- සපරික්කමනා හොතූ''ති -පෙ- අනාපත්ති.

26. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච ''දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරකානං[2] තිණ්ණං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරකානං ද්වින්නං දුක්කටානං -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරකානං ද්වින්නං දුක්කටානං -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති කාරකානං දුක්කටස්ස.

1. දෙසිතවත්ථුකා. ම.ඡ.සං. 2. කාරුකානං - සයා.

22. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි පමාණිකා ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. හෙතෙම 'මට පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කැරේ ල'යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය. පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ... පමාණික ද අනාරම්භ ද වේවා'යි ... පමාණික ද සපරික්කමන ද වේවා'යි ... පමාණික වේවා'යි ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුලාඇවැත් වේ.

23. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට පමාණික වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. හෙතෙම මට 'පමාණික වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කැරේ ල'යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය. 'අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ... 'අනාරම්භ වේවා'යි ... 'සපරික්කමන වේවා'යි ... ඇවැත් නැති.

24. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි දේසිතවත්‍ථුක ද පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට නො දෙසූ කුටිවත් ඇති පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. හේ මට අදේසිතවත්‍ථුක වූ පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කැරේ ල'යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය. දේසිතවත්‍ථුක ද පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ... දේසිතවත්‍ථුක ද පමාණික ද අනාරම්භ ද වේවා'යි... දේසිතවත්‍ථුක ද පමාණික ද සපරික්කමන ද වේවා'යි ... දෙසිතවත්‍ථුක ද පමාණික ද වේවා'යි (දූතයෙක් හෝ යැවිය යුත්තේ ය.) ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුලාඇවැත් වේ.

25. මහණ තෙමේ 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි දෙසිතවත්‍ථුක ද පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඒ මහණහට දෙසූ කුටිවත් ඇති පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. හෙතෙම 'මට දෙසිතවත්‍ථුක වූ පමාණික වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කැරේ ල'යි අසා ද ඒ මහණහු තමා හෝ යායුතු ය. අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ... අනාරම්භ වේවා'යි .. සපරික්කමන වේවා'යි (දූතයෙක් හෝ යැවිය යුත්තේ ය.) ... ඇවැත් නැති.

26. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි දෙසිතවත්‍ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවායි ඇණව'යි. ඔහට අදෙසිතවත්‍ථුක වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. කරනුවනට තුන් දුකුලාඇවැතෙක් වෙයි. ... සාරම්භවූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කරනුවනට දෙ දුකුලාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කරනුවනට දෙ දුකුලාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කරනුවනට දුකුලාඇවැත් වේ.

27. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

28. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'පමාණිකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං තිණ්ණං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස.

29. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'පමාණිකා ච හොතු අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

30. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භා ච සපරික්කමනා චා''ති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං චතුන්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං තිණ්ණං දුක්කටානං -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං තිණ්ණං දුක්කටානං -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං.

31. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකා ච හොතු පමාණිකා ච අනාරම්භා ච සපරික්කමනා චා'ති. තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං පමාණිකං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස. -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස. -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

27. මහණ තෙමේ 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි 'දේසිතවත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට දේසිතවත්ථුක වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් කාරකයනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) ඇවැත් නැති.

28 මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි "පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් කාරකයනට තුන් දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දුකුළාඇවැත් වේ.

29. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි "පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් කාරකයනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) ඇවැත් නැති.

30. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි "දේසිතවත්ථුක ද පමාණික ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට නො දෙසූ කුටිවත් ඇති පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් කාරකයනට සතර දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට තුන් දුකුළාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට තුන් දුකුළාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දෙ දුකුළාඇවැතෙක් වේ.

31. මහණ තෙම 'මට කුටියක් කරව'යි ඇණවා නික්ම යෙයි. යළි "දේසිත වත්ථුක ද පමාණික ද සපරික්කමන ද වේවා'යි ඇණවයි. ඔහට දෙසූ කුටිවත් ඇති පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) කාරකයනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (කුටියක් කෙරෙත් නම්) ඇවැත් නැති,

32. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, සො චෙ විප්පකතෙ ආගච්ඡති, තෙන භික්ඛුනා සා කුටි අඤ්ඤස්ස වා දාතබ්බා භින්දිත්වා වා පුන කාතබ්බා. නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය භින්දිත්වා වා පුන කාරෙය්‍ය, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, -පෙ- ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

33. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, සො චෙ විප්පකතෙ ආගච්ඡති. තෙන භික්ඛුනා සා කුටි අඤ්ඤස්ස වා දාතබ්බා භින්දිත්වා වා පුන කාතබ්බා. නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය භින්දිත්වා වා පුන කාරෙය්‍ය, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, -පෙ- ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, -පෙ- අනාපත්ති.

34. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. තස්ස කුටිං කරොන්ති පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, සො චෙ විප්පකතෙ ආගච්ඡති. තෙන භික්ඛුනා සා කුටි අඤ්ඤස්ස වා දාතබ්බා භින්දිත්වා වා පුන කාතබ්බා. නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය භින්දිත්වා වා පුන කාරෙය්‍ය, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, -පෙ- ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

35. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. තස්ස කුටිං කරොන්ති පමාණිකං සාරම්භං අපරික්කමනං, සො චෙ විප්පකතෙ ආගච්ඡති. තෙන භික්ඛුනා සා කුටි අඤ්ඤස්ස වා දාතබ්බා භින්දිත්වා වා පුන කාතබ්බා. නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය භින්දිත්වා වා පුන කාරෙය්‍ය, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති දුක්කටස්ස. -පෙ- අනාරම්භං අපරික්කමනං, -පෙ- ආපත්ති දුක්කටස්ස. -පෙ- අනාරම්භං සපරික්කමනං, -පෙ- අනාපත්ති.

36. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'කුටිං මෙ කරොථා'ති. තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, සො චෙ විප්පකතෙ ආගච්ඡති. තෙන භික්ඛුනා සා කුටි අඤ්ඤස්ස වා දාතබ්බා භින්දිත්වා වා පුන කාතබ්බා. නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය භින්දිත්වා වා පුන කාරෙය්‍ය, ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, -පෙ- ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසානං,

32. මහණ තෙම 'මට කුටියක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට නො දෙසූ කුටිවත් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. ඉදින් ඒ මහණ (කුටිය) නොනිමවා-තබන ලද කල්හි පැමිණේ නම්, ඒ මහණහු විසින් ඒ කුටිය අනෙකක්හට හෝ දියයුතු ය. බිඳදමා හෝ වටාලා කළයුතු ය. ඉදින් අනෙකක්හට හෝ නො දේ නම් බිඳපියා හෝ වටාලා නො කෙරේ නම්, සඟවෙසෙස් සමග දෙ දුකුලාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ ... සඟවෙසෙස් සමග දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ ... සඟවෙසෙස් සමග දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ ... සඟවෙසෙස්ඇවැත් වේ.

33. මහණ තෙම 'මට කුටියක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට දෙසූ කුටිවත් ඇති සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. ඉදින් ඒ මහණ (කුටිය) කොට අඩාළ කල්හි පැමිණේ නම් ඒ මහණහු විසින් ඒ කුටිය අනෙකක්හට හෝ දියයුතු ය. බිඳපියා හෝ වටාලා කළයුතු ය. ඉදින් අනෙකක්හට හෝ නො දේ නම් බිඳපියා හෝ වටාලා නො කෙරේ නම් දෙ දුකුලාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ ... දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ ... දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ ... ඇවැත් නැති.

34. මහණ තෙම 'මට කුටියක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති: ඉදින් ඒ මහණ (කුටිය) කොට අඩාළ කල්හි පැමිණේ නම් ඒ මහණහු විසින් ඒ කුටිය අනෙකක්හට හෝ දියයුතු ය. බිඳපියා හෝ වටාලා කළයුතු ය. ඉදින් අනෙකක්හට හෝ නො දේ නම් බිඳපියා හෝ වටාලා නො කෙරේ නම් සඟවෙසෙස් සමග දෙ දුකුලාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ ... සඟවෙසෙස් සමග දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ ... සඟවෙසෙස් සමග දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ ... සඟවෙසෙස්ඇවැත් වේ.

35. මහණ තෙමේ 'මට කුටියක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. ඉදින් ඒ මහණ (කුටිය) කොට අඩාළ කල්හි පැමිණේ නම් ඒ මහණහු විසින් ඒ කුටිය අනෙකක්හට හෝ දියයුතු ය. බිඳපියා හෝ වටාලා කළ යුතු ය. ඉදින් අනෙකක්හට නො දේ නම් හෝ බිඳපියා වටාලා නො කෙරේ නම් හෝ දෙ-දුකුලාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ... දුකුලාඇවැත් වෙයි.... අනාරම්භ වූ අපරික්කමන වූ ... දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ ... ඇවැත් නැති.

36. මහණ තෙම 'මට කුටියක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට නො දෙසූ කුටිවත් ඇති පමණ ඉක්ම වූ සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. ඉදින් ඒ මහණ (කුටිකම්) කොට අඩාළ කල්හි පෙරළා ඒ නම්, ඒ මහණහු විසින් ඒ කුටිය අනෙකක්හට හෝ දියයුතු ය: බිඳපියා හෝ වටාලා කළ යුතු ය. ඉදින් අනෙකක්හට නො දේ නම් හෝ බිඳපියා වටාලා නො කෙරේ නම් හෝ දෙ සඟවෙසෙසක් සමග දෙ දුකුලාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ ... දෙ සඟවෙසෙසක් සමග දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ ... දෙ සඟවෙසෙසක් සමග දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ ... දෙ සඟවෙසෙස්ඇවැත් වේ.

37. භික්ඛු සමාදිසිත්වා පක්කමති ‘කුටිං මෙ කරොථා’ති. තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං පමාණිකං සාරම්භං අපරික්කමනං, සො චෙ විප්පකතෙ ආගච්ඡති. තෙන භික්ඛුනා සා කුටි අඤ්ඤස්ස වා දාතබ්බා භින්දිත්වා වා පුන කාතබ්බා, නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය භින්දිත්වා වා පුන කාරෙය්‍ය, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, -පෙ- ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, -පෙ- ආපත්ති දුක්කටස්ස. භික්ඛු සමාදිසිත්වා පක්කමති ‘කුටිං මෙ කරොථා’ති. තස්ස කුටිං කරොන්ති දෙසිතවත්ථුකං පමාණිකං අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

38. අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

39. අනාපත්ති ලෙනෙ ගුහාය තිණකුටිකාය අඤ්ඤස්සත්ථාය, වාසාගාරං ඨපෙත්වා සබ්බත්ථ, අනාපත්ති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**කුටිකාරසික්ඛාපදං නිට්ඨිතං.**

## 3. 7.

## විහාරකාරසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො ඡන්නස්ස උපට්ඨාකො ගහපති ආයස්මන්තං ඡන්නං එතදවොච: ‘විහාරවත්ථුං භන්තෙ ජානාහි, අය්‍යස්ස විහාරං කාරාපෙස්සාමී’ති. අථ ඛො ආයස්මා ඡන්නො විහාරවත්ථුං සොධෙන්තො අඤ්ඤතරං චෙතියරුක්ඛං ඡෙදාපෙසි ගාමපූජිතං නිගමපූජිතං නගරපූජිතං ජනපදපූජිතං රට්ඨපූජිතං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ‘කථං හි නාම සමණා සක්‍යපුත්තියා චෙතියරුක්ඛං ඡෙදාපෙස්සන්ති ගාමපූජිතං නිගමපූජිතං නගරපූජිතං ජනපදපූජිතං රට්ඨපූජිතං, එකින්ද්‍රියං සමණා සක්‍යපුත්තියා ජීවං විහෙඨෙන්තී’ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං, යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “කථං හි නාම ආයස්මා ඡන්නො චෙතියරුක්ඛං ඡෙදාපෙස්සති, ගාමපූජිතං -පෙ- රට්ඨපූජිත”න්ති.

37. මහණ තෙම 'මට කුටියක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට දෙසූ කුටිවත් ඇති පමණින් යුත් සාරම්භ වූ අපරික්කමන වූ කුටියක් කෙරෙති. ඉදින් හෙතෙම (කුටිය) අවසන් නොකළ කල්හි පෙරළා ඒ නම්, ඒ මහණහු විසින් ඒ කුටිය අනෙකක්හට හෝ දියයුතු ය. බිඳපියා හෝ වටාලා කළයුතු ය. ඉදින් අනෙකක්හට නො දේ නම් හෝ බිඳපියා වටාලා නො කරවා නම් හෝ දෙ දුකුලාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ ... දුකුලාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ ... දුකුලාඇවැත් වෙයි. මහණ තෙම 'මට කුටියක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට දෙසූ කුටිවත් ඇති පමණින් යුත් අනාරම්භ වූ සපරික්කමන වූ කුටියක් කෙරෙත් නම් ඇවැත් නැති.

38. තමා විසින් අවසන් නො කරන ලද්ද තෙමේ නිමවා නම්, සඞඝවෙසෙස්-ඇවැත් වෙයි. තමා විසින් කොට අඩාළ කරන ලද්ද මෙරමා ලවා නිමවා නම්, සඞඝවෙසෙස්ඇවැත් වෙයි. මෙරමා විසින් නොනිමවා තබන ලද්ද තෙමේ නිමවා නම්, සඞඝවෙසෙස්ඇවැත් වෙයි. මෙරමා විසින් කොට අඩාළ කරන ලද්ද මෙරමා ලවා නිම කරවා නම්, සඞඝවෙසෙස්ඇවැත් වේ.

39. ලෙනෙහි, ගුහායෙහි, තණකිළියෙහි, අනෙකක්හු උදෙසා කරණ ලද්දෙහි, වසන ගෙය හැර හැම තැනැදූ යි ඇවැත් නැති. උම්මත්තකයහට, ආදිකම්මිකයාහට ඇවැත් නැති.

**කුටිකාර ශික්ෂාපදය නිමි.**

---

# 3. 7.

## විහාරකාරශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වාසය කරණ සේක. එසමයෙහි ආයුෂමත් ඡන්න තෙරුන්ගේ උපස්ථායක වූ ගෘහපති තෙම ආයුෂමත් ඡන්න තෙරුන්ට මෙපවත් කීය: 'වහන්ස, ආර්‍ය්‍යයන් වහන්සේට විහාරයක් කරවන්නෙමි. විහාරයට ගෙබිමක් දනුව'යි. ඉක්බිති ආයුෂමත් ඡන්නයෝ විහාරවාස්තුව ශුද්ධ කරන්නාහු ගැමියන් විසින් පුදන ලද නියම්ගම් වැස්සන් විසින් පුදන ලද නුවරුන් විසින් පුදන ලද දනව්වැස්සන් විසින් පුදන ලද රටවැසියන් විසින් පුදන ලද එක්තරු සැරැකක් සිඳෑ වූහ. මනුෂ්‍යයෝ 'කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ ගැමියන් විසින් පුදන ලද නිගමුන් විසින් පුදන ලද නුවරුන් විසින් පුදන ලද දනව්වැස්සන් විසින් පුදන ලද රටවැස්සන් විසින් පුදන ලද සැරැක සිඳු වූහු ද, ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ එකින්‍ද්‍රියජීවය කලකුරුවති'යි මනුෂ්‍යයෝ අවමන් කෙරෙති. අයුණු කියති, දෙස් පහළ කෙරෙති. භික්ෂූහු අවමන් කරන අයුණු කියන දෙස් පහළ කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. අල්පෙච්ඡ වූ යම් මහණ කෙනෙක් වෙත් නම් ඔහු අවමන් කෙරෙති. අයුණු කියති දෙස් පහළ කෙරෙති. 'කෙසේ නම් ආයුෂමත් ඡන්න තෙමේ ගැමියන් විසින් පුදන ලද ... රටවැසියන් විසින් පුදන ලද සැරැකක් සිඳෑවී ද?'යි.

2. අථ ඛො තෙ භික්ඛූ ආයස්මන්තං ඡන්නං අනෙකපරියායෙන විගරහිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර ත්වං ඡන්න, චෙතියරුක්ඛං ඡෙදාපෙසි ගාමපූජිතං -පෙ- රට්ඨපූජිත"න්ති "සච්චං භගවා"ති. විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම ත්වං මොඝපුරිස, චෙතියරුක්ඛං ඡෙදාපෙස්සසි ගාමපූජිතං නිගමපූජිතං නගරපූජිතං ජනපදපූජිතං රට්ඨපූජිතං. ජීවසඤ්ඤිනො හි මොඝපුරිස, මනුස්සා රුක්ඛස්මිං, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන සස්සාමිකං අත්තුද්දෙසං, භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය. තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමනං, සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනෙ මහල්ලකං විහාරං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය, සඞ්ඝාදිසෙසො"**ති.

**මහල්ලකො** නාම: විහාරො සස්සාමිකො වුච්චති.

**විහාරො** නාම: උල්ලිත්තො වා හොති අවලිත්තො වා උල්ලිත්තාවලිත්තො වා.

**කාරයමානෙනාති**: කරොන්තො වා කාරාපෙන්තො වා.

**සස්සාමිකන්ති**: අඤ්ඤො කොචි සාමිකො හොති ඉත්ථී වා පුරිසො වා ගහට්ඨො වා පබ්බජිතො වා.

**අත්තුද්දෙසන්ති** අත්තනො අත්ථාය.

**භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනායාති** තෙන විහාරකාරකෙන භික්ඛුනා විහාරවත්ථුං සොධෙත්වා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා බුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සොහං භන්තෙ සඞ්ඝං විහාරවත්ථුඔලොකනං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බො, තතියම්පි යාචිතබ්බො. සචෙ සබ්බො සඞ්ඝො උස්සහති විහාරවත්ථුං ඔලොකෙතුං, සබ්බෙන සඞ්ඝෙන ඔලොකෙතබ්බං. නො චෙ සබ්බො සඞ්ඝො උස්සහති විහාරවත්ථුං ඔලොකෙතුං, යෙ තත්ථ හොන්ති භික්ඛූ ව්‍යත්තා පටිබලා සාරම්භං අනාරම්භං සපරික්කමනං අපරික්කමනං ජානිතුං, තෙ යාචිත්වා සම්මන්නිතබ්බා. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං විහාරවත්ථුඔලොකනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛූ සම්මන්නෙය්‍ය, ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං. එසා ඤත්ති.

2. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් ඡන්න තෙරුන්ට නොයෙක් අයුරින් ගරහා භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ ... "සැබවෙක් ද ඡන්නය, තෝ ගැමියන් විසින් පුදන ලද ... රටුන් විසින් පුදන ලද සෑරුකක් සිඳැවූයෙහිදැ?,යි. 'සැබව භාග්‍යවතුන් වහන්සැ'යි. භාග්‍යවත් බුදුහු මෙසෙයින් ගැරහූ කළහ. හිස් පුරුෂය, කෙසේ නම් තෝ ගැමියන් විසින් පුදන ලද නිගමුන් විසින් පුදන ලද නුවරුන් විසින් පුදන ලද දනව්වැසියන් විසින් පුදන ලද රටුන් විසින් පුදන ලද සෑරුකක් සිඳැවූයෙහි ද? හිස් පුරුෂය, මනුෂ්‍යයෝ වෘක්ෂයෙහි ජීවසංඥා ඇත්තාහු ම ය. හිස් පුරුෂය, තෙල නො පහන් වූවන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි,, ... තවද මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසවු:

**"කරවා දෙන හිමියන් ඇති තමා උදෙසා වූ මහල්ලක විහාරයක් කරවන මහණහු විසින් වාස්තුදේශනාව පිණිස භික්ෂූහු පැමිණවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් නිරුපද්‍රව වූ උපචාර සහිත වූ ගෙබිම දෙසියයුතු ය. ඉදින් මහණ තෙම උපද්‍රව සහිත වූ උපචාර රහිත වූ ගෙබිම්හි මහල්ලකවිහාරයක් කරවා නම් වාස්තුදෙශනාව පිණිස භික්ෂූන් නො පමුණුවා නම් සඟාදිසෙස් වේ ය"යි.**

**මහල්ලක** නම්: සස්වාමික වූ විහාරය කියනු ලැබේ.

**විහාර** නම්: ඇතුළත පිරියම් කරණ ලදුයේ හෝ පිටත පිරියම් කරණ ලදුයේ හෝ ඇතුළත පිටත පිරියම් කරණ ලදුයේ හෝ වේ.

**කාරයමානෙන** යනු: කරණුයේ හෝ කරවනුයේ හෝ ය.

**සස්සාමිකං** යනු. ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ගෘහස්ථයෙක් හෝ ප්‍රව්‍රජිතයෙක් හෝ අන් කිසි හිමියෙක් වේ.

**අත්තුද්දෙසං** යනු: තමා සඳහා.

**භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය** යනු: ඒ විහාරකාරක භික්ෂූහු විසින් විහාරවාස්තුව ශුද්ධ කොට සඟුන් වෙත එළැඹ උතුරුසඟ එකස් කොට මහලුතෙරුන් පා වැඳ උළුල්ලෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය. 'වහන්ස, මම කරවා දෙන හිමියන් ඇති තමා උදෙසා වූ මහල්ලකවිහාරයක් කරණු කැමැත්තෙමි. වහන්ස, ඒ මම විහාරවාස්තු අවලොකනයට සඞ්ඝයා අයැදිමි'යි. දෙවන වට ද යැදිය යුතු ය. තෙවන වට ද යැදිය යුතු ය. ඉදින් හැම සඞ්ඝ තෙමේ විහාරවාස්තුව බැලීම ඉවසා නම් හැම සඞ්ඝයා විසින් බැලිය යුතු ය. ඉදින් හැම සඞ්ඝ තෙමේ විහාරවාස්තුව බැලීම නො ඉවසා නම් සෝපද්‍රව අනුපද්‍රව බව සෝපචාර අනුපචාර බව දැනගන්නට ව්‍යක්ත වූ ප්‍රතිබල වූ යම් භික්ෂු කෙනෙක් එහි වෙත් නම් ඒ භික්ෂූහු අයැද සම්මත කළ යුත්තාහ. තවද මහණෙනි, මෙසෙයින් සම්මත කළ යුත්තාහ: ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය.

'වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා, මේ මෙනම් මහණ තෙම තමා උදෙසා වූ මහල්ලකවිහාරයක් කරණු කැමැත්තේ ය. හේ විහාරවාස්තුව බැලීමට සඞ්ඝයා අයැදී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහුගේ විහාරවාස්තුව බලන්නට මෙනම් වූ ද මෙනම් වූ ද භික්ෂූන් සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යි.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං විහාරවත්ථුඔලොකනං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛූ සම්මන්නති, ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස ච ඉත්ථන්නාමස්ස ච භික්ඛූනං සම්මුති ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය

සම්මතා සඞ්ඝෙන ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච භික්ඛූ ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථුං ඔලොකෙතුං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

තෙහි සම්මතෙහි භික්ඛූහි තත්ථ ගන්ත්වා විහාරවත්ථු ඔලොකෙතබ්බං. සාරම්භං අනාරම්භං සපරික්කමනං අපරික්කමනං ජානිතබ්බං. සචෙ සාරම්භං හොති අපරික්කමනං, මායිධ කරීති වත්තබ්බො. සචෙ අනාරම්භං හොති සපරික්කමනං, සඞ්ඝස්ස ආරොචෙතබ්බං අනාරම්භං සපරික්කමනන්ති. තෙන විහාරකාරකෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං සො'හං භන්තෙ සඞ්ඝං විහාරවත්ථුදෙසනං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බො, තතියම්පි යාචිතබ්බො. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං විහාරවත්ථුදෙසනං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථුං දෙසෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු මහල්ලකං විහාරං කත්තුකාමො සස්සාමිකං අත්තුද්දෙසං. සො සඞ්ඝං විහාරවත්ථුදෙසනං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථුං දෙසෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථුස්ස දෙසනා, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දෙසිතං සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො විහාරවත්ථු. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

**සාරම්භං** නාම: කිපිල්ලිකානං වා ආසයො හොති -පෙ- සංසරණනිස්සිතං වා හොති, එතං සාරම්භං නාම.

**අපරික්කමනං** නාම: න සක්කා හොති යථායුත්තෙන සකටෙන අනුපරිගන්තුං, සමන්තා නිස්සෙණියා අනුපරිගන්තුං. එතං අපරික්කමනං නාම.

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙමේ හිමියන් ඇති තමා උදෙසා වූ මහල්ලකවිහාරයක් කරණු කැමැත්තේ ය. හෙතෙම විහාරවාස්තුව බැලීමට සඞ්ඝයා අයැද සිටී. සඞ්ඝ තෙමේ මෙනම් මහණහුගේ විහාරවාස්තුව බලන්නට මෙනම් වූ ද මෙනම් වූ ද භික්ෂූන් සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතක්හට මෙනම් මහණහුගේ විහාර වාස්තුව බලන්නට මෙනම් වූ ද මෙනම් වූ ද භික්ෂූන් සම්මත කිරීම රුචි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රුස්නේ නම් හේ බණන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණහුගේ විහාරවාස්තුව බලන්නට මෙනම් වූ ද මෙනම් වූ ද මහණහු සම්මත කරණ ලද්දහ. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් තුෂ්ණීම් වෙ යි. මෙසේ ධරමි'යි.

ඒ සම්මත වූ භික්ෂූන් විසින් එහි ගොස් විහාරවාස්තුව බැලියයුතු ය. සෝපද්‍රව බව නිරුපද්‍රව බව සොපචාර බව අනුපචාර බව දතයුතු යි. ඉදින් සාරම්භ අපරික්කමන වේ නම් 'මෙහි නගමක් කරු'යි කියයුත්තේ ය. ඉදින් අනාරම්භ සපරික්කමන වේ නම්, අනාරම්භය ය සපරික්කමන ය"යි සඞ්ඝයාට ආරෙවන කළයුතු ය. ඒ විහාරකාරක මහණහු විසින් සඟුන් වෙත එළැඹ උතුරුසඟ එකස් කොට මහලුතෙරුන් පා වැඳ උළුක්කුටියෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය. 'වහන්ස, මම සස්වාමික වූ ආත්මොද්දේශ්‍ය වූ මහල්ලකවිහාරයක් කරණු කැමැත්තෙමි. වහන්ස, ඒ මම විහාරවාස්තු දෙශනාවට සඞ්ඝයා අයදිමි'යි. දෙවන වට ද යැදියයුතු ය. තෙවන වට ද යැදියයුතු ය. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය.

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා, මේ මෙනම් මහණ තෙම සස්වාමික වූ ආත්මොද්දේශ්‍ය වූ මහල්ලකවිහාරයක් කරණු කැමැත්තේ ය. හෙතෙම විහාරවාස්තුදෙශනාවට සඞ්ඝයා අයැද සිටී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මෙනම් මහණහුගේ විහාරවාස්තුව දෙසන්නේ ය. මේ ඤත්තිය" යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම සස්වාමික වූ ආත්මොද්දේශ්‍ය වූ මහල්ලකවිහාරයක් කරණු කැමැත්තේ ය. හෙතෙම විහාරවාස්තුදේශනාවට සඞ්ඝයා අයැද සිටී. සඞ්ඝ තෙමේ මෙනම් මහණහුගේ විහාරවාස්තුව දෙසයි. යම් ආයුෂ්මතක්හට මෙනම් මහණහුගේ විහාරවාස්තුදෙශනාව රුචි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රුස්නේ නම් හේ බණන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණහුගේ විහාරවාස්තුව දෙසන ලදී. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් තුෂ්ණීම් වෙ යි. මෙසේ ධරමි"යි.

**සාරම්භ** නම්: කුහුඹුවන්ගේ හෝ බිලයෙක් වෙයි. ... යන එන මඟ ඇසිරි කරණ ලද හෝ වේ. මේ සාරම්භ නම.

**අපරික්කමන** නම්: ගොනුන් යෙදූ ගැලකින් සිසාරා යන්නට, හාත්පස හිණකින් සිසාරා යන්නට නො හැකි වෙයි. මේ අපරික්කමන නම,

**අනාරම්භං** නාම: න කිපිල්ලිකානං වා ආසයො හොති -පෙ- න සංසරණනිස්සිතං වා හොති. එතං අනාරම්භං නාම.

**සපරික්කමනං** නාම: සක්කා හොති යථායුත්තෙන සකටෙන අනුපරිගන්තුං, සමන්තා නිස්සෙනියා අනුපරිගන්තුං. එතං සපරික්කමනං නාම.

**මහල්ලකො** නාම: විහාරො සස්සාමිකො වුච්චති.

**විහාරො** නාම: උල්ලිත්තො වා හොති අවලිත්තො වා උල්ලිත්තාවලිත්තො වා.

**කාරයෙය්‍යාති** කරොති වා කාරාපෙති වා.

**භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනායාති** ඤත්තිදුතියෙන කම්මෙන විහාරවත්ථුං න දෙසාපෙත්වා කරොති වා කාරාපෙති වා, පයොගෙ පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**සඞ්ඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

3. භික්ඛු විහාරං කරොති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං.

භික්ඛු විහාරං කරොති අදෙසිතවත්ථුකං සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු විහාරං කරොති අදෙසිතවත්ථුකං අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

භික්ඛු විහාරං කරොති අදෙසිතවත්ථුකං අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

භික්ඛු විහාරං කරොති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං.

භික්ඛු විහාරං කරොති දෙසිතවත්ථුකං සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු විහාරං කරොති දෙසිතවත්ථුකං අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස.

භික්ඛු විහාරං කරොති දෙසිතවත්ථුකං අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

භික්ඛු සමාදිසති 'විහාරං මෙ කරොථා'ති. තස්ස විහාරං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

**අනාරම්භ** නම්: කුහුඹුවන්ගේ හෝ බිලයෙක් නො වෙයි ... යන එන මග ඇසිරි කරණ ලද්දේ හෝ නො වේ. මෙල අනාරම්භ නම්.

**සපරික්කමන** නම්: ගොනුන් යෙදූ ගැලකින් සිසාරා යන්නට, හාත්පස නිණකින් සිසාරා යන්නට හැකි වේ. මෙල සපරික්කමන නම්.

**මහල්ලක** නම්: සස්වාමික වූ විහාරය කියනු ලැබේ.

**විහාර** නම්: ඇතුලත පිරියම් කරණ ලද්දේ හෝ පිටත පිරියම් කරණ ලද්දේ හෝ ඇතුලත පිටත පිරියම් කරණ ලද්දේ හෝ වේ.

**කාරෙය්‍ය** යනු: කෙරෙයි හෝ කරවා හෝ යි.

**භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය** යනු: ඤත්තිදුතිය කම්මවදනින් විහාරවාස්තුව නොදෙසවා කෙරෙයි හෝ කරවා හෝ පියොවිහි පියොවිහි දුකුළා වෙයි. පැසුළු මැටිපිඩ නො පත් කල්හි තුලැසිඇවැත් වෙයි. ඒ පිඩ පැමිණි කල්හි සඟවෙසෙස්ඇවැත් වේ.

**සඞ්ඝාදිසෙසො** යනු ... එහිනු දු සඞ්ඝාදිසෙස ය යි කියනු ලැබේ.

3. මහණ තෙම නො දෙසූ ගෙබිම් ඇති උපද්‍රව සහිත වූ උපචාර රහිත වූ විහාරයක් කෙරේ හෝ කරවා නම් සඟවෙසෙස් සමග දෙ දුකුළා-ඇවැතෙක් වෙයි.

මහණ තෙම නො දෙසූ ගෙබිම් ඇති උපද්‍රව සහිත වූ උපචාර සහිත වූ විහාරයක් කරවා නම් සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වෙයි.

මහණ තෙම නො දෙසූ ගෙබිම් ඇති අනුපද්‍රව වූ උපචාර රහිත වූ විහාරයක් කෙරේ හෝ කරවා නම් සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වෙයි.

මහණ තෙම නො දෙසූ ගෙබිම් ඇති අනුපද්‍රව වූ උපචාර සහිත වූ විහාරයක් කෙරෙයි හෝ කරවා නම් සඟවෙසෙස්ඇවැත් වේ.

මහණ තෙම දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙයි හෝ කරවා නම් දෙ දුකුළාඇවැතෙක් වෙයි.

මහණ තෙම දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ සපරික්කමන වූ විහාරයක් කෙරෙයි හෝ කරවා නම් දුකුළාඇවැත් වෙයි.

මහණ තෙම දෙසූ ගෙබිම් ඇති අනාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙයි හෝ කරවා නම් දුකුළාඇවැත් වෙයි.

මහණ තෙම දෙසූ ගෙබිම් ඇති අනාරම්භ වූ සපරික්කමන වූ විහාරයක් කෙරෙයි හෝ කරවා නම් ඇවැත් නැති.

මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවයි. ඔහට නො දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙත් නම් සඟවෙසෙස් සමග දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම් සඟවෙසෙස්-ඇවැත් වේ.

4. භික්ඛු සමාදිසති 'විහාරං මෙ කරොථා'ති. තස්ස විහාරං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

5. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. න ච සමාදිසති 'දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො ච සපරික්කමනො චා'ති. තස්ස විහාරං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

6. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. න ච සමාදිසති දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො ච සපරික්කමනො චාති. තස්ස විහාරං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

7. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො ච සපරික්කමනො චා'ති. තස්ස විහාරං කරොන්ති, අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං. සො සුණාති: 'විහාරො කිර මෙ කයිරති අදෙසිතවත්ථුකො සාරම්භො අපරික්කමනො'ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො, 'දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො ච සපරික්කමනො චා'ති. නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය ආපත්ති දුක්කටස්ස -පෙ- දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො චාති -පෙ- දෙසිතවත්ථුකො ච හොතු සපරික්කමනො චාති -පෙ- දෙසිතවත්ථුකො හොතූ'ති. නො චෙ සාමං වා ගච්ඡෙය්‍ය දූතං වා පහිණෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

8. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො ච සපරික්කමනො චා'ති. තස්ස විහාරං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං. සො සුණාති: "විහාරො කිර මෙ කයිරති දෙසිතවත්ථුකො සාරම්භො අපරික්කමනො"ති. තෙන භික්ඛුනා සාමං වා ගන්තබ්බං, දූතො වා පාහෙතබ්බො, අනාරම්භො ච හොතු සපරික්කමනො චා'ති -පෙ- අනාරම්භො හොතූ"ති -පෙ- සපරික්කමනො හොතූ"ති -පෙ- අනාරම්භං සපරික්කමනං,[1] අනාපත්ති.

1. අනාරම්භං සපරික්කමනං ම. ජ .ස්‍යා: නාදිස්සති.

4. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවයි. ඔහට දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙත් නම් දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) දුකුළා-ඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) ඇවැත් නැති.

5. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි. 'දේසිතවත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ද අණවයි. ඔහට නො දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙත් නම් සඟවෙසෙස් සමග දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස්-ඇවැත් වෙයි. අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස්ඇවැත් වේ.

6. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි. 'දේසිත-වත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි නො ද අණවයි. ඔහට දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙත් නම් දෙ දුකුළා-ඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ විහාරයක් කෙරෙත් නම් දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) ඇවැත් නැති.

7. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි. 'දෙසූ ගෙබිම් ඇත්තේ ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි අණවත්තේත් වෙයි. ඔහට නො දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙති. හෙතෙම මට නො දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයෙක් කෙරේ ල'යි අසා නම් ඒ මහණහු විසින් තමා ම හෝ යායුතු ය. 'දෙසූ ගෙබිම් ඇත්තේ ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළාඇවැත් වෙයි. ... දේසිතවත්ථුක ද අනාරම්භ ද වේවා'යි (දූතයකු හෝ නො යවා නම්) ... දේසිතවත්ථුක ද සපරික්කමන ද වේවා'යි (දූතයකු හෝ නො යවා නම්) ... දේසිතවත්ථුක වේවා'යි ඉදින් තෙමේ හෝ නො යේ නම් දූතයකු හෝ නො යවා නම් දුකුළාඇවැත් වේ.

8. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි. යළි 'දේසිතවත්ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි අණවයි. ඔහට දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙති. හෙතෙම 'මට දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයෙක් කැරේ ල'යි අසා නම් ඒ මහණහු විසින් තමා හෝ යායුතු ය. 'අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය. ... අනාරම්භ වේවා'යි ... සපරික්කමන වේවා'යි ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) ඇවැත් නැති.

9. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො ච සපරික්කමනො චා'ති. තස්ස විහාරං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං තිණ්ණං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස.

10. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. සමාදිසති ච 'දෙසිතවත්ථුකො ච හොතු අනාරම්භො ච සපරික්කමනො චා'ති. තස්ස විහාරං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති කාරුකානං දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

11. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. තස්ස විහාරං කරොන්ති අදෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං. සො ච විප්පකතෙ ආගච්ඡති. තෙන භික්ඛුනා සො විහාරො අඤ්ඤස්ස වා දාතබ්බො, භින්දිත්වා වා පුන කාතබ්බො. නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය, භින්දිත්වා වා පුන කාරෙය්‍ය, ආපත්ති සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

12. භික්ඛු සමාදිසිත්වා පක්කමති 'විහාරං මෙ කරොථා'ති. තස්ස විහාරං කරොන්ති දෙසිතවත්ථුකං සාරම්භං අපරික්කමනං, සො ච විප්පකතෙ ආගච්ඡති. තෙන භික්ඛුනා සො විහාරො අඤ්ඤස්ස වා දාතබ්බො භින්දිත්වා වා පුන කාතබ්බො. නො චෙ අඤ්ඤස්ස වා දදෙය්‍ය භින්දිත්වා වා පුන කාරෙය්‍ය ආපත්ති ද්වින්නං දුක්කටානං -පෙ- සාරම්භං සපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං අපරික්කමනං, ආපත්ති දුක්කටස්ස -පෙ- අනාරම්භං සපරික්කමනං, අනාපත්ති.

13. අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස

14. අනාපත්ති ලෙණෙ ගුහාය තිණකුටිකාය අඤ්ඤස්සත්ථාය, වාසාගාරං ඨපෙත්වා සබ්බත්ථ, අනාපත්ති උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**විහාරකාරසික්ඛාපදං නිට්ඨිතං.**

9. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි. යළි 'දේසිතවත්‍ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි අණවෙයි. ඔහට අදේසිතවත්‍ථුක වූ සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙත් නම් කරණුවනට තුන් දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) කරණුවනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) කරණුවනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) කරණුවනට දුකුළාඇවැත් වේ.

10. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි යළි 'දේසිතවත්‍ථුක ද අනාරම්භ ද සපරික්කමන ද වේවා'යි අණවයි. ඔහට දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙත් නම් කරණුවනට දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) කරණුවනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම් කරණුවනට දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) ඇවැත් නැති.

11. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට නො දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙති. ඉදින් ඒ මහණ විහාරය කොට අඩාල කල්හි පැමිණේ නම් ඒ මහණහු විසින් ඒ වෙහෙර අනෙකක්හට හෝ දියයුත්තේ ය. බිඳපියා හෝ වටාලා කළයුත්තේ ය. ඉදින් අනෙකක්හට හෝ නො දේ නම් බිඳපියා හෝ වටාලා නො කරවා නම් සඟවෙසෙස් සමග දෙ දුකුළාඇවැතෙක් වෙයි. .... සාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) සඟවෙසෙස්ඇවැත් වේ.

12. මහණ තෙම 'මට විහාරයක් කරව'යි අණවා නික්ම යෙයි. ඔහට දෙසූ ගෙබිම් ඇති සාරම්භ වූ අපරික්කමන වූ විහාරයක් කෙරෙති. ඉදින් හෙතෙම විහාරය කොට අඩාල කල්හි පැමිණේ නම් ඒ මහණහු විසින් ඒ විහාරය අනෙකක්හට හෝ දියයුත්තේ ය. බිඳපියා හෝ වටාලා කළයුත්තේ ය. ඉදින් අනෙකක්හට හෝ නො දේ නම් බිඳපියා හෝ වටාලා නො කරවා නම් දෙ දුකුළාඇවැතෙක් වෙයි. ... සාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ අපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) දුකුළාඇවැත් වෙයි. ... අනාරම්භ වූ සපරික්කමන වූ (විහාරයක් කෙරෙත් නම්) ඇවැත් නැති.

13. තමා විසින් කොට අඩාල කරණ ලද්ද තමා විසින් කොට නිමවා නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. තමා විසින් කොට අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. මෙරමා විසින් කොට අඩාල කරණ ලද්ද තමා විසින් නිමවා නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. මෙරමා විසින් කොට අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් සඟවෙසෙස්ඇවැත් වේ.

14. ලෙනෙහි, ගුහායෙහි, තණකිළියෙහි, අනෙකක්හට කරවා නම්, වාසාගාර තබා හැම තන්හි දූ යි ඇවැත් නැති. උන්මත්තකයා හට, ආදිකාර්මිකයා හට ඇවැත් නැති.

**විහාරකාර ශික්ෂාපදය නිමි.**

# 3. 8.

## පඨම-දුට්ඨදොසසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතා දබ්බෙන මල්ලපුත්තෙන ජාතියා සත්තවස්සෙන අරහත්තං සච්ඡිකතං හොති, යං[1] කිඤ්චි සාවකෙන පත්තබ්බං, සබ්බං තෙන අනුප්පත්තං හොති, නත්ථි චස්ස කිඤ්චි උත්තරිං කරණීයං, කතස්ස වා පතිචයො. අථ ඛො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "මයා ඛො ජාතියා සත්තවස්සෙන අරහත්තං සච්ඡිකතං. යං කිඤ්චි සාවකෙන පත්තබ්බං සබ්බං මයා අනුප්පත්තං, නත්ථි ච මෙ කිඤ්චි උත්තරිං කරණීයං, කතස්ස වා පතිචයො. කිං නු ඛො අහං සඞ්ඝස්ස වෙය්‍යාවච්චං කරෙය්‍ය'න්ති. අථ ඛො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස එතදහොසි: "යන්නූනාහං සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙය්‍යං, භත්තානි ච උද්දිසෙය්‍ය"න්ති.

2. අථ ඛො ආයස්මා **දබ්බො මල්ලපුත්තො** සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා දබ්බො මල්ලපුත්තො භගවන්තං එතදවොච: "ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: මයා ඛො ජාතියා සත්තවස්සෙන අරහත්තං සච්ඡිකතං. යං කිඤ්චි සාවකෙන පත්තබ්බං සබ්බං මයා අනුප්පත්තං, නත්ථි ච මෙ කිඤ්චි උත්තරිං කරණීයං. කතස්ස වා පතිචයො, කිං නු ඛො අහං සඞ්ඝස්ස වෙය්‍යාවච්චං කරෙය්‍ය"න්ති. තස්ස මය්හං භන්තෙ එතදහොසි: "යන්නූනාහං සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙය්‍යං, භත්තානි ච උද්දිසෙය්‍ය"න්ති. "ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙතුං, භත්තානි ච උද්දිසිතු"න්ති. "සාධු සාධු දබ්බ තෙන හි ත්වං දබ්බ සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙහි, භත්තානි ච උද්දිසා"ති. "එවං භන්තෙ"ති ඛො අයස්මා දබ්බො මල්ලපුත්තො භගවතො පච්චස්සොසි.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "තෙන හි භික්ඛවෙ සඞ්ඝො දබ්බං මල්ලපුත්තං සෙනාසනපඤ්ඤාපකඤ්ච භත්තුද්දෙසකඤ්ච සම්මන්නතු. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං දබ්බො මල්ලපුත්තො යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං සෙනාසනපඤ්ඤාපකඤ්ච භත්තුද්දෙසකඤ්ච සම්මන්නෙය්‍ය, එසා ඤත්ති:

---

1. යඤ්ච කිඤ්චි, මූ.

# 3. 8.

## පඨමදුට්ඨදොසසික්ඛාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර සමීපයෙහි වූ කලන්දකනිවාප නම් වූ වේළුවනයෙහි වාසය කරණ සේක. එසමයෙහි උපතින් සත්වැසි වූ මල්ලරජපුත්‍ර දබ්බ තෙරුන් විසින් අර්හත්ත්වය පසක් කරණ ලද වෙයි. ශ්‍රාවකයන්හු විසින් ලැබියයුතු (ත්‍රිවිද්‍යාදි) යම්කිසි ගුණජාතයෙක් වේ ද ඒ සියල්ල ඔවුන් විසින් ලබන ලද වෙයි. ඔවුන් විසින් මත්තෙහි කටයුත්තෙක් හෝ කරණ ලද්දහුගේ වටාලා වැඩීමෙක් හෝ නැත්තේ ද වෙයි. එකල්හි ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රයන්ට රහසිගත ව විවෙක ව හුන්නවුන්ට මෙබඳු වූ චිත්තපරිවිතර්කයෙක් උපන. 'උපතින් සත්හැවිරිදි වූ මා විසින් රහත් බව පසක් කරණ ලද. ශ්‍රාවකයන්හු විසින් ලැබියයුතු යම්කිසි ගුණජාතයෙක් වේ නම් ඒ සියල්ල මා විසින් ලබන ලද. මා විසින් මත්තෙහි කටයුත්තෙක් හෝ කරණ ලද්දහුගේ වැඩීමෙක් හෝ නැත්තේ ද වෙයි. මම් සඟහට කිනම් වතාවතක් කෙරෙම් දෝ හෝ'යි. ඉක්බිති ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයනට මේ සිත විය. 'මම් සඟහට සෙනසුන් ද පනවම් නම් බත් ද උදෙසම් නම් මැනැවැ'යි.

2. ඉක්බිති ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ සවස් වේලෙහි පිළිසලනින් නැඟී සිටියාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට එකත්පස් ව හුන්නාහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ "ස්වාමීනි, මෙහි රහොගත ව විවෙකී ව හුන් මට මෙබඳු වූ චිත්තපරිවිතර්කයෙක් උපන. උපතින් සත්හැවිරිදි වූ මා විසින් රහත් බව පසක් කරණ ලද. ශ්‍රාවකයන්හු විසින් ලැබියයුතු වූ සියලු ගුණජාතය මා විසින් ලබන ලද. මා විසින් මත්තෙහි කටයුතු කිසිවක් හෝ කරණ ලද්දහුගේ වටාලා වැඩීමෙක් හෝ නැත්තේ ද වෙයි. මම් සඟහට කිනම් වතාවතක් කෙරෙම් දෝ හෝ'යි. ස්වාමීනි, ඒ මට මේ සිත විය: මම් සඟහට සෙනසුන් ද පනවම් නම් බතුදු උදෙසම් නම් මනා මැ නු'යි. ස්වාමීනි, මම් සඟහට සෙනසුනුදු පනවන්නට බතුදු උදෙසන්නට කැමැත්තෙමි"යි. "මැනැවැ, මැනැවැ දබ්බයෙනි, එසේ වී නම් දබ්බයෙනි, තෙපි සඟහට සෙනසුනුදු පනවවු. බතුදු උදෙසවු ය"යි. 'එසේ ය වහන්සැ'යි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මෙ කරුණෙහි දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක: "එසේ වී නම් මහණෙනි, සඞ්ඝ තෙමේ දබ්බමල්ලපුත්‍රයා සෙනසුන් පනවන්නකු ද බත් උදෙසන්නකු ද කොට සම්මත කෙරේවා. තවද මහණෙනි, මෙසේත් සම්මත කළ යුත්තේ ය. පළමු කොට දබ්බමල්ල පුත්‍ර තෙමේ අයැදිය යුත්තේ ය. අයැද ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

4. "වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා, ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් සෙනසුන් පනවන්නකු ද බත් උදෙසන්නකු ද කොට සම්මත කරන්නේ ය. මෙල ඥප්ති යි.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, සඞ්ඝො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං සෙනාසනපඤ්ඤාපකඤ්ච භත්තුද්දෙසකඤ්ච සම්මන්නති, යස්සායස්මතො ඛමති ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සෙනාසනපඤ්ඤාපකස්ස ච භත්තුද්දෙසකස්ස ච සම්මුති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය:

සම්මතො සඞ්ඝෙන ආයස්මා දබ්බො මල්ලපුත්තො සෙනාසනපඤ්ඤාපකො ච භත්තුද්දෙසකො ච. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

5. සම්මතො ච පනායස්මා දබ්බො මල්ලපුත්තො සභාගානං සභාගානං භික්ඛූනං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති. යෙ තෙ භික්ඛූ සුත්තන්තිකා තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති, "තෙ අඤ්ඤමඤ්ඤං සුත්තන්තං සඞ්ගායිස්සන්තී"ති. යෙ තෙ භික්ඛූ විනයධරා තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති, "තෙ අඤ්ඤමඤ්ඤං විනයං විනිච්ඡිනිස්සන්තී"ති.[1] යෙ තෙ භික්ඛූ ධම්මකථිකා තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති. "තෙ අඤ්ඤමඤ්ඤං ධම්මං සාකච්ඡිස්සන්තී"ති. යෙ තෙ භික්ඛූ ඣායිනො තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති,"තෙ අඤ්ඤමඤ්ඤං න ව්‍යාබාධිස්සන්තී"ති.[2] යෙ තෙ භික්ඛූ තිරච්ඡානකථිකා කායදඩ්ඪිබහුලා [3]විහරන්ති, තෙසම්පි එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති, "ඉමායපිමෙ ආයස්මන්තො රතියා අච්ඡිස්සන්තී"ති. යෙ තෙ භික්ඛූ විකාලෙ ආගච්ඡන්ති, තෙසම්පි තෙජොධාතුං සමාපජ්ජිත්වා තෙනෙව ආලොකෙන සෙනාසනං පඤ්ඤාපෙති. අපිස්සු භික්ඛූ සඤ්චිච්ච විකාලෙ ආගච්ඡන්ති "මයං ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස ඉද්ධි-පාටිහාරියං පස්සිස්සාමා."ති. තෙ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං උපසඞ්කමිත්වා එවං වදෙන්ති: "අම්හාකං ආවුසො දබ්බ, සෙනාසනං පඤ්ඤාපෙහී"ති. තෙ ආයස්මා දබ්බො මල්ලපුත්තො එවං වදෙති: "කත්ථායස්මන්තා ඉච්ඡන්ති, කත්ථ පඤ්ඤාපෙමී"ති. තෙ සඤ්චිච්ච දූරෙ අපදිසන්ති, "අම්හාකං ආවුසො දබ්බ, ගිජ්ඣකූටෙ පබ්බතෙ සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො චොරපපාතෙ සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො ඉසිගිලිපස්සෙ කාළසිලායං සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො වෙභාරපස්සෙ සත්තපණ්ණිගුහායං සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො සීතවනෙ සප්පසොණ්ඩිකපබ්භාරෙ සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො ගොතමකන්දරායං සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො තින්දුකකන්දරායං සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො තපොදකන්දරායං සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො තපොදාරාමෙ සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො ජීවකම්බවනෙ සෙනාසනං පඤ්ඤාපෙහි, අම්හාකං ආවුසො මද්දකුච්ඡිස්මිං මිගදායෙ සෙනාසනං පඤ්ඤාපෙහී"ති. තෙසං ආයස්මා දබ්බො මල්ලපුත්තො තෙජොධාතුං සමා-පජ්ජිත්වා අඞ්ගුලියා ජලමානාය පුරතො පුරතො ගච්ඡති. තෙපි තෙනෙව ආලොකෙන ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස පිට්ඨිතො පිට්ඨිතො ගච්ඡන්ති. තෙසං ආයස්මා දබ්බො මල්ලපුත්තො එවං සෙනාසනං පඤ්ඤාපෙති: අයං මඤ්චො, ඉදං පීඨං, අයං භිසි, ඉදං බිම්බොහනං, ඉදං වච්චට්ඨානං, ඉදං පස්සා-වට්ඨානං, ඉදං පානීයං, ඉදං පරිභොජනීයං, අයං කත්තරදණ්ඩො, ඉදං සඞ්ඝස්ස කතිකසණ්ඨානං, ඉමං කාලං පවිසිතබ්බං, ඉමං කාලං නික්ඛමිතබ්බ"න්ති. තෙසං ආයස්මා දබ්බො මල්ලපුත්තො සෙනාසනං පඤ්ඤාපෙත්වා පුනදෙව වෙළුවනං පච්චාගච්ඡති.

---

1. විනිච්ඡිස්සන්තීති, කත්ථචි. 2. ව්‍යාබාධිස්සන්තී"ති. 3. කායදළ්හිබහුලා ම.ඡ.සං.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා, සඞ්ඝ තෙමේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් සෙනසුන් පනවන්නකු ද බත් උදෙසන්නකු ද කොට සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතක්හට ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් සෙනසුන් පනවන්නකු ද බත් උදෙසන්නකු ද කොට සම්මත කිරීම රුචි වේ නම් හෙතෙම තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රුස්නේ නම් හෙතෙම බණන්නේ ය.

සඞ්ඝයා විසින් ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර තෙමේ සෙනසුන් පනවන්නකු ද බත් උදෙසන්නකු ද කොට සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් තුෂ්ණීම්භාවය යි. මේ මෙසේ ධරමි'' යි.

5. ඉක්බිති සම්මත වූ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ සභාග සභාග වූ භික්ෂූන්ට එකට සෙනසුන් පනවති. යම් මහණ කෙනෙක් සෞත්‍රාන්තිකයෝ වෙද්ද ඔහු ඔවුනොවුන් සූත්‍රාන්තය සඞ්ගායනා කෙරෙති, ඔවුනට එකට සෙනසුන් පනවති. යම් මහණ කෙනෙක් විනයධරයෝ වෙද්ද ඔහු ඔවුනොවුන් විනය විනිශ්චය කෙරෙති' ඔවුනට එකට සෙනසුන් පනවති යම් මහණ කෙනෙක් ධර්මකථිකයෝ වෙද්ද. 'ඔහු ඔවුනොවුන් ධර්මය සාකච්ඡා කෙරෙති' ඔවුනට එකට සෙනසුන් පනවති. යම් මහණ කෙනෙක් ධ්‍යායීහු වෙද් ද 'ඔහු ඔවුනොවුන් නො වෙහෙසති' ඔවුනට එකට සෙනසුන් පනවති. යම් මහණ කෙනෙක් තිරච්ඡානකථා ඇත්තාහු සිරුරු තර කිරීම බහුල ව වෙසෙත් නම් 'මේ ආයුෂ්මත්හු මේ තිරිසන් කථා රතියෙන් වෙසෙති' ඔවුනට ද එකට සෙනසුන් පනවති. යම් මහණ කෙනෙක් විකාලයෙහි එත් නම් තේජෝධාතුවට සමවැද එම ආලෝකයෙන් ඔවුනට ද සෙනසුන් පනවත්. තවද භික්ෂූහු 'ඇපි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන්ගේ ඍද්ධිප්‍රාතිහාර්‍යය බලම්හ' යි දැන දැන නො කල්හි පැමිණෙති. ඔහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් කරා එළඹ 'ඇවැත්නි, දබ්බයෙනි අපට සෙනසුන් පනවාලව' යි කියති. ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ ඒ භික්ෂූන්ට මෙසේ කියති. ආයුෂ්මත්හු කොහි කැමැති වෙද්ද කොහි සෙනසුන් පනවම් දැ? යි. ඔහු දැන දැන දුරු තැන් දක්වති. ඇවැත් දබ්බයෙනි, අපට ගිජ්ඣකූළපර්වතෙහි සෙනසුන් පනවාලව. ඇවැත්නි, අපට සොරපපාතෙහි සෙනසුන් පනවාලව. අවැත්නි, අපට ඉසිගිලිපර්වපාත්හි කළුසලහි සෙනසුන් පනවාලව. ඇවැත්නි, අපට වෙභාරපර්වපාත්හි සප්තපර්ණිගුහායෙහි සෙනසුන් පනවාලව. ඇවැත්නි, අපට ශීතවනයෙහි සාකෙම්බෙයදෙහි සෙනසුන් පනවාලව. ඇවැත්නි, අපට ගොයුම්කඳුරෙහි සෙනසුන් පනවාලව, ඇවැත්නි, අපට තිම්බිරිකඳුරෙහි සෙනසුන් පනවාලව, ඇවැත්නි, අපට තපොදකඳුරෙහි සෙනසුන් පනවාලව ඇවැත්නි, අපට තපොදාරාමයෙහි සෙනසුන් පනවාලව. ඇවැත්නි, අපට ජීවක අඹඋයන්හි සෙනසුන් පනවාලව. ඇවැත්නි, අපට මද්දකුච්ඡි නම් මුවළැව්හි සෙනසුන් පනවාලව''යි කියන්නාහ. ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ තේජෝධාතුවට සමවැද දිලියෙන ඇඟිලි ඇති ව ඔවුනට පෙරට ව පෙරට ව යෙති. උයිත් එ ම එළියෙන් ආයුෂ්මත් දබ්බමල්ල-පුත්‍රයන්ගේ පස්පස්හි යෙති. ඔවුනට ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ මෙසෙයින් සෙනසුන් පනවත්. මේ ඇඳ ය, මේ පුටු ය, මේ බිසි ය, මේ බිම්බෝහන ය, මේ වැසිකිළි ය, මේ කෙසකිළි ය, මේ පැන් ය, මේ පරිභොග උදක ය, මේ සැරයටි ය, මේ සඟුන්ගේ කතිකාවත ය, මෙකල පිවිසියයුතු ය, මෙකල නික්මියයුතු ය'යි. ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ ඔවුනට සෙනසුන් පනවා නැවත වේළුවනයට පෙරළා එත්තාහ.

6. තෙන ඛො පන සමයෙන **මෙත්තියභුම්මජකා** භික්ඛූ නවකා චෙව හොන්ති අප්පපුඤ්ඤා ච, යානි සඞ්ඝස්ස ලාමකානි සෙනාසනානි, තානි තෙසං පාපුණන්ති ලාමකානි ච භත්තානි. තෙන ඛො පන සමයෙන රාජගහෙ මනුස්සා ඉච්ඡන්ති ථෙරානං භික්ඛූනං අභිසඞ්ඛාරිකං පිණ්ඩපාතං දාතුං සප්පිම්පි තෙලම්පි උත්තරිභඞ්ගම්පි. මෙත්තියභුම්මජකානං පන භික්ඛූනං පාකතිකං දෙන්ති යථාරන්ධං කණාජකං බිලඞ්ගදුතියං. තෙ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා ථෙරෙ භික්ඛූ පුච්ඡන්ති: තුම්හාකං ආවුසො භත්තග්ගෙ කිං අහොසි, තුම්හාකං කිං අහොසී"ති. එකච්චෙ ථෙරා එවං වදෙන්ති: "අම්හාකං ආවුසො සප්පි අහොසි තෙලං අහොසි උත්තරිභඞ්ගං අහොසී"ති. මෙත්තියභුම්මජකා පන භික්ඛූ එවං වදෙන්ති: "අම්හාකං ආවුසො න කිඤ්චි අහොසි පාකතිකං යථාරන්ධං කණාජකං බිලඞ්ගදුතිය"න්ති.

7. තෙන ඛො පන සමයෙන **කල්‍යාණභත්තිකො** ගහපති සඞ්ඝස්ස චතුක්කභත්තං දෙති නිච්චභත්තං. සො භත්තග්ගෙ සපුත්තදාරො උපතිට්ඨිත්වා පරිවිසති, අඤ්ඤෙ ඔදනෙන පුච්ඡන්ති, අඤ්ඤෙ සූපෙන පුච්ඡන්ති, අඤ්ඤෙ තෙලෙන පුච්ඡන්ති, අඤ්ඤෙ උත්තරිභඞ්ගෙන පුච්ඡන්ති. තෙන ඛො පන සමයෙන කල්‍යාණභත්තිකස්ස ගහපතිනො භත්තං ස්වාතනාය මෙත්තියභුම්මජකානං භික්ඛූනං උද්දිට්ඨං හොති. අථ ඛො කල්‍යාණභත්තිකො ගහපති ආරාමං අගමාසි කෙනචිදෙව කරණීයෙන. සො යෙනායස්මා දබ්බො මල්ලපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කල්‍යාණභත්තිකං ගහපතිං ආයස්මා දබ්බො මල්ලපුත්තො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො කල්‍යාණභත්තිකො ගහපති ආයස්මතා දබ්බෙන මල්ලපුත්තෙන ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං එතදවොච: "කස්ස භන්තෙ අම්හාකං ඝරෙ ස්වාතනාය භත්තං උද්දිට්ඨ"න්ති? "මෙත්තියභුම්මජකානං ඛො ගහපති භික්ඛූනං තුම්හාකං ඝරෙ ස්වාතනාය භත්තං උද්දිට්ඨ"න්ති.

8. අථ ඛො කල්‍යාණභත්තිකො ගහපති අනත්තමනො අහොසි: "කථං හි නාම පාපභික්ඛූ අම්හාකං ඝරෙ ස්වාතනාය භත්තං භුඤ්ජිස්සන්තී"ති ඝරං ගන්ත්වා දාසිං ආණාපෙසි: "යෙ ජෙ ස්වෙ භත්තිකා ආගච්ඡන්ති, තෙ කොට්ඨකෙ ආසනං පඤ්ඤපෙත්වා කණාජකෙන බිලඞ්ගදුතියෙන පරිවිසා"ති "එවං අය්‍යා"ති ඛො සා දාසී කල්‍යාණභත්තිකස්ස ගහපතිනො පච්චස්සොසි.

9. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ "හිය්‍යො ඛො ආවුසො අම්හාකං කල්‍යාණභත්තිකස්ස ගහපතිනො භත්තං උද්දිට්ඨං, ස්වෙ අම්හෙ කල්‍යාණභත්තිකො ගහපති සපුත්තදාරො උපතිට්ඨිත්වා පරිවිසිස්සති. අඤ්ඤෙ ඔදනෙන පුච්ඡිස්සන්ති, අඤ්ඤෙ සූපෙන පුච්ඡිස්සන්ති, අඤ්ඤෙ තෙලෙන පුච්ඡිස්සන්ති, අඤ්ඤෙ උත්තරිභඞ්ගෙන පුච්ඡිස්සන්තී"ති. තෙ තෙනෙව සොමනස්සෙන න චිත්තරූපං රත්තියා සුපිංසු.

6. තවද එසමයෙහි මෙත්තියභූමමජක භික්ෂූහු නවකයෝ දමද පිනැත්-තාහු ද වෙති. ඔවුනට සඞ්ඝයා පිළිබඳ වූ යම් ලාමක සෙනසුන් කෙනෙක් වෙත් ද ලාමක වූ බතකුත් වේ ද ඒ ලාමක සෙනසුන් හා බත් ම ලැබෙත්. එසමයෙහි රජගහනුවර මනුෂ්‍යයෝ සකස් කළ පිණ්ඩපාතය ද ගිතෙල් ද තලතෙල් ද මත්අවුළු ද ස්ථවිර භික්ෂූන්ට දෙන්නට කැමැති වෙත්. එතෙකුදුවත් මෛත්තියභූමමජක භික්ෂූන්ට කුඩු සහිත වූ කාඩි දෙවැනි කොට ඇති පියවි බත පිසූ සැටියෙන් දෙති. ඔහු පසුබත්හි පිණ්ඩපාතයෙන් හැවැත්තාහු "ස්ථවිරභික්ෂූන් පුළුවුස්ති 'ඇවැත්නි, තොපට බොජුන්හල්හි කෙබඳු බතෙක් වී ද? තොපට කෙබඳු බතෙක් වී ද?'යි. ඇතැම් තෙර කෙනෙක් මෙසේ කියති. 'ඇවැත්නි, අපට ගිතෙල් විය. තලතෙල් විය. මත්අවුළු වී ය'යි. මෛත්තියභූමමජක භික්ෂූහු වැළිත් මෙසේ කියති. 'ඇවැත්නි, අපට කිසිවක් නො වී ය. කුඩු සහිත වූ කාඩි දෙ වැනි කොට ඇති. පිසූ සැටියෙන් පියවි බත වී ය'යි.

7. තවද එසමයෙහි කල්‍යාණභත්තික ගෘහපති තෙම නිතිබත් කොට සතර බතක් දෙයි. හෙතෙම දත්හල්හි අඹුදරුවන් සහිත වූයේ සමීපයෙහි සිට වළඳවයි. කෙනෙක් බතින් පුළුවුස්ති. කෙනෙක් සූපයෙන් පුළුවුස්ති. කෙනෙක් තෙලින් පුළුවුස්ති. කෙනෙක් මසවුළෙන් පුළුවුසිත්. එසමයෙහි කල්‍යාණභත්තික ගෘහපතියාගේ බත සෙට දවසට මෛත්තියභූමමජක භික්ෂූන්ට උදෙසන ලද වෙයි. එකල්හි කල්‍යාණභත්තික ගෘහපති තෙම කිසි කරුණෙ-කින් ආරාමයට ගියේ ය. හෙතෙම ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් සමීපයට එළැඹ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් කල්‍යාණභත්තික ගෘහපතිහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ දහැමි කථායෙන් කරුණු දක්වූහ. සමාදන් කරවූහ. තෙද ගැන්වූහ. සතුටු කළහ. ඉක්බිති කල්‍යාණභත්තික ගෘහපති ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් විසින් දහැමි කථායෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තෙද ගන්වන ලද්දේ සතුටු කරණ ලද්දේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයනට මෙය කී ය. "වහන්ස, අපගේ ගෙහි සෙටදවසට කවරක්හට බත් උදෙසන ලද දැ?'යි ගෘහපතිය, මෛත්තියභූමමජක භික්ෂූන්ට තොපගේ ගෙහි සෙට දවසට බත් උදෙසන ලද යි කීහ.

8. එකල්හි කල්‍යාණභත්තික ගෘහපති නො සතුටුසිත් ඇති වී ය. 'කෙසේ නම් පාප භික්ෂූහු අපගේ ගෙහි සෙට බත් වළඳන්නාහු ද,යි ගෙට ගොස් 'කොල, සෙට බත් වළඳන යම් කෙනෙක් එත් නම් ඔහු කොටුයෙහි අසුන් පනවා කාඩි දෙවැනි කොට ඇති නිවුඩු සහලේ බතින් වළඳව"යි දාසියට අණවිය. 'එසේය ස්වාමීනි' යි ඒ දාසිය කල්‍යාණභත්තික ගෘහපතිහට පිළිවදන් දීය.

9. ඉක්බිති මෛත්තියභූමමජක භික්ෂූහු ඇවැත්නි, ඊයේ අපට කල්‍යාණ-භත්තික ගෘහපතිහුගේ බත උදෙසන ලද. සෙට කල්‍යාණභත්තික ගෘහපති තෙම් අප සමීපයට එළඹ වළඳවන්නේය. කෙනෙක් ඔදනයෙන් පුළුවුස්ති. කෙනෙක් සූපයෙන් පුළුවුස්ති, කෙනෙක් තෙලින් පුළුවුස්ති. කෙනෙක් මසවුළෙන් පුළුවුසිත් ය"යි. ඔහු එ ම සොම්නසින් සිත් වූ පරිදි රාත්‍රියෙහි නිදි නො ගත්හ.

10. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කල්‍යාණභත්තිකස්ස ගහපතිනො නිවෙසනං තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො සා දාසී මෙත්තියභුම්මජකෙ භික්ඛූ දූරතොව ආගච්ඡන්තෙ, දිස්වාන කොට්ඨකෙ ආසනං පඤ්ඤපෙත්වා මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච: "නිසීදථ භන්තෙ"ති. අථ ඛො මෙත්තියභුම්මජකානං භික්ඛූනං එතදහොසි: "නිස්සංසයං ඛො න තාව භත්තං සිද්ධං භවිස්සති යාව[1] මයං කොට්ඨකෙ නිසීදාපියෙය්‍යාමා"[2]ති. අථ ඛො සා දාසී කාණාජිකෙන බිලඞ්ගදුතියෙන උපගඤ්ඡි: "භුඤ්ජථ භන්තෙ"ති "මයං ඛො භගිනි නිච්චභත්තිකා"ති "ජානාමි අය්‍යා නිච්චභත්තිකත්ථ, අපිචාහං හිය්‍යොව ආණත්තා: 'යෙ ජෙ සො භත්තිකා ආගච්ඡන්ති, තෙ කොට්ඨකෙ ආසනං පඤ්ඤපෙත්වා කාණාජිකෙන බිලඞ්ගදුතියෙන පරිවිසා'ති. භුඤ්ජථ භන්තෙ"ති.

11. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ "හිය්‍යො ඛො ආවුසො කල්‍යාණභත්තිකො ගහපති ආරාමං අගමාසි, දබ්බස්ස මල්ලපුත්තස්ස සන්තිකෙ. නිස්සංසයං ඛො මයං දබ්බෙන මල්ලපුත්තෙන ගහපතිනො සන්තිකෙ පරිභින්නා"ති. තෙ තෙනෙව දොමනස්සෙන න චිත්තරූපං භුඤ්ජිංසු. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා ආරාමං ගන්ත්වා පත්තචීවරං පටිසාමෙත්වා බහාරාමකොට්ඨකෙ සඞ්ඝාටිපල්ලත්ථිකාය නිසීදිංසු තුණ්හීභූතා මඞ්කුභූතා පත්තක්ඛන්ධා අධොමුඛා පජ්ඣායන්තා අප්පටිභානා.

12. අථ ඛො මෙත්තියා භික්ඛුනී යෙන මෙත්තියභුම්මජකා භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච: "වන්දාමි අය්‍යා"ති.[3] එවං වුත්තෙ මෙත්තියභුම්මජකා භික්ඛූ නාලපිංසු. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො මෙත්තියා භික්ඛුනී මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච: "වන්දාමි අය්‍යා"ති. තතියම්පි ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ නාලපිංසු. "ක්‍යාහං අය්‍යානං අපරජ්ඣාමි, කිස්ස මං අය්‍යා නාලපන්තී"ති. තථා හි පන ත්වං භගිනි, අම්හෙ දබ්බෙන මල්ලපුත්තෙන විහෙඨියමානෙ අජ්ඣුපෙක්ඛසී'ති. 'ක්‍යාහං අය්‍යා කරොමී'ති 'සචෙ ඛො ත්වං භගිනි ඉච්ඡෙය්‍යාසි අජ්ජෙව භගවා දබ්බං මල්ලපුත්තං නාසාපෙය්‍යා'ති. ක්‍යාහං අය්‍යා කරොමි. කිං මයා සක්කා කාතුන්ති. එහි ත්වං භගිනි, යෙන භගවා තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා භගවන්තං එවං වදෙහි: 'ඉදං භන්තෙ නච්ඡන්නං නප්පතිරූපං, යායං භන්තෙ දිසා අභයා අනීතිකා අනුපද්දවා, සායං දිසා සභයා සඊතිකා සඋපද්දවා, යතො නිවාතං තතො පවාතං,[4] උදකං මඤ්ඤෙ ආදිත්තං, අය්‍යෙනම්හි දබ්බෙන මල්ලපුත්තෙන දූසිතා'ති. එවං අය්‍යාති ඛො මෙත්තියා භික්ඛුනී මෙත්තියභුම්මජකානං භික්ඛූනං පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො මෙත්තියා භික්ඛුනී භගවන්තං එතදවොච: 'ඉදං භන්තෙ නච්ඡන්නං නප්පතිරූපං, යායං භන්තෙ දිසා අභයා අනීතිකා අනුපද්දවා, සායං දිසා සභයා සඊතිකා සඋපද්දවා, යතො නිවාතං තතො පවාතං,. උදකං මඤ්ඤෙ ආදිත්තං, අය්‍යෙනම්හි දබ්බෙන මල්ලපුත්තෙන දූසිතා'ති.

---

1. යථා. මු. 2. නිසීදෙය්‍යාමාති, සීමු. නිසීදපියාමාති ස්‍යා 3. අය්‍යෙති - සීමු.
4. සවාතං - මජසං,

10 ඉක්බිති මෙත්තියභුම්මජක භික්ෂූහු පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන කල්‍යාණභත්තික ගෘහපතිහුගේ නිවෙස්න කරා එළඹියහ. ඒ දැසිය දුරින් ම එන මෛත්තියභුම්මජක භික්ෂූන් දුටුවා ය. දැක කොටුයෙහි අසුන් පනවා මෛත්තියභුම්මජක භික්ෂූන්ට වහන්ස, හුන මැනැවැ'යි කීව. එකල්හි මෙත්තියභුම්මජක භික්ෂූන්ට මේ සිත විය එකැතින් ම තව බත් නො නිමියේ වන. ඒ තාක් ඇපි කොටුයෙහි හිඳුවනු ලබම්හ"යි. ඉක්බිති ඒ දැසිය කාඩි දෙවැනි කොට ඇති නිවුඩු බතින් යුක්ත ව එළඹියා ය. වහන්ස, වළඳව'යි කීව. නැගනියනි, ඇපි නිතිබත් ඇතියම්හ'යි. ස්වාමීනි, නිතිබත් ඇතියවුහු දනිමි. එතෙකුදුවත් මම ඊයේ ම අණ ලත්මි. කොල, සෙට බත් ලද යම් කෙනෙක් එත් නම් ඔහු කොටුයෙහි අසුන් පනවා කාඩි දෙවැනි කොට ඇති නිවුඩුසාලේ බතින් වළඳව'යි වහන්ස, වැළඳුව මැනවැ' යි.

11. ඉක්බිති මෙත්තියභුම්මජක භික්ෂූහු 'ඇවැත්නි' ඊයේ කල්‍යාණභත්තික ගෘහපති තෙම අරමට ගියේ ය. දබ්බමල්ලපුත්‍රයන් හමුයෙහි වී ය. එකැ-තින් ම ඇපි දබ්බමල්ලපුත්‍රයන් විසින් ගෘහපතිහු කෙරෙහි බිඳුනා ලදුම්හ' යි ඔහු එ ම දෙම්නසින් සිත් සේ නො වැළඳූහ. ඉක්බිති මෙත්තියභුම්මජක භික්ෂූහු පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවැත්තාහු අරමට ගොස් පාසිවුරු සඟවා තබා බිහිඅරම්කොටුයෙහි නිහඬ ව මකු ව නැමූ කඳට ඇතිව (කොපයෙන්) දුම්මින් වැටහීම් රහිත ව සැගලීන් අකවටු අවුළුවා හුන්හ.

12. එකල්හි මෙත්තියා මෙහෙණ මෙත්තියභුම්මජක භික්ෂූන් කරා එළඹියාය. එළැඹ මෛත්තියභුම්මජක භික්ෂූන්ට 'වඳිමි හිමියනි'යි කීව. මෙසේ කී කල් ද මෛත්තියභුම්මජක භික්ෂූහු නො බැණ හුන්හ. දෙවනවට ද .... තෙවනවටහි මෙත්තියා මෙහෙණ මෙත්තියභුම්මජක භික්ෂූන්ට 'වඳිමි, හිමියනි' යි කීව. තෙවනවට ද මෛත්තියභුම්මජක භික්ෂූහු නො බැණ හුන්හ. මම ආර්‍යයන්ට කවර අපරාධයක් කෙළෙම් ද? කුමක් හෙයින් ආර්‍යයෝ මා හා නො බෙණෙත් ද?යි එසේ ම ය නැගනියනි, තෝ දබ්බමල්ලපුත්‍රයන් විසින් අප වෙහෙසනු ලබනුවත් උපේක්ෂා කෙරෙහි ය"යි. ආර්‍යයෙනි, මම කුම් කෙරෙම් ද?යි ඉදින් නැගනියනි, තෝ රිසියවු නම් අද ම භාග්‍යවත්හු දබ්බමල්ල-පුත්‍රයා නසවත්තාහ යි, ආර්‍යයෙනි, මම් කුම් කෙරෙම් ද? මා විසින් කුමක් කරන්නට හැකි ද?යි එව නැගනියනි, තෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙව. එළැඹ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කියව. 'ස්වාමීනි, මේ නො රුස්නෙක නුසුදුස්සෙක, ස්වාමීනි, යම් දිශාවක් නිර්භය ද නිදුක් ද අනුපද්‍රව ද ඒ දිශාව භය සහිත ය. දුක් සහිත ය. උපද්‍රව සහිත ය. යම් තැනෙක්හි නිවාත ද එහි මහසුළං නැගිණ. දිය ඇවිලගත් කලක් මෙන් ආර්‍ය දබ්බමල්ලපුත්‍රයන් විසින් මම් දූෂිතයමූ"යි. 'එසේය ආර්‍යයෙනි'යි මෙත්තියා මෙහෙණ මෛත්තිය භුම්මජක භික්ෂූන්ට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියා ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට එකත්පස් ව සිටියා ය. එකත්පස් ව සිටි මෙත්තියා මෙහෙණ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් කීව. 'ස්වාමීනි' මෙය නො රුස්නෙක. නුසුදුස්සෙක ස්වාමීනි, යම් දිශාවක් අභය ද අනීතික ද අනුපද්‍රව ද, ඒ දිශාව භය සහිතය. දුක් සහිත ය. උවදුරු සහිත ය. යම් තැනෙක්හි නිවාත ද එතැන්හි මහ-සුළං නැගිණි. දිය ආදීප්ත කලක් මෙනි. ආර්‍ය දබ්බමල්ලපුත්‍රයන් විසින් දූෂිතයමූ'යි කීව.

13. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං පටිපුච්ඡි: 'සරසි ත්වං දබ්බ එවරූපං කත්තා යථායං භික්ඛුනී ආහා,ති "යථා මං භන්තෙ භගවා ජානාතී"ති. දුතියම්පි ඛො භගවා -පෙ- තතියම්පි ඛො භගවා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං එතදවොච: "සරසි ත්වං දබ්බ එවරූපං කත්තා යථායං භික්ඛුනී ආහා"ති "යථා මං භන්තෙ භගවා ජානාතී"ති· 'න ඛො දබ්බ දබ්බා එවං නිබ්බෙඨෙන්ති. සචෙ තයා කතං කතන්ති වදෙහි, සචෙ අකතං අකතන්ති වදෙහී'ති. "යතො අහං භන්තෙ ජාතො නාභිජානාමි සුපිනන්තෙනාපි මෙථුනං ධම්මං පටිසෙවිතා, පගෙව ජාගරො"ති. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "තෙනහි භික්ඛවෙ මෙත්තියං භික්ඛුනිං නාසෙථ, ඉමෙ ච භික්ඛූ අනුයුඤ්ජථා"ති. ඉදං වත්වා භගවා උට්ඨායාසනා විහාරං පාවිසි.

14. අථ ඛො තෙ භික්ඛූ මෙත්තියං භික්ඛුනිං නාසෙසුං. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ තෙ භික්ඛූ එතදවොචුං: "මා ආවුසො මෙත්තියං භික්ඛුනිං නාසෙථ, න සා කිඤ්චි අපරජ්ඣති, අම්හෙහි සා උස්සාහිතා කුපිතෙහි අනත්තමනෙහි චාවනාධිප්පායෙහී"ති. කිං පන තුම්හෙ ආවුසො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙථා'ති. එවමාවුසො'ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ දබ්බං මල්ලපුත්තං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙථා"ති. "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා දබ්බං මල්ලපුත්තං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අමූලකඤ්චෙව තං අධිකරණං හොති භික්ඛු ච දොසං පතිට්ඨාති, සඞ්ඝාදිසෙසො"ති.**

15. **යො පනාති** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුන්ති** අඤ්ඤං භික්ඛුං

**දුට්ඨො දොසොති** කුපිතො අනත්තමනො අනභිරද්ධො ආහතචිත්තො ඛිලජාතො.

13. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තෙල නිදානයෙහි තෙල කරුණෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් පුළුවුත් සේක. "දබ්බය, යම්සේ මේ මෙහෙණ කිවු ද තෙපි මෙබන්දක් කළහු සිහි කරවු දෑ"යි "භාග්‍යවතුන් වහන්සේ යම්සේ මා දන්නාසේක් ද (එසෙයින් දතයුතු වෙමි')යි. බුදුහු දෙවනවට ද .... බුදුහු තෙවනවට ද ආයුෂ්මත් දබ්බමල්ල-පුත්‍රයන්ට මෙය වදාළහ. 'දබ්බය, යම්සේ මේ මෙහෙණ කිවු ද, තෙපි මෙ බන්දක් කළහු සිහි කරවු දෑ'යි. දබ්බය පණ්ඩිතයෝ මෙසේ පරප්‍රත්‍යයෙන් නිරවුල් නො කෙරෙති. ඉදින් තා විසින් කරණ ලද නම් කරණ ලදූ යි කියව. නො කරණ ලද නම් නො කරණ ලදූයි කියව'යි. 'ස්වාමීනි, මම යම් කලෙක උපන්නෙම් ද එතැන් පටන් සිහිනෙනුදු මෙවුන්දම් සෙවියෙම් නො දන්මි. නිදිවැරුයෙම් කැලමැ' යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමැතූ සේක. එසේ වී නම් මහණෙනි, "මෙත්තියා මෙහෙණ (ලිඞ්ගනාසනායෙන්) නසවු. මේ (මෙහෙයූ) භික්ෂූන් ද විමසව"යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැඟී විහාරයට පිවිසි සේක.

14. ඉක්බිති ඒ භික්ෂූහු මෙත්තියා මෙහෙණ ලිඞ්ගනාසනායෙන් නසාපූහ. එකල්හි මෙත්තියභූම්මජක භික්ෂූහු ඒ භික්ෂූන්ට මෙසේ කීහ. 'ඇවැත්නි, මෙත්තියා මෙහෙණ නහමක් නසවු. ඕ තොමෝ කිසි වරදක් නො කෙරෙයි කිපියා වූ නො සතුටු සිත් ඇති සත්නෙත් නෙරනු කැමැති වූ අප විසින් ඕ තොමෝ මෙහෙයන ලදූ ය'යි. කිමෙක් ද ඇවැත්නි, "තෙපි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් අමූලු පරිජිඇවතින් චෝදනා කරවු දෑ?"යි. එසේය ඇවැත්නි, යි. යම් භික්ෂූ කෙනෙක් අපිස් වූවාහු ද ඔහු අවමන් කෙරෙති. නුගුණ කියති. දෙස් පහළ කෙරෙත්. 'කෙසේ නම් මෙත්තියභූම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයනට අමූලු පරිජිඇවැතින් චෝදනා කළාහු දෑ' යි. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ දන් වූහ. සැබෑද? මහණෙනි, තෙපි දබ්බමල්ලපුත්‍රයනට අමූලු පරිජිඇවතින් චෝදනා කරවු දෑ? යි. සැබව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු වෙසෙසින් ගර්හා කළහ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දබ්බමල්ල පුත්‍රයනට අමූලු පරිජිඇවැතින් චෝදනා කළහු ද? හිස් පුරුෂයෙනි, තෙල නො පහන් වූවන්ගේ පහන් බව පිණිස හෝ නො වෙ යි.... තවද මහණෙනි, මේ ශික්ෂා පදය මෙසේ උදෙසවු.

**"යම් මහණෙක් දුෂ්ට වූයේ, මෙරමා දූෂණය කරණුයේ, නො සතුටු සිත් ඇත්තේ 'මොහු මෙසස්නෙන් නෙරනෙම නම් යෙහෙකැ'යි මහණක්හට අමූලු පරිජිඇවතින් චොදනා කෙරේ නම්, එයින් පසු කලෙක විචාරනු ලබන්නේ හෝ නො විචාරනු ලබන්නේ හෝ ඒ අධිකරණය මුල් රහිත වේ නම්, (චොදක) මහණ තෙමේ ද දෙෂයෙහි පිහිටා නම් සඟවෙසෙස් වේ" ය යි.**

15. **යොපන** යනු: යමෙක් යම්බදුයෙක්... **භික්ඛු** යනු.... මේ තෙම මේ **අර්ථ**යෙහි භික්ෂු යයි අදහස් කරණ ලදී.

**භික්ඛුං** යනු: අන් මහණක්හු.

**දුට්ඨො දොසො** යනු: කිපියේ නො සතුටු සිත් ඇත්තේ නො පහන් වූයේ **කෝප**යෙන් මැඩුණු සිත් ඇත්තේ (පිළිඹු) හුල් ඇත්තේ යි.

**අප්පතීතොති** තෙන ච කොපෙන තෙන ච දොසෙන තාය ච අනත්තමනතාය තාය ච අනභිරද්ධියා අප්පතීතො හොති.

**අමූලකං** නාම අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං.

**පාරාජිකෙන ධම්මෙනාති** චතුන්නං අඤ්ඤතරෙන.

**අනුද්ධංසෙය්‍යාති** චොදෙති වා චොදාපෙති වා.

**අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති** භික්ඛුභාවා චාවෙය්‍යං සමණධම්මා චාවෙය්‍යං සීලක්ඛන්ධා චාවෙය්‍යං තපොගුණා චාවෙය්‍යං.

**තතො අපරෙන සමයෙනාති** යස්මිං ඛණෙ අනුද්ධංසිතො හොති තං ඛණං තං ලයං තං මුහුත්තං වීතිවත්තෙ.

**සමනුග්ගාහියමානොති** යෙන වත්ථුනා අනුද්ධංසිතො හොති තස්මිං වත්ථුස්මිං සමනුග්ගාහියමානො.

**අසමනුග්ගාහියමානොති** න කෙනචි වුච්චමානො.

**අධිකරණං** නාම: චත්තාරි අධිකරණානි විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං.

**භික්ඛු ච දොසං පතිට්ඨාතීති** තුච්ඡකං මයා භණිතං, මුසා මයා භණිතං, අභූතං මයා භණිතං, අජානන්තෙන මයා භණිතං.

**සඞ්ඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

16. අදිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: **"දිට්ඨො මයා පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා"ති, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.**

17. අසුතස්ස හොති පාරාජිකං ධම්මං **අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති: "සුතො මයා පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා"ති, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.**

18. අපරිසඞ්කිතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තං චෙ **චොදෙති: 'පරිසඞ්කිතො මයා පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා"ති, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.**

**අසන්තීනො** යනු: ඒ කෝපයෙන් ද ඒ දෙෂයෙන් ද ඒ නො සතුටු සිත් ඇති බැවින් ද ඒ නො පහන් බැවින් ද නො සතුටු සිත් ඇත්තේ වේ.

**අමූලක** නම්: නො දක්නා ලද්දේ නො අසන ලද්දේ නො සැක කරණ ලද්දේ සි.

**පාරාජිකෙන ධම්මෙන** යනු: සතර පරිජි අතුරෙන් අන්‍යතරයෙකින්.

**අනුද්ධංසෙය්‍ය** යනු: චෝදනා කෙරෙයි හෝ චෝදනා කරවා හෝ.

**අප්පෙවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යං** යනු: භික්ෂු භාවයෙන් තෙරතෙම් නම් මහණදමින් තෙරතෙම් නම් ශීලස්කන්ධයෙන් තෙරතෙම් නම් තපොගුණයෙන් තෙරතෙම් නම්.

**තතො අපරෙන සමයෙන** යනු: යම් ඇසිල්ලෙක චෝදනා කරණ ලද්දේ වේ ද ඒ ඇසිල්ල ඒ ලය ඒ මොහොත ඉක්මගිය කල්හි.

**සමනුග්ගාහියමානො** යනු: යම් වස්තුයෙකින් චෝදනා කරණ ලද්දේ වේ ද ඒ වත්තුයෙහි ලා විචාරනු ලබන්නේ.

**අසමනුග්ගාහියමානො**: යනු: කිසිවක්හු විසින් නො කියනු ලබන්නේ.

**අධිකරණ නම්**: සතර අධිකරණ කෙනෙකි: විවාදධිකරණ ය අනුවාදධිකරණ ය ආපත්තාධිකරණ ය කිච්චාධිකරණ සි.

**භික්ඛු ච දොසං පතිට්ඨාති** යනු: මා විසින් සිස් බස් කියන ලද, මා විසින් මුසවා කියන ලද, මා විසින් අභූතයක් කියන ලද, මා නො දන්නහු විසින් කියන ලද.

**සඞ්ඝාදිසෙසො** යනු... එයිනුදු සඞ්ඝාදිසෙස යි කියනු ලැබේ ය සි.

16. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ නො දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට (තෝ) පරිජිඇවැත් අවන්නෙහි මා විසින් දක්නා ලද්දෙහි ය. අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීය වෙහි, තා සමග පොහෝ කිරීමෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝකම්යෙක් හෝ නැතැ' යි චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

17. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවන්නේ යයි නො අසන ලද්දේ වේ ද, ඉදින් ඔහුට (තෝ) පරිජිඇවැත් අවන්නෙහි මා විසින් අසන ලද්දෙහි ය. අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීය වෙහි, තා සමග පොහෝ කිරීමෙක් හෝ පවුරුණු හෝ සඞ්ඝකම්යෙක් හෝ නැතැ'යි චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

18. චෝදක වූ ඔහු විසින් සැක නො කරණ ලද්දේ වෙයි. ඉදින් ඔහුට පරිජිඇවැත් අවන්නෙහි මා විසින් සැක කරණ ලද්දෙහි ය. අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයයෙහි, තා සමග පොහෝ කිරීම හෝ පවුරුණු හෝ සඞ්ඝකම් හෝ නැතැ'යි චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

19. අදිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: "දිට්ඨො මයා සුතො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා"ති, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

20. අදිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: "දිට්ඨො මයා පරිසඞ්කිතො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

21. අදිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: "දිට්ඨො මයා සුතො ච පරිසඞ්කිතො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි -පෙ-" ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

22. අසුතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති "සුතො මයා පරිසඞ්කිතො ච -පෙ- සුතො මයා දිට්ඨො ච -පෙ- සුතො මයා පරිසඞ්කිතො ච දිට්ඨො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි" -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

23. අපරිසඞ්කිතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති: පරිසඞ්කිතො මයා දිට්ඨො ච -පෙ- පරිසඞ්කිතො මයා සුතො ච -පෙ- පරිසඞ්කිතො මයා දිට්ඨො ච සුතො ච පාරාජිකං ධම්මං අජ්ඣා-පන්නොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

24. දිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: සුතො මයා පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

25. දිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: පරිසඞ්කිතො මයා පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති -පෙ- තඤ්චෙ චොදෙති: සුතො මයා පරිසඞ්කිතො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

26. සුතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති: පරිසඞ්කිතො මයා -පෙ- දිට්ඨො මයා -පෙ- පරිසඞ්කිතො මයා දිට්ඨො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදි-සෙසස්ස.

27. පරිසඞ්කිතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තං චෙ චොදෙති: දිට්ඨො මයා පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි -පෙ- සුතො මයා පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි -පෙ- දිට්ඨො මයා සුතො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

19. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ නො දක්නා ලද්දේ වෙයි, ඉදින් ඔහුට (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් දක්නා ලද්දෙහි අසන ලද්දෙහි ද වෙහි. අශ්‍රමණයෙහි අශාක්‍යපුත්‍රියයෙහි, තා සමග පොහොය හෝ පවුරුණු හෝ සඞ්ඝකම් හෝ නැතැ' යි චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

20. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ නො දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට පරිජිඇවැත් අවත්තෙහි මා විසින් දක්නා ලද්දෙහි ද සැක කරණ ලද්දෙහි ද වෙහි. අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

21. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ නො දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් දක්නා ලද්දෙහි ද අසන ලද්දෙහි ද සැක කරණ ලද්දෙහි ද වෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

22. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවත්තේ යයි නො අසන ලද්දේ වෙයි. ඉදින් ඔහුට (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් අසන ලද්දෙහි සැක කරණ ලද්දෙහි ද ... මා විසින් අසන ලද්දෙහි දක්නා ලද්දෙහි ද ... මා විසින් අසන ලද්දෙහි සැක කරණ ලද්දෙහි ද දක්නා ලද්දෙහි ද වෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

23. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවත්තේ යයි සැක නො කරණ ලද්දේ වෙයි. ඉදින් ඔහුට (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් සැක කරණ ලද්දෙහි දක්නා ලද්දෙහි ද ... මා විසින් පරිසඞ්කිතයෙහි අසන ලද්දෙහි ද ... මා විසින් පරිසඞ්කිතයෙහි දක්නා ලද්දෙහි ද අසන ලද්දෙහි ද වෙහි ...චොදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

24. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට '(තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් අසන ලද්දෙහි ය. ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්-ඇවැත් වේ.

25 චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට චෝදනා කෙරේ නම් (තෝ) පරිජිඇවැත් අවත්තෙහි යයි මා විසින් සැක කරණ ලද්දෙහි ය. ... ඉදින් ඔහුට චෝදනා කෙරේ නම් (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් අසන ලද්දෙහි පරිසඞ්කිත ද වෙහි ... තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

26. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවත්තේ යයි අසන ලද්දේ වෙයි· ඉදින් ඔහුට චෝදනා කෙරේ නම් 'මා විසින් සැක කරණ ලද්දෙහි ... මා විසින් දක්නා ලද්දෙහි ... (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් සැක කරන ලද්දෙහි ද ... තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

27. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවත්තේ යයි සැක කරණ ලද්දේ වෙයි. ඉදින් ඔහුට, (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් දක්නා ලද්දෙහි ය ... (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් අසන ලද්දෙහි ය ... (තෝ) පරිජිඇවැත් අවත්තෙහි මා විසින් දක්නා ලද්දෙහි අසන ලද්දෙහි ද වෙහි, ... චොදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

28. දිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, දිට්ඨෙ වෙමතිකො දිට්ඨං නො කප්පෙති, දිට්ඨං නස්සරති, දිට්ඨං පම්මුට්ඨො[1] හොති, -පෙ- සුතෙ වෙමතිකො සුතං නො කප්පෙති, සුතං නස්සරති, සුතං පම්මුට්ඨො හොති, -පෙ- පරිසඞ්කිතෙ වෙමතිකො පරිසඞ්කිතං නො කප්පෙති: පරිසඞ්කිතං නස්සරති, පරිසඞ්කිතං පම්මුට්ඨො හොති, තඤ්චෙ චොදෙති, පරිසඞ්කිතො මයා දිට්ඨො ච -පෙ- පරිසඞ්කිතො මයා සුතො ච -පෙ- පරිසඞ්කිතො මයා දිට්ඨො ච සුතො ච පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා''ති, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

29. අදිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: ''දිට්ඨොසි පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා''ති, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

30. අසුතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, -පෙ- අපරිසඞ්කිතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති: ''පරිසඞ්කිතොසි, පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

31. අදිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: දිට්ඨොසි සුතොසි -පෙ- දිට්ඨොසි පරිසඞ්කිතොසි -පෙ- දිට්ඨොසි සුතොසි පරිසඞ්කිතොසි, පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, -පෙ- අසුතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති: සුතොසි පරිසඞ්කිතොසි -පෙ- සුතොසි දිට්ඨොසි -පෙ- සුතොසි පරිසඞ්කිතොසි දිට්ඨොසි -පෙ- අපරිසඞ්කිතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති: පරිසඞ්කිතොසි දිට්ඨොසි -පෙ- පරිසඞ්කිතොසි සුතොසි -පෙ- පරිසඞ්කිතොසි දිට්ඨොසි සුතොසි පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

32. දිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, තඤ්චෙ චොදෙති: සුතොසි -පෙ- තඤ්චෙ චොදෙති: පරිසඞ්කිතොසි -පෙ- තඤ්චෙ චොදෙති: සුතොසි පරිසඞ්කිතොසි, පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

33. සුතස්ස හොති 'පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො'ති -පෙ- පරිසඞ්කිතස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොති, තඤ්චෙ චොදෙති: දිට්ඨොසි -පෙ- තඤ්චෙ චොදෙති: සුතොසි -පෙ- තඤ්චෙ චොදෙති: දිට්ඨොසි සුතොසි පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

---

1. පම්මුට්ඨො. මජසං.

28. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ දක්නා ලද්දේ වෙයි. දක්නා ලද්දෙහි විමති ඇත්තේ දක්නා ලද්ද නො හදහයි. දක්නා ලද්ද නො සිහි කෙරෙයි. දක්නා ලද්ද නැසුනේ වෙයි ... ශ්‍රැතයෙහි විමති ඇත්තේ අසන ලද්ද නො හදහයි, අසන ලද්ද නො සිහි කෙරෙයි, අසන ලද්ද නැසුනේ වෙයි ... සැක කරණ ලද්දෙහි විමති ඇත්තේ සැක කරණ ලද්ද නො හදහයි, සැක කරණ ලද්ද නොසිහි කෙරෙයි, සැක කරණ ලද්ද නැසුනේ වෙයි. ඉදින් ඔහුට මා විසින් පරිසඞ්කිතයෙහි දක්නා ලද්දෙහි ද ... මා විසින් පරිසඞ්කිතයෙහි අසන ලද්දෙහි ද .. '(තෝ) පරිජිඇවැත් අවන්නෙහි මා විසින් පරිසඞ්කිතයෙහි දක්නා ලද්දෙහි ද අසනලද්දෙහි ද වෙහි අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි. තා සමග පොහෝ කිරීම හෝ පවුරුණු හෝ සඞ්ඝකම් හෝ නැතැ' යි චොදනා කෙරේ නම්, තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්-ඇවැත් වේ.

29. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ නො දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට 'පරිජිඇවැත් අවන්නෙහි දක්නා ලද්දෙහි ය. අශ්‍රමණයෙහි අශාක්‍යපුත්‍රියයෙහි තා සමග උපෝසථයෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝ-කම්යෙක් හෝ නැතැ'යි චොදනා කරවා නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

30. චෝදක වූ ඔහු විසින් 'පරිජිඇවැත් අවන්නේ ය'යි නො අසන ලද්දේ වෙයි. ... ඔහු විසින් 'පරිජිඇවැත් අවන්නේ ය'යි සැක කරණ ලද්දේ වෙයි. ඉදින් ඔහුට 'තෝ පරිජිඇවැත් අවන්නෙහි. පරිසඞ්කිතයෙහි ය. අශ්‍රමණ-යෙහි ... චොදනා කරවා නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

31. චෝදක වූ ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ නො දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට චොදනා කරවා නම් දක්නා ලද්දෙහි අසන ලද්දෙහි ය. ... දක්නා ලද්දෙහි සැක කරණ ලද්දෙහි ය.... දක්නා ලද්දෙහි අසන ලද්දෙහි සැක කරණ ලද්දෙහි පරිජිඇවැත් අවන්නෙහි ... ඔහු විසින් 'පරිජිඇවැත් අවන්නේ ය'යි නො අසන ලද්දේ වෙයි. ඉදින් ඔහුට චොදනා කරවා නම් 'අසන ලද්දෙහි සැක කරණ ලද්දෙහි ය. ... දක්නා ලද්දෙහි සැක කරණ ලද්දෙහි දක්නා ලද්දෙහිය... ඔහු විසින් 'පරිජිඇවැත් අවන්නේ ය'යි සැක නො කරණ ලද්දේ වෙයි. ඉදින් ඔහුට චොදනා කරවා නම් 'සැක කරණ ලද්දෙහි දක්නා ලද්දෙහි ය. ... සැක කරණ ලද්දෙහි අසන ලද්දෙහි ය. ... සැක කරණ ලද්දෙහි දක්නා ලද්දෙහි අසන ලද්දෙහි පරිජිඇවැත් අවන්නෙහි ය. අශ්‍රමණයෙහි ය. ... තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

32. ඔහු විසින් පරිජිඇවැත් අවදිනුයේ දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට චොදනා කරවා නම් 'අසන ලද්දෙහි ය. ... ඉදින් ඔහුට චොදනා කරවා නම් 'සැක කරණ ලද්දෙහි ය. ... ඉදින් ඔහුට චොදනා කරවා නම් 'අසන ලද්දෙහි සැක කරණ ලද්දෙහි පරිජිඇවැත් අවන්නෙහි අශ්‍රමණයෙහි' ... තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

33 ඔහු විසින් 'පරිජිඇවැත් අවන්නේ ය'යි අසන ලද්දේ වෙයි.... ඔහු විසින් 'පරිජිඇවැත් අවන්නේ ය'යි සැක කරණ ලද්දේ වෙයි. ඉදින් ඔහුට චොදනා කරවා නම් 'දක්නා ලද්දෙහි ය. ... ඉදින් ඔහුට චොදනා කරවා නම් 'අසන ලද්දෙහි ය. ... ඉදින් ඔහුට චොදනා කරවා නම් 'දක්නා ලද්දෙහි අසන ලද්දෙහි පරිජිඇවැත් අවන්නෙහි අශ්‍රමණයෙහි ය.' ... තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

34. දිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, දිට්ඨෙ වෙමතිකො දිට්ඨං නො කප්පෙති, දිට්ඨං නස්සරති, දිට්ඨං පමුට්ඨො හොති -පෙ- සුතෙ වෙමතිකො සුතං නො කප්පෙති සුතං නස්සරති සුතං පමුට්ඨො හොති -පෙ- පරිසඞ්කිතෙ වෙමතිකො පරිසඞ්කිතං නො කප්පෙති, පරිසඞ්කිතං නස්සරති, පරිසඞ්කිතං පමුට්ඨො හොති, තඤ්චෙ චොදෙති: පරිසඞ්කිතොසි දිට්ඨොසි -පෙ- පරිසඞ්කිතොසි සුතොසි -පෙ- පරිසඞ්කිතොසි දිට්ඨොසි සුතොසි පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වාති ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

35. අසුද්ධෙ සුද්ධදිට්ඨී, සුද්ධෙ අසුද්ධදිට්ඨී, අසුද්ධෙ අසුද්ධදිට්ඨී, සුද්ධෙ සුද්ධදිට්ඨී.

36. අසුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො, තඤ්චෙ සුද්ධදිට්ඨීසමානො අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස.

37. අසුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො, තඤ්චෙ සුද්ධදිට්ඨීසමානො ඔකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

38. අසුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො තඤ්චෙ සුද්ධදිට්ඨීසමානො අනොකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදෙන දුක්කටස්ස.

39. අසුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො, තඤ්චෙ සුද්ධදිට්ඨීසමානො ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස.

40. සුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අනජ්ඣාපන්නො, තඤ්චෙ අසුද්ධදිට්ඨීසමානො අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති දුක්කටස්ස.

41. සුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අනජ්ඣාපන්නො, තඤ්චෙ අසුද්ධදිට්ඨීසමානො ඔකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, අනාපත්ති.

42. සුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අනජ්ඣාපන්නො, තඤ්චෙ අසුද්ධදිට්ඨීසමානො අනොකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදෙන දුක්කටස්ස.

43. සුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අනජ්ඣාපන්නො, තඤ්චෙ අසුද්ධදිට්ඨීසමානො ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස.

34. චෝදනා කරවන ඔහු විසින් පරිජ්ආවැත් අචදනා වූ හෙතෙම දක්නා ලද්දේ වෙයි. දක්නා ලද්දෙහි විමති ඇත්තේ දක්නා ලද්ද නො හදහයි. දක්නා ලද්ද නො සිහි කෙරෙයි. දක්නා ලද්ද නැසුනේ වෙයි. ... අසන ලද්දෙහි විමති ඇත්තේ අසන ලද්ද නො හදහයි, අසන ලද්ද නො සිහි කෙරෙයි, අසන ලද්ද නැසුනේ වෙයි. ... පරිසඞ්කිතයෙහි විමති ඇත්තේ පරිසඞ්කිතය නො හදහයි, පරිසඞ්කිතය නො සිහි කෙරෙයි, පරිසඞ්කිතය නැසුනේ වෙයි. ඉදින් ඔහුට චෝදනා කරවා නම් 'සැක කරණ ලද්දෙහි දක්නා ලද්දෙහි ය. ... සැක කරණ ලද්දෙහි අසන ලද්දෙහි ය. ... සැක කරණ ලද්දෙහි දක්නා ලද්දෙහි අසන ලද්දෙහි පරිජ්ආවැත් අවන්නෙහි ය. අශ්‍රමණයෙහි ය, අශාක්‍යපුත්‍රීයයෙහි ය තා සමග උපෝසථයෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝකර්මයෙක් හෝ නැතැ'යි චෝදනා කරවා නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

35. අශුද්ධයා කෙරෙහි ශුද්ධදෘෂ්ටි ඇත්තේ යැ. ශුද්ධයා කෙරෙහි අශුද්ධදෘෂ්ටි ඇත්තේ යැ. අශුද්ධයා කෙරෙහි අශුද්ධදෘෂ්ටි ඇත්තේ යැ. ශුද්ධයා කෙරෙහි ශුද්ධදෘෂ්ටි ඇත්තේ යි.

36. පුද්ගල තෙම අශුද්ධ වූයේ එක්තරා පරිජ්ආවැතකට පැමිණියේ වෙයි. ඉදින් ඔහුට ශුද්ධ ය යන දෘෂ්ටි ඇත්තේ අවකාශ නො කරවා සස්නෙන් නෙරනු කැමැත්තේ කියා නම් සඟවෙසෙස් සමග දුකුළාඇවැත් වේ.

37. පුද්ගල තෙම අශුද්ධ වූයේ එක්තරා පරිජ්ආවැතකට අවන්නේ වෙයි. ඉදින් ඔහුට ශුද්ධ ය යන දෘෂ්ටි ඇතියේ සස්නෙන් නෙරනු කැමැත්තේ අවකාශ කරවා කියා නම් සඟවෙසෙස්ඇවැත් වේ.

38. පුද්ගල තෙම අශුද්ධ වූයේ එක්තරා පරිජ්ආවැතකට අවන්නේ වෙයි. ඉදින් ඔහුට ශුද්ධ ය යන දෘෂ්ටි ඇත්තේ අවකාශ නො කරවා ආක්‍රෝශ කරණ රිසි ඇති ව කියා නම් ඔමසවාදයෙහි පචිති සමග දුකුළාඇවැත් වේ.

39. පුද්ගල තෙම අශුද්ධ වූයේ එක්තරා පරිජ්ආවැතකට අවන්නේ වෙයි. ඉදින් ඔහුට ශුද්ධ ය යන දෘෂ්ටි ඇති ව අවකාශ කරවා ආක්‍රෝශ කරණ රිසි ඇති ව කියා නම් ඔමසවාදයෙහි පචිතිඇවැත් වේ.

40. පුද්ගල තෙම ශුද්ධ වූයේ එක්තරා පරිජ්ආවැතකට නො පැමිණියේ වෙයි. ඉදින් ඔහුට අශුද්ධ ය යන දෘෂ්ටි ඇති ව සස්නෙන් නෙරනු කැමැත්තේ අවකාශ නො කරවා කියා නම් දුකුළාඇවැත් වේ.

41. පුද්ගල තෙම එක්තරා පරිජ්ආවැතකට නො පැමිණියේ ශුද්ධ වූයේ වෙයි. ඉදින් ඔහුට අශුද්ධ ය යන දෘෂ්ටි ඇති ව සස්නෙන් නෙරනු කැමැත්තේ අවකාශ කරවා කියා නම් ඇවැත් නැති.

42. පුද්ගල තෙම එක්තරා පරිජ්ආවැතකට නො පැමිණියේ ශුද්ධ වූයේ වෙයි. ඉදින් ඔහුට අශුද්ධ ය යන දෘෂ්ටි ඇති ව ආක්‍රෝශ කරණ රිසි ඇත්තේ අවකාශ නො කරවා කියා නම් ඔමසවාදයෙහි පචිති සමග දුකුළාඇවැත් වේ.

43. පුද්ගල තෙම එක්තරා පරිජ්ආවැතකට නො පැමිණියේ ශුද්ධ වූයේ වෙයි. ඉදින් ඔහුට අශුද්ධ ය යන දෘෂ්ටි ඇති ව ආක්‍රෝශ කරණ රිසි ඇතියේ අවකාශ කරවා කියා නම් ඔමසවාදයෙහි පචිතිඇවැත් වේ.

44. අසුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො, තඤ්චෙ අසුද්ධදිට්ඨිසමානො අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති දුක්කටස්ස -පෙ- ඔකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, අනාපත්ති -පෙ- අනොකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදෙන දුක්කටස්ස -පෙ- ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස.

45. සුද්ධො හොති පුග්ගලො අඤ්ඤතරං පාරාජිකං ධම්මං අනජ්ඣාපන්නො, තඤ්චෙ සුද්ධදිට්ඨිසමානො අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස -පෙ- ඔකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස -පෙ- අනොකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදෙන දුක්කටස්ස -පෙ- ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස.

46. අනාපත්ති: සුද්ධෙ අසුද්ධදිට්ඨිස්ස, අසුද්ධෙ අසුද්ධදිට්ඨිස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පඨම දුට්ඨදොස සික්ඛාපදං නිට්ඨිතං.**

---

## 3. 9.

## දුතිය දුට්ඨදොස සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන **මෙත්තියභුම්මජකා** භික්ඛූ ගිජ්ඣකූටා පබ්බතා ඔරොහන්තා අද්දසංසු ඡගලකං[1] අජිකාය විප්පටිපජ්ජන්තං, දිස්වාන එවමාහංසු: "හන්ද මයං ආවුසො ඉමං ඡගලකං දබ්බං මල්ලපුත්තං නාම කරොම, ඉමං අජිකං මෙත්තියං නාම භික්ඛුනිං කරොම. එවං මයං වොහරිස්සාම. පුබ්බෙ මයං ආවුසො දබ්බං මල්ලපුත්තං සුතෙන අවොචුම්හ, ඉදානි පන අම්හෙහි සාමං දිට්ඨො මෙත්තියාය භික්ඛුනියා විප්පටිපජ්ජන්තො"ති. තෙ තං ඡගලකං දබ්බං මල්ලපුත්තං නාම අකංසු, තං අජිකං මෙත්තියං නාම භික්ඛුනිං අකංසු. තෙ භික්ඛූනං ආරොචෙසුං: 'පුබ්බෙ මයං ආවුසො දබ්බං මල්ලපුත්තං සුතෙන අවොචුම්හ ඉදානි පන අම්හෙහි සාමං දිට්ඨො මෙත්තියාය භික්ඛුනියා විප්පටිපජ්ජන්තො'ති. භික්ඛූ එවමාහංසු: "මා ආවුසො එවං අවචුත්ථ, නායස්මා දබ්බො මල්ලපුත්තො එවං කරිස්සතී"ති.

1. ඡකලකං. සයා. සී.

44. පුද්ගල තෙම එක්තරා පරිජ්ආවැතකට පැමිණියේ අශුද්ධ වූයේ වෙයි. ඉදින් ඔහුට අශුද්ධ ය යන දෘෂ්ටි ඇති ව සස්තෙන් තෙරණ රිසි ඇතියේ අවකාශ නො කරවා කියා නම් දුකුලාආවැත් වෙයි. ... සස්තෙන් තෙරණ රිසි ඇති ව අවකාශ කරවා කියා නම් ඇවැත් නැති ... ආක්‍රොශ කරණ රිසි ඇති ව අවකාශ නො කරවා කියා නම් ඔම්සවාදයෙහි පචිති සමග දුකුලාආවැත් වේ... ආක්‍රොශ කරණ රිසි ඇති ව අවකාශ කරවා කියා නම් ඔමසවාදයෙහි පචිති-ඇවැත් වේ.

45. පුද්ගල තෙම එක්තරා පරිජ්ආවැතකට නො පැමිණියේ ශුද්ධ වූයේ වෙයි. ඉදින් ඔහුට ශුද්ධය ය යන දෘෂ්ටි ඇති ව සස්තෙන් තෙරණ රිසි ඇතියේ අවකාශ නො කරවා කියා නම් සඟවෙසෙස් සමග දුකුලාආවැත් වේ. ... සස්තෙන් තෙරණ රිසි ඇතියේ අවකාශ කරවා කියා නම් සඟවෙසෙස්-ඇවැත් වේ. ... ආක්‍රොශ කරණ රිසි ඇතියේ අවකාශ නො කරවා කියා නම් ඔමසවාදයෙහි පචිති සමග දුකුලාආවැත් වේ. ... ආක්‍රොශ කරණ රිසි ඇතියේ අවකාශ කරවා කියා නම් ඔමසවාදයෙහි පචිතිආවැත් වේ.

46. ශුද්ධයා කෙරෙහි අශුද්ධ ය යන දෘෂ්ටි ඇතියහුට, අශුද්ධයා කෙරෙහි අශුද්ධ ය යන දෘෂ්ටි ඇතියහුට, උන්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැත්තේ යි.

---

## 3. 9.

## ද්විතීය දුට්ඨදෝස ශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර සමීපයෙහි වූ කලන්දක-නිවාප නම් වේළුවනයෙහි වාසය කෙරෙති. තවද එසමයෙහි මෙත්තිය-භුම්මජක නම් භික්ෂූහු ගිජ්ඣකූළපව්වෙහි සිට බස්නාහු එළියක සමග මෙවුන්දම්හි හැසිරෙණ එළුවකු දැක මෙසේ කීහු. 'ඇවැත්නි, අපි දුන් මේ එළුවා දබ්බමල්ලපුත්‍ර යයි නම් කරම්හ. මේ එළිය මෙත්තියා නම් භික්ෂුණිය කරම්හ. අපි මෙසේ ව්‍යවහාර කරම්හ. ඇවැත්නි, පෙර අපි දබ්බමල්ලපුත්‍රහට ශ්‍රැතයෙන් චොදනා කළම්හ. දුන් වැළිත් අප විසින් 'මෙත්තියා මෙහෙණ සමග මෙවුන්දම්හි හැසිරෙණුයේ තමන් ම දක්නා ලද්දේ ය'යි. ඔහු ඒ එළුවා 'දබ්බමල්ලපුත්‍ර'යි නම් කළහ. ඒ එළිය "මෙත්තියා" නම් භික්ෂුණිය කළහ. ඔහු භික්ෂූන්ට ආරෙචනය කළහ. 'ඇවැත්නි, අපි පෙර දබ්බමල්ලපුත්‍රහට ශ්‍රැතයෙන් කීම්හ. දුන් වැළිත් අප විසින් මෙත්තියා භික්ෂුණිය සමග මෙවුන්දම්හි හැසිරෙණුයේ තමන් ම දක්නා ලද්දේය'යි. භික්ෂූහු මෙසේ කීහු, 'ඇවැත්නි, තෙපි එසේ නොකියවු. ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයෝ මෙසේ නො කරන්නාහ'යි.

2. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං පටිපුච්ඡි: "සරසි ත්වං දබ්බ එවරූපං කත්තා, යථයිමෙ භික්ඛූ ආහංසූ"ති. "යථා මං භන්තෙ භගවා ජානාතී"ති. දුතියම්පි ඛො භගවා -පෙ- තතියම්පි ඛො භගවා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං එතදවොච: "සරසි ත්වං දබ්බ එවරූපං කත්තා; යථයිමෙ භික්ඛූ ආහංසූ"ති. "යථා මං භන්තෙ භගවා ජානාතී"ති. "න ඛො දබ්බ දබ්බා එවං නිබ්බෙඨෙන්ති. සචෙ තයා කතං කතන්ති වදෙහි, සචෙ අකතං අකතන්ති වදෙහී"ති. "යතො අහං භන්තෙ ජාතො නාභිජානාමි සුපිනන්තෙනාපි මෙථුනං ධම්මං පටිසෙවිතා, පගෙව ජාගරො"ති. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "තෙන හි භික්ඛවෙ ඉමෙ භික්ඛූ අනුයුඤ්ජථා"ති. ඉදං වත්වා භගවා උට්ඨායාසනා විහාරං පාවිසි.

3. අථ ඛො තෙ භික්ඛූ මෙත්තියභූමජකෙ භික්ඛූ අනුයුඤ්ජිංසු:* "කිං පන තුම්හෙ ආවුසො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙථා'ති. 'එවමාවුසො'ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම මෙත්තියභූමජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙස්සන්තී"ති අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ දබ්බං මල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙථා"ති. "සච්චං භගවා" විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා දබ්බං මල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චි දෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙස්සථ නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය, අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අඤ්ඤභාගියං චෙව තං අධිකරණං හොති, කොචි දෙසො ලෙසමත්තො උපාදින්නො, භික්ඛු ච දොසං පතිට්ඨාති, සඞ්ඝාදිසෙසො"ති.**

4. **යො පනාති** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුන්ති** අඤ්ඤං භික්ඛුං.

**දුට්ඨො දොසොති** කුපිතො අනත්තමනො අනභිරද්ධො ආහතචිත්තො ඛිලජාතො.

* "තෙ භික්ඛූ අනුයුඤ්ජියමානා භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං" අයම්පි පාඨො පොත්ථකෙසු දිස්සති.

2. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේකාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන් පුළුවුත් සේක. 'දබ්බය, යම්සේ මේ භික්ෂූහු කියත් ද තෙපි මෙබන්දක් කළහු සිහි කරවු දැ?' යි. යම්සේ භාග්‍යවතුන් වහන්සේ මා දන්නා සේක් නම් (එසෙයින් දතයුතු වෙමි) යි, බුදුහු දෙවන වට ද ... බුදුහු තෙවනවට ද ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන්ට මෙය වදාළහ. "දබ්බය, යම්සේ මේ භික්ෂූහු කියත් ද තෙපි මෙබන්දක් කළහු සිහි කරවු දැ? යි. යම්සේ භාග්‍යවතුන් වහන්සේ දන්නා සේක් ද 'එසෙයින් දතයුතු වෙමි' යි. දබ්බය, පණ්ඩිතයෝ මෙසේ (පර ප්‍රත්‍යයෙන්) නිරවුල් නො කෙරෙති. ඉදින් තා විසින් කරණ ලද නම් කරණ ලදැ යි කියව. ඉදින් තා විසින් නො කරණ ලද නම් නො කරණ ලදැ යි කියව"යි. 'ස්වාමීනි, මම යම් කලෙක උපන්නෙම් ද එතැන් පටන් සිහිනෙනුදු මෙවුන්දම් සෙවියෙම් නො දනිමි. නිදි වැරැයෙම් කෑලමා' යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමැතූ සේක. 'එසේ වී නම් මහණෙනි, මේ භික්ෂූන් විමසව'යි. මෙය වදාරා භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගී විහාරයට පිවිසි සේක.

3. ඉක්බිති ඒ භික්ෂූහු මෛත්‍රියභූමජක භික්ෂූන් විමසූහ. කිමෙක් ද "ඇවැත්නි, තෙපි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන්ට අන්‍යභාගීය අධිකරණයක්හුගේ එකදේශලෙශමාත්‍රයක් ගෙන පරිජිඇවැතින් චෝදනා කරවු දැ?"යි. 'එසේය ඇවැත්නි'යි. යම් අපිස් මහණ කෙනෙක් වෙත් නම් ඔහු අවමන් කෙරෙති, අයුණු කියති, දෙස් පහළ කෙරෙත්. 'කෙසේ නම් මෛත්‍රියභූමජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයන්ට අන්‍යභාගීය අධිකරණයක්හුගේ එකදෙ-ශලෙශමාත්‍රයක් ගෙන පරිජිඇවැතින් චෝදනා කෙරෙත් දැ? යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. 'සැබැවෙක් ද මහණෙනි, තෙපි දබ්බමල්ලපුත්‍රහට අන්‍යභාගීය අධිකරණයක්හුගේ එකදෙශලෙශමාත්‍රයක් ගෙන පරිජිඇවැතින් චෝදනා කරවු දැ? යි. 'සැබව භග්‍යවතුන් වහන්සැ' යි. භාග්‍යවත් බුදුහු වෙසෙසින් ගැරහූහ. 'කෙසේ නම් හිස්පුරුෂයෙනි, තෙපි දබ්බමල්ලපුත්‍රහට අන්‍යභාගීය අධිකරණයක්හුගේ එකදෙශලෙශමාත්‍රයක් ගෙන පරිජිඇවැතින් චෝදනා කරවු ද, හිස් පුරුෂයෙනි, තෙල නො පහන් වූවන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු.

**'යම් මහණෙක් දූෂිත වූයේ නො සතුටුසිත් ඇත්තේ 'මොහු මෙසස්නෙන් නෙරනෙම් නම් යෙහෙකැ'යි අන්‍යභාගිය අධිකරණයක්-හුගේ එකදෙශලෙශමාත්‍රයක් ගෙණ මහණක්හට පරිජිඇවතින් චොදනා කරන්නේ නම්, එයින් පසුකලෙක විචාරනු ලබන්නේ හෝ නො විචාරණු ලබන්නේ හෝ ඒ අධිකරණය අන්‍යභාගියද වේ නම් එකදෙශ වූ ලෙශමාත්‍රයෙක් ගන්නා ලද්දේ නම් 'චොදක මහණ තෙමේත් දෙෂයෙහි පිහිටා නම් සඟවෙසෙස් වේය'යි.**

4. **යො පන** යනු: යමෙක් යම්බඳුයෙක්' ...

**භික්ඛු** යනු: ... මේ තෙමේ මේ අර්ථයෙහි භික්ඛු යයි අදහස් කරණ ලද්දේ ය.

**භික්ඛුං** යනු: අන් මහණක්හට.

**දුට්ඨො දොසො** යනු: කිපියේ නො සතුටුසිත් ඇත්තේ නො පහන් වූයේ කොවින් මැඩුණු සිත් ඇත්තේ හටගත් (පිළිකුළු) හුල් ඇත්තේ.

**අප්පතීතොති** තෙන ච කොපෙන තෙන ච දොසෙන තාය ච අනත්තමනතාය තාය ච අනභිරද්ධියා අප්පතීතො හොති.

**අඤ්ඤභාගියස්ස අධිකරණස්සාති** ආපත්තඤ්ඤභාගියං වා හොති අධිකරණඤ්ඤභාගියං වා. කථං අධිකරණං අධිකරණස්ස අඤ්ඤභාගියං. විවාදාධිකරණං අනුවාදාධිකරණස්ස ආපත්තාධිකරණස්ස කිච්චාධිකරණස්ස අඤ්ඤභාගියං, අනුවාදාධිකරණං ආපත්තාධිකරණස්ස කිච්චාධිකරණස්ස විවාදාධිකරණස්ස අඤ්ඤභාගියං, ආපත්තාධිකරණං කිච්චාධිකරණස්ස විවාදාධිකරණස්ස අනුවාදාධිකරණස්ස අඤ්ඤභාගියං, කිච්චාධිකරණං විවාදාධිකරණස්ස අනුවාදාධිකරණස්ස ආපත්තාධිකරණස්ස අඤ්ඤභාගියං. එවං අධිකරණං අධිකරණස්ස අඤ්ඤභාගියං.

කථං අධිකරණං අධිකරණස්ස තබ්භාගියං? විවාදාධිකරණං විවාදාධිකරණස්ස තබ්භාගියං. අනුවාදාධිකරණං අනුවාදාධිකරණස්ස තබ්භාගියං. ආපත්තාධිකරණං ආපත්තාධිකරණස්ස සියා තබ්භාගියං සියා අඤ්ඤභාගියං.

කථං ආපත්තාධිකරණං ආපත්තාධිකරණස්ස අඤ්ඤභාගියං? මෙථුනධම්මපාරාජිකාපත්ති අදින්නාදානපාරාජිකාපත්තියා මනුස්සවිග්ගහපාරාජිකාපත්තියා උත්තරිමනුස්සධම්මපාරාජිකාපත්තියා අඤ්ඤභාගියා. අදින්නාදානපාරාජිකාපත්ති මනුස්සවිග්ගහපාරාජිකාපත්තියා උත්තරිමනුස්සධම්මපාරාජිකාපත්තියා මෙථුනධම්මපාරාජිකාපත්තියා අඤ්ඤභාගියා. මනුස්සවිග්ගහපාරාජිකාපත්ති උත්තරිමනුස්සධම්මපාරාජිකාපත්තියා මෙථුනධම්මපාරාජිකාපත්තියා අදින්නාදානපාරාජිකාපත්තියා අඤ්ඤභාගියා. උත්තරිමනුස්සධම්මපාරාජිකාපත්ති මෙථුනධම්මපාරාජිකාපත්තියා අදින්නාදානපාරාජිකාපත්තියා මනුස්සවිග්ගහපාරාජිකාපත්තියා අඤ්ඤභාගියා. එවං ආපත්තාධිකරණං ආපත්තාධිකරණස්ස අඤ්ඤභාගියං.

කථඤ්ච ආපත්තාධිකරණං ආපත්තාධිකරණස්ස තබ්භාගියං? මෙථුනධම්මපාරාජිකාපත්ති මෙථුනධම්මපාරාජිකාපත්තියා තබ්භාගියා. අදින්නාදානපාරාජිකාපත්ති අදින්නාදානපාරාජිකාපත්තියා තබ්භාගියා. මනුස්සවිග්ගහපාරාජිකාපත්ති මනුස්සවිග්ගහපාරාජිකාපත්තියා තබ්භාගියා. උත්තරිමනුස්සධම්මපාරාජිකාපත්ති උත්තරිමනුස්සධම්මපාරාජිකාපත්තියා තබ්භාගියා. එවං ආපත්තාධිකරණං ආපත්තාධිකරණස්ස තබ්භාගියං.

කිච්චාධිකරණං කිච්චාධිකරණස්ස තබ්භාගියං. එවං අධිකරණං අධිකරණස්ස තබ්භාගියං.

**කිඤ්චි දෙසං ලෙසමත්තං උපාදායාති** ලෙසො නාම: දසලෙසා: ජාතිලෙසො නාමලෙසො ගොත්තලෙසො ලිඞ්ගලෙසො ආපත්තිලෙසො පත්තලෙසො චීවරලෙසො උපජ්ඣායලෙසො ආචරියලෙසො සෙනාසනලෙසො.

**අපපතීතො** යනු: ඒ කෝපයෙන් ද ඒ දොෂයෙන් ද ඒ නො සතුටුසිත් ඇති බැවින් ද ඒ නො පහන් බැවින් ද නො සතුටුසිත් ඇත්තේ වේ.

**අඤ්ඤභාගියස්ස අධිකරණස්ස** යනු: ආපත්ති අන්‍යභාගිය හෝ අධිකරණ අන්‍යභාගිය හෝ වෙයි. කිසෙයින් අධිකරණය අධිකරණයට අන්‍යභාග වේ ද? යත්: විවාදධිකරණය අනුවාදධිකරණයට ආපත්තාධි-කරණයට කිච්චාධිකරණයට අන්‍යභාගිය වෙයි. අනුවාදධිකරණය ආපත්තාධි-කරණයට කිච්චාධිකරණයට විවාදධිකරණයට අන්‍යභාගිය වෙයි. ආපත්තාධි-කරණය කිච්චාධිකරණයට විවාදධිකරණයට අනුවාදධිකරණයට අන්‍යභාගිය වෙයි. කිච්චාධිකරණය විවාදධිකරණයට අනුවාදධිකරණයට ආපත්තාධි-කරණයට අන්‍යභාගිය වෙයි. මෙසෙයින් අධිකරණය අධිකරණයට අන්‍යභාගිය වේ.

කිසෙයින් අධිකරණය අධිකරණයට තද්භාගිය වේ ද? යත්: විවාදධි-කරණය විවාදධිකරණයට තද්භාගිය වෙයි. අනුවාදධිකරණය අනුවාදධි-කරණයට තද්භාගිය වෙයි. ආපත්තාධිකරණය ආපත්තාධිකරණයට තද්භාගිය ද වන්නේ ය, අන්‍යභාගිය ද වන්නේ යි.

කිසෙයින් ආපත්තාධිකරණය ආපත්තාධිකරණයට අන්‍යභාගිය වේ ද? යත්: මෛථුනධම්මපාරාජිකාපත්තිය අදින්නාදානපාරාජිකාපත්තියට මනුෂ්‍ය-විග්‍රහපාරාජිකාපත්තියට උත්තරිමනුෂ්‍යධම්මපාරාජිකාපත්තියට අන්‍යභාගිය වෙයි. අදත්තාදානපාරාජිකාපත්තිය මනුෂ්‍යවිග්‍රහපාරාජිකාපත්තියට උත්තරි-මනුෂ්‍යධම්මපාරාජිකාපත්තියට මෛථුනධම්මපාරාජිකාපත්තියට අන්‍යභාගිය වෙයි. මනුෂ්‍යවිග්‍රහපාරාජිකාපත්තිය උත්තරිමනුෂ්‍යධම්මපාරාජිකාපත්තියට මෛථුනධම්මපාරාජිකාපත්තියට අදත්තාදානපාරාජිකාපත්තියට අන්‍යභාගිය වෙයි. උත්තරිමනුෂ්‍යධම්මපාරාජිකාපත්තිය මෛථුනධම්මපාරාජිකාපත්තියට අදත්තාදානපාරාජිකාපත්තියට මනුෂ්‍යවිග්‍රහපාරාජිකාපත්තියට අන්‍යභාගිය වෙයි. මෙසෙයින් ආපත්තාධිකරණය ආපත්තාධිකරණයට අන්‍යභාගිය වේ

යළි කිසෙයින් ආපත්තාධිකරණය ආපත්තාධිකරණයට තද්භාගිය වේ ද? යත්: මෛථුනධම්මපාරාජිකාපත්තිය මෛථුනධම්මපාරාජිකාපත්තියට තද්භාගිය වෙයි. අදත්තාදානපාරාජිකාපත්තිය අදත්තාදානපාරාජිකාපත්තියට තද්භාගිය වෙයි. මනුෂ්‍යවිග්‍රහපාරාජිකාපත්තිය මනුෂ්‍යවිග්‍රහපාරාජිකාපත්තියට තද්භාගිය වෙයි. උත්තරිමනුෂ්‍යධම්මපාරාජිකාපත්තිය උත්තරිමනුෂ්‍යධම්මපාරාජිකාපත්ති-යට තද්භාගිය වෙයි. මෙසෙයින් ආපත්තාධිකරණය ආපත්තාධිකරණයට තද්භාගිය වේ.

කිච්චාධිකරණය කිච්චාධිකරණයට තද්භාගිය වෙයි. මෙසෙයින් අධිකරණය අධිකරණයට තද්භාගිය වේ.

**කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය** යනු: ලෙස නම් දශ ලෙශ කෙනෙකි. ජාති ලෙශ යෑ නාමලෙශ යෑ ගොත්‍රලෙශ යෑ ලිඞ්ගලෙශ යෑ ආපත්ති ලෙශ යෑ පාත්‍ර ලෙශ යෑ චීවර ලෙශ යෑ උපාධ්‍යාය ලෙශ යෑ ආචාර්‍ය්‍ය ලෙශ යෑ ශයනාසන-ලෙශ යි.

**ජාතිලෙසො** නාම: ඛත්තියො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං ඛත්තියං පස්සිත්වා චොදෙති: “ඛත්තියො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වාති, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස. බ්‍රාහ්මණො දිට්ඨො හොති -පෙ- වෙස්සො දිට්ඨො හොති -පෙ- සුද්දො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං සුද්දං පස්සිත්වා චොදෙති: සුද්දො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**නාමලෙසො** නාම: බුද්ධරක්ඛිතො දිට්ඨො හොති -පෙ- ධම්මරක්ඛිතො දිට්ඨො හොති -පෙ- සඞ්ඝරක්ඛිතො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං සඞ්ඝරක්ඛිතං පස්සිත්වා චොදෙති: සඞ්ඝරක්ඛිතො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**ගොත්තලෙසො** නාම: ගොතමො දිට්ඨො හොති -පෙ- මොග්ගල්ලානො දිට්ඨො හොති -පෙ- කච්චායනො දිට්ඨො හොති -පෙ- වාසිට්ඨො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං වාසිට්ඨං පස්සිත්වා චොදෙති: වාසිට්ඨො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**ලිඞ්ගලෙසො** නාම: දීඝො දිට්ඨො හොති -පෙ- රස්සො දිට්ඨො හොති -පෙ- කණ්හො දිට්ඨො හොති -පෙ- ඔදාතො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං ඔදාතං පස්සිත්වා චොදෙති: ඔදාතො මයා දිට්ඨො, පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**ආපත්තිලෙසො** නාම: ලහුකං ආපත්තිං ආපජ්ජන්තො දිට්ඨො හොති, තඤ්ඤෙව පාරාජිකෙන චොදෙති: අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**පත්තලෙසො** නාම: ලොහපත්තධරො දිට්ඨො හොති -පෙ- සාටකපත්තධරො දිට්ඨො හොති -පෙ- සුම්භකපත්තධරො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං සුම්භකපත්තධරං පස්සිත්වා චොදෙති: සුම්භකපත්තධරො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**ජාතිලෙස** නම්: චෝදකයා විසින් පරිජිඇවැත් අවදනා ක්ෂත්‍රියයෙක් දක්නා ලද්දේ වෙයි. (හෙතෙම) අන්‍යක්ෂත්‍රිය මහණක්හු දැක මා විසින් (පරිජි-ඇවැත් අවදනා) ක්ෂත්‍රියයෙක් දක්නා ලද්දේ ය. (ක්ෂත්‍රිය වූ තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයයෙහි තා සමග උපොසථයෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝකර්මයෙක් හෝ නැතැ' යි චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ. බමුණෙක් දක්නා ලද්දේ වෙයි. ... වෛශ්‍යයෙක් දක්නා ලද්දේ වෙයි. ... පරිජිඇවැත් අවදනා ශුද්‍රයෙක් දක්නා ලද්දේ වෙයි. (හෙතෙම) අන්‍යශුද්‍ර පැවිද්දකු දැක 'මා විසින් (පරිජි-ඇවැත් අවදනා) ශුද්‍රයෙක් දක්නා ලද්දේ ය. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයයෙහි ...චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**නාමලෙස** නම්: (චෝදක මහණහු විසින්) බුද්ධරක්ඛිත නමැත්තෙක් දක්නා ලද්දේ වෙයි. ... ධම්මරක්ඛිත නමැත්තෙක් දක්නා ලද්දේ වෙයි. ... පරිජිඇවැත් අවදනා සඞ්ඝරක්ඛිත නමැත්තෙක් දක්නා ලද්දේ වෙයි. හේ සඞ්ඝරක්ඛිත නම් අනෙකක්හු දැක 'මා විසින් (පරිජිඇවැත් අවදනා) සඞ්ඝ-රක්ඛිත දක්නා ලද්දේ ය. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයයෙහි... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්-ඇවැත් වේ.

**ගොත්තලෙස** නම්: (චෝදක මහණහු විසින්) ගොතම ගොත්‍ර ඇතියෙක් දක්නා ලද්දේ වෙයි. ... මොග්ගල්ලාන ගොත්‍ර ඇතියෙක් දක්නා ලද්දේ වෙයි. ... කච්චායන ගොත්‍ර ඇතියෙක් දක්නා ලද්දේ වෙයි. ... පරිජිඇවැත් අවදනා වාසිට්ඨ ගොත්‍ර ඇතියෙක් දක්නා ලද්දේ වෙයි. හේ වාසිට්ඨ ගොත්‍ර ඇති අන් පැවිද්දකු දැක 'මා විසින් (පරිජිඇවැත් අවදනා) වාශිෂ්ඨයෙක් දක්නා ලද. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීය-යෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**ලිඞ්ගලෙස** නම්: දිගුල්ලෙක් දක්නා ලද්දේ වෙයි. ... ලුහුඬුයෙක් දක්නා ලද්දේ වෙයි. ... කළුයෙක් දක්නා ලද්දේ වෙයි. ... පරිජිඇවැත් අවදනා හෙළලුයෙක් දක්නා ලද්දේ වෙයි. හේ අන් හෙළලු පැවිද්දකු දැක 'මා විසින් (පරිජිඇවැත් අවදනා) හෙළලුයෙක් දක්නා ලද්දේ ය. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයයෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**ආපත්ති ලෙස** නම්: ලුහුඇවැත් අවදනා පැවිද්දෙක් දක්නා ලද්දේ වෙයි. ඉදින් ඔහුට අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයයෙහි, ... පරිජිඇවැතින් චොදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**පත්ත ලෙස** නම්: ලොහොමුවා පා දරන්නෙක් දක්නා ලද්දේ වෙයි. ... සාටකපාත්‍ර (බජ්නැගු මැටිපා) දරන්නෙක් දක්නා ලද්දේ වෙයි. ... පරිජි-ඇවැත් අවදනා සුමභකපාත්‍ර (පියවි මැටිපා) දරන්නෙක් දක්නා ලද්දේ වෙයි. හේ පියවි මැටිපා දරණ අන් මහණක්හු දැක 'මා විසින් (පරිජිඇවැත් අවදනා) පියවි මැටිපා දරන්නෙක් දක්නා ලද. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයයෙහි, ... චොදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**චීවරලෙසො** නාම: පංසුකූලිකො දිට්ඨො හොති -පෙ- ගහපතිචීවරධරෙ දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං ගහපතිචීවරධරං පස්සිත්වා චොදෙති: ගහපතිචීවරධරෙ මයා දිට්ඨො, පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**උපජ්ඣායලෙසො** නාම: ඉත්ථන්නාමස්ස සද්ධිවිහාරිකො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං ඉත්ථන්නාමස්ස සද්ධිවිහාරිකං පස්සිත්වා චොදෙති: පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි,- අසක්‍යපුත්තියොසි,-පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**ආචරියලෙසො** නාම: ඉත්ථන්නාමස්ස අන්තෙවාසිකො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො. 'අඤ්ඤං ඉත්ථන්නාමස්ස අන්තෙවාසිකං පස්සිත්වා චොදෙති: ඉත්ථන්නාමස්ස අන්තෙවාසිකො මයා දිට්ඨො, පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො'සි, අස්සමණො'සි, අසක්‍යපුත්තියො'සි -පෙ- ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**සෙනාසනලෙසො** නාම: ඉත්ථන්නාමස්ස සෙනාසනවාසිකො දිට්ඨො හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො, අඤ්ඤං ඉත්ථන්නාමස්ස සෙනාසන-වාසිකං පස්සිත්වා චොදෙති: ඉත්ථන්නාමස්ස සෙනාසනවාසිකො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො'සි, අස්සමණො'සි, අසක්‍යපුත්තියො'සි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා'ති. ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**පාරාජිකෙන ධම්මෙනාති** චතුන්නං අඤ්ඤතරෙන.

**අනුද්ධංසෙය්‍යාති** චොදෙති වා චොදාපෙති වා.

**අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති** භික්ඛුභාවා චාවෙය්‍යං සමණධම්මා චාවෙය්‍යං, සීලක්ඛන්ධා චාවෙය්‍යං, තපොගුණා චාවෙය්‍යං.

**තතො අපරෙන සමයෙනාති** යස්මිං ඛණෙ අනුද්ධංසිතො හොති තං ඛණං තං ලයං තං මුහුත්තං වීතිවත්තෙ.

**සමනුග්ගාහියමානොති** යෙන වත්ථුනා අනුද්ධංසිතො හොති, තස්මිං වත්ථුස්මිං සමනුග්ගාහියමානො.

**අසමනුග්ගාහියමානොති** න කෙනචි වුච්චමානො.

**අධිකරණං** නාම චත්තාරි අධිකරණානි විවාදාධිකරණං, අනුවාදාධිකරණං, ආපත්තාධිකරණං, කිච්චාධිකරණං.

**කොචි දෙසො ලෙසමත්තො උපාදින්නොති** තෙසං ලෙසානං අඤ්ඤතරො ලෙසො උපාදින්නො හොති.

**චීවර ලේස** නම්: පසුල් සිවුරු දරන්නෙක් දක්නා ලද්දේ වේයි. ... පරිජිඇවැත් අවදනා ගැහැවිසිවුරු දරන්නෙක් දක්නා ලද්දේ වෙයි. හේ ගැහැවිසිවුරු දරණ අන් මහණෙක්හු දක 'මා විසින් (පරිජිඇවැත් අවදනා) ගැහැවිසිවුරු දරන්නෙක් දක්නා ලද. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**උපජ්ඣාය ලේස** නම්: මෙනම් ඇත්තහුගේ පරිජිඇවැත් අවදනා සද්ධිවිහාරිකයෙක් දක්නා ලද වෙයි. මෙනම් ඇත්තහුගේ අන් සද්ධිවිහාරික පැවිද්දකු දක 'මා විසින් මෙනම් මහණහුගේ (පරිජිඇවැත් අවදනා) සද්ධි-විහාරික තෙම දක්නා ලද. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**ආචරිය ලේස** නම්: මෙනම් ඇත්තහුගේ පරිජිඇවැත් අවදනා අතැ-වැසියෙක් දක්නා ලද්දේ වෙයි. හේ මෙනම් ඇත්තහුගේ අන් අතැවැසි පැවිද්දකු දක 'මා විසින් මෙනම් ඇත්තහුගේ (පරිජිඇවැත් අවදනා) අතැවැසි තෙම දක්නා ලද. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි ... චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**සේනාසන ලේස** නම්: මෙනම් ඇත්තහුගේ සෙනසුන් වැසි වූ පරිජි-ඇවැත් අවදනා මහණෙක් දක්නා ලද වෙයි. මෙනම් ඇත්තහුගේ සෙනසුන් වැසි අන් මහණෙක්හු දක 'මා විසින් මෙනම් ඇත්තහුගේ සෙනසුන් වැසි (පරිජිඇවැත් අවදනා) මහණ දක්නා ලද. (තෝ) පරිජිඇවැත් අවන්නෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි. තා සමග උපෝසථයෙක් හෝ පවාරණ-යෙක් හෝ සඞ්ඝකර්මයෙක් හෝ නැතැ'යි චෝදනා කෙරේ නම් තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**පාරාජිකෙන ධම්මෙන** යනු: සතර පරිජි අතුරෙන් එක්තරයෙකින්.

**අනුද්ධංසෙය්‍ය** යනු: චොදනා කෙරෙයි හෝ චෝදනා කරවා හෝ

**අප්පෙවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යං** යනු: භික්ෂු භාවයෙන් ගළවන්නෙම් නම්, ශ්‍රමණධර්මයෙන් ගළවන්නෙම් නම් ශීලස්කන්ධයෙන් ගළවන්නෙම් නම්.

**තතො අපරෙන සමයෙන** යනු: යම් ඇසිල්ලෙක්හි චෝදනා කරණ ලද වේ ද ඒ ඇසිල්ල, ඒ ලය, මොහොත, ඉක්මැගිය කල්හි.

**සමනුග්ගාහියමානො** යනු: යම් පාරාජික වස්තුයෙකින් චෝදනා කරණ ලද්දේ වේ ද ඒ වස්තුයෙහි විචාරනු ලබන්නේ.

**අසමනුග්ගාහියමානො** යනු: කිසි වස්තුයෙකින් නො කියනු ලබන්නේ

**අධිකරණ** නම්: අධිකරණ සතරෙකි: විවාදධිකරණ ය, අනුවාදධි-කරණ ය, ආපත්තාධිකරණ ය, කිච්චාධිකරණ යි.

**කොචි දෙසො ලෙසමත්තො උපාදින්නො** යනු: ඒ ලේශයන් අතුරෙන් එක්තරා ලේශයෙක් ගන්නා ලද්දේ වේ.

**භික්ඛු ච දොසං පතිට්ඨාතීති** තුච්ඡකං මයා භණිතං, මුසා මයා භණිතං, අභූතං මයා භණිතං, අජානන්තෙන මයා භණිතං.

**සඞ්ඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

5. භික්ඛු සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති, සඞ්ඝාදිසෙසෙ සඞ්ඝාදිසෙසදිට්ඨී හොති, තඤ්චෙ පාරාජිකෙන චොදෙති: අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වාති, එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

6. භික්ඛු සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති, සඞ්ඝාදිසෙසෙ ථුල්ලච්චයදිට්ඨී හොති -පෙ- පාචිත්තියදිට්ඨී හොති -පෙ- පාටිදෙසනීයදිට්ඨී හොති -පෙ- දුක්කටදිට්ඨී හොති -පෙ- දුබ්භාසිතදිට්ඨී හොති තඤ්චෙ පාරාජිකෙන චොදෙති: අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

7. භික්ඛු ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති, දුබ්භාසිතෙ දුබ්භාසිතදිට්ඨී හොති, තඤ්චෙ පාරාජිකෙන චොදෙති: අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ- එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

8. භික්ඛු දුබ්භාසිතං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති, දුබ්භාසිතෙ සඞ්ඝාදිසෙසදිට්ඨී හොති -පෙ- දුබ්භාසිතෙ ථුල්ලච්චයපාචිත්තියපාටිදෙසනීයදුක්කට දිට්ඨී හොති. තඤ්චෙ පාරාජිකෙන චොදෙති: අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වාති, එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**එකෙකං මූලං කාතූන චක්කං බන්ධිතබ්බං**

9. භික්ඛු සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති, සඞ්ඝාදිසෙසෙ සඞ්ඝාදිසෙසදිට්ඨී හොති. තඤ්චෙ පාරාජිකෙන චොදාපෙති: "අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා"ති. එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

**භික්ඛු ච දෝසං පතිට්ඨාති** යනු: සික්ඛයෙක් මා විසින් කියන ලද යැ, මුසාවාදයෙක් මා විසින් කියන ලද යැ, අභූතයෙක් මා විසින් කියන ලද යැ, මා නො දත්තහු විසින් කියන ලදී.

**සඞ්ඝාදිසෙසො** යනු: ... එයිනුදු කියනු ලැබෙයි 'සඞ්ඝාදිසෙසො'යි

5. (චොදක මහණ විසින්) සඟවෙසෙස් අවදනා මහණ තෙම දක්නා ලද්දේ වෙයි. සඟවෙසෙස්හි සඟවෙසෙස් ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි, තා සමග උපොසථයෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝකර්මයෙක් හෝ නැතැ'යි පරිජ්ඇවැතින් චොදනා කෙරේ නම් මෙසේත් ආපත්ති—අන්‍යභාගිය ද වෙයි, ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි. තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

6. සඟවෙසෙස් අවදනා මහණෙක් දක්නා ලද්දේ වෙයි. සඟවෙසෙස්හි තුලැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... පචිති ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... පිළිදෙස්නි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුකුළා ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුබැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි අශාක්‍යපුත්‍රියයෙහි ... 'යි පරිජ්ඇවැතින් චොදනා කෙරේ නම් මෙසේත් ආපත්ති—අන්‍යභාගිය ද වෙයි. ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි. තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

7. මහණ තෙම තුලැසි...පචිති...පිළිදෙස්නි ... දුකුළා ... දුබැසි ඇවැත් අවදනේ දක්නා ලද වෙයි. දුබැසියෙහි දුබැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි, .... 'යි පරිජ්ඇවැතින් චොදනා කෙරේ නම් මෙසේත් ආපත්ති—අන්‍යභාගිය ද වෙයි. ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි. තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

8. මහණ තෙම දුබැසිඇවැත් අවදනේ දක්නා ලද වෙයි. දුබැසියෙහි සඟවෙසෙස් ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුබැසියෙහි තුලැසි පචිති පිළිදෙස්නි දුකුළා ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි, තා සමග උපොසථයෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝකර්මයෙක් හෝ නැතැ'යි පරිජ්ඇවැතින් චොදනා කෙරේ නම් මෙසේත් ආපත්ති—අන්‍යභාගිය වෙයි. ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි. තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

**එකක් එක්ක් මුල් කොටගෙණ චක්‍රය බැන්ද යුතු.**

9. මහණ තෙම සඟවෙසෙස්ඇවැත් අවදනේ දක්නා ලද වෙයි. සඟවෙසෙස්හි සඟවෙසෙස් ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි, තා සමග උපොසථයෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝකර්මයෙක් හෝ නැතැ'යි පරිජ්ඇවැතින් චොදනා කරවා නම් මෙසේත් ආපත්ති-අන්‍යභාගිය ද වෙයි. ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි. තෙපුලෙහි තෙපුලෙහි සඟවෙසෙස්ඇවැත් වේ.

10. භික්ඛු සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති, සඞ්ඝාදිසෙසෙ ථුල්ලච්චයදිට්ඨි හොති -පෙ- පාචිත්තියදිට්ඨි හොති -පෙ- පාටිදෙසනීයදිට්ඨි හොති -පෙ- දුක්කටදිට්ඨි හොති -පෙ- දුබ්භාසිතදිට්ඨි හොති -පෙ- තඤ්චෙ පාරාජිකෙන චොදාපෙති: "අස්සමණොසි, අසක්‍යපුත්තියොසි -පෙ-" එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

11. භික්ඛු ථුල්ලච්චයං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති, ථුල්ලච්චයෙ ථුල්ලච්චයදිට්ඨි හොති -පෙ- ථුල්ලච්චයෙ පාචිත්තියදිට්ඨි හොති -පෙ- පාටිදෙසනීයදිට්ඨි හොති -පෙ- දුක්කටදිට්ඨි හොති -පෙ- දුබ්භාසිතදිට්ඨි හොති, සඞ්ඝාදිසෙසදිට්ඨි හොති. තඤ්චෙ පාරාජිකෙන චොදාපෙති: "අස්සමණොසි, අසක්‍යපුත්තියොසි" -පෙ- එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

12. භික්ඛු පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති දුබ්භාසිතෙ දුබ්භාසිතදිට්ඨි හොති -පෙ- දුබ්භාසිතෙ සඞ්ඝාදිසෙසදිට්ඨි හොති -පෙ- ථුල්ලච්චයදිට්ඨි හොති -පෙ- පාචිත්තියදිට්ඨි හොති -පෙ- පාටිදෙසනීයදිට්ඨි හොති -පෙ- දුක්කටදිට්ඨි හොති, තඤ්චෙ පාරාජිකෙන චොදාපෙති: "අස්සමණො'සි, අසක්‍යපුත්තියො'සි, නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා සඞ්ඝකම්මං වා'ති. එවම්පි ආපත්තඤ්ඤභාගියං හොති, ලෙසො ච උපාදින්නො, ආපත්ති වාචාය වාචාය සඞ්ඝාදිසෙසස්ස.

13. අනාපත්ති තථාසඤ්ඤී චොදෙති වා චොදාපෙති වා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**දුතියදුට්ඨදොසසික්ඛාපදං නිට්ඨිතං.**

10. මහණ තෙම සඞ්ඝවෙසෙස්ඇවැත් අවදතෝ දක්නා ලද වෙයි. සඞ්ඝ-වෙසෙස්හි තුල්ලැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... පචිති ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි .... පිළිදෙස්නි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි .... දුකුළා ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුබැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි .... 'යි පරිජ්ඇවැතින් චොදනා කරවා නම් මෙසේත් ආපත්ති—අන්‍යභාගිය ද වෙයි. ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි. තෙපුලෙහි තෙපුලෙහි සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

11. මහණ තෙම තුල්ලැසිඇවැත් අවදතෝ දක්නා ලද වෙයි. තුල්ලැසියෙහි තුල්ලැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... තුල්ලැසියෙහි පචිති ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි .... පිළිදෙස්නි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුකුළා ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුබැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... සඞ්ඝවෙසෙස් ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි ... 'යි පරිජ්ඇවැතින් චොදනා කරවා නම්, මෙසේත් ආපත්ති—අන්‍යභාගිය ද වෙයි, ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි. තෙපුලෙහි තෙපුලෙහි සඞ්ඝවෙසෙස්-ඇවැත් වේ.

12. මහණ තෙම පචිති ... පිළිදෙස්නි ... දුකුළා .... දුබැසි ඇවැත් අවදතෝ දක්නා ලද වෙයි. දුබැසියෙහි දුබැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුබැසියෙහි සඞ්ඝවෙසෙස් ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... තුල්ලැසි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... පචිති ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... පිළිදෙස්නි ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි ... දුකුළා ය යන දෘෂ්ටි ඇත්තේ වෙයි. ඉදින් ඔහුට 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රියයෙහි, තා සමග උපොසථයෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝකර්මයෙක් හෝ නැතැ'යි පරිජ්ඇවැතින් චොදනා කරවා නම්, මෙසේත් ආපත්ති—අන්‍යභාගිය ද වෙයි, ලෙශයෙක් ද ගන්නා ලද්දේ වෙයි, තෙපුලෙහි තෙපුලෙහි සඞ්ඝවෙසෙස්ඇවැත් වේ.

13. එබදු සංඥා ඇත්තේ චොදනා කෙරෙයි හෝ චොදනා කරවයි හෝ ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැත්තේ යි.

**දුතියදුට්ඨදෝස ශික්‍ෂාපදය නිමි.**

# 3. 10

## පඨමසඞ්ඝභෙදසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො දෙවදත්තො යෙන කොකාලිකො කටමොරකතිස්සකො ඛණ්ඩදෙවියා පුත්තො සමුද්දදත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා කොකාලිකං කටමොරකතිස්සකං ඛණ්ඩදෙවියා පුත්තං සමුද්දදත්තං එතදවොච: "එථ මයං ආවුසො සමණස්ස ගොතමස්ස සඞ්ඝභෙදං කරිස්සාම චක්කභෙදන්ති". එවං වුත්තෙ කොකාලිකො දෙවදත්තං එතදවොච: "සමණො ඛො ආවුසො ගොතමො මහිද්ධිකො මහානුභාවො. කථං මයං සමණස්ස ගොතමස්ස සඞ්ඝභෙදං කරිස්සාම චක්කභෙදන්ති". එථ මයං ආවුසො සමණං ගොතමං උපසඞ්කමිත්වා පඤ්ච වත්ථූනි යාචිස්සාම: "භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණවාදී". ඉමානි භන්තෙ පඤ්ච වත්ථූනි අනෙකපරියායෙන අප්පිච්ඡතාය සන්තුට්ඨිතාය සල්ලෙඛාය ධුතතාය පාසාදිකතාය අපචයාය විරියාරම්භාය සංවත්තන්තීති:

"සාධු භන්තෙ භික්ඛූ යාවජීවං ආරඤ්ඤිකා අස්සු, යො ගාමන්තං ඔසරෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං පිණ්ඩපාතිකා අස්සු, යො නිමන්තනං සාදියෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං පංසුකූලිකා අස්සු, යො ගහපතිචීවරං සාදියෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං රුක්ඛමූලිකා අස්සු, යො ඡන්නං උපගච්ඡෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය.

යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං, යො මච්ඡමංසං ඛාදෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍යා"ති.

ඉමානි සමණො ගොතමො නානුජානිස්සති. තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි ජනං සඤ්ඤාපෙස්සාමාති. සක්කා ඛො ආවුසො ඉමෙහි පඤ්චහි වත්ථූහි සමණස්ස ගොතමස්ස සඞ්ඝභෙදො කාතුං චක්කභෙදො. ලූඛප්පසන්නා හි ආවුසො මනුස්සා"ති.

2. අථ ඛො දෙවදත්තො සපරිසො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො දෙවදත්තො භගවන්තං එතදවොච: "භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණවාදී. ඉමානි භන්තෙ පඤ්ච වත්ථූනි අනෙකපරියායෙන අප්පිච්ඡතාය සන්තුට්ඨිතාය සල්ලෙඛාය ධුතතාය පාසාදිකතාය අපචයාය විරියාරම්භාය සංවත්තන්ති.

# 3. 10.

## ප්‍රථමසඞ්ඝභෙදශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර කලන්දකනිවාප නම් වූ වේළුවනයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි දෙව්දත් තෙම කටමෝරකතිස්සක නම් කොකාලික යම් තැනෙක්හි ද ඛණ්ඩදෙවියගේ පුත් සමුද්දදත්ත යම් තැනෙක්හි ද එතැන්හි එළඹ කටමෝරකතිස්සක කොකාලිකට ද ඛණ්ඩදෙවියගේ පුත් සමුද්දදත්තට ද මෙසේ කී ය: "එව ඇවැත්නි, අපි මහණ ගොයුම්හට සඞ්ඝභෙදය කරම්හ. චක්‍රභෙදය කරම්හ" යි. මෙසේ කී කල්හි කොකාලික දෙව්දත්හට මේ කී ය: ඇවැත්නි, මහණ ගොයුම්හු මහත් සෘද්ධි ඇත්තාහ, මහත් අනුභාව ඇත්තාහ. කිසෙයින් අපි මහණ ගොයුම්හට සඞ්ඝභෙද කරමෝ ද චක්‍රභෙද කරමෝ දැ?යි. එව ඇවැත්නි, අපි මහණ ගොයුම්හු කරා එළඹ පඤ්චවස්තූන් ඉල්ලා සිටුම්හ: ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ, නොයෙක් අයුරින් අල්පේච්ඡ බව, සන්තුෂ්ට බව, සල්ලේඛය, ධූතගුණය, ප්‍රසාද එළවන බව, අපචය, වීර්‍ය්‍යාරම්භය පිළිබඳ ගුණ කියන සුල්ලහ. ස්වාමීනි, මේ පඤ්චවස්තූහු අල්පේච්ඡ බවට සන්තුෂ්ටියට සල්ලේඛයට ධූතගුණයට ප්‍රසාද එළවන බවට අපචයට වීර්‍ය්‍යාරම්භයට වැටෙත්.

"ස්වාමීනි, භික්ෂූහු යාවජ්ජීවයෙන් ආරණ්‍යක වන්නාහු නම් මැනව. යමෙක් ග්‍රාමාන්තයට වදනේ නම් වරද ඔහු පහස්නේ ය.

යාවජ්ජීවයෙන් පිණ්ඩපාතික වන්නාහු නම් මැනව. යමෙක් නිමන්ත්‍රණ ඉවසා නම් වරද ඔහු පහස්නේ ය.

යාවජ්ජීවයෙන් පාංශුකූලික වන්නාහු නම් මැනව. යමෙක් ගැහැවි-සිවුරු ඉවසා නම් වරද ඔහු පහස්නේ ය.

යාවජ්ජීවයෙන් වෘක්ෂමූලික වන්නාහු නම් මැනව. යමෙක් සෙවනකට එළඹේ නම් වරද ඔහු පහස්නේ ය.

යාවජ්ජීවයෙන් මත්ස්‍යමාංශ නො වළඳන්නාහු නම් මැනව. යමෙක් මත්ස්‍යමාංශ වළඳා නම් වරද ඔහු පහස්නේ යි.

මේ වස්තූන් ශ්‍රමණ ගෞතමයෝ නො අනුදන්නාහ. අපි මේ වස්තූන් කරණ කොටගෙණ ජනයා දන්වාලම්හ"යි. ඇවැත්නි, මේ පඤ්චවස්තූන් කරණ කොටගෙණ මහණ ගොයුම්හට සඞ්ඝභෙද කරන්නට චක්‍රභෙද කරන්නට හැකියා. ඇවැත්නි, යම් හෙයකින් මනුෂ්‍යයෝ රූක්ෂප්‍රසන්නයෝ ද එහෙයිනැ"යි.

2. ඉක්බිති දෙව්දත් තෙම පිරිස් සහිත වූයේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට එකත්පස් ව හිඳගත. එකත්පස් ව හුන් දෙව්දත් භාග්‍යවතුන් වහන්සේට මෙපවත් කී ය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් අයුරින් අල්පේච්ඡ බව සන්තුෂ්ට බව සල්ලේඛය ධූතගුණය ප්‍රසාදික බව අපචය වීර්‍ය්‍යාරම්භය පිළිබඳ ගුණ කියන සුල්ලහ. ස්වාමීනි, මේ පඤ්චවස්තූහු නොයෙක් අයුරින් අල්පේච්ඡ බවට සන්තුෂ්ටියට සල්ලේඛයට ධූතයට ප්‍රසාදික ගුණයට අපචයට වීර්‍ය්‍යාරම්භයට වැටෙත්.

"සාධු භන්තෙ භික්ඛූ යාවජීවං ආරඤ්ඤකා අස්සු, යො ගාමන්තං ඔසරෙය්‍ය, වජ්ජං නං ඵුසෙය්‍ය. යාවජීවං පිණ්ඩපාතිකා අස්සු, යො නිමන්තනං සාදියෙය්‍ය, වජ්ජං නං ඵුසෙය්‍ය. යාවජීවං පංසුකූලිකා අස්සු, යො ගහපතිචීවරං සාදියෙය්‍ය, වජ්ජං නං ඵුසෙය්‍ය. යාවජීවං රුක්ඛමූලිකා අස්සු, යො ඡන්නං උපගච්ඡෙය්‍ය, වජ්ජං නං ඵුසෙය්‍ය. යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං, යො මච්ඡමංසං ඛාදෙය්‍ය, වජ්ජං නං ඵුසෙය්‍යා"ති. "අලං දෙවදත්ත, යො ඉච්ඡති ආරඤ්ඤකො හොතු, යො ඉච්ඡති ගාමන්තෙ විහරතු, යො ඉච්ඡති පිණ්ඩපාතිකො හොතු, යො ඉච්ඡති නිමන්තනං සාදියතු, යො ඉච්ඡති පංසුකූලිකො හොතු, යො ඉච්ඡති ගහපතිචීවරං සාදියතු. අට්ඨමාසෙ ඛො මයා දෙවදත්ත, රුක්ඛමූලසෙනාසනං අනුඤ්ඤාතං, තිකොටිපරිසුද්ධං මච්ඡමංසං අදිට්ඨං අසුතං අපරිසඞ්කිතන්ති. අථ ඛො දෙවදත්තො න භගවා ඉමානි පඤ්ච වත්ථූනි අනුජානාතීති හට්ඨො උදග්ගො සපරිසො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

3. අථ ඛො දෙවදත්තො රාජගහං පවිසිත්වා පඤ්චහි වත්ථූහි ජනං සඤ්ඤාපෙසි: "මයං ආවුසො සමණං ගොතමං උපසඞ්කමිත්වා පඤ්චවත්ථූනි යාචිම්හ: භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස -පෙ- යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං, යො මච්ඡමංසං ඛාදෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍යා"ති. ඉමානි සමණො ගොතමො නානුජානාති. තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි [1]සමාදාය වත්තාමා"ති. තත්‍ථ යෙ තෙ මනුස්සා අස්සද්ධා අප්පසන්නා දුබ්බුද්ධිනො, තෙ එවමාහංසු: "ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා ධුතා සල්ලෙඛවුත්තිනො, සමණො පන ගොතමො බාහුලිකො බාහුල්ලාය චෙතෙතී"ති. යෙ පන තෙ මනුස්සා සද්ධා පසන්නා පණ්ඩිතා බුද්ධිමන්තො තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම දෙවදත්තො භගවතො සඞ්ඝභෙදාය පරක්කමිස්සති චක්කභෙදායා"ති.

4. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම දෙවදත්තො භගවතො සඞ්ඝභෙදාය පරක්කමිස්සති චක්කභෙදායා"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර ත්වං දෙවදත්ත සඞ්ඝභෙදාය පරක්කමසි චක්කභෙදායා"ති. "සච්චං භගවා" විගරහි බුද්ධො භගවා: කථං හි නාම ත්වං මොඝපුරිස සඞ්ඝභෙදාය පරක්කමිස්සසි චක්කභෙදාය. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

1. "පඤ්චවත්ථූනීති" වචනමත්තම්පි "ඉධ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි" ජනං සඤ්ඤාපෙස්සාමාති අභිණ්හපරිචිතකථාවසෙන වුත්තන්ති. ස. පාසාදිකා.

"ස්වාමීනි, භික්ෂූහු යාවජ්ජීවයෙන් ආරණ්‍යක වන්නාහු නම් මැනව. යමෙක් ග්‍රාමාන්තයට බස්නේ නම් වරද ඔහු පහස්නේ ය. යාවජ්ජීවයෙන් පිණ්ඩපාතික වන්නාහු නම් මැනව. යමෙක් නිමන්ත්‍රණ ඉවසා නම් වරද ඔහු පහස්නේ ය. යාවජ්ජීවයෙන් පාංශුකූලික වන්නාහු නම් මැනව. යමෙක් ගෘහපතිචීවර ඉවසා නම් වරද ඔහු පහස්නේ ය. යාවජ්ජීවයෙන් වෘක්ෂමූලික වන්නාහු නම් මැනව. යමෙක් සෙවනට එළඹේ නම් වරද ඔහු පහස්නේ ය. යාවජ්ජීවයෙන් මත්ස්‍යමාංශ නො වළඳන්නාහු නම් මැනව. යමෙක් මත්ස්‍යමාංශ වළඳා නම් වරද ඔහු පහස්නේ ය'යි. "කම් නැත දෙවදත්තය, යමෙක් රිසියේ නම් ආරණ්‍යක වේවා, යමෙක් රිසියේ නම් ග්‍රාමාන්තයෙහි වාසය කෙරේවා. යමෙක් රිසියේ නම් පිණ්ඩපාතික වේවා. යමෙක් රිසියේ නම් නිමන්ත්‍රණ ඉවසාවා. යමෙක් රිසියේ නම් පාංශුකූලික වේවා. යමෙක් රිසියේ නම් ගෘහපතිසිවුරු ඉවසාවා. දෙවදත්තය, මා විසින් අටමසෙක්හි ම රුක්මුල් සෙනසුන අනුදන්නා ලද (තමා පිණිස) මරණු නො දක්නා ලද නොඅසන ලද සැක නොකරණ ලද ත්‍රිකොටිපරිශුද්ධ වූ මත්ස්‍යමාංශය අනුදන්නා ලදැ"යි. එකල්හි දෙව්දත් භාග්‍යවතුන් වහන්සේ මේ පස්වවස්තූන් නො අනුදන්නාහ'යි. සතුටු වූයේ ඔදවැඩියේ පිරිස් සහිත ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේට අභිවාදන කොට පැදකුණු කොට නික්ම ගියේ ය.

3. ඉක්බිති දෙව්දත් තෙම රජගහනුවර වැද පස්වවස්තුයෙන් ජනයා හඟවාලී ය: "ඇවැත්නි, අපි මහණගොයුම්හු කරා එළඹ පස්වවස්තූන් අයැදිම්හ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් අල්පෙච්ඡ බව පිළිබඳ ... යාවජ්ජීවයෙන් මත්ස්‍යමාංශ නොවළඳන්නාහු නම් මැනව. යමෙක් මත්ස්‍යමාංශ වළඳා නම් වරද ඔහු පහස්නේ ය'යි. ශ්‍රමණගෞතමයෝ මේ වස්තූන් නො අනුදනිති. අපි මේ පස්වවස්තූන් සමාදන් ව වැසෙම්හ'යි. එහි යම් මිනිස් කෙනෙක් ශ්‍රද්ධා නැත්තාහු නො පහන් වූවාහු දුර්බුද්ධි වූවාහු ද ඔහු මෙසේ කීහු: මේ ශ්‍රමණශාක්‍යපුත්‍රියයෝ ධූතගුණ ඇත්තාහ. කෙලෙස් තවන පැවැතුම් ඇත්තාහ. මහණ ගොයුම්හු වැළින් බාහුලික පැවැතුම් ඇත්තාහු බහුලභාවයට සිතන්නාහ'යි. යම් මිනිස් කෙනෙක් සැදැහැ ඇත්තාහු ප්‍රසන්න වූවාහු පණ්ඩිත වූවාහු බුද්ධිමත් වූවාහු වෙත් නම් ඔහු අවමන් කෙරෙති, නුගුණ කියති. දොස් පහළ කෙරෙති. කිසෙයිත් නම් දෙව්දත් භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ සඞ්ඝභෙදයට චක්‍රභෙදයට උත්සාහ කරන්නේ දැ'යි.

4. භික්ෂූහු අවමන් කරණ, නුගුණ කියන, දොස් පහළ කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. අල්පෙච්ඡ වූ යම් භික්ෂු කෙනෙක් වෙත් නම් ඔහු "කෙසේ නම් දෙව්දත් භාග්‍යවතුන් වහන්සේට සඞ්ඝභෙදය පිණිස චක්‍රභෙදය පිණිස උත්සාහ කරන්නේදැ'යි අවමන් කෙරෙති, නුගුණ කියති, දොස් පහළ කෙරෙති. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ ... "සැබවෙක් ද, දේවදත්තය, තෝ සඞ්ඝභෙදය පිණිස චක්‍රභෙදය පිණිස වෑයම් කෙරෙහි දැ" යි. 'සැබව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු වෙසෙසින් ගර්හා කළහ: කෙසේ නම් තෝ, තුච්ඡපුරුෂය, සඞ්ඝභෙදය පිණිස චක්‍රභෙදය පිණිස වෑයම් කෙළෙහි ද? තුච්ඡපුරුෂය, නෙල අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... තවද මහණෙනි, මේ ශික්ෂාපදය මෙසේ උදෙසවූ:

"යො පන භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමෙය්‍ය, භෙදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො: 'මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි, භෙදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි, සමෙතායස්මා සඞ්ඝෙන, සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී'ති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය,[1] ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, සඞ්ඝාදිසෙසො"ති.

5. යො පනාති යො යාදිසො -පෙ-

භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

සමග්ගො නාම සඞ්ඝො: සමානසංවාසකො සමානසීමායං ඨිතො.

භෙදාය පරක්කමෙය්‍යාති 'කථං ඉමෙ නානා අස්සු විනා අස්සු වග්ගා අස්සූ'ති පක්ඛං පරියෙසති, ගණං බන්ධති.

භෙදනසංවත්තනිකං වා අධිකරණන්ති අට්ඨාරසභෙදකරවත්ථූනි.

සමාදායාති ආදාය.

පග්ගය්හාති දීපෙය්‍ය.

තිට්ඨෙය්‍යාති න පටිනිස්සජ්ජෙය්‍ය.

සො භික්ඛූති යො සො සඞ්ඝභෙදකො භික්ඛු.

භික්ඛූහීති අඤ්ඤෙහි භික්ඛූහි.

යෙ පස්සන්ති යෙ සුණන්ති තෙහි වත්තබ්බො: "මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි, භෙදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි, සමෙතායස්මා සඞ්ඝෙන, සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී"ති. දුතියම්පි වත්තබ්බො. තතියම්පි වත්තබ්බො. සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජති, ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති, ආපත්ති දුක්කටස්ස.

1. පටිනිස්සජෙය්‍ය - ඡ.සං.

“යම් මහණෙක් සමග සඞ්ඝයාගේ භෙදය පිණිස යත්න කෙරේ නම් භෙදය පිණිස පවත්නා භෙදකරවස්තුවක් හෝ ගෙණ දැඩි ව ගෙණ සිටි නම් ඒ මහණ තෙම (සෙසු ලජ්ජී මහණුන් විසින් මෙසේ කියයුතු වන්නේ ය: “ආයුෂ්මත්නි, සමග සඞ්ඝයාගේ භෙදය පිණිස නහමක් යත්න කර, භෙදය පිණිස පවත්නා භෙදකරවස්තුවක් හෝ ගෙණ දැඩි ව ගෙණ නහමක් සිටුව, ආයුෂ්මත් තෙම සඞ්ඝයා හා සමග එක් වේවා, යම් හෙයකින් සඞ්ඝ තෙමේ සමග වූයේ ඔවුනොවුන් හා සතුටු වූයේ විරුද්ධවාද රහිත වූයේ සමාන උද්දෙශ ඇත්තේ සුවසේ වෙසේද එහෙයිනි. මෙසේත් ඒ මහණ භික්ෂූන් විසින් කියනු ලබන්නේ එසේ ම දැඩිව ගෙණ සිටි නම් ඒ මහණ තෙම භික්ෂූන් විසින් ඒ අධි-කරණයාගේ දුරලීම පිණිස තෙවනවට දක්වා සමනුභාසන කම් කළ යුත්තේ ය, ඉදින් තෙවනවට දක්වා සමනුභාසන කම් කරණු ලබන්නේ ඒ අධිකරණය දුරලා නම් මේ දුරලීම මැනැවි. ඉදින් නොදුරලා නම් සඟවෙසෙස් වේ” ය යි.

**5.** **යො පන** යනු: යමෙක් යම්බදු වූයෙක් ... **භික්ඛු** යනු ... මේ තෙම මේ අර්ථයෙහි ‘භික්ඛු’ යි අදහස් කරණ ලදී.

**සමග්ගො සඞ්ඝො** නාම: සමාන සංවාසක වූයේ සමාන සීමායෙහි සිටියේ යි.

**භෙදාය පරක්කමෙය්‍ය** යනු: කෙසේ නම් මොහු විවිධ වන්නාහු ද වෙන් වන්නාහු ද වර්ග වන්නාහු දැ යි පක්‍ෂයක් සොයයි ගණයා බඳියි.

**භෙදනසංවත්තනිකං වා අධිකරණං** යනු: අටළොස් භේදකර-වස්තූහු යි.

**සමාදාය** යනු: ගෙණ.

**පග්ගය්හ** යනු: දක්වන්නේ ය.

**තිට්ඨෙය්‍ය** යනු: නො දුර ලන්නේ ය.

**සො භික්ඛු** යනු යමෙක් සඞ්ඝභෙදක වේ නම් ඒ මහණ.

**භික්ඛූහි** යනු: අන්‍යභික්ෂූන් විසින්.

යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් මෙසේ කියයුත්තේ ය: ආයුෂ්මත්නි, සමග සඞ්ඝයාගේ භෙදය පිණිස නහමක් යත්න කර, භෙදය පිණිස පවත්නා භෙදකර වස්තුවක් හෝ ගෙණ දක්වා ගෙණ නහමක් සිට, ආයුෂ්මත් තෙම සඞ්ඝයා හා එක් වේවා, යම් හෙයකින් සඞ්ඝ තෙමේ සමග වූයේ සතුටු වූයේ විවාද රහිත වූයේ සමාන උද්දෙශ ඇත්තේ සුවසේ වෙසේ ද එහෙයිනි. දෙවනවට ද කියයුත්තේ ය. තෙවනවට ද කියයුත්තේ ය. ඉදින් හැරපියා නම් මෙසේ මේ හැරපීම මැනැවි. ඉදින් නො හැරපියා නම් දුකුළාආවැත් වෙයි. අසා නො කියත් නම් දුකුළා-ඇවැත් වෙයි.

සො භික්ඛු සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බො: "මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි, භෙදනවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි, සමෙතායස්මා සඞ්ඝෙන, සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී"ති දුතියම්පි වත්තබ්බො තතියම්පි වත්තබ්බො. සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජති, ආපත්ති දුක්කටස්ස, සො භික්ඛු භික්ඛූහි[1] සමනුභාසිතබ්බො. එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බො, ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදමි -පෙ-

තතියම්පි එතමත්ථං වදමි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමති. සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සමනුභට්ඨො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තස්ස ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති.

සඞ්ඝාදිසෙසොති -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

6. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකො න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

7. අනාපත්ති අසමනුභාසන්තස්ස, පටිනිස්සජ්ජන්තස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පඨමසඞ්ඝභෙදසික්ඛාපදං නිට්ඨිතං.**

---

1. ම.ඡ.සං. න දිස්සතෙ

ඒ මහණ තෙම සඟමැදට ද ඇද කිය යුත්තේ ය: ආයුෂ්මත්නි, සමගි සඞ්ඝයාගේ භේදය පිණිස තනමක් යතන කර, භේදය පිණිස පවත්නා භේදකරවස්තුවක් හෝ ගෙණ දක්වාගෙණ තහමක් සිට, ආයුෂ්මත් තෙම සඞ්ඝයා හා එක් වේවා, යම් හෙයකින් සඞ්ඝ තෙමේ සමගි වූයේ සතුටු වනුයේ විවාද රහිත වූයේ සමාන උද්දේශ ඇත්තේ සුවසේ වෙසේ ද එහෙයිනි. ඉදින් හැරපියා නම් මෙසේ මේ හැරපීම මැනවි. ඉදින් නො හැරපියා නම් දුකුළාඇවැත් වෙයි. ඒ මහණ සෙසු භික්ෂූන් විසින් සමනුභාසන කම් කළයුත්තේ ය. නවද මහණෙනි, මෙසේ සමනුභාසන කම් කළ යුත්තේ ය. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ ඥපනය කළ යුත්තේ ය:

''වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා, මේ මෙනම් මහණ තෙම සමගි සඞ්ඝයාගේ බිඳීම පිණිස යතන කෙරෙයි. හෙතෙම ඒ භේදකරවස්තුව නො හැර පියයි. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහු ඒ වස්තුහුගේ දුරලීම පිණිස සමනුභාසනය කරන්නේ ය. මේ 'ඥත්ති' යැ.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම සමගි සඞ්ඝයාගේ භේදය පිණිස යතන කෙරෙයි. හෙතෙම ඒ භේදකරවස්තුව නො හැරපියයි. සඞ්ඝ තෙමේ ඒ වස්තුහුගේ හැරපීම පිණිස මෙනම් මහණහු සමනුභාසනය කෙරෙයි. ඒ වස්තුහුගේ හැරපීම පිණිස මෙනම් මහණහට සමනුභාසනය යම් ආයුෂ්මතක්හට රුස්නේ නම් හෙතෙම තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රුස්නේ නම් හේ බණන්නේ ය.

දෙවනවට ද මෙ කරුණ කියමි ...

තෙවනවට ද මෙ කරුණ කියමි: වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම සමගි සඞ්ඝයාගේ භේදය පිණිස යතන කෙරෙයි. හෙතෙම ඒ භෙදකරවස්තුව නො හැරපියයි. සඞ්ඝ තෙමේ ඒ වස්තුහුගේ හැරපීම පිණිස මෙනම් මහණහු සමනුභාසන කෙරෙයි. ඒ වස්තුහු ගේ හැරපීම පිණිස මෙනම් මහණහට සමනුභාසනය යම් ආයුෂ්මතක්හට රුස්නේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රුස්නේ නම් හේ බණන්නේ ය.

සඞ්ඝයා විසින් ඒ වස්තුහුගේ හැරපීම පිණිස මෙනම් මහණ තෙම සමනුභාසන කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුස්නේ වෙයි. එහෙයින් තුෂ්ණීම්භූත ය. මෙසේ තෙල තුෂ්ණීම්භාවය ධරමි'' යි.

ඥත්තියෙන් දුකුළා වෙයි. දෙ කම්වදනකින් දෙ තුලැසියෙක් වෙයි. කම්වදන් අවසන්හි සඟවෙසෙස්ඇවැත් වේ. සඟවෙසෙස් අවදනාහට ඥත්තියෙන් වූ දුකුළාව ද දෙ කම්වදනින් වූ දෙ තුලැසි ද නවතිත්.

**සඞ්ඝාදිසෙසො** යනු: ... එයිනුදු 'සඞ්ඝාදිසෙස'යි කියනු ලැබේ.

6. ධම්කම්යෙහි ධම්කම් ය යන සංඥ ඇත්තේ නො හැරපියා නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. ධම්කම්යෙහි වෙමතික වූයේ නො හැරපියා නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. ධම්කම්යෙහි අධම්කම් ය යන සංඥ ඇත්තේ නො හැරපියා නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. අධම්කම්යෙහි ධම්කම් ය යන සංඥ ඇත්තේ දුකුළාඇවැත් වෙයි. අධම්කම්යෙහි විමති ඇත්තේ දුකුළාඇවැත් වෙයි. අධම්කම්යෙහි අධම්කම් ය යන සංඥ ඇත්තේ දුකුළාඇවැත් වේ.

7. සමනුභාසන නො කරන්නහුට, හැරපියන්නහුට, උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැත.

**ප්‍රථම සඞ්ඝභෙද ශික්ෂාපදය නිමි.**

# 3. 11.

## දුතියසඞ්ඝභෙදසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන **දෙවදත්තො** සඞ්ඝභෙදාය පරක්කමති චක්කභෙදාය. භික්ඛූ එවමාහංසු: අධම්මවාදී දෙවදත්තො, අවිනයවාදී දෙවදත්තො. කථං හි නාම දෙවදත්තො සඞ්ඝභෙදාය පරක්කමිස්සති චක්කභෙදායාති. එවං වුත්තෙ **කොකාලිකො** ච[1] කටමොරකතිස්සකො ඛණ්ඩදෙවියා පුත්තො **සමුද්දදත්තො** ච[1] තෙ භික්ඛූ [2]එතදවොචුං. මා ආයස්මන්තො එවං අවචුත්ථ: ධම්මවාදී දෙවදත්තො, විනයවාදී දෙවදත්තො, අම්හාකඤ්ච දෙවදත්තො ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වොහරති, ජානාති. නො භාසති, අම්හාකම්පෙතං ඛමතීති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ දෙවදත්තස්ස සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා භවිස්සන්ති වග්ගවාදකා"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ දෙවදත්තස්ස සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා භවිස්සන්ති වග්ගවාදකා"ති "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා දෙවදත්තස්ස සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා භවිස්සන්ති වග්ගවාදකා. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"තස්සෙව ඛො පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනුවත්තකා වග්ගවාදකා එකො වා ද්වෙ වා තයො වා, තෙ එවං වදෙය්‍යුං: "මා ආයස්මන්තො එතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ, ධම්මවාදී චෙසො භික්ඛු විනයවාදී චෙසො භික්ඛු අම්හාකඤ්චෙසො භික්ඛු ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වොහරති, ජානාති නො භාසති, අම්හාකම්පෙතං ඛමතී"ති. තෙ භික්ඛූ භික්ඛූහි එවමස්සු වචනීයා: "මා ආයස්මන්තො එවං අවචුත්ථ, න චෙසො භික්ඛු ධම්මවාදී, න චෙ සො භික්ඛු විනයවාදී, මා ආයස්මන්තානම්පි සඞ්ඝභෙදො රුච්චිත්ථ. සමෙතායස්මන්තානං සඞ්ඝෙන, සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී"ති. එවඤ්ච තෙ භික්ඛූ භික්ඛූහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍යුං, තෙ භික්ඛූ භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍යුං, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍යුං, සඞ්ඝාදිසෙසො"**ති.

2. **තස්සෙව ඛො පනාති** තස්ස සඞ්ඝභෙදකස්ස භික්ඛුනො.

**භික්ඛූ හොන්තීති** අඤ්ඤෙ භික්ඛූ හොන්ති.

---

1. චසද්දො සාම්පිටකෙ න දිස්සතෙ. 2. එතදවොච. සීමු.

# 3. 11.

## ද්විතීයසඞ්ඝභෙදශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර සමීපයෙහි වූ කලන්දක-නිවාප නම් වේළුවනයෙහි වැඩ වාසය කෙරෙති. තවද එසමයෙහි දෙව්දත් තෙම සඞ්ඝභෙදය පිණිස චක්‍රභෙදය පිණිස යත්න කෙරෙයි. භික්ෂූහු මෙසේ කීහු: 'දෙව්දත් අධර්මවාදී යෑ, දෙව්දත් අවිනයවාදී යෑ. කෙසේ නම් දෙව්දත් සඞ්ඝභෙදය පිණිස චක්‍රභෙදය පිණිස යත්න කෙරේ දැ'යි. මෙසේ කී කල්හි කටමෝරකතිස්සක නම් කොකාලික තෙමේ ද ඛණ්ඩදෙවියගේ පුත් සමුද්දදත්ත තෙමේ ද ඒ භික්ෂූන්ට මෙසේ කීහු: 'ආයුෂ්මත්නි, තහමක් මෙසේ කියවු දෙව්දත් ධර්මවාදී යෑ, දෙව්දත් විනයවාදී යෑ, දෙව්දත් අපගේ ද ඡන්දයත් රුචියත් ගෙණ ව්‍යවහාර කෙරෙයි. අපගේ (ඡන්දදිය) දනී. (දූත) කියයි තෙල අපටද රුචි වේ' ය යි. යම් භික්ෂූ කෙනෙක් අල්පෙච්ඡ වෙත් ද ඔහු අවමන් කෙරෙති, නුගුණ කියති, දෙස් පතල කෙරෙති: 'කෙසේ නම් භික්ෂූහු සඞ්ඝභෙදය පිණිස යත්න කරණ දෙව්දත්හට අනුවර්තික වූවාහු වර්ගවාදක වූවාහු වෙත් දැ' යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේපවත් දැන්වූහ. ... 'සැබෑව ද මහණෙනි, භික්ෂූහු සඞ්ඝභෙදය පිණිස යත්න කරණ දෙව්දත්හට අනුවර්තික වූවාහු ද? අනුවර්තික වූවාහු වර්ගවාදක වූවාහු වෙත් දැ?'යි. 'සැබෑව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු වෙසෙසින් ගැරහූහ. ... 'කෙසේ නම් මහණෙනි, ඒ තුච්ඡපුරුෂයෝ සඞ්ඝභෙදය පිණිස යත්න කරණ දෙව්දත්හට අනුවර්තික වූවාහු වර්ගවාදක වූවාහු වෙත් දැ. මහණෙනි, තෙල නො පහන් වූවන්ගේ ප්‍රසාදය පිණිස හෝ නොවෙයි. ... තව ද මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසවු:

“සඞ්ඝභෙදය පිණිස යත්න කරණ) එ මැ මහණහට අනුවර්තික වූ වර්ගවාදක වූ භික්ෂූහු එකෙක් හෝ දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ වෙත් ද ඔහු මෙසේ කියන්නාහු නම්: ඇවැත්නි, තෙල මහණහට කිසිවක් නොකියවු, තෙල මහණ ධර්මවාදී ය, තෙල මහණ විනයවාදී ය, අපගේද ඡන්දයත් රුචියත් ගෙණ ව්‍යවහාර කෙරෙයි, අපගේ ඡන්දදිය දනියි. අප සමග බෙණෙයි, තෙල අපට ද රිසි වේ' ය යි. ඒ භික්ෂූහු භික්ෂූන් විසින් මෙසේ කියයුත්තාහ: 'ඇවැත්නි, නහමක් මෙසේ කියවු. තෙල මහණ නො ද ධර්මවාදී ය, තෙල මහණ නො ද විනයවාදී ය, ආයුෂ්මත්නට ද සඞ්ඝභෙදය රුචි නො වේවා, ආයුෂ්මතුන්ගේ (සිත) සඞ්ඝයා සමග එකීභාවයට යේවා, සමග සඞ්ඝ තෙමේ සතුටු වනුයේ විවාද නො-කරණුයේ එකොද්දෙශ ඇත්තේ සුවසේ වෙසේ ය'යි. ඒ (අනුවර්තික) භික්ෂූහු භික්ෂූන් විසින් මෙසේත් කියනු ලබන්නාහු එසේ මැ දැඩි කොට ගන්නාහු නම් ඒ භික්ෂූහු භික්ෂූන් විසින් ඒ ලබ්ධිය දුරලීම පිණිස තෙවන වට දක්වා සමනුභාෂන කර්ම කල යුත්තාහ. ඉදින් තෙවන වට දක්වා සමනුභාෂන කර්ම කරණු ලබන්නාහු ඒ ලබ්ධිය හරණාහු නම් මේ දුරලීම මැනවි ඉදින් නො හරණාහු නම් සඟවෙසෙස් වේ ය'යි.

2. තඤ්ඤෙව ඛො පන යනු: ඒ සඞ්ඝභෙදක මහණහට.

භික්ඛූ හොන්ති යනු: අන් භික්ෂූහු වෙත්.

**අනුවත්තකාති** යංදිට්ඨිකො හොති යංඛන්තිකො යංරුචිකො, තෙපි තංදිට්ඨිකා හොන්ති තංඛන්තිකා තංරුචිකා.

**වග්ගවාදකාති** තස්ස වණ්ණාය පක්ඛාය ඨිතා හොන්ති.

**එකො වා ද්වෙ වා තයො වාති** එකො වා හොති ද්වෙ වා තයො වා. තෙ එවං වදෙය්‍යුං: "මා ආයස්මන්තො එතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ, ධම්මවාදී චෙසො භික්ඛු විනයවාදී චෙසො භික්ඛු අම්හාකඤ්චෙසො භික්ඛු ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වොහරති, ජානාති නො භාසති, අම්හාකම්පෙතං ඛමතී"ති.

**තෙ භික්ඛූති** යෙ තෙ අනුවත්තකා භික්ඛූ.

**භික්ඛූහීති** අඤ්ඤෙහි භික්ඛූහි, යෙ පස්සන්ති, යෙ සුණන්ති, තෙහි වත්තබ්බා: "මා ආයස්මන්තො එවං අවචුත්ථ, න චෙසො භික්ඛු ධම්මවාදී, න චෙසො භික්ඛු විනයවාදී, මා ආයස්මන්තානම්පි සඞ්ඝභෙදො රුච්චිත්ථ, සමෙතායස්මන්තානං සඞ්ඝෙන, සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී"ති. දුතියම්පි වත්තබ්බා. තතියම්පි වත්තබ්බා. සචෙ පටිනිස්සජ්ජන්ති, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජන්ති, ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති, ආපත්ති දුක්කටස්ස. තෙ භික්ඛූ සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බා:– "මා ආයස්මන්තො එවං අවචුත්ථ, න චෙසො භික්ඛු ධම්මවාදී, න චෙසො භික්ඛු විනයවාදී, මා ආයස්මන්තානම්පි සඞ්ඝභෙදො රුච්චිත්ථ, සමෙතායස්මන්තානං සඞ්ඝෙන. සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී"ති. දුතියම්පි වත්තබ්බා. තතියම්පි වත්තබ්බා. සචෙ පටිනිස්සජ්ජන්ති, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජන්ති, ආපත්ති දුක්කටස්ස. තෙ භික්ඛූ භික්ඛූහි සමනුභාසිතබ්බා, එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච භික්ඛූ ඉත්ථන්නාමස්ස භික්ඛුනො සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා වග්ගවාදකා. තෙ තං වත්ථුං න පටිනිස්සජ්ජන්ති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛූ සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය: එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච භික්ඛූ ඉත්ථන්නාමස්ස භික්ඛුනො සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා වග්ගවාදකා. තෙ තං වත්ථුං න පටිනිස්සජ්ජන්ති. සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛූ සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස ච ඉත්ථන්නාමස්ස ච භික්ඛූනං සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය: දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි. -පෙ-

**අනුවත්තකා** යනු: යම් දෘෂ්ටි ඇත්තෙක් යම් ක්‍ෂාන්ති ඇත්තෙක් යම් රුචි ඇත්තෙක් වේ ද ඔහු ද, ඒ ලබ්ධි ඇත්තාහු ඒ ක්‍ෂාන්ති ඇත්තාහු ඒ රුචි ඇත්තාහු වෙත්.

**වග්ගවාදකා** යනු: ඔහුගේ ගුණ වැණීමට පක්‍ෂවාදීය පිණිස සිටියාහු වෙත්.

**එකො වා ද්වෙ වා තයො වා** යනු: එකෙක් හෝ වෙයි. දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ වෙත්. ඔහු මෙසේ කියන්නාහු ය: 'ඇවැත්නි, තෙල මහණහට කිසිවක් නො කියවු, තෙල මහණ ධර්මවාදී ය, තෙල මහණ විනයවාදී ය, තෙල මහණ අපගේ ද ඡන්දයත් රුචියත් ගෙණ ව්‍යවහාර කෙරෙයි. අපගේ (ඡන්දීය) දනියි, අප සමග බෙණෙයි. තෙල අපට ද රුචි වේ' යයි.

**තෙ භික්ඛූ** යනු: යම් ඒ අනුවර්තක භික්‍ෂූහු.

**භික්ඛූහි** යනු: අන්‍ය භික්‍ෂූන් විසින් යම් කෙනෙක් දකිත් ද, යම් කෙනෙක් අසද් ද, ඔවුන් විසින් කියයුත්තාහ: 'ඇවැත්නි, තගමක් මෙසේ කියවු, තෙල මහණ නො ද ධර්මවාදී ය. තෙල මහණ නො ද විනයවාදී ය, ආයුෂ්මත්නට ද සඞ්ඝභෙදය රුචි නො වේවා, ආයුෂ්මතුන්ගේ (සිත) සඞ්ඝයා සමග එකීභාවයට යේවා, සමග සඞ්ඝ තෙමේ සතුටු වනුයේ විවාද නොකරණුයේ එකොද්දෙශ ඇත්තේ සුවසේ වෙසේ ය'යි. දෙවන වට ද කියයුත්තාහ. තෙවන වට ද කියයුත්තාහ. ඉදින් දුරලත් නම් මේ දුරලීම මැනවි. ඉදින් නො දුර ලත් නම් දුකුලාඇවැත් වේ. අසා නො කියත් නම් දුකුලාඇවැත් වෙයි. ඒ භික්‍ෂූහු සඟමැදට ද ඇද කියයුත්තාහ; 'ඇවැත්නි, තගමක් මෙසේ කියවු. තෙල මහණ නො ද ධර්මවාදී ය, තෙල මහණ නො ද විනයවාදී ය, ආයුෂ්මත්නට ද සඞ්ඝභෙදය රුචි නො වේවා, ආයුෂ්මතුන්ගේ (සිත) සඞ්ඝයා සමග එකීභාවයට යේවා. සමග සඞ්ඝ තෙමේ සතුටු වනුයේ විවාද නො කරණුයේ එකොද්දෙශ ඇත්තේ සුවසේ වෙසේ ය'යි දෙවන වට ද කියයුත්තාහ. තෙවන වට ද කියයුත්තාහ. ඉදින් දුර ලත් නම් මේ දුරළීම මැනවි. ඉදින් නො දුර ලත් නම් දුකුලාඇවැත් වේ. ඒ භික්‍ෂූහු අත් මහණුන් විසින් සමනුභාසන කම් කළයුත්තාහ. තවද මහණෙනි, මෙසේත් සමනුභාසන කම් කළයුත්තාහ. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මෙනම් වූ ද මෙනම් වූ ද මහණහු සඞ්ඝභෙදය පිණිස යත්න කරණ මෙනම් මහණහට අනුවර්තකයහ. වර්ගවාදකයහ. ඔහු ඒ (භෙදකර) වස්තුව නො හරිත්. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ ඒ වස්තුව හරණ පිණිස මෙනම් වූ ද මෙනම් වූ ද මහණුන්ට සමනුභාසන කම් කරන්නේ ය. තෙල 'ඤත්ති' ය.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මෙනම් වූ ද මෙනම් වූ ද මහණහු සඞ්ඝභෙදය පිණිස යත්න කරණ මෙනම් මහණහට අනුවර්තකයහ වර්ගවාදකයහ. ඔහු ඒ (භෙදකර) වස්තුව නො හරිත්. සඞ්ඝ තෙමේ ඒ වස්තුව හරණ පිණිස මෙනම් වූ ද මෙනම් වූ ද මහණුන්ට සමනුභාසන කම් කෙරෙයි. යම් ආයුෂ්මතක්හට ඒ වස්තුව හරණ පිණිස මෙනම් වූ ද මෙනම් වූ ද මහණුන්ට සමනුභාසන කම් කිරීම රුස්නේ නම් හෙතෙම තූෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රුස්නේ නම් හෙතෙම බණන්නේ ය. දෙවන වට ද මෙපවත් කියමි. ... තෙවනවට ද මෙපවත් කියමි. ...

සමනුභට්ඨා සඞ්ඝෙන ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච භික්ඛූ තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තානං ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති. ද්වෙ තයො එකතො සමනුභාසිතබ්බා. තදුත්තරි න සමනුභාසිතබ්බා.

**සඞ්ඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

3. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී[1] න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකො න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී න පටිනිස්සජ්ජති. ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

4. අනාපත්ති අසමනුභාසන්තානං, පටිනිස්සජ්ජන්තානං, උම්මත්තකානං, ඛිත්තචිත්තානං, වෙදනට්ටානං ආදිකම්මිකානන්ති.

**දුතියසඞ්ඝභෙද සික්ඛාපදං නිට්ඨිතං.**

---

1. ධම්මකම්මසඤ්ඤිනො සී. මු සබ්බත්ථ.

සඞ්ඝයා විසින් ඒ (භේදකර) වස්තුව හරණ පිණිස මෙතම් වූ ද මෙතම් වූ ද භික්ෂූහු සමනුභාසන කම් කරණ ලදහ. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් මේ තුෂ්ණීම්භාව යි. තෙල මෙසේ ධරමි' යි.

ඥප්තියෙන් දුකුළා වෙයි. දෙකම්වදනින් ථුලැසි දෙකෙක් වෙයි. කම්වදන් අවසන්හි සඟවෙසෙස්ඇවැත් වෙයි. සඟවෙසෙස් අවදනාවූහට ඥප්තියෙන් වූ දුකුළා ද දෙකම්වදනින් වූ දෙථුලැසිය ද නවතිත්. දෙතුන් දෙනෙක් එකට සමනුභාසන කම් කළයුත්තාහ. එයින් මත්තෙහි සමනුභාසන කම් නො කළයුත්තාහ

**සඞ්ඝාදිසෙසො** යනු ... එයිනුදු කියනු ලැබෙයි 'සඞ්ඝාදිසෙසො' යි.

3. ධර්මකර්මයෙහි ධර්මකර්ම ය සංඥ ඇත්තාහු (ලබ්ධිය) නො හරිත් නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇත්තාහු නො හරිත් නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්ම ය යන සංඥ ඇත්තාහු නො හරිත් නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි ධර්මකර්ම ය යන සංඥ ඇත්තාහු නො හරිත් නම් දුකුළාඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇත්තාහු ... දුකුළාඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්ම ය යන සංඥ ඇත්තාහු ... දුකුළාඇවැත් වේ.

4. සමනුභාසන කම් නො කරණුවහට, හරණුවහට, උන්මත්තකයහට, නටසිත් ඇතියහට, වෙයින් පෙළෙනුවහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ද්විතීය සඞ්ඝභෙද ශික්ෂාපදය නිමි.**

# 3. 12.

## දුබ්බචසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ඡන්නො අනාචාරං ආචරති. භික්ඛූ එවමාහංසු: "මා ආවුසො ඡන්න, එවරූපං අකාසි. නෙතං කප්පතී"ති. සො එවං වදෙති: "කිංනු ඛො නාම තුම්හෙ ආවුසො, මං වත්තබ්බං මඤ්ඤථ. අහං ඛො නාම තුම්හෙ වදෙය්‍යං. අම්හාකං බුද්ධො අම්හාකං ධම්මො අම්හාකං අය්‍යපුත්තෙන ධම්මො අභිසමිතො. සෙය්‍යථාපි නාම මහාවාතො වායන්තො තිණකට්ඨපණ්ණසටං[1] එකතො උස්සාදෙය්‍ය[2], සෙය්‍යථාපි වා පන නදී පබ්බතෙය්‍යා සඞ්ඛසෙවාලපණකං එකතො උස්සාදෙය්‍ය, එවමෙව තුම්හෙ නානානාමා නානාගොත්තා නානාජච්චා නානාකුලා පබ්බජිතා එකතො උස්සාදිතා. කිංනු ඛො නාම තුම්හෙ ආවුසො, මං වත්තබ්බං මඤ්ඤථ. අහං ඛො නාම තුම්හෙ වදෙය්‍යං. අම්හාකං බුද්ධො අම්හාකං ධම්මො අම්හාකං අය්‍යපුත්තෙන ධම්මො අභිසමිතො"ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා ඡන්නො භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර ත්වං ඡන්න, භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොසී"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරිස්සසි -පෙ- නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"භික්ඛු පනෙව දුබ්බචජාතිකො හොති, උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති, 'මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ, කල්‍යාණං වා පාපකං වා, අහම්පායස්මන්තෙ න කිඤ්චි වක්ඛාමි කල්‍යාණං වා පාපකං වා, විරමථායස්මන්තො මම වචනායා'ති. සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො: 'මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි. වචනීයමෙවායස්මා අත්තානං කරොතු. ආයස්මාපි භික්ඛූ වදෙතු සහධම්මෙන. භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන. එවං සංවද්ධා හි තස්ස භගවතො පරිසා, යදිදං අඤ්ඤමඤ්ඤවචනෙන අඤ්ඤමඤ්ඤවුට්ඨාපනෙනා'ති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාව තතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය. යාව තතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, සඞ්ඝාදිසෙසො"ති.**

---

1. පණ්ණසාසටං. මජසං. 2. උස්සාරෙය්‍ය. මජසං.

# 3. 12.

## දුර්වචශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු කොසැඹෑනුවර සමීපයෙහි වූ ඝෝෂිතාරාමයෙහි වැඩ වෙසෙන සේක. තවද එසමයෙහි ආයුෂ්මත් ඡන්න තෙම අනාචාර කෙරෙයි. භික්ෂූහු මෙසේ කීහ: 'ඇවැත, ඡන්නය, මෙබන්දක් නො කරව, මේ නො කැප ය' යි. හෙතෙම මෙසේ කියයි: 'කිමෙක් ද ඇවැත්නි, තෙපි නම් මා කියයුත්තකු කොට සිතවු ද, මම නම් තොපට කියන්නෙමි. අපගේ බුදුහ, අපගේ දහම, අපගේ ආර්‍ය්‍යපුත්‍රයන් විසින් දහම අවබොධ කරණ ලද ය. යම්සේ නම් මහසුළඟ හමන්නේ තණ වියළිදඹු පරණලා එක්රැස් කරන්නේ ද, තවද යම්සේ හෝ කන්දෙන් ගලාබස්නා නදිය සක් සෙවෙල් පිසඹුරු එක්රැස් කරන්නී ද, එසේ ම තෙපි නොයෙක් නම් ඇත්තහු නොයෙක් ගෝත්‍ර ඇත්තහු නොයෙක් ජාති ඇත්තහු නොයෙක් කුලයෙන් නික්ම පැවිදි වූවහු එක්රැස් වූවහු ය. කිමෙක් ද ඇවැත්නි, තෙපි නම් මා කියයුත්තකු කොට සිතවු ද, මම නම් තොපට කියන්නෙමි, අපගේ බුදුහ, අපගේ දහම, අපගේ ආර්‍ය්‍යපුත්‍රයන් විසින් දහම් අවබොධ කරණ ලද්' යි. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ වූහු ද ඔහු අවමන් කෙරෙති, අයුණු කියති, දෙස් පහළ කෙරෙත්: 'කෙසේ නම් ආයුෂ්මත් ඡන්න තෙම භික්ෂූන් විසින් කරුණු සහිත ව කියනු ලබන්නේ තමා නොකියයුත්තකු කෙළේ දැ' යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේපවත් සැළ කළහ. ... 'සැබෑවෙක් ද ඡන්නය, තෝ භික්ෂූන් විසින් කරුණු සහිත ව කියනු ලබන්නෙහි තමා නො කියයුත්තකු කෙරෙහි දැ' යි. "සැබව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු වෙසෙසින් ගැරහූහ: කෙසේ නම් තුච්ඡපුරුෂය, තෝ භික්ෂූන් විසින් කරුණු සහිත ව කියනු ලබන්නෙහි තමා නො කියයුත්තකු කෙරෙහි ද ... තුච්ඡපුරුෂය, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසවු:

"මහණ තෙම දුර්වචස්වභාව ඇත්තේ වේ ද, ප්‍රාතිමොක්ෂොද්දෙශයෙහි ඇතුළත් වූ ශික්ෂාපදයෙහි ලා (ලජ්ජී) භික්ෂූන් විසින් ප්‍රඥප්තිශික්ෂාපදයෙන් කියනු ලබන්නේ 'ආයුෂ්මත්නි, මට කල්‍යාණ වූ හෝ ලාමක වූ හෝ කිසිවක් නො කියවු. මම ද ආයුෂ්මත්නට කල්‍යාණ වූ හෝ ලාමක වූ කිසිවක් නො කියන්නෙමි. ආයුෂ්මත්නි, මට අවවාදයෙන් වෙන් වවු'යයි තමා නො කියයුත්තකු කෙරේ ද, ඒ මහණ තෙම භික්ෂූන් විසින් මෙසේ කියයුතු වන්නේ ය: 'ආයුෂ්මත් තෙම නහමක් තමා නො කියයුත්තකු කෙරේවා. ආයුෂ්මත් තෙම තමා කියයුත්තකු ම කෙරේවා. ආයුෂ්මත් තෙමේ ද භික්ෂූන්ට ප්‍රඥප්තිශික්ෂාපදයෙන් කියාවා. භික්ෂූහු ද ආයුෂ්මත්හට ප්‍රඥප්තිශික්ෂාපදයෙන් කියන්නාහ. මෙසේ ඒ භාග්‍යවත්හුගේ පර්ෂද් මේ ඔවුනොවුන්ට හිත වචනයෙන් ඔවුනොවුන් ඇවැතින් නගාලීමෙන් වැඩුනී ම' යයි. මෙසේත් ඒ මහණ තෙම භික්ෂූන් විසින් කියනු ලබන්නේ එසේ ම දැඩි කොට ගණී නම් ඒ මහණ තෙම භික්ෂූන් විසින් ඒ ලබ්ධිය දුරැලීම පිණිස තුන්වනවට දක්වා සමනුභාසනය කළයුත්තේ ය. ඉදින් තුන්වනවට දක්වා සමනුභාසන කම් කරණු ලබන්නේ ඒ ලබ්ධිය හැරපියා නම් මෙසේ මේ හැරපීම මැනවි. ඉදින් නො හැරපියා නම් සඟාවශේෂ වේ" ය යි,

2. **භික්ඛු පනෙව දුබ්බචජාතිකො හොතී**ති දුබ්බචො හොති දොවචස්සකරණෙහි ධම්මෙහි සමන්නාගතො අක්ඛමො අප්පදක්ඛිණග්ගාහී අනුසාසනිං.

**උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසූ**ති පාතිමොක්ඛපරියාපන්නෙසු සික්ඛාපදෙසු.

**භික්ඛූහී**ති අඤ්ඤෙහි භික්ඛූහි.

**සහධම්මිකං** නාම: යං භගවතා පඤ්ඤත්තං සික්ඛාපදං එතං සහධම්මිකං නාම. තෙන වුච්චමානො අත්තනා අවචනීයං කරොති, "මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ කල්‍යාණං වා පාපකං වා, අහම්පායස්මන්තෙ න කිඤ්චි වක්ඛාමි කල්‍යාණං වා පාපකං වා, විරමථායස්මන්තො මම වචනායා"ති.

**සො භික්ඛූ**ති යො සො දුබ්බචජාතිකො භික්ඛු.

**භික්ඛූහී**ති අඤ්ඤෙහි භික්ඛූහි, යෙ පස්සන්ති යෙ සුණන්ති තෙහි වත්තබ්බො: "මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි. වචනීයමෙවායස්මා අත්තානං කරොතු. ආයස්මාපි භික්ඛූ වදෙතු සහධම්මෙන. භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන. එවං සංවද්ධා හි තස්ස භගවතො පරිසා යදිදං අඤ්ඤමඤ්ඤවචනෙන අඤ්ඤමඤ්ඤවුට්ඨාපනෙනා"ති. දුතියම්පි වත්තබ්බො. තතියම්පි වත්තබ්බො. සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජති, ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති, ආපත්ති දුක්කටස්ස. සො භික්ඛු සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බො: "මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි. වචනීයමෙවායස්මා අත්තානං කරොතු. ආයස්මාපි භික්ඛූ වදෙතු සහධම්මෙන. භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන. එවං සංවද්ධා හි තස්ස භගවතො පරිසා යදිදං අඤ්ඤමඤ්ඤවචනෙන අඤ්ඤමඤ්ඤවුට්ඨාපනෙනා"ති. දුතියම්පි වත්තබ්බො. තතියම්පි වත්තබ්බො. සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජති, ආපත්ති දුක්කටස්ස. සො භික්ඛු සමනුභාසිතබ්බො. එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බො: ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තනා අවචනීයං කරොති, සො තං වත්ථුං න පටිනිස්සජ්ජති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තනා අවචනීයං කරොති, සො තං වත්ථුං න පටිනිස්සජ්ජති, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සමනුභාසනා තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

2. **භික්ඛු පනෙව දුබ්බචජාතිකො හොති** යනු: දුර්වචසකවූයේ දුර්වච කරණ ධර්මයන්ගෙන් සමන්විත වූයේ (අවවාදය) නො ඉවසන්නේ අනුශාසනය පැදකුණින් (අදර ඇති වැ) නො ගන්නේ වෙයි.

**උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසු** යනු: ප්‍රාතිමොක්‍ෂයෙහි ඇතුළත් වූ ශික්‍ෂාපදයන්හි.

**භික්ඛූහි** යනු: අන්‍ය භික්‍ෂූන් විසින්.

**සහධම්මික** නම්: භාග්‍යවතුන් විසින් පනවන ලද යම් ශික්‍ෂාපදයෙක් වේ ද තෙල සහධම්මික නම. එයින් කියනු ලබන්නේ 'ඇවැත්නි, මට කල්‍යාණ වූ හෝ ලාමක වූ හෝ කිසිවක් නො කියවූ, මම ද ආයුෂ්මත්නට කල්‍යාණ වූ හෝ ලාමක වූ හෝ කිසිවක් නො කියන්නෙමි. ඇවැත්නි, මට අවවාද වචනයෙන් වෙන් වවූ' යයි.

**සො භික්ඛු** යනු: ඒ දුර්වච සවභාව ඇති මහණ තෙම.

**භික්ඛූහි** යනු: අන් මහණුන් විසින්, යම් කෙනෙක් දකිත් ද යම් කෙනෙක් අසත් ද ඔවුන් විසින් 'ආයුෂ්මත් තෙම තමක් තමා නො කියයුත්තකු කෙරේවා, ආයුෂ්මත් තෙම තමා කියයුත්තකු ම කෙරේවා, ආයුෂ්මත් තෙමේ ද භික්‍ෂූන්ට ප්‍රඥප්තිශික්‍ෂාපදයෙන් කියාවා, භික්‍ෂූහු ද ආයුෂ්මත්හට ප්‍රඥප්තිශික්‍ෂාපදයෙන් කියන්නාහ. මෙසේ ඒ භාග්‍යවතුන්ගේ පිරිස් මේ ඔවුනොවුන්ට හිත වචනයෙන් ඔවුනොවුන් ඇවැතින් නැගීමෙන් වැඩුනී මැ ය'යි කියයුත්තේ ය. දෙවනවට ද කියයුත්තේ ය. තෙවනවට ද කියයුත්තේ ය. ඉදින් හැරපියා නම් මේ හැරපීම මැනැවි. ඉදින් නො හැරපියා නම් දුකුළාඇවැත් වෙයි. අසා නො කියත් නම් දුකුළාඇවැත් වෙයි. ඒ මහණ තෙම සඟමැදට ද ඇද 'ආයුෂ්මත් තෙම තමක් තමා නො කියයුත්තකු කෙරේවා, ආයුෂ්මත් තෙම තමා කියයුත්තකු ම කෙරේවා, ආයුෂ්මත් තෙමේ ද භික්‍ෂූන්ට ප්‍රඥප්තිශික්‍ෂාපදයෙන් කියාවා, භික්‍ෂූහු ද ආයුෂ්මත්හට ප්‍රඥප්තිශික්‍ෂාපදයෙන් කියන්නාහ. මෙසේ ඒ භාග්‍යවතුන්ගේ පිරිස් මේ ඔවුනොවුන්ට හිත වචනයෙන් ඔවුනොවුන් ඇවැතින් නැගීමෙන් වැඩුනී ම ය' යි කියයුත්තේ ය. දෙවනවට ද කියයුත්තේ ය. තෙවනවට ද කියයුත්තේ ය. ඉදින් හැරපියා නම් මේ හැරපීම මැනැවි. ඉදින් නො හැරපියා නම් දුකුළාඇවැත් වෙයි. ඒ මහණ තෙම සමනුභාසනය කළ යුත්තේ ය. තවද මහණෙනි, මෙසේත් සමනුභාසනය කළයුත්තේ ය: ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙම මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම භික්‍ෂූන් විසින් ප්‍රඥප්තිශික්‍ෂාපදයෙන් කියනු ලබන්නේ තමා නො කියයුත්තකු කෙරෙයි. හෙතෙම ඒ වස්තුව නො හරියි. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙම ඒ වස්තුව හැරපියනු පිණිස මෙනම් මහණහට සමනුභාසන කම් කරන්නේ ය. තෙල 'ඤත්ති'ය.

වහන්ස, සඞ්ඝ තෙම මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම භික්‍ෂූන් විසින් ප්‍රඥප්තිශික්‍ෂාපදයෙන් කියනු ලබන්නේ තමා නො කියයුත්තකු කෙරෙයි. හෙතෙම ඒ වස්තුව නො හරියි. සඞ්ඝ තෙම ඒ වස්තුව හැරපියනු පිණිස මෙනම් මහණහට සමනුභාසන කම් කෙරෙයි, යම් ආයුෂ්මතක්හට ඒ වස්තුහුගේ හැරපීම පිණිස මෙනම් මහණහට සමනුභාසනය රුචි වේ නම් හෙතෙම තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නුරුස්නේ නම් හෙතෙම බණන්නේ ය.

දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු තස්ස වචනස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී”ති.

ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස, සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තස්ස ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති.

**සඞ්ඝාදිසෙසොති** -පෙ- තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

3. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකො න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී න පටිනිස්සජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී -පෙ- ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො -පෙ- ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී -පෙ- ආපත්ති දුක්කටස්ස.

4. අනාපත්ති අසමනුභාසන්තස්ස, පටිනිස්සජ්ජන්තස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**දුබ්බචසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 3. 13.

## කුලදූසකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තෙන ඛො පන සමයෙන **අස්සජිපුනබ්බසුකා**[1] නාම කීටාගිරිස්මිං ආවාසිකා හොන්ති අලජ්ජිනො පාපභික්ඛූ. තෙ එවරූපං අනාචාරං ආචරන්ති; මාලාවච්ඡං රොපෙන්තිපි රොපාපෙන්තිපි. සිඤ්චන්තිපි සිඤ්චාපෙන්තිපි. ඔචිනන්තිපි ඔචිනාපෙන්තිපි. ගන්ථෙන්තිපි ගන්ථාපෙන්තිපි. එකතොවණ්ටිකමාලං කරොන්තිපි කාරාපෙන්තිපි. උභතොවණ්ටිකමාලං කරොන්තිපි කාරාපෙන්තිපි. මඤ්ජරිකං කරොන්තිපි කාරාපෙන්තිපි. විධූතිකං කරොන්තිපි කාරාපෙන්තිපි. වටංසකං කරොන්තිපි කාරාපෙන්තිපි. ආවෙළං කරොන්තිපි කාරාපෙන්තිපි. උරච්ඡදං කරොන්තිපි කාරාපෙන්තිපි. තෙ කුලිත්ථීනං කුලධීතානං කුලකුමාරීනං කුලසුණ්හානං කුලදාසීනං එකතොවණ්ටිකමාලං හරන්තිපි හරාපෙන්තිපි. උභතොවණ්ටිකමාලං හරන්තිපි හරාපෙන්තිපි. මඤ්ජරිකං හරන්තිපි හරාපෙන්තිපි, විධූතිකං හරන්තිපි හරාපෙන්තිපි, වටංසකං හරන්තිපි හරාපෙන්තිපි. ආවෙළං හරන්තිපි හරාපෙන්තිපි. උරච්ඡදං හරන්තිපි හරාපෙන්තිපි. තෙ කුලිත්ථීහි කුලධීතාහි කුලකුමාරීහි කුලසුණ්හාහි කුලදාසීහි සද්ධිං එකභාජනෙපි භුඤ්ජන්ති-

1. නාම භික්ඛූ. ඉතිපි සීමු.

දෙවනවට ද මෙපවත් කියමි ... තෙවනවට ද මෙපවත් කියමි ... සඞ්ඝයා විසින් ඒ වසතුහුගේ හැරපීම පිණිස මෙනම් මහණ තෙම සමනුභාසනය කරණ ලද්දේ ය. සඞ්ඝයාට රිසි වෙයි. එහෙයින් මේ තුෂ්ණීම්භාව යි. මෙසේ ධරමි' යි.

ඥප්තියෙන් දුකුළා වෙයි. දෙකම්වදනින් දෙථුලැසියෙක් වෙයි. කම්වදන් අවසන්හි සඞ්ඝවෙසෙස්ඇවැත් වේ. සඞ්ඝවෙසෙස් අවදනුවහට ඥප්තියෙන් වූ දුකුළා ද දෙ කම්වදනින් වූ දෙ ථුලැසි ද නවතිත්.

**සඞ්ඝාදිසෙසො** යනු: ... එයින්ද කියනු ලැබෙයි 'සඞ්ඝාදිසෙසො'යි.

3. ධර්මකර්මයෙහි ධර්මකර්ම ය යන සංඥ ඇත්තේ (ලබ්ධිය) නො හරී නම් සඞ්ඝවෙසෙස්ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇත්තේ නො හරී නම් සඞ්ඝවෙසෙස්ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්ම ය යන සංඥ ඇත්තේ නො හරී නම් සඞ්ඝවෙසෙස්ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි ධර්මකර්ම ය යන සංඥ ඇත්තේ ... දුකුළාඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇත්තේ ... දුකුළාඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්ම ය යන සංඥ ඇත්තේ ... දුකුළාඇවැත් වේ.

4. සමනුභාසන කම් නො කරණුවහට, හැරපියනුවහට, උන්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දුඞ්වශික්ෂාපදය නිමි.**

---

## 3. 13.

## කුලදූසකශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙන සේක. තවද එසමයෙහි අශ්වජි ය පුනබ්බසුක ය යන නම් ඇති අලජ්ජී වූ පාපභික්ෂූහු කීටාගිරි දනව්වෙහි ආවාසික වෙති. ඔහු මෙබඳු අනාචාර කෙරෙති: මල්ගස් (තුඹුද) රොපණය කෙරෙති, (මෙරමා ලවා ද) රොපණය කරවති. දිය ඉසිති, දිය ඉස්වති. නෙලති, නෙලවති. ගොතති, ගොතවති. එක්පසැ නටු ඇති මාලා කෙරෙති. කරවති. දෙපසැ නටු ඇති මාලා කෙරෙති, කරවති. මල්කලප් කෙරෙති, කරවති. හිදින් විද කළ මල්දම් කෙරෙති, කරවති. මල්-සුඹුළු කෙරෙති, කරවති. මල් කැරලි කෙරෙති, කරවති. උරසැද කෙරෙති කරවති. ඔහු කුලස්ත්‍රීන්ට කුලදූන්ට කුලකුමරියන්ට කුලසුණිසාවන්ට කුල-දසීන්ට එක්පස නටු ඇති මාලා ගෙණ යෙති, යවති. දෙපස නටු ඇති මාලා ගෙණ යෙති යවති. මල්කලප් ගෙණ යෙති, යවති. හිදින් විද කළ මල්දම් ගෙණ යෙති, යවති. මල් සුඹුළු ගෙණ යෙති, යවති. මල්කැරලි ගෙණ යෙති යවති. උරසැද ගෙණ යෙති, යවති. ඔහු කුලස්ත්‍රීන් කුලදූන් කුලකුමාරිත් කුලසුණිසාවන් කුලදසීන් සමග එක් බඳුනෙහි ද බුදිති-

එකථාලකෙපි පිවන්ති, එකාසනෙපි නිසීදන්ති, එකමඤ්චෙපි තුවට්ටෙන්ති, එකත්ථරණාපි තුවට්ටෙන්ති, එකපාවුරණාපි තුවට්ටෙන්ති, එකත්ථරණපාවුරණාපි තුවට්ටෙන්ති, විකාලෙපි භුඤ්ජන්ති, මජ්ජම්පි පිවන්ති, මාලාගන්ධවිලෙපනම්පි ධාරෙන්ති, නච්චන්තිපි ගායන්තිපි වාදෙන්තිපි ලාසෙන්තිපි, නච්චන්තියාපි නච්චන්ති, නච්චන්තියාපි වාදෙන්ති, නච්චන්තියාපි ලාසෙන්ති, ගායන්තියාපි නච්චන්ති, ගායන්තියාපි ගායන්ති, ගායන්තියාපි වාදෙන්ති, ගායන්තියාපි ලාසෙන්ති, වාදෙන්තියාපි නච්චන්ති, වාදෙන්තියාපි ගායන්ති, වාදෙන්තියාපි වාදෙන්ති, වාදෙන්තියාපි ලාසෙන්ති, ලාසෙන්තියාපි නච්චන්ති, ලාසෙන්තියාපි ගායන්ති, ලාසෙන්තියාපි වාදෙන්ති, ලාසෙන්තියාපි ලාසෙන්ති, අට්ඨපදෙපි කීළන්ති, දසපදෙපි කීළන්ති, ආකාසෙපි කීළන්ති, පරිහාරපථෙපි කීළන්ති, සන්තිකායපි කීළන්ති, ඛලිකායපි කීළන්ති, ඝටිකායපි කීළන්ති, සලාකහත්ථෙනපි කීළන්ති, අක්ඛෙනපි කීළන්ති, පඞ්ගචීරෙනපි කීළන්ති, වඞ්කකෙනපි කීළන්ති, මොක්ඛචිකායපි කීළන්ති, චිඞ්ගුලකෙනපි කීළන්ති, පත්තාළ්හකෙනපි කීළන්ති, රථකෙනපි කීළන්ති, ධනුකෙනපි කීළන්ති, අක්ඛරිකායපි කීළන්ති, මනෙසිකායපි කීළන්ති, යථාවජ්ජෙනපි කීළන්ති, හත්ථිස්මිම්පි සික්ඛන්ති, අස්සස්මිම්පි සික්ඛන්ති, රථස්මිම්පි සික්ඛන්ති, ධනුස්මිම්පි සික්ඛන්ති, ථරුස්මිම්පි සික්ඛන්ති, හත්ථිස්සපි පුරතො ධාවන්ති, අස්සස්සපි පුරතො ධාවන්ති, රථස්සපි[1] පුරතො ධාවන්ති, ධාවන්තිපි ආධාවන්තිපි, උස්සෙළෙන්තිපි[2] අප්පොඨෙන්තිපි නිබ්බුජ්ඣන්තිපි, මුට්ඨීහිපි යුජ්ඣන්ති, රඞ්ගමජ්ඣෙපි සඞ්ඝාටිං පත්ථරිත්වා නච්චන්තිං[3] එවං වදෙන්ති: 'ඉධ භගිනි නච්චස්සූ'ති, නලාටිකම්පි දෙන්ති, විවිධම්පි අනාචාරං ආචරන්ති.

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කාසීසු වස්සං වුත්ථො සාවත්ථිං ගච්ඡන්තො භගවන්තං දස්සනාය යෙන කීටාගිරි තදවසරි. අථ ඛො සො භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කීටාගිරිං පිණ්ඩාය පාවිසි පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්ඛිත්තචක්ඛු ඉරියාපථසම්පන්නො. මනුස්සා තං භික්ඛුං පස්සිත්වා එවමාහංසු: "ක්වායං අබලබලො විය මන්දමන්දො විය භාකුටිකභාකුටිකො විය, කො ඉමස්ස උපගතස්ස පිණ්ඩකම්පි දස්සති. අම්හාකං පන අය්‍යා අස්සජිපුනබ්බසුකා සණ්හා සඛිලා සුඛසම්භාසා මිහිතපුබ්බඞ්ගමා, එහි ස්වාගතවාදිනො අබ්භාකුටිකා උත්තානමුඛා පුබ්බභාසිනො, තෙසං නාම පිණ්ඩො දාතබ්බො"ති. අද්දසා ඛො අඤ්ඤතරො උපාසකො තං භික්ඛුං කීටාගිරිස්මිං පිණ්ඩාය චරන්තං, දිස්වාන යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එතදවොච: "අපි භන්තෙ පිණ්ඩො ලබ්භතී"ති "න ඛො ආවුසො පිණ්ඩො ලබ්භතී"ති "එහි භන්තෙ ඝරං ගමිස්සාමා"ති.

---

1. රථස්ස පුරතො ධාවන්තිපි ආධාවන්තිපි. ම.ජ.සං. 2 උස්සොළෙන්තිපි. පාඨො
3 නච්චකිං ම.ජ.සං.

එක් තලියෙහි ද බොති. එක් අඹුතෙහි ද හිඳිති. එක් ඇඳෙහි ද හොවිති. එක්තිලි ඇති ව හොවිති. එක් පොරෝණ ඇති ව ද හොවිති. එක්තිලිපොරෝණ ඇති ව ද හොවිති. නො කල්හි ද වළඳති. මත්පැන් ද බොති. මල්ගඳ විලවුනු ද දරති නටති ගයති. වයති. ලාස්‍ය නැටුම් නටති. නිළිය නටන කල්හි ද නටති. නටන කල්හි ද ගයති. නටන කල්හි ද වයති. නටන කල්හි ද ලාස්‍ය කෙරෙති. ගයන කල්හි ද නටති. ගයන කල්හි ද ගයති. ගයන කල්හි ද වයති. ගයන කල්හි ද ලාස්‍ය කෙරෙති. වයන කල්හි ද නටති. වයන කල්හි ද ගයති. වයන කල්හිද වයති. වයන කල්හි ද ලාස්‍ය කෙරෙති. ලාස්‍ය කරණ කල්හි ද නටති. ලාස්‍ය කරණ කල්හි ද ලාස්‍ය කෙරෙති. අටපද දූපෝරුයෙහි ද කෙළිති. දශපද දූපෝරුයෙහි ද කෙළිති දූපෝරුයෙහි සෙයින් අහස්හි ද කෙළිති. හිරිමඩලෙහි ද කෙළිති. තිංයෙන් කැට ඇත් මැත් කොට ද කෙළිති. පසැටිනු ද කෙළිති. සිංකෙළියෙනු ද (කල්ලි) කෙළිති. ලහඅතිනු ද කෙළිති. ලාවටිනු ද කෙළිති. පත්තලිනු ද කෙළිති. කුඩාතගුලිනු ද කෙළිති. කරණම් පැනීමෙනු ද කෙළිති. කත්තත්-ගුරුවා ඉදි කොට කෙළිති. පත්නැලියෙනු ද කෙළිති. කුඩා රියෙනු ද කෙළිති. කුඩා දුන්නෙනු ද කෙළිති. අකුරුකෙළියෙනු ද කෙළිති. මනෙසිකායෙනු (සිතූ දෙය කීමෙන්) ද කෙළිති. යථාවද්‍යයෙනු ද (සිරුර දෙස් ඇති සැටි දක්වමින්) කෙළිති. හස්තිශිල්පයෙහි ද හික්මෙති අශ්වශිල්පයෙහි ද හික්මෙති. රථශිල්ප-යෙහි ද හික්මෙති ධනුශ්ශිල්පයෙහි ද හික්මෙති. ඛඩ්ගශිල්පයෙහි ද හික්මෙති. ඇතු පෙරටුයෙහි ද දුවති. අසු පෙරටුයෙහි ද දුවති රිය පෙරටුයෙහි ද දුවති පසුපසට ද දුවති. පෙරට ද දුවති. ප්‍රීතිනාද ද කෙරෙති. අත්පොළසන් ද දෙති. මල්ලව පොර ද කෙරෙති. මිටි පොර ද කෙරෙති. රඟමඩල මැද සළු අතුරා නිළියට 'නැඟනියනි මෙහි නටව'යි මෙසේ කියති. නළලෙහි අත ද තබති. විවිධ අනාචාර ද කෙරෙත්.

2. තවද එසමයෙහි එක්තරා මහණෙක් කාසිජනපදයෙහි වස් විසූයේ බුදුරදුන් දක්නා පිණිස සැවැත්නුවරට යන්නේ කීටාගිරිය යම් තැනෙක්හි ද එතැනට පැමිණියේ ය. ඉක්බිති ඒ මහණ පෙරවරුයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙණ ප්‍රසාද එළවන ගමිතින් නැවැත්මෙන් ඉදිරි බැල්මෙන් අවට බැල්මෙන් අත්පා හැකුළුමින් දිග හැරීමෙන් (යුතුව) යට හෙළූ ඇස් ඇත්තේ පිරිපුන් ඉරියව් ඇත්තේ කීටාගිරියට පිඬු පිණිස පිවිසියේ ය. මිනිස්සු ඒ මහණ දැක මෙසේ කීහ: ඉතා දුබලයකු මෙන් ඉතා සණහයකු මෙන් ඉතා හැකුළු මුහුණ ඇත්තකු මෙන් මේ කවරෙක් ද? මොහු ගෙදොරට පැමිණියහුට කවරෙක් පිණ්ඩපාතයකු දු දෙයි ද? අපගේ ස්වාමිහු අස්සජිපුනබ්බසුකයෝ වැළිත් නිපුණයෝ ය. සඛිලයෝ ය, සුව එළවන කථා ඇත්තාහු ය, සිනහ පෙරටු කොට කථා කරන්නාහු ය, 'එව සුවද්‍ද'යි කියන්නාහු ය, නො හැකුළු බැම ඇත්තාහු ය, නැඟු මුව ඇත්තාහු ය, පලමු කථා කරන්නාහු ය. ඔවුනට නම් පිඬු දිය යුත්තේ ද'යි. එක්තරා උපාසකයෙක් කීටාගිරියෙහි පිඬු පිණිස හැසිරෙන ඒ මහණ දුටුයේ ය. දැක ඒ මහණහු කරා එළඹ ඒ මහණහු වැඳ මේ කී ය. 'වහන්ස, පිඬු ලැබුණේ ද? යි. ඇවැත්නි, පිඬු නො ලැබුණා'යි. එව වහන්ස, ගෙට යම්හ'යි.

3. අථ ඛො සො උපාසකො තං භික්ඛුං ඝරං නෙත්වා භොජෙත්වා එතදවොච: "කහං භන්තෙ අය්‍යො ගමිස්සතී"ති. "සාවත්ථිං ඛො අහං ආවුසො ගමිස්සාමි භගවන්තං දස්සනායා"ති. "තෙන හි භන්තෙ මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, එවඤ්ච වදෙහි:" දුට්ඨො භන්තෙ කීටාගිරිස්මිං ආවාසො, අස්සජිපුනබ්බසුකා නාම කීටාගිරිස්මිං ආවාසිකා අලජ්ජිනො පාපභික්ඛූ. තෙ එවරූපං අනාචාරං ආචරන්ති: මාලාවච්ඡං රොපෙන්තිපි රොපාපෙන්තිපි -පෙ- විවිධම්පි අනාචාරං ආචරන්ති යෙපි තෙ භන්තෙ මනුස්සා පුබ්බෙ සද්ධා අහෙසුං පසන්නා, තෙපි එතරහි අස්සද්ධා අප්පසන්නා. යානිපි තානි සඞ්ඝස්ස පුබ්බෙ දානපථානි, තානිපි එතරහි උපච්ඡින්නානි. රිඤ්චන්ති පෙසලා භික්ඛූ. නිවසන්ති පාපභික්ඛූ. සාධු භන්තෙ භගවා කීටාගිරිං භික්ඛූ පහිණෙය්‍ය යථායං කීටාගිරිස්මිං ආවාසො සණ්ඨහෙය්‍යා"ති.

4. "එවමාවුසො"ති ඛො සො භික්ඛු තස්ස උපාසකස්ස පටිස්සුත්වා යෙන සාවත්ථි තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො, යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං. අථ ඛො භගවා තං භික්ඛුං එතදවොච: "කච්චි භික්ඛු ඛමනීයං, කච්චි යාපනීයං, කච්චිසි අප්පකිලමථෙන අද්ධානං ආගතො, කුතො ච ත්වං භික්ඛු ආගච්ඡසී"ති. "ඛමනීයං භගවා, යාපනීයං භගවා, අප්පකිලමථෙන චාහං භන්තෙ අද්ධානං ආගතො.

5. ඉධාහං භන්තෙ කාසීසු වස්සං වුට්ඨො සාවත්ථිං ආගච්ඡන්තො භගවන්තං දස්සනාය යෙන කීටාගිරි තදවසරිං, අථ ඛ්වාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කීටාගිරිං පිණ්ඩාය පාවිසිං. අද්දසා ඛො මං භන්තෙ අඤ්ඤතරො උපාසකො කීටාගිරිස්මිං පිණ්ඩාය චරන්තං, දිස්වාන යෙනාහං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එතදවොච: "අපි භන්තෙ පිණ්ඩො ලබ්භතී"ති. "න ඛො ආවුසො පිණ්ඩො ලබ්භතී"ති. "එහි භන්තෙ ඝරං ගමිස්සාමා"ති. අථ ඛො භන්තෙ සො උපාසකො මං ඝරං නෙත්වා භොජෙත්වා එතදවොච: "කහං භන්තෙ අය්‍යො ගමිස්සතී"ති. "සාවත්ථිං ඛො අහං ආවුසො ගමිස්සාමි භගවන්තං දස්සනායා"ති. "තෙන හි භන්තෙ මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දාහි, එවඤ්ච වදෙහි: 'දුට්ඨො භන්තෙ කීටාගිරිස්මිං ආවාසො, අස්සජිපුනබ්බසුකා නාම කීටාගිරිස්මිං ආවාසිකා අලජ්ජිනො පාපභික්ඛූ. තෙ එවරූපං අනාචාරං ආචරන්ති: මාලාවච්ඡං රොපෙන්තිපි රොපාපෙන්තිපි -පෙ- විවිධම්පි අනාචාරං ආචරන්ති. යෙපි තෙ භන්තෙ මනුස්සා පුබ්බෙ සද්ධා අහෙසුං පසන්නා, තෙපි එතරහි අස්සද්ධා අප්පසන්නා. යානිපි තානි සඞ්ඝස්ස පුබ්බෙ දානපථානි, තානිපි එතරහි උපච්ඡින්නානි. රිඤ්චන්ති පෙසලා භික්ඛූ. නිවසන්ති පාපභික්ඛූ'ති. සාධු භන්තෙ භගවා කීටාගිරිං භික්ඛූ පහිණෙය්‍ය යථායං කීටාගිරිස්මිං ආවාසො සණ්ඨහෙය්‍යා"ති. "තතො අහං භගවා ආගච්ඡාමී"ති.

3. ඉක්බිති ඒ උපාසක තෙම ඒ මහණ ගෙට පමුණුවා වළඳවා මෙපවත් කී ය: වහන්ස, 'ස්වාමීහු කොහි යෙත් දැ'යි. 'ඇවැත්නි, මම භාග්‍යවතුන් දක්නා පිණිස සැවැතට යෙමි'යි. එසේ වී නම් වහන්ස, මාගේ වචනයෙන් භාග්‍යවතුන්ගේ පාසඟළු උතුමඟින් වඳිනු මැනැවැ. මෙසේත් කියුව මැනැවැ: 'වහන්ස, කීටාගිරියෙහි ආවාසය දූෂිත ය. අස්සජි ය පුනබ්බසුක ය යන අලජ්ජී වූ පාපභික්ෂූහු කීටාගිරියෙහි ආවාසිකයෝ ය. ඔහු මෙබඳු අනාචාරයෙහි හැසිරෙත්: (තුමූ ද) මල්ගස් රෝපණය කෙරෙති. (මෙරමා ලවා ද) රෝපණය කරවති .. විවිධ වූත් නො කටයුතු කෙරෙත්. වහන්ස, පෙර යම් මිනිස් කෙනෙකුත් ශ්‍රද්ධා ඇත්තාහු ප්‍රසන්නයෝ වූහු ද ඔහුත් මෙකල ශ්‍රද්ධා නැත්තාහු අප්‍රසන්නයෝ ය. පෙර සඞ්ඝයාට යම් දන්වැට කෙනෙකුත් වූහු නම් ඔහුත් මෙකල සිඳුනාහු ය. පෙශල භික්ෂූහු වෙත් ව යෙති. පාපභික්ෂූහු නිවසත්. වහන්ස, භාග්‍යවත්හු යම්සේ මේ කීටාගිරියෙහි ආවාසය මැනැවින් පිහිටා නම් එසෙයින් කීටාගිරියට වහන්දෑ කෙනකුත් යවන්නාහු නම් මැනැවැ'යි.

4. 'එසේ ය ඇවැත්නි'යි ඒ මහණ තෙම ඒ උවසුහට පිළිවදන් දී සැවැතට නික්ම ගියේ ය. අනුක්‍රමයෙන් සැවැත්නුවර ජේතවන නම් වූ අනේවඩු සිටුහුගේ අරම යම් තැනෙක්හි ද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැන්හි එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. ආගන්තුක භික්ෂූන් සමඟ සතුටු සාමීචිකථා කිරීම යන මෙය භාග්‍යවත් බුදුවරුන් විසින් පුරුදු කරණ ලද්දේ ම ය. ඉක්බිති භාග්‍යවත්හු ඒ මහණහට මෙය වදාළ සේක. "කිමෙක් ද මහණ ඉවසිය හැකි ද? යැපිය හැකි ද? නො වෙහෙසින් මඟ ආයෙහි ද? මහණ තෝ කොහි සිට ආයෙහි දැ"යි. භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැක්ක. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැක්ක. ස්වාමීනි, මම නො වෙහෙසින් මඟ ආයෙමි.

5. ස්වාමීනි, මම මෙහි කසීජනපදයෙහි වැස නිමවූ වස් ඇත්තෙම් භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස සැවැත්නුවරට එන්නෙම් කීටාගිරිය යම් තැනෙක්හි ද එහි පිවිසියෙමි. ස්වාමීනි, එකල්හි මම පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ කීටාගිරියට පිඬු පිණිස පිවිසියෙමි. ස්වාමීනි, එක්තරා උපාසකයෙක් කීටාගිරියෙහි පිඬු පිණිස හැසිරෙන මා දුටුයේ ය. දැක මා වෙත එළඹ වැඳ මෙපවත් කී ය. 'වහන්ස, පිණ්ඩපාතය ලැබුණේ දැ'යි. 'ඇවැත්නි, පිඬු නො ලැබිනැ'යි. 'එව වහන්ස, ගෙට යම්හ'යි. ස්වාමීනි, ඉක්බිති ඒ උපාසක තෙම මා ගෙට පමුණුවා වළඳවා මෙය කී ය: 'වහන්ස, ස්වාමීහු කොහි යන්නහු දැ'යි. 'ඇවැත්නි, මම භාග්‍යවතුන් වහන්සේ දක්නා සඳහා සැවැත්නුවරට යන්නෙමි'යි. වහන්ස, එසේ වී නම් මාගේ බසින් භාග්‍යවතුන් වහන්සේ ගේ පාසඟළුවත් උතුමඟින් වඳිනු මැනව, මෙසේත් කියනු මැනව. 'ස්වාමීනි,කීටාගිරියෙහි ආවාසය දූෂිත ය. කීටාගිරියෙහි අස්සජිපුනබ්බසුක නම් වූ ආවාසිකයෝ අලජ්ජීහු ය, පාපභික්ෂූහු ය. ඔහු මෙබඳු වූ අනාචාරයෙහි හැසිරෙති: මල්ගස් රෝපණය ද කෙරෙති රෝපණය ද කරවති. ... විවිධ වූ අනාචාරයෙහි ද හැසිරෙත්. ස්වාමීනි, යම් මිනුෂ්‍ය කෙනෙක් ශ්‍රද්ධා ඇත්තාහු ප්‍රසන්නයෝ වූහු නම් ඔහු දු මෙකල්හි ශ්‍රද්ධා රහිතයෝ ය. අප්‍රසන්නයෝ ය. පෙර සඟනට යම් දන්වැට කෙනෙක් වූවාහු නම් ඔහු දු මෙකල්හි සිඳුනාහු ය. සුපෙශල භික්ෂූහු නික්ම යෙති. පාපභික්ෂූහු වාසය කෙරෙත් ය'යි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්සේ කීටාගිරියෙහි මේ ආවාසය පවත්නේ ද එපරිද්දෙන් කීටාගිරියට භික්ෂූන් එවනසේක් නම් මැනැවැ"යි. 'භාග්‍යවතුන් වහන්ස, මම එහි සිට එමි'යි.

6. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "සච්චං කිර භික්ඛවෙ අස්සජිපුනබ්බසුකා නාම කීටාගිරිස්මිං ආවාසිකා අලජ්ජිනො පාපභික්ඛූ, තෙ එවරූපං අනාචාරං ආචරන්ති: මාලාවච්ඡං රොපෙන්තිපි රොපාපෙන්තිපි -පෙ- විවිධම්පි අනාචාරං ආචරන්ති, යෙපි තෙ භික්ඛවෙ මනුස්සා පුබ්බෙ සද්ධා අහෙසුං පසන්නා, තෙපි එතරහි අස්සද්ධා අප්පසන්නා. යානිපි තානි සඞ්ඝස්ස පුබ්බෙ දානපථානි, තානිපි එතරහි උපච්ඡින්නානි. රිඤ්චන්ති පෙසලා භික්ඛූ. නිවසන්ති පාපභික්ඛූ"ති? "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා:

7. "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා එවරූපං අනාචාරං ආචරිස්සන්ති: මාලාවච්ඡං රොපෙස්සන්තිපි රොපාපෙස්සන්තිපි, සිඤ්චිස්සන්තිපි සිඤ්චාපෙස්සන්තිපි, ඔචිනිස්සන්තිපි ඔචිනාපෙස්සන්තිපි, ගන්ථිස්සන්තිපි ගන්ථාපෙස්සන්තිපි, එකතො වණ්ටිකමාලං කරිස්සන්තිපි කාරාපෙස්සන්තිපි, උභතොවණ්ටිකමාලං කරිස්සන්තිපි කාරාපෙස්සන්තිපි, මඤ්ජරිකං කරිස්සන්තිපි කාරාපෙස්සන්තිපි, විධූතිකං කරිස්සන්තිපි කාරාපෙස්සන්තිපි, වටංසකං කරිස්සන්තිපි කාරාපෙස්සන්තිපි, ආවෙලං කරිස්සන්තිපි කාරාපෙස්සන්තිපි, උරච්ඡදං කරිස්සන්තිපි කාරාපෙස්සන්තිපි, තෙ කුලිත්ථීනං කුලධීතානං කුලකුමාරීනං කුලසුණ්හානං කුලදාසීනං එකතො වණ්ටිකමාලං හරිස්සන්තිපි හරාපෙස්සන්තිපි, උභතො වණ්ටිකමාලං හරිස්සන්තිපි හරාපෙස්සන්තිපි, මඤ්ජරිකං හරිස්සන්තිපි හරාපෙස්සන්තිපි, විධූතිකං හරිස්සන්තිපි හරාපෙස්සන්තිපි, වටංසකං හරිස්සන්තිපි හරාපෙස්සන්තිපි, ආවෙලං හරිස්සන්තිපි හරාපෙස්සන්තිපි, උරච්ඡදං හරිස්සන්තිපි හරාපෙස්සන්තිපි, තෙ කුලිත්ථීහි කුලධීතාහි කුලකුමාරීහි කුලසුණ්හාහි කුලදාසීහි සද්ධිං එකභාජනෙපි භුඤ්ජිස්සන්ති, එකථාලකෙපි පිවිස්සන්ති, එකාසනෙපි නිසීදිස්සන්ති, එකමඤ්චෙපි තුවට්ටිස්සන්ති, එකත්ථරණාපි තුවට්ටිස්සන්ති, එකපාපුරණාපි තුවට්ටිස්සන්ති, එකත්ථරණපාපුරණාපි තුවට්ටිස්සන්ති, විකාලෙපි භුඤ්ජිස්සන්ති, මජ්ජම්පි පිවිස්සන්ති, මාලාගන්ධවිලෙපනම්පි ධාරිස්සන්ති, නච්චිස්සන්තිපි, ගායිස්සන්තිපි, වාදිස්සන්තිපි, ලාසෙස්සන්තිපි, නච්චන්තියාපි නච්චිස්සන්ති, නච්චන්තියාපි ගායිස්සන්ති, නච්චන්තියාපි වාදිස්සන්ති, නච්චන්තියාපි ලාසෙස්සන්ති, ගායන්තියාපි නච්චිස්සන්ති, ගායන්තියාපි ගායිස්සන්ති, ගායන්තියාපි වාදිස්සන්ති, ගායන්තියාපි ලාසෙස්සන්ති, වාදෙන්තියාපි නච්චිස්සන්ති, වාදෙන්තියාපි ගායිස්සන්ති, වාදෙන්තියාපි වාදිස්සන්ති, වාදෙන්තියාපි ලාසෙස්සන්ති, ලාසෙන්තියාපි නච්චිස්සන්ති, ලාසෙන්තියාපි ගායිස්සන්ති, ලාසෙන්තියාපි වාදිස්සන්ති, ලාසෙන්තියාපි ලාසෙස්සන්ති, අට්ඨපදෙපි කීළිස්සන්ති, දසපදෙපි කීළිස්සන්ති, ආකාසෙපි කීළිස්සන්ති, පරිහාරපථෙපි කීළිස්සන්ති, සන්තිකායපි කීළිස්සන්ති, ඛලිකායපි කීළිස්සන්ති, ඝටිකායපි කීළිස්සන්ති, සලාකහත්ථෙනපි කීළිස්සන්ති, අක්ඛෙනපි කීළිස්සන්ති, පඞ්ගචීරෙනපි කීළිස්සන්ති, වඞ්කකෙනපි කීළිස්සන්ති, මොක්ඛචිකායපි කීළිස්සන්ති, චිඞ්ගුලකෙනපි කීළිස්සන්ති, පත්තාළ්හකෙනපි කීළිස්සන්ති, රථකෙනපි කීළිස්සන්ති, ධනුකෙනපි කීළිස්සන්ති, අක්ඛරිකායපි කීළිස්සන්ති, මනෙසිකායපි කීළිස්සන්ති, යථාවජ්ජෙනපි කීළිස්සන්ති, හත්ථිස්මිම්පි සික්ඛිස්සන්ති, අස්සස්මිම්පි සික්ඛිස්සන්ති, රථස්මිම්පි සික්ඛිස්සන්ති, ධනුස්මිම්පි සික්ඛිස්සන්ති, ථරුස්මිම්පි සික්ඛිස්සන්ති, හත්ථිස්සපි පුරතො ධාවිස්සන්ති, අස්සස්සපි පුරතො ධාවිස්සන්ති, රථස්සපි පුරතො ධාවිස්සන්ති, ධාවිස්සන්තිපි ආධාවිස්සන්තිපි, උස්සොළ්හිස්සන්තිපි[1], අප්ඵොටෙස්සන්තිපි, නිබ්බුජ්ඣිස්සන්තිපි, මුට්ඨීහිපි යුජ්ඣිස්සන්ති, රඞ්ගමජ්ඣෙපි සඞ්ඝාටිං පත්ථරිත්වා නච්චන්තිං එවං වක්ඛන්ති: "ඉධ භගිනි නච්චස්සූ"ති, නලාටිකම්පි දස්සන්ති, විවිධම්පි අනාචාරං ආචරිස්සන්ති.

1. උස්සොළඝිස්සන්තිපි. සී.මු.

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි ලා භික්ෂුසඞ්ඝයා රැස් කරවා භික්ෂූන් විචාළ සේක. සැබෑවෙක් ද මහණෙනි, කීටාගිරියෙහි අස්සජි-පුනබ්බසුක නම් වූ ආවාසිකයෝ අලජ්ජීහු ය පාපභික්ෂූහුය ඔහු මෙබඳු වූ අනාචාරයෙහි හැසිරෙති. මල්ගස් රෝපණය ද කෙරෙති රෝපණය ද කරවති...විවිධ අනාචාරයෙහි ද හැසිරෙති. පෙර සැදැහැති පහන් වූ යම් මිනිස් කෙනෙක් වූහු නම් ඔහු ද දැන් සැදැහැ නැත්තාහු ය, නො පහන් වූවාහුය. සඟනට පෙර යම් දන්වැට කෙනෙක් වූහු නම් ඔහු ද දැන් සිඳුනාහු ය. පෙශල භික්ෂූහු නික්ම යෙති පාපභික්ෂූහු වාසය කෙරෙත් ය'යි. "සැබෑව භාග්‍යවතුන් වහන්ස". භාග්‍යවත් බුදුහු ගැරහූ සේක:

7. මහණෙනි, ඒ හිස්පුරුෂයෝ කෙසේ නම් මෙබඳු වූ අනාචාරයෙහි හැසිරෙත් ද: මල්ගස් රෝපණය කෙරෙත් ද රෝපණය කරවත් ද, දිය ඉසිත් ද ඉස්වත් ද, නෙලත් ද නෙලවත් ද, ගොතත් ද ගොතවත් ද, එක්පසැ තවූ ඇති මාලා කෙරෙත් ද කරවත් ද, දෙපසැ තවූ ඇති මාලා කෙරෙත් ද කරවත් ද, මල්කලප් කෙරෙත් ද කරවත් ද, හිඳින් විද කළ මල්දම් කෙරෙත් ද කරවත් ද, මල්පුඹුළු කෙරෙත් ද කරවත් ද, මල්කැරලි කෙරෙත් ද කරවත් ද, උරසැද කෙරෙත් ද කරවත් ද, ඔහු කුලස්ත්‍රීන්ට කුලධීතෘන්ට කුලකුමරියන්ට කුලසුණිසාවන්ට කුලදැසීන්ට එක්පසැ තවූ ඇති මාලා ගෙණ යෙත් ද යවත් ද, දෙපසැ තවූ ඇති මාලා ගෙණ යෙත් ද යවත් ද, මල්කලප් ගෙණ යෙත් ද යවත් ද, හිඳින් විද කළ මල්දම් ගෙණ යෙත් ද යවත් ද, මල්පුඹුළු ගෙණ යෙත් ද යවත් ද, මල්කැරලි ගෙණ යෙත් ද යවත් ද, උරසැද ගෙණ යෙත් ද යවත් ද, ඔහු කුලස්ත්‍රීන් කුලධීතෘන් කුලකුමාරින් කුලසුණිසාවන් කුලදැසීන් සමග එක් බඳුනෙහි වළඳත් ද, එක් තලියෙහි බොත් ද, එක් අසුනෙහි හිඳිත් ද, එක් ඇඳෙහි හොවිත් ද, එක් අතුරුණු ඇති ව හොවිත් ද, එක් පොරෝණ ඇති ව හොවිත් ද, එක් අතුරුණු පොරෝණ ඇති ව හොවිත් ද, නො කල්හි වළඳත් ද, මත්පැනු ද බොත් ද, මල්ගඳවිලෙවුනු ද දරත් ද, නටත් ද ගයත් ද වයත් ද, ලාස්‍ය නැටුම් කෙරෙත් ද, (නිළිය) නටන කල්හි නටත් ද, නටන කල්හි ගයත් ද, නටන කල්හි වයත් ද, නටන කල්හි ලාස්‍ය කෙරෙත් ද, ගයන කල්හි ද නටත් ද, ගයන කල්හි ගයත් ද, ගයන කල්හි වයත් ද, ගයන කල්හි ද ලාස්‍ය කෙරෙත් ද, වයන කල්හි ද නටත් ද වයන කල්හි ද ගයත්ද වයන කල්හි වයත් ද, වයන කල්හි ලාස්‍ය කෙරෙත් ද, ලාස්‍ය කරණ කල්හි ද නටත් ද, ලාස්‍ය කරණ කල්හි ද ගයත් ද, ලාස්‍ය කරණ කල්හි වයත් ද, ලාස්‍ය කරණ කල්හි ලාස්‍ය කෙරෙත් ද, අටපද පෝරුයෙහි කෙළිත් ද, දසපද පෝරුයෙහි කෙළිත් ද, පෝරුයෙහි සෙයින් අහස්හි කෙළිත් ද, පාරිමණ්ඩලෙහි කෙළිත් ද, නියෙන් කැට ඇත් මැත් කොට කෙළිත් ද, පසැටිහුදු කෙළිත් ද, සිංකෙළි කෙළිත් ද, ලහ අතිනු ද කෙළිත් ද, ලාවටිනු ද කෙළිත් ද, පත්තලිනු ද කෙළිත් ද, කුඩා නගුලිනු ද කෙළිත් ද, කරණම් පැනීමෙනු ද කෙළිත් ද, කත්තත්ගුරුවා ඉදිකොට කෙළිත් ද, පත්නැලියෙනු ද කෙළිත් ද, කුඩාරියෙනු ද කෙළිත් ද, කුඩාදුන්නෙනු ද කෙළිත් ද, අකුරුකෙළියෙනු ද කෙළිත් ද, මනෙසිකායෙනු ද කෙළිත් ද, යථාවද්‍යයෙනු ද කෙළිත් ද, හස්තිශිල්පයෙහි ද හික්මෙත් ද, අශ්වශිල්පයෙහි ද හික්මෙත් ද, රථශිල්පයෙහි ද හික්මෙත් ද, ධනුශිල්පයෙහි ද හික්මෙත් ද, ඛඩ්ගශිල්පයෙහි ද හික්මෙත් ද, ඇතු පෙරටුයෙහි ද දිවෙත් ද, අසුපෙරටුයෙහි ද දිවෙත් ද, රියපෙරටුයෙහි ද දිවෙත් ද, පසුපසට ද දිවෙත් ද, පෙරටද දිවෙත් ද, ප්‍රිතිනාද කෙරෙත් ද, අපොළත් ද, මල්ලවපොර ද කෙරෙත් ද, මිටුපොර ද කෙරෙත් ද, රඟමඬල මැද සඟළ අතුරා නිළියට නැඟනියනී, මෙහි නටව'යි මෙසේ කියත් ද, තළලෙහි ඇඟිලි තබත් ද, විවිධ අනාචාරයෙහි හැසිරෙත් ද?"

8. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- "විගරහිත්වා ධම්මිං කථං කත්වා සාරිපුත්තමොග්ගල්ලානෙ ආමන්තෙසි: "ගච්ඡථ තුම්හෙ සාරිපුත්තා කීටාගිරිං, ගන්ත්වා අස්සජිපුනබ්බසුකානං භික්ඛූනං කීටාගිරිස්මා පබ්බාජනීයකම්මං කරොථ, තුම්හාකං එතෙ සද්ධිවිහාරිකා"ති. "කථං මයං භන්තෙ අස්සජිපුනබ්බසුකානං භික්ඛූනං කීටාගිරිස්මා පබ්බාජනීයකම්මං කරොම. චණ්ඩා තෙ භික්ඛූ ඵරුසා"ති "තෙන හි තුම්හෙ සාරිපුත්තා බහුකෙහි භික්ඛූහි සද්ධිං ගච්ඡථා"ති. "එවං භන්තෙ"ති ඛො සාරිපුත්තමොග්ගල්ලානා භගවතො පච්චස්සොසුං.

9. එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බං: පඨමං අස්සජිපුනබ්බසුකා භික්ඛූ චොදෙතබ්බා. චොදෙත්වා සාරෙතබ්බා, සාරෙත්වා ආපත්ති[1] රොපෙතබ්බා, ආපත්තිං රොපෙත්වා බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ අස්සජිපුනබ්බසුකා භික්ඛූ කුලදූසකා පාපසමාචාරා, ඉමෙසං පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි ච ඉමෙහි දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො අස්සජිපුනබ්බසුකානං භික්ඛූනං කීටාගිරිස්මා පබ්බාජනීයකම්මං කරෙය්‍ය, න අස්සජිපුනබ්බසුකෙහි භික්ඛූහි කීටාගිරිස්මිං වත්ථබ්බ"න්ති. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ අස්සජිපුනබ්බසුකා භික්ඛූ කුලදූසකා පාපසමාචාරා, ඉමෙසං පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි ච ඉමෙහි දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච. සඞ්ඝො අස්සජිපුනබ්බසුකානං භික්ඛූනං කීටාගිරිස්මා පබ්බාජනීයකම්මං කරොති, න අස්සජිපුනබ්බසුකෙහි භික්ඛූහි කීටාගිරිස්මිං වත්ථබ්බන්ති යස්සායස්මතො ඛමති අස්සජිපුනබ්බසුකානං භික්ඛූනං කීටාගිරිස්මා පබ්බාජනීයකම්මස්ස කරණං; න අස්සජිපුනබ්බසුකෙහි භික්ඛූහි කීටාගිරිස්මිං වත්ථබ්බන්ති. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- කතං සඞ්ඝෙන අස්සජිපුනබ්බසුකානං භික්ඛූනං කීටාගිරිස්මා පබ්බාජනීයකම්මං, න අස්සජිපුනබ්බසුකෙහි භික්ඛූහි කීටාගිරිස්මිං වත්ථබ්බන්ති, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

1. ආපත්තිං. සී.මු.

8. මහණෙනි, තෙල නො පහනුන්ගේ පැහැදීමට හෝ නො වෙයි. ... ගරහා දහැමි කථා වදරා සැරියුත් මුගලන් තෙරුන් ඇමතූ සේක. 'ශාරිපුත්‍රයෙනි, තෙපි කීටාගිරියට යවු. ගොස් අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරියෙන් (තෙරනු සඳහා) පබ්බාජනීයකර්මය කරවු. තුපුහු තොපගේ සද්ධිවිහාරිකයෝ ය' යි. ස්වාමීනි, අපි අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරියෙන් පබ්බාජනීය කර්මය කෙසේ කරමෝ ද ඒ භික්ෂූහු චණ්ඩයෝ ය පරුෂයෝ ය යි. 'එසේ වී නම් ශාරිපුත්‍රයෙනි, තෙපි බොහෝ භික්ෂූන් සමග යව'යි. එසේ ය ස්වාමීනි'යි, සැරියුත්මුගලන් තෙරහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

9. තවද මහණෙනි, මෙසේ කළයුතු ය: පළමු කොට අස්සජිපුනබ්බසුක භික්ෂූහු චෝදනා කටයුත්තාහු ය. චෝදනා කොට සාරණය කටයුත්තාහු ය සාරණය කොට ඇවැත් රෝපණය කළ යුත්තාහු ය. ඇවැත් රෝපණය කොට ප්‍රතිබල වූ ව්‍යක්ත මහණක්හු විසින් සඞ්ඝ තෙමේ ඥපනය කළයුත්තේ ය.

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ අස්සජිපුනබ්බසුක භික්ෂූහු කුලදූෂකයෝ ය පාපසමාචාර ඇත්තාහු ය. මොවුන්ගේ ලාමක වූ සමාචාරයෝ දක්නට ද ලැබෙත් අසනු ද ලැබෙත්. මොවුන් විසින් දූෂිත වූ කුලයෝත් දක්නට ද ලැබෙත් අසනු ද ලැබෙත්. ඉදින් සඟනට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට 'අස්සජිපුනබ්බසුක භික්ෂූන් විසින් කීටාගිරියෙහි නො විසිය යුතු ය' යි කීටාගිරියෙන් පබ්බාජනීය-කර්මය කරන්නේ ය. තෙල 'ඥප්ති' ය.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ අස්සජිපුනබ්බසුක භික්ෂූහු කුලදූෂකයෝ ය. පාපසමාචාරයෝ ය. මොවුන්ගේ ලාමක වූ සමාචාරයෝ දක්නට ද ලැබෙත්. අසනු ද ලැබෙත් මොවුන්. විසින් දූෂිත වූ කුලයෝත් දක්නට ද ලැබෙත්. අසනු ද ලැබෙත්. සඞ්ඝ තෙමේ 'අස්සජිපුනබ්බසුක භික්ෂූන් විසින් කීටාගිරියෙහි නො විසියයුතුය 'යි අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරි-යෙන් පබ්බාජනීයකර්මය කෙරෙයි. යම් ආයුෂ්මතක්හට 'අස්සජිපුනබ්බසුක භික්ෂූන් විසින් කීටාගිරියෙහි නො විසිය යුතු ය'යි අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරියෙන් පබ්බාජනීයකර්මය කිරීම රිසි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රිසි වේ නම් හේ බණන්නේ ය:

දෙවනවට ද මෙකරුණ කියමි ... තෙවනවට ද මෙකරුණ කියමි ... සඞ්ඝයා විසින් අස්සජිපුනබ්බසුක භික්ෂූන් විසින් කීටාගිරියෙහි නො විසියයුතු ය' යි අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරියෙන් පබ්බාජනීයකර්මය කරණ ලද. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් තුෂ්ණීම්භාවය යි. තෙල තුෂ්ණීම්භාවය මෙසේ ධරමි" යි.

10. අථ ඛො සාරිපුත්තමොග්ගල්ලානප්පමුඛො භික්ඛුසඞ්ඝො කීටාගිරිං ගන්ත්වා අස්සජිපුනබ්බසුකානං භික්ඛූනං කීටාගිරිස්මිං[1] පබ්බාජනීයකම්මං අකාසි: "න අස්සජිපුනබ්බසුකෙහි භික්ඛූහි කීටාගිරිස්මිං වත්ථබ්බ"න්ති. තෙ සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතා න සම්මා වත්තන්ති, න ලොමං පාතෙන්ති, න නෙත්ථාරං වත්තන්ති, භික්ඛූ න ඛමාපෙන්ති. අක්කොසන්ති, පරිභාසන්ති ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙන්ති. පක්කමන්තිපි. විබ්භමන්තිපි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අස්සජිපුනබ්බසුකා භික්ඛූ සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතා න සම්මා වත්තිස්සන්ති න ලොමං පාතෙස්සන්ති, න නෙත්ථාරං වත්තිස්සන්ති, භික්ඛූ න ඛමාපෙස්සන්ති, අක්කොසිස්සන්ති, පරිභාසිස්සන්ති, ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙස්සන්ති, පක්කමිස්සන්තිපි විබ්භමිස්සන්තිපී"ති.

11. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "සච්චං කිර භික්ඛවෙ අස්සජිපුනබ්බසුකා භික්ඛූ සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතා න සම්මා වත්තන්ති -පෙ- විබ්භමන්තිපී"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතා න සම්මා වත්තිස්සන්ති, න ලොමං පාතෙස්සන්ති, න නෙත්ථාරං වත්තිස්සන්ති භික්ඛූ න ඛමාපෙස්සන්ති. අක්කොසිස්සන්ති, පරිභාසිස්සන්ති, ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙස්සන්ති, පක්කමිස්සන්තිපි විබ්භමිස්සන්ති'පි. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති කුලදූසකො පාපසමාචාරො, තස්ස ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි ච තෙන දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො: "ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා"ති, එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තෙ භික්ඛූ එවං වදෙය්‍ය: "ඡන්දගාමිනො ච භික්ඛූ දොසගාමිනො ච භික්ඛූ මොහගාමිනො ච භික්ඛූ භයගාමිනො ච භික්ඛූ, තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති: එකච්චං න පබ්බාජෙන්තී"ති. සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො "මා ආයස්මා එවං අවච, න ච භික්ඛූ ඡන්දගාමිනො න ච භික්ඛූ දොසගාමිනො න ච භික්ඛූ මොහගාමිනො න ච භික්ඛූ භයගාමිනො, ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච' කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙවු සුය්‍යන්ති ච පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා"ති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සඞ්ඝාදිසෙසො"ති.**

---

1. කිරිදැව් මු. සී

10. ඉක්බිති ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන ප්‍රමුඛ භික්ෂුසඞඝ තෙමේ කීටාගිරියට ගොස් 'අස්සජිපුනබ්බසුක භික්ෂූන් කීටාගිරියෙහි නො විසියයුතු ය'යි අස්සජිපුනබ්බසුක භික්ෂූන්ට කීටාගිරියෙන් පබ්බාජනීයකර්මය කෙළේ ය. ඔහු සඞඝයා විසින් පබ්බාජනීයකර්මය කරණ ලද්දාහු මනාකොට නොපවතිති. (භික්ෂූන්ට) යටත් ව නො පවතිති. නිස්තරණවතෙහි නො පවතිති. භික්ෂූන් ක්ෂමා නොකරවති. ආක්‍රොශ කෙරෙති. පරිභව බෙණෙති: ඡන්දගාමී බවට දෙ‍්‍වෂගාමී බවට මොහගාමී බවට භයගාමී බවට පමුණුවති. පලායෙති ගිහි ද්‍ වෙති. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡයෝ ද ඔහු අවමන් කෙරෙති, අයුණු කියති දෙස් පහළ කෙරෙත්: 'කෙසේ නම් අස්සජිපුනබ්බසුක භික්ෂුහු සඞඝයා විසින් පබ්බාජනීයකම් කරණ ලද්දාහු මනා කොට නො පවතිත් ද යටත් නො වෙත් ද, නිස්තරණවතෙහි නො පවතිත් ද, භික්ෂූන් ක්ෂමා නො කරවත් ද, ආක්‍රොශ කෙරෙත් ද, පරිභව බෙණෙත් ද, ඡන්දගාමී බවට දෙ‍්‍වෂගාමී බවට මොහගාමී බවට භයගාමී බවට පමුණුවත් ද පලායෙත් ද ගිහි වෙත් ද'යි.

11 ඉක්බිති ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. ... සැබවෙක් ද මහණෙනි, අස්සජිපුනබ්බසුක භික්ෂුහු සඞඝයා විසින් පබ්බාජනීය-කර්මය කරණ ලද්දාහු මනා කොට නො පවතිත් ද ... ගිහි වෙත් දැ'' යි. ''සැබව, භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගර්හා කළහ. ... කෙසේ නම් මහණෙනි, ඒ තුච්ඡපුරුෂයෝ සඞඝයා විසින් පබ්බාජනීයකර්මය කරණ ලද්දාහු මනා කොට නො පවතිත් ද යටත් ව නො පවතිත් ද නිස්තරණ වතෙහි නො පිහිටත් ද භික්ෂූන් ක්ෂමා නො කරවත් ද ආක්‍රොශ කෙරෙත් ද පරිභව බෙණෙත් ද ඡන්දගාමී බවට දෙ‍්‍වෂගාමී බවට මොහගාමී බවට භයගාමී බවට පමුණුවත් ද පලායෙත් ද ගිහි වෙත් දැ' යි. මහණෙනි, තෙල නොපහන්නන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසවු:

**''මහණ තෙම කුලදූෂණය කරන්නේ ලාමක සමාචාර ඇත්තේ එක්තරා ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරු කොට වෙසෙ නම්, ඔහුගේ ලාමක සමාචාරයෝ දක්නා ලැබෙත් නම් අසනු ලැබෙත් නම්, ඔහු දූෂිත කුලයෝ ද දක්නා ලැබෙත් නම් අසනු ලැබෙත් නම් ඒ මහණ තෙම භික්ෂූන් විසින් මෙසේ කියයුතු වන්නේ ය: ආයුෂ්මත් තෙම කුලදූ-ෂකයෙහි ලාමක සමාචාර ඇත්තෙහි ය. ආයුෂ්මත්හුගේ වැළිත් ලාමක සමාචාරයෝ දක්නා ද ලැබෙති අසනු ද ලැබෙත්. ආයුෂ්මත්හු විසින් දූෂිත කුලයෝ ද දක්නා ද ලැබෙති අසනු ද ලැබෙත්. ආයුෂ්මත් තෙම මේ අවසින් නික්ම යේවා තාගේ මෙහි විසීමෙන් කම් නැතැ'යි මෙසේත් ඒ මහණ භික්ෂූන් විසින් කියනු ලබන්නේ ඒ භික්ෂූන්ට මෙසේ කියන්නේ නම්: භික්ෂුහු ඡන්දගාමීහු ද වෙති. භික්ෂුහු දෙ‍්‍වෂගාමීහු ද වෙති භික්ෂුහු මොහගාමීහු ද වෙති භික්ෂුහු භයගාමීහු ද වෙත්. එබඳු ඇවැත්හි ඇතැමකු නෙරති ඇතැමකු නො නෙරති'යි. ඒ මහණ තෙම භික්ෂූන් විසින් මෙසේ කියයුතු වන්නේ ය: ඇවැත්නි, නාහමක් මෙසේ කියව. භික්ෂුහු නො ද ඡන්දගාමීහු ය, භික්ෂුහු නො ද දෙ‍්‍වෂගාමීහු ය, භික්ෂුහු නො ද මොහගාමීහු ය, භික්ෂුහු නො ද භයගාමීහු ය, ආයුෂ්මත් තෙම වැළිත් කුලදූෂක ය ලාමක සමාචාර ඇත්තේ ය. ආයුෂ්මත්හුගේ වැළිත් ලාමක සමාචාරයෝ දක්නා ද ලැබෙති අසනු ද ලැබෙත්. ආයුෂ්මත්හු විසින් දූෂිතකුලයෝ ද දක්නා ද ලැබෙති අසනු ද ලැබෙත්. ආයුෂ්මත් තෙම මේ අවසින් නික්ම යේවා තාගේ මෙහි විසීමෙන් කම් නැතැ'යි. මෙසේත් ඒ මහණ භික්ෂූන් විසින් කියනු ලබන්නේ එසේ ම දැඩි ව ගෙණ සිටී නම් ඒ මහණ භික්ෂූන් විසින් ඒ වස්තුහුගේ දුරළීම පිණිස තෙවනවට දක්වා සමනුභාසන කම් කළ යුත්තේ ය. ඉදින් තෙවනවට දක්වා සමනුභාසනය කරනු ලබන්නේ ඒ වස්තුව හැරපියා නම් මෙසේ මේ හැරපීම මැනවැ. ඉදින් නො හැරපියා නම් සඞඝාදිසෙස් වේ ය'' යි.**

12. **භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා**ති ගාමොපි නිගමොපි නගරම්පි ගාමො චෙව නිගමො ච.

**උපනිස්සාය විහරතී**ති තත්ථ පටිබද්ධා හොන්ති චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා.

**කුලං** නාම: චත්තාරි කුලානි: ඛත්තියකුලං බ්‍රාහ්මණකුලං වෙස්සකුලං සුද්දකුලං.

**කුලදූසකො**ති කුලානි දූසෙති පුප්ඵෙන වා ඵලෙන වා චුණ්ණෙන වා මත්තිකාය වා දන්තකට්ඨෙන වා වෙළුනා වා[1] වෙජ්ජිකාය වා ජඞ්ඝපෙසනිකෙන වා.

**පාපසමාචාරො**ති මාලාවච්ඡං රොපෙතිපි රොපාපෙතිපි, සිඤ්චතිපි සිඤ්චාපෙතිපි, ඔචිනාතිපි ඔචිනාපෙතිපි, ගන්ථෙතිපි ගන්ථාපෙතිපි. -පෙ-

**දිස්සන්ති චෙව සුය්‍යන්ති චා**ති යෙ සම්මුඛා තෙ පස්සන්ති. යෙ තිරොක්ඛා තෙ සුණන්ති.

**කුලානි ච තෙන දුට්ඨානී**ති පුබ්බෙ සද්ධා හුත්වා තං ආගම්ම අස්සද්ධා හොන්ති. පසන්නා හුත්වා අප්පසන්නා හොන්ති.

**දිස්සන්ති චෙව සුය්‍යන්ති චා**ති යෙ සම්මුඛා තෙ පස්සන්ති, යෙ තිරොක්ඛා තෙ සුණන්ති.

**සො භික්ඛූ**ති යො සො කුලදූසකො භික්ඛු.

**භික්ඛූහී**ති අඤ්ඤෙහි භික්ඛූහි. යෙ පස්සන්ති යෙ සුණන්ති, තෙහි වත්තබ්බො: "ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා"ති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තෙ භික්ඛූ එවං වදෙය්‍ය: "ඡන්දගාමිනො ච භික්ඛූ දොසගාමිනො ච භික්ඛූ මොහගාමිනො ච භික්ඛූ භයගාමිනො ච භික්ඛූ තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති එකච්චං න පබ්බාජෙන්ති"ති.

**සො භික්ඛූ**ති සො කම්මකතො භික්ඛු.

---

1 වෙළුයා.

12. **භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා** යනු: ගමුදු නිගමුදු නුවරුදු ගාම ද නිගම ද වෙයි.

**උපනිස්සාය විහරති** යනු: චීවර පිණ්ඩපාත සේනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරයෝ ඇත් ද එහි පිළිබඳ වූවාහු වෙත්.

**කුල** නම්: **ක්‍ෂත්‍රියකුල** ය බ්‍රාහමණකුල ය වෛශ්‍යකුල ය ශුද්‍රකුල ය යි කුල සතරෙකි.

**කුලදූසකො** යනු: මලින් හෝ පෙලෙන් හෝ සුණ්ණයෙන් හෝ මැටියෙන් හෝ දතැටිදඬුයෙන් හෝ හුණදඬුයෙන් හෝ වෙදකමින් හෝ හසුන්පත් ගෙණ යෑමෙන් හෝ කුලයන් දූෂණය කෙරෙයි.

**පාපසමාචාරො** යනු: මල්ගස් රොපණය කෙරේ ද රොපණය කරවා ද, දිය ඉසී ද ඉස්වා ද, මල් නෙලා ද නෙලවා ද, මල් ගොතා ද ගොතවා ද-පෙ-

**දිස්සන්ති චෙව සුය්‍යන්ති ච** යනු; යම් කෙනෙක් හමු වූවාහු නම් ඔහු දකිත්. යම් කෙනෙක් මුවහ වූවාහු නම් ඔහු අසත්.

**කුලානි ච තෙන දුට්ඨානි** යනු: පෙර සැදැහැති ව සිට ඔහු කරා පැමිණ සැදැහැ නැත්තාහු වෙති. පහන් ව සිට නො පහන් වූවාහු වෙත්.

**දිස්සන්ති චෙව සුය්‍යන්ති ච** යනු: යම් කෙනෙක් හමු වූවාහු නම් ඔහු දකිත්. යම් කෙනෙක් මුවහ වූවාහු නම් ඔහු අසත්.

**සො භික්ඛු** යනු යම් කුලදූෂක මහණෙක් වේ ද හෙතෙමේ යි.

**භික්ඛූහි** යනු: අන්‍යභික්‍ෂූන් විසින් ය. යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් මෙසේ කියයුත්තේ ය. 'ආයුෂ්මත් තෙම කුලදූෂක ය පාපසමාචාර ඇත්තේ ය. ආයුෂ්මත්හුගේ ලාමකසමාචාරයෝ දක්නා ද ලැබෙති අසනු ද ලැබෙත් ආයුෂ්මත්හු විසින් දූෂිත වූ කුලයෝ ද දක්නා ද ලැබෙති අසනු ද ලැබෙත්. ආයුෂ්මත් තෙම මේ ආවාසයෙන් නික්ම යේවා නා මෙහි විසීමෙන් කම් නැතැ'යි. මෙසේත් ඒ මහණ භික්‍ෂූන් විසින් කියනු ලබන්නේ ඒ භික්‍ෂූන්ට මෙසේ කියා නම් "භික්‍ෂූහු ඡන්දගාමීහු ද වෙති භික්‍ෂූහු ද්වෙෂගාමීහු ද වෙති. භික්‍ෂූහු මොහගාමීහු ද වෙති. භික්‍ෂූහු භයගාමීහු ද වෙති. එබඳු ඇවැතින් ඇතැමෙකු නෙරපති, ඇතැමකු නො නෙරපත්"යයි.

**සො භික්ඛු** යනු: යම් කම්කෘත වූ මහණෙක් වේ ද (හෙතෙමේයි.)

භික්ඛූහීති අඤ්ඤෙහි භික්ඛූහි. යෙ පස්සන්ති, සුණන්ති, තෙහි වත්තබ්බො: "මා ආයස්මා එවං අවච, න ච භික්ඛූ ඡන්දගාමිනො න ච භික්ඛූ දොසගාමිනො න ච භික්ඛූ මොහගාමිනො න ච භික්ඛූ භයගාමිනො; ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා අලං තෙ ඉධ වාසෙනා"ති. දුතියම්පි වත්තබ්බො තතියම්පි වත්තබ්බො සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජති, ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති, ආපත්ති දුක්කටස්ස. සො භික්ඛු සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බො: "මා ආයස්මා එවං අවච, න ච භික්ඛූ ඡන්දගාමිනො න ච භික්ඛූ දොසගාමිනො න ච භික්ඛූ මොහගාමිනො න ච භික්ඛූ භයගාමිනො, ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා"ති.

දුතියම්පි වත්තබ්බො. තතියම්පි වත්තබ්බො සචෙ පටිනිස්සජ්ජති, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජති, ආපත්ති දුක්කටස්ස. සො භික්ඛු සමනුභාසිතබ්බො. එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බො: බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතො භික්ඛූ ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙති, සො තං වත්ථුං න පටිනිස්සජ්ජති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසෙය්‍ය තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, එසා ඤත්ති:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමො භික්ඛු සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතො භික්ඛූ ඡන්දගාමිතා දොසගමිතා මොහගාමිතා භයගාමිතා පාපෙති, සො තං වත්ථුං න පටිනිස්සජ්ජති, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසති තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සමනුභාසනා, තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය:

දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- සමනුභට්ඨො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු තස්ස වත්ථුස්ස පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

13. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තස්ස ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා පටිප්පස්සම්භන්ති.

**භික්ඛූහි** යනු: අන්‍යභික්‍ෂූන් විසින්. යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් මෙසේ කියයුත්තේ ය: 'ආයුෂ්මත් තෙම මෙසේ නහමක් කියාවා. භික්‍ෂූහු නො ද ඡන්දගාමීහු ය. භික්‍ෂූහු නො ද ද්වෙෂගාමීහු ය. භික්‍ෂූහු නො ද මොහගාමීහු ය. භික්‍ෂූහු නො ද භයගාමීහු ය. ආයුෂ්මත් තෙමේ වනාහි කුලදූෂක ය. පාපසමාචාර ඇත්තේ ය. ආයුෂ්මත්හුගේ වැළිත් ලාමක වූ සමාචාරයෝ දක්නා ද ලැබෙති අසනු ද ලැබෙත්. ආයුෂ්මත්හු විසින් දූෂිත වූ කුලයෝ ද දක්නා ද ලැබෙති. අසනු ද ලැබෙත්. ආයුෂ්මත් තෙම මේ ආවාසයෙන් නික්ම යේවා. තා මෙහි විසීමෙන් කම් නැතැ" යි. දෙවනුව ද කියයුත්තේ ය, තෙවනුව ද කියයුත්තේ යි. ඉදින් දුරලයි නම් මේ දුරලීම මැනැවි. ඉදින් නො දුරලයි නම් දුකුළාඇවැත් වේ අසා නො කියත් නම් දුකුළාඇවැත් වේ. එ මහණතෙම සඟමැදට ද ඇද කියයුත්තේ ය. ආයුෂ්මත් තෙම නහමක් මෙසේ කියාවා. භික්‍ෂූහු නො ද ඡන්දගාමීහු ය. භික්‍ෂූහු නො ද ද්වෙෂගාමීහු ය. භික්‍ෂූහු නො ද මොහගාමීහු ය. භික්‍ෂූහු නො ද භයගාමීහු ය. ආයුෂ්මත් තෙම වනාහි කුලදූෂක ය. පාපසමාචාර ඇත්තේ ය. ආයුෂ්මත්හුගේ වැළිත් පාපසමාචාරයෝ දක්නා ද ලැබෙති, අසනු ද ලැබෙත්. ආයුෂ්මත්හු විසින් දූෂිත වූ කුලයෝ ද දක්නා ද ලැබෙති, අසනු ද ලැබෙත්. ආයුෂ්මත් තෙම මේ ආවාසයෙන් නික්ම යේවා. තා මෙහි විසීමෙන් කම් නැතැ'යි. දෙවනවට ද කියයුත්තේ ය. තෙවනවට ද කියයුත්තේ ය. ඉදින් දුරලා නම් මේ දුරලීම මැනවි. ඉදින් නො දුරලා නම් දුකුළාඇවැත් වේ. ඒ මහණ තෙම සමනුභාසන කම් කළයුත්තේ යි. මෙසේත් මහණෙනි, සමනුභාසන කම් කළයුත්තේ යි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම සඞ්ඝයා විසින් පබ්බාජනීය කර්මය කරනලද්දේ භික්‍ෂූන් ඡන්දගාමී බවට ද්වෙෂගාමී බවට මොහගාමී බවට භයගාමී බවට පමුණුවයි. හෙතෙම ඒ වස්තුව නො දුරලයි. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ ඒ වස්තුව දුරලීම පිණිස මෙනම් මහණහට සමනුභාසන කම් කරන්නේ ය. තෙල ඤත්ති යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම සඞ්ඝයා විසින් පබ්බාජනීය කර්මය කරණලද්දේ භික්‍ෂූන් ඡන්දගාමී බවට ද්වෙෂගාමී බවට මොහගාමී බවට භයගාමී බවට පමුණුවයි. හෙතෙම ඒ වස්තුව නො දුරලයි. සඞ්ඝ තෙමේ මෙනම් මහණහට ඒ වස්තුව දුරලීම පිණිස සමනුභාසන කම් කෙරෙයි. යම් ආයුෂ්මතක්හට මෙනම් මහණහට ඒ වස්තුහුගේ දුරලීම පිණිස සමනුභාසනය රුස්නේ නම් හෙතෙම තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රුස්නේ නම් හෙතෙම බණන්නේ යි.

දෙවනවට ද මෙපවත් කියමි ... තෙවනවට ද මෙපවත් කියමි ... සඞ්ඝයා විසින් මෙනම් මහණ තෙම ඒ වස්තුහුගේ දුරලීම පිණිස සමනුභාසනය කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුස්නේ ය. එහෙයින් මේ තුෂ්ණීම්භාවය යි. මෙය මෙසේ ධරමි"යි.

14. ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම්වදනින් ථුලැසි දෙකෙක් වෙයි. කම්වදන් අවසන්හි සඟවෙසෙස්ඇවැත් වේ. සඟවෙසෙස් අවදනාහට ඤත්තියෙන් වූ දුකුළා ද දෙකම්වදනින් වූ දෙථුලැසිය ද නවතිත්.(සන්සිඳෙත්).

**සඞ්ඝාදිසෙසොති** සඞ්ඝොව තස්සා ආපත්තියා පරිවාසං දෙති මූලාය පටිකස්සති මානත්තං දෙති අබ්භෙති, න සම්බහුලා, න එකපුග්ගලො. තෙන වුච්චති සඞ්ඝාදිසෙසොති. තස්සෙව ආපත්තිනිකායස්ස නාමකම්මං අධිවචනං. තෙනපි වුච්චති සඞ්ඝාදිසෙසොති.

15. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ වෙමතිකො න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී න පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස.

16. අනාපත්ති අසමනුභාසන්තස්ස, පටිනිස්සජ්ජන්තස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**කුලදූසකසික්ඛාපදං නිට්ඨිතං.**

17. උද්දිට්ඨා ඛො ආයස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, නව පඨමාපත්තිකා, චත්තාරො යාවතතියකා, යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා යාවතීහං ජානං පටිච්ඡාදෙති තාවතීහං තෙන භික්ඛුනා අකාමා පරිවත්ථබ්බං. පරිවුත්ථපරිවාසෙන භික්ඛුනා උත්තරි ඡාරත්තං භික්ඛු මානත්තාය පටිපජ්ජිතබ්බං. චිණ්ණමානත්තො භික්ඛු යත්ථ සියා වීසතිගණො භික්ඛුසඞ්ඝො, තත්ථ සො භික්ඛු අබ්භෙතබ්බො. එකෙනපි චෙ ඌනො වීසතිගණො භික්ඛුසඞ්ඝො තං භික්ඛුං අබ්භෙය්‍ය, සො ච භික්ඛු අනබ්භිතො. තෙ ච භික්ඛූ ගාරය්හා. අයං තත්ථ සාමීචි. තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථායස්මන්තො. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

**තෙරසකං නිට්ඨිතං**

**තස්සුද්දානං**

විස්සට්ඨි කායසංසග්ගං දුට්ඨුල්ලං අත්තකාමතං,
සඤ්චරිත්තං කුටී චෙව විහාරො ච අමූලකං.

කිඤ්චි දෙසඤ්ච භෙදො ච තස්සෙව අනුවත්තකා,
දුබ්බචං කුලදූසඤ්ච සඞ්ඝාදිසෙසා තෙරසාති.

## සඞ්ඝාදිසෙසකණ්ඩො නිට්ඨිතො

**සඞ්ඝාදිසෙසො** යනු: සඞ්ඝ තෙමේ ම ඒ ඇවැතට පිරිවෙස් දෙයි මූලට අදියි මානත දෙයි ආහ්වානය කෙරෙයි. භික්ෂූහු තිදෙනෙක් නො දෙත්. එක් පුද්ගලෙක් නො දේ. එයිනුදු කියනු ලැබෙයි. 'සඞ්ඝාදිසෙසො'යි. එ ම ඇවැත් මුළුවට නාමකර්ම යි අධිවචන යි. එයිනුදු කියනු ලැබෙයි 'සඞ්ඝාදිසෙසො'යි.

15. ධර්මකර්මයෙහි ධර්මකර්ම ය යන සංඥ ඇත්තේ (ලබ්ධිය) නො හරි නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතියේ නො හරී නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි අධර්මකර්ම ය යන සංඥ ඇතියේ නො හරී නම් සඟවෙසෙස්ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි ධර්මකර්ම ය යන සංඥ ඇතියේ නම් දුකුළාඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියේ නම් දුකුළාඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්ම ය යන සංඥ ඇතියේ නම් දුකුළාඇවැත් වේ.

16. සමනුභාසනකර්ම නො කරන්නාහට ද, හැරපියන්නාහට ද, උන්මත්තකයාහට ද, ආදිකම්මිකයාහට ද ඇවැත් නැති.

**කුලදූසක ශික්ෂාපදය නිමියේ යි.**

17. ආයුෂ්මත්වරුනි, තෙළෙස් සඟවෙසෙස් ඇවැත්හු උදෙසන ලදහු ම ය. ප්‍රථමාපත්තික නව දෙනෙක, යාවතතියක සතර දෙනෙකි. මහණ තෙම යම් සඟවෙසෙසුන් අතුරෙන් එක්තරා එක්තරා ඇවැතකට හෝ පැමිණ යම්තාක් දින දැන දැන සඟවා ද, ඒතාක් දින ඒ මහණහු විසින් නො කැමැත්තෙන් නමුදු පිරිවෙස් විසිය යුතුයි. වැස නිමවූ පිරිවෙස් ඇති මහණහු විසින් මත්තෙහි සරයක් භික්ෂූනට බුහුමන් පිණිස පිළිපැදිය යුතුයි. පිරූ මානත් ඇති මහණතෙම විංශද්වර්ගික භික්ෂුසඞ්ඝතෙමේ යම් සීමාවෙක්හි වන්නේ නම් එහි අබ්භානකර්මය කළයුත්තේ යි. එක්නමකිනුදු ඌනු වූ විංශද්වර්ගික භික්ෂුසඞ්ඝතෙමේ එමහණහු ඉදින් අබ්භානකර්මයෙන් කරන්නේ නම් ඒ මහණතෙමේත් අනබ්භිත වූයේ වෙයි. ඒ භික්ෂූහුත් ගැරහිය යුත්තාහු වෙති. මේ එහි සාමීචිධර්මය යි. එහිලා ආයුෂ්මතුන් විචාරමි. කිම, පිරිසුදුවූවහු ද?' දෙවනවට ද විචාරමි. කිම, පිරිසුදුවූවහු ද?' තෙවනවට ද විචාරමි. කිම, පිරිසුදු වූවහු ද? මෙහිලා ආයුෂ්මත්හු පරිශුද්ධයහ. එහෙයින් තුෂ්ණීම්භූත වෙති, තෙල නිහඬබව මෙසේ ධරමි.

**තෙරසකය නිමියේ යි.**

**උද්දානය**.

සුක්විසැට්ටි ය, කායසංසග්ග ය, දුට්ඨුල්ලවාච ය, අත්තකාමපාරිචරිය ය, සඤ්චරිත්ත ය, කුටිකාර ය, විහාරකාර ය, අමූල ය, අඤ්ඤභාගිය ය, සඞ්ඝ-භෙද ය, අනුවත්තක ය, දුබ්බච ය, කුලදූසක ය යි තෙළෙස් සඟ-වෙසෙස්හු වෙත්.

**සඞ්ඝාදිසෙස කාණ්ඩය නිමියේය.**

# 4.

# අනියතකණ්ඩං.

**ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ අනියතා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති:**

## 4. 1.

## පඨමඅනියතසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායී සාවත්ථියං කුලූපගො හොති. බහුකානි කුලානි උපසඞ්කමති. තෙන ඛො පන සමයෙන ආයස්මතො උදායිස්ස උපට්ඨාකකුලස්ස කුමාරිකා අඤ්ඤතරස්ස කුලස්ස කුමාරකස්ස දින්නා හොති. අථ ඛො ආයස්මා උදායී පුබ්බණ්හසමයං නිවා-සෙත්වා පත්තචීවරමාදාය යෙන තං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මනුස්සෙ පුච්ඡි: "කහං ඉත්ථන්නාමා"ති*. "දින්නා භන්තෙ අමුකස්ස කුලස්ස කුමාරකස්සා"ති.

2. තම්පි ඛො කුලං ආයස්මතො උදායිස්ස උපට්ඨාකං හොති. අථ ඛො ආයස්මා උදායී යෙන තං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මනුස්සෙ පුච්ඡි: "කහං ඉත්ථන්නාමා"ති. "එසාය්‍ය ඔවරකෙ නිසින්නා"ති. අථ ඛො ආයස්මා උදායී යෙන සා කුමාරිකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තස්සා කුමාරිකාය සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙසි කාලයුත්තං සමුල්ලපන්තො කාලයුත්තං ධම්මං භණන්තො.

3. තෙන ඛො පන සමයෙන විසාඛා මිගාරමාතා බහුපුත්තා හොති බහුනත්තා අරොගපුත්තා අරොගනත්තා අභිමඞ්ගලසම්මතා. මනුස්සා යඤ්ඤෙසු ඡනෙසු උස්සවෙසු විසාඛං මිගාරමාතරං පඨමං භොජෙන්ති. අථ ඛො විසාඛා මිගාරමාතා නිමන්තිතා තං කුලං අගමාසි. අද්දසා ඛො විසාඛා මිගාරමාතා ආයස්මන්තං උදායිං තස්සා කුමාරිකාය සද්ධිං එකං එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසින්නං. දිස්වාන ආයස්මන්තං උදායිං එතදවොච:

"ඉදං භන්තෙ නච්ඡන්නං නප්පතිරූපං, යං අය්‍යො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙති. කිඤ්චාපි භන්තෙ අය්‍යො අනත්ථිකො තෙන ධම්මෙන, අපි ච දුස්සද්ධාපයා අප්පසන්නා මනුස්සා"ති.

4. එවම්පි ඛො ආයස්මා උදායී විසාඛාය මිගාරමාතුයා වුච්චමානො නාදියි. අථ ඛො විසාඛා මිගාරමාතා නික්ඛමිත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි, යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායී මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙස්සතී"ති.

---

* තෙ එවමාහංසු. ම.ඡ.සං.

# 4.

# අනියත කාණ්ඩය.

**ඇවැත්නි, මේ අනියත ධර්මයෝ දෙදෙන උදෙසීමට එති:**

## 4. 1.

## පළමු අනියතශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් උදායී තෙරණුවෝ සැවැත්නුවරෙහි කුලූපග වෙත්. බොහෝ කුලයන් කරා එළඹෙත්. එසමයෙහි ආයුෂ්මත් උදායී තෙරණුවන්ගේ උපස්ථායක කුලයක් සතු කුමරියක් එක්තරා කුලයක් සතු කුමරකුට දින. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙරණුවෝ පෙරවරු වේලෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ ඒ කුලය වෙත එළඹියහ. එළඹ "මෙ නම් කුමරිය කොහි දැ?"යි මිනිසුන් විචාළහ: වහන්ස, අසෝ කුලය සතු කුමරකුට දිනැ"යි, ඒ මිනිස්සු කීහ.

2. ඒ කුලය ද ආයුෂ්මත් උදායී තෙරණුවන්ගේ උපස්ථායක වෙයි. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙරණුවෝ ඒ කුලය කරා එළඹියහ. එළඹ, "මෙ නම් කුමරිය කොහි දැ?"යි "මිනිසුන් විචාළහ. හිමියනි, තෙල කුමරිය ලැගුම් ගෙහි හුන"යි. ඔහු කීහ. එසඳ ආයුෂ්මත් උදායී තෙරණුවෝ ඒ කුමරිය කරා එළඹියහ. එළඹ එකලා වූයේ එකලා ව සිටි ඒ කුමරිය හා සමග රහසිගත ව සිට මෙවුන්දමට යොග්‍ය වූ පිළිසන් අස්නෙහි කල් සලකා පැවති බස් බෙණෙමින් කලට යුතු දහම් බෙණෙමින් නිෂද්‍යා කළහ.

3. එසමයෙහි මෘගාරිමාතෘ වූ විශාඛාවෝ බොහෝ දූ පුතුන් ඇතියහ. බොහෝ මුනුබුරන් ඇතියහ. නීරෙග දූ පුතුන් ඇතියහ. නීරෙග මුනුබුරන් ඇතියහ. උත්තම මඞ්ගල සම්මතයහ. මිනිස්හු දන ප්‍රදනයෙහි දී දින නියම ඇති ආවාහ විවාහ ආදි සැණෙහි දී දින නියම නැති (ඇසළ ඇ) මහ සැණෙහි දී මෘගාරිමාතෘ විශාඛාවන් පළමු කොට වළඳවත්. එ සඳ මෘගාරි-මාතෘ විශාඛාවෝ කැඳවන ලදු ව එකුල කරා ගියහ. මෘගාරිමාතෘ විශාඛාවෝ එකලා ව සිටි ඒ කුමරිය හා සමග ආයුෂ්මත් උදායී තෙරණුවන් රහසිගත ව මෛථුනකර්මයට යෝග්‍යවූ පිළිසන් අස්නෙක එකලා ව හුන්නවුන් දුටහ. දැක ආයුෂ්මත් උදායී තෙරණුවන්ට මෙ පවත් සැළ කළහ:

"යම් හෙයකින් හිමිහු එකලා ව සිටි මිනිස් මාගමක හා සමග රහසිගත ව මෙවුන්දමට යොග්‍ය වූ පිළිසන් අස්නෙක එකලා ව සිට නිෂද්‍යා කෙරෙත් ද, වහන්ස, තෙල අයොග්‍ය ය, නුසුදුසු ය. වහන්ස, හිමිහු ඒ මෙවුන්දමින් අර්ථ නැති වුව ද වැලිත් නොපහන් මිනිස්සු නො හදහවාලිය හෙති"යි.

4. මෘගාරිමාතෘ විශාඛාව විසින් මෙ ලෙසිනුත් ආයුෂ්මත් උදායී තෙරණුවෝ කියනු ලබන්නාහු දු නොපිළිගත්හ. එසඳ මෘගාරිමාතෘ විශාඛාවෝ නික්ම ගොස් භික්ෂූන්ට මෙ පවත් සැළ කළහ. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ වෙත් ද, ඔහු අවඥ කෙරෙත්, නුගුණ බෙණෙත්, අයුණු පතුරුවත්: "ආයුෂ්මත් උදායී තෙරණුවෝ එකලා ව සිටි මිනිස් මාගමක හා සමග රහසි-ගත ව කර්මක්ෂම වූ පිළිසන් අස්නෙක එකලා ව සිට කෙසේ නිෂද්‍යා කළාහු ද" කියා ය.

5. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං: “සච්චං කිර ත්වං උදායි මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙසී”?ති “සච්චං භගවා.” විගරහි බුද්ධො භගවා: “කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**“යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය, පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා. යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො. අයං ධම්මො අනියතො”ති.**

6. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**මාතුගාමො** නාම: මනුස්සිත්ථී. න යක්ඛී. න පෙතී. න තිරච්ඡානගතා. අන්තමසො තදහුජාතාපි දාරිකා. පගෙව මහත්තරී.

**සද්ධින්ති** එකතො.

**එකො එකායාති** භික්ඛු චෙව හොති මාතුගාමො ච.

**රහො** නාම: චක්ඛුස්ස රහො සොතස්ස රහො. චක්ඛුස්ස රහො නාම: න සක්කා හොති අක්ඛිං වා නිඛණීයමානෙ භමුකං වා උක්ඛිපියමානෙ සීසං වා උක්ඛිපියමානෙ පස්සිතුං. සොතස්ස රහො නාම න සක්කා හොති පකතිකථා සොතුං.

**පටිච්ඡන්නං** නාම: ආසනං කුට්ටෙන වා කවාටෙන වා කිලඤ්ජෙන වා සාණිපාකාරෙන වා රුක්ඛෙන වා ථම්භෙන වා කොත්ථළියා වා යෙන කෙනචි පටිච්ඡන්නං හොති.

**අලංකම්මනියෙති** සක්කා හොති මෙථුනං ධම්මං පටිසෙවිතුං.

**නිසජ්ජං කප්පෙය්‍යාති** මාතුගාමෙ නිසින්නෙ භික්ඛු උපනිසින්නො වා හොති උපනිපන්නො වා. භික්ඛු නිසින්නෙ මාතුගාමො උපනිසින්නො වා හොති උපනිපන්නො වා. උභො වා නිසින්නා හොන්ති උභො වා නිපන්නා

**සද්ධෙය්‍යවචසා** නාම: ආගතඵලා අභිසමෙතාවිනී විඤ්ඤාතසාසනා.

5. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ: "උදායිය, තෝ එකලා වූ මිනිස් මාගමක හා සමග රහසිගත ව කම්සෑම වූ පිළිසන් අස්නෙක එකලා ව නිෂද්‍යා කෙළෙහි ල යනු සැබෑ ද?" යි අසා වදාල සේක. "භාග්‍යවතුන් වහන්ස, සැබවෙකැ" යි හේ කීය. භාග්‍යවත් බුදුහු ගැරහූ කළහ: "මොඝපුරුෂය, තෝ එකලා වූ මිනිස් මාගමක හා සමග කම්සෑම වූ පිළිසන් අස්නෙක රහසිගත ව එකලා ව කෙසේ නිෂද්‍යා කෙළෙහි ද, මොඝ-පුරුෂය, මෙය නොපහන් මිනිසුන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසවු:

**"යම් මහණෙක් එකලා වූ මිනිස් මාගමක හා සමග රහසිගත ව කම්සෑම වූ පිළිසන් අස්නෙක එකලා ව නිෂද්‍යා කරන්නේ වේ ද, හැදහිය යුතු බස් ඇති උවැසියක් ඒ මහණහු දැක පරිජියෙන් වේව යි සඟවෙසෙසින් වේව යි පචිතියෙන් වේව යි තුන් ඇවැත් අතුරින් එක්තරා එකෙකින් දෙස් තබා බෙණේ නම්, නිෂද්‍යාව පිළිනා කරණ මහණ පරිජියෙන් වේව යි සඟවෙසෙසින් වේව යි පචිතියෙන් වේව යි තුන් ඇවැත් අතුරින් එක්තරා එකෙකින් කරවිය යුතු. හැදහිය යුතු වචන ඇති ඒ උවැසිය යම් ඇවැතකින් හෝ දෙස් තබා බෙණේ නම්, ඒ මහණ ඒ ඇවැතින් කරවිය යුතු ය. මේ ඇවැත අනියත යි"**

6. **යො පන**-යි යමෙක්, යම් බදු වූවෙක් ...

**භික්ඛූ යි** ... මෙතෙම මේ අර්ථයෙහි දී භික්ෂු ය යි දක්වනලදී.

**මාතුගාම** නම්: මිනිස් මාගම යි. යකින්නක් නො වෙයි. ප්‍රේතියක් නො වෙයි. තිරිසන් ගිය මාගමක් නො වෙයි. යටත් පිරිසෙයින් එදවස උපන් දැරිය ද වෙයි. ඉමහත් සත්‍රිය (මැහැලි) කැලම ය. (=කියනු ම කීම).

**සද්ධිං** යි එකතු ය.

**එකො එකාය** යි මහණෙක් ද මාගමෙක් ද වෙයි.

**රහො** නම්: ඇසට රහස, කණට රහස. ඇසට රහස නම්: කනන කල ඇස වේව යි නඟන කල බැම වේව යි නඟන කල හිස වේව යි දක්නට නොහැකි වෙයි. කණට රහස නම්: පියවි බස් අසන්නට නො හැකි වෙයි.

**පටිච්ඡන්න** නම්: අස්න බිත්තියෙන් හෝ කවුළු දෙරින් හෝ කලාලින් හෝ කඩතුරා පවුරින් හෝ රුකින් හෝ කණුවෙන් හෝ පැලලිපොතුයෙන් හෝ යම් කිසිවකින් වැසුනේ වෙයි.

**අලංකම්මනියෙ** යි මෙවුන්දම් සෙවුනට හැක්කේ වෙයි.

**නිසජ්ජං කප්පෙය්‍ය** යි මාගම හුන්කල මහණ ලං ව හුන්නේ හෝ වෙයි. ලං ව හොත්තේ හෝ වෙයි. මහණ හුන්කල මාගම ලං ව හුන්නී හෝ වෙයි. ලං ව හොත්තී හෝ වෙයි. දෙ දෙනා ම හෝ හුන්නාහු වෙති. දෙ දෙනා ම හෝ හොත්තාහු වෙති.

**සද්ධෙය්‍ය වචසා** නම්: ලැබූ සෝවාන් ඵල ඇති පිළිවිදි සිවුසස් ඇති දත් සසුන් ඇති (උවැසි).

**උපාසිකා** නාම: බුද්ධං සරණං ගතා ධම්මං සරණං ගතා සඞ්ඝං සරණං ගතා.

**දිස්වා**ති පස්සිත්වා.

**තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය, පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා.** නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා. යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිසින්නො මාතුගාමස්ස මෙථුනං ධම්මං පටිසෙවන්තො"ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිසින්නො මාතුගාමස්ස මෙථුනං ධම්මං පටිසෙවන්තො"ති. සො චෙ එවං වදෙය්‍ය: "සච්චාහං නිසින්නො නො ච ඛො මෙථුනං ධම්මං පටිසෙවි"න්ති. නිසජ්ජාය කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිසින්නො මාතුගාමස්ස මෙථුනං ධම්මං පටිසෙවන්තො"ති. සො චෙ එවං වදෙය්‍ය: "නාහං නිසින්නො අපි ච ඛො නිපන්නො"ති, නිපජ්ජාය කාරෙතබ්බො. සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිසින්නො මාතුගාමස්ස මෙථුනං ධම්මං පටිසෙවන්තො"ති. සො චෙ එවං වදෙය්‍ය: "නාහං නිසින්නො, අපි ච ඛො ඨිතො"ති. න කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිපන්නො මාතුගාමස්ස මෙථුනං ධම්මං පටිසෙවන්තො"ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිපන්නො මාතුගාමස්ස මෙථුනං ධම්මං පටිසෙවන්තො"ති. සො චෙ එවං වදෙය්‍ය: "සච්චාහං නිපන්නො, නො ච ඛො මෙථුනං ධම්මං පටිසෙවි"න්ති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිපන්නො. අපි ච ඛො නිසින්නො"ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිපන්නො. අපි ච ඛො ඨිතො"ති. න කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිසින්නො මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තො"ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො -පෙ- "සච්චාහං නිසින්නො, නො ච ඛො කායසංසග්ගං සමාපජ්ජි"න්ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිසින්නො, අපි ච ඛො නිපන්නො"ති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිසින්නො අපි ච ඛො ඨිතො"ති. න කාරෙතබ්බො. සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො නිපන්නො මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තො"ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො -පෙ- "සච්චාහං නිපන්නො, නො ච ඛො කායසංසග්ගං සමාපජ්ජි"න්ති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිපන්නො. අපි ච ඛො නිසින්නො"ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිපන්නො, අපි ච ඛො ඨිතො"ති. න කාරෙතබ්බො.

**උපාසිකා** නම්: බුදුන් සරණ ගියා ය දහම් සරණ ගියා ය සඟුන් සරණ ගියා ය

දිස්වාසී දූක

**පරිජියෙන් වේව සි සඟවෙසෙසින් වේව සි පචිතියෙන් වේව සි තුන් ඇවැතුන් අතුරින් එක්තරා එකෙකින් කියා නම්,** තිඹලූව පිළිත කරණ මහණ පරිජියෙන් වේව සි සඟවෙසෙසින් වේව සි පචිතියෙන් වේව සි තුන් ඇවැත් අතුරින් එක්තරා එකෙකින් කරවිය යුතු ය. හැදහිය යුතු බස් ඇති ඒ උවැසි යම් ඇවැතකින් කියා නම්, ඒ මහණ ඒ ඇවැතින් කරවිය යුතු ය.

ඒ උවැසි "මා විසින් හිමිහු මාගමට මෙවුන්දම් සෙවුමින් හුන්නාහු දක්නා ලදහ"සි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ද එය පිළිත කෙරෙයි නම් පරිජිඇවැතින් කරවිය යුතුයි.

ඒ උවැසි "මා විසින් හිමිහු මාගමට මෙවුන්දම් සෙවුමින් හුන්නාහු දක්නා ලදහ"සි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ඉදින් සැබැව, මම හුන්නෙමි මෙවුන්දම් නො ද සෙවීමි"සි. මෙසේ කියා නම්: තිඹලූයෙන් කරවිය යුතු ය.

ඒ උවැසි "මා විසින් හිමිහු මාගමට මෙවුන්දම් සෙවුමින් හුන්නාහු දක්නා ලදහ"සි. මෙසේ කියා නම්: ඒ මහණ "මම හුහුන්නෙමි වැලිත් හොත්තෙමි"සි. ඉදින් මෙසේ කියා නම්: තිපත්‍යායෙන් කරවිය යුතු ය. ඒ උවැසි "මා විසින් හිමිහු මාගමට වෙවුන්දම් සෙවුමින් හුන්නාහු දක්නා ලදහ"සි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ "මම හුහුන්නෙමි වැලිත් සිටියෙමි"සි. ඉදින් මෙසේ කියා නම්: නොකරවිය යුතු ය.

ඒ උවැසි "මා විසින් හිමිහු මාගමට මෙවුන්දම් සෙවුමින් වැද හොත්තාහු දක්නා ලදහ"සි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ද එය පිළිත කෙරෙයි නම්, පරිජිඇවැතින් කරවිය යුතු ය. ඒ උවැසි "මා විසින් හිමිහු මාගමට මෙවුන්දම් සෙවුමින් හොත්තාහු දක්නා ලදහ"සි ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ "සැබව, මම හොත්තෙමි. මෙවුන්දම් නො ද සෙවීමි"සි. ඉදින් මෙසේ කියා නම්: තිපත්‍යායෙන් කරවිය යුතු ය ..."මම නො හොත්තෙමි. වැලිත් හුන්නෙමි"සි. කියා නම් තිඹලූයෙන් කරවිය යුතු ය. ... "මම නොහොත්තෙමි., වැලිත් සිටියෙමි"සි. කියා නම් නොකරවිය යුතු ය

ඒ උවැසි "මා විසින් හිමිහු මාගමක හා සමග කායසංසගීයට සමවදිමින් හුන්නාහු දක්නා ලදහ"සි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ද එය පිළිත කෙරෙයි නම්, කායසංසගී ඇවැතින් කරවිය යුතු ය..."සැබව, මම හුන්නෙමි. කායසංසගීයට නො ද සමවැදිමි"සි. සේ කියා නම් තිඹලූයෙන් කරවිය යුතු ය. ... "මම හුහුන්නෙමි, වැලිත් හොත්තෙමි"සි. කියා නම් තිපත්‍යායෙන් කරවිය යුතු ය. ... "මම හුහුන්නෙමි, වැලිත් සිටියෙමි"සි. කියා නම් නො කරවිය යුතු ය. ඒ උවැසි "මා විසින් හිමිහු මාගමක හා සමග කායසංසගීයෙහි සමවදිමින් හොත්තාහු දක්නා ලදහ"සි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණද ඒ පිළිත කෙරෙයි නම්, කායසංසගී ඇවැතින් කරවිය යුතු ය. ... "සැබව, මම හොත්තෙමි. කායසංසගීයට නො ද සමවැදිමි"සි. කියා නම් තිපත්‍යායෙන් කරවිය යුතු ය. ... "මම නො හොත්තෙමි, වැලිත් හුන්නෙමි" කියා නම් තිඹලූයෙන් කරවිය යුතු ය. ... "මම නොහොත්තෙමි, වැලිත් සිටියෙමි"සි, කියා නම් නො කරවිය යුතු ය.

සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසින්නො"ති. සො ච තං පටිජානාති, නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිසින්නො, අපි ච ඛො නිපන්නො"ති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිසින්නො අපි ච ඛො ඨිතො"ති. න කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: "අය්‍යො මයා දිට්ඨො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිපන්නො"ති. සො ච තං පටිජානාති, නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිපන්නො අපි ච ඛො නිසින්නො"ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- "නාහං නිපන්නො අපි ච ඛො ඨිතො"ති. න කාරෙතබ්බො.

**අනියතොති** න නියතො පාරාජිකං වා සඞ්ඝාදිසෙසො වා පාචිත්තියං වා.

7. ගමනං පටිජානාති නිසජ්ජං පටිජානාති ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං පටිජානාති නිසජ්ජං න පටිජානාති ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං පටිජානාති නිසජ්ජං පටිජානාති ආපත්තිං න පටිජානාති, නිසජ්ජාය කාරෙතබ්බො. ගමනං පටිජානාති නිසජ්ජං න පටිජානාති ආපත්තිං න පටිජානාති, න කාරෙතබ්බො.

ගමනං න පටිජානාති නිසජ්ජං පටිජානාති ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං න පටිජානාති නිසජ්ජං න පටිජානාති, ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං න පටිජානාති නිසජ්ජං පටිජානාති, ආපත්තිං න පටිජානාති, නිසජ්ජාය කාරෙතබ්බො. ගමනං න පටිජානාති. නිසජ්ජං න පටිජානාති ආපත්තිං න පටිජානාති, න කාරෙතබ්බොති.

පඨමඅනියතසික්ඛාපදං නිට්ඨිතං.

---

## 4. 2

## දුතියඅනියතසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායී භගවතා පටික්ඛිත්තං මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙතුන්ති තස්සායෙව කුමාරිකාය සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසි. කාලයුත්තං සමුල්ලපන්තො කාලයුත්තං ධම්මං භණන්තො. දුතියම්පි ඛො විසාඛා මිගාරමාතා නිමන්තිතා තං කුලං අගමාසි. අද්දසා ඛො විසාඛා මිගාරමාතා ආයස්මන්තං උදායිං තස්සායෙව කුමාරිකාය සද්ධිං එකං එකාය රහො නිසින්නං, දිස්වාන ආයස්මන්තං උදායිං එතදවොච: "ඉදං භන්තෙ නච්ඡන්නං නප්පතිරූපං, යං අය්‍යො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙති. කිඤ්චාපි භන්තෙ අය්‍යො අනත්ථිකො තෙන ධම්මෙන, අපි ච දුස්සද්ධාපයා අප්පසන්නා මනුස්සා"ති. එවම්පි ඛො ආයස්මා උදායී විසාඛාය මිගාරමාතුයා වුච්චමානො නාදියි.

ඒ උවැසි "මා විසින් හිමිහු එකලාව සිටි මාගමක හා සමඟ රහසිගත ව කම්ක්‍ෂම වූ පිළිසන් අස්නෙක එකලා ව හුන්නාහු දක්නා ලදහ"යි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ද එය පිළිත කෙරෙයි නම්, තිඝණ්ණයෙන් කරවිය යුතු ය. ..."මම හුහුන්නෙමි, වැලිත් හොත්තෙමි"යි, කියා නම් නිපත්‍යායෙන් කරවියයුතු ය. .... "මම හුහුන්නෙමි, වැලිත් සිටියෙමි"යි, කියා නම් නො කරවිය යුතු ය.

ඒ උවැසි "මා විසින් හිමිහු එකලා ව සිටි මාගමක හා සමග රහසි-ගත ව කම්ක්‍ෂම වූ පිළිසන් අස්නෙක එකලා ව හොත්තාහු දක්නා ලදහ"යි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ද ඒ පිළිත කෙරෙයි නම් නිපත්‍යායෙන් කරවියයුතු ය. ... "මම නොහොත්තෙමි. වැලිත් හුන්නෙමි"යි, කියා නම්, තිඝණ්ණයෙන් කරවිය යුතු ය. ... "මම නොහොත්තෙමි වැලිත් සිටියෙමි"යි, කියා නම්, නො කරවිය යුතුය.

**අනියතො** යනු: පරිජි යෑ හෝ සඝාවශෙස යෑ හෝ පචිති යෑ හෝ නියත නො වූයේ.

7. ගමන පිළිත කෙරේ නම් හිඳීම පිළිත කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම් ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත කෙරේ නම් හිඳීම පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම් ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත කෙරේ නම් හිඳීම පිළිත කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම් හිඳීම් නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත කෙරේ නම් හිඳීම පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම් නො කරවිය යුත්තේ යි.

ගමන පිළිත නො කෙරේ නම් හිඳීම පිළිත කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම් ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත නො කෙරේ නම් හිඳීම පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම් ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත නො කෙරේ නම් හිඳීම පිළිත කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම් හිඳීම් නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත නො කෙරේ නම් හිඳීම පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම් නො කරවිය යුත්තේ යි.

**පළමු වැනි අනියතශික්‍ෂා පදය නිමි.**

---

## 4. 2

## දෙවැනි අනියතශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරමෙහි වැඩ වෙසෙති. තවද එසමයෙහි ආයුෂ්මත් උදායී තෙරණුවෝ එකලා වූ මිනිස්මාගමක හා රහසිගත ව කම්ක්‍ෂම වූ පිළිසන් අස්නෙක එකලා ව තිඝණ්ණ කිරීම භාග්‍යවතුන් විසින් ප්‍රතික්‍ෂෙප කරණ ලද්දැ'යි එකලා වූ එ මැ කුමරිය සමග එකලා ව රහසිගත ව කලට සුදුසු තෙපුල් බෙණෙමින් කලට සුදුසු දහම් බෙණෙමින් හුන්හ. දෙවන වට ද මිගාරිමාතෘ විශාඛා තොමෝ කැඳවන ලදු ව ඒ කුලයට ගියා ය. ඉක්බිති මිගාරිමාතෘ විශාඛා තොමෝ ආයුෂ්මත් උදායී තෙරණුවන් එකලා වූ එ මැ කුමරිය සමග එකලා ව රහසිගත ව හුන්නවුන් දුටු. දැක ආයුෂ්මත් උදායී තෙරණුවන්ට 'යම් හෙයකින් හිමිහු එකලා වූ මාගමක හා සමග එකලා ව රහසිගත ව තිඝණ්ණ කෙරෙත් ද, වහන්ස, මේ අයොග්‍ය ය. නුසුදුසු ය. වහන්ස, හිමිහු ඒ මෛථුන්දම්න් අර්ථ නැත්තාහු නමුදු වැළිත් නො පහන් මිනිස්හු කදහවාලිය නො හෙති'යි. මෙබස් කිවු ය. ආයුෂ්මත් උදායී තෙරණුවෝ මිගාරිමාතෘ විශාඛාව විසින් මෙසේත් කියනු ලබන්නාහු නො පිළිගත්හ.

2. අථ ඛො විසාඛා මිගාරමාතා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායී මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙස්සතී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං "සච්චං කිර ත්වං උදායී මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසී"?ති "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙස්සසි, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ".

**"නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති නාලංකම්මනියං, අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං. යො පන භික්ඛු තථාරූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, නිසජ්ජං භික්ඛු පටිජානමානො ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො. අයම්පි ධම්මො අනියතො"ති.**

3. **නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොතීති** අපටිච්ඡන්නං හොති, කුඩ්ඩෙන වා කවාටෙන වා කිලඤ්ජෙන වා සාණිපාකාරෙන වා රුක්ඛෙන වා ථම්භෙන වා කොත්ථලියා වා යෙන කෙනචි අපටිච්ඡන්නං හොති.

**නාලංකම්මනියන්ති** න සක්කා හොති මෙථුනං ධම්මං පටිසෙවිතුං.

**අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුන්ති** සක්කා හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං.

**යො පනාති** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**තථාරූපෙ ආසනෙති** එවරූපෙ ආසනෙ

**මාතුගාමො** නාම: මනුස්සිත්ථී, න යක්ඛී න පෙතී න තිරච්ඡානගතා.

විඤ්ඤූ පටිබලා සුභාසිතදුබ්භාසිතං දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං.

**සද්ධින්ති** එකතො.

**එකො එකායාති** භික්ඛු චෙව හොති මාතුගාමො ච.

**රහො** නාම: චක්ඛුස්ස රහො සොතස්ස රහො. චක්ඛුස්ස රහො නාම න සක්කා හොති අක්ඛිං වා නිඛණියමානෙ භමුකං වා උක්ඛිපියමානෙ සීසං වා උක්ඛිපියමානෙ පස්සිතුං. සොතස්ස රහො නාම න සක්කා හොති පකතිකථා සොතුං.

2. ඉක්බිති මාගාරිමාතෘ විශාඛාවෝ තීක්ම ගොස් භික්ෂූන්ට මෙපවත් දැන්වූහ: යම් මහණ කෙනෙක් අලෙපවජ වෙත් ද ඔහු අවමන් කෙරෙති. අපුණ්‍ය කියති, දෙස් පහල කෙරෙත්. 'කිසෙසින් නම් ආයුෂ්මත් උදයී තෙරණුවෝ එකලා වූ මාගමක හා සමග එකලා ව රහසිගත ව නිෂද්‍ය කලෝ දැ'?යි ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. 'සැබවෙක් ද උදයී, තෝ එකලා වූ මිනිස් මාගමක හා සමග එකලා ව රහසිගත ව නිෂද්‍ය කෙළෙහි දැ'යි. භාග්‍යවත්හු පුළුවූත්හ. "සැබැව භාග්‍යවතුන් වහන්ස", භාග්‍යවත් බුදුහු ගර්හා කළහ. 'කෙසේ නම් තුච්ඡපුරුෂය, තෝ එකලා වූ මිනිස් මාගමක හා සමග එකලා ව රහසිගත ව නිෂද්‍ය කෙළෙහි ද, තුච්ඡපුරුෂය, තෙල නො පහදුන්නන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු.

**"අස්න ප්‍රතිච්ඡන්න නො වූයේ ම වේ ද කර්මයොග්‍ය නො වේ ද? මිනිස්මාගමකට තුළුල්තෙපුලින් කියන්නට යොග්‍ය වේ ද, යම් මහණෙක් එබඳු අස්නෙක එකලා වූ මාගමක හා සමග එකලාව රහසිගත ව නිෂද්‍ය කෙරේ නම් හැදැහියයුතු වචන ඇති උවැසියක් තොමෝ ඒ මහණහු දැක සඟාවශෙසයින් හෝ පචිත්තියෙන් හෝ දෙ ඇවැත් අතුරින් එක්තරයෙකින් කියන්නී නම් මහණ තෙම නිෂද්‍යව පිළින් කරන්නේ සඟාවශෙසයින් හෝ පචිත්තියෙන් හෝ දෙ ඇවැත් අතුරින් එක්තරයෙකින් පිළියම් කරවිය යුත්තේය. හැදැහියයුතු වචන ඇති ඒ උවැසි තොමෝ යමෙකින් හෝ කියන්නී නම් ඒ මහණ තෙම ඒ ඇවැතින් හෝ පිළියම් කරවිය යුත්තේ ය. මේ ධර්මය ද අනියත වේ."**

3. **නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති** යනු: නො වැසුනේ වෙයි: බිත්තියෙන් හෝ කවුළුයෙන් හෝ කලාලින් හෝ කඩතුරාපවුරින් හෝ රුකින් හෝ ටැඹින් හෝ පැලලිපොතුයෙන් හෝ යම් කිසිවකින් වැසුනේ වෙයි.

**නාලං කම්මනියං** යනු: මෙවුන්දම් සෙවුනට නො හැකි වෙයි.

**අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං** යනු: මිනිස්මාගමකට තුළුල්තෙපුලින් කියන්නට හැකි වෙයි.

**යො පන** යනු: යමෙක් යම් බඳුයෙක් ... **භික්ඛු** යනු ... මේ තෙම මේ අර්ථයෙහි 'භික්ඛු'යි අදහස් කරණ ලදී.

**තථාරූපෙ ආසනෙ** යනු: එබඳු අස්නෙක.

**මාතුගාම නම්**: මිනිස්මාගම, යකින්නක් නො වෙයි. ප්‍රෙතියක් නො වෙයි, තිරිසන්ගිය මාගමක් නො වෙයි. නුවණැති වූවා සුබැසි දුබැසි තුළුල් නො තුළුල් තෙපුල් දැනගන්නට ප්‍රතිබල වූවා වෙයි.

**සද්ධිං** යනු: එකට.

**එකො එකාය** යනු: මහණෙක් ද මාගමක් ද වෙයි.

**රහො නම්**: ඇසට රහස, කණට රහස. ඇසට රහස නම්: ඇස කසන කල්හි බැම හෝ නහන කල්හි හිස හෝ නගන කල්හි දක්නට නො හැකි වෙයි. කණට රහස නම්: පියවි බස් අසන්නට නො හැකි වෙයි.

**නිසජ්ජං කප්පෙය්‍යාති** මාතුගාමෙ නිසින්නෙ භික්ඛු උපනිසින්නො වා හොති උපනිපන්නො වා, භික්ඛු නිසින්නෙ මාතුගාමො උපනිසින්නො වා හොති උපනිපන්නො වා, උභො වා නිසින්නා හොන්ති උභො වා නිපන්නා.

**සද්ධෙය්‍යවචසා** නාම: ආගතඵලා අභිසමෙතාවිනී විඤ්ඤාතසාසනා.

**උපාසිකා** නාම: බුද්ධං සරණං ගතා ධම්මං සරණං ගතා සඞ්ඝං සරණං ගතා.

**දිස්වාති** පස්සිත්වා.

**තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා** නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: “අය්‍යො මයා දිට්ඨො නිසින්නො මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තො”ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. සා චෙ එවං වදෙය්‍ය: “අය්‍යො මයා දිට්ඨො නිසින්නො මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තො”ති. සො චෙ එවං වදෙය්‍ය: “සච්චාහං නිසින්නො නො ච ඛො කායසංසග්ගං සමාපජ්ජි”න්ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිසින්නො අපි ච ඛො නිපන්නො”ති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිසින්නො අපි ච ඛො ඨිතො”ති. න කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: “අය්‍යො මයා දිට්ඨො නිපන්නො මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තො”ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො -පෙ- “සච්චාහං නිපන්නො නො ච ඛො කායසංසග්ගං සමාපජ්ජින්ති”. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිපන්නො අපි ච ඛො නිසින්නො”ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිපන්නො අපි ච ඛො ඨිතො”ති. න කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: “අය්‍යස්ස මයා සුතං නිසින්නස්ස මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසන්තස්සා”ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො -පෙ- “සච්චාහං නිසින්නො නො ච ඛො දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසි”න්ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිසින්නො අපි ච ඛො නිපන්නො”ති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිසින්නො අපි ච ඛො ඨිතො”ති. න කාරෙතබ්බො.

**නිසජ්ජං කප්පෙය්‍ය** යනු: මාගම හුන් කල මහණ තෙම වැළතු හුන්නේ හෝ වෙයි, වැළත හොත්තේ හෝ වෙයි, මහණ හුන් කල්හි මාගම වැළත හුන්නේ හෝ වෙයි. වැළත හොත්තේ හෝ වෙයි. දෙදෙන හෝ හුන්නාහු වෙති. දෙදෙන හෝ හොත්තාහු වෙති.

**සද්ධෙය්‍යවචසා** නම්: පැමිණි සෝවාන් ඵල ඇති පිළිවිදි සිවුසස් ඇති දත් සසුන් ඇති (උවැසි.)

**උපාසිකා** නම්: බුදුන් සරණ ගියා ය, දහම් සරණ ගියා ය, සඟුන් සරණ ගියා ය.

**දිස්වා** යනු: දැක.

**සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා ද්වින්නං අඤ්ඤතරෙන** ... **සඞ්ඝවෙසෙසින් වේවයි පචිතියෙන් වේවයි දෙ ඇවැත් අතුරින් එක්තරයෙකින් කියා** නම් මහණ තෙම නිඟඬුව පිළිත කරණුයේ සඟ-වෙසෙසින් වේවයි පචිතියෙන් වේවයි දෙ ඇවැත් අතුරින් එක්තරයෙකින් පිළියම් කරවිය යුත්තේ ය. ඒ හැදැහියයුතු වචන ඇති උවැසි තොමෝ යමෙකින් කියා නම් ඒ මහණ තෙම එයින් හෝ පිළියම් කරවිය යුත්තේ යි.

ඒ උවැසි 'හිමිහු මාගමක හා කායසංසග්ගයට සමවදිමින් හුන්නාහු මා විසින් දක්නා ලදහ'යි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ තෙමේ එය පිළිත කෙරේ නම් (සඟවෙසෙස්) ඇවැතින් කරවිය යුත්තේ ය. ඒ උවැසි ඉදින් 'හිමිහු මාගමක හා කායසංසග්ගයට සමවදිමින් හුන්නාහු මාවිසින් දක්නා ලදහ'යි මෙසේ කියා නම්: ඒ මහණ 'සැබැව මම හුන්නෙමි. එතෙකුදුවත් කායසංසග්ගයට නො සමවත්මි' යි. ඉදින් මෙසේ කියා නම්: නිඟඬු නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... මම නිඟඬු නො කෙළෙමි. එතෙකුදුවත් හොත්තෙමි'යි ශය්‍යා නිමිති වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම නිඟඬු නො කෙළෙමි. එතෙකුදුවත් සිටියෙමි'යි. නො කරවිය යුත්තේ යි.

ඒ උවැසි 'හිමිහු මාගමක හා කායසංසග්ගයට සමවදිමින් හොත්තාහු මා විසින් දක්නා ලදහ'යි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ද එය පිළිත කෙරේ නම්, ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'සැබව මම හොත්තෙමි. 'එතෙකුදුවත් කායසංසග්ගයට නො සමවත්මි'යි. කියා නම් ශය්‍යා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම නො හොත්තෙමි එතෙකුදුවත් නිඟඬු කෙළෙම්'යි කියා නම්, නිඟඬු නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම නො හොත්තෙමි එතෙකුදුවත් සිටියෙමි'යි. කියාතම්, නො කරවිය යුත්තේ යි.

ඒ උවැසි 'හිමියන් මාගමකට තුළුල් තෙපුලින් කියමින් හුන්නවුන් මා විසින් අස ලද'යි. ඉදින් මෙසේ කියා නම්: ඒ මහණ ද එය පිළිත කෙරේ නම්, ඇවැතින් කරවිය යුත්තේ ය. ... සැබව මම හුන්නෙමි එතෙකුදුවත් තුළුල් තෙපුලින් නො කීම්'යි. කියා නම්, නිඟඬු නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම නිඟඬු නො කෙළෙම් එතෙකුදුවත් ශයනය කෙළෙම්'යි කියා නම්, ශය්‍යා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම නිඟඬු නො කෙළෙමි. එතෙකුදුවත් සිටියෙම්'යි. කියා නම්, නො කරවිය යුත්තේ යි.

සා චෙ එවං වදෙය්‍ය: “අය්‍යස්ස මයා සුතං නිපන්නස්ස මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසන්තස්සා”ති. සො ච තං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො -පෙ- “සච්චාහං නිපන්නො නො ච ඛො දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසි”න්ති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිපන්නො අපි ච ඛො නිසින්නො”ති. නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිපන්නො අපි ච ඛො ඨිතො”ති. න කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: “අය්‍යො මයා දිට්ඨො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසින්නො”ති. සො ච තං පටිජානාති, නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිසින්නො අපි ච ඛො නිපන්නො”ති. නිපජ්ජාය කාරෙතබ්බො: -පෙ- “නාහං නිසින්නො අපි ච ඛො ඨිතො”ති, න කාරෙතබ්බො.

සා චෙ එවං වදෙය්‍ය: “අය්‍යො මයා දිට්ඨො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිපන්නො”ති. සො ච තං පටිජානාති. නිපජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිපන්නො අපි ච ඛො නිසින්නො”ති, නිසජ්ජාය කාරෙතබ්බො -පෙ- “නාහං නිපන්නො අපි ච ඛො ඨිතො”ති, න කාරෙතබ්බො.

**අයම්පීති** පුරිමං උපාදාය වුච්චති.

**අනියතොති** න නියතො සඞ්ඝාදිසෙසො වා පාචිත්තියං වා.

4. ගමනං පටිජානාති නිසජ්ජං පටිජානාති ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං පටිජානාති නිසජ්ජං න පටිජානාති ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං පටිජානාති නිසජ්ජං පටිජානාති ආපත්තිං න පටිජානාති, නිසජ්ජාය කාරෙතබ්බො. ගමනං පටිජානාති නිසජ්ජං න පටිජානාති ආපත්තිං න පටිජානාති, න කාරෙතබ්බො. ගමනං න පටිජානාති නිසජ්ජං පටිජානාති, ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං න පටිජානාති නිසජ්ජං න පටිජානාති ආපත්තිං පටිජානාති, ආපත්තියා කාරෙතබ්බො. ගමනං න පටිජානාති, නිසජ්ජං පටිජානාති, ආපත්තිං න පටිජානාති, නිසජ්ජාය කාරෙතබ්බො. ගමනං න පටිජානාති, නිසජ්ජං න පටිජානාති, ආපත්තිං න පටිජානාති, න කාරෙතබ්බොති.

### දුතියඅනියතසික්ඛාපදං නිට්ඨිතං

5. උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙ අනියතා ධම්මා. තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

### තස්සුද්දානං

අලංකම්මනියඤ්චෙව තථෙව ච න හෙව ඛො,
අනියතා සුපඤ්ඤත්තා බුද්ධසෙට්ඨෙන තාදිනාති.

## අනියතකණ්ඩො නිට්ඨිතො

ඒ උවැසි 'හිමියන් මාගමකට තුළුල්-තෙපුලින් කියමින් වැද හොත්තවුන් බස මා විසින් අසන ලද'යි. ඉදින් මෙසේ කියා නම් ඒ මහණ ද එය පිළිත කෙරේ නම්, ඇවැතින් කරවිය යුත්තේ ය. ... "සැබැව මම හොත්තෙමි එතෙකුදුවත් තුළුල් තෙපුලින් නො කීමි'යි. කියා නම්, ශයනා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම් නො හොත්තෙමි එතෙකුදුවත් හුන්තෙම්'යි කියා නම්, නිෂද්‍යා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම් නො හොත්තෙමි එතෙකුදුවත් සිටියෙම්'යි. කියා නම්, නො කරවිය යුත්තේ යි.

ඒ උවැසි 'හිමිහු එකලා වූ මාගමක හා එකලා ව රහසිගත ව හුන්නාහු මා විසින් දක්නා ලදහ'යි, ඉදින් මෙසේ කියා නම් ඒ මහණ ද එය පිළිත කෙරේ නම්, නිෂද්‍යා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම් නිෂද්‍යා නො කෙළෙම් එතෙකුදුවත් හොත්තෙම්'යි. කියා නම්, නිපත්‍යා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ... 'මම් නිෂද්‍යා නො කෙළෙම් එතෙකුදුවත් සිටියෙම්'යි. කියා නම්, නො කරවිය යුත්තේ යි.

ඒ උවැසි 'හිමිහු එකලා වූ මාගමක හා එකලා ව රහසිගත ව හොත්තාහු මා විසින් දක්නා ලදහ'යි. ඉදින් මෙසේ කියා නම් ඒ මහණ ද එය පිළිත කෙරේ නම්, නිපත්‍යා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. .. 'මම් නො හොත්තෙමි එතෙකුදුවත් හුන්තෙම්'යි. කියා නම්, නිෂද්‍යායෙන් කරවිය යුත්තේ ය. ... 'මම් නො හුන්තෙමි එතෙකුදුවත් සිටියෙම්'යි. කියා නම්, නො කරවිය යුත්තේ යි.

**අයමපි** යනු පළමු ශික්ෂාපදය හෙණ කියනු ලැබෙයි.

**අනියතො** යනු සඟවෙසෙස හෝ පචිති ය හෝ නියත නො වූයේ.

4. ගමන පිළිත කෙරේ නම් නිෂද්‍යා පිළිත කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම්, ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත කෙරේ නම් නිෂද්‍යාව පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම් ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත කෙරේ නම් නිෂද්‍යාව පිළිත කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම් නිෂද්‍යා නිමිතින් වූ ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත කෙරේ නම් නිෂද්‍යාව පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම්, නො කරවිය යුත්තේ ය. ගමන පිළිත නො කෙරේ නම් නිෂද්‍යාව පිළිත කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම්, ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත නො කෙරේ නම් නිෂද්‍යාව පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත කෙරේ නම් ඇවැතින් කරවිය යුත්තේ ය. ගමන පිළිත නො කෙරේ නම් නිෂද්‍යාව පිළිත කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම් නිෂද්‍යායෙන් කරවිය යුත්තේ ය. ගමන පිළිත නො කෙරේ නම් නිෂද්‍යාව පිළිත නො කෙරේ නම් ඇවැත පිළිත නො කෙරේ නම් නො කරවිය යුත්තේ යි.

### දෙවැනි අනියතශික්ෂාපදය නිමි.

5. ආයුෂ්මත්නි, දෙ අනියතාපත්තීහු උදෙසන ලද්දාහු මැ යි. එහි ලා ආයුෂ්මතුන් පුළුවුස්මි: කිම පිරිසුදු වවූ ද? දෙවන වට ද පුළුවුස්මි: කිම පිරිසුදු වවූ ද? තෙවන වට ද පුළුවුස්මි: කිම පිරිසුදු වවූ ද? මෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදුහ. එහෙයින් තුෂ්ණීම්භූතයහ. මෙය මෙසේ ධරමි" යනුයි.

### එහි උදානය:

අලංකම්මනිය ද නහෙවබො දූ යි අනියතාපත්තීහු තාදිගුණ ඇති ශ්‍රෙෂ්ඨ වූ බුදුන් විසින් පණවන ලදහ.

## අනියත කාණ්ඩය නිමියේය.

# 5.

# නිස්සග්ගියකණ්ඩො.

**ඉමෙ ඛො පනායස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා**

**උද්දෙසං ආගච්ඡන්ති.**

## චීවරවග්ගො

## 5. 1. 1.

## පඨමකඨිනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති ගොතමකෙ චෙතියෙ. තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං තිචීවරං අනුඤ්ඤාතං හොති. ඡබ්බග්ගියා භික්ඛූ භගවතා තිචීවරං අනුඤ්ඤාතන්ති අඤ්ඤෙනෙව තිචීවරෙන ගාමං පවිසන්ති, අඤ්ඤෙන තිචීවරෙන ආරාමෙ අච්ඡන්ති, අඤ්ඤෙන තිචීවරෙන නහානං ඔතරන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකචීවරං ධාරෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ* භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අතිරෙකචීවරං ධාරෙථා?"ති "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අතිරෙකචීවරං ධාරෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අතිරෙකචීවරං ධාරෙය්‍ය නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති.]

2. තෙන ඛො පන සමයෙන ආයස්මතො ආනන්දස්ස අතිරෙකචීවරං උප්පන්නං හොති. ආයස්මා ච ආනන්දො තං චීවරං ආයස්මතො සාරිපුත්තස්ස දාතුකාමො හොති. ආයස්මා ච සාරිපුත්තො සාකෙතෙ විහරති. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: "භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං න අතිරෙකචීවරං ධාරෙතබ්බ"න්ති. ඉදඤ්ච මෙ අතිරෙකචීවරං උප්පන්නං, අහඤ්චිමං චීවරං ආයස්මතො සාරිපුත්තස්ස දාතුකාමො, ආයස්මා ච සාරිපුත්තො සාකෙතෙ විහරති, කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ"න්ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. "කීව චිරං පනානන්ද සාරිපුත්තො ආගච්ඡිස්සතී?"ති "නවමං වා භගවා දිවසං දසමං වා"ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ දසාහපරමං අතිරෙකචීවරං ධාරෙතුං එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

* "ඡබ්බග්ගියෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා" ම.ජ.සං. අභිකං.

# 5.

# නිසැඟිකාණ්ඩය

**ඇවැත්නි, මේ තිස් නිසැඟි පචිති ඇවැත්හු උදෙසීමට පැමිණෙත්.**

## චීවරවග්ගය

## 5. 1. 1.

## ප්‍රථමකඨිනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුද්ධහු විසල්පුර ගොතමක චෛත්‍යස්ථානයෙහි වැඩ වෙසෙති. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් සිවුරු අනුදන්නා ලද වෙයි. සවග මහණහු "භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් සිවුරු අනුදන්නා ලද"යි අනික් ම තුන් සිවුරකින් ගම් වදිති, අනික් ම තුන් සිවුරකින් අරමෙහි හිඳිත්, අනික් ම තුන් සිවුරකින් නහන තොටට බසිත්. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ වෙත් නම් ඔහු අවඥා කෙරෙති, අගුණ කියති, දොස් පහළ කෙරෙත්: කිසෙයින් නම් සවග මහණහු අසිරු සිවුරු ධරත්ද?"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ පවත් "සැළ කළහ... "සැබෑ ද මහණෙනි, තෙපි අසිරා සිවුරු ධරවු ලැ?යි. භගවත්හු පුළුවුත්හ. සැබෑව භාග්‍යවතුන් වහන්ස,"යි ඔහු කීහ. භාග්‍යවත් බුද්ධහු ගැරහූහ.: කිසෙයින් නම් තුවජ පුරුෂයෙනි, තෙපි අසිරා සිවුරු ධරවු ද? තුවජ පුරුෂයෙනි, තෙල නො පහනුන්ගේ පහන් බව පිණිස හෝ නො වෙයි... තව ද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"යම් මහණෙක් තෙම අසිරු සිවුරක් ධරා නම් නිසැඟිපචිති වේ"ය යි.**

භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මෙසේත් මේ ශික්ෂාපදය පණවන ලද්දේ වේ.

[මුල් පැණවීමයි.]

2. එසමයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට අතිරෙක චීවරයෙක් උපන්නේ වෙයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේත් ඒ සිවුර ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට දෙනු කැමැත්තාහ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේත් සාකෙතයෙහි වාසය කෙරෙති. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරුනට මේ සිත විය. 'භාග්‍යවතුන් විසින් අසිරිත් සිවුරක් නො දැරියයුතු ය යි සිකපද පනවන ලදී. මේ ද මට උපන් අසිරිත් සිවුරෙක, මම ද මේ සිවුර ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට දෙනු කැමැත්තෙමි. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේත් සාකෙතයෙහි වාසය කෙරෙති. කෙසේ නම් මා විසින් පිළිපැද්ද යුතු ද?' යි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මේ පවත් දන්වූහ. "ආනන්දය, කිපමණ කලෙකින් ශාරිපුත්‍රයෝ එන්නාහුද?'යි පුළුවුත්හ. 'භාග්‍යවතුන් වහන්ස, නව වැනි හෝ දස වැනි හෝ දවසැ'යි ආනන්ද තෙරණුවෝ කීහ. එකල්හි භාග්‍යවත්හු මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කථා වදරා භික්ෂූන් ඇමතූහ: 'මහණෙනි, දස දවසක් පරම කොට අසිරිත් සිවුරක් ධරන්නට අනුදනිමි. තවද මහණෙනි, මෙසේ මේ ශික්ෂාපදය උදෙසවු:

**"නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ දසාහපරමං අතිරෙකචීවරං ධාරෙතබ්බං. තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තිය**"න්ති.

[**දුතියපඤ්ඤත්ති**.]

3. **නිට්ඨිතචීවරස්මින්ති** භික්ඛුනො චීවරං කතං වා හොති නට්ඨං වා විනට්ඨං වා දඩ්ඪං වා චීවරාසා වා උපච්ඡින්නා.

**උබ්භතස්මිං කඨිනෙති** අට්ඨන්නං මාතිකානං අඤ්ඤතරාය මාතිකාය උබ්භතං හොති, සඞ්ඝෙන වා අන්තරා උබ්භතං හොති.

**දසාහපරමන්ති** දසාහපරමතා[1] ධාරෙතබ්බං.

**අතිරෙකචීවරං** නාම: අනධිට්ඨිතං අවිකප්පිතං.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනුපගපච්ඡිමං.

**තං අතික්කාමයතො නිස්සග්ගියං හොතීති**[2] එකාදසෙ අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: තෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා බුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "ඉදං මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨචීවරං දාතබ්බං:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉදං චීවරං ඉත්ථන්නාමස්ස භික්ඛුනො නිස්සග්ගියං සඞ්ඝස්ස නිස්සට්ඨං. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉමං චීවරං ඉත්ථන්නාමස්ස භික්ඛුනො දදෙය්‍යා"ති.

4. තෙන භික්ඛුනා සම්බහුලෙ භික්ඛූ උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා බුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්සු වචනීයා: "ඉදංමෙම භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං. ඉමාහං ආයස්මන්තානං නිස්සජ්ජාමී"ති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨචීවරං දාතබ්බං.

"සුණන්තු මෙ ආයස්මන්තා. ඉදං චීවරං ඉත්ථන්නාමස්ස භික්ඛුනො නිස්සග්ගියං. ආයස්මන්තානං නිස්සට්ඨං. යදායස්මන්තානං පත්තකල්ලං, ආයස්මන්තා ඉමං චීවරං ඉත්ථන්නාමස්ස භික්ඛුනො දදෙය්‍යු"න්ති.

5. තෙන භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "ඉදං මෙ ආවුසො චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං. ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමී"ති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. තෙන භික්ඛුනා ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨචීවරං දාතබ්බං: "ඉමං චීවරං ආයස්මතො දම්මී"ති.

---

1. දසාහපරමතාය. සී. ලිඛිත. 2. 'හොතීති' ඉදං පදං පොත්ථකෙසු අත්ථි. සික්ඛාපදෙ පන නත්ථි.

**''භික්ෂුහු විසින් කොට නිම වූ සිවුරු ඇති කල්හි කඨින උදුල කල්හි දස දවසක් පරම කොට අතිරික් සිවුර දැරිය යුතු ය. ඒ දශාහ-පරම කාලය ඉක්මවන්නාහට නිසැගිපචිති වේ.**

**[දෙවනපැණවීමයි.]**

3. **නිට්ඨිත චීවරස්මිං** යනු භික්ෂුහුගේ චීවරය කරණ ලද හෝ වෙයි නටුයේ හෝ වැනැසුනේ හෝ දැවුනේ හෝ සිවුරු ලැබීමේ ආශාව සිඳුනී හෝ වෙයි.

**උබ්භතස්මිං කඨිනෙ** යනු අට වැදෑරුම් මාතිකාවන් අතුරෙන් එක්තරා මාතිකායෙකින් උදුලේ වෙයි. සඞ්ඝයා විසින් හෝ අතරු උදුරණ ලද වෙයි.

**දසාහපරමං** යනු දස දවසක් පරම කොට ඇති කාලය දැරිය යුත්තේ ය.

**අතිරෙක** චීවර නම්: නො ඉටන ලද නො විකපන ලද ය.

චීවර නම්: සවැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා විකපුන් පොහොනා පැසිම් සිවුරෙක.

**තං අතික්කාමයතො නිස්සග්ගියං හොති** යනු එකොළොස් වැනි අරුණ නැගෙන සඳ නිසැගි වෙයි. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුඟු-ලක්හට හෝ නිසැජිය යුතු ය. තව ද මහණෙනි, මෙසේ නිසැජිය යුතු ය: 'ඒ මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට මහලු භික්ෂූන් පා වැඳ උළුල්ලෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය. වහන්ස, මේ මාගේ සිවුර දස දවසක් ඉක්මෙන ලද නිසැගි විය. මෙය මම් සඟහට නිසජම්'යි නිසජා ඇවැත් දෙසිය යුතු. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් ඇවැත් පිළිගත යුතු. නිසැදූ සිවුර දිය යුතු:

''වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මෙනම් මහණහුගේ මේ සිවුර නිසැගි විය. සඟහට නිසදන ලද. ඉදින් සඟහට පැමිණිකල් ඇත් නම් සඞ්ඝ තෙමේ මේ සිවුර මෙනම් මහණහට දෙන්නේ ය''යි.

4. ඒ මහණහු විසින් බොහෝ භික්ෂූන් කරා එළඹ උතුරුසඟ එකස් කොට මහලු භික්ෂූන් පා වැඳ උළුල්ලෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නාහු ය. 'වහන්ස, මාගේ මේ සිවුර දස දවස් ඉක්ම ගියේ නිසැගි විය. මම් මේ සිවුර ආයුෂ්මත්නට නිසජම්'යි නිසදා ඇවැත් දෙසිය යුතු. ව්‍යක්ත වූ ප්‍රතිබලවූ මහණක්හු විසින් ඇවැත් පිළිගතයුතු. නිසැදූ සිවුර ඔහුට දිය යුතු:

''ආයුෂ්මත්නි, මා කියන්නක් අසත්වා. මෙනම් භික්ෂුහුගේ මේ සිවුර නිසැගි විය. ආයුෂ්මත්නට නිසජන ලද. ඉදින් ආයුෂ්මත්නට පැමිණි කල් ඇත් නම් ආයුෂ්මත්හු මේ සිවුර මෙ නම් මහණහට දෙන්නාහු ය!''යි

5. ඒ මහණහු විසින් එක් මහණක්හු වෙත එළඹ උතුරුසඟ එකස් කොට උළුල්ලෙන් හිඳ මෙසේ කියයුතු වන්නේ ය. 'ඇවැත්නි, මාගේ මේ සිවුර දස දවසක් ඉක්ම ගියේ නිසැගි විය. මම් මේ සිවුර ආයුෂ්මත්හට නිසජම්'යි නිසදා ඇවැත් දෙසිය යුතු. ඒ මහණහු විසින් ඇවැත් පිළිගත යුතු. නිසැදූ සිවුර 'මේ සිවුර ආයුෂ්මත්හට දෙම්'යි දිය යුතු.

6. දසාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. දසාහාතික්කන්තෙ වෙමතිකො, නිස්සග්ගියං පාචිත්තියං. දසාහාතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අනධිට්ඨිතෙ අධිට්ඨිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිකප්පිතෙ විකප්පිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අනට්ඨෙ නට්ඨසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අදඩ්ඪෙ දඩ්ඪසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිලුත්තෙ විලුත්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. නිස්සග්ගියං චීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. දසාහානතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. දසාහානතික්කන්තෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. දසාහානතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී, අනාපත්ති.

7. අනාපත්ති අන්තොදසාහං අධිට්ඨෙති විකප්පෙති විස්සජ්ජෙති නස්සති විනස්සති ඩය්හති අච්ඡින්දිත්වා ගණ්හන්ති, විස්සාසං ගණ්හන්ති උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

8. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නිස්සට්ඨචීවරං න දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ නිස්සට්ඨචීවරං න දාතබ්බං. යො න දදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

**පඨමකඨිනසික්ඛාපදං නිට්ඨිතං**

---

## 5. 1. 2.

## දුතියකඨිනසික්ඛාපදං*

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ භික්ඛූනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමන්ති. තානි චීවරානි චිරං නික්ඛිත්තානි කණ්ණකිතානි හොන්ති. තානි භික්ඛූ ඔතාපෙන්ති. අද්දසා ඛො ආයස්මා ආනන්දො සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තෙ භික්ඛූ තානි චීවරානි ඔතාපෙන්තෙ. දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "කස්සිමානි ආවුසො චීවරානි කණ්ණකිතානී"ති. අථ ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස එතමත්ථං ආරෙචෙසුං. ආයස්මා ආනන්දො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛූ භික්ඛූනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමිස්සන්තී"ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි, "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ භික්ඛූනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමන්තී"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා. "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා භික්ඛූනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

*උද්දෙසිත සික්ඛාපදං, සීමු. උදෙසිත සික්ඛාපදං, මජසං

6. දස දවසක් ඉක්ම ගිය කල්හි 'ඉක්ම ගියේ ය' යන සංඥා ඇත්තේ, නිසැගි පචිති වෙයි. දසදවසක් ඉක්මගිය කල්හි විමති ඇත්තේ, නිසැගි පචිති වෙයි. දස දවසක් ඉක්ම ගිය කල්හි 'ඉක්ම නො ගියේ ය,' යන සංඥා ඇත්තේ, නිසැගි පචිති වෙයි. නො ඉටන ලද්දෙහි ඉටන ලදැ යි සංඥා ඇත්තේ, නිසැගි පචිති වෙයි. නො විකපන ලද්දෙහි විකපන ලදැ යි සංඥා ඇත්තේ, නිසැගි පචිති වෙයි. නො විසජන ලද්දෙහි විසජන ලදැ යි සංඥා ඇත්තේ, නිසැගි පචිති වෙයි. නො නටුයෙහි නටැ යි සංඥා ඇත්තේ නිසැගි පචිති වෙයි. නො වැනැසුනෙහි වැනැසිනැ යි සංඥා ඇත්තේ, නිසැගි පචිති වෙයි. නො දැවුනෙහි දැවිනැ යි සංඥා ඇත්තේ, නිසැගි පචිති වෙයි. නො පැහැර ගත්තෙහි පැහැර ගන්නා ලදැයි සංඥා ඇත්තේ නිසැගි පචිති වෙයි. නිසැගි සිවුර නො නිසඳ පරිභොග කෙරේ නම් දුකුලාඇවැත් වෙයි. දස දවස් නො ඉක්මුනෙහි ඉක්මිනැ යි සංඥා ඇත්තේ, දුකුලාඇවැත් වෙයි. දස දවස් නො ඉක්මුනෙහි විමති ඇත්තේ, දුකුලාඇවැත් වෙයි. දස දවස් නො ඉක්මුනෙහි නො ඉක්මිනැ යි සංඥා ඇත්තේ, ඇවැත් නැති.

7. ඇතුළු දස දවස්හි ඉටා නම් විකපා නම් විසඳ නම් නැසේ නම් වැනසේ නම් දැවේ නම් අසිදූ ගණිත් නම් විස්වැසි ව ගණිත් නම් ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට, ඇවැත් නැතැ'යි.

8. තවද එසමයෙහි ෂඩ්වර්ගීය භික්ෂූහු නිසැදූ සිවුර නො දෙති. භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. 'මහණෙනි, නිසැදූ සිවුර නො දිය යුතු නො වෙයි. යමෙක් නො දේ නම් දුකුලාඇවැත් වේ' යයි.

**ප්‍රථම කඨින ශික්ෂාපදය නිමි.**

---

## 5. 1. 2.

## ද්විතීයකඨිනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර සමීප-යෙහි වූ අනේපිඬුසිටුහුගේ දෙව්රම්හි වැඩ වාසය කරණ සේක. තවද එසමයෙහි භික්ෂූහු භික්ෂූන්ගේ අත්පසැ සඟළසිවුර තබා හඳනා පොරෝනා සිවුරින් යුතු ව ජනපදචාරිකායෙහි නික්මෙති. ඒ සිවුරු බොහෝ කල් තබන ලද්දැහු හටගත් කැලැල් ඇත්තාහු වෙති. භික්ෂූහු ඒ සිවුරු (අවුවෙහි) තවති. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ සෙනාසන චාරිකායෙහි ඇවිදිනාහු ඒ සිවුරු තවන ඒ භික්ෂූන් දුටහ. දැක ඒ භික්ෂූන් කරා එළඹ ඒ භික්ෂූන්ට මෙසේ කීහ: 'ඇවැත්නි, කැලැල් හටගත් මේ සිවුරු කවරක්හු-ගේ දැ' යි. එකල්හි ඒ භික්ෂූහු ආයුෂ්මත් අනඳ තෙරුන්ට එපවත් දැන්වූහ. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අවමන් කෙරෙති, නුගුණ කියති, දෙස් පතළ කෙරෙත්. 'කෙසේ නම් භික්ෂූහු භික්ෂූන්ගේ අත්පසැ සඟළසිවුර තබා හඳනා පොරෝනා සිවුරින් ජනපදචාරිකායෙහි නික්මුණාහු දැ' යි. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. 'සැබැ ද මහණෙනි, භික්ෂූහු භික්ෂූන්ගේ අත්පසැ සඟළසිවුර තබා හඳනා-පොරෝනා සිවුරින් ජනපද චාරිකායෙහි නික්මෙත් දැ' යි. 'සැබව භාග්‍යවතුන් වහන්ස' භාග්‍යවත් බුදුහු ගර්හා කළහ: 'කෙසේ නම් මහණෙනි, ඒ තුච්ඡ-පුරුෂයෝ භික්ෂූන් අත සඟළසිවුර තබා හඳනා පොරෝනා සිවුරින් ජනපද-චාරිකායෙහි නික්මුණාහු ද, මහණෙනි, මෙල නොපහන්නුන්ගේ පැහැදීමට හෝ නො වෙයි... තවද මහණෙනි, මේ ශික්ෂාපදය මෙසේ උදෙසවු:

**"නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"න්ති:**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති.]

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කොසම්බියං ගිලානො හොති. ඤාතකා තස්ස භික්ඛුනො සන්තිකෙ දූතං පාහෙසුං: "ආගච්ඡතු භදන්තො මයං උපට්ඨහිස්සාමා"ති. භික්ඛූපි එවමාහංසු. "ගච්ඡාවුසො ඤාතකා තං උපට්ඨහිස්සන්තී"ති. සො එවමාහ: "භගවතාවුසො සික්ඛාපදං පඤ්ඤත්තං න තිචීවරෙන විප්පවසිතබ්බ"න්ති. "අහඤ්චම්හි ගිලානො, න සක්කොමි තිචීවරං ආදාය පක්කමිතුං, නාහං ගමිස්සාමී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුතිං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තෙන ගිලානෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ ගිලානො න සක්කොමි තිචීවරං ආදාය පක්කමිතුං, සොහං භන්තෙ සඞ්ඝං තිචීවරෙන අවිප්පවාසසම්මුතිං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බා. තතියම්පි යාචිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු ගිලානො න සක්කොති තිචීවරං ආදාය පක්කමිතුං. සො සඞ්ඝං තිචීවරෙන අවිප්පවාසසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුතිං දදෙය්‍ය: එසා ඤත්ති.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු ගිලානො න සක්කොති තිචීවරං ආදාය පක්කමිතුං. සො සඞ්ඝං තිචීවරෙන අවිප්පවාසසම්මුතිං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුතිං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුතියා දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො තිචීවරෙන අවිප්පවාසසම්මුති, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තිය"**න්ති.

[**දුතියපඤ්ඤත්ති.**]

4. **නිට්ඨිතචීවරස්මින්ති** භික්ඛුනො චීවරං කතං වා හොති නට්ඨං වා විනට්ඨං වා දඩ්ඪං වා චීවරාසා වා උපච්ඡින්නා.

**"භික්ෂූහු විසින් කොට නිම වූ සිවුරු ඇති කල්හි කෙළින් උදුල කල්හි ඉදින් මහණ තෙම එක් රැයකුදු තුන් සිවුරින් වෙන් ව වෙසේ නම් නිසැගි පචිත්තිවේය"සි.**

භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මෙසේත් මේ ශික්ෂාපදය පණවන ලද්දේ වේ.

[මුල් පැණවීමයි.]

2. එසමයෙහි කොසඹෑනුවර එක්තරා මහණෙක් ගිලන් වූයේ වෙයි. නෑයෝ ඒ භික්ෂූහුගේ සමීපයෙහි දූතයකු එවූහ. 'වහන්සේ (මෙහි) එත්වා අපි උවැටන් කරම්හ'සි. භික්ෂූහු ද මෙසේ කීහු: යා ඇවැත්නි, නෑයෝ තොපට උවැටන් කරන්නාහ'සි. හේ මෙසේ කීය: 'ඇවැත්නි, භාග්‍යවතුන් විසින් 'තුන් සිවුරින් නොවෙන් ව විසියයුතු ය'යි සිකපද පණවන ලද: මම ද ගිලන්මි. තුන්සිවුරු ගෙණ නික්ම යන්නට නො පොහොසත්මි. මම නො යෙමි' යි. භග්‍යවතුන් වහන්සේට මෙ පවත් දැන්වූහ:

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි ලා දැහැමි කථා වදාරා භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, ගිලන් මහණහට 'තිචීවර අවිප්පවාස සම්මුතිය' දෙන්නට අනුදනිමි. මහණෙනි, මෙසේත් දියයුතු ය. ඒ ගිලන් මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට මහලු භික්ෂූන් පා වැඳ උළුක්කෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය: "වහන්ස, මම් ගිලන්මි. තුන්සිවුරු ගෙණ යන්නට නො පොහොසත්මි. වහන්ස, ඒ මම් සඞ්ඝයා තිචීවර අවිප්පවාස සම්මුතිය අයදිමි'යි දෙවනවට ද යැදිය යුත්තේ ය. තෙවනවට ද යැදිය යුත්තේ ය. ව්‍යක්ත වූ ප්‍රතිබල මහණක්හු විසින් සඞ්ඝ තෙම දැන්විය යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම ගිලන් වූයේ තුන් සිවුරු ගෙණ නික්ම යන්නට නො හැකි වෙයි. හෙතෙම සඞ්ඝයා තිචීවර අවිප්පවාසසම්මුතිය අයදියි. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත් නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහට 'තිචීවර අවිප්පවාස-සම්මුතිය දෙන්නේ ය" තෙල ඥත්ති'යයි.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙම ගිලන් වූයේ තුන් සිවුරු ගෙණ නික්ම යන්නට නො හැකි වෙයි. හේ සඞ්ඝයා 'තිචීවර අවිප්පවාසසම්මුතිය අයදියි. සඞ්ඝ තෙමේ මෙනම් මහණහට 'තිචීවර අවිප්පවාසසම්මුතිය' දෙයි. මෙ නම් මහණහට තිචීවර අවිප්පවාස-සම්මුතිය දීම යම් ආයුෂ්මතක්හට රිසි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නොරිසි වේ නම් හේ කියන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණහට තිචීවර අවිප්පවාසසම්මුතිය දෙන ලද්දීය. සඞ්ඝයාට රුචි වෙයි. එහෙයින් මේ තුෂ්ණීම්භාවය යි. මෙසේ මේ තුෂ්ණීම්භාවය ධරමි"යි.

තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"භික්ෂූහුගේ සිවුර කොට නිමි කල්හි කෙළින් උදුල කල්හි ඉදින් මහණ තෙම භික්ෂුසම්මුතිය නැති ව එක් රැයකුදු තුන්සිවුරින් වෙන් ව වෙසේ නම් නිසැගි පචිත්තිවේ"යයි.**

[දෙවන පැණවීමයි.]

4. නිට්ඨිතචීවරස්මිං යනු: භික්ෂූහුගේ සිවුර කරණ ලද හෝ වෙයි, නවූයේ හෝ වැනැසුනේ හෝ දැවුනේ හෝ සිවුරු ලැබීමේ ආශාව සිඳුනේ හෝ වෙයි.

**උබ්භතස්මිං කඨිනෙති** අට්ඨන්නං මාතිකානං අඤ්ඤතරාය මාතිකාය උබ්භතං හොති. සඞ්ඝෙන වා අන්තරා උබ්භතං හොති.

**එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍යාති** සඞ්ඝාටියා වා උත්තරාසඞ්ගෙන වා අන්තරවාසකෙන වා.

**අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියාති** ඨපෙත්වා භික්ඛුසම්මුතිං.

**නිස්සග්ගියං හොතීති** සහ අරුණුග්ගමනෙන[1] නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- "ඉදං මෙ භන්තෙ චීවරං රත්තිං විප්පවුත්ථං[2] අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

5. ගාමො එකූපචාරො නානූපචාරො, නිවෙසනං එකූපචාරං නානූපචාරං, උද්දොසිතො[3] එකූපචාරො නානූපචාරො, අට්ටො එකූපචාරො නානූපචාරො, මාළො එකූපචාරො නානූපචාරො, පාසාදො එකූපචාරො නානූපචාරො, හම්මියං එකූපචාරං නානූපචාරං, නාවා එකූපචාරා නානූපචාරා, සත්ථො එකූපචාරො නානූපචාරො, ඛෙත්තං එකූපචාරං නානූපචාරං, ධඤ්ඤකරණං එකූපචාරං නානූපචාරං, ආරාමො එකූපචාරො නානූපචාරො, විහාරො එකූපචාරො නානූපචාරො, රුක්ඛමූලං එකූපචාරං නානූපචාරං, අජ්ඣොකාසො එකූපචාරො නානූපචාරො.

6. ගාමො එකූපචාරො නාම: එකකුලස්ස ගාමො හොති පරික්ඛිත්තො ච, අන්තොගාමෙ චීවරං නික්ඛිපිත්වා අන්තොගාමෙ වත්ථබ්බං. අපරික්ඛිත්තො හොති, යස්මිං ඝරෙ චීවරං නික්ඛිත්තං හොති තස්මිං ඝරෙ වත්ථබ්බං හත්ථපාසා වා න විජහිතබ්බං.

7. නානාකුලස්ස ගාමො හොති පරික්ඛිත්තො ච, යස්මිං ඝරෙ චීවරං නික්ඛිත්තං හොති. තස්මිං ඝරෙ වත්ථබ්බං සභායෙ වා ද්වාරමූලෙ වා හත්ථපාසා වා න විජහිතබ්බං. සභායං ගච්ඡන්තෙන හත්ථපාසෙ චීවරං නික්ඛිපිත්වා සභායෙ වා වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං. සභායෙ චීවරං නික්ඛිපිත්වා සභායෙ වා වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං. අපරික්ඛිත්තො හොති, යස්මිං ඝරෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ඝරෙ වත්ථබ්බං. හත්ථපාසා වා න විජහිතබ්බං.

8. එකකුලස්ස නිවෙසනං හොති පරික්ඛිත්තඤ්ච නානාගබ්භා නානාඔවරකා, අන්තොනිවෙසනෙ චීවරං නික්ඛිපිත්වා අන්තොනිවෙසනෙ වත්ථබ්බං. අපරික්ඛිත්තං හොති, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං. හත්ථපාසා වා න විජහිතබ්බං.

9. නානාකුලස්ස නිවෙසනං හොති පරික්ඛිත්තඤ්ච නානාගබ්භා නානාඔවරකා, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං. අපරික්ඛිත්තං හොති, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති තස්මිං ගබ්භෙ වත්ථබ්බං. හත්ථපාසා වා න විජහිතබ්බං.

---

1. සහ අරුණුග්ගමනා. ම.ජ.සං. 2. රත්තිවිප්පවුත්ථං ම.ජ.සං. සතු 3. උදොසිතො. ම.ජ.සං.

**උබ්භතස්මිං කඨිනෙ** යනු: අට වැදෑරුම් මාතිකාවන් අතුරෙහි එක්තරා මාතිකායෙකින් උද්ධෘතවේ වෙයි. සඞ්ඝයා විසින් හෝ අතරා උද්ධරන ලද වෙයි.

**එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය** යනු: සඟළසිවුරින් හෝ උතුරුසඟසිවුරින් හෝ අතුරුවසාසිවුරින් හෝ.

**අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා** යනු: භික්ෂුසම්මතය තබා.

**නිස්සග්ගියං හොති** යනු: අරුණු නැගීම සමග නිසැගි වෙයි. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලක්හට හෝ නිසැජිය යුතු ය. ... "වහන්ස, මාගේ මේ සිවුර භික්ඛුසම්මුති නැති ව රැයක් වෙන් ව වසන ලද. නිසැගි වූයේ ය. මම් මෙය සඞ්ඝයාට නිසජමි'යි. දෙන්නේ යයි ... දෙන්නාහු යයි ... ආයුෂ්මත්හට දෙමි"යි.

5. ගම එකූපචාර ද නානූපචාර ද වෙයි. නිවෙස්න එකූපචාර ද නානූපචාර ද වෙයි. බඩුහල එකූපචාර ද නානූපචාර ද වෙයි. අටල්ල එකූපචාර ද නානූපචාර ද වෙයි. මහල එකූපචාර ද නානූපචාර ද වෙයි. පහය එකූපචාර ද නානූපචාර ද වෙයි. සඳලුගෙය එකූපචාර ද නානූපචාර ද වෙයි. නැව එකූපචාර ද නානූපචාර ද වෙයි, ගැල් සාත්තුව එකූපචාර ද නානූපචාර ද වෙයි, කෙත එකූපචාර ද නානූපචාර ද වෙයි. කලවිට එකූපචාර ද නානූපචාර ද වෙයි. අරම එකූපචාර ද නානූපචාර ද වෙයි. වෙහෙර එකූපචාර ද නානූපචාර ද වෙයි. රුක්මුල එකූපචාර ද නානූපචාර ද වෙයි. අබ්‍යවස එකූපචාර ද නානූපචාර ද වේ.

6. එකූපචාර ගම නම්: එක් කුලයකට අයත් ගම පිරිකෙව් කරණ ලද්දේ ද වේ නම් ඇතුළුගම සිවුර තබා ඇතුළුගම විසිය යුතු ය. නො පිරිකෙව් කරණ ලද්දේ වේ නම් යම් ගෙයක සිවුර තබන ලද වේ ද ඒ ගෙහි විසිය යුතු ය. අත්පසින් නොහළ යුතු ය.

7. නානා කුලයකට අයත් ගම පිරිකෙව් කරණ ලද්දේත් වේ නම් යම් ගෙයක සිවුර තබන ලද වේ ද ඒ ගෙහි සභායෙහි හෝ ද්වාරසමීපයෙහි හෝ විසිය යුතු ය. අත්පසින් නො හළ යුතු ය. සබයට යන්නහු විසින් අත්පසැ සිවුර තබා සෙබෙහි හෝ දොර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු. සෙබෙහි සිවුර තබා සෙබෙහි හෝ දොර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු. පිරිකෙව් නො කරණ ලද්දේ වේ නම් යම් ගෙයක සිවුර තබන ලද්දේ ද ඒ ගෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු.

8. එක් කුලයකට අයත් නිවෙස්න පිරිකෙව් කරණ ලද්දේත් වේ නම් නානාගර්භයෝ නානා ඔවරකයෝ වෙත් නම් ඇතුළු නිවෙස්නෙහි සිවුර තබා ඇතුළු නිවෙස්නෙහි විසිය යුතු. පිරිකෙව් නොකරණ ලද වේ නම් යම් ගැබෙක සිවුර තබන ලද ද ඒ ගැබෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු.

9. නානා කුලයකට අයත් නිවෙස්න පිරිකෙව් කරණ ලද්දේත් වේ නම් නානාගර්භයෝ නානා ඔවරකයෝ වෙත් නම් යම් ගැබෙක සිවුර තබන ලද ද ඒ ගැබෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු. නොපිරිකෙව් කරණ ලද වේ නම් යම් ගැබෙක සිවුර තබන ලද ද ඒ ගැබෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු.

10. එකකුලස්ස උද්දෝසිතො හොති පරික්ඛිත්තො ච නානාගබ්භා නානාඔවරකා, අන්තොඋද්දෝසිතෙ චීවරං නික්ඛිපිත්වා අන්තොඋද්දෝසිතෙ වත්ථබ්බං. අපරික්ඛිත්තො හොති, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං. හත්ථපාසා වා න විජහිතබ්බං.

11. නානාකුලස්ස උද්දෝසිතො හොති පරික්ඛිත්තො ච නානාගබ්භා නානාඔවරකා, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං. අපරික්ඛිත්තො හොති, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං. හත්ථපාසා වා න විජහිතබ්බං.

12. එකකුලස්ස අට්ටො හොති, අන්තොඅට්ටෙ චීවරං නික්ඛිපිත්වා අන්තොඅට්ටෙ වත්ථබ්බං. නානාකුලස්ස අට්ටො හොති නානාගබ්භා නානාඔවරකා, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං.

13. එකකුලස්ස මාළො හොති, අන්තොමාළෙ චීවරං නික්ඛිපිත්වා අන්තොමාළෙ වත්ථබ්බං. නානාකුලස්ස මාළො හොති නානාගබ්භා නානාඔවරකා, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං.

14. එකකුලස්ස පාසාදො හොති, අන්තොපාසාදෙ චීවරං නික්ඛිපිත්වා අන්තොපාසාදෙ වත්ථබ්බං. නානාකුලස්ස පාසාදො හොති නානාගබ්භා නානාඔවරකා, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං.

15. එකකුලස්ස හම්මියං හොති, අන්තොහම්මියෙ චීවරං නික්ඛිපිත්වා අන්තොහම්මියෙ වත්ථබ්බං. නානාකුලස්ස හම්මියං හොති නානාගබ්භා නානාඔවරකා, යස්මිං ගබ්භෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ගබ්භෙ වත්ථබ්බං ද්වාරමූලෙ වා. හත්ථපාසා වා න විජහිතබ්බං.

16. එකකුලස්ස නාවා හොති අන්තොනාවාය චීවරං නික්ඛිපිත්වා අන්තොනාවාය වත්ථබ්බං. නානාකුලස්ස නාවා හොති නානාගබ්භා නානාඔවරකා, යස්මිං ඔවරකෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං ඔවරකෙ වත්ථබ්බං. හත්ථපාසා වා න විජහිතබ්බං.

17. එකකුලස්ස සත්ථො හොති, සත්ථෙ චීවරං නික්ඛිපිත්වා පුරතො වා පච්ඡතො වා සත්තබ්භන්තරා න විජහිතබ්බා. පස්සතො අබ්භන්තරං න විජහිතබ්බං. නානාකුලස්ස සත්ථො හොති, සත්ථෙ චීවරං නික්ඛිපිත්වා හත්ථපාසා න විජහිතබ්බං.

18. එකකුලස්ස ඛෙත්තං හොති පරික්ඛිත්තඤ්ච, අන්තොඛෙත්තෙ චීවරං නික්ඛිපිත්වා අන්තොඛෙත්තෙ වත්ථබ්බං. අපරික්ඛිත්තං හොති, හත්ථපාසා න විජහිතබ්බං. නානාකුලස්ස ඛෙත්තං හොති පරික්ඛිත්තඤ්ච, අන්තොඛෙත්තෙ චීවරං නික්ඛිපිත්වා ද්වාරමූලෙ වා වත්ථබ්බං. හත්ථපාසා වා න විජහිතබ්බං. අපරික්ඛිත්තං හොති, හත්ථපාසා න විජහිතබ්බං.

10. එක් කුලයකට අයත් පිරිකෙව් කරණ ලද බඩුහලෙක් වේ නම් නානා ගභීයෝ නානා ඔවරකයෝ වෙත් නම් ඇතුළු බඩුහලෙහි සිවුර තබා ඇතුළු බඩුහලෙහි විසිය යුතු ය. නොපිරිකෙව් කරණ ලද වේ නම් යම් ගෑබෙක සිවුර තබන ලද ද ඒ ගෑබෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු.

11. නානා කුලයකට අයත් පිරිකෙව් කරණ ලද බඩුහලෙක් වේ නම් නානා ගභීයෝ නානා ඔවරකයෝ වෙත් නම් යම් ගෑබෙක සිවුර තබන ලද ද ඒ ගෑබෙහි දෙර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු. නො පිරිකෙව් කරණ ලද වේ නම් යම් ගෑබෙක සිවුර තබන ලද ද ඒ ගෑබෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු.

12. එක් කුලයකට අයත් අටල්ලෙක් වේ නම් ඇතුළු අටල්ලෙහි සිවුර තබා ඇතුළු අටල්ලෙහි විසිය යුතු ය. නානා කුලයකට අයත් අටල්ලෙක් වේ නම් නානා ගභීයෝ නානා ඔවරකයෝ වෙත් නම් යම් ගෑබෙක සිවුර තබන ලද ද ඒ ගෑබෙහි දෙර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු.

13. එක් කුලයකට අයත් මහලෙක් වේ නම් ඇතුළු මහලෙහි සිවුර තබා ඇතුළු මහලෙහි විසිය යුතු ය. නානා කුලයකට අයත් මහලෙක් වේ ද නානා ගභීයෝ නානා ඔවරකයෝ වෙත් නම් යම් ගෑබෙක සිවුර තබන ලද ද ඒ ගෑබෙහි දෙර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු.

14. එක් කුලයකට අයත් පහයෙක් වේ නම් ඇතුළු පහයෙහි සිවුරු තබා ඇතුළු පහයෙහි විසිය යුතු. නානා කුලයකට අයත් පහයෙක් වේ නම් නානා ගභීයෝ නානා ඔවරකයෝ වෙත් නම් යම් ගෑබෙක සිවුර තබන ලද ද ඒ ගෑබෙහි දෙර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු.

15. එක් කුලයකට අයත් සඳලුගෙයක් වේ නම් ඇතුළු හර්ම්‍යයෙහි සිවුර තබා ඇතුළු හර්ම්‍යයෙහි විසිය යුතු. නානා කුලයකට අයත් හර්ම්‍යයෙක් වේ නම් නානා ගභීයෝ නානා ඔවරකයෝ වෙත් නම් යම් ගෑබෙක සිවුර තබන ලද ද ඒ ගෑබෙහි දෙර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නොහළ යුතු.

16. එක් කුලයකට අයත් නැවක් වේ නම් ඇතුළු නැවෙහි සිවුර තබා ඇතුළු නැවෙහි විසිය යුතු ය. නානා කුලයකට අයත් නැවක් වෙ නම් නානා ගභීයෝ නානා ඔවරකයෝ වෙත් නම් යම් ඔවරකයෙක්හි සිවුර තබන ලද ද ඒ ඔවරකයෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු.

17. එක් කුලයකට අයත් ගැල්සාත්තුයෙක් වේ නම් ගැල්සාත්තුයෙහි සිවුර තබා පෙරටුයෙන් හෝ පිටු පසින් හෝ සත් අබතුරු කෙතෙක් නො හළ යුත්තාහු ය. ඇලයෙන් අබතුරෙක් නොහළ යුතු ය. නානා කුලයකට අයත් ගැල්සාත්තුයෙක් වේ නම් ගැල්සාත්තුයෙහි සිවුර තබා අත්පසින් නො හළ යුතු.

18. එක් කුලයකට අයත් පිරිකෙව් කළ කෙතක් වේ නම් ඇතුළු කෙතෙහි සිවුර තබා ඇතුළු කෙතෙහි විසිය යුතු ය. නො පිරිකෙව් කරණ ලද වේ නම් අත්පසින් නො හළ යුතු ය. නානා කුලයකට අයත් පිරිකෙව් කළ කෙතක් වේ නම් ඇතුළු කෙතෙහි සිවුර තබා දෙර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු. නොපිරිකෙව් කරණ ලද වේ නම් අත්පසින් නො හළ යුතු.

19. එකකුලස්ස ධඤ්ඤකරණං හොති පරික්ඛිත්තඤ්ච, අන්තොධඤ්ඤකරණෙ චීවරං නික්ඛිපිත්වා අන්තොධඤ්ඤකරණෙ වත්ථබ්බං. අපරික්ඛිත්තං හොති, හත්ථපාසා න විජහිතබ්බං. නානාකුලස්ස ධඤ්ඤකරණං හොති පරික්ඛිත්තඤ්ච, අන්තොධඤ්ඤකරණෙ චීවරං නික්ඛිපිත්වා ද්වාරමූලෙ වා වත්ථබ්බං, හත්ථපාසා වා න විජහිතබ්බං. අපරික්ඛිත්තං හොති, හත්ථපාසා න විජහිතබ්බං.

20. එකකුලස්ස ආරාමො හොති පරික්ඛිත්තො ච, අන්තොආරාමෙ චීවරං නික්ඛිපිත්වා අන්තොආරාමෙ වත්ථබ්බං. අපරික්ඛිත්තො හොති, හත්ථපාසා න විජහිතබ්බං. නානාකුලස්ස ආරාමො හොති පරික්ඛිත්තො ච, අන්තොආරාමෙ චීවරං නික්ඛිපිත්වා ද්වාරමූලෙ වා වත්ථබ්බං, හත්ථපාසා වා න විජහිතබ්බං. අපරික්ඛිත්තො හොති, හත්ථපාසා න විජහිතබ්බං.

21. එකකුලස්ස විහාරො හොති පරික්ඛිත්තො ච, අන්තොවිහාරෙ චීවරං නික්ඛිපිත්වා අන්තොවිහාරෙ වත්ථබ්බං. අපරික්ඛිත්තො හොති, යස්මිං විහාරෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං විහාරෙ වත්ථබ්බං, හත්ථපාසා වා න විජහිතබ්බං. නානාකුලස්ස විහාරො හොති පරික්ඛිත්තො ච, යස්මිං විහාරෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං විහාරෙ වත්ථබ්බං ද්වාරමූලෙ වා, හත්ථපාසා වා න විජහිතබ්බං. අපරික්ඛිත්තො හොති, යස්මිං විහාරෙ චීවරං නික්ඛිත්තං හොති, තස්මිං විහාරෙ වත්ථබ්බං, හත්ථපාසා වා න විජහිතබ්බං.

22. එකකුලස්ස රුක්ඛමූලං හොති යං මජ්ඣන්හිකෙ කාලෙ සමන්තා ඡායා ඵරති, අන්තොඡායාය චීවරං නික්ඛිපිත්වා අන්තොඡායාය වත්ථබ්බං. නානාකුලස්ස රුක්ඛමූලං හොති, හත්ථපාසා න විජහිතබ්බං.

23. අජ්ඣොකාසො එකූපචාරො නාම: අගාමකෙ අරඤ්ඤෙ සමන්තා සත්තබ්භන්තරා එකූපචාරො, තතො පරං නානූපචාරො.

24. විප්පවුත්ථෙ විප්පවුත්ථසඤ්ඤී අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං. විප්පවුත්ථෙ වෙමතිකො අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං. විප්පවුත්ථෙ අවිප්පවුත්ථසඤ්ඤී අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං. අපච්චුද්ධටෙ පච්චුද්ධටසඤ්ඤී -පෙ- අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී -පෙ- අනට්ඨෙ නට්ඨසඤ්ඤී -පෙ- අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤී -පෙ- අදඩ්ඪෙ දඩ්ඪසඤ්ඤී -පෙ- අවිලුත්තෙ විලුත්තසඤ්ඤී අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං. නිස්සග්ගියං චීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. අවිප්පවුත්ථෙ විප්පවුත්ථසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අවිප්පවුත්ථෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. අවිප්පවුත්ථෙ අවිප්පවුත්ථසඤ්ඤී, අනාපත්ති.

25. අනාපත්ති අන්තො අරුණෙ පච්චුද්ධරති, විස්සජ්ජෙති, නස්සති, විනස්සති, ඩය්හති, අච්ඡින්දිත්වා ගණ්හන්ති, විස්සාසං ගණ්හන්ති, භික්ඛුසම්මුතියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**දුතියකඨිනසික්ඛාපදං නිට්ඨිතං.**

19. එක් කුලයකට අයත් පිරිකෙව් කළ කලවිටෙක් වේ නම් ඇතුළ් කලවිටෙහි සිවුර තබා ඇතුළ් කලවිටෙහි විසිය යුතු ය. පිරිකෙව් නොකරණ ලද වේ නම් අත්පසින් නොහළ යුතු ය. නානා කුලයතට අයත් පිරිකෙව් කළ කලවිටෙක් වේ නම් ඇතුළ් කලවිටෙහි සිවුර තබා දොර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු ය. පිරිකෙව් නො කරණ ලද වේ නම් අත්පසින් නො හළ යුතු.

20. එක් කුලයකට අයත් පිරිකෙව් කළ අරමෙක් වේ නම් ඇතුළ් අරමෙහි සිවුර තබා ඇතුළ් අරමෙහි විසිය යුතු ය. නො පිරිකෙව් කරණ ලද වේ නම් අත්පසින් නොහළ යුතු. නානා කුලයතට අයත් පිරිකෙව් කළ අරමෙක් වේ නම් ඇතුළ් අරමෙහි සිවුර තබා දොර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නො හළයුතු. නො පිරිකෙව් කරණ ලද වේ නම් අත්පසින් නො හළ යුතු.

21. එක් කුලයකට අයත් පිරිකෙව් කළ විහාරයෙක් වේ නම් ඇතුළ් විහාරයෙහි සිවුර තබා ඇතුළ් විහාරයෙහි විසිය යුතු ය. නොපිරිකෙව් කරණ ලද වේ නම් යම් විහාරයෙක සිවුර තබන ලද ද ඒ විහාරයෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු ය. නානා කුලයතට අයත් පිරිකෙව් කළ විහාරයෙක් වේ නම් යම් විහාරයෙක සිවුර තබන ලද ද ඒ විහාරයෙහි දොර වෙත හෝ විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු ය. නො පිරිකෙව් කරණ ලද වේ නම් යම් විහාරයෙක සිවුර තබන ලද ද ඒ විහාර-යෙහි විසිය යුතු ය. අත්පසින් හෝ නො හළ යුතු.

22. එක් කුලයකට අයත් රුක්මුලෙක් වේ නම් යම් තැනෙක හිරිමුදුන් කළා හාත්පසැ සෙවනලු පැතිරේ නම් ඇතුළ් සෙවනලුයෙහි සිවුර තබා ඇතුළ් සෙවනලුයෙහි විසිය යුතු ය. නානා කුලයතට අයත් රුක්මුලෙක් වේ නම් අත්පසින් නො හළ යුතු ය.

23. අභ්‍යවකාශ එකූපචාර නම්: නො ගම්හි වූ අරණ්‍යයෙහි හාත්පසැ සත් අබතුරෙක් එකූපචාර ය. එයින් එපිට නානූපචාර යි.

24. භික්ෂුසම්මති නැති ව විප්‍රයුක්තයෙහි විප්‍රයුක්ත ය යන සංඥ ඇත්තෙ නිසැඟිපචිති වෙයි. භික්ෂුසම්මති නැති ව විප්‍රයුක්ත වූයෙහි විමති ඇතියේ නිසැඟිපචිති වෙයි. භික්ෂුසම්මති නැති වැ විප්‍රයුක්ත වූයෙහි අවිප්‍රයුක්ත ය යන සංඥ ඇත්තේ නිසැඟිපචිති වෙයි. නොපසුද්ධරණ ලද්දෙහි පසුද්ධරණ ලද්‍ද යි සංඥ ඇත්තේ ... නොවිසජන ලදුයෙහි විසජන ලද්‍ද යි සංඥ ඇත්තේ ... නොනටුයෙහි නටැ යි සංඥ ඇත්තේ ... නොවැනැසුනෙහි වැනැසුනැ යි සංඥ ඇත්තේ ... නොදැවුනෙහි දැවිනැ යි සංඥ ඇත්තේ ... භික්ෂුසම්මති නැති ව නො පැහැරගත්තා ලදුයෙහි පැහැරගත්තා ලද්‍ද යි සංඥ ඇත්තේ නිසැඟිපචිති වේ. නිසැගි වූ සිවුර නො නිසජා පරිභොග කෙරේ නම් දුකුළාඇවැත් වෙයි. විප්‍රයුක්ත නො වූයෙහි විප්‍රයුක්ත ය යන සංඥ ඇත්තේ දුකුළාඇවැත් වෙයි. අවිප්‍රයුක්තයෙහි වෙමතික වූයේ දුකුළාඇවැත් වෙයි. අවිප්‍රයුක්ත වූයෙහි අවිප්‍රයුක්ත ය යන සංඥ ඇත්තේ ඇවැත් නැති.

25. ඇතුළ් අරුණෙහි පසුද්ධරු නම්, විසජා නම්, නැසේ නම්, වැනැසේ නම්, දැවේ නම්, අසිදැ ගණිත් නම්, විස්වැසි ව ගණිත් නම්, භික්ෂුසම්මතියෙන්, ඇවැත් නැති. උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ද්විතීය කඨින ශික්ෂාපදය නිමි.**

# 5. 1. 3.

## තතියකඨිනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො අකාලචීවරං උප්පන්නං හොති. තස්ස තං චීවරං කයිරමානං නප්පහොති. අථ ඛො සො භික්ඛු තං චීවරං උස්සාපෙත්වා පුනප්පුනං විමජ්ජති. අද්දසා ඛො භගවා සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තං භික්ඛුං තං චීවරං උස්සාපෙත්වා පුනප්පුනං විමජ්ජන්තං. දිස්වාන යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "කිස්ස ත්වං භික්ඛු ඉමං චීවරං උස්සාපෙත්වා පුනප්පුනං විමජ්ජසී"ති? "ඉදම්මෙ භන්තෙ අකාලචීවරං උප්පන්නං කයිරමානං නප්පහොති. තෙනාහං ඉමං චීවරං උස්සාපෙත්වා පුනප්පුනං විමජ්ජාමී"ති. "අත්ථි පන තෙ භික්ඛු චීවරපච්චාසා"ති? "අත්ථි භගවා"ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:– "අනුජානාමි භික්ඛවෙ අකාලචීවරං පටිග්ගහෙත්වා චීවරපච්චාසා නික්ඛිපිතු"න්ති.

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ භගවතා අනුඤ්ඤාතං අකාලචීවරං පටිග්ගහෙත්වා චීවරපච්චාසා නික්ඛිපිතුන්ති අකාලචීවරානි පටිග්ගහෙත්වා අතිරෙකමාසං නික්ඛිපන්ති තානි චීවරානි චීවරවංසෙ භණ්ඩිකාබද්ධානි තිට්ඨන්ති. අද්දසා ඛො ආයස්මා ආනන්දො සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තානි චීවරානි චීවරවංසෙ භණ්ඩිකාබද්ධානි තිට්ඨන්තෙ. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: "කස්සිමානි ආවුසො චීවරානි චීවරවංසෙ භණ්ඩිකාබද්ධානි තිට්ඨන්තී"ති. අම්හාකං ආවුසො අකාලචීවරානි චීවරපච්චාසා නික්ඛිත්තානී"ති. "කීව චිරං පනාවුසො ඉමානි චීවරානි නික්ඛිත්තානී"ති. "අතිරෙකමාසං ආවුසො"ති. ආයස්මා ආනන්දො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛූ අකාලචීවරං පටිග්ගහෙත්වා අතිරෙකමාසං නික්ඛිපිස්සන්තී"ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. –පෙ– "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අකාලචීවරං පටිග්ගහෙත්වා අතිරෙකමාසං නික්ඛිපන්තී"ති? "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා. "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා අකාලචීවරං පටිග්ගහෙත්වා අතිරෙකමාසං නික්ඛිපිස්සන්තී"ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ භික්ඛුනො පනෙව අකාලචීවරං උප්පජ්ජෙය්‍ය, ආකඞ්ඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා ඛිප්පමෙව කාරෙතබ්බං. නො චස්ස පාරිපූරි, මාසපරමං තෙන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං ඌනස්ස පාරිපූරියා සතියා පච්චාසාය, තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය, නිස්සග්ගියං පාචිත්තිය"**න්ති.

3. **නිට්ඨිතචීවරස්මින්ති** භික්ඛුනො චීවරං කතං වා හොති නට්ඨං වා විනට්ඨං වා දඩ්ඪං වා චීවරාසා වා උපච්ඡින්නා.

# 5. 1. 3.

## තෘතීයකඨිනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬුසිටුහුගේ දෙව්රම්හි වැඩ වාසය කරණ සේක. තවද එසමයෙහි එක්තරා මහණෙක්හට අයල්සිවුරක් උපන්නේ වෙයි. ඔහුට ඒ සිවුර කරණු ලබන්නේ නො පොහොනේ ය. ඉක්බිති ඒ මහණ තෙම ඒ සිවුර ඔසවා පුනපුනා විමර්දනය කෙරෙයි. භාග්‍යවතුන් වහන්සේ සෙනාසනචාරිකායෙහි වඩනාහු ඒ මහණ ඒ සිවුර ඔසවා පුනපුනා විමර්දනය කරණුවහු දුටහ. දැක ඒ මහණ යම් තැනෙක්හි ද එතැන්හි එළඹියහ. එළඹ ඒ මහණහට මෙය වදාළහ: 'මහණ, තෝ කුමට මේ සිවුර ඔසවා පුනපුනා විමර්දනය කෙරෙහි දැ'යි. 'වහන්ස, මේ මට උපන් අයල්සිවුර කරණු ලබන්නේ නොපොහොනේ වෙයි. එහෙයින් මම මේ සිවුර ඔසවා පුනපුනා විමර්දනය කෙරෙමි'යි. 'මහණ, තට සිවුරු ලැබීමේ ආශායෙක් ඇත් දැ?'යි. 'ඇත භාග්‍යවතුන් වහන්සැ'යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කථා වදාරා භික්ෂූන් ඇමතූ සේක: 'මහණෙනි, අයල්සිවුරක් පිළිගෙණ සිවුරු ලැබීමේ ආශායෙන් තබන්නට අනුදනිමි'යි.

2. තවද එසමයෙහි භික්ෂූහු භාග්‍යවතුන් විසින් 'අයල්සිවුරක් පිළිගෙණ සිවුරු ලැබීමේ ආශායෙන් තබන්නට අනුදන්නා ලදැ'යි අයල්සිවුරු පිළිගෙණ අතිරෙක මාසයක් කල් තබති. ඒ සිවුරු සිවුරුවසැ බදබැඳි ව සිටිති. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ සෙනාසනචාරිකායෙහි වඩනාහු ඒ චීවරයන් සිවුරුවසැ බදබැඳි ව සිටියන් දුටහ. දැක භික්ෂූන් ඇමැතූහ: 'ඇවැත්නි, කවරක්හුගේ මේ සිවුරු සිවුරුවසැ බදබැඳි ව සිටිත් දැ'යි. 'ඇවැත්නි, අපගේ නොකල්සිවුරු චීවරපච්චාසායෙන් තබන ලද්දැහු ය'යි. ඇවැත්නි, 'කිපමණ කල් මේ සිවුරු තබන ලද්දැහු දැ'යි. 'ඇවැත්නි, අයිරා මසෙකැ'යි. ආයුෂ්මත් අනඳ තෙරණුවෝ අවඥ කෙරෙති, අයුණු කියති දෙස් පහළ කෙරෙත්: 'කෙසේ නම් මහණහු අයල්සිවුරු පිළිගෙණ අයිරා මසක් තැබූ දැ'යි. ඉක්බිති ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. ... "සැබෑ ද මහණෙනි, භික්ෂූහු අයල්සිවුරු පිළිගෙණ අයිරා මසක් තබත් දැ?"යි. 'සැබව භාග්‍යවතුන් වහන්ස.' භාග්‍යවත් බුදුහු ගර්හා කළහ: 'කෙසේ නම් මහණෙනි, ඒ තුච්ඡපුරුෂයෝ අයල්සිවුරු පිළිගෙණ අයිරා මසක් තැබූහු ද, මහණෙනි, නොපහනුන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"භික්ෂුහුගේ සිවුර කොට නිමි කල්හි කඨින් උදුළ කල්හි භික්ෂුනට මැ වැළින් අයල්සිවුරෙක් උපදනේ නම් කැමැති වන්නා වූ භික්ෂුහු විසින් පිළිගත යුතු ය. පිළිගෙණ වහා ම කරවිය යුතු ය. ඉදින් පිරිපුන් බව නො වන්නේ නම් ඒ භික්ෂුහු විසින් ඌනපූරණය පිණිස සිවුරු ලැබීමේ ආශාවක් ඇති කල්හි ඒ සිවුර මසක් පරම කොට ඇති කලක් තැබිය යුතු ය. චීවරාසාවක් ඇති කල්හිදු එයින් මත්තෙහි තබා නම් නිසැගිපචිති වේ"යි.**

3. **නිට්ඨිතචීවරස්මිං** යනු: භික්ෂුහුගේ සිවුර කරණ ලද හෝ වෙයි. නැසුනේ හෝ වැනැසුනේ හෝ දැවුනේ හෝ චීවරාසාව සිඳුනේ හෝ වෙයි.

**උබ්භතස්මිං කඨිනෙති** අට්ඨන්නං මාතිකානං අඤ්ඤතරාය මාතිකාය උබ්භතං හොති, සඞ්ඝෙන වා අන්තරා උබ්භතං හොති.

**අකාලචීවරං** නාම: අනත්ථතෙ කඨිනෙ එකාදසමාසෙ උප්පන්නං, අත්ථතෙ කඨිනෙ සත්තමාසෙ උප්පන්නං, කාලෙපි ආදිස්ස දින්නං, එතං අකාලචීවරං නාම.

**උප්පජ්ජෙය්‍යාති** උප්පජ්ජෙය්‍ය සඞ්ඝතො වා ගණතො වා ඤාතිතො වා මිත්තතො වා පංසුකූලං වා අත්තනො වා ධනෙන.

**ආකඞ්ඛමානෙනාති** ඉච්ඡමානෙන පටිග්ගහෙතබ්බං.

**පටිග්ගහෙත්වා ඛිප්පමෙව කාරෙතබ්බන්ති** දසාහා කාරෙතබ්බං.

**නො චස්ස පාරිපූරීති** කයිරමානං නප්පහොති.

**මාසපරමං තෙන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බන්ති** මාසපරමතා නික්ඛිපිතබ්බං.

**ඌනස්ස පාරිපූරියාති** ඌනස්ස පාරිපූරත්ථාය.

**සතියා පච්චාසායාති** පච්චාසා හොති සඞ්ඝතො වා ගණතො වා ඤාතිතො වා මිත්තතො වා පංසුකූලං වා අත්තනො වා ධනෙන.

**තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසායාති** තදහුප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති, දසාහා කාරෙතබ්බං. ද්වීහුප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති, දසාහා කාරෙතබ්බං. තීහුප්පන්නෙ -පෙ- චතූහුප්පන්නෙ, -පෙ- පඤ්චාහුප්පන්නෙ -පෙ- ඡාහුප්පන්නෙ, -පෙ- සත්තාහුප්පන්නෙ, -පෙ- අට්ඨාහුප්පන්නෙ, -පෙ- නවාහුප්පන්නෙ, -පෙ- දසාහුප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති, දසාහා කාරෙතබ්බං. එකාදසෙ උප්පන්නෙ -පෙ- ද්වාදසෙ උප්පන්නෙ -පෙ- තෙරසෙ උප්පන්නෙ -පෙ- චුද්දසෙ උප්පන්නෙ -පෙ- පණ්ණරසෙ උප්පන්නෙ -පෙ- සොළසෙ උප්පන්නෙ -පෙ- සත්තරසෙ උප්පන්නෙ -පෙ- අට්ඨාරසෙ උප්පන්නෙ -පෙ- එකූනවීසෙ උප්පන්නෙ -පෙ- වීසෙ උප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති, දසාහා කාරෙතබ්බං. එකවීසෙ උප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති, නවාහා කාරෙතබ්බං. ද්වාවීසෙ උප්පන්නෙ -පෙ- තෙවීසෙ උප්පන්නෙ -පෙ- චතුවීසෙ උප්පන්නෙ -පෙ- පඤ්චවීසෙ උප්පන්නෙ -පෙ- ඡබ්බීසෙ උප්පන්නෙ -පෙ- සත්තවීසෙ උප්පන්නෙ -පෙ- අට්ඨවීසෙ උප්පන්නෙ -පෙ- එකූනතිංසෙ උප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති, එකාහා කාරෙතබ්බං. තිංසෙ උප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති, තදහෙව අධිට්ඨාතබ්බං. විකප්පෙතබ්බං. විස්සජ්ජෙතබ්බං. නො චෙ අධිට්ඨෙය්‍ය වා විකප්පෙය්‍ය වා විස්සජ්ජෙය්‍ය වා-

**උබ්භතස්මිං කඨිනෙ** යනු: අට වැදෑරුම් මාතෘකාවන් අතුරින් එක්තරා මාතෘකායෙකින් උද්ධරන ලද්දේ වෙයි. සඞ්ඝයා විසින් හෝ අතර උද්ධරන ලද වෙයි.

**අකාලචීවර** නම්: කෙළින් නොඅතුල කල්හි එකොළොස් මස්හි උපන්නේ ය. කෙළින් අතුල කල්හි සත්මස් මුළුල්ලෙහි උපන්නේ ය. කල්හිදු නොකල්සිවුරු සි උදෙසා දෙන ලද්දේ ය. තෙල අයල් සිවුරු නම.

**උප්පජ්ජෙය්‍ය** යනු: සඞ්ඝයා කෙරෙන් හෝ ගණයා කෙරෙන් හෝ නෑයන් කෙරෙන් හෝ මිත්‍රයන් කෙරෙන් හෝ පසුල් ව හෝ තමාගේ ධනයෙන් හෝ උපදනේ ය.

**ආකඞ්ඛමානෙන** යනු: කැමැත්තහු විසින් පිළිගත යුතු ය.

**පටිග්ගහෙත්වා ඛිප්පමෙව කාරෙතබ්බං** යනු: දස දවසෙකින් කරවිය යුතු ය.

**නො චස්ස පාරිපූරි** යනු: කරණු ලබන්නේ නො පොහොනේ ය.

**මාසපරමං තෙන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං** යනු: මසක් කල් පරම කොට තැබිය යුතු ය.

**ඌනස්ස පාරිපූරියා** යනු: උනු වූවහුගේ සම්පූර්ණ බව පිණිස ය.

**සතියා පච්චාසාය** යනු: සඞ්ඝයා කෙරෙන් හෝ ගණයා කෙරෙන් හෝ නෑයන් කෙරෙන් හෝ මිත්‍රයන් කෙරෙන් හෝ පසුල් ව හෝ තමාගේ ධනයෙන් හෝ සිවුරු ලැබීමේ ආශායෙක් වෙයි.

**තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියා'පි පච්චාසාය** යනු: එදවස උපන් මූලචීවරය ඇති කල්හි පච්චාසාචීවරය උපදී නම් දස දවසින් කරවිය යුතු ය. දෙවන දවස උපන් මූලචීවරය ඇති කල්හි පච්චාසාචීවරය උපදී නම් දස දවසින් කරවිය යුතු ය. තුන්වන දවස උපන් ... සතර වන දවස උපන් ... පස් වන දවස උපන් ... සවන දවස උපන් ... සත් වන දවස උපන් ... අට වන දවස උපන් ... නව වන දවස උපන් ... දස වන දවස උපන් මූලචීවරය ඇති කල්හි පච්චාසාචීවරය උපදී නම් දස දවසින් කරවිය යුතු. එකොළොස් වන දවස උපන් ... දෙළොස් වන දවස උපන් ... තෙළෙස් වන දවස උපන් ... තුදුස් වන දවස උපන් ... පසළොස් වන දවස උපන් ... සොළොස් වන දවස උපන් ... සතළොස් වන දවස උපන් ... අටළොස් වන දවස උපන් ... එකුන්විසි වන දවස උපන් ... විසි වන දවස උපන් මූලචීවරය ඇති කල්හි පච්චාසාචීවරය උපදී නම් දස දවසින් කරවිය යුතු. එක්විසි වන දවස උපන් මූලචීවරය ඇති කල්හි පච්චාසාචීවරය උපදී නම් නව දවසින් කරවිය යුතු ය. දෙවිසි වන දවස උපන් ... තෙවිසි වන දවස උපන් ... සූවිසි වන දවස උපන් ... පස්විසි වන දවස උපන් ... සවිසි වන දවස උපන් ... සත්විසි වන දවස උපන් .. අටවිසි වන දවස උපන් ... එකුන්තිස් වන දවස උපන් මූලචීවරය ඇති කල්හි පච්චාසාචීවරය උපදී නම් එක්දවසින් කරවිය යුතු. තිස් වන දවස උපන් මූලචීවරය ඇති කල්හි පච්චාසාචීවරය උපදී නම් එදවස මැ ඉටිය යුතු ය. විකැපිය යුතු ය. විසැදිය යුතු ය. ඉදින් නො ඉටා නම් හෝ නො විකපා නම් හෝ නො විසඳ නම් හෝ-

එකතිංසෙ අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති, නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං -පෙ- "ඉදං මෙ භන්තෙ අකාලචීවරං මාසාතික්කන්තං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යා"ති -පෙ- දදෙය්‍යු"න්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

4. විසභාගෙ උප්පන්නෙ මූලචීවරෙ පච්චාසාචීවරං උප්පජ්ජති රත්තියො ච සෙසා හොන්ති, න අකාමා කාරෙතබ්බං.

5. මාසාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. මාසාතික්කන්තෙ වෙමතිකො -පෙ- මාසාතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී -පෙ- අනධිට්ඨිතෙ අධිට්ඨිතසඤ්ඤී -පෙ- අවිකප්පිතෙ විකප්පිතසඤ්ඤී -පෙ- අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී -පෙ- අනට්ඨෙ නට්ඨසඤ්ඤී -පෙ- අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤී -පෙ- අදඩ්ඪෙ දඩ්ඪසඤ්ඤී -පෙ- අවිලුත්තෙ විලුත්තසඤ්ඤී නිස්සග්ගියං පාචිත්තියං.

6. නිස්සග්ගියං චීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස. මාසානතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. මාසානතික්කන්තෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. මාසානතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී, අනාපත්ති.

7. අනාපත්ති අන්තොමාසං අධිට්ඨෙති, විකප්පෙති, විස්සජ්ජෙති, නස්සති, විනස්සති, ඩය්හති, අච්ඡින්දිත්වා ගණ්හන්ති, විස්සාසං ගණ්හන්ති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

තතියකඨිනසික්ඛාපදං නිට්ඨිතං.

---

## 5. 1. 4.

## පුරාණචීවරසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො උදායිස්ස පුරාණදුතියිකා භික්ඛුනීසු පබ්බජිතා හොති, සා ආයස්මතො උදායිස්ස සන්තිකෙ අභික්ඛණං ආගච්ඡති, ආයස්මාපි උදායී තස්සා භික්ඛුනියා සන්තිකෙ අභික්ඛණං ගච්ඡති. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායී තස්සා භික්ඛුනියා සන්තිකෙ භත්තවිස්සග්ගං කරොති. අථ ඛො ආයස්මා උදායී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන සා භික්ඛුනී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තස්සා භික්ඛුනියා පුරතො අඞ්ගජාතං විවරිත්වා ආසනෙ නිසීදි, සාපි ඛො භික්ඛුනී ආයස්මතො උදායිස්ස පුරතො අඞ්ගජාතං විවරිත්වා නිසීදි. අථ ඛො ආයස්මා උදායී සාරත්තො තස්සා භික්ඛුනියා අඞ්ගජාතං උපනිජ්ඣායි තස්ස අසුචි මුච්චි.

එක්තිස් වන අරුණ නැගෙන කල්හි නිසැගි වෙයි. සඟහට හෝ ගණයට හෝ පුඟුල්හට හෝ නිසැදිය යුතු ය. තවද මහණෙනි, මෙසේත් නිසැදිය යුතු ය.... "වහන්ස, මේ මාගේ අයල්සිවුර මසක් ඉක්මගියේ නිසැගි විය, මෙය මම සඟහට නිසදමි'යි ... දෙන්නේ ය. ... දෙන්නාහු ය. ... ආයුෂමත්හට දෙමි"යි.

4. විසභාග වූ මූලචීවරය උපන් කල්හි පච්චාසාචීවරය උපදී නම් රාත්‍රිහු ද ශෙෂ වෙත් නම් නො කැමැත්තෙත් නො කරවිය යුතු ය.

5. මසක් ඉක්ම ගිය සිවුරෙහි "ඉක්ම ගියේ ය" යන සංඥ ඇත්තේ නිසැගි පචිති වෙයි. මසක් ඉක්මගිය සිවුරෙහි විමති ඇතියේ ... මසක් ඉක්මගිය සිවුරෙහි ,නො ඉක්මිනැ'යි සංඥ ඇත්තේ ... නො ඉටූයෙහි 'ඉටන ලද'යි සංඥ ඇත්තේ ... නො විකැපූයෙහි 'විකපන ලද'යි සංඥ ඇත්තේ ... නො විසජන ලදුයෙහි 'විසජන ලද'යි සංඥ ඇත්තේ ... නො නටුයෙහි නටැ යි සංඥ ඇත්තේ ... නො වැනැසුනු සිවුරෙහි 'වැනැසිනැ'යි සංඥ ඇත්තේ ... නො දවුනෙහි 'දවිනැ'යි සංඥ ඇත්තේ ... අසිදැ ගන්නා ලද්දෙහි 'නො අසිදැ ගන්නා ලද'යි සංඥ ඇත්තේ නිසැගි පචිති වේ.

6. නිසැයි වූ සිවුර නො නිසජා පරිභොග කෙරේ නම් දුකුලාඇවැත් වෙයි. මසක් නො ඉක්මගිය සිවුරෙහි 'ඉක්මිනැ'යි සංඥ ඇත්තේ දුකුලාඇවැත් වෙයි. මසක් නො ඉක්මගිය සිවුරෙහි විමති ඇතියේ දුකුලාඇවැත් වෙයි. මසක් නොඉක්මගිය සිවුරෙහි 'නො ඉක්මිනැ'යි සංඥ ඇත්තේ ඇවැත් නැති.

7. ඇතුළු මාසයෙහි ඉටා නම්, විකපා නම්, විසජා නම්, නැසේ නම්, විනැසේ නම්, දවේ නම්, අසිදැ ගණිත් නම්, විස්වැසි ව ගණිත් නම් ඇවැත් නැති. උමතුහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තෘතීය කඨින ශික්ෂාපදය නිමි.**

---

## 5. 1. 4.

## පුරාණචීවරශික්ෂාපදය.

1 එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඩු සිටුහුගේ දෙව්රම්හි වැඩ වෙසෙති. එසමයෙහි ආයුෂමත් උදයී තෙරුන්ගේ පුරාණදුතියිකාව මෙහෙණන් කෙරෙහි පැවිදි වූවා වෙයි. ඕ තොමෝ නිරතුරු ආයුෂමත් උදයී තෙරුන් වෙත පැමිණෙයි. ආයුෂමත් උදයී තෙර ද නිරතුරු ඒ මෙහෙණ වෙත යයි. එසමයෙහි ආයුෂමත් උදයී තෙර ඒ මෙහෙණ වෙත බත්කිස කෙරෙයි. එකල ආයුෂමත් උදයී තෙර පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ ඒ මෙහෙණ වෙත එළඹියේ ය. එළඹ ඒ මෙහෙණ පෙරටුයෙහි අඞගජාතය විවර කොට ආසනයෙහි හුන්නේ ය. ඒ මෙහෙණ ද ආයුෂමත් උදයී තෙරුන් ඉදිරියෙහි අඞගජාතය විවර කොට හිඳගතු. එකල්හි ආයුෂමත් උදයී තෙර හටගත් රාග ඇත්තේ ඒ මෙහෙණගේ අඞගජාතය මෙනෙහි කෙළේ ය. ඔහුට අශුචි මිදින.

2. අථ ඛො ආයස්මා උදායී තං භික්ඛුනිං එතදවොච: “ගච්ඡ භගිනි උදකං ආහර, අන්තරවාසකං ධොවිස්සාමී”ති. “ආහරය්‍ය, අහමෙව ධොවිස්සාමී”ති තං අසුචිං එකදෙසං මුඛෙන අග්ගහෙසි, එකදෙසං අඞ්ගජාතෙ පක්ඛිපි. සා තෙන ගබ්භං ගණ්හි. භික්ඛුනියො එවමාහංසු: “අබ්‍රහ්මචාරිනී අයං භික්ඛුනී ගබ්භිනී”ති. “නාහං අය්‍යා අබ්‍රහ්මචාරිනී”ති භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. භික්ඛුනියො උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “කථං හි නාම අය්‍යො උදායී භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙස්සතී”ති. අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “කථං හි නාම ආයස්මා උදායී භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙස්සතී”ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. “සච්චං කිර ත්වං උදායී භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙසී”ති? “සච්චං භගවා”. “ඤාතිකා තෙ උදායී අඤ්ඤාතිකා”ති. “අඤ්ඤාතිකා භගවා”ති. “අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතිකාය න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා පාසාදිකං වා අපාසාදිකං වා. තත්ථ නාම ත්වං මොඝපුරිස අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:”

**“යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා ආකොටාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තිය”න්ති:**

3. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අඤ්ඤාතිකා** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධා.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**පුරාණචීවරං** නාම: සකිං නිවත්ථම්පි සකිං පාරුතම්පි.

**ධොවාති ආණාපෙති,** ආපත්ති දුක්කටස්ස. ධොතං නිස්සග්ගියං හොති. **රජාති ආණාපෙති,** ආපත්ති දුක්කටස්ස, රත්තං නිස්සග්ගියං හොති. **ආකොටෙහීති ආණාපෙති,** ආපත්ති දුක්කටස්ස, සකිං පාණිප්පහාරං වා මුග්ගරප්පහාරං වා දින්නෙ නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා.

4. එවං ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: “ඉදං මෙ භන්තෙ පුරාණචීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා ධොවාපිතං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී”ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී”ති. -පෙ-

2. ඉක්බිති ආයුෂ්මත් උදායී තෙර ඒ මෙහෙණට මෙසේ කී ය. 'යා නැඟණියෙනි, දිය ගෙණෙව. අන්තරවාසකය සෝදමි'යි. "දෙව හිමියනි, මම මැ සෝදමි'යි. ඒ අශුචි එක්දෙසක් මුවින් ගතු. එක්දෙසක් අඞ්ගජාතයෙහි බැහූ. ඕ තොමෝ එයින් ගබ් ගතු. භික්ෂුණීහු මෙසේ කීහු: "මේ මෙහෙණ බඹසර නැත්තී ගැබිලියකැ'යි. "ආර්‍ය්‍යාවෙනි, මම බඹසර නැතියක් නො වෙමි'යි. භික්ෂුණීන්ට මෙ පවත් දැන්වූ. භික්ෂුණීහු අවඥ කෙරෙති. අයුණු කියති. දෙස් පහළ කෙරෙත්: 'කෙසේ නම් උදායී හිමිහු මෙහෙණක ලවා පොරණ සිවුරක් දෙවූහු ද'යි. ඉක්බිති ඒ භික්ෂුණීහු භික්ෂූන්ට මෙපවත් දැන්වූහ. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ වෙත් ද ඔහු අවඥ කෙරෙති අයුණු කියති දෙස් පහළ කෙරෙත්: 'කෙසේ නම් ආයුෂ්මත් උදායී තෙර මෙහෙණක ලවා පොරණසිවුරක් දෙවී ද'යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. 'සැබෑද උදායිය, තෝ මෙහෙණක ලවා පොරණසිවුරක් දෙවීහි ලු'යි. 'සැබව භාග්‍යවතුන් වහන්ස,' උදායිය, තට 'නෑ එකක් ද නො නෑ එකක් දැ'යි. 'නො නෑ එකක භාග්‍යවතුන් වහන්සැ'යි. "තුච්ඡපුරුෂය, නො නෑයෙක් නො නෑ එකක්හට සුදුස්සක් හෝ නො සුදුස්සක් හෝ ප්‍රසාදයට වැටෙන්නක් හෝ අප්‍රසාදයට වැටෙන්නක් හෝ නො දනියි. එහි ලා තුච්ඡපුරුෂය, තෝ නො නෑ මෙහෙණක ලවා පොරණසිවුර දෙවීහි. තුච්ඡපුරුෂය, නොපහන්නන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවූ:

**"යම් මහණෙක් තෙම නොනෑ මෙහෙණක ලවා පොරණසිවුරක් දෙවවා නම් හෝ රදවා නම් හෝ කොලවා නම් හෝ නිසැගිපචිති වේ" යයි.**

3. **යො පන** යනු: යමෙක් යම් බඳුයෙක් ...

**භික්ඛු** යනු: ... මේ තෙමේ මේ අර්ථයෙහි 'භික්ඛු'යයි අදහස් කරණ ලද්දේ ය.

**අඤ්ඤාතිකා** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත් වැනි මුත්තාවුන් තෙක් අසම්බන්ධයෝ යි.

**භික්ඛුනී** නම්: උභතොසඞ්ඝයා කෙරෙහි උපසපන් වූවා.

**පුරාණචීවර** නම්: වරක් හඳනා ලද්දේ ද වරක් පොරෝනා ලද්දේ ද වෙයි.

**'දෙවවයි' අණවා** නම් දුකුලාඇවැත් වෙයි, **දෝනා** ලද්දේ නිසැගි වෙයි. **'රඳවයි' අණවා** නම් දුකුලාඇවැත් වෙයි. රඳනා ලද්දේ නිසැගි වෙයි. **'කොලවයි' අණවා** නම් දුකුලාඇවැත් වෙයි. වරක් අත්පහරක් හෝ මුගුරු පහරක් හෝ දුන් කල්හි නිසැගි වෙයි. සඟනට හෝ ගණයට හෝ පුඟුලක්හට හෝ නිසැජ්ය යුතු ය.

4. තවද මහණෙනි මෙසේත් නිසැජිය යුතු ය. "වහන්ස, මාගේ 'මේ පොරණ සිවුර නොනෑ මෙහෙණක ලවා දෙවවන ලද්දේ නිසැගි විය. මම මෙය සඟනට නිසදමි'යි ... දෙන්නේ යයි ... දෙන්නානු ඥයි ... ආයුෂ්මත්හට දෙමි'යි ...

5. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං ධොවාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං ධොවාපෙති රජාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං ධොවාපෙති ආකොටාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං ධොවාපෙති රජාපෙති ආකොටාපෙති, නිස්සග්ගියෙන ආපත්ති ද්වින්නං දුක්කටානං.

6. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං රජාපෙති, නිස්සග්ගියං පාචිත්තියං -පෙ- රජාපෙති ආකොටාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. රජාපෙති ධොවාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. රජාපෙති ආකොටාපෙති ධොවාපෙති, නිස්සග්ගියෙන ආපත්ති ද්වින්නං දුක්කටානං.

7. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං ආකොටාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං ආකොටාපෙති ධොවාපෙති -පෙ- ආකොටාපෙති රජාපෙති -පෙ- ආකොටාපෙති ධොවාපෙති රජාපෙති, නිස්සග්ගියෙන ආපත්ති ද්වින්නං දුක්කටානං.

8. අඤ්ඤාතිකාය වෙමතිකො -පෙ- අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී -පෙ- අඤ්ඤස්ස පුරාණචීවරං ධොවාපෙති, ආපත්ති දුක්කටස්ස. නිසීදනපච්චත්ථරණං ධොවාපෙති, ආපත්ති දුක්කටස්ස. එකතො උපසම්පන්නාය ධොවාපෙති, ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී -පෙ- ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය වෙමතිකො -පෙ- ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය ඤාතිකසඤ්ඤී -පෙ- අනාපත්ති.

9. අනාපත්ති ඤාතිකාය ධොවන්තියා අඤ්ඤාතිකා දුතියා හොති, අවුත්තා ධොවති, අපරිභුත්තං ධොවාපෙති, චීවරං ඨපෙත්වා අඤ්ඤං පරික්ඛාරං ධොවාපෙති, සික්ඛමානාය, සාමණෙරියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පුරාණචීවරසික්ඛාපදං නිට්ඨිතං.**

5. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණ ය යන සංඥ ඇති ව පොරණ සිවුරු දෙවා නම් නිසැගිපචිති වෙයි. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණ ය යන සංඥ ඇති ව පොරණ සිවුරු දෙවා නම් රජත් කරවා නම් නිසැගි හා සමග දුකුලාඇවැත් වෙයි. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණ ය යන සංඥ ඇති ව පොරණසිවුරු දෙවා නම් කොලවා නම් නිසැගි හා සමග. දුකුලා-ඇවැත් වෙයි. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණ ය යන සංඥ ඇති ව පොරණ සිවුරු දෙවා නම් රජත් කරවා නම් කොලවා නම් නිසැගි හා සමග දෙ දුකුලාඇවැතෙක් වේ.

6. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණය යන සංඥ ඇති ව පොරණ සිවුරු රජත් කරවා නම් නිසැගිපචිති වෙයි ... රජත් කරවා නම් කොලවා නම් නිසැගි හා සමග දුකුලාඇවැත් වෙයි. රජත් කරවා නම් දෙවා නම් නිසැගි හා සමග දුකුලාඇවැත් වෙයි. රජත් කරවා නම් කොලවා නම් දෙවා නම් නිසැගි හා සමග දෙ දුකුලා-ඇවැතෙක් වේ.

7. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණය යන සංඥ ඇති ව පොරණ සිවුරු කොලවා නම් නිසැගිපචිති වෙයි. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණ ය යන සංඥ ඇති ව පොරණ සිවුරු කොලවා නම් දෙවා නම් ... කොලවා නම් රජත් කරවා නම් ... කොලවා නම් දෙවා නම් රජත් කරවා නම් නිසැගි හා සමග දෙ දුකුලා ඇවැතෙක් වේ.

8. නොනෑ මෙහෙණ කෙරෙහි විමති ඇති ව ... නොනෑ මෙහෙණ කෙරෙහි නෑ මෙහෙණ ය යන සංඥ ඇති ව ... අනෙකක්හුගේ පොරණ සිවුරු දෙවා නම් දුකුලාඇවැත් වෙයි, නිසදුන් පසතුරුණු දෙවා නම් දුකුලාඇවැත් වෙයි. භික්ඛුනීසඞ්ඝයා කෙරෙහි උපසපන් මෙහෙණක ලවා දෙවා නම් දුකුලාඇවැත් වෙයි. නෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණ ය යන සංඥ ඇති ව ... දුකුලාඇවැත් වෙයි. නෑ මෙහෙණ කෙරෙහි විමති ඇති ව ... දුකුලාඇවැත් වෙයි. නෑ මෙහෙණ කෙරෙහි නෑ මෙහෙණ ය යන සංඥ ඇති ව ... ඇවැත් නැති.

9. නෑ මෙහෙණ දෙවන කල්හි, නොනෑ මෙහෙණ දෙවැත්තක් වේ නම්, නො කියන ලද්දී දෙවා නම්, පරිභොග නො කරණ ලද්ද දෙවා නම්, සිවුරු තබා අන් පිරිකරක් දෙවා නම්, සික්ඛමානාවක ලවා, සාමණෙරියක ලවා දෙවා නම් ඇවැත් නැති. උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති යයි.

පුරාණචීවර ශික්ෂාපදය නිමි.

## 5. 1. 5.

## චීවරපටිග්ගහණසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන උප්පලවණ්ණා භික්ඛුනී සාවත්ථියං විහරති. අථ ඛො උප්පලවණ්ණා භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං[1] පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන අන්ධවනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා දිවාවිහාරාය අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. තෙන ඛො පන සමයෙන චොරා කතකම්මා ගාවිං වධිත්වා මංසං ගහෙත්වා අන්ධවනං පවිසිංසු. අද්දසා ඛො චොරගාමණිකො උප්පලවණ්ණං භික්ඛුනිං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නං, දිස්වා සචෙ මෙ පුත්තභාතුකා පස්සිස්සන්ති විහෙඨියිස්සන්ති ඉමං භික්ඛුනින්ති අඤ්ඤෙන මග්ගෙන අගමාසි. අථ ඛො සො චොරගාමණිකො මංසෙ පක්කෙ වරමංසානි ගහෙත්වා පණ්ණපුටං [2]බන්ධිත්වා උප්පලවණ්ණාය භික්ඛුනියා අවිදූරෙ රුක්ඛෙ ආලග්ගෙත්වා "යො පස්සති සමණො වා බ්‍රාහ්මණො වා දින්නංයෙව හරතූ"ති වත්වා පක්කාමි. අස්සොසි ඛො උප්පලවණ්ණා භික්ඛුනී සමාධිම්හා වුට්ඨහිත්වා තස්ස චොරගාමණිකස්ස ඉමං වාචං භාසමානස්ස. අථ ඛො උප්පලවණ්ණා භික්ඛුනී තං මංසං ගහෙත්වා උපස්සයං අගමාසි. අථ ඛො උප්පලවණ්ණා භික්ඛුනී තස්සා රත්තියා අච්චයෙන තං මංසං සම්පාදෙත්වා උත්තරාසඞ්ගෙ භණ්ඩිකං බන්ධිත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා වෙළුවනෙ පච්චුට්ඨාසි.

2. තෙන ඛො පන සමයෙන භගවා ගාමං පිණ්ඩාය පවිට්ඨො හොති. ආයස්මා උදායී ඔහිය්‍යකො හොති විහාරපාලො. අථ ඛො උප්පලවණ්ණා භික්ඛුනී යෙනායස්මා උදායී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොච:- "කහං භන්තෙ භගවා"ති. "පවිට්ඨො භගිනි භගවා ගාමං පිණ්ඩායා"ති. "ඉමං භන්තෙ මංසං භගවතො දෙහී"ති. "සන්තප්පිතො තයා භගිනි භගවා මංසෙන. සචෙ මෙ ත්වං අන්තරවාසකං දදෙය්‍යාසි, එවං අහම්පි සන්තප්පිතො භවෙය්‍යං අන්තරවාසකෙනා"ති. "මයං ඛො භන්තෙ මාතුගාමා නාම කිච්ඡලාභා, ඉදඤ්ච මෙ අන්තිමං පඤ්චමං චීවරං, නාහං දස්සාමී"ති. "සෙය්‍යථාපි භගිනි පුරිසො හත්ථිං දත්වා කච්ඡෙ සජ්ජෙය්‍ය,[3] එවමෙව ඛො ත්වං භගිනි භගවතො මංසං දත්වා මයි අන්තරවාසකෙ[4] සජ්ජසී"ති. අථ ඛො උප්පලවණ්ණා භික්ඛුනී ආයස්මතා උදායිනා නිප්පීළියමානා අන්තරවාසකං දත්වා උපස්සයං අගමාසි. භික්ඛුනියො උප්පලවණ්ණාය භික්ඛුනියා පත්තචීවරං පටිග්ගණ්හන්තියො උප්පලවණ්ණං භික්ඛුනිං එතදවොචුං: "කහං තෙ අය්‍යෙ අන්තරවාසකො"ති. උප්පලවණ්ණා භික්ඛුනී භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසි. භික්ඛුනියො උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යො උදායී භික්ඛුනියා චීවරං පටිග්ගහෙස්සති, කිච්ඡලාභො මාතුගාමො"ති. අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං.

---

1. සාවත්ථියං, කත්ථචි 2. පණ්ණෙ පුටං. ස්‍යා. 3. විසජ්ජෙය්‍ය ස්‍යා. 4. අන්තරවාසකං න සජ්ජසීති සී මු. මය්හං අන්තරවාසකං විසජ්ජෙසීති. ස්‍යා.

# 5. 1. 5.

## චීවරප්‍රතිග්‍රහණශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වෙසෙති. එසමයෙහි උපුල්වන් මෙහෙණ සැවැත්නුවර වෙසෙයි. ඉක්බිති උපුල්වන් මෙහෙණ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ පිඬු පිණිස සැවැතට පිවිසියා ය. සැවැතෙහි පිඬු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් නැවැතුනී අන්‍ධවනය කරා එළඹියා ය. එළඹ දිවාවිහාරය පිණිස අන්‍ධවනයට පිවිස එක්තරා රුක්මුලෙකැ දිවාවිහාරයෙහි හුන්නී ය. එසම-යෙහි කල සොරකම් ඇති සොරු දෙනක මරා මස් ගෙණ අන්‍ධවනයට පිවිසියහ. ඉක්බිති සොරදෙටු තෙම එක්තරා රුක්මුලෙක දිවාවිහාරයෙහි හුන් උපුල්වන් මෙහෙණ දිටී. දැක ඉදින් මාගේ දරු-මල්හු මේ මෙහෙණ දක්නාහු නම් වෙහෙසන්නාහ'යි අන් මඟෙකින් ගියේ ය. ඉක්බිති ඒ සොරදෙටු තෙම මස් පැසුනු කල්හි සොඳුරුමස් ගෙණ පත්පළාවක් බැඳ උපුල්වන් මෙහෙණට නුදුරු තැන්හි රුකෙක එල්වා "මහණ වේවයි බමුණු වේවයි යමෙක් දකී නම් දෙන ලද මැ" ය 'ගෙණ යේව'යි කියා ගියේය. උපුල්වන් මෙහෙණ සමාධියෙන් නැගී මෙතෙපුල් කියන ඒ සොරදෙටුවාගේ බස් ඇසූ ය. ඉක්බිති උපුල්වන් මෙහෙණ ඒ මස් ගෙණ මෙහෙණවරට ගියා ය. ඉක්බිති උපුල්වන් මෙහෙණ ඒ රාත්‍රිහුගේ ඇවෑමෙන් ඒ මස් පිළියෙල කොට උතුරුසඟසිවුරෙහි පොදි බැඳ අහසට පැනනැගී වේළුවනවිහාරයෙහි බැස සිටියා ය.

2. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස ගම්වැදුනාහු වෙති. ආයුෂ්මත් උදායී තෙරණුවෝ වෙහෙර රක්නාහු නැවැතුනාහු වෙති. ඉක්බිති උපුල්වන් මෙහෙණ උදායී තෙරුන් කරා එළඹියා ය. එළඹ ආයුෂ්මත් උදායී තෙරුන්ට මෙය කිවූ ය: 'වහන්ස භාග්‍යවතුන් වහන්සේ කොහි දැ'යි. "නැගනියනි, භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස ගමට පිවිසියහ'යි. 'වහන්ස, මේ මස් භාග්‍යවතුන් වහන්සේට දෙව'යි. "නැගනියනි, තොප විසින් භාග්‍යවතුන් වහන්සේ මසින් සතපන ලදහ. ඉදින් තෙපි මට අතුරුවසාසිවුර දෙන්නහු නම් මෙසේ මම ද අතුරුවසාසිවුරින් සතප්නා ලද්දෙම් වන්නෙමි'යි. "වහන්ස, අපි නම් මාගම්වූවමෝ ප්‍රත්‍යය දුකසේ ලබන්-නම්හ. මේ ද මාගේ පැසිම් පස්වැනි සිවුර ය. (එහෙයින්) මම නො දෙමැ'යි 'යම්සේ නැගනියනි, පුරුෂයෙක් ඇතු දී පොරොද්දෙහි ඇලෙන්නේ ද, එපරිද්දෙන් ම නැගනියනි, තෙපි භාග්‍යවතුන් වහන්සේට මස් දී මාකෙරෙහිලා අතුරුවසාසිවුරෙහි ඇලෙන්නහු"යයි. ඉක්බිති උපුල්වන් මෙහෙණ ආයුෂ්මත් උදායී තෙරුන් විසින් දැඩි ව පෙළනු ලබන්නී අතුරුවසාසිවුර දී මෙහෙණ-වරට ගියා ය. භික්‍ෂුණීහු උපුල්වන් මෙහෙණගේ පාසිවුරු පිළිගන්නාහු උපුල්වන් මෙහෙණට මෙපවත් කීහ: "ආර්‍ය්‍යාවෙනි, තොපගේ අතුරුවසා-සිවුර කොහි දැ'යි. උපුල්වන් මෙහෙණ භික්‍ෂුණීන්ට එපවත් දැන්වූය. භික්‍ෂුණීහු අවමන් කෙරෙති අයුණු කියති දොස් පහළ කෙරෙත්: 'කෙසේ නම් උදායී හිමි මෙහෙණගේ සිවුර පිළිගන්නේ ද; මාගම (ප්‍රත්‍යය) දුකසේ ලබන්නී'යයි. ඉක්බිති ඒ භික්‍ෂුණීහු භික්‍ෂූන්ට මෙපවත් දැන්වූහ.

3. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායී භික්ඛුනියා චීවරං පටිග්ගහෙස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර ත්වං උදායී භික්ඛුනියා චීවරං පටිග්ගහෙසීති?" "සච්චං භගවා." "ඤාතිකා තෙ උදායී අඤ්ඤාතිකා"ති. "අඤ්ඤාතිකා භගවා"ති. "අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතිකාය න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා සන්තං වා අසන්තං වා තත්ථ නාම ත්වං මොඝපුරිස අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගහෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියන්ති."**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[**මූලපඤ්ඤත්ති.**]

4. තෙන ඛො පන සමයෙන භික්ඛූ කුක්කුච්චායන්තා භික්ඛුනීනං පාරිවට්ටකචීවරං න පටිග්ගණ්හන්ති. භික්ඛුනියො උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා අම්හාකං පාරිවට්ටකචීවරං න පටිග්ගහෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තාසං භික්ඛුනීනං උජ්ඣායන්තීනං ඛීයන්තීනං විපාචෙන්තීනං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ පඤ්චන්නං පාරිවට්ටකං පටිග්ගහෙතුං, භික්ඛුස්ස භික්ඛුනියා සික්ඛමානාය සාමණෙරස්ස සාමණෙරියා. අනුජානාමි භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං පාරිවට්ටකං පටිග්ගහෙතුං. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා, නිස්සග්ගියං පාචිත්තියන්ති".**

[**දුතියපඤ්ඤත්ති.**]

5. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අඤ්ඤාතිකා** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධා

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපගපච්ඡිමං.

**අඤ්ඤත්‍ර පාරිවට්ටකාති** ඨපෙත්වා පාරිවට්ටකං පටිග්ගණ්හාති.

3. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ වෙත් ද ඔහු අවඥ කෙරෙති අයුණු කියති දෙස් පහළ කෙරෙත්: ‘කෙසේ නම් ආයුෂ්මත් උදායී තෙර මෙහෙණකගේ සිවුරක් පිළිගත්තේ ද’යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. “සැබෑද උදායිය, තෝ මෙහෙණකගේ සිවුරක් පිළිගත්තෙහි ල’යි. “සැබව භාග්‍යවතුන් වහන්ස ‘උදායිය,’’ තාගේ නෑ මෙහෙණක් ද නොනෑ මෙහෙණක් ද’යි. ‘නොනෑ මෙහෙණක භාග්‍යවතුන් වහන්සැ’යි. “තුච්ඡපුරුෂය, නොනෑයෙක් නොනෑ එකකට සුදුස්ස හෝ නුසුදුස්ස හෝ විද්‍යමානය හෝ අවිද්‍යමානය හෝ නොදනියි. එහිලා තුච්ඡපුරුෂය, තෝ නොනෑ මෙහෙණකගේ අතින් සිවුරක් පිළිගත්තෙහි ය. තුච්ඡපුරුෂය, තෙල නොපහනුන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:”

**“යම් මහණෙක් නොනෑ මෙහෙණකගේ අතින් සිවුරක් පිළිගන්නේ නම් නිසැගි පචිති වේ”.**

මෙසේත් මේ ශික්ෂාපදය භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට පණවන ලද්දේ වේ.

[මුල්පැණවීමයි.]

4. තව ද එකල්හි භික්ෂූහු කුකුස් කරන්නාහු භික්ෂුණීන්ගේ පිරුළුසිවුරු නො පිළිගණිති. භික්ෂුණීහු අවඥ කෙරෙත් අයුණු කියත් දෙස් පහළ කෙරෙත්: ‘කෙසේ නම් හිමිහු අපගේ පිරුළුසිවුරු නො පිළිගණිත් ද’යි. භික්ෂූහු ඒ භික්ෂුණීන් අවඥ කරන්නන් අයුණු කියන්නන් දෙස් පහළ කරන්නන්ගේ බස් ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කථා වදාරා භික්ෂූන් ඇමතූ සේක: ‘මහණෙනි, පස් දෙනකුන්ගේ පිරුළුසිවුරු පිළිගන්නට අනුදනිමි: භික්ෂූහුගේ ය, භික්ෂුණීයගේ ය, ශික්ෂමානාවගේ ය, සාමණේරයාගේ ය, සාමණේරියගේ ය. මහණෙනි, මේ පස් දෙනාගේ පිරුළු-සිවුරු පිළිගන්නට අනුදනිමි. තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:’’

**“යම් මහණෙක් නොනෑ මෙහෙණක අතින් පිරුළුසිවුරු තබා සිවුරක් පිළිගන්නේ නම් නිසැගිපචිති වේ.”**

[දෙවනපැණවීමයි.]

5. **යො පන** යනු: යමෙක්, යම්බඳුයෙක් ...

**භික්ඛු** යනු: ... මේ තෙමේ මෙ අර්ථයෙහි ‘භික්ඛු’ ය යි අදහස් කරණ ලද්දේ ය.

**අඤ්ඤාතිකා** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත්මුත්තා යුගය නොක් නොසැබැඳියෝ.

**භික්ඛුනී** නම්: උභතො සඞ්ඝයා කෙරෙහි උපසපන් වූවා.

**චීවර** නම්: ස සිවුරු අතුරින් විකප්පුන් පොහොනා සිවුරු පැසුළු කොට ඇති එක්තරා සිවුරෙකි.

**අඤ්ඤත්‍ර පාරිවට්ටකා** යනු: පිරුළු තබා පිළිගණියි.

6. පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියං හොති නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදම්මෙ භන්තෙ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො පටිග්ගහිතං අඤ්ඤත්‍ර පාරිවත්තකා නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

7. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී චීවරං පටිග්ගණ්හාති අඤ්ඤත්‍ර පාරිවත්තකා, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතිකාය වෙමතිකො චීවරං පටිග්ගණ්හාති අඤ්ඤත්‍ර පාරිවත්තකා, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී චීවරං පටිග්ගණ්හාති අඤ්ඤත්‍ර පාරිවත්තකා, නිස්සග්ගියං පාචිත්තියං. එකතො උපසම්පන්නාය හත්ථතො චීවරං පටිග්ගණ්හාති අඤ්ඤත්‍ර පාරිවත්තකා, ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී -පෙ- ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය වෙමතිකො -පෙ- ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය ඤාතිකසඤ්ඤී -පෙ- අනාපත්ති.

8. අනාපත්ති ඤාතිකාය, පාරිවත්තකං, පරිත්තෙන වා විපුලං, විපුලෙන වා පරිත්තං, භික්ඛුවිස්සාසං ගණ්හාති, තාවකාලිකං ගණ්හාති, චීවරං ඨපෙත්වා අඤ්ඤං පරික්ඛාරං ගණ්හාති, සික්ඛමානාය, සාමණෙරියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**චීවරපටිග්ගහණසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 1. 6.

## අඤ්ඤාතකවිඤ්ඤත්තිසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පට්ඨො හොති ධම්මකථං කාතුං. අථ ඛො අඤ්ඤතරො සෙට්ඨිපුත්තො යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං සෙට්ඨිපුත්තං ආයස්මා උපනන්දො සක්‍යපුත්තො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො සො සෙට්ඨිපුත්තො ආයස්මතා උපනන්දෙන සක්‍යපුත්තෙන ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "වදෙය්‍යාථ භන්තෙ යෙන අත්ථො, පටිබලා මයං අය්‍යස්ස දාතුං යදිදං චීවරපිණ්ඩපාත-සෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර"න්ති. "සචෙ මෙ ත්වං ආවුසො දාතුකාමො'සි ඉතො එකං සාටකං දෙහී"ති.

6. පියොව්හි දුකුලා වෙයි, පිළිගැණිමෙන් නිසැයි වෙයි. සඟනට හෝ ගණයට හෝ පුහුල්හට හෝ නිසැජිය යුතු ය. තවද මහණෙනි, මෙසේත් නිසැජිය යුතු යः 'වහන්ස, මේ මාගේ සිවුර නොනෑ මෙහෙණක අතින් පිරුළ තබා පිළිගන්නා ලද්දේ නිසැයි විය. මෙය මම සඟනට නිසජම්'යි ... දෙන්නේ ය යි ... දෙන්නාහු ය යි ... ආයුෂ්මත්හට දෙම්'යි ...

7. නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ මෙහෙණ ය යන සංඥ ඇති ව පිරිවට තබා සිවුරු පිළිගණි නම් නිසැයිපචිති වෙයි. නොනෑ මෙහෙණ කෙරෙහි විමති ඇති ව පිරුළ තබා සිවුරු පිළිගණි නම් නිසැයිපචිති වෙයි. නොනෑ මෙහෙණ කෙරෙහි නෑ මෙහෙණක යන සංඥ ඇතිව පිරුළ තබා සිවුරු පිළිගණි නම් නිසැයිපචිති වෙයි. භික්ඛුනීසඞ්ඝයා කෙරෙහි උපසපන් මෙහෙණ අතින් පිරුළ තබා සිවුරු පිළිගණි නම් දුකුලාඇවැත් වෙයි. නෑ මෙහෙණ කෙරෙහි නො නෑ මෙහෙණක යන සංඥ ඇති ව ... දුකුලාඇවැත් වෙයි. නෑ මෙහෙණ කෙරෙහි විමති ඇති ව ... දුකුලාඇවැත් වෙයි. නෑ මෙහෙණ කෙරෙහි නෑ මෙහෙණ ය යන සංඥ ඇති ව ... ඇවැත් නැති.

8. නෑ මෙහෙණෙක අතින්, පිරුළ විසින් අල්පයෙකින් මහඇගි සිවුරක් හෝ මහඇගියකින් අල්ප සිවුරක් හෝ ගණි නම්, මහණ විස්වසින් ගණි නම්, තවකාලි කොට ගණි නම්, සිවුරු තබා අන් පිරිකරක් ගණි නම්, ඇවැත් නැති. සික්ඛමානා අතින්, සාමණෙරිය අතින් ගණි නම් ඇවැත් නැති. උම්මත්තකයාහට, ආදිකම්මිකයාහට ඇවැත් නැති.

**චීවරප්‍රතිග්‍රහණශික්ෂාපදය නිමි.**

---

## 5. 1. 6.

## අඤ්ඤාතක විඤ්ඤත්ති ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම්වෙහෙර වැඩ වෙසෙති. තව ද එසමයෙහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙම ධම්කථා කරන්නට සමර්ථ වෙයි. එසඳ එක්තරා සිටු පුත්‍රයෙක් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් කරා එළඹ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ඒ සිටුපුත්හට ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙම දැහැමි කථායෙන් කරුණු දැක්වී ය. සමාදන් කරවී ය. තෙද ගැන්වීය. පැහැදවී. ඉක්බිති ඒ සිටුපුත් තෙම ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් විසින් දැහැමි කථායෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තෙද ගන්වන ලද්දේ පහදවන ලද්දේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රහට 'වහන්ස, කැමැති දැයෙකින් කිව මැනව. අපි හිමියනට සිවුරු පිඬුවා-සෙනසුන්-ගිලන්පසබෙහෙත්පිරිකර දෙන්නට සමර්ථයම්හ'යි මෙය කීය: 'ඉදින් ඇවැත්නි, තෝ මට දෙනු කැමැත්තෙහි නම් මෙයින් එක් සළුවක් දෙව්'යි. හේ කීය.

2. "අම්හාකං ඛො භන්තෙ කුලපුත්තානං කිස්මිං විය එකසාටකං ගන්තුං, ආගමෙහි භන්තෙ යාව ඝරං ගච්ඡාමි, ඝරං ගතො ඉතො වා එකං පහිණිස්සාමි, ඉතො වා සුන්දරතර"න්ති. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො තං සෙට්ඨිපුත්තං එතදවොච:- "සචෙ මෙ ත්වං ආවුසො දාතුකාමො'සි, ඉතො එකං සාටකං දෙහී"ති. "අම්හාකං ඛො භන්තෙ කුලපුත්තානං කිස්මිං විය එකසාටකං ගන්තුං, ආගමෙහි භන්තෙ යාව ඝරං ගච්ඡාමි, ඝරං ගතො ඉතො වා එකං පහිණිස්සාමි, ඉතො වා සුන්දරතර"න්ති. "කිම්පන තයා ආවුසො අදාතුකාමෙන පවාරිතෙන, යං ත්වං පවාරෙත්වා න දෙසී"ති. අථ ඛො සො සෙට්ඨිපුත්තො ආයස්මතා උපනන්දෙන සක්‍යපුත්තෙන නිප්පීළියමානො එකං සාටකං දත්වා අගමාසි. මනුස්සා තං සෙට්ඨිපුත්තං පස්සිත්වා[1] එතදවොචුං: "කිස්ස ත්වං අය්‍යො එකසාටකො ආගච්ඡසී"ති.

3. අථ ඛො සො සෙට්ඨිපුත්තො තෙසං මනුස්සානං එතමත්ථං ආරොචෙසි· මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "මහිච්ඡා ඉමෙ සමණා සක්‍යපුත්තියා අසන්තුට්ඨා, නයිමෙසං සුකරා ධම්මනිමන්තනාපි කාතුං.[2] "කථං හි නාම සෙට්ඨිපුත්තස්ස ධම්මනිමන්තනාය කයිරමානාය සාටකං ගහෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සෙට්ඨිපුත්තං චීවරං විඤ්ඤාපෙස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං: "සච්චං කිර ත්වං උපනන්ද සෙට්ඨිපුත්තං චීවරං විඤ්ඤාපෙසී?"ති "සච්චං. භගවා" "ඤාතකො තෙ උපනන්ද අඤ්ඤාතකො?"ති "අඤ්ඤාතකො භගවා"ති. "අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතකස්ස න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා සන්තං වා අසන්තං වා. තත්ථ නාම ත්වං මොඝපුරිස අඤ්ඤාතකං සෙට්ඨිපුත්තං චීවරං විඤ්ඤාපෙස්සසි. නෙතං මොඝ-පුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"යො පන භික්ඛු අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"න්ති".**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

## [මූලපඤ්ඤත්ති]

4. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ සාකෙතා සාවත්ථිං අද්ධානමග්ගපටිපන්නා හොන්ති. අන්තරාමග්ගෙ චොරා නික්ඛමිත්වා තෙ භික්ඛූ අච්ඡින්දිංසු. අථ ඛො තෙ භික්ඛූ "භගවතා පටික්ඛිත්තං අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙතු"න්ති කුක්කුච්චායන්තා න විඤ්ඤාපෙසුං. යථා නග්ගා'ව සාවත්ථිං ගන්ත්වා භික්ඛූ අභිවාදෙන්ති. භික්ඛූ එවමාහංසු: "සුන්දරා ඛො ඉමෙ ආවුසො ආජීවකා, යෙ ඉමෙ භික්ඛූ[3] අභිවාදෙන්තී"ති. තෙ එවමාහංසු: "න මයං ආවුසො ආජීවකා, භික්ඛූ මය"න්ති. භික්ඛූ ආයස්මන්තං උපාලිං එතදවොචුං: "ඉඞ්ඝාවුසො උපාලි ඉමෙ අනුයුඤ්ජාහී"ති. තෙ අනුයුඤ්ජියමානා එතමත්ථං ආරොචෙසුං.

1. තත්ථ. ම ජ.සං. 2. න ඉමෙ සුකරා ධම්මනිමන්තනායපි කාතුං. සං. 3. භික්ඛූ. මජසං.

2. "වහන්ස, කුලපුත් වූ අපට එක් සළුවකින් යන්නට ලජ්ජාකාරය වෙයි. වහන්ස, යම්තාක් ගෙට යෙම් ද, එතෙක් තවතිනු මැනව. ගෙට ගියෙම් මෙයින් එකක් හෝ මෙයට වඩා සුන්දරතරයක් හෝ එවන්නෙමි'යි. දෙවන වර ද ... තෙවන වර ද ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙම ඒ සිටුපුත්හට 'ඉදින් ඇවැත්නි, තෝ මට දෙනු කැමැත්තෙහි නම් මෙයින් එක් සළුවක් දෙව්'යි කීය. "වහන්ස, කුලපුත් වූ අපට එකසාටක ව යන්නට ලජ්ජාකාරය වෙයි. වහන්ස, යම්තාක් ගෙට යෙම් ද එතෙක් තවතිනු මැනව. ගෙට ගියෙම් මෙයින් එකක් හෝ මෙයට වඩා සුන්දරතරයක් හෝ එවන්නෙමි'යි, හේ කී ය. "ඇවැත්නි, නො දෙනු කැමැති ව පැවරූ තගෙන් කවර ප්‍රයෝජන ද? යම් හෙයකින් තෝ පවරා නො දෙයි ද එහෙයිනි'යි. හේ කීය. ඉක්බිති ඒ සිටුපුත් තෙම ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා විසින් දැඩි ව පෙළනු ලබන්නේ එක් සළුවක් දී ගියේ ය. මිනිස්සු ඒ සිටුපුත්හු දැක 'ආර්යයෙනි, කුමක් හෙයින් තෙපි එකසාටක ව එන්නාහු ද' යි. මෙය කීහ. එසඳ ඒ සිටුපුත් තෙම ඒ මිනිසුන්ට එ පවත් දැන්වී ය. මිනිස්සු අවඥා කෙරෙත්. අගුණ කියත්. දෙස් පහළ කෙරෙත්:

3. 'මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ මහේච්ඡයෝ ය, අසන්තුෂ්ටයෝ ය. මොවුනට දැහැමි නිමන්ත්‍රණයකුදු කරන්නට පහසු නො වෙයි. කෙසේ නම් සිටුපුත්හු විසින් දැහැමි නිමන්ත්‍රණය කරණු ලබන කල්හි සාටකය ගන්නාහු ද' යි. භික්ෂූහු ඒ මිනිසුන් අවඥා කරණුවන් අගුණ කියනුවන් දෙස් පහළ කරණුවන්ගේ බස් ඇසූහ. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ වෙත් ද ඔහු 'කෙසේ නම් ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍ර තෙම සිටුපුතක්හු සිවුරක් විනැවී ද'යි. අවඥා කෙරෙත් අගුණ කියත්. දෙස් පහළ කෙරෙත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ: ' 'සැබෑ ද උපනන්දය, තෝ සිටුපුතක්හු සිවුරක් විනවූයෙහි ද'යි. අසා වදාළහ. "සැබව භාග්‍යවතුන් වහන්ස, යී හේ කී ය. "උපනන්දය, තාගේ නෑයෙක් ද නො නෑයෙක්ද? යි භගවත් ඇසූහ. "නොනෑයෙක භාග්‍යවතුන් වහන්සැ' යි. හේ කීය. "තුච්ඡපුරුෂය, නොනෑයෙක් නොනෑයකුහට සුදුස්ස හෝ නුසුදුස්ස හෝ විද්‍යමානය හෝ අවිද්‍යමානය හෝ නො දනියි. එහි ලා තුච්ඡපුරුෂය, තෝ නොනෑ සිටුපුතක්හු සිවුරක් විනවූයෙහි ය. තුච්ඡපුරුෂය, නොප්‍ර සන්නයන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:"

**'යම් මහණෙක් තෙම නොනෑ ගැහැවියක්හු හෝ ගැහැවිනියක හෝ සිවුරක් විනවා නම් නිසැගි පචිති වේ."**

මෙසේත් මේ ශික්ෂාපදය භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට පණවන ලද්දේ වේ.

**[මුල්පැණවීමයි.]**

4. තව ද එසමයෙහි බොහෝ භික්ෂූහු සාකෙතනුවරින් සැවැත්නුවර බලා අද්දන්මගට පිළිපන්නාහු වෙති. අතරමඟ සොරු නික්ම ඒ භික්ෂූන් (පාසිවුරු) පැහැර ගත්හ. එසඳ ඒ භික්ෂූහු 'භාග්‍යවතුන් විසින් නො නෑ ගැහැවියක්හු හෝ ගෙහබුවක් හෝ සිවුරක් විනවන්නට පිළිකෙව් කරණ ලද්ද'යි කුකුස් කරන්නාහු නො විනවූහ. ලිහිණි වණින් ම සැවතට ගොස් භික්ෂූන් වඳිති. ඒ භික්ෂූහු "ඇවැත්නි, මේ ආජීවකයෝ සුන්දරයහ. මොහු භික්ෂූන් වඳිති'යි මෙසේ කීහ. 'ඇවැත්නි, අපි ආජීවක නො වම්හ. අපි මහණුම්හ'යි. මෙසේ කීහ. භික්ෂූහු ආයුෂ්මත් උපාලිහට 'එසේ වී නම් ඇවැත්නි, උපාලි මොවුන් විමසව'යි කීහ. ඒ භික්ෂූහු අනුයොග කරණු ලබන්නාහු එ පවත් දැන්වූහ.

5. අථ ඛො ආයස්මා උපාලි තෙ භික්ඛූ අනුයුඤ්ජිත්වා භික්ඛූ එතදවොච: "භික්ඛූ ඉමෙ ආවුසො, දෙථ තෙසං චීවරානී"ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ නග්ගා ආගච්ඡිස්සන්ති, නනු නාම තිණෙන වා පණ්ණෙන වා පටිච්ඡාදෙත්වා ආගන්තබ්බ"න්ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

6. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ අච්ඡින්නචීවරස්ස වා නට්ඨචීවරස්ස වා අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙතුං. යං ආවාසං පඨමං උපගච්ඡති, සචෙ තත්ථ හොති සඞ්ඝස්ස විහාරචීවරං වා උත්තරත්ථරණං වා භුම්මත්ථරණං වා භිසිච්ඡවි වා තං ගහෙත්වා පාරුපිතුං, ලභිත්වා ඔදහිස්සාමී"ති. නො චෙ හොති සඞ්ඝස්ස විහාරචීවරං වා උත්තරත්ථරණං වා භුම්මත්ථරණං වා භිසිච්ඡවි වා, තිණෙන වා පණ්ණෙන වා පටිච්ඡාදෙත්වා ආගන්තබ්බං. නත්වෙව නග්ගෙන ආගන්තබ්බං. යො ආගච්ඡෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"යො පන භික්ඛු අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, නිස්සග්ගියං පාචිත්තියං. තත්ථායං සමයො: අච්ඡින්නචීවරො වා හොති භික්ඛු නට්ඨචීවරො වා. අයං තත්ථ සමයො"ති.**

[**දුතියපඤ්ඤත්ති**]

7. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං **අත්ථෙ අධිප්පෙතො භික්ඛූ**'ති.

**අඤ්ඤාතකො** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධො.

**ගහපති** නාම: යො කොචි අගාරං අජ්ඣාවසති.

**ගහපතානී** නාම: යා කාචි අගාරං අජ්ඣාවසති.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපගපච්ඡිමං.

**අඤ්ඤත්‍ර සමයාති** ඨපෙත්වා සමයං.

**අච්ඡින්නචීවරො** නාම: භික්ඛුස්ස චීවරං අච්ඡින්නං හොති, රාජූහි වා චොරෙහි වා ධුත්තෙහි වා යෙහි කෙහිචි වා අච්ඡින්නං හොති.

**නට්ඨචීවරො** නාම: භික්ඛුස්ස චීවරං අග්ගිනා වා දඩ්ඪං හොති, උදකෙන වා වූළ්හං හොති, උන්දූරෙහි වා උපචිකාහි වා ඛායිතං හොති, පරිභොගජිණ්ණං වා හොති. අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදම්මෙ භන්තෙ චීවරං අඤ්ඤාතකං ගහපතිකං අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති -පෙ-

5. ඉක්බිති ආයුෂ්මත් උපාලි තෙරණුවෝ ඒ භික්‍ෂූන් විමසා භික්‍ෂූන්ට 'ඇවැත්නි, මොහු භික්‍ෂූහු ය. මොවුනට සිවුරු දෙව'යි. කීහ. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ වෙත් නම් ඔහු "කෙසේ නම් භික්‍ෂූහු ලිහිණි ව ආවාහු ද, තෘණයෙන් හෝ පර්‍ණයෙන් හෝ පිළිසත් කොට ඉයයුතු නො වේ ද' යි අවඥා කෙරෙති. අයුණු කියති. දෙස් පතළ කෙරෙත්. ඉක්බිති ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළහ.

6. එසඳ භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රකරණයෙහි දැහැමි කථා වදාරා භික්‍ෂූන් ඇමතූ සේක. "මහණෙනි, අසිදැගත් සිවුරු ඇතියහුට හෝ නට සිවුරු ඇතියහුට හෝ නොනෑ ගැහැවියකුහු හෝ ගෙහබුවක හෝ සිවුරක් විනවන්නට, යම් ආවාසයකට පළමු එළඹේ නම්, ඉදින් එහි සඞ්ඝයාගේ විහාර සිවුරක් හෝ පසතුරුණෙක් හෝ බුමුතුරුණෙක් හෝ කිසිසිවියෙක් හෝ වේ නම් '(සිවුරු) ලැබ තබන්නෙමි"යි එය ගෙණ පොරෝනට අනුදනිමි. ඉදින් සඞ්ඝයාගේ විහාර සිවුරක් හෝ පසතුරුණෙක් හෝ බුමුතුරණෙක් හෝ කිසිසිවියෙක් හෝ නොවේ නම් තෘණයෙන් හෝ පර්‍ණයෙන් හෝ පිළිසත් කොට ඉයයුතු ය. ලිහිණි ව නො ම ඉයයුතු ය. යමෙක් ඒ නම් දුකුලාඇවැත් වෙයි. මහණෙනි, මෙසේත් මේ ශික්‍ෂාපදය උදෙසවු."

**"යම් මහණෙක් නොනෑ ගැහැවියකුහු හෝ ගෙහබුවක හෝ සමය තබා සිවුරක් විනවා නම් නිසැගිපචිති වෙයි. එහි මේ සමය වෙයි: මහණ තෙම පැහැර ගන්නා ලද සිවුරු ඇත්තේ හෝ නට සිවුරු ඇත්තේ හෝ වෙයි. මේ එහි සමය වේ."**

**[දෙවන පැණවිමයි.]**

7. **යො පන** යනු: යමෙක්, යම් බඳුයෙක්...

**භික්ඛු** යනු: ...මේ තෙම මේ අර්‍ථයෙහි භික්ඛු ය යි අදහස් කරණ ලද්දේ ය.

**අඤ්ඤාතක** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත් වැනි මුත්තා යුගය තෙක් අසම්බද්ධයෝ ය.

**ගහපති** නම්: යම් කිසිවෙක් ගිහිගෙයි වෙසේ නම් හේ.

**චීවර** නම්: සසිවුරු අතුරින් විකපුත් පොහොනා සිවුරු පැසුළු කොට ඇති එක්තරු සිවුරෙකි.

**අඤ්ඤත්‍ර සමයා** යනු: සමය තබා.

**අච්ඡින්නචීවර නම්:** භික්‍ෂූහුගේ සිවුරු රජුන් විසින් හෝ සොරුන් විසින් හෝ ධූර්‍තයන් විසින් හෝ යම් කිසි කෙනකුන් විසින් හෝ පැහැර ගන්නා ලද වෙයි.

**නට්ඨචීවර** නම්: භික්‍ෂූහුගේ සිවුර ගින්නෙන් හෝ දැවුනේ වෙයි. දිය විසින් හෝ උසුලන ලද වෙයි. මීයන් විසින් හෝ වේයන් විසින් හෝ කන ලද වෙයි. පරිභොගයෙන් දිරුනේ හෝ වෙයි. සමය තබා විනවා (ඉල්ලා) නම් පියොච්හි දුකුලා වෙයි. පිළිගැණිමෙන් නිසැගි වෙයි. සඟනට හෝ ගණයට හෝ පුහුල්හට හෝ නිසැජිය යුතු ය. තව ද "මහණෙනි, මෙසේත් නිසැජිය යුතු ය: 'වහන්ස, මේ මාගේ සිවුර නො නෑ ගැහැවියකුහු සමය තබා විනවන ලද්දේ නිසැගි විය. මේය මම් සඟනට නිසදම්'යි... දෙන්නේ යයි ... දෙන්නාහු ය යි ... ආයුෂ්මත්හට දෙම්'යි...

8. අඤ්ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා චීවරං විඤ්ඤාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතකෙ වෙමතිකො අඤ්ඤත්‍ර සමයා චීවරං විඤ්ඤාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතකෙ ඤාතකසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා චීවරං විඤ්ඤාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ ඤාතකසඤ්ඤී, අනාපත්ති.

9. අනාපත්ති සමයෙ, ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**අඤ්ඤාතකවිඤ්ඤත්තිසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 1. 7.

## තතුත්තරිසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා භික්ඛූ අච්ඡින්නචීවරකෙ භික්ඛූ උපසඞ්කමිත්වා** එවං වදෙන්ති: "භගවතා ආවුසො අනුඤ්ඤාතං අච්ඡින්නචීවරස්ස වා නට්ඨචීවරස්ස වා අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙතුං. විඤ්ඤාපෙථ ආවුසො චීවරන්ති." "අලං ආවුසො ලද්ධං අම්හෙහි චීවරන්ති." "මයං ආයස්මන්තානං අත්ථාය[1] විඤ්ඤාපෙමා"ති. "විඤ්ඤාපෙථ ආවුසො"ති. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ අඤ්ඤාතකෙ[2] ගහපතිකෙ උපසඞ්කමිත්වා එතදවොචුං: "අච්ඡින්නචීවරකා ආවුසො භික්ඛූ ආගතා, දෙථ තෙසං චීවරානී"ති බහුං චීවරං විඤ්ඤාපෙසුං.

2. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො සභායං නිසින්නො අඤ්ඤතරං පුරිසං එතදවොච: "අච්ඡින්නචීවරකා අය්‍යො භික්ඛූ ආගතා, තෙසං මයා චීවරං දින්න"න්ති. සොපි එවමාහ "මයාපි දින්නන්ති". අපරොපි එවමාහ මයාපි දින්නන්ති." තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා න මත්තං ජානිත්වා බහුං චීවරං විඤ්ඤාපෙස්සන්ති. දුස්සවාණිජ්ජං වා සමණා සක්‍යපුත්තියා කරිස්සන්ති, පග්ගාහිකසාලං[3] වා පසාරෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ න මත්තං ජානිත්වා බහුං චීවරං විඤ්ඤාපෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

---

1. 'අත්ථාය' මජ්සං. නත්ථි. 2. 'අඤ්ඤාතකෙ.' මජ්සං. නදිස්සතෙ. 3. පටිග්ගාහිකසාලං, ඉතිපි.

8. නොනැයකු කෙරෙහි නොනැයෙක යන සංඥා ඇති ව සමය තබා සිවුරක් විනවා නම් නිසැගි පචිති වෙයි. නො නැයකු කෙරෙහි විමති ඇති ව සමය තබා සිවුරක් විනවා නම් නිසැගි පචිති වෙයි. නොනැයකු කෙරෙහි නැයෙක යන සංඥා ඇති ව සමය තබා සිවුරක් විනවා නම් නිසැගි පචිති වෙයි. නැයකු කෙරෙහි නො නැයෙක යන සංඥා ඇත්තේ දුකුලාඇවැත් වෙයි. නැයකු කෙරෙහි විමති ඇත්තේ, දුකුලාඇවැත් වෙයි. නැයෙකු කෙරෙහි නැයෙක යන සංඥා ඇත්තේ ඇවැත් නැති.

9. සමයෙහි, නැයන් සතු, පැවැරුවන් සතු සිවුරු විනවන්නහුට, අනෙකකු සඳහා විනවන්නහුට, තමාගේ ධනයෙන් පිරුළු ගන්නහුට, උම්මත්තකයාහට, ආදිකම්මිකයාහට ඇවැත් නැති.

**අඤ්ඤාතකවිඤ්ඤත්ති ශික්‍ෂාපදය නිමි.**

---

## 5. 1. 7.

## තතුත්තරිශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර අනේපිඩුසිටුහුගේ දෙව්රම්වෙහෙරෙහි වැඩ වෙසෙති. එසමයෙහි සවග මහණහු අසිදැගන්නා ලද සිවුරු ඇති භික්‍ෂූන් වෙත එළඹ මෙසේ කියති: 'ඇවැත්නි, භාග්‍යවතුන් විසින් අසිදැගන්නා ලද සිවුරු ඇතියහුට හෝ නට සිවුරු ඇතියහුට හෝ නොනෑ ගැහැවියකුහු හෝ ගෙහඹුවක හෝ සිවුරක් විනැවීම් අනුදන්නා ලද. ඇවැත්නි, සිවුරක් විනවවු" ය යි. 'කම් නැත ඇවැත්නි, අප විසින් සිවුරක් ලබන ලද්'යි. ඔහු කියත්. 'අපි ආයුෂ්මතුන් සඳහා විනවම්හ'යි සවැගියෝ කීහ. 'විනවවූ ඇවැත්නි'යි ඔහු කීහ. ඉක්බිති සවග මහණහු නො නෑ ගැහැවියන් කරා එළඹ මෙසේ කීහ. 'ඇවැත්නි, අසිදැගන්නා ලද සිවුරු ඇති මහණහු ආහ. ඔවුනට සිවුරු දෙව'යි බොහෝ සිවුරු විනවාගත්හ.

2. එසමයෙහි එක්තරා පුරුෂයෙක් සභායෙහි හුන්නේ එක්තරා පුරුෂයකුට මෙ පවත් කී ය: 'ආයසීයෙනි, අසිදැගන්නා ලද සිවුරු ඇති භික්‍ෂූහු ආහ. මා විසින් ඔවුනට සිවුරක් දෙන ලද්'යි. හෙ ද මෙසේ කී 'මා විසිනුදු දෙන ලද්'යි. අනෙකෙකුදු මෙසේ කී: 'මා විසිනුදු දෙන ලද්'යි. ඔහු අවඥ කෙරෙත් අයුණු කියත් දෙස් පහල කෙරෙත්: "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ පමණ නො දැන බොහෝ සිවුරු විනවා ගත්තු ද, පිළී වෙළෙඳහමක් හෝ ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ කෙරෙත් ද පිළී අවුණක් හෝ විවෘත කෙරෙත් දැ යි. භික්‍ෂූහු අවඥ කරණ අයුණු කියන දෙස් පහල කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ වෙත් ද ඔහු අවඥ කෙරෙති අයුණු කියති දෙස් පහල කෙරෙත්: 'කෙසේ නම් සවග මහණහු පමණ නො දැන බොහෝ සිවුරු විනවූහු දැ"යි. ඉක්බිති ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ.

3. "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ න මත්තං ජානිත්වා බහුං චීවරං විඤ්ඤාපෙථා"ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා න මත්තං ජානිත්වා බහුං චීවරං විඤ්ඤාපෙස්සථ, නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"තඤ්චෙ අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා බහූහි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය, සන්තරුත්තරපරමං තෙන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බං. තතො චෙ උත්තරිං[1] සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියන්ති."**

4. **තඤ්චෙ ති** අච්ඡින්නචීවරකං භික්ඛුං.

**අඤ්ඤාතකො** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහ-යුගා අසම්බද්ධො.

**ගහපති** නාම: යො කොචි අගාරං අජ්ඣාවසති.

**ගහපතානී** නාම: යා කාචි අගාරං අජ්ඣාවසති.

**බහූහි චීවරෙහීති** බහුකෙහි චීවරෙහි.

**අභිහට්ඨුං පවාරෙය්‍යාති** යාවතකං ඉච්ඡසි තාවතකං ගණ්හාහීති.

**සන්තරුත්තරපරමං තෙන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බන්ති** සචෙ තීණි නට්ඨානි හොන්ති ද්වෙ සාදිතබ්බානි, ද්වෙ නට්ඨානි එකං සාදිතබ්බං, එකං නට්ඨං න කිඤ්චි සාදිතබ්බං.

**තතො චෙ උත්තරිං සාදියෙය්‍යාති** තතුත්තරිං විඤ්ඤාපෙති, පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං:

"ඉදමෙම භන්තෙ චීවරං අඤ්ඤාතකං ගහපතිකං[2] තතුත්තරිං විඤ්ඤාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති. දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

5. අඤ්ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී තතුත්තරිං චීවරං විඤ්ඤාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතකෙ වෙමතිකො -පෙ- අඤ්ඤාතකෙ ඤාතකසඤ්ඤී තතුත්තරිං චීවරං විඤ්ඤාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ ඤාතකසඤ්ඤී, අනාපත්ති.

6. අනාපත්ති සෙසකං ආහරිස්සාමීති හරන්තො ගච්ඡති, සෙසකං තුය්හෙව හොතූති දෙන්ති, න අච්ඡින්නකාරණා දෙන්ති, න නට්ඨ-කාරණා දෙන්ති, ඤාතකානං, පවාරිතානං, අත්තනො ධනෙන, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**තතුත්තරිසික්ඛාපදං නිට්ඨිතං**

---

1 උත්තරි, මජසං. 2. ගහපතිකං උපසඞ්කමිත්වා. මජසං.

3. 'සැබෑ ද මහණෙනි, තෙපි පමණ නො දත බොහෝ සිවුරු විනවූහු ල'යි භාග්‍යවත්හු ඇසූහ. "සැබෑව භාග්‍යවතුන් වහන්ස"යි ඔහු කීහ. භාග්‍යවත් බුදුහු ගර්හා කළහ: 'කෙසේ නම් තුච්ඡ පුරුෂයෙනි, තෙපි පමණ නො දත බොහෝ සිවුරු විනවූහු ද! තුච්ඡපුරුෂයෙනි, තෙල කරුණ නො පහදුනන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:"

**"ඉදින් නොනෑ ගෘහපතියෙක් හෝ ගෘහපතනියක් හෝ ඒ (අසිදෑගත් නට සිවුරු ඇති) මහණහට කැමැතිතාක් ගෙන යන්නට බොහෝ සිවුරින් පවරා නම් ඒ මහණහු විසින් හඳනා සිවුර හා උතුරුසඟ පරම කොට ඇති සිවුරක් එයින් ඉවසිය යුතු"ය. ඉදින් එයින් මත්තෙහි ඉවසා නම් නිසැගි පචිති වේ"යයි.**

4. **තඤ්චෙ** යනු: පැහැරගත්තා ලද සිවුරු ඇති මහණ.

**අඤ්ඤාතක නාම**: මවුපසින් හෝ පියපසින් හෝ සත් වැනි මීමුතුන් යුගළුව දක්වා අසම්බද්ධයෝ ය.

**ගහපති** නම්: යම් කිසිවෙක් ගිහිගෙයි වෙසේ ද හේ.

**ගහපතානී** නම්: යම් කිසිවක් ගිහිගෙයි වෙසේ ද හෝ.

**බහූහි චීවරෙහි** යනු: බොහෝ වූ සිවුරින්.

**අභිහට්ඨුං පවාරෙය්‍ය** යනු: යම්තාක් රිසියෙහි නම් ඒ තාක් ගණුව යි.

**සන්තරුත්තරපරමං තෙන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බං** යනු: ඉදින් තුන් සිවුර නටුයේ නම් දෙකෙක් ඉවසිය යුතු ය. දෙකෙක් නටුයේ නම් එකෙක් ඉවසිය යුතු ය. එකෙක් නටුයේ නම් කිසිවක් නො ඉවසිය යුතු ය.

**තතො චෙ උත්තරිං සාදියෙය්‍ය** යනු: එයින් මත්තෙහි විනවා නම් ප්‍රයොගයෙහි දුකුළා වෙයි. සිවුරු ලැබීමෙන් නිසැගි වෙයි. සඟහට හෝ ගණයට හෝ පුඟුලක්හට හෝ නිසැජිය යුතු ය. තව ද මහණෙනි, මෙසේත් නිසැජිය යුතුය: 'වහන්ස, මේ මාගේ සිවුර නොනෑ ගැහැවියකු සතු වූයේ පමණින් මතුයෙහි විනවන ලද්දේ නිසැගි විය, මෙය මම් සඟහට නිසදමි' යි ... දෙන්නේ ය යි ... දෙන්නාහු ය යි ... ආයුෂ්මත්හට දෙමි' යි ...

5. නොනෑයකු කෙරෙහි නොනෑයෙක යන සංඥ ඇති ව පමණින් මත්තෙහි සිවුරක් විනවා නම් නිසැගි පචිති වෙයි. නොනෑයකු කෙරෙහි විමති ඇත්තේ ... නොනෑයකු කෙරෙහි නෑයෙක යන සංඥ ඇත්තේ පමණින් මත්තෙහි සිවුරක් විනවා නම් නිසැගි පචිති වෙයි. නෑයකු කෙරෙහි නො නෑයෙක යන සංඥ ඇත්තේ, දුකුළාඇවැත් වෙයි. නෑයකු කෙරෙහි විමති ඇත්තේ, දුකුළාඇවැත් වෙයි. නෑයකු කෙරෙහි නෑයෙක යන සංඥ ඇත්තේ, ඇවැත් නැති.

6. සෙස්ස 'ගෙණ එන්නෙමි'යි ගෙණ යේ නම්, සෙස්ස නොපට ම වේවයි දෙත් නම් අසිදෑගත්තා ලද කරුණින් නො දෙත් නම්, නට හෙයින් නො දෙත් නම්, නතුත්තර සිවුරු ගන්නහුට, නෑයන් සතු, පැවරුවන් සතු තතුත්තර සිවුරු ගන්නහුට, තමාගේ ධනයෙන් ගන්නහුට, උම්මත්තකයාහට ආදිකම්මිකයාහට ඇවැත් නැති.

**තතුත්තරිශික්ෂාපදය නිමි**

# 5. 1. 8.

## පඨමඋපක්ඛටසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො පජාපතිං එතදවොච: "අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. අස්සොසි ඛො අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු තස්ස පුරිසස්ස ඉමං වාචං භාසමානස්ස. අථ ඛො සො භික්ඛු යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "මහාපුඤ්ඤොසි ත්වං ආවුසො උපනන්ද, අමුකස්මිං ඔකාසෙ අඤ්ඤතරො පුරිසො පජාපතිං එතදවොච: අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. "අත්ථාවුසො මං සො උපට්ඨාකො"ති. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො යෙන සො පුරිසො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං පුරිසං එතදවොච: "සච්චං කිර මං ත්වං ආවුසො චීවරෙන අච්ඡාදෙතුකාමොසී"ති. "අපි[1] ම'ය්‍ය එවං හොති: "අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. "සචෙ ඛො මං ත්වං ආවුසො චීවරෙන අච්ඡාදෙතුකාමො"සි, "එවරූපෙන චීවරෙන අච්ඡාදෙහි ක්‍යාහං තෙන අච්ඡන්නොපි කරිස්සාමි, යාහං න පරිභුඤ්ජිස්සාමී"ති.

2. අථ ඛො සො පුරිසො උජ්ඣායති ඛීයති විපාචෙති: "මහිච්ඡා ඉමෙ සමණා සක්‍යපුත්තියා අසන්තුට්ඨා, නයිමෙ සුකරා චීවරෙන අච්ඡාදෙතුං. කථං හි නාම අය්‍යො උපනන්දො මයා පුබ්බෙ අප්පවාරිතො මං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සතී"ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස පුරිසස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුබ්බෙ අප්පවාරිතො ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං "සච්චං කිර ත්වං උපනන්ද පුබ්බෙ අප්පවාරිතො ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජීති[2]? "සච්චං භගවා". "ඤාතකො තෙ උපනන්ද අඤ්ඤාතකො"ති? "අඤ්ඤාතකො භගවා"ති. 'අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතකස්ස න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා සන්තං වා අසන්තං වා. තත්ථ නාම ත්වං මොඝපුරිස පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකං ගහපතිං[3] උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා චීවරචෙතාපනං[4] උපක්ඛටං හොති, ඉමිනා චීවරචෙතාපනෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙස්සාමීති, තත්‍ර චෙසො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය: සාධු වත මං ආයස්මා ඉමිනා චීවරචෙතාපනෙන එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙහීති කල්‍යාණකම්‍යතං උපාදාය, නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

---

1. අපි මෙය්‍ය එවං හොති. මජ්ඣං. 2. ආපජ්ජසි, මජ්ඣං. 3. ගහපතිකං, මජ්ඣං
4. චීවරචෙතාපනං සක.

# 5. 1. 8.

## ප්‍රථම උපක්ඛටශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු-සිටුහුගේ දෙව්රම්හි වැඩ වෙසෙති. තවද එසමයෙහි එක්තරා පුරුෂයෙක් භාර්‍ය්‍යාවට උපනන්ද හිමියන් සිවුරෙන් ආච්ඡාදනය කරන්නෙමි’යි. මේ කී ය: එක්තරා පිඬුසිඟා යන මහණෙක් ඒ පුරුෂයා මෙ තෙපුල් කියන්න ඇසී ය. ඉක්බිති ඒ මහණ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් කරා එළඹ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන්ට ආයුෂ්මත් උපනන්දයෙනි, තෙපි මහපින් ඇත්තහු ය. අසෝ පෙදෙසෙහි එක්තරා මිනිසෙක් බිරිඳට “උපනන්ද හිමියන් චීවරයෙන් ආච්ඡාදනය කරවන්නෙමි’ යි. කී යයි සැල කෙළේ ය. “ඇවැත්නි, (එබඳු මිනිසෙක්) ඇත. හේ මාගේ උපස්ථායකයෙකැ’යි. උපනන්ද තෙර කීය. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙම ඒ පුරුෂයා වෙත එළඹ “සැබැවෙක්ද, ඇවැත්නි, තෙපි මා සිවුරකින් ආච්ඡාදනය කරණු කැමැත්තහු දැ?යි ඇසීය. “හිමියනි ‘උපනන්ද හිමියන් චීවරයෙකින් ආච්ඡාදනය කරන්නෙමි’ යි මට මේ සිත නම් වී යැයි හේ කීය. “ඉදින් ඇවැත්නි, තෙපි සිවුරෙකින් මා ආච්ඡාදනය කරණු කැමැත්තහු නම් මෙබඳු සිවුරෙකින් ආච්ඡාදනය කරවූ. යම් සිවුරක් මම් පරිභොග නො කෙරෙම් නම් ඒ සිවුරින් පුදන ලද්දෙම් නමුදු එයින් මම් කුමක් කෙරෙම් දැ?” යි උපනන්ද තෙර කී ය.

2. ඉක්බිති ඒ පුරුෂ තෙම ‘මේ ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ මහෙච්ඡයෝ ය. අසන්තුෂ්ටයෝ ය, මොවුන් සිවුරකින් පුදන්නට පහසු නො වෙයි. කෙසේ නම් උපනන්ද හිමියෝ කලින් මා විසින් නොපවරණ ලද්දාහු මා වෙත එළඹ චීවරයෙහි අධික විධානයට පැමිණෙන්නාහු දැ’යි අවඥා කෙරෙයි, නුගුණ කියයි, දෙස් පහළ කෙරේ: භික්ෂූහු අවඥා කරණ නුගුණ කියන දෙස් පහල කරණ ඒ මිනිසාගේ බස් ඇසූහ. යම් භික්ෂු කෙනෙක් අල්පෙච්ඡයෝ ද ඔහු ‘කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ පෙර නොපවරණ ලද්දාහු, ගැහැවියකු කරා එළඹ චීවරයෙහි. අධිකවිධානයට පැමිණියාහු දැ!’යි. අවඥා කෙරෙති, අගුණ කියති, දෙස් පහළ කෙරෙති. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් දැන්වූහ. “සැබවෙක් ද උපනන්දය, තෝ පෙර නො පවරණ ලදුයෙහි ගැහැවියකු කරා එළඹ චීවරයෙහි අධිකවිධානයට පැමිණියෙහි දැ?’යි. භාග්‍යවත්හු පුළුවුත්හ. ‘සැබැව භාග්‍යවතුන් වහන්ස’යි හේ කී ය. “උපනන්දය, තාගේ නෑයෙක් ද නොනෑයෙක් දැ?’යි භාග්‍යවත්හු ඇසූහ. ‘නොනෑයෙක භාග්‍යවතුන් වහන්සැ’යි හේ කී ය. “තුච්ඡ පුරුෂය, නොනෑයෙක් නොනෑයකුට සුදුස්ස හෝ නුසුදුස්ස හෝ ඇති දැය හෝ නැති දැය හෝ නො දනියි. තුච්ඡපුරුෂය, එහි නම් තෝ පෙර නො පවරණ ලද්දෙහි නොනෑ ගැහැවියකු කරා එළඹ චීවරයෙහි අධිකවිධානයට පැමිණියෙහි. තුච්ඡ පුරුෂය, තෙල නො පහන් වූවන්ගේ ප්‍රසාදයට හෝ නො වැටෙයි. ... තව ද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:”

**“මහණක්හු ම උදෙසා නොනෑ ගැහැවියකු විසින් හෝ ගැහැවි දුවක විසින් හෝ මේ සිවුරුමිලයෙන් සිවුරක් මිල දී ගෙණ මෙනම් ඇති මහණහුට දෙන්නෙම් යි සිවුරුමිලයක් සපයන ලද්දේ වේ ද, ඉදින් ඒ මහණ පෙර නො පවරණ ලද්දේ එහි එළඹ ‘ආයුෂ්මත, මේ සිවුරු මිලයෙන් මෙබඳු වූ ද මෙබඳු වූ ද සිවුරක් මිල දී ගෙණ මට දෙව’යි සොඳුරු බව කැමැති බව රිසි වැ මෙසේ කළහොත් මැනැවැ යි චීවරයෙහි අධිකවිධානයට පැමිණියේ වී නම් නිසැග්පචිති වෙ.”**

3. **භික්ඛුං පනෙව උද්දිස්සාති** භික්ඛුස්සත්ථාය, භික්ඛුං ආරම්මණං කරිත්වා, භික්ඛුං අච්ඡාදෙතුකාමො.

**අඤ්ඤාතකො** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධො.

**ගහපති** නාම: යො කොචි අගාරං අජ්ඣාවසති.

**ගහපතානී** නාම: යා කාචි අගාරං අජ්ඣාවසති.

**චීවරචෙතාපන්නං** නාම: හිරඤ්ඤං වා සුවණ්ණං වා මුත්තා වා මණී වා පවාළො වා ඵළිකො වා පටකො වා සුත්තං වා කප්පාසො වා.

**ඉමිනා චීවරචෙතාපන්නෙනාති** පච්චුපට්ඨිතෙන.

**චෙතාපෙත්වාති** පරිවත්තෙත්වා.

**අච්ඡාදෙස්සාමීති** දස්සාමි.

**තත්‍ර චෙසො භික්ඛූති** යං භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපන්නං උපක්ඛටං හොති, සො භික්ඛු.

**පුබ්බෙ අප්පවාරිතොති** පුබ්බෙ අවුත්තො හොති, කීදිසෙන තෙ භන්තෙ චීවරෙන අත්ථො, කීදිසං තෙ චීවරං චෙතාපෙමීති.

**උපසඞ්කමිත්වාති** ඝරං ගන්ත්වා, යත්ථ කත්ථචි උපසඞ්කමිත්වා.

**චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍යාති** ආයතං වා හොතු විත්ථතං වා අප්පිතං වා සණ්හං වා.

**ඉමිනා චීවරචෙතාපන්නෙනාති** පච්චුපට්ඨිතෙන.

**එවරූපං වා එවරූපං වාති** ආයතං වා විත්ථතං වා අප්පිතං වා සණ්හං වා.

**චෙතාපෙත්වාති** පරිවත්තෙත්වා.

**අච්ඡාදෙහීති** දජ්ජෙහි.

**කල්‍යාණකම්‍යතං උපාදායාති** සාධත්ථිකො[1] මහග්ඝත්ථිකො.

4. තස්ස වචනෙන ආයතං වා විත්ථතං වා අප්පිතං වා සණ්හං වා චෙතාපෙති, පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති, නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකං ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපන්නං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

1. සාධුත්ථිකො. සතා.

3. **භික්ඛුං පනෙව උද්දිස්ස** යනු: මහණක්හු සඳහා, මහණක්හු අරමුණු කොට, මහණක්හු ආච්ඡාදනය කරණු කැමැත්තේ.

**අඤ්ඤාතකා** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත් වන මිමුතුත් යුගලය දක්වා නො සබඳ වූයේ ය.

**ගහපති** නම්: යම් කිසිවෙක් ගිහිගෙයි වෙසේ නම් හේ ය.

**ගහපතානී** නම්: යම් කිසිවක් ගිහිගෙයි වෙසේ නම් හෝ ය.

**චීවරචෙතාපනන්‍න** නම්: අමුරන් හෝ රන්රන් හෝ මුතු හෝ මිණි හෝ පබළු හෝ පිළිමිණි හෝ පටයෙක් හෝ හු හෝ කපු හෝ ය.

**ඉමිනා චීවරචෙතාපනෙනන** යනු: වෙතට පත් දෑයෙකින්.

**චෙතාපෙත්වා** යනු: පිරිවට්ා.

**අච්ඡාදෙස්සාමි** යනු: දෙන්නෙමි.

**තත්‍ර චෙසො භික්ඛු** යනු: යම් මහණක්හු උදෙසා සිවුරුමිල සපයන ලද වේ ද ඒ මහණ.

**පුබ්බෙ අප්පවාරිතො** යනු: වහන්ස, කෙබඳු සිවුරෙකින් තොපට ප්‍රයොජන වේ ද කෙබඳු සිවුරක් තොපට මිල දී ගනිම් දැ යි පෙර නො කියන ලද්දේ වේ.

**උපසඞ්කමිත්වා** යනු: ගෙට ගොස් යම් කිසි තැනෙක්හි එළඹ.

**චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය** යනු: දිගු ද පුළුල් ද සන ද සිලිටි ද වේව යි.

**චෙතාපෙත්වා** යනු: පිරිවටා.

**අච්ඡාදෙහි** යනු: දෙව.

**කල්‍යාණකම්‍යතං උපාදාය** යනු: සොඳුරු බව කැමැත්තේ මහඇගි බව කැමැත්තේ.

4. ඔහුගේ බසින් දිගු හෝ පුළුල් හෝ සන හෝ සිලුටු හෝ වූවක් මිල දී ගණී නම්, පියෝගි දුකුලා වෙයි. ලැබීමෙන් නිසැගි වෙයි. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුහුලක්හට හෝ නිසැජියයුතු ය. තවද මහණෙනි, මෙසේ නිසැජියයුතු ය; 'වහන්ස, මේ මාගේ සිවුර පෙර නො පවරන ලදුයෙම් නොතෑ ගැහැවියක්හු කරු එළඹ සිවුරෙහි අධිකවිධානයට පැමිණෙන ලදුයේ නිසැගි විය. මම් මෙය සඞනට නිසජම්'යි. ... දෙන්නේ ය යි ... දෙන්නාහ යි ... ආයුෂමත්හට දෙමි'යි. ...

5. අඤ්ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී පුබ්බෙ අප්පවාරිතො ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතකෙ වෙමතිකො -පෙ- අඤ්ඤාතකෙ ඤාතකසඤ්ඤී පුබ්බෙ අප්පවාරිතො ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජති, නිස්සග්ගියං පාචිත්තියං. ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ ඤාතකසඤ්ඤී, අනාපත්ති.

6. අනාපත්ති ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, මහග්ඝං චෙතාපෙතුකාමස්ස අප්පග්ඝං චෙතාපෙති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

පඨමඋපක්ඛටසික්ඛාපදං නිට්ඨිතං.

---

## 5. 1. 9.

## දුතියඋපක්ඛටසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො අඤ්ඤතරං පුරිසං එතදවොච: "අහං අය්‍යං උපනන්දං[1] චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. සො'පි එවමාහ: "අහම්පි අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. අස්සොසි ඛො අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු තෙසං පුරිසානං ඉමං කථාසල්ලාපං. අථ ඛො සො භික්ඛු යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "මහාපුඤ්ඤො'සි ත්වං ආවුසො උපනන්ද අමුකස්මිං ඔකාසෙ අඤ්ඤතරො පුරිසො අඤ්ඤතරං පුරිසං එතදවොච: "අහං අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. සො'පි එවමාහ: අහම්පි අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. අත්ථාවුසො මං තෙ උපට්ඨාකාති

2. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො යෙන තෙ පුරිසා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තෙ පුරිසෙ එතදවොච: "සච්චං කිර මං තුම්හෙ ආවුසො චීවරෙහි අච්ඡාදෙතුකාමත්ථා"ති. "අපි නය්‍ය එවං හොති, අය්‍යං උපනන්දං චීවරෙහි අච්ඡාදෙස්සාමා"ති. "සචෙ ඛො මං තුම්හෙ ආවුසො චීවරෙහි අච්ඡාදෙතුකාමත්ථ, එවරූපෙන චීවරෙන අච්ඡාදෙථ, ක්‍යාහං තෙහි අච්ඡන්නො'පි කරිස්සාමි, යානාහං න පරිභුඤ්ජිස්සාමී"ති.

3. අථ ඛො තෙ පුරිසා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "මහිච්ඡා ඉමෙ සමණා සක්‍යපුත්තියා අසන්තුට්ඨා, නයිමෙ සුකරා චීවරෙහි අච්ඡාදෙතුං, කථං හි නාම අය්‍යො උපනන්දො අම්හෙහි පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සතී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං පුරිසානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුබ්බෙ අප්පවාරිතො ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සතී"ති.

---

1. අහං උපනන්දං. ම.ඡ.සං.

5. නොනැයකු කෙරෙහි නොනැයෙක යන සංඥ ඇති ව පෙරනො පවරන ලදුයේ ගෘහැවියකු කරා එළැඹ චීවරයෙහි විධානයට පැමිණේ නම් නිසැගි පචිති වෙයි. නොනැයකු කෙරෙහි විමති ඇතියේ ... නොනැයකු කෙරෙහි නැයෙක යන සංඥ ඇතියේ පෙර නො පවරන ලදු වැ ගෘහැවියකු කරා එළැඹ චීවරයෙහි විකල්පයට පැමිණේ නම්, නිසැගි පචිති වෙයි. නැයකු කෙරෙහි නොනැයෙක යන සංඥ ඇතියේ දුකුළාඇවැත් වෙයි. නැයකු කෙරෙහි විමති ඇතියේ දුකුළාඇවැත් වෙයි. නැයකු කෙරෙහි නැයෙක යන සංඥ ඇතියේ ඇවැත් නැති.

6. නැයනට, පැවැරූවනට, අනෙකක්හු සඳහා, තමා ගේ ධනයෙන් මහඇගි කොට මිල දී ගණු කැමැත්තහුට නො අනතා කොට මිල දී ගත්වා නම්, ඇවැත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැත්තේ යි·

**ප්‍රථම උපක්ඛට ශික්ෂාපදය නිමි.**

---

# 5. 1. 9.

## ද්විතීය උපක්ඛට ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු- සිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක. තව ද එසමයෙහි එක්තරා මිනිසෙක් එක්තරා මිනිසකුට 'මම් උපනන්ද හිමියනට සිවුරක් දෙන්නෙමි''යි කීය. හෙ තෙමේ 'මම ද උපනන්ද හිමියනට සිවුරක් දෙන්නෙමි'' යී කීය. එක්තරා පිඩුසිගා යන භික්ෂු කෙනෙක් ඒ මිනිසුන්ගේ මේ කථාසල්ලාපය ඇසූහ. ඉක්බිති ඒ මහණ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා කරා එළැඹ, ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා හට ''ඇවැත්නි උපනන්දයෙනි, තෙපි මහපින් ඇත්තව, අසුවල් පෙදෙසෙහි එක්තරා මිනිසෙක් එක්තරා මිනිසකුට මම් උපනන්ද හිමියන් සිවුරකින් පුදන්නෙමි යි කීය. හෙතෙමේ 'මම ද උපනන්ද හිමියන් සිවුරකින් පුදන්නෙමි'යි කීය. ''ඇවැත්නි, ඔහු මට උපස්ථායකයෝ වෙති''යි උපනන්ද තෙරණුවෝ කීහ.

2. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ ඒ මිනිසුන් කරා එළැඹ ''සැබවෙක් ද? ඇවැත්නි, තෙපි මා සිවුරුවලින් පුදනු කැමැතියවූ දූ?'යි විචාළහ. 'හිමියෙනි, උපනන්ද හිමියන් පුදන්නම්හ'යි මෙබඳු සිතෙක් නම් වියැ''යි ඔහු කීහ. 'ඉදින් ඇවැත්නි, තෙපි සිවුරුවලින් පුදනු කැමැතියවූ නම්, මෙබඳු සිවුරකින් පුදව්, යම් බඳු සිවුරු මම් පරිභොග නො කෙරෙම් නම්, එයින් පුදන ලදුයෙම් නමුදු මම් කුමක් කෙරෙම් දූ'යි තෙරණුවෝ කීහ.

3. එකල්හි 'මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ මහෙච්ඡයෝ ය. අසන්තුෂ්ටයෝ යැ මොවුන් සිවුරුවලින් පුදන්නට පහසු නො වෙයි. කෙසේ නම් උපනන්ද හිමියෝ අප විසින් පෙර නො පවරණ ලද්දාහු සමීපයට පැමිණ චීවරයෙහි අධිකවිධා- නයට පැමිණියාහු දූ'යි ඒ පුරුෂයෝ ගරහති නුගුණ කියති දොස් පහළ කෙරෙත්. භික්ෂූහු අවඥ කරණ නුගුණ කියන දොස් පහළ කරණ ඒ පුරුෂ- යන්ගේ බස් ඇසූහ. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡයෝ නම් ඔහු 'කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ පෙර නො පවරණ ලද්දාහු ගෘහැවියන් කරා පැමිණ චීවරයෙහි අධිකවිධානයට පැමිණියාහු දූ' යි අවඥ කෙරෙති නුගුණ කියති දොස් පහළ කෙරෙත්:

4. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. “සච්චං කිර ත්වං උපනන්ද පුබ්බෙ අප්පවාරිතො ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජී?”ති “සච්චං භගවා”. “ඤාතකා තෙ උපනන්ද අඤ්ඤාතකා?”ති “අඤ්ඤාතකා භගවා”ති. “අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතකානං න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා සන්තං වා අසන්තං වා. තත්ථ නාම ත්වං මොඝපුරිස පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකෙ ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**“භික්ඛුං පනෙව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චෙකචීවරචෙතාපන්නා උපක්ඛටා[1] හොන්ති: ඉමෙහි මයං පච්චෙකචීවරචෙතාපන්නෙහි පච්චෙකචීවරානි චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙහි අච්ඡාදෙස්සාමාති. තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය: සාධු වත මං ආයස්මන්තො ඉමෙහි පච්චෙකචීවරචෙතාපන්නෙහි එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙථ. උභො’ව සන්තා එකෙනාති, කල්‍යාණකම්‍යතං උපාදාය, නිස්සග්ගියං පාචිත්තිය”න්ති.**

5. **භික්ඛුං පනෙව උද්දිස්සාති** භික්ඛුස්සත්ථාය, භික්ඛුං ආරම්මණං කරිත්වා, භික්ඛුං අච්ඡාදෙතුකාමා.

**උභින්නන්ති** ද්වින්නං.

**අඤ්ඤාතකා** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධා.

**ගහපතී** නාම: යෙ කෙචි අගාරං අජ්ඣාවසන්ති.

**ගහපතානියො** නාම: යා කාචි අගාරං අජ්ඣාවසන්ති.

**චීවරචෙතාපන්නා** නාම: හිරඤ්ඤා වා සුවණ්ණා වා මුත්තා වා මණී වා පවාළා වා ඵලිකා වා පටකා වා සුත්තා වා කප්පාසා වා.

**ඉමෙහි චීවරචෙතාපන්නෙහීති** පච්චුපට්ඨිතෙහි. **චෙතාපෙත්වාති** පරිවත්තෙත්වා.

**අච්ඡාදෙස්සාමාති** දස්සාම.

**තත්‍ර චෙ සො භික්ඛූති** යං භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපන්නා උපක්ඛටා හොන්ති, සො භික්ඛු.

**පුබ්බෙ අප්පවාරිතොති** පුබ්බෙ අවුත්තො හොති, කීදිසෙන තෙ භන්තෙ චීවරෙන අත්ථො, කීදිසං තෙ චීවරං චෙතාපෙමාති.

**උපසඞ්කමිත්වාති** ඝරං ගන්ත්වා, යත්ථ කත්ථචි උපසඞ්කමිත්වා.

---

1. චීවර චෙතාපන්නානි උපක්ඛටානි. ම.ඡ.සං.

4. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේපවත් දැන්වූහ. "සැබෑද උපනන්දය, තෝ පෙර නො පවරණ ලද්දේ ගැහැවියන් කරා එළඹ චීවරයෙහි අධිකවිධානයට පැමිණියේ ල? යි භාග්‍යවත්හු පුළුවුත්හ. "සැබව, භාග්‍යවතුන් වහන්ස" යි තෙරණුවෝ කීහ. "උපනන්දය, තාගේ නෑයෝ ද නො නෑයෝ ද"යි. භාග්‍යවත්හු අසා වදාළහ. නොනෑ කෙනෙක භාග්‍යවතුන් වහන්සැ'යි තෙරණුවෝ කීහ. "තුච්ඡපුරුෂය, නො නෑයෙක් නො නෑයනට සුදුස්ස හෝ නුසුදුස්ස හෝ ඇති දෑය හෝ නැති දෑය හෝ නො දනිති. තුච්ඡපුරුෂය, එහි තෝ පෙර නො පවරණ ලද්දේ, නොනෑ ගැහැවියන්, කරා එළඹ චීවරයෙහි අධිකවිධානයට පැමිණියෙහි. තුච්ඡපුරුෂය, තෙල නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:"

**"මහණක්හු ම උදෙසා නොනෑ වූ ගැහැවියන් දෙදෙනකුන් විසින් හෝ ගෙහිමියන් දෙදෙනකුන් විසින් හෝ අපි මේ වෙන් වෙන් වූ සිවුරුමිලයෙන් වෙන වෙන සිවුරු මිල දී ගෙණ මෙනම් මහණහු සිවුරින් පුදම්හ'යි වෙන වෙන සිවුරුමිල රැස් කරණ ලද වේ ද, තෙල මහණ පෙර නො පවරන ලදුයේ ඔවුන් සමීපයෙහි එළඹ 'ආයුෂ්මත්නි, තෙපි දෙදෙන මැ එක් ව මේ වෙන වෙන සිවුරුමිලයෙන් මෙබඳු වූ ද මෙබඳු වූ ද සිවුරක් විකොටගෙණ එක් සිවුරෙකින් මා පුදන්නාහු නම් මැනැවැ'යි කල්‍යාණකම්‍යතාව සිතාගෙණ චීවරයෙහි අධිකවිධානයට පැමිණියේ වී නම් නිසැගිපචිති වේ"**

5. **භික්ඛුං පනෙව උද්දිස්ස** යනු: මහණක්හු සඳහා මහණක්හු අරමුණු කොට මහණකු ආච්ඡාදනය කරණු කැමැත්තාහු.

**උභින්නං** යනු: දෙදෙනකුන්ගේ.

**අඤ්ඤාතකා** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත් වන මීමුතුන්සුවල දක්වා නො බැඳුනාහු.

**ගහපති** නම්: යම් කෙනෙක් ගිහිගෙයි වෙසෙත් ද ඔහු.

**ගහපතානී** නම්: ගිහිගෙයි වෙසෙන යම් කිසි ස්ත්‍රීහු ය.

**චීවරචෙතාපන්න** නම්: අමුරන් හෝ රත්රන් හෝ මුතු හෝ මිණි හෝ පබළු හෝ පිළිමිණි හෝ පිලී හෝ හූ හෝ කපු හෝ ය.

**ඉමෙහි චීවරචෙතාපන්නෙහි** යනු: වෙතට පත් දෑයෙකින්,

**පටිවත්තෙත්වා** යනු: පිරිවටා (විකොටගෙණ)

**අච්ඡාදෙස්සාම** යනු: දෙන්නම්හ.

**තත්‍ර චෙසො භික්ඛු** යනු: යම් මහණකු උදෙසා සිවුරුමිල රැස් කරණ ලද ද ඒ මහණ.

**පුබ්බෙ අප්පවාරිතො** යනු: 'වහන්ස, ඔබට කෙබඳු සිවුරෙකින් ප්‍රයෝජන ද? කෙබඳු සිවුරක් ඔබට මිලදී ගණුමෝ ද'යි පෙර නො කියන ලද්දේ වෙයි.

**උපසඞ්කමිත්වා** යනු: ගෙට ගොස්, යම් තැනෙක්හි එළඹ.

**චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍යාති** ආයතං වා හොතු විත්ථතං වා අප්පිතං වා සණ්හං වා.

**ඉමෙහි චීවරචෙතාපන්නෙහීති** පච්චුපට්ඨිතෙහි. **එවරූපං වා එවරූපං වාති** ආයතං වා විත්ථතං වා අප්පිතං වා සණ්හං වා.

**චෙතාපෙත්වාති** පරිවත්තෙත්වා

**අච්ඡාදෙථාති** දජ්ජෙථ. **උභො'ව සන්තා එකෙනාති** ද්වෙපි ජනා එකෙන

**කල්‍යාණකම්‍යතං උපාදායාති** සාධත්ථිකො[1] මහග්ඝත්ථිකො.

6. තස්ස වචනෙන ආයතං වා විත්ථතං වා අප්පිතං වා සණ්හං වා චෙතාපෙන්ති. පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකෙ ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපන්නං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති. -පෙ-

7. අඤ්ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී පුබ්බෙ අප්පවාරිතො ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතකෙ වෙමතිකො -පෙ- අඤ්ඤාතකෙ ඤාතකසඤ්ඤී පුබ්බෙ අප්පවාරිතො ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජති, නිස්සග්ගියං පාචිත්තියං. ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ ඤාතකසඤ්ඤී, අනාපත්ති.

8. අනාපත්ති ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, මහග්ඝං චෙතාපෙතුකාමානං අප්පග්ඝං චෙතාපෙති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**දුතියඋපක්ඛටසික්ඛාපදං නිට්ඨිතං.**

---

1. සාධුත්ථිකො. සතා.

**චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය** යනු: දිගු හෝ පුළුල් හෝ ඝන හෝ සිලුටු හෝ වේවා'යි.

**ඉමෙහි චීවරචෙතාපනෙනහි** යනු: වෙතට පත් ද්‍රව්‍යයෙකින්.

**එවරූපං වා එවරූපං වා** යනු: දිගු හෝ පුළුල් හෝ ඝන හෝ සිලුටු හෝ.

**චෙතාපෙත්වා** යනු: පිරිවටා.

**අච්ඡාදෙථ** යනු: දෙවු.

**උභොව සන්තා එකෙන** යනු: දෙදෙන මැ එකෙකින්.

**කල්‍යාණකම්‍යතං උපාදය** යනු: සොඳුරු බව කැමැත්තේ, මහඅැගි බව කැමැත්තේ.

6. ඔහුගේ බසින් දිගු හෝ පුළුල් හෝ ඝන හෝ සිලුටු හෝ (සිවුරක්) විකොට ගණිත් තම් පියෝහි දුකුළා වෙයි. ලැබීමෙන් නිසැගි වේ. සඟහට හෝ ගණයාට හෝ පුතුලක්හට හෝ නිසැජියයුතු ය. තවද මහණෙනි, මෙසේ නිසැජියයුතු: "වහන්ස, මේ මාගේ සිවුර පෙර නොපවරණ ලදුයෙම් නොනෑ ගැහැවියන් කරා එළඹ චීවරයෙහි විකල්පයට පැමිණියේ නිසැගි විය. මම් මෙය සඟහට නිසජම්'යි ... දෙන්නේ ය යි ... දෙන්නාහු ය යි ... ආයුෂ්මත්හට දෙම්'යි...

7. නොනෑ වූවනු කෙරෙහි නොනෑ ය යන සංඥ ඇති ව පෙර නො පවරණ ලද්දේ ගැහැවියන් කරා එළඹ චීවරයෙහි විකල්පයට පැමිණෝ තම් නිසැගි පචිති වෙයි. නොනැයකු කෙරෙහි විමති ඇතියේ ... නො නැයකු කෙරෙහි නෑයෙක යන සංඥ ඇති ව පෙර නො පවරණ ලදුයේ ගැහැවියන් කරා එළඹ චීවරයෙහි විකල්පයට පැමිණෝ තම් නිසැගි පචිති වෙයි. නැයකු කෙරෙහි නොනෑයෙක යන සංඥ ඇතියේ දුකුළාඇවැත් වෙයි. නැයකු කෙරෙහි විමති ඇතියේ දුකුළාඇවැත් වෙයි. නැයකු කෙරෙහි නෑයෙක යන සංඥ ඇතියේ, ඇවැත් නැති.

5. නැයනට, පැවැරූවනට, අනෙකක්හු සඳහා තමාගේ ධනයෙන්, මහඇගියක් විකොට ගණු කැමැතියන් ලවා මඳ අගනා සිවුරක් මිල දී ගන්වා තම්, උම්මත්තකයාහට, ආදිකම්මිකයාහට ඇවැත් නැති යි.

**ද්විතීය උපක්ඛට ශික්ෂාපදය නිමි.**

# 5. 1. 10.

## රාජසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස උපට්ඨාකො මහාමත්තො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස දූතෙන චීවරචෙතාපන්නං පාහෙසි: ඉමිනා චීවරචෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙහී'ති. අථ ඛො සො දූතො යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "ඉදං ඛො භන්තෙ ආයස්මන්තං උද්දිස්ස චීවරචෙතාපන්නං ආභතං. පටිග්ගණ්හාතු ආයස්මා චීවරචෙතාපන්නන්ති." එවං වුත්තෙ ආයස්මා උපනන්දො සක්‍යපුත්තො තං දූතං එතදවොච: "න ඛො මයං ආවුසො චීවරචෙතාපන්නං පටිග්ගණ්හාම, චීවරඤ්ච ඛො මයං පටිග්ගණ්හාම කාලෙන කප්පිය"න්ති එවං වුත්තෙ සො දූතො ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "අත්ථි පනායස්මතො කොචි වෙය්‍යාවච්චකරො"ති. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො ආරාමං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො තං දූතං එතදවොච: "එසො ඛො ආවුසො උපාසකො භික්ඛූනං වෙය්‍යාවච්චකරො"ති. අථ ඛො සො දූතො තං උපාසකං සඤ්ඤාපෙත්වා යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "යං ඛො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා, උපසඞ්කමතු ආයස්මා කාලෙන, චීවරෙන තං අච්ඡාදෙස්සතී"ති.

2. තෙන ඛො පන සමයෙන සො මහාමත්තො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස සන්තිකෙ දූතං පාහෙසි: "පරිභුඤ්ජතු අය්‍යො තං චීවරං. ඉච්ඡාම මයං අය්‍යෙන තං චීවරං පරිභුත්ත"න්ති. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො තං උපාසකං න කිඤ්චි අවචාසි. දුතියම්පි ඛො සො මහාමත්තො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස සන්තිකෙ දූතං පාහෙසි: "පරිභුඤ්ජතු අය්‍යො තං චීවරං, ඉච්ඡාම මයං අය්‍යෙන තං චීවරං පරිභුත්ත"න්ති. දුතියම්පි ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො තං උපාසකං න කිඤ්චි අවචාසි. තතියම්පි ඛො සො මහාමත්තො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස සන්තිකෙ දූතං පාහෙසි: "පරිභුඤ්ජතු අය්‍යො තං චීවරං, ඉච්ඡාම මයං අය්‍යෙන තං චීවරං පරිභුත්ත"න්ති.

3. තෙන ඛො පන සමයෙන නෙගමස්ස සමයො හොති. නෙගමෙන ච කතිකා කතා හොති: "යො පච්ඡා ආගච්ඡති, පඤ්ඤාසං බද්ධො"ති. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො යෙන සො උපාසකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං උපාසකං එතදවොච:-

# 5. 1. 10.

## රාජශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩ වෙසෙති. තව ද එසමයෙහි ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයන්ගේ උපස්ථායක වූ මහඇමැතියෙක් ආයුෂ්මත් උපනන්ද-ශාක්‍යපුත්‍රයන්ට දූතයකු ලවා සිවුරුමිලයක් යැවී ය "මේ සිවුරුමිලයෙන් සිවුරක් විකොටගෙණ සිවුරෙන් උපනන්දහිමියන් පුදව'යි. එකල්හි ඒ දූත තෙම ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයන් කරා එළඹ ආයුෂ්මත් උපනන්ද-ශාක්‍යපුත්‍රයන්ට "වහන්ස, ආයුෂ්මතුන් උදෙසා මේ සිවුරුමිල ගෙණ එන ලද. ආයුෂ්මත්හු සිවුරුමිල පිළිගණිත්වා"යි කීය. මෙසේ කී කල්හි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ ඒ දූතයාට "ඇවැත්නි, ඇපි සිවුරුමිල නො පිළිගණුම්හ. සුදුසු කල්හි කැප වූ සිවුර වූ කලි ඇපි පිළිගණුම්හයි" කීහ. මෙසේ කී කල්හි ඒ දූත තෙම ආයුෂ්මත් උපනන්දශාක්‍ය-පුත්‍රයන්හෙන් "ආයුෂ්මත්හට කිසි මෙහෙකරුවෙක් ඇද්දැයි" ඇසී ය. එකල්හි එක්තරා උපාසකයෙක් කිසි යම් කටයුත්තෙකින් ආරාමයට ගියේ ය. එකල්හි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ ඒ දූතයාට "ඇවැත, තෙල උපාසක තෙම භික්ෂූන්ගේ මෙහෙකරු යයි කීහ. ඉක්බිති ඒ දූත තෙම ඒ උපාසකයාට දන්වා ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයන් කරා එළඹ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන්ට "වහන්ස, ආයුෂ්මත්හු යම් මෙහෙකරුවකු දක්වූහු නම් මා විසින් හේ දන්වන ලද්දේ ය. ආයුෂ්මත්හු සුදුසුකල ඔහු කරා එළඹෙත්වා. සිවුරෙන් පුදන්නේ ය' යි කීය.

2. තව ද එසමයෙහි ඒ මහඇමැති තෙම ආයුෂ්මත් උපනන්දශාක්‍ය-පුත්‍රයන් වෙත දූතයකු යැවී ය: "හිමියෝ ඒ සිවුර පරිභොග කෙරෙත්වා, අපි හිමියන් ඒ සිවුර පරිභොග කරණු කැමතියම්හ"යි. ඉක්බිති ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයෝ ඒ උවසුනට කිසිවක් නො කීහ. දෙවනවට ද ඒ මහඇමැති තෙම ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයන් වෙත දූතයකු යැවී ය: "හිමියෝ ඒ සිවුර පරිභොග කෙරෙත්වා. අපි හිමියන් ඒ සිවුර පරිභොග කරණු කැමැතියම්හ'යි. දෙවනවට ද ආයුෂ්මත් උපනන්දශාක්‍ය-පුත්‍රයෝ ඒ උවසුහට කිසිවක් නො කීහ. තෙවනවට ද ඒ මහඇමැති තෙම ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයන් වෙත දූතයකු යැවී ය: "හිමියෝ ඒ සිවුර පරිභොග කෙරෙත්වා. අපි හිමියන් විසින් ඒ සිවුර පරිභොග කරණු කැමතියම්හ"යි.

3. තවද එසමයෙහි නියම්ගම්වැසියන්ගේ සමාගමයෙක් වෙයි. නියම්ගම් වැසියන් විසිනුදු 'යමෙක් පසු ව ඒ නම් (හෙතෙම) පණසකින් බැඳුනේ (කහවණු පණසක් දඩ ගෙවිය යුතු වේ') යයි, කතිකාවෙක් කරණ ලද වෙයි. ඉක්බිති ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයෝ ඒ උපාසකයා වෙත එළඹ ඒ උපාසකයාහට මෙය කීහ:-

"අත්ථො මෙ ආවුසො චීවරෙනා"ති. "අජ්ජුණ්හො භන්තෙ ආගමෙහි, අජ්ජ නෙගමස්ස සමයො හොති, නෙගමෙන ච කතිකා කතා හොති: "යො පච්ඡා ආගච්ඡති, පඤ්ඤාසං බද්ධො"ති. "අජ්ජෙව මෙ ආවුසො චීවරං දෙහී"ති ඔවට්ටිකාය පරාමසි. අථ ඛො සො උපාසකො ආයස්මතා උපනන්දෙන සක්‍යපුත්තෙන නිප්පීළියමානො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස චීවරං චෙතාපෙත්වා පච්ඡා අගමාසි. මනුස්සා තං උපාසකං එතදවොචුං" "කිස්ස ත්වං අය්‍යො පච්ඡා ආගතොසි, පඤ්ඤාසං ජීනොසී"ති.

4. අථ ඛො සො උපාසකො තෙසං මනුස්සානං එතමත්ථං ආරොචෙසි. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "මහිච්ඡා ඉමෙ සමණා සක්‍යපුත්තියා අසන්තුට්ඨා, නයිමෙසං සුකරං වෙය්‍යාවච්චම්පි කාතුං. කථං හි නාම ආයස්මා උපනන්දො උපාසකෙන "අජ්ජුණ්හො භන්තෙ ආගමෙහී"ති වුච්චමානො නාගමෙස්සතී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො උපාසකෙන "අජ්ජුණ්හො භන්තෙ ආගමෙහී"ති වුච්චමානො නාගමෙස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "සච්චං කිර ත්වං උපනන්ද උපාසකෙන අජ්ජුණ්හො භන්තෙ ආගමෙහී"ති වුච්චමානො නාගමෙසී"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා. -පෙ- "කථං හි නාම ත්වං මොඝපුරිස උපාසකෙන 'අජ්ජුණ්හො භන්තෙ ආගමෙහී'ති වුච්චමානො නාගමෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

"භික්ඛුං පනෙව උද්දිස්ස රාජා වා රාජභොග්ගො වා බ්‍රාහ්මණො වා ගහපතිකො වා දූතෙන චීවරචෙතාපන්නං පහිණෙය්‍ය: 'ඉමිනා චීවරචෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙහී"ති. සො චෙ දූතො තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: 'ඉදං ඛො භන්තෙ ආයස්මන්තං උද්දිස්ස චීවරචෙතාපන්නං ආභතං. පටිග්ගණ්හාතු ආයස්මා චීවරචෙතාපන්නන්ති". තෙන භික්ඛුනා සො දූතො එවමස්ස වචනීයො: 'න ඛො මයං ආවුසො චීවරචෙතාපන්නං පටිග්ගණ්හාම, චීවරඤ්ච ඛො මයං පටිග්ගණ්හාම කාලෙන කප්පිය'න්ති, සො චෙ දූතො තං භික්ඛුං එවං වදෙය්‍ය: "අත්ථි පනායස්මතො කොචි වෙය්‍යාවච්චකරො'ති චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො නිද්දිසිතබ්බො ආරාමිකො වා උපාසකො වා, 'එසො ඛො ආවුසො භික්ඛූනං වෙය්‍යාවච්චකරො"ති. සො චෙ දූතො තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: 'යං ඛො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා, උපසඞ්කමතු ආයස්මා කාලෙන, චීවරෙන තං අච්ඡාදෙස්සතී'ති. චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො උපසඞ්කමිත්වා ද්වත්තික්ඛත්තුං චොදෙතබ්බො සාරෙතබ්බො: 'අත්ථො මෙ ආවුසො චීවරෙනාති;-

'ඇවැත, මට සිවුරෙන් ප්‍රයොජන ඇතැ'යි. "වහන්ස, අද එක්දවසක් බලව. අද නියම්ගම්වැසියන්ගේ සමාගමයෙක් වෙයි. නියම්ගම්වැසියන් විසිනුදු 'යමෙක් පසුව ලා ඒ නම් (හෙතෙම) පණසකින් බැඳුණේ වේ' යයි කතිකායෙක් කරණ ලද වෙයි. 'අද ම ඇවැත, මට සිවුර දෙව'යි එළියෙහි (=හිඟැ) ගත්හ. ඉක්බිති ඒ උපාසක තෙම ආයුෂ්මත් උපනන්ද-ශාක්‍යපුත්‍රයන් විසින් දැඩි කොට පෙළනු ලබන්නේ ආයුෂ්මත් උපනන්ද-ශාක්‍යපුත්‍රයනට සිවුරක් මිලයට ගෙණ දී පසුවැ ලා ගියේ ය. මිනිස්සු ඒ උවසුහට මෙය කීහ: "කවර හෙයින් ආයෑයෙහි, තෝ පසු වැ ලා ආයෙහි ද, පණසකට පැරදුනෙහි' යයි.

4. ඉක්බිති ඒ උපාසක තෙම ඒ මිනිසුන්ට මෙ පවත් දැන්වී ය. මිනිස්සු අවඥා කෙරෙති නුගුණ කියති දෙස් පහළ කෙරෙත්: 'මේ ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ මහෙච්ඡයෝ ය, අසන්තුෂ්ටයෝ ය, මොවුනට මෙහෙයකුදු කරන්නට පහසු නො වෙයි. කෙසේ නම් ආයුෂ්මත් උපනන්දයෝ උපාසක විසින් 'වහන්ස, අද එක් දවසකට බලනු මැනවැ'යි කියනු ලබන්නාහු නො බැලූහු ද'යි. භික්ෂූහු අවඥා කරණ නුගුණ කියන දෙස් පහළ කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡයෝ නම් ඔහු අවඥා කෙරෙති නුගුණ කියති දෙස් පහළ කෙරෙත්: "කෙසේ නම් ආයුෂ්මත් උපනන්දශාක්‍ය-පුත්‍රයෝ උපාසක විසින් 'වහන්ස, අද එක් දවසකට බලනු මැනැවැ'යි කියනු ලබන්නාහු නොබැලූහු ද' යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළහ: 'සැබෑ ද උපනන්දය, තෝ උපාසක විසින් 'වහන්ස, අද එක් දවසකට බලනු මැනැවැ'යි කියනු ලබන්නෙහි නො බැලීහි ද?' යි. "සැබව භාග්‍යවතුන් වහන්ස". භාග්‍යවත් බුදුහු වෙසෙසින් ගැරහූහ. "කෙසේ නම් තුච්ඡපුරුෂය, තෝ උපාසක විසින් 'වහන්ස, අද එක් දවසකට බලනු මැනැවැ'යි කියනු ලබන්නෙහි නො බැලීහි ද, තුච්ඡපුරුෂය, තෙල නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"මහණක්හු ම උදෙසා රජෙක් හෝ රජ ඇමැතියෙක් හෝ බමුණෙක් හෝ ගැහැවියෙක් හෝ 'මේ සිවුරුමිලයෙන් සිවුරක් විකොට ගෙණ මෙනම් මහණහු සිවුරෙන් ආච්ඡාදනය කරව'යි දූතයකු ලවා සිවුරුමිලයක් යවා නම්, ඉදින් ඒ දූත තෙම ඒ මහණහු කරා එළඹ 'වහන්ස, මේ සිවුරුමිලය ආයුෂ්මතුන් උදෙසා ගෙණ එන ලද ය. ආයුෂ්මත්හු සිවුරුමිලය පිළිගණිත්වා'යි මෙසේ කියා නම්, ඒ මහණහු විසින් ඒ දූත තෙම මෙසේ කියයුතු වන්නේ ය: 'ඇවැත, අපි සිවුරුමිල නො පිළිගණුම්හ. එතෙකුදුවත් ඇපි සුදුසු කල්හි කැප වූ සිවුරක් පිළිගණුම්හ'යි. ඉදින් ඒ දූත තෙම ඒ මහණහට 'ආයුෂ්මතුන්ගේ කිසි මෙහෙකරුවෙක් ඇද්ද'යි මෙසේ කියා නම්, මහණෙනි, සිවුරු කැමති මහණහු විසින් ආරාමිකයෙක් හෝ වෙයි උපාසකයෙක් හෝ වෙයි 'ඇවැත, මේ තෙම භික්ෂූන්ගේ මෙහෙකරු ය'යි මෙහෙකරු දක්විය යුත්තේ ය. ඉදින් ඒ දූත තෙම ඒ මෙහෙකරු ඇනවා මහණහු කරා එළඹ මෙසේ කියා නම්: 'වහන්ස, ආයුෂ්මත්හු යම් මෙහෙකරුවකු දක්වූහු ද, මා විසින් හෙතෙම ඇනවන ලද්දේ ය. ආයුෂ්මත්හු සුදුසු කල්හි එළඹෙත්වා, සිවුරෙන් පුබ වහන්සේ පුදන්නේ ය'යි. මහණෙනි, සිවුරු කැමැති මහණහු විසින් එළඹ 'ඇවැත, මට සිවුරෙන් ප්‍රයොජන ඇතැ'යි මෙහෙකරු තෙම දෙතුන් වරක් සෙවිය යුත්තේ ය. සිහි කරවිය යුත්තේ ය-**

ද්වත්තික්ඛත්තුං චොදයමානො සාරයමානො තං චීවරං අභිනිප්ඵා-දෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුං පරමං තුණ්හීභූතෙන උද්දිස්ස ඨාතබ්බං. චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුං පරමං තුණ්හීභූතො උද්දිස්ස තිට්ඨ-මානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චෙතං කුසලං. තතො චෙ උත්තරිං වායමමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං. නො චෙ අභිනිප්ඵාදෙය්‍ය යතස්ස චීවරචෙතාපන්නං ආභතං, තත්ථ සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො: 'යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපන්නං පහිණිත්ථ, න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනුභොති. යුඤ්ජන්තායස්මන්තො සකං මා වො සකං විනස්සා'ති· අයං තත්ථ සාමීචී"ති.

5. භික්ඛුං පනෙව උද්දිස්සාති භික්ඛුස්සත්ථාය භික්ඛුං ආරම්මණං කරිත්වා භික්ඛුං අච්ඡාදෙතුකාමො.

රාජා නාම: යො කොචි රජ්ජං කාරෙති.

රාජභොග්ගො නාම: යො කොචි රඤ්ඤො භත්තවෙතනාහාරො.

බ්‍රාහ්මණො නාම: ජාතියා බ්‍රාහ්මණො.

ගහපතිකො නාම: ඨපෙත්වා රාජානං රාජභොග්ගං බ්‍රාහ්මණං අවසෙසො ගහපතිකො නාම.

චීවරචෙතාපන්නං නාම: හිරඤ්ඤං වා සුවණ්ණං වා මුත්තා වා මණි වා.

ඉමිනා චීවරචෙතාපන්නෙනාති පච්චුපට්ඨිතෙන.

චෙතාපෙත්වාති පරිවත්තෙත්වා.

අච්ඡාදෙහීති දජ්ජෙහි.

සො චෙ දූතො තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: "ඉදං ඛො භන්තෙ ආයස්මන්තං උද්දිස්ස චීවරචෙතාපන්නං ආභතං. පටිග්ගණ්හාතු ආයස්මා චීවරචෙතාපන්න"න්ති. තෙන භික්ඛුනා සො දූතො එවමස්ස වචනීයො: "න ඛො මයං ආවුසො චීවරචෙතාපන්නං පටිග්ගණ්හාම, චීවරඤ්ච ඛො මයං පටිග්ගණ්හාම කාලෙන කප්පිය"න්ති. සො චෙ දූතො තං භික්ඛුං එවං වදෙය්‍ය: "අත්ථි පනායස්මතො කොචි වෙය්‍යාවච්චකරො"ති. චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො නිද්දිසිතබ්බො, ආරාමිකො වා උපාසකො වා: "එසො ඛො ආවුසො භික්ඛූනං වෙය්‍යාවච්චකරො"ති. න වත්තබ්බො: "තස්ස දෙහී"ති වා සො වා නික්ඛිපිස්සති, සො වා පරිවත්තෙස්සති, සො වා චෙතාපෙස්සතී"ති.

සො චෙ දූතො තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසඞ්ක-මිත්වා එවං වදෙය්‍ය: "යං ඛො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා, උපසඞ්කමතු ආයස්මා කාලෙන, චීවරෙන තං අච්ඡාදෙස්සතී"ති. චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො උපසඞ්කමිත්වා ද්වත්තික්ඛත්තුං චොදෙතබ්බො සාරෙතබ්බො: "අත්ථො මෙ ආවුසො චීවරෙනා"ති. න වත්තබ්බො: "දෙහි මෙ චීවරං, ආහර මෙ චීවරං, පරිවත්තෙහි මෙ චීවරං, චෙතාපෙහි මෙ චීවර"න්ති. දුතියම්පි වත්තබ්බො. තතියම්පි වත්තබ්බො. සචෙ අභිනිප්ඵාදෙති ඉච්චෙතං කුසලං.

**දෙතුණ්යලක් සොයනු ලබන්නේ හිඟි කරවනු ලබන්නේ ඒ සිවුර නිපදවා (සපයා) නම් මේ නිපැදවීම මැනැවි. ඉදින් නො නිපදවා නම්, සිවුයලක් පස්යලක් සයලක් පරම කොට තුණ්හීභූත වූවනු විසින් උදෙසා සිටියයුතු ය. සිවුයලක් පස්යලක් සයලක් පරම කොට තුණ්හීභූත ව උදෙසා සිටිනුයේ ඒ සිවුර නිපදවා නම් මේ නිපැදවීම මැනැවි. ඉදින් එයින් මත්තෙහි වෑයම් කරන්නේ ඒ සිවුර නිපදවා නම් නිසග්ගිපාචිත්ති වෙයි. ඉදින් නො නිපදවා නම් යමක්හු කෙරෙන් ඒ මහණහට සිවුරු-මිලය ගෙණ එන ලද ද එහි තමා හෝ යායුතු ය: 'ඇවැත්නි, තෙපි යම් මහණකු උදෙසා සිවුරුමිලයක් යැවූහු ද, එය ඒ මහණහට කිසි අර්ථයක් සිදු නො කෙරෙයි. ආයුෂ්මත්හු ස්වකීය ධනය ලබත්වා. තොප සතු ධනය නාහමක් වැනැසේවා'යි දූතයකු හෝ යැවිය යුත්තේ ය. මේ එහි අනුධම්තා වේ" යයි.**

5. **භික්ඛුං පනෙව උද්දිස්ස** යනු: භික්ෂුහු සඳහා භික්ෂුහු අරමුණු කොට භික්ෂුහු ආච්ඡාදනය කරණු කැමැත්තේ.

**රාජ** නම්: යම් කිසිවෙක් රාජ්‍යය කෙරේ ද හෙතෙම.

**රාජභොග්ග** නම්: රජහුගේ බත්වැටුම් බුදිත යම් කිසිවෙක්.

**බ්‍රාහ්මණ** නම්: ජාතියෙන් බමුණු වූයේ.

**ගහපතික** නම්: රජ, රාජභොග්‍යයා, බ්‍රාහමණයා තබා ශෙෂ වූයේ ගෘහපතික නම.

**චීවරචෙතාපන්න** නම්: අමුරන් හෝ රන්රන් හෝ මුතු හෝ මිණි හෝ.

**ඉමිනා චීවරචෙතාපන්නෙන** යනු: එළඹසිටියෙන්.

**චෙතාපෙත්වා** යනු: පිරිවටා.

**අච්ඡාදෙහි** යනු: දෙව.

ඉදින් ඒ දූත තෙම ඒ මහණහු කරා එළඹ 'වහන්ස, මේ සිවුරුමිලය ආයුෂ්මතුන් උදෙසා ගෙණ එන ලද ය. ආයුෂ්මත්හු සිවුරුමිලය පිළිගණිත්වා'යි. මෙසේ කියා නම්, ඒ මහණහු විසින් ඒ දූත තෙම මෙසේ කියයුතු වන්නේ ය: 'ඇවැත, ඇපි සිවුරුමිල නො පිළිගණුම්හ. එතෙකුදුවත් ඇපි සුදුසු කල්හි කැප වූ සිවුරක් පිළිගණුම්හ'යි. ඉදින් ඒ දූත තෙම ඒ මහණහට 'ආයුෂ්ම-තුන්ගේ කිසි කැපකරුවෙක් ඇද්ද'යි මෙසේ කියා නම්, මහණෙනි, සිවුරු කැමැති මහණහු විසින් ආරාමික වේවයි උපාසක වේවයි ඇවැත, මේ තෙමේ භික්ෂූන්ගේ කැපකරු' යයි කැපකරු දැක්විය යුත්තේ ය. "ඔහුට දෙව යි හෝ හෙතෙම බහා තබන්නේ ය හෝ හෙතෙම පිරිවටන්නේ ය හෝ හෙතෙම පිකොටගන්නේ ය හෝ"යි නොකියයුත්තේ ය.

ඉදින් ඒ දූත තෙම ඒ කැපකරු ඇනවා ඒ මහණහු වෙත පැමිණ මෙසේ කියා නම්: 'වහන්ස, ආයුෂ්මත්හු යම් කැපකරුවකු දැක්වූහු නම්, හෙතෙම මා විසින් ඇනවන ලද්දේ ය. ආයුෂ්මත්හු සිවුරෙන් ප්‍රයොජන ඇති කල්හි එළඹෙත්වා සිවුරෙන් ඔබ වහන්සේ පුදන්නේ ය'යි. මහණෙනි, සිවුරු කැමැති මහණහු විසින් එළඹ ඇවැත, මට සිවුරෙන් ප්‍රයොජන ඇතැ යි කැපකරු තෙම දෙතුන්යලක් සෙවිය යුත්තේ ය. හිඟි කරවිය යුත්තේ ය, 'මට සිවුරක් දෙව, මට සිවුරක් ගෙණෙව, මට සිවුරක් පිරිවටව, මට සිවුරක් පිකොට ගණැ'යි නො කියයුත්තේ ය. දෙවනුවට ද කියයුතු ය. තෙවනුවට ද කියයුතු. ඉදින් නිපදවා නම් මේ නිපදවීම මැනැව.—

සො චෙ අභිනිප්ඵාදෙති, තත්ථ ගන්ත්වා තුණ්හීභූතෙන උද්දිස්ස ඨාතබ්බං. න ආසනෙ නිසීදිතබ්බං, න ආමිසං පටිග්ගහෙතබ්බං න ධම්මො භාසිතබ්බො. "කිං කාරණා ආගතොසී"ති පුච්ඡියමානො[1] ජානාහි[2] ආවුසොති වත්තබ්බො: සචෙ ආසනෙ වා නිසීදති, ආමිසං වා පතිගණ්හාති, ධම්මං වා භාසති, ඨානං භඤ්ජති. දුතියම්පි ඨාතබ්බං. තතියම්පි ඨාතබ්බං. චතුක්ඛත්තුං චොදෙත්වා චතුක්ඛත්තුං ඨාතබ්බං. පඤ්චක්ඛත්තුං චොදෙත්වා ද්වික්ඛත්තුං ඨාතබ්බං. ඡක්ඛත්තුං චොදෙත්වා න ඨාතබ්බං. තතො චෙ උත්තරිං වායමමානො තං චීවරං අභිනිප්ඵාදෙති, පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති, නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: -පෙ- "ඉදං මෙ භන්තෙ චීවරං අතිරෙකතික්ඛත්තුං චොදනාය අතිරෙකඡක්ඛත්තුං ඨානෙන අභිනිප්ඵාදිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, යතස්ස චීවරචෙතාපන්නං ආභතං තත්ථ සාමං වා ගන්තබ්බං, දූතො වා පාහෙතබ්බො. "යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපන්නං පහිණිත්ථ, න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනුභොති, යුඤ්ජන්තායස්මන්තො සකං, මා වො සකං විනස්සා"ති.

අයං තත්ථ සාමීචි. අයං තත්ථ අනුධම්මතා.

6 අතිරෙකතික්ඛත්තුං චොදනාය අතිරෙකඡක්ඛත්තුං ඨානෙන, අතිරෙකසඤ්ඤී අභිනිප්ඵාදෙති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකතික්ඛත්තුං චොදනාය අතිරෙකඡක්ඛත්තුං ඨානෙන වෙමතිකො අභිනිප්ඵාදෙති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකතික්ඛත්තුං චොදනාය අතිරෙකඡක්ඛත්තුං ඨානෙන ඌනකසඤ්ඤී අභිනිප්ඵාදෙති නිස්සග්ගියං පාචිත්තියං. ඌනකතික්ඛත්තුං චොදනාය ඌනකඡක්ඛත්තුං ඨානෙන අතිරෙකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඌනකතික්ඛත්තුං චොදනාය ඌනකඡක්ඛත්තුං ඨානෙන වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඌනකතික්ඛත්තුං චොදනාය ඌනකඡක්ඛත්තුං ඨානෙන ඌනකසඤ්ඤී, අනාපත්ති.

7. අනාපත්ති තික්ඛත්තුං චොදනාය ඡක්ඛත්තුං ඨානෙන, ඌනකඡක්ඛත්තුං චොදනාය ඌනකඡක්ඛත්තුං ඨානෙන. අචොදියමානො දෙති, සාමිකා චොදෙත්වා දෙන්ති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

රාජසික්ඛාපදං නිට්ඨිතං.

චීවරවග්ගො පඨමො.

---

තස්සුද්දානං:-

උබ්භතං කඨිනං තීණි ධොවනඤ්ච පටිග්ගහො,
අඤ්ඤාතකානි තීණෙව උභින්නං දූතකෙන ච.

---

1. පුච්ඡමානො - ස්‍යා 2. න ජානාසි - සීමු.

ඉදින් නො නිපදවා නම් එහි ගොස් තූෂ්ණිම්භූත වූවහු විසින් උදෙසා සිටිය යුතු ය. අසුනෙක නො හින්ද යුතු ය. අහර නො පිළිගත යුතු ය. දහම් නොකිය යුතු ය. 'කවර කරුණෙන් ආයෙහි ද' යි විචාරණු ලබන්නේ 'ඇවැත දතැ'යි කිය යුතු ය. ඉදින් අසුනෙහි හිඳී නම් හෝ අහර පිළිගණී නම් හෝ දහම් කියා නම් හෝ සිටීම බිදෙයි. දෙවනවට ද සිටිය යුතු ය තෙවනවට ද සිටිය යුතු ය.

සතරවරක් චොදනා කොට සතරවරක් සිටිය යුතු ය. පස්වරක් චොදනා කොට දෙවරක් සිටිය යුතු ය. සවරක් චොදනා කොට නො සිටිය යුතු ය. ඉදින් එයින් මතුයෙහි වෑයම් කරන්නේ ඒ සිවුර නිපදවා නම් පියොච්හි දුකුළා වෙයි. ලැබීමෙන් නිසගි වෙයි. සඟනට හෝ ගණයාට හෝ පුග්ලක්හට හෝ නිසැජිය යුතු ය. තවද මහණෙනි, මෙසේත් නිසජිය යුතු ය. 'වහන්ස, මේ මාගේ සිවුර අයිරා තුන්යලක් චොදනායෙන් අයිරා සයලක් සිටීමෙන් නිපදවන ලද්දේ නිසගි විය. මෙය මම් සඟනට නිසජම් යි ... දෙන්නේ ය යි ... දෙන්නාහ යි ... ආයුෂ්මන්හට දෙමි'යි.

ඉදින් නො නිපදවා නම් යමක්හු කෙරෙන් ඔහුට සිවුරුමිල ගෙණ එන ලද ද එහි තමා හෝ යා යුතු ය. 'ඇවැත්නි, තෙපි යම් මහණක්හු උදෙසා සිවුරු මිලයක් යැවූහු ද එය ඒ මහණහට කිසි අර්ථයක් සිදු නො කෙරේ. ආයුෂ්මත්හු සවකීය ධනය ලබත්වා. තොප සතු ධනය නහමක් වැනසේවා''යි දූතයෙක් හෝ යැවිය යුත්තේ ය.

**අයං තත්ථ සාමීචි යනු: මේ එහි අනුධර්මතා යි.**

6. අයිරා තුන්යලක් චොදනායෙන් අයිරා සයලක් සිටීමෙන් අතිරේකය යන සංඥා ඇත්තේ නිපදවා නම් නිසගිපචිති වෙයි. අයිරා තුන්යලක් චොදනායෙන් අයිරා සයලක් සිටීමෙන් විමති ඇත්තේ නිපදවා නම් නිසගිපචිති වෙයි. අයිරා තුන්යලක් චොදනායෙන් අයිරා සයලක් සිටීමෙන් ඌනය යන සංඥා ඇත්තේ නිපදවා නම් නිසගිපචිති වේ. ඌනතුන්යලක් චොදනායෙන් ඌනසයලක් සිටීමෙන් අතිරේකය යන සංඥා ඇත්තේ දුකුළාඇවැත් වෙයි. ඌනතුන්යලක් චොදනායෙන් ඌනසයලක් සිටීමෙන් විමති ඇත්තේ දුකුළාඇවැත් වෙයි. ඌනතුන්යලක් චොදනායෙන් ඌනසයලක් සිටීමෙන් ඌනය යන සංඥා ඇත්තේ ඇවැත් නැති.

7. තුන්යලක් චොදනායෙන් සයලක් සිටීමෙන් ඌනතුන්යලක් චොදනායෙන් ඌනසයලක් සිටීමෙන් දේ නම්, නො සොයනු ලබන්නේ දේ නම්, හිමියෝ සොයා දෙත් නම් ඇවැත් නැති. උම්මත්තකයාහට ආදිකම්මිකයාහට ඇවැත් නැති යි.

**රාජශික්ෂාපදය නිමි.**

**පළමු වැනි චීවරවර්ගය යි.**

---

**එහි උද්දානය**

උබ්භත කඨින සිකපදය, උද්දෝසිත (දෙවන කඨින) සිකපදය, තෙවන කඨින සිකපදය යන තුණ ද, ධොවන සිකපදය, පටිග්ගහණ සිකපදය යි පසෙකි. තතුත්තරිය උපක්ඛට දෙක ය යන අඤ්ඤතක සිකපද තුණ ය, දූතක සිකපද දෙකය යි සියල්ල දශයෙකි.

# කොසියවග්ගො

## 5. 2. 1.

## කොසියසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ කොසියකාරකෙ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: "බහූ ආවුසො කොසකාරකෙ පචථ අම්හාකම්පි දස්සථ. මයම්පි ඉච්ඡාම කොසියමිස්සකං සන්ථතං කාතු"න්ති. තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා අම්හෙ උපසඞ්කමිත්වා එවං වක්ඛන්ති, බහූ ආවුසො කොසකාරකෙ පචථ, අම්හාකම්පි දස්සථ, මයම්පි ඉච්ඡාම කොසියමිස්සකං සන්ථතං කාතුන්ති. අම්හාකම්පි අලාභා අම්හාකම්පි දුල්ලද්ධං, යෙ මයං ආජීවස්ස හෙතු පුත්තදාරස්ස කාරණා බහූ ඛුද්දකෙ පාණකෙ[1] සඞ්ඝාතං ආපාදෙමා"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ කොසියකාරකෙ උපසඞ්කමිත්වා එවං වක්ඛන්ති:- බහූ ආවුසො කොසකාරකෙ පචථ, අම්හාකම්පි දස්සථ, මයම්පි ඉච්ඡාම කොසියමිස්සකං සන්ථතං කාතුන්ති." අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ කොසියකාරකෙ උපසඞ්කමිත්වා එවං වදෙථ: බහූ ආවුසො කොසකාරකෙ පචථ, අම්හාකම්පි දස්සථ, මයම්පි ඉච්ඡාම කොසියමිස්සකං සන්ථතං කාතු"න්ති "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා කොසියකාරකෙ උපසඞ්කමිත්වා එවං වක්ඛථ, බහූ ආවුසො කොසකාරකෙ පචථ, අම්හාකම්පි දස්සථ, මයම්පි ඉච්ඡාම කොසියමිස්සකං සන්ථතං කාතු"න්ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු කොසියමිස්සකං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය**"න්ති.

2. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සන්ථතං** නාම: සන්ථරිත්වා කතං හොති අවායිමං.

**කාරාපෙය්‍යාති** එකෙනපි කොසියංසුනා මිස්සෙත්වා කරොති වා කාරාපෙති වා, පයොගෙ දුක්කටං: පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ කොසියමිස්සකං සන්ථතං කාරාපිතං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති, දදෙය්‍යාති, දදෙය්‍යුන්ති, ආයස්මතො දම්මී'ති

1. පාණෙ ම.ඡ.සං.

## කොසිය වග්ගය

## 5. 2. 1.

## කොසිය ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ අලව්නුවර අසල අග්ගාලව දෙවොලෙහි වැඩ වසන සේක. එසමයෙහි වූ කලී සවග මහණහු තිහිරිහු නිපදවන්නන් වෙත එළඹ "ඇවැත්නි, බොහෝ තිහිරි පණුවන් පිසවූ. අපට ද දෙවූ. අපි ද තිහිරිහු මුසු ඇතිරියක් කරන්නට කැමැත්තම්හ"යි මෙසේ කියත්. ඒ මිනිස්සු "ශාක්‍යපුත්‍රීය මහණහු අප වෙත එළඹ 'ඇවැත්නි, බොහෝ තිහිරි පණුවන් පිසවූ. අපට ද දෙවූ. අපි දු තිහිරිහු මුසු ඇතිරියක් කරන්නට කැමැත්තම්හ'යි කෙසේ නම් කියත් ද? යම් බඳු අපි ජීවිකා හෙතුයෙන් අඹුදරුවන් රක්නා කරුණින් බොහෝ කුඩා පණුවන් මරණයට පමුණුවමෝ ද ඒ අපට ද අලාභයෙකි: අපගේ ද අභාග්‍යයෙකි."යි අවමන් කරත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්. භික්ෂූහු අවමන් කරණ අයුණු කියන නුගුණ පතුරුවන ඒ මිනිසුන් ගේ බස් ඇසූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙත් ද? ඔහු "කෙසේ නම් සවග මහණහු තිහිරිහු නිපදවන්නවුන් වෙත එළඹ 'ඇවැත්නි, බොහෝ තිහිරි පණුවන් පිසවූ. අපට ද දෙවූ. අපිදු තිහිරිහු මුසු ඇතිරියක් කරන්නට කැමැත්තම්හ"යි කියත් ද'යි අවමන් කෙරෙත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට ඒ පවත් සැල කළහ.... "සැබව, භාග්‍යවතුන් වහන්සැ"යි ඔහු කීහ. භාග්‍යවතුන් වහන්සේ ගැරැහූ සේක: "හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් තිහිරිහු නිපදවන්නවුන් කරා එළඹ 'ඇවැත්නි, බොහෝ තිහිරි පණුවන් පිසවූ. අපට ද දෙවූ. අපිදු තිහිරිහු මුසු ඇතිරියක් කරන්නට කැමැත්තම්හ"යි කෙසේ නම් කියවූ ද? හිස් පුරුෂයෙනි, මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස ද... නො වෙයි. මහණෙනි, මේ සිකපදය මෙසේ ද උදෙසවූ:

**"යම් මහණෙක් තිහිරිහු මුසු ඇතිරියක් කරවන්නේ නම් නිසඟිභවිති වේ."**

2. **යො පන** යනු යම්, යම් බඳු

**භික්ඛු** (මහණෙක්) යනු... මෙ තෙමේ මේ අර්ථයෙහි භික්ෂූ යයි අභිප්‍රෙතය.

**සන්ථත** (ඇතිරිය) නම්: අතුරා වියුම් රහිත කොට කරණ ලද්ද වෙයි.

**කාරාපෙය්‍ය** (කරවන්නේ නම්) යනු එක් තිහිරි කෙන්දකිනු දු මුසු කොට කෙරෙයි නම් හෝ කරවයි නම් හෝ පියොවෙහි දුකුළා වේ. ලබා ගැන්මෙන් නිසඟි වේ. සඟනට හෝ ගණයා හට හෝ පුඟුල් හට හෝ නිසජ්ය යුතු: "වහන්ස, මා විසින් තිහිරිහු මුසු මේ නිසජ්ය යුතු ඇතිරියෙක් කරවන ලද්දේ ය. මෙය මම් සඟනට නිසජම් යි... දෙන්නේය යි... දෙන්නාහ යි... ආයුෂ්මත්හට දෙමි"යි නිසජ්ය යුතු.

3. අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා, ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති, ආපත්ති දුක්කටස්ස.

4. අනාපත්ති විතානං වා භුම්මත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**කොසියසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 2. 2.

## සුද්ධකාළකසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා භික්ඛූ** සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙස්සන්ති, සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙස්සන්තී"ති? අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙථා"ති?. "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා. "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

2. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**කාළකං** නාම: ද්වෙ කාළකානි ජාතියා කාළකං වා රජනකාළකං වා.

**සන්ථතං** නාම: සන්ථරිත්වා කතං හොති අවායිමං.

3. තමා විසින් කොට අඹාල (ඇතිරිය) තෙමේ නිමවා ද, නිසගිපචිති වේ. තමා විසින් කොට අඹාල දූය අනුන් ලවා නිමවා ද, මෙරමා විසින් කොට අඹාල දූය තෙමේ නිමවා ද නිසැගි පචිති වේ. මෙරමා කොට අඹාල දූය මෙරමා ලවා නිමවා ද නිසැගි පචිති වේ. අනෙකක්හු පිණිස කෙරේ ද කරවා ද, දුකුලාඇවැත් වේ: අනෙකකු කල ඇතිරියක් ලැබගෙණ පරිභොග කෙරේ ද, දුකුලාඇවැත් වන්නේ ය.

4. වියනක් හෝ බුමුතුරුණක් හෝ වටතිරයක් හෝ බිස්සක් හෝ කන්වයිනක් හෝ කෙරේ ද, ඔහුට ද උම්තුවාහට ද ආදිකර්මිකයාට ද ඇවැත් නො වේ.

කොසියශික්ෂාපදය නිමි.

---

## 5. 2. 2.

## ශුද්ධකාලකශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ විසල්පුර මහවෙනෙහි කූටාගාරශාලායෙහි වැඩ වසන සේක. එසමයෙහි සවග මහණහු හුදු කළු එළලොම්මුවා ඇතිරියක් කරවත්. මිනිස්සු විහාරචාරිකායෙහි හැසිරෙන්නාහු එය දක, "කෙසේ නම් ශාක්‍යපුත්‍රීය ශ්‍රමණයෝ කාමභොගී ගිහියන් මෙන් හුදු කළු එළලොම්මුවා ඇතිරියක් කරවද්ද"යි අවමන් කරත්, අයුණු කියත්, දෙස් පතුරුවත්. භික්ෂූහු අවමන් කරණ, අයුණු කියන, නුගුණ පතුරුවන ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද, ඔහු "කෙසේ නම් සවග මහණහු හුදු කළු එළලොම්මුවා ඇතිරියක් කරවත්ද!"යි අවමන් කරත්, අයුණු කියත්, නුගුණ පතුරුවත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කළහ. "සැබෑද, මහණෙනි,? තෙපි හුදු කළු එළලොම්මුවා ඇතිරියක් කරවවු දැ?"යි භාග්‍යවතුන්වහන්සේ අසා වදාළසේක. "සැබෑව, භාග්‍යවතුන්වහන්සැ"යි ඒ මහණහු කීහ. භාග්‍යවතුන්වහන්සේ ගැරැහූසේක: "හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් හුදු කළු එළලොම්මුවා ඇතිරියක් කරවවු දැ? හිස් පුරුෂයෙනි, මෙය නොපහන්වූවන්ගේ පැහැදීම පිණිස ද නොවෙයි ... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් හුදු කළු එළලොම්මුවා ඇතිරියක් කරවා නම් නිසැගි පචිති වෙයි."**

2. **යො පන** යනු යමෙක්, යම්බඳු වූ ...

**භික්ඛු** යනු ... මේ තෙමේ මේ අර්ථයෙහි භික්ෂු ය යි අදහස් කරණ ලදී.

**කාළක** නම්: උත්පත්තියෙන් කළු වූයේ රදන් පෙවීමෙන් කළු වූයේ ද යි කළුපැහැය දෙවැදෑරුම් වෙයි.

**සන්ථත** නම්: අතුරා කරණ ලද, නොවියන ලද.

කාරාපෙය්‍යාති කරොති වා කාරාපෙති වා, පයොගෙ දුක්කටං පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපිතං නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

3. අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති, ආපත්ති දුක්කටස්ස.

4. අනාපත්ති විතානං වා භුම්මත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

සුද්ධකාළකසික්ඛාපදං නිට්ඨිතං.

---

# 5. 2. 3.

## ද්වෙභාගසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භගවතා පටික්ඛිත්තං සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙතුන්ති තෙ ථොකං යෙව ඔදාතං අන්තෙ ආදියිත්වා තථෙව සුද්ධකාළකානං සන්ථතං කාරාපෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ථොකංයෙව ඔදාතං අන්තෙ ආදියිත්වා තථෙව සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ථොකංයෙව ඔදාතං අන්තෙ ආදියිත්වා තථෙව සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙථා"ති "සච්චං භගවා, විගරහි බුද්ධො භගවා. "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ථොකංයෙව ඔදාතං අන්තෙ ආදියිත්වා තථෙව සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ-" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:-

කාරාපෙය්‍ය යනු කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝගි දුකුළා වේ. ලැබීමෙන් නිසගි වේ. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුට හෝ නිසජිය යුතු. මහණෙනි, මෙසේ වනාහි නිසජිය යුතු: "වහන්ස, මා විසින් කරවන ලද හුදු කළු එළලොම්මුවා මේ ඇතිරිය නිසගි වෙයි. මම මේය සඟනට නිසජමි යි ... දෙන්නේ යයි ... දෙන්නාහ යි ... ආයුෂමත්හට දෙමි"යි නිසජිය යුතු.

3. තමා විසින් අඩාළ කරණ ලද්ද තෙමේ නිමවා ද, නිසගිපචිති වේ. තමා විසින් අඩාළ කරණ ලද්ද අනුන් ලවා නිමවා ද, නිසගිපචිති වේ. අනුන් විසින් අඩාළ කරණ ලද්ද තෙමේ නිමවා ද නිසගිපචිති වේ. අනෙකකු පිණිස කෙරේ ද කරවා ද දුකුළාඇවැත් වේ. අනෙකකු විසින් කරණ ලද්දක් ලැබ පරිභෝග කෙරේ ද, දුකුළාඇවැත් වන්නේ ය.

4. වියතක් හෝ බුමුතුරුණක් හෝ වටතිරයක් හෝ බිත්සක් හෝ කත්වසිතක් හෝ කෙරේ ද ඇවැත් නො වේ. උමතුවාට ද ආදිකම්මිකයාට ද ඇවැත් නොවේ.

**ශුද්ධකාලකශික්ෂාපදය නිමි.**

---

# 5. 2. 3.

## දෙවභාගශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් නම් අනේපිඬුසිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එසමයෙහි ඡවග මහණහු "භාග්‍යවතුන්වහන්සේ විසින් හුදු කළු එළලොම්මුවා ඇතිරි කරවීම පිළිකෙව්හ"යි තුඹූ මදක් ම සුදු එළලොම් දවලුයෙහි යොදා පෙර සේ ම හුදු කළු එළලොම්මුවා ඇතිරි කරවත්. යම් අපිස් මහණහු වෙද්ද ඔහු "කෙසේ නම් ඡවග මහණහු මදක් සුදු එළලොම් දවලුයෙහි යොදා පෙර සේ ම හුදු කළු එළලොම්මුවා ඇතිරි කරවත් දැ?" යි අවමන් කරත්, අසුණු කියත්, නුගුණ පතුරුවත්. ඉක්බිති ඒ මහණහු භාග්‍ය-වතුන්වහන්සේට එ පවත් සැල කළහ. "සැබෑ දැ? මහණෙනි, තෙපි සුදු එළලොම් මදක් ම දවලුයෙහි යොදා පළමු සේ ම හුදු කළු එළලොම්මුවා ඇතිරි කරවවු දැ?" යි භාග්‍යවතුන්වහන්සේ අසා වදාළ සේක. "සැබෑව, භාග්‍යවතුන්වහන්ස"යි ඔහු කීහ. භාග්‍යවත් බුදුරජාතන්වහන්සේ ගැරහූ සේක: "හිස් පුරුෂයෙනි, තෙපි කෙසේ නම් සුදු එළලොම් මදක් දවලුයෙහි යොදා පළමු සේ ම හුදු කළු එළලොම්මුවා ඇතිරියක් කරවවු දැ? හිස් පුරුෂයෙනි, මෙය නොපහන්වූවන්ගේ පැහැදීම පිණිස ද .... නො වෙයි ... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවූ:

**"නවං පන භික්ඛුනා සන්ථතං කාරයමානෙන ද්වෙ භාගා සුද්ධකාළකානං එළකලොමානං ආදාතබ්බා, තතියං ඔදාතානං, චතුත්ථං ගොචරියානං. අනාදා චෙ භික්ඛු ද්වෙ භාගෙ සුද්ධකාළකානං එළකලොමානං තතියං ඔදාතානං, චතුත්ථං ගොචරියානං, නවං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"**න්ති.

2. **නවං** නාම: කරණං උපාදාය වුච්චති.

**සන්ථතං** නාම: සන්ථරිත්වා කතං හොති අවායිමං.

**කාරයමානෙනාති** කරොන්තො වා කාරාපෙන්තො වා.

**ද්වෙ භාගා සුද්ධකාළකානං එළකලොමානං ආදාතබ්බාති** ධාරයිත්වා ද්වෙ තුලා ආදාතබ්බා.

**තතියං ඔදාතානන්ති** තුලං ඔදාතානං.

**චතුත්ථං ගොචරියානන්ති** තුලං ගොචරියානං.

**අනාදා චෙ භික්ඛු ද්වෙ භාගෙ සුද්ධකාළකානං එළකලොමානං තතියං ඔදාතානං චතුත්ථං ගොචරියානන්ති** අනාදියිත්වා ද්වෙ තුලා සුද්ධකාළකානං එළකලොමානං, තුලං ඔදාතානං, තුලං ගොචරියානං නවං සන්ථතං කරොති වා කාරාපෙති වා, පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදම්මෙ භන්තෙ නවං සන්ථතං අනාදියිත්වා [ද්වෙ තුලා සුද්ධකාළකානං එළකලොමානං,] තුලං ඔදාතානං, තුලං ගොචරියානං කාරාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

3. අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. **අඤ්ඤස්සත්ථාය** කරොති වා කාරාපෙති වා, ආපත්ති දුක්කටස්ස.

4. අනාපත්ති තුලං ඔදාතානං තුලං ගොචරියානං ආදියිත්වා කරොති, බහුතරං ඔදාතානං බහුතරං ගොචරියානං ආදියිත්වා කරොති, සුද්ධං ඔදාතානං සුද්ධං ගොචරියානං ආදියිත්වා කරොති, විතානං වා භුම්මත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිබ්බොහනං වා කරොති. උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**ද්වෙභාගසික්ඛාපදං නිට්ඨිතං.**

---

] - ] සී. මු. නත්ථි.

**"අලුත් ඇතිරියක් කරවන මහණහු විසින් හුදු කළු එළලොම් දෙකොටසක් ගත යුතු. තෙවෙනි කොටස සුදුපැහැ එළලොම් ද සිවුවන කොටස කිඹුල් වන් එළලොම් ද ගත යුතු. ඉදින් මහණ තෙම දෙකොටසක් හුදු කළුපැහැ එළලොම් ද තෙවෙනි කොටස සුදු පැහැ එළලොම් ද සිවුවන කොටස කිඹුල්වන් එළලොම් ද නොගෙණ අලුත් ඇතිරියක් කරවා නම් නිසග්ගිපචිත්ති වේ."**

2. නවං යනු: කිරීම් වශයෙන් අලුත් බව ඇරුබැ කියනු ලැබේ.

**සන්ථතං** යනු: අතුරා කරණ ලද්දෙක් වෙයි, නොවියන ලද්දෙක් වෙයි.

**කාරයමානෙන** යනු: කරණ හෝ කරවන හෝ.

**ද්වෙ භාගා සුද්ධකාළකානං එළකලොමානං ආදාතබ්බා** යනු: මැන තුලා දෙකක් ගත යුතු.

**තතියං ඔදාතානං** යනු: සුදුපැහැ එළලොම් තුලාවක්.

**චතුත්ථං ගොචරියානං** යනු: කිඹුල්වන් එළලොම් තුලාවක්.

**අනාදා චෙ භික්ඛු ද්වෙ භාගෙ සුද්ධකාළකානං එළකලොමානං තතියං ඔදාතානං චතුත්ථං ගොචරියානං** යනු: හුදු කළුපැහැ එළලොම් තුලා දෙකක් ද සුදුපැහැ එළලොම් තුලාවක් ද කිඹුල්පැහැ එළලොම් තුලාවක් ද නො ගෙණ අලුත් ඇතිරියක් කෙරේ නම් හෝ කරවා නම් හෝ පියොවෙහි දුකුළා වේ. ලබා ගැණිමෙන් නිසගි වේ. සඟහට හෝ ගණයාට හෝ පුගුලාට හෝ නිසජිය යුතු. මහණෙනි, මෙසේ වනාහි නිසජිය යුතු: "වහන්ස, හුදු කළුවන් එළලොම් තුලා දෙකක් ද සුදුපැහැ එළලොම් තුලාවක් ද කිඹුල්වන් එළලොම් තුලාවක් ද නොගෙණ මා විසින් කරවන ලද මේ අලුත් ඇතිරිය නිසගි වේ, මෙය මම සඟහට නිසජම් ... දෙන්නේ ය ... දෙන්නාහු ය ... ආයුෂ්මත්හට දෙමි" යි මෙසේ නිසජිය යුතු,

3. තමා විසින් අඩාල කරණ ලද්ද තෙමේ නිමවා නම් නිසගිපචිති වෙයි. තමා විසින් අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් නිසගිපචිති වෙයි. මෙරමා විසින් අඩාල කරණ ලද්ද තෙමේ නිමවා නම් නිසගිපචිති වෙයි. මෙරමා විසින් අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් නිසගිපචිති වේ. අනෙකකු සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුලාඇවැත් වෙයි. අනෙකකු විසින් කරණ ලද්ද ලැබ පරිභොග කෙරේ නම් දුකුලාඇවැත් වේ.

4. සුදු එළලොම් සම ව කිඹුල්වන් එළලොම් සම ව ගෙණ කෙරේ නම්, සුදු එළලොම් බහුතර ව කිඹුල් වන් එළලොම් බහුතර ව ගෙණ කෙරේ නම්, නො මුසු සුදු එළලොම් නො මුසු කිඹුල්වන් එළලොම් ගෙණ කෙරේ නම්, වියනක් හෝ බුමුතුරුණක් හෝ සෙණිපටුරක් හෝ බිස්සක් හෝ බිම්බොහනයක් හෝ කෙරේ නම් ඇවැත් නැති. උම්මත්තකයහට ආදි-කම්මිකයහට ඇවැත් නැති යි.

**ද්වෙභාග ශික්ෂාපදය නිමි.**

# 5. 2. 4.

## ඡබ්බස්සසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ අනුවස්සං සන්ථතං කාරාපෙන්ති, තෙ යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරන්ති: "එළකලොමානි දෙථ එළකලොමෙහි අත්ථො"ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා අනුවස්සං සන්ථතං කාරාපෙස්සන්ති, යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරිස්සන්ති: එළකලොමානි දෙථ එළක-ලොමෙහි අත්ථො"ති. අම්හාකං පන සකිං කතානි සන්ථතානි පඤ්චපි ඡපි වස්සානි හොන්ති, යෙසං නො දාරකා ඌහදන්තිපි උම්මිහන්තිපි උන්දූරෙහිපි ඛජ්ජන්ති. ඉමෙ පන සමණා සක්‍යපුත්තියා අනුවස්සං සන්ථතං කාරාපෙන්ති, යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරන්ති: "එළකලොමානි දෙථ එළකලොමෙහි අත්ථො"ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ අනුවස්සං සන්ථතං කාරාපෙස්සන්ති. යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරිස්සන්ති: "එළකලොමානි දෙථ එළක-ලොමෙහි අත්ථො"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අනුවස්සං සන්ථතං කාරාපෙන්ති. යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරන්ති: "එළකලොමානි දෙථ එළකලොමෙහි අත්ථො"ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා. "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා අනුවස්සං සන්ථතං කාරාපෙස්සන්ති. යාචනබහුලා විඤ්ඤත්තිබහුලා විහරිස්සන්ති: "එළකලොමානි දෙථ එළකලොමෙහි අත්ථො"ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං. ඔරෙන චෙ ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ්ජෙත්වා වා අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"**න්ති.

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති.]

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කොසම්බියං ගිලානො හොති. ඤාතකා තස්ස භික්ඛුනො සන්තිකෙ දූතං පාහෙසුං: "ආගච්ඡතු භදන්තො, මයං උපට්ඨහිස්සාමා"ති. භික්ඛූපි එවමාහංසු: "ගච්ඡාවුසො, ඤාතකා තං උපට්ඨහිස්සන්තී"ති. සො එවමාහ: "භගවතා ආවුසො සික්ඛා-පදං පඤ්ඤත්තං: "නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බ"න්ති. "අහඤ්චම්හි ගිලානො න සක්කොමි සන්ථතං ආදාය පක්කමිතුං, මය්හඤ්ච විනා සන්ථතා න ඵාසු හොති, නාහං ගමිස්සාමී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං.

## 5. 2. 4.

## ජබ්බස්සසික්ඛාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඩු සිටුහු ගේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙති. තවද එසමයෙහි භික්ෂූහු වසක් පාසා ඇතිරි කරවති. ඔහු 'එළලොම් දෙව එළලොමින් අර්‍ථ ඇතැ'යි යැදීම් බහුල ව විතැවීම් බහුල ව වෙසෙති. මිනිස්හු අවඥ කෙරෙති නුගුණ කියති දෙස් පහළ කෙරෙත්: "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ වසක් පාසා ඇතිරි කරවත් ද, 'එළලොම් දෙව එළලොමින් අර්‍ථ ඇතැ'යි යැදීම් බහුල ව විතැවීම් බහුල ව වෙසෙත් ද, අපගේ වැලිත් වරක් කරණ ලද ඇතිරි පස්වසකුදු සවසකුදු පවතිත්. එහි අපගේ දරුවෝ මලමූ ද කෙරෙති (ඔහු) මීයත් විසිනුදු කනු ලැබෙත්. එතෙකුදුවත් මේ ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ වසක් පාසා ඇතිරි කරවති. 'එළලොම් දෙව එළලොමින් ප්‍රයොජන ඇතැ'යි යැදීම් බහුල ව විතැවීම් බහුලව වෙසෙති''යි.

2. භික්ෂූහු අවඥ කරණ නුගුණ කියන දෙස් පහළ කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡයෝ නම් ඔහු අවඥ කෙරෙති නුගුණ කියති දෙස් පහළ කෙරෙත්: "කෙසේ නම් භික්ෂූහු වසක් පාසා ඇතිරි කරවත් ද 'එළලොම් දෙව එළලොමින් ප්‍රයෝජන ඇතැ'යි යැදීම් බහුල ව විතැවීම් බහුල ව වෙසෙත් ද"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. "සැබෑද මහණෙනි, භික්ෂූහු වසක් පාසා ඇතිරි කරවත් ද "එළලොම් දෙව එළලොමින් ප්‍රයොජන ඇතැ"යි යැදීම් බහුල ව විතැවීම් බහුල ව වෙසෙත් ද"යි. සැබව 'භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු 'කෙසේ නම් මහණෙනි, ඒ තුච්ඡපුරුෂයෝ වසක් පාසා ඇතිරි කරවත් ද 'එළලොම් දෙව එළලොමින් ප්‍රයොජන ඇතැ'යි යැදීම් බහුල ව විතැවීම් බහුල ව වාසය කෙරෙත් ද"යි වෙසෙසින් ගර්‍හා කළහ. මහණෙනි, නෙල නො පහන් වූවන්ගේ පැහැදීමට නො වැවෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:"

**"මහණහු විසින් නව ඇතිරිය කරවා සවසක් බැරිය යුතු ය. ඉදින් සවසකින් මෙපිට ඒ ඇතිරිය විසජා හෝ නො විසජා හෝ අනික් නවඇතිරියක් කරවා නම් නිසග්ගිපචිති වේ" යයි.**

භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මෙසේත් මේ ශික්ෂාපදය පණවන ලද වේ.

[මුල් පැණවීමයි]

3. තවද එසමයෙහි කොසඹෑනුවර එක්තරා මහණෙක් ගිලන් වූයේ වෙයි. නෑයෝ 'වහන්සේ පැමිණෙත්වා අපි උපස්ථාන කරම්හ'යි ඒ මහණහු වෙත දූතයකු යැවූහ. භික්ෂූහු ද 'යා ඇවැත, නෑයෝ තොපට උවැටන් කරන්නාහ'යි මෙසේ කීහ. හේ මෙසේ කී ය: "ඇවැත්නි, භාග්‍යවතුන් විසින් සිකපද පණවන ලද. 'මහණහු නවඇතිරියක් කරවා සවසක් බැරියයුතු' යයි. මම් වූ කලි ගිලන් වෙමි. ඇතිරිය ගෙණ නික්ම යන්නට නො හැක්කෙමි. මට ද ඇතිරිය නැති ව සුවයෙක් නො වෙයි. මම් නො යෙමි"යි. භාග්‍යවතුන් වහන්සේට එපවත් දැන්වූහ.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස භික්ඛුනො සන්ථතසම්මුතිං දාතුං. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා: තෙන ගිලානෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ ගිලානො න සක්කොමි සන්ථතං ආදාය පක්කමිතුං, සොහං භන්තෙ සඞ්ඝං සන්ථතසම්මුතිං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බා, තතියම්පි යාචිතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු ගිලානො න සක්කොති සන්ථතං ආදාය පක්කමිතුං, සො සඞ්ඝං සන්ථතසම්මුතිං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සන්ථතසම්මුතිං දදෙය්‍ය. එසා ඤත්ති."

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු ගිලානො න සක්කොති සන්ථතං ආදාය පක්කමිතුං, සො සඞ්ඝං සන්ථතසම්මුතිං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සන්ථතසම්මුතිං දෙති, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සන්ථතසම්මුතියා දානං, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො සන්ථතසම්මුති. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

5. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"**නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං, ඔරෙන චෙ ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ්ජෙත්වා වා අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තිය**"න්ති.

[**දුතියපඤ්ඤත්ති.**]

6. **නවං** නාම: කරණං උපාදාය වුච්චති.

**සන්ථතං** නාම: සන්ථරිත්වා කතං හොති අවායිමං.

**කාරාපෙත්වා**ති කරිත්වා වා කාරාපෙත්වා වා.

**ඡබ්බස්සානි ධාරෙතබ්බ**න්ති ඡබ්බස්සපරමතා ධාරෙතබ්බං.

**ඔරෙන චෙ ඡන්නං වස්සාන**න්ති ඌනකඡබ්බස්සානි.

**තං සන්ථතං විස්සජ්ජෙත්වා**ති අඤ්ඤෙසං දත්වා.

**අවිස්සජ්ජෙත්වා**ති න කස්සචි දත්වා.

**අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා**ති ඨපෙත්වා භික්ඛුසම්මුතිං.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කථා වදාරා භික්ෂූන් ඇමතූ සේක: 'මහණෙනි ගිලන් මහණහට සන්ථතසම්මුතිය දෙන්නට අනුදනිමි. මහණෙනි, මෙසේත් දියයුතු ය. ඒ ගිලන් මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට පෙරව මහලු භික්ෂූන් පා වැඳ උළුක්කුටිකයෙන් හිඳ මෙසේ කියයුතු වන්නේ ය. 'වහන්ස, මම ගිලන් වෙමි. සන්ථතය ගෙණ යන්නට නො හැක්කෙමි. වහන්ස, මම සඞ්ඝයාගෙන් සන්ථතසම්මුතිය අයදිමි. දෙවනවට ද යැදියයුතු තෙවනවට ද යැදියයුතු. ප්‍රතිබල වූ ව්‍යක්ත මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙමේ ගිලන් වෙයි. සන්ථතය ගෙණ යන්නට නො හැකි වෙයි. හේ සඞ්ඝයාගෙන් සන්ථතසම්මුතිය යදියි. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත් නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහට සන්ථතසම්මුතිය දෙන්නේ ය. මේ 'ඤත්ති' යයි.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණ තෙමේ ගිලන් වූයේ සන්ථතය ගෙණ යන්නට නො හැකි වෙයි. හේ සඞ්ඝයාගෙන් 'සන්ථතසම්මුතිය' යදියි. සඞ්ඝ තෙමේ මෙනම් මහණහට 'සන්ථතසම්මුතිය' දෙයි. මෙනම් මහණහට සන්ථතසම්මුතිය දීම යම් ආයුෂ්මතක්හට රිසි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රිසි වේ නම් හේ බණන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණහට 'සන්ථතසම්මුතිය' දෙන ලද, සඞ්ඝයාට රිසි වෙයි. එහෙයින් මේ තුෂ්ණීම්භාවය යි. මේ මෙසේ ධරමි"යි.

5. තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"මහණක්හු විසින් අලුත් ඇතිරියක් කරවා සවසක් ධැරිය යුතු ය. ඉදින් මහණහු විසින් සාවුරුද්දකින් මෙපිට ඒ ඇතිරිය විසජා හෝ නො විසජා හෝ භික්ෂුසම්මති නැති ව අනිත් අලුත් ඇතිරියක් කරවා නම් නිස්සග්ගිපචිත්ති වේ" යයි.**

[දෙවන පැණවීමයි.]

6. **නව නම්:** කිරීම උදෙසා කියනු ලැබෙයි.

**සන්ථත නම්:** නො වියූ අතුරා කරණ ලද්දෙක් වෙයි.

**කාරාපෙත්වා යනු:** කොට හෝ කරවා හෝ.

**ඡබ්බස්සානි ධාරෙතබ්බං යනු:** සාවුරුද්දක් පරම කොට ධැරියයුතු ය.

**ඔරෙන චෙ ඡන්නං වස්සානං යනු:** උනු සාවුරුද්දක්.

**තං සන්ථතං විස්සජ්ජෙත්වා යනු:** අනුනට දී.

**අවිස්සජ්ජෙත්වා යනු:** කිසිවක්හට නො දී.

**අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා යනු:** භික්ෂුසම්මති තබා.

7. අඤ්ඤං නවං සන්ථතං කරොති වා කාරාපෙති වා, පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ සන්ථතං ඌනකඡබ්බස්සානි කාරාපිතං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජාමීති.[1] -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

8. අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති. නිස්සග්ගියං පාචිත්තියං

9. අනාපත්ති ඡබ්බස්සානි කරොති, අතිරෙකඡබ්බස්සානි කරොති, අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා, අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති, විතානං වා භුම්මත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, භික්ඛුසම්මුතියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**ඡබ්බස්සසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 2. 5.

## නිසීදනසන්ථත සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "ඉච්ඡාමහං භික්ඛවෙ තෙමාසං පටිසල්ලීයිතුං, නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනා"ති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නාස්සුධ කොචි භගවන්තං උපසඞ්කමති, අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන. තෙන ඛො පන සමයෙන සාවත්ථියා සඞ්ඝෙන කතිකා කතා හොති. "ඉච්ඡතාවුසො භගවා තෙමාසං පටිසල්ලීයිතුං, න භගවා කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන. යො භගවන්තං උපසඞ්කමති, සො පාචිත්තියං දෙසාපෙතබ්බො"ති.

2. අථ ඛො ආයස්මා උපසෙනො වඞ්ගන්තපුත්තො සපරිසො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං උපසෙනං වඞ්ගන්තපුත්තං භගවා එතදවොච: "කච්චි වො උපසෙන ඛමනීයං, කච්චි යාපනීයං, කච්චිත්ථ අප්පකිලමථෙන අද්ධානං ආගතා"ති. "ඛමනීයං භගවා, යාපනීයං භගවා, අප්පකිලමථෙන ච මයං භන්තෙ අද්ධානං ආගතා"ති.

---

1. නිස්සජ්ජාමි මජසං.

7. අනිත් තව ඇතිරියක් කෙරේ නම් හෝ කරවා නම් හෝ ප්‍රයොග-යෙහි දුකුළා වෙයි. ලැබීමෙන් නිසගි වෙයි. සඟනට හෝ ගණයාට හෝ පුගුලක්හට හෝ නිසැජිය යුතු ය. මහණෙනි, මෙසේත් නිසැජිය යුතු: "වහන්ස, මේ මාගේ ඇතිරිය භික්‍ෂුසම්මති නැති ව උනු සාවුරුද්දක් ඇති ව කරවන ලද්දේ නිසගි විය. මම් මෙය සඟනට නිසජම්'යි. ... දෙන්නේ යයි ... දෙන්නාහු යයි ... ආයුෂ්මත්හට දෙමි" යි.

8. තමා විසින් අඩාල කරණ ලද්ද තෙමේ නිමවා නම් නිසගිපචිති වෙයි. තමා විසින් අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් නිසගිපචිති වෙයි. මෙරමා විසින් අඩාල කරණ ලද්ද තෙමේ නිමවා නම් නිසගිපචිති වෙයි. මෙරමා විසින් අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් නිසගි-පචිති වේ.

9. සාවුරුද්දක් පිරුණු කල්හි කරවා නම්, අසිරු සාවුරුද්දක් පිරුණු කල්හි කරවා නම්, අනෙකක්හු විසින් කරණ ලද්දක් ලැබ පරිභොග කෙරේ නම්, වියනක් හෝ බුමුතුරුණක් හෝ සෙණීපවුරක් හෝ බිස්සක් හෝ බිමෙබාහනයක් හෝ කරවා නම්, භික්‍ෂුසම්මති ඇති කල්හි, උම්මත්තකයාහට, ආදිකම්මිකයහට ඇවැත් නැත්තේ යි.

ජබ්බස්සශික්‍ෂාපදය නිමි.

---

## 5. 2. 5.

## නිසීදනසන්ථත ශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර සම්ප-යෙහි වූ අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක. එකල්හි භාග්‍යවත්හු භික්‍ෂූන් ඇමැතූහ: 'මහණෙනි, මම් තුන්මසක් විවිකත ව වසන්නට කැමැත්තෙමි. පිණ්ඩපාත එළවන එක් මහණක්හු හැර කිසිවකු විසින් නො එළඹිය යුත්තෙම් වෙමි. 'එසේ ය වහන්සැ'යි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී පිණ්ඩපාත එළවන එක් මහණකු හැර කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ කරා නො එළඹෙයි. යළි එසමයෙහි සැවැත්-නුවර සඞ්ඝයා විසින් කතිකාවක් කරණ ලද වෙයි: 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ තුන්මසක් මුළුල්ලෙහි විවිකත ව වාසය කරන්නට කැමති වන සේක. පිණ්ඩපාත එළවන එක් මහණකු විනා කිසිවක්හු විසින් භාග්‍යවතුන් වහන්සේ නො එළඹිය යුත්තාහ. යමෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹේ නම් හෙතෙම පචිතිඇවැත් දෙසැවිය යුත්තේ'යයි.

2. එකල්හි වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂ්මත් උපසෙන තෙමේ පිරිස් සහිත වූයේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස්ව හුන්නාවූ වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂ්මත් උපසෙනහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ: 'කිම උපසෙනය, තොපට ඉවසිය හැකි ද, කිම යැපිය හැකි ද, කිම නො වෙහෙසින් දිගුමඟැ ආවහු දැ'යි. ඉවැසිය හැක්ක භාග්‍යවතුන් වහන්ස, යැපිය හැක්ක භාග්‍යවතුන් වහන්ස, වහන්ස අපි නො වෙහෙසින් දිගුමඟැ ආම්හ'යි.

3. තෙන ඛො පන සමයෙන ආයස්මතො උපසෙනස්ස වඞ්ගන්තපුත්තස්ස සද්ධිවිහාරිකො භික්ඛු භගවතො අවිදූරෙ නිසින්නො හොති. අථ ඛො භගවා තං භික්ඛුං එතදවොච: "මනාපානි තෙ භික්ඛු පංසුකූලානී"ති. "න ඛො මෙ භන්තෙ මනාපානි පංසුකූලානී"ති. "කිස්ස පන ත්වං භික්ඛු පංසුකූලිකො"ති. "උපජ්ඣායො මෙ භන්තෙ පංසුකූලිකො, එවං අහම්පි පංසුකූලිකො"ති. අථ ඛො භගවා ආයස්මන්තං උපසෙනං වඞ්ගන්තපුත්තං එතදවොච: "පාසාදිකා ඛො ත්‍යායං උපසෙන පරිසා, "කථං ත්වං උපසෙන පරිසං විනෙසී"ති. යො මං භන්තෙ උපසම්පදං යාචති, තාහං[1] එවං වදාමි: "අහං ඛො ආවුසො ආරඤ්ඤිකො පිණ්ඩපාතිකො පංසුකූලිකො, සචෙ ත්වම්පි ආරඤ්ඤිකො භවිස්සසි පිණ්ඩපාතිකො පංසුකූලිකො, එවාහං තං උපසම්පාදෙස්සාමී"ති. සචෙ මෙ පටිස්සුණාති, උපසම්පාදෙමි. නො චෙ මෙ පටිස්සුණාති, න උපසම්පාදෙමි. යො මං නිස්සයං යාචති, තාහං එවං වදාමි: "අහං ඛො ආවුසො ආරඤ්ඤිකො පිණ්ඩපාතිකො පංසුකූලිකො, සචෙ ත්වම්පි ආරඤ්ඤිකො භවිස්සසි පිණ්ඩපාතිකො පංසුකූලිකො, එවාහං තෙ නිස්සයං දස්සාමීති. සචෙ මෙ පටිස්සුණාති, නිස්සයං දෙමි. නො චෙ මෙ පටිස්සුණාති, න නිස්සයං දෙමි. එවං ඛො අහං භන්තෙ පරිසං විනෙමී"ති. "සාධු සාධු උපසෙන, සාධු ඛො ත්වං උපසෙන පරිසං විනෙසි. ජානාසි පන ත්වං උපසෙන සාවත්ථියා සඞ්ඝස්ස කතික"න්ති. "න ඛො අහං භන්තෙ ජානාමි සාවත්ථියා සඞ්ඝස්ස කතික"න්ති. සාවත්ථියා ඛො උපසෙන සඞ්ඝෙන කතිකා කතා: "ඉච්ඡතාවුසො භගවා තෙමාසං පටිසල්ලීයිතුං, න භගවා කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන. යො භගවන්තං උපසඞ්කමති, සො පාචිත්තියං දෙසාපෙතබ්බො"ති. "පඤ්ඤායිස්සති භන්තෙ සාවත්ථියා සඞ්ඝො සකාය කතිකාය "න මයං අප්පඤ්ඤත්තං පඤ්ඤාපෙස්සාම, පඤ්ඤත්තං වා න සමුච්ඡින්දිස්සාම, යථා පඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තිස්සාමා"ති. "සාධු සාධු උපසෙන, අප්පඤ්ඤත්තං න පඤ්ඤාපෙතබ්බං, පඤ්ඤත්තං වා න සමුච්ඡින්දිතබ්බං, යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තිතබ්බං". "අනුජානාමි උපසෙන යෙ තෙ භික්ඛූ ආරඤ්ඤිකා පිණ්ඩපාතිකා පංසුකූලිකා යථාසුඛං මං දස්සනාය උපසඞ්කමන්තූ"ති.

4. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ බහිද්වාරකොට්ඨකෙ ඨිතා හොන්ති: "මයං ආයස්මන්තං උපසෙනං වඞ්ගන්තපුත්තං පාචිත්තියං දෙසාපෙස්සාමා"ති. අථ ඛො ආයස්මා උපසෙනො වඞ්ගන්තපුත්තො සපරිසො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො තෙ භික්ඛූ ආයස්මන්තං උපසෙනං වඞ්ගන්තපුත්තං එතදවොචුං "ජානාසි පන ත්වං ආවුසො උපසෙන සාවත්ථියා සඞ්ඝස්ස කතික"න්ති. භගවාපි මං ආවුසො එවමාහ: "ජානාසි පන[2] ත්වං උපසෙන සාවත්ථියා සඞ්ඝස්ස කතික"න්ති. "න ඛො අහං භන්තෙ ජානාමි සාවත්ථියා සඞ්ඝස්ස කතික"න්ති. සාවත්ථියා ඛො උපසෙන සඞ්ඝෙන කතිකා කතා: "ඉච්ඡතාවුසො භගවා තෙමාසං පටිසල්ලීයිතුං න භගවා කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපා-තනීහාරකෙන. යො භගවන්තං උපසඞ්කමති, සො පාචිත්තියං දෙසාපෙ-තබ්බො"ති. "පඤ්ඤායිස්සති භන්තෙ සාවත්ථියා සඞ්ඝො සකාය කතිකාය, "න මයං අප්පඤ්ඤත්තං පඤ්ඤාපෙස්සාම, පඤ්ඤත්තං වා න සමුච්ඡින්දිස්සාම, යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තිස්සාමා"ති. අනුඤ්ඤාතාවුසො භගවතා යෙ තෙ භික්ඛූ ආරඤ්ඤිකා පිණ්ඩපාතිකා පංසුකූලිකා යථාසුඛං මං දස්සනාය උපසඞ්කමන්තූ"ති.

---

1 තමහං ම.ජ.සං. 2. ම.ජ.සං. නත්ථි

3. තවද එසමයෙහි වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂ්මත් උපසේනයන්ගේ සද්ධිවිහාරික මහණෙක් භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි හුන්නේ වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහට මෙය වදාළහ: 'මහණ, තට පසුල්සිවුරු මනාප දැ'යි. 'වහන්ස, මට පසුල්සිවුරු මනාප නො වෙති'යි. 'කවර හෙයින් මහණ, තෝ පංශුකූලිකයෙහි දැ'යි. 'වහන්ස, මාගේ උපාධ්‍යායයෝ පාංශුකූලිකයහ. එසෙයින් මම ද පාංශුකූලිකයෙමි'යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂ්මත් උපසෙනහට මෙය වදාළහ: 'උපසෙනය, තාගේ මේ පිරිස ප්‍රසාදික ය, උපසෙනය, කිසෙයින් තෝ පිරිස හික්මවූයෙහි දැ'යි. "වහන්ස, යමෙක් මා උපසම්පදාව ඉල්වා නම්, ඔහුට මම මෙසේ කියමි: ඇවැත්නි, මම් ආරණ්‍යකයෙමි, පිණ්ඩපාතිකයෙමි, පාංශුකූලිකයෙමි, ඉදින් තො ද ආරණ්‍යක පිණ්ඩපාතික පාංශුකූලික වන්නෙහි නම් මෙසේ මම් තා උපසපන් කරන්නෙමි'යි ඉදින් මට පිළිත කෙරේ නම් උපසපන් කරමි. ඉදින් මට පිළිත නො කෙරේ නම් උපසපන් නො කෙරෙමි. යමෙක් මා නිස ඉල්වා නම් ඔහුට මම් මෙසේ කියමි. 'ඇවැත්නි, මම් ආරණ්‍යකයෙමි පිණ්ඩපාතිකයෙමි පාංශුකූලිකයෙමි, ඉදින් තො ද ආරණ්‍යක පිණ්ඩපාතික පාංශුකූලික වන්නෙහි නම් මෙසේ මම් තට නිස දෙන්නෙමි'යි. ඉදින් මට පිළිත කෙරේ නම් නිස දෙමි, ඉදින් මට පිළිත නො කෙරේ නම් නිස නො දෙමි. වහන්ස, මෙසේ මම් පිරිස හික්මවමි"යි. "මැනැව මැනැව උපසෙනය, උපසෙනය, තෝ මැනැවින් පිරිස හික්මවූයෙහි. තවද 'උපසෙනය' තෝ සැවැත්නුවර සඞ්ඝයාගේ කතිකාව දනී දැ'යි. වහන්ස, මම් සැවැත්නුවර සඞ්ඝයාගේ කතිකාව නො දනිමි'යි. "උපසෙනය, සැවැත්නුවර සඞ්ඝයා විසින් 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ තෙමසක් විවිකත ව වසන්නට රිසි වෙති. පිණ්ඩපාත එළවන එක් මහණක්හු තබා කිසිවකු විසින් භාග්‍යවතුන් වහන්සේ නො එළඹිය යුත්තාහ. යමෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹේ නම් හේ පචිතිඇවැත් දෙසැවිය යුත්තේ'යයි කතිකාවක් කරණ ලද ය. 'වහන්ස, සැවැත්නුවර සඞ්ඝ තෙම සිය කතිකායෙන් පැනෙන්නේ ය. අපි නො පණවන ලද්දක් නො පණවම්හ. පණවන ලද්ද හෝ නො සිඳුම්හ. යථාප්‍රඥප්ත වූ ශික්‍ෂාපදයන්හි සමාදන් ව පවතුම්හ'යි. මැනව මැනැව උපසෙනය, නො පණවන ලද්දක් නො පැණවියයුතු ය, පණවන ලද්ද හෝ නො සිඳියයුතු ය. යථාප්‍රඥප්ත ශික්‍ෂාපදයන්හි සමාදන් ව පැවැතිය යුතු. උපසෙනය, යම් මහණ කෙනෙක් ආරණ්‍යක පිණ්ඩපාතික පාංශුකූලික වෙත් නම් ඔහු සුවසේ මා දක්නට එළඹෙත්වා'යි අනුදනිමි.

4. තවද එසමයෙහි බොහෝ භික්‍ෂූහු "අපි වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂ්මත් උපසෙනයන් ලවා පචිතිඇවැත් දෙසවම්හ'යි බිහිදොර කොටුවෙහි සිටියාහු වෙති. ඉක්බිති වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂ්මත් උපසෙනයෝ පිරිස් සහිත ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියහ. ඉක්බිති ඒ භික්‍ෂූහු වඞ්ගන්තපුත්‍ර වූ ආයුෂ්මත් උපසෙනයන්ට මෙ පවත් කීහ: 'ඇවැත්නි, උපසෙනයෙනි, තෙපි සැවැත්නුවර සඞ්ඝයාගේ කතිකාව දන්නහු දැ'යි. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ද මට මෙසේ වදාළහ: උපසෙනය, තෝ සැවැත්නුවර සඞ්ඝයාගේ කතිකාව දන්නෙහි දැ'යි 'වහන්ස, මම් සැවැත්නුවර සඞ්ඝයාගේ කතිකාව නො දනිමි'යි. "උපසෙනය, සැවැත්නුවර සඞ්ඝයා විසින් 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ තෙමසක් විවිකත ව වාසය කරන්නට රිසි වෙති. පිණ්ඩපාත එළවන එක් මහණක්හු තබා කිසිවකු විසින් භාග්‍යවතුන් වහන්සේ නො එළඹිය යුත්තාහ. යමෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹේ නම් හෙතෙම පචිතිඇවැත් දෙසැවිය යුත්තේ'යයි කතිකාවක් කරණ ලදැ'යි. "වහන්ස, සැවැත්නුවර සඞ්ඝ තෙම සිය කතිකායෙන් පැනෙන්නේ ය. 'අපි නො පණවන ලද්දක් නො පණවම්හ. පණවන ලද්ද හෝ නො සිඳුම්හ. යථාප්‍රඥප්ත ශික්‍ෂාපදයන්හි සමාදන් ව පවතුම්හ'යි. 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'යම් මහණ කෙනෙක් ආරණ්‍යක පිණ්ඩපාතික පාංශුකූලික වෙත් නම් ඔහු සුවසේ මා දක්නට එළඹෙත්වා'යි අනුදන්නා ලද" යයි.

5. අථ ඛො තෙ භික්ඛූ "සච්චං ඛො ආයස්මා උපසෙනො ආහ. න අප්පඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං, පඤ්ඤත්තං වා න සමුච්ඡින්දිතබ්බං, යථාපඤ්ඤත්තෙසු සික්ඛාපදෙසු සමාදාය වත්තිතබ්බ"න්ති. අස්සොසුං ඛො භික්ඛූ අනුඤ්ඤාතා කිර භගවතා යෙ තෙ භික්ඛූ ආරඤ්ඤිකා පිණ්ඩපාතිකා පංසුකූලිකා යථාසුඛං මං දස්සනාය උපසඞ්කමන්තූ"ති. තෙ භගවන්තං දස්සනං පිහෙන්තා[1] සන්ථතානි උජ්ඣිත්වා ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං සමාදියිංසු. අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො අද්දස සන්ථතානි තහිං තහිං උජ්ඣිතානි, පස්සිත්වා භික්ඛූ ආමන්තෙසි "කස්සිමානි භික්ඛවෙ සන්ථතානි තහිං තහිං උජ්ඣිතානී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි, "තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච සඞ්ඝසුට්ඨුතාය සඞ්ඝඵාසුතාය -පෙ- "එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"නිසීදනසන්ථතං පන භික්ඛුනා කාරයමානෙන පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය. අනාදා චෙ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"න්ති".**

6. **නිසීදනං** නාම: සදසං වුච්චති.

**සන්ථතං** නාම: සන්ථරිත්වා කතං හොති අවායිමං.

**කාරයමානෙනාති** කරොන්තො වා කාරාපෙන්තො වා.

**පුරාණසන්ථතං** නාම: සකිං නිවත්ථම්පි සකිං පාරුතම්පි.

**සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණායාති**[2] වට්ටං වා චතුරස්සං[3] වා ඡින්දිත්වා එකදෙසෙ වා සන්ථරිතබ්බං, විජටෙත්වා වා සන්ථරිතබ්බං.

**අනාදා චෙ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථින්ති** අනාදියිත්වා පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කරොති වා කාරාපෙති වා, පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ නිසීදනසන්ථතං අනාදියිත්වා පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං කාරාපිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති. -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති, ආයස්මතො දම්මී"ති.

7. අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා, ආපත්ති දුක්කටස්ස.

---

1. දස්සනාය පිහයමානා, සතා 2. පිරනාචාය, ම.ඡ සං 3 චතුරස්සරං. කණ්ඩී

5. ඉක්බිති ඒ භික්ෂූහු ආයුෂ්මත් උපසේනයෝ සැබවක් ම කියති: 'නො පණවන ලද්දක් නො පැණවියයුතු ය, පණවන ලද්ද හෝ නො සින්ද යුතු ය. යථාප්‍රඥප්ත ශික්ෂාපදයන්හි සමාදන් ව පැවැතියයුතු'යයි. භික්ෂූහු 'යම් මහණ කෙනෙක් ආරණ්‍යක පිණ්ඩපාතික පාංශුකූලික වෙත් නම් ඔහු සුවසේ මා දක්නට එළඹෙත්වායි භාග්‍යවතුන් විසින් අනුදන්නා ලද්දැ'යි ඇසූහ. ඔහු භාග්‍යවතුන් වහන්සේ දක්නට කැමැත්තාහු ඇතිරි හැරපියා ආරණ්‍යකාඞ්ගය පිණ්ඩපාතිකාඞ්ගය පාංශුකූලිකාඞ්ගය සමාදන් වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් හා සමග සේනාසනචාරිකායෙහි වඩනාහු ඒ ඒ තැන්හි හැරපියන ලද ඇතිරි දුටහ. දැක 'මහණෙනි, මේ ඒ ඒ තැන්හි හැරපියන ලද ඇතිරි කවරක්හුගේ දැ'යි භික්ෂූන් ඇමැතූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කථා වදාරා භික්ෂූන් ඇමැතූහ: "එසේ වී නම් මහණෙනි, කරුණු දශයක් නිසා භික්ෂූන්ට ශික්ෂාපද පණවන්නෙමි. සඞ්ඝසුට්ඨුතා පිණිස ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"නිසදුන් ඇතිරියක් කරණ මහණහු විසින් දුර්වර්ණකිරීමට පුරාණ සන්ථතයාගේ හාත්පසින් සුගත්වියතක් ගතයුතු ය. ඉදින් මහණ තෙම පුරාණසන්ථතයාගේ හාත්පසින් සුගත්වියතක් නො ගෙණ අලුත් නිසදුන් ඇතිරියක් කරවා නම් නිසගිපචිති වේ"** යයි.

6. **නිසීදන** නම්: දවලු සහිතයෙක් කියනු ලැබේ.

**සන්ථත** නම්: නො වියු අතුට කරණ ලද්දක් වෙයි.

**කාරයමානෙන** යනු කරන්නේ හෝ කරවන්නේ හෝ.

**පුරාණසන්ථත** නම්: වරක් හැන්ද හෝ වරක් පෙරවූවකි.

**සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය** යනු වට කොට හෝ සිවුරුත් කොට හෝ සිඳ එක්පසෙක හෝ ඇතිරිය යුතු යි. තෙලා හෝ ඇතිරිය යුතු යි.

**අනාදා චෙ භික්ඛු පුරාණ සන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං** යනු පැරණි ඇතිරියක පසකින් සුගත් වියතක් පමණ නොගෙණ අලුත් නිසදුන් ඇතිරියක් කෙරේ හෝ කරවා හෝ පියෝගී දුකුලා වෙයි. ලබා ගැනීමෙන් නිසැගි වේ. සඟනට හෝ ගණයාට හෝ පුඟුලක්හට හෝ නිසජිය යුතු යි. තවද මහණෙනි, මෙසේ නිසජිය යුතු යි. "වහන්ස, පැරණි ඇතිරියක පසකින් සුගත් වියතක් නො ගෙණ කරවන ලද මේ මගේ හිඳිනා ඇතිරිය නිසගි විය. මම මෙය සඟනට නිසජමි ... දෙන්නේ යයි ... දෙන්නාහ යි ... ආයුෂමත්හට දෙමි"යි.

7. තමා විසින් කොට අඩාල කරණ ලද්ද තෙමේ නිමවා නම් නිසගි පචිති වෙයි. තමා විසින් අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් නිසගිපචිති වෙයි. මෙරමා විසින් කොට අඩාල කරණ ලද්ද තෙමේ නිමවා නම් නිසගිපචිති වෙයි. මෙරමා විසින් අඩාල කරණ ලද්ද මෙරමා ලවා නිමවා නම් නිසගිපචිති වෙයි. අනෙකකු සඳහා කෙරෙයි හෝ කරවා හෝ දුකුලාඇවැත් වේ.

8. අනාපත්ති පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං ආදියිත්වා කරොති. අලභන්තො ථොකතරං ආදියිත්වා කරොති, අලභන්තො අනාදියිත්වා කරොති, අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති, විතානං වා භූමත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

නිසීදනසන්ථතසික්ඛාපදං නිට්ඨිතං.

---

## 5. 2. 6.

## එළකලොම සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තස්ස අන්තරා මග්ගෙ එළකලොමානි උප්පජ්ජිංසු. අථ ඛො සො භික්ඛු තානි එළකලොමානි උත්තරාසඞ්ගෙන භණ්ඩිකං බන්ධිත්වා අගමාසි. මනුස්සා තං භික්ඛුං පස්සිත්වා උප්පණ්ඩෙසුං: "කිත්තකෙන තෙ භන්තෙ කීතානි, කිත්තකො උදයො භවිස්සතී"ති. සො භික්ඛු තෙහි මනුස්සෙහි උප්පණ්ඩියමානො මඞ්කු අහොසි. අථ ඛො සො භික්ඛු සාවත්ථිං ගන්ත්වා තානි එළකලොමානි ඨිතකොව ආසුම්භි. භික්ඛූ තං භික්ඛුං එතදවොචුං: "කිස්ස පන ත්වං ආවුසො ඉමානි එළකලොමානි ඨිතකොව ආසුම්භසී"ති. "තථා හි පනාහං ආවුසො ඉමෙසං එළකලොමානං කාරණා මනුස්සෙහි උප්පණ්ඩිතො"ති. "කීව දූරතො පන ත්වං ආවුසො ඉමානි එළකලොමානි ආහරී"ති. "අතිරෙකතියොජනං ආවුසො"ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු අතිරෙකතියොජනං එළකලොමානි ආහරිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර ත්වං භික්ඛු අතිරෙකතියොජනං එළකලොමානි ආහරී"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස අතිරෙකතියොජනං එළකලොමානි ආහරිස්සසි, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"භික්ඛුනො පනෙව අද්ධානමග්ගප්පටිපන්නස්ස එළකලොමානි උප්පජ්ජෙය්‍යුං, ආකඞ්ඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බානි. පටිග්ගහෙත්වා තියොජනපරමං සහත්ථා හරිතබ්බානි[1] අසන්තෙ හාරකෙ. තතො චෙ උත්තරිං හරෙය්‍ය අසන්තෙපි හාරකෙ නිස්සග්ගියං පාචිත්තියන්ති."**

2. **භික්ඛුනො පනෙව අද්ධානමග්ගප්පටිපන්නස්සාති** පථං ගච්ඡන්තස්ස.

---

1. හාරෙතබ්බානි මූ.

8. පැරණි ඇතිරියක පසකින් සුගත්වියතක් පමණ ගෙණ කෙරේ නම්, නොලැබෙන්නේ ඉතා මඳක් ගෙණ කෙරේ නම්, නො ලැබෙන්නේ නො ගෙණ කෙරේ නම්, අනෙකක්හු විසින් කරණ ලද්ද ලැබී පරිභොග කෙරේ නම් වියනක් හෝ බුමුතුරුණක් හෝ සෙණිපවුරක් හෝ බිස්සක් හෝ බිමෙබාහනයක් හෝ කෙරේ නම්, ඔහුට ද, උමතුවූවහුට ද, ආදිකම්මිකයාට ද ඇවැත් නැති.

**නිසීදනසන්ථත ශික්ෂාපදය නිමි.**

---

## 5. 2. 6.

## එළකලොම ශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඩුසිටුහුගේ අරම්හි වැඩ වෙසෙන සේක. එසමයෙහි කොසොල් දනව්හි සිට සැවැත්නුවරට යන එක්තරා මහණෙක්හට අතරමගදී එළුලොම් උපන. ඉක්බිති ඒ මහණ තෙමේ ඒ එළුලොම් උතුරුසඟින් පොදියක් බැඳගෙණ ගියේ ය. මිනිස්සු ඒ මහණ දැක වෙළපූහ: "වහන්ස, ඔබ විසින් කොපමණකින් මිලයට ගන්නා ලද ද. කෙතෙක් ලාබ වන්නේ ද?"යි. ඒ මහණ තෙමේ ඒ මිනිසුන් විසින් වෙළපනු ලබන්නේ මකු වූයේ ය. ඉක්බිති ඒ මහණ සැවැත්නුවරට ගොස් ඒ එළුලොම් සිටි වන ම බිම හෙළී ය. භික්ෂූහු ඒ මහණහට මෙසේ කීහ: "ඇවත, තෝ කුමක් හෙයින් මේ එළුලොම් සිටි වන ම බිම හෙළුයෙහි ද?"යි. "ඇවැත්නි, මම මේ එළුලොම් නිසා මිනිසුන් විසින් වෙළපන ලද්දෙමි. එහෙයිනි"යි. "ඇවැත්නි තෝ කොතෙක් දුර සිට මේ එළුලොම් ගෙණ ආයෙහි ද?"යි. "ඇවැත්නි, අසිරු තුන් යොදුනකි"යි. යම් අපිස් වූ මහණ කෙනෙක් වෙත් ද, ඔහු අවමන් කෙරෙති, අයුණු කියත්, දෙස් පහළ කෙරෙත්: "කෙසේ නම් මහණෙක් අසිරු තුන් යොදුනක් එළුලොම් ගෙණ අයි දැ"යි. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. "සැබෑ ද මහණ? තෝ අසිරු තුන් යොදුනක් එළුලොම් ගෙණ අයි දැ"යි. "සැබව, භාග්‍යවතුන් වහන්ස"යි. භාග්‍යවත් බුදුහු ගැරැහූහ. "තුච්ඡපුරුෂය, තෝ කෙසේ නම් අසිරු තුන් යොදුනක් එළුලොම් ගෙණ අයි ද? තුච්ඡපුරුෂය, "නෙල නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. ... "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"අදන්මඟට පිළිපන් මහණකුහට එළුලොම් උපනේ නම් කැමැති මහණහු විසින් පිළිගත යුතු සි. පිළිගෙණ ගෙණ යන්නකු නැතිකල්හි තුන් යොදුනක් පරම කොට සියතින් ගෙණ යා යුතු සි. ඉදින් ගෙණ යන්නකු නැති කල්හිදු ඉන් මත්තෙහි ගෙණ යන්නේ නම් නිසැගිපචිති වේ."**

2. **භික්ඛුනො පනෙව අද්ධානමග්ගපටිපන්නස්ස** යනු: මග යන්නහුට.

**එළකලොමානි උප්පජ්ජෙය්‍යුන්ති** උප්පජ්ජෙය්‍යුං සඞ්ඝතො වා ගණතො වා ඤාතිතො වා මිත්තතො වා පංසුකූලං වා අත්තනො වා ධනෙන.

**ආකඞ්ඛමානෙනාති** ඉච්ඡමානෙන

**පටිග්ගහෙතබ්බානි, පටිග්ගහෙත්වා තියොජනපරමං සහත්ථා හරිතබ්බානීති,** තියොජනපරමතා සහත්ථා හරිතබ්බානි.

**අසන්තෙ හාරකෙති** නාඤ්ඤො කොචි හාරකො හොති ඉත්ථී වා පුරිසො වා ගහට්ඨො වා පබ්බජිතො වා.

**තතො චෙ උත්තරිං හරෙය්‍ය අසන්තෙපි හාරකෙති** පඨමං පාදං තියොජනං අතික්කාමෙති, ආපත්ති දුක්කටස්ස. දුතියං පාදං අතික්කාමෙති. නිස්සග්ගියං පාචිත්තියං.[1] අන්තො තියොජනෙ ඨිතො බහි තියොජනං පාතෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤස්ස යානෙ වා භණ්ඩෙ වා අජානන්තස්ස පක්ඛිපිත්වා තියොජනං අතික්කාමෙති, නිස්සග්ගියානි හොන්ති. නිස්සජ්ජිතබ්බානි සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බානි: "ඉමානි මෙ භන්තෙ එළකලොමානි තියොජනං අතික්කාමිතානි නිස්සග්ගියානි, ඉමානාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති. -පෙ-

3. අතිරෙකතියොජනෙ අතිරෙකසඤ්ඤී [2]අතික්කාමෙති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකතියොජනෙ වෙමතිකො [2]අතික්කාමෙති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකතියොජනෙ ඌනකසඤ්ඤී [2]අතික්කාමෙති, නිස්සග්ගියං පාචිත්තියං. ඌනකතියොජනෙ අතිරෙකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඌනකතියොජනෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඌනකතියොජනෙ ඌනකසඤ්ඤී, අනාපත්ති.

4. අනාපත්ති තියොජනං හරති, ඌනකතියොජනං හරති, තියොජනං හරතිපි පච්චාහරතිපි, තියොජනං වාසාධිප්පායො ගන්ත්වා තතො පරං හරති, අච්ඡින්නං පටිලභිත්වා හරති, නිස්සට්ඨං පටිලභිත්වා හරති, අඤ්ඤං හරාපෙති, කතභණ්ඩං හරති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**එළකලොමසික්ඛාපදං නිට්ඨිතං.**

---

1. නිස්සග්ගියානි හොන්ති සයා. 2. තියොජනං අතික්කාමෙති, සයා

**එළකලොමානි උප්පජ්ජෙය්‍යුං** යනු: සඞ්ඝයාකෙරෙන් හෝ ගණයාකෙරෙන් හෝ නෑයන්කෙරෙන් හෝ මිතුරන් කෙරෙන් හෝ පංසුකූල ව හෝ සිය ධනයෙන් හෝ උපදනාහු ය.

**ආකඞ්ඛමානෙන** යනු: කැමැතිවන්නහු විසින්.

**පටිග්ගහෙතබ්බානි පටිග්ගහෙත්වා තියොජනපරමං සහත්ථා හරිතබ්බානි** යනු: තුන් යොදුන් පරම තැන් ගෙණ යෑ යුත්තාහ.

**අසන්තෙ හාරකෙ** යනු: ස්ත්‍රියක් වේවයි පුරුෂයෙක් වේවයි ගිහියෙක් වේවයි පැවිද්දෙක් වේවයි ගෙණ යන අන් කිසිවෙක් නැත්තේ වෙයි.

**තතො චෙ උත්තරිං හරෙය්‍ය අසන්තෙ'පි හාරකෙ** යනු: පළමු පිය තුන්යොදුන ඉක්මවා නම් දුකුළාඇවැත් වෙයි. දෙවෙනි පිය ඉක්මවා නම් නිසගිපචිති වෙයි. තුන්යොදුන ඇතුළත සිටියේ තුන්යොදුනෙන් පිටත හෙළා නම් නිසගිපචිති වෙයි. නොදන්නා වූ අනෙකක්හුගේ යානයෙහි හෝ බැඩියෙහි හෝ බහා තුන් යොදුන ඉක්මවා නම් නිසගි වේ. සඟහට හෝ ගණයාහට හෝ පුහුලක්හට හෝ නිසජිය යුතු. තවද "මහණෙනි, මෙසේ නිසජිය යුත්තාහ: "වහන්ස, තුන් යොදුනක් ඉක්මවන ලද මගේ මේ එළලොම් නිසැගි විය. මම් මෙය සඟහට නිසජම් යි, ... දෙන්නේ යි ... දෙන්නහු යි ... ආයුෂ්මත්හට දෙමි"යි.

3. අතිරෙක අයිරු තුන් යොදුනෙහි අයිරු සත් ඇතියේ ඉකුම්වා නම් නිසගිපචිති වෙයි. අයිරු තුන් යොදුනෙහි විමති ඇතියේ ඉකුම්වා නම් නිසගිපචිති වෙයි. අයිරු තුන් යොදුනෙහි උනු ය යන සත් ඇතියේ ඉකුම්වා නම් නිසගිපචිති වේ. උනු තුන් යොදුනෙහි අයිරු සත් ඇතියේ දුකුළාඇවැත් වෙයි. උනු තුන් යොදුනෙහි විමති ඇතියේ දුකුළාඇවැත් වේ'යි. උනුතුන් යොදුනෙහි උනුය යන සත් ඇතියේ ඇවැත් නැති.

4. තුන්යොදුනක් තැන් ගෙණ යේ නම්, උනුතුන් යොදුනක් තැන් ගෙණ යේ නම්, තුන් යොදුනක් තැන් ගෙණ යේ ද පෙරළා ගෙණ ඒ ද, තුන් යොදුනක් තැන් විසියැපි වූයේ ගොස් ඉන් මත්තෙහි ගෙණ යේ නම්, අසිදෑ ගත්තා ලදුව නැවත ලැබ ගෙණ යේ නම්, නිසජන ලද්දක් ලැබගෙණ යේ නම්, අනෙකක්හු ලවා ගත්වා යේ නම්, එළලොමින් කළ බඩුවක් ගෙණ යේ නම් (ඔහුට ද), උමතු වූවහුට ද, ආදි කම්මිකයාට ද ඇවැත් නැති.

එළකලොම ශික්‍ෂාපදය නිමි.

# 5. 2. 7.

## එළකලොමධොවාපන සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි එළකලොමානි ධොවාපෙන්තිපි රජාපෙන්තිපි විජටාපෙන්තිපි. භික්ඛුනියො එළකලොමානි ධොවන්තියො රජන්තියො විජටෙන්තියො රිඤ්චන්ති උද්දෙසං පරිපුච්ඡං අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤං. අථ ඛො මහාපජාපති ගොතමී යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො මහාපජාපතිං ගොතමිං භගවා එතදවොච: “කච්චි ගොතමි භික්ඛුනියො අප්පමත්තා ආතාපිනියො පහිතත්තා විහරන්තී”ති. “කුතො භන්තෙ භික්ඛුනීනං අප්පමාදො, අය්‍යා ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි එළකලොමානි ධොවාපෙන්තිපි රජාපෙන්තිපි විජටාපෙන්තිපි, භික්ඛුනියො එළකලොමානි ධොවන්තියො රජන්තියො විජටෙන්තියො රිඤ්චන්ති උද්දෙසං පරිපුච්ඡං අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤන්ති”.

2. අථ ඛො භගවා මහාපජාපතිං ගොතමිං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො මහාපජාපති ගොතමී භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ පටිපුච්ඡි: “සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුනීහි එළකලොමානි ධොවාපෙථාපි රජාපෙථාපි විජටාපෙථාපී”ති? “සච්චං භගවා”. “ඤාතිකායො තුම්හාකං භික්ඛවෙ අඤ්ඤාතිකායො”ති. “අඤ්ඤාතිකායො භගවා”ති. “අඤ්ඤාතිකා මොඝපුරිසා අඤ්ඤාතිකානං න ජානන්ති පතිරූපං වා අප්පතිරූපං වා පාසාදිකං වා අපාසාදිකං වා. තත්ථ නාම තුම්හෙ මොඝපුරිසා අඤ්ඤාතිකාහි භික්ඛුනීහි එළකලොමානි ධොවාපෙස්සථාපි රජාපෙස්සථාපි විජටාපෙස්සථාපි. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:”

**“යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා එළකලොමානි ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා විජටාපෙය්‍ය වා, නිස්සග්ගියං පාචිත්තියන්ති”.**

3. **යො පනාති** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අඤ්ඤාතිකා** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධා.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

# 5. 2. 7.

## එළකලොමධොවාපන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ ශාක්‍යජනපදයෙහි වූ කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි **ෂවග මහණහු භික්ෂුණීන් ලවා එළුලොම් දෙවවති, රදන් කරවති, තෙළවත්. භික්ෂුණීහු එළුලොම් දෙවන්නාහු රදන්නාහු තෙළන්නාහු උදෙසීම පිළිවිසීම අධිසීලය අධිචිත්තය අධිප්‍රඥව හැරපියති. එකල්හි මහාප්‍රජාවතී ගෞතමී** තොමෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ එකත්පස් ව සිටියා ය. එකත්පස් ව සිටි මහාප්‍රජාවතී ගොතමියට භාග්‍යවතුන් වහන්සේ මේ වදාළ සේක: "කිමෙක් ද? ගෞතමියනි, භික්ෂුණීහු නොපමාවූවාහු, කෙලෙසුන් තවන වෙර ඇත්තාහු නිවන් පිණිස මෙහෙයූ සිත් ඇත්තාහු වෙසෙද් ද." "වහන්ස, භික්ෂුණීන්ට අප්‍රමාදයෙක් කොයින් ද? ෂඩ්වර්ගීය ආර්‍යයෝ මෙහෙණන් ලවා එළුලොම් දෙවවති, රදන් කරවති, තෙළවත්. භික්ෂුණීහු එළුලොම් දෙවන්නාහු රදන්නාහු තෙළන්නාහු උදෙසීම පිළිවිසීම අධිසීලය අධිචිත්තය අධිප්‍රඥව යන මේ හැරපියති"යි.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාවතී ගොතමියට දැහැමි කථාවෙන් කරුණු දක්වූහ. කුසල් දහම්හි සමාදන් කරවූහ. උත්සාහවත් කරවූහ. මැනවින් පැහැද වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් කරුණු දක්වන ලද, සමාදන් කරවන ලද, තෙද ගන්වන ලද, මැනවින් පහදවන ලද මහාප්‍රජාවතී ගොතමී තොමෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියා ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි භික්ෂුසඟන රැස් කරවා ෂවග මහණුන් පුළුවුත් සේක: "සැබෑද මහණෙනි, තෙපි භික්ෂුණීන් ලවා එළුලොම් දෙවවූ ද, රදවවූ ද, තෙළවවූ ද?"යි. "සැබැව භාග්‍යවතුන් වහන්ස." "මහණෙනි තොපගේ නෑයෝ ද නොනෑයෝ ද?" යි. "භාග්‍යවතුන් වහන්ස, නොනෑයෝ ය"යි. "තුච්ඡ පුරුෂයෙනි, නොනෑයෝ නො නෑයන් පිළිබඳ සුදුසු බව හෝ නුසුදුසු බව හෝ පැහැදීම හෝ නො පැහැදීම හෝ නොදනිත්. "තුච්ඡ-පුරුෂයෙනි, එහි නම් තෙපි නොනෑ වූ භික්ෂුණීන් ලවා එළුලොම් දෙවවූහු ය. රැඳවූවහු ය. තෙළවූවහු ය'යි. "හිස්පුරුෂයෙනි, තෙල නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් නො නෑ මෙහෙණක ලවා එළුලොම් දෙවවා නම් හෝ රදවා නම් හෝ තෙළවා නම් හෝ නිසගිපචිති වේ"** යයි.

3. **යො පන** යනු යම්බදු වූ යමෙක් **භික්ඛු'** යි ... මේ තෙමේ මේ අර්ථයෙහි භික්ෂුය යි අදහස් කරණ ලදී.

**අඤ්ඤාතිකා නම්:** මවුපසින් හෝ පියපසින් හෝ සත්වන මුත්තා යුගළ දක්වා නො බැඳුනාහු.

**භික්ඛුණී** නම්, උභතො සඞ්ඝයා කෙරෙහි උපසපන් වූවා ය.

4. "ධොවා"ති ආණාපෙති, ආපත්ති දුක්කටස්ස. ධොතානි නිස්සග්ගියානි හොන්ති. රජාති ආණාපෙති, ආපත්ති දුක්කටස්ස. රත්තානි නිස්සග්ගියානි හොන්ති. "විජටෙහී"ති ආණාපෙති, ආපත්ති දුක්කටස්ස. විජටිතානි නිස්සග්ගියානි හොන්ති. නිස්සජ්ජිතබ්බානි සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බානි: "ඉමානි මෙ භන්තෙ එළකලොමානි අඤ්ඤාතිකාය භික්ඛුනියා ධොවාපිතානි නිස්සග්ගියානි, ඉමානාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති, -පෙ- ආයස්මතො දම්මීති."

5. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි ධොවාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි ධොවාපෙති රජාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි ධොවාපෙති විජටාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි ධොවාපෙති රජාපෙති විජටාපෙති, නිස්සග්ගියෙන ආපත්ති ද්වින්නං දුක්කටානං.

6. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි රජාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි රජාපෙති විජටාපෙති -පෙ- රජාපෙති ධොවාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. -පෙ- රජාපෙති විජටාපෙති ධොවාපෙති, නිස්සග්ගියෙන ආපත්ති ද්වින්නං දුක්කටානං.

7. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි විජටාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී එළකලොමානි විජටාපෙති ධොවාපෙති -පෙ- විජටාපෙති රජාපෙති, නිස්සග්ගියෙන ආපත්ති දුක්කටස්ස. -පෙ- විජටාපෙති ධොවාපෙති රජාපෙති, නිස්සග්ගියෙන ආපත්ති ද්වින්නං දුක්කටානං.

8. අඤ්ඤාතිකාය වෙමතිකො -පෙ- අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී -පෙ- අඤ්ඤස්ස එළකලොමානි ධොවාපෙති, ආපත්ති දුක්කටස්ස. එකතො උපසම්පන්නාය ධොවාපෙති, ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය ඤාතිකසඤ්ඤී, අනාපත්ති.

9. අනාපත්ති ඤාතිකාය ධොවන්තියා අඤ්ඤාතිකා දුතියා හොති, අවුත්තා ධොවති, අපරිභුත්තං කතභණ්ඩං ධොවාපෙති, සික්ඛමානාය, සාමණෙරියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**එළකලොමධොවාපනසික්ඛාපදං නිට්ඨිතං.**

4 'දෙවව'යි ඇණවා නම් දුකුලාඇවැත් වෙයි. ලෙනාලද්දහු නිසජිය යුත්තාහු වෙති. රදන් කරවයි ඇණවා නම් දුකුලාඇවැත් වෙයි. රදන ලද්දහු නිසජිය යුත්තාහු වෙත්. තෙලව යි ඇණවා නම් දුකුලාඇවැත් වෙයි. තෙලන ලද්දහු නිසජිය යුත්තාහු වෙත්. සඟනට හෝ ගණයාට හෝ පුඟුලක්හට හෝ නිසජිය යුත්තාහ. තවද "මහණෙනි මෙසේ නිසජිය යුත්තාහුය." "වහන්ස, නො නෑ මෙහෙණක ලවා දෙවවන ලද මගේ මේ එළලොම් නිසඟි විය. මම මේවා සඟනට නිසජමියි ... දෙන්නේයයි ... දෙන්නාහු යයි ... ආයුෂමත් හට දෙමි"යි:

5. නො නෑ සත් ඇතියාව නො නෑ මෙහෙණක ලවා එළලොම් දෙවවා නම් නිසඟිපචිති වෙයි. නො නෑ සත් ඇතියාව නො නෑ මෙහෙණක ලවා එළලොම් දෙවවා නම් රදන් කරවා නම් නිසඟියක් සමග දුකුලාඇවැත් වෙයි. නො නෑ සත් ඇතියාව නො නෑ මෙහෙණක ලවා එළලොම් දෙවවා නම් තෙලවා නම් නිසඟියක් හා දුකුලාඇවැත් වෙයි. නො නෑ සත් ඇතියාව, නො නෑ මෙහෙණක ලවා එළලොම් දෙවවා නම් රදන් කරවා නම් තෙලවා නම් නිසඟියක් සමග දෙ දුකුලාඇවැතෙක් වේ.

6. නො නෑ මෙහෙණක ලවා නො නෑ ය යන සත් ඇති ව එළලොම් රදන් කරවා නම් නිසඟිපචිති වෙයි. නො නෑ මෙහෙණක ලවා නො නෑ සත් ඇති ව එළලොම් රදන් කරවා නම් තෙලවා නම් ... රදන් කරවා නම් දෙවවා නම් නිසඟියක් සමග දුකුලාඇවැත් වෙයි ... රදන් කරවා නම් තෙලවා නම් දෙවවා නම් නිසඟියක් සමග දෙ දුකුලාඇවැතෙක් වේ.

7. නො නෑ සත් ඇතියාව නො නෑ මෙහෙණක ලවා එළලොම් තෙලවා නම් නිසඟිපචිති වෙයි. නො නෑ සත් ඇතියාව නො නෑ මෙහෙණක ලවා එළලොම් තෙලවා නම් දෙවවා නම් ... තෙලවා නම් රදන් කරවා නම් නිසඟියක් සමග දුකුලාඇවැත් වෙයි. ... තෙලවා නම් දෙවවා නම් රදන් කරවා නම් නිසඟියක් සමග දෙ දුකුලාඇවැතෙක් වේ.

8. විමති ඇත්තේ නො නෑ මෙහෙණක ලවා ... නෑය යන සත් ඇතියේ නො නෑ මෙහෙණක ලවා ... අනෙකක්හුගේ එළලොම් දෙවවා නම් දුකුලා-ඇවැත් වෙයි. භික්ෂුණීන් වෙත උපසපත් වූ මෙහෙණක ලවා දෙවවා නම් දුකුලාඇවැත් වෙයි. නො නෑය යන සත් ඇතියේ නෑ මෙහෙණක ලවා (දෙවවා නම්) දුකුලාඇවැත් වෙයි. විමති ඇත්තේ නෑ මෙහෙණක ලවා (දෙවවා නම්) දුකුලාඇවැත් වෙයි. නෑය යන සත් ඇතියේ නෑ මෙහෙණක ලවා දෙවවා නම් ඇවැත් නැති.

9. නෑ මෙහෙණක දෝනා කල්හි නො නෑ මෙහෙණක් දෙවැත්ත වේ නම්, නො කියන ලද්දී දෙවා නම්, පරිභොග නො කරණ ලද එළලොමින් කළ භාණ්ඩයක් දෙවවා නම්, සික්ඛමානාවක ලවා (දෙවවා නම්), හෙරණක ලවා (දෙවවා නම්), උමතුවූවහුට ද, ආදිකම්මිකයාට ද ඇවැත් නැති.

**එළකලොමධොවාපන ශික්ෂාපදය නිමි.**

## 5. 2. 8.

## රූපියසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො රාජගහෙ අඤ්ඤතරස්ස කුලස්ස කුලූපගො හොති නිච්චභත්තිකො. යං තස්මිං කුලෙ උප්පජ්ජති ඛාදනීයං වා භොජනීයං වා තතො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස පටිවිංසො[1] ඨපීයති. තෙන ඛො පන සමයෙන සායං තස්මිං කුලෙ මංසං උප්පන්නං හොති. තතො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස පටිවිංසො ඨපිතො හොති. තස්ස කුලස්ස දාරකො රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය රොදති: "මංසං මෙ දෙථා"ති. අථ ඛො සො පුරිසො පජාපතිං එතදවොච: "අය්‍යස්ස පටිවිංසං දාරකස්ස දෙහි, අඤ්ඤං චෙතාපෙත්වා අය්‍යස්ස දස්සාමා"ති. තස්ස[2] තං අදාසි.

2. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන තං කුලං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සො පුරිසො යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං අභිවා-දෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "හිය්‍යො ඛො භන්තෙ සායං මංසං උප්පන්නං අහොසි, තතො අය්‍යස්ස පටිවිංසො ඨපිතො. අයං භන්තෙ දාරකො රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය රොදති: "මැංසා මෙ දෙථා"ති. අය්‍යස්ස පටිවිංසො දාරකස්ස දින්නො. කහාපණෙන භන්තෙ කිං ආහරීයතූ"ති. "පරිච්චත්තො මෙ ආවුසො කහාපණොති?" "ආම භන්තෙ පරිච්චත්තොති." "තඤ්ඤෙව මෙ ආවුසො කහාපණා දෙහී"ති.

3. අථ ඛො සො පුරිසො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස කහාපණං දත්වා උජ්ඣායති ඛීයති විපාචෙති: "යථෙව මයං රූපියං පටිග්ගණ්හාම, එවමෙව ඉමෙ සමණා සක්‍යපුත්තියා රූපියං පටිග්ගණ්හන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස පුරිසස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො රූපියං පටිග්ගහෙස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං: "සච්චං කිර ත්වං උපනන්ද රූපියං පටිග්ගහෙසී"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා. "කථං හි නාම ත්වං මොඝපුරිස රූපියං පටිග්ගහෙස්සසි, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"න්ති.**

4. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

---

1. පටිවීෂො. මජසං. 2. තස්ස තං අදාසි. ඉජසං. සාදිස්සනෙ.

## 5. 2. 8.

## රූපියශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ රජගහනුවර සමීපයෙහි වූ, කලන්දකනිවාප නම් වේළුවනයෙහි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ රජගහනුවර එක්තරා කුලයක්හුගේ කුලූපගවූයේ නිච්චභත්තික වෙයි. ඒ කුලයෙහි කෑ යුතු හෝ බුදිය යුතු යමක් උපදී නම් ඉන් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන්ගේ කොටස තබනු ලැබේ. එකල්හි ඒ කුලයෙහි සවස මසක් උපන්නේ වෙයි. එයින් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන්ගේ කොටස තබන ලද්දේ වෙයි. එකුලෙහි දරුවෙක් රෑ අලුයම නැගිට "මට මස් දෙව"යි හඬයි. ඉක්බිති ඒ පුරුෂ තෙමේ බිරිඳට මෙසේ කීය. "ආර්‍ය්‍යයන් වහන්සේගේ කොටස දරුහට දෙව. අන් මසක් මිකොට ගෙණ ආර්‍ය්‍යයන් වහන්සේට දෙන්නෙමු"යි. ඔහුට එය දුනි.

2. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ පෙරවරු හැද පොරවා පාසිවුරු ගෙණ ඒ කුලය වෙත එළඹ පැණවූ අසුනෙහි හුන්නේය. ඉක්බිති ඒ පුරුෂ තෙමේ උපනන්ද ශාක්‍යපුත්‍රයන් වෙත එළඹ වැඳ එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන් ඒ පුරුෂ තෙමේ උපනන්ද ශාක්‍යපුත්‍රයනට මෙය කීය. "වහන්ස, ඊයේ සවස මසක් උපන්නේ විය. එයින් ආර්‍ය්‍යයන් වහන්සේගේ කොටස තබන ලදී. "වහන්ස, මේ දරුවා රෑ අලුයම් වේලෙහි නැගිට මට මස් දෙව"යි හඬයි. ආර්‍ය්‍යයන්ගේ කොටස දරුවාට දෙන ලදී. "කහවණුවකින් කුමක් ගෙණ යුතුද"යි කීය. "ඇවැත මට කහවණුව පරිත්‍යාග කරණ ලදද"යි. "එසේය වහන්ස, පරිත්‍යාග කරණ ලදී"යි. "ඇවැත මට ඒ කහවණුව ම දෙව"යි.

3. ඉක්බිති ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයනට කහවණුව දී අවමන් කෙරෙයි, අයුණු කියයි, නුගුණ පතුරුවයි. "යම් සේ අපි රන්-රිදී මසු කහවණු පිළිගණුමෝ ද එමෙන් ම මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ද රන් රිදී මසු කහවණු පිළිගණිති"යි. භික්ෂූහු අවමන් කරණ, අයුණු කියන, නුගුණ පතුරුවන ඒ පුරුෂයාගේ බස් ඇසූහ. යම් අපිච් මහණ කෙනෙක් වෙද්ද ඔහු අවමන් කරති, අයුණු කියති, නුගුණ පතුරුවත්. "කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ රන් රිදී මසු කහවණු පිළිගත්තාහු දැ"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කළහ. "සැබෑ ද, උපනන්දය, තෝ රන් රිදී මසු කහවණු පිළිගත්තෙහි දැ"යි. "සැබව, භාග්‍ය-වතුන් වහන්ස,." භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ ගැරහූ සේක. "කෙසේ නම් තුච්ඡ පුරුෂය, තෝ රන් රිදී මසු කහවණු පිළිගත්තෙහි ද, තුච්ඡ පුරුෂය, මෙය නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. ... තවද "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:"

**"යම් මහණෙක් රන් රිදී මසු කහවණු තෙමේ ගණී නම් හෝ අනුන් ලවා ගන්වා නම් හෝ ලඟ තබන ලද්දක් ඉවසා නම් හෝ නිස්සග්ගි-පචිත්ති වේ"යයි.**

4. **යො පන** යනු: යමෙක් යම් බඳුවූයෙක්, ...

**භික්ඛු** යනු: ... මේ තෙමේ මේ අර්ථයෙහි භික්ෂුයයි අදහස් කරණ ලදී.

ජාතරූපං නාම: සත්ථුවණ්ණො වුච්චති.

රජතං නාම: කහාපණො ලොහමාසකො- දාරුමාසකො- ජතුමාසකො යෙ වොහාරං ගච්ඡන්ති.

උග්ගණ්හෙය්‍යාති සයං ගණ්හාති, නිස්සග්ගියං පාචිත්තියං.

උග්ගණ්හාපෙය්‍යාති අඤ්ඤං ගාහාපෙති. නිස්සග්ගියං[1] පාචිත්තියං.

උපනික්ඛිත්තං වා සාදියෙය්‍යාති "ඉදං අය්‍යස්ස හොතූ"ති උපනික්ඛිත්තං සාදියති, නිස්සග්ගියං හොති, සඞ්ඝමජ්ඣෙ නිස්සජ්ජිතබ්බං. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: තෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ රූපියං පටිග්ගහෙසිං. ඉදං මෙ නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා. සචෙ තත්ථ ආගච්ඡති ආරාමිකො වා උපාසකො වා. සො වත්තබ්බො: "ආවුසො ඉමං ජානාහී"ති. සචෙ සො භණති "ඉමිනා කිං ආහරියතූ"ති. න වත්තබ්බො "ඉමං වා ඉමං වා ආහරා"ති. කප්පියං ආචික්ඛිතබ්බං: සප්පි වා තෙලං වා මධු වා ඵාණිතං වා. සචෙ සො තෙන පරිවත්තෙත්වා කප්පියං ආහරති, රූපියපටිග්ගාහකං ඨපෙත්වා සබ්බෙහෙව පරිභුඤ්ජිතබ්බං. එවඤ්චෙතං ලභෙථ, ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, සො වත්තබ්බො: "ආවුසො ඉමං ඡඩ්ඩෙහී"ති. සචෙ සො ඡඩ්ඩෙති, ඉච්චෙතං කුසලං. නො චෙ ඡඩ්ඩෙති, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු රූපියඡඩ්ඩකො සම්මන්නිතබ්බො: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, ඡඩ්ඩිතාඡඩ්ඩිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො, යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං රූපියඡඩ්ඩකං සම්මන්නෙය්‍ය, එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං රූපියඡඩ්ඩකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො රූපියඡඩ්ඩකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු රූපියඡඩ්ඩකො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

1. නිස්සග්ගියං හොති. ස්‍යා.

**ජාතරූප** නම්: රත්රන් කියනු ලැබේ.

**රජත** නම්: කහවණුය, ලොහොමසුය, දූවමසුය, ලහමසුයි යමෙක් ව්‍යවහාරයට යේ නම් ඒ යැ.

**උග්ගණ්හෙය්‍ය** යනු: තෙමේ ගණී නම් නිසගිපචිති වේ.

**උග්ගණ්හාපෙය්‍ය** යනු: අනෙකක්හු ලවා හත්වා නම් නිසගිපචිති වේ.

**උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය** යනු: "මෙය ආයසීයත් වහන්සේට වේවා"යි ලඟ තබන ලද්දක් ඉවසා නම් නිසගි වේ. සඟමැද නිසජිය යුතුයි. තවද "මහණෙනි, මෙසේ නිසජිය යුතුයි. ඒ මහණ විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට පෙරෙව මහලු භික්‍ෂූන් පා වැඳ අබදූණිව හිඳ ඇඳිලි බැඳ මෙසේ කිය යුත්තේය. "වහන්ස, මම රන් රිදී මසු කහවණු පිළිගත්තෙමි. මාගේ මෙය නිසගි විය. මම මෙය සඟහට නිසජමි"යි, නිසජා ඇවැත් දෙසිය යුතුයි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් ඇවැත් පිළිගත යුතුයි. ඉදින් එහි ආරාමිකයෙක් හෝ උපාසකයෙක් හෝ පැමිණේ නම් හේ මෙසේ කිය යුත්තේය. ඇවැත මෙය දතැයි. ඉදින් හේ "මෙයින් කුමක් ගෙණ ආයුතුදැ"යි බෙණේ නම් මෙය හෝ මෙය හෝ ගෙණෙවයි නො කිය යුත්තේය. ගිතෙල් හෝ තලතෙල් හෝ මී හෝ පැණි හෝ කැපවතක් පැවසිය යුතුයි. ඉදින් හේ එයින් පෙරළි කොට කැපවතක් එළවා නම් රූපිය ප්‍රතිග්‍රාහකයා තබා සියල්ලන් විසින් පරිභොග කටයුතුයි. ඉදින් මෙසේ ලැබේ නම් එය මැනවි. ඉදින් නො ලැබේ නම් හේ මෙසේ කියයුත්තේ ය. ඇවැත මෙය ඉවත ලවයි. ඉදින් හේ ඉවත ලා නම් තෙල ඉවතලීම මැනවි. ඉදින් ඉවත නොලා නම් පසඟකින් සමන්විත වූ මහණ තෙමේ 'රූපිය ඡඩ්ඩකය'යි සම්මත කටයුත්තේ ය: යමෙක් ඡන්දයෙන් අගතියට නො යේ නම්, ද්වෙෂයෙන් අගතියට නො යේ නම්, මොහයෙන් අගතියට නොයේ නම්, භියෙන් අගතියට නො යේ නම්, ඉවත ලූ නො ලූ දැය දනී නම්, හෙතෙමේ යි. තවද මහණෙනි. මෙසේ සම්මත කටයුත්තේ ය: පළමුකොට මහණ තෙමේ යැදිය යුත්තේ ය. යැද ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය."

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. ඉදින් සඟහට පැමිණි කල් වේ නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහු රූපියඡඩ්ඩක කොට සම්මත කරන්නේය. මේ ඥප්තිය"යි.

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. සඞ්ඝ තෙමේ මෙනම් මහණහු රූපියඡඩ්ඩක කොට සම්මත කෙරෙයි. මෙනම් මහණහුගේ රූපියඡඩ්ඩක සම්මතිය යම් ආයුෂ්මතක්හට රිසි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රිසි වේ නම් හේ කියන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණ තෙමේ 'රූපියඡඩ්ඩක' යයි සම්මත කරණ ලද්දේ ය. එය සඞ්ඝයාට රිසි වෙයි. එහෙයින් තුෂ්ණීම්භාවය යි. මෙය මෙසේ දරමි"යි.

5. තෙන සම්මතෙන භික්ඛුනා අනිමිත්තං කත්වා පාතෙතබ්බං. සචෙ නිමිත්තං කත්වා පාතෙති, ආපත්ති දුක්කටස්ස. රූපියෙ රූපියසඤ්ඤී රූපියං පටිග්ගණ්හාති, නිස්සග්ගියං පාචිත්තියං. රූපියෙ වෙමතිකො රූපියං පටිග්ගණ්හාති, නිස්සග්ගියං පාචිත්තියං. රූපියෙ අරූපියසඤ්ඤී රූපියං පටිග්ගණ්හාති, නිස්සග්ගියං පාචිත්තියං. අරූපියෙ රූපියසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අරූපියෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. අරූපියෙ අරූපියසඤ්ඤී, අනාපත්ති.

6. අනාපත්ති අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපති, "යස්ස භවිස්සති සො හරිස්සතී"ති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

රූපියසික්ඛාපදං නිට්ඨිතං.

---

## 5. 2. 9.

## රූපියසංවොහාර සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිස්සන්ති, සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- 'සච්චං කිර තුම්හෙ භික්ඛවෙ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජථා'ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා. "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියන්ති."**

2. යො පනාති යො යාදිසො -පෙ-

භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

නානප්පකාරකං නාම: කතම්පි අකතම්පි කතාකතම්පි. කතං නාම: සීසූපගං ගීවූපගං හත්ථූපගං පාදූපගං කටූපගං. අකතං නාම: ඝනකතං වුච්චති. කතාකතං නාම: තදුභයං.

5. සම්මතය ලත් ඒ මහණහු විසින් සලකුණු නො කොට ඉවත ලිය යුතුයි. ඉදින් සලකුණු කොට ඉවත ලා තම් දුකුලාඇවැත් වේ. රූපියෙහි රූපිය යන සත් ඇතියේ රූපියවතක් පිළිගණී නම් නිසඟි පචිති වෙයි. රූපියෙහි විමති ඇත්තේ රූපියවතක් පිළිගණී නම් නිසඟි පචිති වෙ යි. රූපියෙහි අරූපිය ය යන සත් ඇත්තේ රූපියවතක් පිළිගණී නම් නිසඟිපචිති වේ. අරූප්‍යයෙහි රූප්‍යසංඥී වූයේ දුකුලාඇවැත් වෙයි. අරූප්‍යයෙහි විමති ඇත්තේ දුකුලාඇවැත් වෙයි. අරූප්‍යයෙහි අරූප්‍ය ය යන සත් ඇත්තේ ඇවැත් නැති.

6. ඇතුළුඅරමැ හෝ ඇතුළුඅවසැ හෝ 'යමක්හුගේ වේ නම් හේ ගෙණ යත්තේ' යයි ගෙණ හෝ ගත්වා හෝ බහා තබා නම්, උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**රූපියශික්‍ෂාපදය නිමි.**

---

# 5. 2. 9.

## රූපියසංවොහාර ශික්‍ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙත සේක. එසමයෙහි **සවග මහණහු** නන්වැදෑරුම් රූපියසංවොහාරයට (රන් රිදී මසු කහවණු ගණුදෙනුවට) පැමිණෙත්. මිනිස්සු අවමන් කෙරෙති, අයුණු කියති, නුගුණ පතුරුවත්. "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ කාමභොගී ගිහියන් මෙන් නන්වැදෑරුම් වූ රූපියසංවොහාරයට පැමිණෙද්ද"යි. භික්‍ෂූහු අවමන් කරණ, අයුණු කියන, නුගුණ පතුරුවන ඒ මිනිසුන්ගේ බස් ඇසූහ: යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද, ඔහු අවමන් කෙරෙති, අයුණු කියති, නුගුණ පතුරුවත්. "කෙසේ නම් සවග මහණහු නන්වැදෑරුම් රූපියසංවොහාරයට පැමිණෙද්ද"යි. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ. ... "සැබෑ ද මහණෙනි, තෙපි නන්වැදෑරුම් රූපියසංවොහාරයට පැමිණියවු දැ"යි. "සැබව, භාග්‍යවතුන් වහන්ස," භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක: "කෙසේ නම් තුච්ඡපුරුෂයෙනි, තෙපි නන්වැදෑරුම් වූ රූපියසංවොහාරයට පැමිණියවු ද, "තුච්ඡපුරුෂයෙනි, නොප නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් නන්වැදෑරුම් රූපියසංවොහාරයට පැමිණේ නම් නිසඟිපචිති වේ" යයි.**

2. **යොපන** යනු: යමෙක් යම් බඳුයෙක් ...

**භික්‍ඛු** යනු: ... මේ තෙමේ මේ අර්ථයෙහි භික්‍ෂුයයි අදහස් කරණ ලදී.

**නානප්පකාරක** නම්: කෘතය ද අකෘතය ද කෘතාකෘතය ද වෙයි. කත නම්: ශීර්ෂාභරණ යැ ග්‍රීවාභරණ යැ හස්තාභරණ යැ පාදාභරණ යැ කට්‍යාභරණ යි. අකත නම්: පිඩු කළ අමුරන් කියනු ලැබේ. කතාකත නම්: ඒ දෙක යි.

රූපියං නාම: සත්ථුවණ්ණො කහාපණො ලොහමාසකො දාරුමාසකො ජතුමාසකො යෙ වොහාරං ගච්ඡන්ති.

සමාපජ්ජෙය්‍යාති කතෙන කතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.[1] කතෙන අකතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. කතෙන කතාකතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අකතෙන කතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අකතෙන අකතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අකතෙන කතාකතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. කතාකතෙන කතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. කතාකතෙන අකතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. කතාකතෙන කතාකතං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. සඞ්ඝමජ්ඣෙ නිස්සජ්ජිතබ්බං. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: තෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො:

"අහං භන්තෙ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිං, ඉදං මෙ නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා. සචෙ තත්ථ ආගච්ඡති ආරාමිකො වා උපාසකො වා, සො වත්තබ්බො: "ආවුසො ඉමං ජානාහී"ති. සචෙ සො භණති: "ඉමිනා කිං ආහරීයතූ"ති. න වත්තබ්බො "ඉමං වා ඉමං වා ආහරා"ති. කප්පියං ආචික්ඛිතබ්බං: සප්පි වා තෙලං වා මධු වා ඵාණිතං වා. සචෙ සො තෙන පරිවත්තෙත්වා කප්පියං ආහරති. රූපියචෙතාපකං ඨපෙත්වා සබ්බෙහෙව පරිභුඤ්ජිතබ්බං. එවඤ්චෙතං ලභෙථ-ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ, සො වත්තබ්බො: "ආවුසො ඉමං ඡඩ්ඩෙහී"ති. සචෙ සො ඡඩ්ඩෙති, ඉච්චෙතං කුසලං. නො චෙ ඡඩ්ඩෙති, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු රූපියඡඩ්ඩකො සම්මන්නිතබ්බො: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය න දොසාගතිං ගච්ඡෙය්‍ය න මොහාගතිං ගච්ඡෙය්‍ය න භයාගතිං ගච්ඡෙය්‍ය ඡඩ්ඩිතාඡඩ්ඩිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො යාචිත්වා බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං රූපියඡඩ්ඩකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං රූපියඡඩ්ඩකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො රූපියඡඩ්ඩකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු රූපියඡඩ්ඩකො. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

3. තෙන සම්මතෙන භික්ඛුනා අනිමිත්තං කත්වා පාතෙතබ්බං. සචෙ නිමිත්තං කත්වා පාතෙති, ආපත්ති දුක්කටස්ස.

---

1. නිස්සග්ගියං හොති. සයා

රූපිය නම්: රත්රන් ය, කහවණු ය, ලොහොමසු ය, දැවමසු ය, ලාහමසු ය, යමක් ගණුදෙනුවට පැමිණේ නම් ඒ යෑ.

සමාපජ්ජෙය්‍ය යනු: කෘතයෙන් කෘතය විකොට ගණී නම් නිසගිපචිති වෙයි. කෘතයෙන් අකෘතය ගණී නම් නිසගිපචිති වෙයි. කෘතයෙන් කෘතාකෘතය විකොට ගණී නම් නිසගිපචිති වෙයි. අකෘතයෙන් කෘතය මිල දී ගණී නම් නිසගිපචිති වෙයි. අකෘතයෙන් අකෘතය මිල දී ගණී නම් නිසගිපචිති වෙයි. අකෘතයෙන් කෘතාකෘතය මිල දී ගණී නම් නිසගිපචිති වෙයි. කෘතාකෘතයෙන් කෘතය මිල දී ගණී නම් නිසගිපචිති වෙයි. කෘතාකෘතයෙන් අකෘතය මිල දී ගණී නම් නිසගිපචිති වෙයි. කෘතාකෘතයෙන් කෘතාකෘතය මිල දී ගණී නම් නිසගිපචිති වේ. (නිසගි වූ වත) සඟමැද නිසැජියයුතු. තව ද මහණෙනි, මෙසේත් නිසැජිය යුතු ය. ඒ මහණහු විසින් සඟ වෙත එළඹ උතුරුසඟ එකස් කොට පෙරෙව මහලු භික්ෂූන් පා වැඳ උළුල්ලෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය. "වහන්ස, මම නන්වැදෑරුම් රූපියසංවොහාරයට පැමිණියෙමි. මගේ මේ රූපියය (රන් රිදී මසු කහවණු) නිසගි විය: මම මෙය සඟහට නිසජමි"යි. නිසඳ ඇවැත් දෙසිය යුතු. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් ඇවැත් පිළිගත යුතුය. ඉදින් එහි ආරාමිකයෙක් හෝ උපාසකයෙක් හෝ පැමිණේ නම් "ඇවත මෙය දනැ"යි හේ කියයුත්තේ ය. ඉදින් හෙතෙමේ 'මින් කුමක් ගෙණ ආයුතු දැ'යි කියා නම් 'මෙනම් මෙනම් දෑය ගෙණෙව'යි නො කියයුත්තේ ය. ගිතෙල් හෝ තලතෙල් හෝ මී හෝ පැණි හෝ කැපවූවක් කියයුතුය. ඉදින් හෙතෙම ඒ රූපියයෙන් පෙරළි කොට කැප දෙයක් ගෙණේ නම් රූපියය ගණුදෙනු කළහු තබා සියල්ලන් විසින් ම වැළඳිය යුතුය. මෙසේ මෙය ලැබේ නම්, ඒ ලැබීම මැනව. ඉදින් නො ලැබේ නම්, හෙතෙමේ "ඇවත මෙය බැහැර ලව"යි හේ කියයුත්තේ ය. ඉදින් හෙතෙමේ එය බැහැර ලා නම් තෙල බැහැර ලීම මැනවි. ඉදින් බැහැර නො ලා නම් පසගින් සමන්විත රූපියඡඩ්ඩක මහණ සම්මත කළ යුත්තේ ය: "යමෙක් ඡන්‍දාගතියට නොයේ නම් ද්‍වෙෂාගතියට නො යේ නම් මොහාගතියට නො යේ නම් භයාගතියට නො යේ නම් බැහැර ලූ නො ලූ දෑය දනී නම් එබන්දෙකි." තවද මහණෙනි, මෙසේ සම්මත කළයුත්තේ ය. පළමුව මහණ තෙම යැදිය යුත්තේ ය. යැද ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමෙ දැන්විය යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙම මා කියන්නක් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත් නම් සඞ්ඝ තෙම මෙනම් මහණහු රූපියඡඩ්ඩක කොට සම්මත කරන්නේ ය. මේ 'ඥප්ති'යයි.

වහන්ස, සඞ්ඝ තෙම මා කියන්නක් අසාවා. සඞ්ඝ තෙම මෙනම් මහණහු රූපියඡඩ්ඩක කොට සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතක්හට මෙනම් මහණහට රූපියඡඩ්ඩකසම්මතිය රිසි වේ නම් හේ තූෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රිසි වේ නම් හේ කියන්නේ ය.

සඞ්ඝයා විසින් මෙනම් මහණ රූපියඡඩ්ඩක කොට සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රිසි වෙයි. එහෙයින් මේ තූෂ්ණීම්භාවය යි. තෙල මෙසේ ධරමි"යි.

3. සම්මතය ලත් මහණහු විසින් නිමිති රහිත කොට ඉවත ලියයුතු ය. ඉදින් නිමිති කොට ඉවත ලා නම් දුකුළාඇවැත් වේ.

4. රූපියෙ රූපියසඤ්ඤී රූපියං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. රූපියෙ වෙමතිකො රූපියං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. රූපියෙ අරූපියසඤ්ඤී රූපියං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අරූපියෙ රූපියසඤ්ඤී රූපියං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අරූපියෙ වෙමතිකො රූපියං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අරූපියෙ අරූපියසඤ්ඤී රූපියං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අරූපියෙ රූපියසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අරූපියෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. අරූපියෙ අරූපියසඤ්ඤී, අනාපත්ති.

5. අනාපත්ති උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**රූපියසංවොහාරසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 2. 10.

## කයවික්කයසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පට්ටො හොති චීවරකම්මං කාතුං. සො පටපිලොතිකානං සඞ්ඝාටිං කරිත්වා සුරත්තං සුපරිකම්මකතං කත්වා පාරුපි. අථ ඛො අඤ්ඤතරො පරිබ්බාජකො මහග්ඝං පටං පාරුපිත්වා යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "සුන්දරා ඛො ත්‍යායං ආවුසො සඞ්ඝාටි, දෙහි මෙ පටෙනා"ති. "ජානාහි ආවුසො"ති? "ආමාවුසො ජානාමී"ති. "හන්දාවුසො"ති අදාසි. අථ ඛො සො පරිබ්බාජකො තං සඞ්ඝාටිං පාරුපිත්වා පරිබ්බාජකාරාමං අගමාසි. පරිබ්බාජකා තං පරිබ්බාජකං එතදවොචුං: "සුන්දරා ඛො ත්‍යායං ආවුසො සඞ්ඝාටි, කුතො තයා ලද්ධා"ති? "තෙන මෙ ආවුසො පටෙන පරිවත්තිතා"ති. "කතිහිපි ත්‍යායං ආවුසො සඞ්ඝාටි භවිස්සති, සො යෙව තෙ පටො වරො"ති.

2. අථ ඛො සො පරිබ්බාජකො "සච්චං ඛො පරිබ්බාජකා ආහංසු. කතිහිපි ම්‍යායං සඞ්ඝාටි භවිස්සති, සො යෙව මෙ පටො වරො"ති යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "හන්ද තෙ ආවුසො සඞ්ඝාටි, දෙහි මෙ පට"න්ති. "නනු ත්වං ආවුසො මයා වුත්තො ජානාහි ආවුසොති, නාහං දස්සාමී"ති.

4. රූප්‍යයෙහි රූප්‍ය ය යන සංඥා ඇත්තේ (කෘතාකෘත) රූප්‍යය ව්‍යවහාර කෙරේ නම් නිස්සග්ගිපචිත්ති වෙයි. රූප්‍යයෙහි විමති ඇතියේ රූප්‍යය ව්‍යවහාර කෙරේ නම් නිස්සග්ගිපචිත්ති වෙයි. රූප්‍යයෙහි අරූප්‍ය ය යන සංඥා ඇතියේ රූප්‍යය ව්‍යවහාර කෙරේ නම් නිස්සග්ගිපචිත්ති වේ. අරූප්‍යයෙහි රූප්‍ය ය යන සංඥා ඇත්තේ රූප්‍යය ව්‍යවහාර කෙරේ නම් නිස්සග්ගිපචිත්ති වෙයි. අරූප්‍යයෙහි විමති ඇතියේ රූප්‍යය ව්‍යවහාර කෙරේ නම් නිස්සග්ගිපචිත්ති වෙයි. අරූප්‍යයෙහි අරූප්‍ය ය යන සංඥා ඇත්තේ රූප්‍යය ව්‍යවහාර කෙරේ නම් නිස්සග්ගිපචිත්ති වේ. අරූප්‍යයෙහි රූප්‍ය ය යන සංඥා ඇත්තේ දුකුලාඇවැත් වෙයි. අරූප්‍යයෙහි වෙමතික වූයේ දුකුලාඇවැත් වෙයි. අරූප්‍යයෙහි අරූප්‍යය යන සංඥා ඇත්තේ ඇවැත් නැති.

5. උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**රූපියසංවොහාර ශික්ෂාපදය නිමි.**

---

## 5. 2. 10.

## කයවික්කයශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍ර තෙමේ සිවුරුකම් කරන්නට සමත් වූයේ වෙයි. හේ මහලු පටකඩින් සඟලක් කොට මොනොවට රඳන ලද්දක් මොනොවට රඳ පිරියම් කරණ ලද්දක් කොට පෙරෙවී ය. ඉක්බිති එක්තරා පිරිවැජියෙක් මහඟු පිළියක් පෙරෙව ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයන් වෙත එළඹ උපනන්දශාක්‍යපුත්‍රයනට මෙය කීය. “ඇවත, තොපගේ මේ සඟල සොඳුරුය. “මගේ පිළියෙන් පෙරළි කොට දෙව”සි. “ඇවැත විමසා ගණැ”සි. එසේය “ඇවැත දනිමි”සි “එසේ නම් ගණැ”සි දුන්නේය. එකල්හි ඒ පිරිවැජි තෙමේ ඒ සඟල පෙරෙව පිරිවැජිඅරමට ගියේය. පිරිවැජියෝ ඒ පිරිවැජියාට මෙය කීහ. “ඇවැත, තාගේ මේ සඟල සොඳුරුය. කොයින් ලබන ලද්දූ”සි. ඇවැත්නි, මා විසින් ඒ පිළියෙන් පෙරළි කොට ගන්නා ලදූ”සි. “තාගේ මේ සඟල කී දවසක් පවත්නේ ද? තාගේ ඒ වස්ත්‍රය ම උතුමැ’සි.

2. ඉක්බිති ඒ පිරිවැජි තෙමේ පිරිවැජියෝ සැබවක් කීහ. “මගේ මේ සඟල කීදවසක් පවත්නේ ද, මගේ ඒ වස්ත්‍රය ම උතුමැ”සි. ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයන් වෙත එළඹ මෙය කීය. “ඇවැත්නි, තාගේ සඟල ගණුව මගේ වස්ත්‍රය දෙව”සි. “ඇවැත්නි තෝ මා විසින් විමසා ගණැ”සි කියන ලද්දේ නො වෙහි ද? “මම නොදෙමි”සි.

3. අථ ඛො සො පරිබ්බාජකො උජ්ඣායති ඛීයති විපාචෙති: ගිහීපි නං ගිහිස්ස විප්පටිසාරිස්ස දෙති[1], කිං පන පබ්බජිතො පබ්බජිතස්ස න දස්සතී"ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස පරිබ්බාජකස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පරිබ්බාජකෙන සද්ධිං කයවික්කයං සමාපජ්ජිස්සතී"ති. "අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර ත්වං උපනන්ද පරිබ්බාජකෙන සද්ධිං කයවික්කයං සමාපජ්ජී"ති?[2] "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස පරිබ්බාජකෙන සද්ධිං කයවික්කයං සමාපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය**න්ති".

4. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**නානප්පකාරකං** නාම: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරා, අන්තමසො චුණ්ණපිණ්ඩොපි දන්තකට්ඨම්පි දසිකසුත්තම්පි.

**කයවික්කයං සමාපජ්ජෙය්‍යාති** 'ඉමිනා ඉමං දෙහි, ඉමිනා ඉමං ආහර, ඉමිනා ඉමං පරිවත්තෙහි, ඉමිනා ඉමං චෙතාපෙහී'ති අජ්ඣාචරති, ආපත්ති දුක්කටස්ස. යතො කයිතඤ්ච හොති වික්කයිතඤ්ච, අත්තනො භණ්ඩං පරහත්ථගතං පරභණ්ඩං, අත්තනො හත්ථගතං, නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "අහං භන්තෙ නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජිං. ඉදං මෙ නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මීති"

5. කයවික්කයෙ කයවික්කයසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. කයවික්කයෙ වෙමතිකො, නිස්සග්ගියං පාචිත්තියං. කයවික්කයෙ න කයවික්කයසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. න කයවික්කයෙ කයවික්කයසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. න කයවික්කයෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. න කයවික්කයෙ න කයවික්කයසඤ්ඤී, අනාපත්ති.

6. අනාපත්ති අග්ඝං පුච්ඡති, කප්පියකාරකස්ස ආචික්ඛති, ඉදං අම්හාකං අත්ථි අම්හාකඤ්ච ඉමිනා ච ඉමිනා ච අත්ථොති භණති. උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**කයවික්කයසික්ඛාපදං නිට්ඨිතං.**

---

## කොසියවග්ගො දුතියො.

**තස්සුද්දානං:-**

කොසියා සුද්ධද්වෙභාගා ඡබ්බස්සානි නිසීදනං,
ද්වෙ ච ලොමානි උග්ගණ්හෙ, උභො නානප්පකාරකාති.

---

1. දෙන්ති ම ඡ.සං. 2. සමාපජ්ජසී. ම ඡ සං.

3. ඉක්බිති ඒ පිරිවැජි තෙමේ අවඥා කෙරෙයි නුගුණ කියයි දොස් පහළ කෙරෙයි: ගිහියා පවා පසුතැවිලි වන ගිහියාට එය දෙයි. "කුමක්හෙයින් පැවිද්දෙක් පැවිද්දාට නොදෙන්නේද"යි. භික්ෂූහු අවඥා කරණ නුගුණ කියන දොස් පහළ කරණ ඒ පිරිවැජියාගේ තෙපුල් ඇසූහ. යම් අපිස්වූ මහණ කෙනෙක් වෙද්ද ඔහු අවඥා කෙරෙති නුගුණ කියති දොස් පහළ කෙරෙත්. "කෙසේ නම් ආයුෂ්මත් උපනන්දශාක්‍යපුත්‍රයෝ පිරිවැජියකු සමග කයවික්කයට ගණුදෙනුවට පැමිණියාහු දැ?යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ. සැබෑද, උපනන්දය, තෝ පිරිවැජියකු සමග ගණු-දෙනුවට පැමිණියෙහි ද"යි. "සැබව භාග්‍යවතුන් වහන්ස". භාග්‍යවත් බුදු-රජානන් වහන්සේ ගැරහූ සේක. "කෙසේ නම් තුච්ඡපුරුෂය, තෝ පිරිවැජ්-යකු සමග ගණුදෙනුවට පැමිණියෙහි ද? තුච්ඡපුරුෂය, නොප නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නොවෙයි. ... "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් නන් වැදෑරුම් ගණුදෙනුවට පැමිණේ නම් නිස්සගි-පචිති වේ"**යයි.

4. **ලයාපන** යනු: යමෙක්. යම්බඳු වූයෙක් ...

**භික්ඛු** යනු ... මෙතෙමේ මේ අර්ථයෙහි 'භික්ෂු'යි අදහස් කරණ ලදී.

**නානප්පකාරක** නම්: සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරය. යටත් පිරිසෙයින් සුණුපිඬකුදු දැහැටි දඬකුදු දවලු හුයකුදු.

**කයවික්කයං සමාපජ්ජෙය්‍ය** යනු: මෙයින් මෙය දෙව. මෙයින් මෙය ගෙණෙව. මෙයින් මෙය පෙරළි කරව. මෙයින් මෙය විකොට ගෙණෙව'යි සිකපද මඬි නම්, දුකුළාඇවැත් වේ. යම් කලෙක දෙනු ලදත් ගන්නා ලදත් වේ ද තමන් අයත් බඩු පර අත් ගියේ ද මෙරමා අයත් බඩු තමා අතට ගියේ ද, එකල්හි නිසගි වේ. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයාට හෝ නිසැජිය-යුතුය. තවද මහණෙනි, මෙසේ නිසැජිය යුතු:

"වහන්ස, මම නන්වැදෑරුම් කයවික්කයට පැමිණියෙමි. මාගේ මෙය නිසගි විය. මම මෙය සඟහට නිසජමි"යි ... දෙන්නේය යි ... දෙන්නාහ'යි ... ආයුෂ්මත්හට දෙමි'යි.

5. විනිමයෙහි විනිමය සත් ඇතියේ නිසගිපචිති වෙයි. විනිමයෙහි විමති ඇත්තේ නිසගිපචිති වෙයි. විනිමයෙහි විනිමය සත් නැතියේ නිසගිපචිති වේ. විනිමය නො වූයෙහි විනිමය ය යන සත් ඇත්තේ දුකුළා-ඇවැත් වෙයි. විනිමය නො වූයෙහි විමති ඇත්තේ දුකුළාඇවැත් වෙයි. විනි-මය නො වූයෙහි විනිමය නො වූයේ ය යන සත් ඇතියේ ඇවැත් නැති.

6. අගය විචාරා නම්, කැපකරුහට කියා නම්, මෙනම් දෙයක් අපට ඇත, අපට මේ මේ දෙයින් ප්‍රයොජනයයි කියා නම්, උමතු වූවහුට, ආදිකම්මිකයාට, ඇවැත් නැති.

**කයවික්කය ශික්ෂාපදය නිමි.**

---

# දෙවන කොසිය වගයි.

**එහි උද්දානය:**

කොසිය සිකපදය, සුද්ධකාලක සිකපදය, ද්වෙභාග සිකපදය, ජබ්බස්ස-සිකපදය, නිසීදන සන්ථත සිකපදය, එළකලොම ධොවන සිකපද දෙකය, රූපිය, රූපියසංවොහාර සිකපද දෙකය, කයවික්කය සිකපදයයි දසයකි.

---

# පත්තවග්ගො.

## 5. 3. 1.

## පත්තසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ බහූ පත්තෙ සන්නිචයං කරොන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා බහූ පත්තෙ සන්නිචයං කරිස්සන්ති, පත්තවාණිජ්ජං වා සමණා සක්‍යපුත්තියා කරිස්සන්ති, ආමත්තිකාපණං වා පසාරෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකපත්තං ධාරෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං: "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අතිරෙකපත්තං ධාරෙථා"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අතිරෙකපත්තං ධාරෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යො පන භික්ඛු අතිරෙකපත්තං ධාරෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියන්ති."

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

[මූලපඤ්ඤත්ති.]

2. තෙන ඛො පන සමයෙන ආයස්මතො ආනන්දස්ස අතිරෙකපත්තො උප්පන්නො හොති, ආයස්මා ච ආනන්දො තං පත්තං ආයස්මතො සාරිපුත්තස්ස දාතුකාමො හොති. ආයස්මා ච සාරිපුත්තො සාකෙතෙ විහරති. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: භගවතා සික්ඛාපදං පඤ්ඤත්තං: "න අතිරෙකපත්තො ධාරෙතබ්බො"ති. අයඤ්ච මෙ අතිරෙකපත්තො උප්පන්නො, අහඤ්චිමං පත්තං ආයස්මතො සාරිපුත්තස්ස දාතුකාමො. ආයස්මා ච සාරිපුත්තො සාකෙතෙ විහරති. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බන්ති." අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි.

# පත්තවග්ගය

## 5. 3. 1.

## පත්තශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩ වාසය කරණ සේක. එසමයෙහි සවගමහණහු බොහෝ පාත්‍ර රැස් කෙරෙති. විහාරචාරිකාවෙහි හැසිරෙන මිනිස්සු දැක හෙළා දකිති, නුගුණ පවසති, දොස් පතුරුවත්. "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ බොහෝ පාත්‍ර රැස් කෙරෙද්ද, ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ පාත්‍ර වෙළෙඳම හෝ කෙරෙද් ද, අමත්අවුණක් හෝ විවෘත කෙරෙත් දැ"යි. භික්ෂූහු හෙළා දකින, නුගුණ පවසන, දොස් පතුරුවන ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද ඔහු හෙළා දකිත්, නුගුණ පවසති, දොස් පතුරුවත්. "කෙසේ නම් සවග මහණහු අතිරේකපාත්‍ර දරද් දැ"යි. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මේපවත් සැල කළහ. "සැබෑද මහණෙනි, තෙපි අතිරේකපාත්‍ර දරවූ දැ"යි. "සැබෑව භාග්‍යවතුන් වහන්ස." භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ ගැරහූ සේක: "කෙසේ නම් තුච්ඡපුරුෂයෙනි, තෙපි අතිරේක පාත්‍ර දරවූ ද? තුච්ඡපුරුෂයෙනි, මෙය නොපහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නොවෙයි. ... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් අතිරේකපාත්‍ර දරා නම් නිස්සග්ගිපාචිත්ති වේ"යයි.**

මෙසේත් මේ සික‍පදය භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට පණවන ලද්දේ වේ.

**[මුල්පැණවිමයි.]**

2. එසමයෙහි ආයුෂමත් අනඳතෙරුන්ට අතිරේක පාත්‍රයෙක් උපන්නේ වෙයි. ආයුෂමත් ආනන්ද ස්ථවිරතෙමේ ඒ පාත්‍රය ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට දෙනු කැමැත්තේ වෙයි. ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සාකේතනුවර වසන සේක. ඉක්බිති ආයුෂමත් ආනන්දස්ථවිරයන් වහන්සේට මේ සිත විය: අතිරේක පාත්‍රයක් නො දැරියයුතු ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් සිකපද පණවන ලදී. මට මේ අතිරේක පාත්‍රයෙක් උපන. මම ද මේ පාත්‍රය ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට දෙනු කැමැත්තෙමි. ආයුෂමත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද සාකේතනුවර වෙසෙති. ම විසින් කෙසේ පිළිපැදිය යුතු දැ"යි. ඉක්බිති ආයුෂමත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට එපවත් සැල කළහ.

3. "කීව චිරං පනානන්ද සාරිපුත්තො ආගමිස්සතී"ති. "නවමං වා භගවා දිවසං දසමං වා"ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ දසාහපරමං අතිරෙක-පත්තං ධාරෙතුං". එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"දසාහපරමං අතිරෙකපත්තො ධාරෙතබ්බො, තං අතික්කාමයතො, නිස්සග්ගියං පාචිත්තියන්ති."**

**[දුතියපඤ්ඤත්ති.]**

4. **දසාහපරම**න්ති දසාහපරමතා ධාරෙතබ්බො.

**අතිරෙකපත්තො** නාම: අනධිට්ඨිතො අවිකප්පිතො.

**පත්තො** නාම: ද්වෙ පත්තා: අයොපත්තො මත්තිකාපත්තො. තයො පත්තස්ස වණ්ණා: උක්කට්ඨො පත්තො මජ්ඣිමො පත්තො ඔමකො පත්තො. උක්කට්ඨො නාම පත්තො අඩ්ඪාළ්හකොදනං ගණ්හාති චතුභාගං ඛාදනං° තදුපියං ච ව්‍යඤ්ජනං. මජ්ඣිමො නාම පත්තො නාළිකොදනං ගණ්හාති චතුභාගං ඛාදනං තදුපියං ච ව්‍යඤ්ජනං. ඔමකො නාම පත්තො පත්ථොදනං ගණ්හාති චතුභාගං ඛාදනං තදුපියං ච ව්‍යඤ්ජනං. තතො උක්කට්ඨො අපත්තො. ඔමකො අපත්තො.

**තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං හොතී**ති [එකාදසෙ පුග්ගලස්ස වා. නිස්සග්ගියො හොති.] නිස්සජ්ජිතබ්බො සඞ්ඝස්ස වා ගණස්ස වා අරුණුග්ගමෙ එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බො: තෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අයං මෙ භන්තෙ පත්තො දසාහාතික්කන්තො නිස්සග්ගියො. ඉමාහං සඞ්ඝස්ස නිස්ස-ජ්ජාමී"ති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨපත්තො දාතබ්බො.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං පත්තො ඉත්ථන්නාමස්ස භික්ඛුනො නිස්සග්ගියො සඞ්ඝස්ස නිස්සට්ඨො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉමං පත්තං ඉත්ථන්නාමස්ස භික්ඛුනො දදෙය්‍යා"ති.

තෙන භික්ඛුනා සම්බහුලෙ භික්ඛූ උපසඞ්කමිත්වා එකංසං උත්තරා-සඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්සු වචනීයා: "අයං මෙ භන්තෙ පත්තො දසාහාතික්කන්තො නිස්සග්ගියො. ඉමාහං ආයස්මන්තානං නිස්සජ්ජාමී"ති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨපත්තො දාතබ්බො.

"සුණන්තු මෙ ආයස්මන්තා. අයං පත්තො ඉත්ථන්නාමස්ස භික්ඛුනො නිස්සග්ගියො ආයස්මන්තානං නිස්සට්ඨො. යදායස්මන්තානං පත්තකල්ලං, ආයස්මන්තා ඉමං පත්තං ඉත්ථන්නාමස්ස භික්ඛුනො දදෙය්‍යු"න්ති.

---

[-] සිමු. නත්ථි

3. "ආනන්දය, ශාරිපුත්‍ර තෙමේ කොපමණ කලකින් එන්නේ දැ?"යි. "භාග්‍යවතුන් වහන්ස, නවවැනි හෝ දසවැනි දවසැ"යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි මේ ප්‍රස්තාවයෙහි දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, දස දිනක් පරම කොට අතිරේක-පාත්‍රයක් දරන්නට අනුදනිමි". "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:"

**"දස දිනක් පරම කොට ඇති කල් අතිරේක පාත්‍රයක් දැරිය යුතුයි. එය ඉක්මවන්නහුට නිසග්ගිපචිති වේ" යයි.**

**[දෙවන පැණවීමයි.]**

4. **දසාහපරමං** යනු: දසදවසක් පරම කොට ඇති කල් දැරිය යුත්තේ ය.

**අතිරේක පත්ත** නම්: නො ඉටන ලදුයේ නො විකපන ලදුයේ යැ.

**පත්ත** නම්: පාත්‍ර දෙකෙකි: අයස්පාත්‍ර යැ මෘත්තිකාපාත්‍ර යි. පාත්‍රයාගේ ප්‍රමාණයෝ තිදෙනෙකි: උත්කෘෂ්ටපාත්‍ර යැ මධ්‍යමපාත්‍ර යැ අවමකපාත්‍ර යි. උත්කෘෂ්ටපාත්‍රය නම්: සහල් දෙනැළියක බත් ද බතින් සතරභාගයක ඛාද්‍ය ද ඊට අනුරූප වූ ව්‍යඤ්ජන ද ගණී. මධ්‍යමපාත්‍රය නම්: සහල් නැළියක බත් ද බතින් සතරභාගයක ඛාද්‍ය ද ඊට අනුරූප වූ ව්‍යඤ්ජන ද ගණී. අවමකපාත්‍රය නම්: සහල් අඩනැළියක බත් ද බතින් සතරභාගයක ඛාද්‍ය ද ඊට අනුරූප වූ ව්‍යඤ්ජන ද ගණී. එයින් උත්කෘෂ්ට වූයේ පාත්‍ර නො වෙයි. අවමක වූයේ පාත්‍ර නො වේ.

**තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං හොති** යනු: එකොළොස් වන අරුණ නැගෙන කල්හි නිසගි වෙයි. සඟනට හෝ ගණයාට හෝ පුද්ගලක්හට හෝ නිසැජියයුතු ය. තවද මහණෙනි, මෙසේත් නිසැජිය යුත්තේ ය: ඒ මහණහු විසින් සඟුන් වෙත එළඹ උතුරුසඟ එකස් කොට මහලු භික්ෂූන් පා වැඳ උළුළු වැ හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය: 'වහන්ස, මේ මාගේ පාත්‍රය දස දවසක් ඉක්මගියේ නිසගි විය. මෙය මම් සඟනට නිසජමි'යි. නිසජා ඇවැත් දෙසියයුතු ය. ප්‍රතිබල වූ ව්‍යක්ත මහණක්හු විසින් ඇවැත් පිළිගතයුතු ය. නිසජන ලද පාත්‍රය දියයුත්තේ යි.

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. මේ මෙනම් මහණහුගේ පාත්‍රය නිසගි වූයේ සඟනට නිසදන ලද්දේ ය. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් වේ නම් සඞ්ඝ තෙමේ මේ පාත්‍රය මෙනම් මහණහට දෙන්නේය"යි.

ඒ මහණහු විසින් බොහෝ භික්ෂූන් වෙත එළඹ උතුරුසඟ එකස් කොට මහලු භික්ෂූන් පා වැඳ අඬදූණිව හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුත්තාහ. "වහන්ස, මේ මාගේ පාත්‍රය දස දවසක් ඉක්මගියේ නිසගි විය. මම මෙය ආයුෂ්මතුන්හට නිසජමි"යි නිසඳ ඇවැත් දෙසිය යුතුයි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් ඇවැත් පිළිගත යුතු ය. නිසජන ලද පාත්‍රය දියයුත්තේ යි.

"ආයුෂ්මත්නි, මා කියන්නක් අසත්වා" මේ මෙනම් මහණහුගේ පාත්‍රය නිසගි වූයේ ආයුෂ්මතුන්හට නිසදන ලදී. ඉදින් ආයුෂ්මතුන්හට පැමිණි කල් වේ නම් ආයුෂ්මත්හු මේ පාත්‍රය මෙනම් මහණහට දෙත්තාහ" යි.

5. තෙන භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අයං මෙ ආවුසො පත්තො දසාහාතික්කන්තො නිස්සග්ගියො. ඉමාහං ආයස්මතො නිස්සජ්ජාමී"ති නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. තෙන භික්ඛුනා ආපත්ති පටිග්ගහෙතබ්බා. නිස්සට්ඨපත්තො දාතබ්බො: "ඉමං පත්තං ආයස්මතො දම්මී"ති.

6. දසාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. දසාහාතික්කන්තෙ වෙමතිකො, නිස්සග්ගියං පාචිත්තියං. දසාහාතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අනධිට්ඨිතෙ අධිට්ඨිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිකප්පිතෙ විකප්පිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අනට්ඨෙ නට්ඨසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අභින්නෙ භින්නසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අවිලුත්තෙ විලුත්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. නිස්සග්ගියං පත්තං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. දසාහානතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. දසාහානතික්කන්තෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. දසාහානතික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී අනාපත්ති.

7. අනාපත්ති අන්තොදසාහං අධිට්ඨාති,[1] විකප්පෙති, විස්සජ්ජෙති, නස්සති, විනස්සති, භිජ්ජති, අච්ඡින්දිත්වා ගණ්හන්ති, විස්සාසං ගණ්හන්ති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

8. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නිස්සට්ඨපත්තං න දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "න භික්ඛවෙ නිස්සට්ඨපත්තො න දාතබ්බො. යො න දදෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

**පත්තසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 3. 2.

## ඌනපඤ්චබන්ධන සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන කුම්භකාරෙන භික්ඛූ පවාරිතා හොන්ති: "යෙසං අය්‍යානං පත්තෙන අත්ථො අහං පත්තෙනා"ති. තෙන ඛො පන සමයෙන භික්ඛූ න මත්තං ජානිත්වා බහූ පත්තෙ විඤ්ඤාපෙන්ති. යෙසං ඛුද්දකා පත්තා තෙ මහන්තෙ පත්තෙ විඤ්ඤාපෙන්ති. යෙසං මහන්තා පත්තා තෙ ඛුද්දකෙ පත්තෙ විඤ්ඤාපෙන්ති. අථ ඛො සො කුම්භකාරො භික්ඛූනං බහූ පත්තෙ කරොන්තො න සක්කොති අඤ්ඤං වික්කායිකං භණ්ඩං කාතුං. අත්තනාපි න යාපෙති. පුත්තදාරාපිස්ස කිලමන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා න මත්තං ජානිත්වා බහූ පත්තෙ විඤ්ඤාපෙස්සන්ති.—

1. අධිට්ඨෙති. ම.ඡ.සං.

5. ඒ මහණහු විසින් එක් මහණක්හු වෙත එළඹ උතුරුසඟ එකස් කොට අඩදණිව හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුත්තේ ය. "ඇවැත්නි, මේ මාගේ පාත්‍රය දස දවසක් ඉක්මගියේ නිසඟි විය. මම මෙය ආයුෂ්මත්හට නිසදමි"යි නිසඳ, ඇවැත් දෙසිය යුතුය. ඒ මහණහු විසින් ඇවැත් පිළිගතයුතුය. "මේ පාත්‍රය ආයුෂ්මත්හට දෙමි"යි නිසදූ පය (ඔහුට) දියයුතු.

6. දස දින ඉක්ම ගියෙහි ඉක්මගිය සත් ඇතියේ නිසඟිපචිති වෙයි. දස දින ඉක්ම ගියෙහි විමති ඇතියේ නිසඟිපචිති වෙයි. දස දින ඉක්ම ගියෙහි, නො ඉක්මිනැ'යි සත් ඇතියේ නිසඟිපචිති වේ. නො ඉටන ලදුයෙහි 'ඉටන ලදූ'යි සත් ඇතියේ නිසඟිපචිති වෙයි. නො විකපන ලදුයෙහි 'විකපන ලදූ' යි සත් ඇතියේ නිසඟිපචිති වෙයි. නොවිසජන ලදුයෙහි 'විසජන ලදූ' යි සත් ඇතියේ නිසඟිපචිති වෙයි. නොනටුයෙහි 'නටැ' යි සත් ඇතියේ නිසඟිපචිති වෙයි. නොවැනැසුනෙහි 'වැනැසිනැ'යි සත් ඇතියේ නිසඟිපචිති වෙයි. නො බිඳුනෙහි 'බිඳිනැ'යි සත් ඇතියේ නිසඟිපචිති වෙයි. නො පැහැරගන්නා ලදුයෙහි 'පැහැරගන්නා ලදූ'යි සත් ඇතියේ නිසඟිපචිති වේ. නිසඟි වූ පාත්‍රය නො නිසජා පරිභොග කෙරේ නම් දුකුළාඇවැත් වෙයි. දසදවසක් නොඉක්මගියෙහි 'ඉක්මිණැ'යි සත් ඇතියේ දුකුළාඇවැත් වෙයි. දසදවසක් නො ඉක්මගියෙහි විමති ඇතියේ දුකුළාඇවැත් වෙයි. දසදවසක් නොඉක්මගියෙහි 'නො ඉක්මිණැ'යි සත් ඇතියේ ඇවැත් නැති.

7. ඇතුළු දසදවසැ ඉටා නම්, විකපා නම්, විසජා නම්, නැසේ නම්, වැනැසේ නම්, බිදේ නම්, අසිදෑ ගණිත් නම්, විස්වැසි වැ ගණිත් නම්, උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

8. තවද එසමයෙහි සවගමහණනු නිස්සජනය කළ පාත්‍රය නො දෙති. භාග්‍යවතුන් වහන්සේට එපවත් දැන්වූහ. "මහණෙනි, නිස්සජනය කළ පාත්‍රය නො දියයුත්තේ නො වෙයි. යමෙක් නො දේ නම් දුකුළාඇවැත්වේ" යයි.

**පතනශික්ෂාපදය නිමි.**

---

## 5. 3. 2.

## ඌනපඤ්චබන්ධන ශික්ෂාපදය.

1 එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ශාක්‍යජනපදයෙහි වූ කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩ වෙසෙති. එසමයෙහි එක්තරා කුඹල්-කරුවකු විසින් භික්ෂූහු පවරණ ලද්දහු වෙත්. "යම් ආර්‍ය්‍යයන් වහන්සේ කෙනකුන්ට පාත්‍රයෙන් ප්‍රයෝජන වේ නම් මම පාත්‍රයෙන් පවරමි'යි. එසමයෙහි මහණහු පමණ නො දැන බොහෝ පා විනවත්. යම් කෙනකුන්ගේ කුඩා පාත්‍රයෝ වෙද්ද, ඔහු මහත් පා විනවත්. යම් කෙනකුන්ගේ මහත් පාත්‍රයෝ වෙද්ද, ඔහු කුඩා පා විනවත්. ඉක්බිති ඒ කුඹල්කරු තෙමේ භික්ෂූන්ට බොහෝ පාත්‍ර ඉදිකරන්නේ අනිත් විකිණිය යුතු බඩුවක් කරන්නට නො හැකි වෙයි. තෙමේ ද නො යැපෙයි. ඔහුගේ අඹුදරුවෝ ද වෙහෙසෙති. මිනිස්සු හෙලා දකිත්, නුගුණ පවසත්, දෙස් පතළ කෙරෙත්. "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ පමණ නො දැන බොහෝ පා විනවද්ද.—

අයං ඉමෙසං බහූ පත්තෙ කරොන්තො න සක්කොති අඤ්ඤං වික්කායිකං භණ්ඩං කාතුං. අත්තනාපි න යාපෙති. පුත්තදාරාපිස්ස කිලමන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ න මත්තං ජානිත්වා බහූ පත්තෙ විඤ්ඤාපෙස්සන්තී"ති.

2. "අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ න මත්තං ජානිත්වා බහූ පත්තෙ විඤ්ඤාපෙන්තීති?" "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා න මත්තං ජානිත්වා බහූ පත්තෙ විඤ්ඤාපෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ පත්තො විඤ්ඤාපෙතබ්බො, යො විඤ්ඤාපෙය්‍ය, ආපත්ති දුක්කටස්සාති."

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පත්තො භින්නො හොති. අථ ඛො සො භික්ඛු "භගවතා පටික්ඛිත්තං පත්තං විඤ්ඤාපෙතුන්ති" කුක්කුච්චායන්තො න විඤ්ඤාපෙති. හත්ථෙසු පිණ්ඩාය චරති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා හත්ථෙසු පිණ්ඩාය චරිස්සන්ති, සෙය්‍යථාපි අඤ්ඤ[1]තිත්ථියා"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ නට්ඨපත්තස්ස වා භින්නපත්තස්ස වා පත්තං විඤ්ඤාපෙතුන්ති".

4. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "භගවතා අනුඤ්ඤාතං නට්ඨපත්තස්ස වා භින්නපත්තස්ස වා පත්තං විඤ්ඤාපෙතුන්ති," තෙ[2] අප්පමත්තකෙනපි භින්නෙන අප්පමත්තකෙනපි ඛණ්ඩෙන විලිඛිතමත්තෙනපි බහූ පත්තෙ විඤ්ඤාපෙන්ති. අථ ඛො සො කුම්භකාරො භික්ඛූනං තථෙව බහූ පත්තෙ කරොන්තො න සක්කොති අඤ්ඤං වික්කායිකං භණ්ඩං කාතුං. අත්තනාපි න යාපෙති. පුත්තදාරාපිස්ස කිලමන්ති. මනුස්සා තථෙව උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා න මත්තං ජානිත්වා බහූ පත්තෙ විඤ්ඤාපෙස්සන්ති. අයං ඉමෙසං බහූ පත්තෙ කරොන්තො න සක්කොති අඤ්ඤං වික්කායිකං භණ්ඩං කාතුං. අත්තනාපි න යාපෙති. පුත්තදාරාපිස්ස කිලමන්තී"ති.

5. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අප්පමත්තකෙනපි භින්නෙන අප්පමත්තකෙනපි ඛණ්ඩෙන විලිඛිතමත්තෙනපි බහූ පත්තෙ විඤ්ඤාපෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අප්පමත්තකෙනපි භින්නෙන අප්පමත්තකෙනපි ඛණ්ඩෙන විලිඛිතමත්තෙනපි බහූ පත්තෙ විඤ්ඤාපෙථා"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අප්පමත්තකෙනපි භින්නෙන අප්පමත්තකෙනපි ඛණ්ඩෙන විලිඛිතමත්තෙනපි බහූ පත්තෙ විඤ්ඤාපෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

---

1 'අඤ්ඤ.' ඉති ච   2. 'තෙ' ඉති ච මජසං නදිස්සතෙ.

මේ තෙමේ මොවුනට බොහෝ පා ඉදිකරන්නේ අතින් විකිණිය යුතු බඩුවක් කරන්නට නො හැකි වෙයි. තෙමේ ද නො යැපෙයි. ඔහුගේ අඹුදරුවෝ ද වෙහෙසෙතැ'යි. මහණහු හෙලා දකින නුගුණ පවසන දෙස් පහළ කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද, ඔහු හෙලා දකිත්, නුගුණ පවසත්, දෙස් පහළ කෙරෙත්. "කෙසේ නම් මහණහු පමණ නො දන බොහෝ පා විනවූහුද'යි.

2. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළහ. ... "සැබෑද, මහණෙනි, භික්ෂූහු පමණ නො දන බොහෝ පා විනවද්ද"යි. "සැබව භාග්‍යවතුන් වහන්ස." භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක: "කෙසේ නම් මහණෙනි, ඒ තුච්ඡපුරුෂයෝ පමණ නො දන බොහෝ පා විනවූහු ද, මහණෙනි, එය නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. ... ගරහා දැහැමි කථා වදාරා භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, පාත්‍රයෙක් විනවා නො ගත යුතුය. යමෙක් විනවා නම් දුකුළා-ඇවැත් වේ"යයි.

3. එසමයෙහි එක්තරා මහණක්හුගේ පාත්‍රය බිඳුනේ වෙයි. ඉක්බිති ඒ මහණ තෙමේ 'භාග්‍යවතුන් වහන්සේ විසින් පාත්‍රය විනවා ගැණීම පිළිකෙව් කරණ ලද්දැ'යි කුකුස් කරන්නේ නො විනවයි. අතින් පිඬු සිඟා යෙයි. මිනිස්සු හෙලා දකිති, නුගුණ පවසති, දෙස් පහළ කෙරෙත්. "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ අන් තොටුවන් සේ අතින් පිඬු සිඟා හැසිරෙත් දැ"යි. භික්ෂූහු හෙලා දකින, නුගුණ පවසන, දෙස් පහළ කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. ඉක්බිති භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එපවත් සැළ කළාහු ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කථා වදාරා භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, නට පා ඇතියහුට හෝ බුන් පා ඇතියහුට හෝ පයක් විනවා ගන්නට අනුදනිමි"යි.

4. එසමයෙහි සවග මහණහු 'භාග්‍යවතුන් වහන්සේ විසින් නට පා ඇතියහුට හෝ බුන් පා ඇතියහුට හෝ පයක් විනවා ගන්නට අනුදන්නා ලද්දැ'යි ඒ මහණහු මඳක් බුන් පමණකිනුදු, මඳක් කැඩුනු පමණකිනුදු ඉරි ගැසුනු පමණකිනුදු, බොහෝ පා විනවා ගණිත්. ඉක්බිති ඒ කුඹල්කරු තෙමේ භික්ෂූන්ට එසේ ම බොහෝ පා ඉදිකරන්නේ අත් විකිණියයුතු බඩුවක් කරන්නට නොහැකි වෙයි. තෙමේ ද නො යැපෙයි. ඔහුගේ අඹුදරුවෝ ද වෙහෙසෙත්. මිනිස්සු එසේ ම හෙලා දකිති, නුගුණ පවසති, දෙස් පහළ කෙරෙත්: "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ පමණ නො දන බොහෝ පා විනවා ගණිත් ද, මේ තෙමේ මොවුනට බොහෝ පා ඉදිකරන්නේ අත් විකිණිය යුතු බඩුවක් කරන්නට නො හැකි වෙයි. තෙමේත් නො යැපෙයි. ඔහුගේ අඹුදරුවෝත් වෙහෙසෙතැ"යි.

5. භික්ෂූහු හෙලා දකින, නුගුණ පවසන, දෙස් පහළ කරණ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද, ඔහු හෙලා දකිති, නුගුණ පවසති, දෙස් පහළ කෙරෙත්: "කෙසේ නම් සවග මහණහු මඳක් බුන් පමණින් මඳක් කැඩුනු පමණින් ඉරි ගැසුනු පමණින් බොහෝ පා විනවද්ද"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එපවත් සැළ කළහ. "සැබෑද, මහණෙනි, තෙපි මඳක් බුන් පමණින් මඳක් කැඩුනු පමණින් ඉරි ගැසුනු පමණින් බොහෝ පා විනවවු ද?"යි. "සැබව, භාග්‍යවතුන් වහන්ස." භාග්‍යවත් බුදුරජානන් වහසේ ගැරහූ සේක. "කෙසේ නම් තුච්ඡපුරුෂයෙනි, තෙපි මඳක් බුන් පමණින් මඳක් කැඩුනු පමණින් ඉරි ගැසුනු පමණින් බොහෝ පා විනවූහුද?. "තුච්ඡපුරුෂයෙනි, තෙල නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. ... "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

"යො පන භික්ඛු ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං. තෙන භික්ඛුනා සො පත්තො භික්ඛුපරිසාය නිස්සජ්ජිතබ්බො. යො ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තො සො තස්ස භික්ඛුනො පදාතබ්බො 'අයං තෙ භික්ඛු පත්තො යාව භෙදනාය ධාරෙතබ්බො'ති. අයං තත්ථ සාමීචී"ති.

6. යො පනාති යො යාදිසො -පෙ-

භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ඌනපඤ්චබන්ධනො** නාම පත්තො: අබන්ධනො වා එකබන්ධනො වා ද්විබන්ධනො වා තිබන්ධනො වා චතුබන්ධනො වා. අබන්ධනොකාසො නාම පත්තො: යස්ස ද්වඞ්ගුලා රාජි න හොති. බන්ධනොකාසො නාම පත්තො: යස්ස ද්වඞ්ගුලා රාජි හොති. නවො නාම පත්තො: විඤ්ඤත්තිං උපාදාය වුච්චති.

**චෙතාපෙය්‍යාති** විඤ්ඤාපෙති, පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියො හොති. සඞ්ඝමජ්ඣෙ නිස්සජ්ජිතබ්බො. සබ්බෙහෙව අධිට්ඨිතපත්තං ගහෙත්වා සන්නිපතිතබ්බං. න ලාමකො පත්තො අධිට්ඨාතබ්බො "මහග්ඝං පත්තං ගහෙස්සාමී"ති. සචෙ ලාමකං පත්තං අධිට්ඨාති "මහග්ඝං පත්තං ගහෙස්සාමී"ති, ආපත්ති දුක්කටස්ස.

එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බො: තෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'අයං මෙ භන්තෙ පත්තො ඌනපඤ්චබන්ධනෙන පත්තෙන චෙතාපිතො නිස්සග්ගියො. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති. නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පත්තග්ගාහාපකො සම්මන්නිතබ්බො. යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: "පඨමං භික්ඛු යාචිතබ්බො, යාචිත්වා බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:"

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං පත්තග්ගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං පත්තග්ගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො පත්තග්ගාහාපකස්ස සම්මුති, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු පත්තග්ගාහාපකො, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

"යම් මහණෙක් උනුපස්බාන් පා ඇතියාව අනිත් අලුත් පයක් විනවා ගණී නම් නිසග්ගපචිති වේ. ඒ මහණහු විසින් ඒ විනවූ පය මහණපිරිස්හි නිසජිය යුතුය. ඒ මහණපිරිසෙහි පයඅන්තයෙහි ලද යම් පාත්‍රයෙක් වේ ද එය ඒ මහණහට දියයුතු: මහණ, තා විසින් මේ පාත්‍රය බිඳීම දක්වා දැරියයුත්තේ' යයි. මේ එහි වත"යි.

6. යො පන යනු: යමෙක් යම්බඳු වූයෙක් ...

භික්ඛු යනු: ... මේ තෙම මේ අර්ථයෙහි 'භික්ෂු'යි අදහස් කරණ ලදී.

ඌනපඤ්චබන්ධනපත්ත නම්: බැඳුම් නැතියේ හෝ එක් බැඳුමක් ඇතියේ හෝ දෙබැඳුමක් ඇතියේ හෝ තුන්බැඳුමක් ඇතියේ හෝ සතර බැඳුමක් ඇතියේ හෝ යි. අබන්ධනොකාසපත්ත නම්: යමක්හුගේ දෑගුල්-හිරෙක් නො වේ ද ඒ යැ. බන්ධනොකාසපත්ත නම්: යමක්හුගේ දෑගුල්-හිරෙක් වේ ද ඒ යැ. නවපත්ත නම්: විඤ්ඤත්තිය සඳහා කියනු ලැබේ.

චේතාපෙය්‍ය යනු: විනවා නම් පියෝගි දුකුළා වෙයි, ලැබීමෙන් නිසගි වෙයි. සඟමැද නිසැජියයුතු. සියල්ලන් විසින් මැ ඉටූ පාත්‍රය ගෙණ රැස්වියයුතු ය. (මාහැගි පාත්‍රයක් ගන්නෙමි.යි) ලාමකපාත්‍රයෙක් නො ඉටියයුතු. ඉදින් (මාහැගි පාත්‍රයක් ගන්නෙමි'යි) ලාමක පාත්‍රයක් ඉටා නම් දුකුළාඇවැත් වෙයි.

තවද මහණෙනි, මෙසේ නිසැජියයුතු: ඒ මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට පෙරෙව මහලු භික්ෂූන් පා වැඳ උළුල්ලෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ: 'වහන්ස, මේ මාගේ පාත්‍රය උනුපස්බානින් යුක්ත වැ විනවා ගන්නා ලදුයේ නිසගි විය. මම් මෙය සඟනට නිසජමි'යි. නිසජා ඇවැත් දෙසියයුතු. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් ඇවැත් පිළිගතයුතු.

පසඟකින් යුත් පත්තගාහාපක මහණ තෙම සම්මත කළයුත්තේ යැ: යමෙක් ඡන්දාගතියට නො යේ ද දෙසාගතියට නො යේ ද මොහාගතියට නොයේ ද භයාගතියට නො යේ ද ගත් නො ගත් බව දනී ද හෙතෙමේ යි. තවද මහණෙනි, මෙසේ සම්මත කළයුත්තේ ය: පළමු කොට මහණ තෙම අයැදිය යුත්තේ ය. අයැද ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙම මෙනම් මහණහු පත්තගාහාපක කොට සම්මත කරන්නේ ය. මේ 'ඤත්ති,යැ,

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්නක් අසාවා සඞ්ඝ තෙම මෙනම් මහණහු පත්තගාහාපක කොට සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතක්හට මෙනම් මහණහුගේ පත්තගාහාපක සම්මතිය රිසි වේ නම් හේ තුෂ්ණීම්භූත වන්නේ ය. යමක්හට නො රිසි වේ නම් හේ කියන්නේ ය.

සඞ්ඝයා විසින් පත්තගාහාපක වූ මෙනම් මහණ තෙම සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රිසි වෙයි. එහෙයින් මේ තුෂ්ණීම්භාවය යි. මෙසේ තෙල තුෂ්ණීම්භාවය ධරමි"යි

තෙන සම්මතෙන භික්ඛුනා පත්තො ගාහෙතබ්බො. ථෙරො වත්තබ්බො: "ගණ්හාතු භන්තෙ ථෙරො පත්ත"න්ති. සචෙ ථෙරො පත්තං[1] ගණ්හාති, ථෙරස්ස පත්තො දුතියස්ස ගාහෙතබ්බො. න ච තස්ස අනුද්දයතාය න ගහෙතබ්බො. යො න ගණ්හෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අපත්තකස්ස න ගාහෙතබ්බො. එතෙනෙව උපායෙන යාව සඞ්ඝනවකා ගාහාපෙතබ්බො. යො ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තො සො තස්ස භික්ඛුනො පදාතබ්බො: "අයං තෙ භික්ඛු පත්තො යාව භෙදනාය ධාරෙතබ්බො"ති. තෙන භික්ඛුනා සො පත්තො න අදෙසෙ නික්ඛිපිතබ්බො, න අභොගෙන භුඤ්ජිතබ්බො, න විස්සජ්ජෙතබ්බො, 'කථායං පත්තො නස්සෙය්‍ය වා විනස්සෙය්‍ය වා භිජ්ජෙය්‍ය වා'ති. සචෙ අදෙසෙ වා නික්ඛිපති අභොගෙන වා භුඤ්ජති විස්සජ්ජෙති වා, ආපත්ති දුක්කටස්ස.

**අයං තත්ථ සාමීචීති** අයං තත්ථ අනුධම්මතා.

7. අබන්ධනෙන පත්තෙන අබන්ධනං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං. අබන්ධනෙන පත්තෙන එකබන්ධනං පත්තං -පෙ- ද්විබන්ධනං පත්තං -පෙ- තිබන්ධනං පත්තං -පෙ- චතුබන්ධනං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

8. එකබන්ධනෙන පත්තෙන අබන්ධනං පත්තං -පෙ- එකබන්ධනං පත්තං -පෙ- ද්විබන්ධනං පත්තං -පෙ- තිබන්ධනං පත්තං -පෙ- චතුබන්ධනං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

9. ද්විබන්ධනෙන පත්තෙන අබන්ධනං පත්තං -පෙ- එකබන්ධනං පත්තං -පෙ- ද්විබන්ධනං පත්තං -පෙ- තිබන්ධනං පත්තං -පෙ- චතුබන්ධනං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

10. තිබන්ධනෙන පත්තෙන අබන්ධනං පත්තං -පෙ- එකබන්ධනං පත්තං -පෙ- ද්විබන්ධනං පත්තං -පෙ- තිබන්ධනං පත්තං -පෙ- චතුබන්ධනං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

11. චතුබන්ධනෙන පත්තෙන අබන්ධනං පත්තං -පෙ- එකබන්ධනං පත්තං -පෙ- ද්විබන්ධනං පත්තං -පෙ- තිබන්ධනං පත්තං -පෙ- චතුබන්ධනං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

12. අබන්ධනෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං චෙතාපෙති, පාචිත්තියං. අබන්ධනෙන පත්තෙන එකබන්ධනොකාසං පත්තං නිස්සග්ගියං. -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති. නිස්සග්ගියං පාචිත්තියං.

13. එකබන්ධනෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං,

1. පත්තං. ම.ජ.ස. නදිස්සතෙ.

ඒ සම්මත මහණහු විසින් පාත්‍රය ගැන්වියයුතු. ‘වහන්ස, තෙරණුවෝ පාත්‍රය ගණිත්වා’යි සඵවිර මහණහට කියයුතු ය. ඉදින් තෙරහු පාත්‍රය ගණිත් නම් තෙරුන්ගේ පාත්‍රය දෙවැන්නාට ගැන්වියයුතු ය. ඔහුට දයා ඇති බැවින් නො ද නො ගතයුත්තේ ය. යමෙක් නො-ගණී නම් දුකුළාඇවැත් වෙයි. පාත්‍රයක් නැත්තහුට නො ගැන්වියයුතු ය. මෙතයින් සඞ්ඝනවකයා තෙක් ගැන්වියයුතු ය. ඒ මහණපිරිසෙහි යම් පර්‍ය්‍යන්තපාත්‍රයෙක් වේ නම් එය ඒ මහණහට දියයුතුය. ‘මහණ, මේ පය තා විසින් බිඳීම තෙක් දැරියයුතු’යයි. ඒ මහණහු විසින් ඒ පාත්‍රය ‘කෙසේ නම් මේ පාත්‍රය නැසේ හෝ වැනසේ හෝ බිදේ හෝ යැ’යි නුසුදුසු තන්හි නො තැබියයුතු ය. නුසුදුසු පරිභොගයෙන් නො වැළඳියයුතු ය. නො විසජියයුතු. ඉදින් නුසුදුසු තන්හි තබා නම් හෝ නුසුදුසු පරිභොගයෙන් වළඳා නම් හෝ විසජා නම් හෝ දුකුළාඇවැත් වේ.

**අයං තත්‍ථ සාමීචි යනු: එහිලා මේ ලොවුතුරු දහම්අනුව ගිය මඟ යි.**

7. බන්ධන නැති පාත්‍රයෙන් යුක්ත ව බන්ධන නැති පාත්‍රයක් විනවා ගණී නම් නිසගිපචිතිඇවැත් වෙයි. බන්ධන නැති පාත්‍රයෙන් යුක්ත ව එක් බන්ධනයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනයක් ඇති පාත්‍රයක් විනවා ගණී නම් නිසගිපචිති වේ.

8. එක් බැඳුමක් ඇති පාත්‍රයෙන් යුක්තව බැඳුම් නැති පාත්‍රයක් .... එක් බැඳුමක් ඇති පාත්‍රයක් .... දෙ බැඳුමක් ඇති පාත්‍රයක් ... තුන් බැඳුමක් ඇති පාත්‍රයක් ... සතර බැඳුමක් ඇති පාත්‍රයක් විනවා ගණී නම් නිසගි-පචිති වේ.

9. දෙ බැඳුමක් ඇති පාත්‍රයෙන් යුක්ත ව බැඳුම් නැති පාත්‍රයක් ... එක් බැඳුමක් ඇති පාත්‍රයක් ... දෙ බැඳුමක් ඇති පාත්‍රයක් ... තුන් බැඳුමක් ඇති පාත්‍රයක් ... සතර බැඳුමක් ඇති පාත්‍රයක් විනවා ගණී නම් නිසගිපචිති වේ.

10. තුන් බැඳුමක් ඇති පාත්‍රයෙන් යුක්තව බැඳුම් නැති පාත්‍රයක්... එක් බැඳුමක් ඇති පාත්‍රයක් .... දෙ බැඳුමක් ඇති පාත්‍රයක් ... තුන් බැඳුමක් ඇති පාත්‍රයක් ... සතර බැඳුමක් ඇති පාත්‍රයක් විනවා ගණී නම් නිසගිපචිති වේ.

11. සතර බැඳුමක් ඇති පාත්‍රයෙන් යුක්ත ව බැඳුම් නැති පාත්‍රයක් ... එක් බැඳුමක් ඇති පාත්‍රයක් ... දෙ බැඳුමක් ඇති පාත්‍රයක් ... තුන් බැඳුමක් ඇති පාත්‍රයක් ... සතර බැඳුමක් ඇති පාත්‍රයක් විනවා ගණී නම් නිසගි-පචිති වේ.

12. බැඳුම් නැති පාත්‍රයෙන් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් විනවා ගණී නම් නිසගිපචිති වෙයි. බැඳුම් නැති පාත්‍රයෙන් යුක්ත ව එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක්. විනවා ගණී නම් නිසගිපචිති වේ,

13. එක් බැඳුමක් ඇති පාත්‍රයෙන් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක්... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනාව-කාශයක් ඇති පාත්‍රයක් විනවා ගණී නම් නිසගිපචිති වේ.

14. ද්විබන්ධනෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ-චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

15. තිබන්ධනෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

16. චතුබන්ධනෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

17. අබන්ධනොකාසෙන පත්තෙන අබන්ධනං පත්තං -පෙ- එකබන්ධනං පත්තං -පෙ- ද්විබන්ධනං පත්තං -පෙ- තිබන්ධනං පත්තං -පෙ- චතුබන්ධනං පත්තං -පෙ- එකබන්ධනොකාසෙන පත්තෙන -පෙ- ද්විබන්ධනොකාසෙන පත්තෙන -පෙ- තිබන්ධනොකාසෙන පත්තෙන -පෙ- චතුබන්ධනොකාසෙන පත්තෙන අබන්ධනං පත්තං -පෙ- එකබන්ධනං පත්තං -පෙ- චතුබන්ධනං පත්තං -පෙ- අබන්ධනොකාසෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

18. එකබන්ධනොකාසෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

19. ද්විබන්ධනොකාසෙන පත්තෙන -පෙ- තිබන්ධනොකාසෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

20. චතුබන්ධනොකාසෙන පත්තෙන අබන්ධනොකාසං පත්තං -පෙ- එකබන්ධනොකාසං පත්තං -පෙ- ද්විබන්ධනොකාසං පත්තං -පෙ- තිබන්ධනොකාසං පත්තං -පෙ- චතුබන්ධනොකාසං පත්තං චෙතාපෙති, නිස්සග්ගියං පාචිත්තියං.

21. අනාපත්ති නට්ඨපත්තස්ස, භින්නපත්තස්ස, ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**ඌනපඤ්චබන්ධනසික්ඛාපදං නිට්ඨිතං.**

14. දෙ බැඳුමක් ඇති පාත්‍රයෙන් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් ... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් විතවා ගණී නම් නිසග්ගිපච්ති වේ.

15. තුන් බැඳුමක් ඇති පාත්‍රයෙන් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් ... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... විතවා ගණී නම් නිසග්ගිපච්ති වේ.

16. සතර බැඳුමක් ඇති පාත්‍රයකින් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් .... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... ද්විබන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් විතවා ගණී නම් නිසග්ගිපච්ති වේ.

17. බන්ධනාවකාශ නැති පාත්‍රයකින් යුක්ත ව බන්ධන නැති පාත්‍රයක් ... එක් බන්ධනයක් ඇති පාත්‍රයක් ... ද්විබන්ධනයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනයක් ඇති පාත්‍රයක් ... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව ... ද්විබන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව ... සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව බන්ධන නැති පාත්‍රයක් ... එක් බන්ධනයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනයක් ඇති පාත්‍රයක් ... බන්ධනාවකාශ නැති පාත්‍රයකින් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් ... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... ද්විබන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් විතවා ගණී නම් නිසග්ගිපච්ති වේ.

18. එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් ... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් විතවා ගණී නම් නිසග්ගිපච්ති වේ.

19. දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් ... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් විතවා ගණී නම් නිසග්ගිපච්ති වේ.

20. සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයකින් යුක්ත ව බන්ධනාවකාශ නැති පාත්‍රයක් ... එක් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... දෙ බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... තුන් බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් ... සතර බන්ධනාවකාශයක් ඇති පාත්‍රයක් විතවා ගණී නම් නිසග්ගිපච්ති වේ.

21. නට පා ඇතියහට, බිත්පා ඇතියහට, නැයනට, පවරණ ලදුවනට අනෙකක්හු සඳහා තමාගේ ධනයෙන්, උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති'යි.

**ඌනපඤ්චබන්ධන ශික්ෂාපදය නිමි.**

## 5. 3. 3.

## භෙසජ්ජසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **පිලින්දිවච්ඡො** රාජගහෙ පබ්භාරං සොධාපෙති ලෙණං කත්තුකාමො. අථ ඛො රාජා මාගධො සෙනියො **බිම්බිසාරො** යෙනායස්මා පිලින්දිවච්ඡො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මන්තං පිලින්දිවච්ඡං එතදවොච: "කිං භන්තෙ ථෙරො කාරාපෙතී"ති. "පබ්භාරං මහාරාජ, සොධාපෙමි ලෙණං කත්තුකාමො"ති. "අත්ථො භන්තෙ අය්‍යස්ස ආරාමිකෙනා"ති. "න ඛො මහාරාජ භගවතා ආරාමිකො අනුඤ්ඤාතො"ති. "තෙන හි භන්තෙ භගවන්තං පටිපුච්ඡිත්වා මම ආරොචෙය්‍යාථා"ති. "එවං මහාරාජා"ති ඛො ආයස්මා පිලින්දිවච්ඡො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පච්චස්සොසි. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මතා පිලින්දිවච්ඡෙන ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

2. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො භගවතො සන්තිකෙ දූතං පාහෙසි: "රාජා භන්තෙ මාගධො සෙනියො බිම්බිසාරො ආරාමිකං දාතුකාමො. කථං නු ඛො භන්තෙ මයා පටිපජ්ජිතබ්බ"න්ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ආරාමික"න්ති. දුතියම්පි ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො යෙනායස්මා පිලින්දිවච්ඡො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මන්තං පිලින්දිවච්ඡං එතදවොච: "අනුඤ්ඤාතො භන්තෙ භගවතා ආරාමිකො"ති. "එවං මහාරාජා"ති. "තෙන හි භන්තෙ අය්‍යස්ස ආරාමිකං දම්මී"ති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මතො පිලින්දිවච්ඡස්ස ආරාමිකං පටිස්සුණිත්වා විස්සරිත්වා චිරෙන සතිං පටිලභිත්වා අඤ්ඤතරං සබ්බත්ථකං මහාමත්තං ආමන්තෙසි: "යො මයා භණෙ, අය්‍යස්ස ආරාමිකො පටිස්සුතො, දින්නො සො ආරාමිකො"ති. "න ඛො දෙව අය්‍යස්ස ආරාමිකො දින්නො"ති. "කීව චිරං නු ඛො භණෙ ඉතො හි තං හොතී"ති. අථ ඛො සො මහාමත්තො රත්තියො විගණෙත්වා [1] රාජානං මාගධං සෙනියං බිම්බිසාරං එතදවොච: "පඤ්ච දෙව රත්තිසතානී"ති. "තෙන හි භණෙ, අය්‍යස්ස පඤ්ච අරාමිකසතානි දෙහී"ති. "එවං දෙවා"ති ඛො සො මහාමත්තො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පටිස්සුණිත්වා ආයස්මතො පිලින්දිවච්ඡස්ස පඤ්ච ආරාමිකසතානි පාදාසි.[2] පාටියෙක්කො ගාමො නිවිසි. "**ආරාමිකගාමකො**"තිපි නං ආහංසු "**පිලින්දගාමකො**"තිපි නං ආහංසු.

---

1. ගණෙත්වා. ම.ජ.සං.   2. අදාසි. ස්‍යා,

# 5. 3. 3.

## භෙසජ්ජ ශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩ වෙසෙත සේක. එසමයෙහි ආයුෂමත් **පිලින්දිවච්ඡ** තෙරණුවෝ ලෙනක් කරණු කැමැත්තාහු රජගහනුවර පවුබෙයදක් ශුද්ධ කරවති. එකල්හි මගධාධිපති සේනිය **බිම්බිසාර** රජ තෙමේ ආයුෂමත් පිලින්දිවච්ඡ තෙරුන් වෙත එළඹ වැඳ එකත්පස්ව හිඳ මෙය සැල කෙළේය. "වහන්ස තෙරණුවෝ කුමක් කරවද්ද"යි "මහරජ, ලෙනක් කරණු කැමැත්තෙම් පවුබෙයදක් ශුද්ධ කරවමි"යි "වහන්ස, හිමියනට ආරාමිකයකුගෙන් ප්‍රයොජන දූ"යි "මහරජ භාග්‍යවතුන් වහන්සේ විසින් ආරාමිකයෙක් නො අනුදන්නා ලද්දේ ය"යි. එසේ වී නම් "වහන්ස භාග්‍යවතුන් වහන්සේ පිළිවිස මට දන්වනසේක්වා'යි. "එසේ ය මහරජැ" යි ආයුෂමත් පිලින්දිවච්ඡ තෙරණුවෝ මගධාධිපති සේනිය බිම්බිසාර රජහට පිළිවදන් දුන්හ. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරණුවෝ මගධාධිපති සේනිය බිම්සරරජුට දහැමි කථාවෙන් කරුණු දැක්වූහ. සමාදන් කරවූහ. තෙද ගැන්වූහ. පැහැද වූහ. ඉක්බිති මගධාධිපති සේනිය බිම්සර රජ තෙමේ ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරණුවන් විසින් දහැමි කථාවෙන් කරුණු දක්වන ලද්දේ (කුසල් දහම්හි) සමාදන් කරවන ලද්දේ තෙද ගන්වන ලද්දේ, පහදවන ලද්දේ හුනස්නෙන් නැගී ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරණුවන් වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

2. ඉක්බිති ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත දූතයකු යැවූහ: "වහන්ස මගධාධිපති සේනිය බිම්සර රජ තෙමේ ආරාමිකයකු දෙනු කැමැත්තේ ය. "වහන්ස මවිසින් කෙසේ පිළිපැදියයුතුද"යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දහැමි කථා වදුරා භික්ෂූන් ඇමතූ සේක "මහණෙනි; ආරාමිකයකු අනුදනිමි"යි. දෙවනවට ද මගධාධිපති සේනිය බිම්සර රජ තෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරණුවන් වෙත එළඹ වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන් මගධාධිපති සේනිය බිම්සර රජතෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරණුවන්ට මෙය සැල කෙළේය. "වහන්ස භාග්‍යවතුන් වහන්සේ විසින් ආරාමිකයෙක් අනුදන්නා ලද්දේ දූ"යි. "එසේය මහරජැ'යි. "වහන්ස එසේ වී නම් හිමියනට ආරාමිකයකු දෙමි'යි. ඉක්බිති මගධාධිපති සේනිය බිම්සර රජ තෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරණුවන්ට ආරාමිකයකු දීමට ගිවිස නො සිහිකොට කලකින් සිහි එළවා හැම කාරියෙහි යුත් එක්තරා මහඇමැතියකු ඇමැතීය.- "තෙල මා විසින් හිමියනට යම් ආරාමිකයෙක් ගිවිස්නා ලද්දේ නම් ඒ ආරාමික තෙම දෙන ලද්දේදූ'යි. "දෙවයන්වහන්ස හිමියනට ආරාමිකයෙක් නො දෙන ලදූ'යි. "කොල එය මෙයින් කෙතෙක් කල් ඉක්ම ගියේ දූ'යි. ඉක්බිති මහාමාත්‍ය තෙමේ දවස් ගැණ මගධාධිපති සේනිය බිම්සර රජහට මෙය සැල කෙළේය. "දෙවයන් වහන්ස පන්සියක් දවසැ'යි. "කොල එසේ වී නම් හිමියනට ආරාමිකයන් පන් සියයක් දෙව'යි. "එසේය දෙවයන් වහන්සැ'යි ඒ මගඇමැති තෙමේ මගධාධිපති සේනිය බිම්සර රජහට පිළිවදන් දී ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්හට ආරාමිකයන් පන්සියයක් දුනි. වෙන ම ගමෙක් පිහිටියේ ය. එය **ආරාමිකගම**'යි කීහ, එය **පිලින්දිගම**" යි ද කීහු.

3. තෙන ඛො පන සමයෙන ආයස්මා පිලින්දිවච්ඡො තස්මිං ගාමකෙ කුලූපගො හොති. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය පිලින්දිගාමං පිණ්ඩාය පාවිසි. තෙන ඛො පන සමයෙන තස්මිං ගාමකෙ උස්සවො හොති. දරකා[1] අලඞ්කතා මාලාකිතා කීළන්ති.

4. අථ ඛො අයස්මා පිලින්දිවච්ඡො පිලින්දිගාමකෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන අඤ්ඤතරස්ස ආරාමිකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. තෙන ඛො පන සමයෙන තස්සා ආරාමිකිනියා ධීතා අඤ්ඤෙ දරකෙ අලඞ්කතෙ මාලාකිතෙ පස්සිත්වා රොදති: "මාලං මෙ දෙථ, අලඞ්කාරං මෙ දෙථා"ති. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො තං ආරාමිකිනිං එතදවොච: "කිස්සායං දරිකා රොදතී"ති. "කිස්සායං දරිකා රොදති"ති. "අයං භන්තෙ දරිකා අඤ්ඤෙ දරකෙ අලඞ්කතෙ මාලාකිතෙ පස්සිත්වා රොදති: "මාලං මෙ දෙථ' අලඞ්කාරං මෙ දෙථා"ති. "කුතො අම්හාකං දුග්ගතානං මාලා, කුතො අලඞ්කාරා"ති.[2] අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො අඤ්ඤතරං තිණණ්ඩුපකං ගහෙත්වා තං ආරාමිකිනිං එතදවොච: "හන්දිමං තිණණ්ඩුපකං තස්සා දරිකාය සීසෙ පටිමුඤ්චා"ති. අථ ඛො සා ආරාමිකිනී තං තිණණ්ඩුපකං ගහෙත්වා තස්සා දරිකාය සීසෙ පටිමුඤ්චි, සා අහොසි සුවණ්ණමාලා අභිරූපා දස්සනීයා පාසාදිකා, නත්ථි තාදිසා රඤ්ඤොපි අන්තෙපුරෙ සුවණ්ණමාලා. මනුස්සා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස ආරොචෙසුං: "අමුකස්ස දෙව ආරාමිකස්ස ඝරෙ සුවණ්ණමාලා අභිරූපා දස්සනීයා පාසාදිකා, නත්ථි තාදිසා දෙවස්සාපි අන්තෙපුරෙ සුවණ්ණමාලා. කුතො තස්ස දුග්ගතස්ස, නිස්සංසයං චොරිකාය ආභතා"ති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො තං ආරාමිකකුලං බන්ධාපෙසි.

5. දුතියම්පි ඛො ආයස්මා පිලින්දිවච්ඡො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය පිලින්දිගාමකං පිණ්ඩාය පාවිසි. පිලින්දිගාමකෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන තස්ස ආරාමිකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පටිවිස්සකෙ පුච්ඡි: "කහං ඉදං ආරාමිකකුලං ගත"න්ති. "එතිස්සා භන්තෙ සුවණ්ණමාලාය කාරණා රඤ්ඤා බන්ධාපිත"න්ති.

6. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො යෙන රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස නිවෙසනං, තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො යෙනායස්මා පිලින්දිවච්ඡො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ආයස්මා පිලින්දිවච්ඡො එතදවොච: "කිස්ස මහාරාජ ආරාමිකකුලං බන්ධාපිත"න්ති. "තස්ස භන්තෙ ආරාමිකස්ස ඝරෙ සුවණ්ණමාලා අභිරූපා දස්සනීයා පාසාදිකා, නත්ථි තාදිසා අම්හාකම්පි අන්තෙපුරෙ සුවණ්ණමාලා, කුතො තස්ස දුග්ගතස්ස, නිස්සංසයං චොරිකාය ආභතා"ති. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පාසාදං සුවණ්ණන්ති අධිමුච්චි, සො අහොසි සබ්බසොවණ්ණමයො. "ඉදං පන තෙ මහාරාජ තාව බහුං සුවණ්ණං කුතො"ති. "අඤ්ඤාතං භන්තෙ, අය්යස්සෙව සො ඉද්ධානුභාවො"ති තං ආරාමිකකුලං මුඤ්චාපෙසි.

---

1. දරිකා. ම.ජ සං.  2. අලඞ්කාරොති. මජසං

3. එසමයෙහි ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙමේ ඒ ගමෙහි කුලූපග වූයෙක් වෙයි. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙමේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පා සිවුරු ගෙණ පිලින්දිගමට පිඬු පිණිස පිවිසියේ ය. එකල්හි ඒ ගමෙහි උත්සවයෙක් වෙයි. දරුවෝ අබරණින් සදන ලද්දාහු මල්දමින් සදන ලද්දාහු ක්‍රීඩා කෙරෙත්.

4. ඉක්බිති ආයුෂමත් පිලින්දිවච්ඡ තෙමේ පිලින්දිගමෙහි ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන්නේ එක්තරා ආරාමිකයකුගේ නිවෙසන වෙත එළඹ පැනවූ අස්නෙහි හුන්නේ ය. එසමයෙහි ඒ ආරාමික බිරිඳගේ දියැනි තොමෝ අන් දරුවන් අබරණින් සදනලදුවන් මල්දමින් සදනලදුවන් දැක මට මල්දමක් දෙව, මට පළඳනාවක් දෙව'යි හඬා. ඉක්බිති ආයුෂමත් පිලින්දිවච්ඡ තෙමේ ඒ ආරාමික බිරිඳට මෙය කීය: 'කුමකට මේ දැරිය හඬා ද'යි. වහන්ස, මේ දැරිය අන් දරුවන් අබරණින් සදනලදුවන් මල්දමින් සදන ලදුවන් දැක 'මට මල්දමක් දෙව' මට පළඳනාවක් දෙව'යි හඬා. දුගී අපට මල්දම් කොයින් ද? අබරණ කොයින් ද?" යි. ඉක්බිති ආයුෂමත් පිලින්දිවච්ඡ තෙමේ එක්තරා තණසුඹුළුවක් ගෙණ ඒ ආරාමික බිරිඳට මෙය කී ය: 'ඉඳ මේ තණසුඹුළුව ඒ දැරියගේ හිසෙහි පළඳව යි. ඉක්බිති ඒ ආරාමිකයාගේ බිරිඳ ඒ තණසුඹුළුව ගෙණ ඇගේ හිසෙහි පැළඳවූ ය. එය මනාරූ ඇති දැකුම්කලූ ප්‍රසාද එළවන සවණ්මාලාවක් වූ ය. රජුගේ ඇතොවුරෙහි දු එබඳු සවණ්මාලා-යෙක් නැති. මිනිස්සු මගධෙශ්වර සෙනිය බිම්බිසාර රජහට දැන්වූහ: "දෙවයන් වහන්ස, අසුවල් ආරාමිකයාගේ ගෙහි මනාරූ ඇති දැකුම්කලූ ප්‍රසාද එළවන සවණ්මාලායෙක් ඇත. දෙවයන් වහන්සේගේ ඇතොවුරෙහි දු එබඳු සවණ්-මාලායෙක් නැති. ඒ දුගීපුරුෂයාහට කොයින් ද? නිසැකයෙන් සොරකමින් ගෙණෙන ලද වනැ" යි. ඉක්බිති මගධාධිපති සෙනිය බිම්බිසාර රජ තෙම ඒ ආරාමික කුලය සිර කරවී ය.

5. දෙවනවට ද ආයුෂමත් පිලින්දිවච්ඡ තෙම පෙරවරුයෙහි හැද පෙරෙව පාසිවුරු ගෙණ පිලින්දිගමට පිඬු පිණිස පිවිසියේ ය. පිලින්දිගමෙහි ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙණුයේ ඒ ආරාමිකයාගේ නිවෙසන වෙත එළඹියේ ය. එළඹ එක්බිති ගෙහි මිනිසුන් විචාළේ ය: "මේ ආරාමික කුලය කොහි ගියේ දැ?" යි. "වහන්ස, තෙල සවණ්මාලාව නිසා රජු විසින් බඳවන ලදැ" යි.

6. එකල්හි ආයුෂමත් පිලින්දිවච්ඡ තෙම මගධාධිපති සෙනිය බිම්බිසාර රජුගේ නිවෙසන කරා එළඹ පණවන ලද අස්නෙහි වැඩහුන්නේ ය. ඉක්බිති මගධාධිපති සෙනිය බිම්බිසාර රජ තෙම ආයුෂමත් පිලින්දිවච්ඡ තෙරුන් වෙත එළඹ ආයුෂමත් පිලින්දිවච්ඡ තෙරුන් වැද එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් මගධාධිපති සෙනිය බිම්බිසාර රජහට ආයුෂමත් පිලින්දිවච්ඡ තෙරණුවෝ මෙය කීහ: "මහරජ, කුමක් හෙයින් ආරාමිකකුලය බඳවනලද දැ" යි. "වහන්ස, ඒ ආරාමිකයාගේ ගෙහි මනාරූ ඇති දැකුම්කලූ ප්‍රසාද එළවන සවණ්මාලායෙක් ඇත. එබඳු සවණ්මාලායෙක් අපගේ ඇතොවුරෙහිදු නැති. ඒ දුගීපුරුෂයහට කොයින් ද? එකාන්තෙන් සොරකමින් ගෙණෙන ලද වනැ" යි. එකල්හි ආයුෂමත් පිලින්දිවච්ඡ තෙරණුවෝ මගධාධිපති සෙනිය බිම්බිසාර රජහුගේ ප්‍රාසාදය රන්මුවා වේවා යි ඉටූහ. හේ සියල්ල රන්මුවා වූයේ විය. "මහරජ, තොපට මේ මෙතෙක් බොහෝ රන් කොයින් දැ?" යි. "වහන්ස, හේ හිමියන්ගේ ම ඍද්ධ්‍යනුභාවයෙකැ යි දන්නා ලදැ"යි ඒ ආරාමික කුලය මිදූවී ය.

7. මනුස්සා අය්‍යෙන කිර පිලින්දිවච්ඡෙන සරාජිකාය පරිසාය උත්තරි-මනුස්සධම්මා[1] ඉද්ධිපාටිහාරියං දස්සිතන්ති අත්තමනා අභිප්පසන්නා ආයස්මතො පිලින්දිවච්ඡස්ස පඤ්චභෙසජ්ජානි අභිහරිංසු. සෙය්‍යථීදං: "සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං" පකතියාපි ච ආයස්මා පිලින්දිවච්ඡො ලාභී හොති පඤ්චන්නං භෙසජ්ජානං, ලද්ධං ලද්ධං පරිසාය විස්සජ්ජෙති. පරිසා චස්ස හොති බාහුලිකා, ලද්ධං ලද්ධං කොලම්බෙපි ඝටෙපි පූරෙත්වා පටිසාමෙති. පරිස්සාවනානිපි ථවිකායොපි පූරෙත්වා වාතපානෙසු ලග්ගෙති. තානි ඔලීනවිලීනානි තිට්ඨන්ති. උන්දූරෙහිපි විහාරා ඔකිණ්ණවි-කිණ්ණා හොන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "අන්තොකොට්ඨාගාරිකා ඉමෙ සමණා සක්‍යපුත්තියා, සෙය්‍යථාපි රාජා මාගධො සෙනියො බිම්බිසාරො"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ එවරූපාය බාහුල්ලාය චෙතෙස්සන්තී"ති.

8. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ එවරූපාය බාහුල්ලාය චෙතෙන්තී"ති? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා එවරූපාය බාහුල්ලාය චෙතෙස්සන්ති" නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භෙසජ්ජානි සෙය්‍යථීදං: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි. තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියන්ති".**

9. **යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භෙසජ්ජානීති**—

**සප්පි** නාම: ගොසප්පි වා අජිකාසප්පි වා මහිසසප්පි වා[2] යෙසං මංසං කප්පති තෙසං සප්පි.

**නවනීතං** නාම: තෙසං යෙව නවනීතං.

**තෙලං** නාම: තිලතෙලං සාසපතෙලං මධුකතෙලං එරණ්ඩකතෙලං වසාතෙලං.

**මධු** නාම: මක්ඛිකා මධු.

**ඵාණිතං** නාම: උච්ඡුම්හා නිබ්බත්තං.

**තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජි-තබ්බානි** සත්තාහපරමතා පරිභුඤ්ජිතබ්බානි.

**තං අතික්කාමයතො නිස්සග්ගියං හොතීති** අට්ඨමෙ අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ භෙසජ්ජං සත්තාහා-තික්කන්තං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති — දදෙය්‍යන්ති-දදෙය්‍යුන්ති — ආයස්මතො දම්මී"ති.

1. ධම්මං. මජසං 2. මහිංසසප්පි. මජසං.

7. මිනිස්සු 'පිළින්දිවච්ඡ හිමියන් විසින් සරජික පිරිස්හි උතුරුමිනිස්-දම්න් ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක්වන ලද්දේ ය' යි සතුටුසිත් ඇත්තාහු වෙසෙසින් ප්‍රසන්න වූවාහු ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරුනට පස්බෙහෙත් එලවූහ. හේ මෙසේ ය: ගිතෙල් යෑ වෙඬරු යෑ තෙල් යෑ මීහි යෑ පැණි යයි. පියවිනුදු ආයුෂ්මත් පිළින්දිවච්ඡ තෙරණුවෝ පස්බෙහෙත් ලබනසුලු වෙති. ලද ලද දය පිරිසෙහි විසජති. ඔබගේ පිරිස ද බාහුලික වෙයි. ලද ලද දය මහසැළෙහිදු කලයෙහිදු පුරා සඟවා තබති. පෙරහනුදු පිහිවාද්‍ද පුරා වාකවුළුවල එල්වා තබති. ඒවා යටටත් දෙපසටත් ගිලිහුනාහු සිටිත්. මීයත් විසිනුදු විහාරයෝ අවකීර්ණ විකීර්ණ වූවාහු වෙත්. මිනිස්සු විහාරචාරිකායෙහි හැසිරෙන්නාහු දැක අවඥා කෙරෙති නුගුණ කියති දෙස් පහළ කෙරෙත්: "මේ ශ්‍රමණශාක්‍යපුත්‍රියයෝ මගධාධිපති සේනිය බිම්බිසාර රජහු සෙයින් ඇතුළ කොටුගුළු ඇත්තාහු ය" යි. භික්ෂූහු අවඥා කරණ නුගුණ කියන දෙස් පහළ කරණ ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙත් නම් ඔහු අවඥා කෙරෙති නුගුණ කියති දෙස් පහළ කෙරෙත්: "කෙසේ නම් භික්ෂූහු මෙබඳු බහුල පැවැතුම් ඇති බවට සිතුහු දැ" යි.

8. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. "සැබෑ ද මහණෙනි, භික්ෂූහු මෙබඳු බහුල පැවැතුම් ඇති බවට සිතත් දැ" යි. 'සැබව භාග්‍යවතුන් වහන්ස.' භාග්‍යවත් බුදුහු ගර්හා කළහ: "කෙසේ නම් මහණෙනි, ඒ තුච්ඡපුරුෂයෝ මෙබඳු බහුල පැවැතුම් ඇති බවට සිතුහු දැ" යි. මහණෙනි, තෙල නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"ගිලන් මහණුන් විසින් වැළැඳියයුතු වූ යම් භෛෂජ්‍ය කෙනෙක් වෙද්ද, ඒ මෙසේ ය: ගිතෙල් යෑ වෙඬරු යෑ තෙල් යෑ මීහි යෑ පැණි යි. ඒවා පිළිගෙණ සත්දවසක් පරම කොට ඇති කාලයක් සංනිධි කොට වැළැඳිය යුත්තාහ. ඒ (සතාහකාලය) ඉක්මවන්නාහට නිසග්ගිපචිති වේ"** යයි.

9. **යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භෙසජ්ජානි** යනු:

**සප්පි** නම්: ගවගිතෙල් වේවයි එළුගිතෙල් වේවයි මීහිගිතෙල් වේවයි යම් කෙනකුන්ගේ මස් කැප වේ නම් ඔවුන්ගේ ගිතෙල්.

**නවනීත** නම්: ඔවුන්ගේ ම වෙඬරු ය.

**තෙල** නම්: තලතෙල් සබතෙල් මීතෙල් එරඬුතෙල් වුරුණුතෙල්.

**මධු** නම්: මී පැණි.

**ඵාණිත** නම්: උගුයෙන් නිපත්තේ යි.

**තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජි-තබ්බානි** යනු: සත්දවසක් පරම කොට වැළඳිය යුත්තාහ.

**තං අතික්කාමයතො නිස්සග්ගියං හොති** යනු: අට වැනි අරුණ නැගෙන කල්හි නිසගි වෙයි. සඟනට හෝ ගණයාට හෝ පුතුලක්හට හෝ නිසැජියයුතු ය. තවද මහණෙනි, මෙසේත් නිසැජියයුතු ය: 'වහන්ස, මාගේ මේ බෙහෙත් සත්දවසක් ඉක්මගියේ නිසගි විය. මම මෙය සඟනට නිසජමි' යි ... දෙන්නේ යයි ... දෙන්නාහ යි ... ආයුෂ්මත්හට දෙමි' යි.

10. සත්තාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. සත්තාහාතික්කන්තෙ වෙමතිකො, නිස්සග්ගියං පාචිත්තියං. සත්තාහා-තික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. අනධිට්ඨිතෙ අධිට්ඨිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං.

11. අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී, අනට්ඨෙ නට්ඨසඤ්ඤී,[1] අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤී, අදඩ්ඪෙ දඩ්ඪසඤ්ඤී, අවිලුත්තෙ විලුත්තසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං:

12. නිස්සට්ඨං පටිලභිත්වා න කායිකෙන පරිභොගෙන පරිභුඤ්ජිතබ්බං. න අජ්ඣොහරිතබ්බං, පදීපෙ වා කාළවණ්ණෙ වා උපනෙතබ්බං. අඤ්ඤෙන භික්ඛුනා කායිකෙන පරිභොගෙන පරිභුඤ්ජිතබ්බං, න අජ්ඣොහරිතබ්බං.

13. සත්තාහානතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. සත්තාහානතික්කන්තෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. සත්තාහාන-තික්කන්තෙ අනතික්කන්තසඤ්ඤී, අනාපත්ති.

14. අනාපත්ති අන්තොසත්තාහං අධිට්ඨෙති, විස්සජ්ජෙති, නස්සති, විනස්සති, ඩය්හති, අච්ඡින්දිත්වා ගණ්හන්ති, විස්සාසං ගණ්හන්ති, අනුප-සම්පන්නස්ස චජිත්වා, වමිත්වා, මුඤ්චිත්වා, අනපෙක්ඛො දත්වා පටිලභිත්වා පරිභුඤ්ජති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

භෙසජ්ජසික්ඛාපදං නිට්ඨිතං.

---

## 5. 3. 4.

## වස්සිකසාටික සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං වස්සිකසාටිකා අනුඤ්ඤාතා හොති. ඡබ්බග්ගියා භික්ඛූ "භගවතා වස්සිකසා-ටිකා අනුඤ්ඤාතා"ති පටිගච්චෙව[2] වස්සිකසාටිකචීවරං පරියෙසන්ති, පටිගච්චෙව කත්වා නිවාසෙන්ති. ජිණ්ණාය වස්සිකසාටිකාය නග්ගා කායං ඔවස්සාපෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපා-චෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ පටිගච්චෙව වස්සිකසාටිකචීවරං පරියෙසිස්සන්ති, පටිගච්චෙව කත්වා නිවාසෙස්සන්ති, ජිණ්ණාය වස්සිකසා-ටිකාය නග්ගා කායං ඔවස්සාපෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ පටිගච්චෙව වස්සික-සාටිකචීවරං පරියෙසථ, පටිගච්චෙව කත්වා නිවාසෙථ, ජිණ්ණාය වස්සික-සාටිකාය නග්ගා කායං ඔවස්සාපෙථා"ති? 'සච්චං භගවා.' විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා පටිගච්චෙව වස්සිකසාටිකචීවරං පරියෙසිස්සථ, පටිගච්චෙව කත්වා නිවාසෙස්සථ, ජිණ්ණාය වස්සිකසාටිකාය නග්ගා කායං ඔවස්සාපෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ":

---

1 අනට්ඨසඤ්ඤී. ම.ජ.ස.   2. පටිකච්චෙව ම. ජ. ස.

10. සත්දවසක් ඉක්මගියෙහි 'ඉක්මිනැ' යි සත් ඇතියේ නිසැගිපචිති වෙයි. සත්දවසක් ඉක්මගියෙහි විමති ඇතියේ නිසැගිපචිති වෙයි. සත් දවසක් ඉක්මගියෙහි 'නො ඉක්මිනැ' යි සත් ඇතියේ නිසැගි පචිති වෙයි. නොඉටතලදුයෙහි 'ඉටතලද්ද' යි සත් ඇතියේ නිසැගිපචිති වෙයි.

11. නො විසජත ලදුයෙහි 'විසජතලද්ද' යි සත් ඇතියේ, නො නටුයෙහි 'නටැ' යි සත් ඇතියේ, නොවැනැසුනෙහි 'වැනැසුනැ' යි සත් ඇතියේ, නොදැවුනෙහි 'දැවිනැ' යි සත් ඇතියේ, නො පැහැරගත්තාලදුයෙහි 'පැහැර ගත්තාලද්ද' යිසත් ඇතියේ නිසැගිපචිති වේ.

12. නිසජතලද්ද ලැබ කායිකපරිභොගයෙන් පරිභොග නොකටයුතු ය. පරගලා නො කටයුතු ය. පහනෙහි හෝ කළුඅලෙව් දීමෙහි හෝ එළවිය යුතු ය. අන් මහණක්හු විසින් කායික පරිභොගයෙන් පරිභොග කටයුතු ය. පරගලා නො කටයුතු.

13. සත්දවසක් නොඉක්මගියෙහි 'නො ඉක්මිනැ' යි සත් ඇතියේ දුකුලාඇවැත් වෙයි. සත්දවසක් නොඉක්මගියෙහි විමති ඇතියේ දුකුලාඇවැත් වෙයි. සත්දවසක් නොඉක්මගියෙහි 'නො ඉක්මිනැ' යි සත් ඇතියේ ඇවැත් නැති.

14. ඇතුළු සත්දවස්හි ඉටා නම් විසජා නම්, නැසේ නම්. වැනැසේ නම්, දැවේ නම්, අසිදැ ගණිත් නම්, විස්වැසි ව ගණිත් නම්, අනුපසපනක්හට දෙතලද්දෙන්, හරණලද්දෙන්, මුදතලද්දෙන්, නිරපෙක්ෂක ව දී නැවත ලැබ පරිභොග කෙරේ නම්, උමමත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති යි.

**භෙසජ්ජ ශික්ෂාපදය නිමි.**

---

# 5. 3. 4.

## වස්සිකසාටික ශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර සමීපයෙහි වූ අනේපිඬුසිටුහුගේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙති. තවද එසමයෙහි භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට වැසිසළුසිවුර අනුදන්නා ලද වෙයි. ෂවගමහණහු 'භාග්‍යවතුන් විසින් වැසිසළුව අනුදන්නාලද්ද'යි කැල ම වැසිසළුසිවුරු සොයති. කැල ම කොට නිවාසනය කෙරෙති, වැසිසළුසිවුර දිරාගිය කල්හි ලිහිණි ව කය තෙමත්. යම් මහණ කෙනෙක් අල්පෙච්ඡ වෙත් නම් ඔහු අවඥ කෙරෙති නුගුණ කියති දෙස් පහළ කෙරෙත්: 'කෙසේ නම් ෂවගමහණහු කැල ම වැසිසළුසිවුරු සෙවූහු ද, කැල ම කොට නිවාසනය කළාහු ද, වැසිසළුසිවුරු දිරාගිය කල්හි ලිහිණි ව කය තෙමූහු ද'යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. "සැබෑ ද මහණෙනි, තෙපි කැල ම වැසිසළුසිවුරු සොයවූ ල, කැල ම කොට නිවාසනය කරවූ ල, වැසිසළුව දිරාගිය කල්හි ලිහිණි ව කය තෙමවූ ලැ'යි. 'සැබැව භාග්‍යවතුන් වහන්ස.' භාගාවත් බුදුහු ගර්හා කළහ: "තුච්ඡපුරුෂයෙනි, කෙසේ නම් තෙපි කැල ම වැසිසළුසිවුරු සෙවූහු ද, කැල ම කොට නිවාසනය කළහු ද, වැසිසළුව දිරාගිය කල්හි ලිහිණි ව කය තෙමූහු ද තුච්ඡපුරුෂයෙනි, තෙල නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... තවද මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවූ:"

**"මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියෙසිතබ්බං. අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙතබ්බං. ඔරෙන චෙ මාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියෙසෙය්‍ය, ඔරෙනඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"**න්ති.

2. **මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියෙසිතබ්බ**න්ති යෙ මනුස්සා පුබ්බෙපි වස්සිකසාටිකචීවරං දෙන්ති. තෙ උපසඞ්කමිත්වා එවමස්සු වචනීයා: "කාලො වස්සිකසාටිකාය, සමයො වස්සිකසාටිකාය, "අඤ්ඤෙපි මනුස්සා වස්සිකසාටිකචීවරං දෙන්ති"ති. න වත්තබ්බා: "දෙථ මෙ වස්සිකසාටිකචීවරං, ආහරථ මෙ වස්සිකසාටිකචීවරං, පරිවත්තෙථ මෙ වස්සිකසාටිකචීවරං, චෙතාපෙථ මෙ වස්සිකසාටිකචීවරන්ති."

**අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙතබ්බ**න්ති අඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ කත්වා නිවාසෙතබ්බං.

**ඔරෙන චෙ මාසො සෙසො ගිම්හානන්ති** අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ වස්සිකසාටිකචීවරං පරියෙසති, නිස්සග්ගියං පාචිත්තියං.

**ඔරෙනඩ්ඪමාසො සෙසො ගිම්හාන**න්ති අතිරෙකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ කත්වා නිවාසෙති, නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ වස්සිකසාටිකචීවරං අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ පරියිට්ඨං, අතිරෙකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ කත්වා පරිදහිතං[1] නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති–දදෙය්‍යාති–දදෙය්‍යුන්ති–ආයස්මතො දම්මී"ති.

3. අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ අතිරෙකසඤ්ඤී, වස්සිකසාටිකචීවරං පරියෙසති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ වෙමතිකො වස්සිකසාටිකචීවරං පරියෙසති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ ඌනකසඤ්ඤී, වස්සිකසාටිකචීවරං පරියෙසති, නිස්සග්ගියං පාචිත්තියං.

4. අතිරෙකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ අතිරෙකසඤ්ඤී කත්වා නිවාසෙති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ වෙමතිකො කත්වා නිවාසෙති, නිස්සග්ගියං පාචිත්තියං. අතිරෙකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ ඌනකසඤ්ඤී කත්වා නිවාසෙති, නිස්සග්ගියං පාචිත්තියං.

5. සතියා වස්සිකසාටිකාය නග්ගො කායං ඔවස්සාපෙති, ආපත්ති දුක්කටස්ස. ඌනකමාසෙ සෙසෙ ගිම්හානෙ අතිරෙකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඌනකමාසෙ සෙසෙ ගිම්හානෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඌනකමාසෙ සෙසෙ ගිම්හානෙ ඌනකසඤ්ඤී, අනාපත්ති.

6. ඌනකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ අතිරෙකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඌනකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඌනකඩ්ඪමාසෙ සෙසෙ ගිම්හානෙ ඌනකසඤ්ඤී. අනාපත්ති.

---

1. නිවාසෙතුං. සාහළුවි.

"ගිම්හන් සාරමස සම්බන්ධ මසෙක් ශෙෂ ව සිටියේ යයි මහණහු විසින් වැසිසළුසිවුර සෙවියයුතු ය. ගිම්හන් සාරමස සම්බන්ධ අඩමසෙක් ශෙෂ ව සිටියේ යයි කොට නිමවා හැන්ද යුතු ය. ඉදින් ගිම්හන් සාරමස සම්බන්ධ මසෙක් ශෙෂ යයි (කියයුතු තැනට) මෑත භාගයෙහි වැසිසළුසිවුරක් සොයා නම් ගිම්හන් සාරමස සම්බන්ධ අඩමසෙක් ශෙෂ යයි කියයුතු තැනට මෑතභාගයෙහි කොට නිවාසනය කෙරේ නම් නිස්සග්ගිපචිත් වේ"යයි.

2. **මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියෙසිතබ්බං** යනු: යම් මිනිස් කෙනෙක් පෙරත් වැසිසළුසිවුරු දෙද්ද ඔවුන් වෙත එළඹ මෙසේ කියයුත්තාහ: "වැසිසළුවට කාලය වෙයි. වැසිසළුවට සමය වෙයි. අන් මිනිස්හු ද වැසිසළු සිවුරු දෙති"යි. "මට වැසිසළුසිවුරක් දෙත්ත. මට වැසිසළුසිවුරක් ගෙණෙත්ත. මට වැසිසළුසිවුරක් පිරිවටා දෙත්ත. මට වැසිසළුසිවුරක් විකොට ගෙණ දෙත්තැ"යි නො කියයුත්තාහ.

**අද්ධමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙතබ්බං** යනු: අඩමසක් ශෙෂ ව සිටි ගිම්හානයෙහි කොට නිමවා හැන්ද යුතු ය.

**ඔරෙන චෙ මාසො සෙසො ගිම්හානං** යනු: අසිරු මසක් ශෙෂව සිටි ගිම්හානයෙහි වැසිසළුසිවුර සොයා නම් නිසග්ගිපචිති වේ.

**ඔරෙනද්ධමාසො සෙසො ගිම්හානං** යනු: අසිරු අඩමසක් ශෙෂ ව සිටි ගිම්හානයෙහි කොට නිමවා හඳී නම් නිසගි වේ. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයාට හෝ නිසැදිය යුතු යි. මහණෙනි, මෙසේත් නිසැදියයුතු යි: "වහන්ස මගේ මේ වැසිසළුසිවුර අසිරු අඩමසක් ශෙෂව සිටි. ගිම්හානයෙහි සොයන ලද්දේ අසිරු අඩමසක් ශෙෂ ව සිටි ගිම්හානයෙහි කොට නිමවා හඳින ලද්දේ නිසගි විය. මම් මෙය සඟනට නිසජම් ... දෙත්තේ යයි ... දෙත්තාහු යයි ... ආයුෂමත්හට දෙමි"යි.

3. අසිරු මසක් ශෙෂ වූ ගිම්හානයෙහි අසිරු සත් ඇතියේ වැසිසළුසිවුර සොයා නම්, නිසගිපචිති වෙයි. අසිරු මසක් ශෙෂ වූ ගිම්හානයෙහි විමති ඇත්තේ වැසිසළුසිවුර සොයා නම් නිසගිපචිති වෙයි. අසිරු මසක් ශෙෂවූ ගිම්හානයෙහි උනුසත් ඇතියේ වැසිසළුසිවුරක් සොයා නම් නිසගිපචිති වේ.

4. අසිරු අඩමසක් ශෙෂවූ ගිම්හානයෙහි අසිරුසත් ඇතියේ කොට නිමවා හඳී නම් නිසගිපචිති වෙයි. අසිරු අඩමසක් ශෙෂවූ ගිම්හානයෙහි විමති ඇත්තේ කොට නිමවා හඳී නම් නිසගිපචිති වෙයි. අසිරු අඩමසක් ශෙෂ වූ ගිම්හානයෙහි උනුසත් ඇතියේ කොට නිමවා හඳී නම් නිසගිපචිති වේ.

5. වැසිසළුව ඇතිකල්හි ලිහිණිව කය තෙමා නම් දුකුලාඇවැත් වෙයි. උනුමසක් ශෙෂවූ ගිම්හානයෙහි අසිරුසත් ඇතියේ දුකුලාඇවැත් වෙයි. උනුමසක් ශෙෂවූ ගිම්හානයෙහි විමති ඇතියේ දුකුලාඇවැත් වෙයි. උනුමසක් ශෙෂ වූ ගිම්හානයෙහි උනුසත් ඇතියේ ඇවැත් නැති.

6. උනුඅඩමසක් ශෙෂ වූ ගිම්හානයෙහි අසිරුසත් ඇතියේ දුකුලාඇවැත් වෙයි. උනුඅඩමසක් ශෙෂ වූ ගිම්හානයෙහි විමති ඇතියේ දුකුලාඇවැත් වෙයි. උනුඅඩමසක් ශෙෂ වූ ගිම්හානයෙහි උනුසත් ඇතියේ ඇවැත් නැති.

7. අනාපත්ති මාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියෙසති, අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙති, ඌනකමාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියෙසති. ඌනකඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙති, පරියිට්ඨාය වස්සිකසාටිකාය වස්සං උක්කඩ්ඪීයති, නිවත්ථාය වස්සිකසාටිකාය වස්සං උක්කඩ්ඪීයති, ධොවිත්වා නික්ඛිපිතබ්බං. සමයෙන නිවාසෙතබ්බං. අච්ඡින්නචීවරස්ස, නට්ඨචීවරස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**වස්සිකසාටිකසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 3. 5.

## චීවරඅච්ඡින්දන සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භාතුනො සද්ධිවිහාරිකං භික්ඛුං එතදවොච: "එහාවුසො ජනපදචාරිකං පක්කමිස්සාමා"ති. "නාහං භන්තෙ ගමිස්සාමි, දුබ්බලචීවරොම්හී"ති. "එහාවුසො අහන්තෙ චීවරං දස්සාමී"ති තස්ස චීවරං අදාසි. අස්සොසි ඛො සො භික්ඛු: "භගවා කිර ජනපදචාරිකං පක්කමිස්සතී"ති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි:- "නදානාහං[1] ආයස්මතා උපනන්දෙන සක්‍යපුත්තෙන සද්ධිං ජනපදචාරිකං පක්කමිස්සාමි, භගවතා සද්ධිං ජනපදචාරිකං පක්කමිස්සාමී"ති. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො තං භික්ඛුං එතදවොච; "එහිදානි ආවුසො ජනපදචාරිකං පක්කමිස්සාමා"ති. "නාහං භන්තෙ තයා සද්ධිං ජනපදචාරිකං පක්කමිස්සාමි, භගවතා සද්ධිං ජනපදචාරිකං පක්කමිස්සාමී"ති. "යම්පි ත්‍යාහං ආවුසො චීවරං අදාසිං මයා සද්ධිං ජනපදචාරිකං පක්කමිස්සතී"ති කුපිතො අනත්තමනො අච්ඡින්දි.

2. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දිස්සතී"ති? අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර ත්වං උපනන්ද භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දී"ති. "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

---

1. නාහං, ස්‍යාම,

7. ගිමන් සිවුමසින් මසක් ශෙෂ යයි වැසිසළුසිවුරක් සොයා නම්, ගිමන් සිවුමසින් අඩමසක් ශෙෂ යයි කොට නිමවා හඳී නම්, ගිමන් සිවුමසින් උනුමසක් ශෙෂ යයි වැසිසළුසිවුර සොයා නම්, ගිමන් සාරමසින් උනුමසක් ශෙෂ යයි කොට හඳී නම්, සොයන ලද වැසිසළුව ඇති කල්හි වස පෙරට අදනා ලැබේ නම්, හදනා ලද වැසිසළුව ඇති කල්හි වස පෙරට අදනා ලැබේ නම්, දෙවා බහා තැබියයුතු ය. සුදුසුකල්හි හැන්දයුතු ය. අසිදැගත්-සිවුරු ඇතියාට, නටසිවුරු ඇතියාට, උවදුරු ඇති කල්හි, උම්මත්තකයහට, ආදිකම්මිකයහට, ඇවැත් නැත්තේ යි.

**වස්සිකසාටික ශික්ෂාපදය නිමි.**

---

## 5. 3. 5.

## චීවරඅච්ඡින්දන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි ආයුෂමත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ බෑයාගේ සද්ධිවිහාරික මහණක්හට මෙය කී ය. "එව ඇවැත්නි, ජනපදචාරිකායෙහි යම්හ"යි. "වහන්ස මම නො යන්නෙමි. දුබුල් සිවුරු ඇත්තෙමි"යි. "එව ඇවැත්නි, මම තට සිවුරක් දෙන්නෙමි"යි, ඔහුට සිවුරක් දිනි. ඒ මහණ තෙමේ "භාග්‍යවතුන් වහන්සේ ජනපද චාරිකායෙහි වඩනාහ"යි. ඇසී ය. ඉක්බිති ඒ මහණහට මේ සිත විය: "මම දැන් ආයුෂමත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් හා සමග ජනපද චාරිකායෙහි නො යන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ හා සමග ජනපද චාරිකායෙහි යන්නෙමි"යි. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ ඒ මහණහට මෙය කීය: "එව ඇවැත්නි, දැන් ජනපද චාරිකායෙහි යම්හ"යි. "වහන්ස, මම නුඹ හා සමග ජනපද චාරිකායෙහි නො යන්නෙමි. භාග්‍යවතුන් වහන්සේ හා සමග ජනපද චාරිකායෙහි යන්නෙමැ"යි. "ඇවැත්නි, මම තට යම් සිවුරක් දිනිම් ද එය මා හා සමග ජනපද චාරිකායෙහි යන්නේ යයි (සිතා) දිනිම්"යි කිපියේ නො සතුටු වූයේ අසිදැ ගත්තේ ය.

2. ඉක්බිති ඒ මහණ තෙමේ භික්ෂූන්ට මෙ පවත් දැන්වී ය. යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද, ඔහු හෙලා දකිති. නුගුණ කියති. දෙස් පතුරු වති. "කෙසේ නම් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ මහණහට තෙමේ සිවුරක් දී කිපියේ නොසතුටු වූයේ අසිදැ ගත්තේ දැ"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ. "සැබෑ ද? උපනන්දය තෝ මහණකුට තෙමේ සිවුරක් දී කිපියේ නො සතුටු වූයේ අසිදැ ගත්තේ දැ?"යි. "සැබව, භාග්‍යවතුන් වහන්ස." භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ ගැරහූ සේක "තුච්ඡ පුරුෂය, කෙසේ නම් තෝ මහණක්හට තෙමේ සිවුරක් දී කිපියේ නො සතුටු වූයේ අසිද ගත්තෙහි ද?" "තුච්ඡ පුරුෂය, නොප නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස නෝ නො වෙයි. ... "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යො පන භික්ඛු භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා නිස්සග්ගියං පාචිත්තියන්ති".**

3. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුස්සාති** අඤ්ඤස්ස භික්ඛුස්ස.

**සාමන්ති** සයං දත්වා

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපගපච්ඡිමං.

**කුපිතො අනත්තමනොති** අනභිරද්ධො ආහතචිත්තො ඛිලජාතො.

**අච්ඡින්දෙය්‍යාති** සයං අච්ඡින්දති, නිස්සග්ගියං[1] පාචිත්තියං.

**අච්ඡින්දාපෙය්‍යාති** අඤ්ඤං ආණාපෙති, ආපත්ති දුක්කටස්ස. සකිං ආණත්තො බහුකම්පි අච්ඡින්දති, නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං. "ඉදං මෙ භන්තෙ චීවරං භික්ඛුස්ස සාමං දත්වා අච්ඡින්නං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති—දදෙය්‍යාති—දදෙය්‍යුන්ති—ආයස්මතො දම්මී"ති.

4. උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා, නිස්සග්ගියං පාචිත්තියං. උපසම්පන්නෙ වෙමතිකො -පෙ- උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා, නිස්සග්ගියං පාචිත්තියං.

5. අඤ්ඤං පරික්ඛාරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා, ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නස්ස චීවරං වා අඤ්ඤං වා පරික්ඛාරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දති වා අච්ඡින්දාපෙති වා, ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස.

6. අනාපත්ති සො වා දෙති, තස්ස වා විස්සසන්තො ගණ්හාති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**චීවරඅච්ඡින්දන සික්ඛාපදං නිට්ඨිතං.**

1. නිස්සග්ගියං හොති, සෑ.

**"යම් මහණෙක් මහණකුට තෙමේ ම සිවුරක් දී කිපියේ නොසතුටු වූයේ අසිදෑ ගණී නම් හෝ අසිදෑ ගන්වන්නේ නම් හෝ නිසගී පචිති වේ" යයි**

3. **යො පන** යනු: යමෙක් යම් බඳුයෙක් ...

**භික්ඛු** යනු: ... මේ තෙමේ මේ අර්ථයෙහි 'භික්ඛු' යයි අදහස් කරණ ලදී.

**භික්ඛුස්ස** යනු: අන් මහණකුට ය.

**සාමං** යනු: තෙමේ ම දී.

**චීවර නම්**: සවැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා විකප්පුත් පොහෝනා පැසුළු සිවුරකි.

**කුපිතො අනත්තමනො** යනු: නොපහන්වූයේ, ක්‍රොධයෙන් ගැටුනු සිත් ඇත්තේ, හටගත් කෙලෙස් කණු ඇත්තේ.

**අච්ඡින්දෙය්‍ය** යනු: තෙමේ අසිදෑ ගණී නම් නිසගිපචිති වේ.

**අච්ඡින්දාපෙය්‍ය** යනු: අනෙකකු අණවා නම් දුකුලාඇවැත් වෙයි. වරක් අණවන ලද්දේ බොහෝ දෙයක් අසිඳ ගණී නම් නිසගි වෙයි. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයාට හෝ නිසජිය යුතු යි. මහණෙනි, මෙසේ නිසදිය යුතු යි: "වහන්ස, මගේ මේ සිවුර මහණකුට තමාම දී අසිදෑ ගන්නා ලද්දේ නිසගි විය. මම් මෙය සඟනට නිසජම්"යි ... දෙන්නේය යි .. දෙන්නාහු යි ... ආයුෂ්මත්හට දෙම්"යි.

4. උපසපන් මහණකු කෙරෙහි උපසපන් සත් ඇතියේ සිවුරක් දී කිපියේ නොසතුටුවූයේ අසිඳ ගණී හෝ අසිඳ ගන්වයි හෝ නිසගිපචිති වෙයි. උපසපන් මහණකු කෙරෙහි විමති ඇතියේ ... උපසපනක්හු කෙරෙහි අනුපසපන් සත් ඇතියේ සිවුරක් දී කිපියේ නොසතුටුවූයේ අසිඳ ගණී හෝ අසිඳ ගන්වයි හෝ නිසගිපචිති වේ.

5. අන් පිරිකරක් දී කිපියේ නොසතුටු වූයේ අසිඳ ගණී හෝ අසිඳ ගන්වයි හෝ දුකුලාඇවැත් වෙයි. අනුපසපනකුට සිවුරක් හෝ අන් පිරිකරක් හෝ දී කිපියේ නොසතුටුවූයේ අසිඳ ගණී හෝ අසිඳ ගන්වයි හෝ දුකුලාඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපන් සත් ඇතියේ දුකුලාඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ දුකුලාඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන් සත් ඇතියේ දුකුලාඇවැත් වෙයි.

6. හෙ තෙමේ හෝ දේ නම්, ඔහුට විස්වස් ඇත්තේ හෝ ගණී නම්, (ඔවුනට ද,) උන්මත්තකයාට ද, ආදිකම්මිකයාට ද, ඇවැත් නැත්තේ යි.

**චීවරඅච්ඡින්දන ශික්ෂාපදය නිමි.**

# 5. 3. 6.

## සුත්තවිඤ්ඤත්තිසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ චීවරකාරසමයෙ බහුං සුත්තං විඤ්ඤාපෙසුං. කතෙපි චීවරෙ බහුසුත්තං අවසිට්ඨං හොති. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි: "හන්ද මයං ආවුසො අඤ්ඤම්පි සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙමා"ති. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ අඤ්ඤම්පි සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙසුං. වීතෙපි චීවරෙ බහුසුත්තං[1] අවසිට්ඨං හොති. දුතියම්පි ඛො ඡබ්බග්ගියා භික්ඛූ අඤ්ඤම්පි සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙසුං. වීතෙපි චීවරෙ බහුසුත්තං අවසිට්ඨං හොති. තතියම්පි ඛො ඡබ්බග්ගියා භික්ඛූ අඤ්ඤම්පි සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙසුං. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙස්සන්තී"ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති:- "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙස්සන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං: "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙථා"ති "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: 'කථං හි නාම තුම්හෙ මොඝපුරිසා සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය"න්ති".**

3. **යො පනාති** යො යාදිසො -පෙ-

**භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සාමන්ති** සයං විඤ්ඤාපෙත්වා.

**සුත්තං** නාම: ඡ සුත්තානි: ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගං.

**තන්තවායෙහීති** පෙසකාරෙහි වායාපෙති, පයොගෙ පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ චීවරං සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි වායාපිතං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති. – දදෙය්‍යාති – දදෙය්‍යුන්ති – ආයස්මතො දම්මී"ති.

---

1 බහුංසුත්තං ම.ඡ.ස.

# 5. 3. 6.

## සුත්තවිඤ්ඤත්ති ශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම්වූ වෙළුවන අරම්හි වැඩවසන සේක. තවද එසමයෙහි **සවග මහණහු** සිවුරු **කරණ** කාලයෙහි බොහෝ හූ විතවූහ. සිවුර නිමි කල්හි ද බොහෝ හූ ඉතිරි විය. ඉක්බිති සවග මහණුන්ට **මේ** සිත විය: "ඇවැත්නි, ඉදින් අපි වෙනත් හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියවමෝ නම් මනා යැ"යි. ඉක්බිති සවග **මහණහු** වෙනත් හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියවූහ. සිවුර වියා නිමි කල්හි ද බෝහෝ හූ ඉතිරි වූයේ වෙයි. දෙවනවට ද සවග මහණහු වෙනත් හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියවූහ. සිවුර වියා නිමි කල්හිදු බොහෝ හූ ඉතිරි වූයේ වෙයි. තෙවනවට දු සවග මහණහු වෙනත් හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියවූහ. මිනිස්සු හෙලා දකිති. නුගුණ කියති. දොස් පතුරුවත්: "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ තුමූ හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියවූහුද"යි.

2. භික්ෂූහු හෙලා දකිත, නුගුණ පවසත, දොස් පතුරුවත ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. යම් අපිය් මහණ කෙනෙක් වෙද්ද ඔහු හෙලා දකිත්, නුගුණ පවසත්, දොස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු තුමූ හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියවද්ද"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ. "සැබෑ ද මහණෙනි, තෙපි තුමූ ම හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියෑවූහු දැ"යි. "සැබෑව භාග්‍යවතුන් වහන්ස." භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ නින්දා කළ සේක: "කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි තුමූ හූ විතවා පෙහෙරුන් ලවා සිවුරක් වියෑවූහු ද? හිස් පුරුෂයෙනි, මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි. .... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් සිවුරු පිණිස හූ විනවා පෙහෙරුන් ලවා සිවුරු පිළියක් වියවා නම් නිසගිපචිති එවි"යයි.**

3. **යොපන** යනු යමෙක් යම්බඳුයෙක් ....

**භික්ඛු** යනු ... මේ තෙමේ මේ කරුණෙහි 'භික්ඛු'යයි අදහස් කරණ ලද්දේයි.

**සාමං** යනු තෙමේ ඉල්ලා ගෙණ.

**සුත්ත** නම්: "කොමුවැහැරියෙන් කළ හූ ය, කපුයෙන් නිපන් හූ ය, කිහිරියෙන් කළ හූ ය, එළලොමින් කළ හූය, හණවැහැරියෙන් කළ හූ ය, මේ පස මුසුකොට කළ හූ ය"යි සවැදෑරුම් හූය.

**තන්තවායෙහි** යනු: පෙහෙරුන් ලවා වියවා නම් පියොවක් පාසා දුකුළා වෙයි. ලැබීමෙන් නිසගි වේ. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයාට හෝ නිසැජිය යුතුයි. "මහණෙනි මෙසේ නිසැජිය යුතුයි. "වහන්ස, මවිසින් මේ සිවුරු පිළිය තමා ම හූ විතවා පෙහෙරුන් ලවා වියවන ලද්දේ නිසගි විය. මම් මෙය සඟනට නිසජම් ... දෙන්නේය'යි ... දෙන්නාහු යි ... ආයුෂ්මත්හට දෙමි"යි.

4. වායාපිතෙ වායාපිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං. වායාපිතෙ වෙමතිකො, නිස්සග්ගියං පාචිත්තියං. වායාපිතෙ අවායාපිතසඤ්ඤී, නිස්සග්ගියං පාචිත්තියං.

5. අවායාපිතෙ වායාපිතසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අවායාපිතෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. අවායාපිතෙ අවායාපිතසඤ්ඤී, අනාපත්ති.

6. අනාපත්ති චීවරං සිබ්බෙතුං, ආයොගෙ, කායබන්ධනෙ, අංසවට්ටකෙ,[1] පත්තත්ථවිකාය, පරිස්සාවනෙ, ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සුත්තවිඤ්ඤත්තිසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 3. 7.

## මහාපෙසකාරසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො පුරිසො පවාසං ගච්ඡන්තො පජාපතිං එතදවොච: "සුත්තං ධාරයිත්වා අමුකස්ස තන්තවායස්ස දෙහි. චීවරං වායාපෙත්වා නික්ඛිප. ආගතො අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. අස්සොසි ඛො අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු තස්ස පුරිසස්ස ඉමං වාචං භාසමානස්ස. අථ ඛො සො භික්ඛු යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා, ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "මහාපුඤ්ඤොසි ත්වං ආවුසො උපනන්ද, අමුකස්මිං ඔකාසෙ අඤ්ඤතරො පුරිසො පවාසං ගච්ඡන්තො පජාපතිං එතදවොච: "සුත්තං ධාරයිත්වා අමුකස්ස තන්තවායස්ස දෙහි. චීවරං වායාපෙත්වා නික්ඛිප. ආගතො අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. "අත්ථාවුසො මං සො උපට්ඨාකො"ති. සොපි ඛො තන්තවායො ආයස්මතො උපනන්දස්ස සක්‍ය-පුත්තස්ස උපට්ඨාකො හොති.

2. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො යෙන සො තන්තවායො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තන්තවායං එතදවොච: "ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වීයති, ආයතඤ්ච කරොහි, විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොහී"ති. "එතෙ ඛො මෙ භන්තෙ සුත්තං ධාරයිත්වා අදංසු ඉමිනා සුත්තෙන චීවරං විනාහීති. න භන්තෙ සක්කා ආයතං වා විත්ථතං වා අප්පිතං වා කාතුං, සක්කා ච ඛො භන්තෙ සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කාතුන්ති." "ඉඞ්ඝ ත්වං ආවුසො ආයතඤ්ච කරොහි විත්ථතඤ්ච අප්පිතඤ්ච, න තෙ[2] සුත්තෙන පටිබද්ධං භවිස්සතී"ති.

---

1. අංසබද්ධකෙ. ම.ජ.සං. 2. න තෙන සුත්තෙන. ම.ජ.සං.

4. වියවන ලදුයෙහි වියවන ලදූයි සත් ඇතියේ නිසගිපචිති වෙයි. වියවන ලදුයෙහි විමති ඇත්තේ නිසගිපචිති වෙයි. වියවන ලදුයෙහි නො වියවන ලදූ'යි සත් ඇතියේ නිසගිපචිති වේ.

5. නොවියවන ලදුයෙහි වියවන ලදූයි සත් ඇතියේ දුකුලා ඇවැත් වෙයි. නොවියවන ලදුයෙහි විමති ඇතියේ දුකුලාඇවැත් වෙයි. නොවියවන ලදුයෙහි නොවියවන ලදූ යි සත් ඇතියේ ඇවැත් නැති.

6. සිවුරු මැහීම පිණිස ද, ආයොගපට්ටය, කායබන්ධනය, අංසවට්ටකය, පත්තත්ථවිකාය, පරිස්සාවනය යන මේ නිමිති කොට හූ විනවන්නහුට ද, ඥාති භික්ෂූන්ට ද, පවරණු ලැබූවනට ද, අනෙකක්හු සඳහා ඉල්වන්නහුට ද, සිය ධනයෙන් ගන්නහුට ද, උමතුවූවහුට ද, ආදිකම්මිකයාට ද ඇවැත් නැති.

**සුත්තවිඤ්ඤත්ති ශික්‍ෂාපදය නිමි.**

---

## 5. 3. 7.

## මහාපෙසකාර ශික්‍ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වසන සේක. එසම-යෙහි එක්තරා පුරුෂයෙක් ප්‍රවාසයට යන්නේ බිරිඳට මෙය කීය: "හූ තුලනය කොට අසුවල් පෙහෙරාට දෙව. සිවුරු පිළිය වියවා තබව. පෙරලා ආයෙම් උපනන්ද හිමියන් සිවුරින් පුදන්නෙමි"යි. එක්තරා පිණ්ඩචාරික මහණෙක් කියන්නා වූ ඒ පුරුෂයාගේ මෙතෙපුල් ඇසී ය. ඉක්බිති ඒ මහණ තෙමේ උපනන්ද ශාක්‍යපුත්‍රයන් වෙත එළඹ මෙය කීය: "ඇවැත් උපනන්දයෙනි, තෙපි මහ පිනැත්තහුය. අසුවල් තැන එක්තරා පුරුෂයෙක් ප්‍රවාසයට යන්නේ බිරිඳට මෙය කීය. "නූල් තුලනය කොට අසුවල් පෙහෙරාට දෙව. සිවුරු පිළියක් වියවා තබව. පෙරලා ආයෙම් සිවුර උපනන්ද හිමියන් පුදන්නෙමි'යි. "ඇත ඇවැත්නි, හේ මට උපස්ථායකයැ'යි. ඒ පෙහෙර තෙමේ ද ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන්ගේ උපස්ථායකයෙක් වෙයි.

2. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ ඒ උපස්ථායකයා වෙත එළඹ පෙහෙරට මෙය කීය. "ඇවැත, මේ සිවුරු පිළිය මා උදෙසා වියනු ලැබේ. දිග්වූවක් ද, පුළුල්වූවක් ද, ඝන වූවක් ද, සමව වියන ලද්දක් ද, සමව නූල් එළා වියන ලද්දක් ද, මනා හිරි අඳින ලද්දක් ද, කොස්සෙන් පිරිසිදු කරණ ලද්දක් ද කරව"යි. "වහන්ස, මොහු මට මේ හුයින් සිවුරු පිළියක් වියවයි හූ පමණ කොට දුන්හ. වහන්ස, දිග හෝ පුළුල් හෝ ඝන හෝ කරන්නට නො හැකිය. "වහන්ස, සුවීත ද, සුප්පවායිත ද සුවිලෙඛිත ද සුවිතච්ඡිත ද කරන්නට හැකි වෙයි." ඇවැත, එසේ නම් නෝ දිග්වූවක් ද, පුළුල්වූවක් ද, ඝන වූවක් ද, කරව. තට හුයින් අඩුවෙක් නොවන්නේ ය."

3. අථ ඛො සො තන්තවායො යථාභූතං සුත්තං තනෙන උපනෙත්වා යෙන සා ඉත්ථී තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං ඉත්ථිං එතදවොච: "සුත්තෙන අය්‍යෙ අත්ථො"ති. "නනු ත්වං අය්‍යො මයා වුත්තො: ඉමිනා සුත්තෙන චීවරං විනාහී"ති, "සච්චාහං අය්‍යෙ තයා වුත්තො: ඉමිනා සුත්තෙන චීවරං විනාහී"ති, අපිච මං අය්‍යො උපනන්දො එවමාහ: "ඉඞ්ඝ ත්වං ආවුසො ආයතඤ්ච කරොහි විත්ථතඤ්ච අප්පිතඤ්ච, න තෙ සුත්තෙන පටිබද්ධං භවිස්සතී"ති." අථ ඛො සා ඉත්ථී යත්තකං යෙව සුත්තං පඨමං අදාසි, තත්තකං පච්ඡා අදාසි.

4. අස්සොසි ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො: "සො කිර පුරිසො පවාසතො ආගතො"ති." අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො යෙන තස්ස පුරිසස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සො පුරිසො යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො පජාපතිං එතදවොච:- "තං වායාපිතං[1] චීවරන්ති?" "ආමය්‍ය වායාපිතං තං චීවරන්ති". "ආහර අය්‍යං උපනන්දං චීවරෙන අච්ඡාදෙස්සාමී"ති. අථ ඛො සා ඉත්ථී තං චීවරං නීහරිත්වා සාමිකස්ස දත්වා එතමත්ථං ආරොචෙසි. අථ ඛො සො පුරිසො ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස චීවරං දත්වා උජ්ඣායති ඛීයති විපාචෙති: "මහිච්ඡා ඉමෙ සමණා සක්‍යපුත්තියා අසන්තුට්ඨා, නයිමෙ සුකරා චීවරෙන අච්ඡාදෙතුං. කථං හි නාම අය්‍යො උපනන්දො මයා පුබ්බෙ අප්පවාරිතො තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සතී"ති.

5. අස්සොසුං ඛො භික්ඛූ තස්ස පුරිසස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුබ්බෙ අප්පවාරිතො ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සතී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර ත්වං උපනන්ද පුබ්බෙ අප්පවාරිතො ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජී"ති? "සච්චං භගවා." "ඤාතකො තෙ උපනන්ද අඤ්ඤාතකො"ති? "අඤ්ඤාතකො භගවා"ති. "අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතකස්ස න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා සන්තං වා අසන්තං වා. තත්ථ නාම ත්වං මොඝපුරිස පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය, තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය: 'ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වියති, ආයතඤ්ච කරොථ විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොථ, අප්පෙවනාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමා'ති, එවඤ්ච සො භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසො පිණ්ඩපාතමත්තම්පි, නිස්සග්ගියං පාචිත්තිය"න්ති."**

1. වීතං. සාළුවි.

3. ඉක්බිති ඒ පෙහෙර තෙමේ ගෙණා පමණ හූ යන්ත්‍රයෙහි එලවා ඒ ස්ත්‍රිය වෙත එළඹ මෙය කීය. "ආයසීමෙනි, හුසින් ප්‍රයොජන ඇතැ"යි. "ආයසීයෙනි මේ හුසින් සිවුරක් වියව'යි තෙපි මා විසින් කියන ලද්දහු නො වේ ද?" "සැබව ආයසීමෙනි, තොප විසින් මේ හුසින් සිවුරක් වියව'යි කියන ලද්දෙමි"යි. එතකුදුවුවත් උපනන්ද සවාමිහු මට මෙය කීහ. "ඉදින් ඇවැත තෝ දිග ද පුළුල ද ඝන ද කරව, තට හුසින් අඩුවෙක් නො වත්නේය"යි. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ යම් පමණ හූ පළමුව දුන්නී ද, පසුව ද එපමණ දුන්නීය.

4. ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ ඒ පුරුෂයා බැහැර සිට ආයේයයි ඇසූහ. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ ඒ පුරුෂයාගේ නිවසට එළඹ පැණ වූ අස්නෙහි හුන්හ. ඉක්බිති ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් වෙත එළඹ වැඳ එකත්පසෙක හුන්නේය. එකත් පසෙක හුන් ඒ පුරුෂ තෙමේ බිරිඳට මෙය කියේය. ඒ සිවුරුපිළිය වියවන ලදද"යි. "එසේ ය හිමියනි, ඒ සිවුරු පිළිය වියවන ලද්දේය'යි. "ගෙණ එව. උපනන්ද හිමියන් සිවුරින් පුදන්නෙමි"යි. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ඒ සිවුරුපිළිය ගෙණවුත් සැමියාට දී මෙ පවත් දැන්වූවාය. ඉක්බිති ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයාට සිවුරුපිළිය දී හෙලා දකියි. නුගුණ පවසයි. දෙස් පතුරුවයි: "මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ මහත් ආශාඇත්තෝය. ලද දෙයින් සතුටු නොවන්නෝය. මොහු සිවුරකින් පුදන්නට පහසු නො වෙත්. "කෙසේ නම් උපනන්ද හිමියෝ මවිසින් පෙර නො පවරණ ලද්දහු පෙහෙරුන් වෙත එළඹ සිවුරෙහි අධික විධානයට පැමිණියාහු ද"යි.

5. භික්ෂූහු හෙලා දකින, නුගුණ පවසන, දෙස් පතුරුවන ඒ පුරුෂයාගේ බස් ඇසූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද ඔහු හෙලා දකිති. නුගුණ පවසති. දෙස් පතුරුවති. "කෙසේ නම් ආයුෂමත් උපනන්ද ශාක්‍යපුත්‍රයෝ පෙර නොප-වරණ ලද්දහු ගැහැවියකුගේ පෙහෙරුන් වෙත එළඹ සිවුරුපිළියෙහි අධික විධානයට පැමිණියාහු ද' යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කළහ. "සැබෑ ද උපනන්දය, තෝ පෙර නො පවරණ ලද්දෙහි ගැහැවියකුගේ පෙහෙරුන් වෙත එළඹ සිවුරෙහි අධික විධානයට පැමිණියෙහි දැ" යි· "සැබව, භාග්‍යවතුන් වහන්ස." "උපනන්දය ගේ තාගේ නෑයෙක් ද? නො නෑයෙක් ද? "භාග්‍යවතුන්වහන්ස නො නෑයෙකි." "හිස්පුරුෂය, නො නෑයෙක් නො නෑයකුගේ සුදුසුබව හෝ නුසුදුසු බව හෝ ඇතිබව හෝ නැතිබව හෝ නො දනියි. එහිලා තුච්ඡපුරුෂය, තෝ පෙර නො පවරණ ලද්දෙහි නො නෑ ගැහැවියකුගේ පෙහෙරුන් වෙත එළඹ සිවුරෙහි අධික විධානයට පැමිණියෙහි ය. "තුච්ඡපුරුෂය, තෙල නොපහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නොවෙයි." ... "මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"මහණකු උදෙසාම නොනෑ ගැහැවියෙක් හෝ ගිහිනියක් හෝ පෙහෙරුන් ලවා සිවුරුපිළියක් වියවා නම් එකල්හි ඒ මහණ තෙමේ පෙර නො පවරණ ලද්දේ පෙහෙරුන් වෙත එළඹ ඉදින් සිවුරෙහි අධික විධානයට පැමිණෙේ නම්: 'ඇවැත්නි, මේ සිවුරුපිළිය මා උදෙසා වියනු ලැබේ. දිග්වූවක් ද පුළුල්වූවක් ද ඝනවූවක් ද කරවු. මනාකොට වියන ලද්දක් ද සමකොට හූ අතුරා වියන ලද්දක් ද මනාකොට තිරි අදින ලද්දක් ද, මනාකොට මදින ලද්දක් ද කරවු. ඉදින් අපිදු ආයුෂමතුන්හට කිසිවක් දෙන්නමෝ නම් යෙහෙකැ'යි. ඒ මහණ තෙමේ මෙසේ කියා යටත් පිරිසෙයින් සවල්පමාත්‍රවූ ද පිඩුපමණකුදු දේ නම් නිස්සග්ගිපචිත්ති වේ" යයි.**

6. **භික්ඛුං පනෙව උද්දිස්සාති** භික්ඛුස්සත්ථාය භික්ඛුං ආරම්මණං කරිත්වා භික්ඛුං අච්ඡාදෙතුකාමො.

**අඤ්ඤාතකො** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධො.

**ගහපති** නාම: යො කොචි අගාරං අජ්ඣාවසති.

**ගහපතානී** නාම: යා කාචි අගාරං අජ්ඣාවසති.

**තන්තවායෙහීති** පෙසකාරෙහි.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපගපච්ඡිමං.

**වායාපෙය්‍යාති** විනාපෙති.

**තත්‍ර චෙ සො භික්ඛූති** යං භික්ඛුං උද්දිස්ස චීවරං වීය්‍යති සො භික්ඛු.

**පුබ්බෙ අප්පවාරිතොති** පුබ්බෙ අවුත්තො හොති: "කීදිසෙන තෙ භන්තෙ චීවරෙන අත්ථො, කීදිසං තෙ චීවරං වායාපෙමී"ති.

**තන්තවායෙ උපසඞ්කමිත්වාති** ඝරං ගන්ත්වා යත්ථ කත්ථචි උපසඞ්කමිත්වා

**චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍යාති** "ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වීය්‍යති, ආයතඤ්ච කරොථ, විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොථ."

**අප්පෙවනාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමාති එවඤ්ච සො භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසො පිණ්ඩපාතමත්තම්පීති.** පිණ්ඩපාතො නාම: යාගුපි භත්තම්පි ඛාදනීයම්පි චුණ්ණපිණ්ඩොපි දන්තකට්ඨම්පි දසිකසුත්තම්පි අන්තමසො ධම්මම්පි භණති.

7. තස්ස වචනෙන ආයතං වා විත්ථතං වා අප්පිතං වා කරොති, පයොගෙ දුක්කටං. පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපන්නං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජාමී"ති. -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

6. **භික්ඛුං පනෙව උද්දිස්ස** යනු: මහණකු සඳහා මහණකු අරමුණු කොට මහණක්හට දෙනු කැමැත්තේ.

**අඤ්ඤාතකා** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත්වන මුත්තා යුගළ තෙක් සම්බන්ධනුවූයේ වෙයි.

**ගහපති** නම්: යමෙක් ගිහිගෙයි වෙසේ නම් හෙ තෙමේ ය.

**ගහපතානී** නම්: ගිහිගෙයි වසන යම්කිසි මාගමක්.

**තන්තවායෙහි** යනු: පෙහෙරුන් ලවා.

**චීවර** නම්: සවැදෑරම් සිවුරු අතුරෙන් එක්තරු විකපුත් පොහෝනා පැසුළු සිවුරෙකි.

**වායාපෙය්‍ය** යනු: වියවයි.

**තත්‍ර චෙසො භික්ඛු** යනු: යම් මහණකු උදෙසා සිවුරක් වියනු ලැබේ ද, ඒ මහණ තෙමේ ය.

**පුබ්බෙ අප්පවාරිතො** යනු: "වහන්ස, කෙබඳු සිවුරකින් තොපට ප්‍රයොජන වේ ද, තොපට කෙබඳු සිවුරක් වියවම් දැ යි" පෙර නොකියනු ලැබුවෙක් වෙයි.

**තන්තවායෙ උපසඞ්කමිත්වා** යනු: ගෙට ගොස් යම්කිසි තැනෙක්හි එළඹ ය.

**චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය** යනු: "ඇවැත මේ සිවුරුපිළිය මා උදෙසා වියනු ලැබේ. දිග්වූවක් ද පුළුල්වූවක් ද ඝනවූවක් ද කරවු. මනා කොට වියන ලද්දක් ද, සම්කොට හූ අතුරා වියන ලද්දක් ද, මනාකොට හිරි අදින ලද්දක් ද, මනාකොට මදින ලද්දක් ද කරවු."

**අප්පෙව නාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමාති එවං ච සො භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසො පිණ්ඩපාතමත්තම්පි** යනු: **පිණ්ඩපාත** නම්: හබු ද, බත් ද, කැවිලි ද, සුණුපිඩක් ද, දැහැටි දඬුවක් ද දහවළුකඩක් ද යටත් පිරිසෙයින් දහම් ද දෙසයි.

7. ඔහුගේ වචනයෙන් දිග්වූවක් හෝ පුළුල්වූවක් හෝ ඝනවූවක් හෝ කෙරේ නම් පියෝහි දුකුළා වෙයි. ලැබීමෙන් නිසගි වේ. සඞතට හෝ ගණහාට හෝ පුගුලාට හෝ නිසැජිය යුතු. මහණෙනි, මෙසේ නිසැජිය යුතුයි. "වහන්ස, මාගේ මේ සිවුර පෙර නො පවරණලදුයෙම් නො නෑ ගැහැවියකුගේ පෙහෙරුන් වෙත එළඹ සිවුරෙහි අධිකවිධානයට පැමිණෙන ලදුයේ නිසගි විය. "මෙය මම් සඞතට නිසජම්' යි ... දෙන්නේය' යි ... දෙන්නාහයි ... ආයුෂමත්හට දෙම්' යි.

8. අඤ්ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී පුබ්බෙ අප්පවාරිතො ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජති, නිස්සග්ගියං පාචිත්තියං. අඤ්ඤාතකෙ වෙමතිකො -පෙ- අඤ්ඤාතකෙ ඤාතකසඤ්ඤී පුබ්බෙ අප්පවාරිතො ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජති, නිස්සග්ගියං පාචිත්තියං.

9. ඤාතකෙ අඤ්ඤාතකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඤාතකෙ ඤාතකසඤ්ඤී, අනාපත්ති.

10. අනාපත්ති ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, මහග්ඝං වායාපෙතුකාමස්ස අප්පග්ඝං වායාපෙති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**මහාපෙසකාරසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 3. 8.

## අච්චෙකචීවරසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො මහාමත්තො පවාසං ගච්ඡන්තො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: "ආගච්ඡන්තු භදන්තා, වස්සාවාසිකං දස්සාමී"ති. භික්ඛූ වස්සං වුට්ඨානං භගවතා වස්සාවාසිකං අනුඤ්ඤාත"න්ති කුක්කුච්චායන්තා නාගමංසු. අථ ඛො සො මහාමත්තො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භදන්තා මයා දූතෙ පහිතෙ නාගච්ඡිස්සන්ති" "අහං හි සෙනාය ගච්ඡාමි, දුජ්ජානං ජීවිතං, දුජ්ජානං මරණ"න්ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස මහාමත්තස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ අච්චෙකචීවරං පටිග්ගහෙත්වා නික්ඛිපිතු"න්ති.

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ "භගවතා අනුඤ්ඤාතං අච්චෙකචීවරං පටිග්ගහෙත්වා නික්ඛිපිතුන්ති." අච්චෙකචීවරානි පටිග්ගහෙත්වා චීවරකාලසමයං අතික්කාමෙන්ති. තානි චීවරානි චීවරවංසෙ භණ්ඩිකාබද්ධානි තිට්ඨන්ති. අද්දසා[1] ඛො ආයස්මා ආනන්දො සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තානි චීවරානි චීවරවංසෙ භණ්ඩිකාබද්ධානි තිට්ඨන්තෙ, දිස්වා භික්ඛූ එතදවොච: "කස්සිමානි ආවුසො චීවරානි චීවරවංසෙ භණ්ඩිකාබද්ධානි තිට්ඨන්තී"ති.? "අම්හාකං ආවුසො අච්චෙකචීවරානී'ති. "කීව චිරං පනාවුසො ඉමානි චීවරානි නික්ඛිත්තානී"ති. අථ ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස යථානික්ඛිත්තං ආරොචෙසුං. ආයස්මා ආනන්දො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භික්ඛූ අච්චෙකචීවරං පටිග්ගහෙත්වා චීවරකාලසමයං අතික්කාමෙස්සන්තී"ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි.

---

1. අද්දස. මජසං

8. නොනැසෙකු කෙරෙහි නොනැසෙක යන සත් ඇතියේ පෙර නො පවරණලද්දේ ගැහැවියකුගේ පෙහෙරුන් වෙත එළඹ සිවුරෙහි අධික විධානයට පැමිණේ නම්, නිසගිපචිති වෙයි. නො නැසෙකු කෙරෙහි විමති ඇත්තේ ... නොනැසකු කෙරෙහි නැසෙක යන සත් ඇත්තේ පෙර නොපවරණ ලද්දේ, ගැහැවියකුගේ පෙහෙරුන් වෙත එළඹ සිවුරෙහි අධික විධානයට පැමිණේ නම් නිසගිපචිති වේ.

9. නැසකු කෙරෙහි නොනැසෙක යන සත් ඇතියේ දුකුළාඇවැත් වෙයි. නැසකු කෙරෙහි විමති ඇත්තේ දුකුළාඇවැත් වෙයි. නැසකු කෙරෙහි නැසෙක යන සත් ඇතියේ ඇවැත් නැති.

10. නැයනට, පැවරූවනට, අනෙකක්හු සඳහා, සිය ධනයෙන්, මහඟු කොට වියවනු කැමැත්තහුගේ සිවුර අගය අඩුවූවක් කොට වියවා නම්, උමතුවූවහුට ද, ආදිකම්මිකයාට ද ඇවැත් නැති.

**මහාපෙසකාර ශික්ෂාපදය නිමි.**

---

## 5. 3. 8.

## අච්චෙකචීවරශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් අනේපිඩුසිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එසමයෙහි එක්තරා මහ ඇමතියෙක් ප්‍රවාසයට යන්නේ භික්ෂූන් වෙත දූතයකු යැවීය. වහන්දූවරු වඩිත සේක්වා වස්සාවාසිකයක් දෙන්නෙමි" යි. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් වස්විසූවන්ට වස්සාවාසිකය අනුදන්නා ලදැයි කුකුස් කරමින් නොගියාහු ය. ඉක්බිති ඒ මහඇමති තෙමේ හෙලා දකියි. නුගුණ පවසයි. දෙස් පතුරුවයි. "කෙසේ නම් වහන්දූවරු මා විසින් දූතයකු යැවූ කල්හි නො එද්ද" යි. මම සේනාව සමග යෙමි. ජීවත්වීම නො දත හැකි ය. මරණය නොදත හැකිය" යි. භික්ෂූහු හෙලා දකින නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මහඇමතියාගේ බස් ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට එපවත් සැළ කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කථා වදරා භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, අතික් සිවුරක් පිළිගෙණ තබන්නට අනුදනිමි" යි.

2. එසමයෙහි මහණහු භාග්‍යවතුන් වහන්සේ විසින් අතික් සිවුරක් පිළිගෙණ තබන්නට අනුදන්නා ලදැයි. අතික් සිවුරු පිළිගෙණ චීවරකාලසමය ඉක්මවත්, ඒ සිවුරු චීවරවංසයෙහි බඳබැඳි ව තිබේ. සෙනාසන චාරිකාවෙහි හැසිරෙණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ චීවරවංසයෙහි බඳබැඳි වූ ඒ සිවුරු දුටහ. දැක භික්ෂූන්ට මෙය කීහ. "ඇවැත්නි, චීවරවංසයෙහි පොදි බැඳ තබන ලද මේ සිවුරු කවරක්හුගේ දැ"යි. "ඇවැත්නි අපගේ අතික් සිවුරු"යි. "ඇවැත්නි, මේ සිවුරු කෙතෙක් කල් තබන ලද්දැ"යි. එකල්හි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තැබූපරිදි සැළ කළහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ හෙලා දකිති. නුගුණ පවසති දෙස් පතුරුවති. "කෙසේ නම් භික්ෂූහු අතික් සිවුරක් පිළිගෙණ චීවරකාලසමය ඉක්මවද්දැ"යි. ඉක්බිති ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැළ කළහ.

3. "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අච්චෙකචීවරං පටිග්ගහෙත්වා චීවරකාලසමයං අතික්කාමෙන්තී"ති.? "සච්චං භගවා." විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා අච්චෙකචීවරං පටිග්ගහෙත්වා චීවරකාලසමයං අතික්කාමෙස්සන්ති". නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"දසාහානාගතං කත්තිකතෙමාසිකපුණ්ණමං භික්ඛුනො පනෙව අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය, අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා යාව චීවරකාලසමයං නික්ඛිපිතබ්බං. තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියන්ති".**

4. **දසාහානාගතන්ති** දසාහානාගතාය පවාරණාය.

**කත්තිකතෙමාසිකපුණ්ණමන්ති** පවාරණා කත්තිකා වුච්චති.

**අච්චෙකචීවරං** නාම: සෙනාය වා ගන්තුකාමො හොති, පවාසං වා ගන්තුකාමො හොති, ගිලානො වා හොති, ගබ්භිනී වා හොති, අස්සද්ධස්ස වා සද්ධා උප්පන්නා හොති, අප්පසන්නස්ස වා පසාදො උප්පන්නො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය: "ආගච්ඡන්තු භදන්තා, වස්සාවාසිකං දස්සාමී"ති" එතං අච්චෙකචීවරං නාම.

**අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා යාව චීවරකාලසමයං නික්ඛිපිතබ්බන්ති** සඤ්ඤාණං කත්වා නික්ඛිපිතබ්බං, අච්චෙකචීවරන්ති.

**චීවරකාලසමයො නාම**: අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමො මාසො, අත්ථතෙ කඨිනෙ පඤ්චමාසා.

**තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍යාති** අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමං දිවසං අතික්කාමෙති, නිස්සග්ගියං[1] පාචිත්තියං. **අත්ථතෙ කඨිනෙ** කඨිනුද්ධාරදිවසං අතික්කාමෙති, නිස්සග්ගියං හොති. **නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස** වා **පුග්ගලස්ස** වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ අච්චෙකචීවරං චීවරකාලසමයං අතික්කාමිතං නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති -පෙ- ආයස්මතො දම්මී"ති.

5. අච්චෙකචීවරෙ අච්චෙකචීවරසඤ්ඤී චීවරකාලසමයං අතික්කාමෙති, නිස්සග්ගියං පාචිත්තියං. අච්චෙකචීවරෙ වෙමතිකො චීවරකාලසමයං අතික්කාමෙති, නිස්සග්ගියං පාචිත්තියං. අච්චෙකචීවරෙ අනච්චෙකචීවරසඤ්ඤී චීවරකාලසමයං අතික්කාමෙති, නිස්සග්ගියං පාචිත්තියං. අනධිට්ඨිතෙ අධිට්ඨිතසඤ්ඤී -පෙ- අවිකප්පිතෙ විකප්පිතසඤ්ඤී, අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී, අනට්ඨෙ නට්ඨසඤ්ඤී, අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤී, අදඩ්ඪෙ දඩ්ඪසඤ්ඤී, අවිලුත්තෙ විලුත්තසඤ්ඤී චීවරකාලසමයං අතික්කාමෙති, නිස්සග්ගියං පාචිත්තියං.

---

1. නිස්සග්ගියං හොති සබ්බ.

3. "සැබෑද මහණෙනි, භික්‍ෂූහු අතික් සිවුරක් පිළිගෙණ චීවරකාල-සමය ඉක්මවද්ද"යි. "සැබව, භාග්‍යවතුන් වහන්ස;" භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ ගැරහූ සේක. "මහණෙනි කෙසේ නම් ඒ තුච්ඡපුරුෂයෝ අතික් සිවුරක් පිළිගෙණ චීවරකාලසමය ඉක්මවද්ද" "මහණෙනි තෙල නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නොවෙයි. ... "මහණෙනි, මේ සික-පදය මෙසේ උදෙසවු:"

**"දසදිනකින් නො පත් වප්මස් මැදි පොහොය තෙක් මහණහට අතික් සිවුරක් උපන්නේ නම් ඉක්මන් බව හඟනා මහණහු විසින් පිළිගත යුතුය. පිළිගෙණ චීවරකාලසමය තෙක් තැබිය යුතුය. ඉදින් ඉන් මත්තෙහි තබන්නේ නම් නිසගිපචිති වේ"** යයි.

4. **දසාහානාගතං** යනු: පවාරණය දසදිනකින් නො පත් කල්හි.

**කත්තිකතෙමාසිකපුණ්ණමං** යනු: වප්මස පවුරුණු පණුරස කියනු ලැබේ.

**අච්චෙකචීවර** නම්: සේනාව සමග යනු කැමැත්තේ හෝ වෙයි. බැහැර විසීමට යනු කැමැත්තේ හෝ වෙයි. ගිලනෙක් හෝ වෙයි. ගැබිණියක් හෝ වෙයි. සැදැහැ නැත්තකුට සැදැහැ උපන්නේ හෝ වෙයි. නො පහන් වූවකුට පහන්බව උපන්නේ හෝ වෙයි. ඉදින් හෙ තෙමේ භික්‍ෂූන් වෙත "වහන්දෑවරු වඩිත්වා. වස්සාවාසිකය දෙන්නෙමි'යි දූතයකු එවා නම් මේ අච්චෙකචීවර නම්.

**අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං. පටිග්ගහෙත්වා යාව චීවරකාලසමයං නික්ඛිපිතබ්බං** යනු: මේ අතික් සිවුරයයි සලකුණු කොට තැබිය යුතුයි.

**චීවරකාලසමය** නම්: කෙළින් නො අතුළ කල්හි වැසි සාරමස පිළිබඳ පැසුළු මසයි. කෙළින් අතුළ කල්හි පස්මසකි.

**තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය** යනු: කෙළින් නො අතුළ කල්හි වැසිසාරමස පිළිබඳ පැසුළු දින ඉක්ම වා නම් නිසගිපචිති වෙයි. කෙළින් අතුළකල්හි කෙළින් උදුරණ දිනය ඉක්මවා නම් නිසගි වෙයි. සඟනට හෝ ගණයාට හෝ පුගුලක්හට හෝ නිසැජිය යුතුය. මහණෙනි, මෙසේ නිසැජිය යුතු ... "වහන්ස, මගේ මේ අතික් සිවුර චීවරකාලසමය ඉක්මවන ලද්දේ නිසගි විය. මම් මෙය සඟනට නිසජම්"යි ... දෙන්නේ යයි ... දෙන්නාහ යි ... ආයුෂමත්හට දෙමි" යි.

5. අතික් සිවුරෙහි අතික් සිවුරෙක යන සත් ඇතියේ චීවරකාලසමය ඉක්මවා නම් නිසගිපචිති වෙයි. අතික් සිවුරෙහි විමති ඇත්තේ චීවරකාලසමය ඉක්මවා නම් නිසගිපචිති වෙයි. අතික් සිවුරෙහි නො අතික් සිවුරෙක යන සත්ඇතියේ චීවරකාලසමය ඉක්මවා නම් නිසගි පචිති වේ. නොඉටන ලදුයෙහි ඉටන ලද යි සත් ඇතියේ ... නොවිකපන ලදුයෙහි විකපන ලදයි සත් ඇතියේ නොවිසජන ලදුයෙහි විසජනලද යි සත් ඇතියේ නොනටුයෙහි නටැයි සත් ඇතියේ, නොවැනැසුනෙහි, වැනැසි නැ'යි සත් ඇතියේ නොදැවුනෙහි දැවිනැ'යි සත් ඇතියේ, නොපැහැර ගන්නා ලදුයෙහි පැහැර ගන්නා ලද'යි සත් ඇතියේ චීවරකාලසමය ඉක්මවා නම් නිසගිපචිති වේ.

6. නිස්සග්ගියං චීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. අනච්චෙකචීවරෙ අච්චෙකචීවරසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අනච්චෙකචීවරෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. අනච්චෙකචීවරෙ අනච්චෙකචීවරසඤ්ඤී, අනාපත්ති.

7. අනාපත්ති අන්තොසමයං[1] අධිට්ඨෙති වික්කප්පෙති විස්සජ්ජෙති නස්සති විනස්සති ඩය්හති, අච්ඡින්දිත්වා ගණ්හන්ති, විස්සාසං ගණ්හන්ති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**අච්චෙකචීවරසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 3. 9.

## සාසඞ්කසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ වුත්ථවස්සා[2] ආරඤ්ඤකෙසු සෙනාසනෙසු විහරන්ති. කත්තිකචොරකා "භික්ඛූ ලද්ධලාභා"ති පරිපාතෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ආරඤ්ඤකෙසු සෙනාසනෙසු විහරන්තෙන තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිතු"න්ති.

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ භගවතා අනුඤ්ඤාතං ආරඤ්ඤකෙසු සෙනාසනෙසු විහරන්තෙන තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිතු"න්ති" තෙ තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිත්වා අතිරෙකඡාරත්තං විප්පවසන්ති. තානි චීවරානි නස්සන්තිපි ඩය්හන්තිපි විනස්සන්තිපි උන්දූරෙහිපි ඛජ්ජන්ති. භික්ඛූ දුච්චොළා හොන්ති ලූඛචීවරා. භික්ඛූ එවමාහංසු: "කිස්ස තුම්හෙ ආවුසො දුච්චොළා ලූඛචීවරා"ති. අථ ඛො තෙ භික්ඛූ භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිත්වා අතිරෙකඡාරත්තං විප්පවසිස්සන්තී"ති.

3. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිත්වා අතිරෙකඡාරත්තං විප්පවසන්තී"ති? "සච්චං භගවා" විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිත්වා අතිරෙකඡාරත්තං විප්පවසිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

---

1. අන්තොකාසමයෙ. ම.ජ.ස. 2. වුට්ඨවස්සා ම.ජ.සං.

6. නිසැගි සිවුර නො නිසජා වළඳු නම් දුකුලාඇවැත් වෙයි. නො අතික් සිවුරෙහි අතික් සිවුරෙක යන සත් ඇතියේ දුකුලාඇවැත් වෙයි. නො අතික් සිවුරෙහි විමති ඇත්තේ දුකුලාඇවැත් වෙයි. නො අතික් සිවුරෙහි නො අතික් සිවුරෙක යන සත් ඇතියේ ඇවැත් නැති.

7. සමයතුළ ඉටා නම්, විකපා නම්, විසඳ නම්, නැසේ නම්, වැනසේ නම්, දැවේ නම්, අසිඳ ගණිත් නම්, විස්වසිත් ගණිත් නම්, ඔවුනට, උමතුවූවහුට, ආදිකම්මිකයාට, ඇවැත් නැත්තේ යි.

අචෙච්චකචීවර ශික්ෂාපදය නිමි.

---

## 5. 3. 9.

## සාසඞ්කශික්ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම්වූ අනේපිඩුසිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. තවද එසමයෙහි භික්ෂූහු වැස නිමවූ වස් ඇතියෝහු වනසෙනසුන්හි වෙසෙති. ඉල්මස සොරු "භික්ෂූහු ලද ලාභ ඇත්තාහු යයි" උවදුරු කෙරෙති. භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි, දැහැමි කථා වදරා භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි වනසෙනසුන්හි වසන්නහු විසින් තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබන්නට අනුදනිමි"යි.

2. එසමයෙහි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ විසින් වනසෙනසුන්හි වසන්නහු විසින් තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබන්නට අනුදන්නා ලදැ'යි තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබා අසිරු සරයක් වෙන්ව වෙසෙති. ඒ සිවුරු නැසෙති. වැනසෙති. දැවෙති. මීයන් විසිනුදු කනු ලැබෙති. මහණහු දිරූ සිවුරුපිළී ඇත්තාහු, රළු සිවුරු ඇත්තාහු වෙත්. භික්ෂූහු මෙසේ කීහ. "ඇවැත්නි, තෙපි කුමක් හෙයින් දිරූ සිවුරුපිළී ඇත්තාහු රළුසිවුරු ඇත්තහුදැ"යි. එකල්හි ඒ භික්ෂූහු භික්ෂූන්ට මෙපවත් දැන්වූහ. යම් අපිස් මහණ කෙනෙක් වෙද්ද ඔහු හෙලා දකිති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් මහණහු තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබා අසිරු සරයක් වෙන්ව වෙසෙද්දැ"යි,

3. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. "සැබෑද මහණෙනි, භික්ෂූහු තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබා අසිරු 'සරයක් වෙන්ව වෙසෙත්ල'යි. "සැබව, භාග්‍යවතුන් වහන්ස". භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක: "මහණෙනි, ඒ තුච්ඡපුරුෂයෝ කෙසේ නම් තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබා අසිරා සරයක් වෙන්ව විසූහු ද. මහණෙනි, තෙල නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"උපවස්සං ඛො පන කත්තිකපුණ්ණමං යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි, තථාරූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තො ආකඞ්ඛමානො තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය. සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො තෙන චීවරෙන විප්පවාසාය, ඡාරත්තපරමං තෙන භික්ඛුනා තෙන චීවරෙන විප්පවසිතබ්බං. තතො චෙ උත්තරිං විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියන්ති."**

4. **උපවස්සං ඛො පනාති** වුත්ථවස්සානං.

**කත්තිකපුණ්ණමන්ති** කත්තිකචාතුමාසිනී වුච්චති.

**යානි ඛො පන තානි අරඤ්ඤකානි සෙනාසනානීති** ආරඤ්ඤකං නාම සෙනාසනං පඤ්චධනුසතිකං පච්ඡිමං.

**සාසඞ්කං** නාම: ආරාමෙ ආරාමූපචාරෙ චොරානං නිවිට්ඨොකාසො දිස්සති. භුත්තොකාසො දිස්සති. ඨිතොකාසො දිස්සති. නිසින්නොකාසො දිස්සති. නිපන්නොකාසො දිස්සති.

**සප්පටිභයං** නාම: ආරාමෙ ආරාමූපචාරෙ චොරෙහි මනුස්සා හතා දිස්සන්ති. විලුත්තා දිස්සන්ති. ආකොටිතා දිස්සන්ති.

**තථාරූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තොති** එවරූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තො.

**ආකඞ්ඛමානොති** ඉච්ඡමානො.

**තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරන්ති** සඞ්ඝාටිං වා උත්තරාසඞ්ගං වා අන්තරවාසකං වා.

**අන්තරඝරෙ නික්ඛිපෙය්‍යාති** සමන්තා ගොචරගාමෙ නික්ඛිපෙය්‍ය

**සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො තෙන චීවරෙන විප්පවාසායාති** සියා පච්චයො සියා කරණීයං.

**ඡාරත්තපරමං තෙන භික්ඛුනා තෙන චීවරෙන විප්පවසිතබ්බන්ති** ඡාරත්තපරමතා විප්පවසිතබ්බං.

**අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියාති** ඨපෙත්වා භික්ඛුසම්මුතිං.

**තතො චෙ උත්තරිං විප්පවසෙය්‍යාති** සත්තමෙ අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: **"ඉදං මෙ භන්තෙ චීවරං අතිරෙකඡාරත්තං විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං. ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති — දදෙය්‍යාති — දදෙය්‍යුන්ති — ආයස්මතො දම්මී"ති.**

**"වස් වැස සිල් මැදි පොහොය තෙක් සැක සහිතයයි සම්මත වූ බිය සහිතවූ වනසෙනසුන් කෙනෙක් වෙද්ද, එබඳු සෙනසුන්හි වසන මහණ තෙමේ කැමැත්තේ නම් තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගම තබන්නේය. ඒ මහණහට ඒ සිවුරෙන් වෙන්ව විසීමට කිසි හේතුවක් ඇත්තේ නම් ඒ මහණ විසින් උඩත් පිරිසෙයින් සරයක් කල් ඒ සිවුරෙන් වෙන්ව විසිය යුතුයි. ඉදින් ඉන් මත්තෙහි භික්ෂුසම්මතියෙන් තොරව වෙන්ව වසන්නේ නම් නිසගීපචිති වේ"** යයි.

4 **උපවස්සං පන ඛො** යනු: විසූවස් ඇතියනට.

**කත්තිකපුණ්ණමං** යනු: ඉල්මස පුණුරුසිය කියනු ලැබේ.

**යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි** යනු: දුනු පන්සියක් වූ පැසුළු සෙනසුන ආරණ්‍යක නම්.

**සාසඞ්කං** නම්: අරම්හි ද අරම් උවසරෙහි ද සොරුන් පිවිසි තැන දක්නා ලැබෙයි. අනුභව කළ තැන දක්නා ලැබෙයි. සිටි තැන දක්නා ලැබෙයි. හුන් තැන දක්නා ලැබෙයි. හොත් තැන දක්නා ලැබෙයි.

**සප්පටිභයං** නම්: අරම්හි ද, අරම් උවසරෙහි ද, සොරුන් විසින් නසන ලද මිනිස්සු දක්නා ලැබෙති. පැහැර ගන්නා ලදහු දක්නා ලැබෙති. පෙළන ලද්දහු දක්නා ලැබෙති.

**තථාරූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තො** යනු: එබඳු සෙනසුන්හි වසන මහණ තෙමේය.

**ආකඞ්ඛමානො** යනු: කැමැතිවන්නේ.

**තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං** යනු: සඟළ හෝ පොරෝණය හෝ අඳනය හෝ යි.

**අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය** යනු: හාත්පසැ ගොදුරුගමෙහි තබන්නේය.

**සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො තෙන චීවරෙන විප්පවාසාය** යනු: හේතුවක් වේ නම්, කටයුත්තෙක් වේ නම්.

**ඡාරත්තපරමං තෙන භික්ඛුනා තෙන චීවරෙන විප්පවසිතබ්බං** යනු: උඩත් පිරිසෙයින් සරයක් වෙන්ව විසිය යුතුයි.

**අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා** යනු: භික්ඛුසම්මුතිය හැර.

**තතො චෙ උත්තරිං විප්පවසෙය්‍ය** යනු: සත්වන අරුණ නැගෙත්ම නිසගි වෙයි. සඟහට හෝ ගණයාට හෝ පුඟුලාට නිසැජිය යුතුය. මහණෙනි, මෙසේ නිසදිය යුතු:

"වහන්ස මගේ මේ සිවුර භික්ෂුසම්මතියෙන් තොරව අසිරා සරයක් වෙන්ව වසන ලද්දේ නිසැගි විය. මෙය මම සඟහට නිසජම් යි, ... දෙන්නේ යයි ... දෙන්නාහ යි ... ආයුෂ්මත්හට දෙමි'යි.

5. අතිරේකඡාරත්තෙ අතිරේකසඤ්ඤී විප්පවසති අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං. අතිරේකඡාරත්තෙ වෙමතිකො විප්පවසති අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං. අතිරේකඡාරත්තෙ ඌනකසඤ්ඤී විප්පවසති අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං. අපච්චුද්ධටෙ පච්චුද්ධටසඤ්ඤී -පෙ- අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී, අනට්ඨෙ නට්ඨසඤ්ඤී, අවිනට්ඨෙ විනට්ඨසඤ්ඤී, අදඩ්ඪෙ දඩ්ඪසඤ්ඤී, අවිලුත්තෙ විලුත්තසඤ්ඤී විප්පවසති අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං.

6. නිස්සග්ගියං චීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති, ආපත්ති දුක්කටස්ස. ඌනකඡාරත්තෙ අතිරේකසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. ඌනකඡාරත්තෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. ඌනකඡාරත්තෙ ඌනකසඤ්ඤී, අනාපත්ති.

7. අනාපත්ති ඡාරත්තං විප්පවසති, ඌනකඡාරත්තං විප්පවසති, ඡාරත්තං විප්පවසිත්වා පුන ගාමසීමං ඔක්කමිත්වා වසිත්වා පක්කමති, අන්තොඡාරත්තං පච්චුද්ධරති, විස්සජ්ජෙති නස්සති විනස්සති ඩය්හති, අච්ඡින්දිත්වා ගණ්හන්ති, විස්සාසං ගණ්හන්ති, භික්ඛුසම්මුතියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සාසඞ්කසික්ඛාපදං නිට්ඨිතං.**

---

## 5. 3. 10.

## පරිණතසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරස්ස පූගස්ස සඞ්ඝස්ස සචීවරභත්තං පටියත්තං හොති: "භොජෙත්වා චීවරෙන අච්ඡාදෙස්සාමා"ති. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ යෙන සො පූගො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා තං පූගං එතදවොචුං: "දෙථාවුසො අම්හාකං ඉමානි චීවරානී"ති. "න මයං භන්තෙ දස්සාම අම්හාකං සඞ්ඝස්ස අනුවස්සං සචීවරභික්ඛා පඤ්ඤත්තා"ති, "බහූ ආවුසො සඞ්ඝස්ස දායකා. බහූ සඞ්ඝස්ස භද්දා[1]. මයං තුම්හෙ නිස්සාය තුම්හෙ සම්පස්සන්තා ඉධ විහරාම. තුම්හෙ චෙ අම්හාකං න දස්සථ අථ කො චරහි අම්හාකං දස්සති? "දෙථාවුසො අම්හාකං ඉමානි චීවරානී"ති. අථ ඛො සො පූගො ඡබ්බග්ගියෙහි භික්ඛූහි නිප්පීළියමානො යථාපටියත්තං චීවරං ඡබ්බග්ගියානං භික්ඛූනං දත්වා සඞ්ඝං භත්තෙන පරිවිසි. යෙ තෙ භික්ඛූ ජානන්ති සඞ්ඝස්ස සචීවරභත්තං පටියත්තං, න ච ජානන්ති. ඡබ්බග්ගියානං භික්ඛූනං දින්නානි, තෙ එවමාහංසු:

1. භත්තා ම. ඡ. සං.

5. අතිරෙක සරයක් ඇතියෙහි අතිරෙක ය යන සන් ඇතියේ භික්‍ෂුසම්මුතියෙන් තොරව වෙත් ව වෙසේ නම් නිසගිපචිති වෙයි. අතිරෙක සරයක් ඇතියෙහි විමති ඇතියේ භික්‍ෂුසම්මතියෙන් තොරව වෙත් ව වෙසේ නම් නිසගිපචිති වෙයි. අතිරෙක සරයක් ඇතියෙහි ඌනුසන් ඇතියේ භික්‍ෂුසම්මුතියෙන් තොරව වෙත්ව වෙසේ නම් නිසගි-පචිති වෙයි. නොපසුදුලෙහි පසුදුලායි සන් ඇතියේ ... නොවිසඳන ලද්දෙහි විසඳන ලදැයි සන් ඇතියේ ... නොනැසුනෙහි නැසිනැයි සන් ඇතියේ, නො වැනසුනෙහි වැනසිනැයි සන් ඇතියේ, නොදැවුනෙහි දැවිනැයි සන් ඇතියේ, නො පැහැරගන්නා ලදුයෙහි පැහැර ගන්නා ලදැයි සන් ඇතියේ, භික්‍ෂුසම්මුතියෙන් තොරව වෙත්ව වෙසේ නම් නිසගිපචිති වේ.

6. නිසැගි වූ සිවුර නො නිසජා වළඳ නම් දුකුලාඇවැත් වෙයි. ඌනු සදවසක් ඇතියෙහි අතිරෙක ය යන සන් ඇතියේ දුකුලාඇවැත් වෙයි. ඌනු සදවසක් ඇතියෙහි විමති ඇතියේ දුකුලාඇවැත් වෙයි. ඌනු සදවසක් ඇතියෙහි ඌනුසන් ඇතියේ ඇවැත් නැති.

7. සරයක් වෙත්ව වෙසේ නම්, ඌනු සරයක් වෙත්ව වෙසේ නම්, සරයක් වෙත්ව වැස යළි ගම් ඉමට බැස වැස නික්මේ නම්, ඇතුළු සදවසැ පසුදුරා නම්, විසඳ නම්, නැසේ නම්, වැනසේ නම්, දැවේ නම්, අසිද ගණිත් නම්, විස්වසිත් ගණිත් නම්, භික්‍ෂුසම්මතයෙන් වෙත්ව වෙසේ නම්, උම්තුවුවහුට, ආදිකම්මිකයාට ඇවැත් නැති සි.

සාසඞ්ක ශික්‍ෂාපදය නිමි.

---

# 4. 3. 10.

## පරිණත ශික්‍ෂාපදය.

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි සැවැත්නුවර එක්තරා සමාගමක් විසින් සඟනට වළඳවා සිවුරු දෙන්-නෙමු'යි, සිවුරු සහිත බතක් පිළියෙළ කරණ ලද්දේ වෙයි. එකල්හි සවගමහණහු ඒ සමූහයා වෙත එළඹ ඒ සමූහයාට මේසේ කීහ; "ඇවැත්නි, අපට මේ සිවුරු දෙව"යි. "වහන්ස, අපි නො දෙම්හ. අප විසින් සඟනට අවුරුදු පතා සිවුරු සහිත භික්‍ෂාව පිහිටුවන ලද්දීය." ඇවැත්නි, "සඞ්ඝ-යාට් දායකයෝ බොහෝ ය. සඞ්ඝයාට ලාභද්වාර බොහෝ ය. අපි තොප නිසා, තොප බලමින් මෙහි වසම්හ. ඉදින් තෙපි අපට නොදෙන්නහු නම් එකල්හි කවරෙක් අපට දෙන්නේ ද "ඇවැත්නි, මේ සිවුරු අපට දෙව සි: එකල්හි ඒ ජනසමූහය සවග මහණුන් විසින් තර කොට කියනු ලබන්නේ පිළියෙළ කළ පරිදි සිවුරු සවග මහණුන්ට දි සඞ්ඝයා බතින් වැළඳවීය. යම් භික්‍ෂුකෙනෙක් සඞ්ඝයාට සිවුරු සහිත බතක් පිළියෙල කරණ ලදැයි දනිත් ද, සවග මහණුන්ට දෙන ලදැයි නොදනිත් ද." ඔහු මෙසේ කීහ.

2. "ඔනොජෙථාවුසො සඞ්ඝස්ස චීවර"න්ති. "තම්පි භන්තෙ යථාපවියත්තං චීවරං අය්‍යා ඡබ්බග්ගියා අත්තනො පරිණාමෙසු"න්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙස්සන්ති"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙථා"ති? "සච්චං භගවා" විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:"

**"යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තිය**න්ති.

3. **යො පනා**ති යො යාදිසො -පෙ-

**භික්ඛූ**ති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ජානා**ති නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති, සො වා ආරොචෙති.

**සඞ්ඝිකං** නාම: සඞ්ඝස්ස දින්නං හොති පරිච්චත්තං.

**ලාභො** නාම: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා, අන්තමසො චුණ්ණපිණ්ඩොපි දන්තකට්ඨම්පි දසිකසුත්තම්පි.

**පරිණතං** නාම: දස්සාම කරිස්සාමාති වාචා භින්නා හොති.

4. අත්තනො පරිණාමෙති. පයොගෙ දුක්කටං, පටිලාභෙන නිස්සග්ගියං හොති. නිස්සජ්ජිතබ්බං සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා. එවඤ්ච පන භික්ඛවෙ නිස්සජ්ජිතබ්බං: "ඉදං මෙ භන්තෙ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමිතං නිස්සග්ගියං, ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමී"ති. -පෙ- දදෙය්‍යාති -පෙ- දදෙය්‍යුන්ති, -පෙ- ආයස්මතො දම්මී"ති.

5. පරිණතෙ පරිණතසඤ්ඤී අත්තනො පරිණාමෙති, නිස්සග්ගියං පාචිත්තියං. පරිණතෙ වෙමතිකො අත්තනො පරිණාමෙති, ආපත්ති දුක්කටස්ස. පරිණතෙ අපරිණතසඤ්ඤී අත්තනො පරිණාමෙති, ආපත්ති දුක්කටස්ස. සඞ්ඝස්ස පරිණතං අඤ්ඤසඞ්ඝස්ස වා චෙතියස්ස වා පරිණාමෙති, ආපත්ති දුක්කටස්ස. චෙතියස්ස පරිණතං අඤ්ඤචෙතියස්ස වා සඞ්ඝස්ස වා ගණස්ස වා පුග්ගලස්ස වා පරිණාමෙති, ආපත්ති දුක්කටස්ස. පුග්ගලස්ස පරිණතං අඤ්ඤස්ස පුග්ගලස්ස වා සඞ්ඝස්ස වා ගණස්ස වා චෙතියස්ස වා පරිණාමෙති, ආපත්ති දුක්කටස්ස. අපරිණතෙ පරිණතසඤ්ඤී, ආපත්ති දුක්කටස්ස. අපරිණතෙ වෙමතිකො, ආපත්ති දුක්කටස්ස. අපරිණතෙ අපරිණතසඤ්ඤී අනාපත්ති.

2. "ඇවැත්නි සඞ්ඝයාට සිවුරු පිරිකර දෙව්"යි. "වහන්ස, තැන පිළියෙල කළ පරිදි සිවුරු සවග මහණහු තමන්ට පිරිණමා ගත්හ" යි. යම් අපිත් මහණහු කෙනෙක් වෙද්ද ඔහු හෙලා දකිති. නුගුණ පවසති දෙස් පතුරුවත්. "කෙසේ නම් සවග මහණහු දැන දැන පිරිණමන ලද සඟසතු ලාභය තමහට පිරිණාමූහුද"යි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැළ කළහ. "සැබෑද, මහණෙනි තෙපි පිරිණමන ලද සඟසතු ලාභය දැන දැන තමහට පිරිණාමූහු දැයි." "සැබව, භාග්‍යවතුන් වහන්ස." භාග්‍යවත් බුදුරජාතන් වහන්සේ ගැරහූ සේක. "කෙසේ නම් තුච්ඡපුරුෂයෙනි, තෙපි පිරිණමන ලද සඟසතු ලාභය දැන දැන තමහට පිරිණාමූහු ද, තුච්ඡපුරුෂයෙනි, තෙල නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස හෝ නොවෙයි මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් දැන දැන සඟසතු පිරිණාමූ ලාභය තමහට පිරිණමවන්නේ නම් නිසග්පචිති වේ"යයි.**

3. **යො පන** යනු: යමෙක් යම් බඳුයෙක් ...

**භික්ඛු** යනු ... මේ තෙමේ මේ අර්ථයෙහි 'භිකඛු'යි අදහස් කරණ ලදී.

**ජානන්ති** නම්: තෙමේ හෝ දනියි. අන් කෙනෙක් හෝ ඔහුට දන්වත්. හෙ තෙමේ හෝ දන්වයි.

**සඞ්ඝිකං** නම්: සඞ්ඝයාට දෙන ලද්දේ පරිභොග කරණ ලද්දේ වෙයි.

ලාභ නම්: සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකරය. යටත් පිරිසෙයින් සුණුපිඬකුදු දැහැටි දඬකුදු දවළුහුයකුදු

**පරිණත** නම්: දෙම්හ. කරම්හ'යි වාක් හෙද කරණලද වේ.

4. තමහට පිරිණමවා නම් පියෝහි දුකුළා වෙයි. ලැබීමෙන් නිසගි වේ. සඟනට හෝ ගණයාට හෝ පුහුලක්හට හෝ නිසැජිය යුතුය. "මහණෙනි, මෙසේ නිසැජිය යුතු "වහන්ස, මවිසින් සඟනට පිරිණාමූ සඟසතු ලාභය දැන දැන තමහට පිරිණමන ලද්දේ නිසගි විය. "මම මෙය සඟනට නිසජමි"යි ... දෙන්නේය යි. ... දෙන්නාහයි. ... ආයුෂ්මත්හට දෙමි"යි.

5. පිරිණමන ලද්දෙහි පිරිණාමි සත් ඇතියේ තමහට පිරිණමා නම් නිසැගි පචිති වෙයි. පිරිණමන ලද්දෙහි විමති ඇත්තේ තමහට පිරිණමා නම් දුකුළාඇවැත් වෙයි. පිරිණමන ලද්දෙහි නොපිරිණාමි සත් ඇතියේ තමහට පිරිණමා නම් දුකුළාඇවැත් වෙයි. සඞ්ඝයාට පිරිණමන ලද්ද අන් සඟනට හෝ සෑයකට හෝ පිරිණමා නම් දුකුළාඇවැත් වෙයි. සෑයකට පිරිණමන ලද්ද අන් සෑයකට හෝ සඟනට හෝ ගණයාට හෝ පුහුලක්හට හෝ පිරිණමා නම් දුකුළාඇවැත් වෙයි. පුහුලක්හට පිරිණමන ලද්ද අන් පුහුලක්හට හෝ සඟනට හෝ ගණයාට හෝ සෑයකට හෝ පිරිණමා නම් දුකුළාඇවැත් වෙයි. නොපිරිණමන ලද්දෙහි පිරිණාමූ සත් ඇතියේ දුකුළාඇවැත් වෙයි. නොපිරිණමන ලද්දෙහි විමති ඇතියේ දුකුළාඇවැත් වෙයි. නො පිරිණමන ලද්දෙහි නො පිරිණමන ලදැයි සත් ඇතියේ ඇවැත් නැති.

6. අනාපත්ති කත්ථ දෙමාති පුච්ඡියමානො යත්ථ තුම්හාකං දෙය්‍යධම්මො පරිභොගං වා ලභෙය්‍ය පටිසඞ්ඛාරං වා ලභෙය්‍ය චිරට්ඨිතිකො වා අස්ස, යත්ථ වා පන තුම්හාකං චිත්තං පසීදති තත්ථ දෙථාති භණති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පරිණතසික්ඛාපදං නිට්ඨිතං.**

---

## පත්තවග්ගො තතියො.

**තස්සුද්දානං:**

ද්වෙ ච පත්තානි භෙසජ්ජං වස්සිකාදානපඤ්චමං,
සාමං වායාපනච්චෙකො සාසඞ්කං සඞ්ඝිකෙන චාති.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තිංසනිස්සග්ගියා පාචිත්තියා ධම්මා. තත්ථායස්මන්තෙ පුච්ඡාමි: කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි: කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි: කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

[අතිරෙකෙකරත්තඤ්ච අකාලපොරාණධොවනං,
පටිග්ගහඤ්ච තඤ්ඤෙව විඤ්ඤත්ති ච තතුත්තරි,
ද්වෙ අප්පවාරිතා චෙව තික්ඛත්තුං චොදනාය චාති.

---

මිස්සකං සුද්ධකඤ්චෙව තුලඤ්ච අනුවස්සකං,
පුරාණසන්ථතඤ්චෙව ලොමානං හරණෙන ච,
ධොවනං රූපියඤ්චෙව ද්වෙ ච නානප්පකාරකාති.

---

අතිරෙකඤ්ච පත්තඤ්ච ඌනෙන බන්ධනෙන ච,
භෙසජ්ජං සාටකඤ්චෙව කුපිතෙන අච්ඡින්දනං,

ද්වෙ තන්තවායා චෙව අච්චෙකචීවරෙන ච,
ඡාරත්තං විප්පවාසෙන අත්තනො පරිණාමනාති.]*

**තිංසකං නිට්ඨිතං.**

## පාරාජිකපාළි නිට්ඨිතා.

---

* ඉමා අතිරෙකගාථායො සීහල පොත්ථකෙසු යෙව දිස්සන්තෙ.

6 කොතැන්හි දෙන්නමෝදැ යි විචාරණු ලබන්නේ, යම් තැනක තොපගේ දෙයධර්මය පරිභොගය හෝ ලබන්නේ නම්, පිළිසකර හෝ ලබන්නේ නම්, කල් පවත්නේ හෝ වන්නේ නම්, යම් තැනක හෝ තොපගේ සිත පහදී නම්, එහි දෙව'යි කියා නම්, උම්මත්තුවූවහුට, ආදිකම්මිකයාට, ඇවැත් නැති.

**පරිණත ශික්ෂාපදය නිමි.**

---

**පාත්‍රවර්ගයයි.**

**එහි උද්දානය:**

පාත්‍රසිකපද දෙකය, භෙසජ්ජ, වස්සික සහ පස්වැනි අච්චේකත ශික්ෂාපදය ද, සුත්තවිඤ්ඤත්ති, මහාපෙසකාර, අච්චෙකචීවර, සාසඞ්ක, සඞ්ඝික පරිණතය යන පසදැ යි දස ශික්ෂාපද කෙනෙක් වෙත්.

ඇවැත්නි, තිස් නිස්සග්ගිපාචිත්ති දහම්හු උදෙසන ලද්දහ. එහිලා ආයුෂ්මතුන් විචාරමි: කිම පිරිසිදුවවු දැ? දෙවනවට ද විචාරමි: "කිම පිරිසිදුවවු දැ? තෙවනවට ද විචාරමි: කිම පිරිසිදුවවු දැ? එහිලා ආයුෂ්මත්හු පිරිසිදුවවූ. එහෙයින් මේ තුෂ්ණීම්භාවය යි. මෙසේ තෙල තුෂ්ණීම්භාවය දරමි"යි.

**තිංසකය නිමි.**

## පාරාජිකපාළිය නිමි.

# පදානුක්කමණිකා


| අ | පිටුව |
|---|---|
| අක්ඛදස්සා | 104 |
| අක්ඛයිතං | 70 |
| අක්ඛරිකාය | 468 |
| අක්ඛාතං | 44, 294 |
| අක්ඛෙත | 468 |
| අකටං | 584 |
| අකතකිබ්බිසො | 158 |
| අකතඤ්ඤුනො | 158 |
| අකප්පියං | 46, 294 |
| අකාමකා | 30 |
| අකාලචීවරං | 512, 514 |
| අකිරියවාදො | 6 |
| අකිලාසුනො | 18 |
| අග්ගදත්තං | 328 |
| අග්ගිසිඛූපමෙ | 198 |
| අගම්මහ | 36 |
| අගාරං | 28 |
| අඞ්ගජාතං | 46, 286, 516 |
| අඞ්ගජාතසාමන්තා | 84 |
| අඞ්ගාරකාසුයා | 46 |
| අඞ්ගුට්ඨං | 82, 292 |
| අඞ්ගුලන්තරිකාය | 92 |
| අඞ්ගුලිපතොදකෙන | 186 |
| අච්චයෙන | 24 |
| අච්චෙකචීවරං | 628 |
| අච්ඡරායො | 38 |
| අච්ඡරියං | 250 |
| අච්ඡාදෙතුං | 624 |
| අච්ඡාදෙතුකාමො | 536 |
| අච්ඡාදෙස්සති | 546 |
| අච්ඡාදෙසි | 26 |
| අච්ඡින්නචීවරෙ | 530 |
| අචිරවුට්ඨිතාය | 28 |
| අචිරූපසම්පන්නො | 34 |
| අජ්ජතග්ගෙ | 40 |
| අජ්ජුණ්හො | 548 |
| අජ්ඣාචාරෙ | 322 |
| අජ්ඣාපන්නො | 426 |
| අජ්ඣාවසතා | 28, 30 |
| අජ්ඣුපගතො | 56 |
| අජ්ඣොකාසෙ | 128 |

| අ | පිටුව |
|---|---|
| අජ්ඣොගාහෙත්වා | 522 |
| අජානන්තස්ස | 80 |
| අජිකා | 434 |
| අජ්කාසප්පි | 610 |
| අජීනක්ඛිපං | 82 |
| අඤ්ඤථත්තාය | 44 |
| අඤ්ඤභාගියස්ස | 436 |
| අඤ්ඤමඤ්ඤවුට්ඨාපනෙන | 464 |
| අඤ්ඤු ගති | 34 |
| අඤ්ඤාතිකාය | 578 |
| අට්ටකං | 180 |
| අට්ටස්සරං | 246, 248 |
| අට්ටීයමානො | 58 |
| අට්ඨපදෙ | 468 |
| අට්ඨානං | 56 |
| අට්ඨාරසභෙදකරවත්ථූනි | 452 |
| අණ්ඩකොසම්හා | 10 |
| අත්තකාමපාරිචරියසික්ඛාපදං | 330 |
| අත්තාගරහිතො | 54 |
| අත්තුද්දෙසං | 382 |
| අත්තූපනායිකං | 198, 200 |
| අත්ථපුරෙක්ඛාරස්ස | 326 |
| අත්ථවසෙ | 54 |
| අත්ථසංහිතං | 14 |
| අත්ථි නාම | 36 |
| අතික්කාමෙති | 140, 574 |
| අතිමඤ්ඤිස්සති | 14 |
| අතියාචකො | 378 |
| අතිරෙකචීවරං | 438 |
| අතිරෙකඡාරත්තං | 632 |
| අතිරෙකපත්තො | 592 |
| අතිහරාපෙසුං | 40 |
| අථෙය්‍යචිත්තො | 130 |
| අද්ධනියං | 22 |
| අද්ධානමග්ගප්පටිපන්නො | 140, 572 |
| අදාතුකාමා | 24 |
| අදිට්ඨෙ | 200, 426 |
| අධිගතසඤ්ඤිතො | 200 |
| අධිගතා | 12 |
| අධිචිත්තං | 576 |
| අධිචිත්තසික්ඛා | 56 |

| අ | පිටුව |
|---|---|
| අධිට්ඨිතෙන | 192 |
| අධිපඤ්ඤ | 56, 576 |
| අධිමානෙන | 200, 234 |
| අධිවචනො | 130 |
| අධිවාසෙතු | 14 |
| අධිවාසෙසි | 24 |
| අධිසයිතානි | 8 |
| අධිසීලසික්ඛා | 56 |
| අධොජානුමණ්ඩලං | 324 |
| අන්තරඝරෙ | 632 |
| අන්තරධාපෙසුං | 18 |
| අන්තරභොගිකා | 104 |
| අන්තරවාසකං | 518, 634 |
| අන්තොකොට්ඨාගාරිකො | 610 |
| අන්තොමතො | 42 |
| අන්දුබන්ධෙන | 106 |
| අනගාරියං | 28 |
| අනඞ්ගණො | 10 |
| අනඤ්ඤගරහිතො | 54 |
| අනත්තමනො | 420 |
| අනත්ථසංහිතං | 194 |
| අනධිගතෙ | 200 |
| අනධිට්ඨිතො | 594 |
| අනන්තරහිතාය | 30 |
| අනනුවජ්ජියං | 46 |
| අනනුඤ්ඤාතං | 28 |
| අනනුලොමිකං | 294 |
| අනපලොකෙත්වා | 24 |
| අනභාවකතා | 4 |
| අනභිජානං | 200 |
| අනභිරද්ධො | 424 |
| අනලසො | 338 |
| අනවකාසො | 56 |
| අනවයො | 96 |
| අනස්සාසකො | 186 |
| අනාගාමිඵලසච්ඡිකිරියාය | 204 |
| අනාදීනවදස්සො | 40 |
| අනාවීකත්වා | 54, 80 |
| අනිච්චානුපස්සී | 156 |
| අනිමිත්තං | 204, 222, 322 |
| අනිසජ්ජිත්වා | 632 |
| අනීතිකා | 422 |
| අනීලකං | 16 |
| අනුකම්පා | 96 |
| අනුඤ්ඤාතා | 28 |
| අනුත්තරෙ | 1 |
| අනුද්දිට්ඨං | 18 |
| අනුද්ධංසිතො | 426 |
| අනුද්ධංසෙති | 196, 256, 424 |
| අනුප්පාදධම්මා | 4 |
| අනුපගම්ම | 26 |
| අනුපද්දවා | 422 |
| අනුප්පන්නා | 4 |
| අනුපරිගන්තුං | 408 |
| අනුපාදාය | 18, 42 |
| අනුපුබ්බෙන | 36 |
| අනුයුඤ්ජථ | 424 |
| අනුයුඤ්ජිංසු | 436 |
| අනුවාදාධිකරණස්ස | 438 |
| අනුසඤ්ඤායමානො | 98 |
| අනෙකපරියායෙන | 42 |
| අනෙකවිහිතං | 10 |
| අප්පකං | 18 |
| අප්පකිලමථො | 380 |
| අප්පග්ඝං | 628 |
| අප්පඤ්ඤත්තො | 40 |
| අප්පටිභාතා | 442 |
| අප්පණිහිතං | 222, 230 |
| අප්පතීතො | 424, 436 |
| අප්පතිරූපං | 46 |
| අප්පත්තො | 200 |
| අප්පපුඤ්ඤ | 54 |
| අප්පමත්තස්ස | 12 |
| අප්පමාණකාය | 374 |
| අප්පවාරිතො | 536, 624 |
| අප්පසන්නානං | 44 |
| අප්පිච්ඡතාය | 448 |
| අප්පිච්ඡස්ස | 48 |
| අප්පිතං | 536, 622 |
| අප්පෙවනාම | 38, 424 |
| අප්පොරෙත්වා | 468 |
| අපගබ්භා | 8 |
| අපච්චක්ඛාතො | 66 |
| අපච්චුද්ධටෙ | 510 |
| අපචයස්ස | 48, 448 |
| අපචිතො | 196 |
| අපඤ්ඤත්තං | 18 |
| අපදං | 116 |

| අ | පිටුව |
|---|---|
| අපදිසන්ති | 418 |
| අපරජ්ඣති | 424 |
| අපරත්තං | 112 |
| අපරික්කමනං | 382 |
| අපරිභුත්තං | 578 |
| අපස්සාය | 88 |
| අපරිසංකිතස්ස | 426 |
| අපසාදිතො | 340 |
| අපසාදෙති | 238 |
| අපස්සෙනං | 162 |
| අපුත්තකං | 40 |
| අබ්‍යාවටෙන | 340 |
| අබ්බුදං | 40 |
| අබ්බොහාරිකා | 260 |
| අබ්භක්ඛිංසු | 182 |
| අබ්භක්ඛුසිං | 12 |
| අබ්භාකුටිකො | 468 |
| අබ්භුග්ගච්ඡි | 42 |
| අබ්භුතං | 250 |
| අබ්භුතධම්මං | 20 |
| අබ්‍රහ්මචරියෙන | 196 |
| අබලඅබලො | 468 |
| අභබ්බො | 68, 244 |
| අභයා | 422 |
| අභික්කන්තං | 14 |
| අභිචාරිණී | 250 |
| අභිජ්ජමානො | 152 |
| අභිනිග්ගණ්හාති | 298 |
| අභිනින්නාමෙසිං | 10 |
| අභිනිප්පීළෙති | 298 |
| අභිනෙත්ත | 130, 596 |
| අභිනිබ්භිජ්ජෙය්‍ය | 8 |
| අභිනිම්මිනිස්සාමි | 16 |
| අභිනිප්ඵාදෙය්‍ය | 552 |
| අභිනිසීදන්ති | 70 |
| අභිප්පමොදයං | 156 |
| අභියුඤ්ජති | 112 |
| අභිරමස්සු | 30 |
| අභිරූළ්හ | 318 |
| අභිවාදෙති | 4 |
| අභිවිඤ්ඤාපෙසි | 40 |
| අභිවිතරිත්වා | 160 |
| අභිසම්මතො | 462 |
| අභිසමෙතාවිනී | 486 |

| අ | පිටුව |
|---|---|
| අභිසංහාරිකං | 420 |
| අභිහට්ඨුං පවාරෙය්‍ය | 534 |
| අභිහරිංසු | 610 |
| අභෙජ්ජප්පත්තො | 10 |
| අමුත්‍ර | 10 |
| අමූලකෙන | 196, 424 |
| අය්‍යපුත්තො | 40 |
| අයොනිසො | 54 |
| අයොපත්තො | 594 |
| අරසරූපො | 4 |
| අරහං | 1 |
| අරහසි | 322 |
| අරියෙන | 66 |
| අරුණුග්ගමනෙ | 516 |
| අරූපියෙ | 586 |
| අරොගතත්තා | 484 |
| අලක්ඛිකො | 54 |
| අලමරියඤාණදස්සනං | 200 |
| අලංකම්මනියෙ | 484 |
| අලොහිතා | 322 |
| අවචනීයං | 464 |
| අවජානාසි | 174 |
| අවහර | 120 |
| අවහරණචිත්තො | 104 |
| අවාපුරණං | 292 |
| අවාසිකං | 556 |
| අවිකොපිකො | 594 |
| අවිචාරං | 10 |
| අවිජ්ජා | 10 |
| අවිජ්ජාසවා | 12 |
| අවිඤ්ඤුස්ස | 66 |
| අවිතක්කං | 10 |
| අවිදූරෙ | 28 |
| අවිප්පවුත්ථො | 510 |
| අවිලුත්තෙ | 596 |
| අවිහෙඨා | 96 |
| අවීතරාගො | 18 |
| අවුත්තා | 570 |
| අස්සමණ්ඩලිකාසු | 14 |
| අස්සාමණකං | 294, 461 |
| අස්සාමිකායො | 374 |
| අස්සසන්තො | 156 |
| අස්සු | 450 |
| අසක්‍යපුත්තියභාවං | 58, 88 |

| අ | පිටුව |
|---|---|
| අසඞ්ගහීතානි | 18 |
| අසද්ධම්මං | 46, 52 |
| අසඤ්ඤකස්ස | 76 |
| අසන්තං | 24 |
| අසප්පායානි | 158 |
| අසම්මුට්ඨා | 10 |
| අසම්භුණාතියමානො | 200 |
| අසල්ලීනං | 10 |
| අසාදියන්තස්ස | 80 |
| අසාරද්ධා | 10 |
| අසාවෙතුකාමො | 66 |
| අසිලොමං | 248 |
| අසුචිං | 256 |
| අසුකස්ස | 426 |
| අසෙචනකො | 154, 156 |
| අංසකූටෙන | 318 |
| අංසවට්ටකෙ | 622 |
| අහිකුණපෙන | 152 |
| **ආ** | |
| ආකඩ්ඪිත්වා | 454 |
| ආකාරෙහි | 64 |
| ආකාසට්ඨං | 108 |
| ආකිණ්ණලොමං | 326 |
| ආකොටාපෙය්‍ය | 518 |
| ආකොටිකා | 634 |
| ආගතඵලා | 486 |
| ආගමෙහි | 22 |
| ආචිණ්ණා | 50 |
| ආතාපිනො | 10, 12, 576 |
| ආදිකම්මිකස්ස | 454 |
| ආදිත්තං | 422 |
| ආදිත්තාය | 46 |
| ආදියෙය්‍ය | 104 |
| ආදිස්ස | 514 |
| ආනාපානස්සතිසමාධි | 154 |
| ආනෙඤ්ජං | 254 |
| ආපණිකස්ස | 144 |
| ආපත්තාධිකරණස්ස | 438 |
| ආභිදොසිකං | 36 |
| ආමිසෙන | 140 |
| ආයතිං | 4 |
| ආයස්මන්තං | 36 |
| ආරඤ්ඤිකො | 34 |

| ආ | පිටුව |
|---|---|
| ආරද්ධං | 10 |
| ආරද්ධවිරියෙන | 240 |
| ආරාධනීයො | 240 |
| ආරාමිකභාවං | 58 |
| ආලග්ගෙත්වා | 142 |
| ආලයසමුග්ඝාතාය | 44 |
| ආලිම්පෙන්තස්ස | 284 |
| ආවසථා | 296 |
| ආවිඤ්ජි | 318 |
| ආවෙළං | 466 |
| ආසයො | 386 |
| ආසවනිරොධො | 12 |
| ආසවසමුදයො | 12 |
| ආසීවිසස්ස | 46 |
| ආහතචිත්තා | 424, 618 |
| ආහිණ්ඩන්තා | 512 |
| ආහිණ්ඩිස්සාමි | 146 |
| **ඉ** | |
| ඉක්ඛණිකා | 250 |
| ඉජ්ඣෙය්‍ය | 184 |
| ඉට්ඨකා | 178 |
| ඉතිවුත්තං | 20 |
| ඉතිහ | 40 |
| ඉත්ථන්නාමො | 120, 168, 458 |
| ඉත්ථිකා | 38 |
| ඉත්ථිධනං | 38 |
| ඉත්ථිපණ්ඩකා | 374 |
| ඉන්දඛීලෙ | 104 |
| ඉන්දගොපකො | 96 |
| ඉස්සාපකතා | 250 |
| **උ** | |
| උක්කඩ්ඪියති | 616 |
| උක්කණ්ඨිතො | 58 |
| උක්කුටිකං | 500, 582 |
| උක්ඛිත්තං | 130 |
| උක්ඛෙපිකො | 212 |
| උග්ගණ්හෙය්‍ය | 580 |
| උග්ඝාටෙත්වා | 292 |
| උච්චාරං | 142, 284 |
| උච්චාරෙසි | 178 |
| උච්චාලිඞ්ගපාණකදට්ඨෙන | 88, 260 |
| උච්ඡින්නමූලා | 4 |
| උච්ඡෙදෙ | 6 |

| උ | පිටුව |
| --- | --- |
| උජ්ඣග්ඝන්ති | 320 |
| උජ්ඣායන්තානං | 450 |
| උජ්ඣායන්ති | 98 |
| උක්කුජ්ජිත | 14, 376 |
| උට්ඨාපෙසුං | 182 |
| උට්ඨෙති | 34 |
| උත්තරත්ථරණං | 128, 530 |
| උත්තරාසඞ්ගො | 22 |
| උත්තරිභඞ්ගං | 420 |
| උත්තරිමනුස්සධම්මස්ස | 42, 256 |
| උත්තාරෙසුං | 142 |
| උතුනී | 40 |
| උද්දිස්සය | 22 |
| උද්දෙසං | 58 |
| උද්දෙසපරියාපන්නාසු | 462 |
| උද්දෙසිතො | 508 |
| උදග්ගො | 34 |
| උදඤ්ජලිං | 290 |
| උදපාදිං | 10 |
| උදයො | 572 |
| උදරවට්ටියං | 92 |
| උද්ධතං | 20 |
| උදුක්ඛලො | 14 |
| උදුක්ඛලභණ්ඩිකං | 44 |
| උන්දූරතං | 386 |
| උප්පණ්ඩුප්පණ්ඩුකජාතො | 42 |
| උපක්ඛටං | 536 |
| උපකච්ඡකෙ | 92 |
| උපචිකානං | 386 |
| උපජ්ඣායං | 58 |
| උපට්ඨානසාලායං | 154 |
| උපට්ඨාසිකං | 482 |
| උපද්දුතා | 374 |
| උපනාමෙති | 14 |
| උපනික්ඛිත්තො | 136, 580 |
| උපනික්ඛිපතං | 169 |
| උපනිජ්ඣායි | 288 |
| උපනිධි | 116 |
| උපනිස්සාය | 34 |
| උපලාපෙත්වා | 50, 140 |
| උපවාදකා | 12 |
| උපසම්පජ්ජ | 18 |
| උපහතින්ද්‍රියො | 88 |

| උ | පිටුව |
| --- | --- |
| උපාදින්නො | 442 |
| උපාදින්නරූපෙ | 262 |
| උපෙක්ඛකො | 10 |
| උබ්බිජ්ජන්ති | 374 |
| උබ්භක්ඛකං | 324 |
| උබ්භතස්මිං | 500, 514 |
| උබ්භුජිත්වා | 94 |
| උභතොබ්‍යඤ්ජනකො | 68 |
| උභතොවණ්ටිකමාලං | 466 |
| උම්මසති | 298 |
| උම්මසනා | 296 |
| **එ** | |
| එකජ්ඣං | 418 |
| එකතොවණ්ටිකමාලං | 460 |
| එකථාලකෙ | 468 |
| එකන්තපරිපුණ්ණං | 28 |
| එකන්තපරිසුද්ධං | 28 |
| එකපාපුරණා | 460, 472 |
| එකමූලකස්ස | 264 |
| එකංසං | 22 |
| එකින්ද්‍රියං | 404 |
| එකුද්දෙසො | 60, 68, 450 |
| එකූපචාරෙ | 506 |
| එතරහි | 16 |
| **ඔ** | |
| ඔක්කමන්ති | 260 |
| ඔක්ඛිත්තචක්ඛු | 468 |
| ඔචරකො | 118 |
| ඔචිනිත්වා | 138 |
| ඔඩ්ඩි | 50 |
| ඔතාපෙන්තො | 502 |
| ඔතිණ්ණො | 294 |
| ඔදකන්තිකං | 48 |
| ඔදනීයඝරං | 132 |
| ඔද්ධතං | 558 |
| ඔනීරක්ඛො | 118 |
| ඔනීතපත්තපාණිං | 26 |
| ඔනොජෙථ | 638 |
| ඔපාතං | 162 |
| ඔපුඤ්ජාපෙත්වා | 38 |
| ඔහතචුම්බටා | 348 |
| ඔභාසන්තස්ස | 496 |
| ඔමකො | 594 |

| ඔ | පිටුව |
|---|---|
| ඔමසති | 298 |
| ඔමසතා | 296 |
| ඔමසවාදස්ස | 430 |
| ඔරකො | 38 |
| ඔරබ්භිකො | 246 |
| ඔරෙනද්ධමාසෙ | 614 |
| ඔරොහන්තා | 246 |
| ඔලඞ්ඝති | 298 |
| ඔලම්බකො | 110 |
| ඔලීනවිලීනා | 610 |
| ඔවට්ටිකාය | 548 |
| ඔවරකෙ | 508 |
| ඔවස්සාපෙන්ති | 612 |
| ඔසරෙය්‍ය | 450 |
| ඔසාදෙහි | 38 |
| ඔසිඤ්චන්තස්ස | 290 |
| ඔභාරෙත්වා | 82 |
| ඔහීය්‍යකො | 522 |
| **ක** | |
| කක්කසලොමං | 326 |
| කච්ඡෙ | 522 |
| කටච්ඡභාරිකා | 88 |
| කටහණ්ඩං | 578 |
| කටිභාරෙ | 110 |
| කටිසුත්තං | 108 |
| කටිං | 50 |
| කණ්ඨසුත්තං | 108 |
| කණ්ඩුවන්තස්ස | 284 |
| කණ්ණකිතානි | 502 |
| කණ්හසප්පස්ස | 46 |
| කත්තරදණ්ඩො | 418 |
| කත්තිකචොරකා | 632 |
| කතකල්‍යාණො | 158 |
| කතභිරුත්තාතො | 158 |
| කතකුසලො | 158 |
| කතාකතං | 584 |
| කතිකසණ්ඨානං | 415 |
| කතිපාහං | 34 |
| කද්දමං | 290 |
| කතාජකං | 420 |
| කප්පෙති | 430 |
| කප්පෙස්සති | 484 |
| කපිඤ්ජරෙ | 110 |

| ක | පිටුව |
|---|---|
| කම්බලං | 620 |
| කම්මකාරි | 364 |
| කම්මනියෙ | 10 |
| කම්මවාචාය | 454 |
| කයවික්කයං | 590 |
| කරණීයං | 12 |
| කරමරානීතා | 348 |
| කවාටෙන | 492 |
| **කා** | |
| කාමපරිළාහානං | 50, 294 |
| කාමපිපාසානං | 44 |
| කාමභොගී | 322 |
| කාමවිතක්කානං | 44 |
| කාමසඤ්ඤානං | 44 |
| කායදළ්හිබහුලා | 416 |
| කායබද්ධනං | 622 |
| කාරුඤ්ඤාධිප්පායො | 140 |
| කාලසුත්තං | 490 |
| කාසායානි | 28 |
| කාසාවකණ්ඨා | 198 |
| **කි** | |
| කිච්චාධිකරණං | 436 |
| කිච්ඡලාභො | 522 |
| කිතවස්සෙව | 198 |
| කිපිල්ලකානං | 396 |
| කිලඤ්ජෙහි | 38, 492 |
| කිලමිස්සාමි | 34 |
| කිලිට්ඨං | 88 |
| කිස්මිං විය | 528 |
| කිසො | 42 |
| කීව චිරං | 594 |
| **කු** | |
| කුක්කුච්චං | 42 |
| කුක්කුටච්ඡාපකානං | 8, 10 |
| කුක්කුරකුණපෙන | 152 |
| කුටුම්බස්ස | 186 |
| කුටිවත්ථු | 386 |
| කුඨාරි | 198 |
| කුඩ්ඩමූලං | 36 |
| කුඩ්ඩො | 492 |
| කුතෙළු | 24 |
| කුද්දාලං | 106 |

| කු | පිටුව |
|---|---|
| කුදස්සු | 196 |
| කුමහිමුඛා | 108 |
| කුම්මාසං | 36 |
| කුම්භිතො | 140 |
| කුලලා | 246 |
| කුලූපගං | 336 |
| කුලපුණ්ණගායො | 294 |
| කුසචීරං | 82 |
| කුසලං | 450 |
| කුලපුණ්ණගාහි | 466 |
| කූටාගාරසාලායං | 26, 152 |
| **කෙ** | |
| කෙවලපරිපුණ්ණං | 1 |
| කෙසකම්බලං | 82 |
| කෙසමස්සුං | 28 |
| **කො** | |
| කොකවිසාසං | 132 |
| කොට්ටෙත්වා | 14 |
| කොපීයං | 108 |
| කොත්ථලියං | 486 |
| කොසකාරකො | 554 |
| කොසජ්ජස්ස | 48 |
| කොසෙය්‍යං | 620 |
| කොළම්බෙ | 610 |
| **ඛ** | |
| ඛණෙත | 40 |
| ඛන්ධභාරෙ | 110 |
| ඛමනීයං | 666 |
| ඛරකම්බලං | 326 |
| ඛරෙ | 156 |
| ඛලිකාය | 468 |
| ඛාදනීයාදීනි | 194 |
| **ඛි** | |
| ඛිත්තචිත්තා | 66, 124 |
| ඛිලජාතො | 436, 618 |
| **ඛී** | |
| ඛීණා | 13 |
| ඛීයනතාතං | 450 |
| ඛීයන්ති | 98 |
| ඛීලං | 114 |

| ඛු | පිටුව |
|---|---|
| ඛුද්දමධුං | 16 |
| ඛුංසෙති | 322 |
| **ග** | |
| ගණකො | 96 |
| ගත්තානි | 34, 146 |
| ගතපච්චාගතෙන | 162 |
| ගන්ධරසා | 2 |
| ගබ්භපාතනං | 182 |
| ගරුපරික්ඛාරානි | 198 |
| ගරුභණ්ඩානි | 198 |
| ගහපතිචීවරධරො | 442 |
| ගහිතාගහිතං | 600 |
| **ගා** | |
| ගාථා | 20 |
| ගාමධම්මං | 48, 52 |
| ගාමූපචාරෙ | 104 |
| **ගී** | |
| ගීවූපගං | 584 |
| **ගෙ** | |
| ගෙය්‍යං | 20 |
| **ගො** | |
| ගොචරියාතං | 360 |
| ගොතිනාදි තිවිටෙඨා | 104 |
| ගොපානසිං | 146, 178 |
| ගොපිතං | 104 |
| ගොපෙතුං | 144 |
| ගොමයෙන | 38 |
| ගොසප්පි | 610 |
| **ඝ** | |
| ඝට්ටාපෙන්තස්ස | 286 |
| ඝටිකං | 292 |
| ඝටිකාය | 468 |
| ඝට්ටෙත්වා | 86 |
| ඝතකතං | 584 |
| ඝරාවාසා | 24 |
| **ඝා** | |
| ඝාතෙන්තා | 196 |
| **ඝො** | |
| ඝොරවිසං | 46 |

| ච | පිටුව |
|---|---|
| චක්කභෙදං | 448, 450 |
| චක්ඛුභූතා | 246 |
| චච්චරනියතං | 386 |
| චතෙනා | 214 |
| චතුක්කභත්තං | 420 |
| චතුපඤ්චං ඛාතං | 230 |
| චතූහි ඨානෙහි | 112 |
| චවිතුකාමො | 58 |
| **චා** | |
| චාලෙසි | 50 |
| චාවනාධිප්පායො | 424 |
| **චි** | |
| චික්ඛල්ලං | 96 |
| චිඞ්ගුලකෙන | 468 |
| චිත්තමනො | 160 |
| චිත්තරූපං | 420 |
| චිත්තසඞ්කප්පො | 160, 162 |
| චිත්තසංඛාරපටිසංවෙදී | 156 |
| චිරට්ඨිතිකං | 16 |
| **චී** | |
| චීවරකාලසමයං | 628 |
| චීවරචෙතාපන්නං | 546 |
| චීවරරජ්ජුයා | 108 |
| චීවරවංසෙ | 108 |
| **චු** | |
| චුණ්ණපිණ්ඩා | 598 |
| චුතූපපාතඤාණං | 12 |
| **චෙ** | |
| චෙතාපෙත්වා | 548 |
| චෙතියරුක්ඛං | 404 |
| **ඡ** | |
| ඡගලකං | 434 |
| ඡන්දං | 456 |
| ඡන්දවාසිනී | 356 |
| ඡන්නා | 338 |
| ඡමහිතත්තං | 38, 154 |
| ඡමායං | 146 |
| ඡළභිඤ්ඤො | 194 |
| **ඡා** | |
| ඡාදෙත්වා | 180 |

| ඡු | පිටුව |
|---|---|
| ඡුපතං | 296 |
| ඡුපි | 84 |
| **ඡෙ** | |
| ඡෙජ්ජභෙජ්ජං | 106 |
| **ජ** | |
| ජඞ්ඝපෙසනිකෙන | 478 |
| ජතුමාසකො | 580 |
| ජන්තාඝරෙ | 132, 286 |
| ජනපදචාරිකං | 616 |
| **ජා** | |
| ජාගරන්තස්ස | 76 |
| ජාගරො | 424 |
| ජාතරූපරජතං | 580 |
| ජානතො | 2, 20 |
| ජානිස්සති | 22 |
| ජායත්තනෙ | 340 |
| ජාරත්තනෙ | 340 |
| ජාරස්ස | 322 |
| **ජි** | |
| ජිඝිංසෙ | 380 |
| ජිගුච්ඡමානො | 58 |
| **ජෙ** | |
| ජෙගුච්ඡී | 6 |
| ජෙට්ඨො | 8, 14 |
| **ඣා** | |
| ඣාතං | 230. |
| ඣාපෙති | 108 |
| **ඤ** | |
| ඤත්තිචතුත්ථෙන | 56, 200 |
| ඤත්තියා | 460 |
| ඤත්තිදුසී | 36 |
| ඤාතිව්‍යසනෙන | 54 |
| **ඨා** | |
| ඨානාරහෙන | 56 |
| **ත** | |
| තක්කං | 190 |
| තක්කවණ්ණං | 260 |
| තඞ්ඛණිකා | 348 |
| තණ්හක්ඛයෙ | 44 |

| ත | පිටුව |
|---|---|
| තතියං ඛාතං | 230 |
| තදහුප්පන්නො | 514 |
| තනත්තවාසෙහි | 620 |
| තප්පච්චයා | 52 |
| තප්පනත්තු | 242 |
| තපනීයා | 8 |
| තපස්සී | 8 |
| තපොගුණා | 442 |
| තරච්ඡවිසාණං | 132 |
| තළාකෙ | 114 |
| **තා** | |
| තාපෙති | 180 |
| තාලපක්කපාලකා | 144 |
| තාලාවත්ථුකතා | 4 |
| තාවකාලිකං | 122 |
| **ති** | |
| තික්ඛත්තුං | 40 |
| තිකොටිපාරිසුද්ධං | 450 |
| තිණණ්ඩුපකං | 608 |
| තිණකුටිකං | 94 |
| තිණහාරියො | 94 |
| තිම්බරුසකො | 32 |
| තිරච්ඡානකථිකා | 418 |
| තිරච්ඡානගතාය | 50 |
| තිරොක්ඛා | 478 |
| තිරොකරණීයං | 38 |
| තිරොභාවං | 338 |
| තිලඵලමත්තං | 66 |
| **තී** | |
| තීරෙත්වා | 30 |
| **තු** | |
| තුච්ඡකං | 202, 444 |
| තුණ්හීභාවෙන | 24, 36 |
| තුවට්ටෙන්ති | 468 |
| **තෙ** | |
| තෙකටුකයාගුං | 148 |
| තෙරසකං | 256 |
| **ථ** | |
| ථකෙත්වා | 292 |
| ථකෙසි | 130 |
| ථමෙහනත්ථස්ස | 288 |

| ථ | පිටුව |
|---|---|
| ථරුස්මිං | 468 |
| ථලට්ඨං | 108 |
| ථවිකාය | 138, 610 |
| **ථා** | |
| ථාලිපාකෙ | 36 |
| **ථු** | |
| ථුල්ලච්චයස්ස | 76, 226 |
| **ථෙ** | |
| ථෙනෙසීති | 103 |
| ථෙය්‍යසංඛාතං | 102 |
| **ථො** | |
| ථොමෙති | 322 |
| **ද** | |
| ද්වික්ඛත්තුං | 550 |
| ද්වයංද්වයසමාපත්ති | 48 |
| ද්විහිතිකා | 14 |
| දක්ඛා | 338 |
| දකවණ්ණං | 260 |
| දජ්ජාමි | 336 |
| දන්තපොනං | 114 |
| දබ්බ දබ්බා | 436 |
| දවත්ථාය | 262 |
| දසපදෙ | 468 |
| දසාහාතික්කන්තො | 594 |
| දසාහපරමං | 498 |
| දසිකසුත්තං | 590 |
| **දා** | |
| දාරුකුඩ්ඩිකං | 96 |
| දාරුධීතලිකාය | 84 |
| දාරුමාසකො | 580 |
| **දි** | |
| දිට්ඨධම්මිකානං | 48 |
| දිට්ඨසංසන්දනො | 200 |
| **දී** | |
| දීඝමද්ධානං | 20 |
| දීපෙය්‍ය | 452 |
| **දු** | |
| දුක්ඛී | 42 |
| දුග්ගතිං | 46 |

දු — පිටුව

දුච්චොළා 632
දුට්ඨුල්ලං 48
දුට්ඨුල්ලාපි 320
දුට්ඨුල්ලාදුට්ඨුල්ලං 322
දුතියං ඛාතං 230
දුතියපඤ්ඤත්ති 54, 530
දුප්පොසතාය 48
දුබ්බචසික්ඛාපදං 462
දුබ්බණ්ණො 42
දුබ්බල්‍යං 54
දුබ්බුද්ධිනො 450
දුබ්භාසිතං 444
දුබ්භික්ඛො 14
දුභරතාය 48
දුම්මඞ්කූනං 48
දුම්මනො 42
දුරනුරක්ඛියා 382
දුල්ලද්ධං 42
දුස්සං 126
දුස්සද්ධාපයා 484
දුස්සයුගෙන 26
දුස්සවාණිජ්ජං 532
දුස්සංහරෙසු 382

දූ

දූතපරම්පරාය 162

දෙ

දෙය්‍යධම්මො 24
දෙවගහදාරූනි 98
දෙස්සො 380

දො

දොණියො 248

ධ

ධජාහටා 348
ධඤ්ඤකරණං 510
ධනක්කීතා 356
ධම්මං චරන්තො 112
ධම්මියා 26
ධම්මවිතක්කෙ 42, 196
ධම්මසාමී 96
ධම්මූපහාරෙ 170
ධම්මිතිසඤ්ජානන්තො 42, 194

ධු — පිටුව

ධුත්තිකා 320
ධුතගුණො 34
ධුතාය 448
ධුරං 112
ධුවලොහිතා 322

ධො

ධොවාති 578
ධොවාපිතං 518

න

නග්ගාය 612
නග්ගො 80
නච්චන්තං 422
නට්ඨචීවරො 530
නට්ඨපත්තස්ස 604
නප්පතිරූපං 422
නවනීතං 610
නවරතනං 326
නවාවුතං 326
නස්සරෙය්‍යාම 98

නා

නාගදන්තො 108
නාතිකඩ්ඪෙය්‍යාසි 38
නානාගොත්තා 462
නානාජච්චා 462

නි

නික්ඛමති 418
නික්ඛිත්තානි 18
නිකච්ච 198
නිඛනීයම්හා 486
නිඛාතං 108
නිඛාදනං 198
නිගූහෙය්‍ය 46
නිච්චභත්තිකා 422
නිච්ඡවිං 250
නිච්ඡාරෙසි 292
නිට්ඨුභිත්වා 330
නිපාතෙසුං 182
නිබ්බාණාය 44
නිබ්බාහාපෙත්වා 38, 96
නිබ්බුජ්ඣන්ති 468
නිබ්බෙඨෙන්ති 436
නිබ්භොගො 4

| නි | පිටුව |
|---|---|
| නිමන්තිතං | 450 |
| නිමන්තෙති | 4 |
| නිමිත්තං | 50 |
| නිමිත්තකම්මං | 172 |
| නියතො | 22 |
| නිරබ්බුදෙ | 22 |
| නිරාදීනවො | 22 |
| නිරුත්තිපථෙ | 128, 130 |
| නිරොධානුපස්සී | 156 |
| නිලීයිංසු | 50 |
| නිවාසෙත්වා | 26 |
| නිවාසෙසි | 612 |
| නිබ්බෙඨාකාසො | 634 |
| නිස්සග්ගියෙන | 308 |
| නිස්සට්ඨචීවරං | 500 |
| නිස්සට්ඨපත්තො | 596 |
| නිස්සංසයං | 50 |
| නිසජ්ජං | ·484 |
| නිසීදිතං | 130 |
| නිසීදනසන්ථතං | 570 |

| නෙ | |
|---|---|
| නෙගමස්ස සමයො | 548 |
| නෙත්ථාරං | 476 |
| නෙරයිකස්ස | 190 |

| ප | |
|---|---|
| පක්කමන්තා | 382 |
| පක්කාමි | 28 |
| පක්ඛං | 450 |
| පක්ඛාලෙත්වා | 82 |
| පක්ඛිත්තං | 46 |
| පකරණෙ | 52, 158, 258 |
| පග්ගය්හ | 450 |
| පග්ගණ්හෙථ | 34, 14, 376 |
| පගෙව | 424 |
| පඞ්ගචීරෙන | 468 |
| පච්චක්ඛෙය්‍යං | 58 |
| පච්චයෙහි | 18, 24 |
| පච්චස්සොසි | 38 |
| පච්චාසා | 572, 514 |
| පච්චාහරති | 348, 374 |
| පච්චුට්ඨෙති | 4 |
| පච්චුද්ධටසඤ්ඤී | 634 |

| ප | පිටුව |
|---|---|
| පච්චුපට්ඨිතං | 124 |
| පච්චූසසමයං | 580 |
| පච්ඡාභත්තං | 246 |
| පච්ඡාසමණෙන | 24 |
| පච්ඡිමකො | 22 |
| පචෙන්තා | 196 |
| පජ්ඣායන්තා | 422 |
| පජ්ඣායි | 42 |
| පජහථ | 18 |
| පඤ්ඤත්තෙ | 24 |
| පඤ්ඤපෙති | 22 |
| පඤ්ඤත්තිසම්බද්ධො | 546 |
| පට්ටො | 588 |
| පටවාසිනී | 357 |
| පටික්කමන්තං | 176 |
| පටික්ඛිත්තං | 598 |
| පටිග්ගහෙසි | 590 |
| පටිඝාතාය | 22 |
| පටිච්ඡන්නො | 484 |
| පටිච්ඡාදෙත්වා | 38, 530 |
| පටිජානමානො | 488 |
| පටිජානිස්සති | 294 |
| පටිඤ්ඤාය | 56 |
| පටිනිස්සග්ගානුපස්සී | 156 |
| පටිනිස්සග්ගාය | 450, 466 |
| පටිනිස්සජ්ජෙය්‍ය | 476 |
| පටිනිස්සට්ඨො | 212, 218 |
| පටිබද්ධචිත්තො | 82, 158 |
| පටිබුද්ධො | 80 |
| පටිවිජානන්තස්ස | 226, 232 |
| පටියත්තං | 636 |
| පටිවිජානි | 328 |
| පටිවිනයො | 44 |
| පටිවිරතං | 334 |
| පටිවිංසො | 142, 580 |
| පටිසන්ථාරං | 638 |
| පටිසල්ලානා | 154 |
| පටිසල්ලීයිතුං | 566 |
| පටිසාමෙති | 610 |
| පටිසායනීයානි | 610 |
| පටිසුණාති | 568 |
| පටො | 588 |
| පඨමපාරාජිකං | 28 |
| පඨමාපත්තිකා | 482 |

| ප | පිටුව |
|---|---|
| පඨමාභිනිබ්බිදා | 10 |
| පඨමාභිසිත්තො | 98 |
| පඨවිනිස්සිතො | 16 |
| පණ්ඩකො | 68 |
| පණ්ඩුපලාසො | 106 |
| පණාමෙත්වා | 22 |
| පණිධාය | 236 |
| පත්තක්ඛන්ධා | 422 |
| පත්තකල්ලං | 406, 454 |
| පත්තගාහාපකො | 600 |
| පත්තත්ථවිකාය | 620 |
| පත්තපරියන්තො | 600 |
| පත්තාළ්හකෙන | 468 |
| පත්පත්පුලකං | 14 |
| පතිකඩ්ඪති | 295 |
| පතිමානෙති | 176 |
| පතිසල්ලීනස්ස | 16 |
| පතිසල්ලීයිතුං | 90, 152 |
| පතිසෙවිතා | 424 |
| පතිසෙවී | 44 |
| පතිසෙවෙය්‍ය | 48 |
| පථව්‍යා රජා | 104 |
| පදක්ඛිණං | 14, 28, 450 |
| පදලෙත්වා | 8 |
| පදුමං | 110 |
| පනසචොරකා | 136 |
| පනාමෙත්වා | 292 |
| පනාමෙසි | 176 |
| පප්පටකොජං | 16 |
| පපතා | 40 |
| පබ්බජෙය්‍ය | 28 |
| පබ්බාජනීයකම්මකතා | 476 |
| පභඞ්ගො | 252 |
| පරක්කමිස්සති | 450 |
| පරචිත්තවිදූ | 238 |
| පරපරිග්ගහිතා | 122 |
| පරාමසති | 294, 298 |
| පරික්ඛිපිත්වා | 38 |
| පරිච්චජන්තො | 580 |
| පරිචාරෙති | 32 |
| පරිචාරෙන්තො | 344 |
| පරිකුද්දු | 44 |
| පරිණතං | 638 |
| පරිණාමෙය්‍ය | 638 |
| පරිපාතෙන්ති | 632 |
| පරිපුඤ්ඡන්තො | 34 |
| පරිබ්බාජකො | 588 |
| පරිභාවි | 8 |
| පරිභුඤ්ජිතබ්බානි | 610 |
| පරිභුත්තං | 546 |
| පරියාගාරෙ | 292 |
| පරියිට්ඨාය | 616 |
| පරියොසානකල්‍යාණං | 1 |
| පරියොදාතෙ | 10 |
| පරියොසාපෙති | 558 |
| පරිවත්තෙය්‍ය | 16 |
| පරිවාසං | 260, 482 |
| පරිවිතක්කො | 16 |
| පරිවුතො | 28, 196 |
| පරිසුද්ධො | 10 |
| පරිසෙදිතානි | 8 |
| පරිහාරපථෙ | 468 |
| පල්ලලං | 380 |
| පවට්ටෙත්වා | 140 |
| පවාරණා | 426 |
| පවාරිතානං | 604, 620 |
| පවාසං | 622 |
| පවුත්තො | 218 |
| පවෙදයෙ | 198 |
| පවෙදෙති | 1 |
| පවෙසෙන්තස්ස | 290 |
| පසන්නම්බවණ්ණා | 42, 194, 256 |
| පස්සද්ධො | 10 |
| පස්සමොහය්‍ය | 156 |
| පස්සසන්තො | 156 |
| පස්සාවට්ඨානං | 94 |
| පස්සාවමග්ගො | 324 |
| පසාදභඤ්ඤං | 242 |
| පහාණං | 44 |
| පහිණාති | 348 |
| පහිණෙය්‍ය | 396 |
| පහිතත්තස්ස | 10 |
| පහිතො | 346 |
| පහීණෙ | 214 |
| පහූතජාතරූපරජතං | 34 |
| පහූතධනධඤ්ඤා | 34 |
| පහූතමච්ඡකච්ඡපා | 252 |
| පහූතවිත්තූපකරණා | 34 |

| පා | පිටුව |
|---|---|
| පංචධනුසතං | 632 |
| පංචභෙසජ්ජානි | 610 |
| පංචමාසකො | 102 |
| පංසුකිතානි | 146 |
| පංසුකූලිකො | 34 |
| **පා** | |
| පාටිදෙසනීයං | 446 |
| පාණාති | 194 |
| පාණිතො | 34 |
| පාණිප්පහාරං | 578 |
| පාණිං | 16 |
| පාණුපෙතං | 14 |
| පාත්වාකාසි | 246 |
| පාතබ්‍යතං | 96 |
| පාතිමොක්ඛං | 16 |
| පාතුකම්මාය | 244 |
| පාතුභවන්ති | 22 |
| පාතෙතබ්බං | 584 |
| පාතෙන්ති | 476 |
| පාදං | 104 |
| පානාගාරසාලා | 386 |
| පාරතො | 38 |
| පාරාජිකො | 48 |
| පාරිවට්ටකං | 524 |
| පාවචනෙ | 246 |
| පාවාරං | 328 |
| පාසාදිකාය | 448 |
| පාහෙසි | 628 |
| **පි** | |
| පිටකං | 108 |
| පිණ්ඩචාරිකො | 174 |
| පිණ්ඩපාතනීහරන්තෙන | 152, 566 |
| පිණ්ඩපාතපටික්කන්තෙන | 374 |
| පිණ්ඩපාතිකො | 34 |
| පිතාමහං | 576 |
| පිතාමහයුගා | 576 |
| පිපාසවිනයො | 44 |
| පිවන්ති | 194 |
| පිංසිංසු | 14 |
| **පී** | |
| පීයෙ | 130 |
| පීණින්ද්‍රියා | 42, 194, 256 |
| පීතිසුඛං | 10 |
| පීළෙන්තස්ස | 288 |

| පු | පිටුව |
|---|---|
| පුචිමන්ද | 1 |
| පුච්ඡිතං | 146 |
| පුච්ඡ | 38 |
| පුණ්ඩරීකං | 110 |
| පුතන්දරස්ස | 194 |
| පුත්තභාතුකා | 522 |
| පුත්තභාවාභිනිබ්බත්ති | 8 |
| පුප්ඵං | 40 |
| පුප්ඵාවලියං | 290 |
| පුප්ඵංසා | 40 |
| පුබ්බණ්හසමයං | 26 |
| පුබ්බණ්හං | 112 |
| පුබ්බණ්හනිස්සිතානං | 388 |
| පුබ්බභාසිනො | 468 |
| පුබ්බරත්තාපරරත්තං | 54 |
| පුබ්බෙනිවාසානුස්සතිඤාණාය | 10 |
| පුරාණදුතියිකා | 38, 84, 316 |
| පුරාණවොහාරිකො | 102 |
| පුරාණං හස්සදුම් | 98 |
| පුරිසගුත්තිං | 106 |
| පුරිසත්ථකාරං | 374 |
| පුරිසූසභො | 90 |
| පුරිසදම්මසාරථී | 1 |
| **පෙ** | |
| පෙත්තිකං | 38 |
| පෙසකාරෙහි | 626 |
| පෙසලානං | 48 |
| **පො** | |
| පොක්ඛරවනෙ | 290 |
| පොසෙස්සති | 60 |
| **ඵ** | |
| ඵඤ්ඤපෙති | 108 |
| ඵරති | 510 |
| ඵලකචීරං | 82 |
| ඵලකෙ | 18 |
| ඵස්සං | 310 |
| **ඵා** | |
| ඵාණිතං | 532 |
| ඵාසුලන්තරිකාහි | 246 |
| **ඵු** | |
| ඵුට්ඨා | 54 |
| ඵුසෙය්‍ය | 450 |

| ඵො | පිටුව |
|---|---|
| ඵොට්ඨබ්බරසා | 4 |
| ඵොට්ඨබ්බුපහාරා | 170 |
| **බ්‍ය** | |
| බ්‍යාකාතුං | 240 |
| **බ්‍ර** | |
| බ්‍රහ්මචරියං | 20 |
| බ්‍රහ්මදණ්ඩං | 160, 330 |
| **බ** | |
| බහිද්ධාකොට්ඨකෙ | 568 |
| බහුකරණීයා | 24 |
| **බා** | |
| බාහාපරම්පරාය | 318 |
| බාහායං | 36 |
| බාහුල්ලාය | 610 |
| බාහුලිකො | 450 |
| බාහුසච්චමහත්තං | 22 |
| **බි** | |
| බිම්බොහනං | 198 |
| බිලඞ්ගදුතියං | 420 |
| **බී** | |
| බීජකං | 40 |
| **බු** | |
| බුඩ්ඪපබ්බජිතො | 94 |
| බුද්ධපමුඛං | 26 |
| බුද්ධානුබුද්ධානං | 18 |
| **බො** | |
| බොජ්ඣඞ්ගානං | 212 |
| බොධපක්ඛියානං | 64 |
| **භ** | |
| භඞ්ගං | 620 |
| භණ්ඩිකාබද්ධානි | 512 |
| භණිතස්ස | 224, 232 |
| භත්තකිච්චං | 36 |
| භත්තග්ගෙ | 420 |
| භත්තුද්දෙසං | 416, 418 |
| භද්‍රො | 56 |
| භවාභවා | 12 |

| භා | පිටුව |
|---|---|
| භාකුටිකභාකුටිකො | 468 |
| භාවනානුයොගමනුයුත්තො | 54 |
| භාවං | 230 |
| **භි** | |
| භික්ඛාචරියං | 56 |
| භික්ඛුපච්චත්ථිකා | 70 |
| භින්නපටධරෙ | 56 |
| භින්නාසන්දි | 596 |
| භිසිං | 530 |
| භිංසනකෙ | 18 |
| **භු** | |
| භුත්තාවිං | 40 |
| භුත්තොකාසං | 6 |
| භුම්මට්ඨං | 108 |
| භුම්මත්ථරණං | 530, 566 |
| **භූ** | |
| භූතපුබ්බං | 18, 378 |
| **භෙ** | |
| භෙදනසංවත්තනිකං | 450 |
| **භො** | |
| භොගව්‍යසනෙන | 54 |
| භොගවාසිනී | 356 |
| **ම** | |
| මක්කටී | 50 |
| මක්ඛිකාමධු | 610 |
| මඞ්කුභූතා | 422 |
| මජ්ඣෙකල්‍යාණං | 1 |
| මඤ්චපීඨභිසිබිම්බොහනං | 292 |
| මඤ්ජරිකං | 466 |
| මත්තංජානිත්වා | 534 |
| මතපතිකා | 330 |
| මදනීයමදනාය | 44 |
| මධුකතෙලං | 610 |
| මධුගොලකං | 148 |
| මන්දමන්දා | 468 |
| මනසාකාසි | 18 |
| මනාපො | 30 |
| මනුස්සවිග්ගහපාරාජිකං | 438 |
| මනුස්සවිග්ගහො | 162 |
| මනෙසිකාය | 468 |

| ම | පිටුව |
|---|---|
| මරණවණ්ණං | 162 |
| මහද්ධනා | 34 |
| මහල්ලකං | 406 |
| මහාභොගා | 34 |
| මහිච්ඡතාය | 48 |
| **මා** | |
| මාතිකාතං | 514 |
| මාතුගාමස්ස | 46 |
| මාතුමත්තිකං | 38 |
| මාරකායිකා | 152 |
| මාලකිතා | 506 |
| මාලාවච්ඡං | 466 |
| මාවිභෙරසිත්ථ | 40 |
| **මි** | |
| මිලක්ඛස්ස | 66 |
| මිහිතපුබ්බඞ්ගමා | 468 |
| **මු** | |
| මුග්ගප්පහාරං | 518 |
| මුච්ඡිතා | 40 |
| මුට්ඨස්සති | 260 |
| මුද්ධප්පසන්නා | 90 |
| මුදුපිට්ඨිකො | 84 |
| මුදුභූතො | 10, 12 |
| මුසලං | 174 |
| මුහුත්තිකා | 346 |
| මුහුත්තෙන | 40 |
| **මූ** | |
| මූලට්ඨස්ස | 114, 120 |
| මූලපඤ්ඤත්ති | 48 |
| **මෙ** | |
| මෙථුනං | 40 |
| මෙථුනධම්මං | 66 |
| මෙදවට්ටි | 150 |
| මෙධාවී | 338 |
| **මො** | |
| මොක්ඛචිකාය | 468 |
| මොක්ඛාධිප්පායො | 314 |
| මොඝපුරිස | 46, 194 |
| **ය** | |
| යථාකම්මූපගො | 12 |
| යථාගොචරෙ | 56 |

| ය | පිටුව |
|---|---|
| යථාජමෙවා | 56 |
| යථාපුතෙතා | 56 |
| යථාභිරන්තං | 26 |
| යථායුත්තෙන | 408 |
| යථාරද්ධං | 420 |
| යථාවජ්ජෙන | 468 |
| යථාවිහාරී | 56 |
| යථාසීලො | 56 |
| **යා** | |
| යාවතබහුලො | 376 |
| යාදිසො | 56 |
| යාපනීයං | 566 |
| යාවතතියකා | 516 |
| යාවතිහං | 482 |
| යාවදත්ථං | 54 |
| **යු** | |
| යුත්තයොගෙන | 242 |
| **ර** | |
| රඞ්ගමජ්ඣෙ | 468 |
| රජ්ජුබද්ධෙන | 106 |
| රජකත්ථරණං | 102, 126 |
| රජකෙහි | 126 |
| රඤ්ඤත්තකාලකං | 556 |
| රජනීයො | 576 |
| රට්ඨපිණ්ඩො | 198 |
| රත්තාති | 578 |
| රථකෙන | 468 |
| රසරසා | 4 |
| රහොගතස්ස | 16, 230 |
| රහොගතසඤ්ඤ | 162 |
| **රා** | |
| රාගවිරාගාය | 44 |
| රාජභොග්ගො | 548 |
| රාජි | 600 |
| රාහස්සං | 48 |
| **රි** | |
| රිඤ්චන්ති | 468, 576 |
| **රූ** | |
| රූපරසා | 4 |
| රූපියචෙතාපන්නං | 586 |

| රූ | පිටුව |
|---|---|
| රූපියඡඩ්ඩකො | 582 |
| රූපියසික්ඛාපදං | 580 |
| රූපූපහාරෙ | 162 |
| **ල** | |
| ලච්ඡන්ති | 34 |
| ලබුජචොරකා | 136 |
| ලම්බී | 84 |
| **ලා** | |
| ලාභග්ගමහත්තං | 22 |
| ලාමකො | 600 |
| ලාසෙන්ති | 468 |
| **ලි** | |
| ලිඛගති | 64 |
| **ලී** | |
| ලීනමනො | 42 |
| **ලූ** | |
| ලූඛචීවරති | 632 |
| ලූඛො | 42 |
| ලූඛං | 144 |
| **ලෙ** | |
| ලෙඛාය | 168 |
| ලෙඩ්ඩුපාතො | 104 |
| ලෙණං | 606 |
| ලෙසමත්තං | 436 |
| ලෙසො | 438 |
| **ලො** | |
| ලොකවිදූ | 1 |
| ලොණසොවීරකං | 192 |
| ලොමහංසෙ | 38, 154 |
| ලොහකුම්භි | 198 |
| ලොහමාසකො | 583 |
| ලොහිතිකා | 96 |
| **ව** | |
| ව්‍යත්තෙන | 582 |
| ව්‍යූහති | 108 |
| වග්ගවාදකා | 456 |
| වඩ්ඪකෙන | 460 |
| වච්චමග්ගං | 68 |
| වච්චූපත්ථම්භෙ | 263 |
| වජ්ඣා | 182 |

| ව | පිටුව |
|---|---|
| වටංසකං | 466 |
| වට්ටූපච්ඡෙදය | 441, 258 |
| වණ්ණවා | 42 |
| වත්තුකාමො | 228 |
| වත්තුවිස්සාරකස්ස | 230 |
| වත්ථං | 286 |
| වතිං | 114, 130 |
| වනෙතා | 214, 228, 230 |
| වනස්පති | 116 |
| වස්සංවුත්ථා | 24 |
| වස්සිකසාටිකා | 610 |
| වසලං | 380 |
| වසලධම්මං | 48 |
| වසාතෙලං | 610 |
| වසිම්හි | 212 |
| වමෙහති | 322 |
| **වා** | |
| වාකචීරං | 82 |
| වාතපාතො | 610 |
| වාතමණ්ඩලිකාය | 130 |
| වායාපෙය්‍ය | 620 |
| වාලකම්බලං | 82 |
| වාලයක්ඛවිහාරං | 188 |
| **වි** | |
| විකප්පනූපගපච්ඡිමං | 530, 618 |
| විකිරති | 18 |
| විගතූපක්කිලෙසෙ | 10 |
| විගතො | 10 |
| විගරහි | 194 |
| විච්ඡිකාතං | 386 |
| විජ්ජාචරණසම්පන්නො | 1 |
| විජටෙන්තියො | 576 |
| විජටෙති | 578 |
| විජායෙය්‍යං | 186 |
| විජිතං | 4 |
| විඤ්ඤත්තිබහුලා | 562 |
| විඤ්ඤතසාසනා | 486 |
| විඤ්ඤාපෙති | 58 |
| විත්ථතා | 622, 544 |
| විතක්කෙකාථ | 18 |
| විතච්ඡෙන්ති | 246 |
| විතුදන්ති | 246 |
| විද්ධංසෙති | 18 |

| වි | පිටුව |
|---|---|
| විදිත්වා | 194 |
| විධාවති | 18 |
| විධූතිකං | 466 |
| විනට්ඨං | 504 |
| විනවජ්ජිතිස්සන්ති | 418 |
| විනිධාය | 218, 230 |
| විනිධාය භාවං | 206 |
| විනිපාතං | 46 |
| විනීතවත්ථු | 326 |
| විනීවරණං | 218, 230 |
| විප්පකතා | 556 |
| විප්පටිපන්නං | 434 |
| විප්පටිපාදෙසුං | 92 |
| විප්පටිසාරී | 42, 240 |
| විප්පවුත්ථෙ | 510 |
| විප්පසන්නඡවිවණ්ණා | 42 |
| විපතෙය්‍ය | 4 |
| විපරිණතං | 296, 322 |
| විපල්ලාසො | 16 |
| විපඤ්චෙන්තානං | 450 |
| විපාචෙන්ති | 54, 98 |
| විබ්භමිස්සාමි | 90, 476 |
| විමුච්චිත්ථ | 12 |
| විමොක්ඛං | 200, 218, 230 |
| විරමථ | 462 |
| විරාගාය | 42, 258 |
| විරාජෙන්ති | 246 |
| විරියාරම්භං | 48 |
| විරූළ්හියා | 202 |
| විලග්ගං | 176 |
| විලීවකාරං | 180 |
| විවට්ටකප්පෙ | 10 |
| විවරාපෙත්වා | 38 |
| විස්සසන්තා | 618 |
| විස්සාසං | 510 |
| විස්සාසගාහී | 122 |
| විසක්කියෙන | 164 |
| විසඤ්ඤොගාය | 258 |
| විසහාමි | 40 |
| විසංයොගාය | 42, 258 |
| විසංවාදෙති | 372 |
| විහාරචීවරං | 530 |
| විහාරපරිභොගං | 146 |
| විහාරපෙක්ඛිකායො | 318 |
| විහාරවත්ථු | 178 |
| විහෙඨයිස්සති | 522 |
| **වී** | |
| වීතික්කමො | 160 |
| වීතිසාරෙත්වා | 4 |
| **වු** | |
| වුත්තො වජ්ජෙහි | 138 |
| වුත්ථා | 194 |
| වුසිතං | 12 |
| **වෙ** | |
| වෙජ්ජිකාය | 478 |
| වෙඨනං | 139 |
| වෙණී | 296 |
| වෙදනට්ටානං | 460 |
| වෙදල්ලං | 20 |
| වෙදිසි | 88 |
| වෙනයිකො | 6 |
| වෙපුරිසිකා | 322 |
| වෙපුල්ලමහත්තං | 22 |
| වෙමතිකො | 298, 430 |
| වෙය්‍යාකරණං | 18, 20 |
| වෙය්‍යාවච්චකරෙ | 546 |
| වෙරඤ්ජභාණවාරො | 26 |
| වෙවචනානි | 64 |
| වෙහාසට්ඨං | 108 |
| **වො** | |
| වොරොපෙති | 158, 162 |
| **ස** | |
| සඞ්ඛාතො | 12 |
| සඞ්ඝාතාය | 24, 420 |
| සඋද්දෙසං | 10 |
| සඋපාදනාය | 42 |
| සක්ඛරධොතානි | 378 |
| සක්ඛලියො | 132 |
| සකටෙහි | 38 |
| සකදාගාමිඵලං | 218 |
| සකපිතුනිවෙසනං | 36 |
| සකසඤ්ඤෙ | 122 |
| සකො | 24 |
| සඞ්කාමෙති | 110 |
| සඞ්කාමෙස්සාමි | 16 |
| සඞ්කෙතකම්මං | 172 |

| ස | පිටුව |
|---|---|
| සඞ්ඛලිකබද්ධෙන | 106 |
| සඞ්ඛලිඛිතං | 28 |
| සඞ්ඛසෙවාලපණකං | 462 |
| සඞ්ගණිකාය | 48 |
| සඞ්ගායිස්සන්ති | 418 |
| සඞ්ඝඵාසුතාය | 48, 54, 570 |
| සඞ්ඝභෙදාය | 450 |
| සඞ්ඝසුට්ඨුතාය | 48, 54, 570 |
| සඞ්ඝාටි | 422 |
| සඞ්ඝාටිපල්ලත්ථිකාය | 422 |
| සච්චං | 24 |
| සච්ඡාකංසු | 42 |
| සච්ඡිකත්වා | 1 |
| සච්ඡිකතසඤ්ඤිනො | 200 |
| සජොතිභූතා | 46, 250 |
| සඤ්ඤුවිකායො | 374 |
| සණ්හං | 536 |
| සත්තාහපරමං | 610 |
| සත්තියො | 248 |
| සත්තිලොමං | 248 |
| සත්ථහාරකං | 160 |
| සත්ථා | 1 |
| සත්ථුවණ්ණෙනා | 580 |
| සත්ථෙන | 140 |
| සද්දමනුස්සාවෙසුං | 40, 382 |
| සද්දුමෙහයන්තුං | 246 |
| සද්දූපහාරෙ | 170 |
| සද්ධාදෙය්‍යං | 258 |
| සද්ධිවිහාරිකා | 238 |
| සද්ධෙය්‍යවචසා | 486 |
| සදෙවකං | 1 |
| සන්තප්පෙසුං | 40 |
| සන්තප්පෙත්වා | 26 |
| සන්තරුත්තරෙන | 502 |
| සන්තමිත්තාතං | 198 |
| සන්තිකාය | 468 |
| සන්තුට්ඨස්ස | 48 |
| සන්ථතං | 554 |
| සන්ථතවාරෙ | 54 |
| සන්ථතසම්මුතිං | 564 |
| සන්දති | 253 |
| සන්දිට්ඨා | 192 |
| සන්දස්සිතො | 606 |
| සන්දස්සෙසි | 526 |

| ස | පිටුව |
|---|---|
| සන්දිස්සන්ති | 202 |
| සන්දස්සෙත්වා | 24 |
| සන්නිධිකාරකං | 610 |
| සන්නිපාතාපෙත්වා | 44 |
| සන්නිසජ්ජම්පි | 146 |
| සප්පිකුම්භිං | 142 |
| සපදානං | 36 |
| සපදානචාරිකො | 34 |
| සපරිකම්මතං | 386 |
| සපරිදණ්ඩා | 346, 348 |
| සබ්‍යඤ්ජනං | 1 |
| සබ්‍රහ්මකං | 1 |
| සබ්‍රහ්මචාරීහි | 64 |
| සභාගාතං | 418 |
| සභායෙ | 506 |
| සමනුගාහිතබ්බො | 406 |
| සම්පජ්ජලිතො | 256 |
| සම්පජ්ජන්ති | 584 |
| සම්පජ්ජලිතාය | 46 |
| සම්පන්නමෙව | 4, 16 |
| සම්පරිකිණ්ණො | 190 |
| සම්පවාරෙත්වා | 26 |
| සම්පවාරෙසුං | 40 |
| සම්බාධපරියායො | 22 |
| සමූහතත්තා | 129 |
| සම්භාවෙස්සති | 238 |
| සම්භින්නා | 322 |
| සමනුගාහිතබ්බා | 582 |
| සම්මප්පදනො | 228 |
| සම්මාසම්බුද්ධො | 1 |
| සම්මිඤ්ජිතෙන | 468 |
| සම්මොදමානො | 450 |
| සම්මොදි | 4 |
| සමඤ්ඤා | 160 |
| සමණකුත්තකස්ස | 152 |
| සමනුභට්ඨා | 460 |
| සමනුභාසිතබ්බො | 464 |
| සමසික්ඛතා | 68 |
| සමාදපිතො | 606 |
| සමාදහං | 156 |
| සමාදියති | 392 |
| සමාදපෙත්වා | 24 |
| සමාදපෙය්‍ය | 160 |
| සමානසංවාසකො | 450 |

| ස | පිටුව |
|---|---|
| සමානසීමායං | 450 |
| සමානාචරියකං | 58 |
| සමාරකං | 1 |
| සමාහිතෙ | 10 |
| සමුක්කට්ඨිතො | 212, 218 |
| සමුත්තෙජෙත්වා | 24 |
| සමුත්තජිතො | 606 |
| සමුදාචරති | 40 |
| සමුදාචරෙය්‍ය | 198, 200 |
| සමුල්ලපන්තො | 490 |
| සමූහනෙය්‍ය | 56 |
| සරසි | 424 |
| සරාගාය | 42 |
| සරාමි | 60 |
| සරීරබන්ධනෙන | 68 |
| සල්ලබාය | 448 |
| සල්ලබස්ස | 48 |
| සලාකාවුත්තා | 14, 16 |
| සලාකග්ගහෙන | 468 |
| සස්සමණබ්‍රාහ්මණිං | 1 |
| සස්සුයා | 340 |
| සස්සුරෙන | 340 |
| සහධම්මෙන | 464 |
| සහධම්මිකං | 462 |
| සඞ්ඛතකම්මං | 48 |
| සඤ්චරිත්තං | 338, 340 |
| සඤ්චිච්ච | 160 |
| සඤ්චෙතනිකා | 260 |
| සම්පහංසෙත්වා | 24 |
| සංයොගාය | 42 |
| සංවට්ටකප්පෙ | 10 |
| සංවට්ටවිවට්ටකප්පෙ | 10 |
| සංවිදහිත්වා | 142 |
| සංවිදාවහාරො | 118 |
| සංසරණතිස්සිතං | 386 |
| සංසීදති | 328 |
| **සා** | |
| සාකාරං | 10 |
| සාකුණිකො | 246 |
| සාජීවං | 56 |
| සාණං | 620 |
| සාණපසිබ්බකෙ | 38 |
| සාණිපාකාරෙන | 486 |

| සා | පිටුව |
|---|---|
| සාඨලං | 1 |
| සාතොදකො | 252 |
| සාදිතබ්බං | 534 |
| සාදියති | 70 |
| සාදියෙය්‍ය | 580 |
| සාධිතානි | 158 |
| සාපතෙය්‍යං | 40, 148 |
| සාමං | 164, 618 |
| සාමග්ගං | 58, 330 |
| සායනීයානි | 158, 194 |
| සාරක්ඛා | 346, 348 |
| සාරත්තො | 82, 298, 516 |
| සාරම්භං | 386 |
| සාරණීයං | 4 |
| සාරෙ | 22 |
| සාරෙතබ්බා | 548 |
| සාලිමංසොදනං | 14 |
| සාසඞ්කසම්මතානි | 634 |
| සාසපතෙලං | 610 |
| **සි** | |
| සික්ඛමානාය | 520 |
| සික්ඛාසාජීවසමාපන්නො | 56 |
| සිඛරිණී | 322 |
| සිතස්ස පාතුකම්මාය | 244 |
| සිද්ධං | 422 |
| සිලං | 178 |
| සිලායං | 14 |
| **සී** | |
| සීතොදකො | 252 |
| සීවථිකං | 86 |
| සීසච්ඡින්නො | 68 |
| සීසභාරෙ | 110 |
| සීසාභිතාපො | 182 |
| සීසූපගං | 584 |
| **සු** | |
| සුකරා | 16, 19 |
| සුඛණො | 322 |
| සුඛපරිභවො | 30 |
| සුඛෙධිතො | 30 |
| සුගතො | 1 |
| සුගතවිදත්ථිං | 572 |
| සුඛකාසිතං | 116 |
| සුඤ්ඤතං | 226 |

| සු | පිටුව |
|---|---|
| සුඤ්ඤාගාරෙ | 234 |
| සුඤ්ඤාගාරගතො | 156 |
| සුණිසාභොගෙන | 340 |
| සුද්ධ | 22 |
| සුත්තං | 74 |
| සුත්තාරුළ්හං | 108 |
| සුද්ධකාළකානං | 556 |
| සුද්ධිකවාරකථා | 224 |
| සුණෙය්‍ය | 28 |
| සුප්පවායිතං | 622 |
| සුපොසතාය | 48 |
| සුපිත්වා | 54 |
| සුභරතාය | 48 |
| සුමුත්තො | 64 |
| සුමුහුත්තො | 322 |
| සුලභො | 322 |
| සුවිතච්ඡිතං | 622 |
| සුවිලෙඛිතං | 622 |
| සුසික්ඛිතො | 96 |
| සුසු | 378 |

| සූ | පිටුව |
|---|---|
| සූකරිකා | 248 |
| සූතාඝරං | 132 |
| සූතානිස්සිතං | 386 |
| **සෙ** | |
| සෙට්ඨො | 14 |
| සෙතට්ඨිකා | 14, 18 |
| සෙතුඝාතො | 14, 194 |
| සෙනාසනවාරිකං | 50 |
| **සො** | |
| සොතාපත්තිඵලං | 218 |
| සොතාපන්නො | 22 |
| **හ** | |
| හච්ඡිස්මිං | 468 |
| හතනෙත්තා | 196 |
| හම්මියං | 508 |
| හරණකං | 116 |
| හරායමානා | 56 |
| හරිතත්තාය | 106 |
| හරිතෙන | 38 |
| **හි** | |
| හිරඤ්ඤං | 60 |
| **හී** | |
| හීනායාවත්තිත්වා | 38, 40 |

# සංඥානාම


**අ** — පිටුව

අග්ගාලව 374, 554
අචිරවතී 142
අජ්ජුක 126, 148
අඹවන 88, 522
අනාථපිණ්ඩික 466, 484, 502, 512, 516, 526, 532, 536, 540, 546, 558, 562, 566, 572, 584, 588, 592, 606, 612, 616, 622, 628, 632, 636
අබ්භූතධම්ම 18
අසජ්ජපුත්තබ්බසුක 466

**ආ**

ආනන්ද 14, 24, 54, 148, 502, 512, 592
ආරමිකගාමක 610
ආලවකභික්ඛු 178, 190, 374
ආලවි 374, 554

**ඉ**

ඉතිවුත්තක 18
ඉසිගිලිපස්ස 94, 418

**උ**

උත්තරකුරු 16
උත්තරාපථක 14
උදායි 256, 292, 320, 330, 338, 484, 516, 522
උපනන්ද 526, 536, 540, 546, 580, 588, 616, 622
උප්පලවණ්ණා 522
උපසේනවඞ්ගන්තපුත්ත 568, 570
උපාලි 90, 148, 528, 530

**ක**

කකුසන්ධ 16, 18, 20
කටමෝරකතිස්සක 448
කන්නකුජ්ජ 26
කපිල 150
කපිලවත්ථු 576, 596, 606
කල්‍යාණභත්තික 420

**ක** — පිටුව

කලන්දගාම 28, 30
කලන්දකනිවාප 244, 416, 434, 448, 452, 522, 580, 625
කලන්දපුත්ත 28
කලිඞ්ගරාජ 250
කස්සප 16, 18, 20
කාලසිලා 418
කාසි (ජනපද) 470
කූටාගාරසාලා 556
කොකාලික 448, 456
කොනාගමන 16, 18, 20
කොසම්බි 126, 150, 404, 462

**ඛ**

ඛණ්ඩදේවිපුත්ත 448

**ග**

ගඞ්ගා 26
ගණක 96, 98
ගිජ්ඣකූට 94, 132, 180, 244, 434
ගොතමකන්දරා 418
ගොතමකචේතිය 498

**ඝ**

ඝොසිතාරාම 404, 462

**ච**

චම්පා 126, 148
චාතුම්මහාරාජික 42
චොරපපාත 418

**ඡ**

ඡන්න 404, 406, 462
ඡබ්බග්ගිය 102, 158, 498, 554, 556, 576, 584, 592, 612, 620, 636

**ජ**

ජාතක 18
ජීවකම්බවන 418

ජ — පිටුව

ජේතවන 466, 484, 502, 512, 516, 526, 532, 536, 540, 546, 556, 562, 566, 572, 584, 588, 592, 606, 612, 616, 622, 628, 632, 636

ත

තපොද 252
තපොදාරාම 418
තාවතිංස 42
තිඳුකකඳර 418
තුසිත 42

ථ

ථුල්ලනඳා 148

ද

දබ්බමල්ලපුත්ත 416
දළ්හික 126, 150
දෙවදත්ත 448, 456

ධ

ධනිය 94, 100

න

නළෙරු 1
නිග්‍රොධාරාම 576, 596
නිම්මානරති 42

ප

පණ්ඩුක 150
පයාගපතිට්ඨාන 26
පරනිම්මිතවසවත්ති 42
පිලිඳිගාමක 606
පිලිඳිවච්ඡ 150, 606

බ

බ්‍රහ්මකායික 42
බාරාණසී 26, 150
බිම්බිසාර 98, 100, 252, 262, 606
බීජක 42
බීජකපිතු 42
බීජකමාතු 42

භ

භද්දියෙජාතියාවන 88
භාරුකච්ඡ 90
භුම්මදෙව 42
භූතවෙජ්ජක 186

ම

මණිකණ්ඨ 378, 380
මද්දකුච්ඡි 418
මහාකස්සප 374, 376
මහාමොග්ගල්ලාන 16, 244
මහාවන 26, 36, 88, 152, 192, 556
මිගලණ්ඩික 152
මිගාරමාතු 490
මෙත්තියභුම්මජක 420, 434
මෙත්තියා 422

ර

රට්ඨපාල 382
රාජගහ 90, 94, 416, 434, 448, 456, 522, 530, 620

ල

ලක්ඛණ 244
ලිච්ඡවි 40, 252

ව

වග්ගුමුදාතීරිය 152, 192, 194, 198
වජ්ජිගාම 34
වජ්ජිපුත්තක 54, 80
වස්සකාර 98
විපස්සී 16, 18
විසාඛා 484, 490
වෙභාර 418
වෙරඤ්ජබ්‍රාහ්මණ 1, 14, 24, 26
වෙරඤ්ජා 1, 14
වෙස්සභූ 16, 18
වෙසාලි 26, 28, 30, 34, 56, 88, 152, 194, 498, 556
වෙළුවන 416, 418, 434, 448, 456, 522, 580, 625

| ස | පිටුව |
|---|---|
| සක්ක (ජනපද) | 576, 596 |
| සඞ්කස්ස | 26 |
| සත්තපණ්ණිගුහා | 418 |
| සත්තරසවග්ගිය | 186 |
| සද්ධා | 92 |
| සප්පසොණ්ඩිකපබ්භාර | 418 |
| සප්පිනිකා | 254 |
| සමුද්දදත්ත | 448, 456 |
| සාකෙත | 528 |
| සාගලා | 126, 150 |
| සාරිපුත්ත | 16, 18, 20, 22, 592 |
| සාවත්ථි | 88, 92, 466, 484, 502, 512, 516, 526, 532, 536, 540, 546, 556, 562, 566, 572, 588, 592, 606, 612, 616, 620, 628, 632, 636 |
| සිවි | 16, 18 |
| සුදින්න | 28, 30, 34, 44, 48 |
| සුන්දර | 84 |
| සුප්පබ්බා | 90 |
| සෙය්‍යසක | 256 |
| සොභිත | 254 |
| සොරෙය්‍ය | 26 |
| **හ** | |
| හාරික | 250 |

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි

32 ඛුද්දක නිකාය - ජාතක පාලි I

33 ඛුද්දක නිකාය - ජාතක පාලි II

34 ඛුද්දක නිකාය - ජාතක පාලි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාලි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාලි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤඤතතිපපකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම විදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රුදැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

*"Wherever the Buddha's teachings have flourished,*
*either in cities or countrysides,*
*people would gain inconceivable benefits.*
*The land and pepole would be enveloped in peace.*
*The sun and moon will shine clear and bright.*
*Wind and rain would appear accordingly,*
*and there will be no disasters.*
*Nations would be prosperous*
*and there would be no use for soldiers or weapons.*
*People would abide by morality and accord with laws.*
*They would be courteous and humble,*
*and everyone would be content without injustices.*
*There would be no thefts or violence.*
*The strong would not dominate the weak*
*and everyone would get their fair share."*

THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL

*With bad advisors forever left behind,*
*From paths of evil he departs for eternity,*
*Soon to see the Buddha of Limitless Light*
*And perfect Samantabhadra's Supreme Vows.*

*The supreme and endless blessings*
*of Samantabhadra's deeds,*
*I now universally transfer.*
*May every living being, drowning and adrift,*
*Soon return to the Pure Land of Limitless Light!*

*~The Vows of Samantabhadra~*

*I vow that when my life approaches its end,*
*All obstructions will be swept away;*
*I will see Amitabha Buddha,*
*And be born in His Western Pure Land of*
*Ultimate Bliss and Peace.*

*When reborn in the Western Pure Land,*
*I will perfect and completely fulfill*
*Without exception these Great Vows,*
*To delight and benefit all beings.*

*~The Vows of Samantabhadra*
*Avatamsaka Sutra~*

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：BUDDHA JAYANTI TRIPITAKA SERIES,**
**Volume1～Volume 14**

**書名：斯里蘭卡巴利文大藏經，第一冊～第十四冊**
**Book Serial No., 書號：SR201～SR214**

**N.T. Dollars：**

401,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,127,200：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,528,300；Print 1,000 sets**
**以上合計，新台幣 1,528,300 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，
崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿毘跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此案所需金額龐大，且分四批出版，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**


《斯里蘭卡巴利文大藏經 第一冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org



**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**



Printed in Taiwan

1,000 copies; January 2013

SR201 - 10858